# ක්‍රොධවග්ගය

# රොහිණියගේ අසුන්හල්පූජාව.

## 17 — 1

**එක්** කලෙක ආයුෂ්මත් **අනුරුද්ධ** මහාස්ථවිරයන් වහන්සේ පන්සියයක් භික්ෂූන් සමග **කිඹුල්වත්** පුරයට වැඩි සේක. "තෙරුන් වැඩියේ ය"යි ඇසූ උන්වහන්සේගේ නෑයෝ උන්වහන්සේ දක්නට විහාරයට ගියහ. එහෙත් උන්වහන්සේගේ බූනු නැනී වූ **රොහිණී** තොමෝ එහි නො ගියා ය. ස්ථවිරයන් වහන්සේ රොහිණිය නො දැක "රොහිණී කොහි දැ?"යි නෑයන් අතින් විචාළ සේක. "ස්වාමීනි! ඕ තොමෝ ගෙයි රැඳුනීය"යි ඔවුහු කීහ. "කුමක් නිසා මෙහි නො ආ දැ?"යි ඇසූවිට "ස්වාමීනි! ඇයගේ සිරුරෙහි කුෂ්ඨරෝගයෙක් හට ගෙණ තිබේ, එයින් ලජ්ජිත ව නො ආවා"යි කීහ. "එසේ නම් ඇය කැඳවා ගෙණ එවූ"යි කැඳවාලා කළාල් කඩින් කළ සැට්ටයක් ඇඟ ලා ගෙණ සිටි රොහිණියට "රොහිණිය! කුමක් නිසා මෙහි මා දක්නට නො ආවා දැ?"යි ඇසූ විට "ස්වාමීනි! දොරට පිළට බසින්නට නො හැකි තරමේ කුෂ්ඨරෝගයෙක් හට ගෙණ මාගේ සිරුරෙහි සැම තැන පැතිර තිබේ, රෙද්දක් හැට්ටයක් අඳින්නට ද නො හැකිය, ඒ ලජ්ජාවෙන් මෙහි නො ආමි"යි කිවූය. ඉතික්බිති අන් කිසිවක් නො විචාරා "හා! හොඳයි; චේවා; කමක් නෑ; දූන් තිට පිණක් දහමක් කරන්නට නො වටතේ දැ?"යි ඇසූහ. "ස්වාමීනි! මම කිනම් පිණක් කරම් ද, මා විසින් කළයුතු පිණ කුමක් ද, මට කළ හැකි පිණ කුමක් දැ?"යි ඇසූ ය. භික්ෂූන් වහන්සේට ඉන්නට නිදන්නට අසුන්හලක් කරව"යි තෙරුන් කී කල්හි "කුමක් දීලා මම එය කරවම් දැ"යි ඇසූවිට "ඇයි! එසේ කියනු? තිට පළඳනා බඩු නැද්දැ?"යි විචාළාහු ය. "ස්වාමීනි! මට පළඳනා බඩු තිබේ, එයින් කුමක් කරම් දැ"යි කී කල්හි ස්ථවිරයන් වහන්සේ ඒ පළඳනා බඩු කොතරම් වටී දැ?"යි ඇසූහ. 'දස දහසක් වටීය යි සිතිය හැකි ය, දස දහසකට මිල කළ හැකි වේය යි ද සිතේය"යි කිවූ ය. එවිට "එසේ නම් ඒ පළඳනා බඩු විකොට ලැබෙන මුදල් වියදම් කොට අසුන්හල කරවාලව"යි දැන්වූහ. "ස්වාමීනි! මට ඒ පිණිස මුදල් දිය හැකි ය, මම ලාබාල ගෑණියක්මි, එහි මට වැඩි වැටහීමෙක් නැත, එහෙයින් එය කරවන්නෝ කවුරුහු දැ?"යි ඇසූ කල්හි ස්ථවිරයන් වහන්සේ අසල සිටි නෑයන් දෙස බලා රොහිණිය දෙන මුදලින් අසුන්හල කරවීම තමුසේලාට භාරැ"යි නෑයන්ට භාර කළහ. නෑයෝ "මේ කටයුත්තෙහිලා ඔබවහන්සේ ගන්නා තැන අපට කියන්නැ"යි ඉල්ලා සිටියහ. "මමත් මෙහිලා තමුසේලා කරණ වැඩට උපකාරකව සිටින්නෙමි"යි තෙරුන් කී කල්හි ඔවුහු "මැනැවැ"යි පිළිගෙණ එයට වුවමනා දැවදඬු ගෙණ

ආහ. අනුරුද්ධ ස්ථවිරයන් වහන්සේ අසුන්හල කරණ සැටි විධාන කරණ සේක් "දෙමහල් අසුන්හල කරවා එහි යට මාලෙහි පෝරුලා පියසි වැසූ තැන සිට යට මාල හැම ද අසුන් ගෙන්වා පණවා තැබිය යුතුය, නො සිස් වූ පැන් කළ නිතර එළවා තැබිය යුතු ය, පහන් දැල්විය යුතුය, යනාදීන් එහි කළයුතු හැම වැඩක් ම සොයා බලා අඩුපාඩුකම් නො තබා කළ යුතුය"යි රොහිණියට නියම කළහ.

රොහිණී තොමෝ ද "මැනැවැ"යි තෙරුන් කී බස පිළිගෙණ තම පළඳනා බඩු විකොට ලත් මුදල් වියදම් කොට නෑයන්ගේ සොයා බැලීම් ඇතිව දෙමහල් අසුන්හල කරවා ඒ මත පෝරු ඇතුරූ තැන් පටන් තෙරුන් කියූ ලෙසින් යටමාලෙහි හැමදීම් ඈ හැමවැඩක් නිතර මැනැවින් කළා ය. භික්ෂූන් වහන්සේ ද නිතර එහි අවුත් පණවා ඇති අසුන්හි වැඩ හිඳිත්. මෙසේ දින පතා නිතර නිතර අසුන්හල පිස දමත් පිස දමත් රෝහිණියගේ ඇඟ පැතිර හට ගෙණ තුබූ කුෂ්ඨරොගය මැලවී ගියේ ය.

ඕතොමෝ අසුන්හලෙහි වැඩ නිමිකල්හි. බුදුරජුන් ප්‍රධාන කොට ඇති මහාසඞ්ඝයාවහන්සේ එහි වැඩමවා වඩා හිඳුවා පිණි වූ කෑයුතු බිදියයුතු අහරපැන් පිළියෙල කොට පිළිගැන්නූ ය. දන් වළඳා අවසන් කළ බුදුරජාණන් වහන්සේ "මේ දානය කා විසින් පිළියෙල කරණ ලද දැ?"යි අනුරුද්ධස්ථවිරයන් වහන්සේගෙන් විචාළ සේක. "ස්වාමීනි! මාගේ බුහුනැනී වූ රොහිණිය විසින් පිළියෙල කරණලද්දැ"යි සැලකළවිට "ඈ කොහි දැ?"යි විචාරා "ඈ මෙහි නැත, ගෙදරැ"යි කී කල්හි "වහා කැඳවාලව"යි වදාළ සේක. බුදුරජුන්ගේ මේ නියමය ඈට දන්වන ලද ද, ඈ එහි යන්නට නො කැමැති වූ ය. බුදුරජාණන් වහන්සේ ඇය තමන් වෙත එන්නට නො කැමති වූවා ද ගෙන්වාලූ සේක. ඇය එහි අවුත් බුදුරජුන් වැඳ සිටිකල්හි "රොහිණී! කුමක් නිසා මෙහි නො ආවා?"යි විචාළ විට "ස්වාමීනි! මම මෙහි නො පැමිණියෙම් අනෙකක් නිසා නොවේ, මාගේ සිරුරෙහි හට ගෙණ තුබූ කුෂ්ඨරොගය මදක් සන්සිඳුනේ ද, සිරුරුසම තවම බලන්නට අප්‍රිය ය, පිළිකුල් ය, ඒ ලජ්ජාව නිසා මෙහි නො පැමිණියා වෙමි"යි කීවා ය. "රොහිණී! තීගේ සිරුරෙහි මේ කුෂ්ඨරොගය කුමක් නිසා හට ගැණුනේ දැ යි තී දනිහි දැ?"යි විචාරා "ස්වාමීනි! නො දනිමි"යි කී කල්හි "තීගේ ක්‍රොධය නිසා මේ උපනැ"යි වදාළ සේක. එවිට රොහිණී "ස්වාමීනි! මෙබඳු මහත් රොගයක් හට ගැණීමට මා කළ ක්‍රොධය කිමැ"යි ඇසූ ය. "එසේ නම් අසව"යි බුදුරජාණන් වහන්සේ ඇයගේ මේ ඉකුත් පුවත මෙසේ පළකළ සේක.

පෙර බරණැස් රජුගේ අගබිසෝ වූ තී රජගෙයි විසූ නළඟනක කෙරෙහි ක්‍රොධ උපදවා මැට දුක් දෙන්නෙමි, යි කසඹිලියාගෙඩි ගෙන්වා වියලා කුඩු කොට ඒ නළඟන තමන් වෙතට කැඳවා ඇයට නො දැනෙන ලෙසින් කසඹිලියා කුඩු ඇය වැද හෝනා ඇඳෙහි ඇඳ ඇතිරිල්ලෙහි උතුරු සළුවෙහි කොඳු පලසෙහි සැම තැන අතර නො තබා කෙළිකවටකමින් ඇයගේ ඇඟපතෙහි ද ඉස්සා ය. එ කෙණෙහි ම ඇයගේ සිරුර ඉල්පී සැමතැන කුදු මහත් ගඩු හට ගැණුනේ ය. ඈ ඇඟ කසමින් වෙදනා ඉවසනු නො හැකිව ගොස් ඇඳ වැතිර ගත්තී එහිදී ද කසඹිලියා කුඩු ඇඟ තැවරී හටගෙණ තුබූ වෙදනාව තවතවත් රළුපරළු වීමෙන් මහත් වූ දුඃඛවෙදනායෙන් පෙළෙන්නට වූ ය. මේ රොහිණී එදා බරණැස් රජුගේ අගමෙහෙසිය"යි ශාස්තෘන් වහන්සේ මේ ඉකුත් පුවත වදාරා "රොහිණී! මේ කර්මය තී විසින් ම කරණ ලද ය, ස්වල්පමාත්‍ර වූත් ක්‍රොධයක් හෝ ඊර්ෂ්‍යාවක් හෝ කා කෙරෙහිදු කරන්නට නො වටනේ ය"යි වදාරා මේ ධර්මදෙශනාව කළ සේක.

**කොධං ජහෙ විප්පජහෙය්‍ය මානං**
**සඤ්ඤොජනං සබ්බමතික්කමෙය්‍ය,**
**තං නාමරූපස්මිං අසජ්ජමානං**
**අකිඤ්චනං නානුපතන්ති දුක්ඛාති.**

ක්‍රොධය දුරු කරන්නේ ය. මානය වෙසෙසින් පහ කරන්නේ ය. සියලු සංයොජන ඉක්ම වන්නේ ය. නාම – රූප දෙක්හි නො ඇලෙන කිඤ්චන නැති ඒ පුද්ගලයා කෙරෙහි දුඃඛයෝ කඩා නො වැටෙත්.

**කොධං ජහෙ** = ක්‍රොධය දුරු කරන්නේ ය.

ක්‍රොධ නම්: සිතෙහි උපදනා රළුපරළු ගතිය යි. "**කුජ්ඣනං= කොධො**" යනු විවෘතියි. ඇස් කන් නාස් ඈ දොරටුවලට සිත් නො ගන්නා රූපාදී වූ අරමුණු හමු වූ කල්හි සිත ඒ අරමුණු හා ගැටීම නිසා සිතෙහි මේ උපදනේ ය.[1] "**කොධස්ස අධිමත්තපරිත්තතා වෙදිතබ්බා**" යනු ආගම බැවින් ක්‍රොධයෙහි අඩුවැඩි බව මෙසේ දත්තේය:– පිළිවෙළින්, ආදියෙහි ක්‍රොධය සිත කළඹනුයේ ය. නැවැත සිත හකුළුවනුයේ ය. නැවැත හනු සොලවනුයේ ය. නැවැත පරොස් බස් කියවනුයේ ය. නැවැත වටපිට බලවනුයේ ය. නැවැත දඬුසැත් ගන්වනුයේ ය. නැවැත දඬුසැත් නංවාලනුයේ ය. නැවැත දඬුසැත් දමාගස්වනුයේ ය. නැවැත මෙරමා සිරුර සිදුරු කර–

1. 1. 3 'වෙරං තෙසං න සම්මති' යනු බලනු.
,, ,, 'න හි වෙරෙන' ,, ,,

වනුයේ ය. නැවැත සිරුර සුණුවිසුණු කරවනුයේ ය. නැවැත අඟපසඟ ඇද කඩවනුයේ ය. නැවැත දිවි තොර කරවනුයේ ය. නැවැත අවසානයෙහි මෙරමා දිවි නස්වා තමාත් නස්වාලනුයේ ය. මෙසේ ක්‍රොධය ක්‍රමයෙන් සිතෙහි නැගී ආයේ යම් කලෙක මෙරමා නස්වා තමාත් නසා ගැණීමෙහි තැනට මෝරා ගියේ නම් එකල ක්‍රොධය බලවත්බවට ගියේ මහත් බවට ගියේ ය”යි දතයුතු ය. ක්‍රොධය පිළිබඳ මේ අවසාන අවස්ථාව අටුවායෙහි කීයේ මෙසේ ය:– **“යදා අඤ්ඤං ජීවිතං වොරොපෙත්වා අත්තානං ජීවිතා වොරොපනත්ථාය ඨිතො, තදා සබ්බචාගපරිච්චාගී නාම හොති”**යි.

ක්‍රොධයෙන් රත් ව ක්‍රොධයෙන් පෙළෙන ක්‍රොධයෙන් සුසුම් ලන මිනිසා කෙතරම් කෑයේ බීයේ ඇන්දේ පැලන්දේ ද දුර්වර්ණ වේ. එසේ ම ගේ දොර තනා ගෙණ මනා යානවාහන නගිමින් සැපපහසු ඇති ඇඳ පුටුවල හිඳිමින් නිදමින් කල් ගෙවන්නේ ද අස්වැසුම් නැතිව දුකසේ ම හොවින්නේ ය. හිඳින්නේ ය. අනර්ථය බල බලා අනර්ථයට වැටෙන්නේ ය.

ක්‍රොධයෙන් මැඩුනු මිනිසා කය - වචන - සිත යන තිදොරින් පරපණ නසා ධනවිනාශයට පැමිණෙන්නේ ය.

ක්‍රොධමදයෙන් මත් වූයේ අයසට පැමිණෙන්නේ ය. නෑදෑ හිත-මිතුරු සුහදයෝ ක්‍රොධ කරන්නහු බැහැර කරන්නෝ ය.

ක්‍රොධය අවැඩ සිදුකරන්නේ ය. ක්‍රොධය සිත තදින් කුපිත කරන්නේය. සිත තුළ උපදනා ක්‍රොධය භයට කාරුණ්‍ය යි කුපිත වූ මිනිසා නො දන්නේ ය.

කිපියේ ලෞකිකලොකොත්තරාර්ථය නො දනී. එයට හෙතු වූ ශමථ – විදර්ශනා ධර්ම ද නො දකියි. සිත තුළ නැගී සිටි ක්‍රොධය කිපියහු මැඩලන්නේ ය. ක්‍රොධය ඔහුට ගනඳුරෙක් වේ.

කිපියේ නො පහසු වැඩ පහසු වැඩ මෙන් සලකන්නේ ය. කොපය නිවී ගිය කල්හි ඔහු ගින්නෙන් දැවුනකු මෙන් තැවෙන්නේය.

ඔහු කොපය උපන් කල්හි දුම් නගිනා ගින්න මෙන් නොපැහැති මුහුණ පෙන්වන්නේ ය. මිනිස්සු මොනයම් හෙතුවකින් හෝ කිපෙත් ද, ඔවුනට විළිබිය නැත්තේ ය. කියන බසෙහි ද වැදගත් බවෙක් නැත්තේ ය. කොපයෙන් මැඩුනහුට කිසි පිහිටෙක් නැත්තේ ය.

කිපියේ මවුපියන් රහතුන් පුහුදුන් යන හැම කෙනකුත් නසන්නේ ය.

යම් මවක විසින් හදා වඩා එලිබස්වන ලද්දේ මෙලොව එලිය දක්වනලද ද හදා වඩා පණ රැක දුන් ඒ මව ද නසන්නේ ය.

සියලු සත්ත්වයෝ තමා වැනියහ. තමා තමාට අතිශය ප්‍රිය ය. කිපියේ නොයෙක් තැන මුසපත් වූයේ නො යෙක් කරුණු ඉදිරියට ගෙණ තමා ද නසා ගන්නේ ය.

කඩුවෙන් තමා නසා ගණියි. මූළා වූවෝ විෂ කත්. ගෙල වැල ලා ගෙණ මැරෙත්. කඳුවලින් පැන කඳුරැලිවල වැටී මැරෙත්.

නැසුනු වැඞීම් ඇති තමන් මරණයට පමුණුවන වැඩ කොට නැසෙත්. ''කිපියේ පිරිහෙන්නේය'' යනු නො සිතත්. මේ පාලි:-

''කොධනො දුබ්බණ්ණො හොති අථො දුක්ඛම්පි සෙති සො,
අථො අත්ථං ගහෙත්වාන අනත්ථං අධිගච්ඡති.

තතො කායෙන වාචාය වධං කත්වාන කොධනො,
කොධාභිභූතො පුරිසො ධනජානිං නිගච්ඡති.

කොධසම්මදසම්මත්තො ආයසක්‍යං නිගච්ඡති,
ඤාතිමිත්තා සුහජ්ජා ච පරිවජ්ජෙනති කොධනං.

අනත්ථජනනො කොධො කොධො චිත්තප්පකොපනො,
භයමන්තරතො ජාතං තං ජනො නාවබුජ්ඣති.

කුද්ධො අත්ථං න ජානාති කුද්ධො ධම්මං න පස්සති,
අන්ධං තමං තදා හොති යං කොධො සහතෙ නරං.

යං කුද්ධො උපරොධෙති සුකරං විය දුක්කරං,
පච්ඡා සො විගතෙ කොධෙ අග්ගිදඞ්ඪොව තප්පති.

දුම්මඞ්කුයං ස දස්සෙති ධූමග්ගී විය පාවකො,
යතො පතායති කොධො යෙන කුජ්ඣන්ති මානවා.

නාස්ස හිරි හොති න ඔත්තප්පං න වාචො හොති ගාරවො,
කොධෙන අභිභූතස්ස න දීපං හොති කිඤ්චනං.

කුද්ධො හි පිතරං හන්ති කුද්ධො හන්ති සමාතරං,
කුද්ධො හි බ්‍රාහමණං හන්ති හන්ති කුද්ධො පුථුජ්ජනං.

යාය මාතුභතො පොසො ඉමං ලොකං අවෙක්ඛති,
තම්පි පාණමපි හනති සො හන්ති කුද්ධො පුථුජ්ජනෙ.

අත්තූපමාහි තෙ සත්තා අත්තා හි පරමං පියො,
හනන්ති කුද්ධො පුථුත්තානං නානාරූපෙසු මුච්ඡිතො.

අසිනා හනන්ති අත්තානං විසං ඛාදන්ති මුච්ඡිතා,
රජ්ජුයා බජ්ඣ මීයන්ති පබ්බතාමපි කන්දරෙ.

භූනහච්චානි කම්මානි අත්තමාරණියානි ච,
කරොන්තා නාවබුජ්ඣන්ති කොධජාතො පරාභවො"සි.

කරුණු මෙසේ බැවින් අටුවායෙහි දී **"කොධො නාම උප්පජ්ජ-මානො සුභාසිතදුබ්භාසිතං අත්ථානත්ථං හිතාහිතං ජානිතුං න දෙති. තස්මා න හි සාධු කොධො"** යනු කීහ. ක්‍රොධය ඉපැදෙනුයේ සුභාෂිත දුර්භාෂිතයන් අර්ථානර්ථයන් හිතාහිතයන් දන්නට නො දේ ද, එහෙයින් ක්‍රොධය සත්ත්වයනට හිත පිණිස නො වැටේ ය, යනු එහි අරුත්.

තවද මෙහිලා මෙ ද දත්තේ ය:- **"දුට්ඨො ඛො බ්‍රාහ්මණ! දොසෙන අභිභූතො පරියාදින්නචිත්තො අත්තබ්‍යාබාධායපි චෙතෙති, පරබ්‍යාබාධායපි චෙතෙති, උභයබ්‍යාබාධායපි චෙතෙති, චෙතසිකම්පි දුක්ඛං දොමනස්සං පටිසංවෙදෙති"** යනු හා **"දුට්ඨො ඛො බ්‍රාහ්මණ! දොසෙන අභිභූතත්තො අත්තත්ථම්පි යථාභූතං න ජානාති, පරත්ථම්පි යථාභූතං න ජානාති, උභයත්ථම්පි යථාභූතං න ජානාති"** යනුත්.

බමුණ! ද්වෙෂයෙන් දූෂිත වූයේ ද්වෙෂයෙන් මැඩුනේ තමාට අවැඩ පිණිස පරහට අවැඩ පිණිස තමාට පරහට අවැඩ පිණිස සිතන්-නේ ය. ඒ හෙතුවෙන් දිවා රෑ දෙක්හි සිත තළමින් පෙළමින් උපදනා දුක් දොම්නස් විඳින්නේ ය. බමුණ! ද්වෙෂයෙන් දූෂිත වූයේ ද්වෙෂයෙන් මැඩුනේ ආත්මාර්ථය හා පරාර්ථය හා ආත්මාර්ථපරාර්ථ හා තතුලෙසින් නො දන්නේ ය, යනු එහි ඉතා කෙටි අරුත්.

පහත් හැසිරීම් ඇති සොරු, දෙපස සවි කළ අත් දඬු ඇති කියතක් ගෙණ එයින් යමක්හුගේ අඟපසඟ කපා ඉරා දමත් ද, එහෙයින් ඒ කැපුම් ඉරුම් ලබන්නේ ඒ සොරුන් කෙරෙහි සවල්ප මාත්‍ර වූත් ක්‍රොධචිත්තාවක් උපද වන්නේ නම් හෙතෙමේ ශාස්තෘ ශාසනය කරන්නෙක් ශාසනික ප්‍රතිපත්ති පුරන්නෙක් නො වන්-නේ ය,යි බුදුරජනන් වහන්සේ වදාළ සේක. මේ ඒ වදාළ සැටි:- **"උභතො දණ්ඩකෙනපි චෙ භික්ඛවෙ! කකචෙන චොරා ඔචරකා අඞ්ගමඞ්ගානි ඔක්කන්තෙය්‍යුං, තත්‍රාපි යො මනො පදූසෙය්‍ය, න මෙ සො තෙන සාසනකරො"**යි.

මෙහි මෙසේ වත් ක්‍රොධයෙන් මැඩුනේ කයින් පව්කම් කොට වචනයෙන් පව්කම් කොට සිතින් පව්කම් කොට නිරයෙහි උපදනේ ය. මේ එහි ආපතය:- **කොධනායං භික්ඛවෙ! පුරිස පුග්ගලො කොධාභිභූතො කොධපරෙතො කායෙන දුච්චරිතං**

**චරති, වාචාය දුච්චරිතං චරති, මනසා දුච්චරිතං චරති, සො කායෙන දුච්චරිතං චරිත්වා වාචාය දුච්චරිතං චරිත්වා මනසා දුච්චරිතං චරිත්වා කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති"** යනු.

ක්‍රොධයට යටත් ව ක්‍රොධයෙන් මැඩුනෝ මෙසේ මරණින් මතු අපායයෙහි ඉපිද එහි ඉතා දිගුකලක් කටුක දුක් විඳ එයින් මිදී පෙර සසර කළ යම් පිණක් කරණ කොට මේ මිනිස්ලොව උපන්නේ පෙර උනුන් කෙරෙහි ඉපද වූ ඒ ක්‍රොධයෙහි සලකුණු විසින් ලැබූ මිනිසත්බවෙහිලා විරූප වූයේ අප්‍රිය වූ දැකුම් ඇතියේ වේ. නිතර පෙළෙන දරුණු රොගපීඩා ඇතියේ වේ. කුදුබැව් කොරබැව් ඇතියේ වේ. දිවි තොර කිරීමෙහි බලාපොරොත්තු ඇති සතුරන්-ගෙන් දව රෑ වට ව සිටියේ වේ. මෙසේ ක්‍රොධයෙන් මැඩුනෝ අපායයෙහි ඉපද දරුණු දුක් විදියේ මිනිස්ලොව මෙසේ නන් වැදෑරුම් දරුණු දුක්වලින් පෙළෙන්නෝ වන්නෝ ය යි දත යුතුය.

මෙසේ ක්‍රොධය සත්ත්වයා සසර ඇවිදුනා තෙක් හැම තැන දුක් දෙන පාපචිත්තාවක් බැවින් කිසි සංස්කාරයක් කෙරෙහි කිසි සත්ත්වයකු කෙරෙහි මොනා ම කරුණක් නිසා වත් කිසිදෑකත් අඩුව හෝ වැඩිව ස්ථාතික ව හෝ අස්ථාතික ව ක්‍රොධචිත්තා නම් සිතෙහි නො ඉපද විය යුතු ය යි ද, ක්‍රොධ කරන්නේ ම පරහට බණින්නේ ම දෙඩන්නේ ම දෙස් නගන්නේ ම සසර උපතුපත් දූයෙහි දුක් විදින්නේ ය යි ද, ක්‍රොධ නො කරන්නේ ම පරහට නො බණින්-නේ ම නො දෙඩන්නේ ම දෙස් නො නගන්නේ ම සසර උප-නුපත් දූයෙහි සැමදූ සැප විදින්නේ ය යි ද, වදාළ සේක.

බුදුරජානන් වහන්සේ **රජගහ** නුවර **වෙළුවනාරාමයෙහි** වැඩ වසනා දවසෙහි රජගහනුවර **භාරද්වාජ** නම් බමුණෙක් විසී ය. ඔහුට **ධනඤ්ජානි** නම් බිරියක් වූ ය. ඕ තොමෝ තුනුරුවන් කෙරෙහි පහන් ව සිටියා ය. ධනඤ්ජානිය භාරද්වාජ බමුණාහට කැම්බීම් ලං කොට දෙන්නී "සම්මා සම්බුදුරජුන්හට නමස්කාර වේවා"යි තෙවරක් නො පැකිළ උදන් අනන්නී ය. භාරද්වාජ දවසක් මෙසින් කිපියේ "මේ සැඩොලිය හැම වේලෙහි හැම තැන මේ මුඩුමහණහුගේ ගුණ කියන්නී ය, සැඩොලිය! දැන් මම තීගේ ඒ ශාස්තෘහට වාද නගන්නෙමි"යි ගුගුලා කීයේ ය. එසේ ක්‍රොධ-යෙන් ගුගුලා කී කල්හි "හොඳයි යන්න, ගොස් මාගේ ශාස්තෘන් වහන්සේගේ තරම දැන ගණිවු"යි ඕතොමෝ යටත් පහත් ව දන්වා සිටියා ය. බමුණු කිපියේ භාග්‍යවතුන් වහන්සේ වෙත එළැඹියේ ය. එළැඹ භාග්‍යවතුන් වහන්සේ සමග සතුටුව කතාබස් කොට පසෙකට වී හිඳ භාග්‍යවතුන් වහන්සේගෙන්

**"කිංසු ඡෙත්වා සුඛං සෙති"** කුමක් නසා සුවසේ හොවී ද?

**"කිංසු ඡෙත්වා න සොචති"** කුමක් නසා ශෝක නො කෙරේ ද?

**"කිස්සස්ස එකධම්මස්ස වධං රොචෙසි ගොතම!"** ගෞතමයෙනි! කිනම් එක් දහමක්හුගේ නැසීම රුස්නෙහි ද? යි මෙසේ ඇසී ය.

එකල්හි බුදුරජාණන් වහන්සේ බමුණා ඇසූ ප්‍රශනයන්ට මෙසේ පිළිතුරු දී වදාළ සේක.

**"කොධං ඡෙත්වා සුඛං සෙති"** ක්‍රොධය නසා සුවසේ හොවියි.

**"කොධං ඡෙත්වා න සොචති"** ක්‍රොධය නසා ශෝක නො කෙරෙයි.

**"කොධස්ස විසමූලස්ස මධුරග්ගස්ස බ්‍රාහ්මණ!"** බමුණ! විෂ සඞ්ඛ්‍යාත දුඃඛ විපාකයට මුල් වූ මිහිරි අග ඇති ක්‍රොධය,

**"වධං අරියා පසංසන්ති"** නැසීම ආය්‍ය්‍යයෝ පසසත්.

**"තං හි ඡෙත්වා න සොචති"** ඒ ක්‍රොධය නසා (සිටියේ) ශෝක නො කෙරේම ය, යි.

මේ ප්‍රශන ව්‍යාකරණයෙන් සතුටට පැමිණි භාරද්වාජතෙමේ බුදුරජුන් වෙත පැවිද්ද හා උපසපත් බව ලබා එකලා ව ගණයා කෙරෙන් වෙන් ව කෙලෙස් තවන වැර ඇතියේ කල් නො යවා ම රහත් බවට පැමිණියේ ය.

මෙ පුවත ඇසූ **අක්කොසක භාරද්වාජ** නම් බමුණු බුදුරජුන් වෙත ගොස් බුදුරජාණන් වහන්සේට අසභ්‍ය වූ පරුෂ වචනයෙන් ආක්‍රොශ පරිභව කරන්නට වන. එකල්හි භාග්‍යවතුන් වහන්සේ "බමුණ! තාගේ නිවසට ආගන්තුක වූ මිත්‍රාමාත්‍යයෝ සහලේ නෑයෝ එත් ද?" යි ඇසූහ. "ඔව්! මාගේ ගෙට ඇතැම් දවස්වල මාගේ ආගන්තුක වූ මිත්‍රාමාත්‍යයෝ සහලේ නෑයෝ පැමිණෙති" යි බමුණු කී ය. "හොඳයි! ඔවුන් ආ විට ඔවුන්ට කෑම් බීම් දෙන්නෙහි දැ?" යි ඇසූහ. "ඔව්, ඇතැම් දිනෙක දෙන්නෙමි" යි කී ය. "හොඳයි! කෑම් බීම් දෙනු සැබෑ ය, ඔවුහු එය නො පිළිගණිත් නම්, එය කාට වේ දැ?" යි ඇසූ විට "ගෞතම! ඔවුහු නො පිළිගණිත් නම් එය අපට ම වේ ය" යි කීයේ ය. බුදුරජාණන් වහන්සේ "බමුණ! එපරිද්දෙන් ආක්‍රොශ නො කරණ අපට තෝ ආක්‍රොශ කෙරෙහි ද?, නො කිපෙන අපට කිපෙහි ද? ඩබර නො කරණ අපට ඩබර නගහි ද? තාගේ ඒ ආක්‍රොශාදිය අපි නො පිළිගණිමු, බමුණ! ඒ ආක්‍රොශාදිය තට ම වෙයි, බමුණ!

යමෙක් ආක්‍රොශ කරන්නහුට පෙරළා ආක්‍රොශ කෙරේ ද, කිපෙන්නහුට පෙරළා කිපේ ද, ඩබර නගන්නහුට පෙරළා ඩබර නගා ද, බමුණ! මෙ තෙමේ උත් හා එකතු ව අනුභව කෙරෙයි. උනුනට සමවලා කෙරෙයි. ඒ අපි තා සමග එකතුව නො වළඳමු, උනුනට සමවලා නො කරමු, බමුණ! එය තට ම වේ ය'' යි වදාළ සේක. එකල්හි බමුණු ''රජු සහිත පිරිස මහණ ගොයුම්හු රහත්හ, යි දනියි, එහෙත් භවත් ගොයුම්හු කිපෙති'' යි සිතී ය.

ඉක්බිති බුදුරජාණන් වහන්සේ මෙසේ වදාළ සේක.

''අකොධස්ස කුතො කොධො දන්තස්ස සමජීවිනො,
සම්මදඤ්ඤා විමුත්තස්ස උපසන්තස්ස තාදිනො.

තස්සෙව තෙන පාපියො යො කුද්ධං පටිකුජ්ඣති,
කුද්ධං අපටිකුජ්ඣන්තො සඞ්ගාමං ජෙති දුජ්ජයං.

උභින්නමත්ථං චරති අත්තනො ච පරස්ස ච,
පරං සඞ්කුපිතං ඤත්වා යො සතො උපසම්මති.

උභින්නං තිකිච්ඡන්තානං අත්තනො ච පරස්ස ච,
ජනා මඤ්ඤන්ති බාලොති යෙ ධම්මස්ස අකොවිදා''යි

දැමුනු සම දිවි වැටුම් ඇති මැනැවින් දැන මිදුනු සන්හුන් වූ තාදී ගුණ ඇති නො කිපෙන්නහුට ක්‍රොධයෙක් කොයින් වේ ද. යමෙක් කිපුනහුට පෙරළා කිපේ ද, එයින් ඔහුට ම පවෙක් වේ. කිපියහුට පෙරළා නො කිපෙන්නේ දිනීමට නො පහසු වූ ක්‍රොධ සඞ්ග්‍රාමය දිනන්නේ ය.

යමෙක් අන්හු කිපියහු දැන සිහි ඇති ව ඉවසා ද, හෙතෙමේ තමාට ද අන්හට ද යන දෙදෙනාට ම වැඩ සිදු කරන්නේ ය.

තමාට හා අන්හට යා යන දෙදෙනාහට ම පිළියම් කරන්නහු බාල ය යි ධර්මයෙහි අදක්‍ෂ වූ ජනයෝ හඟිත්, යනු අරුත් ය.

මේ දෙශනායෙන් පහන් ව අකොසකභාරද්වාජ තෙමේ ද සසුන්හි පැවිදි උපසපන්බව ලබා එකලා ව ගණයා කෙරෙන් වෙන් ව අප්‍රමත්ත වූයේ කෙලෙස් තවන වැර ඇතියේ රහත් බවට පැමිණියේ ය.

අසුරින්දකභාරද්වාජබමුණු බුදුරජාණන් වහන්සේට අසභ්‍ය වූ පරුෂ වචනයෙන් බැණ වැදුනු කල්හි උන්වහන්සේ ඔහුට

"ජයං වෙ මඤ්ඤති බාලො වාචාය ඵරුසං භණං,
ජයං චෙවස්ස තං හොති යං තිතික්ඛා විජානතො.

තස්සෙව තෙන පාපියො යො කුද්ධං පටිකුජ්ඣති,
කුද්ධං අප්පටිකුජ්ඣන්තො සඞ්ගාමං ජෙති දුජ්ජයං.

උභින්නමත්ථං චරති අත්තනො ච පරස්ස ච,
පරං සඞ්කුපිතං ඤත්වා යො සතො උපසම්මති.

උභින්නං තිකිච්ඡන්තානං අත්තනො ච පරස්ස ච,
ජනා මඤ්ඤන්ති බාලොති යෙ ධම්මස්ස අකොවිදා"

යි මේ ධර්මදෙශනාව වදාළ සේක.

අඥාන පුරුෂ තෙමේ නො සැබි බස් කියමින් පරොස් බස් කියමින් එය එකාන්තයෙන් තමාට ජයෙකැ යි සිතන්නේ ය. ඉවසීමෙහි ගුණ දන්නහුගේ යම් ඉවසීමෙක් වේ ද, ඒ ඔහුට ජයෙක් ම වේ; යනු අරුති. ඉතිරි ගාථා තුනෙහි අරුත් කියූ සේ ය.

**"එකධම්මං භික්ඛවෙ! පජහථ, අහං වො පාටිභොගො අනාගාමිතාය, කතමං එකධම්මං? කොධං භික්ඛවෙ! එකධම්මං පජහථ, අහං වො පාටිභොගො අනාගාමිතායාති,**

**යෙන කොධෙන කුද්ධාසෙ සත්තා ගච්ඡන්ති දුග්ගතිං,**
**තං කොධං සම්මදඤ්ඤාය පජහන්ති විපස්සිනො,**
**පහාය න පුනායන්ති ඉමං ලොකං කුදාචනන්ති"**

මහණෙනි! එක් ධර්මයක් පහ කරවූ. මම තමුසේලාට අනාගාමිභාවය ලබා දෙන්නට ඇප වෙමි. මහණෙනි! ක්‍රොධය පහ කරවූ. මම තමුසේලාට අනාගාමිභාවය ලබා දෙන්නට ඇප වෙමි.

යම් ක්‍රොධයකින් කිපියා වූ සත්ත්වයෝ දුගතියට යෙද්ද, ඔවුහු විදසුන් නුවණින් බලන්නාහු ඒ ක්‍රොධය මනා නුවණින් දැක සහමුලින් පහ කෙරෙත්. ක්‍රොධය පහ කළාහු කිසි කලෙකත් මේ ලොකයට පෙරළා නො පැමිණෙත්.

මෙසේ වදාළ බැවින් ක්‍රොධයෙහි ආදීනවය හා ක්‍රොධය දුරු කිරීමෙහි ආනිසංසය දැන තම තමන් සිත් තුළ මොන යම් කාරුණක් නිසා හෝ උපදනා ක්‍රොධය සන්සිඳුවා ගත යුතු ය.

යම් කිසිවකු නිසා යමක්හට ක්‍රොධයෙක් උපන්නේ නම් එහිදී පළමු කොට ඔහු කෙරෙහි මෙත් සිත පැතිර විය යුතු ය. කුළුණු සිත වැඩිය යුතු ය. මැදහත් සිත ලං කොට බැලිය යුතු ය. ක්‍රොධයට කාරුණු වූයේ තම සිතට අරමුණු විසින් නො නගී ද

බිත්ති පවුරු ඈ යම්කින් මුවා කරණ ලද්දකු සේ නො පෙණි යේ ද, එසේ ඔහු අමතක කළ යුතු ය. සිහි නො කළ යුතු ය. “මෙතෙමේ කර්‍මය දැයාද කොට ඇත්තේ ය” යනාදීන් ඔහු පිළිබඳ කර්‍මස්වකතාවය ඉටිය යුතු ය. තදඞ්ගප්‍රහාණාදීන්ගේ වශයෙන් ක්‍රොධය ඔබා ගත යුතු ය. අපරභාගයෙහි විදසුන් කුළු ගන්වා අනාගාමී මාර්‍ගඥනයෙන් ක්‍රොධය මුළුමනින් නසා දුරු කිරීමෙන් අනාගාමී වන්නේ ය. නැවැත උත්පත්ති විසින් මේ ලොකයට නො එන්නේ ය. ව්‍යාපාද නාමයෙන් ඔරම්භාගීය සංයොජනයන්හි ඇතුළත් ක්‍රොධය ඔවුන්ගේ ප්‍රහාණයෙහි දී අනාගාමීමාර්‍ගඥන යෙන් ප්‍රහීණ වන්නේ ය. අනාගාමී තෙමේ කාමලොකයෙහි නැවැත නූපදනේ ය.[1]

**විප්පජහෙය්‍ය මානං** – මානය වෙසෙසින් පහ කරන්නේ ය.

ජාත්‍යාදිය වස්තු කොට නැගි සිතෙහි අහඞ්කාරය මානය යි. එහි නොයෙක් අවස්ථා ඇත්තේ ය. යට කියනලදි.

බුදු රජානන් වහන්සේ “මහණෙනි! සියලු සත්ත්වයෝ මාන-යෙන් යුක්ත වූවෝ මානයෙන් ගෙතුනෝ භවයෙහි ඇලුනාහු ය, මානය ත්‍රිවිධ පරිඥවන්ගෙන් පිරිසිඳ නො දන්නාහු පුන පුනා උත්පත්තියට පැමිණෙත්, යම් කෙනෙක් මානය මුළුමනින් ප්‍රහාණය කොට අර්හත් ඵලයෙහි පිහිටා මානය සමග පවත්නා සියලු කෙලෙසුන් කෙරෙන් මිදුනාහු වෙද්ද ද, යටපත් කළ මානග්‍රන්ථ ඇති ඒ රහත්හු සියලු දුක් ඉක්මවා ගියහ”යි. මේ එහි පාලිය:–

“මානුපෙතා අයං පජා මානගන්ථා භවෙ රතා,
මානං අපරිජානන්තා ආගන්තාරො පුනබ්භවං.

යෙ ච මානං පහත්වාන විමුත්තා මානසඞ්ඛයෙ,
තෙ මානගන්ථාභිභුනො සබ්බදුක්ඛමුපච්චගුං” යනු.

“මහණෙනි! මානය විශිෂ්ටඥනයෙන් නො දැන ගන්නේ මුළුමනින් ඉතිරි නො කොට නො දැන ගන්නේ සිත ඇලුම් නො හරින්නේ කෙලෙස් නො දුර ලන්නේ දුක් කෙළවර කිරීමට පොහොසත් නො වේ” සි මෙහිලා වදාළ බව ද දන්නේ ය. මේ ඒ වදාළ පාලිය:– **“මානං භික්ඛවෙ! අනභිජානං අපරිජානං තත්ථ චිත්තං අවිරාජයං අප්පජහං අභබ්බො දුක්ඛක්ඛයාය”** යනු.

---

1. 1. 3. ‘වෙරං තෙසං න සම්මති’ යනු බලනු
, , 4 ‘නහි වෙරෙන වෙරානි’ ,, ,,

එසේ ම මෙහිලා මේ ද දත්තේ යː-

"යෙන මානෙන මත්තා සෙ සත්තා ගච්ඡන්ති දුග්ගතිං,
තං මානං සම්මදඤ්ඤාය පජහන්ති විපස්සිනො,
පහාය න පුනායන්ති ඉමං ලොකං කුදාචනං" යනු.

යම් මානයෙකින් මත් වූ සත්ත්වයෝ දුගතියට යෙද් ද, ඒ මානය විදසුන් නුවණින් බලන්නාහු මැනැවින් නුවණින් දැන මුළුමනින් පහ කෙරෙත්. මානය පහ කළාහු කිසි කලෙකත් මේ ලොකයට උත්පත්ති විසින් පෙරළා නො එත්, යනු අරුත්.

මානය පීශිෂ්ටඥානයෙන් දැන ගත්තේ මුළුමනින් ඉතිරි නො කොට දැන ගන්නේ එහි සිත නො අලවන්නේ කෙලෙස් දුර ලන්නේ දුක් කෙළවර කිරීමට පොහොසත් වන්නේ ය. එහෙයින් බුදුරජාණන් වහන්සේ **"මානං භික්ඛවෙ! එකධම්මං පජහථ"** මහණෙනි! 'මාන නම් වූ එක්ම ධර්මය පහ කරවු' යි වදාළ සේක. මෙහි **"විපස්සජෙය්‍ය මානං"** යන මේ ද වදාළෝ මානය දුරු කොට හැරීම මුළුමනින් දුක් ගෙවී යෑමට කරුණු වන බැවිනි.[1]

**සංයොජනං සබ්බං අතික්කමෙය්‍ය** = සියලු සංයොජන ඉක්ම වන්නේ ය.[2]

**නාමරූපස්මිං** = නාමයෙහි හා රූපයෙහි.[3]

**අසජ්ජමානං** = නො ඇලෙන.

මාගේ රූප ය, මාගේ වෙදනා ය, මාගේ සංඥ ය, මාගේ සංස්කාර ය, මාගේ විඥාන ය යි නාමරූප දෙක්හි කිසිවිටෙකත් තෘෂ්ණාදෘෂ්ටීන්ගේ වශයෙන් නො ඇලෙන. **තං** යනු බලා සිටියේ ය.

**අකිඤ්චනං** = කිඤ්චන නැති.[4]

රාගාදිකෙලශධර්මයෝ **කිඤ්චන** නම්. පළිබොධ බැවිනි. තව ද නාමරූපාදියෙහි ඇලෙන්නහුට ලෞකික-ලොකොත්තර ගුණයන් ලැබීමට ඉඩ නො දෙන බැවිනුදු රාගාදිකෙලශ කිඤ්චන නම්. **අකිඤ්චනං** යනු ද **තං** යනු බලා සිටියේ ය.

**තං** = ඒ පුද්ගලයා.

---

1. 1, 7. 'අනික්කසාවො' යනු බලනු.
2. 2, 8. 'සංයොජනං' ,, ,,
3. 1, 1. 'මනොපුබ්බඞ්ගමාධම්මා' ,, ,,
4. 15, 2. 'කිඤ්චනං' ,, ,,

ඒ පුද්ගලයා යි කියේ නාමරූප දෙක්හි නො ඇලෙන රාගාදි කිසවුන නැතියේ ය.

**තෙ අනුසතනති දුක්ඛා** = කායික චෛතසික දුඃඛයෝ අනුව නො පවත්නාහු ය. අනුපතිත නො වන්නා හ. කඩා නො වැටෙන්නා හ.[1]

ධර්මදෙශනාවගේ අවසානයෙහි බොහෝ දෙන සෝවන් ඵලාදියට පැමිණියාහු ය. රෝහිණී ද සෝවන් ඵලයෙහි පිහිටියා ය. එකෙණෙහි ම ඇයගේ සිරුර රන්වන් වී ය. කලක් ගෙවා මිය ගිය ඕ තොමෝ දෙව්පුත් සිවු දෙනකුන්ගේ විමන් සීමාතුළ උපන්නී දුටුවන් සිත් ගන්නා රූපයෙන් අග තැන් පත් වූවා ය. ඒ දෙව් පුත් සිවු දෙන ඇය දැක උපන් සෙනහ ඇත්තාහු "මෝ මාගේ විමන් සීමාව තුළ උපන, මෝ මාගේ විමන් සීමාව තුළ උපනැ" යි විවාද කරන්නාහු සක්දෙව් රජු වෙත ගොස් "දෙවයන් වහන්ස! මැ නිසා අප අතර කලහයෙක් උපන, මෙහි යුක්තිය විචාරා කලහය සන්සිඳුවාලනු මැනැවැ"යි දන්වා සිටිය හ. සක්දෙව් රජ තෙමේ ද ඇය දෙස බලා උපන් සෙනහ ඇති ව මැය දුටු වේලේ පටන් මැය ගැණ තොපට කෙසේ අදහස් උපන්නේ දැ"යි ඇසී ය. "මැය දුටු වේලේ මට උපන් සිත යුද්ධබෙරක් මෙන් සන්සිඳුවා ගන්නට නො හැකි වී ය"යි එකෙක් කී ය. දෙවැන්නා "මැ දුටු තැන් පටන් මාගේ සිත කන්දෙකින් ගලා බස්නා ගඟදියක් සේ වහ වහා පවතින්නෙක් වි ය"යි කී ය. "මැ දුටු වේලේ පටන් මාගේ ඇස් කකුළුවකුගේ ඇස් සේ පිටතට නෙරා සිටියේ ය"යි තෙවැන්නා දන් වී ය. සිවු වැන්නා "මාගේ සිත සැයක් සමීපයෙහි එසවූ ධවජයක් සේ නිසල ව සිටින්නට නො හැකි වී ය"යි කියා සිටියේ ය. සක්දෙවිඳු ඒ දෙව්පුතුන්ගේ මේ කතාව අසා "දරුවෙනි! තොපගේ සිත් තොපට තව ම මැඩ ගත හැකි සැහැවි ඇතියේ ය, මම නම් මැ ලැබුයෙම් ම ජීවත් වෙමි, නො ලැබුයෙම් මාගේ මරණය වන්නේ ය"යි ඔවුනට කී ය. එකල්හි ඔවුහු "මහරජ! ඔබවහන්සේගේ මරණයෙන් වැඩෙක් නැතැ"යි ඒ දෙව්දුව සක්දෙවිඳුට පාවා දී ගිය හ. ඕ තොමෝ සක්දෙවිඳුට ප්‍රිය වූ ය. මන වඩන්නී වූ ය. "මම අසවල් කෙළියට යමි"යි ඇය කී කල්හි ඇයගේ වචනය ප්‍රතික්ෂෙප කිරිමට සක්දෙව්රජ තෙමේ අපොහොසත් ව සිටියේ ය.

**රෝහිණීවස්තුව නිමි.**

---

1. 14, 6. 'දුක්ඛං' යනු බලනු

# දෙව්දුවකගේ පැමිණිල්ලෙක්

## 17 — 2

**ත්‍රිලෝගුරු** බුදුරජාණන් වහන්සේ භික්ෂුසඞ්ඝයා වහන්සේ උදෙසා සෙනසුන් අනුදැන වදාළ කල්හි රජගහ නුවර සිටු ආදීහු සෙනසුන් කරවන්නට පටන් ගත්හ. කාත් කවුරුත් නැති අලවුනුවර වැසි අප්‍රකට භික්ෂු නමක් තමන්ට හිඳිනට සෙනසුනක් කරණුයේ එක් වටිනා ගසක් දැක එය කපන්නට පටන් ගත්තේ ය. එතැන, වසන තැන් කොට හුන් ලදරු පුතකු ඇති එක් දෙව්දුවක් පුතු ඇකයෙහි හොවා ගෙණ "හිමියෙනි! මාගේ විමන නො සිඳිනු මැනැව, පුතුන් රැගෙණ වසන්නට තැන් නැති ව අතැන මෙතැන හැසිරෙන්නට නො හැක්කෙමි" යි බැගෑපත් ව ඉල්ලා සිටියා ය. ඒ මහණ ද "මට මෙ වැනි වටිනා අන් ගසක් ලබා ගැණීම නො කළ හැකි ය"යි ඇයගේ ඒ ඉල්ලීම නො පිළිගත්තේ ය. එවිට ඒ දෙව් දූ තොමෝ "මපුතු දැකීමෙන් මේ මහණ ගස නො කපා හරිණු ඇතැ"යි සිතා සිය ලදරු පුත් එම ගසෙහි අත්තක තැබූ ය. මහණ, ගස කපන්නට සිතා ඔසොවා ගසට ගැසූ පොරව රඳවාලන්නට නො හැකි වූයේ ලදරු දෙව්පුතුගේ බාහුව කපා ගෙණ ගියේ ය. එයින් උපන් බලවත් ක්‍රොධ ඇති දෙව් දූ තොමෝ "පහර ගසා මහණ මරන්නෙමි"යි අත් දෙක ඔසොවා ද "මේ මහණ, සිල්වත් ය, මම මොහු මැරූයෙම් නම් නිරයගාමිනී වන්නෙමි, සෙසු දෙවියන් ද තමන් විමන් කොට ගත් ගස් කපා හරිණ මහණුන් දැක අසවල් දෙව්දුව මෙසේ මහණෙක් මරණ ලදැ යි මා පමණ කොට ගෙණ මහණුන් මරා දමනු ඇත, මේ මහණහට ද ගුරුවරයෙක් ඇත්තේ ය, ඒ ගුරුවරයාට මෙය කියන්නෙමි"යි ඉස්සූ දෙ අත පහත හෙලා හඬමින් බුදුරජුන් වෙත ගොස් වැඳ එකත් පසෙක සිටියා ය. එකල්හි බුදුරජාණන් වහන්සේ "දෙව්දුව! නී කුමක් නිසා හඬා දැ"යි අසා වදාළ සේක. "ස්වාමීනි! ඔබවහන්සේගේ ශ්‍රාවකයකු විසින් මා විමන් කොට ගෙණ තුබූ ගස කපා හරිණ ලද්දේ ය, මට දූන් ඉන්නට නිදන්නට තැනක් නැත, මමත් ඔහු මරණු කැමැත්තෙම් වීමි, එහෙත් එසේ නො කොට මම ඒ මහණහු කළ අපරාධය ඔබ වහන්සේට දන්වන්නට මෙහි ආවා වෙමි"යි දෙව්දූ බුදුරජුන්ට එය විස්තර වශයෙන් දන්වා ලූය. බුදුරජාණන් වහන්සේ එය අසා දෙව්දුව! ඒ ඉතා යහපති, නී කළසැටි ඉතා යහපති, ඉතා වෙගයෙන් දුවන රියක් වහා යා නො දී තමන් කැමැති තැනට

පමුණුවා ගන්නියක මෙන් නී තමන් සිතෙහි නැගි ක්‍රොධය සන්සිඳවා ගත් සැටි ඉතා යහපතැ”යි වදාරා මේ ධර්මදෙශනාව කළ සේක.

**යො වෙ උප්පතිතං කොධං රථං භන්තංව ධාරයෙ,**
**තමහං සාරථිං බ්‍රෑමි රස්මිග්ගාහො ඉතරො ජනො'ති.**

යමෙක් එකාන්තයෙන් උපන් ක්‍රොධය ඉතා වේගයෙන් දුවන රියක් මෙන් දරා ද, මම ඔහු රියැදුරු යි කියමි. අන්‍ය වූ (රියැදුරු) ජනතෙමේ රැහැන් අතට ගන්නේ නම් වේ.

**යො වෙ උප්පතිතං කොධං** = යමෙක් එකාන්තයෙන් උපන් ක්‍රොධය.[1]

**රථං භන්තං ඉව** = වෙගයෙන් දුවන රියක් මෙන්.

**ධාරයෙ** = දරා ද.

**තං අහං සාරථිං බ්‍රෑමි** = මම ඔහු රියැදුරු යි කියමි.

යම්සේ රිය පැදවීමෙහි දක්ෂ වූ රියැදුරු තෙමේ ඉතා වෙගයෙන් දුවන රිය වහා යා නො දී තමන් කැමැති තැනට පමණුවා ගණී ද, එපරිද්දෙන් තමන් සිත්තුළ උපන් ක්‍රොධය, යම් ඒ එකෙක් ඉදිරියෙහි වැඩෙන්නට නො දී හිතන්නට පිළිවන් මගට පමුණුවා සන්සිඳවා ලන්නට සමර්ථ වේ ද මම ඔහු රියැදුරු යි කියමි යන අදහසි.

**“සහ රථෙන වර්තතෙ යොසෞ සරථඃ, අශ්වඃ, තං ප්‍රෙරයතීති = සාරථිඃ”** යනු විවෘතියි. රිය හා බැඳුනේ යමෙක්ද හේ සරථය. අශ්වතෙමේ ය. ඒ අසු මෙහෙය වනුයේ **සාරථි** නමි. එය මෙසේ ද කිහ. **‘රථාදිසොධකානිමයොගකාර්තා = සාරථිඃ”** යි. ඔහු පිළිබඳ ලක්ෂණ කියේ මෙසේ ය.

“නිමිත්තශකුනඥො හයශික්ෂාවිශාරදඃ,
හයායුර්වේදතත්ත්වඥො භූරිභාගවිශෙෂවිත්” යි

නිමිත්තලක්ෂණ දන්නා වූ අසුන් හික්මවීමෙහි විශාරද වූ අසුන් පිළිබඳ වෙදකම්හි තතු දත් පෘථිවියෙහි ඒ ඒ කොටස්හි සමවිසමකම් දැන සිටි තැනැත්තේ සාරථිය යනු එහි අරුත් ය. මේ සාමාන්‍ය ලොකයාගේ පිළිගැණීම ය.

---

1, 17 2 ‘කොධං’ යනු බලනු.

බුදුරජාණන් වහන්සේ මෙතිලා ඒ ලොකයා පිළිගත් සාරථිහු නො ද පිළිගත්හ. තම සිත්තුළ උපන් ක්‍රොධවෙගය සන්සිඳවා තම සිත නිවන්මගට මෙහෙය වන්නහු සාරථි යි උන්වහන්සේ පිළිගත්හ.

**රස්මිග්ගාහො ඉතරො ජනො** = අන් රියැදුරු රැහැන් අතට ගත්තේ නම් වේ.

අන්‍ය වූ රජ මහඇමැති ආදීන්ගේ රියසැරි තෙමේ උසස් වූ රියැදුරු නො වේ. හෙතෙමේ මෙති කියූ රියැසැරිට වඩා ඉතා පහත් ය. එහෙයින් හේ උතුම් නො වේ ය යි අටුවායෙහි කීහ.

**ඉතර** ශබ්දය අන්‍ය යන අරුත්හි ආයේ ය. ඒ සර්වනාමයෙකි. සර්වනාම නම්: සියලු නාමයන්ට අයත් නාමයෝ ය. **"සබ්බෙසං නාමානි සබ්බනාමානි"** යනු විවෘතියි. මෙය **න්‍යාසයෙහි** ආයේ ය. මෙයත් කීයේ තුන් ලිඟුවෙහි ම වූ සියලු නාමයන්ට විශෙෂණ විසින් යෙදිය හැකි නාම සර්වනාම බව ය.

"යානි හොන්ති තිලිඞ්ගානි අනුකූලානි යානි ච,
තිලිඞ්ගානං විසෙසෙන පදනෙතානි නාමතො"

යනු එතිලා දත්තේ ය.

මෙ කී නාමයෝ සමහර යෙදුම්හි නාමයන්ට විශෙෂණව ද සමහර යෙදුම්හි එකලාව ද සිට ප්‍රයොගානුකූල ව අර්ථ ප්‍රකාශ කරන්නාහ.

"තෙසු කානිචි රූපානි සෙහඤ්ඤෙහි ච යුජ්ජරෙ,
කානි ච පන සෙහෙව එතෙසං ලක්ඛණං ඉදං"

යනු ශාබ්දික වචනයි. කච්චායන හෙදටීකායෙහි **"සබ්බසද්දවාච කත්තා ච සබ්බලිඞ්ගයුත්තත්තා ච සබ්බනාමං නාම"** මුග්ධ-බොධටීකායෙහි **"සබ්බෙසං බුද්ධිසත්ථානං නාම සර්වනාම"** යනු විසින් කියන ලද්දේ ද සිත්හි කළ යුතු ය. මෙකී ලක්‍ෂණයන්ගෙන් තොර වූයේ සර්වනාම නො වේ ය යි කීහ. මේ ඒ කීම:- **"එතස්මා ලක්ඛණා මුත්තං න පදං සබ්බනාමිකං"** යනු.

රූපසිද්ධි ශබ්දනීති දෙක්හි සර්වනාමශබ්ද සත් විසසකැ යි ද පදසාධනටීකායෙහි සූවිස්සකැ යි ද මොග්ගල්ලායනවෘත්තියෙහි තෙවිස්සකැයි ද මුග්ධබොධයෙහි පන්තිසකැයි ද බාලාවතාරයෙහි දෙවිස්සෙකැයි ද කියන ලදි. කච්චායනහෙදයෙහි එය පයොග වනත – වචන – ගුණ – පුච්ඡා – පමාණික – සබ්බසබ්බ – දිසා – අවත්ථා – සඞ්ඛ්‍යා – කාල යි කොටස් විසින් දශ කොටසක් කොට දක්වන ලද්දේය.[1]

1. 7. 10. 'යත්ථ ක රමති ජනො' යනු බලනු.

ධර්මදේශනාවගේ අවසානයෙහි දෙව් දූ තොමෝ සෝවන් පලයෙහි පිහිටියා ය. ධර්මදේශනා තොමෝ පැමිණ සිටි පිරිසට ද වැඩ සහිත වූ ය.

මෙසේ දෙව් දූ තොමෝ සෝවන්පලයට පැමිණියා ද අඬමින් එහි රැඳී සිටියා ය. එකල්හි බුදුරජාණන් වහන්සේ "දෙව්දුව! තී කුමක් නිසා හඬා ද?"යි අසා වදාළ කල්හි "ස්වාමීනි! මාගේ විමන නටුයේ ය, මට දූන් රැඳෙන්නට තැනෙක් නැත, එහෙයින් කුමක් කරම් ද"යි සිතන් කඳුලු නැගේ ය" යි ඕ තොමෝ කිවූ ය. බුදුරජාණන් වහන්සේ "කණස්සලු නො වෙව, මම තිට වසන්නට විමනක් දක්වා දෙන්නෙමි"යි දෙව්රම් වෙහෙර ගඳකිළිය අසල පළමුදා චුතව ගිය දෙව්දුවකට විමනක් ව තුබූ රුකක් පෙන්වා "අසවල් තැන කවුරුත් නැති නිදහස් වූ රුකෙක් ඇත, එහි යව"යි වදාළ සේක. ඕ එතැනට ගොස් නවාතැන් ගත්තී ය. එතැන් පටන් මැගේ මේ විමන **බුද්ධදත්තික විමානය** යි ප්‍රසිද්ධ වි ය. මහෙශාක්‍ය දෙවියෝ ද එතැන සොලවාලන්නට පොහොන් නො වූහ. බුදුරජාණන් වහන්සේ මෙය කරුණු කොට භික්ෂූන් වහන්සේට **භූතගාමශික්ෂාපදය** පැණවූ සේක.

**අන්‍යතරභික්ෂුවස්තුව නිමි.**

# උත්තරා සිරිමාවට කළ සත්කාරය

## 17 — 3

පුණ්ණ නම් දිළිඳු පුරුෂ තෙමේ රජගහනුවර සුමන සිටාණන්ට බැළමෙහෙ කොට ජීවත් වන්නේ ය. ඔහුගේ ඇඹෙනිය හා උත්තරා නම් දුවනිය හැර උන් නිසා ජීවත් වන කෙනෙක් නැත. එක් කලෙක "රජගහ නුවර කවුරුත් නැකැත් කෙළි කෙළිය යුතු ය"යි රාජනියමයෙන් අණබෙර ගැසී ය. සුමන සිටු මේ අසා උදෑසන ම එහි පැමිණි පුණ්ණ අමතා "දරුව, අපගේ කම්කරුවෝ නැකැත් කෙළි කෙළිනු කැමැත්තාහ, කිම, තෝත් නැකැත් කෙළි කෙළින්නෙහි ද? නැත, බැළමෙහෙ කරහි දැ?"යි ඇසී ය. එවිට පුණ්ණ තෙමේ "සිටුතුමනි! කෙළිනළු, මුදල් හදල් ඇති පොහොසත් මිනිසුන් විසින් කරණු ලබන්නේ ය, එසේ කෙළිනළු කරන්නට අපට පොහොසත් කමෙක් නැත, ඒ තබා මාගේ ගෙයි හෙටට කැඳැත්තක් සාදා ගන්නට පමණවත් සහලෙක් නැත, එබඳු වූ දිළිඳු තැන සිටු නා මට කිනම් කෙළිනළු ද, ගොනුන් ලැබෙතොත් සාන්නට යන්නෙමි"යි කී ය. "එසේ නම් ගොනුන් ගෙණ යව"යි අවසර දුන් කල්හි පුණ්ණ තෙමේ හයිබල ඇති ගොන්බානක් හා නගුල් විය දඬු ද ගෙණ ගෙට ගොස් ඇඹෙනිය අමතා "සොඳුර! නුවරවැස්සෝ අද දවස පුරා කෙළිනළු කරන්නාහ, අපි දුගියම්හ එහෙයින් මම අදත් බැළමෙහෙ කරන්නට යන්නෙමි, ඒ නිසා මෙයට කලින් දවස්හි ගෙණ ආ බත්මාලුවලට වඩා වැඩියෙන් බත්මාලු ටිකක් උයාපිහා ගෙණ මා සානා තැනට ගෙණ එව"යි කියා සාන්නට කුඹුරට ගියේ ය.

ශාරිපුත්‍ර මහාස්ථවිරයන් වහන්සේ නිරෙධ සමාපත්තියට සමවැද සිට සත් දවස ගෙවා එයින් නැගී සිටුනා මෙ දවස "කවරක්හට අද මා විසින් සඞ්ග්‍රහ කළ යුතු දැ"යි බලා වදාරණ සේක් පුණ්ණයා දුටු සේක. එකල්හි උන්වහන්සේ "මෙතෙමේ සැදැහැ ඇත්තේ ද, දෙන්නට කැමැත්තේ ද, දෙන්නට දෑයෙක් ඇත්තේ ද, තිබෙනා දෑයක් දීමෙන් මොහුට සැපතෙක් ලැබේ දැ"යි නුවණ මෙහෙයවා බැලූහ. දෙන දැයින් මහත් සැපතක් ලැබෙන බව දුටු උන්වහන්සේ නිරෙධ සමාපත්තියෙන් නැගී සිටි එ දවස, පාසිවුරු ගෙණ පුණ්ණ සාන තැනට වැඩ වළතෙරක නැවතී සිට වනපඳුරක් දෙස බලමින් වැඩ සිටි සේක. එසේ නිහඬව වන පඳුර දෙස බලමින් වැඩ සිටි සැරියුත් මහාතෙරුන් දුටු පුණ්ණ, සැම නවතා දමා පසඟ පිහිටුවා වැඳ දැහැටියෙන් ප්‍රයෝජන වන්නේ ය යි සිතා දැහැට්ටක් කැප කොට පිළිගැන්වී ය. එකල්හි මහාතෙරුන් වහන්සේ ඔහුට පාත්‍රය

හා පෙරහන ද දුන් සේක. පූර්ණ පැතිත් ප්‍රයෝජන යයි සලකා පැන් පෙරා පිළිගැන් වී ය. "මෙතෙමේ අනුත් වසන ගෙයක පිටිපස්සෙහි ගෙයක වසන්නේ ය, මොහුගේ ගෙදොරට ගියෙම් නම් ඔහුගේ ඇඹෙනියට මා දකින්නට නො ලැබෙන්නේ ය, එහෙයින් මැය බතුත් ගෙණ මගට බස්නාතුරු මෙහි ම රැඳී සිටිය යුතු ය"යි උන්වහන්සේ එහි රැඳී සිට ගත්හ. මෙසේ මද වේලාවක් එහි රැඳී සිට ඈය මගට බටබව දූන ඇතුළු නුවරට අභිමුඛව වැඩි සේක. එසේ වඩනා උන්වහන්සේ අතර මගදී දුටු ඕ තොමෝ "පුදන්නට දෑයක් ඇති දවසෙක මුන්වහන්සේ දකින්නට නො ලැබෙත්, පුදන්නට දෑයක් නැති දවසෙක දකින්නට ලැබෙත්, අද නම් පුදන්නට දෑයෙක් මා අත ඇත්තේ ය, හාමුදුරුවන් වහන්සේ දක්නට ලැබුනාහ. මුන්වහන්සේ මා පිළිගත්වන්නක් පිළිගෙණ මට අනුග්‍රහ කරණ සේක් දෑ"යි බත්බඳුන බිම තබා තෙරුන් පසඟ පිහිටුවා වැඳ "ස්වාමීනි! මේ බතෙහි රළු නොරළුකම් මිහිරි අමිහිරිකම් නො සලකා ඔබවහන්සේගේ දාසයාහට සඞ්ග්‍රහ කරණු මැනැවැ"යි කිවු ය. එකල්හි උන්වහන්සේ පාත්‍රය එළ වූහ. ඈය එක් අතකින් බඳුන අල්ලා ගෙණ එක් අතකින් එයින් බත් ගෙණ පාත්‍රයට බතින් අඩක් බෙදත් ම "දෑන් පමණැ"යි අතින් පාත්‍රය වැසූහ. එකල්හි ඕ තොමෝ "ස්වාමීනි! එක් ම කොටස දෙකොට සක් කරන්නට නො හැකි ය, ස්වාමීනි! ඔබවහන්සේගේ දාසයාට මෙලොවින් සඞ්ග්‍රහ කිරීමෙක් වුවමනා නැත, මෙලොවින් සඞ්ග්‍රහ නො කොට ඔහුට පරලොවින් සඞ්ග්‍රහ කරණු මැනැවැ"යි කියා ගෙණ ආ බත්මාළු සියල්ල ම ඉතිරි නො කොට දෙනු කැමැති ව සියල්ල ම් උන්වහන්සේගේ පාත්‍රයට බෙදා ඔබවහන්සේ විසින් අවබොධ කළ ධර්මයට මම ද හිමිකාරියක් වෙම්වා"යි පැතූ ය.

ශාරිපුත්‍ර මහාස්ථවිරයන් වහන්සේ බත්මාළු පිළිගෙණ "එසේ වේවා"යි වදාරා අනුමෙවෙනි කොට පැන් පහසු තැනකට වැඩ බත්කිස කළ සේක. ඕතොමෝ ද ආපසු හැරී ගොස් සහල්ටිකක් සොයා ගෙණ බත් පිසූ ය. පූර්ණ ද අටකිරියක් පමණ තැන සාපියා බඩගිනි දරා ගන්නට නො හැකි ව ගොන් ලිහා හැර එක් රුක්සෙවනකට වී මග බලමින් හුන්නේ ය. ඒ අතර බිරිය බත් ගෙණ යන්නී එසේ හුන් සිය හිමියා දැක "මෙතෙමේ බඩසයින් පෙළුනේ මා එනු බලමින් හුන්නේ වගතුග නො දැන මට 'බොල කෙල්ල! බොහෝ කල් ඉක්ම වී ය'යි තර්ජනය කොට කැවිටිදඬුයෙන් පහර දෙන්නේ නම් මා කළ කම්හි ප්‍රයෝජනයෙක් නො වන්නේ ය, එහෙයින් පළමු කොට මා කළ ක්‍රියාව දන්වන්නෙමි"යි සිතා "මා හිමියෙනි! අද මේ දවසෙහි සිත පහදා ගණු මැනැව, මා කළ ක්‍රියාව නිරර්ථක නො කරණු මැනැව,

මම අද උදෑසනින් ම බත්මාළු පිස ගෙණ එන්නී අතර මගදී දම්සෙනෙවි සැරියුත් මහාතෙරුන් දැක ඔබවහන්සේට ගෙණ ආ ඒ බත්මාළු සියල්ල උන්වහන්සේට පිළිගන්වා නැවත ගෙට ගොස් මේ බත උයා පිළියෙල කොට ගෙණ ආමි, එහෙයින් සිත පහදා ගණු මැනැවැ''යි කිවු ය. පුණ්ණ ''සොඳුර! කියන්නී කිමැ''යි අසා, ඇය නැවතත් එය කියා සිටි කල්හි ''සොඳුර! නී කළ සැටි ඉතා කදිම ය, මාගේ බත දම්සෙනෙවි සැරියුත් මහා-තෙරුන්ට පිදීමෙන් නී කළ පින්කම ඉතා අගනේ ය, අද උදෑසන මා විසින් ද උන්වහන්සේට දැහැටිදඬුත් මුවදෝනාදියත් දෙන ලද්දේ ය''යි පහන් සිත් ඇති ව ඇයගේ බස් සතුටින් පිළිගෙණ කල් ගෙවා ලත් බත් බිදීමෙන් හට ගත් වෙහෙස ඇත්තේ ඇයගේ ඔඩොක්කුවෙහි හිස තබා නිදන්නට වන්නේ ය.

පසුදා උදෑසන සෑතැන කුඩු වූ පස පටන් සියලු තැන රන් වන් ව කිණිහිරිමල් රැසක් සේ බබළමින් තුබුනේ ය. නින්දෙන් නැගී සිටි පුණ්ණ සෑ තැන බලා ''සොඳුර! අද උදෑසන පටන් මා සෑ තැන රන්වන් ව පෙණෙයි, කිම, ඉතා දවල් වී බත් කෑ බැවින් මාගේ ඇස බමා දැ''යි කී ය. එවිට බිරිය ද ''හිමියෙනි! එතැන මට පෙණෙන්නේ ද එසේ ය''යි කිවු ය. අනතුරුව පුණ්ණ තෙමේ සෑ තැනට ගොස් එක් පස්පිඩක් ගෙණ නගුලිසෙහි ගසා රන්බව දැන ''අය්යෝ පුදුමයි, ආයුෂ්මත් වූ ධර්මසෙනාපති ශාරීපුත්‍ර මහාසථවිරයන් වහන්සේට දුන් දනෙහි විපාකය අද ම දක්නා ලද්දේ ය, මෙතෙක් මහත් ධනයක් පරිහරණය කරන්නට අප දෙදෙනාට නො හැකි ය, එහෙයින් රජුට දන්වමු''යි බිරිය හා කතා කොට රජගෙට ගොස් ''මා සෑ තැන රනින් බර ව සිටියේ ය, ඒ සියලු රන් ගෙන්වා ගණු මැනැවැ''යි රජුට දැන් වී ය. රජතෙමේ ''තෝ කවරහි''යි ඇසූ කල්හි ''මම පුණ්ණ නමැ''යි කී ය. ''අද තාවිසින් කළේ කුමක් දැ?''යි ඇසූ විට ''අද උදෑසන මා විසින් දම්සෙනෙවි මහාතෙරුන්හට දැහැටි දඬුත් මුවදෝනට දියත් දෙනලදී, මා බිරිය මට ගෙණ ආ බත්මාළු ටික අතර මගදී උන්වහන්සේට පුදන ලදැ''යි කී ය. රජතෙමේ ඒ අසා සතුටු ව ''පින්වත! දම්සෙනෙවි සැරියුත් මහාතෙරුන්ට තා විසින් දුන් දන්හි විපාකය අද ම දක්වන ලදැ''යි කියා ''පුණ්ණ මෙහිලා කුමක් කළ යුතු දැ?''යි ඇසී ය. ''දෙවයන් වහන්ස! ගැල් දහසක් එහි යවා ඒ සියලු රන් මෙහි ගෙන්වාලනු මැනැවැ''යි කී ය. රජතෙමේ ගැල් යැවී ය. රාජපුරුෂයන් ඒ රන් රජු අයත්ය යි කියා ගන්නා කල්හි ගත් ගත් රන් මැටි ම වන්නේ ය. එවිට රාජපුරුෂයන් ගොස් එය රජුට දැන්වූ කල්හි රජතෙමේ

‘‘තොප කුමක් කියමින් ඒ රත් ගත් දැ?’’යි ඇසී ය. ‘‘දේවයන් වහන්ස! මේ රන් රජු අයත් ය යි කියමින් ගත්තෙමු’’යි කී කල්හි ‘‘එසේ නො කියා, මේ රන් පුණ්ණයා අයත් ය යි කියමින් ගණිවු’’යි නියම කොට නැවැත ඔවුන් එහි යැවී ය. ඔවුහු ගොස් එසේ කියමින් ගත්හ. ගත් ගත් හැම, රන් ම වී ය. මෙසේ ඒ සියලු රන් ගෙණවුත් ඔවුහු රජමාලිගා මිදුලෙහි ගොඩ ගැසූහ ඒ රන්ගොඩ උසින් අසූරියනක් වී ය. එකල්හි රජතෙමේ නුවරුන් ගෙන්වා ‘‘මේනුවර අන් කාහට මෙතෙක් රන් තිබේ දැ?’’යි ඇසී ය. ‘‘දෙවයන් වහන්ස! අන් කාහටත් මෙපමණ රන් රැසෙක් නැතැ’’යි කී විට ‘‘ඔහුට අප විසින් කුමක් දිය යුතු දැ?’’යි ඇසී ය. ‘‘දෙවයන් වහන්ස! ඔහුට දිය යුත්තේ සිටුසේසතැ’’යි කීහ. රජ තෙමේ පුණ්ණ ‘‘මහදනසිටැ’’යි නම් කොට බොහෝ සම්පත් දී සිටුසේසත ද ඔහුට දුන්නේ ය. ඉක්බිති පුණ්ණ තෙමේ ‘‘දෙවයන් වහන්ස! අපි මෙතෙක් කල් අන්සතු ගෙයක විසූම්හ, අපට වසන්නට තැනක් දුන මැනැවැ’’යි ඉල්ලී ය. ‘‘එසේ නම් අර පෙණෙන වල්ලැහැබ වල් කප්පා හැර පිරිසිදු කොට ගෙයක් කර ගණුව’’යි පෙර සිටුවරයකු විසූ තැනක් පෙන්වී ය. ඔහු එතැන පිරිසිදු කරවා කිහිප දවසකින් ම ගෙයක් කරවා බුදුරජුන් ප්‍රධාන භික්‍ෂුසඞ්ඝයා එහි වැඩමවා සත් දවසක් මහාදන් දී එක් ම දවසෙහි ගෙවැදීමේ මඞ්ගලයත් සේසත් නැගීමේ මඞ්ගලයත් සිදු කෙළේ ය. එහි දී බුදුරජානන් වහන්සේ අනුමෙවෙති බණ වදාරණ සේක් අනුපිළිවෙළ කතාව වදාළ සේක. ඒ අවසන්හි පුණ්ණසිටු හා සිටු බිරිය ද ඔවුන්ගේ උත්තරා නම් දුවනිය ද යන තිදෙන සෝවන් පලයට පැමිණියහ. මෙසේ සිටුනා කල්හි රජගහනුවර සිටු තෙමේ තම පුතුට පුණ්ණසිටුහුගේ දූ වූ උත්තරාව ආවාහ කර දෙන්නට සිතා කරුණු විචාළේ ය. පුණ්ණසිටු තෙමේ රජගහනුවර සිටුගේ ඒ ඉල්ලීම ප්‍රතික්‍ෂෙප කෙළේ ය. එවිට රජගහනුවර සිටු ‘‘එසේ නො කර ව, මෙතෙක් කල් අප ඇසුරු කොට වසන්නා වූ ඔබ විසින් මේ මහත් සැපත ලද්දී ය, ඒ නිසා ඔබගේ දූව මා පුතුට සරණ කොට දෙව’’යි නැවැත් ද දන්වා යැවී ය. පුණ්ණසිටු එ වර ‘‘ඔබගේ පුත් මිසදිටු ගත්තේ ය, මාගේ දුවනිය බුදුරුවන් ඈ තුනුරුවන් හැර ජීවත් වන්නට අපොහොසත් ය, එ බැවින් මාගේ දුවනිය ඔබගේ පුතුට සරණ කොට දෙන්නට නො හැකි ය’’යි දන්වා යැවී ය. එකල්හි බොහෝ සෙට්ඨිගණකාදී වූ කුලපුත්‍රයෝ පුණ්ණසිටු වෙතට ගොස් නොයෙක් ලෙසින් කරුණු කියා පැරැත්ත කොට රජගහ සිටු සමග ඇති විශ්වාසය නො බිඳ ඔහු පුතුට දුවනිය සරණ කොට දෙන්නැ’’යි ඉල්ලා සිටියහ.

එකල්හි පූර්ණසිටු බොහෝ දුරට සිතා බලා ඔහු හා පටහැනිවීම නො සුදුසු ය'යි සෙට්ඨිගණකාදීන්ගේ ඉල්ලීම පිළිගෙණ ඇසළ-පුණුපොහෝ දවසෙහි සිය දුවනිය රජගහ සිටුපුත්හට පාවා දුන්නේ ය.

මෙසේ සරණ ගියදා සිට ඇයට මහණකු වෙත මෙහෙණක වෙත යන්නට, දනක් දෙන්නට, බණක් අසන්නට ඉඩෙක් නො ලැබුනේ ය. මෙසේ දෙ මස් දෙපෝයක් පමණ ඉක්ම ගිය කල්හි අසල සිටි සෙවක-සෙවිකාවන් අතින් "ඇතුල් වස ගෙවී යෑමට තව කොපමණ දවස් තිබේ ද"යි ඇසූය. "ආයඹීාවෙනි! එයට තව ඇත්තේ අඩමසෙකැ"යි ඔවුන් කී කල්හි ඕතොමෝ සියපියානන්හට මෙසේ ලියා යැවූ ය.

රජගහනුවර සිටුගෙදරදීය.

දෙපා වැඳ ඉතා යටහත්ව ලියමි.

පියානන් වහන්ස!

කුමක් නිසා මා මෙබඳු සිරගෙයක සිර කොට තුබූවහු ද? මාගේ සිරුරෙහි ලකුණු තබා අත්හට දාසියක කොට ගන්නට ඉඩ හැර ගන්නෙක් ගණිවා යි පළට කළෝ නම් මෙයට වඩා මට මහත් සැපතක් වන්නට තුබුනේ ය. මෙබඳු මිසදිටු ගත් ගෙදරකට මා සරණ කොට දීම නො වටනේ ය. මෙහි ආදා පටන් හාමුදුරු නමක් දකින්නට නො ලැබුනේ ය. මෙහෙණක නො දුටු වෙමි. දන් ටිකක් දෙන්නට, බණපදයක් අසන්නට පන්සලකට පය තබන්නට ඉඩ නො ලැබින. එහෙයින් මේ සිර ගෙයින් මා මුදාගණු මැනැව.

මෙයට, යටත්, කීකරු, දයාබර

උත්තරා.

උත්තරා යැවූ මේ ලියුම බැලූ පූර්ණ සිටු "මාගේ දුවනිය දුකට වැටුනීය"යි කම්පිත ව තමාගේ ශොකය ද දන්වා කහවණු පසළොස් දහසක් යවමින් "මෙනුවර සිරිමා නම් වෙසඟනක් වෙසෙයි, ඈ ගෙන්වා සිටුපුත්හට පාදපරිචාරිකා කොට ගන්නැ යි දක්වා දෙන්න, සිරිමාව ඒ පිණිස දවසකට දහසක් ගන්නීය, මේ මුදල ඒ පිණිස යොදා දුව පින්දහම් කරන්නැ"යි දන්වා යැවූයේ ය. උත්තරා ද පියා දන්වා එවා ඇති පරිදි සිරිමාව ගෙන්වා "යෙහෙළි! මේ කහවණු පසළොස් දහස ගෙණ මේ අඩ මස අපගේ සිටුපුත්හට පාදපරිචාරිකා වන්නැ"යි කීවු ය. ඕ තොමෝ, සිරිමාවත් රැගෙණ සිටුපුත් වෙතට ගියාය. එවිට ඔහු

සිරිමාව දැක ''මෝ කවරු''යි ඇසී ය. ''හිමියෙනි! මේ අඩමස මාගේ මේ යෙහෙළිය ඔබට මෙහෙ කරණු ඇත, එහෙයින් මැය මෙහි රඳවා ගෙණ මෙහෙ කරවා ගන්න, මට මේ අඩමස දනක් පිණක් කර ගන්නට ඉඩ පහසු ඕනෑ ය''යි උත්තරා තොමෝ කියා සිටියා ය. සිටුපුත් රූසපුයෙන් පිරිපුන් සිත්කලු ඒ ගැගැණිය දැක උපන් සෙනහ ඇතියේ ''හා! හොඳයි, උත්තරා දන්පින් කර ගන්නැ''යි සිරිමාව රඳවා ගත්තේ ය.

උත්තරා ද බුද්ධප්‍රමුඛභික්‍ෂුසඞ්ඝයා පවරා ''ස්වාමීනි! මේ අඩමස අන් තැනක ඇරයුම් නො ඉවසා මෙහි ම මාගේ භික්‍ෂාව පිළිගණු මැනවැ''යි ඇයද බුදුරජානන් වහන්සේ එහිලා ගිවිස්වා ගෙණ ''මෙතැන් සිට මහාපවාරණය තෙක් මට බුදුරජුන්ට උපස්ථාන කරන්නට බණ අසන්නට ලැබෙන්නේ ය''යි තුටුසිත් ඇතිව ''මෙසේ කැඳ පිසවු, බත් පිසවු, එළවලු පිළියෙල කරවු, කැවුම් පිසවු''යි මුළුතැන් ගෙයි කටයුතු සංවිධාන කරමින් මුළුතැන් ගෙය සිසාරා හැසිරෙන්නී ය. දවසක් ඇයගේ හිමි වූ සිටුපුත් ''හෙට පවාරණය වන්නේ ය''යි මුළුතැන්ගේ දිසාවට මූණ දී වාකවුළුව ලඟ සිට ''මේ මෝඩ ගැහැණී කුමක් කරන්නී දැ''යි බලනුයේ ඩහදියෙන් තෙත් වූ හලුයෙන් ගැවසුනු සිරුරු ඇති ව අඟුරුදූලියෙන් වැකුණු පිළී හැඳ විරූප ව එසේ පිසමන් නියම කොට හැසිරෙන්නිය දැක ''අනේ; මේ මෝඩ ගැහැණී පින් මඳ බැවින් මෙවැනි තැනක ඇති යසිසුරු සැපසම්පත් විඳ දරා ගත නො හැකි ව මුඩුමහණුන්ට කන්නට බොන්නට දීමත් මහා–කාරියකැ යි සිතා තුටුසිත් ඇති ව සැලිසැලී ඇවිදිනීය''යි සිනහ සී එතැනින් ඉවත් ව ගියේය. ඔහු එතැනින් බැහැර ගිය කල්හි ඒ අසල සිටි සිරිමා ''කුමක් නිසා කුමක් දැක මෙතෙමේ සිනා සේ දැ''යි ඒ වාකවුළුයෙන් ම බලන්නී මුළුතැන්ගෙයි සිටි උත්තරාව දැක, සිනාසුනේ මෑ දැකලා ය, ඒකාන්තයෙන් මෑ හා මොහුගේ කාමසන්‍ථවයක් විය යුතු ම ය''යි සිතූ ය.

සිරිමා තොමෝ ඒ ගෙට අඩමසකට පැමිණි බැහැරි ඉත්රියක් ව ඒ ගෙයි ඇති හැම සැපසම්පත් අනුභව කරන්නී ද තමා බැහැරින් ආ ගැහැණියක බව නො සලකා ''මම මේ ගෙයි ස්වාමි ය''යි සිතා ගෙණ උත්තරාව කෙරෙහි ක්‍රොධ කළා ය. මෙසේ නිකරුණේ උත්තරාව කෙරෙහි උපදවා ගත් ක්‍රොධ ඇති සිරිමා ''උත්තරාවට හොඳ කාරියක් කරන්නෙමි''යි සිතා පහයෙන් බැස මුළුතැන් ගෙට ඇතුල්ව කැවුම් පිසන ඇතිළියක කැකෑ–රෙමින් තුබූ ගිතෙල් සැන්දකට ගෙණ උත්තරාවන් සිටි තැනට ගියා ය. උත්තරා ද එන්නා වූ ඇය දැක ''මාගේ යෙහෙළිය මට

මහත් උපකාරයෙක් කරණ ලද ය, එය අතින් පයින් ගත හැකි දූයෙක් වී නම් බහා තබන්නට සරසින් සක්වලගබ ප්‍රමාණවත් නො වන්නේ ය, උසින් බඹලොව දක්වා මේ අතර ඉතා මිටි ය, මාගේ යෙහෙළියගේ ගුණය ම මහත් ය, මම මෑ නිසා දන් දෙන්නට බණ අසන්නට ඉඩ ලබා ගතිමි, ඉදින් මෑ කෙරෙහි මාගේ සිත්හි ක්‍රොධයෙක් වේ නම්, මේ කැකෑරෙණ ගිතෙල් මා දවාවා, ඉදින් ක්‍රොධයෙක් නො වේ නම්, මා නො දවාවා''යි සිරිමාවන් කෙරෙහි මෙත් පැතිර වූ ය. සිරිමා තොමෝ උත්තරාවන්ගේ හිසෙහි ඒ කකාළ තෙල් වක්කළා ය එහෙත් ඒ තෙල සිහිල් දියක් මෙන් වී ය. හිස වක් කළ තෙල සිහිල් විනැයි දැන 'නැවැත ගොස් සැන්ද පුරවා කකාළ තෙල් ගෙණ එන සිරිමාව දුටු උත්තරාවගේ මෙහෙකරු දැස්සෝ ''නො හික්මුණු ජඩ කෙල්ල! අහක පල, තී අපගේ උත්තමාවගේ හිස කකාළ තෙල් වක් කරණු තබා ලඟට එන්නට වත් තරම් දැ''යි අසා අතින් පයින් දඹු මුගුරෙන් තළා පෙළා ඇණ බැණ ඇද බිම හෙළූහ. උත්තරා තොමෝ එය වළකන්නට අසමත් වූ ය. එහෙත් උත්තරා තොමෝ දැස්සන් ලඟට විත් දැස්සන් ඈත් කොට ''ඇයි; සිරිමාවෙනි! මෙබඳු බර සැහැසිකමක් කෙළෙහි? වේසාකම් කරමින් අතැන මෙතැන ඇවිදුනා තිට පසළොස් දවසකට වුවත් මෙබඳු මහත් සැපතක් ලබා දුන් මට මෙබන්දක් කෙළෙහි''යි සිරිමාවට අවවාද කොට උණුදිය ගෙන්වා එයින් නාවා සිය වරක් පිසූ බෙහෙත් තෙල් ගා ඇඟ මැඩූ ය. ඉක්බිති සිරිමා තොමෝ තමා බැහැරි ගැහැණියක බව සලකා ''මැයගේ හිමියා සිනාසෙනු දැකීමෙන් මැයගේ හිස මත කකාළ තෙල් වක් කිරීමෙන් මා කළ ක්‍රියාව ඉතා බැරෑරුම් ය, හිසමත තෙල් වක් කළ මා අල්ලා ගන්නට ද සිය දැස්සන්ට මෝ කිසිත් නියමයක් නො කළා ය, දැස්සන් මා තළා පෙළද්දීත් එවුන් වළකා මට කළයුතු සියලු සාත්තු සප්පායම් කළා ය, ඉදින් මා කළ වරදට මැයගෙන් මම ක්‍ෂමාව නො ගත්තෙම් නම්, මෑ ක්‍ෂමා නො කැරවීම් නම් මාගේ හිස සත් කඩකට පැළී යන්නේ ය''යි ඇයගේ පා මුල වැද හෙව ''ආය්‍ය්‍යාවෙනි! මට කමන්නැ''යි කියා සිටියා ය.

එකල්හි උත්තරා තොමෝ ''මම තී සේ නො වෙමි, පියෙක් සිටියි, මම පියකු ඇති දුවක් මි, එහෙයින් පළමු කොට මාගේ පියානන් කමා කරන්නැ''යි කිවූ ය. ''ඓවා; හොඳයි, මම තීගේ පිය වූ පූර්‍ණ සිටු කමා කරන්නෙමි''යි කී කල්හි ''පූර්‍ණ සිටු තෙමේ මට සසර ඉපැදුම් දුන් මාගේ පියා ය, ඔහු කමා කැරවීමෙන් එතරම් වැඩෙක් නැත, එහෙත් එ ද මනා ය. කමා කරවිය යුත්තෝ නිවනෙහි ඉපැදුම් දුන් පියානෝ ය, ඒ මපියානන් කමා කරවා

නම් කමා කරමි''යි උත්තරා තොමෝ කිවු ය. ''තිට නිවනෙහි උපත දුන් ඒ පියානෝ කවුරු දැ''යි ඇසූ විට තිලෝගුරු සම්මා සම්බුදු රජානන් වහන්සේ ය''යි කියූ. ''ඔහු හා මාගේ විශ්වාසයෙක් නැතැ''යි කී විට ''හොඳයි! මම තී හඳුන්වා දෙන්නෙමි, හෙට උන්වහන්සේ භික්ෂු ගණයා හා ගෙණ මෙහි වඩිනා සේක, එහෙයින් තී හැකි පමණින් යම් කිසි පිදිවිල්ලක් පිළියෙළ කොට ගෙණ මෙහි අවුත් උන්වහන්සේ කමා කරගන්නැ''යි දූන් වූ ය. සිරිමා ද ''මැනැවි ආර්‍යාවෙනි!''යි කියා එතැනින් නැගිට ගෙට ගොස් පන්සියයක් පමණ වූ තම මෙහෙකාර ගෑණුන්ට දන්වා නන්වැදෑරුම් කෑම් බීම් පිළියෙල කොට ගෙණ පසුදා ඒ සියල්ලත් රැගෙණ උත්තරාවගේ ගෙට ගොස් ඒ ගෙණ ගිය දෑය බුදුන් ප්‍රධාන භික්ෂූන් වහන්සේට බෙදා දෙනු නො හැකි ව පසෙකට වී නිහඬව සිටියා ය. උත්තරා තොමෝ ඒ සියල්ල තමිතට ගෙණ බුදු පාමොක් මහ සඟනට වැළඳ වූ ය. සිරිමා, බුදු පාමොක් මහසඟන වළඳා අවසන් කළ කල්හි පිරිවර සමග බුදුරජානන් වහන්සේගේ පා මුල්හි වැඳ වැටුනී ය. එකල්හි බුදුරජානන් වහන්සේ තී කළ අපරාධය කිමැ?''යි පිළිවිසි සේක. ''ස්වාමීනි, මම ඊයේ මාගේ මේ යෙහෙළියගේ හිස මත කකාළ තෙල් හැන්දක් වක් කෙළෙමි, ඒ වේලෙහි මේ ආර්‍යාවන්ගේ දාස්සෝ මා අල්ලා මට අතින් පයින් පහර දුන්හ. ඒ දුටු මෝ තොමෝ වහා පැමිණ ඔවුන් බැහැර කොට මට සාත්තු සප්පායම් කළා ය, ඒ මම මැයගේ ගුණයෙහි ම පැහැද මෑ කමා කරමි, එහෙත් ඔබ වහන්සේ කමා කරවා ගණිති නම්, කමා කරමි යි කියා''යි කිවූ ය. ''උත්තරා! මෑ කියනු හැබෑ දැ?''යි අසා වදාළ සේක. ''මපියානන් වහන්ස! එසේ ය, මාගේ මේ යෙහෙළිය මාගේ හිසෙහි කකාළ තෙල් හැන්දක් වක් කළා''යි කී විට බුදුරජානන් වහන්සේ ''උත්තරා! ඒ තෙල් වක් කළ වේලෙහි තී කුමක් සිතූ දැ?''යි ඇසූහ. ''ස්වාමීනි! මාගේ මේ යෙහෙළියගේ ගුණය ම මහත් ය, සක්වළ ගබ ඉඩ කඩ රහිත ය, බඹලොව මිටි ය, මෑ නිසා මට පසළොස් දවසක් දන් දෙන්නට බණ අසන්නට ඉඩ පහසු ලැබුනේ ය, ඉදින් මේ නිසා මැය කෙරෙහි මා සිත්තුළ ක්‍රොධයෙක් උපන්නේ නම්, මේ ගිනි තෙල මා දවාවා, ක්‍රොධයෙක් නො ද උපන්නේ නම්, මා නො ද දවාවා, යි මැය කෙරෙහි මෙත් සිත පැතිර වීමි''යි කී විට ''මැනැවි, මැනැවි, උත්තරා! ක්‍රොධය පැරද විය යුත්තේ මෙසේ ය, ක්‍රොධය මෛත්‍රියෙන් දිනිය යුතු ය, ඇණුම් බැණුම් ගැරහුම් කරන්නේ ඇණුම් බැණුම් ගැරහුම් නො කරන්නහු විසින් දිනිය යුතු ය, තද මසුරු බැව් ඇත්තේ තමන් සතු දෑය දීමෙන් බොරු කියන්නේ සත්‍ය වචනයෙන් දිනිය යුතු ය''යි වදාරා මේ ධර්ම දෙශනාව කළ සේක.

**අක්කොධෙන ජිනෙ කොධං අසාධුං සාධුනා ජිනෙ,**
**ජිනෙ කදරියං දානෙන සච්චෙන අලිකවාදිනන්ති.**

ක්‍රොධ කරන්නහු ක්‍රොධ නො කිරීමෙන් දිනන්නේ ය. ගුණ නැත්තහු ගුණයෙන් දිනන්නේ ය. තද මසුරහු දීමෙන් දිනන්නේ ය. බොරු කියන සුල්ලහු සත්‍ය වචනයෙන් දිනන්නේ ය.

**අක්කොධෙන ජිනෙ කොධං** = ක්‍රොධ නො කිරීමෙන් ක්‍රොධ කරන්නහු දිනන්නේ ය.

**අක්කොධ** නම්: ක්‍රොධ නො කිරීම ය. තමන් කෙරෙහි නගනා ඇණුම් බැණුම් ගැරහුම්වලට තමන්ට කරණ වැරදි වලට තමන්ට කරණ නපුරු කම්වලට නො කිපීම ය. එසේ කරන්නවුන් කෙරෙහි නො සැඞ වීම ය. මෙත් වැඞීම ය.[1]

**අසාධුං සාධුනා ජිනෙ** මනාගුණ නැතියහු මනාගුණයෙන් දිනන්නේ ය.

**අසාධු** නම්: අන්හට ඇණුම් බැණුම් ගැරහුම් ඈ කරණ නපුරු ගති ඇත්තේ ය. බුද්ධා දී වූ සත් පුරුෂයන්ගේ සිත් ගත් ගුණ නැත්තේ ය.

**සාධුනා** = බුද්ධාදී වූ උතුමන්ගේ සිත් ගත් ගුණයෙන් යන අරුත්.

**ජිනෙ කදරියං දානෙන**=තදමසුරු ඇත්තහු දීමෙන් දිනන්නේ ය.[2]

**සච්චෙන අලික වාදිනං** = බොරු කියන සුල්ලහු සත්‍ය වචනයෙන් දිනතේය.[3]

ධම්දෙශනාවගේ අවසානයෙහි සිරිමා ගැණුන් පන්සිය දෙනාත් සමග සෝවන් පලයෙහි පිහිටා ගතු.

## උත්තරා උපාසිකා වස්තුව

---

| | | | | |
|---|---|---|---|---|
| 1. | 1. 3. | 'වෙරං තෙසං සම්මති' | යනු බලනු. | |
| ,, | ,, 4. | 'අවෙරෙන ච සම්මන්ති' | ,, | ,, |
| 2. | 13. 10. | 'න වෙකදරියං, දෙව ලොකං වජන්ති | ,, | ,, |
| 3. | 1. 10. | 'අපෙතො දමසච්චෙන' | ,, | ,, |

# ගැහැණියකට දෙව්ලොව උපතට කරුණු වූ පින්කම.

## 17 — 4

**එක්** කලෙක **මහාමෞද්ගල්‍යායන** මහාස්ථවිරයන් වහන්සේ චාරිකා පිණිස දෙව්ලොවට වැඩ එක් මහෙශාක්‍ය දෙව්දුවකගේ විමන් දෙර වැඩ සිටි සේක. ඒ දෙව්දුව ඒ වේලෙහි උන්වහන්සේ වෙත පැමිණියා වැඳ එකත් පසෙක්හි සිටියා ය. එ කල්හි මහා මෞද්ගල්‍යායන මහාස්ථවිරයන් වහන්සේ ඇය අමතා, "එම්බා දෙව්දු! තීගේ සමපත් මහත් ය, කිනම් කුශල කර්මයක් කොට මේ මහත් සැපත ලද දැ?"යි අසා වදාළ සේක. ඕ තොමෝ මේ මහත් සැපත ලැබීමට තමන් කළ කුසලය ඉතා සුලු බැවින් එය කීමෙහි ලජ්ජිත වූවා "සවාමීනි! මෙහිලා මා නො විචාරණු මැනැවැ"යි කිවු ය. "කළ කුසලය කියන්නැ"යි නැවැතත් වදාළ විට "සවාමීනි! මෙය ලැබීමට මා කළ ලොකු කුසලයෙක් නැත, දනක් පිණක් නො කෙළෙමි, බණ දහමක් නො ඇසීමි, පූජාවක් නො ද කෙළෙමි, කෙළෙම් බොරු නො කීම ය, එක ද බොරුවකුත් මොන කරුණක් නිසා වත් නො කීමි, මේ මහත් සැපත ලැබීමට කරුණු වූයේ සත්‍ය වචන මාත්‍රය"යි කියා සිටියා ය.

ඉක්බිති මහා මෞද්ගල්‍යායන මහා ස්ථවිරයන් වහන්සේ එපමණකින් නො නැවතී තව තවත් දෙව් විමන් කරා වැඩි සේක් උන්වහන්සේ දැක ඉදිරියට පැමිණි අන් දෙව්දූන් අතින්ද උනුන් කළ පින්කම් ඇසූහ. ඒ දෙවඟනෝ ද කළ කම් සඟවාලන්නට නො හැකි ව තම තමන් කළ කම් මෙසේ පැවැසූහ. එක් දෙව් දුවක් "සවාමීනි! කියන්නට තරම් පින්කමක් මම නො කෙළෙමි, දනක් නො දුනිමි, සවාමීනි! කසුප් බුදුරජානන් වහන්සේගේ කාලයෙහි මම අන්හු අයත් දාසියක් වීමි, මාගේ සවාමි තෙමේ චණ්ඩ ය, පරුෂ ය, මා දුටු විට මූණ රළු වෙයි, අතට ගත්තේ යමක් ද එයින් පහර දෙන්නේ ය, කැටින් මුගුරෙන් ගසා ඔලුව් පළන්නේ ය, මේ නිසා කොපය උපන්නේ ද, මම 'මෙතෙමේ තීගේ සවාමියා ය, තිට අධිපති ය, තී ඔහුට යටත් ය, මා මරාවා, නාස් ඈ කපා හරීවා, තළාවා, පෙළාවා, ඔහු කෙරෙහි නො කිපෙව්'යි තමාට ම අවමන් කොට ගෙණ කිසිදැකත් කොප නො කෙළෙමි, ඒ පිණෙන් ඒ මෛත්‍රියෙන් මා විසින් මේ සැපත ලදැ" යි කිවු ය. අන් දෙව්දුවක් "සවාමීනි! මම උක්කෙතක් රකින්නී එක් මහණක්හට උක්දඬුකඩක් දුනිමි"යි ද, අන් දෙව්

දුවක් මම තිඹිරි ගෙඩියක් දුනිමි'' යි ද, අන් දෙව්දුවක් ''මම කැකිරි ගෙඩියක් දුනිමි'' යි ද අන් දෙව් දුවක් ''මම බොරළු දමනු ගෙඩියක් දුනිමි'' යි ද අන් දෙව් දුවක් ''මම මුල පලා මිටක් දුනිමි''යි ද, අන් දෙව්දුවක් කොසඹ කොළ මිටක් දුනිමි'' යි ද මෙසේ තම තමන් දුන් දන් දන්වා ''මේ මේ කාරණයෙන් අප විසින් මේ සැපත් ලද්දු''යි ඒ හැම දෙන කියා ලූහ.

මහාමෞද්ගල්‍යායන මහාස්ථවිරයන් වහන්සේ පෙරළා මිනිස් ලොවට වැඩ බුදුරජානන් වහන්සේ වෙත එළැඹියහ. එළැඹ ''ස්වාමීනි! ඇත්ත කීම් පමණකින්, තරහ සන්සිඳවා ගැණිම් පමණකින්, ඉතා සුලු තිඹිරිගෙඩි ඇ දීම් පමණකින් දෙව් සැපත් ලැබිය හැකි ද?''යි ඇසූහ. ''මුගලන! ඇයි; මාගෙන් මෙසේ අසනු; තමුසේට මේ සියලු තොරතුරු ඒ ඒ දෙව්දූන් විසින් කියන ලද්දේ නො වේ ද?''යි අසා වදාළ කල්හි මෞද්ගල්‍යායන මහා ස්ථවිරයන් වහන්සේ ''ස්වාමීනි! එසේ ය, සුලු පින් කම්නුත් දෙව්සැපැත් ලැබිය හැකි බව සිතමි'' යි කීහ. ඉක්බිති බුදුරජානන් වහන්සේ ''මුගලන! ඇත්ත පමණකුත් කියා කිපීම් පමණකුත් හැර පියා ඉතා සුලු දනක් පමණකුත් දීලා දෙව්ලොව උපදිති'' යි වදාරා මේ ධම්දෙශනාව කළ සේක.

**සච්චං භණෙ න කුජ්ඣෙය්‍ය දජ්ජාප්පස්මිම්පි යාචිතො,**
**එතෙහි තීහි ඨානෙහි ගච්ඡෙ දෙවාන සන්තිකෙති.**

සත්‍ය වචනයක් (ම) කියන්නේ ය. (පරහට) නො කිපෙන්නේ ය. ඉල්ලන ලදුයේ (දිය යුතු දෑය) ටික වතුදු දෙන්නේ ය. මේ කරුණු තුනෙන් දෙවියන්ගේ සමීපයට යන්නේ ය.

**සච්චං භණෙ** = ඇත්ත කියන්නේ ය.

ඇත්ත ම කිය යුතුය, යනු අරුත් – මෙහි **සච්චං** යන්නෙන් වාක් සත්‍යය ම ගැණේ. නිබොරු බස වාක් සත්‍ය නම්. බොරු කියන්නහුට මෙලොව නො කට හැකි පාපයෙක් නැත්තේ ය. නපුරෙක් නැත්තේ ය.[1]

**න කුජ්ඣෙය්‍ය** = නො කිපෙන්නේ ය.

නො කිපිය යුතු ය. කිසිම සත්ත්වයකු කෙරෙහි කිසිම සංස්කාරයක් කෙරෙහි සත්ත්වසංස්කාරයන් ලක් කොට නො ද කිපිය යුතු ය.[2]

1. 1. 7. 'අපෙතො දමසච්චෙන' යනු බලනු.
2. 17. 1. 'කොධං ජහෙ' ,, ,,

**දජ්ජං අප්පස්මිං යාචිතො** = ඉල්ලන ලද්දේ ටික දෑයක් ඇති කල්හිදු දෙන්නේ ය. දිය යුතු ය.

සිල්වතුන් විසින් ඉල්ලන ලදුයේ දිය යුතු වූ යමක් තමන් වෙත තිබේ නම්, ඒ ටික දෑය වුව ද දිය යුතු ය. මෙහි යාචක – යාචිත යි දෙදෙනෙකි. **යාචක** නම්, ඉල්ලන්නේ ය. චුතිග්‍රාහකය දිය යුත්තේ ය. **යාචිත** නම්, යාචකයන් විසින් ඉල්ලන ලදුයේ ය. හේ දායක ය. දෙන්නේ ය. සිල්වතුන් ගෙදොර සිඟා සිටි කල්හි සිල්වත්හු මට දෙව යි නො ඉල්ලන්නාහු ද ගෙදොරට පැමිණ සිටින්නාහු යාචක නම් වෙත්. **"යාචිතොති යාචනකා නාම සීලවන්තො පබ්බජිතා, තෙ හි කිඤ්චාපි දෙථාති අයාචිත්වා ඝරද්වාරෙ තිට්ඨන්ති අත්ථතො පන යාචන්තියෙව නාම, එවං සීලවන්තෙසු යාචිතො අප්පස්මිම්පි දෙය්‍යධම්මෙ විජ්ජමානෙ අප්පමත්තකම්පි දදෙථ"** යනු අටුවා[1]

**එතෙහි තීහි ඨානෙහි** = මේ තුන් කරුණෙන්.

බොරු නො කීම – ක්‍රොධ නො කිරීම – ටික දෑය වුවත් දීම යන මේ තුන් කරුණෙන් යනු අරුත්.

**ගච්ඡෙ දෙවාන සන්තිකෙ** = දෙවියන්ගේ සමීපයට යන්නේ ය.

මරණින් මතු උත්පත්ති විසින් දෙව්ලොවට යන්නේ ය. ටික දෑයක් වුවත් සිල්වතුනට කම් පල අදහා සැදෑ සිතින් දෙන්නේ දුන්නේ දෙව්ලොව උපදින්නේ ය.[2]

ධර්මදෙශනාවගේ අවසානයෙහි බොහෝ දෙන සෝවාන් පලාදියට පැමිණියාහු ය.

මහාමොග්ගල්ලාන ස්ථවිර වස්තුව නිමි.

---

1. 13. 10. 'න වෙ කදරියා දෙවලොකං වජන්ති' යනු බලනු.
2. 14. 9. 'පූජාරහෙ පූජයතො' ,, ,,

# බුදුරජුන්ගේ පෙර දැහි මවුපිය දෙදෙනෙක්

**17 — 5**

**එක්** දවසක් භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ භික්ෂූන් පිරිවරා ගෙණ **සාකෙත** නුවරට පිඬු සිඟා වැඩි සේක. ඒ වේලෙහි සාකෙත නුවර වැසි එක් මහලු බමුණෙක් නුවරින් බැහැර යනුයේ ගම් දොරදී බුදුරජුන් දැක සිරිපාමුල වැටී ගොප් ඇටය තදින් අල්ලා ගෙණ "දරුව! මවු පියන් මහලු බවට පැමිණි කල්හි දූ පුතුන් විසින් ඔවුහු පිළිදැගිය යුතු නො වෙත් ද? කුමක් නිසා මෙතෙක් අප දක්නට නො ආවාහු ද? දැන් කෙසේ හෝ මා විසින් ඔබ වහන්සේ දක්නා ලදහ, එවු; මෑනියන් දක්නට යමු"යි බුදු රජුන් කැඳවා ගෙණ සියගෙට ගියේය. බුදුරජාණන් වහන්සේ එහි වැඩම කොට භික්ෂූන් සමග පැණ වූ අසුන්හි වැඩහුන් සේක. එකල්හි බැමිණිය ද බුදුරජුන් ඉදිරියට අවුත් බුදුරජුන්ගේ සිරිපාමුල වැටී 'පුතා! මෙතෙක් කොහි ගියහු? මහලු මවුපියෝ දූ පුතුන් විසින් උවැටන් කළ යුත්තෝ නොවෙත් ද?"යි ගෙයි සිටි දූ පුතුන් දෙදෙනාට අඬගසා "එවු; සොහොයුරු වඳිවු"යි ඔවුන් දෙන්නා බුදුරජුන් ඉදිරියට යැවූ ය. ඒ දෙදෙන ද තුටුසිත් ඇතිව බුදු පාමොක් මහණ ගණයා වළඳවා "ස්වාමීනි! හැමදා මෙහි ම භික්ෂාව ගණු මැනැවැ"යි ආරාධනා කළහ.

බුදුරජාණන් වහන්සේ "ඒ නො කළ හැකි ය, බුදුවරුනට හැමදා එක් තැන ම භික්ෂාව ගත නො හැකි ය" යි වදාළ කල්හි "එසේ නම් ස්වාමීනි! යම් කෙනෙක් ඔබ වහන්සේට භික්ෂාව පිණිස ආරාධනා කරන්නට ආවාහු නම්, ඔවුන් හැම දෙනා අප වෙතට එවනු මැනැවැ" යි දන්වා සිටියහ. එතැන් සිට බුදුරජාණන් වහන්සේ ආරාධනා පිණිස තමන් වෙත එන හැම දෙනා බමුණුගෙට යවන සේක. ඔවුහු එහි ගොස් අපි හෙට දානය පිණිස බුදුරජුන්ට ආරාධනා කරමු"යි බමුණු මාල්ලන්ට දන්වා සිටිත්. බමුණු පසුදා තම ගෙයින් බත්බඳුන් එළවලු බඳුන් හා කැවිලි පෙවෙලි කඳ බැඳ ගෙණ එතැනට යන්නේ ය. අන් තැනෙකින් ආරාධනාවක් නැති කල්හි බුදුරජාණන් වහන්සේ බමුණුගෙයි ම වළඳන සේක. ඒ බමුණු මහල්ලෝ දෙදෙන දැන් හැමදා දන් දෙමින් බණ අසමින් වතාවත් කරන්නෝ අනාගාමීඵලයට පැමිණියාහු ය.

භික්ෂූන් වහන්සේලා දම්සබා මඩුවට රැස්ව "ඇවැත්නි! බමුණු, සුද්ධොදන රජ බුදුරජුන්ගේ පියා බවත් මහාමායා

දෙවිය මවු බවත් දන්නේ ය, එහෙත් බුදුරජාණන් වහන්සේ ඔවුන්ගේ ඒ කතාව ඉවසන සේක, මෙසේ කියනුත් මෙසේ ඉවසනුත් කුමක් නිසා දැ''යි කතා කරන්නට වූහ. බුදුරජාණන් වහන්සේ මේ කතාව අසා ''මහණෙනි! ඒ දෙදෙන ම තම පුතුට පුතු ය කියති'' යි වදාරා ඒ ඉකුත් පුවත දක්වා වදාළ සේක.

''මහණෙනි! මේ බමුණු තෙමේ අතර නො තබා දැ පන් සියයක් පිළිවෙළින් මාගේ පියා විය, අතර නො තබා දැ පන් සියයක් බාප්පා විය, අතර නො තබා දැ පන් සියයක් මහප්පා විය, එසේ ම මේ බැමිණිය ද අතර නො තබා දැ පන් සියයක් මට මවු වූ ය, අතර නො තබා දැ පන් සියයක් බාලම්මා වූ ය, අතර නො තබා දැ පන් සියයක් මහම්මා වූ ය, මෙසේ මම යෙළ දහසක් දැහි බමුණු අත වැඩුනෙමි, යෙළ දහසක් දැහි බැමිණිය අත වැඩුනෙමි''යි මෙලෙසින් තුන් දහසක් දැහි තමන් ඒ දෙදෙනාගේ පුත් වූ බව මෙසේ වදාළ සේක.

''යම් කිසිවකු කෙරෙහි – සිත වැද ගැණුම් පැහැදුම්,
වේ නම් නො දුටු එපුරිස් – කෙරෙහි විස්වස් කරණේ.

පෙර සමග විසුමෙන් – වත්මන්හි හිතයෙන් හෝ,
මෙසේ ඒ පෙම් උපදී – දියැ උපුල් හට ගණු මෙන්,,යි.

බුදුරජාණන් වහන්සේ තෙමසක් ම මෙසේ ඒ කුලය ඇසුරු කොට විසූ සේක. ඒ දෙදෙන ද රහත් බව පසක් කොට පිරිනිවියහ. ඉක්බිති පිරිනිවි ඔවුනට මහත් සත්කාර කොට එක් ම කුළුගෙයක නගා ආදහන භූමියට ගෙණ ගියහ. බුදුරජාණන් වහන්සේ ද භික්ෂූන් පිරිවර කොට ගෙණ ඔවුන් සමග ම එහි වැඩියහ. මහාජන තෙමේ ද ''මේ බුදුරජුන්ගේ මවු පියහ'' යි නික්ම ආයේ ය. බුදුරජාණන් වහන්සේ ආදහන භූමියෙහි එක් ශාලාවකට පිවිස වැඩ සිටියහ. මිනිස්සු උන්වහන්සේ වෙත එළැඹ ''ස්වාමීනි! ඔබ වහන්සේගේ මවුපියෝ කලුරිය කළහ, යි නො සිතන සේක්වා''යි බුදුරජුන් සමග පිළිසඳර කතායෙහි යෙදී සිටියහ. උන්වහන්සේ ද ''එසේ නො කියවූ'' යි ඔවුනට නො වදාරා ම පිරිසගේ අදහස් බලා එතැනට සුදුසු සේ දහම් දෙසන සේක් මේ ජරා සූත්‍රය දෙසූ සේක.

''මද මෙදිවි මිය යේ – මෙ විට හවුරුදු සියයෙන්,
යමෙකෙක් ඉකුත් කෙළෙ නම් – දිරා මිය යේ වාසිය''යි.

දෙශනාවසානයෙහි අසූහාර දහසක් දෙනාට ධර්‍මාවබොධය විය. භික්ෂූහු, බමුණු හා බැමිණිය පිරිනිවිබව නො දන්නාහු

''ස්වාමිනි! ඔවුන්ගේ පරලොව කවරේ දැ?''යි ඇසූහ. ඉක්බිති බුදුරජානන් වහන්සේ ''මහණෙනි! අසෙඛ මුනිනට පරලොවෙක් නැත, මෙබඳු වූවෝ නියමයෙන් ම ච්‍යුතිරහිත වූ අමාමහා නිවනට පැමිණෙති''යි වදුරා මේ ධර්මදෙශනාව කළ සේක.

**අහිංසකා යෙ මුනයො නිච්චං කායෙන සංවුතා,**
**තෙ යන්ති අච්චුතං ඨානං යත්ථ ගන්ත්වා න සොචරෙ.**

යම් මුනිහු හිංසා නො කෙරත් ද, නිතර කයින් සංවෘත වූවෝ ද ඒ මුනිහු යම් තැනකට ගොස් ශොක නො කෙරෙත් ද, ච්‍යුතිරහිත වූ එතැනට යත්නාහු ය.

**අහිංසකා** = හිංසා නො කරන්නා වූ.

**හිංසා** නම්: ''මේ සත්ත්වයෝ නැසෙත්වා, සිඳෙත්වා, වැන සෙත්වා, නො වෙත්වා, යි සත්ත්වයන් අරමුණු කොට සිතේ නගිනා චින්තාමාත්‍රයෙන්, සත්ත්වයන් අතින් පයින් දඬුයෙන් මුගුරෙන් කැටින් කැබලිතියෙන් පරොස් බසින් පෙළීම ය. සත්ත්වයන්ට වධ දීම ය. මේ හිංසාව සත්ත්වයන් අරමුණු කොට මුත් සංස්කාරයන් අරමුණු කොට නො ද උපදනේ ය. **''විහිංසා සඤ්ඤා සඞ්ඛාරෙසු න උප්පජ්ජන්ති, ඉමෙ සත්තා හඤ්ඤන්තු වා උච්ඡිජ්ජන්තු වා විනස්සන්තු වා මා වා අහෙසුන්ති චින්තනකාලෙ පන සත්තෙසු උප්පජ්ජති''** යනු අටුවා. එබඳු තැළීමක් පෙළීමක් වධදීමක් එකද සත්ත්වයකු කෙරෙහි කිසිවිටෙකත් කිසිකරුණක් නිසාත් නො කරණුවෝ අහිංසකයෝ ය.

**යෙ මුනයො** = යම් මුනීහු.

කායදුශ්චරිත – වාග්දුශ්චරිත – මනොදුශ්චරිතයන් මුළුමනින් ප්‍රහාණය කොට සිටියේ **මුනි** නම් වේ.[1]

**නිච්චං කායෙන සංවුතා** = කයින් සංවෘත වූවෝ ද.

මෙහි කියූ සංවරය කයින් පමණෙකැ යි නො ගත යුතුය. වචසින් හා මනසින් වන සංවරය ද මෙයින් ම ගැණෙන බව **''කායෙනාති දෙසනා මත්තමෙතං, තීහිපි ද්වාරෙහි සංවුතාති අත්ථො''**යි අට්ඨකථාව කියූ ය. එහෙයින් කය වචන සිත යන තුන්දෙරින් සිදුවන පව්වලින් වැළකී සිටියේ **සංවුත** නම් වේ. ඒ වැළක්ම ද කඩින් කඩ නො ව නො කඩව ම දිගට පවත්නේ ම ගත යුත්තේ ය. **නිච්චං** යනු යෙදුනේ ඒ දක්වනු සඳහා ය.

---

1. 4. 5. 'එවං ගාමෙ මුනි චරෙ' යනු බලනු.

**තෙ යන්ති අච්චුතං ඨානං** = ඒ මුනිහු ච්‍යුති රහිත වූ තැනට යෙත්.

ච්‍යුතිරහිත තැන නම්: අමාමහනිවන ය. එතැන සදාකාලික ය.[1] **"නත්ථි එතස්මිං චුතං චවනන්ති = අච්චුතං"** යනු අරුත් විදැහීම ය. අමාමහ නිවන මගපල නැණින් අවබොධ කළ කල්හි ච්‍යුතියෙක් මෙහි නැත්තේ ය යනු දත්තේ ය.

**යත්ථ ගන්ත්වා න සොචරෙ** = යම් තැනකට ගොස් ශොක නො කෙරෙත් ද.

අසෙඛමුනි වූ රහතුන් වහන්සේ යම් තැනකට පැමිණියාහු ශොක නො කෙරෙත් නම් ච්‍යුතිරහිත වූ එතැනට පැමිණෙත් නාහු ය. හෙවත් නිවනට යත්නාහු ය. නිවන් ලැබීමෙන් ජාති ජරා මරණ ශොක පරිදෙවාදී වූ හැම දුකෙන් මිදෙත්නාහු ය. **"යස්මිං ගන්ත්වා න සොචන්ති න විහඤ්ඤන්ති තං ඨානං ගච්ඡන්ති"** යනු අටුවා.

ධම්දෙශනාවගේ අවසානයෙහි බොහෝ දෙන සෝවන්පලාදියට පැමිණියාහු ය.

**සාකෙතබ්‍රාහමණ වස්තුව නිමි.**

1. 14. 6. 'දුක්ඛස්ස ච අනික්කමං' යනු බලනු

# කුඩු කැවුමක් පිළිගැණීම

## 17 — 6

**බුදුරජාණන්** වහන්සේ **ගිජුකුළු** පව්වෙහි වැඩවසන කල්හි රජගහ සිටුහට **පුණ්ණා** නම් දාස්සක් වූ ය. දවසක් ඈට කොටා ලන්නට මහත් වූ වී ගොඩක් දුන්හ. ඕ තොමෝ රෑද පහන් දල්වා ගෙණ වී කොටන්නී ඩහදියෙන් තෙමී ගිය සිරුරු ඇතියා විඩා හරින්නට පිටතට ගොස් සුළං හමනා තැනක සිටියා ය.

ඒ කාලයෙහි **දබ්බමල්ලපුත්ත** මහාසථවිරයන් වහන්සේ භික්ෂූන්ට සෙනසුන් පැණවීමෙහි කායසීහාරය ඉසුලූහ. එහෙයින් උන්වහන්සේ බණ අසා තම තමන්ගේ සෙනසුන් කරා යන්නා වූ භික්ෂූන්ට මග පෙන්වීමට තමන් වහන්සේගේ ඇඟිල්ලක් දල්වා ඔවුන් ඉදිරියෙහි යන්නාහ. පුණ්ණා තොමෝ ඒ එළියෙන් පව්වෙහි ඒ ඒ තැන යන එන භික්ෂූන් දැක "මම නම් මාගේ දුකින් පෙළුනී මේ මහ රෑත් නිදි නො ලබා වැඩ කරමි, කුමක් නිසා මේ පින්වතුන් වහන්සේලා මේ මහ රෑ නො නිදත් ද එකාන්තයෙන් මෙහි කවර නමක්හට හෝ ලෙඩක් දුකක් විය යුතු ය, නයි-පොලොං ඈ සතකුගෙන් හෝ උපද්‍රවයක් විය යුතු ය" යි සිතා උදෑසන ම කුඩු සුඟක් ගෙණ දියෙන් තෙමා අත්ලෙහි ම කැවුමක් සාදා ගිනි අඟුරෙහි තබා පුළුස්සා ඔඩොක්කුවෙහි සඟවා ගෙණ ගංතොටට යන මගදී කන්නෙමි" යි කළයක් ගෙණ පැන්තොට බලා නික්මුනා ය. බුදුරජාණන් වහන්සේ ද ගමට පිඬු සිඟා වඩින්නට ඒ මගට ම පිළිපන් සේක. පුණ්ණා බුදුරජුන් දැක මෙයට පෙර අන් දිනයන්හි බුදුරජුන් හමු වුව ද උන්වහන්සේට පිදීමට මා අත පිදිය යුතු දෑයෙක් නො වී ය, අද නම් යම් තම් දෑයෙක් ඇත්තේ ය, බුදුරජාණන් වහන්සේ ද හමු වූ සේක, ඉදින් මා පුදනු ලබන දෑයෙහි මිහිරි නො මිහිරි බව නො සලකා පිළිගන්නා සේක් නම් මේ කුඩු කැවුම පුදන්නෙමි" යි කළය එකත් පසෙක තබා බුදුරජුන් වැඳ "ස්වාමීනි! මාගේ මේ රසක් ගුණයක් නැති රළු දානය පිළිගෙණ මට සඞ්ග්‍රහ කරණු මැනැවැ" යි ඉල්ලා සිටියා ය. බුදුරජාණන් වහන්සේ අනඳ තෙරුන් පසිබ්බකයෙන් බැහැරට ගෙණ දුන් මහරජුන් විසින් දෙන ලද පාත්‍රය එළවා කැවුම පිළිගත් සේක. පුණ්ණා ද එය පාත්‍රයෙහි පිහිටුවා පසඟ පිහිටුවා වැඳ "ස්වාමීනි! බුදුරජුන් විසින් අවබොධ කළ ධර්මය ම මටත් ලැබේවා" යි පැතූ ය. උන්වහන්සේ "එසේ වේවා" යි එහි සිට ම අනුමෙවෙනි බණ වදාළ සේක. ඉක්බිති පුණ්ණා තොමෝ "බුදුරජාණන් වහන්සේ මට සඞ්ග්‍රහය

පිණිස කැවුම පිළිගත් සේක, එහෙත් එය නො වළඳනු ඇත, ඒකාන්තයෙන් එය ඉදිරියෙහි කවුඩකුට හෝ දී රජකුගේ හෝ රාජපුත්‍රයකුගේ ගෙට ගොස් මිහිරි බොජුන් වළඳනා සේකැ"යි සිතූ ය. බුදුරජාණන් වහන්සේ "පුණ්ණා මෙසේ සිතා ය" යි ඇයගේ සිත්හසර දැන අනඳ තෙරුන් දෙස බැලූහ. ආනන්ද ස්ථවිරයන් වහන්සේ උන්වහන්සේට වැඩ හිඳින්නට සිවුර පණවා ලූහ. බුදුරජාණන් වහන්සේ නුවරෙන් පිටත ම වැඩ හිඳ කුඩු කැවුම වැළඳූ සේක. දෙවියෝ සක්වළ ගැබ දෙව් මිනිසුනට සුදුසු වූ රස ඕජාව මීවදයක් පෙළා මී මිරිකා ගන්නා සේ මිරිකා ගෙණ ඒ කැවුමෙහි බැහූහ. පුණ්ණා ද එය වළඳනු බලා සිටියා ය. කැවුම් වළඳා අවසන්හි ආනන්ද ස්ථවිරයන් වහන්සේ පැන් පිළිගැන්නූහ. බුදුරජාණන් වහන්සේ කැවුම් වළඳා අවසන්හි පුණ්ණාව අමතා "පුණ්ණා! කුමක් නිසා නී මාගේ සව්වනට ගරහා ද" යි අසා වදාළ සේක. "නැත සවාමීනි! මම පරිභව නො කරමි" යි කී කල්හි "එසේ නම් ඊයේ පෙරේදා මාගේ සව්වන් දෙස බලා නී විසින් කුමක් කියන ලද ද?"යි ඇසූහ. "මම නම් මේ පරවැඩ කිරීමෙන් උපදනා දුක් උවදුරෙන් පෙළී නිදි නො ලබමි, මේ පින්වතුන් වහන්සේලා කුමක් නිසා මේ රෑ නො නිදන්නාහු ද, ඒකාන්ත යෙන් කවරක්හට හෝ ලෙඩක් දුකක් විය යුතු ය, නැත, නයි - පොළොං ආදී සතකුගෙන් උවදුරක් විය යුතු ය"යි සවාමීනි! මම මෙතෙක් සිතීමි, අන් කිසිත් නො සිතීමි"යි කීවු ය. "පුණ්ණා! නී නම් පරවැඩ නිසා දුක් උවදුරෙන් පෙළෙන්නී නො නිදහි, මාගේ සව්වෝ හැම ද නිදිවැරීමෙහි යෙදී සිටුනා බැවින් නො නිදත්"යි වදාරා මේ ධර්මදේශනාව කළ සේක.

**සදා ජාගරමානානං අහොරත්තානුසික්ඛිනං,**
**නිබ්බානං අධිමුත්තානං අත්ථං ගච්ඡන්ති ආසවා ති.**

සියලු කල්හි නො නිදන්නා වූ දවරැහි හික්මෙන්නා වූ නිවනෙහි ඇලුනවුන්ගේ ආස්‍රවයෝ විනාශයට යෙත්.

**සදා ජාගරමානානං** = සියලු කල්හි නො නිදන්නා වූ

මෙහි කියූ නො නිදීම කෙලෙස් නින්දෙන් නො නිදීම ය. කෙලෙසුනට වසඟව කෙලෙසුනට යටත්ව නො විසීම ය. එහෙයින් කිසිවිටෙකත් රාග ද්වෙෂ මොහාදි ක්ලෙශ රාශියෙන් ආතුරව ගිලන් ව සිටිනවුන්ගේ කාමාදි ආස්‍රව ධර්මයෝ මොනලෙසකිනුත් විනාශයට නො යෙත්.

**අහොරත්තානුසික්ඛිනං** = දවරැහි හික්මෙන්නා වූ

ශීල - සමාධි - ප්‍රඥා සඞ්ඛ්‍යාත ශික්‍ෂාවන්හි හික්මීම මෙයින් ගැණේ. අනෙක් හැම හික්මීමෙක් ත්‍රිවිධශික්‍ෂාවන්හි හික්මීමට යට ව සිටියේ ය. ත්‍රිවිධ ශික්‍ෂාවන්හි හික්මෙන්නේ ම සසරදුකින් නිදහස ලබන්නේ ය. මොහුගේ ම ආස්‍රවයෝ විනාශයට යෙත්.

**“අහං ච රත්ති ච = අහොරත්තං”** යනු අන්‍යෝන්‍යවිරුද්ධාර්ථ යන්ගේ සමාසය යි. **‘අහොරත්ති’** යන මෙහි ඉකාරයට අකාරය ව **‘අහොරත්ත’** විය.

**නිබ්බානං** = නිවනෙහි[1]

මෙහි **‘නිබ්බානං’** යන්නට නිවනෙහි යි අරුත් දෙන්නේ ඉදිරියේහි ඇති **‘අධිමුත්තානං’** යනු බලාය. **‘අධිමුත්තානං’** යන මෙහි යේදී සිටි **අධි** යන්නහු ආධාරාර්ථය කියන්නේ ද එහෙයිනි.

**අධිමුත්තානං** = ඇලුනවුන්ගේ. භාවනායෙහි යෙදෙන්නවුන්ගේ. නිර්වාණාධ්‍යාසය දන්නවුන්ගේ.

**අත්ථං ගච්ඡන්ති ආසවා** = ආස්‍රවයෝ විනාශයට යෙත්.

මෙහි **අත්ථ** ශබ්දයෙන් විනාශය කියැ වේ. මේ වනාහි **ප්‍රයොජන - ඵල - ශබ්දාර්ථ - වෘද්ධි - වස්තු - ද්‍රව්‍ය - විනාශ - පශ්චිම පර්වත** යන අරුත්හි ආයේ ය. **“කිමත්ථං ආගතොසි - අත්ථෙ ජාතෙ ච පණ්ඩිතා - සාත්ථං සව්‍යඤ්ජනං - හොති සීලවතං අත්ථො - යද්‍යප්‍යත්ථෙ පතිට්ඨිතා - අත්ථං ගච්ඡන්ති ආසවා - අත්ථඞ්ගතෙ දිවසකරෙ** - යන මොවුහු එයට නිදර්ශන වෙත්. මෙය සප්තම්‍යර්ථයෙහි නිපාතයක් සේ ද එයි.[2]

ධර්මදෙශනාවගේ අවසානයෙහි පූර්ණා තොමෝ සිටිපරිද්දෙන් ම සෝවාන්පලයෙහි පිහිටා ගත්තා ය. පැමිණ සිටි පිරිසටද ධර්මදෙශනාව සාර්ථක වූය. බුදුරජාණන් වහන්සේ ගිජුඅඟුරෙහි ලා පුළුස්සා ගත් කුඩුකැවුම් වළඳා වෙහෙරට වැඩි සේක. ඒ අතර භික්‍ෂූන් වහන්සේ “ඇවැත්නි! බුදුරජුන් විසින් කරණ ලද්දේ අමාරුකාරියෙකි, පූර්ණාව විසින් පිළිගැන්නූ කුඩුකැවුම් වැළඳීම ලෙහෙසි කාරියෙක් නො වේ” යි දම්සබා මඬුල්ලට රැස්ව කතා කරන්නට වූහ. එ වේලෙහි බුදුරජාණන් වහන්සේ එහි වැඩ “මහණෙනි! තමුසේලා මෙහි රැස්ව කුමක් කතා කරමින් හුන්නාහු ද?” යි විචාළ කල්හි කළා වූ කුඩුකැවුම් කතාව දැන් වූහ.

---

1. 14. 6 ‘දුක්ඛස්ස ච අතික්කමං’ යනු බලනු.
2. 7. 4. ‘යස්සාසවා පරික්ඛීණා’ ,, ,,

"මහණෙනි! මම කුඩුකැඩුම් වැළඳූයෙම් දැන් පමණක් ම නො වෙමි, පෙරත් මැය දුන් කුඩුත් වැළඳීමි" යි ඒ අතීත පුවත දක්වනු පිණිස,

"ඉඳුල් තණ හා උළු - කැන් දිය කුඩු ද කා බී,
වැඩුනෙහි ද මෙ බොජුන් තට - ජීය දූත් කිම නො බුදිහි.

යම් තැන බොහෝ දෙන - දෑ විනයුමෙන් එ පුරිස්,
නො දනිත් ද එහි මහබඹ! - බුදිමි උළුකැන් දිය කුඩු.

අස්රදක් වූ මම - යම් බඳුයෙම් ද එබඳු,
කුලපෙදෙස් ඈ විසිතුදු - මං ගැණ තෝ ද දනිහි.

මම තමන් බල දැන - මාගේ උතුම් අසු බැව්,
දත්නා තා වෙතටවුත් - නො කම් කුඩු (කිසිලෙසකින්)"යි.

මේ කුණ්ඩකසින්ධව පොතක ජාතකය විසතර විසින් වදාළ සේක.

පූර්ණාවසථාව නිමි.

# අතුල උපාසකයා.

## 17 — 7

**සැවැත්** නුවර **අතුල** නම් උපාසකයෙක් වෙයි. ඔහුට පන්සියයක් උපාසකයෝ පිරිවර විසින් වූහ. දවසක් අතුල උපාසක තෙමේ ඒ උපාසකයන් කැටුව බණ ඇසීමට විහාරයට ගොස් **රේවත** තෙරුන් ඉදිරියෙහි බණ අසනු කැමැති ව තෙරුන් වැඳ වාඩි ගත්තේ ය. ඒ ස්ථවිරයන් වහන්සේ විවේකයෙහි ඇලුණෝ සිංහයකු සේ එකලාව විසූ බැවින් ඔහු හා කිසිවක් කතා නො කළහ. එකල්හි උපාසක තෙමේ ''ස්ථවිරයන් වහන්සේ මා හා කතා නො කෙරෙති''යි කිපියේ එතැනින් නැගිට සැරියුත් මහ තෙරුන් වෙත ගොස් එකත් පසෙක වාඩි ගත. එවිට තෙරුන් විසින් ''උපාසක! කුමක් නිසා මෙහි ආයෙහි?''යි විචාරණ ලද්දේ ''ස්වාමීනි! මම මේ උපාසකයනුත් සමග බණ අසන්නට සිතා රේවත තෙරුන් වෙත ගියෙමි, උන්වහන්සේ මා හා කිසිවක් කතා නො කළහ, මගේ සිත්හි නැගුනු කෝපය නිසා මම මෙහි පැමිණියෙමි, මට බණක් වදාරණු මැනැවැ'' යි කී ය. ශාරිපුත්‍ර මහාස්ථවිරයන් වහන්සේ ''උපාසක! එසේ නම් හිඳුව''යි හිඳුවා ගෙණ බොහෝ කොට අබිදහම් බණක් දෙසූහ. උපාසක තෙමේ ''අබිදහම ඉතා සියුම් ය, එය අපට වටහා ගැණීම පහසු නො වේ, ස්ථවිරයන් වහන්සේ බොහෝ කොට අබිදහම් ඇද බාන්නාහ, අපට මෙයින් කම් කිමැ''යි උන්වහන්සේ කෙරෙහි ද කිපියේ සිය උපාසක පිරිසත් ගෙණ අනඳ තෙරුන් වෙත ගියේ ය. තෙරුන් විසිනුදු ''උපාසක! කුමක් නිසා මෙහි ආයෙහි?''යි විචාරණ ලද්දේ ''ස්වාමීනි! අපි බණ අසන්නට සිතා රේවත තෙරුන් වෙත ගියෙමු, උන්වහන්සේගෙන් වචනමාත්‍රයෙකුත් නො ලැබින, එයින් හට ගත් කෝප ඇති ව එතැනින් නැඟිට සැරියුත් මහා තෙරුන් වෙත ගියෙමු, එතැනදී අපට අසන්නට ලැබුනු බණ, අප වැන්නන්ට තේරුම් ගත හැකි බණෙක් නො වී ය, උන්වහන්සේ අපගේ හැටි නො සලකා අබිදහම් දෙසාබෑහ, මෙයින් අපට කම් කිමැ'යි කියා මෙහි ආම්හ, එහෙයින් ස්වාමීනි! අපගේ හැටි බලා යම්කිසි බණක් වදාරණු මැනැවැ''යි කී ය. එසේ කී කල්හි ආනන්ද මහාස්ථවිරයන් වහන්සේ ඔවුනට පහසුවෙන් දත හැකි බණක් ම වැඩියක් ගැඹුරු නො කොට දිග් නො ගසා යන්තමකින් දෙසූහ. එයිනුදු කිපුනු ඒ උපාසකයෝ බුදුරජුන් වෙත ගොස් වැඳ එකත් පස්ව හුන්හ. ''කුමක් නිසා මෙහි ආවහු දැ?'' යි ඔවුන් විචාළ කල්හි ''ස්වාමීනි! බණක් ඇසීමට ය''යි කීහ. එවිට බුදුරජානන් වහන්සේ මෙයට කලින් තෙපි බණ ඇසූවහු දැ?''යි අසා වදාළ සේක. ''ස්වාමීනි!

අපි පළමු කොට බණ අසන්නට සිතා ගියමෝ රේවත තෙරුන් වෙත ය, උන්වහන්සේ වචනයක් පමණකුත් අප හා කතා නො කළහ, කොපයෙන් ගැහි ගැහී එතැනින් නැගිට සැරියුත් මහා තෙරුන් වෙත ගියමෝ ය, උන්වහන්සේ අපට අබිදහම් දෙසාබෑහ, ඒ බණ අපට තේරුම් ගත නො හැකි වී ය, එතැනින් නැගිට අනඳ මහා තෙරුන් වෙත ගියෙමු, ගියමෝ ද කොපයෙන් ය, එහි දී කුඩා දරුවනට සෑහෙන ඉතා සුලු බණක් යන්තමකින් උන්වහන්සේ කියා පෑහ, එ ද අපසිත් නො ගත්තේ ය, කොප-යෙන් පිපිරි පිපිරී මෙහි ආම්හ''යි ඔවුහු කීහ.

ඉක්බිති බුදුරජානන් වහන්සේ අතුලගේ කතාව අසා, ''අතුල! කම් නැත, මේ නින්දා-ප්‍රශංසා දෙක පෙර සිට එන්නේ ය, නිහඬ වූව ද ගැරහුම් ය, බෙහෝ කොට කීව ද ගැරහුම් ය, මද කොට කීව ද ගැරහුම් ය, එකාන්තයෙන් ගැරහිය යුත්තෙක් හෝ එකාන්තයෙන් පැසසිය යුත්තෙක් හෝ නැත්තේය, ඇතැම් කෙනෙක් රජුනට ද ගරහත්, ඇතැම් කෙනෙක් පසසත්, මහපොළොවට සඳහිරුට සිවුපිරිස් මැද හිඳ දම් දෙසන සම්බුදුනට ද ඇතැම් කෙනෙක් ගරහත්, ඇතැම් කෙනෙක් පසසත්, කලෙක නින්දා කළෝ කලෙක ප්‍රශංසා කෙරෙත්, කලෙක ප්‍රශංසා කළෝ කලෙක නින්දා කෙරෙත්, නුවණ නැති මෝඩ මිනිසුනට නින්දා ප්‍රශංසා දෙකක් නැත්තේය, ඔවුනට නින්දාවත් ප්‍රශංසාවත් දෙක එකෙක් ම ය, ඔවුහු ගැරහිය යුත්ත නො දනිත්, පැසසිය යුත්ත නො දනිත්, ගැරහිය යුත්තට පසසත්, පැසසිය යුත්තට ගරහත්, මේ මෝඩ මිනිසුන්ගේ ගතිය ය, නුවණැත්තෝ එසේ නො වෙත්, නුව-ණැත්තහු විසින් ගැරහුම් කරණ ලද්දේ නම් ඒ ගැරහිය යුත්තේ ම ය, පසස්නා ලද්දේ නම් පැසසිය යුත්තේ ම ය''යි වදාරා මේ ධර්මදෙශනා කළ සේක.

**පොරාණමෙතං අතුල! නෙතං අජ්ජතනාමිව,**
**නින්දන්ති තුණ්හීමාසීනං නින්දන්ති බහුභාණිනං,**
**මිතභාණිම්පි නින්දන්ති නත්ථි ලොකෙ අනින්දිතො.**

**න චාහු න ච භවිස්සති න චෙතරහි විජ්ජති,**
**එකන්තං නින්දිතො පොසො එකන්තං වා පසංසිතො.**

**යඤ්චෙ විඤ්ඤූ පසංසන්ති අනුවිච්ච සුවෙ සුවෙ,**
**අච්ඡිද්දවුත්තිං මෙධාවිං පඤ්ඤාසීලසමාහිතං.**

**නෙක්ඛං ජම්බොනදස්සෙව කො තං නින්දිතුමරහති,**
**දෙවාපි නං පසංසන්ති බ්‍රහ්මුනාපි පසංසිතො.**

අතුල! මෙය පෙරවූවෙක. මෙය අද වූවෙක් ම නො වේ. නිහඬව හුන්නහුට ද නින්දා කෙරෙත්. බොහෝ කොට කතා කරන්නහුට ද නින්දා කෙරෙත්. පමණ කොට කතා කරන්නහුට ද නින්දා කෙරෙත්. ලෙව්හි නින්දා නො කරණ ලද්දෙක් නැත්තේ ය.

එකාන්තයෙන් නින්දා කරණ ලද පුරුෂයෙක් හෝ එකාන්ත-යෙන් ප්‍රශංසා කරණලද පුරුෂයෙක් හෝ නො වී ය. (ඉදිරියෙහි) නො වන්නේ ය. දැනුත් නැත්තේ ය.

නුවණැත්තෝ දිනපතා නුවණින් විමසා යමක්හට ප්‍රශංසා කෙරෙත් ද සිදුරු රහිත පැවැතුම් ඇති විදසුන් නුවණ ඇති ප්‍රඥයෙන් හා ශීලයෙන් යුක්ත වූ ඔහුට-

දඹරන් නිකකට මෙන් නින්දා කරන්නට කවරෙක් සුදුසු වේ ද, ඔහුට දෙවියෝ ද ප්‍රශංසා කෙරෙත්. බ්‍රහ්මයා විසිනුදු පසස්නා ලද්දේය.

**පොරාණං එතං අතුල** = අතුල, මෙය පෙරවූවෙක, පෙරසිට එන්නෙකි.

**අතුල** යනු ආලපනයෙහි ආයේ ය. **"අතුලාති තං උපාසකං ආලපති"**යි අටුවාව කීයේ එහෙයිනි. තමාට අභිමුඛ නො වූවකු අභිමුඛ කර ගැණීම සඳහා යෙදුනේ ආලපනය යි.

**එතං** යනු ආයේ සමීපාර්ථ වාචී වූ **එත** ශබ්දයෙනි. ඉතා ලඟ සිටියහු, මදක් ඈත්හි සිටියහු, ඇසින් දැකිය හැකි තැන සිටියහු සඳහා මේ යෙදෙන්නේ ය. යෙදෙන්නේ ද සිංහලයෙහි පිළිවෙළින් මේ-තෙල-අර යනු විසිනි. මේ-තෙල-අර යන අරුත් ඒ කිසිත් නො සලකා විශෙෂයක් නො කොට සිංහලයෙහි නො යෙදුනේ ද නො යෙදෙන්නේ ද නො වේ. **"එතසද්දො සමීපපච්චාවචනො"** යනු ශාබ්දික වචනයි.

**පොරාණ** යනු පෙරවූයේය, යන අරුත්හි ආයේ ය. **පුරා** යන නිපාතය කෙරෙන් භවාර්ථයෙහි **ණ ප්‍රත්‍යය** වීමෙන් සිද්ධ ය. මෙහි ණ කාරය අවයව ව සිටියේ ය. අනුබන්ධ නො වේ. **"පුරා භවො පොරාණො"** යනු දත්තේ ය. අභිධෙය්‍ය ලිඞ්ගිකය.

**න එතං අජ්ජතනං එව** = මෙය අද වූවෙක් ම නො වේ.

අද වූයේය, යන අරුත්හි **අජ්ජතන** යනු ආයේ ය. **අජ්ජ** යන නිපාතය කෙරෙන් භවාර්ථයෙහි තන ප්‍රත්‍යයයෙන් සිද්ධ ය. **"අජ්ජ-භවො = අජ්ජතනො"** යනු වාක්‍යයි. **එව න** යනු නිපාතයෝ ය. **එව** යනු නිර්ධාරණයෙහි ය. **න** යනු ප්‍රතිෂෙධයෙහි ය

"අතුල! මේ නින්‍දකිරීමත් ප්‍රශංසා කිරීමත් පෙර සිට මුග්ධ-ලොකයා අත එන්නේ ය, කරුණු නො දන්නවුන් අත එන්නේ ය, මෙය මෙකල්හි වූවෙක් ම නො වේ" යනු අදහසි.

**නින්‍දන්ති තුණ්හී ආසීනං** = නිහඬව හුන්නහුට ද නින්‍ද කෙරෙත්. ගරහත්.

ගොළුවකු සේ බිහිරකු සේ කිසිත් නො දන්නකු සේ නිහඬව හුන්නහුට ද නින්‍ද කෙරෙත්, යනු මේ වදාළ සේ යි. **"කිං එසො මූගො විය බධිරො විය කිඤ්චි අජානන්තො විය තුණ්හී භූතො නිසින්නොති තං නින්‍දන්ති"** යනු අටුවා. **තුණ්හී** යනු නිහඬ බැව්හි එන නිපාතයෙකි. **"තුණ්හීති අසඞ්ඛ්‍යං"** යනු ශබ්දික වචන යි.

**නින්‍දන්ති බහු භාණිනං** = බොහෝ කොට කතා කරන්නහුට නින්‍ද කෙරෙත්.

"මෙ තෙමේ සුළඟින් සැලෙන තල්පතක් සේ තට තට යන හඬ නගමින් කතා කරන්නේ ය, වට පිට නො බලා පිරිස නො බලා කටට ආ ආවක් කියන්නේ ය, මූගේ කතාවේ කොණෙක් මිම්මෙක් නැත්තේ ය, තම කතාවේ මුල මැද අග මූ නො දන්නේ ය, මූ මහාවාචාලයෙකැ" යි නින්‍ද කරන්නේ ය, බණින්නේ ය, දෙඩන්නේ ය." **"කිං එස වාතාහතතාලපණ්ණං විය තටතටායති, ඉමස්ස කථාය පරියන්තොයෙව නත්ථීති නින්‍දන්ති"** යනු අටුවා.

**මිතභාණිං අපි නින්‍දන්ති** = පමණ කොට කතා කරන්නහුට ද නින්‍ද කෙරෙත්.

"මේ තෙමේ තමාගේ වචනය රත්රන් මසුරන් කොට සිතයි, එක් දෙබසක් කියා නිහඬ වෙයි, මූට කතා කරන්නට නො හැකි ද එසේ නම් මූ මෙහි ආයේ කුමට ය, කතා කරන්නට අපොහොසත් එකකු කැඳවූවෝ කවරහ"යි පමණ දැන කතා කරන්නහුට ද නින්‍ද කරන්නෝ ය. බණින්නෝ ය. දෙඩන්නෝ ය. **"කිං එස සුවණ්ණහිරඤ්ඤං විය අත්තනො වචනං මඤ්ඤමානො එකං ද්වෙ වා වත්වා තුණ්හී අහොසීති නින්‍දන්ති"** යනු අටුවා.

**නත්ථි ලොකෙ අනින්‍දිතො** = ලෙව්හි නින්‍ද නො කරණ ලද්දෙක් නැත්තේ ය.

නිහඬ ව සිටිය ද නින්‍දය. බොහෝ කොට කතා කළ ද නින්‍දය. පමණ දැන පමණට කතා කළ ද නින්‍ද ය. එහෙයින් හැම අතකින් නින්‍ද ය. මෙසේ වත් මේ මිනිස් ලොව නින්‍ද නො කරණ

ලද්දෙක් කොතැනකත් නැත්තේ ය. හැම කෙනෙක් ම මෙසේ නින්දා ලබන්නෝ ය. **"එවං සබ්බථාපි ඉමස්මිං ලොකෙ අනින්දිතො නාම නත්ථි"** යනු අටුවා.

**න ච අහු න ච භවිස්සති න ච එතරහි විජ්ජති** = නො වී ය. නො වන්නේ ය· දැනුත් නැත්තේ ය.

පෙර කවරෙක් නො වූයේ ඉදිරියෙහි කවරෙක් නො වන්නේ දැන් කවරෙක් නැත්තේ? යන මෙහි මෙසේ දත යුතු ය.

**එකන්තං නින්දිතො පොසො** = එකාන්තයෙන් නින්දා කරණ ලද පුරුෂයෙක්.

එකාන්තයෙන් නින්දා කරණ ලද නින්දා ලැබූ පුරුෂයෙක් අතීතයෙහිත් නො වී ය. අනාගතයෙහිත් නො වන්නේ ය. දැනුත් නැත්තේය යි.

**එකන්තං වා පසංසිතො** = එකාන්තයෙන් ප්‍රශංසා කරණ ලද (පුරුෂයෙක්)

එකාන්තයෙන් ප්‍රශංසා කරණ ලද ප්‍රශංසා ලැබූ පුරුෂයෙක් අතීතයෙහිත් නො වී ය. අනාගතයෙහිත් නො වන්නේ ය. දැනුත් නැත්තේ ය යි.

**යං චෙ විඤ්ඤූ පසංසන්ති අනුවිච්ච සුවෙ සුවෙ** = නුවණැත්තෝ දිනපතා විමසා යමක්හට ප්‍රශංසා කෙරෙත් ද.

එහි **විඤ්ඤූ** නම්: ඇති තාක් ධර්මයන්ගේ යථාස්වභාවය තතු ලෙසින් දන්නෝ ය. **"යථාසභාවං ජානන්තීති = විඤ්ඤූ"** යනු විවරණයි. **අනුවිච්ච** යන මෙහි අරුත්, හොඳට විමසා බලා, යනු ය **චෙ** – **සුවෙ** – **සුවෙ** – යනු නිපාතයෝ ය. **චෙ** යනු අනියමෙහි හා ශඞ්කායෙහි ආයේ ය. **"මං චෙ ත්වං නිඛණං වනෙ = එකරත්තිම්පි චෙ විසෙ වසෙය්‍ය"** යනු නිදසුන් ය. **සුවෙ** යනු කාලාන්තරයෙහි ය.

**අච්ඡිද්දවුත්තිං මෙධාවිං පඤ්ඤාසීලසමාහිතං** = සිදුරු රහිත ශික්ෂා නොහොත් සිදුරු රහිත දිවිවැටුම් ඇති නුවණැති ප්‍රඥයෙන් හා ශීලයෙන් යුක්ත වූ.

මෙහි **අච්ඡිද්දවුත්ති** නම්: නො සිදුරු වූ නො කඩ වූ ශීල – සමාධි – ප්‍රඥා සඞ්ඛ්‍යාත ශික්ෂා ඇත්තේ හෝ සිදුරු රහිත නිදොස් වූ දිවිවැටුම් ඇත්තේ ය. **"අච්ඡිද්දාය සික්ඛාය වා අච්ඡිද්දාය වා ජීවිතවුත්තියා සමන්නාගතත්තා අච්ඡිද්දවුත්ති"** යනු අටුවා.

**මෙධාවී** නම්: ධර්මෞජස් ප්‍රඥා ඇත්තේ ය.[1] ලෞකික ලෝකෝත්තර ප්‍රඥායෙන් හා චතුර්විධ පාරිශුද්ධිශීලයෙන් යුක්ත වූයේ **පඤ්ඤාසීලසමාහිත** නම්.[2] මෙතුන් පදය යට ගාථායෙහි එන **තං** යනු විසෙසන්තේ ය.

**නෙක්ඛං ජම්බෝනදස්ස ඉව කො තං නින්දිතුං අරහති** = දඹරන් නික්කට මෙන් ඔහුට නින්දා කරන්නට කවරෙක් සුදුසු වේ ද.

**නෙක්ඛ** නම්: සවර්ණ පසෙකි. රන් පස් කළඳෙක් සුවර්ණයෙකි. එකල්හි නිෂ්කය රන් පස් විසි කළඳෙක් වේ. **නෙක්ඛ** ශබ්දය එතරම් රණින් කළ ආභරණ විශෙෂයන්හි ද වැටේ. **ජම්බුනද** නම් හොයෙහි හට ගත් රත්රන් **ජාම්බොනද** නමින් කිය වේ. ඒ මේ නිෂ්කය දඹනදරන් පිළිබඳ ය. රණින් කැරුණේ ය. දෙසින් විරහිත ය. ගැටීමට මැදීමට සුදුසු ය. එහෙයින් බබලන්නේ ය. අගය මහත් ය.

මෙසේ දෙස් රහිත වූ ගැටීමට මැදීමට සුදුසු වූ බැබලීම් සහිත වූ අගය මහත් වූ දඹනදරන් නිකට ගරහන්නට සුදුස්සකු නැත්තා සේ සිදුරු රහිත වූ නුවණැති ප්‍රඥායෙන් හා ශීලයෙන් යුක්ත වූ ඒ පුද්ගලයාහට ගැරහීමට කවරෙකුත් සුදුසු නො වේ. කාටත් ඔහුට ගරහනු බැරි ය.

**දේවාපි නං පසංසන්ති** = දෙවියෝ ද ඔහුට පසසත්.

දෙවියෝත් නුවණැති මනුෂ්‍යයෝත් මෙබඳු මහත් ගුණ ඇති ඔහු කරා පැමිණ උවැටන් කොට සතුති කරත්. පසසත්.

**බ්‍රහ්මුනා අපි පසංසිතො** = බඹහු විසිනුදු පසස්නා ලද්දේ ය.

මොහු පසසන ලද්දේ හුදෙක් දෙව් මිනිසුන් විසින් පමණක් නො වේ. දසදහසක් සක්වළ මහබඹහු විසිනුදු පසස්නා ලද්දේ ම ය.

ධර්මදෙශනාවගේ අවසානයෙහි ඒ පන්සියයක් උපාසකයෝ සෝවන් පලයෙහි පිහිටියහ.

**අතුලඋපාසකවස්තුව නිමි.**

---

1. 2. 3. 'මෙධාවී' යනු බලනු.

2. 1. 8. 'සාරෙ ච සාරදස්සිනො' }
,, ,, 7. සීලෙසු සුසමාහිතො } ,,

# සවග මහණුන්ගේ අසංවරය

## 17 — 8

**එක්** දවසක් බුදුරජාණන් වහන්සේ **පණ්ඩුක - ලොහිතක - මෙත්තිය - භුම්මජක - අස්සජි - පුනබ්බසුක** යන සවග මහණුන් දෙයතින් සැරයටිදඬු ගෙණ ලීයෙන් කළ පාවහන් ලා ගෙණ ගල්මතුපිට ඇවිදුනා කල්හි එයින් නැගි 'ඛට, ඛට' යන හඬ අසා "ආනන්ද! මේ ඇසෙන හඬ කිමැ?"යි අසා වදාළ සේක. එකල්හි ආනන්ද මහාස්ථවිරයන් වහන්සේ "ස්වාමීනි! සවගමහණෝ දෙයතින් සැරයටි ගෙණ ලී සෙරෙප්පු පය ලා ගෙණ ගල් මතුපිට එහා මෙහා ඇවිදින්නාහු ය, මේ 'ඛට, ඛට' හඬ උන්ගේ ගමන් නිසා නැගුනේ ය"යි සැළකළහ. ඉක්බිති බුදුරජාණන් වහන්සේ ඒ අසා එසේ නො කරණ ලෙසට සිකපදයක් පණවා මේ ධර්මදෙශනාව කළ සේක.

**කායප්පකොපං රක්ඛෙය්‍ය කායෙන සංවුතො සියා'**
**කායදුච්චරිතං හිත්වා කායෙන සුචරිතං චරෙ.**

**වචීපකොපං රක්ඛෙය්‍ය වාචාය සංවුතො සියා,**
**වචීදුච්චරිතං හිත්වා වාචාය සුචරිතං චරෙ.**

**මනොපකොපං රක්ඛෙය්‍ය මනසා සංවුතො සියා,**
**මනොදුච්චරිතං හිත්වා මනසා සුචරිතං චරෙ.**

**කායෙන සංවුතා ධීරා අථො වාචාය සංවුතා,**
**මනසා සංවුතා ධීරා තෙ මෙ සුපරිසංවුතාති.**

කායදුශ්චරිතය රක්නේ ය. කයින් සංවෘත වූවෙක් වන්නේ ය. කායදුශ්චරිතය හැරපියා කයින් සුචරිතය කරන්නේ ය.

වාග්දුශ්චරිතය රක්නේ ය. වචසින් සංවෘත වූවෙක් වන්නේ ය. වාග්දුශ්චරිතය හැරපියා වචසින් සුචරිතය කරන්නේ ය.

මනොදුශ්චරිතය රක්නේ ය. මනසින් සංවෘත වූවෙක් වන්නේ ය. මනොදුශ්චරිතය හැරපියා මනසින් සුචරිතය කරන්නේ ය.

ධෘතිමත් වූ යම් කෙනෙක් කයින් සංවෘත වූවෝ ද, නැවැත වචසින් සංවෘත වූවෝ ද මනසින් සංවෘත වූවෝ ද ඒ ධෘතිමත්හු එකාන්තයෙන් මනාකොට සංවෘත වූවාහු වෙත්.

**කායප්පකොපං රක්ඛෙය්‍ය** = කායදුශ්චරිතය රක්නේ ය. කාය-දුශ්චරිතය නො කරන්නේ ය.

**කායප්පකොප** නම්: කාය කර්මද්වාරය කුප්පන කාය කර්මද්වාර යෙන් සිදුවන ප්‍රාණඝාත - අදින්නාදාන - කාමමිථ්‍යාචාර යන මේය.

**කායෙන සංවුතො සියා** = කයින් සංවෘත වූවෙක් වන්නේ ය.

කයින් සංවෘත වූයේ නම්: කායද්වාරයෙන් සිදුවන පව්කම් වලින් මුළුමනින් වැළකී සිටියේ ය.

**කායදුච්චරිතං හිත්වා කායෙන සුචරිතං චරෙ** = කායදුශ්චරිතය හැරපියා කයින් සුචරිතය කරන්නේ ය.

**කායසුචරිතය** නම්: කායද්වාරසංවරය පිණිස පණවා වදාළ ශික්ෂාපදයන් නො ඉක්මවා රැකීම ය. කම්පථවිසින් ම ප්‍රාණ-ඝාතාදී වූ පව්කම් තුනෙන් වළකින්නහුගේ සිත්හි උපදනා චේතනාවිරතීහු ය. ඔහු කායදුශ්චරිතය හැර සිටිය යුතු ය.

**වචීපකොපං රක්ඛෙය්‍ය** = වාග්දුශ්චරිතය රක්නේ ය. වාග්-දුශ්චරිතය නො කරන්නේ ය.

**වචීපකොප** නම්: වාක්කර්මද්වාරය කුප්පන වාක්කර්මද්වාරයෙන් සිදුවන මුසාවාද - පිසුණවචන - ඵරුසවචන - සම්ඵප්පලාප යන මේ ය.

**වාචාය සංවුතො සියා** = වචසින් සංවෘත වූවෙක් වන්නේ ය.

වචසින් සංවෘත වූයේ නම්: වාග්ද්වාරයෙන් සිදුවන පව්කම් වලින් මුළුමනින් වැළකී සිටියේ ය.

**වචීදුච්චරිතං හිත්වා වාචාය සුචරිතං චරෙ** = වාග්දුශ්චරිතය හැරපියා වචසින් සුචරිත කරන්නේ ය.

**වාක්සුචරිත** නම්: වාග්ද්වාරසංවරය උදෙසා පණවා වදාළ ශික්ෂාපදයන් නො ඉක්මවා රැකීම ය. කම්පථවිසින් මුසාවාදදී වූ පව්කම් සතරින් වළකින්නහුගේ සිත්හි උපදනා චේතනා-විරතීහු ය. ඔහු වාග්දුශ්චරිතය හැර සිටිය යුතු ය.

**මනොපකොපං රක්ඛෙය්‍ය** = මනොදුශ්චරිතය රක්නේ ය. මනො-දුශ්චරිතය නො කරන්නේ ය.

**මනොපකොප** නම්: මනසකර්මද්වාරයෙන් සිදුවන අභිජ්ඣා-ව්‍යාපාද - මිච්ඡාදිට්ඨි යන මේ ය.

**මනසා සංවුතො සියා** = මනසින් සංවෘත වූවෙක් වන්නේ ය.

මනසින් සංවෘත වූයේ නම්: මනසකර්මද්වාරයෙන් සිදුවන පව්කම්වලින් මුළුමනින් වැළකී සිටියේ ය.

**මනොදුච්චරිතං හිත්වා මනසා සුචරිතං චරෙ** = මනොදුශ්චරිතය හැරපියා මනසින් සුචරිත කරන්නේ ය.

**මනඃසුචරිත** නම්: කායවාග්ද්වාරදෙක්හි සංවරය උදෙසා පැණ වූ ශික්ෂාපදයන් නො ඉක්මවා රැකීම ය. කම්පථවිසින්

අනභිජ්ඣා – අව්‍යාපාද – සම්මාදිට්ඨි යන මේ චේතනා සම්ප්‍රයුක්ත වූ ධර්ම තුන ද මනස්සුචරිත නම්. ඔහු මනොදුශ්චරිතය හැර සිටිය යුතු ය.[1]

මේ අටුවා:– **කායද්වාරෙ පඤ්ඤත්තසික්ඛාපදස්ස අවීතික්කමො කායසුචරිතං, වචීද්වාරෙ පඤ්ඤත්තස්ස සික්ඛාපදස්ස අවීතික්කමො වචීසුචරිතං, උභයත්ථ පඤ්ඤත්තස්ස සික්ඛාපදස්ස අවීතික්කමො මනොසුචරිතං, අයං පඤ්ඤත්තිකථා, පාණාතිපාතාදීහි පන විරමන්තස්ස උප්පන්නා තිස්සො චෙතනාපි විරතියොපි කායසුචරිතං, මුසාවාදාදීහි විරමන්තස්ස චතස්සො චෙතනා විරතියොපි වචීසුචරිතං, අනභිජ්ඣා අබ්‍යාපාදො, සම්මාදිට්ඨීති තයො චෙතනාසම්පයුත්තා ධම්මා මනොසුචරිතන්ති අයං කම්මපථො"** යනු.

මේ කායසුචරිතාදීහු මෙසේ ප්‍රඥප්ති විසින් හා කර්මපථ විසින් දෙපරිදි දෙපරිදි වෙති යි දතයුතු ය.

**කායෙන සංවුතා ධීරා** = (යම්) ධෘතිමත්හු කයින් සංවෘතයෝ ද.

**අථො වාචාය සංවුතා** = නැවැත වචසින් සංවෘතයෝ ද

**මනසා සංවුතා ධීරා තෙ වෙ සුපරිසංවුතා** = ඒ ධෘතිමත්හු ඒකාන්තයෙන් මනා කොට සංවෘත වෙත්. වසා රැක ගත් තුන්දොර ඇත්තාහ.

කාය – වචන – සිත යන තිදෙරින් සංවරයෙහි පිහිටි ප්‍රාණඝාතාදී වූ පව්කම් නො කරණ නුවණැත්තෝ මනා කොට වසා ගත් අවුරා ගත් තුන්දොර ඇත්තාහු නම් වෙත්. **"යෙ පණ්ඩිතා පාණාතිපාතාදීනි අකරොන්තා කායෙන, මුසාවාදාදීනි අකරොන්තා වාචාය, අභිජ්ඣාදීනි අසමුට්ඨාපෙන්තා මනසා ච සංවුතා, තෙ ඉධ ලොකස්මිං සුපරිසංවුතා සුරක්ඛිතා සුගොපිතා සුපිහිතද්වාරාති"** යනු අටුවා.

ධර්මදෙශනාවගේ අවසානයෙහි බොහෝ දෙන සෝවන්ඵලාදියට පැමිණියාහු ය.

**ඡබ්බග්ගිය භික්ෂුවස්තුව නිමි.**

සකලජනධර්මාර්ථසංග්‍රහාභිලාෂී පණ්ඩිත අම්බලම්ගොඩ
ධම්මකුසල ස්ථවිරයන් කළ සද්ධර්මසාගර නම් වූ
ධර්මපදවර්ණනායෙහි ක්‍රෝධවර්ගාත්මක
සප්තදශතරඞ්ගය නිමියේ ය.

---

1 1. 10. 'පාපකාරී', යනු බලනු

# මලවර්ගය

# ගොඝාතක පුත්‍රයා

## 18 — 1

**සැවැත්** නුවර වැසි එක් ගෙරින් මරන්නෙක් ගෙරින් මරා හොඳ හොඳ මස් ගෙණ පිසවා අඹුදරුවන් සමග එක්ව හිඳ කමින් වැඩි මස් මිලට විකුණන්නේ ය. මෙතෙමේ පණස් පස් අවුරුද්දක් මෙසේ ගෙරින් මරා කමින් දවස් යවන්නේ ද ගෙය අසල වෙහෙර වැඩ හුන් බුදුරජානන් වහන්සේට වත් එක් දවසකුදු බත්හැන්දක් කැඳහැන්දක් පමණකුත් නො දුන්නේ ය. හෙතෙමේ මසක් නැතුව නම් කවදැත් නො කන්නේ ය. දවසක් දැවල මස් විකොට තමන් පිණිස මස් කැල්ලක් ගෙණවුත් පිස තබන්නට අඹුට දීලා තෙමේ නාන්නට ගියේ ය.

ඒ අතර ඔහුගේ යහළුවෙක් එහි පැමිණ ඔහුගේ අඹුට කතා කොට "අපගේ ගෙට අමුත්තෙක් ඇවිත් සිටියි, විකුණන්නට තුබූ මස් වත් තිබේ නම් එයින් ටිකක් දෙන්නැ" යි ඉල්ලා සිටියේ ය. "විකුණන්නට තුබූ මස් නැත, ඔබගේ යහළු, මස් විකුණා අවුත් දැන් නාන්නට ගියේ වනැ"යි කී විට, නැවැතත් ඔහු "එහෙම කියන්නට කරන්නට එපා, ටිකක් වූවත් ඇත, තිබේ නම් එයින් ටිකක් වත් දෙන්නැ"යි ඉල්ලී ය. "අපගේ ගෙයි එක්කෙනාට උයා තබන්නට දීලා ගිය මස් ටික හැර අන් මසෙක් නම් නැතැ"යි කී කල්හි මස් ඉල්ලා ආයේ, "හරි, මා යහළු, දීලා ගිය මස් හැර අන් මසෙක් නැත, ඔහු මස් නැතිව බත් නො-කනබවත් දනිමි, කමෙක් නෑ, මෑ මෙය නො දෙන හැඩැ යි පෙණෙන්නේ"යි තෙමේ ම ගෙට ඇතුල් ව සඟවා තුබූ මස් ටික පැහැර ගෙණ ගියේ ය.

ගෙරින් මරන්නා නාලා ආයේ බිරිය පලාකොළ තැම්බුමකුත් සමග බත් බෙදා තුබූ කල්හි ' මා උයන්නට දීලා ගිය මස් කොහි දැ"යි ඇසී ය. ඔහේගේ යහළුවෙක් මෙහි අවුත් ඔහුගේ ගෙදරට අමුත්-තෙක් අවුත් සිටී ය කියා මාගෙන් මස් ටිකක් තිබේ නම් දෙන්නැ යි ඉල්ලී ය, මම මස් නැතැ යි කීමි, එසේ කියත් ම ඔහු නැවැත නැවැතත් මස් ඉල්ලා කරදර කෙළේ ය, එවිට මම ඔයාට රෑ බතට උයා තබන්නට දීලා ගිය මස් ටිකක් නම් තිබෙනවා, එය නම් මොනලෙසකටත් දෙන්නට නො හැකි ය, අපගේ ගෙයි එක්කෙනා මස් නැතිව බත්කන්නේ නැතැ යි කීපවිටක්ම කීවා, එහෙත් ඔහු ඒ කිසිත් නො සලකා ගෙට ඇතුල් ව මස්ටික බලාත්-කාරයෙන් ම ගෙණ ගියේ ය"යි අඹු කී කල්හි "මට මස් නැතිව බත් කන්නට නො හැකි යි, මස් ගෙණ එව"යි ඔහු ගුගුළේ ය.

"හිම්! දැන් මම කුමක් කරම් ද, තරහ නො ගෙණ මේ බත්ටික කන්නැ"යි අඹු කන්නලව් කළා ය. "මට ඔය බතින් වැඩක් නෑ, බත් ගෙණ යව, මම බත් නො කමි" යි බත් ආ පසු යවා ගෙයි තැබූ පිහියක් ගෙණ ගෙය පිටිපස බැඳ සිටි ගොනා ළඟට ගොස් උගේ කට අරවා කටේ අත දමා දිව එළියට ඇද එය මුලින් ම කපා ගෙණ අවුත් අඟුරෙහි දමා කර කරලා බත් ගෙන්වා ගෙණ බත් උඩ එය තබා ගෙණ හිඳ බත් කටක් කටට ගෙණ කර කරලා ගත් මස් කැබැල්ලෙන් කෑල්ලක් කඩා කටට ගත්තේ ය. එකෙණෙහි ම උගේ දිව මුලින් ම ගැලවී බත් උඩට වැටුනේ ය. මෙසේ ඒ වේලෙහි ම ඔහු කළ ඒ පව්කමට සරිලන විපාක ද ලැබුනේ ය. ඔහු ඒ ගොන් මෙන් ලේදහර කටින් වගුරුවමින් ගෙයතුළ දණ ගාමින් එහා මෙහා හැසිරෙන්නට වන. කතාබහක් නැත්තේ ය. කෑමෙක් බීමෙක් නො වී ය. එවේලෙහි ඔහුගේ පුත්, පියා දෙස බලමින් ඔහු ළඟ ම සිටියේ ය. එසේ සිටි පුතු දැක ඔහුගේ මවු "පුත! බලන්න, විපාකයේ මහත, ගොන් මෙන් ගේ මැද දණ ගා හැසිරෙමින් තාගේ පියා මොර දෙන සැටි බලන්න, මේ දුක ඔබ මතුයෙහි ද වැටෙන්නට බැරි නැත, ඒ නිසා මා ගැණ නො බලා මෙයින් මිදී යන්නට ගෙයින් පිටව යන්නැ"යි පුතුට කිවූ ය. පුතු ද මවුගේ බස් පිළිගෙණ මරණබියෙන් තැති ගෙණ මවට වැඳ ගෙය හැර දමා තක්සලාවට ගියේ ය. ගොඝාතක එදා ම මැරී ගොස් අවීචිමහානරකයෙහි උපන. ගොන් ද මළේ ය. පුතු තක්සලාවට ගොස් රන්කරු ගෙදරක නවාතැන් ගෙණ රන්කරුකම් උගත්තේ ය.

එක් දවසක් ඔහුගේ ගුරුවරයා කම්මලේ වැඩ කොට ගමට යන්නට සැරසී ඔහුට සැලැස්මක් දී "මේ සැලැස්මෙහි පෙණෙන ලෙසට ආහරණයක් කරව"යි නියම කොට ගමට ගියේ ය. ඔහු ද ගුරුවරයා දුන් සැලැස්මට අනුව ඒ ආහරණය සාදා තැබී ය. ගම සිට පෙරළා පැමිණි ගුරු, ආහරණස බලා සතුටු ව "මූට කොතැන ගියත් කරදරයක් නැතිව බත්පත සපයා ගෙණ ජීවත් විය හැකි ය"යි වැඩිවියට පැමිණ සිටි තම දුව බිරිය කොට ඔහුට පාවා දුන්නේ ය. කල් යත් මොහු දූ පුතුන්ගෙන් වැඩී ගියේ ය. පුත්තු පියා වෙතම රැඳී ශිල්ප උගත්තාහු තරුණ වයසට පැමිණියෝ ටික කලක් තක්සලාවෙහි රැඳී හිඳ පසුව රජගහ නුවරට ගොස් එහි ගේදොර ගොඩ නගා ගෙණ වසන්නාහු සැදූහැතියෝ වූහ. තක්සලාවෙහි ම රැඳී හුන් ඔවුන්ගේ පියා කිසිත් පින්දහමක් නො-කොට හුන්නේ මහලුවයසට පැමිණියේ ය. එහෙයින් දූ පුත්තු "අපගේ පියා නිකම් ම මහලුව ගියේ ය"යි තමන් වෙතට ගෙන්වා ගෙණ උවැටන් කරන්නෝ පියාට පින් ලබා දෙන්නට බුදුපාමොක්

මහසඟනට දන් පිණිස ආරාධනා කළහ. පසුදා එහි වැඩම කළ බුදුපාමොක් මහසඟන ගෙයි වඩා හිඳුවා මැනැවින් වළඳවා, අවසන්හි "ස්වාමීනි! මේ දූනය ජීවත් ව ඉන්නාවූ අපගේ මේ පියානන්ද නමින් පියානන්දට පින් පිණිස පිදීම්හ, එහෙයින් අපගේ පියානන්දට පින් අනුමෝදන් කරවන සේක්වා"යි ඔවුහු බුදුරජානන් වහන්සේට සැළකළහ. උන්වහන්සේ ඔහු අමතා "උපාසක! තමුසේ දූන් මහලු ය, දිරා ගිය සිරුරු ඇතියහු ය, මෝරා ඉදී ගිය පඬුවන් කොළයක් වැනියහු ය, එහෙත් තමුසේට පරලොව ගෙණ යැමට සැහෙන පින් නැමැති මගවියදම් ද නැත, එහෙයින් ඒ පිණිස පින් පිහිට කොට ගණුව, නුවණැත්තෙක් වෙව, අඥනයෙක් නො වෙව"යි අනුමෝදනා කරණ සේක් මේ ධර්මදෙශනාව කළ සේක.

**පණ්ඩුපලාසොවදානිසි යමපුරිසාපි ච තමුපට්ඨිතා,**
**උය්‍යොගමුඛෙ ච තිට්ඨසි පාථෙය්‍යම්පි ච තෙ න විජ්ජති.**

**සො කරොහි දීපමත්තනො ඛිප්පං වායාම පණ්ඩිතො භව,**
**නිද්ධන්තමලො අනඞ්ගණො දිබ්බං අරියභූමිමෙහිසිති.**

දූන් (සිදී බිම වැටුනු) පඬුපැහැති පරණලාපතක් මෙන් විහි. යමදූතයෝ ද තා වෙතට එළැඹ සිටියහ. පරිහානිමුඛයෙහි ද සිටිහි. මගවියදම් ද තට නැත.

ඒ තෝ තමහට පිහිටක් කරව. වහා වැයම් කරව. නුවණැත්තෙක් වෙව. නසනලද රාගාදිමල ඇත්තෙහි රාගාදිඅඞ්ගණ නැත්තෙහි දිව්‍යානුභාව ඇති නොහොත් ශොභාවත් වූ ආර්‍යභූමියට පැමිණෙන්නෙහි ය.

**පණ්ඩුපලාසො ඉව ඉදානි අසි** = දූන් (තෝ) පඬුපැහැති පරණලාපතක් මෙන් වෙහි ය.

"උපාසක! තෝ දූන් සිදී බිම වැටුනු පඬුපැහැති පරණලාපතක් වැනි වෙහි"යි මේ වදාළ සැටියි. දලුවේ පටන් ක්‍රමයෙන් මෝරා ගිය කොළය ඉදී පඬුපැහැතිවනු එකාන්ත ය. එසේ පඬුපැහැ ගත් කොළය නටුවෙන් ගිලිහී වැටෙනු ද එකාන්ත ය. එමෙන් සත්ත්වයා ද මවුකුස පිළිසිඳ ගත් තැන් පටන් ක්‍රමයෙන් මෝරා ගොස් දිරාපත්වනු ද එකාන්ත ය. ඉදී පඬුපැහැ ගත් කොළය නටුවෙන් ගිලහී වැටෙන්නාසේ දිරාපත් වූ සත්ත්වයා ද ජීවිතයෙන් ගිලිහී වැටෙනු ද එකාන්ත ය.

**යමපුරිසා අපි ච තං උපට්ඨිතා** = යමදූතයෝ ද තා වෙතට එළැඹ සිටියාහ.

**යමපුරිසා** නම්: යමදූතයෝ ය. මරණය මෙහි යමදූත නම් මරණය ද තට ඉතා ළංව සිටියේ ය. තා මැරෙන්නට ළඟ ය. යන අරුත්.

**උය්‍යොගමුඛෙ ච තිට්ඨසි** = පරිහානිමුඛයෙහි ද සිටිහි.

තෝ දූන් ආයුෂයෙන් ඇසින් කණින් නැහැයෙන් දිවෙන් සිරුරෙන් යන පසිඳුරන්ගෙන් පිරිහුනෙහි පිණෙන් ද පිරිහී සිටිහි.

**පාථෙය්‍යම්පි ච තෙ න විජ්ජති** = මගවියදම් ද තට නැත.

දුර බැහැර යන්නහුට මගවියදම් පිණිස මිලමුදල් ඈ යම් කිසිවක් අතමිට තිබිය යුතු ය. එසේ අතමිටෙකි යමක් නැතිව මගට පිළිපන්නහුට නිදුකින් දුර බැහැර යා නො හැකිය. මග-තොට දී කෑම් බීම් ඉඳුම් හිටුම් ඈ හැම එකෙකින් ඔහු වෙහෙසට පත් වන්නේ ය. තා විසින් යා යුතු මග ඉතා දිග ය. එතරම් දිග මගෙක් තවත් නැත්තේ ය. එය කොතැනින් කවද අවසන් වේ දැ යි තෝ නො දන්නෙහි ය. තා විසින් යායුතු මග නිදුකින් අවසන් කිරීමට බතින් බුලතින් මිලමුදලින් කළ නො හැකි ය. ඒ පිණිස දාන-ශීල-භාවනා වශයෙන් රැස් කර ගත් පින් නැමැති මගවියදම් වුවමනා ය. පින්නැත්තේ නම් ගමන් මග බිහිසුණු ය. එහෙත් තට පින්නැමැති මගවියදම් නැත. මගට හිත වූයේ **පාථෙය්‍ය** නම් වේ.

**සො කරොහි දීපං අත්තනො** = ඒ තෝ තමාට පිහිටක් කර ගණු ව.

එසේ වූ තෝ මුහුදෙහි නැවු නට කල්හි දිවයින් සොයන්නා සේ තමාට කුසල් නැමැති පිහිටක් කර ගණුව. මේ අටුවා:- **"සො ත්වං සමුද්දෙ නාවාය භින්නාය දීපසඞ්ඛාතං පතිට්ඨං විය අත්තනො කුසලපතිට්ඨං කරොහි"** යනු. දීපැ යි මෙහි කීයේ පිහිට ය. එනම් කුසල් ය.[1]

**ඛිප්පං වායාම** = වහා වෑයම් කරව.

හිස ගිනි ගත්තෙක් ඒ හිස ඇවිළ ගත් ගින්න නිවාලන්නට යම් සේ වෑයම් කෙරේ ද, එමෙන් රාගද්වෙෂාදී වූ කෙලෙස් ගිනි වලින් දවරැසි මොහොතකුත් නො හැර දැවෙන මේ පස්කඳ හැරපියා නිවන් ලබන්නට පින් කිරීමෙහි උත්සාහවත් විය යුතුය යනු මේ වදළ සැටි යි.

**පණ්ඩිතො භව** = නුවණැත්තෙක් වෙව

1. 2. 3. 'දීපං කයිරාථ' යනු බලනු.

මැරි යෑමට පෙරාතුව හයිබල ඇති කල්හි කුසල් කරණුයේ එහිලා වෑයම් කරණුයේ **පණ්ඩිත** නම්. මේ මෙහි සාධකා:- **"යො හි මරණමුඛං අප්පත්වා ඝාංකුං සමත්ථකාලෙයෙව කුසලං කරොති වායමති එස පණ්ඩිතො නාම"** යනු.[1]

**නිද්ධන්තමලො** = නැසූ රාගාදිකෙලෙස්මල ඇතියෙහි.

**සො ත්වං** යනු බලා සිටියේ ය. සත්ත්වයන්ගේ සිත් තුළ හට ගන්නා කෙලෙස්, මල නම් වේ. **"මලනි සඞ්කිලිස්සති එතෙනාති මලං"** යනු විවෘති සි. මෙය අටුවායෙහි **"කිලිස්සනට්ඨෙන මලං"** යි කීහ. යමකින් සත්ත්වසන්තානය කිලිටි වේ නම් ඒ මල. ඒ මේ රාගාදි වූ කෙලෙස් මල යමකු විසින් නසන ලද්දේ නම් ඒ **නිද්ධන්තමල. "රාගාදීනං මලානං නීහටත්තාය නිද්ධන්තමලො"** යි අටුවායෙහි ආයේ ය.

**අනඞ්ගණො** = රාගාදිඅඞ්ගණ නැත්තෙහි.

**සො ත්වං** යනු බලා සිටියේ ය. මෙහි **අඞ්ගණ** නම් රාගාදි කෙලෙස් ය.[2]

**දිබ්බං අරියභූමිං එහිසි** = දිව්‍යානුභාව ඇති නොහොත් ශොභාවත් වූ ආර්‍ය්‍යභූමියට පැමිණෙන්නෙහි ය.

අවිහ – අතප්ප – සුදස්ස = සුදස්සී – අකනිට්ඨ යන ශුද්ධාවාස භූමි පස දිව්‍යානුභාව ඇති ආර්‍ය්‍යභූමීහු ය. රහතුන්ට හා අනාගාමීන්ට ම වාසස්ථාන බැවින් මේ භූමි පස ශුද්ධාවාසැ යි කියනු ලැබේ.

"උපාසක! තමූසේ දූත් ගැලවී වැටෙන්නට ලංව සිටි පරණලාපතක් වැනියහු ය, තට මරණය ලංව සිටි, පරිහානි මුඛයෙහි සිටිනහු ය, පරලොවට සෑහෙන පින්කම් නො කළ බැවින් පින් නැමැති මගවියදම් ද තට නැත, දූත් වත් පිහිටක් කර ගණිවු, පින් කර ගැණිමට වහා ම උත්සාහවත් වියයුතු ය, නුවණැත්තෙකු ව කෙලෙස්මල නසා කෙලෙස් නැත්තකු ව ශුද්ධාවාසභූමියට පැමිණිමට වග බලා ගත යුතු ය" යනු ආශය යි.

ධර්මදෙශනාවගේ අවසානයෙහි උපාසක තෙමේ සෝවන්ඵලයෙහි පිහිටියේ ය. පැමිණ සිටි පිරිසට ද ධර්මදෙශනාව වැඩ සහිත වූය.

---

1. 2. 1. 'අප්පමාදම්හි පණ්ඩිතා' යනු බලනු
2. 9. 9. 'අනඞ්ගණස්ස' ,, ,,

ඔවුහු පසුදවටත් දානය පිණිස බුදුරජාණන් වහන්සේට ආරාධනා කොට ගෙට වැඩමවා ගෙණ දන් වළඳවා, වළඳ අවසන්හි "ස්වාමීනි! මේ දානයත් අපගේ ජීවත් ව ඉන්නා පියානන්දෑට ම පින් පිණිස දෙන ලද්දේ ය, එහෙයින් ඔහුට අදත් අනුමෙවෙනි බණක් වදාරණු මැනැවැ"යි බුදුරජුන්ට ආරාධනා කළහ. උන්වහන්සේ අනුමෙවෙනි බණ වදාරණ සේක් මේ ධර්මදේශනාව කළ සේක.

**උපනීතවයො ච දානිසි සම්පයාතොසි යමස්ස සන්තිකං,**
**වාසොපි ච තෙ නත්ථි අන්තරා පාථෙය්‍යම්පි ච තෙ න විජ්ජති.**

**සො කරොහි දීපමත්තනො ඛිප්පං වායාම පණ්ඩිතො භව,**
**නිද්ධන්තමලො අනඞ්ගණො න පුන ජාතිජරං උපෙහිසීති.**

ගෙවී ගිය වයස් ඇත්තෙහි ද විහි. යමයාගේ සමීපයට පැමිණි-යෙහි වෙහි. තට අතුරෙහි වාසයෙකුදු නැත. තට මගවියදම් ද නැත. ඒ තෝ තමාට පිහිටක් කර ගණුව. වහා වැයම් කරව. නුවණැත්තෙක් වෙව. නසා ලූ මල ඇත්තෙහි අඞගණ නැත්-තෙහි නැවැත ජාති-ජරාවනට නො පැමිණෙන්නෙහි ය.

**උපනීතවයො ච ඉදානි අසි** = දැන් ඉක්ම ගිය වයස් ඇත්-තෙහි ද වෙහි ය.

තමුසේ දැන් ප්‍රථම – මධ්‍යම – පශ්චිම යන තුන් වයස ම ඉක්මවා මරණ මුඛයෙහි සිටිනහු ය.

**සම්පයාතො අසි යමස්ස සන්තිකං** = යමයාගේ සමීපයට පැමිණි-යෙහි වෙහි ය.

තමුසේ දැන් මරණමුඛයට යන්නට සූදානම් ව සිටිනහු ය. තට දැන් මරණ මුඛයට නො පැමිණ දිගට මෙහි සිටිනු නො හැකිය.

**වාසො අපි ච තෙ නත්ථි අන්තරා** = තට අතුරෙහි වාසයෙක් ද නැත්තේ ය.

මගට බට මිනිස්සු තමන්ගේ ඒ ඒ කටයුතු කරමින් අතර මග ද නවාතැන් ගණිත්. පරලොව යන්නහුට එසේ නො කොට හැකි ය. "මා දන් දෙන තුරු බණ අසනතුරු කිහිපදවසක් ඉවසා බලවු"යි කියා නො මැරී ඉන්නට කිසිවකුටත් නො හැකි ය. එහි අතර නැවැත්මෙක් නැත. සත්ත්ව තෙමේ යම් මොහොතක

මෙලොවින් ච්‍යුත ව ගියේ නම් ඒ මොහොතෙහි කොතැනකත් රැඳීමෙක් නැතිව පරලොවට ම යන්නේ ය. ච්‍යුතියට අනතුරු ව ප්‍රතිසන්‍ධිය ලැබීම එකාන්තනියමයෙක් වේ ද එහෙයිනි.

**පාථෙය්‍යං අපි ච තෙ නත්‍ථි** = තට මගවියදම් ද නැත.

**සො කරොහි දීපං අත්තනො** = ඒ තෝ තමාට පිහිටක් කරගණුව.

**ඛිප්පං වායාම** = වහා වෑයම් කරව.

**පණ්ඩිතො භව** = නුවණැත්තෙක් වෙව.

**නිද්ධන්තමලො** = නසාලූ රාගාදි කෙලෙස්මල ඇත්තෙහි.

**අනඞ්ගණො** = රාගාදි අඞ්ගණ නැත්තෙහි

**න පුන ජාතිජරං උපෙහිසි** = නැවත ජාති - ජරාවනට නො පැමිණෙන්නෙහි ය.

මෙහි ජාති - ජරා මුඛයෙන්, ව්‍යාධි - මරණ ද දක්වන ලද ය. එහෙයින් නුවණැතිව නසා හළ රාගාදී වූ කෙලෙස් ඇතියේ රාගාදී වූ අඞ්ගණ නැතියේ නැවැත කවදත් ජාති - ජරා - ව්‍යාධි - මරණයනට නො පැමිණෙන්නේ ය. ඒ එකාන්ත ය.

බුදුරජානන් වහන්සේ යට කියූ ගථා දෙකින් අනැගැමිමග ද මේ ගාථා දෙකින් රහත්මග ද දක්වා වදාළ සේක. යම් සේ රජු තමාගේ මුව පමණට බත් පිඩ වඩා එය පුතුට ලං කළ කල්හි ඔහු තමාගේ මුව පමණින් ම ගණී ද එමෙන් බුදුරජානන් වහන්සේ විසින් මතු දෙමගට පැමිණෙනු පිණිස උපාසකයාට දහම් දෙසන ලදුයේ ද, උපාසක තමාගේ උපනිශ්‍රය බලයෙන් යට ගාථා දෙක අසා සෝවාන් පලයට පැමිණ මේ අනුමොදනා අවසානයෙහි අනැගැමිමගට ද පැමිණියේ ය.

ධම්දෙශනා තොමෝ එහි පැමිණ සිටි පිරිසට ද වැඩ සහිත වූ ය.

**ගොඝාතකපුත්‍රවස්තුව නිමි.**

# ශ්‍රද්ධාවත් බ්‍රාහ්මණයෙක්

## 18 — 2

**එක්** දවසක් එක්තරා බ්‍රාහ්මණයෙක් උදෑසන ම ගෙන් නික්ම ගොස් භික්ෂූන් වහන්සේලා පිඬු සිඟා යන්නට සිවුරු පොරවනු බලා සිටියේ ය. උන්වහන්සේලා සිවුරු පෙරවූවෝ තණකොළ බහුල ව වැඩී තුබූ බිම්පෙදෙසක සිට ය. එහි දී එක් නමක් සිවුරු පොරවද්දී උන්වහන්සේගේ සිවුරෙහි කොන් තණකොළවල ගැටීමෙන් පින්නෙන් තෙමී ගියේ ය. ඒ දුටු බමුණා පසුදා උදෑසන උදැල්ලක් ගෙණ ගොස් එතැන තණකොළ සැස බැහැරලා කමතක් සේ පිළියෙල කෙළේ ය. භික්ෂූන් පසුදාත් එතැනට පැමිණ සිවුරු පොරවනු බලා සිටි ඔහු එදා එක් නමකගේ සිවුරෙහි කොණක් බිම ගැටී පස් තැවෙරෙණු දැක "වැලි ගෙණවුත් මෙතැන පිරවිය යුතු ය"යි සිතා වැලි ගෙණවුත් එතැන විසිරවී ය. තවත් දවසක් පෙරවරුයෙහි තද අව්වේ සිට සිවුරු පොරවන භික්ෂූන්ගේ සිරුරුවලින් ඩහදිය ගලනු දැක එදා එහි මඩුවක් තැනවී ය. නැවැත දවසක් තද වැස්සේ තෙමි තෙමී සිවුරු පොරවන භික්ෂූන්ගේ සිවුරු තෙමී ගියවුන් දැක "මෙහි මා ශාලාවක කරවිය යුතු ය"යි ශාලාවක කරවී ය. එය පූජා කිරීමේ උත්සවයට බුද්ධ ප්‍රමුඛ මහාසඞ්ඝයා වහන්සේට ආරාධනා කොට වැඩමවා ගෙණ ශාලාවෙහි ඇතුළත පිටත දෙක්හි උන්වහන්සේලා වඩා හිඳුවා දන් වැළඳවී ය. වළඳවා අවසන්හි අනුමෙවෙනි බණ අසන්නට පාත්‍රය ගෙණ "ස්වාමීනි! මම පළමු කොට මෙතැන වැඩී තුබූ තණකොළ වල් පැළෑටි උදුරා බැහැර කොට කමතක් සේ මෙතැන පිළියෙල කෙළෙමි, එසේ කෙළෙම් මෙතැන රැදී සිවුරු පොරවන භික්ෂූන් වහන්සේලාගේ සිවුරුවල කොන් තණකොළ මතුයෙහි ගැටී පින්නෙන් තෙමී ගියවුන් දැක ය, නැවැත මෙතැන වැලි ගෙණවුත් වැතුරුයෙම් සිවුරුකොන් පස් තැවරී කිලිටි වනබව දැකීමෙනි, තෙවනවර මෙතැන තද අව්වේ සිට සිවුරු පොරවන භික්ෂූන්ගේ සිරුරුවලින් ගලනා ඩහදිය දැක මඩුවක් කරවීමි, නැවැත දවසක් තද වැස්සේ තෙමි තෙමී සිවුරු වළඳන භික්ෂූන් දැක මේ ශාලාව ගොඩ නැංවීමි"යි සියලු තොරතුරු දන්වා සිටියේ ය.

ඉක්බිති බුදුරජාණන් වහන්සේ ඔහුගේ කතාව අසා "බ්‍රාහ්මණ! නුවණැත්තේ හැම මොහොතක් පාසා මද මද විසින් පින් කරණුයේ පිළිවෙළින් තමන් පිළිබඳ සියලු අකුසල් මුල් සිඳ හරී ය"යි වදාරා මේ ධර්මදෙශනාව කළ සේක.

**අනුපුබ්බෙන මෙධාවී ථොකථොකං ඛණෙ ඛණෙ,**
**කම්මාරො රජතස්සෙව නිද්ධමෙ මලමත්තනොති.**

නුවණැත්තේ පිළිවෙළින් කෙණෙහි කෙණෙහි මඳ මඳ කොට පින් කරන්නේ, රන්වල ඇති මල දවා හරිණ රන්කරුවකු මෙන් තමාගේ කෙලෙස්මල දුරු කරන්නේ ය.

**අනුපුබ්බෙන මෙධාවී** = නුවණැත්තේ පිළිවෙළින්.

පෙර යම් ලෙසකින් කරණ ලද නම් ඉදිරියෙහි ඒ ලෙසින් කිරීම **අනුපුබ්බ** නම්. **"පුබ්බස්ස අනුරූපෙං = අනුපුබ්බං"** යනු දන්නේ ය. **"යථා කතං තථා කාරණන්ති අත්ථො"** යනු ටීකායි. මෙධා නම් වූ නුවණ ඇතියේ මෙධාවී.[1]

**ථොක ථොකං** = ටික ටික මඳ මඳ කොට.

**ථොක** යනු ටික – බිඳ යන අරුත් ඇත්තේ ය. එබඳු එක් ම අරුත් ඇති ශබ්ද දෙකක් එකයොග වූ කල්හි අධිකාර්‍ථයෙක් ඉන් ලැබෙන්නේ ය. එහෙයින් **ථොකථොකං** යන මෙහි අරුත් 'ඉතාටික විසින්'යි ගත වරද නැත.

**ඛණෙ ඛණෙ** = ක්‍ෂණයෙහි ක්‍ෂණයෙහි ඉඩ ලද ලද ඇසිල්ලෙහි.

දස අසුරුසණක් පමණ කාලය **ඛණ** නම්. සත්ත්වයන්ගේ ආයුකාලයෙන් ක්‍ෂණමාත්‍රයක් ගත වූ කල්හි එද ආයුෂයාගේ එක්තරා පමණකින් පිරිහීමෙක් වේ. **"සත්තානං ආයු ඛීයති හායති එත්ථාති = ඛණො"** යනු කියේ එහෙයිනි.

**කම්මාරො රජතස්ස ඉව** = රන්මල දවා හරිණ රන්කරු මෙන්.

**"යථා සුවණ්ණකාරො එකවාරං එව සුවණ්ණං තාපෙත්වා කොට්ටෙත්වා මලං නීහරිත්වා පිළන්ධනවිකතිං කාතුං න සක්කොති, පුනප්පුනං තාපෙනෙතා කොට්ටෙනෙතා පන නීහරති තතො නෙකවිධං පිළන්ධනවිකතිං කරොති"** රන්කරු එක්වරක් ම රන් කෝවයෙහිලා තවා තළා රන්හි වූ මලකඩ හැර නන්වැදෑරුම් රන් අබරණ කරන්නට සමර්‍ථ නො වේ. ඔහු එය නැවැත නැවැත කෝවයෙහි ලා තවා තළා රන් මල හැර පිරිසිදු කොට ඉන්පසු තමන් කැමැති සේ එයින් නොයෙක් පලඳනා කරන්නේ ය, යනු පාළිපාඨයෙහි අරුත්.

**කම්මාර** නම්: රන්රිදී ආදි වූ ලොහකර්‍මාන්තයෙහි යෙදුනේ ය. **"ලොහකිච්චං කරොතීති = කම්මාරො"** යනු විවෘතියි.

---

1. 2. 3. 'දීපං කයිරාථ මෙධාවී' යනු බලනු.

**රජත** නම්: සත් රුවන් අතුරෙහි ගැණෙන එක්තරා ලෝහයෙකි. රන් - රිදී - මුතු - මැණික් වෙරළු - විදුරු - පබළු යන මේ ය සත්රුවන්. එහෙත් මෙහිලා රජත ශබ්දයෙන් සවණි ගැණෙන්නේ ය.

**නිද්ධමෙ මලං අත්තනො** = තමාගේ කෙලෙස්මල දුරු කරන්නේ ය.

රන්කරු යට කියූ සේ ක්‍රමයෙන් රන් පිරිසිදු කොට එයින් නන් වැදෑරුම් පලඳනා කරන්නා සේ නුවණැති මිනිසා පුන පුනා හැම මොහොතෙහි මදින් මද පින් කිරීමෙන් සිය සතන්හි නගිනා රාගාදී වූ හැම කිලිටි දුරු කරන්නේ ය. එකල්හි හේ නසාලූ මල ඇත්තේ කෙලෙස් නැත්තේ වේ.

ධම්දෙශනාවගේ අවසානයෙහි බ්‍රාහමණ තෙමේ සෝවන්-පලයෙහි පිහිටියේ ය. ධම්දෙශනා තොමෝ මහජනයාට ද වැඩ සහිත වූය.

**අන්‍යතර බ්‍රාහමණවස්තුව නිමි.**

# ඉණිකුණුව උපන් මහණෙක්

## 18 — 3

**සෑවැත්** නුවර වැසි කුලපුත්‍රයෙක් පැවිදිව ලැබූ උපසමපදා ඇතියේ **තිෂ්‍ය** සථවිර යි ප්‍රසිද්ධ වූයේ ය. ඒ සථවිර එක් කලෙක දනවූ වෙහෙරක වස් එළැඹුනේ එහිදී තමන්ට ලැබුනු අට රියනක් පමණැති දළ රෙදිකඩක් වස් පවරා අවුත් සිය බුහුනක අතට දුන්නේ ය. ඕ තොමෝ එය ගෙණ "මේ සළුව මාගේ සහෝදර යාට සුදුසු නැතැ"යි එය තියුණු කරයකින් කැබලි කැබලි කොට කපා වංගෙඩියක ලා කොටා කුඩු කොට පොලා නැවත වැටි කොට හීත් නුලට අඹරා සළුවක් වියවාලූ ය. පසු දිනෙක ඒ සථවිර තෙමේ නුල් ඉදිකටු සපයා ගෙණ ගෙත්තම් කරන්නට දත් තරුණ හෙරණුන් කිහිප නමකුත් එක්කර ගෙණ බුහුන වෙතට ගොස් "එදා මා දුන් සළුව දෙන්න, එයින් මම සිවුරක් මසා ගන්නෙමි"යි ඉල්ලා සිටියේ ය. ඕ තොමෝ එවේලෙහි නව රියන් පමණැති සළුවක් ගෙණවුත් සොහොයුරු තෙරුන් අතට දුන්නී ය. ඒ සථවිර එය දිග හැර බලා "මා දුන් සළුව මෙය නො වේ, එය දළය, අටරියනක් පමණ දිග ය, මෙය සියුම් ය, නවරියනක් තරම් දිග ය, මෙය අක්කාගේ ය, මෙයින් මට වැඩෙක් නැත, මාගේ සළුව ම දෙන්නැ"යි ඉල්ලී ය. "සවාමීනි! මෙය ඔබවහන්සේ මට දුන් සළුව, මෙය ගන්නැ"යි කියන ලද්දේ ද ඔහු එය ගන්නට නො කැමැති විය. ඉක්බිති බුහුන තමන් කළ සියල්ල කියා "සවාමීනි! මේ සළුව ඔබ වහන්සේගේ ම ය, එහෙයින් මෙය ගෙණ ගොස් සිවුරක් මසා ගන්නැ"යි කීවූ ය. සථවිර, සළුව රැගෙණ විහාරයට ගොස් සිවුර ගෙත්තම් කරන්නට පටන් ගත. එහිදී බුහුන සිවුර ගෙත්තම් කරන්නන්ට කැඳබත් ඈ හැම දෙයක් පිළියෙළ කොට දුන්නී ය. සිවුරෙහි ගෙත්තම් නිමකළ දවසෙහි වැඩියක් ඕ තොමෝ සත්කාර කර වූ ය. සථවිර තෙමේ සිවුර දිග හැර බලා එහි ආලය උපදවා "හෙට ම මෙය පොර වන්නෙමි"යි හකුලා සිවුරු ලන හුණ දණ්ඩෙහි දමා නිදන්නට ගියේ ය. හේ එදා දවල් වැළඳූ අහර දිරවා ගත නො හී එදා රෑ ම කලුරිය කොට ඒ සිවුරෙහි නැම්මෙක ඉණිකුණු ව උපන. සොහොයුරිය, සෝයුරු තෙරුන්ගේ කලුරිය කිරීම අසා මහණුන්ගේ පාමුල වැටී හඬන්නට වූ ය. භික්ෂූහු ඒ තෙරුන්ගේ මළසිරුර ආදාහනය කරවා ගිලන් උවැටන් කළ එකකු නො වූ බැවින් "මොහුගේ සිවුරු පිරිකර සඞ්ඝයාට

අයත් ය, එය බෙදමු"යි ඒ සිවුරත් බෙදන්නට ගෙන්වා ගත්හ. ඒ සිවුරෙහි ඉපද සිටි ඉණිකුණු "මොවුහු මා අයත් දූය පැහැර ගණිත්"යි හඬලමින් සිවුර හැම තැන දුවන්නට වන.

බුදුරජානන් වහන්සේ ගඳකිළියෙහි වැඩහුන් සේක් ම දිව කණින් ඒ ඉණිකුණුගේ හැඬීම අසා "ආනන්ද! තිස්සගේ සිවුරු පිරිකර සත් දවසක් ගත වනතුරු නො බෙද, බැහැර තබන්නට කියව"යි වදාළ සේක. උන්වහන්සේ එසේ කර වූහ. ඉණිකුණු සත්වන දා කලුරිය කොට ඉණිකුණු අත්බවෙන් මිදී තුසිත දෙව්ලොව උපන. බුදුරජානන් වහන්සේ අටවන දා "තිස්සගේ සිවුරු පිරිකර බෙද ගණිවු"යි නියම කොට වදාළ සේක. භික්ෂූහු එසේ කළහ. "කුමක් හෙයින් බුදුරජානන් වහන්සේ තිස්ස තෙරුන්ගේ සිවුරු පිරිකර සත් දවසක් නො බෙද තබන්නට නියම කොට අටවනදා බෙද ගන්නට නියම කළ සේක් දැ?"යි භික්ෂූහු කතාවක් ඉපද වූහ. උන්වහන්සේ ඔවුන් වෙත වැඩම කොට "මහණෙනි! තමුසේලා කුමක් ගැණ කතා කරන්නහු දැ?"යි අසා වදාළ කල්හි ඔවුහු "තිස්ස තෙරුන්ගේ සිවුරු පිරිකර බෙදීමෙහි ලා බුදුරජුන් කළ නියමය ගැණැ"යි සැළ කළහ. "මහණෙනි! තිස්ස කලුරිය කොට ඔහු අළුත මසා ගත් සිවුරෙහි ඉණිකුණුව ඉපද, තමුසේලා ඒ සිවුර බෙදන්නට ගත් ඇසිල්ලෙහි ම මූලා මාගේ සිවුර බෙද ගණිති' යි හඬමින් වැලපෙමින් සිවුර හැම තැන දුවන්නට වන, තමුසේලා ඒ වේලෙහි සිවුර බෙද ගත්තහු නම්, ඉණිකුණා තමුසේලා කෙරෙහි උපදවන ක්‍රොධයෙන් සිත දූෂිත කොට ගෙණ අපායයෙහි උපදිනු ඇත, ඒ නිසා එදා සිවුරු බෙදීම නවතාලන්නට නියම කෙළෙමි, දැන් ඉණිකුණා මැරී ගොස් තුසිත දෙව්ලොව ඉපිද සිටුනා බැවින් තමුසේලාට සිවුරු බෙද ගන්නට අනුදන්නා ලදැ"යි වදාළ සේක.

ඉක්බිති ඒ භික්ෂූන් වහන්සේලා "ස්වාමීනි! මේ තණ්හාව ඒකාන්තයෙන් ඉතා බිහිසුණු ය, ඉතා බියකරු ය"යි කී කල්හි "එසේය, මහණෙනි! සත්ත්වයාහට තණ්හාව විපත් කර ය, යම්සේ යකඩින් නැගි මල එම යකඩය කා විනාශ කෙරේ ද, වැඩකට ගන්නට නො හැක්කක් කෙරේ ද, එපරිද්දෙන් ම මහණෙනි! මේ තණ්හාව ලෝ වැසි හැම සතුන්ගේ ඇතුළත ඉපද ඔවුන් නරකාදියෙහි උපදවා විනාශයට පමුණුවා"යි වදාරා මේ ධම්දෙශනාව කළ සේක.

**අයසාව මලං සමුට්ඨිතං තදුට්ඨාය තමෙව ඛාදති,**
**එවං අතිධොනචාරිනං සකකම්මානි නයන්ති දුග්ගතින්ති**

යකඩින් ම නැගුනු මලය එයින් ම නැගී එය ම යම්සේ කා දමා ද, එසේ සිවුපසය නො පස්විකා වළඳන මහණහු සවකීය වූ ඒ පාපකර්මයෝ දුගතියට පමුණු වන්නාහු ය.

**අයසා එව මලං සමුට්ඨිතං** = යකඩින් ම නැගුනු මලකඩ.

**අය** (අයස්) නම්: අද ව්‍යවහාරයෙහි එන යකඩ ය. ඒ ලෝහයෙකි. **පදසාධනටීකා**යෙහි කාලලෝහය යි කියන ලදී. **අය** ශබ්දය මනොගණික බැවින් **අයසා** යි සිටියේ ය. ශබ්ද ශාස්ත්‍රයෙන් විස්තර දත හැකි ය. මේ ලෝහය මිනිසුනට අතිශය ශ්‍රෙෂ්ඨ වූ රසායනයෙක් ද වෙයි. ආයුෂය දෙන්නේ ය. බලවීර්‍ය්‍ය දරන්නේ ය. රෝග නසන්නේ ය. මද වඩන්නේ ය. එහෙයින් අයස් (යකඩ) සමාන කිසිත් ද්‍රව්‍යයෙක් නැතැ යි ද වෛද්‍යශාස්ත්‍රයෙහි දක්වන ලද්දේ ය.

"ආයුඃ ප්‍රදතා බලවීර්‍ය්‍යධාතා
රෝගාපහර්තා මදනස්‍ය කර්තා,
අයඃසමානං න හි කිඤ්චිදස්ති
රසායනං ශ්‍රෙෂ්ඨතමං නරාණාම්"

යනු එහි ආයේ ය.

**තතො උට්ඨාය තං එව ඛාදති** – එයින් නැගී එය ම කා දමන්නේ ය.

මෙයින් වදාළේ යකඩයෙහි හටගන්නා යකඩ මලයෙන් ම යකඩය නැසී යන බව ය. යකඩ මලය යකඩය ම කා දමන බව ය.

**එවං අතිධොනචාරිනං** = එසේ ම සිවුපසය ප්‍රත්‍යවෙක්ෂා නො කොට වළඳන මහණහු.

ධොන නම්: සිවුපසය යි. **"ධොනා වුච්චන්ති චත්තාරො පච්චයා"** යනු අටුවා. ශාසනික භික්ෂූන් විසින් සිවුපසය වැළඳිය යුත්තේ එහි ආදීනව – ආනිසංස සැලකීමෙනි. මේ සිවුපසය මේ පිණිසය යි ප්‍රත්‍යවෙක්ෂා කොට සලකා වැළඳීමෙහි නුවණින් තොර වූ ප්‍රත්‍යවෙක්ෂා කොට වළඳන නුවණින් බැහැර වූ මහණ, **අතිධොනචාරී** නම්. සසර බිය දක්නා සුලු ව වසන්නා වූ ඉතා සුලු වරද පවා මහත් කොට ගන්නා භික්ෂූන් වහන්සේ සිවු-පසයෙහිලා නුවණින් දන "ශිතොෂණ නසනු පිණිස මැසි මදුරු අවුසුලන් නයිපොළොන් ඈ උවදුරු නසනු පිණිස, ලජ්ජාස්ථාන වසාගණු පිණිස මම සිවුරු දරමි, කෙළිසෙල්ලම් පිණිස

මද වැඩීම පිණිස, තරබාරුවනු පිණිස, උනුතැන් පුරවනු පිණිස, සැරසීම පිණිස ආහාර නො ගණිමි, යත්තමකින් සිරුර පවත්වා ගණු පිණිස, සාපිපාසා දුක් නසනු පිණිස, බඹසර රැකීම පිණිස බඩගිනි වේදනා නසනු පිණිස, දුක් වේදනා නො ද උපදවනු පිණිස මම ආහාර ගණිමි, ශීතොෂ්ණ නසා මැසි මදුරු අව් සුළං නයි පොළොන් ඈ උවදුරු නසා සෘතුපීඩා නසා වග වලස් බිය නසා සිත එකඟ කරණු පිණිස මම සෙනසුන් සෙවනය කරමි, හැමකල්හි උපදනා දුක්වේදනා නසා නීරොග වනු පිණිස බෙහෙත් පිරිකර ගිලන්පස මම ගණිමි”යි මෙසේ ප්‍රත්‍යවෙක්ෂා කරන්නාහ.

**සකකම්මානි නයන්ති දුග්ගතිං** = ස්වකීය පාපකර්මයෝ දුගතියට පමුණු වන්නාහ.

මෙසේ සිවුපසය පස්විකා වැළඳිය යුතු වුව ද එසේ වළඳන නුවණින් තොර වූ මහණ අතිධොනචාරී වූයේ ආශායෙන් මැඩී කළ අකුශල බලයෙන් දුගතියට යන්නේ ය යි වදාළ සේක.[1]

ධර්මදෙශනාවගේ අවසානයෙහි බොහෝ දෙන සෝවන් ඵලාදියට පැමිණියාහුය.

**තිෂ්‍යස්ථවිර වස්තුව නිමි.**

1. 1 12. ‘දුග්ගතිං ගතො’ යනු බලනු.

# ලාලුදායී ස්ථවිරයන් වහන්සේ

**18 — 4**

**බුදුරජාණන්** වහන්සේ සැවැත් නුවර වැඩවසන දවස්හි එහි පස්කෙළක් පමණ ආර්යශ්‍රාවකයෝ විසූහ. ඔවුහු පෙරවරුයෙහි දන්පින්කම් කොට පස්වරුයෙහි ගිතෙල් තලතෙල් මී උක්හකුරු හා සිවුරුපිළී ඈ ගෙණ විහාරයට ගොස් බණ අසන්නෝ ය. බණ අසා පෙරළා යන ගමනේදී සැරියුත්-මුගලන් දෙනමගේ ගුණ කියමින් යන්නාහ. මේ කතාව ඇසූ ලාලුදායී ස්ථවිර තෙමේ ඔවුන් ගෙන්වා "හොඳයි, මොවුන්ගෙන් බණ අසා තමුසේලා මෙසේ ගුණ කියමින් යන්නහුය, මාගෙන් බණ ඇසූදාට මා ගැණ කුමක් කියන්නහු ද? කියන්නට යමෙක් ඉතිරි වේ දැ?"යි ඇසී ය. ඒ මිනිස්සු ලාලුදායී තෙරුන් කී මේ කතාව අසා "මෙසේ කියන මොහු ද ධර්මකථිකයකු විය යුතු ය, අප මොහුගෙන් ද බණ ඇසිය යුතු ය"යි දවසක් දන් දී තෙරුන් වෙත ගොස් "ස්වාමීනි! අද අප බණ අසන දවස ය, අද අපි සඞ්ඝයාට දන් දුනිමු, ඔබවහන්සේ අද අපට දහම් දෙසන්නට ඕනෑ ය"යි දහම් දෙසන්නට ආරාධනා කළහ. ඔහු ද ඒ ආරාධනාව පිළිගත්තෝ ය. දහම් දෙසන වේලාව පැමිණි කල්හි ඔවුහු තෙරුන් වෙත ගොස් "ස්වාමීනි! දැන් දහම් දෙසන වේලාව ය, එහෙයින් දහම් දෙසන්නට වඩිනු මැනැවැ"යි දන්වා සිටියහ. ලාලුදායී ස්ථවිර, විසිතුරු විජිනිපතක් අතට ගෙණ බණ අසුන් අරාහිඳ විජිනිපත සලමින් එක් ම බණපදයකුත් සිතා මතා ගත නො හී "මම පෙළ කියන්නෙමි, අනිකකු ලවා එහි අරුත් කියවා ගණිමු"යි බණ අස්නෙන් බිමට බැස්සේ ය. එවිට බණ අසන්නට රැස් ව හුන් මිනිස්සු අනෙකකු ලවා බණ කියවා ගෙණ නැවැතත් පෙළ කියවා ගන්නට ලාලුදායී තෙරුන් බණඅස්නට නැංවූහ. එවර ද ඔහු කියයුතු කිසිවක් නො දැන "මම රෑ බණ කියන්නෙමි, අනෙකකු ලවා පෙළ ද කියවා ගණිමු"යි බණ අස්නෙන් නැගී ගියේ ය. ඔවුහු තෙරුන් කී ලෙසට අනෙකකු ලවා පෙළ ද කියවා ගෙණ "රෑ බණ කියන්නැ"යි තෙරුන් බණ අස්නට නංවාලූහ. රෑත් බණ කියා ගත නො හැකි වූ ඔහු "මම එළිවන යාමයෙහි කියන්නෙමි, දැන් අනෙකකු ලවා කියවා ගන්නැ"යි කී ය. ඒ වර උපාසකවරු රෑ අනෙකකුලවා කියවා ගෙණ එළිවන යාමයෙහි තෙරුන් කැඳවූහ. ඔහුට ඒ වරත් බණ කියන්නට නො හැකි වි ය.

එ වේලෙහි බණහලෙහි මහත් ගාලගොට්ටියෙක් නැගිනි. රැස්ව හුන් මිනිස්සු ද ගල් කැට දඬු මුගුරු ආදිය ගෙණ

“මෝඝයා! ඔබ සැරියුත් මුගලන් දෙනමගේ ගුණ කියනු ඉවසා ගත නො හී මමත් බණ කියන්නෙමි, මාගෙන් ද බණ අසවු, කියා අවුත් දැන් කුමක් හෙයින් බණ නො කියහු දැ”යි තැති ගන්වා පන්නා දැමූහ. ඔවුහු පලා යන්නා වූ ඔහු ලුහුබැන්දූහ. ලාලුදායී තෙර පලා යනුයේ වැසිකිළිවළෙක වැටුනේ ය. ඒ අතර රට වැස්සෝ “අද ලාලුදායී, සැරියුත් - මුගලන් තෙරුන්ගේ ගුණ කියන කල්හි එය ඉවසා ගත නො හැකි ව ‘මමත් බණ කියන්නට දත් ධර්මකථිකයෙක්මි’යි තමන්ගේ උගත්කම් පෙන්වා මිනිසුන් මුළා කොට, ඔවුන් ද පිදිවිලි ගෙණ බණ අසන්නට රැස් ව හුන් කල්හි සතර වරක් ම බණ අසුන් අරා හිඳ කියයුතු කිසිත් බණක් නො දැන අපගේ උතුම් සැරියුත් - මුගලන් තෙරුන් හා එකට එක කරන්නට ආවහු’යි කැට දඬු මුගුරු ආදිය ගෙණ තැති ගන්වා පන්නා හරිණලදුව වැසිකිළිවළෙක වැටු-නේය”යි රට සැම තැන කතා කරන්නට වූහ. බුදුරජානන් වහන්සේ භික්ෂූන් අමතා, “මහණෙනි! රට වැසියා අතර ලාලුදායී ගැණ කතාවක් පැතිර ගොස් තිබෙනු අසන්නට ලැබේ, ඒ කිමැ?” යි අසා වදාළ සේක. භික්ෂූහු එ පුවත සැලකළහ. “මහණෙනි! උදායී අසුචිවළ වැටුනේ අද පමණක් නො වේ, පෙරත් අසුචිවළ වැටුනේ ය”යි එ පුවත දක්වන සේක්:

“සබඳ! මම සිවුපා – සබඳ! නො ද සිවුපායෙහි,
සිහ! එව නවාතැන් ගණු – කිම බියව පැන යන්නෙහි?,

අපිරිසිදු කුණුලොම් – දුගඳ ඇතියෙහි හූරු,
මා හා යුද කැමැති නම් – දිනුම් දෙන්නෙම් තාහට”යි

මේ ජාතකය විස්තර විසින් වදාළ සේක. ශාරිපුත්‍ර මහාස්ථවිරයන් වහන්සේ එදා සිංහ වූහ. ලාලුදායී ඌරා විය. නැවැත බුදුරජානන් වහන්සේ “මහණෙනි! ලාලුදායී යම්තම් බණදහමක් උගත්තේ ය, එහි ද පුනපුනා හැදෑරීමෙක් නො වී ය, ස්වල්ප විසිතුරු උගත් යමෙක් වේ නම් එය නො හැදෑරීම එයට මලැ”යි වදාරා මේ ධර්මදේශනාව කළ සේක.

**අසජ්ඣායමලා මනතා අනුට්ඨානමලා ඝරා,**
**මලං වණ්ණස්ස කොසජ්ජං පමාදො රක්ඛතො මලන්ති,**

හදාළ ශාස්ත්‍රයෝ නො හැදෑරීම මල කොට ඇතියහ. ගෘහයෝ වීර්‍ය්‍ය නො කිරීම මල කොට ඇතියහ. ශරීරවර්ණයට කුසීත බව කිලිටෙක. යමක් රක්නාහට ප්‍රමාදය කිලිටෙක.

**අසජ්ඣායමලා මනතා** = හදාළ ශාස්ත්‍රයෝ නො හැදෑරීම මල කොට ඇතියහ.

ශාස්ත්‍රය – විද්‍යාව – වේදය – වේදගීතය – රහස්සාකච්ඡාව – යක්ෂාදීන්ගෙන් වන උවදුරු වළකාලීම පිණිස තන්ත්‍රාදියෙහි දක්වූ අක්ෂරරචනාවිශේෂය හා සූක්‍ෂ්ම ශිල්ප අතුරෙහි හෙන යම් එක් ශිල්පයක්, මන්ත්‍ර විසින් ගන්නැයි ධර්මශාස්ත්‍රයෙහි දක්වන ලද්දේ ය.

තමන් මැනැවින් උගත් ධර්මශාස්ත්‍රශිල්පයෝ ආසෙවන – භාවන – සජ්ඣායන – අනුයොග – විසජ්ජන විසින් පුන පුනා නො හැදෑරීමෙන් නො විමසීමෙන් වැඩකට ගත නො හැකිලෙසින් මල බැඳී ගන්නාහ. අමතක ව යන්නාහ. ඒ මල බැඳුනු උගත් කම වැඩ පිණිස නො වැටෙන්නේ ය. එහෙයින් ඒ උගත් ශාස්ත්‍රයෝ **අසජ්ඣායමල** යි වදාළ සේක.

**අනුට්ඨානමලා ඝරා** = ගෘහයෝ වීර්‍ය්‍ය නො කිරීම මල කොට ඇතියහ.

මිනිසුන් විසින් වාසය පිණිස ගොඩ නගා ගත් ගෙවල් **ඝර** නම් වෙත්.[1] ගෙයි වසන්නෝ අලසයෝ වෙත් නම් ගෙයි කැඩුම් බිඳුම් නැවැත නැවැත පිළිසකර නො කෙරෙත් නම් කල් යන කල්හි ඒ ගෙය වඩවඩාත් දිරුම් කඩට යන්නේ ය. වාසයට නො සුදුසු වන්නේ ය. නිශ්ශ්‍රීක වන්නේ ය. ගෙයි වසන්නෝ ද හැම යසසින් පිරිහෙන්නෝ ය. ඇද වැටෙන්නෝ ය. එහෙයින් ගෙයි වසන්නෝ උත්‍ථානවීර්‍ය්‍ය රහිත වූවාහු නම් නැඟී සිටිමෙහි වීර්‍ය්‍යයෙන් තොර වූවාහු නම් එබන්දන් වසන ගෘහයෝ **අනුට්ඨානමල** නම් වෙත්. ගෙයිවැස්සෝ ගැණෙන්නෝ උපචාර විසිනි.

**මලං වණ්ණස්ස කොසජ්ජං** = සිරුරුපැහැයට කුසීතබව කිළි–ටෙක් වේ.

සිරුරුපැහැය නැසී යෑමට කුසීතබව කරුණු වන්නේ ය. ඇතැම් ගිහි–පැවිද්දෝ අලසකම නිසා සුදුසු කාලයෙහි නෑම් සේදීම් නො කරන්නෝ ය. ඩහදියෙන් දූවිලියෙන් කිලිටි වූ සිරුරු ඇතිව රෙදිපිළි ඇතිව වසන්නෝ ය. සුදුසු වේලෙහි ඌර්‍ධ්වවිරේචන – අධොවිරේචනාදිය නො කරන්නෝ ය. හිස රැවුළු නො සිඳ වන්නෝ ය. නියපොතු කපා හැර අත්පා පිරිසිදු නො කරන්නෝ ය. දත් පිරිසිදු නො කරන්නෝ ය. මෙබන්දන්

1. 5. 14. 'ආවාසෙසු ච' යනු බලනු.

ඇඟ ගැටී හමන වාතයෝ දුගඳින් මුසු වූවෝ ආසනනයෙහි සිටියවුන්ගේ හිස්මොළ කකියා වත්නෝ ය. එහෙයින් බුදුරජාණන් වහන්සේ කුසීතබව සිරුරුපැහැයට කිලිටැයි වදාළ සේක.[1]

**පමාදෙ රක්ඛතො මලං** = රක්නාහට ප්‍රමාදය කිලිටෙක් වේ.

කෙත්වත් ගේදෙර ගෙරිසරක් මිලමුදල් ඈ රකින්නෝ පමායෙන් කල් ගෙවත් නම් එහි රැක්මෙහි උත්සාරහිත වෙත් නම් ඒ හැම නැසී යනු ඉදිරියෙහි නො වැඩෙනු එකාන්ත ය.

පමාබවෙන් කල් යවන්නහුගේ මේ හැම දූයෙක් නැසීමට යන්නේ ය. ගෙරිසරක් නො තොට වැටීමෙන් වගවලසුන්ට අසුවීමෙන් සොරුන්ගේ පැහැර ගැන්මෙන් අන්හු අයත් කෙත් වතුවලට වැදීමෙන් විනාශයට යනු නො වැළකිය හැකි ය. තෙමේ ද දඩගැසුම් ඇණුම් බැණුම්වලට ලක් වන්නේ ය. එසේ ම පැවිද්දෙන් සදෙර නො රක්නෝ කෙලෙසුන්ට යටත් ව ශාසනික ගුණධර්මයන්ගෙන් ඇද වැටෙන්නෝ ය. එහෙයින් ප්‍රමාදය විනාශය එළවන බැවින් මලයෙකැයි වදාළ සේක.[2]

ධර්මදේශනාවගේ අවසානයෙහි බොහෝදෙන සෝවන්පලාදියට පැමිණියාහු ය.

**ලාළුදායී ස්ථවිර වස්තුව නිමි.**

1. 1. 6. 'කුසිතං' යනු බලනු.
2. 2. 6. 'පමාදෙ' ,, ,,

# සොරසැමියන් සොයා ගිය ගැහැණි

## 18 — 5

**බුදුරජාණන්** වහන්සේ වෙළුවන මහාවිහාරයෙහි වැඩ වසන එක් සමයෙක්හි එහි එක් කුලපුත්‍රයක්හට සමානජාති ඇති එක් කුල කුමරියක සරණ කොට ගෙණ ආහ. ඕ වෙසඟනක් වූ ය. ගෙණ ආ දා සිට කිසිත් විළිබියක් නැති ව සොර සැමියන් කරා යන්නී ය. ඇයගේ ස්වාමිපුත්‍ර වූ ඒ කුලපුත්‍ර තෙමේ තම බිරිය සොර සැමියන් කරා යෑමෙන් හටගත් ලජ්ජා ඇතියේ කිසිවකුගේ ඉදිරියට යන්නට නො හැකි ව බුද්ධොපස්ථානයට යෑම පවා හැර දමා ගෙයි හිඳ කිහිප දවසක් ගතවූවාට පසු බුදුරජුන් වෙත එළැඹැ වැඳ පසකට වි හුන්නේ ය. බුදුරජාණන් වහන්සේ "කිම, උපාසක! ටික දවසක් මෙහි නො ආවහු?"යි අසා වදාළ කල්හි "ස්වාමීනි! මාගේ බිරිය ගෙට ආ දා සිට ම සොර සැමියන් කරා යන්නී ය, එයින් ලජ්ජාවට පත් මම කිසිවකුගේ ඉදිරියට යන්නට නො හැකි ව ගෙයි ම හුන්නෙමි"යි කී ය. "උපාසක! පෙරත් මා, බෝසත් අවදියෙහි මෙබන්දක් නිසා මා වෙත පැමිණි තමුසේට, ගැණු, උස් පහත් දිළිඳු නො දිළිඳු හැඩ වැඩ ඇති නැති කවුරුත් දිය නාන පැන්තොට ආදියට සමානයහ, එහෙයින් ගැණුන් කෙරෙහි විශ්වාසය නො තැබිය යුතු ය, එසේ ම ඇලා කෙරෙහි නො කිපිය යුතු ය යි තමුසේට කියන ලද්දේ ය, තමුසේ භවයෙන් වැසී ගිය එය නො සලකා තැවෙත්නහු ය"යි වදාළ කල්හි "ඒ ඉකුත් පුවත වදාරණු මැනැවැ" යි ඔහු විසින් ආරාධිත වූ බුදුරජාණන් වහන්සේ:

"ගඟ මග අවන්හල – ගිමන්හල පැන් බොන තැන්,
උස් පහත් හැම දෙනහට – පොදු වේ ද යම්සේ ලොව.

එමෙන් මේ ගැණුන් – උස් පහත් හැම දෙනහට,
පොදු වෙත් එයින් උන්හට – කුලහසරඹුම් නැත්තේ,,

යි මෙසේ ඒ පුවත විස්තර කොට "ගැණුන්ට පරපුරුෂයන් කරා යෑමත් දන් දෙන්නහුට මසුරු කමත් එලොව මෙලොව දෙක්හි සත්ත්වයන් විසින් කරණු ලබන පව්කමුත් උන් උන් නසාලන අරුතින් මල ය, අවිද්‍යාව වනාහි ඒ හැම මලයක් හැම කිලුටක් අබිබවා සිටුනා බැවින් බලගතු මලය" යි වදාරා මේ ධම්දෙශනාව කළ සේක.

**මලිත්ථියා දුච්චරිතං මච්ඡෙරං දදතො මලං,**
**මලා වෙ පාපකා ධම්මා අස්මිං ලොකෙ පරම්හි ච.**

**තතො මලා මලතරං අවිජ්ජා පරමං මලං,**
**එතං මලං පහාත්වාන[1] නිම්මලා හොථ භික්ඛවොති.**

සත්‍රියට දුශ්චරිතය මලයෙක් වේ. දන් දෙන්නහුට මසුරු බව මලයෙක් වේ. අකුශල ධර්මයෝ මෙලොව ද පරලොව ද ඒකාන්ත යෙන් මලයෝ ය.

මහණෙනි! ඒ හැම මලයට වඩා අධිකතර මලයක් තමුසේලාට කියමි. අවිද්‍යාව මහත්ම මලය යි. මේ අවිද්‍යා මලය පහ කොට මලරහිත වවු.

**මලං ඉත්ථියා දුච්චරිතං** = සත්‍රියට දුශ්චරිතය මලයෙකි. කිලුටෙකි.

මල නම් කිමැ යි යට කියන ලද්දේ ය. **ඉත්ථී** නම්: පුරුෂයන් පතන්නී ය. පුරුෂයන් විසින් පතනු ලබන්නී හෝ ය. පරකිය ග්‍රන්ථයන්හි සත්‍රීහු, **පද්මිනී – චිත්‍රී – ශංඛිණී – හස්තිනී** යි කොටස් සතරකට බෙදා දක්වන ලදහ. එහි ම මැලාගේ ලක්ෂණ ද කියා ඇත්තේ ය. ඒ එයින් දතයුතු ය.

**දුච්චරිත** නම්: මෙහි සත්‍රීන් විසින් සොර සැමියන් සෙවීම ය. සොර සැමියන් සෙවනය කරන්නී නියම හිමියා විසින් බැහැර ලන්නී ය. හෙතෙමේ ඇයට වධ හිංසා පමුණුවන්නේ ය. තලන්නේ ය. කොටන්නේ ය. බණින්නේ ය. මවුපියෝ ද "නී අපගේ කුලය කෙලසන්නී ය, නී ඇසින් දක්ම ද අපට නොද රුස්නේ ය" යි ගෙයින් පන්නා හරින්නෝ ය. එයින් ඕතොමෝ අනාථ ව හැසිරෙන්නී මහත් දුකට වැටෙන්නී ය. මේ මෙය කියූ සැටි:– **"අතිචාරිනිං පි ඉත්ථිං සාමිකොපි ගෙහා නීහරති. මාතාපිතුනන්නං සන්තිකං ගතම්පි ත්වං කුලස්ස අඞ්ගාරභූතා අක්ඛීහිපි න දට්ඨුං පිහෙමාති තං නීහරති, සා අනාථා විචරන්තී මහාදුක්ඛං පාපුණාති"** යනු. මේ මෙලොව දී ලැබෙන ස්වල්ප මාත්‍ර විපාකයෙකි. පරලොව අපායයෙහි උපදින්නී ය. සත්‍රියට පරපුරුෂ සෙවනය මලයෙකැ යි වදාළෝ මෙලොව පරලොව දෙක්හි ම මේ හෙතුවෙන් දුකට වැටෙන බැවිනි. පුරුෂයිනට ද පරසත්‍රී සෙවනය මලැ යි දතයුතු ය.

**මච්ඡෙරං දදතො මලං** = දන් දෙන්නහුට මසුරුබව මලයෙකි.

"දන් දෙමි" යි සිතන්නහුට යම් ලෙසකින් මසුරු බවෙක් සිතෙහි උපන්නේ නම් ඒ මසුරු සිත, දෙමි යි නැගී ආ සිත යටපත් කරන්නේ ය. එහෙයින් ඔහු පිණෙන් පිරිහෙන්නේ ය. එකල

1. පහන්ත්වාන යනු සමහර තැනක.

ඔහු එලොව මෙලොව දෙක්හි ම හැම සැපතින් පිරිහෙනු ඒකාන්ත ය. **“ඛෙත්තකසනකාලෙ ඉමස්මිං ඛෙත්තෙ සම්පන්නෙන සලාකභත්තාදීනි දස්සාමීති චින්තෙත්වා නිප්ඵන්නෙ සස්සෙ මච්ඡෙරං උප්පජ්ජිත්වා චාගචිත්තං නිවාරෙති, සො මච්ඡෙරවසෙන චාගචිත්තෙ අවිරූහන්තෙ මනුස්සසම්පත්තිං දිබ්බසම්පත්තිං නිබ්බානසම්පත්තින්ති තිස්සො සම්පත්තියො න ලභති”** යනු අට්ඨකථා ය. එහෙයින් දන් දෙන්නහුට මසුරුබව මලයෙක් වේ.[1]

**මාලා වෙ පාපකා ධම්මා** = අකුශල ධර්මයෝ ඒකාන්තයෙන් මලයෝ ය.

**අස්මිං ලොකෙ පරම්හි ච** = මෙලොවෙහි ද පරලොවෙහි ද.

මෙලොව පරලොව දෙක්හි අකුශලධර්මයෝ අකුසල් කරන්නහු දෙලොවෙහි ම හැම සැපතින් පිරිහෙලන බැවින් ඒකාන්තයෙන් මලයෝ වෙත්.

**තතො මලා මලතරං** = ඒ හැම මලයට වඩා දූෂිමලයක් (කියමි)

**අවිජ්ජා පරමං මලං** = අවිද්‍යාව මහත් මලය වේ.

**එතං මලං පහන්ත්වාන නිම්මලා හොථ භික්ඛවො** = මහණෙනි! මේ මලය පහ කොට මලරහිතයෝ වවු.

මහණෙනි! මේ හැම මලයට හැම කිලුටට වඩා ඉතා දූෂි මලය මම තමුසේලාට කියන්නෙමි. අවිද්‍යාව එහිලා දූෂි මලය යි දත යුතු ය. මේ මලය හැම කෙලෙස් මලයනට මුල් ව සිටියේ ය. එහෙයිනි මෙය හැම මලයක් යට කොට සිටුනා දූෂි මලය වනුයේ. මෙය සසර දිග් ගැසීමෙහි මූල හෙතු ය. මහණෙනි! සසර දුක් නැසීමට මේ අවිද්‍යා මලය නැසිය යුතු ය. එය නැසිය යුත්තේ රහත්මග නුවණින් ය. ඒ නුවණින් මෙය පහ කොට නසා හැර මලරහිතයන් වීම තමුසේලාගේ පරම යුතුකම ය.

**අවිජ්ජා** නම්: සිවුසස් දම් වසාලන බලවත් මෝහය යි. පුරන්නට නො සුදුසු බැවින් කාය දුශ්චරිතාදිය අවින්දිය නම්. නො පිරිය යුතු නො විඳිය යුතු ඒ කායදුශ්චරිතාදිය විඳුනා බැවින්, විඳිය යුතු පිරිය යුතු කායසුචරිතාදිය නො විඳුනා බැවින්, ස්කන්ධයන්ගේ සමූහ භාවය ආයතනයන්ගේ ආයතනභාවය ධාතූන්ගේ ශූන්‍ය - සුඛ - සුභාදිශූන්‍යභාවය ඉන්ද්‍රියයන්ගේ අධිපතිභාවය සත්‍යයන්ගේ තථභාවය නො දන්නා බැවින්, දුඃඛසමුදයාදීන්ගේ

1. 13 10 ‘කදරියො’ බලනු.

පීඩනාදි අර්ථ නො දන්නා බැවින්, සසර, යොනි - ගති - භව - විඥානස්ථිති - සත්ත්වාවාසයන්හි සත්ත්වයන් දුවවන බැවින් අවිද්‍යමාන වූ ස්ත්‍රී - පුරුෂාදි සම්මුති ධර්මයන්හි දුවවන බැවින්, විද්‍යමාන වූ ස්කන්ධාදීන්හි නො පවත්නා බැවින්, චක්ෂුර්විඥානාදීන්ගේ චක්ෂුප්පසාදාදිවස්තු හා රූපාදි ආරම්මණ ද අවිජ්ජාදි පටිච්චසමුප්පාද ධර්ම හා සඞ්ඛාරාදිපටිච්චසමුප්පන්න ධර්මයන්ගේ ද ඒ ඒ ස්වභාවයන් මුවහ කරණ බැවින් ඒ බලවත් මොහය අවිජ්ජා නම් වේ. මේ වනාහි ව්‍යඤ්ජනාර්ථ විසින් හා ස්වභාවාර්ථ විසින් අවිජ්ජා යනු තේරූ සැටියි[1]

ධර්මදෙශනාවගේ අවසානයෙහි බොහෝ දෙන සෝවාන්පලාදියට පැමිණියාහු ය.

**අන්‍යතර කුල පුත්‍ර වස්තුව නිමි.**

---

1. 11. 8. 'ගහකූටං විසංඛිතං' යනු බලනු.

# වෙදකම් කළ මහණෙක්

## 18 — 6

**ශාරිපුත්‍ර** මහාස්ථවිරයන් වහන්සේට **චූලසාරික** නම් සද්ධිවිහාරිකයෙක් වූයේ ය. වෙදකම් කිරීමෙහි දක්‍ෂ වූ ඔහු දවසක් වෙද කමක් කොට ලැබුනු මිහිරි අහරක් ගෙණ එනුයේ අතර මග දී හමු වූ සැරියුත් මහ තෙරුන් වහන්සේට "ස්වාමීනි! මම වෙදකම් කොට හැමදා හාමුදුරුවන් වහන්සේට ආහාර සපයා ගෙණ එන්නෙමි, මෙබඳු මිහිරි ආහාර ලබනු පහසු නැත, එහෙයින් මෙය වළඳනු මැනවැ"යි කී ය. මහාස්ථවිරයන් වහන්සේ ඔහුගේ කතාව අසා කිසිත් නො බැණ නිහඬ ව වැඩි සේක. භික්‍ෂූන් වහන්සේලා විහාරයට ගොස් බුදුරජාණන් වහන්සේට එපුවත සැළ කළහ. එකල්හි උන්වහන්සේ "මහණෙනි! ලජ්ජා භය නැති අනුන් ගසා කෑමෙහි දක්‍ෂ වූ මහණ තෙමේ කවුඩකු වැනි ව එක්විසි අනෙසනයෙහි යෙදුනේ සුවසේ ජීවත් වන්නේ ය, ලජ්ජාභය දෙකින් යුත් මහණ දුකසේ ජීවත් වන්නේ ය"යි වදාරා මේ ධර්මදෙශනාව කළ සේක.

**සුජීවං අහිරිකෙන කාකසූරෙන ධංසිනා,**
**පක්ඛන්දිනාපගබ්භෙන සංකිලිට්ඨෙන ජීවිතං.**

**හිරිමතා ච දුජ්ජීවං නිච්චං සුචිගවෙසිනා,**
**අලීනෙනාපගබ්භෙන සුද්ධාජීවෙන පස්සතා'ති.**

පවෙහි විළිබිය රහිත වූ ගසා කෑමෙහි ශූර කවුඩකු වැනි වූ මෙර මා ගුණ මකන ගෙන්ගෙට දුවන සුලු බුහුටි වූ කිලිටි දිවි වැටුම් ඇති මහණහු විසින් ජීවත්වීම සුවසේ කට හැකි ය.

පවෙහි විළිබිය ඇති පිරිසිදු වූ කාය කර්මාදිය නිතර සොයන සුලු දිවි වැටුමෙහි නො ඇලුනු බුහුටි නො වූ පිරිසිදු දිවිවැටුම් ඇති එය ම සරු කොට දන්නා මහණහු විසින් ජීවත්වීම දුකසේ කට යුතු ය.

**සුජීවං** = ජීවත්වීම සුවසේ කට හැකි ය. සුවසේ ජීවත් විය හැකි ය.

**අහිරිකෙන** = විළිබිය නැති.

**අහිරිකෙන** යන්නට විළිබිය නැතැ යි කීයේ බිය ද මෙහි ලා ගැණෙන බැවිනි. **"ඡින්නහිරොත්තප්පෙන"** යනු අටුවා. විළිබිය නැත්තහුට නො කළැකි පහත් වැඩෙක් නැත්තේ ය. විළිබිය නැත්තේ, මවුපිය නොවූවනට "මේ මාගේ මව, මේ මාගේ පිය, මේ මහපිය, මේ සුලුපිය, මේ මහම්මා, මේ බාලම්මා, මේ

අය්‍යා, මේ මල්ලී, මේ අක්කා, මේ නගා, මේ නැන්දා, මේ මාමා යනාදී විසින් නැති නෑකම් කියමින් එක්විසි අනෙසනයන්හි පිහිටා කෑම් බීම් ඉඳුම් හිටුම් යාන වාහන ගේදොර වතුපිටි වෙහෙර පන්සල් ඔවුන්ගෙන් ලබා ගෙණ ගෙයක් ගානේ යමින් එමින් මුදල් ද උපයා ගෙණ සුවසේ ජීවත් වන්නේ ය.

**හිරි** නම්: කායදුශ්චරිතාදී වූ පව්කම් නිසා සිතේ නගිනා ලජ්ජාගතිය යි. පව්කම්හි හැකිළෙන පසුබට වන ගතිය යි. **"කායදුච්චරිතාදීහි හිරීයතීති = හිරි, ලජ්ජායෙතං අධිවචනං"** යි කීයේ එහෙයිනි. ඒ මේ හිරිතොමෝ **අජ්ඣත්තසමුට්ඨානාහිරි-අත්තාධිපතෙය්‍යා හිරි-ලජ්ජාසභාවසණ්ඨිතා හිරි-සප්පතිස්ස-ලක්ඛණා හිරි** යි සිවු වැදෑරුම් වන්නී ය.

එහි සතුන් මැරීම, හොරකම් කිරීම, මිස හැසිරීම, බොරු කීම, කේලාම් කීම, පරොස් බස් බිණීම, නිසරුබස් බිණීම, රහ මෙර බීම ඈ පව්කම් කිරීම ජාතිමත් කුලීනයන්ගේ වැඩෙක් නො වේ. එය පහත් කුලැතියන්ගේ වැඩෙකැ'යි තමන්ගේ ජාතිමහත්ත්වය කුලවත්බව සැලකීමෙන් හා, පව්කම් කිරීම කොළු-කෙල්ලන්ගේ වැඩෙක, කිසිත් උගැන්මක් නැති අඥනයන්ගේ වැඩෙක, වැඩට සුදුසු තරුණ වයසෙහි සිටියවුන්ගේත් දූන උගත්කම් ඇති නුවණැති මිනිසුන්ගේත් වැඩෙක් නො වේ. එහෙයින් මා වැනි මෝරාගිය වයසක් මෝරාගිය නුවණක් ඇති මිනිසුන් විසින් පව්කම් කිරීම නො සුදුසු ය යි තමන්ගේ තරුණ වයස ගැණ සැලකීමෙන් හා පව්කම් කිරීම, හැම තැන පසු බස්නා කිසිත් කර ගත නො හැකි දුබල මිනිසුන්ගේ වැඩෙක, හයිබල ඇති ක්‍රියායෙහි දක්‍ෂ වූ මිනිසුන්ගේ වැඩෙක් නො වේ. එහෙයින් පව්කම් කිරීම, මා වැනි ශූර වූ මිනිසක්හට නො සුදුසු ය යි තමන්ගේ ශූරභාවය සැලකීමෙන් හා පව්කම් කිරීම, අඥබාලයන්ගේ මෙ ලොව පරලොව දැනීමෙහි මූඪ වූවන්ගේ වැඩක් මිස බොහෝ ඇසූ පිරූ තැන් ඇති නුවණැති මෙලොව පරලොව දන්නා මිනිසුන්ගේ වැඩෙක් නො වේ. එහෙයින් බහුශ්‍රැත වූ මට පව්කම් කිරීම නො සුදුසු ය යි තමන්ගේ බහුශ්‍රැතභාවය සැලකීමෙන් හා පව්කම් නො කරන්නහුගේ ආත්මගෞරවය නිසා සිත්හි උපදනා ලජ්ජාස්වභාවය **'අජ්ඣත්තසමුට්ඨාන හිරි'** නම්.

තමා සැදැයෙන් පැවිදි වූ බව, බොහෝ ඇසූපිරූතැන් ඇති බව, ධුත ගුණාදිය රක්නාබව යන මේ ඈ තන්හි පිහිටා තමා අධිපති කොට ගන්නහුට උපදනා ලජ්ජාව **'අත්තාධිපතෙය්‍යහිරි'** නම් සැදැති කුලපුත් තමා අධිපති කොට අකුශලය දුරු කරයි,

කුශලය වඩයි, වරද දුරලයි, නිවරදයෙහි යෙදෙයි, පිරිසිදු සිතැති ව ජීවිතය ගෙවාල,යි යනු මෙහිලා බුදුරජානන් වහන්සේ වදාළ සේක.

එළිමහන්හි මල මූ පහ කරන්නෙක් එහි දී ලජ්ජාවිය යුත්තකු දැක ලජ්ජිත වන්නේ යම්සේ ද, එසේ ලජ්ජාසවභාවයට පැමිණ පව්කම් නො කිරීමෙහි ලා ඔහුට උපදනා ලජ්ජාව **'ලජ්ජාසභාවසණ්ඨිතහිරි'** නම්.

ජාතිමහත්තවය – ශාස්තෘමහත්තවය – දායාදමහත්තවය – බ්‍රහ්මචාරී මහත්තවය යන මේ කරුණු සිහි කොට පව්කමින් වළකින්නහුට උපදනා ලජ්ජාව **'සප්පතිස්සවලක්ඛණාහිරි'** නම්.

**ඔත්තප්ප** නම්: පව්කම් කිරීමෙහි බියවීම ය. කායදුශ්චරිතාදිය කරණ කොට වන්නා වූ බිය ය. **"තෙහියෙව ඔත්තප්පතීති =ඔත්තප්පං, පාපතො උබ්බෙගස්සෙතං අධිවචනං"** යනු කියේ එහෙයිනි. ඒ මේ ඔත්තප්පය **බහිද්ධා සමුට්ඨානඔත්තප්ප-ලොකාධිපතෙය්‍යඔත්තප්ප – භයසභාවසණ්ඨිතඔත්තප්ප – වජ්ජභීරුකභයදස්සාවිලක්ඛණඔත්තප්ප** යි සිව් වැදෑරුම් වන්නේ ය.

එහි පව්කම් කරන්නේ සිවුපිරිස්හි ගර්හාවට වැටෙන්නේ ය. නුවර වැසියා අසුචියට පිළිකුල් කරන්නා සේ පව්කම් කරන්නහුට පිළිකුල් කරන්නේ ය. ලෝ වැස්සෝ පව්කම් කරන්නහුට ගර්හා කරන්නෝ ය. සිල්වතුන් විසින් වැදගතුන් විසින් හේ බැහැර කරණ ලද්දේ ය. "මහණ! කෙසේ නම් පව්කම් කරන්නෙහි දැ"යි මෙසේ පිටතින් පැමිණෙන ගැරහුම් නින්දා දැක සිත්හි නගිනා බිය **'බහිද්ධාසමුට්ඨානඔත්තප්ප'** නම්.

"ලොකය ඉමහත් ය, එහි ඍද්ධිමත් වූ දිවැස් ඇති පරසිත් දන්නා මහණ බමුණෝ ද දෙවියෝ ද ඇත, ඔවුහු හැම කෙනෙක් 'මේ මිනිහා පැවිදිව සිටත් පව්කම් නෝබිනාකම් කෙරේ ය'යි දන්නාහු ය, එහෙයින් මා විසින් පව්කම් නො කටයුතු ය, අකුසල් නො කොට හළ යුතු ය, පිරිසිදු ජීවිතයක් ගතකළ යුතු ය'යි ලොකය දෙස බලා පව්කම් කිරීමෙහිලා සිතෙහි නගිනා බිය **'ලොකාධිපතෙය්‍යඔත්තප්ප'** නම්.

"පව්කම් කරන්නහුට සතර අපායය සිය ගෙය වැනි ය, පව්කම් කරන්නෝ මරණින් මතු එකාන්තයෙන් අපායයෙහි උපදින්නෝ ය, එහි එසේ උපන්නෝ යමදූතයන් විසින් කරණු ලබන කම්කටොලුවලට යටත්ව සිටින්නෝ ය, එහෙයින් මා විසින් කිසිත් පාපයෙක් නො කට යුතු ය"යි අවාබිය දැකීමෙන් සිතෙහි නගිනා බිය **'භයසභාවසණ්ඨිතඔත්තප්ප'** නම්.

“මම කය වචන මනස යන තිදොරින් පව්කම් කරන්නෙම් නම්, කිම, තෙමේ ඒ මට නො ගරහන්නේ ද, තෙමේ තමාට දොස් නො කියන්නේ දැ”යි තමාගෙන් තමා කෙරෙහි නගිනා දොෂාරොපණයෙන් හා එසේම එහි ලා පරුගෙන් නගිනා දොෂාරොපණයෙන් හා රජදරුවන් සොරුන් අල්ලා කරවන දෙතිස් කම් කටොලු දැක කාබුත් මරණින් මතු අපායයෙහි ඉපද විඳින දුක් දැකීමෙන් හා උපදනා බිය දැකීම ලකුණු කොට සිටි බිය **‘වජ්ජාභීරුකභයදස්සාවිලක්ඛණඔත්තප්ප’** නමි.

මෙසේ ඉතා සැකෙවින් කියූ ලොකපාලකධර්ම වූ මේ විළිබිය යමක් හට නැත්තේ නම්, ඔහු වැදූ මව ගැණ සුලුමව ගැණ නැන්දනිය ගැණ බුහුන ගැණ කෙල්ලන් ගැණ තරුණියන් ගැණ මැහැල්ලන් ගැණ තැකීමක් සැලකීමක් නො කොට එළු තිරෙළුවන් සේ කුකුළුහූරන් සේ බලු සිවලුන් සේ ගෙරිහරක් සේ වරදවා ක්‍රියා කරන්නේය. අද මිනිස්සමාජයෙහි බලු සිවලුන් අත කෙරෙණ එබඳු පහත් ලාමක නිඤු කොතෙකුත් දක්ක හැකි ය. ගැණු-පිරිමි දෙපසෙහි ම ඇතැම් දෙන මහජනසන්නිපාතස්ථා-යන්හි වේදිකා මතුයෙහි නැගී නග්නව නටන්නෝ ය. නග්නව උනුන් වැළඳ ගන්නෝ ය. ඒ ඒ අඟපසඟ විදහා දක්වන්නෝ ය. නග්නව දුවන්නෝ ය. පනින්නෝ ය. එළු තිරෙළුවන් වැනි කුකුළුහූරන් වැනි බලු සිවලුන් වැනි ගෙරිහරකුන් වැනි මේ ගැණු-පිරිමි සමාජදූෂකයෝ ය. කුලපරම්පරානාශකයෝ ය. ගුණධර්ම සිඳ හරින්නෝ ය. මොවුන්ගේ මේ විළිබිය නැති ජඩකම් බලා අසද්ධර්මයන් බලා ඉන් සෑහීමට යන්නෝ එයට රුකුල් දෙන්නෝ තුති පැසසුම් කරන්නෝ තෑගිබෝග දෙන්නෝ මොවුනට වඩා අධමයෝ ය. පාපතරයෝ ය. සමාජය වරදට හෙළන්නෝ ය. මෙසේ මහත් පව්කම්වලට තුඩු දී සිටුනා විළි-බිය යමක්හට නැත්තේ නම් හේ **අහිරිකා** නම් වේ.

**කාකසූරෙන** = ශූරවූ කවුඩකු වැනි.

**‘සඞ්කිලිට්ඨෙන’** යන්නෙන් ගැණෙන්නහු වෙසෙසා සිටියේ ය. ශූර වූ කවුඩු තෙමේ ගෙවල පිළියෙල කොට තුබූ කැඳබත් ආදී වූ යමක් ගසා කනු කැමැති ව බිත්ති අටලු ගස් අතු ඈ යම් තැනක රැඳී තුටු සිත් ඇති ව බලන්නකු මෙන් අන් තැනක යැවූ සිත් ඇත්තකු මෙන් නිදන්නකු මෙන් හිඳ ගෙවල මිනිසුන්ගේ ප්‍රමාද-යක් බලා එක්වර පියාඹා අවුත් හැළිවලන් බඳුන් ඈ යම් තැනක තුබූ දැය කට පුරා ගෙණ පැන දුවන්නේ ය.

**කාක** නම්: ගොදුරෙහි තදින් ගිජු වූ නිතර සැලෙන සැහැවි ඇති පක්ෂිවිශෙෂයෙකි. බ්‍රාහමණ-ක්‍ෂත්‍රිය-වෛශ්‍ය-ශුද්‍ර වශයෙන් මිනිසුන් සිවු කොටසක් කොට බෙදූ සේ කාකපක්ෂීහු ද ඒ සිවු කොටසෙහිලා බෙදන ලදහ. එහි සිරුරෙන් මහත් වූ, මහත් වූ දිග් තුඩු ඇති දැඩි හඬ ඇති කළුපැහැති කවුඩන් බ්‍රාහමණ යි ද, පිඟු නිල්වන් මුසු පැහැති ඇස් ඇති තියුණු හඬ ඇති ඉතා ශූර වූ කවුඩන් ක්‍ෂත්‍රියැ යි ද, පඬු නිල් පැහැති සිරුරු ඇති සුදු නිල් මුසු පැහැති තුඩු ඇති නො තද ව හඬ නගන කවුඩන් වෛශ්‍යැ යි ද, අලු පැහැති කෘශ වූ සිරුරු ඇති චපල වූ මහත් සේ හඬ නගන කවුඩන් ශුද්‍රැ යි ද බෙදූහ. කාකවිස්තරය ද ඉතා පළල් ය. පොත-පතෙහි ඒ එන්නේ ය.

**ධංසිනා** = මෙරමා ගුණ නසන.

**'සඞ්කිලිට්ඨෙන'** යන්නට විශෙෂණ ව සිටියේ ය. "අසුවල් සළුවිරයන් වහන්සේ ආශා නැතියහ" යි අසා "ඇයි, අපි ආශා නැත්තමෝ නො වෙමු දැ"යි මේ ඈ කියමින් මෙරමා ගුණ නසන්නා වූ, යන අරුත්.

මෙබන්දහුගේ කීම් බස් අසා "මෙතෙමේ ද අප්පිච්ඡතාදිගුණ-යුක්තය" යි සිතන්නා වූ මිනිස්සු මෝහට යමක් දිය යුතු ය, යි ද සිතත්. එහෙත් ඔහු එතැන් සිට නුවණැති මිනිසුන්ගේ සිත් ගැණීමෙහි අපොහොසත් වූයේ ඔවුන්ගෙන් ලත් හැම ලාභයෙන් පිරිහෙන්නේ ය. මෙසේ මෙරමා ගුණ මකන ගිහියා හෝ පැවිද්ද, තමාගේ හා මෙරමාගේ හැම ලාභ නසාලන්නේ වේ.

**පක්ඛන්දිනා** = ගෙන් ගෙට දුවන සුලු වූ. ඇතුළට වදින සුලු වූ. ගෙවලට කඩා පනින්නා වූ.

**'සඞ්කිලිට්ඨෙන'** යනු හා එක් වන්නේ ය. මෙරමා අයත් කටයුතු තමා අයත් කටයුතු සේ දක්වන මෙතෙමේ, භික්‍ෂූන් අළුයම නැගිට සැමිදුල් ඈ හැමද කමටහන් මෙනෙහි කිරීමෙන් මද වේලාවක් හිඳ නැගී ගමට පිඬු පිණිස වදනා කල්හි, මූණකට සෝදා රන්වන් කොට රැඳූ සිවුරු හැඳ පෙරව ඇස අඳුන් ගා හිස තෙල් ගැල්වීම් ආදියෙන් සිරුර සරසා ගෙණ වත් පිළිවෙත් සරුව හමදනා එකකු මෙන් මුසුන් පහර දෙක තුනක් මලුවෙහි දක්වා දෙරටු ව බලා යන්නේ ය. ගම් නුවර වැසි මිනිස්සු සැදැහිව "සෑ වඳිමු, මල් පුදමු"යි විහාරයට ආවාහු මොහු දැක "මේ විහාරය මුන්වහන්සේ නිසා රැකෙන්නේ ය, නො නැසී පවත්නේ ය, මුන්වහන්සේ සිවු පසයෙන් වෙහෙසට නො ද පැමිණෙත්වා"යි ඔහුට සිවුපසය වඩාලා දෙන්නේ ය.

**පගබ්භතා** = බුහුටි වූ. කායපාගබ්භියාදියෙන් යුක්ත වූ.

**'සඞ්කිලිට්ඨෙන'** යනු බලා සිටියේය. **කායපාගබ්භිය – වචී – පාගබ්භිය – මනොපාගබ්භිය** යි පාගබ්භිය තෙවැදෑරුම් ය. එහි සඞ්ඝ – ගණ – පුග්ගල – භොජනසාලා – ජන්තාඝර – නහානතිත්ථ – භික්ඛාචාරමග්ග – අන්තරඝර යන අට තන්හි නො සුදුසු ක්‍රියා කිරීම, නො සුදුසු සේ හැසිරීම **'කායපාගබ්භිය'** නම් වේ. යමෙක් සඟ මැද සඟළ සිවුරෙන් හෝ දෙ අතින් දෙදණ වසා අවුළුවා ගෙණ හිඳී නම්, පාපිට පා තබා හිඳී නම්, ගණයා මැද වැඩි-මහල්ලන් මැද එසේ හිඳී නම්, බොජුන්හලෙහි වැඩි මහල්ලන්ට අසුන් නො දේ නම්, නවකයන් අසුන්වලින් වළකා නම්, ගිනි-හලෙහි වැඩි මහල්ලන් නො විචාරා ගිනි දල්වා නම්, නානතොටෙහි ආ පිළිවෙළින් ස්නානය කටයුතු ය යි කළ නියමය නො සලකා පසු ව අවුත් වැඩි මහල්ලන් හා නවකයන් වළකා පළමු ව ස්නානය කෙරේ නම්, පිඬු සිඟා යැමෙහි දී අග්‍රාසන – අග්‍රෝදක – අග්‍රපිණ්ඩ ලබනු රිසියෙන් වැඩි මල්ලන් පසුපසෙහි කොට ඉදිරියෙහි යේ නම්, ගම් වැදීමෙහි ලා බාහුයෙන් බාහුව ගටා වැඩි මහල්ලන්ට පළමු ව ගම් වදී නම්, තරුණයන් හා කායක්‍රීඩා කෙරේ නම් හෙතෙමේ කයින් නො සුදුසු සේ ක්‍රියා කරන්නේ ය. හැසි-රෙන්නේය යි දතයුතු ය.

සඞ්ඝ – ගණ – පුග්ගල – අන්තරඝර යන සිවු තන්හි නො සුදුසු වදන් පැවසීම **'වචීපාගබ්භිය'** නම් වේ. සඟ මැද ගණයා මැද වැඩි මහල්ලන් ඉදිරියෙහි යමෙක් අවසර නො ලබා නො ද විචාරා බණ කියා නම්, මිනිසුන් විසින් පැණ විචාරණ ලදුයේ වැඩි-මහල්ලන් නො විචාරා එයට පිළිතුරු දේ නම්, මෙ නම් ගමෙහි කුමක් තිබේ ද? කැඳ? නොහොත් කැවිලි? තලප? මට කුමක් දෙන්නෙහි? කුමක් අද කන්නෙමු? කුමක් බොන්නෙමු? යි මේ ඈ කියා නම්, හේ වචනයෙන් නො සුදුසු සේ ක්‍රියා කරන්නේ ය නො සුදුසු වදන් පවසන්නේ ය යි දත යුතු ය.

යට කියූ ඒ ඒ තන්හි කයින් හා වචසින් වරදට නො ද පැමිණ සිතින් ම කාමවිතර්කාදීන්ගේ වශයෙන් නො සුදුසු විතැකුම් කිරීම **'මනොපාගබ්භිය'** නම් වේ. මෙසේ කය – වචස – මනස යන තිදෙරින් මෙ කියූ කායපාගබ්භියාදියෙන් යුක්ත වූයේ පාගබ්භිය නැමැයි දත යුතුය.

**සඞ්කිලිට්ඨෙන ජීවිතං** = ඉතා කිලිටි දිවි වැටුම් ඇති මහණහු විසින් ජීවත්වීම.

හිරිඹතප් සිඳී යෑම, ශූර වූ කවුඩකු මෙන් මෙරමා අයත් දෑය උදුරා ගැණිම, මෙරමා පිළිබඳ ගුණ මැකීම, අනෙසකයන්හි පිහිටා ගෙයක් ගානේ යෑම, කය – වචස – මනස යන තිදෙරින් නො සුදුසු සේ හැසිරීම, බුද්ධාදී වූ උතුමන් විසින් නින්ද කරණ ලද අන්‍ය වූත් පාපක්‍රියාවන්හි යෙදීම යන මෙයින් කිලිටි වූ පිළිකුල් කට යුතු වූ චරිත ඇති මහණ **සඞ්කිලිට්ඨ** නම්.

මෙහි ඉතා සැකෙවින් කියූ මේ හැම කරුණු ම රැඳී සිටි ජීවිත ඇත්තේ ම සඞ්කිලිට්ඨ ය යි නො ගත යුතු ය. මින් එකෙකුනුදු සඞ්කිලිට්ඨ වන්නේ ය. මේ සියල්ලෙන් හෝ නැත, මින් එකෙකින් හෝ කිලිටි දිවිවැටුම් ඇත්තහුට සුවසේ ජිවත් විය හැකි ය. "ජිවිතං, සුජීවං" යනු වදාළේ එහෙයිනි.

**හිරිමතා ච** (දුජ්ජීවං) = පවෙහි විළිබිය ඇති.

**දුජ්ජීවං** යනු මත්තෙහි සම්බන්ධයට යන්නේ ය. මෙ තෙමේ නො මව, මවැ යි නො පියහු, පියැ යි නො බුහුණ, බූහුණැ යි නො බෑයා, බෑයැ යි නො නෑයා, නෑයැ යි කිසිවිටෙකත් නො ගන්නේ ය. මේ ලාමක හැඟුම්හි නො පිහිටා ගත් මෙ තෙමේ නො දැහැමි සිවුපසය අසුචියක් සේ සලකා දැහැමින් සෙමින් සිවුපසය සොයනුයේ ගෙපිළිවෙළින් පිඬු සිඟා හැසිර අපහසුවෙන් රළු පැවැතුමෙන් ජිවිකාව කරන්නේ ය.

**නිච්චං සුචිගවෙසිනා** = නිතොර පිරිසිදු වූ කායකර්මාදිය සොයන සුලු.

**'ජසසතා'** යනු බලා සිටියේ ය. යමෙක් දව රැ දෙක්හි තමාගේ කය පිළිබඳ පිරිසිදු බව ප්‍රාණඝාතාදිපාපකර්මයන්ගෙන් වැළක්ම, වචනය පිළිබඳ පිරිසිදුබව මෘෂාවාදදිපාපකර්මයන්ගෙන් වැළක්ම, සිත පිළිබඳ පිරිසිදුබව අභිද්‍යාදි පාපකර්මයන්ගෙන් වැළක්ම සොයනුයේ **සුචිගවෙසී** නම්.

**අනලලිනෙන** = දිවිවැටුමෙහි නො ඇලුනා වූ.

මෙහි දිවිවැටුම සඳහා සිවුපසය එක් රැස් කර ගැණිමෙහි නො ඇලුනු රසවිෂයයෙහි ගෙධව පිණි පිණී දෑය සෙවීමෙහි නො ඇලුනේ **අනලලීන** නම්.

**අපගබ්භෙන** = බුහුටි නො වූ.

යට දැක් වූ කායපාගබ්භියාදී වූ තෙවැදෑරුම් පාගබ්භියෙන් තොර වූයේ **අපගබ්භ** නම්.

**සුද්ධාජීවෙන** = පිරිසිදු දිවිවැටුම් ඇත්තා වූ.

විළි-බිය දෙකින් යුක්ත වූයේ පිරිසිදු කායකර්මාදිය සොයනුයේ දිවිවැටුමෙහි නො ඇලුනේ කායපාගබ්භියාදියෙන් තොර වූයේ **සුද්ධාජීව** නම්.

**පස්සතා** = දක්නා මහණහු විසින්.

මෙසේ පිරිසිදු වූ ආජීවය ම සරු කොට සලකන ආජීව පාරිශුද්ධිය සඳහා පණවා වදාළ සිකපද දිවි ගිය ද නො කඩ කොට රක්නා වූ මහණහුට සුවසේ ජීවිත් විය නො හැකි ය. ඔහුගේ ජීවිතයාත්‍රාව තද දුකින් තද වෙහෙසින් වන බව **'දුජ්ජීවං'** යන්නෙන් වදාළ සේක.

ධර්මදේශනාවගේ අවසානයෙහි බොහෝ දෙන සෝවන්පලා-දියට පැමිණියාහු ය.

**ශාරිපුත්‍රස්ථවිර සද්ධිවිහාරිකවස්තුව නිමි.**

# පන්සියයක් උපාසකයෝ

## 18 — 7

**සැවැත්** නුවර වැසි පන් සියයක් උපාසකයෝ එක් දවසක් බුදුරජුන් වෙත ගොස් වැද එකත් පස් ව සිටියාහ. උන්ගෙන් කෙනෙක් පණිවායෙන්, කෙනෙක් අයිනාදනින්, කෙනෙක් පරඹුවන් සෙවුමෙන්, කෙනෙක් මුසවායෙන්, කෙනෙක් රහමෙරින් වැළකී සිටියහ. මෙසේ එක් එක් සිකපද රැක්කා වූ ඒ උපාසකයෝ "මා රක්නා සිකපදය රැකීම පහසු නො වේ, මම රකින්නට අපහසු නො රැකිය හැකි සිකපදය රකිමි"යි මෙසේ විවාද කරන්නෝ එබව බුදුරජාණන් වහන්සේට දන්වාලූහ. උන්වහන්සේ ඔවුන්ගේ විවාදය අසා එක් සිකපදයකුත් රැකීම පහත් නො කොට ඒ හැම එකක් රැකීම පහසු නො වේ ය"යි වදාරා මේ ධම්දෙශනාව කළ සේක.

**යො පාණමතිපාතෙති මුසාවාදඤ්ච භාසති,**
**ලොකෙ අදින්නං ආදියති පරදාරඤ්ච ගච්ඡති.**

**සුරාමෙරයපානඤ්ච යො නරො අනුයුඤ්ජති,**
**ඉධෙව පොසො ලොකස්මිං මූලං ඛනති අත්තනො.**

**එවං භො පුරිස! ජානාහි පාපධම්මා අසඤ්ඤතා,**
**මා තං ලොභො අධම්මො ච චිරං දුක්ඛාය රන්ධයුං.**

යමෙක් පණ නසා ද, බොරුත් කියා ද, ලෙව්හි නො දුන් දෑය ගණී ද, පරඹුවන් කරා යේ ද.

යම් මිනිසෙක් රහමෙර පීමෙහිත් යෙදේ ද, මෙතෙමේ මෙලොව දී ම තමාගේ මූලය කණින්නේ ය.

භවත් පුරුෂ! අකුශලධර්මයෝ සංයම නැත්තාහ යි මෙසේ දැන ගණුව. ලොභය ද ද්වෙෂය ද යන අකුශල මූලයෝ දෙදෙනා තා බොහෝ කලක් නරකාදි දුකට නො පමුණු වත්වා.

**යො පාණං අතිපාතෙති** = යමෙක් පණ නසා ද.

යමෙක් සවැදෑරම් වූ සාහත්ථිකාදි ප්‍රයොගයන් අතුරෙහි යම් ප්‍රයොගයකින් පරපණ නසා ද, පරපණ සිඳ හරී ද, හෙතෙමේ ද, (මතුසම්බන්ධය) මෙහි පණැයි කියේ ජීවිතෙන්ද්‍රිය ය.[1]

**මුසාවාදඤ්ච භාසති** = බොරුත් කියා ද.

1. I 10. 'පාපකාරී' යනු බලනු.

**ලොකෙ අදින්නං ආදියති** = ලෙව්හි නො දුන් දැය ගණී ද.

**සුරාමෙරයපානං ච යො නරො අනුයුඤ්ජති** = යම් මිනිසෙක් රහමෙර බීමෙහිත් යෙදේ ද.[1 – 2]

‘සුරාමෙරයපානං’ යන්නට ‘රහමෙරබීමෙහි’යි සත්වන විබ-තින් අරුත් දෙනුයේ මෙහි පෙණෙන ‘අනුයුඤ්ජති’ යන ක්‍රියා පදයෙහි යෙදීසිටි ‘අනු’ යනු බලා ය.

**ඉධ එව සො ලොකස්මිං** = මෙතෙම් මෙලොවදී ම.

**මූලං ඛණති අත්තනො** = තමාගේ මූලය කණින්නේ ය.[3]

පරලොව විඳිනා දුක් තිබේවා. ඔහු මෙ කියූ පව්කම් කරණුයේ මෙලොවදීම කොහ්වක් ගේදෙර හරකබාන රන්රුවන් ඈ මෙලොව දිවිවැටුමට උපකාරව සිටි පිහිට විසින් පැවැති හැම දැයක් නැසී ගොස් අනාථ ව අසරණ ව මග බැස යන්නේ ය. හිඟන්නෙක් වන්නේ ය. එය නො වැළැකිය හැකි ය. තමන් උපයන්නා වූ ද මවුපියන් සතුව තිබුනා වූ ද එහැම, වෙළෙඳම් ගොවිකම් ඈ සුදුසු කටයුතුවලට නො යොදා උකස් තබා වෙසඟනන්ට දී, රහමෙරබීම් මස්කෑම් ආදියට වියදම් කොට හොරකම් ඈ නපුරුකම් කොට පසු ව එයට දඬ ගෙවා ගෙවා ලන්නේ ය. තමාට මෙලොව දිවි වැටුම පිණිස වූ සියලු දැය නැසී යෑමෙන් මොහුගේ මුල සිඳී යන්නේ ය.[4]

**එවං භො පුරිස! ජානාහි** = භවත් පුරුෂ! මෙසේ දනුව.

**භො** යනු ආමන්ත්‍රණාර්ථයෙහි නිපාතයෙකි. එය මෙහි පුරිස යන්නට එක් වන්නේ ය. පස්වැදෑරුම් දුසිල්කම් කරන්නහු අම-තන්නේ ය. “එම්බා දුසිල්කම් කරණ පුරුෂ!” යනු අරුත්.

**පාපධම්මා අසඤ්ඤතා** = අකුශලධර්මයෝ සංයම නැත්තාහ.

මෙහි කියූ පාපධර්මනම්: ප්‍රධාන විසින් පස් පව්ය. ඒ කරන්න-හුට කායසංවරයෙක් නැත. වාක්සංවරයෙක් නැත. මනස්සං වරයෙක් නැතැ යි දත යුතු ය යනු වදාළ සේක.

**මා තං ලොභො අධම්මො ච චිරං දුක්ඛාය රන්ධයුං** = ලොභය ද ද්වේෂය ද යන අකුශලමූලයෝ තා බොහෝ කලක් නරකාදි දුකට නො පමුණු වත්වා.

---

1. 1. 10. ‘පාපකාරි’ යනු බලනු.
2. 7. 8. ‘යො නරො’ ,, ,,
3. 4. 3. ‘නරං’ ,, ,,
4. 12. 1 ‘අත්තානං’ ,, ,,

සමහර විටෙක අකුසල්, ලොභ-ද්වෙෂ මුල් කොට හෝ සමහර විටෙක ද්වෙෂ-මොහ මුල් කොට හෝ සමහර විටෙක ලොභ-මොහ මුල් කොට හෝ සමහර විටෙක ලොභ-ද්වෙෂ-මොහ, මුල් කොට හෝ සමහරවිටෙක මොහය මුල් කොට සිදු වන්නේ ය. මේ කොයි ලෙසකින් හෝ කිලිටි වූ සිත් ඇති මිනිසා පව්කම් කොට මෙලොව අසරණ වනු පමණක් නො ව පරලොව ද බොහෝ කාලයක් දුකෙහි වැටෙන්නේ ය. එහෙයින් කෙලෙස් සහ ගිය සිතින් පව්කම් කොට දුකට නො පැමිණේවා යි මෙයින් වදාළ සේක. ලොභ-ද්වෙෂ වදාළ තැන මොහයද ගැණෙන බැවින් මෙහි මොහයාගේ ගැණීම ද කිය යුතු ය.

ධර්මදෙශනාවගේ අවසානයෙහි ඒ පන් සියයක් උපාසකයෝ සෝවන්පලයෙහි පිහිටා ගත්හ. ධර්මදෙශනාතොමෝ පැමිණ සිටි පිරිසට ද වැඩසහිත වූ ය.

**පඤ්චශත උපාසකවස්තුව නිමි.**

# තම නෑයන් උසස් කොට දක් වූ තිස්ස මහණ

## 18 — 8

**තිස්ස** නම් මහණ, අනාථපිණ්ඩික සිටාණන් හා විශාඛා මහ උපාසිකාව ප්‍රධාන කොට ඇති පන් සියයක් පමණ ආර්‍ය්‍යශ්‍රාවක යන්ගේ දන්දීම්වලට හා කොසොල් මහරජුගේ අසදිස මහා දානයටත් නින්දා පරිභව කරමින් හැසුරුණේ ය. උන් උන්ගේ දන්හල්හිදී සිහිල් දෑයක් ලත් කල සිහිල්ය යි ද, උණුසුම් දෑයක් ලත් කල කට තබන්නට නො හැකි සේ උණුසුම් ය යි ද, ටික දෑයක් ලත් කල "මුන් බඩ පුරා කන්නට බොන්නට නො දෙති"යි ද, බොහෝ කොට ලත් කල "මුන්ගේ ගෙයි තබා ගන්නට ඉඩපහසු නැති බැවින් දෙති"යි ද, "භික්ෂූන්ට දිය යුත්තේ යැපෙන පමණෙක් නො වේ දෑ"යි ද, "මෙතෙක් කැඳබත් කැවිලිපෙවිලි තිකරුණේ බැහැර දමති"යිද නින්දා කරන්නේ ය. තම නෑයන් කිසිවක්හට කිසිවක් නො දෙනත්, "අපගේ නෑගෙවල් සිවු දිගින් වඩින්නා වූ භික්ෂූන් වහන්සේලාට පැන් ලිඳක් ව සිටිති"යි කියමින් නෑයන්ට පසසන්නේ ය.

එක් ද්වාරපාලකයක්හුගේ පුත්‍ර වූ මේ තිස්ස තෙමේ දනවු සැරි සරණ වඩුවන් හා එක් ව ගොස් සැවැත් නුවරට පැමිණ එහි දී පැවිදි වූයේ ය. සෙසු භික්ෂූන් වහන්සේලා "සැදෑයෙන් දන් දෙන උපාසක උපාසිකාවන්ට මෙසේ නින්දා පරිභව කරමින් ඇවිදුනා මොහුට නිග්‍රහ කළ යුතු ය"යි සිතා "ඇවැත්නි! ඔබගේ නෑයෝ කොහි වෙසෙත් දෑ?යි ඇසූහ. එකල්හි තිස්ස "අසුවල් ගමෙහි වෙසෙති"යි කී ය. භික්ෂූන් වහන්සේලා "මොහු කීයේ ඇත්තෙක් දෑ"යි සොයා බලන්නට තරුණ මහණුන් කිහිප නමක් එහි යැවූහ. එහි ගිය උන්වහන්සේලා එගම් වැස්සන් විසින් ආදරයෙන් පිළිගෙණ අසුන්හලෙහි වඩා හිඳුවා සත්කාර කරණ ලදහ. ලද සත්කාර ඇති ඒ භික්ෂූන් "මෙගමින් නික්ම ගොස් පැවිදි වූ තිස්ස නම් කෙනෙක් වෙත් ද? ඔහුට නෑ වූවෝ මෙහි වෙසෙත් ද? එසේ නම් ඔවුහු කවරහු"යි ඇසූ කල්හි ගම්වැස්සෝ "මෙහි කුලගෙයකින් නික්ම ගොස් පැවිදි වූ එනම් ඇතියෙක් නැත, කුමක් නිසා මුන්වහන්සේලා මෙසේ අසත් දෑ"යි සිතා "ස්වාමීනි! මෙහි එක් දොරටු පල්ලකුගේ පුතෙක් වඩුවන් හා එක් ව ගොස් තැන තැන ඇවිද පසු ව පැවිදි ව සිටිය යි දැන ගන්නට ලැබී ඇත, ඔහු ගැණවත් ද මේ අසත්නහු?"යි කීහ. තිස්ස මහණහුගේ වතගොත සොයා ගිය භික්ෂූන් වහන්සේලා

එහි ඔහුට කිය යුතු තරම් පොහොසත් නෑ කෙනෙකුත් නැති බව දූත සැවැත් නුවරට අවුත් "ස්වාමීනි! තිස්ස නිකරුණේ නත් දෙඩමින් ඇවිදී ය"යි දන්වා සිටියහ. බුදුරජානන් වහන්සේට ද භික්ෂූහු එබව සැලකළහ. එකල්හි උන්වහන්සේ "මහණෙනි! මේ තිස්ස, තමන්ගේ හා නෑයන්ගේ උසස්කම කියමින් මෙසේ ඇවිදින්නේ දැන් පමණක් ම නො වේ, මෙතෙමේ පෙරත් තමන් පිළිබඳ නැති ගුණ කියමින් තමා උසස් කොට දක්වමින් හැසිරෙන්නෙක් වූයේ ය"යි වදාළ විට "ස්වාමීනි! ඒ වදාරණු මැනැවැ"යි ඇයැද සිටියහ. එකල්හි බුදුරජානන් වහන්සේ,

"අත් දනවු ගිය හේ - අත්වැණුම් බස් කියනේ,
යළි අවුදු හිමි දුස්නේ - කටාහක' බෝ විඳ ගත්"

යි මේ කටාහක ජාතකය විස්තර විසින් වදාරා "මහණෙනි! යමෙක් මඳ කොට වේව යි බොහෝ කොට වේව යි රළු කොට වේව යි පිණි කොට වේව යි දුන් කල්හි ද, අන්හට දී තමන්ට නො දුන් කල්හි ද, මකු වේ ද, මූණ හැකිළේ ද, ඔහුට ධ්‍යාන යක් හෝ විදර්ශනාවක් හෝ මාර්ගඵලාදියක් හෝ නො උපදනා බව දනිවූ"යි වදාරා මේ ධර්මදේශනාව කළ සේක.

**දදන්ති වෙ යථා සද්ධං යථාපසාදනං ජනො,**
**තත්ථ වෙ මඞ්කු යො හොති පරෙසං පානභොජනෙ,**
**න සො දිවා වා රත්තිං වා සමාධිං අධිගච්ඡති.**

**යස්ස චෙතං සමුච්ඡින්නං මූලඝච්චං සමූහතං,**
**ස වෙ දිවා වා රත්තිං වා සමාධිං අධිගච්ඡතීති.**

ජන තෙමේ ශ්‍රද්ධාව වූ පරිදි ප්‍රසාදය වූ පරිදි ඒකාන්තයෙන් (යමක්) දෙන්නේ ය. යමෙක් අනුන්ගේ ආහාර පානයෙහි දෙම්නස් ඇත්තේ වේ ද හෙතෙමේ ඒකාන්තයෙන් දහවල්හි හෝ රාත්‍රියෙහි හෝ සමාධියට නො පැමිණෙන්නේ ය.

යමක්හු විසින් වනාහි මේ දෙම්නස මුල් සිඳ නසන ලද ද හෙතෙමේ ඒකාන්තයෙන් දහවල්හි හෝ රාත්‍රියෙහි හෝ සමාධියට පැමිණෙන්නේ ය.

**දදන්ති වෙ යථාසද්ධං යථාපසාදනං ජනො** = ජන තෙමේ ඇදහීම පරිදි පැහැදීම පරිදි යමක් ඒකාන්තයෙන් දෙන්නේ ය.

කම්පල අදහා දන් දෙන මිනිස්සු ඒ තමන්ගේ කම්පල ඇදහීම අනුව කම්පල ඇදහීමට අනුරූප පරිදි ඒ ඒ පුද්ගලයන් කෙරෙහි පැහැද සිටි පරිදි රළු වූ අම්හිරි දෑයක් හෝ පිණි වූ මිහිරි දෑයක් හෝ දෙන්නේ ය.

**"සද්ධාය අනුරූපං = යථාසද්ධං, පසාදනස්ස අනුරූපං = යථාපසාදනං"** යි වාක්‍ය විසින් අරුත් ගත යුතු ය. ඇදහීමට අනුරූප පරිදි, පැහැදීමට අනුරූප පරිදි යනු අරුත්.

**යොග්ගතා – වීච්ඡා – පදත්ථානතිවුත්ති – සමානභාව** යි යථා ශබ්දයෙහි අර්ථ සතරෙක් ඇත්තේ ය. සමානභාවාර්ථ හැර අන් තුන් තන්හි **යථා** ශබ්දය සමාස වේ. **යථා** යනු **සද්ධා–පසාදන** යන ශබ්ද දෙක හා යොග්‍යාර්ථයෙහි සමස්තව සිටියේ ය. **යථාබුද්ධං යථාසත්ති** යන දෙතන්හි වූයේ වීප්සා – පදාර්ථානතිවෘත්ති යන දෙයරුත්හි ය. **"යෙ යෙ බුද්ධා = යථාබුද්ධං, සත්තිං අනතික්කම්ම = යථාසත්ති"** යනු අර්ථසමර්ථනය යි. සමානභාවාර්ථයෙහි යථා ශබ්දයාගේ සමාසයෙක් නැත්තේ ය. **"යථා දෙවදත්තො, තථා යඤ්ඤදත්තො"** යනු එහිලා දන්නේ ය.

**තත්ථ චෙ මඞ්කු යො හොති පරෙසං පානභොජනෙ** = යමෙක් අනුන්ගේ ආහාර පානයෙහි ඒකාන්තයෙන් දොම්නස් ඇත්තේ වේ ද.

සිතෙහි හටගත් දොම්නස් ඇතියේ **මඞ්කු** නම්. තෙදරහිත වූයේ ද මඞ්කු යි කියනු ලැබේ. **පර** යනු අවසථානුරූපව තුන් ලිඟුවෙහි ම එන්නේ ය. **පසම්තුරු – උත්තම – අන්‍ය – පශ්චාද්භාව** යන අරුත් කියන්නේ ය. අන්‍යාර්ථයෙහි ආයේ ලිඞ්ගත්‍රයෙහි ලා දත යුතු ය. මෙහි ද අන්‍යාර්ථය ගෙණ සිටියේ ය. **"පච්චනීකොත්තමෙස්වඤ්ඤෙ පච්ඡාභාවෙ පරො තිසු"** යනු කොෂාගතය.

**පානභොජන** යන මෙහි **පාන** ශබ්දය, බීම – බඳුන – රැකීම – රකින්නහු – දිය යන අරුත්වල වැටෙන්නේ ය. එහෙත් මෙහි ගැණෙනුයේ ජලාදිද්‍රවජාතිහු ය. බොනදෑ ය. **භොජන** ශබ්දය වැළඳීම – වළඳන බඳුන – වළඳනදෑය කියන්නේ ය. ලෝ වැසි මිනිසුන් අතර නන්වැදෑරුම් කන බොන දෑය ඇත්තේ ය. ඒ හැම; පානභොජන යන මෙහි ඇතුළත් ය.

**න සො දිවා වා රත්තිං වා සමාධිං අධිගච්ඡති** = හෙතෙමේ ඒකාන්තයෙන් දහවල්හි හෝ රාත්‍රියෙහි හෝ සමාධියට නො පැමිණෙන්නේ ය.

**දිවා** යනු හා **රත්ති** යනු හා කාලාර්ථවාචක ය. දිවා යනු අව්‍යයෙකි. **රත්ති** යනු නාමයෙකි.[1] **සමාධි** යන මෙයින් උපචාර–අර්පණා – මාර්ග – ඵලසමාධිහු ගැණෙත්. එහෙයින් මෙසේ දොම්නස්

1. 5. 1. 'දීඝා ජාගරතො රත්ති' යනු බලනු.

වනුයේ දුවල වුව ද රෑ වුව ද උපචාර වශයෙන් හෝ අර්පණා වශයෙන් හෝ මාර්ග වශයෙන් හෝ ඵල වශයෙන් හෝ සිත පිළිබඳ එකඟ බවට නො පැමිණෙන්නේ ය.[1]

**යස්ස ච එතං සමුච්ඡින්නං මූලඝච්චං සමූහතං** = යමක්හු විසින් වනාහි මේ දෙමිනස මුල් සිඳ නසන ලද නම්.

**යස්ස** යනු **සමුච්ඡින්නං** යනු බලා කතු අරුත්හි සවන විබතින් සිටියේ ය. එහෙයින් ‘යමක්හු විසිනැ’ යි අරුත් දෙන ලද්දේ ය. යමකු විසින් මඞ්කුභාවය යි කියූ අකුසලය අර්හත් මාර්ගඥානයෙන් අවිද්‍යා - තෘෂ්ණා නම් වූ කෙලෙස් මුල් සමග සිඳ හරින ලද්දේ නම්.

පැරණි ධම්මපද සන්නයෙහි ‘එතං සමුච්ඡින්නං’ මූලඝච්චං සමූහතං’යි දෙකොටසක් කොට වෙන වෙන ම අරුත් දෙන්නේ ය. එහෙත් “මඞ්කුභාව සඞ්ඛ්‍යාත අකුශලය මූලඝාතනය කොට අර්හත්මාර්ගඥානයෙන් නසන ලද නම්, යනු අටුවායෙහි කියන ලද්දේ ය. මේ එය: **“යස්ස පුග්ගලස්ස එතං එතෙසු ඨානෙසු මඞ්කුභාවසඞ්ඛාතං අකුසලං සමුච්ඡින්නං, මූලඝච්චං කත්වා අරහත්තමග්ගඤාණෙන සමූහතං”** යනු.

**සො වෙ දිවා වා රත්තිං වා සමාධිං අධිගච්ඡති** = හෙතෙමේ ඒකාන්තයෙන් දහවල්හි හෝ රාත්‍රියෙහි හෝ සමාධියට පැමි-ණෙන්නේ ය.

කරුණු මෙසේ බැවින් නුවණැතියන් විසින් දීමෙහි තමාට හයිබලයෙක් නො වේ නම්, දීමෙහි කැමැත්තෙක් නො වේ නම්, අනුන්ගේ දීමෙහිලා සිත් පහදවා ගැණීම් පමණකුත් කළයුතු ය. ඒ චිත්තප්‍රසාදමාත්‍රය ද සැප ලැබීමට කරුණු වන්නේ ය.

ධර්මදෙශනාවගේ අවසානයෙහි බොහෝ දෙන සෝවන් පලාදි යට පැමිණියාහු ය.

**තිස්සදහර වත්ථුව නිමි.**

---

1. 6. 11. “සම්බොධි අඞ්ගෙසු” }
1. 10. 13. “සමාහිත” } යනු බලනු.

# බණ ඇසූ උපාසක

## 18 — 9

**දවසක්** තෙරුවන් සරණ ගිය පස් දෙනෙක් බණ අසනු කැමැති ව විහාරයට ගොස් බුදුරජුන් වැඳ එකත් පසෙක හුන්හ. බුදුරජහු වනාහි "මෙ තෙමේ රජ ය, මෙ තෙමේ බමුණු ය, මෙ තෙමේ ගැහැවිය, මෙ තෙමේ සුදුරු ය, මෙ තෙමේ පොහොසත් ය, මෙ තෙමේ දුප්පත් ය, මෙ තෙමේ නිලධර ය, මෙ තෙමේ රාජ පුරුෂය, මෙ තෙමේ නෑය, මෙ තෙමේ නො නෑය, මෙ තෙමේ හිතවත් ය, මෙ තෙමේ අහිත ය, මෙ තෙමේ දෙස් කියන්නේ ය, මෙ තෙමේ පසසන්නේ ය, මොහුට හොඳට බණ කියන්නෙමු, මොහුට යන්තම් බණක් කියන්නෙමු" යි චිත්තාමාත්‍රයක් නම් කවදාත් කිසි කරුණක් නිසාත් නො ද උපද වන්නාහු ය. යම් කිසි කරුණක් ඇරැබැ දහම් දෙසන සේක් ධර්මගෞරවය පෙරටු කොට අහස්ගඟ බිමට බාන්නාක් මෙන් ඉතා විසිතුරු කොට ම දෙසන සේක.

මෙසේ දහම් දෙසන අප බුදුරජුන් හමුවෙහි උන් ඒ පස් දෙනා අතුරෙහි එකෙක් හුන්නේ ම නිදි ගත්තේ ය. එකෙක් ඇඟිල්ලෙන් බිම කණිමින් හුන්නේ ය. එකෙක් බැහැරට ගොස් ගසක් සොලවමින් හුන්නේ ය. එකෙක් උඩ බලා හුන්නේ ය. එකෙක් අන් අතක සිත නො යවා බණ ඇසී ය. එ වේලෙහි බුදුරජුන් වෙත පවන් සලමින් සිටි ආනන්ද ස්ථවිරයන් වහන්සේ ඔවුන් එහි හුන් ආකාරය දුටහ.

**ආනන්ද ස්ථවිරයන් වහන්සේ** = "ස්වාමීනි! භාග්‍යවතුන් වහන්ස! භාග්‍යවතුන් වහන්සේ මේ උපාසකයන්ට මහා මෙඝගර්ජනාවක් සේ දහම් දෙසද්දීත් මොවුන්ගෙන් එකෙක් නිදන්නේ ය, එකෙක් බිම කණින්නේ ය, එකෙක් ගසක් සොලවන්නේ ය, එකෙක් උඩ බලා හිඳින්නේ ය, එකෙක් නම් බණ අසන්නේ ය,

**බුදුරජාණන් වහන්සේ** = ආනන්ද! තමුසේ මේ උපාසකයෝ කවරහ'යි දන්නහු ද?

**ආනන්ද** = නැත, ස්වාමීනි! නො දනිමි,

**බුදුරජ** = ආනන්ද! මොවුන් අතුරෙහි යමෙක් මෙහි නිදන්නේ ද, ඔහු ද පන් සියයක් සර්

යොනියෙහි ඉපද දරණ ගසා එ මතුයෙහි හිස තබා නිදිගත්තේ ය, දූනුත් ඒ පුරුද්දෙන් මෙසේ නිදත්තේ ය, එහෙයින් ඔහුගේ කණට මාගේ බණ නො ද වදිත්තේ ය,

ආනන්ද = සවාමීනි! ඒ දෑ පත් සියය පිළිවෙළින් වූයේ ද, නැත, අතරින් අතර ජාතියක් හැර ජාතියක් සපී ව උපන්නේ ද?

බුදුරජ = ආනන්ද! කලෙක මිනිසකු ව කලෙක දෙවියකු ව කලෙක නාගයකු ව අතර-තුර ඒ ඒ ජාතීන්හි ඉපද ඉපද එන්නා වූ මොහු නාග ව උපන් ජාති ම මෙතෙකැයි බුදුනුවණින් ද පිරිසිඳ දක්-වන්නට නො හැකි ය, ජාතියක් හැර ජාතියක් නො ව පිළිවෙළින් ම මෙතෙමේ දෑ පත් සියයක් ම නාග යොනියෙහි ඉපද, නිදන්නේ ද, නිදීමෙන් සෑහිමට නො පැමිණියේ ය, දූනුත් නිදන්නේ එහෙයිනි,

ආනන්ද! බිම කණිමින් සිටින උපාසක දෑ පත් සියයක් ගැඩවිල් යොනියෙහි ඉපද පොළොව සෑරී ය, ඒ පුරුද්දට දූනුත් පොළොව සාරන්නේ ය, ඒ මූත් ඔහු ද මාගේ බණ නො අසන්නේ ය,

දෑ පත් සියයක් වඳුරු යොනියෙහි ඉපද ආ උපාසක, එදෑ ගස් කොළන් අතුරිකිලි සොලොව සොලොවා හුන් පුරුද්දෙන් අදත් ගස් කොළන් සොලවනු විනා බණ නො අසන්නේ ය, ඔහුගේ කණට මාගේ දහම් හඬ නො වදින්නේ ය,

අහස බලා සිටුනා උපාසක, පෙර පිළිවෙළින් දෑ පත් සියයක් නැකැති ව උපන්නේ ය, එදෑ නැකැත් තරු බලා සිටි පුරුද්දෙන් අදත් අහස දෙස බලා සිටින්නේ ය, ඔහුට ද මාගේ බණින් වැඩෙක් නැත,

ආනන්ද! බණ අසන උපාසක, දෑ පන් සියයක් මිනිස් ව ඉපිද වෙද මන්ත්‍ර හදාරමින් ආයේ ය, ඒ ඒ ජාතීන්හි වෙද මන්ත්‍රයන්හි පරතෙරට ගිය වෙද මන්ත්‍ර හදාළ බමුණු විය, ඒ නිසා මන්ත්‍ර සසඳන්නකු මෙන් සකසා අදත් බණ අසන්නේ ය,

**ආනන්ද** = ස්වාමීනි! භාග්‍යවතුන් වහන්ස! භාග්‍ය-වතුන් වහන්සේගේ දහම් දෙසීම තුනු සිවි ඈ සිඳ ගෙණ ඇට මිදුළුවල වැදී සිටුනේ ය, එසේ වතුදු බුදුරජුන් දහම් දෙසන කල්හි කුමක් හෙයින් මොවුහු සකස් ව දහම් නො අසත් ද?

**බුදුරජ** = ආනන්ද! තමුසේ මාගේ ධර්මය හැම දෙනකුට එකසේ ඇසිය හැකි ය යි සිතන්නහු ද?

**ආනන්ද** = ස්වාමීනි! හැම දෙනකුට බුදුරජුන්ගේ බණ ඇසීම අපහසු ද?

**බුදුරජ** = ඔව්, ආනන්ද! අපහසුයි, බුද්ධ - ධම්ම - සඞ්ඝ යන මේ පද තුන, මේ සත්ත්වයන් විසින් නොයෙක් කප් කෙළ සිය දහ-සෙක්හිදු නො ඇසූ විරූ ය, බණක් අසන්නට නො හැකි වූ මේ සත්ත්වයෝ අග මුල නො දත හැකි සසරෙහි දිගට සැරිසරු එන්නෝ නන්වැදෑරුම් තිරිසන් කතා කරමින් අසමින් ආවාහු ද, එහෙයින් මොවුහු දූත් රා අරක්කු බොමින් කෙළිමඬුලුවල නටමින් ගයමින් ජඩ ව හැසිරෙන්නෝ ය, ඒ නිසා මොවුනට බණ දහම් අසන්නට සිත් නො උපදනේ ය, මොවුහු බණ දහම් ඇසීමෙහි අපොහොසත් වෙති,

**ආනන්ද** = ස්වාමීනි! මේ සත්ත්වයෝ බණ දහම් ඇසීමෙහි අපොහොසත් වෙති, යි වදා-රණුවෝ කුමක් නිසා ද?

බුදුරජ = රාගය නිසා ආනන්ද! ද්වේෂය නිසා මොහය නිසා තෘෂ්ණාව නිසා, ආනන්ද! රාගය තරම් ගින්නෙක් කොතැනකත් නැත, රාගය මහා ගින්නෙක, රාග ගින්න, අලුත් ඉතිරි නො කොට සත්ත්වයන් දවාලන්නේ ය, කල්පවිනාශ කාලයෙහි සත් හිරු පහළවීම නිසා හට ගන්නා කප් නස්නා ගින්න ද කිසිවකුත් ඉතිරි නො කොට දවන්නේ නමුත් එය හැමදා පවත්නා ගින්නෙක් නො වේ, එය එක් ම කාලයෙක හට ගෙණ දැවිය යුත්ත පමණක් දවන්නේ ය, ආනන්ද! රාගගින්න එසේ එක් කලෙක හට ගන්නෙක් නො වේ, සත්ත්වයා එයින් නො දැවෙන කාලයෙක් නැත්තේ ය, හැම දවස හැම පැය හැම මොහොත සත්ත්වයා රාගගින්නෙන් දැවෙන්නේ ය, එහෙයින් රාගය තරම් ගින්නෙක් නැත, එසේ ම ද්වේෂය තරම් ඩැහැගැන්මෙක් මොහය තරම් දැලෙක් තෘෂ්ණාව තරම් ගඟක් නැත''

මෙසේ වදාළ බුදුරජාණන් වහන්සේ නැවැත මේ ධර්මදෙශනාව කළ සේක.

**නත්ථි රාගසමො අග්ගි නත්ථි දොසසමො ගහො,**
**නත්ථි මොහසමං ජාලං නත්ථි තණ්හා සමා නදී'ති.**

රාගය හා සම ගින්නෙක් නැත. ද්වේෂය හා සම ඩැහගැන්මෙක් නැත. මොහය හා සම දැලෙක් නැත. තෘෂ්ණාව හා සම නදියක් නැත.

**නත්ථි රාගසමො අග්ගි** =රාගය හා සම ගින්නෙක් නැත.

''රාගය හා සම ගින්නෙක් නැතැ'' යි වදාළෝ ගින්න යම් කිසිවක් නිසා හට ගන්නේ නම් පළමු කොට එය ම දවා හළු කොට හරින්නා සේ, රාගය යම් කිසිවකුගේ සන්තානයෙහි නැඟී ආයේ නම් ඔහු දවා ලන්නේ ද එහෙයිනි. ගින්න, හසු වන හසු වන හැම දැය දවන්නේ ය. රාගයත් රාගීහු පිළිබඳ ආයු වර්ණාදිය හා ධනධාන්‍යාදිය ද දවන්නේ ය. රාග ගින්නෙන් තැවී දැවී ගිය සිත් ඇති ව මරණයට පැමිණියවුන්ගේ පැමිණෙන්නත්

ගේත් ගණනෙක් නැත. **"රාගග්ගි දහති මච්චෙ රත්තෙ කාමෙසු මුච්ඡිතෙ"** යනු ද දන්නේ ය. රාග ගින්න, රාගයෙන් රත් වූ කාම වස්තූන්හි මුළා වූ මිනිසුන් දවා ලන්නේ ය, යනු එහි අරුත්.

**අග්ගි** නම්: ගින්න ය. වෛදිකයන් විසින් ගින්න දෙවියකු කොටත් සියලු වෛදික දෙවතාවුන් අතුරෙහි ඉන්ද්‍රදෙවතාවාට දෙවන කොටත් දක්වන ලද්දේ ය. මේ මෙයට සාධකයෙක්:

"ත්වමග්නෙ සර්වදෙවානාං ශරීරාන්තරගොචරඃ,
ත්වං සාක්ෂී මම දෙහස්ථස්ත්‍රාහි මාං දෙවසත්තම!"

එම්බා! අග්නි! තෝ සියලු දෙවියන්ගේ ශරීරාවකාශය ගොදුරු කොට සිටිහි. තෝ ප්‍රත්‍යක්ෂයෙහි. මාගේ සිරුරෙහි සිටිහි. දෙවෝත්තමය! මා රකුව. ගින්න, මිනිසුන්ගේ ගතිපැවැතුම් දනීය යි වෛදිකයෝ කියත්:

"ආදිත්‍යචන්ද්‍රාවනිලොනලශ්ච
ද්‍යෞර්භූමිරාපො හෘදයං යමශ්ච,
අහශ්ච රාත්‍රිශ්ච උභෙ ච සන්ධ්‍යෙ
ධර්මශ්ච ජානාති නරස්‍ය වෘත්තම්"

යනු මේ ඒ කීම ය. සූර්‍ය්‍ය – චන්ද්‍ර – වාත – අග්නි – අහස – භූමි – ආප – හෘදය – යම – දිවා – රාත්‍රි– උභය සන්ධ්‍යා – ධර්ම යන මොවුහු මිනිසාගේ පැවැත්ම දනිත්.

තවද අග්නි, සියලු දෙවියනට පළමුව ආරාධනය කටයුතු-බව කියා ඍග්වේදයෙහි සර්වප්‍රථමසූක්තයෙහි **"අග්නිං ඊළේ, ඊළේ අග්නිං, අග්නිං ඊළේ, ඊළේ පුරෝහිතම්"** යනාදිය කියන ලද්දේ ය.

වෛදිකයන් ගින්න කෙරෙහි, තමන් ගත් අරුත් දක්වන්නට ආරෝපණය කළ නම් රාශියක් ඔවුන්ගේ පොතපතෙහි දක්නට ලැබේ. ඔවුන් එක් තැනෙක අග්නිය පොළොවෙහි ගින්න මෙන් අන්තරීක්ෂයෙහි විදුලිය මෙන් ආලෝකයෙහි හිරුමෙන් දක්වා ඇත්තේ ය. වෛදිකයන්ගේ මේ කියුම් සිහින් මවා ගත් බොරු කියුම් ය. එහෙයින් විඥයන් විසින් නො ගත-යුත්තේ ය. වෛදිකයෝ ස්වභාවසිද්ධවස්තුතත්ත්වයක් වූ ගින්න තම තමන්ගේ යාගහෝමාදියෙහි යොදා ගත්තාහු අවසානයෙහි දෙවත්වයට පමුණුවාලූහ. එතැන් සිට ඔවුනට ගින්න දෙවියෙක් විය. සඳ – හිරු – අහස – පොළොව – වා – දිය යනාදීහු ද ප්‍රකෘති සිද්ධයෝ ය.

බුදුරජාණන් වහන්සේ වැඩි වශයෙන් **අග්ගි** යනු යොදා ගත්බව දෙශනායෙන් පැහැදිලි වන්නේ ය. ඉදිරියෙහි ඇති හසු හසුවන කුඩු මහත් හැම දූය දවා යනුයේ අග්ගි යි අප විසින් ගතයුතු යතරුත ය. මිනිසුන්ගේ මෙලොව ජීවිතයට මෙයින් ලැබෙන වහල ඉමහත් ය. මේ නොවේ නම් මිනිසුනට ජීවත්වනු ද නො හැකි ය. වෛදිකයන් දෙවත්වයෙහි ලා ගත් ගින්න නො ව අනුදහනාඤීවත් ගින්න ම මෙහි අදහස් කරණලද ය. රාගයත් එසේ අනුදහනාඤීවත් බැවින් රාගය ම **රාගග්ගි** යි කියනු ලැබේ.[1]

**නත්ථි දොසසමො ගහො** = ද්වෙෂය හා සම ඩැහගැන්මෙක් නැත.

යක් – පිඹුරු – කිඹුල් – කොට් – වග ඈ සතුනට හැමදා මිනිසුන් ඩැහැ ගත හැකි නො වේ. ඒ වන්නේ ඉතා කලාතුරෙ-කිනි. එහෙත් මොවුන් විසින් ඩැහැගැන්මෙන් වන දුක ද ජාතියක් පාසා ඉදිරියට නො යන්නේ ය. එය එක් ජාතියකින් ම කෙළවර වේ. ද්වෙෂ කිරීමෙන් වන දුක එසේ නො වේ. එය සසර වසන තාක් ම ද්වෙෂීහු ලුහු බැඳ පසුපස එළවා යන්නේ ය. එහෙයින් ද්වෙෂය තරම් ඩැහැගැන්මෙක් නැතැ යි වදාළ සේක.[2]

**නත්ථි මොහසමං ජාලං** = මෝහය හා සම දැලෙක් නැත.

වෙගයෙන් යන මෘගපක්ෂිමත්ස්‍යාදීන් හසු කොට ගන්නේ **ජාල** නම්. එය ඒ ඒ සතුන් බැඳ ගැණීමෙහිලා ව්‍යාධාදීන් විසින් යොදනු ලබන්නේ ය.[3]

මෝහය ද හැමතින් සත්ත්වයන් බඳිනා වළඳනා අ'රුතින් දැලක් වැනි ය. මෝහයෙන් මුළා වූ සත්ත්වයෝ කෙළවරක් නො දත හැකි කලක් සසර බැඳී අපායයෙහි වැටී දුක් විඳින්නෝ ය. දැලට බැඳුනු සතුනට වැද්ද අතින් කෙවුළා අතින් නිදහස් වනු නො හැකි සේ මෝහයෙන් මුළාවූවනට සසරින් නිදහසෙක් නො වන්නේ ය. එහෙයින් මෝහය තරම් දැලෙක් නැතැ'යි වදාළ සේක.[4]

**නත්ථි තණ්හාසමා නදී** = තෘෂ්ණාව හා සම නදියක් නැත.

**"ගඞ්ගාදීනං පූරණකාලෝපි ඌනකාලෝපි සුක්ඛ-කාලෝපි පඤ්ඤායති, තණ්හාය පන පූරණකාලෝ වා සුක්ඛකාලෝ වා නත්ථි, නිච්චං ඌනාව පඤ්ඤායතීති දුප්පූ-රියට්ඨෙන තණ්හාය සමා නදී නාම නත්ථි"** යනු අටුවා.

---

1. 1. 7. 'අනික්කසාවො' යනු බලනු.
2. 1. 7. 'අනික්කසාවො' ,, ,,
3. 13. 7. 'ජාලමුත්තොව' ,, ,,
4. 1. 7. 'අනික්කසාවො' ,, ,,

ලෝකයෙහි ප්‍රකෘතිසිද්ධ ගඞ්ගාදීන්ගේ දිය පිරුණු කාලයෙක් දිය අඩුව ගිය කාලයෙක් මුළුමනින් වියළී ගිය කාලයෙක් දක්නට ලැබේ. තෘෂ්ණාගඞ්ගාවට එසේ දිය පිරුණු, වියළුනු කාලයෙක් නැත්තේ ය. එය හැමදා ඌනව ම පෙණෙන්නී ය. රන් රිදී මුතු මැණික් දූ දරු අෑ කාමවස්තු කොතෙක් ලදුවත් තව තවත් පතනු සොයනු රැස් කරණු විනා සෑහීමෙක් නො ලැබෙන්නේ ය.

නදී යනු ගඞ්ගාවට නමෙකි. නිතර වාතවෙගයෙන් සැලෙන ජලය හඬ නගනා බැවින් එක් තැන රැස් ව සිටි ජලස්කන්ධය "අභික්කන්ධණං නදතීති = නදී" යනු විසින් නදී යි හඳුන් වනු ලැබේ. ඒ ඒ පර්වතයන්ගෙන් ඇද හැලෙන ජලය ගලා ගොස් ඒ ඒ තැන රැඳී සිටියේ ගං හෝ බවට පැමිණියේ ය. එබඳු ගඞ්ගාවෝ කලෙක ජලයෙන් පිරී ගන්නෝ ය. කලෙක අඩු වන්නෝ ය. කලෙක මුළුමනින් වියැලෙන්නෝ ය.

ධර්මදෙශනාවගේ අවසානයෙහි සකසා බණ අසා හුන් ඒ උපාසක තෙමේ සෝවාන්පලයෙහි පිහිටියේ ය. ධර්මදෙශනා තොමෝ පැමිණ සිටි පිරිසට ද වැඩ සහිත වූ ය.

**පඤ්චඋපාසක වස්තුව නිමි.**

## මෙණ්ඩකසිට්ඨානෝ

### 18 — 10

**තිලෝගුරු** සම්මා සම්බුදු රජාණන් වහන්සේ අඞ්ගුත්තරාප දනව්වෙහි සැරි සරණ **සේක් මෙණ්ඩක** සිටු, ඔහුගේ බිරිය වූ **චන්‍ද්‍රපදුමා,** පුතනු වූ **ධනඤ්ජය** සිටු, ලේලිතිය වූ **සුමනා,** මිනී බිරිය වූ **විසාඛා,** දස වූ **පුණ්ණ** යන මොවුනට තුබූ සෝවන් පලයට පැමිණීමෙහි පුණ්‍යසමපත්තිය දැක **භද්දිය** නගරයට වැඩ දැසමත් වෙනෙහි වැඩ විසූ සේක. මෙණ්ඩක සිටු බුදුරජුන් භද්දිය නගරයට වැඩ දැසමත් වෙනෙහි වැඩ වසන බව දැන ගත්තේ ය.

මෙණ්ඩක සිටුහුගේ පහය පිටිපස අට කිරියක් පමණ වපුරණ තැන ඇතුන් තරමට අසුන් තරමට ගොනුන් තරමට ගනරන්මුවා එළුවෝ පොළොව පළා ගෙණ පිටින් පිට පැහැර පැන නැගී සිට ගත්හ. ඔවුන්ගේ මුවතුළ පස් පැහැයකින් විසිතුරු වූ හුවට බහන ලද්දේ ය. ගිතෙල් තලතෙල් මීපැණි උක්හකුරු ඈ යමකින් හෝ ඇඳුම් කැඩුම් රන් රිදී මුතු මැණික් ඈ යමකින් හෝ වැඩක් ඇති කල්හි ඔවුන්ගේ මුවතුළින් හුවට බැහැර කරත්. එවේලෙහි එක් එළුවකුගේ මුවෙන් පමණකුත් දඹදිව් වැස්සනට පොහොනා පමණට ගිතෙල් තලතෙල් මීපැණි උක්හකුරු ඇඳුම් කැඩුම් රන් රිදී මුතු මැණික් බැහැරට එන්නේ ය. එතැන් සිට ඒ සිටු තෙමේ මෙණ්ඩකසිටු යි ප්‍රසිද්ධ විය. මේ මහත් පුණ්‍යර්ද්ධිය ලැබීමට ඔහු පෙර කළ කුශලකර්මය මෙසේ දත යුතුය.

මෙතෙමේ විදර්ශී බුදුරජුන්ගේ කාලයෙහි **අවරොජ නම්** කෙලෙඹියාගේ බෑනා වූයේ මාමා හා සමාන නම් ඇතියේ අවරොජ නම් විය. එදවස ඔහුගේ මාමා බුදුරජාණන් වහන්සේට වැඩ හිඳිනු පිණිස ගඳකිළියක් කරන්නට පටන් ගත්තේ ය. ඒ දුටු බෑනා මාමා වෙත ගොස් "මාමේ! අපි දෙදෙන ම එකතු ව මේ ගඳකිළිය කරමු"යි කී කල්හි "බෑනා! මට එයට එකග වන්නට නො හැකි ය, මම අන්කෙනකු හා එක් ව මේ ගඳකිළිය කරන්නට නො කැමැත්තෙමි, මම මෙය එකලා ව ම කරන්නෙමි"යි ඔහුගේ ඉල්ලීමට ඉඩ නො දුන්නේ ය. "හොඳයි, එවිට මාමා මෙතැන ගඳකිළිය ගොඩ නගා අවසන් කළ පසු මමත් මෙහි කුඤ්ජර නමින් ශාලාවක් කරවන්නෙමි"යි සිතා ඔහු වනයට කම්කරුවන් යවා ඔවුන් ලවා එයට නිසි වූ දැවදඬු ගෙන්වා තමන් අදහස් කළ පරිදි එහි කුඤ්ජරශාලාව කර වී ය. එහි එක් කණුවක් රුවන් ඔබ්බවා එක් කණුවක් රිදී ඔබ්බවා, එක් කණුවක් මැණික් ඔබ්බවා කර වීය. මෙසේ එහි කණු තලාංද මුදුන්යට උළුවහු කවුළුදෙර පරාල

වහල්උළු යන හැම එකෙක් රන් ඔබ්බවා ම කරවන ලද්දේ ය. එහි මතුයෙහි කරවනලද කොත තබන කපාලය ගනරන්මුවා ය. දිය බැහැර යන කොටුව හා කොත් කැරැල්ල පබළුමුවා ය. කුඤ්ජරශාලාව මැද රුවන් මණ්ඩපයක් කරවා ධර්මාසනයක් පිහිටුවා ලිය. එහි පා හා විට්ටම් සතර ගනරන්මුවා ය. රන්මුවා එළුවන් සතර දෙනකු ධර්මාසනයෙහි පාඅලු කොට පාසතර යට තැබී ය. රන්මුවා එළුවන් දෙදෙනකු පා පුටුව යට ද, රන්මුවා එළුවන් සදෙනකු මණ්ඩපය වටා ද තැබී ය. ධර්මාසනය පලමු කොට හුවලින්ද ඒ මැද රන්කෙඳිවලින් ද වියවා මුදුන පටහුයින් වියැවී ය. එහි ගේත්තුපුවරුව සඳුන්ලීයෙන් කරවන ලද්දේ ය. මෙසේ කුඤ්ජර ශාලාවෙහි සියලු වැඩ අවසන් කරවා ශාලාව පිළිබඳ පුද උලෙළ කරණුයේ බුදුරජුන් ප්‍රධාන අටසැට දහසක් භික්‍ෂූන් පවරා සිවුමසක් මහදන් දී අවසාන දිනයෙහි ඒ හැම දෙනාවහන්සේට තුන් සිවුරු ද පිදී ය. හැම දෙනාවහන්සේට බාල ව සිටි මහණහු ලත් තුන් සිවුරු දහසක් අගනේ විය.

මෙසේ මෙතෙමේ විදර්ශී බුදුරජුන්ගේ කාලයෙහි පින්කම් කොට ඒ අත්බවෙන් ච්‍යුත ව දෙව්මිනිසුන් අතර සැරි සරණුයේ මේ කල්පයෙහි බරණැස් නුවර මහාසම්පත් ඇති සිටුගෙයක ඉපද නමින් බරණැස්සිටු යි ප්‍රසිද්ධ වී ය. ඔහු එක් දවසක් රජුට උවැටන් සඳහා යනුයේ පෙරෙවි බමුණා දැක "ගුරුන්නාන්සේ! කොහොම ද, නැකත් මොහොත් බලහු ද?"යි ඇසී ය. "ඔව්, පරීක්‍ෂා කොට බලමි, නැකැත් මොහොත් බලනු මිසක් අපට ඇති අන් කාරිය කිමැ"යි පෙරෙවි බමුණා කී කල්හි "එසේ නම් අපගේ මේ රටට වන වැඩ අවැඩ බලා කියන්නැ"යි කී ය. බමුණා ද නැකැත් මොහොත් බලා "එක් බියක් වන්නට ඉඩ ඇතැ"යි කී ය. "ඒ වන්නට තිබෙන බිය කිමැ?"යි ඇසූ කල්හි "සිට! දුර්භික්‍ෂයෙන් හට ගන්නා බියක් විය හැකි ය"යි කී ය. "ඒ කවදා වන්නේ දැ?"යි විචාළ විට මෙයින් අවුරුදු තුනක් ගිය තැන විය හැකි ය"යි බමුණා කීයේ ය.

සිටු තෙමේ එය අසා ගොවිතැන් බොහෝ කොට කරවා ගෙයි තුබූ මිලමුදලින් ද හැල්වී ඈ ධාන්‍ය ගෙන්වා එක් දහස් දෙසිය පණසක් කොටුගුල් කරවාලා සියලු කොටුගුල් වීවලින් පුරවා ලී ය. කොටුගුල් නො පොහොනා කල්හි මහසැළි තාලි කළ කොතල ඈ පුරවා, එයිනුදු ඉතිරි වූ සියල්ල බිම වළ ගස්වා තබා එසේ කොටත් ඉතිරි වූ හරිය මැටි හා එක් කොට හනා බිත්තිවල ගැස් වී ය. බමුණා කිහූ ලෙසට තුන් අවුරුද්ද ගිය තැන භය හට-ගත්තේ ය. සිටු තෙමේ කොටුගුල්වල හා හැළි තාලි කොතල

ආදියෙහි පුරවා තුබූ වී හාල් පිස අනුභව කරණුයේ වී සහල් අවසන් ව ගිය කල්හි පිරිවරජනයා කැඳවා "දරුවෙනි! තෙපි හැම දෙන පිළිවන් පිළිවන් තැනකට ගොස් කඳු බෑවුම් ඇසුරු කොට හිඳ දිවි යවා රට ආහාරපානයෙන් පිරී ගත් පසු මා වෙත එනු කැමැත්තහු එවු, නො එනු කැමැත්තහු එහි ම රැඳී වතුපිටි කුඹුරු හේන් වවා වඩා ගෙණ දිවි පවත් වවූ"යි කී ය. ඔවුහු තමන් අයත් හැම දූය මිටි බැඳ කර තබා ගෙණ අඹුදරුවනුත් සමග පිටත් ව ගියහ. සිටානන් කෙරෙහි ඇලී බැඳී සිටි පුණ්ණ නම් මෙහෙකරු තෙමේ සාබිය ගැණ නො සලකා සිටානන්ට පක්ෂ පාත ව වන්නෙක් වේවා යි සිටානන් වෙත ම රැඳී ගත්තේ ය. පුණ්ණ, සිටු, සිටුබිරිය, සිටුපුත්, සිටුලේළිය යන පස්දෙන එහි රැඳුනාහ. ඔවුහු වල කැණ එහි තැන්පත් කොට තුබූ ධාන්‍යය ද අවසන් වූ කල්හි බිත්තිවල මැටි ගස්වා තුබූ ධාන්‍යය බිම හෙලා දියෙන් තෙමා වී වෙන් කොට ගෙණ වියලා කොටා පොලා සහල් ගෙණ එයින් යැපුනාහ. සාබිය දිගින් දිගට පවත්නා කල්හි සිටුබිරිය, මැටි හා මුසු කොට තුබූ වී ද අවසන් වන බව දැක බිත්තිමුල්හි ඉතිරිව තුබූ වී ටිකත් බිත්තිමුල් හාරා අරගෙණ දියෙන් තෙමා සෝදා ගරු මැටිකැට හැර දමා දෙනැළියක් පමණ වී වණා ලා කොටා එක් සහල් නැළියක් ගෙණ "සායෙහි සොරු බොහෝ ය"යි සොරබිය නිසා කළයෙක ලා පස් නො වැටෙන ලෙසට වැසුන් බැඳ පොළොව සාරා වළෙහි ලා තැබූ ය.

දවසක් සිටු තෙමේ රජුට උවැටනට ගොස් අවුත් "සොඳුර! බඩගිනී යි, කන්නට මොකුත් තිබේ දැ"යි බිරියගෙන් ඇසී ය. ඕ තොමෝ තුබූ දූය නැතැ'යි නො කියා "හිමි! හාල් නැළියක් තිබේ ය"යි කිවු ය. "ඒ කොහි දැ?"යි ඇසූවිට "සොරබිය නිසා පොළොව වළක් සාරා එහි තැබූ ය"යි දැන් වූ ය. "එසේ නම් එය ගෙණ ටිකක් පිසව"යි කී කල්හි "හිමි! කැඳ පිසන්නෙම් ද, නැත, බත් පිසන්නෙම් ද? කැඳ පිසන්නෙම් නම් ඒ හාල් දෙවරකට සෑහෙන්නේ ය, බත් පිසන්නෙම් නම් එක් වරකට සෑහෙන්නේ ය, පිසන්නෙම් කැඳ ද, බත් දැ'යි කියනු මැනැවැ"යි කීවා ය. "අපට මේ හැර අන් පිහිටෙක් නැ නො වේ ද, බත් ම කාලා මැරෙමු, බත් ම පිසන්නැ"යි කී කල්හි ඕ තොමෝ බත් පිස කොටස් පහක් කොට සිටානන්ගේ කොටස පිහානට බෙදා ඔහුගේ ඉදිරියෙහි තැබූ ය.

ඒ වේලෙහි ගන්ධමාදනපර්වතයෙහි වැඩ වසන පසේ බුදුකෙනෙකුන් වහන්සේ සමාපත්තියෙන් නැගී සිට ලොව බලා වදාරණ සේක් එදවස දඹදිව පුරා පැවැති සාබියෙන්, සිටුගෙදරක පස්දෙනකුට

එක් ම සහල් නැළියක බත් පිසා ඇති බවත්, "මේ ගෙයි වැස්සෝ සැදැහැති ද, මට සඞ්ග්‍රහයක් කිරීමට මොවුනට හැකි දැ"යි විමසත් ඔවුන් සැදැහැතියන් බවත් දැක සිවුරු ගැටවටු ගත්වා පාත්‍රය ගෙණ ඒ සිටුගෙයි දොරකඩට පැමිණ තමත් දැක්වූ සේක. සමාපත්තිය තුළ දී සමාපත්තිබලය නිසා සමාපත්තික තෙමේ නො දැ පෙළෙන්නේ ය. සමාපත්තියෙන් නැගී සිටි කල්හි බඩගින්න උදරපටලය දවන්නාක් මෙන් බලවත්ව නැගී සිටියි. එහෙයින් සමාපත්තියෙන් නැගී සිටියේ ම ආහාරපාන ලැබෙන තැනක් බලා වඩින්නේ ය. එදවස උන්වහන්සේට යමක් පිදූයේ සෙනවිරත් තනතුරු ඈ යම්කිසි තනතුරක් ලබා සම්පත්තියෙන් ආඪ්‍ය වන්නේ ය.

සිටු තෙම් ගෙදර වැඩ සිටි උන්වහන්සේ දැක පහන් සිත් ඇතියේ "පෙරත් දන් පින්කම් නො කළ බැවින් මට දැන් මෙබඳු බිහිසුණු සායකට මුණ දෙන්නට සිදු විය, මේ බත් පිඟානෙන් ද මට එක් දවසක් ම බඩගිනි නිවා ගත හැකි ය, එහෙයින් මම මේ බත් පිඟාන මුන්වහන්සේට පුදන්නෙමි, එය මට නොයෙක් කප් කෙළ ගණනක් හිතසුව එළවනු එකාන්ත ය"යි සිතා අතට ගත් බත්පත පැත්තක තබා පසේ බුදුරජුන් වෙත එළැඹ පසඟ පිහිටුවා වැඳ ගේතුළට වැඩම කරවා අසුනෙහි වඩා හිඳුවා පා දෙවා ඒ බත්පත රත්මුවා දරණුවක තබා ගෙණවුත් බුදුරජුන්ගේ පාත්‍රයෙහි බැහී ය. එයින් අඩක් පාත්‍රයෙහි බහත් ම උන්වහන්සේ පාත්‍රය අතින් වැසූහ. එවිට සිටු තෙමේ "සවාමීනි! පස් දෙනකුන් උදෙසා එක් සහල් නැළියකින් පිසූ බතින් මේ එක් කොටසෙකි මෙය නැවැත දෙකට බෙදන්නට නො හැකි ය, මට මෙලොවින් සඞ්ග්‍රහයෙක් වුවමනා නැත, මම මේ බත් සියල්ල බුදුරජුන්ට පුදනු කැමැත්තෙමි, එහෙයින් මේ බත්පත පිළිගත මැනැවැ"යි බත්පත පිළිගැන් වී ය. පිළිගත්වා "සවාමීනි! මෙයට පසු කිසිකලෙක උපනුපන් තැනක මෙබඳු සාබියෙක් දක්නට නො ලැබේවා, මෙතැන් පටන් සියලු දඹදිව් වැස්සනට බත්බිජුවට දෙන්නට මම සමත් වෙම්වා, ජීවිකාව පිණිස සියතින් වැඩ කිරීමෙහි ගැහැටෙක් නො වේවා, මේ එක් දහස් දෙසිය පණසක් කොටුගුල් සිස් කරවා පිරිසිදු කරවා ඉස් සොදා නාපියා කොටුගුල් දොරකඩ සිට මා උඩ බැලූ ඇසිල්ලෙහි ම රත්හැල් වී කඳුවලින් මාගේ කොටුගුල් පිරී ඉතිරී යේවා, එසේ ම උපනුපන් හැම තැන මේ බිරිය මට බිරිය වේවා, මේ පුත් මට පුත් වේවා, මේ ලේළිය මට ලේළි වේවා, මේ දස් මට දස් වේවා"යි පැතී ය.

මේ පිදීම් පැතීම් දුටු ඔහුගේ බිරිය ද ''මාගේ හිමි බඩසයින් පෙළෙද්දී මම කෙසේ කන්නෙම් දැ''යි තමාගේ බත් කොටසත් පසේ බුදුරජුන්ට පුදා ''ස්වාමීනි! සසර උපදනා තාක් කිසි කලෙක මෙබඳු සායක් දක්නට නො ලබම්වා, බත්තලිය ඉදිරියෙහි තබා-ගෙණ දඹදිව් වැසි සියල්ලනට බත් බෙදා දී මා එතැනින් නැගී සිටිනාතුරු බත්තලිය පිරී ඉතිරී සිටියේ ම වේවා, එහි අඩුබවක් නම් නො දකිම්වා, මෙ තෙමේ මට ජාති ජාතියෙහි හිමි වේවා, මෙතෙමේ මට පුත් වේවා, මෝ මට ලේලි වේවා, මෙතෙමේ මට දස් වේවා''යි තම හිමියා පැතූ සේ පැතූ ය.

පුත්‍ර තෙමේ ද තමාගේ කොටසත් පුදා ''මෙතැන් පටන් මේ පිණින් මෙවැනි බිහිසුණු සාගතයකට මූණදීමක් නො ලබම්වා, කහවණු දහසක් ලා බැඳි පසුම්බියක් ගෙණ දඹදිව් වැසි සියලු දෙනාට මුදල් බෙදා දෙන අතරේදී මාගේ මුදල් පසුම්බිය මොන-ලෙසකිනුත් අඩු නො වේවා, පිරී සිටියේ ම වේවා, මේ දෙමවු-පියෝ ම මට සසර වසනතුරු මවුපියහු වෙත්වා, මෝ ම මට බිරිය වේවා, මේ තෙමේ ම දස් වේවා''යි පැතුයේ ය.

ලේලි ද තම කොටස පුදා ''මෙවක් පටන් මෙබඳු දරුණු දුකකට කිසිදාකත් හසු නො වෙම්වා, එක් ම වී පැසක් ගෙණ දඹදිව වසන්නවුනට බෙදා දෙන ගමනේ දී එහි වීවල කිසිම අඩුබවෙක් නො වේවා''යි පතා ගත්තා ය.

දාසයා ද තමාට ලැබුනු කොටසත් පුදා ''මෙසේ වූ දුර්භික්‍ෂයෙක් කවදාකත් නො වේවා, මා සීසාන විට මැතින් හීවට තුනක, ඈතින් හීවට තුනක, මැදින් එක් හීවටෙකැ යි දූව ඔරුවක් පමණ වූ හීවට සත සත එකවිට ම යේවා''යි පතා ගත්තේ ය. දාසයා මේ පිණෙන් එදවස ම සෙනෙවිරත්තනතුරු ලබන්නට සමර්‍ථ ව සිටියේ ද තම ස්වාමියා කෙරෙහි වූ සෙනහයෙන් ''මොවුහු ම මාගේ ස්වාමීහු වෙත්වා''යි පැතී ය. එහෙයින් සෙනෙවිරත්තනතුර එදවස නො ලැබින.

පසේ බුදුරජානන් වහන්සේ ඔවුන්ගේ පැතුම් අවසන්හි ''එසේ වේවා''යි වදුරා ප්‍රත්‍යෙක බුද්ධගාථාවන්ගෙන් අනුමෙවෙනි කොට ''මා විසිනුදු මොවුන්ගේ සිත් පැහැද විය යුතු ය'' යි සිතා ''මා ගන්‍ධමාදන පර්‍වතයට යනතුරු මොවුහු මා දකිත්වා''යි ඉටා ගන්‍ධමාදන පර්‍වතයට වැඩිය සේක. ඔවුහු ද ඈස්පිය නො හෙළා උන්වහන්සේ දෙස බලා සිටියහ. උන්වහන්සේ ගෙණ ගිය හාල් නැළියේ බත් පන්සියයක් පසේ බුදුවරුනට බෙදා දී වැළඳූ සේක. ඒ බත් උන්වහන්සේගේ ආනුභාවයෙන් හැම

දෙනා වහන්සේට සැඟී ගියේ ය. ඔවුහු උන්වහන්සේලා වළඳනු ද බලා සිටියහ. මැදි දහවල ඉක්ම ගිය පසු සිටු බිරිය සැළිය සෝදා වසා තැබූ ය. සිටු තෙමේ බඩගිනි ඉවසනු නො හැකි ව වැදහෙව නිදන්නට වන. සවස නින්දෙන් නැගිට "සොඳුර! බඩගිනි ඉවසනු නො හැකි ය, සැළි පතුලෙහි දම්කොඩවක් තිබේ දැ"යි ඇසී ය. ඕ, සැළිය සෝදා වසා තුබූ බව නො කියා "සැළිය ඇර බලා කියමි"යි නැගිට සැළිය තුබූ තැනට ගොස් සැළිය ඇර බැලූ ය. එ වේලෙහි මේරූ දෑසමන් මොට්ටු තරම් වූ බත් ඇටවලින් සැළිය වසා තුබූ පියන් පත මතු වී තිබෙනු දැක ප්‍රීතියෙන් පිණා ගිය සිරුරු ඇත්තී "හිමි! නැගිටින්න, මම සැළිය සෝදා වසා තැබීමි, එය දැන් මේරූ දෑසමන් මල් මොට්ටු තරම් බත් ඇටවලින් පිරී තිබේ, පින් නම් කළ යුතුම ය, දන් නම් දිය යුතුම ය, හිමි! නැගී සිටින්න, දන් දීමෙහි විපාක අනුන්ගෙන් අසා දැනගත යුතු නො වේ, අපි ම ඇසින් දුටුම්හ, නැගිට මූණ කට සෝදා බත් වළඳනු මැනැවැ"යි කියා සිටියා ය. මෙසේ ඕ, පළමු කොට පිය පුතුනට බත් දී ඔවුන් වළඳා අවසන් කළ කල්හි ලේළිය හා එක්ව හිඳ බත් කාලා පූර්ණහට ද බත් දුන්නී ය. එහෙත් ඒ බතෙහි අඩුබවෙක් නො වී ය. බත් ගත් තැන් පිරී සිටියේ ය. හැන්දෙන් එක් වරක් ම බත් ගත්තා සේ පෙණිනා. එදා ම කොටුගුල් හැළිවළන් ආදීහු ද පෙර පිරී තුබූ සේ පිරී සිටියහ. "සිටුගේ ගෙයි බත් උපන, ඉන් ප්‍රයොජන ඇත්තෝ අවුත් ගණිත්වා"යි මුළු නුවර ප්‍රසිද්ධ කළහ. මිනිස්සු සිටු ගෙට ගොස් බත් බිජුවට ගත්හ. දඹදිව් වැසි සියල්ලෝ ඒ සිටු පවුල නිසා දිවි ලැබූහ.

සිටු තෙමේ එයින් ච්‍යුත ව දෙව්ලොව ඉපද අප බුදුරජුන් දවස දක්වා දෙව් මිනිසුන් අතර සැරි සරණුයේ මෙ දවස භද්දිය නුවර සිටු ගෙයි උපන. ඔහුගේ බිරිය ද මහාසම්පත් ඇති කුල ගෙයක ම උපන්නී ය. ඉප ද වැඩිවිය පැමිණියා මෙණ්ඩක සිටාණන් හා ශරණ ගියා ය. සිටාණන් පෙර කළ කුශලකර්මයන් නිසා ඔහුගේ ගේ පිටිපස යට කියූ ලෙසින් රන් එළුවෝ පොළොවින් නැගී සිට ගත්හ. ඔවුන්ගේ එවක පුත් මෙදා ත් ඔවුනට පුත් විය. එවක ලේළි මෙදාත් ලේළි වූ ය. එවක දස මෙදාත් දස විය.

දවසක් සිටු තෙමේ තමන් කළ පින් විමසනු කැමැත්තේ එක් දහස් දෙසිය පණසක් කොටුගුල් පිරිසිදු කරවා ඉස් සෝදා නාපියා දොරකඩ සිට අහස දෙස බැලී ය. එකෙණෙහි සියලු කොටුගුල් රත්හැල් වී කඳුවලින් පිරී ගත. නැවැත සිටු, සෙස්ස-

වුත්ගේත් පිත් විමසනු කැමැති ව සිටු බිරියට, පුතුට, ලේළියට, දසයාට තමත් විමසූ ලෙසින් තම තමත්ගේ පින් විමසා බලවූ,යි නියම කෙළේ ය.

ඉක්බිති සිටුබිරිය සියලු අබරණ ලා සැරසී මහාජනයා බලා ඉන්ද දී ම සහල් නැළියක් මත්නවා ඉන් බත් පිසවාලා දෙර කොටුවෙහි පුටුවක් ගෙන්වා තබා හිඳ රන් හැන්දක් ගෙණ "බත් වුවමනා අය එන්වා"යි ප්‍රසිද්ධ කරවා ආ ආවුනට උන් එළ වූ බඳුන් පුරවා බත් දුන්නී ය. මෙසේ ආ ආවුනට බඳුන් පුරා දවස මුළුල්ලෙහි බත් දුන්නී ද, සැළියෙහි බත්වල මදවූත් අඩු බවෙක් දක්නට නො ලැබිනා. ඈය පෙර බුදුරජුනට හා භික්ෂුසඞ්ඝයාහට වම් අතින් හැළිය අල්ලා ගෙණ දකුණතින් හැන්ද ගෙණ පාත්‍ර පුරවා බත් දුන් බැවින් වම් අත්ල පුරා පියුම් ලකුණෙක් පිහිටියේ ය. දකුණු අත්ල පුරා සඳ ලකුණෙක් පිහිටි-යේ ය. වමතින් ඞබරාව ගෙණ භික්ෂුසඞ්ඝයාට පැන් පෙරා දෙමින් එහා මෙහා හැසුරුණී ද, එහෙයින් දකුණු පාදතලය පුරා සඳ ලකුණත් වම් පාදතලය පුරා පියුම් ලකුණත් පිහිටා ගත. මෝ **චන්ද්‍රපදුමා** යි නම් ඇත්තී වූවා එහෙයිනි.

පුත්‍ර තෙමේ හිස පටන් නා පියා කහවණු දහසක් බහා බැඳි මුදල් පසුම්බියක් ගෙණ "මුදල් වුවමනා අය එන්වා"යි ප්‍රසිද්ධ කරවා ආ ආවුනට උන් අත තුබූ මලු පුරවා සිය දහස් ගණනින් කහවණු දුන්නේ ය. එහෙත් තමත්ගේ මුදල් පසුම්බියෙහි තුබූ කහවණු දහසෙහි එකෙකිනුදු අඩුවෙක් නො වී ය.

ලේළි, මයිලනු කී ලෙසට ඇඳුම් කැඩුම් ලා අබරණින් සැරසී වී පිරූ පැසක් ගෙණ මිදුලෙහි හිඳ "බත් බිජුවට වුවමනා අය එන්වා"යි දන්වා ආ ආවුනට උන් ගෙණ ආ ගෝනි මලු පැස් පුරවා වී බෙදා දුන්නී ය. එහෙත් තමත්ගේ වී පැසෙහි අඩු-වෙක් නො වී ය.

දස, ඇඳුම් ආයිත්තම් ලා සැරසී රන්වියගස්හි රනින් කළ රැහැන්වලින් ගොනුන් බැඳ රන් කෙවිටක් ගෙණ ගොනුන් දෙදෙනාගේ ඇඟපත සුවඳ පසඟුල් දීලා සුවඳවත් කොට සරසා අංවල රන්කොපු බහා කුඹුරට ගෙණ ගොස් සීසාන්නට පටන් ගත්තේ ය. මෑතින් තුනක, ඈතින් තුනක, මැදත් එකෙකැයි හීවට සතක් එක්වට ම පොළොව බිඳ ගියේ ය. දඹදිව් වැස්සෝ එදවස බත් බිජුවට හා රන් අමුරන් මිල මුදල් අතුරෙහි තම තමන් කැමැති දෑය සිටුගෙදරින් ම ලබා ගත්හ.

මෙසේ මහත් ආනුභාව ඇති සිටු තෙමේ බුදුරජාණන් වහන්සේ භද්දිය නගරයට වැඩිසේකැ යි අසා පෙර ගමන් කිරීමට සූදානම් ව ගෙයින් නික්ම ගියේ අතරමගදී හමු වූ තීර්ථකයන් විසින් "කිම, ගැහැවිය! ක්‍රියාවාදී වූ තමුසේ අක්‍රියාවාදී වූ මහණ ගොයුම් වෙතට යන්නහු ද"යි වළකනු ලබන්නේ ද ඔවුන්ගේ කියුම් නො පිළිගෙණ බුදුරජුන් වෙත ගොස් වැඳ එකත් පසෙක හුන්නේ ය. එකල්හි ඔහුට බුදුරජාණන් වහන්සේ අනුපිළිවෙළ කතාව වදාළ සේක. ඒ දෙශනාවසානයෙහි සිටු තෙමේ සෝවන් පලයෙහි පිහිටා ගෙණ තීර්ථකයන් බුදුරජුන්ගේ අගුණ කියා තමන් බුදුරජුන් වෙත පැමිණීම වළකාලන්නට කළ උත්සාහය දන්වා සිටියේ ය. ඉක්බිති බුදුරජාණන් වහන්සේ "ගැහැවිය! මේ සත්ත්වයෝ තමාගේ මහත් වූ ද දෙෂය නො දක්නෝ ය, අනුන්ගේ නැත්තා වූ ද දෙෂය ඇත්තක් කොට ඒ ඒ තැන සිට රොඩු බොල් පොළා හරින්නා සේ පතුරුවා හරින්නෝ ය"යි වදාරා මේ ධර්මදෙශනාව කළ සේක.

**සුදස්සං වජ්ජමඤ්ඤෙසං අත්තනො පන දුද්දසං,**
**පරෙසං හි සො වජ්ජානි ඔපුණාති යථාභුසං,**
**අත්තනො පන ඡාදෙති කලිංව කිතවා සඨො.**

අනුන්ගේ වරද සුවසේ දක්ක හැකි ය. තමාගේ වරද වූකලී දක්නට දුෂ්කර ය. ඒ එසේ ම ය. (අනුන්ගේ වරද සොයන) හෙතෙමේ අනුන්ගේ දෙස් බොල් පොළා හරින්නා සේ පොළාලයි. කොළ අතු ආදියෙන් සිරුර වසාලන ළිහිණි වැද්දකු මෙන් තමාගේ වරද වසාලයි.

**සුදස්සං වජ්ජං අඤ්ඤෙසං** = අනුන්ගේ ඉතා සවල්ප වූ ද වරද සුවසේ දක්ක හැකි ය.

අනුන්ගේ වරද ඉතා කුඩා වුව ද එය සුවසේ දක්ක හැක්කේ නුවණ මද එලොව මෙලොව නො දන්නවුනට ය. ඔවුනට අනුන්ගේ අබැටක් තරම් වූද වරද මහමෙර තරමට මහත් ව පෙණී යන්නේ ය. **"පරස්ස අනුමත්තම්පි වජ්ජං ඛලිතං සුදස්සං, සුඛෙන පස්සිතුං සක්කා"** යනු අටුවා.

**වජ්ජ** යනු හෙරියෙහි හා දෙෂයෙහි නැගී සිටියි. **"වජ්ජං වාදියන්ති"** යන මෙහි හෙරියෙහි ද, **"වජ්ජභීරුකො"** යනාදි- යෙහි දෙෂයෙහි ද වැටෙ යි. **අඤ්ඤෙසං** යනු අඤ්ඤ ශබ්දයෙන් පදභාවයට ආයේ ය. සර්වනාමයෙකි. බාලාර්ථයෙහි සිටුනා කල්හි මෙය සර්වනාම වේ.

**අත්තනො පන දුද්දසං** = තමන්ගේ මහත් වූ ද වරද දක්ක නො හෙන්නේ ය.

තමන් කයින්-වචනයෙන්-සිතින් කරණ මහවරද සුළු කොට ගැණීම නුගත් ලොකයාගේ සිරිත ය. ඒ නො මැනැවි. වරද සුළු වුව ද සුළු කොට ගැණීම නො සුදුසු ය. වරද සුළු කොට ගැණීම, කළ වරදටත් වඩා වැඩි තරම් වරදෙකි. **"අණුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවී"** යනු වදාළෝ ඉතා කුඩා වරද ද භය වශයෙන් මහත් කොට, මහත් වරදක් කොට ගත යුතු බව දක්වනු සඳහා ය. එහෙයින් වරද සුළුය යි කිසි-විටෙකත් නො ගත යුතු ය. එය අනිෂ්ටවිපාක නො දෙන්නෙක් නො වේ.

**පරෙසං හි සො වජ්ජානි ඔපුණාති යථාභුසං** = අනුන්ගේ වරද සොයන හෙතෙමේ අනුන්ගේ ස්වල්ප වූ ද වරද රොඩු බොල් පොළන්නක්හු මෙන් පොළන්නේ ය:

උස් තැනක සිට රොඩු බොල් පොළාලන කල්හි ඒ රොඩු බොල් සුළඟට අසුවීමෙන් අවට සැම තැන පැතිර යන්නා සේ දවරැහි අනුන්ගේ වරද සොය සොයා ඇවිදුනා තැනැත්තේ ඒ තමා දුටු පරා පිළිබඳ ඉතා සුළු වරද ද මහත් කොට ගෙණ ගෙයක් ගානේ යමින් සැම තැන පතුරුවා ලන්නේ ය. මේ වනාහි තමාගේ මහත් වරද සුළු කොට ගැණීමට ද වඩා දරුණු ය.

**අත්තනො පන ඡාදෙති කලිං ඉව කිතවා සඨො** = කොළ අතු ආදියෙන් තම සිරුර වසාලන ලිහිණි වැද්දකු මෙන් තම වරද වසාලයි.

මෙහි සිරුර **කලි** නම්. පක්ෂීන් රවටා උන් මරාලන බැවිනි. **"එත්ථ සකුණෙසු අපරජ්ඣනභාවෙන අත්තභාවො කලි නාම"** යනු අටුවා. කොළ අතු ආදියෙන් සිරුර වසා ලනුයේ **කිතවා.** 'සඨො' යනු වෙසෙසා සිටියේ ය. ලිහිණි වැද්දා **සඨ** නම්. ලිහිණි වැද්දා යම්සේ පක්ෂීන් අල්වා ගෙණ මරණු කැමැත්තේ සිය සිරුර කොළ අතු ආදියෙන් වසා ගෙණ සැඟවී සිටී ද, එමෙන් මෙතෙමේ තමාගේ වරද වසා ගෙණ හිඳින්නේ ය. කොළ අතු ආදියෙන් සිය සිරුර වසා ගෙණ හිඳින ලිහිණි වැද්දකු මෙන් මෙතෙමේ ඉතා මහත් වූ ද තමාගේ දෙෂය තමාගේ වරද සඟවා ගෙණ හිඳින්නේ ය.

ධර්මදෙශනාවගේ අවසානයෙහි බොහෝ දෙන සෝවාන් පලාදියට පැමිණියාහු ය.

**මෙණ්ඩකශ්‍රෙෂ්ඨිවස්තුව නිමි.**

# උජ්ඣානසඤ්ඤි ස්ථවිර

## 18 — 11

උජ්ඣානසඤ්ඤි ස්ථවිර තෙමේ "මූ මෙසේ කන්නේ ය, මූ මෙසේ පොරව න්නේ ය, මූ මෙසේ හිඳින්නේ ය, මූ මෙසේ කියන්නේ ය, බොන්නේ ය, නිදන්නේ ය, යන්නේය"යි භික්‍ෂූන් වහන්සේලාගේ සිදුරු සොයමින් දවරු දෙක්හි අතැන මෙතැන තැන තැන ඇවිදින්නේ ය. එකල්හි භික්‍ෂූන් වහන්සේලා බුදු-රජුන් වෙත ගොස් "ස්වාමීනි! අසුවල් ස්ථවිර, භික්‍ෂූන්ගේ සිදුරු සොයමින් අතැන මෙතැන ඇවිදින්නේ ය"යි දන්වා සිටියහ. "මහණෙනි! යමෙක් යමකු නිසි මග යවන්නට වත පිළිවෙතෙහි යොදන්නට සිතා අවවාද විසින් වත් හිස සිට මෙසේ කියා නම්, හේ ගරහනුයේ නො වේ, නො ගරහනුයේ ය, යමෙක් අන්හු හෙලා දකිනු කැමැති ව අනුන්ගේ සිදුරු සොයසොයා මෙසේ කියමින් හැසිරේ නම් ඔහුට ධ්‍යානාභිඥ අතුරෙහි කිසි විශෙෂයෙක් නො ලැබෙන්නේ ය, හුදෙක් ඔහුට ආස්‍රවයෝ ම වැඩෙති"යි වදාරා මේ ධම්දෙශනාව කළ සේක.

**පරවජ්ජානුපස්සිස්ස නිච්චං උජ්ඣානසඤ්ඤිනො,**
**ආසවා තස්ස වඩ්ඪන්ති ආරා සො ආසවක්ඛයා'ති.**

අනුන්ගේ වරද දක්නා සුලු නිතර අන්හට දෙස් කියන සුලු ඔහුට ආස්‍රවයෝ වැඩෙන්නාහ. හෙතෙමේ රහත් බැවින් දුරුයි.

**පරවජ්ජානුපස්සිස්ස** = අනුන්ගේ වරද දක්නා සුලු වූ.

**නිච්චං උජ්ඣානසඤ්ඤිනො** = නිතර අනුන්ගේ දෙස් කියන සුලු වූ.

**ආසවා තස්ස වඩ්ඪන්ති** = ඔහුට ආස්‍රවයෝ වැඩෙත්.

නිතර අනුන්ගේ සිදුරු සොයමින් 'මෙසේ හැන්ද යුතු ය' මෙසේ පෙරවිය යුතු ය, මෙසේ කෑ යුතු ය, මෙසේ බිණිය යුතු ය, යනාදීන් අනුනට දෙස් පරොස් බස් කියන්නහුට ආස්‍රවයෝ වැඩෙත්.

කාම – භව – දිට්ඨි – අවිජ්ජා යන මොවුහු ආස්‍රවයෝ ය. මෙ කියූ ආස්‍රවයෝ යට කී ලෙසින් දෙස් පරොස් කියන ගිහියනට හා පැවිද්දනට දවරු දෙක්හි නිතර වැඩෙන්නාහ.[1]

**ආරා සො ආසවක්ඛයා** = හෙතෙමේ රහත් බැවින් දුරු ය.

ඒ පුද්ගලයාහට ධ්‍යානාදිගුණවිශෙෂයකුත් නො ලැබෙන කල්හි රහත්බව ලැබෙනු යි කිසිලෙසකින් නො කියහැකි ය.[2] **ආරා** යනු මෙහි දූරාර්‍ථයෙහි නිපාතයෙකි.

ධම්දෙශනාවගේ අවසානයෙහි බොහෝ දෙන සෝවන් පලාදියට පැමිණියාහු ය.

**උජ්ඣානසඤ්ඤිස්ථවිර වස්තුව නිමි.**

---

1. 7. 4. 'යස්සාසවා' යනු බලනු.
2. 14. 6. 'දුක්ඛස්ස ච අනිත්තමං' ,, ,,

## සුභද්‍රපරිව්‍රාජක

### 18 — 12

සුභද්‍ර පරිව්‍රාජක තෙමේ පෙර තමන්ගේ කනිටු බෑයා, එක් ගොයම් වාරයක දී නව වරක් අගස් දන් දෙනු දැක ද, තෙමේ දන් නො දෙනු කැමැති ව මග හැර හැර පසු බැස සිට පසු ව එක් දනක් දුන්නේ ය. එහෙයින් බුද්ධත්වයෙන් ප්‍රථම අවස්ථා-යෙහි හා මධ්‍යම අවස්ථායෙහි බුදුරජුන් දක්නට මොහුට වාසනාවක් නො පැදුනී ය. අවසානයෙහි බුදුරජුන් පිරිනිවන් පාන්නට වැදහොත් කල්හි "කරුණු තුනක් පිළිබඳ ව මා සිත් තුළ උපන් සැක ය මහලු පිරිවැජියන් විචාලෙම් ද, මහණ ගොයුම් දහරු යී සිතා උන් අතින් නො විචාලෙමි, දැන් ඔහු පිරිනිවන් ඇදේ වැතිර හෝතේ ය, මේ කරුණු තුන ඔහු අතින් නො විචාලොත් මට විපිළිසරක් විය හැකි ය, එබඳු විපිළිසරෙක් නූපදීවා" යි සුභද්‍ර, බුදුරජුන් වෙත ගියේ ය. ගොස් සිටි කල්හි අනඳ තෙරුන් විසින් බුදුරජුන් වෙත එළැඹීම වළකනු ලද්දේ ය. එකල්හි "ආනන්ද! සුභද්‍ර නො වළකන්න, ඔහුට මා වෙතට එන්නට ඉඩ දෙන්න, ඔහු ඇවිත් සිටිනුයේ මාගෙන් ප්‍රශ්නයක් අසනු සඳහා ය" යි බුදුරජුන් වදාළ කල්හි ආනන්ද ස්ථවිරයන් වහන්සේ ඔහුට බුදුරජුන් වෙත යන්නට ඉඩ දුන්හ. එකල්හි ඔහු එහි තිරය ඇතුළට වැද ඇඳ යටට වී හිඳ "පින්වත් මහණ! කිම, අහස පිය සටහන් ඇත්තෙක් ද? මෙයින් පිටත මහණහු වෙත් ද? සදාකාලික වූ සංස්කාරයෝ ඇද්ද?" යි මේ ප්‍රශ්න තුන ඇසී ය. බුදුරජාණන් වහන්සේ අහසෙහි පියසටහන් නැති බවත් මින් පිටත මහණුන් නැති බවත් නො නස්නා වූ සංස්කාරයන් නැතිබවත් වදාරණ සේක් මේ ගාථාවන්ගෙන් ධර්මදේශනා කළ සේක.

**ආකාසෙව පදං නත්‍ථි සමණො නත්‍ථි බාහිරෙ,**
**පපඤ්චාභිරතා පජා නිප්පපඤ්චා තථාගතා.**
**ආකාසෙව පදං නත්‍ථි සමණො නත්‍ථි බාහිරෙ,**
**සඞ්ඛාරා සස්සතා නත්‍ථි නත්‍ථි බුද්ධානමිඤ්ජිතං.**

අහසෙහි පියසටහනෙක් නැත. බැහැරි සසුන්හි මහණෙක් නැත. සත්ත්වප්‍රජාව ප්‍රපඤ්චයෙහි ඇලුනී ය. තථාගතයන් වහන්සේ ප්‍රපඤ්ච රහිතයහ.

අහසෙහි පියසටහනෙක් නැත. බැහැරි සසුන්හි මහණෙක් නැත. නිත්‍ය වූ සංස්කාරයෝ නැත. බුදුවරුන්ට කම්පනයෙක් නැත.

**ආකාසෙ එව පදං නත්‍ථි** = අහසෙහි පාසටහනෙක් නැත.

අහසෙහි දක්වාලිය හැකි වර්‍ණයෙක් සටහනෙක් නැත්තේ ය. අහස, පැහැසටහනෙකුත් දක්විය හැකි තැනෙක් නො වේ. සිස් තැනක් බැවිනි.[1] එසේ නම් පාසටහනක් දක්විය නො හැකිය යනු කියයුතු නො වේ.

**පද** ශබ්දය ස්ථාන – රක්‍ෂා – නිර්‍වාණ – හෙතු – ශබ්ද – වස්තු – කොට්ඨාස – පාද – පාදලාඤ්ඡන යන අරුත්හි වැටේ. මෙහි ආයේ පාදලාඤ්ඡනයෙහි ය. **ඒ** පාසලකුණ ය. අහසෙහි පාසලකුණු දක්විය නො හැකි ය.

**සමණො නත්‍ථි බාහිරෙ** = බැහැරි සසුන්හි මහණෙක් නැත.

**සමණ** නම්: රාගාද්‍වෙෂාදී වූ කෙලෙස් සන්සිඳ වූයේ ය.[2] **බාහිර** නම්: දුරක්ඛාතසාසනයෝ ය. යම් ශාසනයෙක් ආය්‍ර්‍යාෂ්ටාඞ්ගික මාර්‍ගයෙන් තොර වූයේ නම් ඒ ශාසනය දුරක්ඛාත ය. එබඳු දුරක්ඛාතසාසනයෙක මාර්‍ගස්ථ-ඵලස්ථ විසින් අටවැදෑරුම් වූ ශ්‍රමණයෝ නො ලැබෙත්. ඒ තබා කල්‍යාණ පෘථග්ජනයකුගේ උපතෙකුදු එහි නො වන්නේ ය.

**පපඤ්චාභිරතා පජා** = සත්ත්වප්‍රජාව ප්‍රපඤ්චයෙහි ඇලුනී ය.

තෘෂ්ණා-දෘෂ්ටි-මානයෝ **ප්‍රපඤ්ච** නම් වෙත්. තෘෂ්ණා-ප්‍රපඤ්චය **එක්සිය** අටවැදෑරුම් ය. දෘෂ්ටිප්‍රපඤ්චය දෙ සැට වැදෑරුම් ය. මානප්‍රපඤ්චය නවවැදෑරුම් ය.[3] **පජා** නම්: සත්ත්ව ලොකය යි.

**නිප්පපඤ්චා තථාගතා** = තථාගතයන් වහන්සේ ප්‍රපඤ්ච-රහිතය හ.

තථාගතයන් වහන්සේ බෝ මැඩදී ම සියලු ප්‍රපඤ්චයන් මුලසුන් කල සේක. **තථාගත** නම්, සම්මා සම්බුදුරජානන් වහන්සේ ය. උන්වහන්සේ අට කරුණෙකින් තථාගත සේක. මේ ඒ අට කරුණ:

**තථා ආගතොති = තථාගතො** = යම් අභිනීහාරයකින් පසු දාන – සීල – නෙක්ඛම්ම – පඤ්ඤා – විරිය – ඛන්ති – සච්ච – අධිට්ඨාන – මෙත්තා – උපෙක්ඛා යන පාරමීධර්‍ම, පාරමී – උපපාරමී – පරමත්‍ථ පාරමීන් විසින් සම තිසක් කොට පුරා අඞ්ග-අත්ත-ධන-දාර-රජ්ජ

1. 7. 4. ‘ආකාසෙව’ යනු බලනු.
2. 14. 4. ‘සමණො’ ,, ,,
3. 14. 9 ‘පපඤ්චසමතික්කන්තො’ ,, ,,

යන මහාපරිත්‍යාග කොට විදර්ශී ආදී වූ සම්බුදුවරයෝ යම් සේ ආවාහු ද අපගේ සම්බුදුරජාණන් වහන්සේත් එසේ ආ සේක් තථාගත නම් වූහ, යනු විතර හැර කොටින්.

"යථෙව ලොකම්හි විපස්සි ආදයො
සබ්බඤ්ඤුභාවං මුනයො ඉධාගතා,
තථා අයං සක්‍යමුනීපි ආගතො
තථාගතො වුච්චති තෙන චක්ඛුමාති"

යනු ද මෙහිලා සාධක.

**තථා ගතොති=තථාගතො** = මනුලොව එළිය දුටු ඇසිල්ලෙහි විදර්ශී ආදී වූ සම්බුදුවරයෝ සමපයින් පොළොව පිහිටා ගෙණ උතුරු දිගට මුණ ලා යම් සේ සත් පියවරක් තබා ඉදිරියට ගියාහු ද, අපගේ සම්බුදුරජාණන් වහන්සේත් එසේ වැඩි සේක් තථාගත නම් වූහ, යනු විතර හැර කොටින්.

"මුහුත්තජාතොව ගවම්පතී යථා
සමෙහි පාදෙහි ඵුසී වසුන්ධරං,
සො වික්කමී සත්තපදානි ගොතමො
සෙතඤ්ච ඡත්තං අනුධාරයුං මරූ,

ගන්ත්වාන සො සත්තපදානි ගොතමො
දිසා විලොකෙසි සමා සමන්තතො,
අට්ඨඞ්ගුපෙතං ගිරම්බ්භුදීරයී
සීහො යථා පබ්බතමුද්ධනිට්ඨිතොති"

යනු ද මෙහිලා සාධක.

**තථලක්ඛණං = ආගතොති = තථාගතො** = සියලු රූපාරූප ධර්ම යන්ගේ සත්‍ය වූ නිබොරු වූ ස්වලක්‍ෂණ – සාමාන්‍ය ලක්‍ෂණ, ඥානගතියෙන් අවබොධ කළ සේක්, ස්වලක්‍ෂණ – සාමාන්‍ය ලක්‍ෂණයන් අවිරුද්ධ කොට දත් සේක් තථාගත නම් වූහ, යනු විතර හැර කොටින්.

"සබ්බෙසං පන ධම්මානං සකසාමඤ්ඤලක්ඛණං,
තථමෙවාගතො යස්මා තස්මා නාථො තථාගතොති."

යනු ද මෙහිලා සාධක.

**තථධම්මෙ යථාවතො අභිසම්බුද්ධොති තථාගතො** = තථධර්ම සඞ්ඛ්‍යාත දුඃඛ – සමුදය – නිරොධ – මාර්ගසත්‍යයන් මැනැවින් අවබොධ කළ සේක් තථාගත නම් වූහ, යනු විතර හැර කොටින්.

**"චත්තාරිමානි භික්ඛවෙ! තථානි අවිතථානි අනඤ්ඤථානි කතමානි චත්තාරි? ඉදං දුක්ඛං අරියසච්චන්ති භික්ඛවෙ! තථමෙතං අවිතථමෙතං අනඤ්ඤථමෙතන්ති විත්ථාරො, තානි ච භගවා අභිසම්බුද්ධො, තස්මාපි තථානං අභිසම්බුද්ධත්තා = තථාගතො"** යනාදිය ද මෙහිලා සාධක.

**තථදස්සිතාය = තථාගතො** = දෙවියන් සහිත ලොකයෙහි අපරිමිත ලොකධාතූන්හි අපරිමිතසත්ත්වයන්ගේ චක්ඛු - සොත - ඝාණ - ජිව්හා - කාය - මන යන ද්වාරයනට ගොදුරු වූ හමු වූ රූප - සද්ද - ගන්ධ - රස - ඵොට්ඨබ්බ - ධම්ම යන ආරම්මණ අවබොධ කළ සේක් තථාගත නම් වූහ, යනු විතර හැර කොටින්.

**"යං සදෙවකස්ස ලොකස්ස -පෙ- සදෙවමනුස්සාය අපරිමාණාසු ලොකධාතුසු අපරිමාණානං සත්තානං චක්ඛුද්වාරෙ ආපාථං ආගච්ඡන්තං රූපාරම්මණං නාම අත්ථි, තං භගවා සබ්බාකාරතො ජානාති පස්සති"** යනාදිය ද මෙහිලා සාධක.

**තථවාදිතාය = තථාගතො** = සම්මා සම්බුද්ධ රජානන් වහන්සේ යම් රැයක නිරුත්තර වූ සම්බොධිය සමධිගමය කොට යම් රැයක අනුපාදිශෙෂ නිර්වාණධාතුයෙන් පිරිනිවි සේක් ද, මේ අතර පන් සාළිස් වසක් මුළුල්ලෙහි සත්‍ය වූ අත් පරිදි නො වූ සූත්‍රගෙය්‍යාදි ධර්ම සමූහය දෙසූ සේක් රාගමදාදි මද නිම්මදනය කළ සේක් තථාගත නම් වූහ, යනු විතර හැර කොටින්.

**"යඤ්ච චුන්ද! රත්තිං තථාගතො අනුත්තරං සම්මාසම්බොධිං අභිසම්බුජ්ඣති, යඤ්ච රත්තිං අනුපාදිසෙසාය නිබ්බානධාතුයා පරිනිබ්බායති, යඤ්ච එතස්මිං අන්තරෙ භාසති ලපති නිද්දිසති, සබ්බං තං තථමෙව හොති න අනඤ්ඤථා, තස්මා තථාගතොති වුච්චති"** යනු ද මෙහිලා සාධක.

**තථාකාරිතාය = තථාගතො** = සම්මා සම්බුද්ධරජානන් වහන්සේ කය වචනයටත්, වචනය කයටත් අනුලොම් කොට යම්සේ කියූ සේක් නම් එසේ කළ සේක්, යම්සේ කළසේක් නම් එසේ කී සේක් තථාගත නම් වූහ, යනු විතර හැර කොටින්.

**"යථාවාදී භික්ඛවෙ! තථාගතො තථාකාරී, යථාකාරී තථාවාදී ඉති යථාවාදී තථාකාරී යථාකාරී තථාවාදී, තස්මා තථාගතොති වුච්චති"** යනු ද මෙහිලා සාධක.

**අභිභවනට්ඨෙන = තථාගතො** = සම්මා සම්බුද්ධරජානන් වහන්සේ උඩින් භවාග්‍රය, යටින් අවීචිය කෙළවර කොට සරස අපරිමිත ලොක ධාතූන්හි අපරිමිත සත්ත්වයන් ශිලයෙන් සමාධියෙන්

ප්‍රඥායෙන් විමුක්තියෙන් විමුක්තිඥාන දර්ශනයෙන් අභිභවනය කළ සේක් සියලු සත්ත්වයන් එකී ගුණයන්ගෙන් යටපත් කොට සිටි සේක් ඔවුනතුර අතුල්‍ය සේක් අප්‍රමෙය සේක් නිරුත්තර සේක් දෙවියනට අතිදෙව සේක් ශක්‍රයනට අතිශක්‍ර සේක් බ්‍රහ්මයනට අතිබ්‍රහ්ම සේක් සර්ව සත්ත්වෝත්තම සේක් තථාගත නම් වූහ, යනු විතර හැර කොටින්.

**‘‘සදෙවකෙ ලොකෙ -පෙ- සදෙවමනුස්සාය තථාගතො අභිභූ අනභිභූතො අඤ්ඤදත්ථු දසො වසවත්ති, තස්මා තථා-ගතොති වුච්චති’’** යනු ද මෙහිලා සාධක.

මෙ කියූ කරුණු අට ඉතා සැකෙවින් මෙසේ දත්නනු විසින් තථාගතභාවයෙහි ලා මෙ ද දත යුතු යැ:- **‘‘ලොකො භික්ඛවෙ! තථාගතෙන අභිසම්බුද්ධො, ලොකස්මා තථාගතො විසංයුත්තො, ලොකසමුදයො භික්ඛවෙ! තථාගතෙන අභි-සම්බුද්ධො, ලොකසමුදයො තථාගතස්ස පහීනො, ලොක නිරොධො භික්ඛවෙ! තථාගතෙන අභිසම්බුද්ධො, ලොක-නිරොධො තථාගතස්ස සච්ඡිකතො, ලොකනිරොධගාමිනී පටිපදා භික්ඛවෙ! තථාගතෙන අභිසම්බුද්ධා, ලොකනිරොධ-ගාමිනී පටිපදා තථාගතස්ස භාවිතා, යං භික්ඛවෙ! සදෙවකස්ස ලොකස්ස සමාරකස්ස සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙව මනුස්සාය දිට්ඨං සුතං මුතං විඤ්ඤාතං පරියෙසිතං අනුවිචරිතං මනසා, සබ්බං තං තථාගතෙන අභිසම්බුද්ධං, තස්මා තථා-ගතොති වුච්චති’’** යනු.

‘‘මහණෙනි! ලොකය – ලොකසමුදය – ලොකනිරොධය – ලොකනිරොධගාමිනී ප්‍රතිපදාව තථාගතයන් වහන්සේ විසින් අවබොධ කරණ ලදහ, මහණෙනි! තථාගතයන් වහන්සේ ලොකය හා නො ගැටුනු සේක, තථාගතයන් වහන්සේ විසින් ලොක-සමුදය ප්‍රහීණ කරණ ලදුයේ ය, ලොක නිරොධය පසක් කරණ ලදුයේ ය, ලොකනිරොධගාමිනී ප්‍රතිපදාව වඩනා ලද ය, මහණෙනි! දෙවියන් මරුන් බඹුන් සහිත වූ ලොකයා විසින් මහණ බමුණන් හා සෙසු දෙව්මිනිසුන් සහිත වූ සත්ත්වප්‍රජාව විසින් යම් රූප – ශබ්ද – ගන්ධ – රස – සප්‍රෂ්ටව්‍ය ධර්මාලම්බනයෙක් ලබන ලද ද, සොයන ලද ද ලුහු බඳිනා ලද ද එ හැම තථාගතයන් වහන්සේ විසින් අවබොධ කරණ ලද ය. එහෙයින් තථාගත’’ යි කියනු ලැබේ, යනු එහි ඉතා කෙටි අරුත්.

බුදුරජානන් වහන්සේ ලොකය සත්‍ය වූ තීරණපරිඥායෙන් ලොකසමුදය සත්‍ය වූ ප්‍රහාණපරිඥායෙන්, ලොකනිරොධය සත්‍ය වූ සාක්ෂාත්කරණයෙන්, ලොකනිරොධගාමිනී ප්‍රතිපදාව සත්‍ය වූ

භාවනායෙන් අවබොධ කළ සේකැ යි කොටින් දත යුතු ය. මේ හැර මෙහි කියන මේ කරුණු අට ද තථාගතභාවය පිණිස වන්නේ ය. එහෙයින් එ ද සැකෙවින් දන්නේ ය.

**තථාය ආගතොති = තථාගතො** = දිවකුරු බුදුරජු පටන් කසුප් බුදුරජු තෙක් ලොව පහළ වූ අටවිසි බුදුරජුන් වෙතින් බුදුබව පිණිස ලත් විවරණ ඇති අපගේ බුදුරජානන් වහන්සේ කළ අභිනීහාර ඇති බෝසතුන් විසින් ලැබිය යුතු යම් අනුසස් කෙනෙක් වූහු නම්, ඒ හැම අනුසස් ලබා කරණ ලද සත්‍ය වූ අවිතථ වූ ඒ මහාප්‍රතිඥයෙන් අභිසම්බොධියට පැමිණී සේක් 'තථාගත' නම්හ.

**තථාය ගතොති = තථාගතො** = අපගේ බුදුරජානන් වහන්සේ බුදුරජුන් පිළිබඳ යම් මේ මහා කරුණායෙක් වේ ද, ඒ මහා කරුණයෙන් ම දුකට වැටුණු සත්ත්වයන් දැක "මොවුනට මා හැර අන් පිහිටෙක් නැත, මම පළමු ව සසරින් මිදී මේ සත්ත්වයන් ද සසරින් මුදා හරින්නෙමි" යි උත්සාහ ඇති ව ප්‍රාර්ථනා තුබූ සේක. ඒ ප්‍රාර්ථනා පරිදි ලොවට හිත සලසනු පිණිස අත්හට ඇසිම් පමණිනුදු බිය දන වන දුෂ්කරක්‍රියා කරමින් මහාසතුන් පිළිබඳ ප්‍රතිපත්තිය, හානභාගිය - සංකිලෙසභාගිය - ඨිතිභාගිය නො වේ ද, විසෙසභාගිය ම වේ ද, එසේ පිළිපදිමින් සියලු බොධිසම්භාරයන් එක් කොට අභිසම්බොධියට පැමිණී සේක. පැමිණ ඒ මහාකරුණායෙන් ම මෙහෙයුනු සිත් ඇති ව විවෙකරතිය ත් උතුම් වූ ශාන්තවිමොක්ෂසුඛය ත් හැරපියා අඥනජනයන්ගෙන් පිරී ගත් ලොකයෙහි ඔවුන් කළ සම්මාන - අවමාන ගැණ නො තකා හික්මවිය හැකි හැම දෙනා හික්මවමින් සියලු බුදුකිස නිමවාලූ සේක. මෙසේ මේ අවස්ථා තුනෙහි ම වෙනස් නො වූ අඩු වැඩි නො වූ සමකිස ඇති මහාකරුණායෙන් ම සියලු ලොවට හිත පිණිස පිළිපන් සේක් 'තථාගත' නම්හ.

**තථානි ආගතොති = තථාගතො** = චතුර්විධ මාර්ගඥන - ත්‍රිවිධ අප්‍රතිහතඥන - චතුර්විධ ප්‍රතිසංවිද්ඥන - චතුර්විධ වෛශාරද්‍යඥන - පංචවිධ ගති පරිච්ඡෙදඥන - ෂට්විධ අසාධාරණඥන - සප්තවිධ බොධ්‍යඞ්ගඥන - අෂ්ටවිධ මාර්ගාඞ්ගවිභාවනඥන - නවවිධ ආනුපූර්වීඥන - දශබලඥන යන ඥනරාශිය අධිගත සේක් අපගේ බුදුරජානන් වහන්සේ 'තථාගත' නම්හ.

**තථං ගතොති = තථාගතො** = බුදුරජානන් වහන්සේ යම් අභිජාතියක් යම් අභිසම්බොධියක් යම් ධර්මවිනය පැණවීමක් යම් අනුපාදිශෙෂනිර්වාණ ධාතුවක් යම් ප්‍රයොජනයක් පිණිස පැතූ

සේක් නම් පැවැත් වූ සේක් නම් ඒ අභිජාත්‍යාදිය ඒකාන්ත විසින් සිද්ධියට ගිය බැවින් ඒ පැතීම් එසේ ම වූයේ ය. නො වෙනස් වූයේ ය. අන් පරිද්දෙකින් නො වූයේ ය. මෙසේ බුදුරජාණන් වහන්සේ ඒ අභිජාත්‍යාදියට පැමිණි සේක් 'තථාගත' නම්හ.

**තථාවිධොති = තථාගතො** = පිරිනිවී ගිය භාග්‍යවතුන් වහන්සේලා මාර්ගශීලයෙන්, ඵලශීලයෙන්, මාර්ගඵලශීලයෙන්, මාර්ගසමාධියෙන්, ඵලසමාධියෙන්, සියලු ලෞකික ලොකොත්තර සමාධියෙන්, මාර්ගප්‍රඥයෙන්, ඵලප්‍රඥයෙන්, සියලු ලෞකික ලොකොත්තර ප්‍රඥයෙන් දිනපතා වැළඳිය යුතු වූ සූවිසි කෙළලක්ෂයක් සමාපත්තිවිහරණයෙන්, අනන්තාපරිමාණ භෙද ඇති නො සිතිය හැකි අනුභාවවත් වූ සියලු සර්වඥ ගුණයන්ගෙන් යම්බඳු වූවාහු ද අපගේ බුදුරජාණන් වහන්සේ ද එබඳු වූ සේක. ආයුවෙමත්‍යතා-සරීරවෙමත්තතාදිය හැර අන් සියලු ශීලවිශුද්ධි ආදී විශුද්ධීන්හි ශමථ විදර්ශනා ප්‍රතිපත්තීන්හි තමන් වහන්සේ විසින් පිළිපැදි ගුණයන්හි අතීත භාග්‍යවතුන් හා කිසිත් වෙනසෙක් නැත්තේ ය. එහෙයින් අපගේ බුදුරජාණන් වහන්සේ ඒ සියලු ගුණයන්ගෙන් අතීත භාග්‍යවතුන් හා සම ව සිටි සේක් 'තථාගත' නම්හ.

**තථා පවත්තිතොති = තථාගතො** = අනන්‍යසාධාරණ සෘද්ධ්‍යනු-භාවයෙන් යුක්ත බැවින් හා අර්ථප්‍රතිසංවිද් ආදීන්ගේ උසස් කෙළවරට පැමිණීමෙන් අනාවරණඥනප්‍රතිලාභයෙන් ද භාග්‍ය-වතුන් පිළිබඳ කායවචීචිත්තප්‍රවෘත්තීන්ගේ නැසීමක් නො මැති බැවින් නො නැසුනු කායවචීචිත්තප්‍රවෘත්ති ඇති සේක් 'තථාගත' නම්හ.

**තථෙහි ආගතොති = තථාගතො** = බොධිසම්භාරධර්මයන් රැස් කිරීමෙහි දී එයට නො පටහැනි වූ පැවැත්ම ආදීනවානිශංසප්‍රත්‍ය වෙක්ෂා කිරීම් ආදී වශයෙන් පැවැති නුවණින් දත් සේක් ද, පස් වැදෑරුම් වූ ගතිවිෂයයෙහි පැවැති සත්ත්වයන්ගේ ගමන මෝහට ඇත්තේ 'අගත' නම්. ඒ මේ අගතභාවය සොපාදිශෙෂ – අනු-පාදිශෙෂ නිර්වාණයට පැමිණීමෙන් පරිපූර්ණ වූ ආර්‍යමාර්ගඥන යෙන් දත් සේක් ද එහෙයින් බුදුරජාණන් වහන්සේ 'තථාගත' නම්හ.

**තථාගතභාවෙන = තථාගතො** = සද්ධර්මය ආර්‍යමාර්ගය ඵලධර්මය නිර්වාණය ආර්‍යසඞ්ඝය යන මේ හැම තථාගත නම්. මේ කියූ තථාගතභාවය ඇති සේක් බුදුරජාණන් වහන්සේ 'තථාගත' නම්හ.

මෙහි මෙසේ කියන ලද්දේ තථාගත වූ බුදුරජාණන් වහන්සේගේ තථාගතභාවය යන්නමකින් කියූ පොතපතෙහි ආ ධර්ම විවරණයෙන් ද අංශුමාත්‍රයෙක් ම වේ. පොතපත ද කියන්නේ තථාගතභාවයෙන් මුඛමාත්‍රයක් ම කියූ බව ය. මෙහි දී පොත පතින් ඉතා ටිකක් ම ගෙණ ලියූ මේ තථාගතභාවය පිළිබඳ කථාවද මෙංන ලෙසකිනුත් එයට ලංව නො සිටුනී ය. තථාගත යන් වහන්සේම තථාගත භාවය දක්වීමෙහි සමර්ථ සේක. ලොව අන් හැමකෙනෙක් ම එහි අසමර්ථයහ. තථාගත පදය මහදර්ථ ඇතියේ ය. මහාගති ඇතියේ ය. මහාවිෂය ඇතියේ ය. **අප්පමාද පදය** සේ සියලු ත්‍රිපිටක බුද්ධවචන ගැබ් කොට සිටියේ ය.

යථෙව ලොකෙ පුරිමා මහෙසිනො
සබ්බඤ්ඤුභාවං මුනයො ඉධාගතා,
තථා අයං සක්‍යමුනීපි ආගතො
තථාගතො වුච්චති තෙන චක්ඛුමං.

පහාය කාමාදිමලෙ අසෙසතො
සමාධිඤ්ඤාණෙහි යථාගතා ජිනා,
පුරාතනා සක්‍යමුනී ජුතින්ධරො
තථාගතො තෙන තථාගතො මතො.

තථඤ්ච ධාත්වායතනාදිලක්ඛණං
සභාවසාමඤ්ඤවිභාගභෙදතො,
සයම්භුඤාණෙන ජිනොයමාගතො
තථාගතො වුච්චති සක්‍යපුඞ්ගවො.

තථානි සච්චානි සමන්තචක්ඛුනා
තථාඉදප්පච්චයතා ච සබ්බසො,
අනඤ්ඤනෙය්‍යෙන යතො විභාවිතා
තථාගතො තෙන ජිනො තථාගතො.

අනෙකභෙදාසුපි ලොකධාතුසු
ජිනස්ස රූපායතනාදිගොචරෙ,
විචිත්තභෙදෙ තථමෙව දස්සනං
තථාගතො තෙන සමන්තලොචනො.

යතො ච ධම්මං තථමෙව භාසති
කරොති වාචායනුරූපමත්තනො,
ගුණෙහි ලොකං අභිභුය්‍යයීරියති,
තථාගතො තෙනපි ලොකනායකො.

තථං පරිඤ්ඤාය තථාය සබ්බසො
අවෙදි ලොකං පභවං අතික්කමි,
ගතො ච පච්චක්ඛක්‍රියාය නිබ්බුතිං
සදරියමග්ගඤ්ච ගතො තථාගතො.

තථං පටිඤ්ඤාය තථාය සබ්බසො
හිතාය ලොකස්ස යතොයමාගතො,
තථාය නාථො කරුණාය සබ්බදා
ගතො ච තෙනාපි ජිනො තථාගතො.

තථානි ඤාණානි යතොයමාගතො
යථාසභාවං විසයාවබොධතො,
තථාභිජාතිප්පභුතිං තථාගතො
තදත්‍ථසම්පාදනතො තථාගතො.

යථාවිධාසුං පුරිමා මහෙසිනො
තථාවිධොයම්පි තථා යථාරුචි,
පවත්තවාචාතනුචිත්තභාවතො
තථාගතො වුච්චති අග්ගපුග්ගලො.

සම්බොධිසම්භාරවිපක්ඛතො පුරෙ
ගතං න සංසාරගතම්පි තස්ස,
න චත්‍ථි නාථස්ස භවන්තදස්සිනො
තථෙති තස්මා අගතො තථාගතො.

තථාගතො ධම්මවරො මහෙසිනා
යථා පහාතබ්බමලං පහීයති,
තථාගතො අරියගණො විනායකො
තථාගතො තෙන සමඞ්ගිභාවතො.

සන මෙහිද අරුත් ගුරුන් විචාරා දතයුතු ය.

"යථා ගතාසෙත මුනයඃ ශිවාං ගතිං
තථා ගතිං සොපි ගතසතථාගතඃ"

යි **සර්වඥීනසඞ්ග්‍රහයෙකි** එන මෙහි යට දක්වූ හැම අරුතෙක් ඇතුළත් ව සිටියේ ය. යම් ලෙසකින් යම් ප්‍රතිපදයෙකින් පූර්ව මුනිහු නිහීය වූ මොක්ෂයට පැමිණියාහු ද, අපගේ බුද්ධමුනි තෙමේ ද එසේ ඒ ප්‍රතිපත්ති මාර්ගයෙන් නිහීය වූ මොක්ෂයට පැමිණියේ ය. එහෙයින් තථාගත නම් වේ යනු අරුත්.

**ආකාසෙ ච පදං නත්ථි** = අහසෙහි පියසටහනෙක් නැත.
**සමණො නත්ථි බාහිරෙ** = බැහැරි සසුන්හි මහණෙක් නැත.
**සඞ්ඛාරා සස්සතා නත්ථි** = නිත්‍ය වූ සංස්කාරයෝ නැත.

**සඞ්ඛාර** නම්: හෙතුප්‍රත්‍යයයන් විසින් උපදවනු ලබන්නේ ය. **"පච්චයෙහි අභිසඞ්ඛරීයන්තීති=සඞ්ඛාරා"** යනු නිරුක්ති. ප්‍රත්‍යය නම්: කර්ම - චිත්ත - ඍතු - ආහාරයෝ ය. ප්‍රත්‍යයයන් විසින් උපදවනු ලබන සංස්කාරයෝ උපාදින්නස්කන්ධ - අනුපාදින්නස්කන්ධ යි දෙකොටසකට බෙදෙත්. එහි තෘෂ්ණාදි උපාදානයන් විසින් 'මමය,' 'මාගේ ය,' යන ඈ ලෙසින් ගණු ලබන්නේ උපාදින්නස්කන්ධ ය. ඒ නම්: සත්ත්ව තෙමේ ය. එහි නාම - රූප දෙකොටස ම එක්ව සිටියේ ය. මේ උපාදින්නස්කන්ධය යටින් අවීචිය පටන් උඩින් භවාග්‍රය කෙළවර කොට මේ දෑතුරෙහි සිටි සිත් පිත් ඇත්තේ ය. මෙහි මෙසේ විශේෂයක් නො තබා කියන ලද ද භවයෙහි මේ දෙකොටස ම එක්ව නො යෙදෙන තැන් ද ඇත්තේ ය. සමහර තැනක රූපය පමණක් සමහර තැනක නාමය පමණක් යෙදෙනාතර සමහර තැනක නාම - රූප දෙක ම යෙදෙන්නේ ය. එහෙයින් එයට අනුව එකවොකාරභව - චතුවොකාරභව - පංචවොකාරභවය යි භවයෝ වෙන් කොට දක්වන ලදහ. **සවිඤ්ඤාණසඞ්ඛාර** ය කියනු ලබන්නේ ද මේ උපදින්නස්කන්ධ යි.

**අනුපාදින්නස්කන්ධ** නම්: වෘක්ෂ - ලතා - භූමි - පර්වත - නදී - තටාක - සමුද්‍ර - උද්‍යාන - විමානාදී වූ සිත් පිත් නැති පඨවි ආදී මහාභූතයන්ගේ එක්වීමෙන් නැගුනු ඉතා සියුම් පරමාණු ද ඇතුළත් කොට සිටි වස්තුජාතය යි. මේ හැමතැන සිටියේ රූපස්කන්ධය පමණෙක් ය. මෙය අවිඤ්ඤාණසඞ්ඛාර යි ද හඳුන්වනු ලැබේ.

අවිද්‍යා ශබ්දයෙන් ආ සඞ්ඛාර, සංස්කාර ශබ්දයෙන් ආ සඞ්ඛාර යි සඞ්ඛාර දෙපරිදි වේ. ඔවුනතුරෙහි **පුඤ්ඤාභිසඞ්ඛාර - අපුඤ්ඤාභිසඞ්ඛාර - ආනෙඤ්ජාභිසඞ්ඛාර - කායසඞ්ඛාර - වචීසඞ්ඛාර - චිත්තසඞ්ඛාර** යන මොවුහු අවිද්‍යා ප්‍රත්‍යයෙන් වූ සඞ්ඛාරයෝ ය. මේ සියල්ල ලෞකිකකුශලාකුශලචේතනා ය.

එහි දාන-ශීලාදීන්ගේ වශයෙන් පවත්නා අටවැදෑරුම් කුශල චේතනා ද භාවනා වශයෙන් පවත්නා පස්වැදෑරුම් රූපාවචර කුශල චේතනා ද යන තෙළෙස් කුශලචේතනා පුඤ්ඤාභිසඞ්ඛාර නම්. ප්‍රාණඝාතාදීන්ගේ වශයෙන් පවත්නා දොළොස් අකුශල චේතනා අපුඤ්ඤාභිසඞ්ඛාර නම්. ආකාසානඤ්චායතනාදීන්ගේ වශයෙන් පවත්නා සිවු වැදෑරුම් අරූපාවචර චේතනා ආනෙඤ්ජාභිසඞ්ඛාර නම්.

**කායද්වාරයෙන්** හට ගන්නා වූ කාමාවචර කුසල් සිත් අටෙහි යෙදෙන චේතනා අට හා, දොළොස් අකුසල් සිත්හි යෙදෙන චේතනා දොළොස කායසඞ්ඛාර නම්. මේ චේතනා විස්ස වාග් ද්වාරයෙහි හට ගත්තේ වචීසඞ්ඛාර නම්. කාය-වාග්විඥප්ති දෙක නො උපදවා මනොද්වාරයෙහි යෙදෙන කාමාවචර කුසල චේතනා අට, අකුසල චේතනා දොළොස, රූපාවචර කුසල චේතනා පස, අරූපාවචර කුසල චේතනා සතර යන එකුන්තිස් චේතනා, චිත්තසඞ්ඛාර නම්. මෙ කී චේතනාවෝ සංස්කාරයන් කෙරෙහි ප්‍රධාන ව සිටින්නෝ ය. චේතනාවෝ ම ඒ ඒ සිත්වල යෙදෙන අන්‍ය වූ ස්පර්ශාදිසංස්කාරයන් උනුන් පිළිබඳ කෘත්‍යයන්හි යොදා ලමින් තුමූ ද තමකෘත්‍යයෙහි යෙදෙත්. චේතනා ම කර්ම යි වදාළෝ ද එහෙයිනි[1]

**සඞ්ඛතසඞ්ඛාර - අභිසඞ්ඛතසඞ්ඛාර - අභිසඞ්ඛරණසඞ්ඛාර - පයොගාභිසඞ්ඛාර** යන මේ සතර, සඞ්ඛාර ශබ්දයෙන් ආ සඞ්ඛාරයෝ ය. **"අනිච්චා වත සඞ්ඛාරා"** = 'සියලු සංස්කාරයෝ ඒකාන්තයෙන් අනිත්‍යයහ, යනාදීන් කියූ උත්පාදාදිලක්ෂණ යුක්ත වූ සියලු ධර්ම, තමන් අයත් ප්‍රත්‍යය හෙතුවෙන් වන බැවින් සඞ්ඛත සඞ්ඛාර නම්. කුශලා කුශලකර්ම වෙගයෙන් උපන් ත්‍රෛභූමක ධර්ම, අභිසඞ්ඛතසඞ්ඛාර නම්. **"අනිච්චා වත සඞ්ඛාරා"** යනාදීන්හි කියූ සංස්කාරයන්හි ම ඒ වැදී සිටියි. **"අවිජ්ජාගතොයං භික්ඛවෙ! පුරිසපුග්ගලො පුඤ්ඤං චෙ සඞ්ඛාරං අභිසඞ්ඛරොති"** = "අවිද්‍යාවෙන් ඇවුරුණු නුවණ වැඩී ගිය පුරුෂ තෙමේ පුණ්‍යාභි සංස්කාර ද රැස් කෙරෙයි, යනාදී තන්හි වැදී සිටි ත්‍රෛභූමක කුශලාකුශලචේතනා අභිසඞ්ඛරණ සඞ්ඛාර නම්. **"යාවතිකා භික්ඛවෙ! අභිසඞ්ඛාරස්ස ගති, තාවතිකං ගන්ත්වා අක්ඛාතං මඤ්ඤෙ අට්ඨාසි"** = කාය ප්‍රයොග වෙගයෙහි ගමන යම් පමණ වේ ද, එ පමණ ගොස් අකුරෙහි හැනී සිටියා සේ සිටියේ ය, යනාදි තන්හි ආයේ පයොගාභිසඞ්ඛාර නම්. ඒ නම් කායික - චෛතසික වීර්‍ය්‍ය යි.

සඞ්ඛාර විසින් ගැණෙන්නෝ මෙ පමණක් ම නො වෙති. මෙයින් අන්‍ය වූවෝ ද වෙත්. **"සඤ්ඤාවෙදයිතනිරොධං සමාපජ්ජන්තස්ස ඛො ආවුසො විසාඛ! භික්ඛුනො වචීසඞ්ඛාරො පඨමං නිරුජ්ඣති තතො කායසඞ්ඛාරො තතො චිත්ත සඞ්ඛාරො"** = සංඥා-වෙදනා දෙදෙනාගේ නිරොධයෙන් නිරොධ සමාපත්තියට සමවදින්නහුගේ වාක්සංස්කාර (විතක්ක - විචාර) පළමු ව නිරුද්ධ වේ. අනතුරුව කායසංස්කාර (ආශ්වාස - ප්‍රශ්වාස)

---

1. 1. 1. 'මනොපුබ්බඞ්ගමා ධම්මා' යනු බලනු.

නිරුද්ධ වේ. අනතුරුව චිත්තසංස්කාර (සංඥා - වේදනා) නිරුද්ධ වේ; යන මේ ආදී තන්හි සඞ්ඛාර ශබ්දයෙන් ගැණෙන සංස්කාර තත් වැදෑරුම් ය. වාග්භෙද කොට ශබ්දය පිළියෙල කරණ බැවින් විතර්ක - විචාර, වාක්සංස්කාර නම්. කරජකාය විසින් සකස් කරණ බැවින් ආශ්වාස - ප්‍රශ්වාස, කාය සංස්කාර නම්. විතක්ක - විචාර හැර සෙසු සම පණස් චෛතසික, චිත්තසංස්කාර නම්.

හැම කල්හි නො නැසී පවත්තේ **සස්සත** නම්. නො නැසෙන දෑය, නිත්‍ය වූ දෑය, නො වෙනස් වන තත්ත්වය 'සස්සත' යි කියනු ලැබේ. **"සස්සතීති = සස්සතො, සදා සරතීති ගච්ඡතීති = සස්සතො"** යනු අරුත් හෙළි කිරීම ය. නිරන්තර භාවයෙහි වූ **"සස්ස + සාත වෙච"** යන ධාතුවෙන් **ත** ප්‍රත්‍යය වීමෙන් හෝ **සදා** යනු පෙරටු කර ගත් **"සර + ගතියං"** යන ධාතුවෙන් ත ප්‍රත්‍යය වීමෙන් සිද්ධ වූයේ ය. එහි සදා යන්නට ස ආදෙශ ද වී ය. හැම කල්හි නො නැසී පවත්නා නිත්‍ය වූ සංස්කාරයෝ නැත්තාහ,යි දතයුතු ය.

**නත්ථි බුද්ධානං ඉඤ්ජිතං** = බුදුවරුන්ට සැලීමෙක් නැත.

ඒ ඒ අරමුණුවල ඒ ඒ අරමුණු විෂයයෙහි සත්ත්වයන්ගේ සැලීමට කරුණු වන්නෝ තෘෂ්ණා - මානාදී වූ ක්ලේශයෝ ය. යමක්හට එබඳු කෙලෙස් නැත්තේ නම් හේ කිසි තැනක නො සැලෙන්නේ ය. බුදුරජාණන් වහන්සේ සංස්කාරයක් සස්සත යි ගැණීමට කරුණු වූ තෘෂ්ණා මානාදී වූ සියලු කෙලෙස් නසාලූ බැවින්, උන්වහන්සේට ඉඤ්ජනයෙක් සැලීමෙක් පෙරළීමෙක් නැත්තේ ය.

ධර්මදෙශනාවගේ අවසානයෙහි සුභද්‍ර තෙමේ අනාගාමී ඵල යෙහි පිහිටා ගත්තේ ය. ධර්මදෙශනා තොමෝ පැමිණ සිටි පිරිසට ද වැඩ සහිත වූය.

**සුභද්‍රපරිබ්‍රාජක වස්තුව නිමි.**

සකලජනධර්මාර්ථසඩ්ග්‍රහාභිලාෂී **පණ්ඩිත අම්බලම්ගොඩ ධම්මකුසල** ස්ථවිරයන් කළ **සද්ධර්මසාගර** නම් වූ **ධර්මපදවර්ණනායෙහි** මලවග්ගාත්මක අෂ්ටාදශ තරඞ්ගය නිමියේ ය.

# පණ්ඩිතවර්ගය

# ධර්‍මයෙහි පිහිටියෝ

## 19 — 1

**භික්‍ෂූන්** වහන්සේලා සැවැත් නුවර උතුරු වාසල් දොර සමීපයෙහි ගමෙක පිඩු සිඟා ගෙණ එත්නෝ නුවර මැදින් අවුත් විහාරයට පිවිසෙත්නෝ ය. එසේ පිවිසෙන එක් දවසෙක වලාකුල් නැගී වසින්නට වන. භික්‍ෂූන් වහන්සේලා වැස්සට බියෙන් ඉදිරියෙහි තුබූ අධිකරණශාලාවකට ගොඩ වූහ. එහි දී අල්ලස් ගෙණ හිමියන් අහිමියන් කරමින් වරද කළවුන් නිදහස් කරමින් නඩු විසඳන මහාවිනිසකරුවන් දැක "අනේ; මේ විනිසකරුවෝ නො දැහැමි සි, මොවුහු දැහැමින් යුක්තියෙහි පිහිටා නඩු විසඳති යි අපි මෙතෙක් සිතා ගෙණ සිටියෙමු, අධිකරණශාස්ත්‍රය නො දන්නා අපටත් යුක්තිය මේ ය යි දැනෙද්දී මොවුනට යුක්තිය නො දැනෙන්නට හෙතුවෙක් නැත, මොවුන් අල්ලසට යටත් ව නො දැහැමි ව නඩු විචාරති" යි සිතා වැසි පායා ගිය කල්හි විහාරයට ගොස් බුදුරජුන් වෙත එළැඹ වැඳ එකත් පස්හි හිඳ "මහාවිනිසකරුවෝ යුක්තිය පසෙක තබා රාජධර්‍මයට විරුද්ධ ව නඩු විචාරති" යි දන්වා සිටියහ. එකල්හි බුදුරජානන් වහන්සේ "මහණෙනි! ඡන්දාදීන්ගේ වශයට ගොස් සැහැසි ව නඩු විසඳන්නෝ ධර්‍මයෙහි පිහිටියෝ නො වෙති, අපරාධය, වරද මැනැවින් දැන අපරාධය වරද සොයා බලා රාජධර්‍මයට එකඟ ව අපරාධයට අනුරූප ව නො සැහැසි ව විනිශ්චය කරන්නෝ ම ධර්‍මයෙහි පිහිටියෝ වෙත්"යි වදාරා මේ ධර්‍මදෙශනාව කළ සේක.

**න තෙන හොති ධම්මට්ඨො යෙනත්ථං සහසා නයෙ,**
**යො ච අත්ථං අනත්ථං ච උභො නිච්ඡෙය්‍ය පණ්ඩිතො.**

**අසාහසෙන ධම්මෙන සමෙන නයතී පරෙ,**
**ධම්මස්ස ගුත්තො මෙධාවී ධම්මට්ඨොති පවුච්චතීති.**

යම් කරුණෙකින් විනිශ්චය කටයුතු අර්‍ථය බොරුවෙන් විනිශ්චයට පමුණුවා ද, එපමණෙකින් විනිශ්චයධර්‍මයෙහි පිහිටියේ නො වේ. නුවණැති යමෙක් වනාහි විනිශ්චය කටයුතු වූ සත්‍යකාරණය ද අසත්‍යකාරණය ද යන දෙ කරුණ නිශ්චය කෙරේ ද.

නිබොරු බසින් විනිශ්චයධර්‍මයෙන් අපරාධයට අනුරූප පරිදි ම ජය-පරාජයට පමුණුවා ද ධර්‍මයෙන් රක්නා ලද (ඒ) නුවණැති පුරුෂ තෙමේ විනිශ්චයධර්‍මයෙහි පිහිටියේ ය යි කියනු ලැබේ.

**න තෙන හොති ධම්මට්ඨො යෙනත්ථං සහසා නයෙ** = යම් කරුණෙකින් විනිශ්චය කටයුතු වූ අර්ථය බොරුවෙන් විනිශ්චයට පමුණුවා ද එපමණෙකින් ධර්මයෙහි පිහිටියේ නො වේ.

**යො ච අත්ථං අනත්ථං ච උභො නිච්ඡෙය්‍ය පණ්ඩිතො** = නුවණැති යමෙක් වනාහි විනිශ්චය කටයුතු වූ සත්‍යකාරණය ද අසත්‍ය කාරණය ද යන දෙකරුණ නිශ්චය කරන්නේ ද.

අධිකරණවිනිශ්චය සඳහා අසුන් අරා සිටි අධිකරණනායක තෙමේ විනිශ්චය කළයුතු අධිකරණයක් ඡන්ද – දේස – භය – මෝහ යන සතර අගතියෙන් බැඳී සතර අගතියෙහි පිහිටා බොරුවෙන් හිමියන් අහිමියන් කොට වරද නිවරද කොට විනිශ්චය කෙරේ නම්, විසඳූ නම්, ඔහු, ඒ අධිකරණනායකයා ඒ විනිශ්චය මාත්‍රයෙන් යුක්තිධර්මයෙහි පිහිටියේ නො වේ. එහි ඇතැම් අධිකරණනායක–යෙක් ඡන්දයෙන් අගතියට ගොස් “මේ මාගේ නෑ, මේ මාගේ මිතුරු”යි ගෙණ නෑයා හෝ මිතුරා නො හිමිද්‍රව්‍යට හිමි කරන්නේ ය. බොරුවෙන් දිනවන්නේ ය. තවත් එකෙක් ද්වේෂයෙන් දුෂ්ට ව අගතියට ගොස් “මේ මාගේ සතුරු, මූ මට ගැහැට කෙළේ ය” යි ගෙණ සතුරා අයත් ද්‍රව්‍ය ඔහුට අහිමි කරන්නේ ය. බොරු කියා සතුරා පරද වන්නේ ය. තවත් එකෙක් බියපත් ව අගතියට ගොස් පොහොසතුන් පිළිබඳ අධිකරණයන්හිදී නො හිමි වූ ද්‍රව්‍යට පොහොසතුන් හිමියන් කරන්නේ ය. ඔවුන් නො හිමිද්‍රව්‍යෙහි හිමියන් නො කෙළෙම් නම්, එරෙහි ව එති යි ගෙණ දුප්පතුන් අයත් ද්‍රව්‍ය පොහොසතුන්ට අයත් කරන්නේ ය. බොරු කියා පරද වන්නේ ය. තවත් එකෙක් මෝහයෙන් මුළා ව අගතියට ගොස් අල්ලස් ගෙණ හිමියා අහිමියා කරන්නේ ය. බොරු කියා පරද වන්නේ ය. සමහර පැවිද්දෝ ද අගතියට බැඳී බොරු, නිබොරු කොට, කළ යුතු විනිශ්චය, ධර්මවිනය ලෙසින් නො කොට, අධර්මයෙන් අවිනය යෙන් අධිකරණවිනිශ්චය කරන්නෝ ය. මෙසේ අගතියට බැඳී සිටුනා ගිහි පැවිද්දෝ ධර්මයෙහි පිහිටියෝ නො වෙත්.

නුවණැත්තේ වනාහි සත්‍ය – අසත්‍ය දෙක යුක්තියට අනුව විනිශ්චය කොට අපරාධය ලෙසින් උනුන් ජයපරාජයට පමුණු වන්නේ ය.

**අසාහසෙන ධම්මෙන සමෙන නයතී පරෙ** = නිබොරු බසින් විනිශ්චයධර්මයෙන් අපරාධය ලෙසින් අන්හු ජය පරාජයට පමුණුවා ද.

**ධම්මස්ස ගුත්තො මෙධාවී ධම්මට්ඨො ති වුච්චති** = ධර්මය විසින් රක්නා ලද ඒ නුවණැති පුරුෂ තෙමේ විනිශ්චයධර්මයෙහි පිහිටියේ ය යි කියනු ලැබේ.

ඇත්ත කියා විනිශ්චයධර්මයෙහි පිහිටා විනිශ්චයධර්මය ලෙසින් කළ අපරාධය මැනැවින් සොයා බලා එයට අනුරූප පරිදි මෙරමා ජයපරාජයට පමුණු වන පුරුෂ, ධර්මයෙන් රැකුනේ යුක්තිධර්මයෙහි පිහිටා සිටියේ ය.

**ධම්මට්ඨ** නම්: යුක්තිධර්මයෙහි පිහිටියේ ය. **සහසා** යන්නෙන් මෙහි මුසාවාදය කියැවෙන්නේ ය. **අත්ථ** නම්: මෙහි සත්‍යය යි **අනත්ථ** නම්: අසත්‍යය යි. ඒ සත්‍ය – අසත්‍ය දෙක **උභො** යන්නෙන් ගැණේ. උභශබ්දය ලිඞ්ගත්‍රයයෙහි සමාන රූප ඇත්තේ ය. බහුවචනයෙහි ය. ද්විශබ්දාර්ථවාචී සර්වනාමයෙකි. **පණ්ඩිතො** යනු කියන ලද්දේ ය.[1] **අසාහසෙන** = සත්‍යවචනයෙන් **ධම්මෙන** = අගතියෙන් තොර වූ විනිශ්චයෙහිලා ධර්මවිනයයෙහි හා පෞරාණික රාජධර්මයෙහි එන යුක්තියෙන්, **සමෙන** = අපරාධයනට අනුරූප පරිද්දෙන් යන අරුත්: **ධම්මස්ස ගුත්තො** = විනිශ්චය ධර්මයෙන් රැකුනේ ය. ධර්මෞජස් ප්‍රඥයෙන් යුක්තා වූයේ **මෙධාවී** නම්[2].

ධර්මදෙශනාවගේ අවසානයෙහි බොහෝ දෙන **සෝවන්** පලාදියට පැමිණියාහු ය.

**විනිශ්චයමහාමාත්‍යවස්තුව නිමි.**

---

1. 2. 1. 'පණ්ඩිතො' යනු බලනු.
2. 2. 3 'මෙධාවී' ,, ,,

# සවග මහණෝ

## 19 — 2

**සවග** මහණෝ වෙහෙරෙහි හා ගමෙහි හා දන්හල් අවුල් කරමින් එහි වළඳනා මහණුන්ට ගැහැට කරමින් හැසිරෙත්නාහ. දවසක් ගමෙහි දන්හලක දන් වළඳා පැමිණි තරුණ මහණුන් හා හෙරණුන් අතින් වෙහෙර වැසි භික්ෂූන් වහන්සේලා "ඇවැත්නි! ගමෙහි දන්හල් කෙසේ පවතී දැ?"යි ඇසූහ. "ස්වාමීනි! නො අසනු මැනවි, සවග මහණෝ 'අපි ම ව්‍යක්තයම්හ' අපි ම පණ්ඩිත යම්හ, මූන්ට පහර දී මූන් හිසැ කුණු කසළ දමා මෙතැනින් මූන් පන්නා හරිමූ' යි අප පිටි කොන්දෙන් අල්ලා ඇඟපත කුණුකසළ දමා බත්හල අවුල් කළහ" යි ඔවුහු කීහ. එය ඇසූ භික්ෂූන් වහන්සේලා බුදුරජුන් වෙත ගොස් වැද එ පුවත බුදු රජුන්ට දන්වාළූහ. උන්වහන්සේ "මහණෙනි! මම, පමණ නො සලකා බොහෝ සේ කටට ආවක් කියමින් අනුන් වෙහෙසට පත් කරණ දෙඩමලු තැනැත්තහු පණ්ඩිතයෙකැයි නො කියමි, උපද්‍රව රහිත වූ වෛර නැත්තා වූ නිර්භය වූවහු ම පණ්ඩිතය යි කියමි" යි වදාරා මේ ධර්මදෙශනාව කළ සේක.

**න තෙන පණ්ඩිතො හොති යාවතා බහු භාසති,**
**ඛෙමී අවෙරී අභයො පණ්ඩිතොති පවුච්චතීති.**

යම් පමණ කරුණෙකින් බොහෝ කොට බෙණේ ද එපමණින් පණ්ඩිත නො වේ. (යමෙක්) උවදුරු නැත්තේ ද, වෛර නැත්තේ ද, බිය නැත්තේ ද හෙතෙමේ පණ්ඩිත ය යි කියනු ලැබේ.

**න තෙන පණ්ඩිතො හොති යාවතා බහු භාසති** – යම් පමණ කරුණෙකින් බොහෝ කොට බෙණේ ද එපමණ කරුණෙකින් පණ්ඩිත නො වේ.

යමෙක් සඟමැද හෝ ගිහි පිරිස් මැද තමන් උසස් කොට පරා පහත් කොට දක්වමින් පමණ ඉක්මවා කල්වේලා නො බලා තැන නො තැන නො සලකා කටට ආ ආවක් කියමින් දෙඩමලු ව බොහෝ කොට කතා කෙරේ ද එපමණෙකින් ඔහු පණ්ඩිතයෙක් නො වේ. කුත්සිතභාෂී වේ.

**ඛෙමී අවෙරී අභයො පණ්ඩිතො ඉති පවුච්චති** = උවදුරු නැත්තේ වෛර නැත්තේ නිර්භය වූයේ පණ්ඩිත ය යි කියනු ලැබේ.

**ඛෙමී** නම්: උපද්‍රව උපසර්ගී නැත්තේ ය. **අවෙරී** නම්: ප්‍රාණ ඝාතාදිපංචවිධ දුශ්චරිත නැත්තේ ය. **අභය** නම්: තමාගෙන් අන්හටත් පරාගෙන් තමාටත් බිය නැත්තේ ය. **පණ්ඩිතො** යනු කියන ලදි.[1]

ධර්මදේශනාවගේ අවසානයෙහි බොහෝ දෙන සෝවාන්පලාදියට පැමිණියාහු ය.

**ෂඩ්වර්ගියභික්‍ෂුවස්තුව නිමි.**

1. 2. 1. 'පණ්ඩිතා' යනු බලනු.

# ඒකුදාන ස්ථවිරයන් වහන්සේ

## 19 — 3

**ඒකුදාන** ස්ථවිරයන් වහන්සේ එක් වන ලැහැබෙක වසන සේක. උන්වහන්සේට එක් ම උදානයෙක් ප්‍රගුණ ව තුබුනේ ය. මේ ඒ උදානය:

තද එකඟ බැව් ඇති – නො පමා පලසමවතෙහි,
විදසුනැ ද හික්මුනු – අසිරා නැණැති එකහැටි.

රා ඈ දෙසිත් හැම – සන්හුන් වී ද ඈති ඒ,
රහතුනට නො ද වනුයේ – සෝ දුක් (කිසිත් තත්හි)''

උන්වහන්සේ පොහෝ දවස්හි තුමූ ම බණ ඇසීමට කල් දන්වා මේ උදානය කියන්නෝ ය. එවේලෙහි බණ ඇසූ දෙවියන් කරණ සාධුනාදය පොළොව ගුගුරණ හඬක් මෙන් පවත්තේ ය. එක් පොහෝ දවසෙක පන් සිය පන් සිය දෙනා පිරිවරා ගත් තෙවළාදර තෙර දෙදෙනකුන් වහන්සේ ඒ ඒකුදාන තෙරුන් වසනා තැනට ගියහ. උන්වහන්සේ ඒ දෙන ම දැක තුටුසිත් ඇත්තාහු, ''ඔබවහන්සේලා මෙහි මා වසන තැනට පැමිණීමෙන් මට කරණ ලද්දේ ඉතා යහපතෙක, අද අපි ඔබවහන්සේලා වෙතින් බණ අසමු''යි කීහ. එවිට ඒ දෙදෙනා වහන්සේ ''ඇවැත්නි! බණ අසන්නෝ කවුරු ද?''යි ඇසූහ. ''ඇයි, සවාමීනි! එසේ අසහු? බණ අසන දවස්හි මේ වනලැහැබ දෙවියන්ගේ සාධුනාදයෙන් එක් පැහැර නිකුත් නාද ඇත්තේ වන්නේ ය'' යි කී කල්හි තෙවළාදර දෙනමගෙන් එක් නමක් පෙළ කී ය. එක් නමක් එහි අරුත් පැවසී ය. එහෙත් එදා එක් දෙවියෙකුත් සාධුකාර නො දුන්නේ ය. ඒ දුටු තෙවළාදර දෙදෙනා වහන්සේ ''ඇවැත්නි! තමුන්නාන්සේ බණ දෙසන දවස්හි මේ වනලැහැබෙහි වසනා දෙවියෝ මහහඬින් සාධුකාර දෙති, යි කීවහු ය, කෝ ඒ සාධු කාර?'' යි ඇසූහ. ''සවාමීනි! අන් දවස්හි නම් මේ වනලැහැබ එක් පැහැර නිකුත් සාධුනාද ඇත්තේ වන්නේ ය, අද මේ කුමක් වී දැ'' යි නො දනිමි'' යි කී විට ''ඇවැත්නි! එසේ නම් තමුන්නාන්සේ ම බණ කියවු'' යි කීහ. ඒකුදාන ස්ථවිරයන් වහන්සේ තල්වැට ගෙණ බණ අසුන් අරා හිඳ එම ගාථාව ම කීහ. දෙවියෝ මහහඬින් සාධුකාර දුන්හ. එකල්හි ඔවුන්ගේ පිරිවර මහණෝ ''මේ වනලැහැබෙහි වසන දෙවියෝ මූණ බලා සත්කාර කරන්නෝ ය. තෙවළාදර දෙන ම මෙතෙක් වේලා මෙතෙක් බණ කියන ලද නමුත් ඔවුනට ප්‍රශංසා මාත්‍රයකුත් නො කොට මහලු

තෙරුන් එක් ම ගාථාවක් කියන්නා හා මහහඬින් සාධුකාර දෙති'' යි පරිභව කොට විහාරයට ගොස් ඒ කාරණය බුදුරජානන් වහන්සේට සැළකළහ. ''මහණෙනි! මම යමෙක් බොහෝ කොට බණ උගෙණ බොහෝ කොට බණ කියා ද, එහෙත් ඔහු ධර්මධර ය යි නො කිය මි, යමෙක් එක් ගාථාවක් නමුත් උගෙණ සත්‍යය පිළිවිද දනී නම් මෙතෙමේ ධර්මධර නම් වේ'' ය යි වදාරා මේ ධර්ම දෙශනාව කළ සේක.

**න තාවතා ධම්මධරො යාවතා බහු භාසති,**
**යො ච අප්පම්පි සුත්වාන ධම්මං කායෙන පස්සති,**
**ස වෙ ධම්මධරො හොති යො ධම්මං නප්පමජ්ජතීති.**

යම් පමණෙකින් බොහෝ කොට බෙණේ ද, එපමණෙකින් ධර්මධර යෙක් නො වේ. යමෙක් වනාහි ටිකක් නමුදු බණ අසා කයින් සිවුසස් දනී ද, යමෙක් ධර්මයෙහි නො පමා වේ ද, හෙතෙමේ ඒකාන්තයෙන් ධර්මධර නම් වේ.

**න තාවතා ධම්මධරො යාවතා බහු භාසති** = යම් පමණෙකින් බොහෝ කොට බෙණේ ද, එපමණෙකින් ධර්මධරයෙක් නො වේ.

යමෙක් වනාහි පාඩම් කිරීම් පාඩම් කීම් ඈ විසින්, අන්හට බණදෙසීම් ඈ විසින් දව රෑ දෙක්හි අතර නො තබා ම බොහෝ කොට කියා ද, එපමණෙකින් හෙතෙමේ ධර්මධරයෙක් නො වේ. යටත් පිරිසයින් වංශය රක්නෙක් ප්‍රවේණිය රක්නෙක් ද නො වේ.

ධර්මය දරණුයේ **ධර්මධර** නම්. මෙහි **ධර්ම** යි කියේ හුදෙක් පර්‍ය්‍යාප්ති ධර්මය ම නො වේ. ප්‍රතිවෙධධර්මය ද එයින් ගැණේ. ඒ හා ම ප්‍රතිපත්තිධර්මය ද කියැවෙන්නේ ය. එහෙයින් ධර්මධර නම්, පර්‍ය්‍යාප්ති – ප්‍රතිපත්ති – ප්‍රතිවෙධධර්ම දරන්නේ ය. **''ධම්මධරාති පරියත්තිධම්මානං ච පටිවෙධධම්මානං ච ධාරණතො ධම්මධරා පටිපත්තිධම්මෙ ච එකෝව සඞ්ගහං ගච්ඡති''** යනු අටුවා.

**තාවතා, යාවතා** යනු නිපාතයෝ ය. එහි 'තාවතා' යනු නියමයෙන් පිරිසිඳීමෙහි ය. 'යාවතා' අනියමින් පිරිසිඳීමෙහි ය. **''තාවතා නියමත්‍ථපරිච්ඡෙදෙ ච යාවතා අනියමත්‍ථපරිච්ඡෙදෙ ච වත්තතෙ''** යනු ශාබ්දිකවචනයි.

**යො ච අප්පං අපි සුත්වාන ධම්මං කායෙන පස්සති** = යමෙක් වනාහි ටිකක් නමුත් බණ අසා කයින් සිවුසස් දහම් දක්නේ ද.

**''යො පන අප්පමත්තකම්පි සුත්වා ධම්මමත්‍ථාය අනත්‍ථමත්‍ථාය ධම්මානුධම්මපටිපන්නො හුත්වා නාමකායෙන දුක්ඛාදීනි පරිජානන්තො චතුසච්චධම්මං පස්සති''** යනු අටුවා. යමෙක් වනාහි

ටිකක් නමුත් අසා පාලිධර්මය හා එහි අර්ථකථාව දැන නව ලොවුතුරු දහම් ලැබීමට කරුණු වූ ශීලවිශුද්ධි ආදී වූ පූර්වභාග ප්‍රතිපදාවට පිළිපන්නේ නාමකායින් දුඃඛාදීන් පිරිසිඳ දක්නේ වේ ද, යනු අරුත්.

මෙහි **ධම්මං** යනු සිවුසස් දහම් ය. **කායෙන** යන්නෙන් චිත්තචෛතසිකධර්ම කියැ වේ. **පස්සති** යනු නුවණින් දකියි යනු අරුත්. මසැසින් දකී, යි යනු නො සෙද්.

"**සො ච ධම්මධරො හොති යො ධම්මං න පමජ්ජති** = යමෙක් සිවුසස් දහම් දැනීමෙහි පමා නො වේ ද, හෙතෙමේ ඒකාන්ත යෙන් ධර්මධර වේ.

යමෙක් ටිකක් නමුත් බණ අසා කායින් සිවුසස් දහම් දක්නේ වේ ද, එසේ යමෙක් පිරිපුන් වැර ඇති ව 'අද ම රහත් වෙමි' යි ප්‍රතිවෙධය බලාපොරොත්තුවෙමින් වෙසේ ද හෙතෙමේ ඒකාන්ත විසින් 'ධර්මධර' නම් වේ.

"**යොපි ආරද්ධවිරියො හුත්වා අජ්ජ අජ්ජෙවාති පටිවෙධං ආකඞ්ඛන්තො ධම්මං නප්පමජ්ජති, අයම්පි ධම්මධරොයෙවාති අත්ථො**" යනු අටුවා.

ධර්මදෙශනාවගේ අවසානයෙහි බොහෝ දෙන සෝවාන්ඵලා- දියට පැමිණියාහු ය.

**එකොනවිංශතිධර්මිෂ්ඨවර්ගවර්ණනාව නිමි.**

# ලකුණ්ටකභද්දිය ස්ථවිරයන් වහන්සේ

## 19 — 4

**ලකුණ්ඨක** භද්දිය ස්ථවිරයන් වහන්සේ බුදුරජාණන් වහන්සේට උපස්ථානයට ගොස් පෙරළා එන කල්හි වනවැසි තිස් නමක් පමණ භික්ෂූන් වහන්සේලා අතර මග දී ඒ තෙරුන් දුටුවෝ ද උන් හා කිසිත් නො බැණ බුදුරජුන් වෙතට ගොස් වැඳ එකත් පස්හි හිඳ ගත්හ. එකල්හි බුදුරජාණන් වහන්සේ ඔවුන්ට රහත් වන්නට තුබූ හෙතුසම්පත් දැක "මහණෙනි! තමුසේලා මෙහි එද්දී දූත් මෙතැනින් නික්ම ගිය භික්ෂු නම දුටුවහු දැ?" යි අසා වදාළ සේක. "ස්වාමීනි! නො දුටුම්හ" යි කී විට "ඇයි, කුමක් නිසා නො දුටහ" යි විචාළ සේක. "ස්වාමීනි! අපි මග ගිය කුඩා නමක් දුටුම්හ, අප දුටු ඒ නම, කුඩා සාමණේර නමකි, මහතෙර නමක් නො වේ"යි භික්ෂූන් කී කල්හි "මහණෙනි! තමුසේලා දුටු ඒ නම හෙරණෙක් නො වේ, මහතෙර නමෙකැ"යි වදාළ සේක. "ස්වාමිනි! අප දුටු ඒ නම ඉතා ම කුඩා ය, ඉතා ම මිටි ය, කුඩා ළදරුවකු තරම් ය" යි කී විට "මහණෙනි! තමුසේලාගේ ඇදහීම වැරදි ය, ඒ ඒ අය කඳ බසින් මහත් වූ තරමින් මහලු වූ තරමින් තෙර අසුනෙහි හුන් තරමින් මම ඔවුන් ස්ථවිර ය යි නො කියමි, යමෙක් සිවු සස්දහම් පිළිවිද දැන මහ ජනයා මැද අහිංසක ව සිටී නම්, කාහටත් යමකුගෙන් ගැහැටෙක් කරදරයෙක් පෙළීමෙක් නො වේ නම් අණින්නාට නො අණී නම්, දෙඩන්නාට නො දෙඩා නම්, බණින්නාට නො බණී නම්, ගසන්නාට නො ගසා නම් මෙතෙමේ ම ස්ථවිර නමැයි කියමි"යි වදාරා මේ ධර්මදෙශනාව කළ සේක.

**න තෙන ථෙරො හොති යෙනස්ස පලිතං සිරො,**
**පරිපක්කො වයො තස්ස මොඝජිණ්ණොති වුච්චති.**

**යම්හි සච්චං ච ධම්මො ච අහිංසා සඤ්ඤමො දමො,**
**සවෙ වන්තමලො ධීරො ථෙරො ඉති පවුච්චතීති.**

යම් කරුණෙකින් ඔහුගේ හිස ඉදී ගියේ වේ ද, ඒ හිස කෙස් ඉදී ගිය හෙතුවෙන් ස්ථවිර නම් නො වේ. ඔහුගේ වයස මුහුරා ගියේ වේ. ඔහු හිස් මහල්ලා යි කියනු ලැබේ.

යමකු කෙරෙහි සත්‍යය ද ධර්මය ද අහිංසාව ද සංයමය ද දමනය ද යන මෙ කියූ ගුණයෝ වෙත් ද, වමාරා දැමූ කෙලෙස් මල ඇති ධාරණ ප්‍රඥ ඇති හෙතෙමේ එකාන්තයෙන් ස්ථවිරය යි කියනු ලැබේ.

**න තෙන ථෙරො හොති යෙනස්ස පලිතං සිරො** = යම් කරුණෙකින් කෙස් ඉදීගිය හිස ඇත්තේ වේ ද ඒ හෙතුවෙන් ස්ථවිර නම් නො වේ.

මහලුබැව් නැමැති යම්කිසි කරුණෙකින් අතපය දිරුම් කඩට ගිය පමණෙකින් ඇස්-කන්-නාස් ඈ ඉඳුරන් දුබල වූ පමණෙකින් හැට හැත්තෑ වයස් ඉක්ම වූ පමණෙකින් හිස නර නැගි පමණෙකින් ස්ථවිර නො වේ.

**ථෙර** නම්: ස්ථිරභාවය කරන්නා වූ ගුණයන්ගෙන් යුක්ත වූයේ ය. තමන්ගේ ශ්‍රමණභාවයෙහි ස්ථිරභාවයට පැමිණියේ ය. ප්‍රාතිමොක්ෂසංවරාදී වූ ස්ථිරභාවය කරන්නා වූ ධර්මයන්ගෙන් පිරී ඉතිරී ගියේ ය. මේ අටුවා:- **"ථිරභාවප්පත්තො ථෙරකාරකෙහි ගුණෙහි සමන්නාගතත්තා, ථෙරොති. අත්තනො සමණධම්මෙ ථිරභාවප්පත්තො, පාතිමොක්ඛසංවරාදිථිරකාරකෙහි ධම්මෙහි සමන්නාගතො"** යනු. උපසම්පත්තියෙන් දසවස් ඉක්මවා සිටි මෙ කියූ ගුණයුත් මහණතෙමේ විනයයෙහි ලා ස්ථවිර යි කියනු ලැබේ. ස්ථවිරභාවය වදාරණ බුදුරජාණන් වහන්සේ ස්ථවිරභාවය කරණ ධර්ම මෙසේ වදාළ සේක:- **"ඉධ භික්ඛවෙ! භික්ඛු සීලවා හොති පාතිමොක්ඛසංවරසංවුතො විහරති, ආචාරගොචරසම්පන්නො අණුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවී සමාදාය සික්ඛති සික්ඛාපදෙසු, බහුස්සුතො හොති සුතධරො සුතසන්නිචයො, යෙ තෙ ධම්මා ආදිකල්‍යාණා මජ්ඣෙකල්‍යාණා පරියොසානකල්‍යාණා සාත්ථා සව්‍යඤ්ජනා කෙවලපරිපුණ්ණා පරිසුද්ධං බ්‍රහ්මචරියං අභිවදන්ති, තථාරූපාස්ස ධම්මා බහුස්සුතා හොන්ති ධතා වචසා පරිචිතා මනසානුපෙක්ඛිතා දිට්ඨියා සුප්පටිවිද්ධා, චතුන්නං ඣානානං ආභිචෙතසිකානං දිට්ඨධම්මසුඛවිහාරානං නිකාමලාභී අකිච්ඡලාභී අකසිරලාභී, ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති"** යි.

"මහණෙනි! මේ ශාසනයෙහි මහණ සිල්වත් වෙයි, ප්‍රාතිමොක්ෂසංවරශීලයෙන් සංවෘත ව වෙසෙයි, ආචාරයෙන් හා ගොචරයෙන් යුක්ත වෙයි, අණුමාත්‍ර වරදෙහි බිය දක්නා සුලු වෙයි, සිකපද මොනවට සමාදන් ව ගෙණ වෙසෙයි, මේ ශාසනයෙහි මහණ බහුශ්‍රැත වෙයි, ශ්‍රැතධර වෙයි, රැස් කොට ගත් ශ්‍රැත ඇත්තේ වෙයි, ආදිකල්‍යාණ මධ්‍යකල්‍යාණ පර්‍ය්‍යවසානකල්‍යාණ වූ අර්ථසහිත වූ ව්‍යඤ්ජනසහිත වූ කෙවලපරිපූර්ණ වූ පරිශුද්ධබ්‍රහ්මචර්‍ය්‍යය පවසන යම් ඒ ධර්මයෝ වෙත් ද, එබඳු වූ

ධර්මයෝ මේ මහණහු විසින් බෙහෙවින් අසන ලද්දාහු දරණ ලද්දාහු වචනයෙන් පුරුදු කරණ ලද්දාහු සිතින් පුනපුනා දක්නා ලද්දාහු ප්‍රඥයෙන් අවබොධ කරණ ලද්දාහු වෙත්, අධිචිත්තය ඇසුරු කොට සිටි මෙලොව සැපවිහරණ ඇති චතුර්විධධ්‍යානයන් කැමැති සේ ලබන සුලු වෙයි, සුව සේ ලබන සුලු වෙයි, මහත් කොට ලබන සුලු වෙයි, ආස්‍රවයන්ගේ ක්‍ෂය කිරීමෙන් ආස්‍රවරහිත වූ චෙතොවිමුක්තිය හා ප්‍රඥවිමුක්තිය මෙ ලොව දී ම තමා විසින් විශිෂ්ටඥනයෙන් දැන ප්‍රත්‍යක්‍ෂ කොට එයට පැමිණ වෙසෙසි,, යනු එහි අරුත්.

මෙ ද මෙහිලා දතයුතුය:-

“යො උද්ධතෙන චිත්තෙන සම්ඵඤ්ච බහු භාසති,
අසමාහිතසඞ්කප්පො අසද්ධම්මරතො මගො,
ආරා සො ථාවරෙය්‍යම්හා පාපදිට්ඨි අනාදරො.

යො ච සීලෙන සම්පන්නො සුතවා පටිභානවා,
සඤ්ඤතො ධීරධම්මෙසු පඤ්ඤායත්ථං විපස්සති,
පාරගූ සබ්බධම්මානං අඛිලො පටිභානවා.

පහීණජාතිමරණො බ්‍රහ්මචරියස්ස කෙවලී,
තමහං වදාමි ථෙරොති යස්ස නො සන්ති ආසවා,
ආසවානං ඛයා භික්ඛු සො ථෙරොති පවුච්චතීති”

යමෙක් විසුරුණු සිතින් බෝහෝ කොට නිසරුබස් බෙණේ ද, එකඟ නො වූ සඞ්කල්ප ඇති අසද්ධර්මයෙහි ඇලී සිටියා වූ මෘගයකු වැනි වූ ලාමකදෘෂ්ටි ඇති ආදර රහිත වූ හෙතෙමේ ස්ථාවරභාව යෙන් දුරුව සිටියි.

යමෙක් ශීලයෙන් යුක්ත වූයේ ශ්‍රැතවත් වූයේ ප්‍රතිභාන ඇතියේ ස්ථාවරධර්මයෙහි සංයත වූයේ මගනුවණින් සත්‍යාර්ථය වෙසෙසින් දක්තේ ද, සකන්ධාදී වූ සියලු ධර්මයන්හි පරතෙරට ගියේ වේ ද රාගාදී වූ හුල් නැත්තේ වේ ද, වැටහෙන නුවණ ඇත්තේ වේ ද,

ප්‍රහීණ කළ ජාතිමරණ ඇත්තේ වේ ද, බඹසරින් පිරිපුන් වූයේ ද, යමක්හට ආස්‍රව නැත්තේ ද, ඔහු මම ස්ථවිරයි කියමි. ආස්‍රවයන් ක්‍ෂය කිරීමේ හෙතුවෙන් ඒ මහණ ස්ථවිර යි කියනු ලැබේ, යනු අරුත්.

**සිඛරං** යන විභක්ත්‍යන්තපදයෙන් මුදුනෙහි පිහිටි කෙස් කියනු ලැබේ. එසේ කියනු ලබනුයේ ස්ථාන නාමයෙන් ස්ථානීන් ගන්නා බැවිනි. මෙහි ගැණෙනුවෝ මුදුනෙහි පිහිටි ඉදී ගිය

කෙශයෝ ය. **පලිත** යනු යෙදුනේ ඉදී ගිය බව කියනු පිණිස ය. ජරාවෙන් මැඩුනු එයින් ම සුදු වූ කෙශයෝ පලිත නම් වෙත්. **"ජරාඝාතා සුක්කකෙසාදයො පලිතං නාම"** යනු ආජ්ඤා වචන යි.

**වයො** යන්නෙන් ප්‍රථම – මධ්‍යම – පශ්චිම වයස් කොට්ඨාස කියැ වේ. වය ශබ්දය මෙහි සිටියේ ආයු කොටස් කියනු සඳහා ය. එහෙයින් මනොගණික වේ. මෙහි පිරිහීම් අරුතෙක් ද ඇත්තේ ය. එහි ලා මනොගණයෙහි නො වේ. **"වයො ඉති අයං සද්දො පරිහානිවාචකො ච තද පුරිසනයෙ සබ්බථා පවිවෙඨා, ආයුකොට්ඨාසවාචකො ච මනොගණපක්ඛිත්තතා පුරිසනයෙ එකදෙසෙන පවිවෙඨා"** යනු ශාබ්දික වචනයි.

නිකම්ට මහලු වූයේ දිරීමට ගියේ **මොඝජිණ්ණ** නම්. ඇතුළත සීලාදි ගුණ කිසිත් නැති හෙයින් වයසින් පමණක් මහලු වූයේ ය. දිරා ගියේ ය. හිස්මහල්ලා ය. ගුණනුවණින් මහලු නො වූයේ ය.

**යම්හි සච්චං ච ධම්මො ච අහිංසා සඤ්ඤමො දමො** = යමකු කෙරෙහි සත්‍යය ද ධර්මය ද අහිංසාව ද සංයමය ද දමනය ද (යන ගුණයෝ වෙත් ද)

සොළොස් අයුරෙකින් ප්‍රතිවෙධ කටයුතු වූ සිවු සස්දහම් **සච්ච** නම්. චතුර්විධමාර්ගඥානයෙන් දුඃඛාදිචතුර්විධආර්‍ය්‍යසත්‍යයන් පිළිවිද දැනීම, පරිඤ්ඤා – පහාන – සච්ඡිකිරියා – භාවනා යි සිවු අයුරෙකින් වනුයේ ය. ඒ සිවු අයුර එක් එක් මගක් පිළිබඳ වන කල්හි සොළොස් අයුරු වේ.[1]

නුවණින් සාක්ෂාත් කළ බැවින් නවවිධලොකොත්තර ධර්මය **ධම්ම** නම්. **"ඤාණෙන සච්ඡිකතත්තා නවවිධලොකුත්තරො ධම්මො ධම්මො නාම"** යනු අටුවා.[2]

**අහිංසා** නම්: කිසිවක්හට හිංසා නො කිරීම ය. අහිංසා ශීර්ෂයෙන් මෙහි දක්වන ලද්දේ චතුර්විධඅප්‍රමාණ්‍යයෝ ය. **මෙත්තා – කරුණා – මුදිතා – උපෙක්ඛා** යන මොවුහු ය ඔවුහු. **"අහිංසාති අහිංසනසභාවො දෙසනාමත්තමෙතං චතුබ්බිධාපි අප්පමඤ්ඤා භාවනා"** යනු අටුවා.

එහි **මෙත්තා** නම්: "හැම දෙන සුවපත් වෙත්වා" යන ඈ විසින් හැම සතුන් කෙරෙහි හිතරුත පැතීම ය. අන්හු පිළිබඳ දියුණු ව කැමැති වන අයුරෙන් නුවණ පෙරටු කොට සිත්හි උපදනා ධර්මශක්තිය, සෙනහය, මෛත්‍රිය යි.

---

1. 14. 6. 'දුක්ඛං දුක්ඛසමුප්පාදං' යනු බලනු.
2. 8. 14. 'අප්පසං ධම්මමුත්තමං' ,, ,,

**"මිජ්ජතීති = මෙත්තා, සිනියහතීති අත්ථො"** යනු එහි අර්ථ විසින් කීහ. **"මිත්තෙ භවං මිත්තස්ස වා එසා පවත්තතීතිපි = මෙත්තා"** යනු ද දන්නේ ය.

සවරූපාර්ථ විසින් අන්හු කෙරෙහි හිත අදහසින් පවත්නා අද්වෙෂචෛතසිකය මෙත්තා ය. මෙය සූවිසි වැදෑරුම් කාමාවචර සිත්හි ද, පසළොස් වැදෑරුම් රූපාවචර සිත්හි ද දොළොස් වැදෑරුම් අරූපාවචර සිත්හි ද අට වැදෑරුම් ලොකොත්තර සිත්හි ද යන එකුන් සැටක් සිත්හි හා විස්තර විසින් එකානූවක් සිත්හි ද යෙදේ. ද්වෙෂයට පටහැනි ව සිටියේ ය.

මෙත් වඩනු කැමැත්තහු විසින් කුඩු මහත් පළිබොධයෙන් දුරු ව කමටහන් ගෙණ බත් කිස කොට බත්මත සන්සිඳුවා විවෙකස්ථානයෙක පැණ වූ අසුනෙක සුවසේ හිඳ මුලින් ම ද්වෙෂයෙහි දෙසයත් ඉවසීමෙහි ආනිසංසයත් සිහි කළ යුතු ය. මේ භාවනායෙන් කළ යුත්තේ ද්වෙෂය දුරු කිරීම හා ඉවසීම ලබා ගැණීම ය. දෙස් වශයෙන් නො දුටු කිසිවක් දුරු කරන්නට හෝ අනුසස් වශයෙන් නො දුටු කිසිවක් ලබා ගන්නට හෝ නො හැකි ය. එහෙයින් **"දුට්ඨො ඛො ආවුසො දොසෙන අභිභූතො පරියාදින්නචිත්තො පාණම්පි හනති"** = ද්වෙෂයෙන් දූෂිත වූ එයින් ම මැඩුනා වූ හාත්පසින් මැඩ ගන්නා ලද්දා වූ සිත් ඇති තැනැත්තේ සතුන් මැරීම් ඈ පව්කම් කරන්නේ ය, යි වදාළ පරිදි ද්වෙෂයෙහි දෙස් දක්ක යුතු ය.

එසේ ම **"ඛන්තී පරමං තපො තිතික්ඛා, ඛන්තිබලං බලා ණීකං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං, ඛන්ත්‍යා භිය්‍යො න විජ්ජති"** = ඉවසීම පරම තපස් ය, ඉවසීම බල කොට ඇති ඉවසීම බල ඇණි කොට ඇති ඔහු, මම බ්‍රාහ්මණෑ යි කියමි, ඉවසීමට වඩා උසස් ගුණයෙක් නැත්තේ ය, යි වදාළ පරිදි ඉවසීමෙහි අනුසස් දක්ක යුතු ය.

මෙසේ දෙස් දැක ද්වෙෂයෙන් සිත මුදාලන්නට හා, අනුසස් දැක ඉවසීමෙහි සිත යොදා ලන්නට හා මෛත්‍රී භාවනාව පටන් ගත යුතු ය. එහිලා පළමු කොට මූන් මූන් කෙරෙහි මෙත් වැඩිය යුතු ය, මූන් මූන් කෙරෙහි මෙත් නො වැඩිය යුතු ය, යනාදී විසින් ඒ ඒ පුද්ගලයන් පිළිබඳ දෙස් හා අනුසස් දත යුත්තේ ය.

එහි අප්‍රිය – අතිප්‍රියසහාය – මධ්‍යස්ථ – වෛරී යන මේ සිවු දෙනා කෙරෙහි පළමු කොට මෙත් නො වැඩිය යුතු ය යි දක්වන ලද්දේ ය. සීමා විසින් ලිඞ්ග විසභාගයන් කෙරෙහි හා මළවුන් කෙරෙහි මෙත් නො වඩන්නේ ය. අප්‍රියයා ප්‍රිය තන්හි තැබීමෙහි,

අතිප්‍රියසහායයා මධ්‍යස්ථතන්හි තැබීමෙහි, මධ්‍යස්ථයා ප්‍රිය තන්හි තැබීමෙහි සිත පෙළෙන්නේ ය. වෛර ඇත්තන් සිහි කරත් ම ක්‍රොධය උපදනේ ය. ස්ත්‍රීන්ට පුරුෂයෝ, පුරුෂයන්ට ස්ත්‍රීහු ලිඞ්ග විසභාගයෝ ය. මෙසේ ලිඞ්ගයෙන් විසභාග ව සිටියවුන් කෙරෙහි මෙත් වඩන්නාහට වැඩෙනුයේ රාගය යි. මෛත්‍රිය නො වේ.

පෙර එක් ඇමැතියෙක් 'කවුරුන් කෙරෙහි මෙත් වඩම් දැ?' යි කුලූපග මහණකු අතින් විචාළේ ය. ඒ මහණ විශෙෂයක් නො පෙන්වා ප්‍රියයකු කෙරෙහි මෙත් වඩව' යි කී ය. ඔහුට සිය බිරිය තරම් ප්‍රිය වූ අනෙකෙක් නො වී ය. බිරිය ම ප්‍රිය ය. එහෙයින් ඔහු සිය බිරිය කෙරෙහි මෙත් වැඩී ය. එහි දී උපන් රාගයෙන් අන්ධ ව බිරිය වෙත යැමට කැමැති ව දොර කඩ සොයා ගත නො හැකි ව බිත්තිය බිඳ ගෙණ යන්නට සිතා බිත්තියට පහර දුන්නේ ය. කරුණු මෙසේ බැවින් ප්‍රියයා කෙරෙහි සීමා විසින් පළමු කොට මෙත් වැඩීම නො කට යුතු ය.

මළවුන් කෙරෙහි මෙත් වැඩීමෙන් උපචාර – අර්පණා සමාධීහු නො ලැබෙත්. එක් තරුණ භික්ෂු නමක් තම ඇදුරන් කෙරෙහි මෙත් වඩනුයේ, එය සඵල නො වන බව දැක මහතෙරුන් කරා ගොස්, "ස්වාමීනි! මට මෛත්‍රීධ්‍යානසමාපත්තිය හොඳට පුහුණු ය, එයට සමවැදෙන්නට නො හැකි ය, කරුණු කිමැ?" යි විචාළේ ය. එකල්හි මහාස්ථවිරයන් වහන්සේ "ඇවැත්නි! ඔබ ගත් නිමිත්ත ජීවත් ව ඇද්දැ?' යි සොයා බලව" යි කීහ. ඔහු නිමිත්ත සොයා බැලී ය. එවිට සිය ඇදුරන් අපවත් වූ බව දුටුයේ, ඒ නිමිත්ත හැර දමා අන් තැනක මෙත් වැඩීමෙන් අර්පණාව ලබා ගත්තේ ය. එහෙයින් පළමු කොට මළවුන් කෙරෙහි ද මෙත් වැඩීම නො කට යුතු ය.

මෙත් වඩන්නහු විසින් පළමු කොට "මම සුවපත් මි, මම නිදුක් මි" යි හෝ "මම වෛර නැත්තෙම් මි" මම ව්‍යාපාද නැත් තෙම් මි, උවදුරු නැත්තෙම් මි, සුවසේ ආත්මභාවය පරිහරණය කරමි" යි හෝ පුන පුනා තමන් කෙරෙහි මෙත් වැඩිය යුතු ය. මෙසේ මේ මෙත් වැඩීම, "මහණෙනි! මහණ තෙමේ මෙත් සහගිය සිතින් කෙසේ එක් දිශාවක් පතුරුවා වෙසේ ද, ප්‍රිය මනාප වූ එකකු දැක මෙත් කරන්නා සේ සියලු සතුන් කෙරෙහි මෙත් පතුරුවන්නේ ය" යන අර්ථවත් **"කථඤ්ච භික්ඛවෙ! භික්ඛු මෙත්තා-සහගතෙන චෙතසා එකං දිසං ඵරිත්වා විහරති, සෙය්‍යථාපි එකං පුග්ගලං පියං මනාපං දිස්වා මෙත්තායෙය්‍ය, එවමෙව සබ්බ සත්තෙ මෙත්තාය ඵරති"** යන විභඞ්ගපාළි ප්‍රදෙශය හා

අනොධිසො ඵරණ වශයෙන් "සියලු සත්ත්වයෝ සියලු ප්‍රාණීහු සියලු භූතයෝ සියලු පුද්ගලයෝ සියලු ආත්මභාවයෙහි ඇතුළත් වූවෝ් අවෛර–අව්‍යාපාද–අනීඝයෝ වෙත්වා, සුව ඇත්තෝ ආත්මභාව පරිහරණය කෙරෙත්වා" යන අර්ථවත් **"කතමෙහි පඤ්චහි ආකාරෙහි අනොධිසො ඵරණා මෙත්තාචෙතොවිමුත්ති භාවෙතබ්බා? සබ්බෙ සත්තා – පෙ – සබ්බෙ පාණා – පෙ – සබ්බෙ භූතා – පෙ – සබ්බෙ පුග්ගලා – පෙ – සබ්බෙ අත්තභාවපරියාපන්නා අවෙරා හොන්තු අබ්‍යාපජ්ජා හොන්තු අනීඝා හොන්තු සුඛී අත්තානං පරිහරන්තු"** යන පටිසම්භිදා පාලිප්‍රදෙශය හා,

"සියලු සත්ත්වයෝ සුව ඇත්තෝ වෙත්වා, උවදුරු නැත්තෝ වෙත්වා, සුවපත් ආත්මභාව ඇත්තෝ වෙත්වා" යන අර්ථවත් **"සුඛිනො වා ඛෙමිනො හොන්තු සබ්බෙ සත්තා භවන්තු සුඛිතත්තා"** යන කරණීය මෙත්ත සූත්‍ර ප්‍රදෙශය හා විරොධයෙක් නො වන්නේ ද? එහි තමන් කෙරෙහි මෙත් වැඩීමෙක් නො වදුරණ ලද්දේ නො වේ ද? යන මේ ප්‍රශ්නයෙහි ලා මෙසේ දතයුතු යː– සැබව, එහි තමන් කෙරෙහි මෙත් වැඩීමෙක් නො වදුරණ ලද්දේ ය. එහෙත් එහි හා මෙහි හා විරොධයෙක් ද නැත්තේ ය. එහි මෛත්‍රී භාවනාවිධි, අර්පණා විසින් දක්වන ලද ය. මෙහි තමන් සාක්ෂ්‍ය කොට දක්වන ලද ය. අවුරුදු සියයක් දහසක් නමුදු "මම සුවපත් මි" යනාදීන් විසින් තමන් කෙරෙහි මෙත් වඩන්නහුට අර්පණා නම් නො ලැබේ. එසේ මෙත් වැඩීමෙන් "මම යම් සේ සුවපත් වනු කැමැත්තෙම් ද, දුකට පිළිකුල් කරම් ද, ජීවත්වනු කැමැත්තෙම් ද, නො මැරෙණු කැමැත්තෙම් ද, එසේ අන්‍යසත්ත්වයෝත් කැමැත්තාහ" යි තමන් සාක්ෂ්‍ය කොට තැබීමෙන් ඔහුට අනුන් කෙරෙහි හිතසුව කැමැතිබව උපදින්නේ ය. එහි,

"සබ්බා දිසා අනුපරිගම්ම චෙතසා
නෙවජ්ඣගා පියතරමත්තනා ක්වචි,
එවං පියො පුථු අත්තා පරෙසං
තස්මා න හිංසෙ පරං අත්තකාමො"

යනු දෙශනාය. "සිතින් සියලු දිගුත් සොයා බැලූ ව ද ඒ කිසි දිගෙක තමාට වඩා ප්‍රියතරයකු නො ලැබී ය, තම තමන්ගේ ආත්මභාව ඔවුනොවුනට වෙන් වෙන් ව ප්‍රිය වේ, එහෙයින් තමහට වැඩ කැමැත්තේ අන්හට හිංසා නො කරන්නේ ය." යනු එහි අරුත්.

කරුණු මෙසේ බැවින් තමන් සාක්‍ෂ්‍ය කොට තබා අනුන් කෙරෙහි මෙත් වැඩිය යුතුය යනු වදාරණ ලද්දේ ය. තමන් කෙරෙහි පළමු කොට මෙත් වඩා අනතුරු ව සුවසේ මෙත් පවත්-වනු පිණිස තමාට ප්‍රිය වූ මන වඩන්නා වූ ගුරු ඇදුරු ආ එකෙක් වේ නම්, ඔහු පිළිබඳ දන-ප්‍රියවචනාදී වූ ප්‍රිය මනාප වූ කරුණු ද ශීල-ශ්‍රැතාදී වූ ගුණ ද සලකා "ඒ සත්පුරුෂයෝ සුවපත් වෙත්වා, නිදුක් වෙත්වා" යනාදීන් විසින් මෙත්, මෙත් වැඩිය යුත්තේ ය. මෙබන්දන් කෙරෙහි මෙත් වැඩීමෙන් අපීණා ලැබිය හැකි ය.

මෙත් වඩන්නහු විසින් මෙතෙකින් සතුටට නො පැමිණ සීමසංභෙදය කරණු කැමැති ව අනතුරු ව අතිප්‍රියමිත්‍රයා කෙරෙහි, අනතුරු ව මධ්‍යස්ථයා කෙරෙහි, අනතුරු ව වෛර ඇත්තහු කෙරෙහි දැයි එක් එක් කොටසෙහි සිත මොලොක් කොට කම්යට යොග්‍ය කොට මෙත් වැඩිය යුතු යි. යමක්හට වෛර ඇත්තෝ නො වෙත් නම්, වෛරීපුද්ගලයා කෙරෙහි මෙත් වඩම් යි උත්සාහ නො කළ යුතු ය. වෛරීපුද්ගලයා කෙරෙහි මෙත් වැඩිය යුතු ය යි, කීයේ වෛරීපුද්ගලයන් ඇත්තහුට ය. වෛරී පුද්ගලයා කෙරෙහි මෙත් වඩත් ම ඔහු කළ අපරාධ විරුද්ධකම් සිහිවීමෙන් ක්‍රොධය උපදී නම්, පළමු කියන ලද්දවුන් අතුරෙන් යමකු කෙරෙහි මෛත්‍රීධ්‍යාන උපදවා එයින් නැගී සිට නැවැත මෙත් සිතින් ඔහු කෙරෙහි නැගි ක්‍රොධය දුරු කරගත යුතු ය.එසේත් ක්‍රොධය නො සන්සිඳේ නම්, කකචොපමාදීන්ගේ අනුසාරයෙන් ක්‍රොධය දුරු කරන්නට නැවැත නැවැත උත්සාහ කළයුතු ය. (ක්‍රොධය දුරුකර ගැණීමෙහිලා විශුද්ධිමාර්ගීයෙහි විස්තර විසින් දක්වූ කරුණු උගෙණ ඒ ලෙසින් ක්‍රොධය සන්සිඳවා ගතයුතු ය.)

මෙත් වඩන්නහුගේ සිත්හි වෛරීපුද්ගලයන් නිසා නගිනා ක්‍රොධය සන්සිඳෙන කල්හි ප්‍රිය – අතිප්‍රියසහාය – මධ්‍යස්ථයන් කෙරෙහි මෙත්, වෛරීපුද්ගලයන් කෙරෙහි ද මෙත් සිත නගින්නේ ය. එකල්හි පුන පුනා මෙත් වඩා සීමසම්භෙදය කළ යුතු ය. තමා කෙරෙහි, ප්‍රියයා කෙරෙහි, අතිප්‍රියයා කෙරෙහි, මධ්‍යස්ථයා කෙරෙහි සමසිත් ඉපදවීම සීමසම්භෙදය යි දතයුතු ය.

තෙමේ ය, ප්‍රිය ය, මධ්‍යස්ථ ය, සතුරු ය යන සිව්දෙන එක් තැනක වසන කල්හි සොරු රැළක් එහි පැමිණ "මරා ගෙලලේ ගෙණ බිල්ලට දෙන්නට මුන් සිව්දෙනාගෙන් එකකු අපට දෙව"යි මෙත් වඩන්නහුගෙන් ඉල්ලා සිටි කල්හි මෙත් වඩන්න-හුට "අසුවලා ගෙණ යෙත්වා"යි සිතිවිල්ලෙක් උපන්නේ නම් සීමසම්භෙදය වූයේ නො වේ. "මුන් හැර මා ගෙණ යෙත්වා"යි

සිත් වී නම් එහි ද සීමසම්භේදයෙක් නො වේ. "තමා හෝ අන් එකකු හෝ ගෙණ යෙත්වා"යි අදහස් වී නම් ඔහු කෙරෙහි හිත කැමැත්තෙක් මෙත් වඩන්නහු තුළ නැත්තේ ය. ඒ සිවු දෙනා අතුරෙන් එකකුත් දිය නො හැකි ය, යි සිත් උපන්නේ නම් සිවු දෙනා කෙරෙහි ම සමසිත් ඇත්තේ නම් සීමසම්භේදය වූයේ වේ. පොතපතෙහි මෙය මෙසේ කීහ:

"අත්තනි හිතමජ්ඣත්තෙ අහිතෙ ච චතුබ්බිධෙ,
යදා පස්සති නානත්තං හිතචිත්තොව පාණිනං,
න නිකාමලාභී මෙත්තාය කුසලීති පවුච්චති.

යදා චතස්සො සීමායො සම්භින්නා හොන්ති භික්ඛුනො,
සමං ඵරති මෙත්තාය සබ්බං ලොකං සදෙවකං,
මහාවිසෙසො පුරිමෙන යස්ස සීමා න ඤායති"

යනු.

තමා කෙරෙහි, ප්‍රියයා කෙරෙහි මධ්‍යස්ථයා කෙරෙහි අප්‍රියයා කෙරෙහි යන සිවු දෙනා කෙරෙහි යම් කලෙක යමෙක් ප්‍රිය ය, මැදහත් ය යනාදී විසින් වෙනස්බවක් දකී ද හුදෙක් හේ සත්ත්වයන් කෙරෙහි හිතසිත් ඇත්තේ ම ය, යි කියනු ලැබේ. නියම විසින් මෛත්‍රිය කැමැති පරිදි ලබුයේ ය, කුසල් ඇත්තේ ය, යි නො ද කියනු ලැබේ.

යම් කලෙක තෙමේ ය, හිතවත් ය, මධ්‍යස්ථ ය, වෛරී ය යන සිවු තන්හි මහණහු විසින් සීමා බිඳින ලද ද එකල්හි හෙතෙමේ දෙවියන් සහිත ලොකයෙහි සමසේ මෙත් පතුරුවන්නේ වේ. යමක්හට "මේ මම, මේ හිතවත්" යනාදී විසින් සීමා නො හැගේ ද, හෙතෙමේ පළමු සීමා දක්නහුට වඩා මහත් භාවනාවිශෙෂ ඇත්තෙක් වන්නේ ය, යන අරුත්.

සීමසම්භේදය හා සමකාලයෙහි ම මෙසේ මෙත් වඩන්නහු විසින් නිමිත්ත හා උපචාරය ලදුයේ වේ. සීමසම්භේදය කළ කල්හි සීමසම්භේද විසින් පැවැති ඒ ශමථනිමිත්ත සෙවනය කරණුයේ බහුල කරණුයේ වඩනුයේ නිදුකින් ම අර්පණාවට පැමිණෙන්නේ ය. මෙත් වඩන්නේ මෙපමණෙකින් පඤ්චාඞ්ග-විප්‍රහීණ වූ පඤ්චාඞ්ගසමන්වාගත වූ ත්‍රිවිධකල්‍යාණයෙන් හා දශලක්ෂණයෙන් යුක්ත වූ මෛත්‍රීසහගත ප්‍රථමධ්‍යානය ලැබුයේ වේ. ප්‍රථමධ්‍යානය ලැබූ පසු සීමසම්භේද විසින් පැවැති ශමථ-නිමිත්ත ම සෙවුමෙන් වැඩුමෙන් බහුල කිරීමෙන් පිළිවෙළින් චතුෂ්කනයයෙහි ද්විතීය - තෘතීයධ්‍යානයන්ට ද, පඤ්චකනයයෙහි ද්විතීය-තෘතීය-චතුර්ථධ්‍යානයන්ට ද පැමිණෙන්නේ ය. හෙතෙමේ

ප්‍රථමධ්‍යානාදීන් අතුරෙහි කිසියම් ධ්‍යානයක සිට මෛත්‍රී-සහගත සිතින් එක් දිශාවක් පතුරුවා වසන්නේ ය. එසේ ම දෙවන – තෙවන – සිවුවන දිසා ද, උඩ – යට – සරස ද සියලු තන්හි සියලු සතුන් හීන-මධ්‍යමාදී වූ කිසිත් භෙදයක නො ලා තමන් හා සමත්වයෙන් ගෙණ සත්‍ත්වයන් ඇති සියලු ලොකය පැතිරවීම් විසින් මහත් වූ, භූමි විසින් මහද්ගත වූ, අපමණ සතුන් අරමුණු කිරීම් විසින් අප්‍රමාණ වූ, වෛර නැත්තා වූ, දෞර්මනස් නැත්තා වූ මෛත්‍රීසහගතචිත්තයෙන් පතුරුවා වසන්නේ ය. මේ විකුබ්බණය ලබන්නෝ ප්‍රථමධ්‍යානාදි වශයෙන් අර්පණාවට පැමිණියෝ ම ය. විකුබ්බණ නම්: මෙහි ඔධිසො-අනොධිසො-මෙත්තාභාවනා ය. මෙත් පැතිරවීම ය. එක් එක් දිසා, වෙන් කොට ගැණීමෙන් සීමා වෙන් කොට මෙත් පැතිරවීම ඔධිසො-ඵරණමෙත්තා ය. කිසිත් භෙදයක් නො කොට සියලු සතුන් ආත්මසමතායෙන් ගෙණ මෙත් පැතිරවීම අනොධිසොඵරණ-මෙත්තා ය.

**පටිසම්භිදායෙහි,** අනොධිසොඵරණමෙත්තාචෙතොවිමුත්තිය පස් අයුරෙකින් ද, ඔධිසොඵරණමෙත්තාචෙතොවිමුත්තිය සත් අයු-රෙකින් ද, දිසාඵරණමෙත්තාචෙතොවිමුත්තිය දස අයුරෙකින් ද දක්වන ලද ය.

එහි පස්වැදෑරුම් **අනොධිසොඵරණමෙත්තාචෙතොවිමුත්තිය** මෙසේ දත්තේ ය:- සියලු සත්‍ත්වයෝ, සියලු ප්‍රාණීහු, සියලු භූතයෝ, සියලු පුද්ගලයෝ, සියලු ආත්මභාවපර්‍ය්‍යාපන්නයෝ වෛර නැත්තෝ වෙත්වා, නීරොග වෙත්වා, නිදුක් වෙත්වා, සුව ඇත්තාහු ආත්මභාවය පරිහරණය කෙරෙත්වා’යි මේ සත්ත්වගණය මෙසේ සත්ත්ව – ප්‍රාණී – භූත – පුද්ගල – ආත්මභාව පර්‍ය්‍යාපන්න යි වෙන් වෙන් කොට ගෙණ ඔවුන් කෙරෙහි **“සබ්බෙ සත්තා අවෙරා හොන්තු –පෙ– සුඛී අත්තානං පරිහරන්තු”**යි වෙන් වෙන් ව යොදා මෙත් වැඩීම අනොධිසොඵරණමෙත්තා-චෙතොවිමුත්තිය යි.

රූපාදිස්කන්ධයන්හි ඡන්දරාග විසින් ඇලුනු බැවින් **සත්ත්ව.** ආශ්වාස-ප්‍රශ්වාස දෙකෙන් ජීවත් වන බැවින් **ප්‍රාණී.** කර්‍ම-කෙලශ දෙකෙන් උපන් බැවින් **භූත.** නිරයෙහි හෙන බැවින් **පුද්ගල.** ශරීරයෙන් යුක්ත බැවින් **ආත්මභාවපර්‍ය්‍යාපන්න.**

**සත්ත්ව** යනු සේ ම සෙසු වචන ද රූඪී විසින් සියලු සත්ත්වයනට ව්‍යවහාර කරණු ලැබේ. සත්ත්වයන් කෙරෙහි නැගෙන ජන්තු-ජීව යනාදි අන්‍ය වචන ඇත ද ප්‍රකට වශයෙන්

පවත්නා මේ නාමවචන පස ම ගෙණ අනොධිසොඵරණමෙත්තා චෙතොවිමුත්තිය දක්වන ලදි. යමකු විසින් ඒ වචන, වචන මාත්‍ර විසින් නො ගෙණ අර්ථ විසින් ගන්නා ලද්දේ නම්, ඔහුට අනොධිසොඵරණය නො ලැබෙන්නේ ය. වෙන් වෙන් විසින් අරුත් නො ගෙණ මෙහි කියූ ලෙසින් අනොධිසොඵරණමෙත්තාව පැතිර වියයුතු ය.

මෙහි "සියලු සත්‍වයෝ වෛර නැත්තාහු වෙත්වා" යනු එක් අර්පණාවකි. "සියලු සත්‍වයෝ නීරොග වෙත්වා" යනු එක් අර්පණාවකි. "සියලු සත්‍වයෝ සුව ඇත්තාහු ආත්මභාවය පරිහරණය කෙරෙත්වා" යනු එක් අර්පණාවකි. සෙසු ප්‍රාණී – භූත – පුද්ගල – ආත්මභාවපර්‍යාපන්නයන්හි ද මෙසේ "වෛර නැත්තාහු වෙත්වා" යනාදීහු වෙන් වෙන් ව යෙදෙත්තෝ ය. එකල්හි එකකු කෙරෙහි අර්පණා සතර බැගින් අර්පණා විස්සෙක් ලැබෙත්තේ ය.

සියලු ස්ත්‍රීහු, සියලු පුරුෂයෝ, සියලු ආර්‍ය්‍යයෝ, සියලු අනාර්‍ය්‍යයෝ, සියලු දෙවියෝ, සියලු මනුෂ්‍යයෝ, සියලු විනිපාතිකයෝ වෛර නැත්තෝ වෙත්වා, නීරොග වෙත්වා, නිදුක් වෙත්වා, සුව ඇත්තාහු ආත්මභාවය පරිහරණය කෙරෙත්වා'යි මේ සත්‍වගණය මෙසේ ස්ත්‍රී – පුරුෂ – ආර්‍ය්‍ය – අනාර්‍ය්‍ය – දෙව – මනුෂ්‍ය – විනිපාතික යි වෙන් වෙන් කොට ගෙණ ඔවුන් කෙරෙහි **"අවෙරා හොන්තු"** යනාදි සතර වෙන් වෙන් ව යොදා මෙත් වැඩීම **ඔධිසොඵරණමෙත්තාචෙතොවිමුත්තිය** යි දත්තේ ය.

මෙසේ සත්‍වගණය සතට බෙදා ගත් කල්හි එහි එකෙක අර්පණා සතර බැගින් අර්පණා අටවිස්සෙක් ලැබෙත්තේ ය. මෙහි ස්ත්‍රී-පුරුෂ යනු ලිඞ්ග විසින්, ආර්‍ය්‍ය-අනාර්‍ය්‍ය යනු ආර්‍ය්‍ය පෘථග්ජන විසින්, දෙව-මනුෂ්‍ය-විනිපාතික යනු උත්පත්ති විසින් කියන ලද්දේ ය.

"පෙරදිග සියලු සත්‍වයෝ, සියලු ප්‍රාණීහු, සියලු භූතයෝ, සියලු පුද්ගලයෝ සියලු ආත්මභාවපර්‍යාපන්නයෝ වෛර නැත්තෝ වෙත්වා, නීරොග වෙත්වා, නිදුක් වෙත්වා, සුව ඇත්තාහු ආත්මභාවය පරිහරණය කෙරෙත්වා" යන මේ ලෙසින් පැලදිග – උතුරුදිග – දකුණුදිග – පෙරඅනුදිග – පැලඅනුදිග-උතුරුඅනුදිග – දකුණුඅනුදිග-යටදිග-උඩදිග යි දිගුන් වෙන් කොට ඒ දිග්හි වසන සියලු සත්‍වාදීන් කෙරෙහි **"අවෙරා හොන්තු"** යනාදී සතර වෙන් වෙන් කොට යොදා මෙත් වැඩීම **දිසාඵරණ-මෙත්තාචෙතො විමුත්තිය** යි දත යුතු ය.

මෙසේ දිගුත් වෙන් කොට සතාබාදීත් ද වෙන් කොට ගෙණ මෙත් වඩනා කල්හි එකෙකා කෙරෙහි 'වෛර නැත්තාහු වෙත්වා' යනාදී විසින් සතර සතර බැගින් දසදිසායෙහි වූවත් ලක් කොට අපීණා දෙසියයෙක් ලැබෙන්නේ ය.

"පෙරදිග සියලු සත්‍රීහු, සියලු පුරුෂයෝ, සියලු ආයර්‍යයෝ, සියලු අනායර්‍යයෝ, සියලු දෙවියෝ, සියලු මනුෂ්‍යයෝ සියලු විනිපාතිකයෝ වෛර නැත්තෝ වෙත්වා, නීරොග වෙත්වා, නිදුක් වෙත්වා, සුව ඇත්තාහු ආත්මභාවය පරිහරණය කෙරෙත්වා" යන මේ ලෙසින් සෙසු නව දිසායෙහි ද යොදා ගන්නේ ය. මෙහි ද දස දිසායෙහිලා සත්‍රී-පුරුෂාදී වූ සත් දෙනා කෙරෙහි වෙන් වෙන් ව 'වෛර නැත්තෝ වෙත්වා' යනාදී විසින් මෙත් වඩත්, එකකු නිසා අපීණා අටවිස්සෙක් ලැබෙන්නේ ය. මෙසේ දස දිසායෙහි වූවත් ගෙණ මෙත් වඩනා කල අපීණා දෙසිය අසූවෙක් ලැබෙන්නේ ය. මුළුල්ල හාරසිය අසූවෙක් වේ. පටිසම්භිදායෙහි අපීණා පන් සිය අටවිස්සෙක් දක්වන ලද්දේ ය.

මෙහි ඉතා කොටින් කියූ අපීණා අතුරෙහි යම්කිසිවකුගේ වශයෙන් මෙත්තාචෙතොවිමුත්තිය වඩනුයේ නම් ඔහු **"සුඛං සුපති"** යනාදීන් දක්වන ලද අනුසස් එකොළොස ලබන්නේ ය. මේ ඒ අනුසස් එකොළොස:

**සුඛං සුපති**=සෙසු දෙනා නිදත්, දකුණාලයෙන් නො නිදා ඇත මැත පෙරළෙමින් සුරු සුරු යන හඬ නගමින් දුකසේ නිදන්නෝ ය. මෙත් වඩනුයේ එසේ නො නිදා සුවසේ නිදන්නේ ය. නින්දට වදනේ ද සමවතට සමවැදුනකු සේ වන්නේ ය.

**සුඛං පටිබුජ්ඣති** = සෙසු දෙන නතනමින් හැපෙමින් පෙරළෙමින් දුක සේ නින්දෙන් නැගිටින්නෝ ය. මෙත් වඩනුයේ එසේ නො නැගිට පිපෙන පියුමක් සේ විකාර නැති ව නින්දෙන් නැගී සිටින්නේ ය.

**න පාපකං සුපිනං පස්සති** = සිහින දක්නේ ද නපුරු සිහින ලාමක සිහින නො දකියි. සෑ වඳින්නකු සේ බණ අසන්නකු සේ යහපත් සිහිනයක් ම දකියි. සෙසු දෙන තමා සොරුන් විසින් පිරිවරා ගත්තකු සේ වගවලසුන් විසින් උපද්‍රතයකු සේ කඳු බෑවුම්හි ඇද වැටෙන්නකු සේ දකින්නෝ ය. මෙසේ මෙත් වඩනුයේ පවිටු සිහින නො දක්නේ ය.

**මනුස්සානං පියො හොති** = මෙත් වඩනුයේ උරෙහි ලූ මුත්හරක් සේ හිස පලන් මල්දමක් සේ මිනිසුනට ප්‍රිය වේ. මිනිසුන්ගේ මන වඩන්නේ වේ.

**අමනුස්සානං පියො හොති** = මෙත් වඩනුයේ විසාඛ තෙරුන් මෙන් අමනුෂ්‍යයනට ප්‍රිය වේ. විසාඛ ස්ථවිරයන් වහන්සේ දඹදිව් පැළලුප් නුවර විසූ කෙළෙඹියෙකි. ඔහු 'ලක්දිව සෑ මලින් සරසනලද ය, කසාවතින් බබලන්නේ ය, රිසි තැනක හිඳින්නට හැකි ය, උතුසප්පාය–සෙනාසනසප්පාය–පුග්ගලසප්පාය-ධම්මසව නසප්පාය 'යන මේ සියල්ල සුලභ ය' යි අසා තමන් අයත් සියලු දැය දූ පුතුනට දී එක් කහවණුවක් පමණක් ගෙණ එය රෙදි කොණෙක ගැට ගසා ගෙණ ගෙන් නික්ම නැව්තොටට අවුත් නැවක් එනතුරු එහි රැඳී සිටියේ ය. වෙළඳාමෙහි දක්‍ෂ වූ ඔහු නැව්තොට ඒ ඒ තැනින් බඩු ලබා ගෙණ විකුණා මාසයක් තුළ දී කහවණු දහසක් උපයා ගත්තේ ය. එසේ එහි මසක් පමණ රැඳී කහවණු දහසක් උපයා ගත් ඔහු නැව් නැග අවුත් ලක්–දිවට බැස මහාවිහාරයට ගොස් මහතෙරුන් වෙතින් මහණකම ඉල්ලා සිටියේ ය. භික්‍ෂූන් වහන්සේලා මහණ කරන්නට ඔහු සීමාවට කැඳවා ගෙණ ගියහ. එහි දී ඔහු තම හිණ තුබූ ඒ දහස බැඳි පියල්ල බිම හෙළී ය. "මේ කිමැ?"යි ඇසූ විට "කහවණු දහසෙකැ" යි කී ය. එකල්හි භික්‍ෂූන් වහන්සේලා "පින්වත! පැවිද්දාට මිල මුදල් පරිහරණය නො සුදුසු ය, නො පිළිවන, මේ වේලෙහි ම එයට කළ යුත්තක් කරව" යි කී විට ඔහු, "විසාඛ-යන් පැවිදි වන තැනට පැමිණියෝ හිස් අතින් නො යෙත්වා"යි කහවණු පොදිය සීමාමාලකයෙහි විසුරුවා හැර පැවිදි උපසපන් බැව් ලබා පස් වසක් නිස සමාදන් ව ගෙණ උභයමාතෘකා පුහුණු කොට පවරා තමන්ට හිත වූ කමටහනක් ගෙණ එක් එක් වෙහෙරෙහි සිවුමස සිවුමස සමවත් පුරමින් හැසුරුණේ ය. එසේ හැසිරෙණුයේ එක්තරා වනලැහබක් දැක එහි රුක්මුලෙක හිඳ සමවතට සමවැද සමවතින් නැඟී තමන් තුළ වූ ගුණ සිහි කරන් ම නැගුනු ප්‍රීතිසෞමනස්‍යයෙන් මෙසේ උදන් ඇනී ය. මේ ඒ උදානය:–

"යාවතා උපසම්පන්නො යාවතා ඉධමාගතො,
එත්ථන්තරෙ ඛලිතං නත්ථි අහො ලාභා තෙ මාරිස."

යම් දවසක උපසපන් වීම් ද, යම් දවසක මෙහි ආයෙම් ද මේ අතර මා අතින් කිසිවරදෙක් සිදු නො වී ය. නො දුක! එය නට මහත් ලාභයෙකි.

දවසක් සිතුල්පවුවෙහෙර බලා යන මේ මහණ, දෙමංහන්දියකට පැමිණ 'කිනම් මගකින් යා යුතු දැ'යි සිතමින් එහි නැවතී සිටියේ ය. එකල්හි දෙවියෙක් "ස්වාමීනි! මේ මගින් වඩිනු මැනැවැ" යි අත දිගු කොට මග දක්වී ය. ඒ මහණ ඒ මගින් සිතුල් පව්වට ගොස් සිවු මසක් එහි වැස "හෙට උදැසන මින් බැහැර යන්නෙමි"යි සිතා නිදි ගත්තේ ය. සක්මන් කෙළවර තුබූ මිදෙල් රුක විසූ දෙවියා හිණිපෙතමත්තෙහි හිඳ හඬන්නට වන. ස්ථවිරයන් වහන්සේ "හඬන්නේ කවරු?"යි ඇසූ විට "ස්වාමීනි! මම මිදිල දෙවතා"යි කී ය. "ඇයි, හඬහි?" යි ඇසූ විට "ඔබවහන්සේ හෙට මෙතැනින් වඩින නිසා" යි කී ය. "මා මෙහි වසත්, තට ඇති කාරිය කිමැ?" යි ඇසූ විට "ස්වාමීනි! ඔබවහන්සේ මෙහි වසන සේක් නම්, අමනුෂ්‍යයෝ උනුන් කෙරෙහි මෛත්‍රිය ඇත්තෝ වෙති, ඔබවහන්සේ මෙතැනින් ගිය සේක් නම්, ඔවුහු කලහ කරන්නෝ ය, නපුරු බස් කියන්නෝය" යි කී ය. එවිට ස්ථවිරයන් වහන්සේ "මා මෙහි විසීමෙන් තොපට වැඩෙක් පහසුබවෙක් වේ නම්, ඒ මැනැවැ" යි තවත් සිවු මසක් එහි වැස, ඒ සිවු මසත් ගෙවා නැවැත යන්නට සැරසෙත් ම පළමුසේ මිදෙල්රුක්වැසි දෙවියා හඬන්නට වන. එවර ද උන්වහන්සේ ගමන හැර දමා එහි රැඳුනාහ. මෙපරිද්දෙන් විසාඛ ස්ථවිරයන් වහන්සේ සිතුල්පවුවෙහෙරෙහි ම වැස එහිදී ම පිරිනිවියහ. මෙත් වඩනුයේ අමනුෂ්‍යයනට ප්‍රිය වනුයේ මෙසේ ය.

**දෙවතා රක්ඛන්ති** = දූ පුතුන් රක්නා මවුපියන් සේ දෙවියෝ මෙත් වඩන්නහු රකිත්.

**නාස්ස අග්ගි වා විසං වා සත්ථං වා කමති** = මෙත් වඩන්නහුගේ සිරුරෙහි **උත්තරා** උපාසිකාවගේ සිරුරෙහි මෙන් ගිනි නො වදියි. **සංයුත්තභාණකචූළසීව** තෙරුන්ට මෙන් විස නො කැවේ. **සඞ්කිච්ච** සාමණේරයන්ට මෙන් දඬුමුගුරු ආයුධ නො වදියි.

ගවදෙනක වසුට කිරි පොවමින් සිටිය දී වැද්දෙක් ඇය දැක දිගම්ට ඇති උල්පිහියකින් ඇයට ඇන්නේ ය. එය දෙනගේ සිරුර වැදී තල්කොළයක් සේ ඇකිළී ගියේ ය. ඒ හාස්කම උපාචාර බලයෙකින් අර්පණාබලයෙකින් වූයේ නො වේ. හුදෙක් වසු කෙරෙහි පැවැති සෙනහයෙහි බලයෙන් ම වූයේ ය. එහෙයින් මෙත් වැඩුම මේ සා මහත් ආනුභාව ඇතැ යි දත යුත්තේ ය.

**තුවටං චිත්තං සමාධියති** = මෙත් වඩන්නහුගේ සිත වහා සමාහිත වේ. ඒ සිත පිළිබඳ සමාහිතභාවයෙහි ලැසිබවෙක් නැත්තේය.

**මුඛවණ්ණො විප්පසීදති** = නටුවෙන් ගිලිහී වැටුනු තල්ගෙඩියක් සේ මෙත් වඩන්නහුගේ මුහුණ ඉතා පහන් වේ.

**අසම්මූළ්හො කාලං කරොති** = මෙත් වඩන්නහුට සිහිමුළාවෙන් වන මරණයෙක් නැත. නො මුළාව ම නිදිගත් වන ම කළුරිය කරන්නේ ය.

**උත්තරිං අප්පටිවිජ්ඣන්තො බ්‍රහ්මලොකූපගො හොති** = මෙත් සමවතින් මත්තෙහි රහත්බවට පැමිණෙන්නට නො හැකි වී නම් මෙයින් ච්‍යුත ව නිදා පිබිදියා සේ බඹලොව උපදින්නේ ය. **"ඉධ භික්ඛවෙ! එකච්චො පුග්ගලො මෙත්තාසහගතෙන චෙතසා එකං දිසං ඵරිත්වා විහරති, තථා දුතියං-තථා තතියං-තථා චතුත්ථං, ඉති උද්ධමධො තිරියං සබ්බධි සබ්බත්තතාය සබ්බාවන්තං ලොකං මෙත්තාසහගතෙන චෙතසා විපුලෙන මහග්ගතෙන අප්පමාණෙන අවෙරෙන අබ්‍යාපජ්ඣෙන ඵරිත්වා විහරති, සො තදස්සාදෙති, තං නිකාමෙති, තෙන ච විත්තිං ආපජ්ජති, තත්ථ ඨිතො තදධිමුත්තො තබ්බහුලවිහාරී අපරිහීනො කාලං කුරුමානො බ්‍රහ්මකායිකානං දෙවානං සහව්‍යතං උපපජ්ජති, බ්‍රහ්මකායිකානං දෙවානං කප්පො ආයුප්පමාණං, තත්ථ පුථුජ්ජනො යාවතායුකං ඨත්වා යාවතකං තෙසං දෙවානං ආයුප්පමාණං තං සබ්බං ඛෙපෙත්වා නිරයම්පි ගච්ඡති, තිරච්ඡාන යොනිම්පි ගච්ඡති, පෙත්තිවිසයම්පි ගච්ඡති, භගවතො හිත සාවකො තත්ථ යාවතායුකං ඨත්වා යාවතකං තෙසං දෙවානං ආයුප්පමාණං, තං සබ්බං ඛෙපෙත්වා තස්මිංයෙව භවෙ පරිනිබ්බායති, අයං ඛො භික්ඛවෙ! විසෙසො අයං අධිප්පායො ඉදං නානාකරණං සුතවතො අරියසාවකස්ස අස්සුතවතා පුථුජ්ජනෙන යදිදං ගතියා උපපත්තියා සති"** යනු සාධක සූත්‍රයි.

මහණෙනි! මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් මෙත්සහ ගිය සිතින් එක් දිසාවක් පැහැස වෙසෙයි. එසේ දෙවන දිසාව තෙවන දිසාව සතරවන දිසාව ද යි මෙසේ උඩ–යට–සරස හැම තැන සියලු සතුන් ආත්මසමතායෙන්, මුළුලොව විපුල වූ මහද්ගත වූ අප්‍රමාණ වූ වෛර නැත්තා වූ දොම්නස් රහිත වූ මෙත්සහගිය සිතින් පැහැස වෙසෙයි. හෙතෙමේ ඒ ධ්‍යානය රස විඳ ගණියි. ඒ ධ්‍යානය කැමැති වෙයි. ඒ ධ්‍යානයෙන් සතුටට පැමිණෙයි. ඒ ධ්‍යානයෙහි සිටියේ ඒ ධ්‍යානයෙහි ඇලුනේ ඒ ධ්‍යානයෙහි බහුල විහරණ ඇතියේ ඉන් නො පිරිහුනේ කළුරිය කරණුයේ බ්‍රහ්මකායික දෙවියන්ගේ සහභාවයට පැමිණෙයි. මහණෙනි! බ්‍රහ්මකායික දෙවියන්ගේ ආයුඃප්‍රමාණය කල්පයෙකි. එහි පෘථග්ජන තෙමේ ආයු ඇති තාක් සිට ඒ දෙවියන්ගේ ආයුඃප්‍රමාණය යම් පමණ වේ ද

ඒ හැම ගෙවා නිරයට ද තිරිසන්යෝනියට ද ප්‍රෙතවිෂයට ද උත්පත්ති වශයෙන් පැමිණෙයි. භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක තෙමේ වනාහි එහි ආයු ඇති තාක් සිට ඒ දෙවියන්ගේ ආයුඃප්‍රමාණය යම් තරම් වේ නම්, එහැම ගෙවා ඒ භවයෙහි ම පිරිනිවෙයි. මහණෙනි! ගතිය හා උපපත්තිය හා ඇති තාක් අශ්‍රුතවත් පෘථග්ජනයා හා ශ්‍රුතවත් ආර්‍යශ්‍රාවකයාගේ මේ වෙනස වේ, යනු එහි සිංහලයි.

බ්‍රහ්මෝත්තම වූ බුදුරජුන් විසින් වදාළ මේ මෙත් බඹවිහරණය ඉතා සැකෙවින් මෙසේ දත යුත්තේ ය.

**හිතාකාරප්පවත්තිලක්ඛණා මෙත්තා** = මෛත්‍රිය සත්ත්වයන් කෙරෙහි හිත ආකාරයෙන් පැවැත්ම ලකුණු කොට සිටියා ය.

**හිතූපසංහරණරසා** = සත්ත්වයන් කෙරෙහි හිතඑළවීම කෘත්‍යය කොට සිටියා ය.

**ආඝාතවිනයපච්චුපට්ඨානා** = වෛර දුරු කිරීම වැටහීම කොට සිටියාය.

**සත්තානං මනාපභාවදස්සනපදට්ඨානා** = සත්ත්වයන් කෙරෙහි මනාපබව දැක්ම ආසන්න කාරණය කොට සිටියා ය.

**ව්‍යාපාදූපසමො එතිස්සා සම්පත්ති** = ව්‍යාපාදයාගේ සන්සිඳීම මෙහි සම්පත්තිය යි.

**සිනෙහසම්භවො විපත්ති** = තෘෂ්ණාස්නෙහයාගේ ඉපැත්ම විපත්ති ය යි.

මෙත් බඹවිහරණයට රාගය ආසන්න සතුරු ව සිටියේ ය. මෛත්‍රිය හා රාගය ගුණ දැක්මෙහි ලා සමාන බැවිනි. ඒ රාග සතුරු තෙමේ ස්වල්ප වූ ද සිහිමුළායෙන් මෛත්‍රිය දුරු කොට ඒ අරමුණෙහි උපදනට නිසි බැවින් වහා එයට අවකාශ ලබන්නේ ය. එහෙයින් රාගසතුරාගෙන් මෛත්‍රිය මැනැවින් රැක ගත යුතු ය. පුරුෂයාට කඳුහෙල් වනගහන ඈසුරු කළ දූර සතුරා මෙන්, මෙත් බඹවිහරණයට ව්‍යාපාදය දූරසතුරු ය. මෛත්‍රිය හා ව්‍යාපාදය ස්වභාව විසින් ම අසමාන බැවිනි. ව්‍යාපාදයෙන් බිය රහිත ව ලද පිහිට ඇති මෛත්‍රිය ව්‍යාපාදයට මැඩ ලිය නො හැකි සේ රැක ගත යුතු ය. මෛත්‍රිය හා ව්‍යාපාදය කිසි කලෙක එක් තන්හි පිහිට නො ලබන්නේ ය.

**කරුණා** නම්: මෙරමා දුක් විඳුනා කල්හි සාධූන්ගේ හෘදයෙහි හට ගන්නා සැලීම ය. අනුන් පිළිබඳ දුක් දැක එය බැහැර කරණු කැමැත්තෙන් නො ඉවසිම් විසින් සිතෙහි උපදනා ධර්මශක්තිය,

වෙනස්බව කරුණා ය. **“පරදුක්ඛෙ සති සාධූනං හදයකම්පනං කරොතීති=කරුණා”** යනු එහි අර්ථ විසින් කීහ. තවද **“කිණාති වා පරදුක්ඛං හිංසති විනාසෙතීති = කරුණා”** මෙරමා දුක හිංසා කරන්නී විනාශ කරන්නී කරුණා. **“කිරයති වා දුක්ඛිතෙසු ඵරණවසෙන පසාරියතීති = කරුණා”** දුකට පැමිණියවුන් කෙරෙහි පැතිරවීම් විසින් විසුරුවා හරින්නී දිග හරින්නී කරුණා.

මෙය ටීකානය විසින් පඤ්චමධ්‍යානවර්ජිතරූපාවචර සිත් දෙළොසෙහි ද, සොම්නස් සහගිය මහාකුසල-මහාක්‍රියා සිත් අටෙහි දැ යි යන සිත් විස්සෙහි ද, අර්ථකථානය විසින් උපෙක්ෂාසහගත මහාකුසලමහාක්‍රියා සිත් අටෙහි දැ යි අටවිසි සිත්හි යෙදේ.

කරුණාව වඩනු කැමැත්තහු විසින් කරුණාරහිත බවෙහි දෙස් හා කරුණාසහිත බවෙහි අනුසස් සලකා භාවනාව පටන් ගත යුතු ය. එසේ කරුණාභාවනාව පටන් ගන්නහු විසිනුදු පළමු කොට ප්‍රිය පුද්ගලාදීන් කෙරෙහි කරුණාව නො වැඩිය යුතු ය. එසේ කියේ ප්‍රියයා ප්‍රිය තන්හි ද අතිප්‍රියයා අතිප්‍රිය තන්හි ද මධ්‍යස්ථයා මධ්‍යස්ථ තන්හිද අප්‍රියයා අප්‍රිය තන්හි ද වෛර ඇත්තහු වෛරී තන්හිද සිටුනා බැවිනි. ලිඞ්ගවිසභාගයන් කෙරෙහි හා කළුරිය කළවුන් කෙරෙහි ද කරුණව නො වැඩිය යුතු ය. එසේ කියනු ඔවුන් මෙයට තැන් නො වන බැවිනි.

**“කථඤ්ච භික්ඛවෙ! භික්ඛු කරුණාසහගතෙන චෙතසා එකං දිසං ඵරිත්වා විහරති, සෙය්‍යථාපි නාම එකං පුග්ගලං දුග්ගතං දුරුපෙතං දිස්වා කරුණායෙය්‍ය, එවමෙව සබ්බෙ සත්තෙ කරුණාය ඵරති”** යි විභඞ්ගයෙහි වදාළ බැවින්, පළමු කොට කරුණා කළ යුතු සැහැවි ඇති ඉතා දුක්පත් දිළිඳු සිඳලූ අත්පා ඇති කබලක් ඉදිරියෙහි තබා ගෙණ අම්බලමක වැද හෝනා අතින් පයින් කඩා හැලෙන පණුවැදලි ඇති බැගෑහඬින් හඬන පව් කළ මිනිසකු දැක “අනේ! මේ මිනිස් එකාන්තයෙන් දුකට පැමිණියේ ය, මොහු මේ දුකින් මුදා ගන්නෙම් ඉතා යෙහෙකැ”යි කරුණාව වැඩිය යුතු ය. ඉදින් එවැන්නකු නො ලත් කල්හි සුව විඳින පව් කරණ පුද්ගලයා නැසිය යුත්තකු හා සම තැන තබා, සම කොට සිතා කරුණාව වැඩිය යුතු ය.

පැහැර ගත් බඩු අතේ ඇති ව අල්ලා ගත් සොරු නසාලන්නැ යි රජුගෙන් අණලත් රාජපුරුෂයෝ සොරු බැඳ ගෙණ සන්ධියෙහි සන්ධියෙහි සිය ගණන් පහර දෙමින් වධකස්ථානයට ගෙණ යන්නෝ ය. එසේ මරන්නට ගෙණ යන ඔහු දුටු මිනිස්සු ඔහුට කන බොන දැය ද බුලත් පුවක් ඈ ද දෙති. සොරු ඒ දුන් දැය ගෙණ

කමින් බොමින් සුව ඇත්තකු සේ යස ඉසුරු ඇත්තකු සේ වඩසථානයට යන්නේ ය. එහෙත් කිසිවෙක් මූ සුව ඇත්තෙක, යස ඉසුරු ඇත්තෙකැ'යි නො සිතන්නේ ය. 'ඒකාන්තයෙන් මේ බැගෑපත් මිනිස්, දූන් මරණයට පැමිණෙන්නේ ය, නගන පියෙන් පියට මොහුට මරණය ළං වන්නේ ය'යි මිනිස්සු ඔහු කෙරෙහි කරුණාව උපද වන්නෝ ය. එපරිද්දෙන් කරුණාකර්මස්ථානය ගත්තහු විසින් සැපවත් වූ ද පුද්ගලයා කෙරෙහි කරුණාව වැඩිය යුතු ය. මේ මිනිසා දූන් සුවසේ සැදී පැදී පස්කම්සුව වළඳන්නේ ද, කළ පින් කමක් නැති බැවින් මතු අපායයෙහි ඉපිද කටුක දුක් විඳීය, යි ඔහු කෙරෙහි ද කරුණාව වැඩිය යුතු ය. අනතුරු ව වෛරීන් කෙරෙහි ද ක්‍රමයෙන් කරුණාව වැඩිය යුතු ය. එහි දී වෛරීන් කෙරෙහි ද්වෙෂය උපදී නම්, මෛත්‍රියෙන් එය සන්සිඳවා ගත යුතු ය. කළ කුසල් ඇත්තෙක් වේ නම්, ඥාති-රොග-භොග ව්‍යසනාදීන් අතුරෙන් කිසිවකින් යුක්තය, යි දැක හෝ අසා, නැත, 'සසර දුක් නො ඉක්ම වූ බැවින් ඒකාන්තයෙන් දුක් ඇත්තේ ම ය'යි හැම අතකින් කරුණාව උපදවා යට කියූ පරිදි තෙමේ ය, ප්‍රිය පුද්-ගල ය, මධ්‍යස්ථ ය, වෛරී ය යන සිවු දෙනා කෙරෙහි සීමසම්භේදය කොට ඒ නිමිත්ත ම සෙවුමෙන් බලමින් බහුල කරමින් මෛත්‍රියෙහි ලා කියූ සේ ත්‍රික-චතුෂ්කාධ්‍යාන විසින් අර්පණා ලැබිය යුතු ය.

මෙහි ද පංචවිධ අනොධිසොඵරණා සප්තවිධ ඔධිසොඵරණා දසවිධ දිසාඵරණා චෙතොවිමුත්ති ද 'සුඛං සුපති' යනාදී විසින් කියූ අනුසස් ද යට මෛත්‍රීකථායෙහි කියූ ලෙසින් දත යුතු ය.

**දුක්ඛාපනයනාකාරප්පවත්තිලක්ඛණා කරුණා** = කරුණාව දුකට පත් සත්ත්වයන්ගේ දුක්දුරු කරණ අයුරෙන් පැවැත්ම ලකුණු කොට සිටියා ය.

**පරදුක්ඛාසහනරසා** = මෙරමා දුක් නො ඉවසීම කෘත්‍යය කොට සිටියා ය.

**අවිහිංසා පච්චුපට්ඨානා** = අන්හට හිංසා නො කිරීම වැටහීම කොට සිටියා ය.

**දුක්ඛාභිභූතානං අනාථභාවදස්සනපදට්ඨානා** = දුකින් පෙළුන වුන්ගේ අසරණබව දැක්ම ආසන්නකාරණය කොට සිටියා ය.

**විහිංසූපසමො තස්සා සම්පත්ති** = විහිංසාවගේ සන්සිඳීම මෙහි සම්පත්තිය යි.

**සොකසම්භවො විපත්ති** = ශොක හටගැණීම විපත්තිය යි.

කරුණාබ්‍රහ්මවිහරණයට ගෙහසිත දෞර්මනස්‍ය ආසන්නසතුරු ව සිටියේ ය. විපත් දැකීම් වශයෙන් සමාන බැවිනි. විහිංසාව දූරසතුරු ය. කරුණාව හා විහිංසාව ස්වභාව විසිත්ම අසමාන බැවිනි. කරුණාව හා විහිංසාව කිසි කලෙක එක් තන්හි පිහිට නො ලබන්නේ ය. මෙහි ගෙහසිත දෞර්මනස්‍ය යි කීයේ කාමගුණයන් හා හැනී ගිය කාමගුණ ඇසුරු කළ දෞර්මනස යි. මේ දෞර්මනස ඉපැදෙනුයේ තමන් බලාපොරොත්තු වන කම්සැප නො ලැබීමෙනි.

**මුදිතා** නම්: සැපවත් ව සිටුනා සත්ත්වයන් දැකීමෙන් උන් කෙරෙහි සතුටුවීම ය. මවක් දූ පුතුන්ගේ ධනසම්පත්තිය හා සුඛසම්පත්තිය ද පැහැසටහන් ආදිය ද දැකීමෙන් යම්සේ සතුටු වන්නී ද, එපරිද්දෙන් සතුරු-මිතුරු-උදාසීන වූ සුවපත් ව සිටුනා සියලු සතුන් කෙරෙහි සිතෙහි උපදනා ධර්මශක්තිය, හැමසතුන් කෙරෙහි සතුටුවීම මුදිතා ය. ඒ මේ ධර්මශක්තිය වැඩී ගිය දූ පුතුන් ඇති මවකගේ සිත්හි දූපුතුන් නිසා හට ගන්නා වූ මුදිතාවට සමාන ව සිටියා ය. **"මොදන්ති තාය තං සමඞ්ගිනො, සයං වා මොදති, මොදනමත්තමෙව වා මුදිතා"** යම් ධර්මශක්තියක් කරණ කොට ගෙණ ඒ ධර්මශක්තියෙන් ශක්තිසම්පන්නවූවාහු සතුටු වෙත් ද, තෙමේ හෝ සතුටු වේ ද, සතුටුවීම් මාත්‍රය ම හෝ මුදිතා.

මේ මුදිතාචෛතසිකය, පඤ්චමධ්‍යානවර්ජිතද්වාදශවිධ රූපාවචරචිත්තයන්හි ද මහාකුසල-මහාක්‍රියා චිත්තයන්හි ද උපදනේ ය. කරුණාව හා මුදිතාව හා දෙක උනුනට විරුද්ධ අරමුණු ඇත්තේ ය. කරුණාවට දුක්පත් සතුන්, මුදිතාවට සුවපත් සතුන් අරමුණු වන බැවින් කිසි කලෙක මේ ධර්ම දෙක එක සිතෙක නො යෙදෙන්නේ ය. දුකටපත් සතුන් අරමුණු කොට කරුණාභාවනාව වඩා ප්‍රථමධ්‍යානය උපද වන්නහුට උපදනා ප්‍රථමධ්‍යානචිත්තයෙහි කරුණාචෛතසිකය මුත්, මුදිතාචෛතසිකය නො උපදනේ ය. එසේ ම සුවපත් සතුන් අරමුණු කොට මුදිතාභාවනාව වඩා ප්‍රථමධ්‍යානය උපද වන්නහුට උපදනා ප්‍රථමධ්‍යානාදිචිත්තයෙහි මුදිතාචෛතසිකය මුත්, කරුණාචෛතසිකය නො උපදනේ ය.

මුදිතාව වඩන්නහු විසින් "මහත් ආනුභාව හා සෘද්ධි ඇති බ්‍රහ්මයෝ නීරොග ව බොහෝ කලක් සතුටින් වෙසෙන්නාහ, මහත් ආනුභාව හා සෘද්ධි ඇති දෙවියෝ දෙවඟනන් පිරිවරා ගෙණ දිව් සැප වළඳන්නාහ, මිනිස්ලෝවැසි රජදරුවෝ මහත් සැප විඳිමින් සතුටු වන්නාහ, මොවුන්ගෙන් අන්‍ය වූ සත්ත්වයෝ ද ලත් සැපතින් සතුටු වන්නාහ, අපායයෙහි ඉපිද සිටුනා සත්ත්වයෝ පව්කම් ගෙවා එයින් නිදහස් ව සුගතියෙහි ඉපිද සැප විඳිමින් සතුටු වන්නාහ" යන මේ ආ ලෙසින් දැකීමෙන් හා ඇසීමෙන් ඔවුන්ගේ ඒ සැපතෙහි සතුටු වෙමින් මුදිතාව ඉපද විය යුතු ය.

මුදිතාව පළමු කොට ප්‍රියයා කෙරෙහි හෝ මධ්‍යස්ථයා කෙරෙහි හෝ වෛරීහු කෙරෙහි හෝ නො වැඩිය යුතු ය. ප්‍රියයා ප්‍රිය වූ තරමින් මුදිතාවට ස්ථාන නො වේ. මධ්‍යස්ථ – වෛරීහු ද එසේ ය. ලිඞ්ග විසභාගයෝ කාලක්‍රියා කළෝ ද මෙයට තැන් නො වෙත්. සොණ්ඩසහාය යි කියන අතිප්‍රිය පුද්ගලයා ම මුදිතාවට කරුණු ය. අතිප්‍රියයා මුදිතමුදිත ම වේ. පළමු සිනාසී පසුව කතාව පටන් ගන්නේ ය. එහෙයින් ඔහු කෙරෙහි ම පළමු කොට මුදිතාව වඩන්නේ ය. සුඛිත මුදිත වූ ප්‍රිය පුද්ගලයකු දැක හෝ අසා හෝ 'මේ පුද්ගලයා එකාන්තයෙන් මුදිත ය, අහෝ! ඉතා යෙහෙකැ'යි ඔහු කෙරෙහි හෝ මුදිතාව වැඩිය යුතු ය.

අතිප්‍රිය පුද්ගලයා හෝ ප්‍රිය පුද්ගලයා හෝ පසුගිය කාලයෙහි සුවපත් වූයේ ද දැන් ඔහු දුක්ඛිත නම්, දුරුපෙත නම්, ඔහුගේ ඒ යටගිය දවස තුබූ සුඛිතභාවය සිහි කොට 'මෙතෙමේ එදා මහත් යසිසුරු ඇත්තේ මහත් පිරිවර ඇත්තේ වී ය, නිතර සතුටින් කල් ගෙවී ය'යි ඔහුගේ ඒ යටගිය මුදිත ගතිය සලකා මුදිතාව වැඩිය යුතු ය. ඔහු එදා මුදිත නො වී නම්, ඉදිරියෙහි එන දවසෙහි වන ප්‍රමුදිතභාවය සලකා 'මෙතෙමේ අනාගතයෙහි යසිසුරු ලබා ඇතුන් පිට අසුන් පිට රන්සිවිගෙට නැගී ඇවිදින්නේ ය'යි මෙසේ ඉදිරියෙහි ලබන ප්‍රමුදිතභාවය සිහි කොට මුදිතාව වැඩිය යුතු ය. ප්‍රිය පුද්ගලයා කෙරෙහි මුදිතාව වඩා නැවැත මධ්‍යස්ථයා කෙරෙහි ද, නැවැත වෛරීහු කෙරෙහි ද මුදිතාව වැඩිය යුතු ය. ඉදින් වෛරීහු කෙරෙහි ක්‍රොධය උපදින්නේ නම්, පෙර සේ මෙත් වඩා සිත සන්සිඳුවා ගත යුතු ය. මෙහි කියූ මුත් කෙරෙහි ද තමා කෙරෙහි ද සමසිත් උපදවා සීමසම්භේද කොට ඒ නිමිත්ත ම සෙවනය කරමින් බහුල කරමින් මෛත්‍රීකථායෙහි කියූ ලෙසින් ත්‍රික-චතුෂ්කධ්‍යාන විසින් අර්පණා ලබාගත යුතු ය. එයින් පසු මතු ලැබිය යුතු පඤ්චවිධ අනොධිසොඵරණ – සත්තවිධ ඔධිසොඵරණ – දසවිධ දිසාඵරණවිකුබ්බණ ද 'සුඛං සුපති' යනාදී විසින් කියූ අනුසස් ද දත යුත්තේ ය.

**පමොදලක්ඛණා මුදිතා** = මුදිතාව පරසම්පත්තියෙහි සතුටුවීම ලකුණු කොට සිටියා ය.

**අනිස්සායනරසා** = ඊර්ෂ්‍යා නො කිරීම කෘත්‍යය කොට සිටියා ය.

**අරතිවිඝාතපච්චුපට්ඨානා** = පරසම්පත්ති – අසිකුශලධර්ම – පන්ත-සෙනාසන යන මෙහි නො ඇලීම් නසාලීම වැටහීම කොට සිටියා ය.

**සත්තානං සම්පත්තිදස්සනපදට්ඨානා** = සත්ත්වයන්ගේ සම්පත්ති දැක්ම ආසන්නකාරණය කොට සිටියා ය.

**අරතිවූපසමො තස්සා සම්පත්ති** = නො ඇලුම් සන්සිඳවීම මෙහි සම්පත්තිය යි.

**ගෙහසසම්භවො තස්සා විපත්ති** = ගෙහසිත ප්‍රෙම විසින් සතුට ඉපදවීම මුදිතාවට විපත්තිය යි.

මුදිතාබ්‍රහ්මවිහරණයට ගෙහසිත සොම්නස ආසන්න සතුරු ව සිටියේ ය. ගෙහසිත සොම්නස සම්පත් දැකීම් විසින් සමාන බැවිනි. අරතිය දූරසතුරු ය. අරතිය සවභාව විසින් අසමාන බැවිනි. මෙහි ගෙහසිතසොම්නසැ යි කියේ පස් වැදෑරම් වූ කාම්ගුණ ඇසුරු කල සොම්නස ය. මේ සොම්නස ඉපැදෙනුයේ තමන් බලාපොරොත්තු වන කාම්සැප ලැබීමෙනි.

**උපෙක්ඛා** නම්: හිත වැඩෙහිලා සතුටුවීම හිතවැඩ එළවීම දුකට පැමිණියවුන් දැක, 'මොවුහු දුකින් මිදෙත්වා' නො වෙහෙසුනෝ වෙත්වා' යනාදීන් විසින් පක්‍ෂයකට නො බැස ඒ ඒ සත්ත්වයන් විසින් කරණ ලද කර්මයනට අනු ව යුක්තියට අනු ව බැලීමෙන් සිතෙහි උපදනා ධර්ශකතියවූ, මැදහත් ලෙසින් බැලීම ය. **"අවෙරා හොන්තූති ආදිව්‍යාපාරප්පහාණෙන මජ්ඣත්තභාවූපගමනෙන ච උපෙක්ඛතීති = උපෙක්ඛා"** යනු දන්නේ ය.

තමන් හා එක් ව යෙදුනු සිතුවිලි සිය කිසෙහි සමාන ව පවත්වාලීමට හෙතු වූ මේ උපෙක්‍ෂාව පරමාර්ථ විසින් සත්ත්වාලම්බනයක් හෝ සංස්කාරාලම්බනයක් අරමුණු කොට, මහා කුසල – මහාවිපාක – මහාක්‍රියා යන සූවිසි සොභන සිත්හි ද, සත් විසි මහද්ගත සිත්හි ද, අටවැදෑරුම් ලොකොත්තර සිත්හි ද යන එකුන් සැටක් සිත්හි යෙදෙන්නේ ය. ඒ නම්, තත්‍ර මධ්‍යස්ථතා චෛතසිකය යි. උපෙක්‍ෂාවෙදනාව ද උපෙක්‍ෂා යි කියනු ලැබේ. අරමුණු ගැණ මැදහත් ව බලනුයේ උපෙක්‍ෂා බලයෙනි. සැප දුක් දෙක්හි අවිරුද්ධ ව ඉටු අරමුණටත් අනිටු අරමුණටත් නො බරව සමව සිටුනී ය. අටලෝ දහම්හි සතුටට හෝ නො සතුටට හෝ නො ද පැමිණෙන්නී ය. ඒ මේ උපෙක්‍ෂාව පාරමිතා විසින් ද බොධ්‍යඞ්ග විසින් ද ධර්මයෙහි එන්නී ය.

උපෙක්‍ෂාව, **ඡළඞ්ගුපෙක්ඛා – බ්‍රහ්මවිහාරුපෙක්ඛා – බොජ්ඣඞ්ගුපෙක්ඛා – විරියූපෙක්ඛා – සඞ්ඛාරුපෙක්ඛා – වෙදනූපෙක්ඛා – විපස්සනූපෙක්ඛා – තත්‍රමජ්ඣත්තුපෙක්ඛා – ඣානුපෙක්ඛා – පාරිසුද්ධිඋපෙක්ඛා** යි දසවැදෑරුම් ය.

එහි "සදෙරෙහි එළඹ සිටි ඉටු අනිටු අරමුණු නිසා රහතුන් වහන්සේගේ සිත්හි වූ පිරිසිදු පියවිබව නො හැරීම් විසින් පවත්නා මැදහත් බව ඡළඞ්ගුපෙක්ඛා ය. **"ඉධ භික්ඛවෙ!**

**ඛීණාසවො භික්ඛු චක්ඛුනා රූපං දිස්වා නෙව සුමනො හොති දුම්මනො**" යනාදීන් විසින් ඒ ආයේ ය. සියලු සතුන් කෙරෙහි පැවැති මැදහත්බව බ්‍රහ්මවිහාරුපෙක්ඛා ය. "**උපෙක්ඛාසහගතෙන චෙතසා එකං දිසං ඵරිත්වා විහරති**" යනාදීන් විසින් වදාළෝ ඒ ය. සහජාතධර්මයන් කෙරෙහි මැදහත් වූ චිත්තගතිය බොජ්ඣඞ්ගුපෙක්ඛා ය. "**උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගං භාවෙති විවෙකනිස්සිතං**" යනාදීන් ඒ දත යුතු ය. ඉතා අධික නො වූත් ඉතා ලිහිල් නො වූත් වීර්‍ය්‍යය, මැදහත් උත්සාහය විරියුපෙක්ඛා ය. "**කාලෙන කාලං උපෙක්ඛානිමිත්තං මනසි කරොති**" යනාදිය එහි ලා දත්තේ ය. නීවරණාදිධර්මයන්ගේ තතු සෙවීමෙහි තීරණයට බැස ගැණීමෙහි පැවැති මැදහත් බව සඞ්ඛාරුපෙක්ඛා ය. "**අට්ඨසඞ්ඛාරුපෙක්ඛා සමාධිවසෙන, දසසඞ්ඛාරුපෙක්ඛා විපස්සනාවසෙන උප්පජ්ජන්ති**" යනාදියෙන් එය කියැ වේ. නො දුක නො සැප යි ගත් අදුක්ඛමසුඛ වෙදනාව වෙදනුපෙක්ඛා ය. "**යස්මිං සමයෙ කාමාවචරං කුසලං චිත්තං උප්පන්නං හොති උපෙක්ඛාසහගතං**" යනාදිය එහිලා දෙශනා ය. සංස්කාරධර්මයන්ගේ තතු සෙවීමෙහි පැවැති මැදහත් බව විපස්සනුපෙක්ඛා ය. "**යදත්ථි යං භූතං තං පජහති උපෙක්ඛං පටිලභති**" යනාදි දෙශනා ඒ පිණිස අවා ය. තමන් හා සමග උපන් ධර්මයන් ඒ ඒ තමන් අයත් කෘත්‍යයන්හි යෙදෙන කල්හි එහි මැදහත් වීම් වශයෙන් පවත්නා සිතුවිල්ල තත්‍රමජ්ඣත්තුපෙක්ඛා ය. ප්‍රණීततර තෘතීයධ්‍යානසුඛයෙහි මැදහත් ව බැලීම ඣානුපෙක්ඛා ය. "**උපෙක්ඛකො ච විහරති**" යනාදීන් වදාළෝ ඒ ය. සියලු විරුද්ධධර්මයන්ගෙන් පිරිසිදු වූ ප්‍රත්‍යනීකධර්ම සන්සිඳවීමෙහි ලා අමුතුවලා උත්සාහරහිත වූ චිත්තස්වභාවය පාරිසුද්ධිඋපෙක්ඛා ය. "**උපෙක්ඛාසතිපාරිසුද්ධිං චතුත්ථජ්ඣානං**" යනාදි දෙශනායෙන් ඒ ගන්තේ ය.

එහි ෂළඞ්ග – බ්‍රහ්මවිහාර – බොජ්ඣඞ්ග – තත්‍රමජ්ඣත්තතා – ඣාන – පාරිසුද්ධි උපෙක්ෂාවෝ අර්ථ විසින් තත්‍රමජ්ඣත්තතා උපෙක්ඛා යි ගැණෙත්. මේ වනාහි අවස්ථාභෙද විසින් ගත යුතු ය. එකක්හුගේ ඒ ඒ අවස්ථායෙහි වන කුමාර – තරුණ – මහල්ලක – සෙනාපති රාජාදි භෙද සේ ය. එහෙයින් යම් තැනක ෂළඞ්ගුපෙක්ඛාව වන්නී නම්, එහි අනෙක් බ්‍රහ්මවිහාරුපෙක්ඛාදීහු නො ද උපදිත්. සෙසු තැන ද මෙසේ ය. සඞ්ඛාර – විපස්සනා උපෙක්ෂා ද අර්ථ විසින් එකෙක් ම ය. එක් ම ප්‍රඥාව කෘත්‍ය විසින් මෙසේ දෙපරිදි ය. සංස්කාර ධර්මවිෂයයෙහි විපස්සනුපෙක්ඛාව නැඟී සිටි කල්හි සඞ්ඛාරුපෙක්ඛාව ද නැඟී සිටියා වේ. විරිය – වෙදනා උපෙක්ෂා දෙක උනුන් හා ද අනෙක් උපෙක්ෂාවන් හා ද අර්ථ විසින් වෙන් ව සිටියේ ය.

ඡළඞ්ග – විපස්සනා – සඞ්ඛාර උපෙක්ෂා තුන කාමාවචර ය. බ්‍රහ්මවිහාර – ඣාන – පාරිසුද්ධි උපෙක්ෂා තුන රූපාවචර ය. වේදනා – විරිය – තත්‍රමජ්ඣත්තතා උපෙක්ෂා තුන චාතුර්භූමක ය. බොජ්ඣඞ්ගුපෙක්ඛාව කාමාවචර හා ලොකොත්තර ද වේ. එහෙයින් පෘථග්ජන – ශෛක්ෂ්‍ය – අශෛක්ෂ්‍ය යන පුද්ගලයන්ට ලැබෙත්නී ය.

මෙසේ භෙදයට ගිය මේ දසවැදෑරුම් උපෙක්ෂා අතුරෙහි සියලු සතුන් මැදහත් ව බැලීම ය යි කියූ බ්‍රහ්මවිහාරුපෙක්ඛාව මෙහි ගණු ලබන්නී ය.

උපෙක්ෂාව වඩනු කැමැත්තහු පළමු කොට මෛත්‍රී - කරුණා - මුදිතා යන තුන් තැන්හි ලත් ත්‍රික හෝ චතුෂ්කධ්‍යාන ඇත්තකු විය යුතු ය. ත්‍රික හෝ චතුෂ්කධ්‍යාන ලත් ඔහු ප්‍රගුණ වූ තෘතීය හෝ චතුර්ථධ්‍යානයෙන් නැගී ‘සියලු සත්ත්වයෝ සුවපත් වෙත්වා’යි කරණු ලබන මෛත්‍රිය සතුන් කෙරෙහි මමත්වයෙන් පවත්නා බැවින් ද, කරුණාව දෞර්මනසට ළංව සිටි බැවින් ද, මුදිතාව සොම්නස් යොගයෙන් ඖදාරික බැවින් ද මුලින් කියූ කරුණා - මුදිතාවන්ගේ දොස් ද උපෙක්ෂාව ශාන්ත බැවින් එහි අනුසස් ද සලකා යම් ප්‍රකෘතිමධ්‍යස්ථ පුද්ගලයෙක් වේ නම්, ඒ පුද්ගලයා මැදහත් ආකාරයෙන් බලා උපෙක්ෂාව ඉපද විය යුතු ය. අනතුරු ව ඉපදවිය යුත්තී ප්‍රිය පුද්ගලාදීන් කෙරෙහි ය. මධ්‍යස්ථයා කෙරෙහි උපෙක්ෂාව උපදවා නැවැත ප්‍රියයා කෙරෙහි නැවැත අතිප්‍රියයා කෙරෙහි නැවැත වෛරීහු කෙරෙහි නැවැත තමන් කෙරෙහි මැදහත් ලෙසින් සීමසම්භෙදය කොට විශෙෂයක් නො තබා නො සලකා ඒ නිමිත්ත ම වැඩිය යුතු ය. සෙවිය යුතු ය. බහුල කළ යුතු ය. මෙසේ කරන්නා වූ ඔහුට මේ තෘතීයධ්‍යානය ළංවූ ප්‍රීතිය නැමැති සතුරා ඇත්තේ ය, චතුර්ථධ්‍යානය එබඳු සතුරකු නැති බැවින් ශාන්තය, යි අනුසස් සලකන කල්හි චතුර්ථ ධ්‍යානය ලැබෙන්නේ ය. මෛත්‍රී ආදියෙහි තෘතීයධ්‍යානය උපදවා ගන්නහුට ම අරමුණු සමාන බැවින් චතුර්ථධ්‍යානය ලැබෙන බව සැලකිය යුතු ය. එයින් මතු ලැබිය යුතු විකුර්වණ ද ආනිසංස ද මෛත්‍රියෙහි කීසේ ය.

**සත්තෙසු මජ්ඣත්තාකාරප්පවත්තිලක්ඛණා උපෙක්ඛා** = උපෙක්ෂාව සත්ත්වයන් කෙරෙහි මැදහත් අයුරෙන් පැවැත්ම ලකුණු කොට සිටියා ය.

**සත්තෙසු සමභාවදස්සනරසා** = සත්ත්වයන් කෙරෙහි සමබව දැක්ම කෘත්‍යය කොට සිටියා ය.

**පටිඝානුනයවූපසමපච්චුපට්ඨානා** = ප්‍රතිඝය හා අනුනය සන්සිඳවීම වැටහීම කොට සිටියා ය.

**කම්මස්සකතා පදට්ඨානා** = සත්ත්වයෝ කර්මය ස්වකීය කොට සිටියෝ ය, ඔවුහු කවරකුගේ රුචියෙන් සුවපත් වූවාහු හෝ වෙත් ද, දුකින් හෝ මිදෙත් ද, පැමිණි සැපතින් හෝ නො පිරිහෙත් දැයි මෙසේ කර්මස්වකතාව පිළිබඳ දැක්ම ආසන්න කාරණය කොට සිටියා ය.

**පටිඝානුනයවූපසමො තස්සා සම්පත්ති** = ප්‍රතිඝය හා අනුනය සන්සිඳවීම සම්පත්තිය යි.

**ගෙහසිතාය අඤ්ඤාණුපෙක්ඛාය සම්භවො විපත්ති** = ගෙහසිත උපෙක්ෂාසහගත මොහයාගේ ඉපැත්ම විපත්තිය යි.

උපෙක්ෂා බ්‍රහ්මවිහරණයට ගෙහසිත උපෙක්ෂාසහගත මොහය ආසන්න සතුරු ව සිටියේ ය. මෙය දොෂගුණ නො විචාරීම් විසින් සමාන බැවිනි. රාගය හා ප්‍රතිඝය දුර සතුරු ය. ස්වභාව විසින් අසමාන බැවිනි. උපෙක්ෂාව හා රාග ප්‍රතිඝයෝ කිසිසේත් කිසි කලෙක එක් තැනක නො ලැබෙත්.

සිවු වැදෑරුම් බ්‍රහ්මවිහරණයන්ගේ සාධාරණප්‍රයෝජනය, විදර්ශනා සුඛය හා භවසම්පත්තිය යි. ව්‍යාපාදාදිය දුරු කිරීම එකිනෙකට අයත් වූ වෙන් වෙන් වූ ප්‍රයොජනය යි. එහි මෛත්‍රී යෙහි ප්‍රයොජනය ව්‍යාපාදය දුරු කිරීම ය. කරුණායෙහි ප්‍රයො-ජනය විහිංසාව දුරු කිරීම ය. මුදිතායෙහි ප්‍රයොජනය අරතිය දුරු කිරීම ය. උපෙක්ෂායෙහි ප්‍රයොජනය අරතිරාග දුරු කිරීම ය. **"නිස්සරණං හෙතං ආවුසො ව්‍යාපාදස්ස යදිදං මෙත්තාචෙතොවිමුත්ති, නිස්සරණං හෙතං ආවුසො විහෙසාය යදිදං කරුණාචෙතොවිමුත්ති, නිස්සරණං හෙතං ආවුසො අරතියා යදිදං මුදිතාචෙතොවිමුත්ති, නිස්සරණං හෙතං ආවුසො රාගස්ස යදිදං උපෙක්ඛාචෙතොවිමුත්ති"** යනු දෙශනා ය. බ්‍රහ්මවිහාර යනට කත්තුකම්‍යතා ඡන්දය ආදිය වේ. නීවරණාදිය මැඩ පැවැත් වීම මධ්‍යය වේ. අර්පණාව අවසානය වේ.

මොවුනට එක් සත්ත්වයෙක් හෝ බොහෝ සත්ත්ව කෙනෙක් හෝ අරමුණු වෙති. උපචාරයෙහි දී හෝ අර්පණාවට පැමිණි කල්හි හෝ අරමුණ වැඩෙන්නේ ය. දක්ෂ ගොවියා තමන් විසින් සෑයුතු තැන පිරිසිඳ සාන්නා සේ ම බ්‍රහ්මවිහාර වඩන්නේ ද පළමු කොට එක් ආවාසයක් පිරිසිඳ එහි වසන සතුන් කෙරෙහි 'මේ ආවාසයෙහි වසන සත්ත්වයෝ වෛර නැත්තෝ වෙත්වා' යනාදීන් මෙත් වඩන්නේ ය. එහි සිත මෘදු කොට කර්මයට යොග්‍ය කොට අවාස

දෙකක් පිරිසිඳ ගන්නේ ය. පිළිවෙළින් ආවාස තුනක්, සතරක්, පසක්, සයක්, සතක්, අටක්, නවයක්, දසයක්, එක් වීථියක්, ගම් අඩක්, මුළු ගමක්, දනව්වක්, රාජ්‍යයක්, එක් දිශාවක්, එක් සක්වළක් හා එයින් මතු ද පිරිසිඳ එහි සතුන් කෙරෙහි මෙත් වඩන්නේ ය. මෙත් වඩන්නා සේ ම කරුණාදිය ද වඩන්නේ ය. අරමුණු වඩනා සැටි මෙසේ දන්නේ ය.

මෛත්‍රාදි බ්‍රහ්මවිහාරයන්ගේ වශයෙන් තුන් තුන් ධ්‍යානයන් උපදවා සිටියහුට ම උපෙක්ෂාබ්‍රහ්මවිහාරය ඵල සහිත වේ ද, සමෘද්ධ වේ ද, අන් ලෙසකින් සමෘද්ධ නො වේ ද, එහෙයින් මෛත්‍රා – කරුණා – මුදිතා යන බ්‍රහ්මවිහාර තුනෙහි අමුඛ්‍යඵලය උපෙක්ෂාබ්‍රහ්මවිහාරය වේ. ටැම් නො සිටුවා මහතලාඳ සඟල නො නගා හිස් අහසෙහි කැණිමඩල පිහිටුවා ගොනැස් තබන්නට නො හැකි වේ ද, එපරිද්දෙන් මෛත්‍රාදී වූ මුල් බඹවිහරණ තුන වඩා තෘතීයද්ධ්‍යානය නො උපදවා සිටුවන උපෙක්ෂාබ්‍රහ්මවිහාර ධ්‍යානය උපදවන්නට නො හැකි ය.

සත්ත්වයන් අත ඇති යහපත් ප්‍රතිපත්තියක් බැවින් මේ විහරණ සතර ශ්‍රේෂ්ඨ ය, නිර්දෝෂය යන අරුත් විසින් ගෙණ බ්‍රහ්මවිහාර ය යි කියනු ලැබේ. මෙයින් අන්‍ය වූ කර්මස්ථානයෝ ආත්මහිත ප්‍රතිපත්තිහු වෙත්. මේ සතර ආත්මහිත වන්නා සේ ම පරහිත ප්‍රතිපත්තිහු ද වෙත්.

බ්‍රහ්මයෝ නීවරණ විරහිත බැවින් නිර්දෝෂ සිතැත්තෝ ම වෙසෙත් ද, මේ විහරණ වඩා දියුණු කොට ගත්තෝ ද, බ්‍රහ්මයන් මෙන් නිර්දෝෂ සිතැති ව වෙසෙත්. එබැවින් නිර්දෝෂයහ.

මෛත්‍රිය ව්‍යාපාද බහුලයාහට ද, කරුණාව විහිංසාබහුලයාහට ද, මුදිතාව අරතිබහුලයාහට ද උපෙක්ෂාව රාගබහුලයාහට ද විශුද්ධිමාර්ගී වන බැවින් බ්‍රහ්මවිහාර සතරෙක් වී ය.

හිත එළවීම – අහිත දුරු කිරීම – සම්පත්තියෙහි සතුටුවීම – හැම තන්හි සතුටුවීමැ යි සත්ත්වයන් කෙරෙහි මනසකාරය සිවු වැදෑරුම් ය. මවු තොමෝ ළදරු – ගිලන් – තරුණ – සිය කිස යෙදුනහු යන පුතුන් සිවු දෙනා අතුරෙහි ළදරු පුතුගේ දියුණුව, ගිලන් පුත් ගිලන් බවෙන් මුදවා ගැණීම – තරුණ පුතුගේ තරුණ බැව්හි කල් පැවැත්ම, සිය කිස යෙදුනු පුතු බලා මැදහත්වීම යන මෙ තැන්හි යම්සේ පවතී ද, එසේ ම බ්‍රහ්මවිහාර වඩන්නහු විසින් සියලු සතුන් කෙරෙහි මෛත්‍රා – කරුණා – මුදිතා – උපෙක්ඛා යන බ්‍රහ්මවිහාර වැඩිය යුතු ය. එහෙයින් මෙය මනසකාර විසිනුදු සිවුවැදෑරුම් ය.

පළමු කොට සත්ත්වයන් කෙරෙහි හිත වැඩ එළවන අයුරෙන් පිළිපැද්ද යුතු ය. මෛත්‍රිය හිතාකාරයෙන් පැවැත්ම ලක්ෂණ කොට සිටියා ද එහෙයිනි. මෙසේ පැතූ හිත වැඩ ඇති සත්ත්වයන් දුකින් පෙළෙන බව දැක හෝ අසා 'මේ පිළිවෙතින් මෙතෙමේ සතර අපායයෙහි උපදනේ ය' යි සලකා උන් දුකින් මුදා ගන්නා අයුරින් පිළිපැද්ද යුතු ය. කරුණාව සතුන් දුකින් මුදා ගන්නා අයුරෙන් පැවැත්ම ලක්ෂණ කොට සිටියා ද එහෙයිනි. පැතූ හිත වැඩ ඇත්තා වූ ද පැතූ දුක් පහකිරීම් ඇත්තා වූ ද ඒ ඒ සත්ත්වයන්ගේ සම්පත් දැක ඒ සම්පත්තියෙහි සතුටුවීම් වශයෙන් පිළිපැද්ද යුතු ය. මුදිතාව සතුටුවීම ලක්ෂණ කොට සිටියා ද එහෙයිනි. මෙසේ හිතාදි ආකාරයෙන් පැවැත්මෙන් මතු කළයුතු සිවුවන අයුරක් නැති බැවින් දැන් මැදහත් ලෙසින් පිළිපැද්ද යුතු ය. උපෙක්ෂාව මැදහත් ව පැවැත්ම ලක්ෂණ කොට සිටියා ද එහෙයිනි. මෙසේ හිතාදිආකාර විසින් මේ සතර පවත්නා බැවින් පළමු කොට මෙත්තා, අනතුරු ව කරුණා, අනතුරු ව මුදිතා, අනතුරු ව උපෙක්ඛා පිළිවෙළින් කියන ලද ය. මෙසේ කියන ලද්දී මේ ධර්මයන්ගේ පැවැත්ම බොහෝ සෙයින් මෙබඳු ආකාර ඇති බැබින් අන් අයුරකින් නො පවත්නා බැවින් හෙවත් මේ නියමයට විරුද්ධ ව උපෙක්ෂාබ්‍රහ්මවිහාරය පළමු කොට වඩන්නට නො ලැබෙන බැවින් බුදුරජුන් විසින් මෙත්තා – කරුණා – මුදිතා – උපෙක්ඛා යි පිළිවෙළින් දෙශනා කළ බැවින් ද වේ.

බ්‍රහ්මවිහාරයෝ මෙතෙක් දෙනා කෙරෙහි පවතිත්වා, මෙතෙක් දෙනා කෙරෙහි නො පවතිත්වා,යි පිරිසිඳීමක් නැත්තෝ ය. සත්ත්වයන් කෙරෙහි සම්‍යක්ප්‍රතිපත්තිය හෙතු කොට ප්‍රමාණ රහිත ද වෙති. එහෙයින් අප්පමඤ්ඤා යි කියන ලදහ. මොවුහු අප්‍රමාණ ආලම්බනයෙහි පවත්නෝ ය. අප්‍රමාණ සත්ත්වයෝ මෙයට අරමුණු වෙත්. උද්ධුමාතකාදිඅශුභයෙහි ඉදිමී ගිය ඒ ඒ තැන් අරමුණු කරන්නා සේ එක් සත්ත්වයකුගේ ද මෙතෙක් තන්හි මෙත් වැඩිය යුතු ය යි පමණ කොට නො ගෙණ සියලු සතුන් කෙරෙහි පැතිරවීම් විසින් මේ හැම වැඩිය යුතු ය.

"විසුද්ධිමග්ගාදිවසා වුත්තසෙසා
හිතාදිආකාරවසා පනායං,
කාමෙං පවත්තන්ති ච අප්පමාණෙ
තා ගොචරෙ යෙන තදප්පමඤ්ඤා"

යනු දත්තේය.

මෙසේ අප්‍රමාණ සත්ත්වයන් අරමුණු කොට ඇති බැවින් එක් ම ලක්‍ෂණයෙන් යුත් බ්‍රහ්මවිහාර අතුරෙහි මෛත්‍රා - කරුණා - මුදිතා යන තුන සොම්නස හා නො වෙන් ව පවත්නා බැවින් චතුෂ්කනය විසින් ත්‍රිකද්ධ්‍යානිකයහ. පඤ්චකනය විසින් චතුෂ්කද්ධ්‍යානිකයහ. එසේ වනුයේ දෞර්මනසින් උපදනා ව්‍යාපාද - විහිංසා - අරති යන පාපධර්මයන්ගේ නිශ්ශරණයට දොරටුව වන බැවිනි. දෞර්මනස හා යෙදී ගත් ව්‍යාපාද - විහිංසා - අරතීන්ගේ නිශ්ශරණයට දොරටු වූ මෛත්‍රී කරුණා මුදිතාවෝ සොම්නස් සහ ගියාහු ම වෙත්. උපෙක්‍ෂාව වනාහි අවශෙෂ චතුෂ්කපඤ්චක ක්‍රමයෙහි චතුර්ථද්ධ්‍යානික හෝ පඤ්චමද්ධ්‍යානික හෝ වන්නී ය. උපෙක්‍ෂාසම්ප්‍රයුක්තවෙදනායෙන් යුක්ත බැවිනි. සත්ත්වයන් කෙරෙහි මැදහත් අයුරෙන් පැවැති බ්‍රහ්මවිහාරොපෙක්‍ෂාව උපෙක්‍ෂාවෙදනායෙන් තොර ව නො පවත්නී ය.

මෛත්‍රීචෙතොවිමුක්තිය ශුභවිමොක්‍ෂය පරම කොට ඇත්තී ය. කරුණාචෙතොවිමුක්තිය ආකාසානඤ්චායතනය පරම කොට ඇත්තී ය. මුදිතාචෙතොවිමුක්තිය විඤ්ඤාණඤ්චායතනය පරම කොට ඇත්තී ය. උපෙක්‍ෂාචෙතො විමුක්තිය ආකිඤ්චඤ්ඤායතනය පරම කොට ඇත්තී ය. ත්‍රික - චතුෂ්කද්ධ්‍යාන වශයෙන් හා එකද්ධ්‍යාන වශයෙන් බෙදී ගිය මේ බ්‍රහ්මවිහාරයන්ගේ ශුභපරමාදි වශයෙන් උතුන් හා අසමාන වූ ආනුභාවය දත යුතු ය. මේ සිවු දෙන ශුභවිමොක්‍ෂයනට උපනිශ්‍රය වන බැවින් මෙසේ වදාළේක.

මෙත් විහරණ ඇත්තහුට ප්‍රිය - අතිප්‍රිය - මද්ධ්‍යස්ථ - වෛරී යන මොවුහු නො පිළිකුල් ව ශුභවශයෙන් ම වැටහෙත්නෝ ය. මෙත් වැඩීමෙන් සත්ත්වසඞ්ඛ්‍යාත වූ යම්කිසි අරමුණක් නො පිළිකුල් ලෙසින් ගැණීම පුරුදු වූ බැවින් ඒ සියලු ම සත්ත්වසංස්කාරයෝ නො පිළිකුල් ලෙසින් වැටහෙත්. එබැවින් මෛත්‍රී තොමෝ සත්ත්වසංස්කාරයන් කෙරෙහි ඇලීම් වශයෙන් පවත්නී ය. සතුරු කෙලෙසුන් කෙරෙන් ද සිත මැනවින් මිදෙන්නේ ය. මෛත්‍රී භාවනායෙන් උපදවන ධ්‍යානය ශුභවිමොක්‍ෂ නම් වූයේ එහෙයිනි. සත්ත්වසංස්කාරයන් පිළිකුල් ලෙසින් පුරුදු නො කළ බැවින් ස්වභාවයෙන් පිළිකුල් නො කටයුතු වූ නීලාදී වූ පරිශුද්ධවර්ණයෙහි ද සිත මෙහෙයන විට ගැහැටක් නැති ව සිත එහි වැද ගන්නේ ය. එබැවින් මෛත්‍රිය ශුභවිමොක්‍ෂ නම් වූ ධ්‍යානයට උපනිශ්‍රය වේ. මත්තෙහි අන් කිසිදු විමොක්‍ෂයකට උපනිශ්‍රය නො වන බැවින් මෛත්‍රිය ශුභවිමොක්‍ෂය පරම කොට උතුම් කොට සිටියා යි දත යුතු ය.

සත්ත්වයන් පිළිබඳ දුක සිහි කරන්නා වූ කරුණාවිහරණ ඇත්තහුට කරුණාව උපදින බැවින් රූපයෙහි ආදීනව මැනැවින් ප්‍රකට වන්නේ ය. එබැවින් පඨවිකසිණාදීන් අතුරෙහි එක්තරා කසිණයක් උගුළුවා හැර රූපරහිත වූ කිසිණු ඉගුළු අහසෙහි සිත මෙහෙයන විට නො දුකින් ම රූපයන්ගේ අභාවය වූ එම අහසෙහි සිත වැද ගන්නේ ය. මෙසේ කරුණාව ආකාසානඤ්චායතනයට උපනිශ්‍රය වේ. එයින් මතු කිසිවකට උපනිශ්‍රය නො වේ. එහෙයින් කරුණාව ආකාසානඤ්චායතනය පරම කොට උතුම් කොට සිටියා යි දත යුතු ය.

භොගසම්පත් ආදියෙන් වෙසෙසින් සතුටු වූ සත්ත්වයන්ට උපන් මුදිතායෙන් යුත් විඥනය ගැණ සිහි කරන්නා වූ මුදිතා විහාරි පුද්ගලයාහට "ඉතා යහපති, සත්ත්ව තෙමේ සතුටු වන්නේ ය"යි මුදිතාව උපදනා බැවින් ප්‍රමුදිත වූ විඥනය දැකීමෙන් ඒ විඥනය අල්ලා ගැණීමෙහි ඔහුගේ සිත පුරුදු වූයේ වෙයි. ඉක්බිති ආකාසකසිණය හැර යම්කිසි කසිණයෙක රූපාවචරධ්‍යානාධිගමයෙන් රූපවිරාග භාවනායෙන් පිළිවෙළින් ආකාසානඤ්චායතනය ඉක්මවා ආකාසනිමිත්ත ගොදුරු කොට ඇති ප්‍රථමාරූප්‍යවිඥනයෙහි අරූපධ්‍යානය ලැබීම පිණිස සිත එළවත් ම ඔහුගේ ඒ සිත ප්‍රථමාරූප්‍යවිඥනයෙහි නිදුකින් ම වැද ගන්නේ ය. එහි අපීණා සිත පහළ වන්නේ ය. මෙසේ මුදිතාව විඤ්ඤාණඤ්චායතනයට උපනිශ්‍රය වේ. එයින් මතු අන් කිසිවකට උපනිශ්‍රය නො වන බැවින් මුදිතාව විඤ්ඤාණඤ්චායතනය පරම කොට උතුම් කොට සිටියා යි දත යුතු ය.

උපෙක්‍ෂාබ්‍රහ්මවිහරණය ඇත්තහුට "සත්ත්වයෝ සුවපත් වෙත්වා, දුකින් මිදෙත්වා, ලද සැපතින් වෙන් නො වෙත්වා"යි මෙනෙහි කිරීමක් නැති බැවින් සුව පැතීම් ඈ විසින් පවත්වන මෛත්‍රාදී වූ භාවනා තිදෙන පරමාර්ථ විසින් සලකා සත්ත්වයන් අරමුණු කරති. උපෙක්‍ෂාව වනාහි හුදෙක් මධ්‍යස්ථ විසින් ම සත්ත්වයන් අරමුණු කරන්නී ය. පරමාර්ථ විසින් ගැණීමට විමුඛ ව පුරුදු කළ, පරමාර්ථ විසින් අවිද්‍යමාන වූ ප්‍රඥප්ති ගැණීමෙහි සිත් ඇත්තහු භාවනා ක්‍රමයෙන් ලබා ගත් විඤ්ඤාණඤ්චායතනය ඉක්ම සවභාවයෙන් අවිද්‍යමාන වූ පරමාර්ථවිඥනයාගේ අභාවයෙහි සිත එළවත් ම ඒ සිත නිදුකින් ම ආකිඤ්චඤ්ඤායතනයෙහි වැද ගන්නේ ය. අපීණා විසින් පවත්නේ ය. මෙසේ හෙයින් උපෙක්‍ෂාව ආකිඤ්චඤ්ඤායතනයට උපනිශ්‍රය වේ. එයින් මතු කිසිවකට උපනිශ්‍රය නො වේ. එහෙයින් උපෙක්‍ෂාව ආකිඤ්චඤ්ඤායතනය පරම කොට උතුම් කොට සිටියා යි දත යුතු ය.

බ්‍රහමවිහාරයන්ගේ ශුභපරමාදිභාවය සැකෙවින් මෙසේ දැන අනතුරු ව බ්‍රහමවිහාරයෝ දානාදී වූ සියලු යහපත් දහම් පුරා-ලන්නාහ යි ද දත්තේ ය.

සියලු සතුන් කෙරෙහි හිත අදහස් ඇති බැවින්, ඔවුන් දුක් නො ඉවසන බැවින්, සම්පත් පිළිබඳ චිරස්ථිතිය කැමැති බැවින්, සියල්ලන් කෙරෙහි අපක්ෂපාතී බැවින්, සම ව පැවැති සිත් ඇති සත්ත්වයෝ 'මොහුට දියයුතු ය, මොහුට නො දියයුතු ය' යනු විසින් කිසිවකු කෙරෙහි වෙනසක් නො කොට සැපයට කරුණු වූ දන් දෙන්නෝ ය. හිංසා පීඩා දුරු කරන්නාහු සිල් සමාදන් ව ගන්නෝ ය. සිල් පුරණු පිණිස ගිහිගෙන් නික්ම පැවිදි වන්නෝය සත්ත්වයන් පිළිබඳ හිත අහිත දෙක්හි නො මුළාවනු පිණිස ප්‍රඥව පිරිසිදු කරන්නෝ ය. සත්ත්වයන්ට හිතසුව පිණිස නිතර වීර්‍ය්‍යය වඩන්නෝ ය. වීර්‍ය්‍යය විසින් ධීරභාවයට පැමිණ ද සත්ත්වයන්ගේ අපරාධ ඉවසන්නෝ ය. 'මේ තොපට දෙන්නෙමු, මේ තොපට හිත වැඩ කරන්නෙමු'යි කළ පිළිණ බොරු නො කරන්නෝ ය. සත්ත්වයන්ට හිතසුව පිණිස ගත් නො සැලෙන අධිෂ්ඨාන ඇත්තාහ. සත්ත්වයන් කෙරෙහි නො සැලෙන මෙත් සිතින් පූර්වකාරිහු වන්නා හ. යමක්හට උපකාරයක් කොට එයට ප්‍රත්‍යුපකාරයක් නො පතන්නාහ. මෙසේ පළමු කොට බ්‍රහමවිහාරභාවනාවන් පුරුදු කොට ඒ ආධාරයෙන් දශපාරමිධර්ම පුරා දශබල - චතුර්-වෛශාරද්‍ය - ෂට්අසාධාරණඥාන - අෂ්ටාරශ බුද්ධධර්ම යි ප්‍රභෙදගත වූ සියලු කල්‍යාණ ධර්ම පුරන්නාහ'යි මෙසේ මේ චතුර්විධබ්‍රහම-විහරණයන් දානාදිසකලකල්‍යාණධර්ම පුරාලන බව ඉතා සැකෙවින් දතයුතු ය.

**සඤ්ඤම** නම්: ප්‍රාතිමොක්ෂසංවරශීලය යි. කය - වචන දෙක හික්ම වන බැවින් තමාට හා අන්හට විපත් නො වන සැටියෙන් කය - වචන හසුරුවන බැවින් එසේ කියනු ලැබේ.[1]

**දම** නම්: ඉන්ද්‍රියසංවරශීලය යි. ඇස් - කන් - නාස් ඈ ඉඳුරන් දමනය කරණ බැවින්, තමාට යටත් කර ගන්නා බැවින් ඉන්ද්‍රිය සංවරශීලය දම නම් වේ.[2]

**සො වෙ වන්තමලො ධීරො ථෙරො ඉති පවුච්චති** = වමාරා දැමූ කෙලෙස් මල ඇති ධාරණප්‍රඥ ඇති හෙතෙමේ ස්ථවිර යි කියනු ලැබේ.

---

1. 2. 3. 'සඤ්ඤමෙන' යනු බලනු
2. 2. 3. 'දමෙන' ,, ,,

**වනතමල** නම්: අගීනමාගීඥන නැමැති මුඛයෙන් නසාලූ වමාරා දැමූ කෙලෙස් මල ඇති රහතුන් වහන්සේ ය.[1]

**ධීර** නම්: ගිහිගෙන් නික්මුනුද, සිට රහත්මගපල ලබනතුරු ම දවරැ දෙක්හි නිතර පැවැති වීර්‍යයෙන් යුක්තවූයේ ය. මෙහිලා රහතුන් වහන්සේ ම ගැණෙති.[2]

ධම්දෙශනාවගේ අවසානයෙහි ඒ භික්ෂූහු රහත්බැව්හි පිහිටා ගත්හ.

**ලකුණ්ටකභද්දියසථවිර වස්තුව නිමි.**

1. 1. 7. වන්තකසාවසස' යනු බලනු.
2. 2. 1. "උසහනි ධීරා" ,, ,,

## පදව්‍යඤ්ජනයෙහි දක්‍ෂ වූ ශ්‍රමණයෝ

### 19 — 5

**එක්** කලෙක තමන්ට බණදහම්, උගන්වාලීමෙන් ධර්මාචාර්‍ය්‍ය ව සිටි උගතුනට පුදසැලකිලි හා ඔවුන්ගේ සිවුරු රැඳීම් ඈ වතාවත් කරණ තරුණ මහණුන් හා හෙරණුන් දුටු ඇතැම් තෙරහු, "අපි පදව්‍යඤ්ජනයෙහි පමණක් දක්‍ෂ වම්හ, එහෙත් අර්‍ත්‍ථ විසින් කිසිත් දැනුමෙක් අපට නැත, එහෙයින් අපි බුදුරජුන් වෙතට ගොස් 'ස්වාමිනි! අපි පදව්‍යඤ්ජනයෙහි පමණක් දක්‍ෂ වෙමු, එය මිහිරි ලෙස හඩ නඟා කියන්නට අපට පිළිවන, ඒ මුත් ධර්‍මාර්‍ත්‍ථ යෙහි නම් දැනුමෙක් නැත, ධර්‍මාර්‍ත්‍ථයන් අන් කවුරුන් වෙත උගත් නමුත් මොවුන් වෙත ගොස් එබණ පිරිසිදු කොට කියවා නො ගෙණ සජ්ඣායනා නො කරවු'යි ඒ ග්‍රන්‍ථධූර පුරණ මහණුන්ට නියම කොට වදාරණු මැනවැ'යි දන්වා සිටිමු, එසේ කළ කල්හි අපට ලාභසත්කාර ලැබෙනු ඇතැ"යි කියා ගෙණ බුදුරජුන් වෙත ගොස් වැඳ එකත් පස්හි සිට එසේ කීහ.

බුදුරජානන් වහන්සේ ඔවුන්ගේ එබස් අසා "මේ ශාසනයෙහි ප්‍රවේණි වශයෙන් නම් එසේ කිය හැකි ය, මොවුහු වනාහි ලාභ සත්කාරයෙහි ගිජු වූවෝ"යි දැන වදාරා, "මම තෙපි හොඳට මිහිරි ලෙසින් කියන්නට දන්නහු පමණින් වදන්හි සොඳුරුබව ඇති පමණින් යහපත් සැහැවි ඇතියහු,යි නො කියමි, යමක්හු විසින් ඊර්‍ෂ්‍යාදිඅසද්ධර්‍ම, රහත්මගින් සිඳ හරිණ ලද නම් මෙතෙමේ ම යහපත් සැහැවි ඇතැ"යි වදාරා මේ ධර්‍මදෙශනාව කළ සේක.

**න වාක්කරණමත්තෙන වණ්ණපොක්ඛරතාය වා,**
**සාධුරූපො නරො හොති ඉස්සුකී මච්ඡරී සඨො.**

**යස්ස චෙතං සමුච්ඡින්නං මූලඝච්චං සමූහතං,**
**සවන්තදොසො මෙධාවී සාධුරූපොති වුච්චතීති.**

ලක්‍ෂණසම්පන්නවචනමාත්‍රයෙන් හෝ ශරීරවර්‍ණය යහපත් බැවින් හෝ ඊර්‍ෂ්‍යා ඇති මසුරුබැවින් යුත් කපටි වූ මිනිස් තෙමේ මනා සැහැවි ඇත්තේ නො වේ.

යමක්හු විසින් වනාහි මේ ඊර්‍ෂ්‍යාදී වූ දෙස්රැස මුලින් සිඳින ලද ද මනා කොට සිඳින ලද ද වැමැරූ කෙලෙස් ඇති නුවණැති හෙතෙමේ මනා සැහැවි ඇත්තේය යි කියනු ලැබේ.

**න වාක්කරණමත්තෙන** = ලක්‍ෂණසම්පන්නවචනමාත්‍රයෙන් හෝ හොඳට කතාකළ පමණින්.

න කාරය, මෙහි එන **හොති** යනු හා සම්බන්ධ වන්නේ ය. **“ව්‍යාක්ඛරණමනෙතන”** යන්නට අර්ථකථායෙහි **“වචීකරණ-මනෙතන ලක්ඛණසම්පන්නවචනෙන”** යි අරුත් දෙන ලද්දේ ය. එසේ අරුත් දෙන ලද්දේ මේ දෙශනාවට **ලක්** වූ භික්ෂූන්ගේ හා බුදුරජාණන් වහන්සේගේ අදහස් ලෙසිනි. නැත, හුදෙක් වදන් පමණක් කියැවෙන **‘ව්‍යාක්ඛරණ’** යන්නට එබඳු අරුත් කීමෙක් නො වන්නේ ය. පුරාණසන්නයෙහි ජිත්තසවර, භිත්තසවර, ගද්ගදස්වර, කාකස්වර නො ව ගම්භීරතාදි වශයෙන් ලක්ෂණසම්පන්න තෙපුල් ඇති පමණින්,යි මෙම කියන ලද්දේ ය. යුක්තස්ථානයෙහි යෙදුනු ශිථිල-ධනිතාදිව්‍යඤ්ජනසම්පත්තියෙන් හා ස්ථාන-කරණ-ප්‍රයත්නයෙන් නිසිසේ නැගි අක්ෂරසම්පත්තියෙන් පරිපූර්ණ වූ වචන ම ගම්භීරතාදිගුණ සෙවුනේ ය. එබඳු ‘වදන් පමණින්’ යනු අරුත්.

**වණ්ණපොක්ඛරතාය ච** = සිරුරු පැහැය යහපත් බැවින් හෝ සිරුරුපැහැය සිත් ගන්නා පමණින්.

**වණ්ණපොක්ඛරතා** නම්: සිරුරෙහි සුන්දරභාවය යි. **“වණ්ණපොක්ඛරතායාති වණ්ණසුන්දරතාය”** යනු අටුවා. **වණ්ණපො-ක්ඛරතා** යන්න වඩාත් පහදා ලන්නට **අභිරූපා - දස්සනීයා - පාසාදිකා** යනු යෙදින. ඉතා උස් නො වූයේ, ඉතා මිටි නො වූයේ අභිරූප. ඉතා කෙට්ටු නො වූයේ, ඉතා තර නො වූයේ දස්සනීය. ඉතා කලු නො වූයේ, ඉතා සුදු නො වූයේ පාසාදික. මෙ කියූ ලක්ෂණයෙන් යුත් සිරුර හා සිරුරු පැහැය දුටුදුටු-වන්ගේ සිත් ඇද ගණුයේ සොඳුරු බැවින් යුක්ත ය. ඒ වර්ණ සෞන්දර්යයෙන් හෝ යන අරුත්.

**සාධුරූපො නරො හොති ඉස්සුකී මච්ඡරී සඨො** = ඊර්ෂ්‍යා ඇති මසුරු වූ කපටි වූ මිනිස් තෙමේ යහපත් ගති ඇත්තේ නො වේ.

යමක්හට නිවරද වූ තමන් හා අනුන් නො පෙළන කාය-සාමචාර-වාක්සමාචාර-මනස්සමාචාර ඇත්තේ නම් හේ **සාධු රූප** ය.

**ඉස්සුකී** නම්: ඊර්ෂ්‍යා ඇත්තේ ය. මෙරමා සැපත් නො ඉවසීම මැකීම ලකුණු කොට සිටි චිත්තගතියෙන් යුක්ත වූයේ ය. **“පර සම්පත්තිඛීයනලක්ඛණාය ඉස්සාය සමන්නාගතො”** යනු එහි ව්‍යක්තිය යි. සත්ත්වයන් කෙරෙහි හා සත්ත්වයන් පිළිබඳ ගුණයන් කෙරෙහි දෙෂාරොපණය කරන්නී ද ඊර්ෂ්‍යා ය. මෝ අන්හු ලබනා පූජාසත්කාර-යසපිරිවර දකීමෙන් උගත්කම් දකීමෙන් කැම්බීම් ඇඳුම් පැලඳුම් යාන වාහන ගේදොර දකීමෙන් ආරොහපරිණා-

හාදිය දැකීමෙන් සිතතුළ උපදනී ය. යමක්හුගේ සිතෙහි මෝ උපදනී නම්, එය ඔහුට හිතපිණිස නො වන්නී ය. ඔහු ඒ හෙතු වෙන් එලොව හා මෙලොව හා දෙලොවින් පිරිහෙන්නේ ය.[1]

**“ඉධ පන මාණව! එකච්චො ඉත්ථී වා පුරිසො වා ඉස්සාමනකො හොති, පරලාභසක්කාරගරුකාරමානනවන්දනපූජනාසු ඉස්සති උපදුස්සති ඉස්සං බන්ධති, සො තෙන කම්මෙන එවං සමත්තෙන සමාදින්නෙන කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති, සචෙ මනුස්සත්තං ආගච්ඡති, යත්ථ යත්ථ පච්චාජායති, අප්පෙසක්ඛසංවත්තනිකා පරලාභසක්කාරගරුකාරමානනවන්දනපූජනාසු ඉස්සති උපදුස්සති, ඉස්සං බන්ධති”** යනු දෙශනා ය.

“මාණවකය! මේ ලෝකයෙහි ඇතැම් - ගැණු පිරිමි ඊර්ෂ්‍යායෙන් කැලඹුනු සිතැති ව මෙරමා ලබන ලැබුම් සැලකිලි ගරු බුහුමන් වැඳුම් පිදුම් දැක ඒ ඉවසනු නො හැකි ව සුසුම් ලනුවෝ ඊර්ෂ්‍යායෙන් උපක්‍රොශ කරන්නෝ ය, ඔවුහු ඒ ඊර්ෂ්‍යා සඞ්ඛ්‍යාත අකුශලකර්මයෙන් මරණින් මතු නිරයෙහි උපදින්නෝ ය, ඉදින් නිරයෙහි නො ඉපද මිනිසත්බවට ආවෝ නම් කිසිත් ආනුභාවයක් නැති හැම බලයෙකින් පිරිහුනු නිස්තෙජසකයෝ වන්නාහ” යනු එහි කෙටි අදහස ය.

ඊර්ෂ්‍යාව සිටියා ද්වෙෂය මිතුරු කොට ගෙණ ය. මෝ දෙමනස්සසහගතපටිඝසම්පයුත්තඅසඞ්ඛාර - සසඞ්ඛාර දෙසිතෙහි උපදනී ය. එහෙයිනි ද්වෙෂය මිතුරු කොට සිටියා යනු.

“සැවැත් නුවර කුලගෙයක කෙළෙඹි පුත්‍රයෙක් වී ය, හේ තුනුරුවන් කෙරෙහි සැදැහැති ය, එහෙත් ඔහුගේ බිරිය සැදැහැ නැත්තී ය, නො ද පහන් ය, ක්‍රොධයෙන් දැවෙන්නී ය, දූපුත් නැත්තී ය, නමින් **මිත්තා** ය, එහෙයින් කෙළෙඹි කුලවංශය සිඳීයේ ය යි අන් සත්‍රියක බිරිය කොට ගෙණ ආයේ ය, ඕ **තිස්සා** නම් ය, තුනුරුවන් කෙරෙහි සැදැහැත්තී කෙළෙඹියාගේ සිත් ගත්තී ය, මන වඩන්නී ය, ටික දවසක් යත් ම ඕ ගැබ් ගත්තී දස මසක් ගෙවා පුතකු වැදූ ය, පුතුට **භූත** යි නම් කළහ, තිස්සා එතැන් සිට ගෙයි සවාමිදූ වූවා භික්‍ෂූන් සතර නමකට නිතර උවටැන් කළා ය, එයින් වඳ බිරිය වූ මිත්තා ඇයට ඊර්ෂ්‍යා කළා ය, මේ දෙදෙන දවසක් දිය නාන්ට ගියහ, එහි දී දූපුත් ඇත්තී දිය නාලා තෙත් හිසකෙස් ඇති ව එහි රැඳී සිටියා ය, කෙළෙඹි ඇය කෙරෙහි වූ ගුණදහම් සලකා බැඳුනු සෙනහ ඇතියේ ඇය හා එහි කතා

1. 4. 1. ‘සො ඉමං පඨවිං විජෙස්සති’ යනු බලනු.

කරමින් සිටියේ ය, මිත්තා එය නො ඉවසන්නී ඊර්ෂ්‍යායෙන් මැඩුනී ගෙය හැමද එකතු කොට තුබූ කුණුකසළ ගෙණවුත් තිස්සාවගේ හිසමත බැහූ ය, මෙසේ ඊර්ෂ්‍යායෙන් හා ක්‍රොධයෙන් මැඩී සිටි ඕ තොමෝ ආයු ගෙවා කලුරිය කොට ප්‍රෙතලොකයෙහි ඉපද, දුක් විඳින්නී දවසක් සවස්වේලෙහි ගෙන් පිටත සිටි තිස්සාවට තමන් දක් වූ ය, එකල්හි තිස්සාව හා ප්‍රෙතිය අතර මෙස් කතාවක් උපන,

**තිස්සා** = ‘‘විළිවැසුම් නැතියෙහි ය, නපුරු සිරුරු පැහ ඇති-යෙහි ය, මස් ලේ සිඳී යෑමෙන් කෙට්ටු වූ සිරුරු ඇතියෙහි ය, ඉල්පී ගිය නහර ඇතියෙහි ය, මෙසේ මතු වූ ඉල ඇට ඇති ව සම්නහර පමණක් ඉතිරිව ගිය නී මෙහි සිටිනෙහි කවර?,

**පෙති** = පෙර ජාතියෙහි මම මිත්තා, නී තිස්සා, මම නී හා සම හිමි ඇතියා අකුසල් කොට මේ මිනිස් ලොවින් ච්‍යුත ව ප්‍රෙතලොකයෙහි උපන්මි,

**තිස්සා** = කා විසිමුනි නිදෙරින් කළ අකුසලය කුමක් ද? කිනම් අකුශල කර්මයක්හුගේ විපාක විසින් ප්‍රෙත-ලොකයට ගියා ද?,

**පෙති** = එද, මම සැඩ වූවා පරොස්බස් කියා ඊර්ෂ්‍යා ඇතියා මසුරු බැව් ඇතියා කපටි ගැණියක් වීමි, නපුරුබස් කියා මම මෙලොවින් ගිලිහී ප්‍රෙතලොකයට ගියා,

**තිස්සා** = එද, නී සැඩ වූ සැටි මම ද දනිමි, හොඳයි වේවා, කළ කිනම් කර්මයක් හෙතු කොට කුණු කසළින් ගැවසුනී?,

**පෙති** = එද, නී ඉස් සෝද නාලා පිරිසිදු රෙදිපිළී හැඳ අබරණ ලා සැරැසී ගත්තා, මමත් නිට වඩා ඉතා ඉහලින් සැරසුනා, ඒ අතර මා බලා ඉන්ද දී නී හිමියා සමග තනිව කතා කරමින් සිටියා, එය දැක මාගේ සිත්හි ඊර්ෂ්‍යාවත් ක්‍රොධයත් දැඩි ව උපන් බැවින් පස් ගෙණ ඒ පස් මම නීගේ හිසමත දැම්මා ඒ කළ අකුශලකර්මයාගේ විපාක විසින් මම දූන් පසින් වැකුණු සිරුරු ඇතියා වෙමි,

**තිස්සා** = එද නී පස් ගෙණ මා හිසමත දැමූ සැටි මම දනිමි, එයින් දූන් වැඩෙක් නැත, නිතර සිරුර කසන්නීහි කිම?,

**පෙති** = එදා අපි දෙදෙන බෙහෙත් බඩු ටිකක් සපයා ගෙණ එන්නට කැලෑවට ගියමෝ ය, නී වෙදුන් කියූ බෙහෙත් බඩු සපයා ගෙණ ආවා, මම නිට නො පෙණෙන සේ කසඹිලියා කොළ හා ගෙඩි කිහිපයක් ගෙණාවා, ඒ ගෙණ ආ කසඹිලියා කොළ හා ගෙඩි නී නිදන ඇඳෙහි නිට නො පෙණෙන ලෙසින් විසිර විමි, ඒ කළ පාපකම්ය නිසා මාගේ ඇඟපත සැම තැන මේ කුෂ්ටරෝගය නැගී ඇත, නිතර ඇඟ කසින්නිම් ඒ නිසා ය,

**නිසසං** = හරි, ඇත්ත යි, එදා නී මං නිදන ඇඳෙහි කසඹිලියා විසිර වූ බව මං දන්නවා, මොක ද, දූන් හෙළුවෙන්?

**පෙති** = එදා, මෙහි මිතුරන්ගේ සමාගමයෙක් විය, නෑයන් ගේ ත් රැස්වීමෙක් ද විය, ඒ දෙකට ම මං හැර දමා නී සැමියා සමග ගියා, මට ඒ පිණිස කිසින් දූන්-වීමෙක් නො වී ය, එදා මම නීගේ රෙද්දක් සොරා ගතිම්, ඒ පාපයෙන් දූන් හෙළුවෙන් සිටින්නී,

**නිසසං** = ඇත්ත යි, නී මාගේ රෙද්දක් සොරාගත් බව මං දූන සිටියා, මොක ද නී වෙතින් නදින් අසූචිගඳ හමන්නේ, මොක ද, කළ කම්ය?,

**පෙති** = මම එදා ඊෂ්‍යීායෙන් හා ක්‍රොධයෙන් නීගේ සුවඳ සබන්, වට්නා මල්මාලා, ඇඟ ගල්වන විලවුන් ගෙණ ගොස් අසූචිවළෙක දූම්මා. මාගේ සිරුරෙන් නිතර අසූචිගඳ හමන්නේ ඒ කළ පාපකම්ය නිසා ය,

**නිසසං** = දුකට පැමිණියා කුමක් නිසා ද?,

**පෙති** = අපගේ ගෙයි තුබූ ධනය අප දෙදෙනාට ම සමාන ව තුබුනේ ය, එසේ මා වෙතත් දියයුතු දෑය තිබියදීත් මා එයින් පිහිටක් කර ගත්තේ නැත, දනක් පිණක් නො කෙළෙම්, පින්දහම් නො කළ නිසා දුකට පැමිණියා,

**නිසසං** = එදා නී මං ගැණ නො මගින් කල්පනා කළා, නිට හිත කැමතියක වැඩ කැමැතියක කොට මං ගැණ නො සිතුයෙහි ය, හැමවේලේ මට ඊෂ්‍යීාකළා, මට ක්‍රොධ කළා, මේ එදා කළ පාප කම්යන්ගේ විපාකය යි, එය ඉතා බිහිසුණු බව ඇස් ඉදිරියෙහි ම දකුව, නීගේ ගෙයි එදා මෙහෙකරන්නෝ වූවාහු ද,

එසේ ම නොයෙක් ආභරණයෝ වූවාහු ද නී අයත් වූ ඒ සියල්ල දූත් අත් ගෑණු ප්‍රයොජනයට ගණිත්, වසතු සමපත් සදෘකාලික නො වේ, ඒ කිසි දූයෙක ඊෂර්‍ෂ්‍යා මාත්සර්‍ය්‍යාදිය නො කටයුතු ය,

**භූත** නම් මේ පුතුගේ පියා කඩපිළෙහි සිට දූත් ගෙදර එනු ඇත, ඔහු ගෙදර ආ විට දිය යුතු දූයක් නිට දෙනු ද ඇත, එතෙක් බැහැර නො ගොස් මෙහි ම සිටුව,

**පෙතී** = මම හෙළුවෙත්, සිරුරු පැහැය දූකිය නො හැකි ය, ඇඟපත වැහැරී ගොස් ය, නහර ඉල්පී තිබේ, මෙය ගෑණුත්ට මහත් ලජ්ජාවක, භූතගේ පියා මා නො දකීවා,

**තිසසා** = එසේ නම් නී කෙසේ සුවපත් වන්නි හි? කාම්සැපතින් පිරී යන්නී හි, ඒ පිණිස නිට කුමක් කුමක් දෙම් ද, බතක් බුලතක් කැවිලියක් පෙවිලියක් රෙදිකඩක් දෙම් ද, වෙන අන් කවර උපකාරයක් කරම් ද?,

**පෙතී** = සඞ්‍ඝසම්මතයෙන් සඞ්‍ඝයා වෙතින් භික්‍ෂූන් සිවු නමක් ද පුද්ගල විසින් භික්‍ෂූන් සිවු නමක් දූ යි භික්‍ෂූන් අට නමක් වළඳවා ඒ දක්‍ෂිණාව මට පමුණු වන්න, එකල්හි මම සුව ඇතියා වෙම්, සියලු සැපතින් පිරී ඉතිරී යනු ඇතැ” යි.

ඉක්බිති තිසසා පෙතියගේ ඉල්ලීම පරිදි ඒ කාරණය සිය සැමියාට දන්වා පසුදා භික්‍ෂූන් අට නමක් වළඳවා රෙදිපිළි පූජා කොට පෙතියට පින් පැමිණ වූ ය. පින් පමුණුවාලූ කෙණෙහි ම ඇයට දිව්‍යමයආහාරපානවස්ත්‍රාභරණ හා හැම යසිසුරු ම ලැබින. එයින් ඕ දුකින් මිදුනා.

**මච්ඡරී** නම්: මසුරුකම් ඇත්තෝ ය. සිය සැපැත් සැඟවීම ලකුණු කොට සිටි විත්තගතියෙන් යුක්ත වූයේ ය. මසුරුකමින් යුත් පුද්ගල තෙමේ තමා සතු කිසි දූයක් අනුනට සාධාරණවීම ගුණ සතුටු නො වන්නේ ය. කිසිවක්හට කිසිවකුත් නො දෙන්නේ ය.

මේ මාත්සර්‍ය්‍ය හෙවත් මසුරුකම **ආවාස – කුල – ලාභ – ධර්ම – වර්ණ** යි පස් වැදෑරුම් ය. එහි **ආවාසමාත්සර්‍ය්‍ය** නම්: අරම් – පිරිවෙන් – වෙහෙර – පන්සල් – රැතැන් – දිවා තැන් වතු පිටි ආදිය පිළිබඳ මසුරුබව ය. මේ මසුරුකමින් යුක්ත වූයේ

අන් මහණුන්ගේ පැමිණීම නො ඉවසන්නේ ය. පැමිණියහු ද නොයෙක් නැති බැරිකම් කියා පිටත් කොට යවන්නේ ය. ආවාසමාත්සර්යය හෙතු කොට මරණින් මතු යකෙක් හෝ ප්‍රෙතයෙක් ව ඒ ආවාසයෙහි ඇති තාක් කුණු කසළ හිසින් ගෙණ හැසිරෙන්නේ ය. **කුලමාත්සර්යය** නම්: ඒ ඒ කුලයන් නිසා "මේ මාගේ උපස්ථායක කුල ය, මේ ඥාති කුල ය, මේ කුලයන් කරා අනෙකෙක් නො පැමිණෙන්නේ නම් මැනැවැ"යි කුල පිළිබඳ මසුරුබව ය. කුලමාත්සර්යය හෙතු කොට යම් කුලයක් පිළිබඳ මසුරුබවෙක් යමක්හට වේ නම්, ඒ කුලයෙහි අන්හට දෙන දානමානාදිය දැක "මාගේ කුලය මා කෙරෙහි බිඳී ගියේ වන, මට වූවා මහත් හානියකැ"යි සිතන්නහුගේ කටින් ලේ උතුරන්නේ ය. මලමගින් විරෙචනය වන්නේ ය. අතුනු බහන් ද කැඩි කැඩී නිකුත් වන්නේ ය. **ලාභමාත්සර්යය** නම්: චීවර – පිණ්ඩපාත – සෙනාසන – ග්ලානප්‍රත්‍යයයන් පිළිබඳ මසුරුබව ය. මෙයින් මැඩී සිටියේ, අන් මහණුන්ට එයින් යමක් ලැබෙනු නො කැමැත්තේ ය. ලාභමාත්සර්යය හෙතු කොට සඞ්ඝසන්තක වූ ගණසන්තක වූ ලාභයෙහි මසුරු කම් කොට ඒ සියල්ල තමාගේ ය යි සිතා වළඳනුයේ අයත් කොට ගණුයේ මරණින් මතු යකෙක් හෝ ප්‍රෙතයෙක් හෝ මහාපිඹුරෙක් හෝ වන්නේ ය. **ධර්මමාත්සර්යය** නම්: තමන් දන උගත් ධර්මශාස්ත්‍රාදියෙහි මසුරු බව ය. මෙයින් මැඩුනේ තමන් උගත් ධර්මශාස්ත්‍රය අන්හට උගන්වනු නො කැමැත්තේ ය. **වර්ණමාත්සර්යය** නම්: ශරීරවර්ණ – ගුණවර්ණයන් නිසා උපදනා මසුරුබව ය. මෙයින් මැඩුනේ මෙරමා පිළිබඳ හැඩ හුරුකම් දකින්නට අසන්නට නො කැමැත්තේ ය. එසේ ම මෙරමා පිළිබඳ සිල්වත්බව සුරුබුහුටි බව ඈ අසන්නට නො කැමැත්තේ ය. උගත්කම නො ඉවසන්නේ ය. මේ හෙතු කොට දුර්වර්ණී වනුයේ කෙළ තොලු වන්නේ ය. වැදූ මවට ද අප්‍රිය වන්නේ ය.

ආවාසමාත්සර්යයෙන් මරණින් මතු ලෝකුඹු නරකයෙහි උපදින්නේ ය. කුලමාත්සර්යයෙන් හිඟන්නෙක් වන්නේ ය. ලාභමාත්සර්යයෙන් ගූථනරකයෙහි පැසෙන්නේ ය. ධර්මමාත්සර්යයෙන් කුක්කුළ නරකයෙහි ඉපද ගන්නේ ය. වර්ණමාත්සර්යයෙන් අන්නු සිත් ගන්නා සිරුරු පැහැයෙන් තොර වූයේ අප්‍රිය වූ දැකුම් ඇතියේ වන්නේ ය. මේ ඊර්ෂ්‍යා – මාත්සර්ය දෙක පහවනුයේ සෝවන්මග නුවණින් ය. මෙ දෙක පහව යන තුරු මිනිස්සු වෛරාදිපාපධර්මයන්ගෙන් නො ද මිදෙන්නාහ.[1]

1. 1. 4. 'න හි වෙරෙන' යනු බලනු.

කපටි පුද්ගල තෙමේ **සඨ** නම්. මෙ තෙමේ තමන් වෙත නැත්තා වූ සද්ගුණ පෙන්වා තමන් වෙත නැති උගත්කම් පෙන්වා මිහිපිට ඉන්නා එක් ම උගතා තමන් බව දක්වා ලොකයා මුළා කොට ලාභසත්කාරාදිය සොයන්නේ ය. **"අසන්තො අවිජ්ජමානගුණසම්භාවනලක්ඛණං සාඨෙය්‍යං"** කපටිබව තමන් වෙත නැති ගුණ පැවසීම ලකුණු කොට සිටියේ ය. **"තෙසං සමුද්ධරණරසං"** තමන් වෙත නැති ගුණ කියා පෑම කෘත්‍යය කොට සිටියේ ය. **"සරීරාකාරෙනපි තෙසං විභූතකරණපච්චුපට්ඨානං"** තමන් වෙත මහත් ගුණ ඇතැයි ලොකයාහට හඟවන අදහසින් අත පය නො සොල්වා වට පිට නො බලා බිම බලා සෙමින් සෙමින් පා නැගීම් ආදී වූ ශරීරාකාරයෙන් ඒ නැති ගුණ ප්‍රකට කිරීම ඵල කොට සිටියේ ය. **"සඨො අසන්තගුණදීපනතො න සම්මා භාසිතා"** යි කී බැවින් කපටි පුද්ගල, නැති ගුණ දක්වන බැවින් මැනැවින් කියන්නෙක් නො වේ ය යි දතයුතු ය.

**යස්ස ච එතං සමුච්ඡින්නං** = යමක්හු විසින් මේ දෙස් රැස මනා කොට සිඳින ලද ද.

**මූලඝච්චං සමූහතං** = මුල් සිඳීමෙන් නසන ලද ද.

**සො වන්තදොසො මෙධාවී** = වැමෑරූ කෙලෙස් ඇති නුවණැති හෙතෙමේ.

**සාධුරූපො ඉති වුච්චති** = මනා සැහැවි ඇත්තේ ය යි කියනු ලැබේ.

යමක්හු විසින් මේ ඊර්ෂ්‍යාදිදෝෂජාතය අග්‍රමාර්ගඥානයෙන් මුල් සහිත ව සිඳින ලද ද, හේ **වන්තදොස** ය[1] ධර්මෞජස් ප්‍රඥා ඇතියේ **මෙධාවී** ය[2] කෙලෙස් වැමෑරීම් ඇ ඇතියේ **සාධුරූප** ද වේ. මෙතෙමේ සක්විති සැපත් ඈ බලා ද ගුණයෙන් නො පිරිහෙන්නේ ය. ස්ථිර ගුණ ඇතියේ ය. විටින් විට වෙනස් වන සාමාන්‍ය ගුණ ඇතියෙක් නො වේ.

ධර්මදෙශනාවගේ අවසානයෙහි බොහෝ දෙනා සෝවාන්ඵලාදියට පැමිණියාහු ය.

**සම්බහුලභික්ෂු වස්තුව නිමි.**

---

1\. 1. 7. 'යො ච වන්තකසාවස්ස' යනු බලනු
2\. 2. 5. 'මෙධාවී' " "

# වාදයෙන් පැන යන හත්ථක.

## 19 — 6

**වාදයට** අඩ ගසා වාද නො කොට සැඟවී ගත්නා **හත්ථක** තෙමේ "තෙපි අසුවල් වේලෙහි අසුවල් තැනට එවු' වාද කරන්නෙමු" යි කලින් ම එහි ගොස් මද වේලාවක් රැඳී සිට "බලවු' තීර්ථකයෝ මට බියෙන් මෙතෙක් මෙහි නො ආහ, මොවුන්ගේ මේ නො පැමිණීම ම පරාජය" යි වාදයෙන් බැහැර ව අනෙකෙකින් අනෙක වසමින් පැන යන්නේ ය. බුදුරජානන් වහන්සේ "හත්ථක, වාදයට අඩ ගසා වාද නො කොට පැන යන්නේ ය"යි අසා හත්ථක කැඳවා "ඇත්ත ද, හත්ථක! තමුසේ වාදයට අඩ ගසා වාද නො කොට පැන යන්නාහු?"යි විචාරා "ඇත්තැ" යි කී කල්හි "කුමක් නිසා මෙසේ කරහු? මෙබඳු බොරු කියන්නේ හිස මුඩු කිරීම් පා සිවුරු දැරීම් පමණෙකින් හැසිරෙන්නේ මහණෙක් නම් නො වේ, යමෙක් කුදු මහත් හැම පවක් සන්සිඳුවා සිටියේ ද මෙතෙමේ ම මහණැ"යි මේ ධර්මදෙශනාව කළ සේක.

> **න මුණ්ඩකෙන සමණො අබ්බතො අලිකං භණං,**
> **ඉච්ඡාලොභසමාපන්නො සමණො කිං භවිස්සති.**
>
> **යො ච සමෙති පාපානි අණුං ථූලානි සබ්බසො,**
> **සමිතත්තා හි පාපානං සමණොති පවුච්චති.**

ව්‍රත ගුණ රහිත වූ බොරු කියන පුද්ගල තෙමේ හිස මුඩු කිරීම් පමණෙකින් මහණෙක් නො වේ. ඉච්ඡාවට හා ලොභයට පැමිණියේ තෙසේ මහණෙක් වේ ද.

යමෙක් වනාහි කුඩා වූ ද මහත් වූ ද පව්කම් මුළුමනින් සන්සිඳුවා ද, පව් සන්සිඳ වූ බැවින් ම හේ මහණැ යි කියනු ලැබේ.

න යනු නිපාත යි. **මුණ්ඩක** නම්: මෙහි හිස මුඩු කිරීම ය. හිස මුඩු කොට සිටි පුද්ගල ද මුණ්ඩක යි ගැණේ. හිස රැවුළු සිඳ හැරීම ශාසනික භික්ෂූන්ගේ පිළිවෙතෙකි. එ ද සිතෙහි නගිනා මානමදාදී කෙලෙස් යටපත් කර ගැණීමට ඉවහල් ව සිටුනා බැවින් සඳුන් පිළිවෙතෙක් වේ. සිරුරෙහි විවර්ණභාවයට කරුණු වන්නේ ය. භික්ෂූන් විසින් ශරීරයෙහි විවර්ණභාවය නිතර සිහි කළ යුතුය යි වදාළෝ ද මානමදාදීන් යටපත් කරණු සඳහා ය. **"වෙවණ්ණියම්හි අජ්ඣුපගතොති පබ්බජිතෙන අභිණ්හං**

**පච්චවෙක්ඛිතබ්බං"** යනු දෙශනා ය. **"කොසමස්සුඛරොමසංණනා සරීරවෙවණ්ණියං වෙදිතබ්බං"** යනු අටුවා ය. එක්වර හිස රැවුළු සිඳ හැරීම ශ්‍රමණයන්ගේ යුතුකම ය. හිසකෙස් සිඳීම තබා, රැවුළු පමණක් සිඳීම බෞද්ධසංස්කෘතිය නො වේ. ශාසනානුලොමික නො වේ. යුතුකම ද නො වේ. එහෙත් ඒ දෙක එක්වර සිඳ හැරිය ද එම පමණින් මහණෙක් ද නො වේ.

**සමණො** = මහණෙක්.[1]

**අබ්බතො** = ව්‍රතරහිත වූ. ව්‍රතරහිත වූයේ හෝ.

මෙහි **වත** නම්: චතුපාරිසුද්ධිසීලය හා ධුතාඞ්ගධර්මයෝ ය. එහෙයින් ඒ සිව් පිරිසිදු සිල් රැකීම හා දුහඟපිරීම නො කරණුයේ **අබ්බත** නම්. **"සීලවතෙන ධුතවතෙන විරහිතො"** යනු අටුවා.[2]

**අලිකං භණං** = බොරු කියන්නා වූ. බොරු කියන්නේ හෝ.

**බුදුරජ** = රාහුල! අර පෙණෙන දිය බඳුනෙහි ඉතිරිව තිබෙන දියත්ත දක්නහු ද?

**රාහුල** = ස්වාමීනි! එසේය. දකිමි.

**බුදුරජ** = රාහුල! යම් කෙනෙක්හට දැන දැන බොරු කීමෙහි ලජ්ජායෙක් නො වේ නම් ඔවුනට ඉතිරි ව ඇත්තේ ඒ දිය බඳුනෙහි රැඳී තිබෙන දියත්ත පමණ වූ ඉතා ටික වූ මහණකමෙකි.

ඉක්බිති බුදුරජානන් වහන්සේ බඳුනෙහි තුබූ දියත්ත බැහැරට දමා නැවැත රාහුල තෙරුන් මෙසේ ඇමතූ සේක.

**බුදුරජ** = රාහුල! බැහැරට දැමූ අර පෙණෙන දියත්ත රාහුලට පෙණේ ද?

**රාහුල** = ස්වාමීනි! එසේය. බැහැර දැමූ ඒ දියත්ත මට පෙණේ.

**බුදුරජ** = රාහුල! යම් කෙනෙක්හට දැන දැන බොරු කීමෙහි ලජ්ජායෙක් නො වේ නම් ඔවුන්ගේ මහණකම බැහැර දැමූ දියත්ත සේ බැහැර දමන ලද ය.

---

1. 14. 4 'සමණො' යනු බලනු.
2. 1. 14. 'අනුධම්මචාරී' 7. 6. 'සුබ්බතො' යනු බලනු.

ඉක්බිති බුදුරජානන් වහන්සේ ඒ දියබඳුන යටිහුරු කොට නැවැත රාහුල තෙරුන් හා කතාවට බට සේක.

බුදුරජ = රාහුල! යටිහුරු කළ දිය බඳුන දක්නහු?

රාහුල = එසේය, සවාමිනි!

බුදුරජ = රාහුල! යම් කෙනෙක්හට දැන දැන බොරු කීමෙහි ලජ්ජායෙක් නො වේ නම් ඔවුන්ගේ මහණකම යටිහුරු කරණ ලද්දේ ය.

ඉක්බිති බුදුරජානන් වහන්සේ දියබඳුන උඩුහුරු කොට නැවැත රාහුල තෙරුන්ගෙන් මෙසේ අසා වදාළ සේක.

බුදුරජ = රාහුල! උඩුහුරු කළ දියෙන් හිස් වූ දිය බඳුන තමුසේ දක්නහු?

රාහුල = සවාමිනි! එසේය.

බුදුරජ = රාහුල! යම් කෙනෙක්හට දැන දැන බොරු කීමෙහි ලජ්ජායෙක් නො වේ නම් ඔවුන්ගේ මහණකම මුළුමනින් ම හිස් ය. සිවුරු දැරීම් පමණින් හිසරැවුළු සිඳ හැරි පමණින් මහණෙක් නො වේ. රාහුල! යම් කෙනෙක්හට දැන දැන බොරු කීමෙහි ලජ්ජායෙක් නො වේ නම් ඔහුට නො කළැකි පාපයෙක් ඇතැ යි මම නො - කියමි. එහෙයින් රාහුල! හිනාවටවත් කෙළි-කවට කමටවත් බොරු නො කිය යුතු ය. රාහුල! බොරු නො කියන්නෙමි,යි තදින් තසිට ගෙණ හික්මෙන්න.

කාරුණු මෙසේ බැවින් බොරු කියන්නා මහණෙක් නො වේ ය යි වදාළ සේක. ගිහිගෙයි සිටියේ ද බොරු කියන්නේ නම් දෙලොවින් පිරිහෙන්නේ ය.[1]

**ඉච්ඡාලොභසමාපන්නො** = ඉච්ඡාවට හා ලොභයට පැමිණියේ.

**ඉච්ඡා** නම්: අරමුණු කැමැතිවීම ය. ඕ අතට නො පත් අරමුණු පිළිබඳ ය. ඉච්ඡායෙන් අතිච්ඡාවට, අතිච්ඡායෙන් මහිච්ඡාවට පැමිණෙන්නේ ය.[2]

1. 1. 10 'පාපකාරි' යනු බලනු
2. 5. 2. 'තත්ථි බාලෙ සහායතා' යනු බලනු.

**ලෝභ** නම්: සත්ත්වයන් රූපශබ්දාදී වූ අරමුණුවල රැඳවී-මෙහි ඇලවීමෙහි ශක්තිය යි. මෙය අතට පත් අරමුණු පිළිබඳ ය. **"අසම්පත්තෙසු ආරම්මණෙසු ඉච්ඡාය පත්තෙසු ලොභො සමන්නාගතො"** යනු අටුවා.[1]

**සමණො කිං භවිස්සති** = කෙසේ මහණෙක් වේ ද. කිම මහණෙක් වේ ද.

ශීලාදිව්‍රතරහිත වූ බොරු කියන පුද්ගල තෙමේ හිසමුඩු කිරීමෙන් පමණක් මහණෙක් නො වේ. හුදෙක් හිසමුඩු කිරීමෙන් උතුමන් නො හටගන්නා බව හා දුගඳ නො හමනා බව වන්නේ ය.

**යො ච සමෙති පාපානි අණුං ථූලානි සබ්බසො** = යමෙක් වනාහි කුඩු-මහත් පව්කම් මුළුමනින් සන්සිඳුවා ද.

**යො** යනු අනියාමිතවචනයි. කවරෙක් හෝ වේවා යි කිය හැකි වුව ද මෙහිලා ප්‍රධාන විසින් පැවිද්දෙක් ම ගැණෙන්නේ ය.

**සමිතත්තා හි පාපානං සමණො ඉති පවුච්චති** = පව් සන්සිඳ වූ බැවින් ම මහණැයි කියනු ලැබේ.

පව් සන්සිඳීම සෝවාන් ඈ මගනුවණින් පිළිවෙළින් වන්නේ ය. පව් සන්සිඳ වූයේ ම මහණෙක් වන්නේ ය. **හි** යනු අවධාරණාර්ථයෙහි ය.

ධර්මදෙශනාවගේ අවසානයෙහි බොහෝ දෙන සෝවන්පලා-දියට පැමිණියාහුය.

**හත්ථකවස්තුව නිමි.**

1. 1. 7. 'අනික්කසාවො' යනු බලනු.

# බැහැරි සසුන්හි පැවිදි වූ බමුණෙක්.

**19 — 7**

**බැහැරි** සසුන්හි පැවිදි ව ගත් එක්තරා බමුණෙක් පිඬු සිඟා ජීවත් වනුයේ "ශ්‍රමණ ගෞතම තෙමේ පිඬු සිඟා වළඳා ජීවත් වන තමන්ගේ ශ්‍රාවකයන් භික්ෂු යි හඳුන් වන්නේ ය, මා ද පිඬු සිඟා යන බැවින් මම ද භික්ෂු නම් වෙමි"යි සිතා දවසක් බුදුරජුන් වෙත ගොස් "භවත් ගෞතමයන් වහන්ස, මම ද පිඬු සිඟා ගෙණ වළඳා ජීවත් වෙමි, එහෙයින් මාත් භික්ෂු යි හඳුනා ගණු මැනැවැ"යි දන්වා සිටියේ ය. එකල්හි බුදුරජාණන් වහන්සේ "බ්‍රාහමණ! මම පිඬු සිඟීම් පමණින් යමක්හට භික්ෂු යි නො කියමි, විෂම වූ පාපධර්ම සමාදන් ව ගෙණ පවත් වනුයේ භික්ෂු නම් නො වේ, යමෙක් වනාහි නුවණින්, මේ ආධ්‍යාත්මිකසංසකාර ය, මේ බාහිර සංසකාර ය"යි සියලු සංසකාරයන්ගේ නියම තතු දැන දවස–රින්නේ නම් හෙතෙමේ භික්ෂු නම් වේ ය"යි වදාරා මේ ධර්මදෙශනාව කළ සේක.

**න තෙන භික්ඛු සො හොති යාවතා භික්ඛතෙ පරෙ,**
**විස්සං ධම්මං සමාදාය භික්ඛු හොති න තාවතා.**

**යොධ පුඤ්ඤඤ්ච පාපඤ්ච බාහිත්වා බ්‍රහ්මචරියවා,**
**සඞ්ඛාය ලොකෙ චරති සවෙ භික්ඛූති වුච්චතීති.**

යම් පමණකින් අනුන්ගේ ගේ දොර සිට සිඟා ද, එපමණින් භික්ෂු නම් නො වේ. විෂම වූ පාපධර්ම, නොහොත් දුගඳ හමන කාය කර්මාදිය සමාදන් ව ගෙණ වසන්නේ එපමණින් භික්ෂු නම් නො වේ.

මේ සසුනෙහි යම් මහණෙක් පින් ද පව් ද දුරු කොට බඹසර ඇතියේ ලොකයෙහි සියලු ධර්මයන් නුවණින් සලකා ගෙණ හැසිරේ ද හෙතෙමේ භික්ෂු යි කියනු ලැබේ.

**න තෙන භික්ඛු සො හොති යාවතා භික්ඛතෙ පරෙ** = යම් පමණකින් අනුන්ගේ ගේ දොර සිට සිඟා ද, එ පමණින් භික්ෂු නම් නො වේ.

යමෙක් සිල් රැකුම් ආදී ගුණදහම් වැඩීම් පසෙක තබා මෙලොව උදරපූරණය පිණිස මහණ වෙස් ගෙණ අනුන්ගේ ගේ දොරදොර සිඟා යේ නම් ඒ සිඟා ගිය පමණින් ඔහුට භික්ෂු යි නො කිය හැකි ය. පිඬු සිඟා ගිය පමණින් භික්ෂු නම් නො වේ.

**භික්ඛු** කවරැ යි ඉදිරියෙහි දත හැක්කේ ය. **'යාවතා, පරෙ'** යනු විසතර විසින් යට පැවසුනේ ය.

**විසමං ධම්මං සමාදය භික්ඛු හොති න තාවතා** = විෂම වූ පාපධර්ම නොහොත් දුගඳ හමනා කායකර්මාදිය සමාදන් ව ගැණීමෙන් එපමණින් භික්ෂු නම් නො වේ.

**විසමං** = විෂමය යන අරුත් ඇතියේ ය. යම් ධර්මයකින් යම් ක්‍රියායෙකින් යමක්හට තමසිත සෙමෙහි තැබිය නො හැක්කේ ද ඒ ධර්ම, ඒ ක්‍රියා විෂම ය. සතුන් මැරීම් ඈ පව්කම් කරන්නහුට සෙමෙහි පවතිනු නො හැකි ය. ඔහුගේ සිතෙහි සැනසිල්ලෙක් නැත්තේ ය. එසේ ම ඒ පාපධර්ම දුගඳ වහනය කරන්නේ ය. පව්කම් කරන්නේ ද දුගඳ ඇතියේ ය. 'විසස' යනු චිතකාග්නිධූමයෙහි ද වැටේ. චිතකාග්නිධූම නම් මිනීදුම් ය. ඒ දුගඳ ය. සංස්කෘතයෙහි 'විස්‍ර' යි කියනු ලැබේ. **ධම්ම** යන්නෙන් පාපධර්ම ගැණේ.

**යො ඉධ පුඤ්ඤං ච පාපං ච බාහිත්වා බ්‍රහ්මචරියවා** = මේශාසනයෙහි යම් මහණෙක් පින්පව් දුරු කොට බඹසර ඇතියේ.

**'බ්‍රහ්මචරියවා'** යන මෙය **'චරිත'** යනු හා බැඳී සිටියේ ය. බ්‍රහ්මචරියවා = බඹසර ඇතියේ ය යන අරුත්.[1]

**සඞ්ඛාය ලොකෙ චරති** = ලොකයෙහි නුවණින් දැන හැසිරේ ද.

ස්කන්ධාදිලොකයෙහි 'මේ ආධ්‍යාත්මිකස්කන්ධ ය, මේ බාහ්‍යස්කන්ධය, යනාදී විසින් සියලු ධර්මයන් නුවණින් දැන හැසිරේ ද, මාර්ගඥනයෙන් බිඳ හළ කෙලෙස් ඇති ව හැසිරේ ද.

**සො වෙ භික්ඛු ඉති වුච්චති** = හෙතෙමේ එකාන්තයෙන් භික්ෂු යි කියනු ලැබේ.

සඞ්ඛාය = නුවණින් යන අරුත්. **සඞ්ඛා** යනු ප්‍රකෘතියි. එය ඥනපර්‍ය්‍යාය වේ. **ලොක** නම්: මෙහි ස්කන්ධලොකය යි.[2]

විෂම වූ නොහොත් ගැරහුම් ලැබෙන කාය දුශ්චරිතාදි පාපධර්මයන්හි බැඳී සිටුනා පුද්ගල තෙමේ අනුන්ගේ ගේ දොරදොර සිට සිඟා කෑ පමණින් භික්ෂු නම් නො වේ. සසුන් වත් යම් මහණෙක් පින්පව් නසා බඹසරින් යුතුව ස්කන්ධාදිලොකය නුවණින් දැන සලකා මගනුවණින් සිඳ හළ කෙලෙස් ඇතියේ නම් හේ ම එකාන්තයෙන් භික්ෂු නම් වේ.

ධර්මදෙශනාවගේ අවසානයෙහි බොහෝ දෙන සෝවාන්පලාදියට පැමිණියාහු ය.

අන්‍යතරබ්‍රාහ්මණ වස්තුව නිමි.

---

1. 11. 9. 'අචරිත්වා බ්‍රහ්මචරියං' යනු බලනු.
2. 6. 11. 'තෙ ලොකෙ පරිනිබ්බුතා' ,, ,,

# නියම මුනිවරයා

**19 — 8**

**තීර්ථකයෝ** වැළඳූ තන්හි මිනිසුනට අනුමෝදනා පිණිස “යහපතෙක් වේවා, සැපතෙක් වේවා, ආයු වැඩේවා, අසුවල් තැන කටු ඇත්තේ ය, එතන්හි නො යෙත්වා” යනාදි ලෙසින් මගුල් කියා තමන් වසනා තැන් බලා යෙත්. භික්ෂූන් වහන්සේලා බුද්ධත්වය පිළිබඳ ප්‍රථමබෝධියෙහි අනුමෙවෙනි බණ වදාරන්නට නො අනුදත් බැවින් බත්හලෙහි වළඳා මිනිසුනට අනුමෙවෙනි බණ නො වදාරා ම නික්ම යන්නෝ ය. එකල්හි මිනිස්සු “අපි තීර්ථකයන් වෙතින් මඟුල්බණ අසන්නෙමු, ඔවුහු අපට ආසිරි පතන්නෝ ය, හිත පතන්නෝ ය, මේ පින්වතුන් වහන්සේලා දන් වළඳා කිසිත් නො බැණ නිහඬ ව ම යන්නාහ”යි අවමන් කළහ. භික්ෂූන් වහන්සේලා මේ වග බුදුරජාණන් වහන්සේට දන්වා ලූහ. එවිට උන්වහන්සේ “මහණෙනි! මෙතැන් පටන් තමුසේලා ද බත්හල්හි දන් වළඳා අවසන්හි සැපපහසු ඇති පරිදි කැමැති සේ අනුමෙවෙනි බණ කියවූ, වෙත පැමිණියවුනට දහම් දෙසවූ”යි අනුදත් සේක. එතැන් පටන් භික්ෂූන් වහන්සේලා එසේ අනුමෙවෙනි බණ වදාළාහු ය. මිනිස්සු අනුමෙවෙනි ඈ බණ අසන්නෝ සැදැහයෙන් ඔද වැඩි ව වීර්යවත් ව භික්ෂූන්ට ආරාධනා කොට පුදසැලකිලි වඩවඩාත් කරන්නට පටන් ගත්හ. ඒ දුටු තීර්ථකයෝ “දෙඩමලුවීම නො හොබනා බැවින් අපි මුවෙන් නො බණුම්හ, අපි මුනීහු වම්හ, එහෙයින් නිහඬ වම්හ, ශ්‍රමණ ගෞතමයන්ගේ ශ්‍රාවකයන් දන්හල්හි මහාහඬ නඟා දෙඩමලු ව බණ දෙසති”යි අවමන් කරන්නට වූහ. බුදුරජාණන් වහන්සේ නිවටුන්ගේ ඒ කතාව අසා “මහණෙනි! මම නිහඬවීම් පමණින් මුනි යි නො කියමි, මේ ලොකයෙහි ඇතැම් කෙනෙක් කියන්නට කිසිත් නො දන්නා බැවින් නිහඬ වෙත්, ඇතැම් කෙනෙක් බිය නිසා නිහඬ වෙත්, ඇතැම් කෙනෙක් අපගේ මේ දහම් අන්‍යයෝ නො දනිත්වා යි මසුරු බැවින් නො කියත්, එහෙයින් නිහඬවීම් පමණින් මුනි නම් නො වේ, පව් සන්සිඳවාලීමෙන් ම මුනි නම් වේ ය”යි වදාරා මේ ධර්මදේශනාව කළ සේක.

**න මොනෙන මුනී හොති මූළ්හරූපො අවිද්දසු,**
**යො ච තුලංව පග්ගය්හ වරමාදාය පණ්ඩිතො.**

**පාපානි පරිවජ්ජෙති ස මුනී තෙන සො මුනී,**
**යො මුනාති උභො ලොකෙ මුනී තෙන පවුච්චති.**

මුස වූ ගති ඇති අඥාන පුද්ගල තෙමේ මුවෙන් නො බැණ හුන් පමණින් මුනි නම් නො වේ. නුවණැති යමෙක් වනාහි

තරාදියක් ගෙණ සිටියකු මෙන්, ගත යුතු උතුම් ගුණය ගෙණ පාපයන් දුරු කෙරේ ද ඒ මුනි තෙමේ එකරුණෙන් මුනි නම් වේ. යමෙක් දෙලොව නුවණින් පිරිසිඳ දනී ද ඒ හෙතුයෙන් හෙතෙමේ මුනි යි කියනු ලැබේ.

**න මොනෙන මුනී හොති මූළ්හරූපො අවිද්දසු** = සිස් සැහැවි ඇති නුවණ නැති තැනැත්තේ නිහඬවීම් පමණින් මුනි නො වේ.

**මූළ්හරූප** නම්: සිස් සැහැවි ඇත්තේ ය. එලොව මෙලොව ගැණ යුතු අයුතු ගැණ පින් පව් ගැණ වරද නිවරද ගැණ දැනුම් නැත්තේ ය. මුළා වූයේ ය. **"මූළ්හරූපොති තුච්ඡරූපො"** යනු අටුවා. කිසිවක් නො දන්නේ **අවිද්දසු** ය. **"අවිද්දසූති අවිඤ්ඤූ"** යනු අටුවා. එකාර්ථවත් පදදෙකක් එක් තැන යෙදී සිටි කල්හි අධිකාර්ථයක් කියන බැවින් එසේ වූ මේ දෙපදය අධික මුළාබව ඇත්තකු කියන්නේ ය.

**යො ච තුලං ඉව පග්ගය්හ වරං ආදාය පණ්ඩිතො** = නුවණැති යමෙක් තරාදියක් ගෙණ අධිකය හැර අඩුව පුරන්නා සේ ශීල සමාධ්‍යාදිගුණය ගෙණ.

වර්තමාන ව්‍යවහාරයෙහි එන තරාදිය **තුලා** නම්: **"පක්ඛානං සමතාහිතභාවකාරණතො තුලයති මිණාති එතායාති = තුලා"** පක්ෂයන්ගේ සමභාවය කිරීමෙන්, දෙපක්ෂය සමකිරීමෙන් යමකින් මැණීම කෙරේ නම් ඒය තුලා.

**පාපානි පරිවජ්ජෙති** = පව් දුරු කෙරේ ද,[1]

**සො මුනි තෙන සො මුනි** = ඒ මුනි තෙමේ එකරුණෙන් මුනි නම් වේ.

**යො මුනාති උභො ලොකෙ මුනි තෙන පවුච්චති** = යමෙක් දෙලොව පිරිසිඳ දනී ද ඒ හෙතුයෙන් හෙතෙමේ මුනි යි කියනු ලැබේ.

නුවණැත්තේ තරාදියක් ගෙණ වැඩි දෑය බැහැර කොට අඩු දෑය බහා පුරන්නා සේ ශීලසමාධ්‍යාදී වූ උතුම් ගුණයෙහි පිහිටා ගෙණ පව් දුරු කරන්නේ ය. එසේ ම හෙතෙමේ සකන්ධලොක යෙහි ආධ්‍යාත්මික - බාහ්‍යසකන්ධාදී වූ උභයාර්ථයන් දන්නේ ය. එලොව මෙලොව හා ආත්මහිත පරහිත දන්නේ ය. එහෙයින් මුනි යි කියනු ලැබේ.[2-3],

ධර්මදෙශනාවගේ අවසානයෙහි බොහෝ දෙන සෝවන්පලාදී-යට පැමිණියාහුය.

**තිත්ථිකවස්තුව නිමි.**

---

1. 1. 10. 'පාපකාරි' යනු බලනු.
2. 3. 17. 5. 6. 11. 'මුනයො ලොකෙ ,, ,,

# බිලි වැද්දෙක්

## 19 — 9

**එක්** දවසක් බුදුරජාණන් වහන්සේ එක්තරා බිලිවැද්දකුට සෝවාන් මග ලැබීමට තුබූ හෙතුවාසනාගුණය දැක සැවැත් නුවර උතුරුවාසල් දොර සමීපයෙහි වූ ගමෙහි පිඬු සිඟා හැසිර භික්සඟුන් පිරිවරා ගෙණ බිලිවැද්දා බිලි බාන තැනින් වැඩම කළ සේක. එ වේලෙහි බිලි බාමින් සිටි ඒ වැදි, බුදුපාමොක් මහසඟුන් දැක බිලි පිත්ත පසෙක දමා නැඟී සිටියේ ය. බුදුරජාණන් වහන්සේ ඔහුට නො දුරෙහි නැවතී සිට "තමුසේ කවරහු? තමුසේ කවර නම් ඇතියහු?" යි ඈ ලෙසින් උන් උන් විචාළ සේක. උන්වහන්සේලා ද "මම සැරියුත්, මම මුගලන්" යන ඈ ලෙසින් වෙන වෙන ම තම තමන්ගේ නම් කියා පෑහ. එ වේලෙහි බිලි වැද්දා "බුදුරජාණන් වහන්සේ මෙහි සිටුනා හැම කෙනකුන්ගේ නම් විචාරණ සේක්, දැන් උන්වහන්සේ මාගේ නමත් විචාරණු ඇතැ"යි සිතී ය. බිලිවැද්දාගේ මේ සිතුවිල්ල දත් බුදුරජාණන් වහන්සේ "උපාසක! ඔබ කිනම් ඇතියහ?"යි විචාළ විට "සවාමීනි! මම ආයඕ නම් වෙමි"යි කී ය. "උපාසක! තා වැනි සතුන් මරා කන්නෝ ආයඕ නම් නො වෙති, ආයඕයෝ නම් මහාජනයාට හිංසා පීඩා නො කරන්නෝ ය, ඔවුහු රෑ දෙවෙනි අවිහිංසායෙන් ම කල් ගෙවන්නාහ"යි වදාරා මේ ධම් දෙශනාව කළ සේක.

**න තෙන අරියො හොති යෙන පාණානි හිංසති,**
**අහිංසා සබ්බපාණානං අරියොති පවුච්චතීති·**

යම් කරුණෙකින් ප්‍රාණීන් නසා ද, ඒ කරුණෙන් හේ ආයඕ නම් නො වේ. සියලු ප්‍රාණීන්ට හිංසා නො කිරීම හෙතු කොට ගෙණ ආයඕ යි කියනු ලැබේ.

**න තෙන අරියො හොති යෙන පාණානි හිංසති** = යම් කරුණෙකින් ප්‍රාණීන් නසා ද, ප්‍රාණීන්ට හිංසා කෙරේ ද, ඒ කරුණෙන් ආයඕ නම් නො වේ.

සත්ත්වයන් නසන්නේ සත්ත්වයන්ට හිංසා කරන්නේ ආයඕ නම් නො වේ යනු කෙටි අදහස ය. ආයඕ නම්: නියම විසින් මාගීඵලාවබොධය කොට සිටියේ ය.1

**පාණ** නම්: දිවි දරන්නේ ය. ජීව වායු බලයෙන් රෑදෙන්නේ ය. **"අණනි පසසසතීති = පාණො"** යනු බැවින් අස්සාස – පස්සාස

1. 2. 1. 'අරියානං ගොචරෙ රතා' යනු බලනු.

දෙකින් රැඳෙන්නේ ය. එහි විනයක්‍රම විසින් ඇතුළත නැඟී සුසුම් ලෑම **අස්සාස.** පිටත නැඟී සුසුම් ලෑම **පස්සාස.** සූත්‍ර ක්‍රම විසින් පිටත නැඟ ඇතුළත සුසුම් ලෑම **අස්සාස.** ඇතුළත නැඟ පිටත සුසුම් ලෑම **පස්සාස.** අස්සාස නම් පිටත නික්මෙන වාතය, පස්සාස නම් ඇතුළත පිවිසෙන වාතය, යි විනයාට්ඨකථායෙහි ආයේ ය. මවු කුසින් බිහි වන වේලෙහි පළමු කොට ඇතුළත රැඳී සිටි වාතය පිටතට නික්මෙන්නේ ය. ඉන් පසු ව පිටත සිටි වාතය සියුම් රජස් ගෙණ ඇතුළට පිවිසෙනුයේ තල්ල හැපී නිවී යන්නේ ය.[1]

**හිංසන්ති** යන ක්‍රියායෙන් ගැණෙන හිංසා කිරීම නම් හිංසාවට යටත් වන්නහු මස් ලේ නැත්තකු කොට දුකට පැමිණවීම ය. **අහිංසා** නම්: මෙහි හිංසා නො කිරීම ය.[2]

ධර්මදෙශනාවගේ අවසානයෙහි බිලී වැද්දා සෝවාන් පලයෙහි පිහිටියේ ය. ධර්මදෙශනා තොමෝ පැමිණ සිටි පිරිසට ද වැඩ සහිත වූය.

**බාලිසිකවත්ථුව නිමි.**

1. 10. 5. 'පාණීනං' යනු බලනු.
2. 14. 6. 'අට්ඨඞ්ගිකං මග්ගං' " "

# බුදුරජාතන් කළ අවවාදයෙක්

## 19 — 10

ශීලාදිගුණසම්පන්න භික්ෂූන් අතුරෙහි ඇතැම් කෙනකුන්හට "අපි පිරිපුන් සිල් ඇතියම්හ, අපි ධූතාඞ්ගධරයම්හ, අපි බහුශ්‍රැත යම්හ, අපි ප්‍රාන්තසේනාසනයන්හි, ඇලුනම්හ, අපි ධ්‍යානාභිඥ-ලාභිම්හ, එහෙයින් අපට රහත්වනු අරුමයෙක් නො වේ, තමන් කැමැති දවසෙක රහත් වන්නට හැක්කෙමු"යි මෙසේ අදහස් උපන. "දැන් අපට රහත්වීම ඉතා ලඟ ය, ඒ අසිරි නො වේ"යි ඒ භික්ෂූන් අතර සිටි අනාගාමීනට සිත් විය. ඒ සියල්ලෝ එක් ව දවසක් බුදුරජුන් වෙත ගොස් වැඳ එකත් පසෙක හුන්නාහු "කිම, මහණෙනි! තමුසේලාගේ පැවිදිකිස මුදුන් පැමිණියේ දැ?"යි උන්වහන්සේ අසා වදාළ කල්හි "ස්වාමිනි! අපි මෙබඳු මෙබඳු තරම් ඇතියම්හ, අපි කැමති මොහොතෙක රහත් වන්නට සමර්ථයම්හ"යි කීහ. ඉක්බිති බුදුරජාතන් වහන්සේ ඔවුන්ගේ බස් අසා "මහ-ණෙනි! මහණහු විසින් සිල් පිරීම් ඈ පමණකින් හෝ අනගැමිසුව ලැබීම් පමණකින් හෝ සසරදුක ටිකැ යි සලකන්නට නො වටී, ආස්‍රවක්ෂයට නො පැමිණ සුවපත්මි යි ද නො සිතිය යුතු ය"යි වදාරා මේ ධම්දෙශනාව කළ සේක.

> න සීලබ්බතමත්තෙන බාහුසච්චෙන වා පන,
> අථ වා සමාධිලාභෙන විවිත්තසයනෙන වා.
>
> ඵුසාමි නෙක්ඛම්මසුඛං අපුථුජ්ජනසෙවිතං,
> භික්ඛු විස්සාසමාපාදි අප්පත්තො ආසවක්ඛයං.

මහණ! ශිලයෙන් හා ව්‍රතයෙන් යුත් පමණින් හෝ නැවැත බහු ශ්‍රැතභාවයෙන් හෝ නොහොත් සමාධිලාභයෙන් හෝ කායවිවෙ-කයෙන් යුක්ත ව විසීමෙන් හෝ පුහුදුන් විසින් නො සෙවුනා ලද අනාගාමිඵලසැපය පහස්නෙමි යි හෝ රහත්පලයට නො පැමිණි (තෝ) භවයෙහි විශ්වාසයට නො පැමිණෙව.

න සීලබ්බතමත්තෙන = සිවු පිරිසිදු සිල් පමණින් හෝ කෙලෙස් ධූතගුණ පමණින් හෝ.[1]

බාහුසච්චෙන වා පන = නැවැත ත්‍රිපිටකධර්මය උගත් පමණින් හෝ.[2]

අථ වා සමාධිලාභෙන = නොහොත් රූපාරූප අෂ්ටසමාපත්ති ලද පමණින් හෝ.[3]

---

1. ½ 10. 'සීලවතං ගන්ධො' 7. 6. 'සුබ්බතො' යනු බලනු.
2. 15. 8. 'බහුස්සුතං ච' යනු බලනු.
3. 10. 10. 'සමාහිතා ච' යනු බලනු.

ප්‍රථම – ද්විතීය – තෘතීය – චතුර්ථධ්‍යාන යන රූපසමාපත්ති සතර හා ආකාසානඤ්චායතන–විඤ්ඤාණඤ්චායතන–ආකිඤ්චඤ්ඤායතන – නෙවසඤ්ඤානාසඤ්ඤායතන යන අරූපසමාපත්ති සතර රූපාරූප අෂ්ටසමාපත්තීහු ය.

**විවිත්තසයනෙන වා** = කායවිවෙකයෙන් යුක්තව විසීමෙන් හෝ.[1]

**ඵුසාමි නෙක්ඛම්මසුඛං** = අනාගාමිඵලසැපය පහස්නෙමි.[2]

**අපුථුජ්ජනසෙවිතං** = පුහුදුන් විසින් නො සෙවුනා ලද.[3]

**භික්ඛු** = මහණ.

**විස්සාසං** = භවයෙහි විශ්වාසයට.[4]

**මා ආපාදි** = නො පැමිණෙව.

**අප්පත්තො ආසවක්ඛයං** = රහත්පලයට නො පැමිණියා වූ (තෝ)[5]

මහණ! රහත්පලයට නො පත් තෝ, සීලයෙන් හා තෙලෙස් දුහඟින් යුත් පමණින්, තුන් පිටකය උගත් පමණින්, පිරිස් මැද විසීමෙන් වෙන්වීම් පමණින් සාමාන්‍ය කෙලෙස් සහිත මිනිසුන් නො සෙවුනු අනාගාමි ඵලසුඛය චිත්තබලයෙන් පහස්නෙමි යන මෙපමණින් භවයෙහි විශ්වාසයට නො පැමිණෙව යන අරුත්.

අනාගාමිඵලයට පැමිණි එහෙත් රහත්පලයට නො පැමිණි මහණහු ශීලසමාධ්‍යාදිගුණයෙහි පිරිපුන් ව සිටියහු ද මට ඉතිරි ව ඇති භවය ස්වල්ප ය, භවය ස්වල්ප ව ගියේ ය'යි භවයෙහි විශ්වාසය නො තැබිය යුතු ය. යම්සේ ස්වල්පමාත්‍ර වූ ද ගූථය දුර්ගන්ධ වේ ද එමෙන් ස්වල්පමාත්‍ර වූ ද භවය දුක් වේ, යනු භාවයි.

ධර්මදෙශනාවගේ අවසානයෙහි ඒ භික්ෂූහු රහත්බවෙහි පිහිටා ගත්හ. ධර්මදෙශනා තොමෝ පැමිණ සිටි පිරිසට ද වැඩ සහිත වූය.

**භික්ෂුවස්තුව නිමි.**

සකලජනධර්මාර්ථසඩ්ග්‍රහාභිලාෂී **පණ්ඩිත අම්බලම්ගොඩ ධම්මකුසල** ස්ථවිරයන් කළ **සද්ධර්මසාගර** නම් වූ ධර්මපදවර්ණනායෙහි ධර්මාර්ථවර්ගාත්මක එකෝනවිංශතිතමතරඞ්ගය නිමියේ ය.

---

1. 15 15. 'විමෙකමනුබ්‍රෑහයෙ' යනු බලනු.
2. 14. 2. 'නෙක්ඛම්මූපසමෙ' ,, ,,
3. 4. 12. පුථුජ්ජනෙ' ,, ,,
4. 15. 6. 'විස්සාසපරමා' ,, ,,
5. 15. 6. 'දුක්ඛස්සච අතික්කමං' ,, ,,

# මාර්ගවර්ගය

## ආ ගිය තැන් ගැණ කතා කළ භික්ෂූන් වහන්සේලා

### 20 — 1

**භික්ෂූන්** පන් සියයක් දෙනා වහන්සේ බුදුරජුන් දනවු සැරිසරා පෙරළා සැවැත් නුවරට වැඩම කළ කල්හි උවැටන්හලෙහි රැස් ව හිඳ "අසවල් ගමෙහි මග තොට වළගොඩැලි නැති ව සම ව පිහිටා තුබුනේ ය, ගල් මුල් ද එහි නො වි ය, අසවල් ගමට යන මග, වළගොඩැලි සහිත ය, කණු කටු ගැල්කැට බොහෝ ය" යන ඈ ලෙසින් තම තමන් ආ ගිය මග තොට ගැණ කතා කරමින් හුන්හ. ඒ වේලෙහි බුදුරජානන් වහන්සේ ඒ භික්ෂූන්ට රහත් වන්නට තුබූ වාසනා ගුණය දැක එ තැනට වැඩම කොට පණවා තුබූ අසුනෙහි වැඩ හිඳ "මහණෙනි! තමුසේලා දැන් මෙහි මා එන්නට කලින් කළ කතාව කිමැ?" යි විචාරා එය දන්වා සිටි කල්හි "මහණෙනි! තමුසේලා දැන් මෙහි කළ කතාව මිනිසුන් යන එන මග තොට ගැණ ය, එයින් තමුසේලාට වැඩෙක් නැත, එහෙයින් ඒ නො සුදුසු ය, මහණුන් විසින් කළ යුත්තේ අරිඅටඟිමග ගැණ කතා ය, අරිඅටඟිමගෙහි මහණුන් විසින් යොග කටයුතු ය, එය වඩන්නට උත්සාහ කළ යුතු ය, මෙසේ අරිඅටඟිමගෙහි යෙදෙන්නා වූ මහණ තෙමේ සියලු සසර දුකින් මිදේ ය, යි වදාරා මේ ධර්මදෙශනාව කළ සේක.

**මග්ගානට්ඨඞ්ගිකො සෙට්ඨො සච්චානං චතුරො පදා,**
**විරාගො සෙට්ඨො ධම්මානං ද්විපදානං ච චක්ඛුමා.**

**එසොව මග්ගො නත්ථඤ්ඤො දස්සනස්ස විසුද්ධියා,**
**එතං හි තුම්හෙ පටිපජ්ජථ මාරසෙසනං පමොහනං.**

**එතං හි තුම්හෙ පටිපන්නා දුක්ඛස්සන්තං කරිස්සථ,**
**අක්ඛාතො වෙ මයා මග්ගො අඤ්ඤාය සල්ලසන්ථනං.**

**තුම්හෙහි කිච්චං ආතප්පං අක්ඛාතාරො තථාගතා,**
**පටිපන්නා පමොක්ඛන්ති ඣායිනො මාරබන්ධනා'ති.**

මාර්ග අතුරෙහි අෂ්ටාඞ්ගිකමාර්ගය උතුම් වේ. සත්‍ය අතුරෙහි සත්‍ය පද සතර උතුම් වේ. ධර්ම අතුරෙහි නිර්වාණය උතුම් වේ. දෙපා ඇත්තවුන් අතුරෙහි බුදුරජ තෙමේ උතුම් වේ.

දර්ශනයාගේ විශුද්ධිය පිණිස මේ ම මාර්ගය වේ. අන් මගෙක් නැත්තේ ය. තෙපි මේ මගෙහි පිළිපදිවු. මෙය මරහු මුළා කරන්නේ ය.

මේ මගෙහි පිළිපන් තෙපි සසරදුක කෙළවර කරන්නහු ය. මා විසින් රාගාදී වූ කෙලෙස් උල් උපුටාලන මාර්ගය ඒකාන්ත යෙන් ප්‍රත්‍යක්ෂ විසින් දැන ප්‍රකාශ කරණ ලද්දේ ය.

තොප විසින් කෙලෙස් තවන වීර්‍ය්‍යය කටයුතු ය. තථාගත වරයෝ මග කියන්නාහු වෙත්. නිවන්මගට ධ්‍යාන කරන්නෝ ත්‍රෛභූමකවෘත්තයෙන් මිදෙන්නාහු ය.

**මග්ගානං** = මාර්ගයන් අතුරෙහි.

මෙහි **මග්ග** යන්නෙන් ලොකයෙහි ඇති තාක් කුදු මහත් පයින් යායුතු මං, රියෙන් යායුතු මං ඈ විසින් ගම්-ගඞ්ගා-පොකුණු-කුඹුරු ආදීන්ගේ අවටින් අවුත් ගමට පිවිසෙන නන් වැදෑරුම් මං කියත්. **"මහන්තඅමහන්තජඞ්ඝමග්ගසකටමග්ගාදිවසෙන නානාවිධා සාමන්තගාමනදීතලාකඛෙත්තාදීහි ආගන්ත්වා ගාමං පවිසනමග්ගා"** යනු විසින් ඒ කියන ලද්දේ ය. මෙහි ආදි ශබ්දබලයෙන් අහස්මං, මුහුදුමං, ඇළ දෙළ විල් අසල මං ගණිත්. මේ මෙහි නිරුක්ති:- **"පටිකොහි මජ්ජතෙ නිබ්බිණං කරීයතෙති= මග්ගො"** යනු. මග යන්නන් විසින් තෘණරහිත කරණු ලබන්නේ 'මග්ග' නම්. **'මජ්ජ + සංසුද්ධියං'** යන ධාතුයෙන් නිපන්නේ ය. **"පටිකොහි මග්ගීයතෙති වා=මග්ගො"** මග යන්නන් විසින් සොයනු ලබන්නේ හෝ 'මග්ග' නම්. **'මග්ග + ගවෙසනෙ'** යනු එහි ධාතු යි. මග්ග ශබ්දයෙන් මෙහි දෙසැට මිසදිටු ද ගැණේ. **'මග්ගානං'** යන මෙයින් 'ඒ හැම මාර්ගයන් අතුරෙහි' යි අරුත් ගත යුතු ය.

**අට්ඨඞ්ගිකො** (මග්ගො) **සෙට්ඨො** = අෂ්ටාඞ්ගිකමාර්ගය ශ්‍රෙෂ්ඨ වේ.

ජඞ්ඝමාර්ග-ශකටමාර්ග-ද්වාෂෂ්ටිදෘෂ්ටිමාර්ගයන් අතුරෙහි, එකෙකිනුදු නිවනට යන්නට නො හැකි ය. ආර්‍ය්‍යභාවය සිදු කරන්නට නො හැකි ය. ඒ සිදු කරන්නට හැකි එක් ම මාර්ගය අෂ්ටාඞ්ගික මාර්ගය යි. මේ ම චතුස්සත්‍යාවබොධය කරන්නා වූ එක් ම මාර්ගය වේ. **"යාවතා භික්ඛවෙ! ධම්මා සඞ්ඛතා, අරියො අට්ඨඞ්ගිකො මග්ගො තෙසං අග්ගමක්ඛායති, යෙ භික්ඛවෙ! අරියෙ අට්ඨඞ්ගිකෙ මග්ගෙ පසන්නා, අග්ගෙ තෙ පසන්නා, අග්ගෙ ඛො පසන්නානං අග්ගො විපාකො හොති"** යනු ද මෙහිලා දත්තේ ය. මහණෙනි! යම් පමණ හෙතුයෙන් හටගත් ධර්මයෝ වෙත් ද, ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගික මාර්ගය ඔවුනට අග්‍රය යි කියනු ලැබේ. මහණෙනි! යම් කෙනෙක් ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගිකමාර්ගයෙහි පහන් වෙත් ද ඔවුහු අග්‍රස්ථානයෙහි පහන් වූවෝ වෙත්. අග්‍රස්ථානයෙහි පහන් වූවනට අග්‍ර විපාකයෙක් වන්නේ ය, යනු අරුත්.

මේ නිරුක්ති: **"මං සිවං ගච්ඡති එතෙනාති=මග්ගො"** මෙයින් නිවනට යේනු යි 'මග්ග' නම්. ආර්ය්‍යමාර්ගය යි. **"අවිජ්ජා-සම්මූළ්හෙහි මග්ගෙතබ්බොති වා නිබ්බානත්ථිකෙහි මග්ගීය-තීති=මග්ගො"** අවිද්‍යායෙන් මුළාවූවන් විසිනුදු සෙවිය යුතු වූයේ, නිවන් කැමැත්තන් විසින් සොයනු ලබනුයේ 'මග්ග' නම්. එහෙයින් ලොකයෙහි ඇති තාක් මාර්ගයන් අතුරෙහි ආර්ය්‍ය අෂ්ටාඞ්ගිකමාර්ගය ම ශ්‍රෙෂ්ඨ ය, යි වදාළ සේක. **"සබ්බෙසම්පි මග්ගානං සම්මාදිට්ඨි ආදීහි අට්ඨහි අඞ්ගෙහි මිච්ඡාදිට්ඨි ආදීනං අට්ඨන්නං පාපධම්මානං පහාණකරො නිරොධං ආරම්මණං කත්වා චතූසුපි සච්චෙසු දුක්ඛපරිජානනාදිකිච්චං සාධයමානො අට්ඨඞ්ගිකො මග්ගො සෙට්ඨො උත්තමො"** යනු අටුවා.[1] **මග්ග** ශබ්දය පටිපදා-උපාය-කථාපබන්ධාදියෙහි ද හෙන්නේ ය.

**සච්චානං චතුරො පදා** = සත්‍ය අතුරෙහි සත්‍යපද සතර ශ්‍රෙෂ්ඨ වේ.

**"සච්චං භණෙ න කුජ්ඣෙය්‍ය"** යනු විසින් ආ වාක්සත්‍යය හෝ වේවා, **"සච්චො බ්‍රාහ්මණො, සච්චො ඛත්තියො"** යනු විසින් ආ සම්මුතිසත්‍යය හෝ වේවා, **"ඉදමෙව සච්චං මොඝ-මඤ්ඤං"** යනු විසින් ආ දෘෂ්ටිසත්‍යය හෝ වේවා, **"එකං හි සච්චං න දුතියං අත්ථි"** යනු විසින් ආ පරමාර්ථසත්‍යය හෝ වේවා, මෙයින් අන්‍ය වූ සත්‍යයෙක් වේ නම් ඒ හෝ වේවා, යන මේ සියලු සත්‍යයන් අතුරෙහි, පිරිසිඳ දතයුතු අරුතෙන්, පැහිය යුතු අරුතෙන්, ප්‍රත්‍යක්ෂ කටයුතු අරුතෙන්, වැඩිය යුතු අරුතෙන්, එකවට පිළිවිදිය යුතු අරුතෙන්, ඇති සැටි පිළිවිදිය යුතු අරුතෙන් **"දුක්ඛං අරියසච්චං"** යනු හා **"දුක්ඛසමුදයං අරියසච්චං"** යනු හා **"දුක්ඛනිරොධං අරියසච්චං"** යනු හා **"දුක්ඛනිරොධගාමිනී අරියසච්චං"** යනු හා ශ්‍රෙෂ්ඨ වූ පදසතර වේ. උතුම් වූ පද සතර වේ. මෙයින් අන්‍ය වූ පදයෝ ශ්‍රෙෂ්ඨ නො වෙත්. එහි වාක්සත්‍ය නම්: නිබොරුබස ය. සම්මුති සත්‍ය නම්: යමකට හෝ යමක්හට කටයුතු පහසු වනු සඳහා පණවා ගත් නාම ය. දෘෂ්ටිසත්‍ය නම්. තමන් ගත් මිථ්‍යාව ම සත්‍ය ය, ඉන් බැහැරිය සිස් ය, බොරුය යි ගත් දෘෂ්ටිය ය. පරමාර්ථ සත්‍ය නම්: ස්කන්ධ-ධාතු-ආයතනාදී විසින් කෙරෙණ දෙශනා ය. මාර්ගය හා නිවන කිය වේ.

**විරාගො සෙට්ඨො ධම්මානං** = ධර්ම අතුරෙහි නිවන ශ්‍රෙෂ්ඨ වේ.

---

1. 14. 6. 'අරියඤ්චට්ඨංගිකංමග්ගං' යනු බලනු.

මේ මෙහිලා දතයුතු ය. **"යාවතා භික්ඛවෙ! ධම්මා සඞ්ඛතා වා, විරාගො තෙසං ධම්මානං අග්ගමක්ඛායති, යදිදං මදනිම්මදනො පිපාසවිනයො ආලයසමුග්ඝාතො වට්ටූපච්ඡෙදො තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බානං, යෙ භික්ඛවෙ! ධම්මෙ පසන්නා, අග්ගෙ තෙ පසන්නා අග්ගෙ ඛො පන පසන්නානං අග්ගො විපාකො හොති"** යනු.

මහණෙනි! හෙතු බලයෙන් හට ගත්තා වූ හෝ හෙතුබලයෙන් නො හට ගත්තා වූ යම් පමණ ධර්මයෝ වෙත් ද, නිවන ඔවුනට අග්‍ර ය, යි කියනු ලැබේ. රාගාදිමද මඩින්නා වූ පවස සන්සිඳුවන්නා වූ තෘෂ්ණාසඞ්ඛ්‍යාතආලය නසන්නා වූ සසරදුක් නසාලන්නා වූ තෘෂ්ණාව ගෙවා ලන්නා වූ පහ වූ රාගය ඇති නිරොධ සඞ්ඛ්‍යාත වූ නිවන ය ඒ අග්‍ර වනුයේ. මහණෙනි! යම් කෙනෙක් ඒ විරාගධර්මයෙහි පහන් වෙත් ද, ඔවුහු අග්‍රස්ථානයෙහි පහන් වූවෝ වෙත්. අග්‍රස්ථානයෙහි පහන් වූවනට අග්‍රවිපාකයෙක් වන්නේ ය, යන අරුත්.[2]

**ද්විපදානං ච චක්ඛුමා** = දෙපා ඇත්තවුන් අතුරෙහි බුදුරජ තෙමේ ශ්‍රෙෂ්ඨ වේ.

**"යාවතා භික්ඛවෙ! සත්තා අපදා වා දිපදා වා චතුප්පදා වා බහුප්පදා වා රූපිනො වා අරූපිනො වා සඤ්ඤිනො වා අසඤ්ඤිනො වා නෙවසඤ්ඤිනාසඤ්ඤිනො වා, තථාගතො තෙසං අග්ගමක්ඛායති අරහං සම්මාසම්බුද්ධො, යෙ භික්ඛවෙ! බුද්ධෙ පසන්නා, අග්ගෙ තෙ පසන්නා, අග්ගෙ ඛො පන පසන්නානං අග්ගො විපාකො හොති"** යන මේ ව්‍යක්තිය දන්නේ ය.

මහණෙනි! පා නැත්තා වූ හෝ දෙපා ඇත්තා වූ හෝ සිවුපා ඇත්තා වූ හෝ බොහෝ පා ඇත්තා වූ හෝ රූපී වූ හෝ අරූපී වූ හෝ සංඥී වූ හෝ අසංඥී වූ හෝ නෛසංඥීනාසංඥී වූ හෝ යම් පමණ සත්ත්වයෝ වෙත් ද, සම්මා සම්බුදුරජානන් වහන්සේ ඔවුනට අග්‍රහ යි කියනු ලැබෙත්. මහණෙනි! යම් කෙනෙක් බුදුරජුන් කෙරෙහි පහන් වෙත් ද එවුහු අග්‍රස්ථානයෙහි පහන් වූවෝ වෙත්. අග්‍රස්ථානයෙහි පහන් වූවනට අග්‍ර විපාකයෙක් වන්නේය, යන අරුත්.

මෙහි **අපදා** නම්: නයි – පොළොන් – පිඹුරු – ගැරඬි ආදීන් හා මත්ස්‍ය ජාතීහු ය. **දිපදා** නම්: දෙවි – බඹ – මිනිස් – යක් – රකුස් ආදීන් හා පක්ෂිජාතීහු ය. **චතුප්පදා** නම්: ඇත් - අස් – ගොන් – කොටලු – එළු – බැටලු ආදීහු ය. **බහුප්පදා** නම්: පත්තෑ – හැකරැලි ආදීහු ය. **රූපී** නම්: කාමාවචර-රූපාවචර සත්ත්වයෝය.

1. 14. 6. 'දුක්ඛස්ස ච අතික්කමං' යනු බලනු.

**සංඥී** නම්: සංඥභවයෙහි උපන්නෝ ය. **අසඥ්ඥී** නම්: අසංඥ භවයෙහි උපන්නෝ ය. **නෙවසංඥීනාසංඥී** නම්: භවාග්‍රයෙහි උපන්නෝ ය. ලෝකයෙහි ඇති තාක් මේ කියූ සත්ත්වයන් අතුරෙහි සම්මා සම්බුදුරජාණන් වහන්සේ අද්විතීයහ. අප්‍රතිමයහ. අප්‍රති-සමයහ. අප්‍රතිභාගයහ. අප්‍රතිපුද්ගලයහ. අසමයහ. අසමසමයහ.

**මසැස - දිවැස - පැණැස - බුදුඇස - සමතැස** යන පසැසින් යුක්ත බැවින් බුදුරජාණන් වහන්සේ **චක්‍ඛුමන්තු** නම්. විබත් ගත්තේ **චක්‍ඛුමා** ය. එහි සිවුරගින් යුත් ගනඳුරෙහි ද යොදුනක් ඝන වූ විදුරුගල් පවා විනිවිද දක්නට හැකි පස් පැහැයෙන් දිස්නා පියවි ඇස, මසැස නම් ය. චුතූපපාතැ යි කියූ මැරෙණ - උපදින සත්ත්වයන් දක්නා දිබ්බචක්‍ඛුඥාණය, දිවැස නම් ය. කාලත්‍රයවිෂය වූ සර්වධර්මයන් එකකුත් නො හැර දක්නා නුවණ පැණැස නම් ය. දශසහස්‍රීලෝකධාතුයෙහි අල්පරජස්ක - මහා රජස්කාදි සත්ත්වයන් දක්නා නුවණ, බුදුඇස නම් ය. සබ්බඥ්ඥුත ඥාණය, සමතැස නම් ය.

**එසො ව මග්ගො නත්ථි අඤ්ඤො දස්සනාය විසුද්ධියා** = දර්ශන-යාගේ විශුද්ධිය පිණිස මේ ම මාර්ගය වේ. අන්‍යමාර්ගයෙක් නැත්තේ ය.

මාර්ගඵලසඞ්ඛ්‍යාතදර්ශනයාගේ පිරිසිදුබවට එක් ම මාර්ගය අෂ්ටා-ඞ්ගිකමාර්ගය යි. ඒ හැර අන් මගෙක් නැත්තේ ය. මාර්ගඵලඥානය ලැබීමට අෂ්ටාඞ්ගිකමාර්ගය ම වැඩිය යුතු ය. සිවුසස් හා නිවන දක්නා මගපලනුවණ, **දස්සන** නම්.[1]

**එතං හි තුම්හෙ පටිපජ්ජථ** = තෙපි මේ මගෙහි පිළිපදිවු.

නිවන් ලැබීමට සසර දුක් මුළුමනින් අවසන් කිරීමට ඇති එක ම මග, අෂ්ටාඞ්ගිකමාර්ගය බැවින්, එය ලෞකික - ලොකොත්තර විසින් වඩා ගන්නට ඒ මගින් නිවන් ලබන්නට උත්සාහවත් විය යුතු ය.

**මාරස්ස එතං පමොහනං** = මේ අෂ්ටාඞ්ගික මාර්ගය මරු මුළා කරන්නේ ය.

කෙලෙස් මරුසෙන් පරයන බැවින් හා දෙව්පුත් මරුට විෂය නො වන බැවින් හා අෂ්ටාඞ්ගිකමාර්ගය මරුට මහත් අවුලෙකි. මහත් මුළාවෙකි. මරහු බැඳ තැබීමෙකි. එහෙයින් **මාරපමොහන** නම් වේ.

**එතම්හි තුම්හෙ පටිපන්නා දුක්ඛස්සන්තං කරිස්සථ** = මේ මගෙහි පිළිපන් තෙපි සසර දුක් කෙළවර කරන්නාහු ය.

1. 14 6 'දුක්ඛස්ස ච අතික්කමං' යනු බලනු.

සියලු සසරදුක් කෙළවර වනුයේ නිවන් ලැබීමෙනි. නිවන සංසාරදුක්ඛයාගේ කෙළවර ය. දුක් හා එහි කිසිත් හැපීමෙක් නැත්තේ ය. දුක් නැති කිරීමෙහි මාර්ගය, අෂ්ටාඞ්ගිකමාර්ග ය යි. එහෙයින් එහි පිළිපැද දුක් කෙළවර කරවු,යි මෙයින් වදාළ සේක.

**අක්ඛාතො වෙ මයා මග්ගො අඤ්ඤාය සල්ලසන්ථනං** = රාගාදී වූ හුල් උදුරණ මග දැන මේ මග එකාන්තයෙන් මා විසින් කියන ලදී.

**අඤ්ඤාය** දැන. මේ දැනීම ප්‍රත්‍යක්ෂසිද්ධ ය. අනුන්ගෙන් අසා දැන හෝ මේ මෙසේ විය යුතු ය යි අනුමානයෙන් හෝ දැන ගැණීමෙක් නො වේ. ඇසින් දුටු සේ නුවණින් දක්නා ලද්දේ ය, යනු අරුත්.

රාග-ද්වෙෂාදිකෙලශධර්මයෝ අරමුණු ලැබ සිත්හි වහා නැගී සත්ත්වයන් විදින පෙළන බැවින් **සල්ල** නම් වෙත්. රාග සල්ලාදීන්ගේ නිමමථනය මැඩලීම උපුටාලීම **සල්ලසන්ථන** නම් වේ.

**තුම්හෙහි කිච්චං ආතප්පං** = තොප විසින් කෙලෙස් තවන වීය්‍ය්‍යය කටයුතු ය.

**ආතප්ප** නම්: වීය්‍ය්‍ය යි. මෙයින් ගැණෙන වීය්‍ය්‍යය සාමාන්‍ය වීය්‍ය්‍යයෙක් නො වේ. මේ වනාහි උපන් කෙලෙස් නැසීම, නො උපන් කෙලෙසුනට උපදින්නට නො දීම, නො උපන් කුසල් උපදවාලීම, උපන් කුසල් වැඩීම යන කෘත්‍යය සතරක් සිදු කරණ සම්‍යක්ප්‍රධානවීය්‍ය්‍යය යි. ඒ මේ වීය්‍ය්‍යය කෙලෙස් තවාලන බැවින් 'ආතප්ප' යි කියනු ලැබේ. එහෙයින් තොප විසින් උපන් කෙලෙස් සිඳ හරිණු පිණිස, නො උපන් කෙලෙස් නො උපදනා පිණිස, නො උපන් කුසල් උපදනා පිණිස, උපන් කුසල් වැඩෙනු පිණිස වීය්‍ය්‍යය කටයුතු ය,යි වදාළ සේක.[1]

**අක්ඛාතාරො තථාගතා** = තථාගතවරයෝ (මග) කියන්නෝ ය.

තථාගතයන් වහන්සේලා යායුතු මග, නිවන් ලබන පිළිවෙත වදාරණු විනා අතින් ගෙණ තර්ජනය කොට බලයෙන් ගෙණ කිසිවකු නිවනට නො ද පමුණුවන්නාහ.[2]

**පටිපන්නා පමොක්ඛන්ති ඣායිනො මාරබන්ධනා** = නිවන් මඟට පිළිපන් ධ්‍යාන කරන්නෝ මාරබන්ධනයෙන් මිදෙන්නාහු ය.

---

1. 10. 10. 'ආතාපිනො' යනු බලනු
2. 18. 12. 'තථාගතා' ,, ,,

ශමථ – විදශීනා විසිත් නිතර භාවනායෙහි යෙදී වසත්තෝ නිවත්මගෙහි පිළිපදිත්තෝ මාරබඣන යයි කියූ ත්‍රෛභූමකවෘතත යෙත් මිදෙත්නාහු ය.[1]. [2].

ධම්දෙශනාවගේ අවසානයෙහි ඒ භික්ෂූහු රහත්බවෙහි පිහිටා ගත්හ. ධම්දෙශනා තොමෝ පැමිණ සිටි පිරිසට ද වැඩ සහිත වූ ය.

**පඤ්චශතභික්ෂුවස්තුව නිමි.**

1. 2. 1. 'ඛායිතො' යනු බලනු.
2. 3. 1. 'මාරධෙය්‍යං' ,, ,,

# අනිත්‍යානුදර්ශනය වැඩූ පන් සියයක් භික්ෂූන් වහන්සේලා

## 20 — 2

**දවසක්** පන් සියයක් භික්ෂූන් වහන්සේලා බුදුරජානන් වහන්සේ වෙත ගොස් කමටහන් උගෙණ වන මැද කමටහන්හි යොග කරන් නාහු රහත් වන්නට නො හැකි ව නැවැත කමටහන් විශෙෂ කොට උගන්නෙමු'යි බුදුරජුන් වෙත ආහ. එකල්හි බුදුරජානන් වහන්සේ "මොවුනට සත්ප්‍රාය වනුයේ කිනම් කමටහනැ"යි බලා වදාරණ සේක් "මොවුන් කසුප් බුදුරජුන් දවස අවුරුදු විසි දහ-සක් මුළුල්ලෙහි සංසකාරයන් පිළිබඳ අනිත්‍යලක්ෂණයෙහි යොග කොට සිටුනා බැවින් මොවුනට අනිත්‍යලක්ෂණය වැඩීම සත්ප්‍රාය වන්නේ ය, එහෙයින් අනිත්‍යලක්ෂණ දක්වා මොවුනට එක් ම ගාථා වක් දෙසිය යුතු ය"යි දැක "මහණෙනි! කාමභවාදියෙහිවූ සියලු ම සංසකාරයෝ ඉපද නැසෙන බැවින් අනිත්‍යයහ"යි වදාරා මේ ධර්ම දෙශනාව කළ සේක.

**සබ්බෙ සඞ්ඛාරා අනිච්චාති යදා පඤ්ඤාය පස්සති,**
**අථ නිබ්බින්දති දුක්ඛෙ එස මග්ගො විසුද්ධියාති.**

සියලු සංසකාරයෝ අනිත්‍යයහ යි යම් කලෙක නුවණින් දකී ද එකල්හි, දුකෙහි කළ කිරෙයි. මෙය නිවනට මග වේ.

**සබ්බෙ සඞ්ඛාරා අනිච්චා ඉති** = සියලු සංසකාරයෝ අනිත්‍යහ යි.

**සබ්බ** යනු කියනලදී. – කාම – රූප – අරූප යන භවත්‍රය යෙහි පහළ වූ රූපාරූපස්කන්ධයෝ ය **සඞ්ඛාර**. ඔවුහු නම්: සඞ්ඛතසඞ්ඛාරයෝ ය. **"පච්චයෙහි සඞ්ඛරීයන්තීති සඞ්ඛාරාති ලද්ධනාමා පඤ්චක්ඛන්ධා"** යනු සඞ්ඛාරයන්නෙහි අරුත් හෙළි කරමින් ස්කන්ධපඤ්චකය නො අඩුව ලැබෙන පඤ්චවොකාර භවය මුල් කොට කියන ලද්දේ ය. **"කාමභවාදීසු උප්පන්නා ඛන්ධා"** යනු එය ම ව්‍යක්ත කරන්නේ ය. එකවොකාර – චතුවොකාරභව යන් පිළිබඳ ස්කන්ධයෝ ද මෙහි ම ඇතුළත් වෙත්. මෙහි ආදි-ශබ්දය එය කියන්නේ ය.[2]

---

1. 10. 1. 'සබ්බෙ තසන්ති දණ්ඩස්ස' යනු බලනු
2. 1. 1 'ධම්මා' ,, ,,
,, 4. 1. 'කො ඉමං පඨවිං' ,, ,,
,, 18. 10 'සඞ්ඛාරා' ,, ,,

පූර්ව-අපර දෙ කෙළවර ඇති බැවින්, නිති නො පවත්නා බැවින්, කල් නො පවත්නා බැවින්, ඇසිල්ලක් ම පවත්නා බැවින් නිත්‍ය නො වෙත් නු යි අනිත්‍යයහ. **"ආදිඅන්තවන්තතො අනිච්චන්තිකතො තාවකාලිකතො ඛණපභිඞ්ගතො ච න නිච්චන්ති අනිච්චං"** යනු අටුවා.

යද **පඤ්ඤාය පස්සති** = යම් කලෙක නුවණින් දකී ද.

මෙහි **පඤ්ඤා** යනු වදාළේ පඤ්චස්කන්ධයෙහි හෙවත් සංස්කාර ධර්මයන්ගේ අනිත්‍යාදිලක්‍ෂණ තතු අරුත් විසින් දත යුත්තේ විදර්ශනාඥානයෙනැ යි දක්වනු පිණිස ය. පඤ්චස්කන්ධය නාම විසින්, රූප විසින්, ධාතු විසින්, ආයතන විසින්, ඉන්ද්‍රිය විසින්, ප්‍රත්‍යය විසින්, ප්‍රත්‍යයොත්පන්න විසින් වෙන් වෙන් කොට ගෙණ නො වඩා ගත් නො මෝරවා ගත් නුවණින් සංස්කාරධර්මතත්ත්වය ඇති සැටියෙන් අවබොධ කට නො හැකි ය. එහෙයින් 'විදර්ශනා නම් කිමැ'යි පොතපතෙහි දක් වූ විස්තර විසින් කියයුතු වුවත් මෙහිලා එය කළ නො හැකි ය. ඒ තරමට විදර්ශනාකථාව දීර්ඝ ව සිටුනී ය. එහිලා මෙහි එන්නී ඉතා කෙටි කතාවකැ යි දැන විස්තරකථාව දනු පිණිස විසුද්ධිමග්ග පටිසම්භිදාමග්ගාදිය බැලිය යුතු ය.

**විදර්ශනා** නම්: පඤ්චස්කන්ධයෙහි හෙවත් නාම – රූපධර්මයන් ගේ එකෙනෙකට වෙනස් ව සිටි, එකෙනෙකට අසාධාරණ ව සිටි ලක්‍ෂණ හා, ඒ හැම එකක්හු කෙරෙහි සාධාරණත්වයෙන් සිටි අනිත්‍යාදිලක්‍ෂණ දැනීම ය. මේ දැනීම පඤ්චස්කන්ධය, සත්ත්ව – පුද්ගල – ස්ත්‍රී – පුරුෂ-ගෘහ-පර්වත- වෘක්‍ෂ – ලතාදියට නගා ගෙණ, පෙරළා ගෙණ ඒ විසින් දැනීමට වඩා විශිෂ්ට බැවින් දුක් තරණය කිරීමට හිත බැවින් විදර්ශනා යි කියනු ලැබේ. සත්ත්ව පුද්ගලාදි- ප්‍රඥප්තිමාත්‍රයෙහි සම්මුතියෙහි පිහිටි සාමාන්‍ය ලොකයාගේ නාම- රූපධර්ම, සත්ත්ව – පුද්ගලාදිවශයෙන් ගැණීම එහි මූලාබව නිසා වන්නේ ය. ඒ වනාහි සාමාන්‍ය දර්ශනයෙක් වේ. විදර්ශනා නම් නො වේ.

**"පඤ්චක්ඛන්ධෙ අනිච්චාදිවසෙන විවිධා පස්සතීති = විපස්සනා, අනිච්චාදිවසෙන විවිධෙහි ආකාරෙහි ධම්මෙ පස්සතීති= විපස්සනා"** යනු විසින් විදර්ශනා නම් කිමැ යි ඉතා සැකෙවින් කියන ලද්දේ ය. ඒ මේ විදර්ශනාඥානය සිල් ඇති ව සිටිය ද ලෞකිකය ගැණ කාමවස්තූන් ගැණ සිතමින් බලමින් පතමින් කල් ගෙවන්නන් විසින් ලැබිය හැකි නො වේ. ඒ පිණිස පිළිවෙ- ළින් සීලවිසුද්ධි – චිත්තවිසුද්ධි – දිට්ඨිවිසුද්ධි – කඞ්ඛාවිතරණවිසුද්ධි – මග්ගාමග්ගඤාණවිසුද්ධි – පටිපදාඤාණදස්සනවිසුද්ධි – ඤාණදස්සන

විසුද්ධි යන සප්තවිශුද්ධීන් අතුරෙහි පූර්වාවස්ථායෙහි සීලවිසුද්ධිය පටන් පටිපදාඤාණදස්සනවිසුද්ධිය කෙළවර කොට සිටි ෂට් විශුද්ධීන්ගෙන් විශුද්ධියට පිරිසිදු බවට පැමිණිය යුතු ය. ඔහුට ම ය මාර්ගාධිගමාවස්ථායෙහි ඤාණදස්සනවිසුද්ධියෙන් ද විශුද්ධිය ලැබෙන්නී. මේ සත්වන විශුද්ධියෙන් පිළිවෙළින් විශුද්ධ වන්නේ ම මඟින් මග කෙලෙස් නසා ලනුයේ ම නිවන් දක්නේ ය.

මෙහි ලා පළමු කොට සීලවිසුද්ධියෙන් කය - වචන දෙක මුළුමනින් පිරිසිදු කර ගතයුතු ය. ශීලයෙන් ගුණයනට තැන් විය යුතු ය. සිල් නැත්තේ ගුණවත් නො වේ. ඒ මේ ශීලවිශුද්ධිය යත්තමකින් නො විය යුතු ය. ශීලවිශුද්ධියෙන් පිරිසිදු බවට නො පැමිණියේ චිත්තාවිශුද්ධි ආදියෙන් පිරිසිදුබවට යන්නේ ය, යනු නො වන්නේ ය. කය - වචන පිරිසිදු නො වූවහුගේ සිත පිරිසිදු නො වන බැවිනි.

ශීලය නම්: කය - වචන දෙක්හි සංවර ය යි. එය පංචසීල-අෂ්ටාඞ්ගසීලාදීන්ගේ වශයෙන් වනුයේ නන්වැදූරුම් ය. පිළිවෙළින් ප්‍රණීත - ප්‍රණීතතර - ප්‍රණීතතම වශයෙන් නැඟී යන්නේ ය. සිල් අතුරෙහි ශ්‍රේෂ්ඨ වනුයේ සිවු පිරිසිදු සීලය යි. ඒ ම සීලවිසුද්ධිය යි දතයුතු යි. **“තත්ථ සීලවිසුද්ධි නාම සුපරිසුද්ධං පාතිමොක්ඛසංවරාදි චතුබ්බිධං සීලං”** යනු කීයේ එහෙයිනි. ඒ යට කියන ලදි.[1]

කාමච්ඡන්දාදිනීවරණධර්මයන් ඔබාලීමෙන් යටපත් කිරීමෙන් ලැබෙන චිත්තසමාධිය, චිත්තවිසුද්ධි නම්. **“චිත්තවිසුද්ධි නාම සඋපචාරා අට්ඨ සමාපත්තියො”** යි ඒ ආයේ ය. ඒ මේ සමාධිය උපචාර- අර්පණා විසින් දෙවැදූරුම් ය. උපචාර නම්: අර්පණාවට පැමිණීමට කලින් අර්පණාවට ලං ව සිටි සමාධිය යි. හේ කාමාවචර ය. රූපාවචර - අරූපාවචරසමාධි ය යි ගැණෙන අෂ්ටසමාපත්තිය අර්පණාසමාධි නම්. විස්තර යට කියන ලදි.[2]

මෙසේ මූලභූත වූ සීලවිසුද්ධියෙහි හා චිත්තවිසුද්ධියෙහි පිහිටා අනතුරු ව නාම - රූපධර්මයන්ගේ ඇති තතු පිරිසිඳ දැනීම නම් වූ දිට්ඨිවිසුද්ධිය සැපයිය යුතු ය. දිට්ඨිවිසුද්ධි නම්: නාම - රූපධර්මයන්ගේ ඇති තතු නියම විසින් පිරිසිඳ දැනීම ය. **“නාමරූපානං යථාවදස්සනං දිට්ඨිවිසුද්ධි නාම”** යනු විසින් එය කිහ. මේ වනාහි නාම - රූපධර්මයන්ගේ ඇති තතු දැනීමෙන් දෙසැට මිසදිටු බිඳහරිණ නුවණ ය.

---

1. 4. 10. ‘සීලවතං ගන්ධො’ යනු බලනු
2. 2. 1. ‘ඣායිනො’, ,, ,,

විදර්ශනාවට කරුණු වූ ෂට් විශුද්ධීන් අතුරෙහි මූලභූත වූ සීලවිසුද්ධි - චිත්තවිසුද්ධි දෙකට අනතුරු ව ලැබෙන ශරීරභූත වූ විශුද්ධි සතරෙහි ප්‍රථමවිශුද්ධිය සේ ගැණෙන දිට්ඨිවිසුද්ධිය සපයනු කැමැති යෝගීන් අතුරෙහි කෙනෙක් භාවනාකර්මයෙහි යෙදුනෝ් පඤ්චෝපාදානස්කන්ධය, නාම-රූප විසින්, කෙනෙක් පඨවී ආදි චතුර්විධ ධාතු විසින්, කෙනෙක් අෂ්ටාරශධාතු විසින්, කෙනෙක් ද්වාදශායතන විසින්, කෙනෙක් පඤ්චස්කන්ධ විසින් නුවණින් විමසා පිරිසිඳ බලන්නාහ.

පඤ්චස්කන්ධය, මෙසේ නාම - රූප විසින්, චතුර්විධ ධාතු විසින්, අෂ්ටාරශධාතු විසින්, ද්වාදශායතන විසින්, පඤ්චස්කන්ධ විසින් බැලීම ඉතා කෙටියෙන් බැලීම ය. බැලීමැ යි කීයේ නුවණින් පිරිසිඳීම ය. පිරිමැදීම ය.

එහි ඉතා කෙටියෙන් පිරිසිඳිනුයේ පඤ්චස්කන්ධය, නාම-රූප විසින් දෙකඩ කොට 'මේ නාමය රූපය නො වේ, මේ රූපය නාම නො වේ, නාමය රූපයෙන් අනෙකෙක, රූපය නාමයෙන් අනෙකෙක, නාම - රූප දෙකෙන් අන්‍ය වූ ආත්මයෙක් ජීවයෙක් සත්ත්වයෙක් පුද්ගලයෙක් නැතැ යි පිරිසිඳින්නේ ය. නාම-රූප දෙක්හි එසේ නිෂ්ඨාවට යන්නේ ය.

විස්තර විසින් පිරිසිඳිනුයේ එක් එක් ධාතුව, එක් එක් ස්කන්ධය, එක් එක් ආයතනය, එකක් එකක් විසින් චක්ඛුආදි ධාතු හා ඔවුනට අයත් ඵස්සාදිනාම, කෙසාදිරූප, වෙන් කොට දැන ඒ එක් එක් නාමයක්, එක් එක් රූපයක් ලක්ඛණ-රස-පච්චුපට්ඨාන-පදට්ඨාන විසින්, කම්ම-චිත්ත-උතු-ආහාරසමුට්ඨාන විසින්, කලාප විසින් පිරිසිඳින්නේ ය. විස්තරකථාව විශුද්ධිමාර්ග-යෙහි දක්ක හැකි ය.

අරමුණට නැමෙන **ලක්ෂණ** ඇති ධර්මසමූහය **නාම** නම්. සෙසු චෛතසිකයන් හා එක්වට ඉපදීම එක්වට නැසීම එක් ම අරමුණෙක උනුන් හා එක් ව විසීම **සාම්‍ය** නම්. උනුන් කෙරෙන් වෙන් නො වීම **ඵල** නම්. ප්‍රතිසන්ධිවිඥනය **පදස්ථාන** නම්. **"නමන ලක්ඛණං නාමං, සම්පයොගරසං, අවිනිබ්භොගපච්චුපට්ඨානං විඤ්ඤාණ පදට්ඨානං"** යි ඒ කීහ. **"මනොපුබ්බඞ්ගමා"** යන්-නට කළ පරිකථාව බලනු.

නැසෙන වැනසෙන වෙනස් වන සැහැවි ඇති ධර්මසමූහය **රූප** නම්. ඔවුනොවුන් හා **එකමුතුබවක්** නැති බැවින් අඹරා වියලා ගත් පිටි මෙන් විසිර යැම **සාම්‍ය** නම්. අරමුණු නො ගැණීම **ඵල** නම්. ප්‍රතිසන්ධිවිඥනය **පදස්ථාන** නම්. **"රුප්පනලක්ඛණං රූපං,**

**විකිරණරසං, අබ්‍යාකතපච්චුපට්ඨානං විඤ්ඤාණපදට්ඨානං"** යනු ආගමිකකථා ය. මෙහි **"කො ඉමං පඨවිං විජෙස්සති"** යන්නට කළ පරිකථාව බලනු.

දිට්ඨිවිසුද්ධිය ශරීරභූත වූ විශුද්ධි සතරින් ප්‍රථමවිශුද්ධිය බැවින් එය උපචාර සහිත වූ අෂ්ටසමාපත්තිලාභී ශමථයානිකයා විසින් සම්පාදනය කළ යුතු බව **"තං සම්පාදෙතුකාමෙන සමථයානිකෙන තාව ඨපෙත්වා නෙවසඤ්ඤානාසඤ්ඤායතනං, අවසෙස රූපාරූපාවචරජ්ඣානානං අඤ්ඤතරතො වුට්ඨාය විතක්කාදීනි ඣානඞ්ගානි, තං සම්පයුත්තා ච ධම්මා ලක්ඛණ රසාදිවසෙන පරිග්ගහෙතබ්බා"** යන මෙයින් පැහැදිලි වන්නේ ය. ඒ දිට්ඨිවිසුද්ධිය සපයනු කැමැති ශමථයානිකයා විසින් නෙවසඤ්ඤානාසඤ්ඤායතනය හැර අවශෙෂ වූ රූපාවචර-අරූපාවචරධ්‍යානයන් අතුරෙන් එක්තරා ධ්‍යානයකින් නැගී විතර්කාදි වූ ඒ ඒ ධ්‍යානාඞ්ග හා ඒ හා යෙදුනු ස්පර්ශාදිධර්ම, ලක්ෂණ-රසාදිවශයෙන් පරිග්‍රහ කට යුතු ය, යන අරුත්.

මෙසේ ධ්‍යානාඞ්ග හා තත්සම්ප්‍රයුක්තධර්ම පිරිසිඳ දැන ඒ හැම එකෙක් අරමුණට නැමෙන බැවින් නාම ය යි ද, සිත්හි කළ යුතු ය. අනතුරු ව පුරුෂයෙක්, තම ගෙය තුළ සිටි සර්පයකු දැක උඟ ලුහු බැඳ යනුයේ උඟ වසන තැන් දක්නේ යම්සේ ද, එසේ ඒ යොගී තෙමේ ඒ නාමධර්ම පිරික්සනුයේ නාම ධර්මයන්ගේ නිඃශ්‍රයස්ථානය වූ හෘදයවස්තුරූපය දක්නේ ය. ඉක්බිති හෘදයවස්තුරූපයට නිඃශ්‍රය වූ සෙසු උපාදායරූපයන් ද නුවණින් දැක මේ සියලු උපාදායරූප නැසෙන වැනසෙන බැවින් රූප ය යි සිත්හි කරන්නේ ය. පිරිසිඳින්නේ ය. නුවණින් පිරිමදින්නේ ය. මෙසේ අරමුණට නැමෙන සැහැවි ඇති බැවින් නාමැ යි ද, නැසෙන වැසෙන සැහැවි ඇති බැවින් රූපැ යි ද නාම-රූප දෙක යථාර්ථ විසින් ඇති සැටියෙන් සැකෙවින් නිශ්චය කරන්නේ ය. නුවණින් පිරිමදින්නේ ය. මේ කියේ සමථයානිකයා අරූපමුඛයෙන් විදර්ශනාවට බැස ගන්නා සැටි යි.

ශුද්ධවිදර්ශනායානිකයා හෝ මේ ශමථයානිකයා චතුර්ධාතුව්‍යවස්ථා කිරීමෙහි දී චතුර්ධාතුනිශ්චය කිරීමෙහි දී 'තද්ගති ඇතියේ පඨවීධාතු ය, යනාදීන් ඒ ඒ ධාතුපරිග්‍රහමුඛයන් අතුරෙන් එක්තරා මුඛයෙකින් පඨවී ආදි ධාතු සතර ලක්ෂණරසාදීන්ගේ වශයෙන් වෙන් වෙන් ම සැකෙවින් හෝ විස්තර විසින් පරිග්‍රහ කළ යුතු ය. පිරිසිඳිය යුතු ය. එසේ පරිග්‍රහ කරත්, ඇති සැටියෙන් පඨවී ආදි ධාතුන් පැහැදිලි ව වැටහී ගිය පසු පළමු කොට හෙතෙමේ කර්මයෙන් හට ගත් කෙශයෙහි පඨවී-ආප-තෙජ-වායු-

වර්ණ-ගන්ධ-රස-ඔජා-ජීවිත-කායප්පසාද යි කායදසක වශයෙන් ලැබෙන රූප දසය හා, කර්මයෙන් හට ගත් කෙශයෙහි භාවරූපයත් ලැබෙන බැවින් භාවදසක වශයෙන් ගන්නා රූප දසය ද යන රූප විස්ස ද, කෙශයෙහි, ආහාරයෙන් හට ගත් අවිනිබ්භොග (සුද්ධට්ඨක) රූප අට ය, සිතින් හට ගත් අවිනිබ්භොගරූප අට ය, යන මෙ කියූ රූප සූවිස්ස ද යි මෙ හැම එකතු ව රූප සූසාළිසක්, කර්ම - චිත්ත - සෘතු - ආහාරයෙන් හට ගත් එක් ම කෙශයෙහි ලැබෙන්නේ ය. එසේ කර්මාදී සතරින් හට ගත් ලොමාදී වූ අන් තෙවිසි කොටස්හි ද එකක් එකක් පාසා හැම කොටසෙක ම රූප සූසාළිස සූසාළිස බැගින් ලැබෙන්නේය යි දක්නේ ය. මේ චතු-සමුට්ඨානිකකෙසාදී වූ සූවිසි කොටස්හි යොගීහු විසින් පිරිසිඳින ලද, නුවණින් පිරිමඳින ලද රූපසඞ්ඛ්‍යාව එක්දහස් සපණසෙක් වන්නේ ය.

මේ දෙතිස් කොටසින් ඉතිරි වූ අනෙක් කොටස් අට අතුරෙහි **සෙද - අස්සු - ඛෙල - සිඞ්ඝාණිකා** යන සිවු කොටසෙහි සෙදයෙහි සොළොසෙක, අස්සුයෙහි සොළොසෙක යන ඈ ලෙසින් ඍතු-චිත්ත සමුට්ඨාන ඔජට්ඨමක රූප විසින් එකක් පාසා රූප සොළොස සොළොස බැගින් රූප සූසැටෙක් ලැබෙන්නේ ය. මෙතෙමේ මෙ ද මෙසේ නුවණින් දක්නේ ය. එහි සෙද නම්: ඛහදිය ය. අස්සු නම්: කඳුළු ය. ඛෙල නම්: මුවතුළ නගින කෙල ය. සිඞ්ඝාණිකා නම්: සොටු ය.

**උදරිය - කරීස - පුබ්බ - මුත්ත** යන සිවු කොටස ඍතු-සමුට්ඨාන බැවින් මේ එක් එක් කොටසෙහි ඍතුසමුට්ඨානසුද්ධට්ඨකය බැගින් රූප දෙතිසෙක් වන්නේ ය. මෙතෙමේ මෙ ද මෙසේ නුවණින් දක්නේ ය. එහි උදරිය නම්: කුක්ෂිගත ආහාර ය. කරීස නම්: මල ය. පුබ්බ නම්: සැරව ය. මුත්ත නම්: මූත්‍ර ය. ඍතු-චිත්තසමුට්ඨානික වූත් ඍතුසමුට්ඨානික වූත් මේ කොටස් අටෙහි යොගීහු විසින් පිරිසිඳින ලද, නුවණින් පිරිමඳින ලද රූප සඞ්ඛ්‍යාව සයානුවෙක් වේ.

මෙසේ මේ දෙතිස් කොටසෙහි ලැබෙන රූප, එකතු ව එක් දහස් එක් සිය දෙ පණසෙකි. චතුසමුට්ඨානිකයෙහි මෙතෙක, ද්වි-සමුට්ඨානිකයෙහි, එකසමුට්ඨානිකයෙහි මෙතෙකැ යි මෙසේ කර්මාදී සතරින් හට ගත් කෙශාදී වූ දෙතිස් කොටසෙහි ලැබෙන රූප නිරවුල් ව වෙන් වෙන් ව පැහැදිලි ව පෙණී ගිය කල්හි අනෙකුදු තෙජො කොටස් සතර හා වායු කොටස් සය ද යි යන දසය ප්‍රකට වන්නේ ය.

එහි **සන්තාපන - ජීරාපන - පරිදහන - පාචකතෙජොධාතු** කොටස් අතුරෙහි, අනුභව කළ ආහාර පැසවන පාචකතෙජොධාතු නම් වූ කර්‍මයෙන් හට ගත් තෙජොධාතු කොටසෙහි ඕජාව අටවැනි කොට ඇති ඔජට්ඨමකරූප අට හා, කම්මසමුට්ඨානජීවිතින්‍ද්‍රිය රූපය යන රූප නවය පිහිටියේ ය.

සන්තාපනතෙජොධාතු කොටසෙහි සිතෙන් හට ගන්නා ඔජට්ඨමකරූප අට, ඍතුයෙන් හට ගන්නා ඔජට්ඨමකරූප අට, ආහාරයෙන් හට ගන්නා ඔජට්ඨමකරූප අට, කර්‍මයෙන් හට ගන්නා ජීවිතනවක යන රූප තෙතිස පිහිටියේ ය. ජීරාපන - පරිදහන තෙජොධාතු දෙ කොටෙසෙහි එකක් එකක්හු කෙරෙහි පිහිටියේ ද මේරූප තෙතිස ම ය. මෙතෙමේ මෙ ද නුවණින් දක්නේ ය.

සවැදෑරුම් වූ වායු කොටස් අතුරෙහි, චිත්තජ ආශ්වාස-ප්‍රශ්වාස වායු කොටසෙහි සිතින් හට ගන්නා ඔජට්ඨමකරූප අට හා, ශබ්දය දෑ යි යන රූප නවය වූයේ ය. ඉතිරි **උද්ධඞ්ගම-අධොගම-කුච්ඡිසය -කොට්ඨාසය-අඞ්ගමඞ්ගානුසාරී** යන වායු කොටස් පසෙහි ද එකක් එකක්හු කෙරෙහි පිහිටියෝ ද සන්තාපනාදිතෙජොධාතු කොටස් තුණෙහි පිහිටි රූපයෝ ම ය. මෙතෙමේ මෙ ද මෙසේ නුවණින් දක්නේ ය. එහි සන්තාපන නම්: සිරුර තවන්නේ ය. ජීරාපන නම්: සිරුර දිර වන්නේ ය. පරිදහන නම්: සිරුර දවන්නේ ය. පාචක නම්: අනුභව කළ ආහාර පැස වන්නේ ය. උද්ධඞ්ගම නම්: උඩ බලා නගින්නේ ය. අධොගම නම්: යට බලා යන්නේ ය. කුච්ඡිසය නම්: කුසතුළ බඩවැලින් පිටත හැසිරෙන්නේ ය. කොට්ඨාසය නම්: බඩවැල් ඇතුළත සිටියේ ය. අඞ්ගමඞ්ගානුසාරී නම්: සිරුරෙහි අවයව ක්‍රියා කර වන්නේ ය. මේ තෙජො-වායු දෙ කොටසෙහි යොගීහු විසින් පිරිසිඳින ලද, නුවණින් පිරිමඳින ලද රූපසඞ්ඛ්‍යාව දෙසිය දෙයසූවකි.

මෙසේ මේ යොගීහට විස්තර විසින් පඨවි කොටස් දෙ විස්ස ය, ආපො කොටස් දස ය, තෙජො කොටස් සතර ය, වායු කොටස් සය, යි දෙ සාළිස් අයුරෙන් භූතරූප සතර හා, උපාදායරූප සූවිස්ස ප්‍රකට ලෙසින් නුවණට හසු වූ කල්හි චක්ඛු-සොත-ඝාන-ජිහ්වා-කාය-හදයවත්‍ථු යන මේ සවැදෑරුම් වස්තු හා, චක්ඛු-සොත-ඝාන-ජිහ්වා-කායද්වාර යන ද්වාර පස දෑ'යි මොවුන්ගේ වශයෙන් චක්ඛුදසක-සොතදසක-ඝානදසක-ජිහ්වාදසක - කායදසක යන දසක පස ද, හදයවත්‍ථුදසකය දෑ යි අන්‍ය වූත් සැටරූප කෙනෙක් නුවණෙහි නැගී සිටිත්. ප්‍රකට ව වැටහෙත්. මෙතෙමේ සියලු රූප නැසෙන වැනසෙන සැහැවි ඇතැ යි එක් කොට ගෙණ මේ රූපැ යි නුවණින් බලන්නේ ය. පිරිමඳින්නේ ය.

මෙසේ රූපධම් නුවණින් පිරිමදින ලද යොගීහට ඉනික්බිති අවාරවශයෙන් දෙපස් විඤ්ඤාණ ය, මනොධාතු තුන ය, අටසැටක් මනොවිඤ්ඤාණධාතුය යන එක් අසූවක් ලෞකික සිත් ද, ඒ එක් අසූවක් සිත් සමග නො වෙනස් ව එකට හට ගත්තා වූ ඵස්ස-වේදනා-සඤ්ඤා-චේතනා-ජීවිතිත්‍රිය-එකග්ගතා-මනසිකාර යන චෛතසික ද ප්‍රකට වන්නාහ. එකල්හි හෙතෙමේ ඒ සියලු රූපධම් නැමෙන සැහැවි ඇතැ යි එක් කොට දක්නේ ය. චතුර්ධාතු ව්‍යවස්ථාමුඛයෙන් විස්තර විසින් නාම-රූප දෙක මෙසේ නිශ්චය කරන්නේ ය. විශෙෂයෙක් වේ. ඒ නම්: විදර්ශනායානිකයාහට හෝ ශමථයානිකයාහට මග-පලසිත් පිරිසිඳීමට අසුනොවන බව ය. එසේ වනුයේ ඔවුන් අවබොධ කිරීම් වශයෙන් නො ද පැමිණි බැවිනි. **“ලොකුත්තරචිත්තානි පන නෙව සුද්ධවිපස්සකස්ස න සමථයානිකස්ස පරිග්ගහං ගච්ඡන්ති අනධිගතත්තා”ති”** යනු විසින් ඒ කිහ. මේ වනාහි චතුර්ධාතුව්‍යවස්ථා කිරීම් වශයෙන් නාම-රූප දෙක ව්‍යවස්ථා කිරීම ය.

**අනෙකෙක්** “මේ අත්බැව්හි චක්ඛුධාතු-රූපධාතු-චක්ඛුවිඤ්ඤාණ ධාතු ඇතැ”යි මේ ඈ ලෙසින් නුවණින් සලකා බලා ලෝවැස්සන් විසින් ‘ඇස’යි ගෙණ ඇති සුදුකළුමඩලින් විසිතුරු වූ දිගින් හා පලලින් යුත් ඇස්වලෙහි නහරවැලින් බැඳුනු මස්පිඩ නො ගෙණ උපාදායරූප අතුරෙහි එන චක්ඛුප්පසාදය ම චක්ඛුධාතු යි ව්‍යවස්ථා කරන්නේ ය. එහි දී චක්ඛුප්පසාදයට නිඃශ්‍රය වූ පඨවි ආදි මහාභූත සතර, එහි පිරිවර වූ වර්‍ණ-ගන්ධ-රස-ඔජා යන රූප සතර, පරිපාලක වූ ජීවිතින්‍ද්‍රියරූපය යන සහජාතරූප නවය හා, එහි පිහිටි කායදසකය හා ඉත්ථිභාවදසක-පුම්භාවදසක යන දසක දෙකෙන් එක් දසකයක් ද යි යන කම්ජරූප විස්ස, ආහාර සමුට්ඨානඔජට්ඨමකය, චිත්තසමුට්ඨානඔජට්ඨමක ය, උතුසමුට්ඨාන ඔජට්ඨමකය, යන අනුපාදින්නක වූ අකම්ජ වූ රූප සුවිස්ස ද යි චක්ඛුප්පසාදය හැර සෙසු රූප තෙපණස චක්ඛුධාතු ය, යි ඔහු විසින් නිශ්චය කරණු ලැබේ. සොතධාතු ආදියෙහි ද මේ ක්‍රමය ම වේ.

කායධාතුයෙහි ඒ රූප තෙපණසින් චක්ඛුදසකය හැර අනික් රූප තෙසාළිස ගන්නේ ය. මෙහි ලා සමහර කෙනෙක් උතු සමුට්ඨානඔජට්ඨමක-චිත්තසමුට්ඨානඔජට්ඨමක යන කලාප දෙකට ශබ්දයත් එකතු කිරීමෙන් නවයක් නවයක් කොට පන්සාළිස් රූපකෙනකුත් ගණිත්. මෙසේ මේ පඤ්චපසාදය හා ඔවුන්ට ගොදුරු වූ රූප-ශබ්ද-ගන්ධ-රස-සප්‍රෂ්ටව්‍ය යන දස රූපය දසධාතු නම්. සෙසු සොළොස් සුඛුමරූප ධම්මධාතු නම් වේ.

චක්ඛුප්පසාදය නිසා රූපය අරමුණු කොට පවත්නා සිත, චක්ඛුවිඤ්ඤාණධාතු නම් වන්නා සේ සොතප්පසාදය නිසා ශබ්දය අරමුණු කොට පවත්නා සිත, සොතවිඤ්ඤාණධාතු,යි මේ ඈ ලෙසින් පඤ්චප්පසාදරූප නිසා කුසල්-අකුසල් විසින් ලැබෙන-ද්විපඤ්චවිඤ්ඤාණය, පඤ්චවිඤ්ඤාණධාතු නම්. මනොධාතු සිත් තුන, එක් ම මනො ධාතු නම්. මේ සියලු එක් සැටක් වූ ලෞකික සිත් සත්තවිඤ්ඤාණධාතු නම්. මේ එක් අසූවක් සිත් හා යෙදුනු සපශ්‍රාදි-චෛතසික ධම්මධාතු නම් වේ.

චක්ෂුරාදී වූ පස හා රූපාදී වූ පස ද යන රූප දසය හා ධර්මධාතුවට අයත් ධර්ම අතුරෙහි සොළොස් සුඛුම රූප ද යන අඩ එකොළොස රූප නම්. ධර්මාලම්බනයට අයත් දෙපණස් චෛතසික හා නිර්වාණය, නාම බැවින් නො ගැණේ. චක්ඛුවිඤ්ඤාණ ධාතු-ඝානවිඤ්ඤාණධාතු-ජිහ්වාවිඤ්ඤාණධාතු-කායවිඤ්ඤාණධාතු-මනොධාතු-මනොවිඤ්ඤාණධාතු යන මෙ සත හා ධර්මධාතුයෙන් අඩක් වූ දෙපණස් චෛතසිකය, නිර්වාණය යන අඩකින් අටක් වූ කාමධාතු දූ යි මෙසේ අටළොස් ධාතු වශයෙන් නාම-රූප දෙක ව්‍යවස්ථා කරන්නේ ය.

**අනෙකෙක්** චක්ඛුධාතුයෙහි කියූ ලෙසින් රූප තෙපණස හැර පියා චක්ඛුප්පසාදමාත්‍රය ම චක්ඛායතනැ යි ගෙණ එහි කී පරිදි අනික් සොත-ඝාන-ජිහ්වා-කායධාතූන්, සොතායතන-ඝානායතන-ජිහ්වායතන-කායායතන වශයෙන් ද, ඔවුනට විෂය වූ රූප-ශබ්ද-ගන්ධ-රස-ස්ප්‍රෂ්ටව්‍ය යන පස, රූපායතන-සද්දායතන-ගන්ධායතන-රසායතන-ඵොට්ඨබ්බායතන වශයෙන් ද, ලෞකික සත්ත විඤ්ඤාණධාතූන් මනායතන වශයෙන් ද සිතට නගා ගෙණ, අඩස් එකාදස ආයතන, රූප ය යි ද, දියඩස් ආයතන, නාම ය යි ද ද්වාදසායතන වශයෙන් නාම-රූප දෙක ව්‍යවස්ථා කරන්නේ ය. මේ වනාහි ද්වාදශායතන වශයෙන් ව්‍යවස්ථා කිරීම ය.

**අනෙකෙක්** 'මේ ශරීරයෙහි කම්ම-චිත්ත-උතු-ආහාර යන සතරින් හට ගත් පඨවි-ආපො-තෙජෝ-වායො යන මහාභූතරූප සතර ය, ඒ සතර ඇසුරු කොට සිටි, වණ්ණ-ගන්ධ-රස-ඔජා යන සතර ය, චක්ඛුප්පසාද-සොතප්පසාද-ඝානප්පසාද-ජිහ්වාප්පසාද-කායප්පසාද යන රූප පස ය, හදයවත්ථු රූපය, භාවරූපය, ජීවිතින්ද්‍රියරූපය, චිත්තයෙන් හා සෘතුයෙන් හට ගත් ශබ්දය යන මේ සතළොස් නිෂ්පන්නරූපයෝ අනිත්‍යාදි විසින් පිරිමැදීමට සුදුසු වූවෝ, කර්මාදී සතරින් නිපන්නෝ, නැසෙන වැනසෙන සැහැවි ඇති බැවින් රූප නම් වෙත්. කායවිඤ්ඤත්ති-වචීවිඤ්ඤත්ති-

ආකාසධාතුරූපයාගේ ලහුතා-මුදුතා-කම්මඤ්ඤතා-උපචය-සන්තති-ජරතා-අනිච්චතා යන දස රූපයෝ අනිත්‍යාදි විසින් පිරිමැදීමට සුදුසු නො වෙත්. මොවුහු රූපයන්ගේ ආකාර-විකාර හා රූපාන්තර පිරිසිඳීම් පමණ වූවාහු නිෂ්පන්නරූප නම් ද නො වෙත්. නැසෙන වැනසෙන සැහැවි නැති බැවින් රූපරූප නම් ද නො වෙත්. එහෙත් රූපයන්ගේ ආකාර-විකාර අනන්තර පරිච්ඡෙද මාත්‍ර බැවින් රූපලෙසින් ගණනට යෙති,යි මේ සත් විසි රූපය, රූපස්කන්ධ ය යි ද, මුලින් කියූ එක් අසූවක් සිත් හා යෙදී සිටි වෙදනාව, වෙදනාස්කන්ධ ය යි ද, ඒ සිත් හා ම යෙදී සිටි, සංඥාව, සංඥාස්කන්ධ ය යි ද, සෙසු ස්පර්ශාදිචෛතසික, සංස්කාරස්කන්ධ ය යි ද, සතර අරූපස්කන්ධ නාම ය යි ද ගෙණ පඤ්චස්කන්ධමුඛයෙන් නාම-රූප දෙක ව්‍යවස්ථා කරන්නේ ය. මෙහි කියූ දශවිධ අනිෂ්පන්නරූපයෝ අනිත්‍යාදි වශයෙන් විදර්ශනා කිරීම පිණිස නො පවත්නෝ ද ආකාර-විකාර ලක්ෂණමාත්‍රිකවූවෝ රූපැ යි ගණු ලැබෙත්. මේ වනාහි පඤ්ච ස්කන්ධ වශයෙන් නාම රූප දෙක ව්‍යවස්ථා කිරීම ය.

**අනෙකෙක්** නැසෙන වැනසෙන සැහැවි ඇති පඨවී ආදී සතර මහාභූතරූප හා ඒ ඇසුරු කොට පවත්නා සෙසු උපාදායරූප සූවිස්ස, මේ අත්බැව්හි රූපැ යි ගන්නේ ය. එසේ ම මනායතනය හා ධර්මායතනයෙහි එක දෙශයක් වූ දෙ පණස් චෛතසික ද, නිර්වාණය ද නාමැ යි ගන්නේ ය. මෙසේ ගෙණ මේ නාමය ද, මේ රූපය ද, නාම-රූපැ යි සැකෙවින් නාම-රූප දෙක ව්‍යවස්ථා කරන්නේ ය. මේ වනාහි සැකෙවින් නාම-රූප දෙක ව්‍යස්ථා කිරීම ය.

මෙසේ ශූන්‍යතාදී වූ විමොක්ෂ මුඛයෙන් රූප පිරිසිඳ දූන අරූප පිරිසිඳින කල්හි ඒ අරූපධර්ම ඉතා සියුම් බැවින් නො වැටහෙනු හැකි ය. එකල්හි රූපධර්ම ම පුන පුනා මෙනෙහි කළ යුතු ය. රූපධර්ම පුන පුනා මෙනෙහි කරණ කල්හි, යම් යම් ලෙසකින් රූපධර්ම පිරිසිදු ව නිරවුල් ව වැටහේ ද, ඒ ඒ ලෙසින් රූපධර්ම ඇසුරු කොට සිටි අරූපධර්ම ද නිරායාශයෙන් වැටහෙනු ඇත.

කැඩපතකින් මූණ බලන්නක්හට කැඩපත අපිරිසිදු බැවින් මූණ පැහැදිලි ව නො පෙණේ නම්, නැවැත එය පිරිසිදු කොට මූණ බලන කල්හි ඉතා පිරිසිදු ලෙසින් මූණ පෙණෙන්නේ ය.

තෙල් කැමැත්තක්හු තල අඹරා පිටි කොට ඒ පිටි බඳුනෙක දමා දිය ඉස වරක් දෙකක් පෙළු පමණින් තෙල් නො ලැබුන ද එය බැහැර නො දමා නැවැත නැවැත උණුදිය ඉස මැඩීමෙන් තෙල් ලබා ගත හැකි ය.

දිය පිරිසිදු කරන්නට ඉඟිනි ඇට දිය කළය තුළ බහා වරක් දෙ වරක් එය අතින් ගෙණ කළයෙහි ගෑවූ පමණින් දිය පහන් නො වූව ද නැවැත නැවැත ගෑවීමෙන් බොරමඩ පහ ව ගොස් දිය පහන් වන්නේ ය.

එපරිද්දෙන් විදර්ශකයා විසින් මෙහි ලා වීර්යය නො හැර රූපය ම නැවැත නැවැත පිරිමදින කල්හි මෙනෙහි කරණ කල්හි පිරිසිදු කළ කැඩපතෙහි මූණ පෙණෙන්නා සේ තලපිටි නැවැත නැවැත පෙළත්, තෙල් ලැබෙන්නා සේ ඉඟිනි ඇට නැවැත නැවැත ගටත්, දිය පහන් වන්නා සේ විදර්ශකයාගේ සම්මර්ශනඥානයට පටහැනි ව සිටි කෙලෙස් යටපත් වීමෙන් සිත පහන් වූ කල්හි රූපධර්ම හා, රූපධර්ම ඇසුරු කොට සිටි අරූප ධර්ම ද පහන් ව නිරවුල් ව වැටහෙන්නෝ ය.

යන්ත්‍රයෙහි උක් දඬු බහා වරක් දෙකක් පෙළා නො නැවතී පැණි ලැබෙන තුරු ම යන්ත්‍රය ක්‍රියා කරවන්නා සේ, බඩු පැහැර ගත් සොරකු අල්ලා වරකින් දෙකෙකින් තොරතුරු විචාරා නො දත හැකි පමණින් සොරු අත් නො හැර සොරු තළා පෙළා තොරතුරු දැන ගන්නා සේ, රියට නො පුරුදු නො දැමුනු ගොනකු රියෙහි බැඳ වරකින් දෙ වරකින් නො දැමුන ද එහිලා නැවැත නැවැත උත්සාහ කරන්නා සේ, යම් කිසි මාළුපිණියක් ගින්නෙන් පිසන්නකු එය පැසෙනතුරු ම නැවැත නැවැත ගිනි දල්වන්නා සේ, යට කියූ ලෙසින් විදර්ශකයා විසින් රූපධර්ම පිරිසිඳිය යුතු ය. මෙනෙහි කළ යුතු ය. පරිග්‍රහ කටයුතු ය.

මෙසේ ඉතා පිරිසිදු ලෙසින් කළ රූප පිරිසිඳීම් ඇතියහුට අරූපධර්ම, ස්පර්ශ වශයෙන් හෝ, වේදනා වශයෙන් හෝ, විඥාන වශයෙන් හෝ වැටහෙන්නේ ය. 'පෘථිවි ධාතුව කැකුළුබව ලකුණු කොට සිටියේ ය' යනාදි ලෙසින් ධාතූන් පිරිසිඳින කල්හි ඇතැම් එකක්හට ස්පර්ශය පළමු කොට අරමුණු වන්නේ ය. ඒ හා යෙදී සිටි වේදනාව වේදනාස්කන්ධ ය යි ද, සංඥාව සංඥාස්කන්ධ ය යි ද, ස්පර්ශය හා චේතනාව සංස්කාරස්කන්ධ ය යි ද, සිත විඥානස්කන්ධ ය යි ද, වැටහෙනු ඇත.

එසේ ම 'කෙශයෙහි කැකුළු බව පඨවී ධාතුය – ආශ්වාස – ප්‍රශ්වාස දෙක්හි වූ පඨවී ධාතුව කැකුළුබව ලකුණු කොට ඇත්තේ ය' යි ස්පර්ශය පළමු කොට අරමුණු වන්නේ ය. ඒ හා යෙදුනු වේදනාව වේදනාස්කන්ධ ය යි ද, සංඥාව සංඥාස්කන්ධ ය යි ද, ස්පර්ශය හා චේතනාව සංස්කාරස්කන්ධ ය යි ද, සිත විඥානස්කන්ධ ය යි ද වැටහෙන්නෝ ය. මෙසේ අරූපධර්මයෝ ස්පර්ශ වශයෙන් වැටහෙත්.

එකක්හට ‘පඨවි ධාතුව කැකුළු බව ලකුණු කොට සිටියේ ය, ඒ පඨවී ධාතු අරමුණෙහි රස විඳින්නා වූ වේදනාව වේදනාස්කන්ධ ය යි ද, ඒ හා යෙදුනු සංඥාව සංඥාස්කන්ධ ය යි ද, ඒ හා යෙදුනු ස්පර්ශය හා චේතනාව සංස්කාරස්කන්ධ ය යි ද, සිත විඥානස්කන්ධ ය යි ද, වැටහෙනු ඇත.

එසේ ම කේශයෙහි පඨවී ධාතුව කැකුළුබව ලකුණු කොට ඇත්තේ ය – ආශ්වාස – ප්‍රශ්වාස දෙක්හි පඨවී ධාතුව කැකුළු බව ලකුණු කොට ගත්තේ ය, ඒ අරමුණු කොට පවත්නා එහි රස විඳිනා වේදනාව වේදනාස්කන්ධ ය යි ද, සංඥාව සංඥාස්කන්ධ ය යි ද, ස්පර්ශය හා චේතනාව සංස්කාරස්කන්ධ ය යි ද, ඒ හා යෙදුනු සිත විඥානස්කන්ධ ය යි ද වැටහෙන්නෝ ය. මෙසේ අරූපධර්මයෝ වේදනා වශයෙන් වැටහෙත්.

එකක්හට ‘පඨවී ධාතුව කැකුළුබව ලකුණු කොට සිටියේ ය’යි අරමුණු දැන ගන්නා විඥානය විඥානස්කන්ධ ය යි ද, ඒ හා යෙදුනු වේදනාව වේදනාස්කන්ධ ය යි ද, සංඥාව සංඥාස්කන්ධ ය යි ද, ස්පර්ශ චේතනා සංස්කාරස්කන්ධ ය යි ද වැටහෙත්.

එසේ ම ‘කේශයෙහි පඨවී ධාතුව කැකුළුබව ලකුණු කොට ඇත්තේ ය — ආශ්වාස – ප්‍රශ්වාස දෙක්හි පඨවී ධාතුව කැකුළුබව ලකුණු කොට ඇත්තේ ය’ යි අරමුණු දැන ගන්නා විඥානය විඥානස්කන්ධ ය යි ද, ඒ හා යෙදුනු වේදනාව වේදනාස්කන්ධ ය යි ද සංඥාව සංඥාස්කන්ධ ය යි ද, ස්පර්ශ – චේතනා සංස්කාරස්කන්ධ ය යි ද වැටහෙත්. මෙසේ අරූපධර්මයෝ විඥාන වශයෙන් වැටහෙත්.

මෙපරිද්දෙන් ‘කර්මයෙන් හට ගත්නා කේශයෙහි පඨවී ධාතුව කැකුළුබව ලකුණු කොට ඇත,’ යනාදී ක්‍රමයෙන් දෙසාළිස් ධාතු කොටස්හි සතර සතර ධාතු වශයෙන්, සෙසු චක්ඛු ධාතු ආදී රූප පිරිසිඳීම් මුඛයන්හි ද සියලු නයභේදය දැන එයට අනු ව අර්ථ උගත යුතු ය.

මෙසේ පිරිසිදු ලෙසින් නිරවුල් ව රූප පිරිසිඳීම් ඇත්තහුට අරූපධර්ම, ස්පර්ශ – වේදනා – විඥාන යන තුන් අයුරින් පැහැදිලි ව වැටහෙන බැවින් රූපපරිග්‍රහය ඇත්තා වූ ම ඔහු විසින් නාම පරිග්‍රහයෙහි නාම පිරිසිඳීමෙහි ද උත්සාහවත් විය යුතු **ය.** ඉන් අන්හු විසින් එහිලා උත්සාහ නො කටයුත්තේ ය. මෙසේ ස්පර්ශාදීන්ගේ වශයෙන් දතයුතු ධර්මයන්හි සිහිය එළඹ සිටි කල්හි චතුර්විධ අරූපස්කන්ධ, **නාමය** යි ද, ඔවුනට අරමුණු වූ මහාභූත රූප සතර හා ඒ මහාභූතරූපයන් නිසා පවත්නා සූවිසි උපාදාය රූප, **රූපය** යි ද හෙතෙමේ නිෂ්ඨාවට යන්නේ ය. පිරිසිඳින්නේ ය. වටහා ගන්නේ ය. එහි නුවණ බැස ගන්නේ ය.

යෝගී තෙමේ මෙහි මෙසේ සතර ධාතු – අටළොස් ධාතු – දොළොස් ආයතන – පස් වැදෑරුම් ස්කන්ධ විසින් සියලු ත්‍රෛභූමක ධර්ම කඩුවකින් සුමුගුවක් විවෘත කරන්නකු සේ එකට බැඳී තුබූ තල් කඳක් පළන්නකු සේ නාමය ද, රූපය ද දෙපරිද්දෙකින් නියම කොට ගෙණ නාම රූප මාත්‍රයෙන් මතු අන්‍ය වූ සත්ත්වයෙක් පුද්ගලයෙක් දෙවියෙක් බ්‍රහ්මයෙක් නැතැ යි නිමාවට යන්නේ ය. මෙ තෙමේ ඇති සැටියෙන් නාම – රූප නියම කොට සත්ත්ව – පුද්ගල මුළාව දුරු කරන්නට නො මුළා බැව්හි සිත පිහිටු වන්නට 'මේ ධර්මස්වභාවය නාම – රූප මාත්‍රයෙක් ම ය, සත්ත්වයෙක් පුද්ගලයෙක් නැත්තේ ය' යි නිශ්චයට බසින්නේ ය. අර්ථ ව්‍යක්තිය පිණිස මෙ ද දත්තේ ය.

"යථාපි අඞ්ගසම්භාරා හොති සද්දො රථො ඉති,
එවං ඛන්ධෙසු සන්තෙසු හොති සත්තොති සම්මුති"

'අවයව සමූහය එක් වූ කල්හි රියය යන ශබ්දයෙක් නැගී එන්නේ යම්සේ ද, එ පරිද්දෙන් රූපාදිස්කන්ධ ඇති කල්හි සත්ත්ව යන සම්මුතිය ලොකයා අතර වන්නේ ය' යනු අරුත්.

තවද මෙ ද දතයුතු ය:– **"සෙය්‍යථාපි ආවුසො කට්ඨං ච පටිච්ච වල්ලිං ච පටිච්ච මත්තිකං ච පටිච්ච තිණං ච ආකාසො පරිවාරිතො අගාරන්තෙව සඞ්ඛං ගච්ඡති, එවමෙව ඛො ආවුසො අට්ඨිං ච පටිච්ච නහාරුං ච පටිච්ච මංසං ච පටිච්ච චම්මං ච පටිච්ච ආකාසො පරිවාරිතො රූපන්තෙව සඞ්ඛං ගච්ඡති"** යනු. 'කාෂ්ඨය නිසා වැල් නිසා මැටි නිසා තණ නිසා අහස පිරිවරණ ලදුයේ ගේය කියන්නා සේ ඇට නිසා නහර නිසා මස් නිසා සම නිසා අහස පිරිවරණ ලදුයේ ශරීර ය යි ව්‍යවහාරයට එන්නේය' යනු එහි කෙටි තේරුම ය.

මෙහිලා මෙ ද දත යුතුය:–

දුක්ඛමෙව හි සම්භොති දුක්ඛං තිට්ඨති වෙති ච,
නාඤ්ඤත්‍ර දුක්ඛා සම්භොති නාඤ්ඤත්‍ර දුක්ඛා නිරුජ්ඣති'' යනු.

'ලොකයෙහි දුක ම හටගණියි. දුක ම පවති. දුක ම නිරුද්ධ වේ. දුක හැර දුකින් පිට කිසිවෙක් නැත්තේ ය. දුක හැර කිසිවෙක් නිරුද්ධ නො වේ, යන අරුත්.

මෙසේ බුදුරජාණන් වහන්සේ නොයෙක් ලෙසින් පරමාර්ථ විසින් නාම – රූප දෙක ම දක්වා වදාළ සේක. සත්ත්ව – පුද්ගලාදීන්ගේ වශයෙන් සම්මුතිමාත්‍රය මුත් සත්ත්වයකු පුද්ගලයකු නො ද දැක් වූ සේක.

අකුරු – පත් – මැදිරි – නැබ – රියහිස් ඈ අවයව **එක්** අයුරකින් පිහිටි කල්හි **රථ** යන ව්‍යවහාරය මතු ව ආයේ ද, එහි එක් එක් අවයවය වෙන් වෙන් කොට බලන කල්හි එහි රථයක් නො වන්නා සේ ගල් – ගඩොල් – වැලි – **සුණු** – දැවදඬු ඈ ගෘහොපකරණ එක් අයුරකින් පිහිටි කල්හි **ගේ** යන ව්‍යවහාරය මතු ව ආයේ ද, එහි එක් එක් අවයවය වෙන් වෙන් කොට බලන කල්හි එහි ගෙයක් නම් නො වන්නා සේ, මහපට ඇඟිලි ඈ එක් අයුරකින් තුබූ කල්හි **මිට** යන ව්‍යවහාරය නැඟී ආයේ ද, මහපට ඇඟිලි ඈ විදහා ගත් කල්හි මිටක් නම් නො වන්නා සේ, දෙණ හා තත් එක් කොට බැඳි කල්හි **වීණා** යන ව්‍යවහාරය නැඟී ආයේ ද, ඒ දෙක එක් කොට නො බැඳි කල්හි වීණාවක් නම් නො වන්නා සේ, ඇත් – අස් – රිය – පාබලයන් එක් වූ කල්හි **සේනා** යන ව්‍යවහාරය මිනිසුන් කෙරෙහි වැද සිටියේ ද, ඇත් – අස් – රිය – පාබලයන් වෙන් වෙන් ව සිටි කල්හි සෙනාවක් නම් නො වන්නා සේ, පවුරු – ගේදොර – ගෝපුර ඈ එක් තැනක වූ කල්හි **නුවර** යන ව්‍යවහාරය මිනිසුන් අතර පැතිර ගියේ ද, පවුරු – ගේදොර – ගෝපුර ඈ නො වූ තැන නුවරක් නම් නො වන්නා සේ, කඳ – අතු – කොළ ඈ එක් අයුරකින් සැදී ගත් කල්හි **රුක** යන ව්‍යවහාරය මුවතුඩ රැඳුනේ ද, ඒ එකෙකක් වෙන් වෙන් කොට ගත් කල්හි රුකක් නම් නො වන්නා සේ, නාම – රූප දෙක එක් වූ තැන සත්ත්ව – පුද්ගල විසින් පවත්නා සම්මුතියෙහි ලා පෙණී සිටියේ ද, ඒ දෙක වෙන් වෙන් කොට නාම – රූපාදීන්ගේ වශයෙන් පරමාර්ථ විසින් සොයා බලන කල්හි සත්ත්ව – පුද්ගල ව්‍යවහාර බිඳ වැටෙන්නේ ය. නාම – රූප මාත්‍රය ම මුත් සත්ත්වයෙක් පුද්ගලයෙක් නැත්තේය යන තිරණයට වැටෙන්නේය. මෙහි ‘මම වෙමි” යි මාන වශයෙන් “මම” යි ආත්ම වශයෙන් ගැණීමට තැනක් හසු නො වන්නේ ය. පරමාර්ථ විසින් නාම – රූප ම දක්නහුගේ ඒ දැකීම **“යථාභූතදස්සන”** යි කියනු ලැබේ. මේ පරමාර්ථ තත්ත්වය හැර පියා යමෙක් ‘සත්ත්වයෙක් ඇතැ’ යි ගන්නේ නම් හෙතෙමේ ‘සත්ත්ව’ යි ගත් ඒ නාම – රූපයන්ගේ විනාශය හෝ අවිනාශය පිළිගන්නේ ය. විනාශය පිළිගන්නේ උච්ඡේදදෘෂ්ටියෙහි ද, අවිනාශය පිළිගන්නේ ශාශ්වතදෘෂ්ටියෙහි ද වැටෙන්නේ ය. සත්ත්වයා ශාශ්වතැ යි ගන්නේ භවයෙහි ගැලී යන්නේ ය. උච්ඡේද යි ගන්නේ ධර්මතත්ත්වය ඉක්මවා යන්නේ ය.

බුදුරජාණන් වහන්සේ මෙය මෙසේ වදාළ සේක: **“ද්වීහි භික්ඛවෙ! දිට්ඨිගතෙහි පරියුට්ඨිතා දෙවමනුස්සා ඔලීයන්ති එකෙ, අතිධාවන්ති එකෙ, චක්ඛුමන්තො ච පස්සන්ති, කථඤ්ච**

**භික්ඛවෙ! ඔලීයන්ති එකෙ? භවාරාමා භික්ඛවෙ! දෙවමනුස්සා භවරතා භවසම්මුදිතා තෙසං භවනිරොධාය ධම්මෙ දෙසියමානෙ චිත්තං න පක්ඛන්දති, නප්පසීදති, නාධිමුච්චති, එවං ඛො භික්ඛවෙ! ඔලීයන්ති එකෙ. කථඤ්ච අතිධාවන්ති එකෙ? භවෙනෙව ඛො පනෙකෙ අට්ටීයමානා හරායමානා ජිගුච්ඡමානා විභවං අභිනන්දන්ති, යතො කිර භො අයං අත්තා කායස්ස භෙදා උච්ඡිජ්ජිස්සති, විනස්සති, න හොති පරම්මරණා එතං සන්තං එතං පණීතං එතං යථාවන්ති. එවං ඛො භික්ඛවෙ! අතිධාවන්ති එකෙ. කථඤ්ච භික්ඛවෙ! චක්ඛුමන්තො පස්සන්ති ඉධ භික්ඛවෙ! භික්ඛු භූතං භූතතො පස්සති, භූතං භූතතො දිස්වා භූතස්ස නිබ්බිදාය විරාගාය නිරොධාය පටිපන්නො හොති. එවං ඛො භික්ඛවෙ! චක්ඛුමන්තො පස්සන්ති**"යි. මේ මෙහි අරුත්: "මහණෙනි! ශාශ්වත – උච්ඡේදදෘෂ්ටි දෙකින් මැඩුනු දෙව් මිනිසුන් අතුරෙහි ඇතැම් කෙනෙක් භවයෙහි ගැලී යෙත්, ඇතැම් කෙනෙක් අතිධාවනය කෙරෙත්. ඇති තතු පිරිසිඳ දන්නා වූ නුවණැස් ඇත්තාහු ම නියම තතු දකිත්. මහණෙනි! කෙසේ ඇතැම් කෙනෙක් භවයෙහි ගැලී යෙත් ද? මහණෙනි! ඇතැම් දෙව් මිනිස් කෙනෙක් භවයෙහි සතුටු වූවාහු භවයෙහි ඇලුනාහු භවයෙහි තදින් ඇලුනාහු වෙති, ඔවුනට භවනිරෝධය පිණිස දහම් දෙසන කල්හි සිත එහි නො බසියි, නො පහදියි, නො පිහිටයි, නිශ්චයට නො පැමිණෙයි, මහණෙනි! මෙසේ ඇතැම් දෙව් මිනිස්සු භවයෙහි ගැලී යෙත්. මහණෙනි! ඇතැම් දෙව් මිනිස් කෙනෙක් කෙසේ අතිධාවනය කෙරෙත් ද? ඇතැම් කෙනෙක් භවයෙන් ම පෙළෙන්නාහු ලජ්ජිත වන්නාහු පිළිකුලට පැමිණියාහු විභව නම් වූ උච්ඡේදය කැමැති වෙත්, යම් හෙයකින් මේ ආත්මය මරණින් පසු සිඳී යේ ද වැනසේ ද මරණින් මතු නො වේ ද, මේ උච්ඡේදය ශාන්ත ය, මේ සිඳී යෑම ප්‍රණීත ය, මේ සිඳී යෑම නියම තත්ත්වය යි. මහණෙනි! මෙසේ ඇතැම් දෙව් මිනිස්සු අතිධාවනය කෙරෙත්. මහණෙනි! කෙසේ නුවණැස් ඇත්තාහු ම දකිත් ද? මහණෙනි! මේ ශාසනයෙහි මහණ තෙමේ පඤ්චස්කන්ධය පඤ්චස්කන්ධය යි දකියි, පඤ්චස්කන්ධය පඤ්චස්කන්ධ වශයෙන් දැක පඤ්චස්කන්ධයෙහි කලකිරීම පිණිස නො ඇලීම පිණිස නිරුද්ධිය පිණිස පිළිපන්නේ වෙයි, මහණෙනි! නුවණැස් ඇත්තාහු මෙසේ දකිත්" යනු.

නූලෙන් ක්‍රියා කරවන දැව රූකඩය සිස් වූයේ දිවි නැතියේ උත්සාහ නැතියේ ක්‍රියා නැතියේ ද, දැව හා නූල් එකතු වීමෙන් යනුයේ සිටිනුයේ උත්සාහ ඇතියකු දිවි ඇතියකු ක්‍රියා ඇතියකු සේ පෙණේ ද, එසේ මේ නාම – රූප දෙක ද සිස් වූයේ දිවි

නැතියේ උත්සාහ නැතියේ ක්‍රියා නැතියේ ද එ දෙක එක්වීමෙන් යනුයේ සිටිනුයේ උත්සාහ ඇතියකු දිවි ඇතියකු ක්‍රියා ඇතියකු සේ පෙණෙන්නේ ය.

"නාමං ච රූපං ච ඉධත්ථි සච්චතො
නහෙත්ථ සත්තො මනුජොව විජ්ජති,
සුඤ්ඤං ඉදං යන්තමිවාභිසඞ්ඛතං
දුක්ඛස්ස පුඤ්ජො තිණකට්ඨසාදිසො"

සත්‍ය විසින් මේ සිරුරෙහි නාමය හා රූපය ඇත්තේ ය. මේ සිරුරෙහි සත්ත්වයෙක් ද නැත. මිනිසෙක් ද නැත. මේ සිරුර දැවදඬුයෙන් කළ රූකඩයක් සේ හිස් ය. දුක් ගොඩෙකි. තණ හා දරකෝටු සමාන ය.

බට දඬු මිටි දෙකක් එකකට එකක් හේත්තු කොට ඇද නො වැටෙන සේ තුබූ කල්හි එකකට එකෙක් ආධාරව සිටියේ ඇද නො වැටේ ද, එකක් වැටුනු කල්හි අනෙකත් ඇද වැටේ ද, එමෙන් පංචවොකාරභවයෙහි නාම - රූප දෙක උනුන් නිසා පවත්නේ ය. එකකට එකෙක් රැකුල් දී සිටුනේ ය. එකකු වැටෙන කල්හි අනෙක ද වැටේ. මේ මෙහි ව්‍යක්ති ය.

"යමකං නාමරූපං ච උභො අඤ්ඤඤ්ඤනිස්සිතා,
එකස්මිං භිජ්ජමානස්මිං උභො භිජ්ජන්ති පච්චයා" යනු.

දඬුකඩකින් බෙරයට ගැසූ කල්හි බෙරය නිසා ශබ්දය පවත්නේ ය. එහෙත් බෙරය අනෙකෙක. ශබ්දය අනෙකෙක. බෙරය හා ශබ්දය මුසු නො වේ. බෙරය ශබ්දය නො වේ. ශබ්දය බෙරය නො වේ. බෙරය ශබ්දයෙන් හිස් ය. ශබ්දය බෙරයෙන් හිස් ය. එමෙන් වස්තු - ද්වාර - ආලම්බන යන රූපයන් නිසා නාමධර්ම පවත්නා කල්හි රූපය අනෙකෙක. නාමය අනෙකෙක. නාම - රූප දෙක උනුන් හා මුසු නො වේ. නාමය රූපයෙන් හිස් ය. රූපය නාමයෙන් හිස් ය. නාමය රූපය නො වේ. රූපය නාමය නො වේ. එහෙත් බෙරය නිසා ශබ්දය පවත්නා සේ රූපය නිසා නාමය පවත්නේ ය.

"න චක්ඛුතො ජායරෙ ඵස්සපංචමා
න රූපතො නො ච උභින්නමන්තරා,
හෙතුං පටිච්ච පභවන්ති සඞ්ඛතා
යථාපි සද්දො පහටාය භෙරියා"

ස්පර්ශ - වේදනා - සංඥා - චේතනා - චිත්ත යන පස, ඇසින් නො උපදී. රූපයෙන් උපදනේ ද නො වේ. ඇස - රූප

දෙදෙනා අතුරෙනුදු උපදනේ ද නො වේ. ඇස-රූප-ආලෝක-මනසිකාර යන හෙතුව නිසා සඞ්ඛතධම් උපදී. බෙරයට ගැසූ කල්හි ශබ්දය උපදනා සේ උපදී.

"න සොතතො ජායරෙ ඵස්සපඤ්චමා
න සද්දතො නො ච උභින්නමන්තරා,
හෙතුං පටිච්ච පභවන්ති සඞ්ඛතා
යථාපි සද්දො පහටාය භෙරියා"

ස්පර්ශ-වෙදනා-සංඥා-චෙතනා-චිත්ත යන පස, කණින් නො උපදී. ශබ්දයෙන් උපදනේ ද නො වේ. කණ-ශබ්ද දෙදෙනා අතුරෙනුදු උපදනේ නො වේ. කණ-ශබ්ද-කන්සිදුර-මනසිකාර යන හෙතුව නිසා සඞ්ඛතධම් උපදී. බෙරයට ගැසූ කල්හි ශබ්දය උපදනා සේ උපදී.

"න ඝානතො ජායරෙ ඵස්සපඤ්චමා
න ගන්ධතො නො ච උභින්නමන්තරා,
හෙතුං පටිච්ච පභවන්ති සඞ්ඛතා
යථාපි සද්දො පහටාය භෙරියා"

ස්පර්ශ-වෙදනා-සංඥා-චෙතනා-චිත්ත යන පස, නැහැයෙන් නො උපදී. ගන්ධයෙන් උපදනේ ද නො වේ. නාසිකා-ගන්ධ දෙදෙනා අතුරෙනුදු උපදනේ නො වේ. නැහැය-ගඳ-වායු මනසිකාර යන හෙතුව නිසා සඞ්ඛතධම් උපදී. බෙරයට ගැසූ කල්හි ශබ්දය උපදනා සේ උපදී.

"න ජිව්හතො ජායරෙ ඵස්සපඤ්චමා
න රසතො නො ච උභින්නමන්තරා
හෙතුං පටිච්ච පභවන්ති සඞ්ඛතා
යථාපි සද්දො පහටාය භෙරියා"

ස්පර්ශ-වෙදනා-සංඥා-චෙතනා-චිත්ත යන පස, දිවෙන් නො උපදී. රසයෙන් උපදනේ ද නො වේ. දිව-රස දෙදෙනා අතුරෙනුදු උපදනේ නො වේ. දිව-රස-කෙල-මනසිකාර යන හෙතුව නිසා සඞ්ඛතධම් උපදී. බෙරයට ගැසූ කල්හි ශබ්දය උපදනා සේ උපදී.

"න කායතො ජායරෙ ඵස්සපඤ්චමා
න ඵස්සතො නො ච උභින්නමන්තරා,
හෙතුං පටිච්ච පභවන්ති සඞ්ඛතා
යථාපි සද්දො පහටාය භෙරියා"

ස්පර්ශ-වේදනා-සංඥා-චේතනා-චිත්ත යන පස, කයින් නො උපදී. ස්පර්ශයෙන් උපදනේ ද නො වේ. කාය-ස්පර්ශ දෙදෙනා අතුරෙහුදු උපදනේ නො වේ. කය - පැහැසිය යුත්ත - තදබව - මනසිකාර යන හෙතුව නිසා සඞ්ඛතධර්ම උපදී. බෙරයට ගැසූ කල්හි ශබ්දය උපදනා සේ උපදී.

“න චක්ඛුරූපා පභවන්ති සඞ්ඛතා
න චා පි ධම්මායතනෙහි නිග්ගතා,
හෙතුං පටිච්ච පභවන්ති සඞ්ඛතා
යථාපි සද්දො පහටාය භෙරියා”

හෘදයවස්තුරූපයෙන් සඞ්ඛතධර්මයෝ නො උපදිත්. ඒ සඞ්ඛත-ධර්මයෝ ධර්මායතනයෙහුදු නො නික්මෙත්. හෙතුව නිසා හට ගණිත්. බෙරයට ගැසූ කල්හි ශබ්දය උපදනා සේ උපදිත්.

නාමය තෙද නැත්තේ ය. තම තෙදින් පවතිනු නො හැක්කේ ය. නො කන්නේ ය. නො බොන්නේ ය. කතා නො කරන්නේ ය. ඉරියවු නො ද පවත් වන්නේ ය. රූපය තෙද නැත්තේ ය. තම තෙදින් පවතිනු නො හැක්කේ ය. කනු කැමැති බවෙක් නැත්තේ ය. බොනු කැමැති බවෙක් නැත්තේ ය. කතා කරණු කැමැති බවෙක් නැත්තේ ය. ඉරියවු පැවැත්වීමෙහි කැමැති බවෙක් නැත්තේ ය. නාමය නිසා රූපයත් රූපය නිසා නාමයත් පවතී. නාමයට කනු කැමැති බව, බොනු කැමැති බව, කතා කිරීමෙහි කැමැති බව, ඉරියවු පැවැත්වීමෙහි කැමැති බව ඇති කල්හි රූපය කන්නේ ය. බොන්නේ ය. කතා කරන්නේ ය. හිඳින්නේ ය. සිටින්නේ ය. ඇවිදින්නේ ය. නිදන්නේ ය.

උත්පත්තියෙන් අන්ධ වූවෙක් දෙපා කොර වූවකු හා එක් ව ගමනක් යනු කැමැත්තේ, අන්ධයා කොරාට කතා කොට “යහළුව! මට පයින් යා හැකි ය, එහෙත් මග තොට ඇති උස් පහත් තැන් - වළගොඩැලි - කණු කටු බැලීමට මට ඇස් නැත්තේ ය” යි කී ය. එ කල්හි කොරා ද “යහළුව! මට ඇස් ඇත්තේ ය, ඇසින් බැලිය හැකි ය, එහෙත් යෑමට ඊමට මට පා නැත්තේ ය” යි කී ය. මෙසේ කතාවට වැටුනු ඒ දෙදෙන දවසක් එක් ව තුටු පහටු ව අන්ධයා, කොරා තම කර පිට තබා ගත්තේ ය. කොරා ද අන්ධයාගේ කර පිට හිඳ ‘වම හැර දකුණට යව, දකුණ හැර වමට යව’ යි අන්ධයාට කියන්නේ ය. අන්ධයා කොරා කියන ලෙසට කොරාත් කර තබාගෙණ වරක් වම හැර දකුණට යන්නේ ය. වරක් දකුණ හැර වමට යන්නේ ය. මෙහි අන්ධයාත් කොරාත් දෙදෙන ම තෙද නැතියෝ ය. දුබලයහ. තම තමන්ගේ තෙදින්

බලයෙන් යනු නො හැක්කෝ ය. දෙදෙන එක් ව උනුන් නිසා යන්නෝ ය. මෙහිලා දෙදෙන ම සමයහ. එකෙක් එකකුට යටත් නො වේ. එ මෙන් නාමය ද තෙද නැත්තේ තමා තෙදින් නො උපදනේ ඒ ඒ ක්‍රියාවන්හි නො පවත්නේ ය. රූපය ද තෙද නැත්තේ තමා තෙදින් නො උපදනේ ඒ ඒ ක්‍රියාවන්හි නො පවත්නේ ය. එහෙත් උනුන් නිසා ඉපැත්ම හා පැවැත්ම හා වන්නේ ය.

"න සකෙන බලෙන ජායරෙ
නො පි සකෙන බලෙන තිට්ඨරෙ,
පරධම්මානුවත්තිනො
ජායරෙ සඞ්ඛතා අත්තදුබ්බලා"

නාම රූප ධර්මයෝ ස්වකීය බලයෙන් නො උපදිත්. ස්වකීය බලයෙන් නො සිටිත්. අන් දහම් අනුව පවත්නාහු ය. තුමූ දුබලයහ.

"පරපච්චයතො ච ජායරෙ
පර ආරම්මණතො සමුට්ඨිතා,
ආරම්මණපච්චයෙහි ච
පරධම්මෙහි ච මෙ පභාවිතා"

නාම රූප ධර්මයෝ අන්‍ය ධර්මයන්හුගේ හෙතුයෙන් උපදිත්. අන්‍ය ධර්මයන්හුගේ අරමුණු විසින් පරා අයත් දහම් එල්බ ගෙණ නැගී සිටිත්. මේ සඞ්ඛත ධර්මයෝ ආරම්මණ - හෙතුන්ගෙන් ද, තමා කෙරෙන් වෙන් වූ ධර්මයන්ගෙන් ද උපදනාහු වෙත්.

"යථාපි නාවං නිස්සාය මනුස්සා යන්ති අණ්ණවෙ,
එවමෙව රූපං නිස්සාය නාමකායො පවත්තති"

යම්සේ නැව නිසා මිනිස්සු මුහුදෙහි යෙත් ද, එපරිද්දෙන් රූපය නිසා නාමකය පවතී.

"යථාච මනුස්සෙ නිස්සාය නාවා ගච්ඡති අණ්ණවෙ,
එවමෙව නාමං නිස්සාය රූපකායො පවත්තති."

යම් සේ මිනිසුන් නිසා නැව මුහුදෙහි යේ ද, එපරිද්දෙන් නාමය නිසා රූපකය පවතී.

"උභො නිස්සාය 'ගච්ඡන්ති මනුස්සා නාවා ච අණ්ණවෙ,
එවං නාමඤ්ච රූපඤ්ච උභො අඤ්ඤොඤ්ඤනිස්සිතා."

මිනිස්සු හා නැව හා ඒ දෙපක්ෂය නිසා ම මුහුදෙහි යන්නාහ. එපරිද්දෙන් නාමය හා රූපය ද යන දෙදෙන උනුන් නිසා පවත්නාහ.

මෙසේ නානා නයින් නොයෙක් ක්‍රමයෙන් නාම-රූප විනිශ්චය කරන්නහුගේ පංචස්කන්ධවිෂයයෙහි බොහෝ කලක් පැවැති සත්ත්වසංඥව යටපත් ව නො මුළාබැව්හි පිහිටි නාම-රූපයන්ගේ ඇති තතු දැනීම දිට්ඨිවිසුද්ධි ය යි සැකෙවින් දතයුතු ය. **නාමරූපවවත්ථාන – සඞ්ඛාරපරිච්ඡේද** යනු විසිනුදු මෙය බණ පොතපතෙහි කියන ලද්දේ ය. විස්තර දන්නට විශුද්ධිමාර්ගය බැලිය යුතු ය. මෙහි කියන ලද්දී ඉතා කෙටි කතාවක් ය.

දිට්ඨිවිසුද්ධියෙහි දී පිරිසිඳ දත් නාම-රූපධර්මයන්ගේ ඉපැත්මට හා පැවැත්මට අත දී සිටුනා හෙතුන් සොයා බැලීමෙන් අතීත-වර්තමාන-අනාගතස්කන්ධයන්හි හා බුද්ධාදී වූ අටතන්හි උපදනා සැකය තරණය කොට සිටි නුවණ **'කඞ්ඛාවිතරණ විසුද්ධි'** නම්.

මේ ඒ ආපත ය:- **"තස්සෙව පන නාමරූපස්ස පච්චයපරිග්ගහණෙන තීසු අද්ධාසු කඞ්ඛං විතරිත්වා ඨිතං ඤාණං කඞ්ඛාවිතරණවිසුද්ධි නාම"** යනු.

වෙදකමෙහි දක්ෂ වූ එහි පළපුරුදුකම් ඇති වෙද්‍ය, රොගියකු බලා ඔහුට පිළියම් නියම කරන්නට පෙරාතු ව රොගය හටගැණීමෙහි හෙතු සොයන්නේ ය. අනුකම්පා ඇති මිනිසෙක් මග තොටෙ වැටී උඩුකුරු ව හෝනා කුඩා දරුවකු දැක ඔහුගේ 'මවුපියෝ කවුරු දැ' යි සොයන්නේ ය. එමෙන් කඞ්ඛාවිතරණ විසුද්ධිය සපයනු කැමැති යොගීහු විසින් දිට්ඨිවිසුද්ධිය සැපයීමේ දී 'මේ නාමය, මේ රූපය' යි නිශ්චය කර ගත් නාම-රූප ධර්මයන්ගේ ඉපැත්මෙහි හා පැවැත්මෙහි හෙතු සෙවිය යුතු ය. සත්ත්ව පුද්ගලාදීන්ගේ වශයෙන් ලොකයා පිළිගත් සම්මුති විසින් නගා ගත් මේ නාම-රූප, හැමදා හැමතැන හැමදෙනාට එකසේ නො වන්නේ ය. නාම-රූප පිළිබඳ වෙනස්කම් නොයෙක් ලෙසින් දක්නට ඇත්තේ ය. නාම-රූපයන්ගේ ඉපැත්ම හා නැවැත්ම හෙතු රහිත වූයේ නම් එබඳු වෙනස්කම් නාම-රූපයන් පිළිබඳ ව ඇති විය නො හැකි ය. උත්පත්තිහෙතූන්ගේ වෙනස්කම නිසා ම එයින් උපදනා ඵලධර්ම වූ නාම-රූපයන්ගේ ද වෙනස් කම වන්නේ ය. එහෙයින් නාම-රූප හෙතුන්ගෙන් ම ඇතිවිය යුතු ය. නාම-රූප දෙක හැර ඊශ්වර ප්‍රකෘතිපුරුෂාදී වූ මැවුම් කරුවෙක් ද මෙහි නැත්තේ ය. මැවුම්කරුවකු විසින් නාම-රූප මවනලද නම් ඒ නාම-රූප ඔහුගේ කැමැත්ත අනුව පැවැතිය යුතු ය. මෙහි එසේ මැවුම්කරුවකුගේ කැමැත්තට අනු ව පැවැත්මෙක් ද නැත්තේ ය. මැවුම්කරුවකු කියතොත් ඔහු ද

නාම-රූපමාත්‍ර ම ය. එහෙයින් ඊශ්වරාදිහෙතුවකින්දු නාම-රූප-යන්ගේ හට ගැන්මෙක් නැත්තේ ය. නො ද උපදින්නේ ය. නාම-රූපයන්ගේ ඉපැත්මෙහි හා නැවැත්මෙහි හෙතු නැත්තේ නො වේ. හෙතු ඇත්තේ ය. ඒ සෙවිය යුතුය. යි කඞ්ඛාවිතරණ විසුද්ධිසම්පාදකයොගී තෙමේ නාම-රූප පිළිබඳ හෙතුප්‍රත්‍යය සොයන්නේ ය.

පළමු කොට රූපකාය පිළිබඳ හෙතු සොයන්නේ 'මේ කය, උපුල්-පියුම්-හෙළපියුම්-හෙල්මැලි ආදීන්ගේ ඇතුළත නො උපද-නේ ය, මුතු-මැණික් උපදනා තැනක හෝ නො උපදනේ ය, උපදනේ මවුකුස ආමාශය-පක්වාශය යන මෙ දෙක අතර උදරපටලයට පිටුපා පිටකටුවට මුණ ලා අතුණු-අතුණුබහනින් දුවටී තෙමේත් දුගඳ ඇතියේ පිළිකුල් සහිත වූයේ එසේ ම දුගඳ ඇති පිළිකුල් වූ ඉඩ පහසු නැති පීඩා සහිත වූ තැනෙක, කුණුමසෙහි මළකුණෙහි කුණුකොම්බුයෙහි ගම්දෙර ගවරවළෙහි අසුචිවළෙහි උපදනා පණුවකු සේ ය, එසේ උපදනා මේ රූප කායයට අවිද්‍යා-තෘෂ්ණා-උපාදාන-කර්ම යන මේ සතර, උපදවන හෙයින් හෙතුහු වෙති, මෙහි ලා ආහාරය රුකුල් දෙන බැවින් ප්‍රත්‍යය වේය යි මේ ධර්ම පස හෙතුප්‍රත්‍යය වෙති, ඔවුනතුරෙනුදු අවිද්‍යා-තෘෂ්ණා-උපාදාන යන මෙ තුන මේ කයට ළදරුහට මවක මෙන් ආධාරව සිටිති, ආහාරය පුතු වඩන කිරි මවක මෙන් දරා සිටුනේ ය' යි මෙසේ රූපකායයාගේ ප්‍රත්‍යය පරීක්‍ෂා කරන්නේ ය.

මෙසේ රූපකාය පිළිබඳ ප්‍රත්‍යයයන් පරීක්‍ෂා කොට නුවණින් විමසා බලා නැවැත මෙතෙමේ **"චක්ඛුඤ්ච පටිච්ච රූපෙ ච උප්පජ්ජති චක්ඛුවිඤ්ඤාණං"** යි වදාළ බැවින් 'චක්‍ෂුඃප්‍රසාදය නිසා රූපාලම්බනය නිසා චක්‍ෂුර්විඥානය උපදී' යි යනාදී ක්‍රමයෙන් නාමකාය පිළිබඳ ප්‍රත්‍යයපරීක්‍ෂායෙහි යෙදෙන්නේ ය. එසේ නාමකායපරීක්‍ෂායෙහි යෙදුනු මෙතෙමේ නාමකාය පිළිබඳ ප්‍රත්‍යය යන් ද දැක නාම-රූපධර්මයන්ගේ ඉපැත්ම හා පැවැත්ම මෙසේ ය යි නිශ්චයට බසින්නේ ය. ඉතික්බිති 'මේ නාම-රූපයන්ගේ දැන් පැවැත්ම මෙසේ වනුයේ අතීතයෙහි ද එසේ වී ය, අතීත යෙහි ද නාම-රූපධර්ම හෙතුප්‍රත්‍යයය නිසා ම පැවැත්තේ ය, අනාගතයෙහි ද හෙතුප්‍රත්‍යයය නිසා ම පවත්නේ ය, යි දකින් නේ ය. මෙසේ නුවණින් දක්නා වූ ඔහු වෙතින්—

**අහොසිං නුඛො අහං අතීතමද්ධානං** = මම යටගිය දවස වූයෙම් දෝ?

**න නුඛො අහොසිං අතීතමද්ධානං** = මම යටගිය දවස නො වූයෙම් දෝ?

**කින්නුඛො අහොසිං අතීතමද්ධානං** = මම යටගිය දවස කවරෙක් වූයෙම් දෝ?

**කථන්නුඛො අහොසිං අතීතමද්ධානං** = මම යටගිය දවස කෙසේ වූයෙම් දෝ?

**කිං හුත්වා කිං අහොසිං නුඛො අහං අතීතමද්ධානං** = මම යටගිය දවස කවරෙක් ව සිට කවරෙක් වූයෙම් දෝ? යි මෙසේ පූර්වාන්තසඞ්ඛ්‍යාතඅතීතපඤ්චස්කන්ධය අරබයා උපදනා පස් වැදෑරුම් සැකය ද,

**භවිස්සාමි නුඛො අහං අනාගතමද්ධානං** = මම මතු එන දවස වන්නෙම් දෝ?

**න නුඛො භවිස්සාමි අනාගතමද්ධානං** = මම එන දවස නො වන්නෙම් දෝ?

**කින්නුඛො භවිස්සාමි අනාගතමද්ධානං** = මම එන දවස කවරෙක් වන්නෙම් දෝ?

**කථන්නුඛො භවිස්සාමි අනාගතමද්ධානං** = මම එන දවස කෙසේ වන්නෙම් දෝ?

**කිං හුත්වා කිං භවිස්සාමි නුඛො අහං අනාගතමද්ධානං** = මම එන දවස කවරෙක් ව සිට කවරෙක් වන්නෙම් දෝ? යි මෙසේ අපරාන්තසඞ්ඛ්‍යාතඅනාගතස්කන්ධපඤ්චකය අරබයා උපදනා පස් වැදෑරුම් සැකය ද,

**අහන්නුඛොස්මි** = මම වෙම් දෝ?

**නො නුඛොස්මි** = මම නො වෙම් දෝ?

**කින්නුඛොස්මි** = මම කවරෙක් වෙම් දෝ?

**කථන්නුඛොස්මි** = මම කෙසේ වෙම් දෝ?

**අයන්නුඛො සත්තො කුතො ආගතො** = මේ සත්ත්ව තෙමේ කොතැන සිට මෙහි ආයේ දෝ?

**සො කුහිං ගාමී භවිස්සති** = හෙතෙමේ නැවත කොතැනක යන්නේ වන්නේ දෝ? යි මෙසේ වර්තමානස්කන්ධපඤ්චකය අරබයා උපදනා ස වැදෑරුම් සැකය දැ යි සොළොස් වැදෑරුම් සැකය පහව යන්නේ ය.

**අනෙනකොක්** = නාමකායය පිළිබඳ සාධාරණ – අසාධාරණ විසින් දෙවැදෑරුම් වූ ප්‍රත්‍යය ය ද, රූපකායය පිළිබඳ කර්මාදී විසින්

සිවු වැදෑරුම් වූ ප්‍රත්‍යය ද බලන්නේ ය. චක්ෂුරාදි සදෙර ද රූපාදි ආලම්බන සය ද නාමයට සාධාරණප්‍රත්‍යය වෙති යි ද, කුශල - අකුශල-විපාක-ක්‍රියා භෙදයෙන් සර්වප්‍රකාර වූ නාමය, චක්ෂුරාදි ද්වාරයෙන් රූපාදි වූ සවැදෑරුම් අරමුණෙහි පවත්නේ ය. යොනිසො මනසිකාර-සද්ධම්මසවණාදිය කුශලයට ම අසාධාරණප්‍රත්‍යය වෙති යි ද, අයොනිසො මනසිකාර-අසද්ධම්මසවණාදිය එයට විපරීත වූ අකුශලයට අසාධාරණප්‍රත්‍යය වෙති යි ද, කර්ම-අවිද්‍යා-ගති කාලාදිය විපාකයට අසාධාරණප්‍රත්‍යය වෙති යි ද, භවඞ්ගාදිය ක්‍රියා චිත්තයට අසාධාරණප්‍රත්‍යය වෙති යි ද බලන්නේ ය.

රූපයට කර්ම-චිත්ත-ඍතු-ආහාර යි ප්‍රත්‍යය සතරෙක් වේ. ඔවුනතුරෙහි කර්මය අතීත වූයේ ම උත්පත්තික්ෂණයෙහි කර්ම සමුත්ථානරූපයට ප්‍රත්‍යය වේ ය යි ද, ඍතු-ආහාර දෙක ඍතුජ ආහාරජ රූපයනට ස්ථිතික්ෂණයෙහි ප්‍රත්‍යය වේ ය යි ද බලන්නේ නාම-රූපයන් පිළිබඳ ප්‍රත්‍යය පිරිසිඳින්නේ ය. මෙතෙමේ මෙසේ ප්‍රත්‍යය වශයෙන් නාම-රූපයන්ගේ පැවැත්ම බලා මේ නාම-රූප වර්තමානයෙහි පවත්නා සේ අතීතයෙහි ද ප්‍රත්‍යය වශයෙන් පැවැත් තේ ය යි නුවණින් බලන්නේ ය. මෙසේ බලන්නා වූ ඒ යොගී තෙමේ ප්‍රත්‍යයයන්ගෙන් වන නාම-රූපයන්ගේ පැවැතුම් දැක පෙර කියූ සේ තුන් කල්හි ම වූ සැකයෙන් මිදෙන්නේ ය. විචි-කිච්ඡාව පහව යන්නී ය.

**අනෙකෙක්** නාම-රූපසඞ්ඛ්‍යාතසංස්කාරයන්ගේ දිරායෑම ද දිරාගියවුන්ගේ මරණය ද බලා 'මේ සංස්කාරයන්ගේ දිරීම හා මැරීම ජාතිය ඇති කල්හි ම වන්නේ ය, ජාතිය කර්මභවය ඇති කල්හි ම වන්නී ය, කර්මභවය කාමොපාදානාදිය ඇති කල්හි ද, කාමොපාදානාදිය තෘෂ්ණාව ඇති කල්හි ද, තෘෂ්ණාව සුඛ-දුඃඛ-උපෙක්ෂා වෙදනා ඇති කල්හි ද, වෙදනාව ස්පර්ශය ඇති කල්හි ද චක්ෂුරාදිෂඩායතන ඇති කල්හි ද, ෂඩායතන නාම-රූප ඇති කල්හි ද, නාම-රූප ප්‍රතිසන්ධිවිඥානය ඇති කල්හි ද, ප්‍රතිසන්ධිවිඥානය කුශලාකුශලකර්මසඞ්ඛ්‍යාත සංස්කාර ඇති කල්හි ද, සංස්කාර අවිද්‍යාව ඇති කල්හි ද, වන්නේ ය, යි ප්‍රතිලොමප්‍රතීත්‍යසමුත්පාද වශයෙන් නාම-රූපයන් පිළිබඳ ප්‍රත්‍යය නිශ්චය කරන්නේ ය. එකල්හි හෙතෙමේ සැකයෙන් මිදෙන්නේ ය. විචිකිච්ඡාව පහව යන්නී ය.

**අනෙකෙක්** 'අවිද්‍යාව නිසා සංස්කාරයෝ, සංස්කාරයන් නිසා විඥාන ය, විඥානය නිසා නාමරූප, නාමරූප නිසා ෂඩායතන, ෂඩායතන නිසා ස්පර්ශය, ස්පර්ශය නිසා වෙදනාව, වෙදනාව නිසා තෘෂ්ණාව, තෘෂ්ණාව නිසා උපාදාන, උපාදාන නිසා භවය, භවය නිසා ජාතිය, ජාතිය නිසා ජරා-මරණ-ශොක-පරිදෙව දුඃඛ-

දෞර්මනස්‍ය-උපායාසයෝ වෙත්,යි අනුලෝමප්‍රතීත්‍යසමුත්පාද වශයෙන් නාමරූපයන් පිළිබඳ ප්‍රත්‍යය නිශ්චය කරන්නේ ය. මෙසේ ප්‍රත්‍යය නිශ්චය කරණුයේ සැකයෙන් මිදෙන්නේ ය. විචිකිච්ඡාව පහව යන්නී ය.

**අනෙකෙක්** ‘යටගිය ජාතියෙහි කර්ම රැස් කරණ කාලයෙහි දුඃඛාදීන්හි මුළාවීම නම් වූ අවිද්‍යාව, කුශලාකුශලකර්ම රැස්කිරීම නම්වූ පූර්වචේතනා සඞ්ඛ්‍යාතසංස්කාරය, උත්පත්තිභවයෙහි ඇලීම නම් වූ තෘෂ්ණාව, ‘මේ කර්මය රැස් කොට අසවල් තැන සැප විඳින්නෙමි, උපච්ඡේදයට පැමිණෙන්නෙමි,යි ඈ විසින් පැවැති කර්මභවයට ප්‍රත්‍යය වූ දැඩිගැණීම නම් වූ උපාදානය, අපරචේතනා සඞ්ඛ්‍යාතසප්තාමජවනචේතා නම් වූ කර්මභවය යන පූර්වකර්මභවයෙහි වූ මේ පස් දෙන, මේ ජාතියෙහි පිළිසිඳ ගැණීමට ප්‍රත්‍යය වෙති යි ද, මෙහි අතීතභවය හා වර්තමානභවය ගැළපීම් වශයෙන් උපන් බැවින් ප්‍රතිසන්ධි නම් වූ විඥානය, ඒ හෙතුවෙන් වන රූපාරූපධර්මයන්ගේ පහළවීම නම් වූ නාමරූපය, චක්ෂුඃප්‍රසාදදී වූ ආයතනය, අරමුණු පැහැසීම් විසින් උපදනා ස්පර්ශය, ඒ හා උපන් විපාකවෙදනාව යන මේ පස, මේ උත්පත්තිභවයෙහි පෙර කළ කර්මහෙතුයෙන් වෙති යි ද, මේ ජාතියෙහිදු අවිද්‍යාදී වූ පස, මත්තෙහි පිළිසිඳ ගැණීමට ප්‍රත්‍යය වෙති යි ද, මෙසේ කම්මවට්ට විපාකවට්ට විසින් නාමරූපයන්ගේ ප්‍රත්‍යය බලන්නේ ය. එහි කම්මවට්ටය, දිට්ඨධම්මවෙදනීය-උපපජ්ජවෙදනීය-අපරාපරියවෙදනීය – අහොසිකම්ම යි විපාක දෙන කාලයාගේ වශයෙන් සිවුවැදෑරුම් ය. විපාක දෙන ක්‍රමවිසින් යගරුක-යබහුල-යදාසන්න-කටත්තාකම්ම යි සිවුවැදෑරුම් ය. කෘත්‍ය විසින් ජනක-උපත්ථම්භක-උපපීළක-උපඝාතක යි සිවුවැදෑරුම් ය.[1]

මෙසේ ද්වාදශවිධකර්මයන්ගේ කර්මභේදය හා විපාකභේදය ද බුදුවරුන්ගේ කර්මවිපාකඥානයට තතු සේ පෙණෙන්නේ ය. එය ශ්‍රාවකයන් හා අසාධාරණ ය. ශ්‍රාවකයනට විෂය නො වේ. විදර්ශකයා විසින් කර්මාන්තර ය ද විපාකාන්තරය ද ලෙශමාත්‍රයකින් නමුදු දතයුතු බැවින් විදර්ශකයා පිණිස මේ මුඛමාත්‍රයෙක් මෙහි දක්වුනේ ය. මේ ද්වාදශවිධකර්මය, කම්මවට්ටයෙහි බහා නාමරූපයන්ගේ ප්‍රත්‍යයය නුවණින් පිරිමදිනුයේ කම්මවට්ට-විපාකවට්ට වශයෙන් ප්‍රත්‍යයයන්ගෙන් නාමරූපයන්ගේ පැවැත්ම දැක ‘මේ කර්මය දැන් පවත්නා ලෙසින් අතීතයෙහි ද කම්මවට්ට-විපාකවට්ට විසින් පැවැත්තේ ය, අනාගතයෙහි ද කම්මවට්ට-විපාකවට්ට වශයෙන් ප්‍රත්‍යය නිසා පවතින්නේ ය යි කර්මය ද, කර්මවිපාකය ද, කර්මවෘත්තය ද, විපාකවෘත්තය ද, කර්මප්‍රවෘත්තිය ද, විපාක

1. 5. 7. ‘පාපකං කම්මං’ යනු බලනු.

ප්‍රවෘත්තිය ද, කර්මසන්තතිය ද, විපාකසන්තතිය ද, ක්‍රියා ද, ක්‍රියා ඵල ද, කර්මයෙන් විපාකයෝ පවතිත්, විපාකය කර්මයෙන් හට ගණියි, එහෙයින් නැවත ඉපැත්ම වෙයි, ලෝකය මෙසේ පවති,යි සලකන්නේ ය. මෙසේ නුවණින් මේ තත්ත්වය සලකන්න හුගේ පූර්වාන්තාදිය නිසා පෙර කියූ සේ 'මම වීම් ද?' යනාදී නයින් පැවැති සොළොස් වැදෑරුම් සැකය පහව යන්නේ ය. සියලු භව – යෝනි – ගති – ඨිති – සත්තාවාසයන්හි හෙතුඵලසම්බන්ධයෙන් පවත්නා නාම-රූප මාත්‍රය ම ඔහුට වැටහෙන්නේ ය. මෙතෙමේ සත්ත්ව පුද්ගල ආත්ම විසින් ගතයුත්තෙක් ඇතැ යි නො දක්නේ ය. දානාදික්‍රියාවන් මුත් ආත්ම පුද්ගල වශයෙන් ගත යුත්තක් නො වන බැවින් ඒ ඒ ක්‍රියා කරන්නකු, විපාක සකන්ධයන්ගේ පැවැත්ම හැර විපාක විඳින්නකු නො දක්නේ ය. 'කාරණය ඇති කල්හි කාරක යි ද, විපාකයන්ගේ පැවැත්ම ඇති කල්හි ඵල විඳින්නේ ය' යි ද ව්‍යවහාරමාත්‍රයෙන් නුවණැත්තෝ ව්‍යවහාර කරති,යි මනා කොට නුවණින් දක්නේ ය.

කම්මවට්ට – විපාකවට්ට වශයෙන් නාමරූපයන්ගේ ප්‍රත්‍යය පිරිසිඳ දැනීමෙන් තුන් කල්හි වූ සකන්ධයන්ගේ පැවැත්මෙහි පහව ගිය සැක ඇතිව සිටි ඒ යෝගියා විසින් අතීත-අනාගත-ප්‍රත්‍යුත්පන්න වූ සියලු ධර්මයෝ ච්‍යුති-ප්‍රතිසන්ධි වශයෙන් දන්නාලද්දහු වෙත්. මේ ඔහුගේ ඤාතපරිඤ්ඤා ය.

මෙතෙමේ "අතීතභවයෙහි කර්මය නිසා උපන් සකන්ධයෝ ඒ භවයෙහි දී ම නිරුද්ධ වූහ, අතීතභවයන්හි දී කරණ ලද කර්මයන් නිසා මේ භවයෙහි අන්‍ය වූ ම සකන්ධයෝ පහළ වූහ, අතීතභවයෙන් මේ භවයට ආ එක ද ධර්මයෙක් නැත්තේ ය, මේ භවයෙහි ද කර්මයන් නිසා උපන් සකන්ධයෝ මේ භවයෙහි ම නිරුද්ධ වෙත්, අනාගතභවයෙහි අන්‍ය වූ සකන්ධයෝ පහළවන්නාහ. මේ භවයෙන් පුනර්භවයට එක ද ධර්මයෙක් නො යන්නේ ය, එහෙයින් ධර්මයන්ගේ භවයෙන් භවයට යෑමෙක් නම් නැත්තේ ය"යි දන්නේ ය.

ගුරුමුඛයෙන් හැදෑරූ මන්ත්‍රාදිය අතැවැසියාගේ මුඛයට ඇතුල් නො වේ. එහෙත් ඒ නො ඇතුල්වීමෙන් අතැවැසියාගේ හැදෑරීම නො පවත්නේ නො වේ. පවත්නේ ම ය. දූතයා විසින් බොනලද මනෞෂධකය රෝගියාගේ උදරයට නො වදින්නේ ය. ඒ නො වැදීමෙන් ඔහුගේ රෝගය නො සන්සිඳෙන්නේ නො වේ. සන්සිඳෙන්නේ ම ය. කැටපතක් ඉදිරියෙහි සිට කරණ මුහුණ සැරසීම කැටපතෙහි පෙණෙන මූවපිළිබිඹුවට නො ද යන්නේ ය. එහෙත් කැටපතෙහි ඒ සැරසීම නො පෙණෙන්නේ නො වේ.

පෙණෙන්නේ ම ය. එක් පහන්වැටියක පහන්සිළුව අන් පහන් වැටියකට යන්නේ නො වේ. එහෙත් ඒ හෙතුයෙන් ඒ පහන් වැටියෙහි පහන්සිළුව නො දැල්වෙන්නේ නො වේ. දැල්වෙන්නේ ම ය. එ පරිද්දෙන් අතීතභවයෙන් මේ භවයට ද, මේ භවයෙන් පුනර්භවයට ද කිසිදු ධර්මයෙක් යන්නේ නො වේ. එහෙත් අතීත භවයෙහි ස්කන්ධ – ආයතන – ධාතුප්‍රත්‍යයයෙන් පුනර්භවයෙහි ද, මේ භවයෙහි ස්කන්ධ – ආයතන ධාතුප්‍රත්‍යයයෙන් පුනර්භවයෙහි ද ස්කන්ධ – ආයතන – ධාතූහු නො උපදින්නාහු නො වෙත්.

මෙසේ ච්‍යුති-ප්‍රතිසන්ධි වශයෙන් දක්වන ලද සියලු ධර්ම ඇති ඒ යොගීහුගේ, නුවණ සියලු අයුරින් නාමරූපයන් පිළිබඳ ප්‍රත්‍යයපරීක්ෂා කොට සිටියේ තහවුරු බවට පැමිණියේ වේ. ඔහු කෙරෙන් අතීත-අනාගත-වර්තමානස්කන්ධයන් පිළිබඳ ව පවත්නා සොළොස්වැදෑරුම් සැකය පහ ව යන්නේ ය. එ පමණක් නො ව බුද්ධ-ධම්ම-සඞ්ඝ-සික්ඛා-පුබ්බන්ත-අපරන්ත – පුබ්බන්තාපරාන්ත – පටිච්චසමුප්පාද යන අට තැන්හි වූ සැකය ද ප්‍රහීණ වන්නේ ය. දෙසැට මිසදිටු ද යටපත් වන්නී ය. මෙසේ නොයෙක් ක්‍රමයෙන් නාමරූපධර්මයන්ගේ ප්‍රත්‍යයපරීක්ෂායෙන් තුන් කල්හි පැවැති සැකය තරණය කොට සිටි නුවණ කඞ්ඛාවිතරණවිසුද්ධි ය යි දතයුතු ය. **ධම්මට්ඨිතිඤාණ-යථාභූතඤාණ-සම්මාදස්සන** යන නම් වලින් ද මෙය හඳුන්වනු ලබන්නී ය.

**“අවිජ්ජාපච්චයා සඞ්ඛාරා පච්චයසමුප්පන්නා, උභොපෙතෙ ධම්මා පච්චයසමුප්පන්නාති පච්චයපරිග්ගහෙ පඤ්ඤා ධම්මට්ඨිති ඤාණං”** යි ආ බැවින් අවිද්‍යාව හෙත්වාදිවශයෙන් සංස්කාරයන්ට ප්‍රත්‍යය වේ. සංස්කාර, ප්‍රත්‍යයයෙන් හට ගත් බැවින් ප්‍රත්‍යය සමුත්පන්න වේ. අවිද්‍යාව ද ආස්‍රවාදිප්‍රත්‍යයයෙන් උපදනා බැවින් අවිද්‍යා-සංස්කාර දෙක ම ප්‍රත්‍යයසමුත්පන්නය යි පිරිසිඳ දැනීම් වශයෙන් පැවැති නුවණ, ධම්මට්ඨිතිඤාණ නම් වේ.

අනිත්‍ය විසින් මෙනෙහි කරණුයේ, නිමිත්ත නම් වූ පඤ්ච-ස්කන්ධය ඇති සැටියෙන් දක්නේ ද, ඔහුගේ දැකීම සම්මාදස්සන නමි. වර්තමානස්කන්ධයන්හි ප්‍රත්‍යක්ෂයෙන් දක්නා ලද ධර්මයට අනු ව යැමෙන් අතීත-අනාගත-ස්කන්ධයන්හි ද යුක්ති වශයෙන් එළවා සියල සංස්කාර, අනිත්‍ය වශයෙන් බැලීමෙන් යට දැක් වූ ෂොඩශවිධ විචිකිත්සාස්ථානයෙහි හා බුද්ධාදී වූ අෂ්ටස්ථානයෙහි හා ද්වාෂෂ්ටිදෘෂ්ටිස්ථානයෙහි හා පැවැති සැකය පහව යන්නේ ය.

දුඃඛ විසින් මෙනෙහි කරණුයේ, පවත්ත නම් වූ උපාදාන-ස්කන්ධයාගේ පැවැත්ම කෙලශාභිසංස්කාරයන් විසින් පවත්වාලන බැවින් අභිශයින් දුඃඛ යි දක්නේ ද, ඔහුගේ ඒ දැකීම සම්මාදස්සන

නම්. වර්තමානස්කන්ධයන්හි ප්‍රත්‍යක්‍ෂ වශයෙන් දක්නා ලද ධර්මයට අනු ව යෑමෙන් අතීත-අනාගතස්කන්ධයන්හි ද යුක්ති වශයෙන් එළවා සියලු සංස්කාර, දුඃඛ වශයෙන් බැලීමෙන් යට **දක්** වූ ෂොඩශවිධ වූත් අෂ්ටවිධ වූත් සංශයස්ථානයෙහි හා ද්වාෂෂ්ටිවිධ වූ දෘෂ්ටිස්ථානයෙහි පැවැති සැකය පහව යන්නේ ය.

අනාත්ම විසින් මෙනෙහි කරණුයේ, සංස්කාරනිමිත්ත හා පවත්ත නම් වූ උපාදින්නස්කන්ධය ද තතු සේ දක්නේ ද, ඔහුගේ ඒ දැකීම සම්මාදස්සන නම්. වර්තමානස්කන්ධයන්හි ප්‍රත්‍යක්‍ෂ වශයෙන් දක්නා ලද ධර්මයට අනු ව යෑමෙන් අතීත-අනාගතස්කන්ධයන්හි ද යුක්ති වශයෙන් එළවා බැලීමෙන් සියලු සංස්කාර, අනාත්ම වශයෙන් බැලීමෙන් යථොක්ත ස්ථානයන්හි පැවැති සැකය පහව යන්නේ ය.

මෙසේ නොයෙක් ක්‍රමයෙන් නාම-රූප දෙදෙනාගේ ප්‍රත්‍යය පරීක්‍ෂායෙන් අතීත-අනාගත-වර්තමානස්කන්ධයන්හි වූ සැකය තරණය කොට සිටි නුවණ, කඞ්ඛාවිතරණවිසුද්ධි ය යි කියන ලද්දේ ය. මෙ නුවණින් යුක්ත වූ භාග්‍යවත් විදර්ශක තෙමේ බුදුසසුනෙහි ලද අස්වස් ඇතියේ ලද පිහිට ඇතියේ නියතගති ඇතියේ **'චුල්ලසොතාපන්න'** නම් වේ.

'මේ මග ය, මේ මග නො වේ ය' යි මග නො මග දැන ගැණීම් විසින් ලැබෙන නුවණ, **'මග්ගාමග්ගදස්සනවිසුද්ධි'** නම් වේ. එය මෙසේ කීහ: **"අයං මග්ගො අයං න මග්ගොති එවං මග්ගං ච අමග්ගං ච ඤත්වා ඨිතං ඤාණං මග්ගාමග්ගදස්සන විසුද්ධි නාම"** යනු විසිනි.

එහි මග නම්: ලොකොත්තරමාර්ගය යි. නො මග නම්: අභිමානවස්තු යි. සීලවිසුද්ධියෙන් කයත්, චිත්තවිසුද්ධියෙන් සිතත් පිරිසිදු කර ගත්තහුගේ නුවණ, දිට්ඨි-කඞ්ඛාවිතරණ විසුද්ධීන්ගෙන් තවත් දුරට පිරිසිදු වූ කල්හි ඔහුට පෙර කවර-දාකත් නො දුටුවිරූ ආලෝකයෙක් දක්නට ලැබෙන්නේ ය. ඒ හා ම ඔහුගේ සිතෙහි ප්‍රීති-ප්‍රශ්‍රබ්ධි ආදී ධර්මසමූහයෙක් නැඟී සිටින්නේ ය. මෙසේ දක්නට ලැබෙන සිතෙහි නැඟී සිටින ආලෝක ප්‍රීති ආදි ධර්ම, අභිමානවස්තු නම් වේ. මේ අභිමාන වස්තුසඞ්ඛ්‍යාතආලෝකාදිය 'මෙතෙක් නො ලැබූ ඤාණදස්සන විසුද්ධිය ලැබීම්' යි යන වැරදි හැඟීමට කරුණු වන බැවින් නො මග නම් වේ. මෙසේ ඤාණදස්සනවිසුද්ධිය ලැබීමෙහි විදර්ශක-යාගේ මග නො මග දෙක පිරිසිඳ දන්නා නුවණ 'මග්ගාමග්ග ඤාණ' නම්. ඒ ම, මග නො මග දෙක්හි උපදනා බලවත්

මූලාංයෙන් හා ලොභයෙන් විදර්ශකයා නගා සිටුවන බැවින් පිරිසිදු බවට පමුණු වන බැවින් 'මග්ගාමග්ගඤාණදස්සනවිසුද්ධි' යි කියනු ලැබේ.

පටන් ගත් විදර්ශනා ඇත්තහුට මේ ආලෝකාදිය පහළ වූ කල්හි මග නො මග දන්නා නුවණක් පහළ වන බැවින්, හෙතෙමේ අතීතාදිභෙද විසින් භෙදයට ගිය සියලු සංස්කාරධර්මයන් කලාප විසින් මිටි මිටි කොට නයවිදර්ශනාව පිණිස පළමු කොට පිළිවෙළින් යොග කරන්නේ ය. යොග කළ යුතු ය. කඞ්ඛාවිතරණවිසුද්ධියට අනතුරු ව එයට ලං කොට මෙය දෙසන ලද්දේ විදර්ශනාවට ද චක්ඛුදසකාදි වසයෙන් මිටි මිටි කොට කලාප විසින් පිරිමැදීම මුල් වන බැවිනි.

මෙහි තවත් ක්‍රමයෙක් වෙයි. ඒ නම්: පරිඥාවන්ගේ වශයෙන් යොග කිරීම ය. පරිඥා තුනෙකි. **ඤාතපරිඤ්ඤා – තීරණපරිඤ්ඤා – පහාණපරිඤ්ඤා** විසින්. එහි 'රූප ය නැසෙන වැනසෙන ලකුණු ඇත්තේ ය, වෙදනාව විඳීම ලකුණු කොට සිටියා ය, යනාදී වශයෙන් සකන්ධ – ධාතු – ආයතනාදි ධර්ම, ඒ ඒ ධර්මයනට අයත් ලක්‍ෂණ විසින් ඇති සැටියෙන් පිරිමැදීම සැලකීම දැනීම ඤාත-පරිඤ්ඤා ය.

'රූපය හැමදා එකසේ පවත්නේ නො වේ, එය හැම මොහොතෙහි වෙනස් ව යන්නේ ය, නිති පැවැත්මෙක් නැත්තේ ය, වෙදනාව ද එසේ ය, යනාදී ලෙසින් රූපාදිධර්ම පිළිබඳ සාධාරණ පොදු ලක්‍ෂණ වූ අනිත්‍ය – දුඃඛ – අනාත්ම යන ලකුණු අරමුණු කිරීමෙන් උපන් දැනීම තීරණපරිඤ්ඤා ය.

රූපාදී වූ ත්‍රෛභූමක ධර්මයන් කෙරෙහි නිත්‍ය – ශුභ – සුඛාදී සංඥාවන් දුරු කිරීම් බැහැරලීම් වශයෙන් පැවැති ස්වභාවය, ලක්‍ෂණය අරමුණු කොට සිටි විදර්ශනාප්‍රඥාව පහාණපරිඤ්ඤා ය. විස්තර **පටිසම්භිදාමග්ග, විසුද්ධිමග්ග** දෙක්හි ආයේ ය.

විදර්ශක තෙමේ තමන් ලැබූ කඞ්ඛාවිතරණවිසුද්ධියෙන් පසු කලාපසම්මර්ශනයෙහි පටන් යොග කරන්නේ ය. කලාපසම්මර්ශන නම්: කාම – රූප – අරූප යන තුන් බිමට අයත් අතීත – අනාගත – වර්තමාන ධර්මයන් බණපොතෙහි කියූ ලෙසින් සුදුසු පරිදි මිටි මිටි කොට හකුළා ගෙණ සිතින් පිරිමැදීම ය. මේ පිරිමැදීම ඔවුන්ගේ අනිත්‍යාදිලක්‍ෂණත්‍රයය පිරිසිදු ව නුවණට හසුවන තුරු ඔවුන් පිළිබඳ නිත්‍ය – ශුභ – සුඛාදිසංඥාවන් දුර ගසා යන තුරු එකින් එක හෝ මිටි මිටි කොට හෝ අනිත්‍යාදිලක්‍ෂණ මෙනෙහි කිරීම් වශයෙන් වන්නේ ය.

අනිත්‍යාදි වශයෙන් පිරිමැදිය යුතු ධර්ම නම්: **සක්ඛ** – **ද්වාර** – **ආරම්මණ** – **විඤ්ඤාණ** – ඵස්ස – වේදනා – සඤ්ඤා – චේතනා – තණ්හා – විතක්ක – විචාර – ධාතු – කසිණ – කායකොට්ඨාස – ආයතන – ධාතු – ඉන්ද්‍රිය – කාමාදිධාතු – භව – ඣාන – අප්පමඤ්ඤා – සමාපත්ති – පටිච්චසමුප්පාදඞ්ග යන මේ ය.

එහි සක්ඛ පසෙකි. ආරම්මණ සයෙකි. විඤ්ඤාණ සයෙකි. ඵස්ස සයෙකි. සඤ්ඤා සයෙකි. චේතනා සයෙකි. තණ්හා සයෙකි. විතක්ක සයෙකි. විචාර සයෙකි. ධාතු සයෙකි. කසිණ දසයෙකි. කාය කොට්ඨාස දෙතිසෙකි. ආයතන දෙළොසෙකි. ධාතු අටළොසෙකි. ඉන්ද්‍රිය දෙවිස්සෙකි. ධාතු තුනෙකි. භව නවයෙකි. ඣාන සතරෙකි අප්පමඤ්ඤා සතරෙකි. සමාපත්ති සතරෙකි. පටිච්ච සමුප්පාදඞ්ග දෙළොසෙකි. මුළුල්ල දෙසිය එකෙකි.

මෙ කියූ ධර්ම අනිත්‍යලක්ෂණයෙන් යුක්ත වන බැවින් අනිත්‍ය ය. දුඃඛලක්ෂණයෙන් යුක්ත බැවින් දුඃඛ ය. අනාත්මලක්ෂණයෙන් යුක්ත බැවින් අනාත්ම ය.

එහි **අනිත්‍යලක්ෂණ** නම්: බිඳී යෑම ය. මේ බිඳී යෑමට තුඩු දී සිටුනා පිළිසිඳ ගත් තැන් පටන් නැසීම තෙක් මොහොතක් පාසා වන මේරීම – දිරීම – වියළීම – තරවීම – කොරවීම – කුදුවීම – දත් වැටීම – ඇස් අඳුරුවීම – නර නැගීම – කන් නො ඇසීම – අත පය වෙව්ලීම – ඇඟ රැලි වැටීම – කැලල් නැගීම යනාදී වූ ත්‍රෛභූමකරූපාරූපධර්මයන් කෙරෙහි වන වෙනස් බැව් ය කොට්ත්.

**දුඃඛලක්ෂණ** නම්: පිළිසිඳ ගත් තැන් පටන් නිතර දවරැයි පෙළෙන බව ය. මේරීම – දිරීම – වියළීම යනාදී වූ මෙයින් හා ශීතයෙන් උෂ්ණයෙන් සතුරන්ගෙන් මිතුරන්ගෙන් හිමියන්ගෙන් අඹුන්ගෙන් දූන්ගෙන් පුතුන්ගෙන් රජුන්ගෙන් සොරුන්ගෙන් මවගෙන් පියාගෙන් බෑයාගෙන් බුහුනගෙන් ගුරුන්ගෙන් සිසුන් ගෙන් යන මේ ඈ නොයෙක් දෙනාගෙන් නොයෙක් ලෙසින් වන පෙළීම ය. තැවීම ය ගැටීම ය කොට්ත්.

**අනාත්මලක්ෂණ** නම්: තම කැමැත්තට අනු ව නො පවත්නා බව ය. තම කැමැත්තට අනු ව ඉපදීමට, නො දිරීමට, නො මැරීමට, තම පඤ්චස්කන්ධය පිළිබඳ කිසිවක් තමන්ගේ යටතෙහි පැවැත් වීමට නො හැකි බව ය. ආධිපත්‍යයක් නො මැති බවය. කරන්නකු විඳින්නකු නො ලැබීම ය. එක් ම පැවැත්මක් නැති බව ය. ගත යුතු කිසිත් හරයක් නැති බව ය කොට්ත්.

අනිත්‍යාදිලක්ෂණවත් සක්ඛාදිධර්මසමූහය නුවණින් පිරි-මදින්නා වූ විදර්ශක තෙමේ මේ ධර්මසමූහයට අයත් එක් එක්

ධර්මය අතීත - අනාගත - ප්‍රත්‍යුත්පන්න - ආධ්‍යාත්මික - බාහිර - ඖදාරික - සූක්‍ෂම - හීන - ප්‍රණීත - දූර - සන්තික යන එකොළොස් අවකාශයකින් පිරිසිඳ අනිත්‍ය විසින් දුඃඛ විසින් අනාත්ම විසින් පිරිසිඳින්නේ ය.

එහි විදර්‍ශක තෙමේ "අතීත භවයෙහි වූ රූපයෝ වර්තමාන භවයට නො ද පැමිණියෝ අතීතභවයෙහි දී ම නිරුද්ධ වූවෝ අනිත්‍යයහ, අනාගත භවයෙහි උපදනා රූපයෝ ඉදිරියෙහි වන භවයකට නො ද පැමිණෙන්නෝ අනාගත භවයෙහි දී ම නිරුද්ධ වන්නෝ අනිත්‍යයහ, වර්තමානභවයෙහි උපදනා රූපයෝ ඉදිරි භවයට නො ද පැමිණෙන්නෝ වර්තමාන භවයෙහි දී ම නිරුද්ධ වන්නෝ අනිත්‍යයහ, සිය සතන්හි උපදනා රූපයෝ බැහැර නො යන්නෝ සිය සතන්හි ම නිරුද්ධ වන්නෝ අනිත්‍යයහ, බැහැර උපදනා රූපයෝ සිය සතන්හි නො වදිනුවෝ බැහැර ම නිරුද්ධ වන්නෝ අනිත්‍යයහ. ඖදාරිකරූපයෝ සූක්‍ෂමරූප භාවයට නො යන්නෝ ඖදාරිකභාවයෙන් ම නිරුද්ධ වන්නෝ අනිත්‍යයහ, සූක්‍ෂම රූපයෝ ඖදාරිකභාවයට නො යන්නෝ සූක්‍ෂමරූපභාවයෙන් ම නිරුද්ධ වන්නෝ අනිත්‍යයහ, හීනරූපයෝ ප්‍රණීත රූපභාවයට නො යන්නෝ හීනරූපභාවයෙන් ම නිරුද්ධ වන්නෝ අනිත්‍යයහ, ප්‍රණීතරූපයෝ හීනරූපභාවයට නො යන්නෝ ප්‍රණීතරූපභාවයෙන් ම නිරුද්ධ වන්නෝ අනිත්‍යයහ, දූරරූපයෝ වෙත නො පැමිණෙන්නෝ දුර ම නිරුද්ධ වන්නෝ අනිත්‍යයහ, සන්තිකරූපයෝ දුර නො යන්නෝ වෙත ම නිරුද්ධ වන්නෝ අනිත්‍යයහ" යි මෙසේ රූපස්කන්ධය අවකාශ වශයෙන් එකොළසකට බෙදා අනිත්‍ය විසින් නැසෙන වැනසෙන ක්‍ෂය වන අරුත් විසින් විදර්‍ශනා කරන්නේ ය. මේ වනාහි මේ එකොළොස් අවකාශයෙහි වූ රූපස්කන්ධය පිළිබඳ සම්මර්‍ශනය යි. මේ එක් සම්මර්‍ශනයෙකි.

එසේ ම "මම නැසෙමි' මා සතු දෑය නැසේ ය" යි සිතන මෙනෙහි කරණ කෙලෙස් නො පැහූ පුහුදුන්හට බිය උපදවන අරුතින් දුකට තැන් වන බැවින් මේ එකොළොස් අවකාශයෙහි වූ රූපස්කන්ධය, දුඃඛ යි විදර්‍ශනා කරන්නේ ය. මෙ ද රූපස්කන්ධය පිළිබඳ එක් සම්මර්‍ශනයෙකි.

අනිත්‍ය වූ දුක් වූ රූපස්කන්ධයෙහි හරයෙක් නැත, කරන්නෙක් නැත, විඳින්නෙක් නැතැ යි, රූපස්කන්ධය අනාත්ම වශයෙන් නිසරු, අරුතින් විදර්‍ශනා කරන්නේ ය. මෙ ද රූපස්කන්ධය පිළිබඳ එක් සම්මර්‍ශනයකි.

විදර්ශක, මෙසේ රූපස්කන්ධය අවකාශ එකොළොසකට බෙදා, අනිත්‍ය - දුඃඛ - අනාත්ම විසින් සම්මර්ශනය කරණ බැවින් රූපස්කන්ධ යෙහි, ඒ එකොළොස් තන්හි, අනිත්‍ය විසින් එකොළොසෙක. දුඃඛ විසින් එකොළොසෙක, අනාත්ම විසින් එකොළොසෙකැ යි සම්මර්ශන තෙතිසෙක් වන්නේ ය. වේදනා-සංඥා-සංස්කාර-විඥාන යන අනික් ස්කන්ධ සතරෙහි ද එකෙක, එකෙක මෙසේ සම්මර්ශන තෙතිස තෙතිස ලැබෙන බැවින් ස්කන්ධ පසෙහි සම්මර්ශන එක්සිය පන් සැටෙක් වන්නේ ය.

ද්වාර ආරම්මණාදී වූ ඉතිරි දෙ විසි කොටස් ද, මෙසේ කොටස් වශයෙන් එකොළොසට, එකොළොසට බෙදා අනිත්‍යාදීන්ගේ වශයෙන් වඩනා කල්හි එතැන්හි ද සම්මර්ශනඥානය ලැබෙන බව යට කියූ ලෙසින් දතයුතු ය. මෙහි දක් වූ පඤ්චස්කන්ධාදීන් අතුරෙහි යම් කොටසෙක් වඩාත් පැහැදිලි ව වැටහේ නම්, සුවසේ පිරිමැදිය හැක්කේ නම් විදර්ශකයා එහි ම යොග කළ යුතු ය. සම්මර්ශනය දියුණුවත් ම මුල දී නො වැටහුණු ධර්ම වැටහෙන්නේ ය. සම්මර්ශනය ද තව තවත් වැඩෙන්නේ ය. මෙසේ වැඩීමෙන් ලබා ගත් තිලකුණු දැක්ම වඩාලාත් තහවුරු කර ගැණීම පිණිස පිරිසිදු වනු පිණිස විදර්ශක තෙ මේ:

**අනිච්චතො** = අනිත්‍යය අන්ත කොට ඇති බැවින්, පූර්වාපරඅන්ත ඇතිබැවින් අනිත්‍ය වශයෙන්, **දුක්ඛතො** = ඉපදීම් පෙළීම් දෙකෙන් පෙළෙන බැවින්, දුකට වස්තු බැවින් දුඃඛ වශයෙන්, **රොගතො** = ප්‍රත්‍යයයෙන් යැපිය යුතු බැවින්, සියලු රොගයනට මුල් බැවින් රොග වශයෙන්, **ගණ්ඩතො** = දුක්පිදුම් ඇති බැවින්, කෙලෙස් අසුචි ගලන බැවින්, ඉපදීම - දිරීම - ඉදිමීම - පැසවීම - බිඳීම යන මෙයින් යුක්ත බැවින් ගණ්ඩවශයෙන්, **සල්ලතො** = පීඩා උපදවන බැවින්, ඇතුළත විඳුනා බැවින්, ආර්‍ය්‍යමාර්ගයෙන් මුත් අන් මගකින් බැහැර කළ නො හැකි බැවින් සල්ල වශයෙන්, **අඝතො** = ගැරහිය යුතු බැවින්, අවැඩ එළවන බැවින්, දුකට වස්තු බැවින් අඝවශයෙන්, **ආබාධතො** = පරහට යටත් බැවින්, ආබාධ-යනට පිහිට බැවින් ආබාධ වශයෙන්, **පරතො** = තම වශයෙහි නො පවත්නා බැවින්, ‘නො දිරව’ නො මියේවා’යි මෙසේ කළ නියමයනට යටත් නො වන බැවින් පරවශයෙන්, **පලොකතො** = ව්‍යාධි - ජරා - මරණයන්ගෙන් බිඳෙන බැවින් පලොක වශයෙන්, **ඊතිතො** = මහත් වූ නොයෙක් ව්‍යසන පමුණු වන බැවින් ඊති-වශයෙන්, **උපද්දවතො** = නො දත් මහත් අනර්ථ පමුණු වන බැවින්, සියලු උපද්‍රවයනට වස්තු බැවින් උපද්දව වශයෙන්, **භය-තො** = සියලු බිය උපදවන තැන් බැවින්, නිවනට සතුරු බැවින්

භය වශයෙන්, **උපසග්ගතො** = අනර්ථ ලුහු බඳිනා බැවින්, රාග - ද්වෙෂාදී වූ නොයෙක් දෙෂයන් එල්බ සිටුනා බැවින්, රාගාදීන් විසින් ඇලෙන බැවින් උපසග්ගවශයෙන්, **චලතො** = ජරා - ව්‍යාධි - මරණයෙන් හා අටලෝදහමින් සැලෙන බැවින් චල වශයෙන්, **පභඞ්ගුතො** = උපක්‍රමයෙන් හා ස්වභාව විසින් නැසෙන බැවින් පභඞ්ගු වශයෙන්, **අද්ධුවතො** = සියලු කල්හි, ගසක ගෙඩියක් සේ වැටෙන සැහැවි ඇති බැවින් අද්ධුව වශයෙන්, **අතාණතො** = ජරා - මරණාදී වූ දුකින් හා අපායාදී වූ දුකින් නො රැකිය හැකි බැවින්, රැකුම් නැති බැවින් අතාන වශයෙන්, **අලෙණතො** = රක්‍ෂාස්ථාන සොයන්නවුනට රක්‍ෂාස්ථාන නොවන බැවින්, තමාට හා රක්‍ෂාස්ථාන නො වන බැවින් අලෙන වශයෙන්, **අසරණතො** = පැමිණි බිය දුරු කිරීමෙන් සත්නට පිහිට වීමෙහි අපොහොසත් බැවින්, තමාට හා පිහිට නො වන බැවින් අශරණ වශයෙන්, **රිත්තතො** = ධ්‍රුව - සුභ - සුඛ - ආත්මභාවයෙන් සිස් බැවින් රික්ත වශයෙන්, **තුච්ඡතො** = සිස් බැවින් හා අල්ප බැවින් හා ලාමක බැවින් තුච්ඡ වශයෙන්, **සුඤ්ඤතො** = ස්වාමී - නිවාසී - කාරක - වේදක - අධිෂ්ඨායික යන ආත්මභාවයෙන් සිස් බැවින් සුඤ්ඤ වශයෙන්, **අනත්තතො** = තමා ද ස්වාමිකාදිභාවයෙන් තොර බැවින් අනත්ත වශයෙන්, **ආදීනවතො** = දුක් බැවින්, දිළිඳු බැවින් ආදීනව වශයෙන්, **විපරිණාමධම්මතො** = ජරා - මරණ දෙකින් පෙළෙන බැවින් විපරිණාමධම්ම වශයෙන්, **අසාරකතො** = දුර්වල බැවින්, පහසු වෙන් බිඳිය හැකි බැවින් අසාර වශයෙන්, **අඝමූලකතො** = පවට මුල් බැවින් අඝමූලක වශයෙන්, **වධකතො** = මිතුරකු වැනි සතුරකු සේ විශ්වස්හි තබා සිටුනවුන් නසන බැවින් වධක වශයෙන්, **විභවතො** = නිත්‍ය - ශුභ - සුඛාදී වූ වැඩීම් නැති බැවින් විභව වශයෙන්, **සාසවතො** = ආශ්‍රවයනට හෙතු බැවින් සාසව වශයෙන්, **සඞ්ඛතතො** = ප්‍රත්‍යයෙන් නිපදවන ලද බැවින් සඞ්ඛත වශයෙන්, **මාරාමිසතො** = මෘත්‍යු මාරාදීනට ගොදුරු වන බැවින් මාරාමිස වශයෙන්, **ජාතිධම්මතො** = උපදනා සැහැවි ඇති බැවින් ජාතිධම්ම වශයෙන්, **ජරාධම්මතො** = දිරීම් සැහැවි ඇති බැවින් ජරාධම්ම වශයෙන්, **ව්‍යාධිධම්මතො** = ලෙඩ රෝ සැහැවි කොට ඇති බැවින් ව්‍යාධිධම්මවශයෙන්, **මරණධම්මතො** = මැරීම් සැහැවි ඇති බැවින් මරණධම්මවශයෙන්, **සොකධම්මතො** = ශොකය ස්වභාවය කොට ඇති බැවින් සොකධම්මවශයෙන්, **පරිදෙවධම්මතො** = වැළපීම ස්වභාවය කොට ඇති බැවින් පරිදෙවධම්ම වශයෙන්, **උපායාසධම්මතො** = දැඩි තැවීම ස්වභාවය කොට ඇති බැවින් උපායාසධම්ම වශයෙන්, **සඞ්කිලෙසධම්මතො** = තෘෂ්ණා - දෘෂ්ටි - දුශ්චරිත සඞ්-

කෙලශයනට ගොදුරු වන බැවින් සඞ්කිලෙසධම්මවශයෙන්, යන ප්‍රභෙද විසින් මෙසේ විදර්ශනා කරන්නේ ය. මෙ කියූ සම සතළිස් විදර්ශනාවෝ අනිත්‍යාදිඅනුපස්සනා තුනෙහි ඇතුළත් ව සිටියහ.

එහි අනිච්ච - පලොක - චල - පභඞ්ගු - අද්ධුව - විපරිණාම ධම්ම - අසාරක - විභව - සඞ්ඛත - මරණධම්ම වශයෙන් එක් එක් ස්කන්ධයෙහි දසය දසය බැගින් පඤ්චස්කන්ධයෙහි අනිච්චානුපස්සනාවෝ පණසක් වෙත්.

දුක්ඛ - රොග - ගණ්ඩ - සල්ල - අඝ - ආබාධ - ඊති - උපද්දව - භය - උපසග්ග - අතාණ - අලෙන - අසරණ - ආදීනව - අඝමූල - වධක - සාසව - මාරාමිස - ජාතිධම්ම - ජරාධම්ම - ව්‍යාධිධම්ම - සොකධම්ම-පරිදෙවධම්ම-උපායාසධම්ම-සංකිලෙසධම්ම වශයෙන් එක් එක් ස්කන්ධයෙහි පස් විස්ස පස් විස්ස බැගින් පඤ්චස්කන්ධයෙහි දුක්ඛානුපස්සනාවෝ එක්සිය පස් විස්සක් වෙත්.

පර - රිත්ත - තුච්ඡ - සුඤ්ඤ - අනත්ත වශයෙන් එක් එක් ස්කන්ධයෙහි පස පස බැගින් පඤ්චස්කන්ධයෙහි අනත්තානුපස්සනාවෝ පස් විස්සක් වෙත්.

මෙසේ අනිච්චාදී වූ අනුපස්සනා තුනට ඇතුළත් වූ දෙසියයක් භෙදවත් වූ අනිත්‍යාදිසම්මර්ශනයෙන් පඤ්චස්කන්ධය සම්මර්ශනය කරන්නා වූ විදර්ශකයාගේ නයවිපස්සනා නම් වූ තිලකුණු මෙනෙහි කිරීම තහවුරු වන්නේ ය. නයවිපස්සනා වසයෙනුදු වැර වඩන්නා වූ විදර්ශකයාහට ඒ නයවිපස්සනාව තහවුරු නො වේ නම්, උපන්නුපන් සංස්කාරයන්ගේ විනාශය දැකීම - ඒ විනාශය වඩාත් ආදරයෙන් දැකීම - නිතර අතර නො තබා සංස්කාරවිනාශය දැකීමෙහි යෙදීම — ආවාසාදිසතප්‍රායසෙවනය — විදර්ශනාසමාධිහුගේ නිමිති ගැණීම -සප්තබොධ්‍යඞ්ගයන් අනු ව පැවැත්ම - කායජීවිත දෙක්හි පහ වූ අපෙක්‍ෂාව - උපනුපන් පීඩා උත්සාහයෙන් මැඩලීම - අනිමතාණිසිද්ධිය තෙක් භාවනා කිරීම යන මේ ගුණ නවය වඩා මෙ තෙමේ ශ්‍රද්ධාදිඉන්ද්‍රියයන් තියුණු කරන්නේ ය.

මේ නව අයුරින් ශ්‍රද්ධාදිඉන්ද්‍රියයන් තියුණු කොට ගත් විදර්ශක, **ආවාස-ගොචර-භස්ස-පුග්ගල-භොජන-උතු-ඉරියොපථ** යන නො සැප වූ මෙ සත දුරු කොට සැප දැය සෙවනය කරන්නේ ය. ඒ අතර, කලෙක රූපය කලෙක අරූපය සම්මර්ශනය කරන්නේ ය. එහි රූපසම්මර්ශනය කරන්නේ කාමාවචරාදිභූමිවශයෙන් ද අණ්ඩජාදියොනි වශයෙන් ද භින්න වූ සත්ත්වයනට උපදනා රූප, කම්ම-

**කම්මසමුට්ඨාන - කම්මපච්චය - කම්මපච්චයචිත්තසමුට්ඨාන
- කම්මපච්චයආහාරසමුට්ඨාන - කම්මපච්චයඋතුසමුට්ඨාන**
විසින් ඉපදීම-පැවතීම-නැසීම යන මෙතැන්හි ද, **ආහාර-ආහාර
සමුට්ඨාන - ආහාරපච්චය - ආහාරපච්චයආහාරසමුට්ඨාන -
ආහාරපච්චයඋතුසමුට්ඨාන** විසින් රූපයන්නේ ඉපදීම-පැවැතීම
-නැසීම යන මේ තැන්හි ද වගවිභාග ඇති සැටියෙන් විග්‍රහ කොට
සම්මර්ශනය කරන්නේ ය. මෙසේ සම්මර්ශනය කරන්, රූපයන්ගේ
ඉපදීම දක්නේ ම ක්ෂණික ව රූපවිනාශ වන බැවින් රූපයන්ගේ
නැසීම ද දක්නේ ය. ඒ හා ම එ දෙක අතර වූ පැවැත්ම ද දකී.

අනතුරු ව අරූපසම්මර්ශන කරන්නේ අරූපයන්ගේ හට-
ගැණීම දක්නේ ය. මේ දැකීම එක් අසූවක් ලෞකිකචිත්තයන්ගේ
ඉපදීම් වශයෙන් වන්නේ ය. අරූප නම්: නාමධර්ම ය. ඒ නම්:
එක් අසූවක් සිත් ය. ලොකෝත්තර සිත් මෙයට ඇතුළත් නො වේ.

පෙර අත්බැව්හි රැස් කරණ ලද කුශලාකුශලකර්මයන්ගේ වශ
යෙන් එකුන් විසි විපාක සිත් ප්‍රතිසන්ධියෙහි දී ඒ ඒ භවවශයෙන්
උපදනේ ය. ඒ එකුන්විසි සිත් ම ප්‍රතිසන්ධිචිත්තයට අනතුරු චිත්ත
යෙහි පටන් භවාඞ්ග වශයෙන් ද, ආයුකෙළවර චුති වශයෙන් ද
උපදිත්. ඔවුනතුරෙහි කාමාවචරවිපාකචිත්තය, චක්ෂුරාදිඅතිම-
හන්තාලම්බනයෙහි ද, මනොද්වාරයෙහි විභූතාලම්බනයෙහි ද මහා-
විපාක අට හා සන්තීරණ තුන ද යන සිත් එකොළොසින්, එකෙක්
තදාලම්බනවශයෙන් පවත්නේ ය. ස්ථිතිකාලයෙහි චක්ෂුඃප්‍රසාදය
නො නට බැවින් රූපයන්ගේ හමුවීමෙන් ආලොකය ඇසුරු කොට
සිටි මෙනෙහි කිරීම හෙතු කොට ඇති චක්ෂුර්විඥානචිත්තය සම්ප්‍ර-
යුක්ත ධර්මයන් හා එක්ව උපදී. උපදින නිරුද්ධ වන රූප, කිසිවක්
හට ප්‍රත්‍යය නො වන බැවින් ස්ථිතිඅවස්ථාවට පැමිණිසා වූ ම රූපය,
ස්ථිතිඅවස්ථායෙහි ම වූ චක්ෂුඃප්‍රසාදරූපයෙහි ගැටෙන්නේ ය. ඒ අර-
මුණ ගැටුනු කල්හි දෙවරක් භවඞ්ගචලන-භවඞ්ගුපච්ඡෙද විසින්
භවඞ්ගය ඉපද නිරුද්ධ වන්නේ ය. ඉතික්බිති ක්‍රියාමනොධාතු ව
එම අරමුණෙහි ආවර්ජනකෘත්‍යය සිද්ධ කරමින් ආවර්ජන නමින් පහළ
වන්නේ ය. නැවැත එම රූපය ම බලමින් කුසලවිපාක වූ හෝ
අකුසලවිපාක වූ හෝ චක්ෂුර්විඥානය ද, එයට අනතුරු ව එ ම රූපය
පිළිගණිමින් විපාකමනො ධාතුව සම්පටිච්ඡන නමින් ද, ඒ රූපය ම
මනා කොට තීරණය කරමින් විපාක අහෙතුක මනොවිඥාන ධාතුව
සන්තීරණ නමින් ද, ඒ ම විනිශ්චය කරමින් උපෙක්ෂාසහගත ක්‍රියා
අහෙතුක මනොවිඥානධාතුව මනොද්වාරාවර්ජන නමින් ද උපදිත්.
ඉන්පසු පස් වරක් හෝ සත් වරක්, කාමාවචර කුශල අකුශල ක්‍රියා

චිත්තයන් අතුරෙහි එක් සිතක් හෝ දෙවන වාර වශයෙන් උපෙක්ෂා සහගත අහේතුක චිත්තය හෝ ජවන වශයෙන් උපදනේ ය. අනතුරු ව කාමාවචරසත්ත්වයනට එකොළොස් තදාරම්මණ චිත්තයන් අතුරෙහි ජවනයනට සුදුසු පරිදි යම්කිසි සිතක් තදාරම්මණවශයෙන් උපදී. සොත ආදී වූ සිවු දොරෙහි ද මේ මෙසේ දත්තේ ය. මනොද්වාරයෙහි මහද්ගතරූපාරූප සිත් උපදී.

මෙසේ සදොරෙහි වන චිත්තයන්ගේ පැවැත්ම දැක, විදර්ශක තෙමේ අරූපයන්ගේ ඉපදීම බලනුයේ අරූප සම්මර්ශනය කරණුයේ කලෙක රූප ද නුවණින් විමසා බලා තිලකුණට නගා උදය - ව්‍යය ඥානානුසාරයෙන් ප්‍රඥාභාවනාව සපයන්නේ ය. මෙතෙමේ ම ප්‍රඥාභාවනාව සම්පූර්ණ කිරීමෙහි සමර්ථ වේ.

**අන් විදර්ශකයෙක්** රූපසප්තක අරූපසප්තක විසින් ද සංස්කාරධර්ම තිලකුණට නගා සම්මර්ශනය කරන්නේ ය. එහි **ආදාන-නික්ඛෙප-වයොවුද්ධත්ථංගමන-ආහාරසමුට්ඨාන-උතුසමුට්ඨාන-කම්මසමුට්ඨාන - චිත්තසමුට්ඨාන - ධම්මතාරූප** යන මේ සතින් රූපය විදර්ශනා කිරීම රූපසප්තක විසින් සම්මර්ශනය කිරීම නම් වේ.

**ආදානනික්ඛෙප** යන්නෙහි ආදාන නම්: පටිසන්ධිය යි. නික්ඛෙප නම්: චුතිය යි. පටිසන්ධි-චුති දෙකින් පිරිසිඳෙන එක එක භවයෙහි වන සියලු රූපධර්මයෝ උත්පාද-නිරුද්ධ වශයෙන් පවත්නෝ ය. ජරා මරණ දෙකින් පෙරළෙන්නෝ ය. තාවකාලිකයහ. නිත්‍යස්වභාවයෙන් නො පවත්නාහ. එහෙයින් අනිත්‍යයහ. උපන් රූපධර්ම ස්ථිතියට පැමිණීම, ස්ථිතියෙහි පැවැති රූපධර්ම ජරායෙන් පෙළීම, ජරාවට පැමිණි රූපධර්ම බිඳියෑම යන මෙයින් නිරතුරු ව පෙළෙන බැවින්, ඉවසීමට නො හැකි බැවින්, සසර දුකට කරුණු හෙයින්, සැපයට ප්‍රතිපක්ෂ බැවින් දුඃඛයහ. විශේෂ විසින් උපන් රූපධර්මයෝ ස්ථිතියට නො පැමිණෙත්වා, ස්ථිතියට නො පැමිණියෝ නො දිරත්වා දිරූවෝ නො බිඳෙත්වා, යන ස්ථිති - ජරා - භෙද යන මෙ තන්හි කිසිවකුගේ වශවර්තිභාවයක් නො වන බැවින් ශූන්‍යයහ. එසේ ශූන්‍ය බැවින්, වශයෙහි නො පවත්නා බැවින්, ඊශ්වරයකු නැති බැවින්, වශයෙහි පවත්වන්නකු නැති බැවින්, ආත්මයක් නැති බැවින් අනාත්මයහ. මෙසේ අවුරුදු සියයෙකින් පිරිසිඳිනා ලද රූපය අනිත්‍ය-දුඃඛ-අනාත්ම යන ත්‍රිලක්ෂණයට නගා බැලීම ආදානනික්ඛෙප විසින් විදර්ශනා කිරීම ය.

**වයොවුද්ධත්ථංගමන** නම්: වයස් වශයෙන් වැඩුනු රූපයාගේ විනාශය බැලීම ය. විදර්ශක තෙමේ අවුරුදු සියයකින් පිරිසිඳෙන වයස්කාලය තෙතිස් - සූතිස් - තෙතිස් යන ගණන් විසින් තුන්

කොටසක් කොට, ප්‍රථම වයස්කාලය සේ ගැණෙන අවුරුදු තෙතිසෙහි පැවැති රූප, මධ්‍යමවයස් කාලය සේ ගැණෙන අවුරුදු සුතිසටත් ඒ මධ්‍යමකාලයෙහි පැවැති රූප, පශ්චිම වයස් කාලය සේ ගැණෙන අවුරුදු තෙතිසටත් නො පැමිණ ඒ ඒ උපන් අවස්ථාවන්හි ම ඉදිරියට නො ගොස් නිරුද්ධ වන බැවින් අනිත්‍ය ය, අනිත්‍ය ය බැවින් දුක් ය, දුක් බැවින් අනාත්ම ය'යි විදර්ශනා කරන්නේ ය.

නැවැත මෙතෙමේ ඒ අවුරුදු සියය **මන්දදශක** – **ක්‍රීඩාදශක** – **වර්ණදශක** – **බලදශක** – **ප්‍රඥාදශක** – **හායනාදශක** – **ප්‍රාග්භාරදශක** – **ප්‍රවඞ්කදශක** – **මොමූහදශක** – **ශයනදශක** යි දශක වශයෙන් බෙදා විදර්ශනා කරන්නේ ය.

මෙසේ බෙදුනු දශකයන් අතුරෙහි **මන්දදශක** නම්: ජීවත්වන්නහුගේ ජීවිතය පිළිබඳ මුල් දස අවුරුද්ද ය. ඒ කාලයෙහි මිනිසා ලදරුවකු සේ හැසිරෙන්නේ ය. **ක්‍රීඩාදශක** නම්: කෙළිසෙල්ලම් කරණ කාලය යි. මේ කාලයෙහි සෙල්ලම් කරන්නේ ය. **වර්ණදශක** නම්: සිරුරුපැහැය පහන් වන කාල ය යි. මේ කාලයෙහි සිරුරු පැහැයෙන් පැහැපත් වන්නේ ය. **බලදශක** නම්: ශරීරශක්තියෙන් වැඩෙන ඔදවැඩි වන කාල ය යි. මේ කාලයෙහි ශරීරශක්තියෙන් නැගී සිටින්නේ ය. **ප්‍රඥාදශක** නම්: නුවණින් වැඩී සිටින කාල ය යි. මේ කාලයෙහි නුවණින් වැඩී සිටින්නේ ය. **හායනාදශක** නම්: සිරුර හා නුවණ පිරිහෙන කාල ය යි. මේ කාලයෙහි ශරීරශක්තියෙන් හා නුවණින් පිරිහෙන්නේ ය. **ප්‍රාග්භාරදශක** නම්: සිරුර ඉදිරියට බරව නැමී සිටිනා කාල ය යි. මේ කාලයෙහි ශරීරය ඉදිරියට නැමී සිටින්නේ ය. **ප්‍රවඞ්කදශක** නම්: සිරුර වක ගැසෙන කාල ය යි. මේ කාලයෙහි ශරීරය නගුල් කොණක් සේ වක ගැසී යන්නේ ය. **මොමූහදශක** නම්: නුවණ පිරිහී සිහි මුළා වන කාල යයි මේ. කාලයෙහි කිසිවක් සිතෙහි නො රැඳෙන්නේ ය. **ශයනදශක** නම්: ඇඳ වැතිර හෝනා කාල ය යි. මේ කාලයෙහි නිතර ඇඳ වැතිර හෝනේ ය.

විදර්ශක තෙමේ ප්‍රථමදශකයෙහි පැවැති රූප, දෙවන දශකයට දෙවන දශකයෙහි පැවැති රූප, තෙවන දශකයට යනාදි ලෙසින් ඒ ඒ දශකයන්හි වූ රූප ඒ ඒ දශකයන්හි ම ඉපද නිරුද්ධ වන මුත් අන් දශකයකට නො යන බැවින් අනිත්‍ය යි ද, අනිත්‍ය බැවින් දුක් යි ද, දුක්බැවින් අනාත්ම යි ද, තිලකුණු විසින් නගා විදර්ශනා කරන්නේ ය.

නැවැත මේ විදර්ශකයා විසින් ඒ අවුරුදු සියය පස්වස බැගින් විසි කොටසකට බෙදා ඒ ඒ කොටස්වලට අයත් රූප, අන් කොටසකට නො පැමිණ ඒ ඒ කොටස්හි ම ඉපද නිරුද්ධ වන බැවින්

අනිත්‍ය-දුඃඛ-අනාත්ම විසින්, නැවත අවුරුදු සියය, සිවු වස බැගින් කොටස් පස් විස්සකට, තුන් වස බැගින් කොටස් තෙතිසකට, දෙ-වස බැගින් කොටස් පණසකට, එක් වස බැගින් කොටස් සියයකට නැවත එක් වසක් ගෙණ වස්සාන-හෙමන්ත-ගිම්හාන විසින් ඍතු තුනකට, වස්සාන - සරද - හෙමන්ත - සිසිර - වසන්ත - ගිම්හ විසින් ඍතු සයකට, මාස විසින් දෙළොසකට, පක්‍ෂ විසින් කාලපක්‍ෂ-ශුක්ලපක්‍ෂ යි දෙ පසකට, එක් දිනයක් ගෙණ රෑදවලැ යි දෙ කොට-සකට, දවල, පූර්වාහ්ණ - මද්ධ්‍යාහ්න - සායාහ්න යි තුන් කොටසකට, රාත්‍රිය, ප්‍රථම - මද්ධ්‍යම පශ්චිම යි තුන් කොටසකට බෙද, ඒ ඒ කොටස්හි උපදනා රූප අන් කොටසකට නො පැමිණ ඒ ඒ කොටස්හි ම ඉපද නිරුද්ධ වන බැවින් අනිත්‍ය-දුඃඛ-අනාත්ම විසින් තිලකුණු මෙනෙහි කළ යුතු ය.

නැවත ඉදිරියට යැමෙහි පැවැති රූපය පෙරළා ඊමට, ඉදිරිය බැලීමෙහි පැවැති රූපය ඔබනොබ බැලීමට, අත් පා හැකිළීමෙහි පැවැති රූපය අත්පා දිග හැරීමට නො පැමිණ ඒ ඒ තන්හි ම නිරුද්ධ වන බැවින් අනිත්‍ය-දුඃඛ-අනාත්ම ය යි මෙනෙහි කළ යුතුය.

උද්ධරණයෙහි පැවැති ධාතූන් හා ඔවුන් නිසා පැවැති රූප යන සියලු ධර්ම, අතිහරණයට නො පැමිණ, අතිහරණයෙහි පැවැති රූප, වීතිහරණයට නො පැමිණ, වීතිහරණයෙහි පැවැති රූප, වොස්සජ්ජනයට නො පැමිණ, වොස්සජ්ජනයෙහි පැවැති රූප, සන්නික්ඛෙපනයට නො පැමිණ, සන්නික්ඛෙපනයෙහි පැවැති රූප සන්නිරුම්භනයට නො පැමිණ ඒ ඒ තන්හි ම ඉපිද නිරුද්ධ වෙති. මෙසේ ඒ ඒ තන්හි උපන් රූපයෝ අන් කොටසකට නො-පැමිණ ඒ ඒ තන්හි ම පුරුක් පුරුක් ව කොටස් කොටස් ව රත් වූ යකබලෙක බහාලූ තල ඇට මෙන් තට තට යන හඬ ඇති ව බිඳෙන්නාහ. එහෙයින් අනිත්‍යයහ, දුඃඛයහ, අනිත්‍යයහ, යි විදර්ශනා වඩන්නහුගේ රූපසම්මර්ශනය සියුම් වේ.

එහි පය භූමියෙන් නැගීම **උද්ධරණ** නම්. පය ඉදිරියට යැවීම **අතිහරණ** නම්. පය එහා මෙහා කිරීම **වීතිහරණ** නම්. පය යටට හෙළීම **වොස්සජ්ජන** නම්. පොළොවෙහි පා තැබීම **සන්නික්ඛෙපන** නම්. පය උදුරණ කල පොළොව සමඟ පෙළීම **සන්නිරුම්භන** නම්. උද්ධරණයෙහි දී පඨවි - ආපො ධාතු දෙක හීන වේ. තෙජෝ - වායු දෙක අධික ව බලවත් වේ. අතිහරණ - වීතිහරණ දෙක්හි ද එසේ ය. වොස්සජ්ජනයෙහි තෙජෝ - වායු දෙක අඩු ව හීන වේ. පඨවි - ආපො ධාතු දෙක අධිකව බලවත් වේ. සන්නික්ඛෙපන - සන්නිරුම්භන දෙක්හි ද එසේ ය.

**ආහාරසමුට්ඨාන නම්**: ආහාරයෙන් හට ගන්නා රූපයෝ ය. ආහාරයෙන් හට ගන්නා රූප ක්ෂුධා සුහිත කාලයන්හි ප්‍රකට ව පෙණෙන්නේ ය. බඩසා ඇති කාලයෙහි උපදනා රූප මලානික වේ. දැගිය කණුවක් මෙන් අඟුරු පැසෙක සැඟවුන කවුඩකු මෙන් දුර්වර්ණ වේ. රළු වේ. ආහාරපානයෙන් බඩ පිරී ගිය කල්හි උපදනා රූප ප්‍රණීත වේ පිණා ගියේ වේ. මොලොක් වේ. මනා පහස් ඇත්තේ වේ. වර්ණවත් වේ. විදර්ශක තෙමේ ඒ මේ රූප එසේ පිරිසිඳ ගෙණ බඩසා කාලයෙහි පැවැති රූප, බඩ පිරී ගිය කාලයට නො පැමිණ ඒ බඩසා කාලයෙහි ම නිරුද්ධ වන්නේ ය. බඩ පිරී ගිය කාලයෙහි පැවැති රූප, බඩසා කාලයට නො පැමිණ ඒ බඩ පිරී ගිය කාලයෙහි ම නිරුද්ධ වේ. එහෙයින් ඒ රූප අනිත්‍ය ය, දුක්ඛ ය, අනාත්ම ය, යි විදර්ශනා කරන්නේ ය.

**උතුසමුට්ඨාන නම්**: සෘතුයෙන් හට ගන්නා රූපයෝ ය. සෘතුයෙන් හට ගන්නා රූප, ශීත උෂ්ණ කාලයන්හි ප්‍රකට වන්නේ ය. උෂ්ණකාලයෙහි උපදනා රූපයෝ මලානිකයහ. දුර්වර්ණයහ. රෞද්‍රයහ. ශීත කාලයෙහි උපදනා රූපයෝ ප්‍රණීතයහ. මෘදුයහ. සුවපහස් ඇත්තාහ. විදර්ශක තෙමේ ඒ මේ රූප, එසේ පිරිසිඳ උෂ්ණකාලයෙහි පැවැති රූප, ශීතකාලයට නො පැමිණ උෂ්ණ කාලයෙහි ම නිරුද්ධ වන්නේ ය. ශීතකාලයෙහි පැවැති රූප, උෂ්ණකාලයට නො පැමිණ ශීතකාලයෙහි ම නිරුද්ධ වන්නේ ය. එහෙයින් ඒ රූප අනිත්‍යය, දුඃඛය, අනාත්මය, යි විදර්ශනා කරන්නේ ය.

**කම්මසමුට්ඨාන නම්**: කර්මයෙන් හට ගන්නා රූපයෝ ය. කර්මයෙන් හට ගන්නා රූප, ද්වාර වශයෙන් ප්‍රකට වන්නේ ය. චක්ඛු ද්වාරයෙහි චක්ඛුදසක – කායදසක – භාවදසක යන කලාප–යන්ගේ වශයෙන් රූප තිසෙක් වේ. ඔවුනට උපකාර වූ සෘතු – චිත්ත – ආහාරයන්ගෙන් හට ගන්නා වූ ශුද්ධාෂ්ටකකලාප තුනෙහි රූප සූවිස්සෙක් වේ. මෙසේ චක්ඛුද්වාරයෙහි රූප සූපණසෙක් ලැබෙන්නේ ය. සොත-ඝාන-ජිහ්වාද්වාරයන්හි ද එසේ සිවූ පණස බැගින් රූපයෝ වන්නාහ. කායද්වාරයෙහි කායදසක – භාවදසක වශයෙන් ද සෘතු – චිත්ත – ආහාරයන්ගෙන් හට ගන්නා වූ ශුද්ධා–ෂ්ටකකලාපයන්ගේ වශයෙන් ද රූපයෝ සිවූ සාළිසෙක් වෙත්. මනොද්වාරයෙහි වත්‍ථුදසක – කායදසක – භාවදසකයන්ගේ වශ–යෙන් හා සෘතු – චිත්ත – ආහාරයන්ගෙන් හට ගන්නා වූ ත්‍රිවිධ ශුද්ධාෂ්ටකකලාපයන්ගේ වශයෙන් ද රූප සිවුපණසෙක් වන්–නේය. මෙහි මනොද්වාර නම්: සාවජ්ජනභවඞ්ගය යි. විදර්ශක තෙමේ ඒ මේ රූප එසේ පිරිසිඳ, චක්ඛුද්වාරයෙහි පැවැති රූප, සොතද්වාරයට නො පැමිණ එහි ම, සොතද්වාරයෙහි පැවැති රූප,

ඝ්‍රාණද්වාරයට නො පැමිණ එහි ම, ඝ්‍රාණද්වාරයෙහි පැවැති රූප, ජිහ්වාද්වාරයට නො පැමිණ එහිම, ජිහ්වාද්වාරයෙහි පැවැති රූප, කායද්වාරයට නො පැමිණ එහි ම, කායද්වාරයෙහි පැවැති රූප, මනොද්වාරයට නො පැමිණ එහි ම නිරුද්ධ වන්නේ ය. එහෙයින් අනිත්‍යයහ, දුඃඛයහ, අනාත්මයහ, යි තිලකුණට නගා විදර්ශනා කරන්නේ ය.

**චිත්තසමුට්ඨාන නාම්**: සිතින් හට ගන්නා රූපයෝ ය. චිත්තයෙන් හට ගන්නා රූප සෞමනස්ස – දෞමනස්ස විසින් ප්‍රකට වන්නේ ය. සොම්නසින් යුක්ත ව සිටුනා වේලෙහි ඔහුගේ සිරුරෙහි මොළොක් වූ සිනිඳු වූ පිණා ගියා වූ පැහැපත් වූ රූපයෝ හට ගණිත්. දොම්නසින් යුක්ත ව සිටුනා වේලෙහි ඔහුගේ සිරුරෙහි මැලවී ගිය රළු වූ නො පැහැපත් වූ රූපයෝ හට ගණිත්. විදර්ශක තෙමේ ඒ මේ රූප එසේ පිරිසිඳ සොම්නස් කල්හි පැවැති රූප දොම්නස් කලට නො පැමිණ එකල්හි ම, දොම්නස් කල්හි පැවැති රූප, සොම්නස් කලට නො පැමිණ එකල්හි ම නිරුද්ධ වන්නාහ. එහෙයින් අනිත්‍යය හ, දුඃඛය හ, අනාත්මය හ, යි තිලකුණට නගා විදර්ශනා කරන්නේ ය.

**ධම්මතා රූප නාම්**: සත්ත්වශරීරයෙන් බැහැරි වූ අනින්ද්‍රියබද්ධ සන්තානයෙහි උපදනා රූපයෝ ය. යකඩ – ලොහ – සුදු ඊයම් – කලු ඊයම් – රන් – රිදී – මුතු – මැණික් ආදි ප්‍රභෙද ඇති හට ගන්නා කප පටන් උපදනා රූප සමූහය යි ඒ. අශොකඅඞ්කුරරූපය ආදියෙහි තුනී රත් පැහැයෙන් යුක්ත ය. දෙතුන් දිනක් ගිය තැන මදක් රතු වේ. එයට අනතුරු ව තරුණ පත් බදු පැහැය ඇතියේ අනතුරු ව මේරූ පත් බඳු පැහැය ඇතියේ, ඉක්බිති කොළ පැහැය ඇතියේ නිල් පැහැය ඇතියේ වේ. එ තැන් පටන් වර්ණාදී වශයෙන් සමාන සවභාව ඇති රූපය, හෙතු ඵල පරම්පරා නො සිඳ පවත්නේ අවුරුද්දකින් පමණ පඬුවන් ව නටුවෙන් ගැලවී බිම හෙන්නේ ය. මෙහි ද විදර්ශක තෙමේ ඒ පිරිසිඳ තුනී රතු පැහැති අවස්ථායෙහි පැවැති රූපය, තද රතු පැහැති අවස්ථාවට නො පැමිණ, තද රතු පැහැති අවස්ථායෙහි පැවති රූපය, මද රතු පැහැති අවස්ථාවට, පඬුවන් අවස්ථායෙහි පැවැති රූපය ගිලිහී වැටෙන අවස්ථාවට නො පැමිණ නිරුද්ධ වන්නෝ ය. එහෙයින් අනිත්‍යය හ, දුඃඛය හ, අනාත්මය හ, යි තිලකුණට නගා විදර්ශනා කරන්නේය. මෙ තෙමේ මෙසේ රූපසප්තක වශයෙන් පළමු කොට තිලකුණට නගා සම්මර්ශනය කරන්නේ ය.

නැවැත, මේ විදර්ශක, **කලාප—යමක—ඛණ—පටිපාටි—දිට්ඨිඋග්ඝාටන—මානසමුග්ඝාටන—නිකන්තිපරියාදාන** යන අරූපසප්තක විසින් විදර්ශනා කරන්නේ ය.

එහි **කලාප** නම්: ඵස්ස-වෙදනා-සඤ්ඤා-චෙතනා-චිත්ත යන ඵස්සපඤ්චකධම්යෝ ය. එහි දී විදශීක, මේ කෙස් අනිත්‍යය, දුක් ය, අනත් ය යි විදශීනා කිරීමෙහි දී උපන් ඵස්සපඤ්චමක නාමධම්, අනික් අනික් කොටසකට නො පැමිණ පුරුක් පුරුක් ව කොටස් කොටස් ව රත් කබලෙක ලූ තල ඇට සේ 'තට තට' යන අනුකරණයෙන් විනාශ වන්නේ ය. එහෙයින් අනිත්‍යය, දුඃඛය, අනාත්මය යි සත්‍යමශීනය කරන්නේ ය. කොටින් මෙහිලා චිත්ත-චෛතසික ධම්, සමූහ වශයෙන් කැටි කොට ගෙණ විදශීනා කිරීම කලාප විසින් කරණ සත්‍යමශීන ය යි දතයුතු ය. චිත්ත-චෛතසික ඉතා සියුම් ය. උන් නුවණින් දැනීම ලෙහෙසි පහසු නො වේ. විදශීනාවට පහසු වන පිණිස ඒ චිත්ත-චෛතසික, සමූහ වශයෙන් ගණිත්.

**යමක** නම්: නාම-රූපධම්යන් යුග්ම යුග්ම වශයෙන් ගැණීම ය. රූපයක් සත්‍යමශීනය කොට ඒ සත්‍යමශීනය කළ සිතත් අනික් සිතකින් සත්‍යමශීනය කිරීම ය. මෙහි දී විදශීක, යට කියූ ආදාන නික්ඛෙප රූපය අනිත්‍යය, දුඃඛය, අනාත්ම ය යි විදශීනා කොට ඒ විදශීනා කළ සිත ද අනික් සිතකින් අනිත්‍යාදී වූ තිලකුණට නගා බලන්නේ ය. එසේ රූපාරූප ධම්, යුගළ යුගළ වශයෙන් ගෙණ විදශීනා වැඩීම යමක වශයෙන් වැඩීම ය යි දතයුතු ය. වයොවුඩ්ඪත් නාමරූප ය, ආහාරසමුට්ඨානරූප ය, ඍතුසමුට්ඨාන රූප ය, කම්මසමුට්ඨානරූප ය, චිත්තසමුට්ඨානරූප ය, ධම්මතා රූප ය, අනිත්‍ය-දුඃඛ-අනාත්ම විසින් විදශීනා කොට ඒ විදශීනා කළ සිත ද අන් සිතකින් විදශීනා කිරීම යමක වශයෙන් යුගළ වශයෙන් සත්‍යමශීනය කිරීම නම්.

**ඛණ** නම්: එක්තරා කාලපරිච්ඡෙදයෙකි. ඒ ක්ෂණ වශයෙන් විදශීනා කිරීම මෙයින් ගැණේ. විදශීක, ආදානනික්ඛෙපරූප ය තිලකුණට නගා විදශීනා කොට ඒ රූප විදශීනා කළ පළමු වන සිත ද අනිත්‍ය ය, දුඃඛ ය, අනාත්ම ය යි විදශීනාවට නගා නැවැත ඒ සිත ද අනිත්‍යාදී වශයෙන් විදශීනා කරන්නේ ය. මෙසේ දෙවන, තුන්වන, සතරවන සිත ද යි සිත් සතරක් විදශීනා කිරීම ක්ෂණික වශයෙන් සත්‍යමශීනය කිරීම නම් වේ. නැවැත පෙර කියූ සේ ධම්මතාරූපය තෙක් ඒ හැම රූප අනිත්‍ය ය, දුඃඛ ය, අනාත්මය යි විදශීනා කොට ඒ පළමු සිත දෙවන සිතින් ද, දෙවන සිත තුන්වන සිතින් ද, තුන්වන සිත සතරවන සිතින්ද සතරවන සිත පස්වන සිතින් ද විදශීනා කරන්නේ ය. මෙසේ රූප පිරිසිඳි සිතෙහි පටන් සතර සතර සිතක් සත්‍යමශීනය කිරීම ක්ෂණික වශයෙන් සත්‍යමශීනය යි දතයුතු ය.

පටිපාටි නම්: පිළිවෙළ ය. රූප කොටසක් විදර්ශනා කළ සිත, දෙවෙනි සිතකින් දැ යි පිළිවෙළින් දසවන සිත දක්වා විදර්ශනා කිරීම මෙයින් කියන ලදි. ආදානනික්ඛෙප වශයෙන් සත්තමර්ශනය කළ රූපය අනිත්‍ය-දුඃඛ-අනාත්ම විසින් වඩා ඒ වැඩූ පළමු සිත, පළමු සිත වැඩූ දෙවන සිත, දෙවන සිත වැඩූ තෙවන සිත, තෙවන සිත වැඩූ සතරවන සිත දැ යි මෙසේ පිළිවෙළින් දසවැනි සිත අනිත්‍යාදිවශයෙන් විදර්ශක තෙමේ එකොළොස්වන සිතින් විදර්ශනා කරන්නේ ය. මෙසේ සෙසු වයොවුද්ධත්ථගාමි රූප ය, ධම්මතාරූපය දැ යි යට කියූ රූපයන්හි විදර්ශනා වඩා ඒ වැඩූ සිත් ද දසවන සිත තෙක් අනිත්‍යාදිවශයෙන් වඩන්නේ ය. මෙසේ විදර්ශනා පිළිවෙළින් මුළු දවස ම වඩන්නට වටනේ ය. දසවන සිත තෙක් විදර්ශනා වැඩීමෙන් රූපකර්මස්ථාන හා අරූප කර්මස්ථාන ද ප්‍රගුණ වන්නේ ය. එහෙයින් දසවන සිත තෙක් සත්තමර්ශනය කළයුතු ය යි කියනලදි. මෙසේ සත්තමර්ශනය කිරීම පිළිවෙළින් සත්තමර්ශනය කිරීම නම් වේ.

සත්කායදෘෂ්ටිය දුරු වන තුරු විදර්ශනා කිරීම **දිට්ඨිඋග්ඝාටන** නම්. මානය දුරු වන තුරු විදර්ශනා කිරීම **මානඋග්ඝාටන** නම්. තෘෂ්ණාව දුරු වන තුරු විදර්ශනා කිරීම **නිකන්තිපරියාදාන** නම්.

යට කියූ රූපසප්තකයෙහි රූපය ද, මේ අරූපසප්තකයෙහි අරූපය ද විදර්ශනාවට නැගූ යොගීහු විසින් නාම-රූපයන්ගෙන් මත්තෙහි සත්ත්වයෙක් නො දක්නා ලදුයේ සත්ත්වසංඥාව උගුළුවා හරිණ ලද්දී වේ. සත්ත්වසංඥාව උගුළුවා හළ සිතින් සංස්කාර පරිග්‍රහය කරන්නහුට ම දෘෂ්ටියෙහි ඉපැත්මෙක් නැත්තේ ය. දෘෂ්ටිය නො ද උපදනී නම් දෘෂ්ටිය උගුළුවන ලද්දී ය. දෘෂ්ටිය උගුළුවා හළ සිතින් සංස්කාරයන් සත්තමර්ශනය කරන්නහුට මානය නො උපදනේ ය. එකල්හි මානය ඉගිළී ගියේ වේ. මානය උගුළුවා හළ සිතින් සංස්කාරයන් පරිග්‍රහ කරන්නහුට තෘෂ්ණාව නො උපදී. එකල්හි නිකාන්තිය ක්‍ෂය වූවා වේ.

තවද "සංස්කාරයෝ ම සංස්කාර විදර්ශනා කෙරෙති" යි මෙසේ අනිත්‍යාදීන්ගේ වශයෙන් සත්තමර්ශනය-කරන්නහුගේ ආත්මදෘෂ්ටිය, "සංස්කාරයෝ ම සංස්කාර විදර්ශනා කෙරෙති" යි සත්තමර්ශනය කරන්නහුගේ මානය, "සංස්කාරයෝ ම සංස්කාර විදර්ශනා කෙරෙති" යි ගන්නහුගේ සියම් වූ තෘෂ්ණාව යන දෘෂ්ටි-මාන-තෘෂ්ණාවෝ උද්ඝාටනය වන්නාහ.

තවද සංස්කාර තමා වශයෙහි නො පවත්නා බැවින් අනාත්ම ය, ඇති ව නැති වන අරුතින් අනිත්‍ය ය, ඉපදීම් - නැසීම් දෙකින් පෙළෙන බැවින් දුඃඛ ය යි දක්නහුගේ දෘෂ්ටිය, සංස්කාර ඇති ව නැති වන බැවින් අනිත්‍ය ය, ඉපදීම් - නැසීම් දෙකින් පෙළෙන බැවින් දුඃඛ ය, තමා වශයෙහි නො පවත්නා බැවින් අනාත්ම ය යි දක්නහුගේ මානය, සංස්කාර ඉපදීම් - නැසීම් දෙකින් පෙළෙන බැවින් දුඃඛ ය, ඇති ව නැති වන බැවින් අනිත්‍ය ය, තමා වශයෙහි නො පවත්නා බැවින් අනාත්ම ය යි දක්නහුගේ ආත්මදෘෂ්ටිය යන මොවුහු උද්ඝාතනය වෙත්. මෙසේ සංස්කාර අනාත්ම වශයෙන් දක්නහුගේ ආත්මදෘෂ්ටිය, අනිත්‍ය වශයෙන් දක්නහුගේ මානය, දුඃඛ වශයෙන් දක්නහුගේ තෘෂ්ණාව ඉගිළී යැමෙන් රූපකර්මස්ථානයත් අරූපකර්මස්ථානයත් දෙක ප්‍රගුණ වන්නේ ය.

යට කියූ සේ පිළිවෙළින් විදර්ශනා වඩන විදර්ශකයාගේ අනාත්මානුපස්සනාව තියුණු වූ කල්හි අනිච්චානුපස්සනා-දුක්ඛානුපස්සනා දෙකත් එයට අනුව පවතී නම් එකල්හි ඔහුගේ දෘෂ්ටිය ඉගිළී යන්නී ය. සියලු දෘෂ්ටීහු පවත්නෝ ආත්මදෘෂ්ටිය මුල් කොට ගෙණ ය. අනාත්මානුපස්සනාව ආත්මදෘෂ්ටියට සෘජු ව ප්‍රතිපක්ෂ ව සිටුනී ය. අනිච්චානුපස්සනාව තියුණු ව ගිය කල්හි ඉතිරි අනුපස්සනා දෙක එයට අනුව පවත්නේ ය. එකල්හි මානය ඉගිළී යන්නේ ය. අනිච්චානුපස්සනාව නිත්‍ය යි ගැණීමට සෘජු ව විරුද්ධ වන්නී ය. දුක්ඛානුපස්සනාව තියුණු වූ කල්හි ඉතිරි අනුපස්සනා දෙක එයට අනු ව පවත්නේ ය. එකල්හි නිකන්තිය දුරු වන්නී ය. දුක්ඛානුපස්සනාව නිකන්තියට ප්‍රතිපක්ෂ ය. මෙසේ තෙ වැදෑරුම් වූ අනුපස්සනාවන්ගේ සෘත්‍ය විශෙෂයෙන් දෘෂ්ටි-මාන-නිකන්තීන්ගේ උද්ඝාතයෙන් රූප කර්මස්ථාන-අරූප කර්මස්ථාන පුහුණු වූවෝ වෙත්. මෙසේ පුහුණු ව ලත් විදර්ශක තෙමේ අනිච්චානුපස්සනාදී වූ අටළොස් මහා විදර්ශනාවෙන් එක දෙශයක් ප්‍රතිවෙධ කිරීමෙන් ඔවුනට පටහැනි ව සිටි නිත්‍යසංඥාදිය ද මැඩ ලන්නේ ය.

එහි **අනිච්චානුපස්සනායෙන්** නිත්‍යසංඥාව, **දුක්ඛානුපස්සනායෙන්** සුඛසංඥාව, **අනත්තානුපස්සනායෙන්** ආත්මසංඥාව, **නිබ්බිදානුපස්සනායෙන්** සප්‍රීතික තෘෂ්ණාව, **විරාගානුපස්සනායෙන්** රාගය, **නිරොධානුපස්සනායෙන්** සමුදය, **පටිනිස්සග්ගානුපස්සනායෙන්** භවතෘෂ්ණාව, **ඛයානුපස්සනායෙන්** ඝනසංඥාව, **වයානුපස්සනාවෙන්** සංස්කාරයන්ගේ රැස්කිරීම, **විපරිණාමානුපස්සනායෙන්** ධ්‍රුවසංඥාව, **අනිමිත්තානුපස්සනායෙන්** නිත්‍යනිමිත්ත,

**අප්පණිහිතානුපස්සනායෙන්** ප්‍රණිධිය, **සුඤ්ඤතානුපස්සනා**යෙන් ආත්මවශයෙන් අභිනිවෙශ ය, **අධිපඤ්ඤාධම්මවිපස්සනා**යෙන් තෘෂ්ණා – දෘෂ්ටි විසින් දැඩිව ගැණීම, **යථාභූතඤාණදස්සන**යෙන් සම්මොහාභිනිවෙස ය, **ආදීනවානුපස්සනායෙන්** ආලය වශයෙන් දැඩිව ගැණීම, **පටිසඞ්ඛානුපස්සනායෙන්** අවිද්‍යාව, **විවට්ටානුපස්සනායෙන්** කාමසංයොගාදී කෙලශ ප්‍රවෘත්තිය දුරු කරන්නේ ය.

මෙසේ සම්මර්ශනඥානයාගේ පරතෙරට පත් වූ කල්හි කෙලෙස් පහ ව යෑමෙන් ඥානයාගේ පාරිශුද්ධිය වන බැවින් විදර්ශක තෙමේ අනිත්‍යානුදර්ශනාදියට පටහැනි වූ නිත්‍යසංඥාදිය පහ කිරීමෙන් පිරිසිදු නුවණ ඇති ව සංස්කාරයන් පිළිබඳ ත්‍රි ලක්ෂණය මෙනෙහි කිරීමෙන් නයවිදර්ශනා නම් වූ කලාපසම්මර්ශන ඥානයට අනතුරු ව උදයව්‍යයානුදර්ශනඥානය ලැබීම පිණිස යොග කරන්නේ ය.

මෙ තෙමේ 'මේ නාම-රූප' උත්පත්තියෙන් පෙර නූපන් නාම රූපයන්ගේ එක් තැනෙක රැස්වීමෙක් නැත්තේ ය, උපදින්නා වූ නාමරූපයන්ගේ එක් තැන්ව සිට ඒමෙක් ද නැත්තේ ය, නිරුද්ධ වන්නා වූ නාමරූපයන්ගේ දිශානුදිශාවන්ට යෑමෙක් හෝ නැත්තේ ය, නිරුද්ධ වූ නාමරූපයන්ගේ එක් තැනෙක පිහිටා සිටීමෙක් නැත්තේ ය, වීණාව වයන කල්හි උපදනා ශබ්දය ඉපදීමට පෙර එක් තැනෙක රැස් ව සිටියේ නො වේ, උපදනේ ද එක් ව සිට උපදනේ ද නො වේ, නැසී යනුයේ ද දිශාවිදිශාවන්ට යන්නේ ද නො වේ, නැසී ගියේ ද කිසි තැනක පිඩු වන්නේ ද නො වේ, එහෙත් වීණාව-උපවීණාව පුරුෂයාගේ එයට සුදුසු ව්‍යායාමය යන මෙතුන නිසා පෙර නො වූ ශබ්දයෙක් හට ගන්නේ ය, එසේ සියලු රූපාරූපධර්මයෝ පෙර නො වූවෝ ම ඇති වෙති, ඇති වූවෝ නැති වෙත්' යි මෙසේ පළමු කොට ස්කන්ධයන්ගේ උදය-ව්‍යය දෙක සැකෙවින් මෙනෙහි කරන්නේ ය. එහි උදය නම්: හට ගැණීම ය. ව්‍යය නම්: නැසීම ය. එදෙක අනු ව බැලීමෙහි නුවණ, 'උදයබ්බයානුපස්සනාඤාණ' නම් වේ. **"නිබ්බත්තිලක්ඛණං උදයො, විපරිණාමලක්ඛණං වයො, අනුපස්සනා ඤාණං"** යනු එහිලා දත්තේ ය.

නැවැත මෙතෙමේ, 'අවිද්‍යාවගේ ඉපැත්මෙන්, තෘෂ්ණාවගේ ඉපැත්මෙන්, **කර්මයාගේ** හට ගැන්මෙන්, ආහාරයාගේ හට ගැන්මෙන්, රූපයන්ගේ හට ගැන්ම වේ ය, යි මෙසේ හට ගැණීම් අරුත් විසින් රූපස්කන්ධයාගේ හට ගැණීම දක්නේ ය. පෙර නො වූ රූප අළුතින් ම උපදනා බව (නිබ්බත්තිලක්ඛණය) ක්ෂණ

වශයෙන් දක්නේ රූපස්කන්ධයාගේ ඉපැත්ම බලන්නේ ය. අවිද්‍යා - තෘෂ්ණා - කර්ම - ආහාර යන ප්‍රත්‍යය හෙතුයෙන් රූපයන්ගේ හට ගැණීම වේ ය, යි ප්‍රත්‍යය වශයෙන් සිවු අයුරකින් හා මේ රූපයෝ පෙර නො වූවෝ උපදනාහ, යනාදී නිබ්බත්තිලක්ඛණ විසින් එක් අයුරකින් දූ යි පස් අයුරකින් රූපස්කන්ධයාගේ හට ගැණීම දක්නේ ය.

අනතුරු ව මෙතෙමේ, අවිද්‍යාවගේ නිරොධයෙන්, තෘෂ්ණාවගේ නිරොධයෙන්, කර්මයාගේ නිරොධයෙන්, කබලීකාහාරයාගේ නිරොධයෙන් අනාගතරූප නිරොධය වේ ය, යි මෙසේ හෙතු නිරොධයාගේ වශයෙන් බැලීමෙන් සිවු අයුරකින් හා විපරිණාමලක්ඛණය ක්ෂණවශයෙන් නැසී යෑම බැලීමෙන් එක් අයුරකින් දූ යි පස් අයුරකින් රූපස්කන්ධයාගේ බිඳී යෑම බලන්නේ ය. මෙසේ පස් අයුරකින් රූපයාගේ හට ගැණීම හා පස් අයුරකින් නැසී යෑම දූ යි දස අයුරකින් රූපස්කන්ධයාගේ උදය-ව්‍යය බලන්නේ ය.

අවිද්‍යාසමුදයෙන්, තෘෂ්ණාසමුදයෙන්, කර්මසමුදයෙන්, වෙදනා සමුදය වේ ය, යි ප්‍රත්‍යය වශයෙන් බැලීමෙන් සිවු අයුරකින් හා මේ වෙදනාවෝ පෙර නො වූවෝ උපදනාහ, යනාදී විසින් නිබ්බත්ති ලක්ඛණය බැලීමෙන් එක් අයුරකින් දූ යි පස් අයුරකින් වෙදනා ස්කන්ධයාගේ හට ගැණීම බලන්නේ ය.

අවිද්‍යානිරොධයෙන්, තෘෂ්ණානිරොධයෙන්, කර්මනිරොධයෙන්, ස්පර්ශනිරොධයෙන් වෙදනානිරොධය වේ ය, යි ප්‍රත්‍යයනිරොධයාගේ වශයෙන් බැලීමෙන් සිවු අයුරකින් ද, විපරිණාමලක්ඛණය ක්ෂණ වශයෙන් නැසී යෑම බැලීමෙන් එක් අයුරකින් දූ යි පස් අයුරකින් වෙදනාස්කන්ධයාගේ නැසී යෑම බලන්නේය. මෙසේ පස් අයුරකින් වෙදනාවගේ හටගැණීම හා පස් අයුරකින් නැසී යෑම දූ යි දස අයුරකින් වෙදනාස්කන්ධයාගේ උදයව්‍යය බලන්නේ ය. අවිද්‍යා - තෘෂ්ණා - කර්ම - ස්පර්ශසමුදයයෙන් සංඥාසමුදය වේ ය යි ප්‍රත්‍යය වශයෙන් බැලීමෙන් සිවු අයුරකින් හා, 'මේ සංඥාවෝ පෙර නො වූවෝ උපදනාහ, යනාදී නිබ්බත්තිලක්ඛණය බැලීමෙන් එක් අයුරකින් දූයි පස් අයුරකින් සංඥාස්කන්ධයාගේ සමුදය බලන්නේය.

අවිද්‍යා - තෘෂ්ණා - කර්ම - ස්පර්ශනිරොධයෙන් සංඥානිරොධය වේ ය යි ප්‍රත්‍යයනිරොධයාගේ වශයෙන් බැලීමෙන් සිවු අයුරකින් හා, විපරිණාමලක්ඛණය බැලීමෙන් එක් අයුරකින් දූ යි පස් අයුරකින් සංඥාස්කන්ධයාගේ නිරොධය බලන්නේ ය. මෙසේ පස් අයුරකින් සංඥාවගේ සමුදය හා පස් අයුරකින් නිරොධය දූ යි දස අයුරකින් සංඥාස්කන්ධයාගේ උදය-ව්‍යය බලන්නේ ය.

අවිද්‍යා – තෘෂ්ණා – කර්ම – ස්පර්ශසමුදයයෙන් සංස්කාරසමුදය වේ ය යි ප්‍රත්‍යය බැලීමෙන් සිවු අයුරකින් හා, ‘මේ සංස්කාරයෝ පෙර නො වූවෝ උපදනාහ, යනාදී නිර්වෘත්තිලක්ෂණය බැලීමෙන් එක් අයුරකින් දැ’යි පස් අයුරකින් සංස්කාරස්කන්ධයාගේ සමුදය බලන්නේ ය.

අවිද්‍යා – තෘෂ්ණා – කර්ම – ස්පර්ශ නිරොධයෙන් සංස්කාර නිරොධය වේ ය’යි ප්‍රත්‍යයනිරොධයාගේ වශයෙන් බැලීමෙන් සිවු අයුරකින් හා, විපරිණාමලක්ෂණය බැලීමෙන් එක් අයුරකින් දැ’යි පස් අයුරකින් සංස්කාරස්කන්ධයාගේ නිරොධය බලන්නේ ය. මෙසේ පස් අයුරකින් සංස්කාරයන්ගේ සමුදය හා පස් අයුරකින් නිරොධය දැ’යි දස අයුරකින් සංස්කාරස්කන්ධයාගේ උදය-ව්‍යය බලන්නේ ය.

අවිද්‍යා – තෘෂ්ණා – කර්ම – නාමරූප සමුදයයෙන් විඥාන සමුදය වේ ය’යි සමුදය බැලීමෙන් සිවු අයුරකින් හා, ‘මේ විඥානයෝ පෙර නො වූවෝ උපදනාහ, යනාදී නිර්වෘත්තිලක්ෂණය බැලීමෙන් එක් අයුරකින් දැ’යි පස් අයුරකින් විඥානස්කන්ධයාගේ සමුදය බලන්නේ ය.

අවිද්‍යා-තෘෂ්ණා-කර්ම-නාමරූප නිරොධයෙන් විඥානනිරොධය වේ ය’යි ප්‍රත්‍යය නිරොධය බැලීමෙන් සිවු අයුරකින් හා, විපරිණාමලක්ෂණය බැලීමෙන් එක් අයුරකින් දැ’යි පස් අයුරකින් විඥාන ස්කන්ධයාගේ නිරොධය බලන්නේ ය. මෙසේ පස් අයුරකින් විඥානයන්ගේ සමුදය හා පස් අයුරකින් නිරොධය දැ’යි දස අයුරකින් විඥානස්කන්ධයාගේ උදය ව්‍යය බලන්නේ ය.

මෙසේ විදර්ශක තෙමේ එක් එක් ස්කන්ධයෙක්හි උදය වශයෙන් පසෙක, ව්‍යය වශයෙන් පසෙකැයි දසය දසය බැගින් ස්කන්ධ පස සම පණස් අයුරකින් දක්නේ ය.

මෙසේ දක්නා වූ විදර්ශකයාගේ නුවණ මේ ධර්මයෝ පෙර නො වූවෝ හට ගණිති, හට ගත්තෝ නැසෙති’යි අතිශයින් විශද වන්නේ ය. අවිද්‍යාදී වූ ප්‍රත්‍යයයන්ගේ වශයෙන් ද උත්පාදදී වූ ක්ෂණමාත්‍ර වශයෙන් ද උදය-ව්‍යය බලන්නා වූ ඔහුට දුඃඛාදිසත්‍යභෙදය අනුලොමාදිප්‍රතීත්‍යසමුත්පාදභෙදය, ඒකත්වාදිනයභෙදය, අනිත්‍යාදි ලක්ෂණභෙදය යන මෙ හැම භෙදයෝ ප්‍රකට ව පෙණෙත්. යම් නුවණකින්, අවිද්‍යාදීන්ගේ හට ගැණීමෙන් ස්කන්ධයන්ගේ හට ගැණීම වේ, අවිද්‍යාදීන්ගේ නැසීමෙන් ස්කන්ධයන්ගේ නැසීම වේ’යි දක්නේ නම්, ඒ දැකීම ප්‍රත්‍යය වශයෙන් උදය – ව්‍යය දැකීම ය යි ද, යම් නුවණකින්, ඇතිවීම හා නැතිවීම දකී නම්, ඒ දැකීම ක්ෂණවශයෙන් උදය - ව්‍යය දැකීම ය යි ද දතයුතු ය. උත්පත්තික්ෂණයෙහි නිර්වෘත්ති ලක්ෂණය වේ. භඞ්ගක්ෂණයෙහි විපරිණාමලක්ෂණය වේ.

අවිද්‍යාදී වූ ප්‍රත්‍යයයන්ගේ වශයෙන් රූපාදීන් උපදිනු දැකීමෙහිදී රූපාදීන් උපදවනුවෝ අවිද්‍යාදීහු ය'යි ප්‍රකට වන්නේ ය. මේ වනාහි දුඃඛාදිසත්‍යයන්ගේ වැටහීම ය. රූපාදීන්ගේ උදය, ක්‍ෂණ වශයෙන් දැකීමෙන් ජාතිදුක්ඛය ප්‍රකට වන බැවින් දුඃඛසත්‍යය ප්‍රකට වන්නේ ය. අවිද්‍යාදීන්ගේ නිරොධයෙන් රූපාදීන් නිරුද්ධවනු දැකීමෙන් නිරොධසත්‍යය ප්‍රකට වන්නේ ය. ක්‍ෂණයකින් ඉපිද නැසෙනබව දැකීමෙන් දුඃඛසත්‍යය ප්‍රකට වන්නේ ය. උදය – ව්‍යය දැකීමෙන් මේ ලෞකික මාර්ග ය'යි මාර්ගසත්‍යය පැහැදිලි වන්නේ ය.

'අවිද්‍යාදිය ඇති කල්හි සංස්කාරාදීහු වෙති'යි යන මේ ආදීන් දැකීමෙන් අනුලොමප්‍රතීත්‍යසමුත්පාදය හා අවිද්‍යාදිය නැසීමෙන් රූපාදීන්ගේ අනුත්පාදය වේ ය'යි දැකීමෙන් ප්‍රතිලොමප්‍රතීත්‍යසමුත්පාදය ද හෙළි වන්නේ ය. ජරා – මරණ දැකීමෙන් හා ක්‍ෂණවශයෙන් උදය – ව්‍යය දැකීමෙන් ප්‍රතීත්‍යසමුත්පන්නධර්ම වැටහී යන්නේ ය. උදය – ව්‍යය දෙකින් යුක්තවූවෝ ප්‍රතීත්‍යසමුත්පන්නයෝ ය. සඞ්ඛතයෝ ය.

එසේ ම මේ විදර්ශකයාහට **එකත්වනය – නානාත්වනය – අව්‍යාපාරනය – ධර්මතානය** යන නයක්‍රමද වැටහෙන්නේ ය. එහි සන්තතිපරම්පරාව අතර නො කැඩී පැවැත්මත්, හෙතූන්ගේ හා, හෙතූන්ගෙන් හට ගන්නවුන්ගේ එක් සන්තතියක් ව පැවැත්මත් එකත්වනය නම්. හෙතු - ඵල දෙක එකක් ම නො වනබව හා ඔවුන්ගේ ලක්‍ෂණ එකක් අනෙකට වෙනස්බව නානාත්වනය නම්. මෙය දක්නේ නාම-රූප බිඳි බිඳී අළුත් අළුත් නාම – රූප ඇතිවනු දක්නේ ය. කිසිවකුගේ උත්සාහයක් කර්තෘත්වයක් නැති ව හෙතුඵල පරම්පරාවගේ පැවැත්ම අව්‍යාපාරනය නම්. කිරෙන් දිහි ඇතිවන්නා සේ ප්‍රත්‍යයයට අනුරූප ව ඵලය උපදනාබව ධර්මතානය නම්. එකත්වනයෙන් උච්ඡෙදදෘෂ්ටිය, නානාත්වනයෙන් ශාස්වතදෘෂ්ටිය, අව්‍යාපාරනයෙන් ආත්මදෘෂ්ටිය, ධර්මතානයෙන් අක්‍රියදෘෂ්ටිය යන මොවුහු දුර ගසා යන්නාහු ය.

ක්‍ෂණවශයෙන් උදය – ව්‍යය දැකීමෙන් අනිත්‍යලක්‍ෂණය ද, එදෙකින් පෙළෙනබව දැකීමෙන් දුඃඛලක්‍ෂණය ද, ප්‍රත්‍යයහෙතුවෙන් ඉපැත්ම දැකීමෙන් අනාත්මලක්‍ෂණය ද අවබොධ කිරීම ලක්‍ෂණාවබොධ නම් වේ.

මෙසේ සත්‍ය - ප්‍රතීත්‍යසමුත්පාද-නය-අනිත්‍යාදිලක්‍ෂණ ප්‍රකට ලෙසින් වැටහුනු කල්හි ඔහුට 'පෙර නූපන් විරූ මේ ධර්මයෝ උපදනාහ, උපන් නාමරූපධර්මයෝ නිරුද්ධ වන්නාහ, නිතර අළුත් වූම

සංස්කාරයෝ වෙති'යි වැටහෙන්නේ ය. ඉර උදුනි පිනිබිඳු සේ පොකුණෙක නැගි නැගී උඩට එන දිය බුබුලු සේ දියෙහි ඇඳි ඉරක් සේ ඉදිඅග හෙලූ අබැටක් සේ විදුලිය නැගීමක් සේ ඉතා මදකලක් සිටින්නෝ ව ද මායාවක් මිරිඟුවක් ගිනිපෙණෙලිසකක් ගන්ධර්වනගරයක් පෙනපිඩක් කෙසෙල්කඳක් යන මේ ආදීන් මෙන් අසාරලෙසින් නිස්සාරලෙසින් සංස්කාරයෝ වැටහෙන්නාහ.

මෙතෙකින් මේ විදර්ශක තෙමේ උදයව්‍යයානුදර්ශනඥනය හෙවත් තරුණවිදර්ශනාඥනය ලැබුයේ වේ. එහෙයින් මෙතෙමේ **ආරබ්ධවිදර්ශක** නමින් හැඳින් වේ.

මෙසේ තරුණවිදර්ශනාඥනය ලත් ඔහුට ඉදිරියෙහි **ඕභාස – ඤාණ – පීති – පස්සද්ධි – සුඛ – අධිමොක්ඛ – පග්ගහ – උපට්ඨාන – උපෙක්ඛා – නිකන්ති** – යන විදර්ශනොපක්ලෙශ දශයෙක් පහළ වන්නේ ය.

එහි **ඕභාස** නම්: විදර්ශනාචිත්තයෙන් උපන් ආලොක ය යි. එය උපන් කල්හි ඇතැම් විදර්ශකයෙක් "මට මෙයට පෙර මෙබඳු ආලොකයෙක් නූපන්නේ ය, ඒකාන්තයෙන් මම මාර්ගයට පැමිණි-යෙම් වෙමි, ඵලයට පැමිණියෙම් වෙමි"යි අමාර්ගය ම මාර්ග ය යි ද, අඵලය ම ඵල ය යි ද ගන්නේ ය.

**ඤාණ** නම්: නාමරූපධර්මයන් තීරණය කරන්නා වූ පමණ කරන්නා වූ විදර්ශකයාහට, හරණලද විදුරවිය මෙන් නො පැකිළෙන වෙග ඇති ව තියුණු ව ඉතා විශද ව පහළ වන විදර්ශනාඥන ය යි.

**පීති** නම්: විදර්ශනාප්‍රීති ය යි. එය ඛුද්දිකාදී විසින් පස්වැදෑරුම් ය. මේ පස්වැදෑරුම් ප්‍රීතිය විදර්ශකයාගේ මුළු සිරුර පුරාලමින් සිටුනී ය.

**පස්සද්ධි** නම්: විදර්ශනාචිත්තයෙන් උපන් කය–සිත දෙක්හි සන්සිඳීම ය. එය උපන් කල්හි විදර්ශකයාගේ කය – සිත දෙක, උඩගුබව සන්සිඳී යෑමෙන් සන්සිඳුනේ වේ. ථිනමිද්ධය දුරුවීමෙන් සැහැල්ලු වේ. මානදිට්ඨි සන්සිඳීමෙන් මොලොක් වේ. සෙසු නීවරණ සන්සිඳීමෙන් කර්මයට යොග්‍ය වේ. අශ්‍රද්ධාදිය දුරුවීමෙන් නො ගිලන් වේ. මායාසාඨෙය්‍ය සන්සිඳීමෙන් ඍජු වේ. මේ පස්සද්ධි ආදියෙන් අනුගෘහිත වූ කය සිත ඇති විදර්ශක තෙමේ මිනිස්බව ඉක්මවා සිටි විදර්ශනාප්‍රීතිසුඛය වළඳන්නේ ය.

**සුඛ** නම්: විදර්ශනාචිත්තයෙහි උපන් සැප ය යි. එය උපන් කල්හි විදර්ශකයාහට මුළු සිරුර තෙමී ගියාක් මෙන් ඉතා ප්‍රණීත වූ කිසිදු කත් නො වූ විරූ සුඛයෙක් උපදනේ ය.

**අධිමොක්ඛ** නම්: විදර්ශනාචිත්තය හා එක් ව යෙදී ගත් බලවත් ශ්‍රද්ධා ය. එකල්හි විදර්ශකයාගේ චිත්තචෛතසිකධර්ම අතිශය ප්‍රසන්නභාවයට පැමිණෙන්නේ ය.

**පග්ගහ** නම්: විදර්ශනාචිත්තයෙහි වූ බලවත් වීර්‍ය්‍ය ය යි. එකල්හි විදර්ශකයාහට විදර්ශනාචිත්තය හා යෙදුනු ලිහිල් නො වූ ඉතා දැඩි ද නො වූ මනා කොට ගන්නා ලද වීර්‍ය්‍යයෙක් උපදනේ ය.

**උපට්ඨාන** නම්: විදර්ශනාචිත්තය අරමුණෙහි මොනවට එළැඹ සිටීම ය. විදර්ශනාචිත්තය හා යෙදුනු මනා ව එළැඹ සිටි මනා ව පිහිටුවන ලද සිහි ය යි. විදර්ශක තෙමේ යමක් යමක් මෙනෙහි කෙරේ නම්, ඔහුට ඒ ඒ නාමරූපාදිධර්ම විනිවිද ගොස් දිවැස් ඇත්තහුට පරලොව සේ සිහියට නඟින්නේ ය.

**උපෙක්ඛා** නම්: විදර්ශනෝපෙක්‍ෂා ආවර්ජනෝපෙක්‍ෂා ය. නාම–රූපධර්මයන් උදය-ව්‍යය වශයෙන් මනා ව පරීක්‍ෂා කිරීමෙන් ඒ පිළිබඳ මධ්‍යස්ථභාවයෙන් පැවැති උපෙක්‍ෂාව විදර්ශනෝපෙක්‍ෂා නම්.

**නිකන්ති** නම්: විදර්ශනාචිත්තය හා යෙදුනු සියුම් වූ තෘෂ්ණා ය.

මෙ කියූ ඕභාසාදීන් අතුරෙහි යම් එකක් උපන් කල්හි විදර්ශක තෙමේ 'මෙයට පෙර මට මෙබඳු ආලොකාදියක් නූපන් විරී ය, ඒකාන්තයෙන් මම මාර්ගයට, ඵලයට පැමිණියෙම්'යි නො මගට වැටෙන්නේ ය. එකල්හි ඔහුගේ විදර්ශනාව නො මග ගියා වේ. හේ මුල් කමටහන හැරදමා ආලොකාදිය ම ආස්වාදනය කරමින් හිඳින්නේ ය.

මෙ ඕභාසාදීන්හි එකෙක් එකෙක් ම තෘෂ්ණා-මාන-දිට්ඨි ගාහ වශයෙන් දසය දසය බැගින් බෙදුනේ සමතිසෙක් වේ. ආලොකය ආස්වාදනය කිරීම් වශයෙන් තෘෂ්ණාව ද 'මට මනා ආලොකයෙක් උපනැ'යි ගැණීමෙන් මානය හා දෘෂ්ටිය ද උපදී. මෙසේ ආලොක–යෙහි තෘෂ්ණා – මාන – දෘෂ්ටි වශයෙන් ගැණීම් තුනෙකි. සෙසු තන්හි ද මෙසේ ය. මේ උපක්ලේශයන් එකක් එකක් ම 'මේ මාගේ ය'යි, 'මේ මම වෙමි'යි ද, 'මේ මාගේ ආත්ම ය'යි ද තෘෂ්ණා–මාන – දෘෂ්ටි වශයෙන් ගන්නා අදක්‍ෂ වූ විදර්ශක තෙමේ මේ හැම තැන්හි සැලෙන්නේ ය.

දක්‍ෂ වූ විදර්ශක තෙමේ ආලොකාදිය උපන් කල්හි "මට උපන් මේ ආලොකය අනිත්‍ය ය, සඞ්ඛත ය, පටිච්චසමුප්පන්න ය, ක්‍ෂය වන සුලු ය, ව්‍යය වන සුලු ය, නැසෙන සුලු ය, නිරුද්ධ

වන සුලු ය''යි පරීක්ෂා කොට ගන්නේ ය. එසේ ම මෙ තෙමේ 'මේ ආලෝකය ආත්ම වේ නම් ආත්ම ය යි ගන්නට වටනේ ය, එහෙත් අනාත්ම වූ ම මේ ආලෝක ය තමා වශයෙහි නො පවත්නා බැවින් අනාත්ම ය, ඇතිව නැති වන බැවින් අනිත්‍ය ය, උදය-ව්‍යය දෙකින් පෙළෙන බැවින් දුඃඛ ය, ඥාන ප්‍රීති ආදීහු ද මාගේ නො වෙත්, මම ද නො වෙමි, මාගේ ආත්මය ද නො වෙත්''යි බලන්නේ ය. එතැන්හි ද හේ නො ද සැලෙන්නේ ය. මේ කිසිත් තැනෙක වික්ෂෙපයට නො ගිය විදර්ශකයාගේ උප-ක්ලේශයන්ගෙන් මිදුනු විදර්ශනාවීථියට පිළිපන් විදර්ශනාඥානය ම මග නො මග දැන ගන්නේ ය. මෙසේ විදර්ශකයාගේ 'මේ මග ය, මේ නො මග ය'යි මාර්ග - අමාර්ග දැන සිටි නුවණ, මග්ගාමග්ගඤාණ දස්සනවිසුද්ධි නැමැ යි දත යුතු ය.

මෙතෙකින් මොහු විසින් දිට්ඨිවිසුද්ධියෙහිලා දුඃඛසත්‍යය ද, කඞ්ඛාවිතරණවිසුද්ධියෙහිලා සමුදයසත්‍යය ද, මග්ගාමග්ගඤාණ-දස්සනවිසුද්ධියෙහිලා මාර්ගසත්‍යය ද ව්‍යවස්ථාකරණලද ය. (විසුද්ධි මග්ගපටිසම්භිදාමග්ග බැලිය යුතුය.)

උදයබ්බයානුදස්සනඤාණය පටන් සඞ්ඛාරුපෙක්ඛාඤාණය තෙක් පැවැති අටවැදෑරුම් ඤාණයන්ගේ වශයෙන් විදර්ශනා වාරයාගේ මුදුනට පැමිණි ඒ සඞ්ඛාරුපෙක්ඛාඤාණය මුදුන් පැමිණි විදර්ශනා ය. ඒ හා නවවන සච්චානුලොමිකඤාණය ද යන මේ නවය **'පටිපදාඤාණදස්සනවිසුද්ධි'** නම් වේ. මේ මෙය පොතෙහි ආ සැටි: **"අට්ඨන්නං පන ඤාණානං වසෙන සිඛාප්පත්තා හි විපස්සනා නවමං ච සච්චානුලොමිකඤාණන්ති අයං පටිපදා ඤාණදස්සනවිසුද්ධි නාම"**යි.

**උදයබ්බයානුපස්සනාඤාණ - භඞ්ගානුපස්සනාඤාණ-භයතුපට්ඨානඤාණ-ආදීනවානුපස්සනාඤාණ-නිබ්බිදානුපස්සනාඤාණ -මුඤ්චිතුකම්‍යතාඤාණ - පටිසඞ්ඛානුපස්සනාඤාණ - සඞ්ඛාරුපෙක්ඛාඤාණ - සච්චානුලොමිකඤාණ** යන මේ නවය, පටිපදා ඤාණදස්සන විසුද්ධියෙහිලා ගන්නේ ය. නවලෝකොත්තරමාර්ග ඥානයට පැමිණීමෙහි ප්‍රතිපදාවන බැවින් මේ නවවිධඥානය ප්‍රතිපදා යි ගණු ලැබේ. මේ වනාහි අනුන් කියනු ඇසීමෙන් හෝ අනුමානයෙන් හෝ උපදනා දුර්වලඥානයෙක් නො වේ. ඒ ඒ ධර්ම පිළිබඳ යථාතත්ත්වය ඇසින් දක්නා සේ නුවණින් දක්නා බැවින් මෙ නුවණ ඥාන දර්ශන නම් වී ය. ඒ විශුද්ධි නම් වූයේ ක්ලේශමලයෙන් ඈත් ව පිරිසිදු ව සිටුනා බැවිනි. ඥානදර්ශනය විශුද්ධ බැවින් ම 'ඤාණ දස්සනවිසුද්ධි'යි කියනු ලැබේ.

උදයව්‍යයානුපස්සනාඥානය එහි පළමු වැන්න ය. විදර්ශක තෙමේ පළමු කොට එහි යොග කරන්නේ ය. මග්ගාමග්ගඥාන දස්සනවිසුද්ධියෙහි ලා සැපයූ උදයව්‍යයානුපස්සනාඥානය විදර්ශනොපක්ලෙශයන්ගෙන් කිලිටි ව දුබල ව සිටුනා බැවින් එසේ කරන්නේ ය. උපක්ලෙශයන්ගෙන් කිලිටි වූ මොට වූ උදයව්‍ය-යානුපස්සනාඥානය අනිත්‍යාදිලක්ෂණ සලකා බැලීමෙහි සමර්ථ නො වේ. එහෙයින් රූපාරූපධර්ම පිළිබඳ වූ හැම ලක්ෂණයක් අවබොධ කර ගනු පිණිස නැවැත ද විදර්ශක තෙමේ මෙහි යොග කරන්නේ ය.

රූපාරූපධර්ම පිළිබඳ වූ ලක්ෂණ අතුරෙහි අනිත්‍යලක්ෂණය උදය-ව්‍යය මෙනෙහි නො කිරීමෙන් ද, සන්තති වශයෙන් වැසුනු බැවින් ද, දුඃඛලක්ෂණය සංස්කාරයන්ගේ නිතර පෙළීම මෙනෙහි නො කිරීමෙන් ද, යැම් ඊම් ඈ ඉරියව්වලින් වැසුනු බැවින් ද, අනාත්මලක්ෂණය නන්වැදෑරුම් ව සිටි ඒ ඒ ධාතූන් වෙන් වෙන් කොට මෙනෙහි නො කිරීමෙන් ද, ඝනයෙන් වැසුනු බැවින් ද තතුලෙසින් නුවණට හසු නො වන්නේ ය.

පංචස්කන්ධයෙහි හැම මොහොතක ම අතර නො තබා ඉපිද ඉපිද නැසි නැසී ගැළපී ගැළපී යන සංස්කාරයන්ගේ අතරෙක් නො පෙණෙන්නේ ය. එහෙයින් ම ය තුබූ සංස්කාර ම දිගින් දිගට නො නැසී පවත්නා සේ පෙණෙනුයේ. සංස්කාරයන්ගේ ඉපදීම හා බිඳීම වනුයේ ඉතා වේගයෙනි. ඒ සඳහා ගත වන ඉතා සුළු කාලය මෙ පමණැ යි කියනු තබා සිතනු ද නො හැකි ය. එ දෙක ඉතා වෙගයෙන් වන්නේ ය. ඉපැදෙනබව හා නැසෙනබව හා නො පෙණෙන පරිදි ක්‍ෂණික ව පවත්නා සංස්කාරයන්ගේ පරම්පරා සම්බන්ධය එකට ගැළපී සිටීම 'සන්තති' යි කියනු ලැබේ. මේ සන්තතිය බිඳ හැරීමෙහි පොහොසත් වූ තියුණු වූ නුවණට ම ඉපදීම හා බිඳීම දක්නා නුවණට ම අනිත්‍යලක්ෂණය හසුවන්නේ ය. සංස්කාරයන්ගේ සන්තති වශයෙන් ගැළපී සිටීම නො දත් නුවණට අනිත්‍යලක්ෂණය හසු නො වේ. එහෙයින් විදර්ශක තෙමේ සංස්කාරයන්ගේ ඉපදීම හා බිඳීම නැවැත නැවැත මෙනෙහි කරන්නේ ය.

සංස්කාරයන්ගේ ඉපදීම හා බිඳීම හා දෙක පෙළීමෙකි. එය නිතර මෙනෙහි කළ යුතු ය. දිගට එක් ම ඉරියව්වකින් ඉන්න හුට දැනෙන පෙළීම සුළු නො වේ. එහෙයින්, උපන් ඒ පෙළීම දුරු කරනු පිණිස අන් ඉරියව්වෙක් ගත යුතු ය. මෙසේ ඒ ඒ අවස්ථායෙහි උපදනා පෙළීම් වෙහෙසීම් දුරුකරනු පිණිස ගන්නා ඉරියව්වලින් දුඃඛලක්ෂණය වැසී යන්නේ ය. සංස්කාරයන්ගේ

ඉපදීම බිඳීම පෙළීම දන්නා නුවණටම දුඃඛලක්‍ෂණය හසු වන බැවින් විදර්ශක තෙමේ සංස්කාරයන්ගේ ඉපදීම හා බිඳීම නැවැත නැවැත මෙනෙහි කරන්නේ ය.

උදයව්‍යයඥානය පවත්නේ නානාධාතූන් විෂය කොට ය. ධාතූන් වෙන් කොට බැලීමෙන් ඒ නුවණ පොහොසත් වන්නේ ය. 'ධාතූන් එක් ව සිටිති' යි ගත්තහුට උදයව්‍යඥානය ලබනු නො හැකි ය. ඒ මේ ඝනසංඥා ව දුරලන්නට ධාතූන් වෙන් කොට බලා එකිලා උදයව්‍යය ද බැලිය යුතු ය. එකල්හි ධාතූන් එක් ව සිටිති යි යන හැඟීම බැහැර ගොස් අනාත්මලක්‍ෂණය ඒ නුවණට හසු වන්නේ ය. එහෙයින් විදර්ශක තෙමේ සංස්කාරයන්ගේ ඉපදීම හා බිඳීම නැවැත නැවැත මෙනෙහි කරන්නේ ය.

සංස්කාරධර්ම, අනිත්‍ය දුඃඛ අනාත්ම වශයෙන් පිරිසිඳින කල්හි විදර්ශකයාගේ නුවණ වඩාත් තියුණු වන්නේ ය. සංස්කාරධර්ම වහා වැටහෙන්නේ ය. නුවණ තියුණු වන කල්හි සංස්කාර වහා වැටහෙන කල්හි සිහිය, උත්පාද-ස්ථිති-ප්‍රවෘත්තිනිමිත්තයෙහි නො සිට නිරොධයෙහි බැස ගන්නී ය. සංස්කාරයන්ගේ මේ නිරොධය දැකීමෙහි නුවණ භඞ්ගානුපස්සනා ය. විදර්ශක, උපදනා රූපධර්ම යන්ගේ බිඳීම දැක රූපාදිය අරමුණු කොට උපදනා සිත්වල ද බිඳීම දක්නේ ය. වැසි වස්නා කල්හි දිය පිට නැඟී නැඟී බිඳී බිඳී යන දිය බුබුලු දක්නා සේ රූපාරූපධර්මයන්ගේ භඞ්ගය දක්නේ ය-

මෙසේ භඞ්ගානුදර්ශනඥානයෙන් සංස්කාරයන්ගේ බිඳි බිඳී යෑම දුටු විදර්ශකයාහට සංස්කාර, බිය උපදවා ලන්නවුන් සේ සිහියට නඟින්නේ ය. ''අතීතසංස්කාරයෝ බිඳී ගියහ, වර්තමාන සංස්කාරයෝ බිඳෙති, අනාගතසංස්කාරයෝ බිඳෙන්නාහ'' යි ඔහුට වැට හෙන්නේ ය. බිඳී ගිය, බිඳෙන සංස්කාර දැක හොඳට පළපුරුදුබැව් ඇති හෙතෙමේ ඒ අනු ව අනාගතසංස්කාර ද බිඳෙනු ඇතැ යි නිශ්චයට බසින්නේ ය. තීරණය කරන්නේ ය. සංස්කාරයන් මෙසේ තීරණය කළ ඔහුට සංස්කාර හැම එකෙක් සිංහ-ව්‍යාඝ්‍ර-කොටි-වලස්-යක්‍ෂ-රාක්‍ෂසයන් වසන තැන් සේ පෙණෙන්නේ ය. යම් නුවණකින් එසේ දක්නා ලද ද ඒ නුවණ භයතුපට්ඨානඥාණ යි දතයුතු ය. මේ නුවණින් තොර වූයේ 'සංස්කාර මම ය, මාගේ ය, යි ගෙණ එහි ආලය උපද වනුයේ දුකෙහි ගැලෙන්නේ ය.

භයතුපට්ඨානඥාණයෙන් සංස්කාරයන් බිය විසින් දක්නේ, භව - ගති - යොනි ආදී වූ කිසිත් තැනෙක පිහිටෙක් ඇතැ යි

නො ද ගන්නේ ය. කිසි සංස්කාරයෙක්හි පැතීමක් නො කරන්නේ ය. භවත්‍රය ම, ගිනි අඟුරු පිරි වලක් සේ, සතරමහාභූත, විසඝොර සපුන් සේ, පස්කඳ, කඩු ගත් වධකයන් සේ, ආධ්‍යාත්ම් කායතන, හිස් වූ ගම් සේ, සප්තවිඥනස්ථිති-නවසත්ත්වාස, ගිනි ඇවිළ ගත්තවුන් සේ මෙසේ සංස්කාර, මහාආදීනව රාශියකින් පිරීගත් බිය විය යුත්තන් සේ දක්නේ, එහි කළ කිරෙන්නේ ය. ගත යුතු හරයෙක් නැතැ යි දෝෂ දක්නේ ය. සංස්කාරයන් කෙරෙහි වූ මේ දෙස් දක්නා නුවණ, 'ආදීනවානුපස්සනාඥණ' යි දතයුතු ය.

ආදීනවානුදර්ශනඥනයෙන් සංස්කාරයන්ගේ දෙස් දැකීමෙන් කළකිරුණු විදර්ශක තෙමේ සංස්කාරයන් කෙරෙහි නො ඇලෙන්නේ ය. ඉදිරියෙහි තව තවත් කළ කිරෙන්නේ ය. එසේ නො ඇලීම් වශයෙන් කළකිරීම් වශයෙන් උපදනා නුවණ, 'නිබ්බිදානුපස්සනාඥණ' නම්. හේ මෙසේ සංස්කාරයන් කෙරෙහි කළකිරුණේ නිවනෙහි ඇලෙන්නේ ය. රජහස්, සිතුකුළු පව්වෙහි ඇලෙන්නා සේ ය. භයතුපට්ඨාන-ආදීනවානුපස්සනා-නිබ්බිදනුපස්සනා යන මෙ තුන අකුරු වශයෙන් වෙනස් වූයේ ද, අරුත් වශයෙන් වෙනස් වූයේ නො වේ. එ තුන අරුත් වශයෙන් එකෙක් ම ය. සංස්කාරයන්ගේ දෙස් දැකීම් වශයෙන් එකෙක් ම වේ. තුනක් කොට බෙද දක්වන ලද්දේ සංස්කාරයන්ගේ ආදීනවය බිය වියයුතු සේ ගැණීමෙන් හා පිළිසරණ නො වන බව දැකීමෙන් හා සතුටු නො වියයුතු ඇලුම් නො කටයුතු සේ ගැණීමෙනි.

විදර්ශක තෙමේ මෙසේ මේ නුවණින් වැඩුනේ සසර දුකින් මිදෙනු පිණිස සංස්කාරයන්ගෙන් මිදිය යුතු ම ය යි දක්නේ ය. එසේ දක්නා වූ නුවණ, 'මුඤ්චිතුකම්‍යතාඥණ, නම්. මෙයින් ඔද වැඩුනු කල්හි විදර්ශකයාගේ සිත හැම සංස්කාරයකින් හැකිළී ගන්නේ ය. කුඩුවක ලූ පක්ෂියකුට, බැඳුමට හසු වූ වන මුවකුට, දැලට හසු වූ මසකුට, සර්පයකුට හසු වූ මැඩියකුට, ඉන් ඉන් මිදීම පිණිස උපදනා කැමැත්ත සේ මේ විදර්ශකයාහට ද භවයෙන් මිදීම පිණිස උපදනා කැමැත්ත ඉතා බලවත් වේ.

භවයෙන් මිදීමෙහි ආශාවෙන් තදබද වූ විදර්ශක තෙමේ මිදීමෙහි උපාය සෙවීම පිණිස නැවැත නැවැතත් සංස්කාරධර්ම, හැම එකක් තිලකුණට නගා බලන්නේ ය. එහි දී මෙතෙමේ, හැමද නො පවත්නා බැවින්, තාවකාලික බැවින්, ඉපදීමෙන් බිඳීම් දෙකින් පිරිසිඳිනා බැවින්, පලුදු වන බැවින්, සැලෙන බැවින්, බිඳෙන සුලු බැවින්, නො තිර බැවින්, පෙරළෙන බැවින්, හරයක්

නැති බැවින්, පිරිහෙන බැවින්, හෙතුයෙන් හටගන්නා බැවින්, මැරෙණ බැවින් හැම සංස්කාරයෙක් අනිත්‍ය වන්නේ ය යි දක්නේ ය.

නිතර පෙළෙන බැවින්, ඉවසීමට නො හැකි බැවින්, දුකට වස්තු බැවින්, ලෙඩක් ගඩක් හුලක් වැනි බැවින්, පවට කරුණු බැවින්, ආබාධ බැවින්, ව්‍යසන බැවින්, අනර්ථ කර බැවින්, බිය විය යුතු බැවින්, අනර්ථ විසින් ලුහුබැඳි බැවින්, රැකුමක් නො වන බැවින්, රැකුමට තැන් නො වන බැවින්, අසරණ බැවින්, දොස් සහිත බැවින්, පවට මුල් වන බැවින්, නසාලන බැවින්, ආස්‍රවයනට හිත බැවින්, මාරාමිස බැවින්, උපදින දිරණ බැවින්, ලෙඩ රෝදුක් දනවන බැවින්, තැවිලි කරණ බැවින්, හඬවන බැවින්, වෙහෙස කරණ බැවින්, කෙලෙසන බැවින් හැම සංස්කාරයෙක් දුඃඛ වන්නේ ය යි දක්නේ ය.

සිය වසයෙහි නො පවත්නා බැවින්, නිසරු බැවින්, මද බැවින්, කරන්නකු විඳින්නකු නො වන බැවින් හැම සංස්කාරයෙක් අනාත්ම වන්නේය යි දක්නේ ය.

මෙසේ අනිත්‍ය – දුඃඛ – අනාත්ම විසින් සංස්කාරයන් ගැණ වඩ වඩාත් සිතීමෙන් සැලකීමෙන් විදර්ශකයාහට උපදනා නුවණ, ‘පටිසඞ්ඛානුපස්සනාඤාණ’ නම්. සංස්කාරයන් කෙරෙහි බියක් හෝ ඇල්මක් නො කොට සංස්කාරයන් මැදහත් ලෙසින් බැලීමෙන් මේ නුවණ උපදනේ ය. එහි දී විදර්ශකයා සංස්කාරයන්ගේ ශූන්‍යත්වය හිස් බව දෙ අයුරෙකින්, සිවු අයුරෙකින්, සය අයුරෙකින්, අට අයුරෙකින්, දස අයුරෙකින්, දොළොස් අයුරෙකින්, දෙසාලිස් අයුරෙකින් බලන්නේ ය. මෙසේ බලන්නහුගේ සිත මඳක් නැමුනු පියුම් පතෙක ලූ දිය මෙන් භව – යොනි – ගති ආදියෙහි නොඇලෙන්නේ ය.

මෙහිලා සංස්කාරයන් කරුණු කොට උපදනා භයතුපට්ඨාන – ආදීනවානුපස්සනා – නිබ්බිදානුපස්සනා – මුඤ්චිතුකාමතා යන මේ ඤාණ සතර අනුසය විසින් පවත්නා සක්කායදිට්ඨිය ඇසුරු කොට සිටියේ ය. එහෙයින් මේ සතර, සක්කායදිට්ඨිය දුරු කිරීමෙහි සමර්ථ නො වේ. පටිසඞ්ඛානුපස්සනාඤාණය ම එහි සමර්ථ වන්නේ ය. එය වැඩූ කල්හි ම සක්කායදිට්ඨිය බැහැර යෑමෙන් සංස්කාරයන් ගැණ තුබූ බියත් ඇලීමත් දුරු වන්නේ ය. මම ය, මාගේ ය, යි ගැන්මෙක් ඉන් පසු නො වන්නේය. සංස්කාරයන් කෙරෙහි මැදහත් වන්නේ ය. හේ දිව්‍ය බ්‍රහ්මාදී වූ කිසිත් සැපතක නො ඇලෙන්නේ ය. ගින්නෙහි ලූ පියාපතක් සේ සම්කැබැල්ලක් සේ සංස්කාරයන් කෙරෙන් හැකිළී ගන්නේ ය.

සඞ්ඛාරුපෙක්ඛාඤාණය ලැබීමෙන් පසු විදර්ශකයාගේ සිත නිවන ශාන්ත ය, ප්‍රණීත ය යි අරමුණු කිරීම් වශයෙන් නිවනට වැද ගන්නේ ය. එහෙත් නිවන් දක්නා තුරු ම ඔහුගේ සිත නැවත නැවතත් සංස්කාරයන් අරමුණු කොට ම පවත්නේ ය. ඉතික්බිති මෙතෙමේ නිවන් දක්නට මුලින් කළ ශූන්‍යතාභාවනා ව හැරදමා නැවත ද සංස්කාරයන් පිළිබඳ අනිත්‍යාදිලක්ෂණ සිතට නගා බලන්නේ ය. එහි දී ආධ්‍යාත්මික බාහිරාදිවශයෙන් භෙදයට ගිය සියලු සංස්කාරයන් එසේ වෙන් වෙන් කොටත් එක් තැන් කොටත් බලන්නේ ය.

සඞ්ඛාරුපෙක්ඛාඤාණය ලැබූ මෙතෙමේ අනතුරු ව අනුලොම-ගොත්‍රභූඤාණයන්ගේ ප්‍රතිලාභය පිණිස පෙර විමසා බලා වඩා ඇති සංස්කාරයන් පිළිබඳ ත්‍රිලක්ෂණයෙහි සිත හසුරු වන්නේ ය. ඒ පිණිස අමුතු භාවනායෙක් නැත. එහෙයින් එය අපහසු නො වේ. ඉතා පහසු ය. ත්‍රිලක්ෂණයෙහි සිත හසුරුවා බලා වඩා සිටුනා බැවිනි. සඞ්ඛාරුපෙක්ඛාඤාණය ලබා ඇති බැවින් දැන් මොහුගේ විදර්ශනාව මුදුන් පැමිණියා වෙයි. එහෙයින් ශිඛාප්‍රාප්ත ය. ව්‍යුත්ථානගාමිනී ය. ශිඛාප්‍රාප්තවිදර්ශනා-ව්‍යුත්ථානගාමිනීවිදර්ශනා යන නම් වලින් මෙය හඳුන්වනු ලැබේ. ශිඛාප්‍රාප්ත නම්: උතුම් බවට පැමිණියා යනු යි. ව්‍යුත්ථානගාමිනී නම්: මාර්ගය කරා යන්නී යනු යි. ව්‍යුත්ථානැ යි මාර්ගයට නමි. මාර්ග නම්: සෝවන් ඈ මග ය. ඇතුළත පිටත පැවැතුම්වලින් නැගී සිටිනුයේ විදර්ශනායෙහි බලයෙනි. සෝවන් ඈ මග කෙලෙසුන්ගෙන් හා ලොකයෙන් මිදෙනබැවින් විමොක්ඛයි ද කියනු ලැබේ. එය අනිමිත්තවිමොක්ඛ-අප්පණිහිත විමොක්ඛ-සුඤ්ඤතවිමොක්ඛ යි තෙ වැදෑරුම් ය. අනිච්චානුපස්සනා -දුක්ඛානුපස්සනා-අනත්තානුපස්සනා යන තෙවැදෑරුම් අනුදර්ශන යෝ විමොක්ඛ නම් වූ ලොකොත්තරමාර්ගයට පමුණු වන බැවින් විමොක්ඛමුඛ නම්හ.

සඞ්ඛාරුපෙක්ඛාඤාණයෙන් තිලකුණු බලන විමසන විදර්ශකයාගේ ශ්‍රද්ධාව බලවත්තර වේ. වීර්යය ද බලවත් ය. සිහිය ද මැනවින් එළඹ සිටියි. සිත සුසමාහිත වේ. සඞ්ඛාරුපෙක්ඛාඤාණය ඉතා තියුණු වේ. ඉතා ඉක්මනින් ඇසිල්ලෙකින් මාර්ගචිත්තය උපදින්නේ ය යි කියයුතු තරමට මෙ කියූ ශ්‍රද්ධාදීන්ගෙන් විදර්ශක තෙමේ පුෂ්ටිමත් ව නැගී සිටියේ සියලු සංස්කාරධර්ම, අනිත්‍ය - දුඃඛ - අනාත්ම විසින් පිරිමදින්නේ ය. එකල්හි විදර්ශකයාගේ සිත භවාඞ්ග - භවාඞ්ගචලන - භවාඞ්ගුපච්ඡෙද වශයෙන් ක්‍රමයෙන් නැගී යන්නේ ය. ඉක්බිති සඞ්ඛාරුපෙක්ඛාඤාණයෙන් පිරිමැදීම කළ පරිදි සියලු සංස්කාර අනිත්‍ය යයි හෝ දුක්ඛ යයි හෝ අනාත්ම යයි

හෝ අරමුණු කරමින් මනොද්වාරාවජ්ජනචිත්තය පහළ වන්නේය. ඉක්බිති එය ම අරමුණු කොට ජවන් සිත් උපදනේ ය. එහි ප්‍රථම ජවනය පරිකම් නම. දෙවන ජවනය උපචාර නම. තුන්වන ජවනය අනුලෝම නම. මේ හැම ජවනයකගේ ම උපතට අරමුණු වූවෝ සංස්කාරයෝම ය. මේ ජවන් සිත් තුන හා උපන් නුවණ විපස්සනාඤාණාදී වූ ඥාන අටටත් මතු ලැබෙන ගොත්‍රභූඤාණයට හා මාර්ගඥානයන්ටත් අනුලෝම ව සිටුනා බැවින් අනුලෝමඤාණ නම්. අනුලෝමඤාණය ව්‍යුත්ථානගාමිනීවිදර්ශනාවගේ කෙළවර වන්නේය. උදයබ්බයඤාණය පටන් අනුලෝමඤාණය තෙක් ඇති ඥාන නවය පටිපදාඤාණදස්සනවිසුද්ධි යි දත යුතු ය. (විස්තර කථාව මෙහි දසවන තරඞ්ගයෙහි දසවන කථාවස්තුයෙහි **'සම්පන්න විජ්ජාචරණ'** යන්නට කළ පරිකථාව බලා දත යුතු සි.)

ව්‍යුත්ථානගාමිනී විදර්ශනාඥානය හැම අතකින් මුදුන් පැමිණෙනුයේ ගොත්‍රභූඥානය ලැබීමෙනි. එය අනුලෝමඥානයට අනතුරුව ලැබෙන්නේ ය. මෙය පටිපදාඤාණදස්සනවිසුද්ධියටත් ඤාණදස්සනවිසුද්ධියටත් ඇතුළත් නො වේ. ඉපැදෙනුයේ නිවන් අරමුණු කොට ය. සංස්කාර අරමුණු කොට ඉපැදෙනුයේ නො වේ. නිවන් දක්නේ වුව ද, නිවන් දැකීමෙන් වන කෙලෙස් නැසීමෙක් මෙයින් නො වන්නේ ය. පෘථග්ජනගොත්‍රය මැඩලනු බැවින් හා ආර්‍ය්‍යගොත්‍රයට පමුණුවන බැවින් හා මෙය ගොත්‍රභූ නම් ය. ගොත්‍රභූඥානයෙන් හැම අතකින් මුදුන් පැමිණියා වූ ව්‍යුත්ථානගාමිනී විදර්ශනාඥානයෙන් ම සංස්කාරයන්ගේ සථානත්ත්වය දතයුතු බව බුදුරජානන් වහන්සේ **"සබ්බේ සඞ්ඛාරා අනිච්චා"** යනාදීන් වදාළ ගාථායෙහි එන **'පඤ්ඤාය'** යන මෙයින් එළිපෙහෙළි කළ සේක. (විසුද්ධිමග්ග - පටිසම්භිදා මග්ග බැලිය යුතුයි)

සංස්කාරයන්ගෙන් තොර වූ නිවන් දක්නා වූ පෘථග්ජන ගොත්‍රය මඩින්නා වූ ආර්‍ය්‍යගොත්‍රයට පමුණු වන්නා වූ ගොත්‍රභූචිත්තයට අනතුරු ව නිවන ප්‍රත්‍යක්ෂ වශයෙන් දක්නා වූ සෝතාපත්තිමග්ගචිත්තය උපදනේ ය. එයට අනතුරුව ඒ හා ම එහි පලසිත් ද උපදී. මේ මාර්ගඥානයෙන් සිවු සස් දහම් ප්‍රත්‍යක්ෂ විසින් දත හෙන්නේ ය. අනතුරු ව සංස්කාරයන් අරමුණු කොට පළමු කියූ සේ මනොද්වාරාවජ්ජන - පරිකම්ම - උපචාර - අනුලෝම යන ජවන්සිත් ඉපද නිරුද්ධ වත් ම නිවන් අරමුණු කොට ගොත්‍රභූචිත්තය නැගී සිටුනේ ය. එයින් පසු නිවන් අරමුණු කොට සකෘදාගාමිමග්ගචිත්තය හා පලසිත් ද උපදී. සෙසු මගපලසිත් පිළිලැබුම ද මෙසේ දත්තේ ය.

---

1. 14. 6. 'දුක්ඛස්ස ච අතික්කමං' යනු බලනු

මෙසේ උපදින සෝතාපත්තිමග්ගඤාණ - සකදාගාමිමග්ගඤාණ - අනාගාමිමග්ගඤාණ - අරහත්තමග්ගඤාණ යන ඥානචතුෂ්කය **'ඤාණදස්සනවිසුද්ධි'** නම් වේ.

**අථ නිබ්බින්දති දුක්ඛෙ** = එකල්හි දුකෙහි කළකිරෙයි.

මෙහි දුක යි වදාරණ ලද්දේ ස්කන්ධපරිහරණයෙහි දී සත්ත්ව-යනට විඳින්නට වන සත්ත්වයන් විසින් විඳිය යුතු දුක් ය.[1] ස්කන්ධ පරිහරණදුඃඛයෙහි කළකිරුණේ පිරිසිඳ දැනීම් විසින් දුඃඛසත්‍යය ද ප්‍රහාණ කිරීම් විසින් සමුදයසත්‍යය ද ප්‍රත්‍යක්ෂ කිරීම් විසින් නිරෝධසත්‍යය ද පුරුදු කිරීම් විසින් මාර්ගසත්‍යය ද ප්‍රතිවෙධ කරන්නේ ය.

**එසො මග්ගො විසුද්ධියා** = මෙය නිවනට මග ය.

සකල සංස්කාරයන් කෙරෙහි කළකිරීම, පිරිසිදු වීමට මගැ යි මෙයින් වදාළ සේක. පිරිසිදුවීම නම්: නිවන් ලැබීම ය. යමෙක් මෙසේ නිවන් ලබා සිටියේ නම් හෙතෙමේ මුළුමනින් කෙලෙසුන් නසා සිටි බැවින් ස්කන්ධයන් බහා තැබූ බැවින් පිරිසිදු වූයේ ය.

ධර්මදෙශනාවගේ අවසානයෙහි ඒ භික්ෂූහු රහත් බැව්හි පිහිටා ගත්හ. ධර්මදෙශනා තොමෝ පැමිණ සිටි පිරිසට ද වැඩ සහිත වූ ය.

**අනිත්‍යලක්ෂණවස්තුව නිමි.**

1. 14. 6. 'දුක්ඛං' යනු බලනු

# දුඃඛානුදර්ශනය වැඩූ පන්සියයක් දෙනා වහන්සේ

## 20 – 3.

**දවසක්** පන් සියයක් භික්ෂූන් වහන්සේලා බුදුරජානන් වහන්සේ වෙත ගොස් කමටහන් උගෙණ වන වැද යොග කරන්නට පටන් ගත්හ. එහෙත් රහත් වන්නට නො හැකි වූ උන්වහන්සේලා නැවැත කමටහන් විශෙෂ කොට උගන්නට බුදුරජුන් වෙතට පැමිණියහ. බුදුරජානන් වහන්සේ "මොවුනට හිත සැප එළවන කමටහන කමැ"යි බලා වදූරණ සේක් මොවුන් කසුප් බුදුරජුන් දවස, අවුරුදු විසිදහසක් සංස්කාරයන් පිළිබඳ දුඃඛලක්ෂණයෙහි යොග කොට සිටුනා බව දැක මොවුනට හිතසුව එළවනුයේ දුඃඛ ලක්ෂණ වැඩීමය, එහෙයින් දුඃඛලක්ෂණ දන්වා එක් ම ගාථාවක් දෙසිය යුතු ය"යි "මහණෙනි! කාමභවාදියෙහි වූ සියලු සංස්කාරයෝ උදය ව්‍යයයෙන් පෙළෙන බැවින් දුඃඛහ"යි වදූරා මේ ධර්මදෙශනාව කළ සේක.

> **සබ්බෙ සඞ්ඛාරා දුක්ඛාති යදා පඤ්ඤාය පස්සති,**
> **අථ නිබ්බින්දති දුක්ඛෙ එස මග්ගො විසුද්ධියා.**

සියලු සංස්කාරයෝ දුඃඛහ යි යම් කලෙක නුවණින් දකී ද, එකල්හි දුකෙහි කළකිරෙයි. මෙය නිවනට මග ය.

**සබ්බෙ සඞ්ඛාරා දුක්ඛා ඉති** = සියලු සංස්කාරයෝ දුඃඛහ යි.
**යදා පඤ්ඤාය පස්සති** = යම් කලෙක නුවණින් දකී ද.
**අථ නිබ්බින්දති දුක්ඛෙ** = එකල්හි දුකෙහි කළ කිරෙයි.
**එසො මග්ගො විසුද්ධියා** = මෙය නිවණට මග ය.

ස්කන්ධයෝ ඉපදීම් නැසීම් දෙකින් පෙළෙන බැවින් දුක් ය. ස්කන්ධයන්ගේ ඒ ඉපදීම හා නැසීම දැකීමෙහි දූන ගැණීමෙහි පොහොසත් වූවා ව්‍යුත්ථානගාමිනීප්‍රඥා ය. ව්‍යුත්ථානගාමිනීප්‍රඥායෙන් ස්කන්ධයන්ගේ දුක දූන ගත්තහුට නිවන අරමුණු කොට උපදනා මාර්ගචිත්තය අප්පණිහිතවිමොක්ඛ නම්. සංස්කාරයන් කෙරෙහි මම ය, මාගේ ය, මේ සැපය, යනාදී විසින් පැවැති තෘෂ්ණාප්‍රණිධිය බැහැර කොට දුඃඛාකාරය දැක එය දුරු කරණ ව්‍යුත්ථානගාමිනී විදර්ශනාප්‍රඥාව අප්පණිහිතානුදස්සනවිමොක්ඛ මුඛ නම් වේ. මේ විදර්ශනාප්‍රඥාව ස්කන්ධපරිහරණය දුකැ යි දන්නී ය. එහෙයින් එහි කළකිරුණු විදර්ශක, චතුස්සත්‍යය ප්‍රතිවෙධ කරන්නේ ය. විස්තර කතාව අනිත්‍යානුදර්ශනයෙහි කීලෙසින් දන්නෝය. දුඃඛානුදර්ශනය ද එහි කියන ලදි. මෙහි ද **'පඤ්ඤාය'** යන්නෙන් ගණු ලබන්නී ව්‍යුත්ථානගාමිනීප්‍රඥා ම ය.

ධර්මදෙශනාවගේ අවසානයෙහි ඒ භික්ෂූහු රහත්බවෙහි පිහිටි-යහ. ධර්මදෙශනා තොමෝ පැමිණ සිටි පිරිසට ද වැඩ සහිත වූය.

**දුඃඛලක්ෂණවස්තුව නිමි.**

# අනාත්මදර්ශනය වැඩූ පන්සියයක් දෙනා වහන්සේ

## 20 — 4.

දවසක් පන් සියයක් භික්ෂූන් වහන්සේලා බුදුරජානන් වහන්සේ වෙත ගොස් කමටහන් උගෙණ වන වැද යොග කරන්නට පටන් ගත්හ. එහෙත් රහත් වන්නට නො හැකි වූ උන්වහන්සේලා නැවැත කමටහන් විශෙෂ කොට උගන්නට බුදුරජුන් වෙතට පැමිණියහ. බුදුරජානන් වහන්සේ “මොවුනට හිතසුව දෙන කමටහන කිමැ”යි බලා වදාරණ සේක් මොවුන් කසුප් බුදුරජුන් දවස විසි දහසක් අවුරුදු සංස්කාරයන් පිළිබඳ අනාත්මලක්ෂණයෙහි යොග කොට සිටුනා බව දැන “මොවුනට හිතසුව දෙනුයේ අනාත්ම ලක්ෂණ වැඩිම ය, එහෙයින් අනාත්මලක්ෂණ දක්වා එක් ම ගාථාවක් දෙසිය යුතු ය” යි “මහණෙනි! සියලු ස්කන්ධයෝ තමා යටතෙහි තමා කැමති සේ නො පවත්නා බැවින් අනාත්මහ”යි වදාරා මේ ධර්මදෙශනාව කළ සේක.

**සබ්බෙ ධම්මා අනත්තාති යදා පඤ්ඤාය පස්සති,**
**අථ නිබ්බින්දති දුක්ඛෙ එස මග්ගො විසුද්ධියා.**

නිර්වාණ – ප්‍රඥප්ති සහිත වූ සියලු ධර්මයෝ ආත්මරහිතහ යි යම් කලෙක නුවණින් දකී ද, එකල්හි දුකෙහි කළකිරෙයි. මෙය නිවනට මගය.

**සබ්බෙ ධම්මා අනත්තා ඉති** = නිර්වාණ – ප්‍රඥප්ති සහිත වූ සියලු ධර්මයෝ ආත්මරහිතහ යි.

**යදා පඤ්ඤාය පස්සති** – යම් කලෙක නුවණින් දකී ද.

**අථ නිබ්බින්දති දුක්ඛෙ** = එකල්හි දුකෙහි කළකිරෙයි.

**එසො මග්ගො විසුද්ධියා** = මෙය නිවනට මග ය.

මෙහි “**සබ්බෙ ධම්මා**” යි වදාළෝ පඤ්චස්කන්ධය යි. “**සබ්බෙ ධම්මාති පඤ්චක්ඛන්ධා ව අධිප්පෙතා**” යනු අටුවා. මෙහිදු “**සබ්බෙ සඞ්ඛාරා අනත්තා**” යි වදාළේ නම් නිර්වාණය හා සත්ත්වපුද්ගල-ප්‍රඥප්තිය ආත්මසහිත දැ යි සැකයෙක් උපදනේ ය. එය වළකනු සඳහා මෙසේ වදාළ සේක. “පඤ්චස්කන්ධයට අයත් කිසිවෙක් නො දිරාවා, නො ද මැරේවා” යි කිසිවක් හටත් තම කැමැත්ත සේ තම යටතෙහි පවත්වා ලන්නට නො හැකි ය. මෙසේ තම යටතෙහි නො පවත්නා බැවින් පංචස්කන්ධය ආත්මත්වයෙන් ශූන්‍ය ය. අස්වාමික ය.

ත්‍රිලක්ෂණය සංස්කාර පිළිබඳ ය. සඞ්ඛතභාවයෙන් බැහැර වූ කිසි පදාර්ථයක ත්‍රිලක්ෂණය දක්ක නො හැකි ය. නිර්වාණයත් ප්‍රඥප්තියත් සඞ්ඛත නො වේ. එහෙයින් එ දෙක ම විදර්ශනාවට අරමුණු නො වේ. නිර්වාණයෙහි හා ප්‍රඥප්තියෙහි ආත්ම-අනාත්ම දෙක ම නො නැගිය හැකි ය. එහෙත් නිර්වාණාවබොධය පිණිස සඞ්ඛතයන් අරමුණු කොට ත්‍රිලක්ෂණභාවනාසඞ්ඛ්‍යාතවිදර්ශනා භාවනාව වැඩිය යුතු ය. සීමාරහිත ව සියලු සංස්කාර, අනාත්ම වශයෙන් වැඩීමෙන්, වඩන්නේ කාම – රූප – අරූප ලොකයෙහි තෘෂ්ණාදෘෂ්ටිරහිත වන්නේ ය. ඔහු පිළිබඳ අහංකාර – මමං – කාරයෝ නැතිව යන්නාහ. අසාධාරණඥනයෙන් ඔද වැඩි වන්නේ ය. හෙතු-ඵල ධර්ම දක්නේ ය. විදර්ශනාභාවනායෙන් මේ අනුසස් සය ලැබෙන බව බුදුරජානන් වහන්සේ වදාළ සේක. මේ වදාළ සැටි: **"ඡ භික්ඛවෙ! ආනිසංසෙ සම්පස්සමානෙන භික්ඛුනා අලමෙව සබ්බසඞ්ඛාරෙසු අනොධිං කරිත්වා අනත්ත-සඤ්ඤං උපට්ඨාපෙතුං, කතමෙ ඡ? සබ්බලොකෙ ච අතම්මයො භවිස්සාමි, අහංකාරා ච මෙ උපරුජ්ඣිස්සන්ති, මමංකාරා ච මෙ උපරුජ්ඣිස්සන්ති, අසාධාරණෙන ඤාණෙන සමන්නාගතො භවිස්සාමි, හෙතු ච මෙ සුදිට්ඨො, හෙතු-සමුප්පන්නා ච ධම්මා"** යි.

යම් කලෙක යමක්හු පිළිබඳ ව්‍යුත්ථානගාමිනී විදර්ශනාප්‍රඥව සංස්කාරයන් අනාත්ම විසින් දකී ද, එකල්හි නිවන අරමුණු කොට ඔහුට උපදනා මාර්ගචිත්තය **'සුඤ්ඤතාවිමොක්ඛ'** නම් වේ. අනාත්මලක්ෂණය ඇසුරු කොට නැගෙන පහළ වන විදර්ශනාප්‍රඥව "කුශලාකුශල කර්ම රැස් කරණුයේ විපාක විඳිනුයේ මාගේ ආත්මය" යි මෙසේ පැවැති දෘෂ්ටි හැඟීම දුරු කරමින් සංස්කාර පිළිබඳ ආත්මශූන්‍යත්වය ආත්මයක් නැති බව ම පුන පුනා බලන බැවින් **'සුඤ්ඤතානුපස්සනාවිමොක්ඛමුඛ'** යි හඳුන් වනු ලැබේ.[1]

මෙහි ද **'පඤ්ඤය'** යන්නෙන් ගණු ලබන්නී ව්‍යුත්ථානගාමිනී විදර්ශනාප්‍රඥ ය.

ධර්මදෙශනාවගේ අවසානයෙහි ඒ භික්ෂූහු රහත් බවෙහි පිහිටා ගත්හ. ධර්මදෙශනා තොමෝ පැමිණ සිටි පිරිසට ද වැඩ සහිත වූ ය.

**අනාත්මලක්ෂණවස්තුව නිමි.**

---

1. 12. 1. 'අත්තානං චෙ පියං ජඤ්ඤා' යනු බලනු.

# ප්‍රධානකර්මික තිෂ්‍යස්ථවිරයන් වහන්සේ

## 20 — 5

**බුදුරජාණන්** වහන්සේ දෙව්රම් මහාවෙහෙර වැඩ වසන එක් කලෙක සැවැත් නුවර වැසි පන් සියයක් කුලපුත්‍රයෝ උන් වහන්සේ වෙත පැවිදි ව කමටහන් කියවා ගෙණ කමටහන් වඩන්නට වනයට ගියහ. ඔවුනතුරෙන් එකෙක් එහි ම රැඳුනේ ය. කමටහන් වඩන්නට වනයට ගිය ඒ භික්‍ෂූන් වහන්සේලා එහි මහණදම් වඩන්නෝ, රහත්බවට පැමිණ ඒ තමන් පිළිවිදි ගුණය බුදුරජුන්ට දන්වන්නට වනයෙන් නික්ම පෙරළා සැවැත් නුවරට පැමිණියහ. සැවැත් නුවරින් යොදුනක් පමණ ඈත්හි එක් ගම් පෙදෙසක පිඩු සිඟා හැසිරෙණ ඒ භික්‍ෂූන් දුටු එක් උපාසකයෙක් කැඳබත් ආදියෙන් සඞ්ග්‍රහ කොට අනුමෙවෙනි බණක් අසා ප්‍රසන්න ව පසුදාටත් දානය පිණිස ඔවුනට ආරාධනා කොට සිටියේ ය. එදා එහි කැඳබත් වැළඳූ ඒ භික්‍ෂූන් වහන්සේලා එදා ම සැවැත් නුවරට ගොස් පා සිවුරු තැන්පත් කොට තබා සවස බුදුරජුන් වෙත පැමිණ වැඳ සිටියහ. බුදුරජාණන් වහන්සේ ඔවුන් ගැණ තමන් වහන්සේගේ සිතෙහි නැගි සතුට ප්‍රකාශ කරණ සේක් ඔවුන් සමග බොහෝ වේලාවක් පිළිසඳර කතා වෙහි යෙදී වැඩ හුන් සේක. කමටහන් වඩන්නට නො ගොස් එහි රැඳි ගත් මහණ, එහි සිටියේ "මොවුන් සමග පිළිසඳර කතා කරණ බුදුරජුන්ගේ මුඛය ඒ පිණිස නො පොහොනේ ය, මා මගපල නො ලබා සිටුනා බැවින් මා හා කතා නො කරණ සේක, අද ම රහත්බවට පැමිණ බුදුරජුන් පිළිසඳර කතාවට ඇද ගන්නෙමි" යි සිතී ය. එහි බුදුරජුන් වෙත පිළිසඳර කතා වෙහි යෙදී හුන් ඒ භික්‍ෂූන් වහන්සේලා "ස්වාමීනි! අපි කමට-හන් වඩා වනයෙන් නික්ම එන්නමෝ එන මග දී උපාසකයකු විසින් හෙට දානය පිණිස පවරණ ලද්දමෝ වෙමු, එහෙයින් හෙට උදය අප එහි යා යුතු ය, එයට අපට අවසර දී වදාරණ සේක්වා" යි දන්වා සිටියහ.

මේ කතාවට කන්දී සිටි ඔවුන්ගේ යහළු මහණ, එදා මුළු රැය සක්මන් කරණුයේ නිදිබරින් සක්මන් කෙළවර තුබූ ගල් පෝරුවක් මත වැටුනේ ය. වැටුනු ගමනේ ම කලවා ඇටයක් කැඩී ගියේ ය. මහණ, මහහඬින් කෑගැසී ය. ඔහුගේ සහායක භික්‍ෂූහු ඒ කෑ ගැසීම අසා හැඳින ඒ ඒ තැනින් දුව ආහ. පහන් දල්වා බලා ඔහුට කළයුතු කටයුතු ද කළහ. මෙසේ කරත් ම ඉරුද නැඟී ගියේ ය. හොඳට ම පාන් විය. උපාසකයාගේ ආරාධනාවට යන්නට ඉඩ නො ලැබූහ. බුදුරජාණන් වහන්සේ

"මහණෙනි! ඇයි, නො ගියහු ද උපාසකයාගේ ආරාධනාවටැ" යි අසා වදාළ කල්හි "ස්වාමීනි! එසේ ය, නො ගියෙමු" යි ඒ තොරතුරු දැන් වූහ. "මහණෙනි! මේ මහණ, මෙසේ තමුසේලාගේ ලාභයට අන්තරාය කරන්නේ දැන් පමණක් ම නො වේ, පෙරත් මෙසේ කෙළේ ය" යි වදාළ විට "ස්වාමීනි! එය වදාරණු මැනැවැ" යි ඇයද සිටියහ. එකල්හි බුදුරජාණන් වහන්සේ

"පළමු කළයුතු දැය – පසු ව කරණට කැමැතී,
මිනිසා තැවේ පසුදු – වරණදඹු බිඳියහු සේ"

යනු විසින් එපුවත වදාළ සේක.

"ඒ භික්ෂුහු, එදා මාණවකයෝ වූහ, අලස මාණවක, මේ මහණ තෙමේ ය, තථාගත තෙමේ ඇදුරු වී ය" යි බුදුරජාණන් වහන්සේ මෙසේ ද වදාරා නැවැත "මහණෙනි! යමෙක් උත්ථාන වීර්‍ය්‍ය කළයුතු කාලයෙහි කටයුතු සඳහා නැගී සිටිය යුතු කාලයෙහි උත්ථානවීර්‍ය්‍ය, නැගී සිටීම නො කෙරේ ද යටපත් කළ සම්‍යක්සඞ්කල්පනා හා සිත් ඇත්තේ වේ ද කුසීත වේ ද ඒ මහණ තෙමේ ධ්‍යානාදිවිශෙෂයක් නො ලබන්නේ ය" යි වදාරා මේ ධර්මදෙශනාව කළ සේක.

**උට්ඨානකාලම්හි අනුට්ඨහානො**
**යුවා බලී ආලසියං උපෙතො,**
**සංසන්නසඞ්කප්පමනො කුසීතො**
**පඤ්ඤාය මග්ගං අලසො න වින්දති**

වීර්‍ය්‍ය කළයුතු කල්හි වීර්‍ය්‍ය නො කරණුයේ තරුණ වූයේ ද, කාය බල ඇත්තේ ද, අලස බැවින් යුක්ත වූයේ නම් යට කොට පියන ලද සම්‍යක්සඞ්කල්පනා හා සිත් ඇති කුසීත වූ අලසයා ප්‍රඥයෙන් දක්ක යුතු වූ නොහොත් ප්‍රඥව ලබන්නට උපායයක් නො ලබන්නේ ය.

**උට්ඨානකාලම්හි** = වීර්‍ය්‍ය කිරීමට සුදුසු කාලයෙහි.

**අනුට්ඨහානො** = වීර්‍ය්‍ය නො කරණුයේ. නො නැගී සිටිනුයේ

**යුවා** = තරුණ වූයේ ද.

**බලී** = කාය බල ඇතියේ ද.

**ආලසියං උපෙතො** = අලස බැවින් යුක්ත වූයේ නම්. අලස බවට පැමිණියේ නම්.

**උට්ඨානකාල** නම් ධාර්මික වූ එලොව මෙලොව දෙකට හිතවූ කාර්‍ය්‍යකරණයෙහිලා නැගී සිටුනා වීර්‍ය්‍ය කටහැකි කාල ය යි

**උට්ඨානසම්පදා** යි බණ පොතෙහි ආයේ ද මේ නැගී සිටුනා වීර්‍ය්‍ය යි. **“ඉධ ව්‍යග්ඝපජ්ජ! කුලපුත්තො යෙන කම්මට්ඨානෙන ජීවිතං කප්පෙති, යදි කසියා, යදි වණිජ්ජාය, යදි ගොරක්ඛෙන යදි ඉස්සත්ථෙන, යදි රාජපොරිසෙන, යදි සිප්පඤ්ඤතරෙන, තත්ථ දක්ඛො හොති අනලසො, තත්‍රූපායාය වීමංසාය සමන්නාගතො, අලං කාතුං අලං සංවිධාතුං අයං වුච්චති ව්‍යග්ඝපජ්ජ උට්ඨානසම්පදා”** යනු මේ බණ පොතෙහි ආ සැටියි. මේ ලොකයෙහි යම් කිසිවෙක් ගොවිතැනින් හෝ වෙළඳාමෙන් හෝ ගෙරි රැකීමෙන් හෝ යම් කර්මාන්තයකින් හෝ ධනුශ්ශිල්පයෙන් හෝ රාජ සෙවායෙන් හෝ යන එක්තරා ශිල්පයකින් ජීවිකාව කෙරේ ද, එහි ලා දක්‍ෂ වේ ද, අලස නො වේ ද මේ කාලයෙහි මේ කරන්නට වටනේය, යි දැනීමෙහි උපාය වූ නුවණින් යුක්ත වූයේ ද එසේ නුවණින් දැන ගොවිතැන් කිරීම් ඈ දැහැමි කටයුතුවල යෙදූ උත්සාහය යොදන උත්සාහය, උත්ථානවීර්‍ය්‍යය, උත්ථානසම්පදා ය, යි කියන ලදි.

ඒ මේ උත්ථානවීර්‍ය්‍යය කළයුතු කාලයෙහි ඒ නො කරණුයේ **අනුට්ඨාන** නම්. මෙ තෙමේ වීර්‍ය්‍යයෙන් තෙද ගැණුනේ නො වේ. උත්ථානවීර්‍ය්‍යවත් නො වූ මෙ තෙමේ පැවිද්දෙක් වූයේ ගුරුවර මවුපිය නෑදෑ හිත මිතුරන්ගේ බල කිරීමෙන් මෙහෙයන ලදු ව ඉඳහිට සමහර විටෙක පැවිදිකම් කරන්නේ ය. ගිහියෙක් වූයේ සමහර විටෙක ගිහිකම් කරන්නේ ය. එ ද කැමැත්තෙකින් නො වන්නේ ය. මෙහෙයීමෙන් වන්නේ ය.

යොවුන් බැව්හි සිටියේ **යුවා.** බණපොතෙහි යොවුන් වයස මෙසේ දැක්වූහ: **“අයං භවං පුරිසො දහරො හොති යුවා සුසු කාළකෙසො භද්‍රෙන යොබ්බනෙන සමන්නාගතො පඨමෙන වයසා”** යි. මෙහි එන **දහරො යුවා සුසුකාළකෙසො භද්‍රෙන යොබ්බනෙන පඨමෙන වයසා** යන පදයන්ගෙන් දැක්වුනේ එක් ම යොවුන් වයස ය. **දහරො** = තරුණ වූයේ. **යුවා** = යොවුන් බැවින් යුක්ත වූයේ. **සුසුකාළකෙසො** = අතිශයින් කළු කෙස් ඇතියේ. **පඨමෙන වයසා** = ප්‍රථම වයස වූ, **භද්‍රෙන යොබ්බනෙන** = යහපත් යොවුන් බැවින්, යනු එ පදයන්ගේ අරුත්. මෙහි පළමුවන වයස නම් තෙතිස් වසෙකැයි අටුවායෙහි කියන ලද්දේ ය. එයින් යුක්ත වූයේ යුවා ය.

අවුරුදු විසින් සොළොස් වන අවුරුද්දෙහි මුල සිට තිස්වන අවුරුද්දෙහි කෙළවර තෙක් මෙයතර කාලය තරුණ කාල ය යි කෙනකුන් ගන්නා අතර, තව කෙනෙක් සොළොස් වන අවුරුද්දෙහි මුල සිට පන්තිස් වන අවුරුද්දෙහි කෙළවර තෙක්

තරුණ කාල ය යි ගණිත්. මෙලෙසින් නියමිත වූ වයස් කාලයෙහි සිටියේ යුවා නම්. **"ෂොඩශවර්ෂාත් ත්‍රිංශද්වර්ෂපර්යන්තං වයස්කො යුවා, ආෂොඩශාද්භවෙද්බාලඃ පංචත්‍රිංශාද්යුවා නරඃ"** යනු ග්‍රන්ථාගත ය.

කායබල ඇතියේ **බලී** ය. ප්‍රථම යෞවනයෙහි සිටියේ ය. **"බලමෙතස්ස අත්ථීති = බලී"** යනු ව්‍යුත්පත්ති යි. බල යනුවෙන් මෙහි ගැණෙනුයේ කායබලය යි.

අලසබව **ආලසිය** නම්. එයින් යුක්ත වූයේ එයට පැමිණියේ **උපෙත** ය. බඩපුරා කා බී කිසිත් නො කොට මැලිකමින් දවස ගෙවනුයේ ය.

**සංසන්නසඞ්කප්පමනො** = යට කොට පියන ලද, යටපත් කළ සම්‍යක්සඞ්කල්පනා හා සිත් ඇති.

මිථ්‍යාවිතර්කයන් විසින් හැම අතකින් ඔබා දැමූ යටපත් කළ නෛෂ්ක්‍රම්‍යසඞ්කප්පාදී වූ සම්‍යක්සඞ්කල්පනා හා සිත් ඇතියේ ය **සංසන්නසඞ්කප්පමන**. කාම –ව්‍යාපාද – විහිංසා යන විතර්කයෝ මිථ්‍යාවිතර්කයෝ ය. මොවුහු යමක්හුගේ සිත්හි උපදිත් නම්, ඒ සිතෙහි සම්‍යක්සඞ්කල්පනාවන්ට නැගී සිටීමට අවසරයෙක් නැත්තේ ය. මිථ්‍යාවිතර්කයන් විසින් ඒ සිත පාපයට නතු-කරණ බැවිනි.

**කුසීතො** = කුසීත වූ.[1]

**පඤ්ඤාය මග්ගං** = ප්‍රඥාවට උපායයක්. නුවණ ලැබීමට මඟක්.[2]

**අලසො න වින්දති** = අලසයා නො ලබන්නේ ය.

අලස පුද්ගල තෙමේ ප්‍රඥයෙන් දැක්ක යුතු වූ ආර්‍යමාර්ගීය, ලෞකික – ලොකොත්තර විසින් බෙදෙන නුවණ ලැබීමට උපාය නො ලබන්නේ ය. උත්පත්තියෙන් අලස වූයේ අලස බැවින් අති-ශයින් මැඩුනේ සිටි තැන සිටින්නේ ම ය. හුන් තැන හුන්නේම ය. සේ තමන්ගේ උත්සාහයෙන් ඉරියවු වෙනස් කිරීමට ද නො-හැක්කේ ය. ලැව් ගිනි නැගී වන පෙදෙස් දැවෙන විට ද මෙ-තෙමේ පලා නො යන්නේ ය. අලසබව ඒ තරමට මහත් ය. මොහුට වඩා තරමකින් නැගී සිටි උත්සාහ ඇත්තේ ද අලසයා-මැ යි කියන ලදී.

ධර්මදෙශනාවගේ අවසානයෙහි බොහෝ දෙන සෝවන් ඵලා-දියට පැමිණියාහු ය.

**ප්‍රධානකර්මිකතිෂ්‍යස්ථවිරවස්තුව නිමි.**

---

1. 1. 6. 'කුසීතං' යනු බලනු
2. 14. 6. 'දුක්ඛස්ස ච අතික්කමං' ,, ,,

# ප්‍රේතයෙක් ව උපන් මහණෙක්

## 20 — 6

**එක්** දවසක් ලක්ෂණ ස්ථවිරයන් වහන්සේ සමග ගිජ්ඣකූට පර්වතයෙන් බස්නා වූ **මහාමෞද්ගල්‍යායන** මහාස්ථවිරයන් වහන්සේ එක් තැනෙක දි සිනා පහළ කළහ. ඒ දුටු ලක්ෂණ ස්ථවිරයන් වහන්සේ "ඇවැත්නි! සිනා පහළ කළහු කුමක් නිසා?" යි ඇසූ කල්හි "ඇවැත්නි! ඔබවහන්සේගේ ප්‍රශ්නයට පිළිතුරු දීමට මේ කාලය නො වේ, එය බුදුරජුන් ඉදිරියෙහි දී මාගෙන් අසන්නැ" යි කියා ලක්ෂණ ස්ථවිරයන් වහන්සේ සමග ම රජගහනුවර පිඬු සිඟා ගොස් එයින් වැළකුනාහු වෙළුවනාරාමයට පැමිණ බුදුරජුන් වැඳ සිටියහ. එ වේලෙහි ලක්ෂණ ස්ථවිරයන් වහන්සේ මග බැස එද්දී මුගලන් තෙරුන්ගෙන් ඇසූ ප්‍රශ්නය බුදුරජුන් ඉදිරියෙහි දී නැවැතත් ඇසූහ. "ඇවැත්නි! ලක්ෂණ ස්ථවිරතුමනි! මට සිනා ආයේ ප්‍රේතයකු දැකීමෙනි, උගේ ඇඟපත තුන් ගවු පමණ ය, මිනිස් සිරුරක් වගේ ය, ඔලුව උෟරුඔලුවක් වැනි ය, කටේ නඟුටෙක් තුබුනේ ය, එයින් පණුවෝ කඩා හැලෙත්, මා නම් එබඳු සතකු මෙයට කලින් දැක නැත, උෟ දැකීමෙන් මට සිනා ගියේ ය" යි මෞද්ගල්‍යායන ස්ථවිරයන් වහන්සේ දන්වාලූ කල්හි බුදුරජාණන් වහන්සේ "මහණෙනි! මාගේ ශ්‍රාවකයෝ චක්ෂුර්භූතයහ, මෙබඳු දැකුම් දැකීමෙහි ඇස් ඇතිව සිටිත්, මම ද මේ ප්‍රේතයා එදා බෝමැඩ දී ම දිටිමි, ඒ වග මම එදා නො කීයෙමි මිනිසුන් නො අදහන බැවිනි, ඒ මා කියන්න නො පිළිගැනීම නො පිළිගන්නවුනට අහිතකර බැවින් ඔවුනට අනුකම්පායෙන් මම එදා එය නො කීමි, දැන් එහි සාක්කිකරු වශයෙන් මුගලන් තැන ඉදිරිපත් ව සිටුනා බැවින් මුගලන් කියන එ පුවත ඇත්තැ" යි වදාළ සේක. එහි දී භික්ෂූන් වහන්සේලා "ස්වාමීනි! ප්‍රේතයකු වන්නට ඔහු එදා කුමක් කෙළේ ද?" යි ඇසූ කල්හි "එසේ නම් මහණෙනි! එය මෙසේ දනිවූ" යි වදාරා ඔහු පෙර කළ කම් දක්වා වදාළ සේක.

"පෙර කසුප් බුදුරජුන් දවස ස්ථවිර දෙනමක් එක් ගමෙක විසූහ. ඒ දෙනමගෙන් එක් නමක් වයසින් සැට වයස් ඇත්තේ ය, එක් නමක් නවපණස් වස් ඇත්තේ ය, එකුන් සැට වස් ඇත්තේ අනෙකාගේ පා සිවුරු ගෙණ හෙරණකු මෙන් සියලු වත් පිළිවෙත් කරමින් කල් යැවී ය, මෙසේ එක් ම මවු කුස උපන් සොහොයුරන් සේ සමගියෙන් කල් ගෙවූ ඔවුන්

වසන තැනට බණදහම් කීමෙහි සමත් ස්ථවිර නමක් පැමිණි-යේ ය, ඔහු එතැනට පැමිණි දිනය මිනිසුන් රැස් ව බණ අසන දවසෙක් වී ය, එහි විසූ ස්ථවිර දෙනම ඔහුට සඬග්‍රහ කොට වත් දක්වා 'සත්පුරුෂයන් වහන්ස! අද අපට බණක් වදාරණු මැනැවැ' යි ආරාධනා කළහ, හෙතෙමේ එය පිළිගෙණ බණ දෙසී ය, ස්ථවිර දෙනම බණ අසා අපට ධර්මකථිකයෙක් ලැබිනැ යි සතුටු ව පසුදා ධර්මකථිකයාත් කැටු ව අසල් ගමට වැඩ සිඟා වළඳා කෙළවර 'ඇවැත්නි! ඊයේ බණ හමාර කළ තැන සිට සුලුවෙන් බණක් වදාරණු මැනැවැ' යි එ ගම මිනිසුනට ද බණ ඇස්සූහ, බණ ඇසූ මිනිස්සු බණට පැහැද පසුදාටත් ආරා-ධනා කළහ, මෙ පරිද්දෙන් ඒ ස්ථවිර දෙනම මෙසේ ධර්මකථික-යාත් කැටු ව අවට ගොදුරුගම්හි ද පිඩු පිණිස හැසුරුණාහ, මිනිසුනට බණ ද කියවූහ, ඒ අතර ධර්මකථික තෙමේ 'මේ දෙදෙන ම ඉතා මොළොක් ය, මා කෙරෙහි මිනිසුන්ගේ පැහැ-දීම ද ඇත, මෙහි කන්නට බොන්නට ද තිබේ, අපහසුවෙක් නැත, එහෙයින් මේ දෙදෙනා පන්නා හැර මෙ තැන අල්ලා ගන්නෙම්' යි සිතා එදා සවස වත් පිරිත් කියන වේලෙහි තෙරුන් පැමිණ වත් පිරිත් කියා ගියකල්හි මදක් එහි රැඳී සිට මහ තෙරුන් වෙතට ගොස් 'ස්වාමීනි! කියයුත්තෙක් ඇතැ' යි කියා 'කියන්නැ' යි කී කල්හි මදක් කල්පනා කොට 'ස්වාමීනි! මේවා කීම ඒ තරම් සුදුසු නැත, කතායෙහි බොහෝ වැරදි ඇතිවිය හැකි ය' යි කිසිත් නො කියා ම බැහැර ගියේ ය, අනික් තෙරුන් ළඟට ගොස් එසේ ම කියා කියන්නට සිතූ කතාව නො කියා ම ගියේ ය, පසුදාත් එසේ ම කෙළේ ය, තෙවන දිනයෙහි ඒ ස්ථවිර දෙනමට මොහුගේ මේ කතායෙන් මහත් කුහුලෙක් උපන, ධර්මකථික තෙමේ වැඩිමහල් තෙරුන් වෙතට ගොස් "ස්වාමීනි! දත්විය යුත්තෙක් ඇත, එහෙත් එය ඔබවහන්සේට දන්වා-ලන්නට කැමැත්තෙක් නැත, නො දන්වා සිටීමට ද නො හැකි ය, මෙය මා සිත තදින් පෙළා ලන්නේ ය' යි කියා යන්නට සූදා-නම්වන් ම ඒ මහලු තෙරුන් විසින් ඇවිටිලි කරණ ලදුයේ 'කිමෙක් ද ස්වාමීනි! කුඩා තෙරුන් වහන්සේ ඔබවහන්සේ හා සමෙහාග ඇත්තාහු ද?" යි ඇසී ය, 'සත්පුරුෂය! කුමක් නිසා මෙසේ අසා ද?' අපි එක් ම මවුකුස විසූ දෙදෙනකු වැනියම්හ, අප දෙදෙනා අතුරෙහි එකකු ලත් දෑය අනෙකා විසිනුදු ලැබූ දෑයෙක් ම විය, මා විසින් මෙතෙක් කල් මොහුගේ අගුණයෙක් නම් නො දක්නා ලද්දේය යි මහලු තෙරුන් කී විට 'ඒ එසේ ද?' යි ඇසී ය, 'ඔවු, කිසිදාකත් ඒ තෙරුන්ගේ අගුණයෙක් දක්නට නො ලැබිනැ, යි මහලු තෙරුන් නැවැතත් කී කල්හි ධර්මකථික

තෙමේ, 'ස්වාමීනි! ඒ බාල ස්ථවිර, මා මෙහි ආ දා සිට 'මේ මහලු තෙරුන් වහන්සේ ලජ්ජීයහ, ප්‍රියශීලයහ, ඔබ වහන්සේ කුලපුත්‍ර වහු ය, යි සිතා ඔහු හා එක් ව සම්භෝග කරතොත් සිහි නුවණින් යුතුව ම මනා පරීක්ෂායෙන් ම කරන්නැ' යි මට නිතර කියන්-නේ ය, එහෙයින් ඔහුගෙන් ගැහැටක් නො වනලෙසට වැඩ කරන්නට වග බලා ගැන්නැ' යි දන්වා සිටියේ ය, මහලු තෙරුන් වහන්සේ එ බස් අසා කරුණු නො විමසා දූඹිව කිපුනාහු පොලු පහරින් බිඳී යන කුලල් බඳුනක් සේ බාල තෙරුන් කෙරෙහි බිඳී ගියහ, මේ ධර්මකථිකයා, බාල තෙරුන් වෙතට ද ගොස් මෙසේ මැ කී ය, බාලතෙරුන් වහන්සේ ද එ බස් අසා මහලු තෙරුන් කෙ-රෙහි කිපී ගත්හ,

මෙ තෙක් මේ දෙදෙනා වහන්සේ අතර හෙදයෙක් නො වී ය, හැම එකක් එක් ව ම කළහ, ගමට පිඬු පිණිස ගියෝ ද, එක් ව ම ගියහ, වෙන් ව ගිය දවසෙක් නො වී ය, මෙදා සිට ඒ දෙන ම වෙන් වෙන් ව පිඬු සිඟා ගියහ, දවසක් බාල තෙරුන් වහන්සේ පිඬු සිඟා ගොස් පෙරාතු ව අවුත් උවැටන්හලෙහි සිටියහ, වැඩි මහලු තෙරුන් වහන්සේ පසු ව එහි ආහ, ඒ වේලෙහි බාලතෙරුන් වහන්සේ පිඩු සිඟා ගෙණ එන මහතෙරුන් දැක 'මම ඉදිරියට ගොස් මුන්වහන්සේගේ පා සිවුරු පිළිගණිම් දැ' යි සිතා 'නො පිළිගණිම්' යි අදහස් කළෝ ද වේවා, කමෙක් නැත, මම පෙර සේ මා විසින් කළයුතු වතාවත නො පිරිහෙලා කරන්-නෙමි, යි සිත මොළොක් කොට තෙරුන් කරා ගොස් 'ස්වාමීනි! පා සිවුරු දුන මැනැවැ' යි ඉල්ලා සිටියහ, එවිට මහතෙරුන් වහන්සේ 'නො හික්මුණු මහණ! තෝ මාගේ පා සිවුරු පිළි-ගැණිමට නො සුදුස්සෙහි, යා බැහැරැ' යි අසුරක් ගැසූහ, 'ඔවු, ස්වාමීනි! මමත් ඔබවහන්සේගේ පා සිවුරු පිළිගැණිමට තරම් නො වෙමි, පා සිවුරු නො ද පිළිගණිම් යි ද සිතුයෙමි, එසේ සිතා ද ටිකකින් නමුත් මට වැඩිමාලු නිසා ඒ අදහස් වෙනස් කොට මෙසේ පා සිවුරු ගන්නට ආයෙමි' යි බාලතෙරුන් කී කල්හි 'තෝ සිතුයෙහි, මේ වෙහෙරෙහි මාගේ ඇලිමෙක් ඇතැ? යි, මෙ තැන් සිට තා හා එක් ව විසීමෙක් නැතැ' යි මහලු තෙරුන් වහන්සේ දූඹි ව කියා සිටියහ, ඉක්බිති බාල තෙරුන් වහන්සේ 'ස්වාමීනි! මා මේ වෙහෙර අත්පත් කොට ගෙණ මෙහි රැඳී සිටිනු ඇතැ' යි ඔබවහන්සේගේ හැඟීම ය, මා සිත් තුළ එබඳු කැත කමෙක් නැත, මම පැවිදි වූයෙම් විහාර පන්සල් ගොඩ නගා ගෙණ දායකයන් බඳවා ගෙණ ගෝලබාලයන් හදා වඩා ගෙණ මිලමුදල් රැස් කරමින් පවුල් රකිමින් වෙළහෙළදම් කරමින් මහණකමට නො සරිලන සේ ජීවත්වීමට නො වෙමි, මෙත්නා

ඔබවහන්සේගේ වෙහෙර,' යි පා සිවුරු ගෙණ නික්ම ගියහ, මහා සථවිර තෙමේ ද ඒ වේලෙහි ම පා සිවුරු ගෙණ මගට බටහ, මෙසේ නික්ම යන ඒ දෙදෙන එක් මග නො ගොස් දෙමගකින් ගියහ, එක් නමක් පැසුළුදෙරින් ද එක් නමක් පැදුම්දෙරින් ද නික්ම ගත්හ, ධර්මකථික තෙමේ 'සවාමිනි! මෙසේ නො කරණු මැනැව, මෙසේ නො වඩිනු මැනැවැ' යි බොරුවට පැරුත්ත කරණුයේ 'අහක යව' යි ඒ දෙනම කී කල්හි ඒ වෙහෙර රැඳී ගත්තේ ය, පසුදා අසල දැයක ගමට පිඬු සිඟා ගිය ඔහුගෙන් එහි මිනිසුන් 'සවාමිනි! අපගේ අනික් සවාමීන් වහන්සේලා දෙනම කොයි දැ' යි විචාළ කල්හි 'උපාසකයෙනි! ඒ දෙනම උන් උන් කොලාහල කොට නො වඩිනු මැනැවැ' යි මා කියද්දීත් පා සිවුරු ටිකත් ඇරගෙණ පන්සල හැරදමා ගියහ' යි කී ය, ඔවුනතුරෙහි සිටි නුවණමඳ මිනිස්සු ධර්මකථියා කියූ තොරතුරු සැබවැ' යි පිළිගත්හ, නුවණැති මිනිස්සු 'අපි මෙතෙක් කල් උන්වහන්සේලා අතර කිසිත් අමනාපයක් කිසිත් වරදක් සිත් නො ගත් කිසිවක් නො දුටුවෙමු' මේ ධර්මකථිකයා නිසා ඒ දෙනමට යම්කිසි බියක් ගැහැටක් විය යුතු ය' යි සිතා දොම්නසට පැමිණියහ,

මෙසේ පන්සල හැරදමා ගිය උන්වහන්සේලා දෙනමගේ සිතට සැනසිල්ලෙක් නො වී ය, ගිය ගිය තැන ගැහැට විඳින්-නට සිදු විය, මෙසේ වෙන් වෙන් ව ගිය ඒ දෙනම අතුරෙහි වැඩි මහලු තෙර 'අනේ, මෝඩකමේ තරම, ඒ ඇසිල්ලෙහි දුටු ආගන්තුක මහණහුට මා හා සම්භෝග නො කරන්නැ'යි කියන ලද්දේ නො වේ දැ'යි නිතර නිතර සිතමින් කල් යැවී ය, බාල-තෙර ද සිහි කල්පනා නැති මේ මහලු තෙරුන් සිහි කල්පනා නැති කමේ තරම් පෙන්වමින් දුටු ඇසිල්ලක් ඇති ඒ අළුත් මහණහුට මා හා සම්භෝග නො කළ යුතු ය'යි මාගේ තරම් දැන දැනත් කීයේ නො වේ දැ'යි සිතන්නට වන, මෙසේ දවරු දෙක්හි සිත් තැවුලෙන් මිරිකුනු ඒ දෙනමට හැදූරීම් සිහිකිරීම් ඈ කිසිවෙක් නො වී ය, ඒ දෙදෙන පසු කාලයෙහි දවසෙක පැසුළු දිග එක් වෙහෙරකට ගියහ, එහි දී ඔවුනට වසන්නට එක් ම ආවාසයෙක් ලැබින, වැඩි මහලු තෙරුන් ගෙට ඇතුල් ව ඇඳෙහි වැතිර ගත් කල්හි අනික් සථවිර තෙමේ ද ගෙට ඇතුල් වී ය, එ වේලෙහි මහතෙර, ඒ තෙරුන් හැඳින හඬන්නට විය, බාල තෙර මහතෙරුන් ද හැඳින ගෙණ කියම් ද්‍යෝ නො කියම් ද්‍යෝ'යි සිතා 'අනුන් කියන බස් එක එල්ලේ නො ඇදහිය යුතු ය' යි වැඩිමහලු තෙරුන් වැඳ 'සවාමිනි! මම මෙ-තෙක් කල් ඔබවහන්සේගේ පා සිවුරු ගෙණ සනාතිකාවචරව හැසු-රුණෙමි, මෙතෙක් දවස් ඔබවහන්සේ මාගේ කයින් වචනයෙන් සිතින් කෙරුණු නො සරුප් වැඩක් දුටුවහු දැ?'යි ඇසී ය, 'නො

දුටුවෙමි'යි මහතෙර කී ය, එසේ නම් ධම්කපිකයාහට 'මේ උන්නාන්සේ සමග සම්භෝග නො කරන්නැ'යි කුමක් නිසා කීවහු දැ?'යි ඇසූ කල්හි 'මම එසේ නො කීමි, මටත් ඒ උන්නාන්සේ ඔය නම සමග සම්භෝග නො කරන්නැ යි කීහ'යි කී ය. ඒ දෙනම එ වේලෙහි ම 'අප දෙනම බිඳහරිණු කැමැති ව මේ මහණහු විසින් මෙසේ කියන ලද්දැ'යි දැන උනුත් වරද දෙසා ගත්හ, අවුරුදු බොහෝ ගණනක් අස්වැසිලි නො ලැබූ ඒ දෙන ම එ දවස සමගි ව ධම්කපිකයා විහාරයෙන් නෙරපනු පිණිස විහාරයට පෙරළා ගියහ, එ වේලෙහි එහි හුන් ධම්කපිකයා තෙරුන් දැක පා සිවුරු පිළිගන්නට ඉදිරියට ගියේ ය, එකල්හි ඒ තෙරවරු 'තෝ මේ වෙහෙර වසන්නට නො සුදුස්සෙහි'යි වැරෙන් කීහ. ධම්කපික එහි රැ දෙන්නට නො හැකිව එ තැනින් බැහැර ගියේ ය, අවුරුදු විසිදහසක් පිරූ මහණදම, ඔහු අපායයෙහි නො හෙළා රඳවා ගන්නට අපොහොසත් වී ය, ආයු කෙළවර කළුරිය කොට අවීචියෙහි උපන්නේ එහි එක් බුද්ධාන්තරයක් පැසී දැන් ගිජ්ඣකූට පර්වත ප්‍රාන්තයෙහි ප්‍රෙතයෙක් ව ඉපද දුක් විඳී ය''යි මෙසේ බුදුරජානන් වහන්සේ ඔහු පෙර කළ කම් ගෙණ හැර දක්වා ''මහණහු විසින් නම් විශෙෂයෙන් කය වචන සිත යන තුන් දොරින් සිදුවන හැම පව් ම හැර පියා සත්හුන් වියයුතු ය''යි වදාරා මේ ධර්මදෙශනාව කළ සේක.

**වාචානුරක්ඛී මනසා සුසංවුතො**
**කායෙන ච අකුසලං න කයිරා,**
**එතෙ තයො කම්මපථෙ විසොධයෙ**
**ආරාධයෙ මග්ගං ඉසිප්පවෙදිතන්ති.**

(යමෙක්) තමා වචසින් රක්නා සුලු වේ ද, මනසින් මොනවට හැවුරුණේ වේ ද, කයිනුත් අකුසල් නො කරන්නේ ද, මේ ත්‍රිවිධ කර්මපථය පිරිසිදු කරන්නේ ද, හෙතෙමේ ඍෂින් විසින් ප්‍රකාශ කරණ ලද ආර්‍යමාර්ගය සිද්ධ කරන්නේ ය.

**වාචානුරක්ඛී** = තමා වචසින් රක්නාසුලු වේ ද.

මුසාවාද - පිසුණවචන-ඵරුසවචන-සම්ඵප්පලාප යන චතුර්විධ වාග්දුශ්චරිතය නො කොට හැරීමෙන් යමෙක් පිරිසිදුව සිටියේ නම් වාග්ද්වාරයෙන් කෙරෙණ මේ පව්කම්වලින් වැළකී සිටියේ නම්, හේ **වාචානුරක්ඛී** ය[1] **චෙතිය - තක්කාරි - වණ්ණාරොහ - සඞ්ඛභෙද** ජාතකාදිය බැලිය යුතුය.

**මනසා සුසංවුතො** = මනසින් මොනවට හැවුරුණේ වේ ද.

1. 1. 10. 'පාපකාරී' යනු බලනු.

අභිජ්ඣා-ව්‍යාපාද-මිච්ඡාදිට්ඨි යන ත්‍රිවිධ මනො දුශ්චරිතයෙන් වැළකුණේ **මනසා සුසංවුත** ය[1] **සුවණ්ණහංස - මහාවාණිජ - එකපණ්ණක - තිලමුට්ඨි** ජාතකාදිය බැලිය යුතු ය.

**කායෙන ච අකුසලං න කයිරා** = කයින් ද අකුසල් නො කරන්-නේ ය.

ප්‍රාණඝාත - අදත්තාදාන - කාමමිථ්‍යාචාර යන ත්‍රිවිධ කාය දුශ්චරිතය නො කොට හැරීමෙන් එයින් වැළකුනේ කයින් අකුසල් නො කරණුයේ ය[2]. **මතකභත්ත - සීලවීමංස - ලොහකුම්භි - මහානාරදකස්සප** ජාතකාදිය බැලිය යුතුය.

**එතෙ තයො කම්මපථෙ විසොධයෙ** = මේ ත්‍රිවිධකර්මපථය පිරිසිදු කරන්නේ ද.

මෙහි **කර්මපථ** නම්:- මෙ කියූ දශවිධ අකුශලකර්ම කරන්නහුගේ හෝ එයින් වළකින්නහුගේ සිත්හි ඒ ඒ අවස්ථායෙහි කළ කර්මයට අනුරූප ව උපදනා චෙතනා ය. මේ චෙතනා ම කර්ම නම් ද වේ. දුක් විසින් විපාක දෙන්නී අකුසල් විසින් නැගුනු චෙතනා ය. සැප විසින් විපාක දෙන්නී කුසල් විසින් නැගුනු චෙතනා ය. මෙසේ අකුසල් වශයෙන් නැගිය හැකි කර්ම නො කොට සිටියේ ම එකී කර්මයන්ගෙන් වැළකී සිටියේ ම කර්මපථ පිරිසිදු කරන්නෝ ය'යි වදාළ සේක. කායාදී වූ ත්‍රිද්වාර රැක ගන්නේ ය මෙ තෙමේ. ඉදිරියෙහි ලැබිය යුතු වූ විශෙෂාධිගමයට පැමිණෙන්නේ ද මෙ තෙමේ ය.

**ආරාධයෙ මග්ගං ඉසිප්පවෙදිතං ඉති** = ඍෂීන් විසින් ප්‍රකාශ කරණ ලද ආර්‍ය්‍යමාර්ගය සිද්ධ කරන්නේ ය.

මෙහි **මග්ග** යනු ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගිකමාර්ගය සඳහා යෙදුනේ ය.[3] ආර්‍ය්‍යඅෂ්ටාඞ්ගිකමාර්ගය දෙශනා කිරීමෙහි සමත් වූවෝ ඍෂීහු ම ය. ඒ දෙසීමෙහි අනෙකෙක් සමර්ථ නො වේ. මෙහිලා ගැණෙන **ඍෂීහු** නම්: **"සීලාදිගුණෙ එසන්ති වා, සිවං, ඉච්ඡන්ති = ඉසි"** යි කියූ බැවින් ශීල - සමාධි - ප්‍රඥා - විමුක්ති - විමුක්තිඥානදර්ශන යන පඤ්චවිධ ධර්මස්කන්ධයන් එෂණය කළ බැවින් පුරුදු කළ බැවින් බුදු - පසේබුදු - මහරහතුන් වහන්සේලා ය.

පරවාදයෙහි 'යමෙක් සියලු වෙදමන්ත්‍රයන් දනී නම් හෝ සංසාරයෙහි පරතෙර නුවණින් දකී නම් හෝ හේ 'ඍෂි' යි කියන ලද්දේ ය. මෙ එය කියූ සැටි: **"ඍෂති ප්‍රාපෙනොති සර්වාන් මන්ත්‍රාන් ඥානෙන සංසාරපාරං වාති = ඍෂිඃ"** යි.

1. 1. 10. 'පාපකාරී' යනු බලනු.
2. ,, ,, ,, ,, ,,
3. 14 6. 'අරියංචට්ඨඞ්ගිකං මග්ගං' යනු බලනු.

"සප්ත බ්‍රහ්මර්ෂි දෙවර්ෂි මහර්ෂි පරමර්ෂයඃ,
කාණ්ඩවර්ෂිශ්ච ශ්‍රැතර්ෂිශ්ච රාජර්ෂිශ්ච ක්‍රමාවරාඃ"

යනු රත්නකොෂයෙහි ආයේ ය. **ව්‍යාසාදීහු** මහර්ෂිහු ය. **භෙලාදීහු** පරමර්ෂිහු ය. **කණ්වාදීහු** දෙවර්ෂිහු ය. **වසිෂ්ඨාදීහු** බ්‍රහ්මර්ෂිහු ය. **සුශ්‍රැතාදීහු** ශ්‍රැතර්ෂිහු ය. **ඍතුපර්ණාදීහු** රාජර්ෂිහු ය. **ජෛමිනී** ආදීහු කාණ්ඩවර්ෂිහු ය. මේ ඍෂීන් පිළිබඳ විවිධමත පරවාදයෙහි දක්නට ලැබේ. මෙහිලා ඒ දැක්විය නො හැකි ය. පරවාදයෙහි දැක්වෙන මේ ඍෂීන්ට, ශාසනික ඍෂීන්ට ගොදුරු වන ආර්‍ය්‍ය මාර්ගය ගොදුරු නො වේ. ආර්‍ය්‍යමාර්ගය ගොදුරු වනුයේ බුද්ධාදී වූ ශාසනික ඍෂීන්ට ම ය.

ධර්මදෙශනාවගේ අවසානයෙහි බොහෝ දෙන සෝවත්පලාදියට පැමිණියාහු ය.

**සූකරප්‍රේතවස්තුව නිමි.**

# පොඨිල ස්ථවිරයන් වහන්සේ

## 20 — 7

**පොඨිල** ස්ථවිරයන් වහන්සේ පිළිවෙළින් විදර්ශී ආදී වූ බුදුරජුන් සත් දෙනකුන් වහන්සේගේ සසුන්හි පිළිවෙළින් පැවිදි ව තෙවලාදර ව පන් සියයක් දෙනා වහන්සේට දහම් කියවූහ. අප බුදුරජුන් දවස උන්වහන්සේ එක් දවසක් "මේ මහණහුට අත්හට පිහිට වීමෙහි අදහසක් මුත් තමන්ට පිහිටක් කර ගැණිමෙහි සිතුවිල්ලෙක් නැත්තේ ය, එහෙයින් මොහු සංවේගයට පමුණුවන්නෙමි" යි සිතා පොඨිල තෙරුන්, තමන් වහන්සේට උපස්ථානයට පැමිණි කල්හි "තුච්ඡ පොඨිල! එව, තුච්ඡ පොඨිල! වඳුව තුච්ඡ පොඨිල! හිඳුව, තුච්ඡ පොඨිල! යව" යි වදාරණ සේක. ඔහු එතැනින් නැගී ගිය කල්හිත් "තුච්ඡ පොඨිල ගියේ ය" යි වදාරණ සේක.

එකල්හි පොඨිල ස්ථවිර තෙමේ "මම අට්ඨකථා සහිත ත්‍රිපිටක ධර්මය දරන්නෙක්මි, භික්ෂූන් පන් සියයක් අටලොස් වගක් කොට ඔවුනට තෙවලා දහම් කියවමි, එහෙත් බුදුරජානන් වහන්සේ මට නිතර තුච්ඡ පොඨිල, තුච්ඡ පොඨිල, යි වදාරණ සේක, මා ලැබූ ධ්‍යානාදිගුණවිශෙෂයක් නොමැති බැවින් උන්වහන්සේ මා මෙසේ අමතන සේක් වනැ" යි උපන් සංවේග ඇතියේ "මම දූන් වන වැද මහණදම් කරන්නෙමි" යි තෙමේ මකාටත් නො දන්වා පාසිවුරු පිළියෙල කොට ගෙණ ඉතා අලුයම සියල්ලනට පසුව බණ උගෙණ යන මහණහු හා කැටුව එතැනින් නික්ම ගියේ ය. පිරිවෙණෙහි හිඳ බණ දහම් හදාරණ මහණෝත් ඔහු ඇදුරු ය යි නො සැලකූහ. පොඨිල ස්ථවිර තෙමේ ද වනසෙනසුනෙක වසන භික්ෂූන් තිස් දෙනකුන් වෙත එළඹ සඞ්ඝස්ථවිරයන් වහන්සේ වැඳ "ස්වාමීනි! මට පිහිටවනු මැනැවැ" යි කියා සිටියේ ය. "ඇවැත්නි! ඔබවහන්සේ තෙවලාදරයහු, ධර්මකථික වහු, අප ද ඔබවහන්සේගේ ඇසුරෙන් යම් කිසිවක් දතයුතුව ඇත, කුමක් නිසා මෙසේ කියහු ද" යි උන්වහන්සේ ඇසූ කල්හි "ස්වාමීනි! එසේ නො කියනු මැනැවැ" යි නැවැතත් දන්වා සිටියේ ය. මේ වන සෙනසුනෙහි වුසූ හැම දෙනා වහන්සේ රහතුන් වහන්සේ ය.

එකල්හි එහි විසූ මහතෙරුන් වහන්සේ "මෙ තෙමේ ආගම ධර්මය උගත් නිසා හට ගත් අභිමාන ඇතැ" යි දැන ඔහු දෙවන මහතෙරුන් වෙත යැවූහ. පොඨිල ස්ථවිර තෙමේ ඒ තෙරුන් වෙත ද ගොස් මහතෙරුන් ළඟ කියූ සේ කී ය. දෙවන මහ

තෙරුන් වහන්සේ ද පොඨිල තෙරුන්, තෙවන තෙරුන් වෙත යැවූහ. එහිදී ද එසේ ම කී ය. මෙ ලෙසින් හැම දෙනා වහන්සේ වෙත යැවූ පොඨිල තෙරුන් කෙළවර හැමට බාලව සිටි සත් හැවිරිදි හෙරණහු වෙත ද යැවූහ. මෙසේ හැම දෙනා වෙත ගිය පොඨිල තෙරුන්ගේ අභිමානය පහව ගියේ ය. පහව ගිය මත් ඇති ඔහු හෙරණුන් වෙත ඇඳිලි බැඳ "සත්පුරුෂය! මට පිහිට වන්නැ" යි කී කල්හි "ඈයි, ඇදුරුතුමනි! මේ කුමක් කියහු? ඔබවහන්සේ මහලු වූවහු බොහෝ ඇසූ පිරූ තැන් ඇතියහු ය, අප විසිතුදු යමක් කමක් උගත යුත්තේ ඔබවහන්සේගේ ඇසුරෙනැ" යි කියේ ය. එවිට පොඨිල "සත්පුරුෂය! මා බැහැර නො කොට මට පිහිට වන්නැ" යි ඉල්ලා සිටියේ ය. "ස්වාමීනි! හොඳ යි, ඔබවහන්සේ මාගේ අවවාදයට නැමී කීකරු වන්නාහු නම් මම ඔබවහන්සේට පිහිට වන්නෙමි" යි හෙරණ තෙමේ කී ය. එවිට පොඨිල "සත්පුරුෂය! මට ගින්නට පනින්නට කියා නම් මම ගින්නට පනින්නෙමි, මූදට පනින්නට කියා නම් මුදට ද පනින්නෙමි, කියන හැම එකක් ඒ කියන හැටියට කරන්නෙමි, මට පිහිට වන්නැ" යි කී ය. එවිට හෙරණ තෙමේ අසල තුබූ විලක් පෙන්වා "ස්වාමීනි! හැඳි පෙර වූ සිවුරු ඇති ව අර විලට බසින්නැ" යි කී ය. මාහැඟි දෙපට සිවුරක් හැඳ පෙරවූ බව දැනත් හෙරණහු විසින් මෙසේ කියන ලද්දේ පොඨිල අවවාදයට නැමුරු ද කීකරු ද යි විමසනු සඳහා ය. ස්ථවිර තෙමේ ද කියූ ඇසිල්ලෙහි ම දියට බටුයේ ය. සිවුරු කොන් තෙමුණු කෙණෙහි ම "ස්වාමීනි! ගොඩ නගින්නැ" යි හෙරණුන් කියත් ම විලෙන් නැගී අවුත් ඉදිරියෙහි සිට ගත්තේ ය. ඉක්බිති ඔහුට "ස්වාමීනි! තුඹසෙක සිදුරු සයෙක් ඇත්තේ ය, එහි එක් සිදුරකින් ගොයෙක් තුඹසට වැදුනේ ය, ඇතුළට වැදුනු ඒ ගොයා අල්වා ගණු කැමැත්තේ, සවන සිදුර හැර අන් සිදුරු පස වසා ඇතුල් වූ ඒ සිදුරෙන් ම ගොයා අල්වා ඇද ගන්නේ ය, එපරිද්දෙන් ඔබවහන්සේ ද රූ ඈ අරමුණු වැද ගන්නා ඇස් - කන් - නාස් ඈ දොරටු සයෙන් මන්දොර හැර අන් දොරටු පස වසා පියා මන්දොරෙහි කටයුතු පටන් ගන්නැ" යි හෙරණුන් මෙසේ මග පෙන් වූ කල්හි ඇසූ පිරූ තැන් ඇති ඒ මහණහුට ඒ භාවනා විධිය මෙ පමණකින් ම පහන් දැල්වීමක් වැනි විය. පොඨිල ස්ථවිර තෙමේ "සත්පුරුෂය! මේ පමණැ" යි කියා කරජකයෙහි නුවණ බහා මහණදම් කරන්නට පටන් ගත්තේ ය. විසි යොත්නකින් ඈත්හි වැඩ විසූ බුදුරජානන් වහන්සේ පොඨිල තෙරුන් බලා "මේ මහණ යම් සේ මහානුවණැතියේ ද එ පරිද්දෙන් ම මොහු

ලවා ම මොහුට පිහිටක් කරවාලන්නට වටී ය” යි සිතා වදුරා ඔහු හා කතා කරන්නහු සේ ආලෝකයක් විහිදුවා මේ ධර්ම දෙශනාව කළ සේක.

**යොගා වෙ ජායතී භූරි අයොගා භූරිසඞ්ඛයො,**
**එතං ද්වෙධාපථං ඤත්වා භවාය විභවාය ච,**
**තථාත්තානං නිවෙසෙය්‍ය යථා භූරි පවඩ්ඪතීති.**

යෙදීමෙන් එකාන්තයෙන් නුවණ උපදී. නො යෙදීමෙන් ප්‍රඥාවගේ විනාශය වේ. වැඩ පිණිසත් අවැඩ පිණිසත් පවත්නා මේ දෙවග දැන යම් සේ ප්‍රඥාව වැඩේ නම් එසේ තමා පිහිටුවා වන්නේ ය.

**යොගා වෙ ජායතී භූරි** = යෙදීමෙන් එකාන්තයෙන් නුවණ උපදී.

කොතැනක යෙදීමෙන් නුවණ උපදී දැ? යි ප්‍රශ්නයෙක් නැගී ඒ නම්, එයට පිළිතුරු වනුයේ අටතිස් අරමුණෙහි යොග කිරීමෙන් නුවණ උපදී යනු යි. මෙහි දෙවන තරඟයෙහි **‘ඣායිනො’** යන්නෙහි ලා අටතිස් අරමුණු නම් පමණින් කියන ලද්දේ ය. ඒ කියූ අටතිස් අරමුණෙන් යමක් අරමුණු කොට නුවණ යොදා ඒ නුවණ යෙදූ අරමුණෙහි සිත දියුණු කිරීමෙන් එකාන්ත විසින් ලොවී ලොවුතුරු නුවණ උපදනේ ය. එ නුවණ පොළොව මෙන් පළල් ව සිටියේ ය. **‘භූරි’** යනු යෙදුනේ ඒ කියනු සඳහා ය.

**භූරි** නම්: ප්‍රඥා ය. **‘භූරිපඤ්ඤො’** යන මෙහි **‘පඤ්ඤො’** යනු ලොප් වීමෙන් තදර්ථය ගෙණ ‘භූරි’ යනු ඉතිරි විය. **“භූරි වුච්චති පඨවී, තාය පඨවිසමාය විත්ථතාය පඤ්ඤාය ච භූරීති වුච්චති”** යන මෙයින් එය ව්‍යක්ත වේ. එසේ ම ඇති අරුත්හි ඇලෙන බැවිනුදු ප්‍රඥා ව භූරි නම්. **“භූතෙ අත්ථෙ රමතීති = භූරි”** යනු අටුවා.

**අයොගා භූරිසඞ්ඛයො** = නො යෙදීමෙන් නුවණෙහි නැසීම වේ.

පඨවිකසිණාදී වූ අටතිස් අරමුණෙන් එක්තරා අරමුණක් තම චරිතයට අනුකූල ව ගෙණ එහි යොග නො කිරීමෙන් සිත නො වැඩීමෙන් ලොවී ලොවුතුරු නුවණ වැනසෙන්නේ ය. ලෞකික - ලොකොත්තර විසින් නුවණ නො වැඩුයේ එ ලොවින් හා මෙ ලොවින් පිරිහෙන්නේ ය. ලොවී ලොවුතුරු අරුත් සිදුකර ගැණීමෙහි ප්‍රබල හසනය වනුයේ ප්‍රඥයෙන් ඔදවැඩි වූ වීර්‍ය්‍යය යි පැරණි-යන් කියේ එහෙයිනි, **“පඤ්ඤානුයාතං විරියං වදන්ති සබ්බත්ථ සිද්ධිග්ගහණග්ගහත්ථං”** යනු. ආප්ත විසින් මෙය දත යුතු ය.

**එතං ද්වෙධාපථං ඤත්වා භවාය විභවාය ච** = වැඩීමට හා නො වැඩීමට මේ දෙමඟ දැන.

අටතිස් අරමුණු බැවුම්හි යෙදීම, වැඞීම පිණිස වන්නේ ය. අටතිස් අරමුණු බැවුම්හි නො යෙදීම, නො වැඞීම පිණිස වන්නේ ය. එහෙයින් මේ යෙදීම් නො යෙදීම් දෙ මග මැනැවින් දැන වැඩෙන මගෙහි යෙදිය යුතු ය.

**තථා අත්තානං නිවෙසෙය්‍ය යථා භූරි පවඩ්ඪති ඉති** = යම්සේ නුවණ වැඩේ නම් එසේ තමා පිහිටු වන්නේ ය.

මේ කියූ යෙදීම් නො යෙදීම් දෙ මග දැන වියත්වත් පුද්ගල තෙමේ තමාගේ සිත ලොවී ලොවුතුරු නුවණ වැඩෙන පරිද්දෙන් කමටහන්හි පිහිටු වන්නේ ය. යොනිසොමනසිකාරයෙහි යොදන්-නේ ය. අටතිස් අරමුණෙන් එකෙක තම සිත පිහිටුවා නුවණ යොදා භාවනා කළ යුතු ය.

ධර්මදෙශනාවගේ අවසානයෙහි පොඨිල ස්ථවිර තෙමේ රහත් බැව්හි පිහිටයේ ය.

**පොඨිලස්ථවිරවස්තුව නිමි.**

# මහලු තෙරුන් පන් සියයක්

## 20 — 8

මේ පන් සියයක් පමණ වූ මහලු සථවිරවරු ගිහි කල්හි සැවැත් නුවර ධනධාන්‍යයෙන් ආඪ්‍ය ව මහත් ධන ඇති ව මහත් භොග ඇති ව වාසය කළ කෙළෙඹියෝ වූහ. එදුත් ඔවුහු උනුන් යහළු ව එක් ව ම පින් කළාහු ය. දවසක් ඔවුහු බුදුරජුන් වෙත ගොස් බණ අසා "අපි දුන් මහල්ලම්හ, එහෙයින් ගිහි කම්කටුල්ලෙන් ඇති කාරිය කිමැ"යි කතා බස් කොට දෙව්රමට ගොස් පැවිද්ද ඉල්ලා සිටියහ. බුදුරජාණන් වහන්සේ ඔවුන් පැවිදි කරවූ හ. මහලු වයසට ගොස් පැවිදි වූ මොවුහු මහලු බැවින් තෙවළා දහම් උගැන්මෙහි අපොහොසත් වූවෝ වෙහෙර කෙළවර පන්සලක් කරවා ගෙණ එහි එක් ව විසූහ. පිඬු සිඟා යන්නාහු බොහෝ සෙයින් පැරණි අඹුදරුවන්ගේ ගෙවලට ම යෙති. සිඟා ගත් දැය එහිදී ම වළඳති. ඔවුනතුරෙහි එකක්හුගේ පෙරඹු මිහිරට කෑම් බීම් පිළියෙල කිරීමෙහි සමත් වූවා **මධුරපාචිකා** නම් වූ ය. ඕ තොමෝ ඒ සියලු දෙනාහට උපකාර ව සිටියා ය. සියල්ලෝ ම තම තමන් සිඟා ලද ආහාර පාන ගෙණ ගොස් ඇයගේ ගෙයි හිඳ වළඳන්නාහ. ඕ ද ගෙයි තුබූ සැටියෙන් ඔවුනට බත් මාලු සපයා දෙන්නී ය. මේ අතර දවසෙක ඕතොමෝ එක්තරා රොගයකින් කලුරිය කළා ය.

එ කල්හි ඒ මහලු තෙරුන්නාන්සේලා තම යහළු තෙරුන් ගේ පන්සලෙහි රැස් වී උනුන් ගෙල අත් ලා ගෙණ මධුරපාචිකා උපාසිකා ව මළා ය"යි විලාප කියමින් හඬන්නට වූහ. අසල වෙහෙර විසූ භික්ෂූන් වහන්සේලා හැඬීම අසා වට පිට සිට දුවැවිත් "ඇවැත්නි! හඬන්නෝ කුමක් නිසා දැ?"යි ඇසූහ. "සවාමීනි! අපගේ යහළු තෙරුන් ගේ පැරණි අඹු, කළුරිය කළා ය, ඈ අපට බොහෝ උපකාරව සිටියා ය, කෑම් බීම් රසට මිහිරට උයන්නට පිළියෙල කරන්නට හොඳ හපන් කමක් ඇයට තුබුනේ ය, දැන් කොතැනින් තමන් කැමැති සේ කටට මිහිරි කැවිල්ලක් පෙවිල්ලක් ලබා ගෙණ වළඳන්නෙමු දැයි සිතෙන විට නො දැන ම හැඬේ ය"යි කීහ. එය ඇසූ භික්ෂූන් වහන්සේලා ධම්සභා රැස්වීමෙහි දී මේ කතාව ඉපද වූහ. ඒ අතර බුදුරජනන් වහන්සේ එහි වැඩම කොට "තමුසේලා කුමක් ගැණ කතා බස් කරමින් කල් ගෙවන්නහු දැ?"යි අසා තොරතුරු දැන "මහණෙනි! මොවුහු දැන් පමණක් ම මැය ගැණ විලාප කියා හඬන්නෝ නො වෙත්, පෙරත් එක් කලෙක

මොවුහු කපුටුයොන්හි ඉපද මුදුබඩ හැසිරෙන්නාහු මුදු රළලට හසු වී මුහුදෙහි වැටී මළ කැවිඩියක නිසා හඬමින් වැලපෙමින් කැවිඩිය බේරා ගණුම්හ යි මුදු දිය ඉසින්නෝ වෙහෙසට පත්වූහ''යි

> ''අප අයත් දෙහනු – සත්හුන් ය මුව වියලේ,
> නිමා නො ම වතු දූ– පිරේ සිඳු දිය අදිමු''

යි කාක ජාතකය විස්තර විසින් වදාරා ඒ මහලු මහණුන් අමතා ''මහණෙනි! රාග ද්වෙෂමොහ වනය සිඳලන්නට වටනේ ය, එසේ සිඳ හළ කල්හි තමූසේලා නිදුක් වන්නහු ය''යි වදාරා මේ ධර්ම- දෙශනාව කළ සේක.

> **වනං ඡින්‍දථ මා රුක්ඛං වනතො ජායතෙ භයං,**
> **ඡෙත්‍වා වනං ච වනථං ච නිබ්බනා හොථ භික්ඛවො.**
>
> **යාවං හි වනථො න ඡිජ්ජති අණුමත්තොපි නරස්ස නාරිසු,**
> **පටිබද්ධමනොව තාව සො වච්ඡො ඛීරපකොව මාතරීති.**

මහණෙනි! කෙලෙස්වනය සිඳ හරිවූ. රුක් නො සිඳිවූ. කෙලෙස් වනයෙන් බිය උපදී. මහකෙලෙස්වනය ද මඳ කෙලෙස්වනය ද රහත් මග නැණ සැතින් සිඳ හැර වනරහිතයෝ වවූ.

සත්‍රීන් කෙරෙහි පුරුෂයාගේ ස්වල්පමාත්‍ර වූ ද තෘෂ්ණායෙක් යම්- තාක් කල් නො සිඳී පවතී ද, ඒ තාක් ම හෙතෙමේ මව කෙරෙහි ප්‍රෙමයෙන් ඇලීමෙන් කිරි බොන ලමා වස්සකු මෙන් සත්‍රීන් කෙරෙහි පිළිබඳ සිත් ඇත්තේ ම වේ.

**වනං ඡින්‍දථ** = කෙලෙස්වනය සිඳ හරිවූ.

බුදුරජානන් වහන්සේ ''**වනං ඡින්‍දථ** = වනය සිඳ හරිවූ''යි වදාළ කල්හි පැවිදි වී නො බෝ කල් ඇති ඒ මහණුන්ට ''බුදුරජා- නන් වහන්සේ අප ලවා වෑ–පොරෝ ආදියෙන් ගස් වැල් සිඳ හරවා ලන්නට කැමැති සේකැ''යි ගස් වැල් සිඳ දැමීමෙහි කැමැත්තෙක් උපන්නේ ය. එකල්හි බුදුරජානන් වහන්සේ ''**මා රුක්ඛං** = ගස් වැල් නො සිඳිවූ''යි වදාරා ඒ මහණුන් ගස් වැල් කැපීමෙන් වළකාලූ සේක.

**වන** නම්: මහරුක් ය. පළමු උපන් රුක් හෝ **වන** නම. ''**වනකෘවාති එකථ මහන්තානං රුක්ඛානං වනං නාම, පුබ්බුප්පත්තිකානං රුක්ඛානං වා වනං නාමං**'' යනු අටුවා. **වන** යනු නැගී සිටියේ මහ රුක්ගොමුයෙහි ය. පළමු උපන් රුක්ගොමුව හෝ එයින් ගැණේ. එහෙන් **වන** ශබ්දයෙන් මෙහි ගැණෙනුයේ කෙලෙස් ය. මහ ගස්

කොළන්, වනැ යි කියන්නා සේ භවයෙහි ප්‍රතිසන්ධිය දෙන මහත් වූ කෙලෙස්, වන නම්. පළමු උපන් ගස් කොළන් හෝ වනැ යි කියන්නා සේ පළමු ව උපන් කෙලෙස් හෝ වන නම්. **"එව මෙව මහන්තා මහන්තා භවාකඩ්ඪනකා කිලෙසා වනං නාම, පුබ්බුප්පත්තිකා වා වනං නාම"** යනු අටුවා. එහෙයින් භවයෙහි ප්‍රතිසන්ධිය දෙන රාගද්වේෂමෝහාදී වූ කෙලෙස් හෝ පළමු උපන් කෙලෙස් සිඳ හරි වූ"යි දක්වන්නටය 'වනය සිඳ හරිවූ' යි වදාළෝ.

**මා රුක්ඛං** = රුක් නො සිඳිවූ.

මෙයින් අළුත පැවිදි වූ මහණුන්ට ගස් වැල් කපා හෙලීමෙහි උපන් කැමැත්ත වළකාලූ සේක.

**වනතො ජායතෙ භයං** = කෙලෙස්වනයෙන් බිය උපදී.

මහවනලැහැබ්හි වසන සිංහව්‍යාඝ්‍රාදිචණ්ඩ සත්ත්වයන්ගෙන් බිය උපදනා සේ රාගද්වේෂමෝහාදී වූ කෙලෙස් වනයෙන් ජාති-ජරා-මරණාදී වූ බිය උපදනේ ය. වන වැදුනහුට මුත් වන නො වැදුනහුට වන වැසි සතුන්ගෙන් බියෙක් නො වන්නේ ය. වන්නේ නම් වන වැදුනු අවස්ථායෙක ම වන්නේ ය. එහෙත් කෙලෙස්වනයෙන් උපදනා ජාති-ජරා මරණාදී වූ බිය ලෝ වැසි දිව්‍ය බ්‍රහ්මාදී වූ කෙලෙස් නො නැසූ හැම කෙනෙක්හට ම දව රෑ දෙක්හි අතර නො තබා ම උපදනේ ය. මේ බියෙන් තැති නො ගත් එක ද සත්ත්වයෙක් ලොව නැත්තේ ය. හැම එකෙක් මේ බියෙන් මැඩී සිටුනේ ය. **"සබ්බෙ භායන්ති මච්චුනො"** යනු වදාළෝ ද එහෙයිනි. එහි පරිකථාව බලනු.

**ඡෙත්වා වනං ච වනථං ච නිබ්බනා හොථ භික්ඛවෙ** = මහණෙනි! මහ කෙලෙස්වනය ද මද කෙලෙස්වනය ද සිඳහැර වන රහිතයෝ වවූ.

**වන** යන්නෙන් මහරුක්, පසු උපන් රුක්, මහකෙලෙස්, පළමු උපන් කෙලෙස් ගැණෙන්නා සේ, **වනථ** යන්නෙන් කුඩාරුක්, පසු උපන් රුක්, පැවැත්මෙහි විපාක දෙන කෙලෙස්, පසු පසු උපන් කෙලෙස් ගණු ලැබෙත්. මේ **'වනථ'** යනු අටුවා කළ සැටි:- **"වනථස්සවාති ඛුද්දකා රුක්ඛා වනථා නාම, අපරාපරුප්පත්තිකා වනථා නාම, එවමෙව පවත්තියං විපාකදායකා වනථා නාම, අපරාපරුප්පත්තිකා වනථා නාම"**යි.

ඡෙත්වා යන මෙයින් කියැවෙනුයේ සිඳ හැරීම ය. වන-වනථ දෙකින් කියන කෙලෙස් මුලමනින් සිඳ හැරිය යුත්තේ සිවුවන

මග නැණින් ය. එහි විස්තර මෙහි චතුර්දශ තරඞ්ගයෙහි සවන කතා පුවතෙහි එන **“දුක්ඛස්ස ච අතික්කමං”** යන්නට ලියූ පරිකථායෙහි එන්නේ ය.

**“නිබ්බුතා හොථ භික්ඛවෝ”** යන සිවුවන පාදයෙන් “මහණෙනි! තමුසේලා වන – වනථ නම් වූ කුදු – මහත් සියලු කෙලෙස්, රහත් මග නැණින් කපා සිඳ හැර කෙලෙස් රහිත වහු”යි වදාළ සේක.

**භික්ඛවෝ,** යනු මෙහි ආමන්ත්‍රණය පිණිස යෙදුනේ ය. බුදුරජුන් භික්ෂූන්ට ඇමතීමෙහි දී **‘භික්ඛවෝ’** යන මෙ පදය ගාථාවන්හි අසන්ධි විෂයයෙහි පමණක් යෙදී සිටියේ ය යි ද, ගද්‍යවාක්‍ය යන්හි සන්ධිවිෂයයෙහි ම යෙදුනේ ය යි ද ශබ්දනීතියෙහි කියන ලද්දේ ය. **“අරඤ්ඤෙ රුක්ඛමූලෙ වා සුඤ්ඤාගාරෙව භික්ඛවෝ”** යනු හා **“තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි භික්ඛවොති”** යනු හා නිදර්ශන විසින් එහි දක්වුනේ ය. තවද ශ්‍රාවකයන් භික්ෂූන් ඇමතීම සඳහා ‘භික්ඛවෝ’ යනු නො යෙදූ බව ද එහි ම කියන ලදී. විමසා ගත යුතු. **“භික්ඛවෙ, භික්ඛවෝ”** යන දෙ පදයෙහි යෙදුම් ගැණ එහි එන විස්තරය කියවා බැලිය යුතුය.

**යාවං හි වනථො න ඡිජ්ජති අණුමත්තොපි නරස්ස නාරිසු** = සත්‍රීන් කෙරෙහි පුරුෂයාගේ ඉතා සවල්ප වූ ද තෘෂ්ණායෙක් යම්තාක් කල් නො සිඳී පවතී ද.

**අණුමත්ත,** ‘අණුවක් පමණ’ යන අරුත්. අණු නම්: ඉතා කුඩා දූයෙකි. පියවි ඇසට මහත් ව නො ද පෙණෙන්නේ ය. මෙයට වඩා කුඩා දූයෙක් නැත්තේ ය යි ලොකයාගේ පිළිගැණීම ය. අණුව බෙදා වෙන් කළ නො හැකි ය. බෙදා වෙන් කළහොත් අණුවෙක් නො ලැබෙන්නේ ය. ලැබෙනුයේ රූපකලාප සමූහයෙකි. අණුව රූපකලාපසමූහයකගේ සංයොගයෙකි. එක් වීමෙකි. අණුව ඉතා ම කුඩා දූයැ යි පිළිගන්නහුට එහි රූප කලාප අනුවටත් වඩා ඉතා ම කුඩා ය යි නො පිළිගෙණ සිටිනු නො හැකි ය. එදා විසූ බෞද්ධවිද්‍යාධරයන් වර්තමාන බාහිරක විද්‍යාධරයනට පෙර, මේ අණුව ගැණ දැන සිටි බව අණුව රූප කලාපයන්ගේ එක්වීමෙකැ යි කීමෙන් පැහැදිලි වන්නේ ය. හැමට පෙර අණුවෙහි තතු සොයා ගත්තෝ ලොවට කියා පෑවෝ බෞද්ධ විද්‍යාධරයෝ ය.

සත්‍රීන් කෙරෙහි පුරුෂයාගේ ද පුරුෂයන් කෙරෙහි සත්‍රියගේ ද සිත්හි නගිනා අණුවක් පමණ වූත් තෘෂ්ණාව කාම හැඟීම යම්තාක් කල් නො සිඳ පවතී නම්.

**පටිබද්ධමනො එව තාව සො වච්ජො ඛීරපකොව මාතරි** - ඒ තාක් කල් ම හෙතෙමේ මව කෙරෙහි ප්‍රේමයෙන් ඇලී කිරි බොන ලදරු වසු පැටවකු සේ ස්ත්‍රීන් කෙරෙහි පිළිබඳ සිත් ඇත්තේ වේ.

මෙහි ස්ත්‍රීන් කෙරෙහි බැඳුනේ ඇලුනේ **පටිබද්ධමන** නම්. එසේ ම මෙසින් පුරුෂයන් කෙරෙහි බැඳුනු ඇලුනු ස්ත්‍රිය ද ගැණේ. ස්ත්‍රීන් කෙරෙහි බැඳුනු පුරුෂයාත් පුරුෂයන් කෙරෙහි බැඳුනු ස්ත්‍රියත් මේ බැඳීම නිසා නො කරණ පව්කමෙක් නො සිතන පව්කමෙක් නැත්තේ ය. නො කරණ ජඩකමෙක් නො කරණ තිරිසන් කමෙක් වල්කමෙක් නැත්තේ ය.

ලදරු වසු මව වෙත ගොස් කිරි උරා බොනුයේ මව කෙරෙහි බලවත් ඇලීමෙනි. එමෙන් මේ ස්ත්‍රී - පුරුෂ දෙදෙනා උනුන් කෙරෙහි ප්‍රේමයෙන් බැඳුනාහු ඇලුනාහු වෙත්. මේ බැඳීම් ඇලීම් සසර දුකට මුල්ව සිටුනේ ය.

ධර්මදෙශනාවගේ අවසානයෙහි පන් සියයක් පමණ වූ ඒ මහලු තෙරහු සෝවන්පලයෙහි පිහිටා ගත්හ. ධර්මදෙශනා තොමෝ පැමිණ සිටි පිරිසට ද වැඩ සහිත වූ ය.

**මහල්ලකසම්බහුලවත්ථුව නිමි**

# සවණ්ණකාර ස්ථවිරයන් වහන්සේ

## 20 — 9

මනා රූ ඇති සවණ්ණකාර පුත්‍රයෙක් ශාරිපුත්‍ර මහාස්ථවිරයන් වහන්සේ වෙත පැවිදි වී ය. මහාස්ථවිරයන් වහන්සේ "තරුණ වයසෙහි සිටිනවුන්ගේ රාගය නැඟී සිටුනේ ය" යි සවණ්ණකාර පුත්‍ර මහණහුට රාගය සන්සිඳී යනු පිණිස අශුභකර්මස්ථානය දුන්හ. එහෙත් ඔහුට එය සතප්‍රාය නො වී ය. ඔහු වන වැද තෙමසක් මුළුල්ලෙහි වෑයම් කරණුයේ ද, සිත එකඟකර ගැණුම පමණකුත් කරගත නො හැකි ව පෙරළා මහතෙරුන් වෙත ආයේ තෙරුන් විසින් "තමුසේට කමටහන වැටහින ද?" යි අසා වදාළ කල්හි "නො වැටහිනැ" යි කීයේ ය. ඉක්බිති මහාස්ථවිරයන් වහන්සේ "ඔහුට කමටහන නො සැප ය යි තීරණයට බසින්නට නො වටී ය" යි නැවැතත් ඒ කමටහන ම මැනැවින් කියා දුන්හ. හෙතෙමේ එය ගෙණ වඩනුයේ දෙවන වරත් කිසිත් ගුණ–විශෙෂයක් උපදවා ගන්නට නො හැකි ව පෙරළා අවුත් ඒ වග මහතෙරුන් වහන්සේට දන්වා සිටියේ ය. ඒ වාරයෙහි ද මහාස්ථවිරයන් වහන්සේ එය ම කරුණු සහිත කොට උපමා සහිත කොට කියා දුන්හ. එහෙත් ඒ මහණ තෙරුන් වෙත පැමිණ තමන්ට කමටහන නො සැපයෙන බව කී ය.

ශාරිපුත්‍ර මහාස්ථවිරයන් වහන්සේ "භාවනා වඩන භික්ෂු තෙමේ තමන් කෙරෙහි විද්‍යමාන වූ කාමච්ඡන්දාදීහු විද්‍යමානහ යි ද, අවිද්‍යමාන වූ කාමච්ඡන්දාදීහු අවිද්‍යමානහ යි ද දක්නේ ය, මේ භික්ෂු නම ද භාවනා කරන්නේ ය, භාවනා නො කරන්නේ නො වේ, එහි ලා පිළිපන්නේ ය, නො පිළිපන්නේ නො වේ, මම මොහුගේ අදහස් කෙබඳු දැ යි නො දනිමි, මෙතෙමේ ඒකාන්ත–යෙන් බුදුරජුන් විසින් හික්මවිය යුත්තෙක් වන්නේ" යි ඒ මහණහු කැටුව සවස් වේලෙහි බුදුරජුන් වෙත එළැඹ "ස්වාමීනි! මෙ තෙමේ මාගේ සද්ධිවිහාරිකයෙක, මම මොහු රාගචරිත ය යි සිතා මොහුට අශුභකර්මස්ථානය දුනිමි" යි සියලු තොරතුරු සැළකොට සිටියහ.

එ කල්හි බුදුරජානන් වහන්සේ "අනුන්ගේ අදහස් දැන ගැණීමෙහි නුවණ, පැරුම් පුරා දසදහස් ලෝදා ගුගුරුවා සව්නේ දත් බුදුවරුන්ට ම අයත් ය" යි වදාරා "මෙ තෙමේ කවර කුලයෙ–කින් නික්ම අවුත් පැවිදි වූවෙක් දැ" යි බලා වදාරණ සේක් "කඹුරුකුලයෙන් නික්ම අවුත් පැවිදි වූයේ ය යි ද, පෙරත් දු පන් සියයක් ම පිළිවෙළින් කඹුරුකුලයෙහි උපන්නෙකැ" යි ද

දැන වදරා "බොහෝ කාලයක් මුළුල්ලෙහි කඹුරු කම් කළ මේ තරුණයා විසින් ඒ හැම කල්හි ම කිනිහිරිමල් රත් නෙළුම්මල් ආදී මල් සෑදීමට රතුපැහැති රන් තලා පෙලා මට කොට නොයෙක් අතට පෙරළන ලද්දේ ය, එ හෙයින් මොහුට අශුභකර්මස්ථානය නො සුදුසු ය, සත්ප්‍රාය ද නො වේ, මන වඩන්නා වූ කර්මස්ථානයෙක් ම මොහුට හිතකර ය" යි දැන "ශාරීපුත්‍රය! තමුසේ කමටහන් දී සිවු මසක් වෙහෙසට පත් කළ මේ මහණහු අද සවස් වරුවෙහි දී ම රහත්බවට පැමිණියහු දක්ක හැකි ය, තමුසේ යන්නැ" යි තෙරුන් පිටත් කොට යැවූ සේක. අනතුරු ව බුදුරජාණන් වහන්සේ තමන් වහන්සේගේ ඍද්ධි බලයෙන් රථරෝදයක් තරම් වූ රන්පියුමක් මවා පියුම්පෙතිවලින් හා පියුම් නටුවෙන් දිය බිඳු වැගිරෙන්නා සේ කොට "මහණ! මේ පියුම ගෙණ වෙහෙර කෙළවර ඇති වැලිගොඩෙහි තබා එය ඉදිරියෙහි එයට ලං ව අරමිණිය ගොතා හිඳ **"ලෝහිතකං, ලෝහිතකං"** යි පිරියම් කරව" යි ඒ රන්පියුම දුන් සේක. ඔහු එය බුදුරජුන් අතින් ගණිත් ම ඔහුගේ සිත පහන් විය. බුදුරජුන්ගේ නියමය ලෙස වෙහෙර කෙළවරට ගොස් වැලිගොඩ මතුයෙහි පියුම් නටුව සිටුවා එය ඉදිරියෙහි පලඟ බැඳ හිඳ "ලෝහිතකං, ලෝහිතකං" යි පිරියම් කරන්නට පටන් ගත්තේ ය. එ කෙණෙහි ම ඔහුගේ සිතෙහි රැඳී තුබූ නිවරණයෝ යටපත් ව ගියහ. උපචාරධ්‍යානය උපන. අනතුරු ව ප්‍රථමධ්‍යානය උපදවා එය පස් අයුරකින් වශීභාවයට පමුණුවා නැවැත හුන් පරිදි ම හිඳ ද්විතීයධ්‍යානාදිය ද උපදවා ඒ ධ්‍යානයන් ද වශීභාවයට පැමිණ වූ කල්හි චතුර්ථධ්‍යානයට සමවැද හුන්නේ ය.

බුදුරජාණන් වහන්සේ ඒ වේලෙහි ඔහුට ධ්‍යාන උපන්බව දැන "මෙ තෙමේ තම ශක්තියෙන් මත්තෙහි වූ විශෙෂගුණ උපදවා ගන්නට සමර්ථ වේ දැ" යි බලා වදාරණ සේක් එහි අසමර්ථය යි දැන "ඒ පියුම මැල වේවා" යි ඉටූ සේක. අතින් පිරිමැදි ඒ පියුම මැලවෙන්නා සේ කලු පැහැ ඇත්තේ විය. "මහණ! ධ්‍යානයෙන් නැගිට පියුම දෙස බලා 'කිම, මේ පියුම ජරායෙන් පහරණ ලදුයේ පෙණෙන්නේ ය, අනින්ද්‍රියබද්ධවස්තූන් පවා මෙසේ ජරායෙන් පහරණ ලද කල්හි ඉන්ද්‍රියබද්ධවස්තූන් කෙරෙහි ජරාව බලපැවැත්වීමෙහි ලා කවර කතා ද, බලා සිටිය දී ම මේ පියුම ජරාව විසින් මැඩ ගන්නා ලදැ" යි සිතී ය. එසේ සිතත් ම අනිත්‍යලක්‍ෂණය සිතෙහි නැගී සිට ගත. අනිත්‍යලක්‍ෂණය සිතෙහි නගිත් ම ඉතිරි දුඃඛලක්‍ෂණ - අනාත්මලක්‍ෂණ ද නැගී ගියේ වන. එකල්හි ඔහුට භවත්‍රයම ගින්නෙන් ඇවිළ ගත්තක් සේ,

ගෙල බැඳි මලකුණක් සේ වැටහින. මේ මහණ හුන් තැනට නො දුරෙහි පියුම් විලෙක් ද විය. ගම් වැසි කුඩා දරුවෝ විල ළඟට අවුත් විලට බැස ඇඹුල්මල් කඩා ගොඩ බිම රැස් කළහ. පොකුණ තුළ තුබූ මල් හා ගොඩ බිම ගොඩ ගසා තුබූ මල් ද දුටු, ඒ මහණහුට පොකුණ තුළ තුබූ මල් අභිරූප ව දිය වගුරුවන්නා සේ ද ගොඩ බිම තුබූ මල් මුදුන් මැලවුනවුන් සේ ද වැටහින. "ඉන්ද්‍රියබද්ධ නො වූ වස්තු මෙසේ ජරාව විසින් පහරණු ලබන්නේ නම්, ඉන්ද්‍රියබද්ධවස්තු කෙසේ නම් නො පහරණු ලැබේ ද" යි අනිත්‍යලක්ෂණය ඉතා විශද ව ඔහුගේ සිතෙහි කා-වැදී සිටියේ ය.

බුදුරජාණන් වහන්සේ "මේ මහණහුට දැන් කමටහන මැනැවින් පෙණී ගියේ වනැ" යි ගඳකිළියෙහි ම වැඩහුන් සේක් ආලෝකයක් මුදා හළ සේක. ඒ ආලෝකය ඔහුගේ මුහුණ වැද සිටියේ ය. එකල්හි "මේ කිමැ" යි බලන්නා වූ ඔහුට බුදුරජාණන් වහන්සේ තමන් ඉදිරියෙහි වැඩ සිටිති, යි පෙණී ගියහ. ඔහු එ කෙණෙහි හුන් තැනින් නැගිට දෙහොත් මුදුනේ තබා සිට ගත්තේ ය. ඉක්බිති බුදුරජාණන් වහන්සේ ඔහුට වන හිත සැප සලකා මේ ධර්මදේශනාව කළ සේක.

**උච්ඡින්ද සිනෙහමත්තනො කුමුදං සාරදිකං ව පාණිනා,**
**සන්තිමග්ගමෙව බ්‍රෑහය නිබ්බානං සුගතෙන දෙසිතන්ති.**

සරත් කල්හි කුමුදු මලක් අතින් අල්ලා උදුරන්නකු මෙන් තමාගේ තෘෂ්ණාස්නේහය මුලින් සිඳ හරුව. නිවන්මග ම වඩව. නිවන සුගතයන් වහන්සේ විසින් දෙසන ලද ද එහෙයිනි.

**උච්ඡින්ද සිනෙහං අත්තනො** = තමාගේ ස්නේහය රහත් මග නුවණින් සිඳ දමව.

**ඡින්ද** යනු **උ** යන්නෙන් වඩා වදුළෙෝ ආත්මස්නේහය ආත්ම තෘෂ්ණාව රහත්මග නුවණින් ම මුල් සුන් කොට සිඳ හළ යුතු බව දක්වනු සඳහා ය.

**උ** යනු ඊශ්වර – දුඃඛලාභ – ප්‍රතිෂේධ – රෝගමුක්ති – ප්‍රස්ථාන – යුක්ති – උද්ගතාදි අර්ථ රාශියක් කියන්නේ ය. ඔවුනතුරෙහි ඊශ්වරාර්ථ වාචක වූයේ ශුද්ධ නාමපද විසිනි. දුඃඛලාභ – ප්‍රතිෂේධ – රෝගමුක්ති යන මෙයරුත්හි වූයේ නිපාත පද විසිනි. සෙසු අරුත්හි උපසර්ග පද විසින් ආයේ ය. මෙහි සිටියේ රහත්මග නුවණ කියනු සඳහා නාම පද විසිනි. එහෙයින් **"උච්ඡින්දැ, ති අරහත්තමග්ගෙන ඡින්ද"** යි අටුවාව කිවු ය.

**සිනෙහ** නම්: සිය සිරුර පිළිබඳ ඇල්ම ය. ඇල්ම තෘෂ්ණා ය. එය භවොත්පත්තියෙහි මූල කාරණය වේ. මේ නිසා හැම එකෙක දැඩි ගැණීම වන්නේ ය.[1]

**අත්තනො** යන මෙහි අත්ත ශබ්දයෙන් පඤ්චස්කන්ධය කියවේ. එය නැසෙන සුල්ලේ ය. නො ලැබිය හැක්කේ ය.[2]

**කුමුදං සාරදිකං ඉව පාණිනා** = අතින් අල්ලා කුමුදු මලක් උදුරන්නකු සේ.

**කුමුද** නම්: හෙළුපුල් ය. කුමුද යනු, රත්පියුම්හි ද වැටෙන බව මෙදිනීකොෂකාරයෝ කියත්. ශීතලක – ශශිකාන්ත – ඉන්දු – කමල – චන්ද්‍රිකාම්බුජ – ගන්ධසොභ යනාදීහු පර්යාය නාම වෙත්.

**සාරදික** යනු ශරත් කාලයෙහි වූයේ ය යන අරුත් ඇත්තේ ය. අවුරුද්දෙහි දෙළොස් මස ඍතු විසින් සයට බෙදති. එහි වප් – ඉල් දෙමසින් පිරිසිදෙන කාලය ශරත් යි ගණු ලැබේ. විල්වල කුමුදු මල් බහුල වනුයේ ද මේ කාලයෙහි ය. වලාකුල් පහව යැමෙන් අහස ද නිර්මල වේ. දෙළොස් මසින් පිරි අවුරුද්ද ද ශරත් යි කියනු ලැබේ.

**සන්තිමග්ගං එව බ්‍රෑහය** = නිවන් මග ම වඩව.

**සන්තිමග්ග** නම්: ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය යි. එ මග නො ගියහුට කෙලෙස් මුළුමනින් නසා හැර නිවන් ලබන්නට නො හැකි ය.[3]

**නිබ්බානං සුගතෙන දෙසිතං ඉති** = නිවන සුගතයන් වහන්සේ විසින් දෙසන ලදද. (එහෙයිනි)

**නිබ්බානං** = නිවන. නිවන කිමැයි යන්නමකින් යට කියන ලදි. ඒ බැලිය යුතු ය.[4] **සුගත** නම්: බුදුරජානන් වහන්සේ ය. උන්වහන්සේ කෙරෙහි නැගුනු 'සුගත' යනු කිනම් අරුත් නිසා නැගුනේ ද යනු ඉදිරියෙහි කියැවෙන්නේ ය.

ධර්මදෙශනාවගේ අවසානයෙහි ඒ මහණ තෙමේ රහත් බවෙහි පිහිටා ගත්තේ ය.

**සුවණ්ණකාරස්ථවිරවස්තුව නිමි**

---

1. 14. 6. 'දුක්ඛසමුප්පාදං' යනු බලනු.
2. 12. 1. 'අත්තානං චෙ පියං ජඤ්ඤා' ,, ,,
3. 14. 6. 'අරියංචට්ඨඞ්ගිකං මග්ගං' යනු බලනු.
4. ,, ,, 'දුක්ඛස්සච අතික්කමං' ,, ,,

# මහාධන වෙළෙන්ද

## 20 — 10

**මහාධන** වෙළෙඳ තෙමේ වණ්ණක් මල් දියෙන් රැඳූ රතු පැහැති රෙදිපිළි රැසක් ගැල් පන් සියයෙක පුරවා ගෙණ වෙළඳාමට සැවැත් නුවරට ගියේ ය. යන්නේ අතර මග වූ ගං ඉවුරකට පැමිණ හෙට ගඟින් එතෙර වන්නෙමි' යි ගං ඉවුරෙහි ම ගැල් ලිහා තබා එහි ම රැඳුනේ ය. එදා රෑ අහස වලාකුල් නැගී තදින් වැසි වසින්නට වන. වැසි දිය ගලා නො ගොස් සත් දවසක් ම ගඟ පුරා සිටියේ ය. නුවර වැස්සෝ ද සතියක් මුළුල්ලෙහි නැකැත් කෙළි කෙළියහ. වෙළෙඳ ගැල් පුරවා ගෙණ ගිය රත් පිළීයෙන් වැඩෙක් නො වී ය. එකල්හි හෙතෙමේ "මම දුර සිට ආයෙමි, මේ පිළීන් රැගෙණ පෙරළා ගම් බලා ගියොත් එද පමායෙක් වන්නේ ය, එහෙයින් වැසි කාලයත් හිමන් කාලයත් ගිමන් කාලයත් මෙහි ම රැඳී රෙදි පිළීත් විකුණා ගෙණ ම යන්නෙමි" යි සිතා එහි ම රැඳී සිටියේ ය.

බුදුරජානන් වහන්සේ එහි පිඬු සිඟා වැඩි සේක්, වෙළෙඳාගේ මේ අදහස දැන සිනහ පහළ කළ සේක. ආනන්ද ස්ථවිරයන් වහන්සේ බුදුරජුන් සිනහ පහළ කළ බව දැක "සිනහ පහළ කිරීමෙහි හෙතු කිමැ?"යි උන්වහන්සේගෙන් විචාළාහු ය. "ආනන්ද! තමුසේ මහාධන වෙණෙඳහු දුටු වහු දැ?" යි බුදුරජුන් අසා වදාළ කල්හි 'එසේය' යි ආනන්ද ස්ථවිරයන් වහන්සේ පිළිතුරු දුන්හ. "මහාධන වෙණෙඳ තමාගේ ජීවිතයට වන අන්තරාය නො දැක මේ මුළු අවුරුද්ද ම් මෙහි ම රැඳී හිඳ බඩු විකුණන්නට අදහස් කොට සිටුනේ ය" යි වදාළ කල්හි "ස්වාමීනි! වෙළෙන්දාගේ ජීවිතයට අන්තරායයෙක් වන්නේ ද? ඒ කෙබඳු එකෙක් දැ?" යි ඇසූහ. "ආනන්ද! ඔව්, අන්තරායයෙක් වන්නේ ය, අදින් සත් දවසක් ගිය තැන මෙ තෙමේ සත් දවස කෙළවර මියෙන්නේ ය"යි වදාරා, නැවැත බුදුරජානන් වහන්සේ "කළයුතු වීයඊය අද ම කළ යුතු ය, හෙට කවරෙක්, මැරේ ද, නො මැරේ දැ යි කෙසේ දනී ද, මහසෙන් ඇති මරහු හා අපගේ අල්ලස් දීමෙක් හෝ ගැණීමෙක් නැත්තේ ය, සත්හුන් රාගාදී වූ කෙලෙස් ඇති බුදුරජ තෙමේ මෙසේ වසන සුලු වූ කෙලෙස් තවන වැර ඇත්තා වූ දව රෑ දෙක්හි අනලස් වූ මෙසේ පිළිපන් පුද්ගලයා භද්‍රෙකරත්තය යි කියන්නේ ය" යි වදාළ සේක.

ඉක්බිති ආනන්ද ස්ථවිරයන් වහන්සේ "ස්වාමීනි! මේ වග ඔහුට දන්වන්නට මම යමි" යි කී විට "ආනන්ද! ඔහු හා විශ්වාස ඇත්තහු නම් යන්නැ" යි අවසර දුන්හ. ස්ථවිරයන් වහන්සේ

ගැල් තුබූ තැනට ගොස් පිඩු සිඟා හැසුරුණාහ. වෙළෙන්ද තෙමේ තෙරුන් ආහාරයෙන් පිදී ය. එකල්හි ස්ථවිරයන් වහන්සේ "කොතෙක් කල් මෙහි වසන්නහු දැ?" යි ඔහුගෙන් ඇසූහ. "ස්වාමීනි! මම බොහෝ දුර සිට ආයෙමි, ඉදින් මම මේ බඩුත් රැගෙණ පෙරළා ගියෙම් නම් එය මට පමායෙක් වන්නේ ය, එහෙයින් මෙහි අවුරුද්දක් පමණ රැඳී සිට බඩුත් විකුණා ගෙණ යන්නෙමි"යි හේ කී ය. "උපාසක! ජීවිතයට වන අන්තරාය පහසුවෙන් දත හැක්කේ නො වේ, එහෙයින් අප්‍රමත්ත ව කටයුතු කිරීම වටනේ ය" යි තෙරුන් කී විට "කිමෙක් ද, ස්වාමීනි! මට අන්තරායයෙක් වන්නේ දැ?" යි ඇසී ය. "ඔවු, උපාසක! ඔබගේ ජීවිතය පවත්නේ සතියක් පමණ ය, සතියකට වඩා ඔබට ජීවත්වනු නො හැකි ය" යි කියා සිටිය හ. වෙළෙන්ද සංවෙගයට පැමිණ බුදුරජුන් ප්‍රධාන භික්සඟුන් පවරා සතියක් දන් දී බණ අසනු පිණිස බුදුරජුන්ගේ පාත්‍රය ගත්තේ ය. බුදුරජානන් වහන්සේ "උපාසක! නුවණැත්තහු විසින් මේ මේ වැඩ කරමින් වැසි සාර මසත් හිමත් ගිමත් අටමසත් මෙහි ම වසන්නෙමි'යි සිතන්නට නො වටනේ ය, තමාගේ ජීවිතයට වන අනතුරු ගැණ ම සිතිය යුතු ය" යි වදාරා මේ ධර්මදෙශනාව කළ සේක.

**ඉධ වස්සං වසිස්සාමි ඉධ හෙමන්තගිම්හිසු,**
**ඉති බාලො විචින්තෙති අන්තරායං න බුජ්ඣතීති.**

වැසි සාර මස මෙහි ම වසන්නෙමි. හිමත් සාර මස හා ගිමත් සාර මසත් මෙහි ම වසන්නෙමි යි. මෙසේ අඥාන තෙමේ සිතයි. තමාගේ ජීවිතයට වන අන්තරාය නො දනියි.

**ඉධ වස්සං වසිස්සාමි** = වැසි සාර මස මෙහි වසන්නෙමි.

**ඉධ හෙමන්තගිම්හිසු** = හිමත් සාර මස හා ගිමත් සාර මසත් මෙහි වසන්නෙමි.

**ඉති බාලො විචින්තෙති** = අඥාන තෙමේ මෙසේ සිතයි.

**අන්තරායං න බුජ්ඣති** = අන්තරාය නො දනියි.

එ ලොව මෙ ලොව වැඩ කිසිත් නො දත් අඥානයා "වැසි සාරමස මෙ නම් මෙ නම් වැඩ කරමින් වසන්නෙමි, හිමත් සාර මස හා ගිමත් සාර මසත් මෙ නම් මෙ නම් වැඩ කරමින් වසන්නෙමි"යි සිතන්නේ ය. එහෙත් ඉදිරියෙහි තමාගේ ජීවිතයට කෙබඳු අනතුරෙක් නපුරෙක් වේ දැ යි නො දනියි.

විනය පොතෙහි **"උතූනිධ පන සාසනෙ හෙමන්තගිම්හවස්සානං වසෙන තිනි හොන්ති"** යි හෙමන්ත – ගිම්හ – වස්සාන

විසින් අවුරුද්දෙහි මාස දෙළොස, ඍතු තුනකට බෙදන ලද්දේ ය. මෙහි මෙසේ බෙදන ලද්දේ මගධ රට වැස්සන් විසින් පිළිගත් සැටියෙනි. මගධ රට වැස්සෝ ඉල්මස කාල පක්ෂය පටන් පිළිවෙළින් සාර මසක් සාර මසක් කොට අවුරුද්ද තුනට බෙදා ගත්හ. මේ ඔවුන් බෙදා ගත් සැටි:

"චතුරො චතුරො මාසා කත්තිකකාල පක්ඛතො,
කමා හෙමන්ත ගිම්හානා වස්සානා උතුයො සියුං"

ඉල් – උඳුවප් – දුරුදු – නවම් යන සිවු මස හෙමන්තය යි. මැදින් – බක් – වෙසක් – පොසොන් යන සිවු මස ගිම්හ ය යි. ඇසළ – නිකිණි – බිනර – වප් යන සිවු මස වස්සානය යි.

ශීත-උෂ්ණ-වර්ෂා යන ලක්ෂණ විසින් ද ඍතුහු තුනට බෙදෙත් **"ශීතොෂ්ණවර්ෂාලක්ෂණාස්ත්‍රයඃ ඍතයො භවන්ති"** යනු ආප්තයි. අනෙක් ඍතුහු සාධාරණ ලක්ෂණ ඇත්තාහු වෙති.

එහි **හෙමන්ත** නම්: හිම බහුල කාලය යි. **"හිමානි එත්ථ සන්තීති = හෙමො, හෙමො එව = හෙමන්තො"** යනු අරුත්. **ගිම්හ** නම්: හිරු රැස් සැඩපරුස කාලය යි. **"ඝරති පීළයතීති = ගිම්හො"** යනු අරුත්. **වස්සාන** නම්: වැසි බහුල කාලය යි. **"වස්සති එත්ථාති = වස්සං"** යනු අරුත්.

මේ මෙසේ බෙදුනේ ද ලෝ වැසි මිනිසුන් විසින් තම තමන් උපන් රටවල කාලගුණය අනුව අවුරුද්දෙහි මාස දෙළොස මෙයට වෙනස්ව ද බෙදා ගෙණ ඇත්තේ ය.

"වසන්තග්‍රීෂ්මවර්ෂාශ්ච ශරද්ධෙමන්තශෛශිරාඃ,
ෂඩමී ඍතවඃ ප්‍රොක්තා චෛත්‍රාදීනාං යුගෙඃ ක්‍රමාත්"

යි ජ්‍යොතිශශාස්ත්‍රයෙහි ආයේ ය. වසන්ත – ග්‍රීෂ්ම - වර්ෂා – ශරත් – හෙමන්ත – ශිශිර යි ඍතුන් සවැදෑරුම් ය යි මෙයින් කියත්. එහි බක් – වෙසක් දෙ මස වසන්ත ය. පොසොන් – ඇසළ දෙ සම ග්‍රීෂ්ම ය. නිකිණි – බිනර දෙ මස වර්ෂා ය. වප් – ඉල් දෙ මස ශරත් ය. උඳුවප්–දුරුතු දෙ මස හෙමන්ත ය. නවන්–මැදින් දෙ මස ශිශිර ය.

"මාසෙඃ ද්විසඞ්ඛෛර්මාඝාද්‍යෛඃ ක්‍රමාත් ෂඩෘතවඃ සමෘතාඃ,
ශිශිරොථ වසන්තශ්ච ග්‍රීෂ්ම වර්ෂාශරද්ධිමාඃ"

යි මෙහි ලා වෛද්‍යශාස්ත්‍රයෙහි කියන ලද්දේ ය. එහි නවන් මස ආදී කොට දෙ මස දෙ මස පිළිවෙළින් ශිශිර – වසන්ත – ග්‍රීෂ්ම – වර්ෂා – ශරත් – හිම යි සයක් කොට බෙදුනේ ය.

**ශාර්ඞ්ගධරසංහිතා**යෙහි මේෂසඞ්ක්‍රාන්තියෙහි මුල සිට වෘෂභ රවිය අවසන් කොට ඇති කාලය, ග්‍රීෂ්ම, මිථුන කටක රවි දෙක ප්‍රාවෘෂ්, සිංහ - කන්‍යා රවි දෙක වර්‍ෂා, තුලා - වෘශ්චික රවි දෙක ශරත්, ධනු - මකර රවි දෙක හෙමන්ත, කුම්භ - මීන රවි දෙක වසන්ත ය යි කියන ලදී. මේ ඒ කීම:-

"ග්‍රීෂ්මෝ මේෂ වෘෂෞ ප්‍රොක්තෞ ප්‍රාවෘඩ් මිථුන කර්කටෞ,
සිංහ කන්‍යෙ ස්මෘතා වර්‍ෂා තුලා වෘශ්චිකයොඃ ශරත්,
ධනුර් ග්‍රාහෞ ච හෙමන්තෞ වසන්තඃ කුම්භමීනයොඃ "යි

සූර්‍ය්‍ය මාස විසින් කියන ලද මේෂ-වෘෂභ දෙක්හි මද වෙනසෙක් ඇත ද, ඒ බක්-වෙසක් දෙ මස ම ය. මුලින් කියූ වසන්තය, මෙහි ග්‍රීෂ්ම යි දක්වනලදී. ශිශිර විසින් ඍතුයෙක් මෙහි නො ආයේය. ප්‍රාවෘෂ්-වර්‍ෂා දෙකින් වැසි කාලය ම කියනු ලැබේ. ඒ වැසි කාලය, මිථුන-කටක-සිංහ-කන්‍යා යන සතර ඈතම් කොට සිටියේ ය. අධික වැස්ස ප්‍රාවෘෂ් ය. මද වැස්ස වර්‍ෂා ය. මිථුන-කටක දෙක්හි අධික වැසි ලැබේ. සිංහ-කන්‍යා දෙක්හි මද වැසි ලැබේ.

අවුරුද්ද ඍතු සයට බෙදූ තැන හෙමන්ත-ශිශිර දෙක එක් කොට පසක් විසින් බෙදා ඇත්තේ ය. **"ද්වාදශමාසාඃ පඤ්චර්තවඃ හෙමන්ත ශිශිරයොරෙකීකාරණෙන විවක්‍ෂිතම්"** යනු ආජ්‍ඤය.

ධර්මදෙශනාවගේ අවසානයෙහි වණික් තෙමේ සෝවන් පල-යෙහි පිහිටා ගත්තේ ය. ධර්මදෙශනා තෙමෝ පැමිණ සිටි පිරිසට ද වැඩ සහිත වූ ය. වණික් තෙමේ බුදුරජුන් පසු පස ගොස් පෙරළා අවුත් හිසරුදයෙක් උපනැ යි ඇඳෙහි වැතිර ගත්තේ ය. වැතිර ගත්තේ ම කලුරිය කොට තුසිතභවනයෙහි උපන්නේ ය.

**මහාධනවාණිජවස්තුව නිමි.**

# කිසාගොතමී

## 20 — 11

**සම්මා** සම්බුදු රජාණන් වහන්සේ සැවැත් නුවර දෙව්රම් වෙහෙර වැඩ වසන සේක් දවසක් කිසාගොතමිය අමතා "ගොතමි! තිට නො මළ කෙනකු ඇති ගෙයකින් අබ අහුරක් ලැබුනා දැ"යි අසා වදාළ සේක. එ කල්හි ඕ තොමෝ "ස්වාමිනි! මේ මුළුගම ජීවත් වන්නවුනට වඩා මළාහු ම ඉතා බොහෝ ය" යි කිවු ය. ඉක්බිති බුදුරජාණන් වහන්සේ "ගොතමි! තී මාගේ පුතු මළේ ය යි සිතහි, මරණය සියලු සතුන් පිළිබඳ ව සිදු වන එකාන්ත ධර්මයෙකි, මරණය සියලු සතුන් මැඩ සිටියේ ය, මරණයට යටත් නො වන එක ද සත්ත්වයෙක් ලොකයෙහි කිසි තැනෙක නැත්තේ ය, මරු, සියලු සතුන් නො ද පිරිපුන් අදහස් ඇති ව සිටිය දී ම, යම් කිසිවක් මහත් දිය සැඩ පහරකින් ඇද ගෙණ යන්නා සේ ඇද ගෙණ ගොස් අපාය නැමැති සමුද්‍රයෙහි බහා ලන්නේ ය" යි වදාරා මෙ ධර්මදෙශනාව කළ සේක.

**තං පුත්තපසුසම්මත්තං ව්‍යාසත්තමනසං නරං,**
**සුත්තං ගාමං මහොඝොව මච්චු ආදය ගච්ඡති.**

දරුවන් හා ගොමහිෂාදීන් නිසා තදින් මත් වූ වෙසෙසින් ලැගුනු සිත් ඇති මිනිසා, නිදිගත් ගමක් මුහුදට ඇද ගෙණ යන මහ දියවතුරක් මෙන් මරණය තෙමේ ඇද ගෙණ යන්නේ ය.

**තං පුත්තපසුසම්මත්තං ව්‍යාසත්තමනසං නරං** = දරුවන් හා ගොමහිෂාදීන් නිසා තදින් මත් වූ වෙසෙසින් ලැගුනු සිත් ඇති මිනිසා.

යමෙක් උස්මහත්කම් හැඩහුරුකම් පැහැසටහන් හසිබල නුවණ ඈ යන මෙයින් යුත් තමන්ගේ දූ පුතුන් දෙස බලා "මාගේ දූ පුත්තු උස්මහත්කමින් හැඩහුරුකමින් පැහැසටහනින් හසිබලයෙන් නුවණින් අන් දරුවන් අබිබවා සිටිති, සියලු කටයුතු වල දක්ෂ වෙති, එ මතු ද නො වේ, මාගේ ගොමහිෂාදීහු ද හැඩහුරුකමින් ඇඟමසින් තරබාරුකමින් යුක්ත වෙති, බර ඉසිලීමෙහි ශක්තිමත් ය, මාගේ දෙන්නු බොහෝ කිරි ඇතියහ" යනාදීන් දූ පුතුන්ගේ හා ගොමහිෂාදීන්ගේ මහත්කම් බලා මත් වූයේ ද මත් වන්නේ ද හේ **පුත්තපසුසම්මත්ත** නම්.

රන් රිදී මසු කහවණු ඈ අතුරෙහි හෝ සිවුරු පිරිකර ඈ අතුරෙහි හෝ කිසිවක් ලබා එයින් සෑහීමට නො පැමිණ වඩ වඩාත් එය ලැබීමෙහි ඇලුනේ, ඇස්-කන්-නාස් ඈ දෙරටුවලින්

ගතයුතු වූ අරමුණු අතුරෙහි, නන්වැදෑරුම් කුදු-මහත් පිරිකර අතුරෙහි යමෙක් යමෙක් ලද ද එයින් සෑහීමට නො පැමිණ නො ලද දූය පැතීම් විසින් ලද දූයෙහි ඇලීම් විසින් මත් වූයේ ද මත් වන්නේ ද **ඛ්‍යාසත්තමනස** නම්.

**සුත්තං ගාමං මහොඝො ඉව මච්චු ආදාය ගච්ඡති** = නිදිගත් ගමක් මුහුදට ඇද ගෙණ යන මහදියවතුරක් මෙන් මරු තෙමේ ඇද ගෙණ යන්නේ ය.

දූ පුතුන් නිසා ගොමහිෂාදීන් නිසා රන් රිදී මසු කහවණු ඈ නිසා පා සිවුරු පිරිකර නිසා මත් වූ, ඒ කිසිවෙක් ලද ද එයින් සතුටට නො පැමිණ වඩ වඩාත් එය ලැබීමෙහි පැතුම් ඇති මිනිසා මෘත්‍යුමාර තෙමේ දෙ තුන් යොදුන් පැතිර සිටි ගැඹුරු වූ මහත් දිය කඳක් නිදිගත් ගම්වැස්සන් බලු බලලුන් කිසිවකුත් ඉතිරි නො කොට මුහුදට ඇද ගෙණ යන්නා සේ අපාය-යට ඇද ගෙණ යන්නේ ය යි මෙයින් වදාළ සේක.[1]

ධර්මදේශනාවගේ අවසානයෙහි කිසාගොතමී තොමෝ සෝ-වන් පලයෙහි පිහිටියා ය. ධර්මදේශනා තොමෝ පැමිණ සිටි පිරිසට ද වැඩ සහිත වූ ය.

### කිසාගොතමීවස්තුව නිමි

1. 4. 3. 'සුත්තං ගාමං මහොඝොව' යනු බලනු.

# පටාචාරා

## 20 – 12

**සම්මා** සම්බුදුරජාණන් වහන්සේ සැවැත් නුවර දෙව්රම් වෙහෙර වැඩ වසන සේක්, තුනී වූ ශොක ඇති පටාචාරාව දැක "පටාචාරා! දූ පුතුන් ආදී වූ කිසිවෙක් පරලොව යන්නහුට පිහිටා හිටින්නට තැනෙක්, සැඟවී ගන්නට තැනෙක්, මේ මට පිහිටැ යි ගන්නට තැනෙක් නො වන්නේය, ඔවුහු හැමදෑ ජීවත් වන්නාහු ද නො වෙත්, මියෙන්නාහ ඔවුහු, එහෙයින් නුවණැත්තහු විසින් සිල් සමාදන් ව ගෙණ ඒ මැනැවින් රකිමින් නිවන් මග ම සාදා ගන්නට වටනේ ය" යි වදාරා මේ ධර්‍මදෙශනාව කළ සේක.

**න සන්ති පුත්තා තාණාය න පිතා නපි බන්ධවා,**
**අන්තකෙනාධිපන්නස්ස නත්ථි ඤාතිසු තාණතා.**

**එතමත්ථවසං ඤත්වා පණ්ඩිතො සීලසංවුතො,**
**නිබ්බානගමනං මග්ගං ඛිප්පමෙව විසොධයෙ.**

මරහු විසින් මඩනා ලද්දහුට ආරක්‍ෂා පිණිස දූ පුත්තු නැත්තාහ. පියෙක් නැත. නෑයෝ ද නැත. නෑයන් කෙරෙහි පිහිටෙක් නැත.

නුවණැත්තේ මේ කාරණය දැන ශිලයෙන් සංවෘත වූයේ නිවන් යන මග වහා ම පිරිසිදු කරන්නේ ය.

**න සන්ති පුත්තා තාණාය** = ආරක්‍ෂා පිණිස දූ පුත්තු නැත්තාහ.

**න පිතා න අපි බන්ධවා** = පියෙක් නැත. නෑයෝ ද නැත.

**නත්ථි ඤාතිසු තාණතා** = නෑයන් කෙරෙහි පිහිටෙක් නැත.

**පුත්ත** යනු දූ පුතුන් දෙ පස කෙරෙහි ම නැගී සිටියේ ය. **"පුත්තා ච දුහිතරො ච = පුත්තා"**යි එකශෙෂද්වන්ද්වසමාසයෙහි ලා පුත්ත ශබ්දය ප්‍රධාන බැවින් හේ ඉතිරි ව දූ පුතුන් දෙපස බලා 'පුත්තා'යි බහුවචය ගත්තේ ය. **දුහිත්‍රා සහ වචනෙ පුත්‍රශබ්දඃ විශිෂ්‍යතෙ"** යනු අනුශාසනා ය[1]

**තාණ** නම්: රැකීම ය. **පිතා** යනු යට කියන ලද්දේය.[2] සෙනහ යෙන් එකට බැඳුනේ **බන්ධු.** මේ අපගේ එකෙකැ යි ප්‍රෙමබන්ධන-යෙන් බැඳුනේ මේ තෙමේ ය.

---

1. 5. 3. 'කුතො පුත්තා' යනු බලනු
2. 8. 9. 'පිතා කයිරා' ,, ,,

**අනතක** නම්: මරු ය. එක් එක් භවයෙකින් පිරිසිඳෙන සත්‍ත්‍ව ජීවිතය, ඒ ඒ භවයෙහි විනාශයට යනුයේ ද එහෙයිනි.[1] **අධිපන්න** නම්: යට කොට ගන්නා ලද්දේ ය. මරුට යටත් නො වූ එක ද සත්‍ත්‍වයෙක් ලොකයෙහි කොතැනකත් නැත්තේ ය. හැම සත්‍ත්‍වයෙක් මරු නිසා ඒ ඒ භවයෙන් ගිලිහෙන්නේ ය. **ඤාති** නම්: මවු පසින් හා පිය පසින් පැවැත එන්නෝ ය. යට කියන ලදි.[2]

**එතං අත්‍ථවසං ඤත්‍වා පණ්ඩිතො සීලසංවුතො** = නුවණැත්තේ මේ කාරණය දැන ශීලයෙන් සංවෘත වූයේ.

මරුට යටත් වූවහුට පිහිට වන්නට දූ පුත්තු නැත. පියෙක් නැත. නෑ කෙනෙක් නැත. නෑයන්ගෙන් කිසිත් පිහිටෙක් නැත. යන මේ කාරණය දැන නුවණැත්තේ ශීලයෙහි පිහිටා ගන්නේ ය. දිවි ගිය ද සිල් නො බිඳින්නේ ය. මැනැවින් සිල් රකින්නේ ය. **පණ්ඩිත** නම්: නුවණැත්තේ ය.[3] **සීලසංවුත** නම්: කය වචන දෙකින් කිසිත් වරදක් නො වන ලෙසට කය වචන දෙක මැනවින් රැක ගන්නේ ය.[4]

**නිබ්බානගමනං මග්ගං ඛිප්පං එව විසොධයෙ** = නිවන් යන මග වහාම පිරිසිඳු කරන්නේ ය.

**නිවන් යන මග** නම්: ආයර්‍ය අෂ්ටාඞ්ගික මාර්ගයයි.[5] එය දාන-ශීල - භාවනා වශයෙන් ගැණෙන පූර්‍වභාගප්‍රතිපත්ති පුරා විදසුන් නුවණින් සියලු සංස්කාරයන් විෂයයෙහි නිර්‍වේදයට පැමිණ ස්‍රොතාපත්ති ආදී වූ මාර්‍ගකුශලචිත්තයන් උපදවා ගැණීමට සුදුසු සේ පිළිවෙත් පිරීම, එ මග පිරිසිඳු කිරීම ය. නිවන් යන මග පිරිසිදු කරන්නේ මෙ කියූ ලෙසට ය.

ධර්‍මදෙශනාවගේ අවසානයෙහි පටාචාරා තොමෝ සෝවන් පලයෙහි පිහිටා ගත්තී ය. අන් බොහෝ දෙන ද සෝවන් පලාදියට පැමිණියාහු ය.

**පටාචාරාවස්තුව නිමි.**

සකලජනධර්‍මාර්‍ථසඞ්ග්‍රහාභිලාෂී **පණ්ඩිත** අම්බලම්ගොඩ **ධම්මකුසල** ස්ථවිරයන් කළ **සද්ධර්‍මසාගර** නම් වූ **ධර්‍මපදවර්‍ණනායෙහි** මාර්‍ගවර්‍ගාත්මකවිංශතිතම තරඞ්ගය නිමියේ ය.

---

1. 4. 2. 'මාරස්ස' යනු බලනු.
2. 3. 9. 'ඤාතකා' ,, ,,
3. 2. 1. 'අප්පමාදම්හි පණ්ඩිතා' ,, ,,
4. 4. 10. 'සීලවතං ගන්‍ධො' ,, ,,
5. 14. 6. 'අරියඤ්චට්ඨංගිකං මග්ගං' ,, ,,

# ප්‍රකීර්ණ වර්ගය

# ගඞ්ගාරෝහණ කථාව

## 21 — 1

**එක් කලෙක විශාලා** මහානගරය ආහාරපාන වර්ගයන්ගෙන් හා ධන ධාන්‍යාදියෙන් කිසිත් අඩුවක් පාඩුවක් නැතිව පිරී සිටියේ ය. එසේ ම නොයෙක් ලෙසින් වත් පොහොසත්කම් ඇති මහාජනයාගෙන් අතුරු සිදුරු නැති සේ පිරී ගත්තේ ය. එහි වත් පොහොසත්කම් නැති දුකින් පෙළුනු එකද ගෙයෙක් නො වී ය. රජකම් කළ කැත් රජදරුවෝ ම සත් දහස් සත් සිය සත් දෙනෙක් වූහ. ඔවුනට වසන්නට එ පමණ ම ප්‍රාසාදයෝ, එ පමණ ම කූටාගාරයෝ, උයන් කෙළි කෙළිනට කළ එ පමණ ම පුෂ්පාරාම-ඵලාරාමයෝත් එ පමණ ම පොකුණුත් වූහ.

මෙසේ හැම දෑයෙකින් සමෘද්ධිමත් වූ මේ නගරය එක් කලෙකදී හැම යසිසුරෙන් ඈද වැටුනේ ය. හැම සැපතින් පිරිහී ගියේ ය. කෑම් බීම් ඇඳුම් පැළඳුම් කිසිවක් එහි නො වී ය. කුඹුරු වතු පිටි පාළු විය. සහල් කොටුගුල් සිස් විය. ගෙරිසරක් මැරී ගියේය. වැව් පොකුණු සිඳී ගියේ ය. මෙසේ සාය තර ව ගියෙන් කෑම් බීම් නො ලැබීමෙන් පළමු කොට දුප්පත් මිනිස්සු මිය ගියහ. මළකුණු දවාලන්නට වළ ලන්නට සොහොන් ගොච්චන් නො වූයෙන් ඒ ඒ තැන මැරී වැටුනු මිනී කුණුවල ගඳින් සතර දිගින් පැන ආ යක් රකුස් ඈ අමනුෂ්‍යයන්ගෙන් නගරය අතුරු සිදුරු නැතිසේ පිරී ගත්තේ ය. මෙසේ කඩා වැදුනු අමනුෂ්‍යයන් විසින් පෙළනු ලබන්නාහු තව තවත් මැරී වැටුනාහ. නො මැරී ඉතිරි වූ මිනිසුන් අතර කුණපගන්ධය තදින් පැතිර යෑමෙන් අහිවාතක රෝගය ද පැතිර ගියේ ය. මෙසේ මේ නගරය දුර්භික්ෂභය - අමනුෂ්‍යභය - රෝගභය යන තුන් බියෙන් එක් වරම පෙළෙන්නට වන.

එ කල්හි සත්තමකින් දිවි රඳවා ගෙණ නො මැරී හුන් නුවර වැසි මිනිස්සු එක් ව රජු වෙත ගොස් "මහරජ! දැන් මෙහි බිය තුනෙක් ඉස වසා නැගී ගොස් තිබේ, දිනපතා මැරෙණ මිනිසුන්ගේ ගණන සුලු නො වේ, මෙයට පෙර සත්වන රාජපරම්පරාව දක්වා මෙබඳු බිහිසුණු බියෙක් මෙහි නො ද උපන්නේ ය, දැහැමි රජුන් දවස මෙබඳු බියෙක් උපනැයි අපි නො දනුම්හ" යි දන්වා සිටියහ. එවිට රජ තෙමේ මන්ත්‍රණසභාශාලාවට හැම දෙනා රැස් කරවා "මා අත නො දැහැමි බවෙක් වේ නම්, නීති විරොධි - ධර්ම විරොධි රට නැසී යන පාලනයෙක් වේ නම්, මහා

ජනයාට අහිතකර පැණවූමෙක් වේ නම් එය සොයා බලා මට දන්වා ලවු" යි රැස් වූ මිනිසුනට දන්වා සිටියේ ය. මිනිස්සු ද නොයෙක් ලෙසින් පරීක්‍ෂා කරණුවෝ රජු අත කිසිත් දෙසක් නො දැක "මහරජ! දෙවයන් වහන්සේ අත කිසිත් දෙසෙක් නැතැ" යි දන්වා, නැවැත "අප රටට පැමිණි මේ විපත කෙසේ සන්සිඳුවා ගණිමු ද" යි සාකච්ඡා කළහ. ඒ සාකච්ඡායෙහිදී සමහර කෙනෙක් "දෙවියන්ට බිලියම් කරමු" යි ද, සමහර කෙනෙක් "දෙවියන්ට කන්නලව් කරමු" යි ද, සමහර කෙනෙක් "මහදෙවි ඇනට සෙත් කවි කියමු" යි ද නියම කොට ගෙණ තම තමන් අදහස් ලෙසින් ඇදහුම් ලෙසින් ඒ හැම එකක් කළහ. එහෙත් ඒ එකෙකිනුදු එක ද බියෙක් නො සන්සිඳුනේ ය.

මේ අතර සමහර දෙනෙක් එහි පැමිණ "පූරණකාශ්‍යපාදී ශාසතෘවරයෝ මහත් ආනුභාව ඇත්තාහ, මහත් තෙද ඇත්තාහ, උන්වහන්සේලා මෙහි වැඩමවා ගතහොත් ඒ ඇසිල්ලෙහි ම මේ හැම බිය සන්සිඳී යන්නේය" යි කීහ. එහි අන් කෙනෙක් "සම්මා සම්බුදුරජානන් වහන්සේ ලොව පහළව වැඩ සිටුනා සේක, උන් වහන්සේ වැඩමවා ගතහොත් මේ හැම උවදුරු සන්සිඳී යනු එකාන්ත ය, උන්වහන්සේ මහත් සෘද්ධි ඇති සේක, මහත් ආනුභාව ඇති සේක, සියලු සත්නට හිත පිණිස දහම් දෙසන සේක, උන්වහන්සේගේ හැම දේශනාවක් එලොව මෙලොව දෙකින් පැමිණෙන උවදුරු නැසීමෙහි පොහොසත් ය, එහෙයින් උන් වහන්සේ වැඩමවා ගණිමු" යි කීහ. මොවුන්ගේ මේ කතාවට කවුරුත් කන් නතු කොට "උන්වහන්සේ දැන් කොතැනක වසන සේක් ද" යි සොයා බැලූහ. මෙ දවස බුදුරජානන් වහන්සේ වස් වසන දවස් ලං ව තුබූ බැවින් වස් වසන තුරු රජගහ නුවර වෙළුවනාරාමයෙහි වැඩ විසූ සේක.

**බිම්බිසාර** මහරජතුමන් බුදුරජුන් දක්නට ගිය ගමනේ දී ඒ රජුන් හා එක් ව ගිය එහි දී බණ අසා සෝවන් පලයට පැමිණි **මහාලි** ලිච්ඡවි තෙමේ ද එහි රැස් වූ මහාජනයා කරණ කතාබස් අසමින් උන් අතර සිටියේ ය. විසල් පුර වැස්සෝ පඬුරු පාක්-කුඩම් මහත් රැසක් පිළියෙල කොට ඔහු අතට දී "බිම්සර රජුට දන්වා බුදුරජුන් වැඩමවා ගෙණ එන්නැ" යි මහාලි ලිච්ඡවීහු හා පෙරෙවි බමුණු පුතු රජගහ නුවරට යැවූහ. ඒ පිදිවිලි ද ගෙණ බිම්සර රජු වෙත ගිය ඒ දෙදෙන පිදිවිලි පුදා, විසල්පුර වැස්-සන්ගේ ඕනෑකමත් අදහසත් දන්වා විශාලානගරයට වැඩම වන්නට අප වෙනුවෙන් බුදුරජුන්ට ආරාධනා කරණු මැනැවැ" යි සැළකොට සිටියහ. එවිට බිම්සර රජ තෙමේ "තමුසේලා ම ඒ

කරගත යුතු ය'' යි කියා විශාලානගරයට වඩිනු පිණිස බුදු රජුන්ට ආරාධනා කරන්නට අකැමැත්ත දක්වී ය. ඉන්පසු ඒ දෙදෙන ම බුදුරජුන් වෙත ගොස් වැඳ ''සවාමීනි! විශාලානගරය දුර්භික්‍ෂභය - අමනුෂ්‍යභය - රොගභය යන තුන් බියෙකින් පෙළෙන්නේ ය, මේ නිසා දිනපතා එහි මැරී වැටෙනවුන්ගේ ගණන ඉතා බොහෝ ය, කියනු නො හැකි ය, කෑම් බීම් ඇඳුම් පැලඳුම් බෙහෙත් පිළියම් ලබා ගන්නට නො පිළිවන, ඒ කිසිත් එහි නැත, එහෙයින් අප කෙරෙහි අනුකම්පායෙන් අපේ නගරයට වැඩම කරණ සේක්වා, බුදුරජානන් වහන්සේ එහි වැඩම කළ සැටියේ සියලු උවදුරු සන්සිඳී යනු එකාන්ත යි එ නුවර වැස්සන් ගේ දුඞ පිළිගැණිම ය'' යි දන්වා සිටියහ.

එ කල්හි ඔවුන්ගේ බස් අසා බලා වදාළ බුදුරජානන් වහන්සේ ''විසල් පුරයෙහි රුවන්සුත දෙසූ ඇසිල්ලෙහි එහි අණ කෙළ ලක්‍ෂයක් සක්වල පැතිර සිටුනේ ය, එහි බලය මඞින්නට, එය ඉක්මවා යන්නට දෙවිබඹුන් ඈ කිසිවකුට නො හැකි ය, සුත් දෙසුම් අවසන්හි සුවාසූ දහසක් දෙනාට ධම්ාවබොධය වන්නේ ය, හැම බිය, හැම උවදුරු සන්සිඳෙන්නාහ'' යි දැන වදුරා ඔවුන් කළ ඒ ආරාධනාව පිළිගත් සේක. බිම්සර රජ ''බුදුරජුන් විසල් පුර වැස්සන්ගේ ආරාධනාව පිළිගත්නා ලදැ'' යි අසා නුවර වැස්සන්ට මංපෙත් ඉදි කොට සරසන්නට නියම කොට බුදුරජුන් වෙත එළැඹැ ''සවාමීනි! විසල් පුරයට වඩින්නට ආරාධනා පිළිගත් සේක් දැ'' යි විචාරා ''මහරජ! එසේ ය, පිළිගතිමි'' යි වදාළ කල්හි ''සවාමීනි! මදක් බලාපොරොත්තු වනු මැනවි, මග පිළියෙල කර ගත යුතු ය'' යි දන්වා රජගහ නුවරටත් ගඞගා නම් ගඟටත් අතර පස්යොදුන් පමණ බිම සම කරවා යොදුනෙන් යොදුනට නවාතැන් ගණු පිණිස විහාරත් පිහිටුවා බුදුරජානන් වහන්සේට වඩින්නට කල් දන්වා සිටියේ ය. ඉක්බිති උන්වහන්සේ භික්‍ෂූන් ද පන් සියයක් කැටු ව මගට පිළිපන් සේක. රජ තෙමේ බුදුරදුන් වඩනා එ මග සිරිපා තැබූ කල්හි දණ තෙක් එරෙණ පමණින් පස් පැහැති මල්විසුරුවා ධවජපතාකා නංවා කෙහෙල් තොරන් බන්දවා මග දෙපස පුන්කලස් තබ්බවා කුඩයක් මත කුඩයක් සිටිනා පරිද්-දෙන් කුඩ දෙකක් එක් කොට බුදුරජුන්හට සේසත් නංවා එක් එක් භික්‍ෂූන් වහන්සේ මතුයෙහි එක් එක් කුඩය සේසත් කොට නංවා පිරිවර සහිත ව සුවඳ මල් ආදියෙන් පුද දෙමින් බුදුරජුන් එක් එක් විහාරයෙහි වඩා හිඳුවා මහදන් පවත්වමින් පස් දවසකින් ගංඉවුරට වැඩම කරවා ගඟින් එතෙර වඩිනු පිණිස නැවක් ද පිළියෙල කරවූයේ ය. එසේ කොට රජ තෙමේ විසල්පුර වැසි යන්ට ''බුදුරජානන් වහන්සේ විසල්පුරයට වඩනා සේක, එහෙයින්

තොරන් බැඳ ධ්වජපතාකා නංවා පුන්කලස් තබ්බවා මල් විසුරුවා මග මැනැවින් සරසා පෙර ගමන් කොට උත්වහන්සේ පිළිගණිව්වු'' යි දන්වා යැවූයේ ය.

විසල්පුර වැස්සෝ ''බිම්සර රජු කළ තරමට වැඩිතරමින් පුද උලෙළ පවත්වමු'' යි විසල් පුරයටත් ගඞ්ගා නම් ගඟටත් අතර තුන් යොදුන් පමණ වූ බිම සම කරවා බුදුරජුන්ට කුඩ සතරක් ද එක් එක් භික්‍ෂූන් වහන්සේට කුඩ දෙක දෙක බැගින් දැයි කුඩ පිට කුඩ නංවා සරසා පුද පෙරහරින් අවුත් ගං ඉවුරෙහි සිට ගත්හ. බිම්සර රජු විසින් නැව් දෙකක් එක් කොට බඳවා පිළිසෙල කර වූ නැව මතුයෙහි මණ්ඩපයක් කරවා මල්දම් ආදියෙන් සරසවා එහි බුදුරජුන්ට වැඩ හිඳිනට සියල්ල රත්මුවා අසුනක් පණවා තුබුනේ ය. බුදුරජාණන් වහන්සේ එහි වැඩ හුන් සේක. භික්‍ෂූන් වහන්සේලා ද නැවට නැගී බුදුරජාණන් වහන්සේ පිරිවරා හුන්හ. නැව පිටත් වූ ය. රජ තෙමේ පසු ගමන් කරණුයේ කරවටක් දියට බැස ''ස්වාමීනි! භාග්‍යවතුන් වහන්සේ පෙරළා වඩින තුරු මම මේ ගංඉවුරෙහි ම හිඳින්නෙමි'' යි කියා නැවතුනේ ය. ශාස්තෘන් වහන්සේ යොදුනක් පමණ ගඟෙහි ගොස් විසල්පුර වැස්සන්ගේ නගර සීමාවට ලංවූ සේක. ලිච්ඡවි රජදරුවෝ කර-වටක් දියට බැස ශාස්තෘන් වහන්සේ වැඩම කළ නැව ඉවුරට ගෙණ අවුත් උත්වහන්සේ නැවෙන් ඉවුරට බස්වා ගත්හ. බුදු රජුන් නැවෙන් බැස ඉවුරෙහි පා තබත් ම මහමේ නැගී පොකුරු වැසි වසින්නට වන. රට පුරා හැම තැන දණ පමණ කලවේ පමණ උකුළු පමණ දියකඳ ගලා සියලු මිනීකුණු ගඟට ඇද දැමී ය. මුළුරට ගොඩබිම පිරිසිදු වූ ය ලිච්ඡවි රජදරුවෝ එ තැන් සිට ශාස්තෘන් වහන්සේ යොදුනෙන් යොදුන් තන්හි වඩා හිඳුවා මහදන් දී පුද පෙරහර වඩවඩාත් කරන්නාහු තෙ දිනෙකින් විසල් පුරයට වැඩමවා ගත්හ. සක්දෙව් රජ තෙමේ දෙව්ගණා පිරිවරා ගෙණ එහි ආයේ ය. මහතෙදැති දෙවියන් එහි එත් එත් ම අමනුෂ්‍යයෝ බොහෝ සෙයින් පලා ගියහ.

බුදුරජාණන් වහන්සේ සවස නුවර දොර සිට ''ආනන්ද! මේ රුවන් සුත උගෙණ ලිච්ඡවි කුමරුන් සමඟ ගොස් විසල් පුර තුන් පවුරු වළලු අතර පිරිත් කරව''යි අනඳ තෙරුන්ට නියම කළ සේක. ආනන්ද ස්ථවිරයන් වහන්සේ බුදු රජුන් වදාළ රුවන් සුත උගෙණ බුදුරජුන්ගේ සෙල්මුවා පාත්‍රයෙන් දිය ගෙණ නුවර දොර සිට දිව්කුරු බුදු රජුන්ගෙන් විවරණ ලත් තැන් පටන් අප බුදු රජුන්ගේ දසපාරමී – දස උපපාරමී – දසපරමත්ථපාරමී – පඤ්ච-මහාපරිච්චාග – ලෝකත්ථචරියා – ඤාතත්ථචරියා – බුද්ධචරියා –

පශ්චිමභවයෙහි මවුකුසැ පිළිසිඳ ගැණීම – මවුකුසින් බිහිවීම – මහබිනික්මන් කිරීම – ප්‍රධන්වීර්‍ය – බෝමැඩ කළ මාරවිජය – සව්නේ දත් නුවණ ලැබීම – නවලොවුතුරු දහම යන සියලු බුදුගුණ ගැණ සලකා නුවරට ඇතුළු ව තුන් යම් රෑ මුළුල්ලෙහි තුන් පවුරු අතර පිරිත් කරමින් හැසුරුණාහ. අනඳ තෙරුන් විසින් ඒ රුවන් සුතුරෙහි එන **"යං කිඤ්චි විත්තං"** යනාදී ගාථායෙහි ආදියෙහි ම වූ **"යං කිඤ්චි"** යනු වදළ ඇසිල්ලෙහි උඩට දමාලූ පිරිත් දිය ඉතිරි ව රැඳී හුන් අමනුෂ්‍යයන්ගේ හිස මතුයෙහි වැටුනේ ය. එහි තෙවන ගාථායෙහි පටන් රිදී බුබුලු වැනි දිය බින්දු අහස නැගී අවුත් ගිලන් මිනිසුන් මතුයෙහි වැටින. එ කෙණෙහි ම ලෙඩින් නැගී සිටි මිනිස්සු හුන් තැනින් නැගිට නැගිට අවුත් තෙරුන් පිරිවරා ගත්හ. පලා නො ගොස් හුන් අමනුෂ්‍යයෝ ද "යං කිඤ්චි"යි වදළ පදයෙහි පටන් පිරිත් දිය බිඳු ඇඟ වැටීමෙන් තැති ගත්තාහු බිත්තිකොන් කසළගොඩ ගේපිළිකන් ආදිය ඇසුරු කොට සිටියාහු ඒ ඒ දොරටුවෙන් පලා ගියහ. පලා යන්නට දොරටු පමණ නො වූ බැවින් පවුරු වළලු ආදිය බිඳ ගෙණ දුවන්නට වූහ.

ඉක්බිති විසල්පුර වැස්සෝ නුවර මැද සන්ථාගාරශාලාව සුවඳ පිරිබඩ කොට මත්තෙහි රත්තරු ආදියෙන් විසිතුරු වූ නන් පැහැති පටකඩ වියන් බඳවා වැඩ හිඳිනට නිසි බුද්ධාසනයක් පණවා එහි වඩින්නට බුදුරජුන්ට ආරාධනා කළහ. උන්වහන්සේ එහි පණවා තුබූ අසුනෙහි වැඩහුන් සේක. භික්ෂු සඞ්ඝයා වහන්සේත් ලිච්ඡවී සමූහයාත් උන්වහන්සේ පිරිවරා හුන්හ. සක්දෙව් රජ තෙමේ ද දෙවසමූහයා විසින් පිරිවරණ ලදු ව තමන්ට සුදුසු තැනක් ගෙණ සිටියේ ය. ආනන්ද ස්ථවිරයන් වහන්සේ මුළු නුවර හැසිර සන්හුන් ලෙඩරොග ඇති මිනිසුන් සමග අවුත් බුදුරජුන් වැඳ එකත් පසෙක හුන්හ. එ වේලෙහි බුදුරජාණන් වහන්සේ පිරිස දෙස බලා එහි දී රුවන්සුත ම දෙසූ සේක. දෙශනාවසානයෙහි අසූසාර දහසක් සත්නට ධර්මාවබොධය වූයේ ය.

මෙසේ සත් දවසක් රුවන්සුත දෙසා විසල්පුර වැස්සන්ගේ සියලු බිය මුළුමනින් සන්සිඳවා ලිච්ඡවි සමූහයා අමතා තමන් වහන්සේ පෙරළා වඩනා බව ඔවුනට දන්වා විසල්පුරයෙන් නික්ම ගත් සේක. ලිච්ඡවීහු ද හැකි තරමින් වඩා පුද උළෙළ පවත්වා උන්වහන්සේ තෙ දිනකින් ගං ඉවුරට පමුණුවාලූහ. එ වේලෙහි ගඟ පත්ලෙහි හුන් නා රජහු "මිනිස්සු තථාගතයන් වහන්සේට පුද උළෙළ පවත් වත්නාහ, අපි කුමක් කරමු දැ"යි සිතා රන් රිදී මිණි මුවා නැව් මවා එහි අසුන් පණවා ගඟදිය පස්පැහැති පියුමෙන් සරහා "ස්වාමිනි! අපටත් අනුග්‍රහ කර වදරණ සේක්වා"යි තම

තමන්ගේ නැව්වලට නගින ලෙසට බුදුරජුන්ගෙන් ඉල්ලා සිටියහ. මිනිසුන් හා නා රජුන් කරණ පුද උලෙළ දුටු බූමාටු දෙවියන් ආදි කොට අකනිටා බඹලොව තෙක් පැතිර හුන් සියලු දෙවියෝ නොයෙක් ලෙසින් පුදපෙරහර පැවැත් වූහ. එහි දිව්‍ය නාගයෝ නාග භවනය පටන් යොදුනක් පමණ තැන් කුඩසේසත් මතුයෙහි කුඩසේසත් නැගුහ. මිනිස්ලොවට පහත්තල වැසි නාගයෝ ද එසේ කළහ. බූමාටු දෙවියෝ පොළොවෙහි හා ගස් ගල් කඳුහෙල් ආදියෙහි ද, අහස් වැසි දෙවියෝ අහසෙහි දූ යි මෙසේ දිව්‍ය බ්‍රහ්ම නාගයෝ, නාගභවනය පටන් සක්වළ කෙළවර බඹලොව තෙක් සේසත් මතුයෙහි සේසත් නගාලූහ. සේසත් අතුරෙහි සේසත්, ධවජ අතුරෙහි ධවජ, පතාකා අතුරෙහි පතාකා නැගුහ. පතාකා අතුරෙහි මල්දම් මල්කලස් මල්ලිය තැබූහ. සියලු අබරණින් සැරසුනු දිව්‍යපුත්‍රයෝ සැණවෙස් ගෙණ බුදුරජුන්ට සතුතිඝොෂා පවත්වමින් අහසෙහි හැසුරුණහ. බුදුරජානන් වහන්සේ පිළිබඳ **යමකසාම්භාර්ය** – **දෙවොරෝහණ** - **ගඞ්ගාරෝහණ** යන සමාගම්හි දෙවි බඹ මිනිස් ආදීන්ගේ රැස්වීම ඉතා මහත් ව ගියේ ය.

මෙසේ බුදුරජාණන් වහන්සේ විශාලාමහානගරයෙහි පැන නැගුනු තෙ වැදූරුම් බිය උවදුරු මුළුමනින් සන්සිඳවා පෙරළා වඩිනු බලා සිටි බිම්සර රජ තෙමේ ලිච්ඡවීන් විසින් කරණ ලද පුද පෙරහැරට වඩා ඉතා මහත් වූ පුදපෙරහැර පිළියෙල කෙළේ ය. බුදුරජාණන් වහන්සේ ගඟ දෙපස රජුන් කළ මහත් පරිත්‍යාග බලා නා රජුන්ගේ අදහස් දැන නැව් පන් සියයක් මවා එක එක නැවෙහි පන් සියය පන් සියය භික්ෂූන් පිරිවර කොට ඇති බුදුවරුන් පන් සියයක් මවාලූහ. එක් එක් සේසත යට එක් එක් කප්රුක යට එක් එක් මල්දම යට නයින් පිරිවරා වැඩ හුන් සේක. එ සේ ම බූමාටු දෙවියන් පටන් අකනිටා බඹලොව දක්වා එක් එක් අවකාශයෙහි පිරිවර සහිත කොට බුදුවරුන් මවා පෑ සේක. මුළු සක්වල ගබ එක් ම සැරසුම් ඇත්තක් එක් ම උලෙළ ඇත්තක් එක් ම සැණකෙළි ඇත්තක් වූ කල්හි නයින්ට අනුග්‍රහ කරණු පිණිස එක් රුවන් නැවකට නැගි සේක. භික්ෂූන් වහන්සේලා අතුරෙහිදු එක් එක් නම එක් එක් නැවට නැංගේ ය. නා රජහු බුදුපාමොක් මහසඟුන් නාග භවනයට පමුණුවා මුළු රැය බුදුරජුන් වෙත හිඳ දහම් අසා පසුදා බුදුපාමොක් හැම දෙනා වහන්සේ දෙවියන් අයත් කෑයුතු බිදිය යුතු දෑයෙන් වැළඳ වූහ. බුදුරජාණන් වහන්සේ අනුමෙවෙනි බණ වදුරා නාගභවනයෙන් නික්ම සියලු සක්වල වැසි දෙවියන් විසින් පුදනු ලබන සේක් මැවූ නැව් පන් සියයෙන් ගඞ්ගා නදිය තරණය කොට මෙතරට වැඩි සේක. රජ තෙමේ පෙර ගමන් කොට බුදුරජුන් නැවෙන් බස්වා ගෙණ එනුයේ ලිච්ඡවීන් කළ

සත්කාරයනට වඩා දිගුණ තිගුණ කොට පුද සැලකිලි පවත්වා යට කියූ ලෙසින් පස් දවසෙකින් රජගහනුවරට වැඩමවා ගත්තෝ ය.

පසුදා පිඩු සිඟා ගොස් පෙරළා පැමිණි මහාසඞ්ඝයා වහන්සේලා දම්සබා මඩුයෙහි රැස්ව හිඳ "අය්යෝ; පුදුම ය, බුදුරජුන්ගේ මහානුභාව ය, අහෝ; පුදුම ය, ශාස්තෲන් වහන්සේ කෙරෙහි දෙව්මිනිසුන් තුළ ඇති මහත් ප්‍රසාද ය, ගඞ්ගා නදියෙහි එ ගොඩ මෙ ගොඩ දෙක්හි අට යොදුන් මග බුදුරජුන් කෙරෙහි වූ ප්‍රසාදයෙන් රජුන් විසින් පොළොව සම තලා කොට සැම තැන වැලි විසුරු වන ලද ය, මග සැම තැන දණක් පමණට නන් පැහැති මල් අතුරණ ලද ය, ගඞ්ගා නදියෙහි දිය කඳ නයින්ගේ ආනුභාවයෙන් පස් පැහැති පියුමෙන් ගැවසී ගත්තේ ය, නාලොව පටන් අකනිටා බඹලොව දක්වා සේසත් මතුයෙහි සේසත් නගන ලද ය, මුළු සක්වල ගබ එක් ම සැරසුම් ඇත්තක් එක් ම උලෙළ ඇත්තක් වී ය" යි කතා කරමින් හුන්හ. එ වේලෙහි එහි වැඩම කළ බුදුරජානන් වහන්සේ භික්ෂූන් කළ ඒ කතාව විචාරා දැන "මහණෙනි! මේ පූජාසත්කාරය මාගේ බුද්ධානුභාවයෙන් වූයේ නො වේ, නා දෙව් බඹුන්ගේ ආනුභාවයෙන් නිපන්නේ නො වේ, මා පෙර සසර ඇවිදුනා කාලයෙහි කළ ස්වල්පමාත්‍රපරිත්‍යාගයක අනුසස් බෙලෙන් මේ උපනැ"යි වදළ විට භික්ෂූන් විසින් ආරාධිත වූ සේක් ඒ ඉකුත් වත මෙසේ වදාළසේක.

"යටගිය දවස තක්සලානුවර **සඞ්ඛ** නම් බ්‍රාහ්මණයෙක් වූයේ ය, ඔහුගේ පුත් වූ සොළොසැවිරිදි **සුසීම** නම් මාණව තෙමේ දවසක් පියා වෙත ගොස් 'පියාණෙනි! මම බරණැසට ගොස් වෙද මන්ත්‍ර හදාරන්නට කැමැත්තෙමි'යි කීය, 'පුත! එසේ නම් අසුවල් බ්‍රාහ්මණ තෙමේ මාගේ යහළුවෙක, ඔහු වෙතට ගොස් වෙදමන්ත්‍ර හදාරව'යි කීය, සුසීම ද යහපතැ'යි කියා බරණැසට ගොස් ඒ බමුණා සොයා ගෙණ බමුණා වෙත ගොස් මාගේ පියාගේ නියමයෙන් ඔබතුමන් වෙත ආයෙමි'යි කී ය, එ බමුණු ද 'මාගේ යහළුවාගේ පුත්'යි ඔහු සතුටින් එහි රඳවා ගෙණ ගමන් විඩා සන්සිඳී ගිය කල්හි සුබ නැකතක් අල්ලා වෙදමන්ත්‍ර හදාර වන්නට පටන් ගත්තේ ය, නුවණැති හෙතෙමේ වහවහා බොහෝ කොටත් උගත්තේ උගත් උගත් මන්ත්‍ර රන් බඳුනෙක ලූ සිංහතෙලක් මෙන් නැසී යන්නට නො දී මැනැවින් දරණුයේ නො බෝ දවසකින් ම ගුරුන් වෙතින් උගත යුතු සියල්ල උගෙණ පිරිවහන්නේ තමන් උගත් වෙදමන්ත්‍රාදියෙහි මුල-මැද දක්නේ වී ය, කෙළවර නො දක්නේ ගුරුන් වෙත එළැඹ 'ඇදුරුතුමනි! මට

මා උගත් වේදමන්ත්‍රාදියෙහි මුල හා මැද පෙණෙන්නේ ය, එහෙත් කෙළවර නො පෙණෙන්නේ ය'යි කීයේ ය, එකල්හි ඇදුරු බමුණු 'පුත! මටත් ඔබට මෙන් මෙහි කෙළවර නො පෙණෙන්නේ ය'යි කී කල්හි 'මෙහි කෙළවර කවරෙක් දනී දැ'යි ඇසී ය, 'පුත! ඉසිපතනයෙහි වසන ඍෂිවරයෝ මේ දන්නෝ ය, ඔවුන් වෙත ගොස් ඔවුන් විචාරව යි ඇදුරු බමුණු කී ය, ඉක්බිති සුසීම ඉසිපතන යට ගොස් එහි හුන් පසේ බුදුවරුන් වෙත එළැඹ 'ස්වාමීනි! මම වේදමන්ත්‍රාදිය උගත්තෙමි, එහෙත් මට පෙණෙනුයේ එහි මුල - මැද පමණ ය, කෙළවර නො පෙණේ, ඔබ වහන්සේලා එහි කෙළවර දන්නා සේක් දැ?'යි අසා සිටියේ ය, උන්වහන්සේලා 'දනිමු' කී කල්හි 'එසේ නම් මට එහි කෙළවර කියා දෙනු මැනැවැ'යි සුසීම ඉල්ලා සිටියේ ය, 'නො පැවිදි වූවනට අපි එය කියා දෙන්නෝ නො වෙමු, අප මෙන් ඔබත් පැවිදිවෙතොත් කියා දෙනු හැකි ය, පැවිදි වන්නැ'යි පසේබුදුවරු කීහ, සුසීම 'යහපතැ'යි එ බස් පිළි ගෙණ පසේබුදුවරුන් වෙත පැවිදි වී ය, පැවිදි වූ ඔහුට 'තා විසින් මෙසේ හික්මිය යුතු ය, මෙසේ හැන්ද යුතු ය, මෙසේ පෙරවිය යුතු ය, හිඳිය යුතු ය, සිටිය යුතු ය, වැළඳිය යුතු ය, පිය යුතු ය, යනාදීන් පළමු කොට ආභිසමාචාරිකශික්ෂාව කියා දුන්හ, හේ ආභිසමාචාරිකශික්ෂායෙහි හික්මෙනුයේ හෙතුසම්පන්න බැවින් වැඩි දවස් නො යවා ම ප්‍රත්‍යෙකසම්බොධිඥනය ලබා මුළු බරණැස අහස් තලයෙහි පුන්සඳ මෙන් පතළ වූයේ ලාභයෙන් හා යශසින් අගතැන් පත් වී ය, මේ පසේ බුදු රජ තෙමේ ලාභයෙන් යශසින් අග තැන් පත් වූයේ ද පෙර මද ආයු දෙන කර්මයක් කොට සිටි බැවින් නො බෝ දවසින් ම පිරිනිවියේ ය, එහි විසූ අනෙක් පසේ බුදුවරු හා මහාජනයා ද එක් ව ආදහනය කොට ධාතූන් ගෙණ නුවර දෙර සෑයක් කොට එහි පිහිටුවා ලූහ.

සඬ්ඛබ්‍රාහමණ තෙමේ 'මපුත් වේද උගන්නට ගොස් බොහෝ කල් ගත විය, එහෙත් ඔහු ගැණ කිසිත් තොරතුරෙක් මෙතෙක් දැන ගන්නට නො ලැබිනි, එහෙයින් මම ගොස් ඔහු ගැණ සොයා බලා එන්නෙමි' යි තක්සලානුවරින් නික්ම ගියේ බරණැසට පැමි-ණියේ ය, එහි දී මහාජනයා රැස් ව හුන් තැන් බලා ගොස්, 'මේ පින්වතුන් අතුරෙහි කවරෙක් හෝ මපුත් ගැණ දන්නේ වනැ' යි සිතා උන් උන්ට ලං ව, සුසීම නම් බ්‍රාහමණ තරුණයෙක් තක්සලා-යෙන් වේද උගන්නට කලකට පෙර මෙහි පැමිණියේ ය, මෙහි පැමිණියාට පසු ඔහු ගැණ කිසිවක් දැන ගන්නට නො ලැබුනු බැවින් මම ඔහු සොයා ආයෙමි' මේ අය ඔහු ගැණ දනිත් දැ' යි ඇසී ය, 'ඔවු අපි දනිමු, ඔය කියන තරුණයා අසුවල් බමුණු වෙත වේදමන්ත්‍ර උගෙණ හඳුරා නැවැත පැවිදි ව පසේ බුදුබවත් ලබා

පසුගියදු ඉසිපතනයෙහි දී පිරිනිවී ය, අපි එකතු ව ඒ සිරුර දවා ධාතූන් ගෙණ අර පෙණෙන සෑය බන්දවා එහි තැන්පත් කෙළෙමු' යි ඔවුහු සෑය පෙන් වූහ.

සඞ්ඛබ්‍රාහමණ තෙමේ මෙ පුවත අසා බිම ඇද වැටී අතින් පොළොවට ගසමින් හඬ හඬා ඒ සෑබිමට ගොස් එහි තණ පැලැටි උදුරා දමා උතුරුසළුවෙන් වැලි ගෙණවුත් සෑබිමෙහි විසුරුවා කෙණ්ඩියෙන් දිය ගෙණ සෑබිම ඉස දූලි මකා සෑය වනපසමලින් පුදා උතුරුසළුව පතාකාවක් කොට පුදා තමන් අත තුබූ පත්කුඩය දාගැබ මතුයෙහි බැඳ තබා දාගැබ පැදකුණු කොට වැඳ ගියේ ය'' යි.

බුදුරජානන් වහන්සේ මෙසේ මේ ඉකුත් පුවත වදාරා ''මහණෙනි! එදා සඞ්ඛ බ්‍රාහමණ වූයෙම් මම වෙමි, එදා මම සුසීම පසේ බුදුන්ගේ දාගැබ පිහිටි බිම තණ පැලැටි උදුරා හැර පිරිසිදු කෙළෙමි, ඒ පිණෙහි විපාක විසින් අට යොදුන් දිග් මග තුබූ කණු කටු උදුරා දමා පිරිසිදු කොට මොවුහු මග සම තලා කළහ, වැලි ගෙණවුත් සෑමිදුලෙහි විසිරූ වූ පිණෙන් අට යොදුන් මග වැලි විසිර වූහ, එහි වනපසමලින් කළ පූජායෙහි පිණෙන් මොවුහු අට යොදුන් මග නන් පැහැති මලින් දණ දක්වා එරෙණ තරමින් පුරවා ලූහ, එක් යොදුන් පමණ තැන ගඟ දිය පස් පැහැති පියුමෙන් ගැවසුනේ ද එම පිණෙන් ය, මම එදා කෙණ්ඩියෙන් දිය ගෙණ ඒ සෑමිදුලෙහි ඉසීමි, ඒ පිණෙහි පල විසින් විසල්පුර පොකුරු වැසි වට, මම එහි පතාකාවක් නගා කුඩයක් කොත් කැරල්ලෙහි බැන්දෙමි, ඒ පිණෙන් අකනිටා බඹලොව දක්වා ධවජ–පතාකා–සේසත් මත සේසත් නැගීම් බැඳීම් ආදියෙන් මුළුසක්වලගබ එක් ම උලෙළ ඇත්තක් සේ වි ය, මහණෙනි! මේ මා ලත් පූජාසත්කාරය බුඬ්ධානුභාවයෙන් ලද්දේ නො වේ, පෙර මා කළ සවල්පමාත්‍ර වූ පරිත්‍යාගයෙහි ආනුභාවයෙන් මේ ලදූ'' යි වදාරා මේ ධර්මදෙශනාව කළ සේක.

**මත්තාසුඛපරිච්චාගා පස්සෙ චෙ විපුලං සුඛං,**
**චජෙ මත්තාසුඛං ධීරො සම්පස්සං විපුලං සුඛනති.**

ඉදින් ඉතා මද සැපයක් අත් හැරීමෙන් මහත් සැපයක් දක්නේ නම් ඒ මහත් සැපය මොනවට දක්නා වූ නුවණැති පුරුෂ තෙමේ ඉතා මද සැපය අත් හරණේ ය.

**මත්තාසුඛපරිච්චාගා** = මද සැපය අත්හැරීමෙන්.

මෙහි සවල්පාර්ථවාචක වූ **'මත්තා'** යනු උපකරණ – පරිමාණ – ධන – අක්‍ෂරාවයව – හ්‍රසවදීර්ඝාදිභෙද – කාලවිශෙෂ යනාදී අරුත්හි ද යෙදෙන්නේ ය. ලිඞ්ග විසින් සත්‍රී – නපුංසක දෙක්හි ප්‍රකට ව දක්නට ලැබේ.

**පස්සෙ චෙ විපුලං සුඛං** = ඉදින් මහත් සැපයක් දක්නේ නම්.

ඉතා මදසැපයක් හැර දැමීමෙන් මහත් සැපයක් ලැබිය හැකි නම් යුතුකම වනුයේ මද සැපය හැර දැමීම ය.

"න ස්වල්පස්‍ය කෘතෙ භූරි නාශයෙන්මතිමාන්නරඃ
එතදෙවාත්‍රපාණ්ඩිත්‍යං යත්ස්වල්පාද්භූරිරක්‍ෂණම්"

යන මෙ ද සිත්හි තගන්නේ ය. නුවණැති මිනිස් ටික දෑයක් නිසා මහත් දෑය නො නසන්නේ ය. ටික දෑය හැරදමා මහත් දෑය රැකීම ම නුවණැතිබවය යනු අදහසි. මේ වනාහි නුවණැති ලොකයාගේ පිළිගැණීම ය.

එදා සඞ්ඛ බ්‍රාහමණ ව උපන් බුදුරජානන් වහන්සේ 'පෙරවගන්නට නැතැ' යි නො සිතා වෙත තුබූ එක් ම උතුරුසළුව හා 'අව්වෙන් පෙළෙන්නෙම් වේ දැ' යි නො සිතා පත්කුඩය පිදීමත්, දෑගැබ් මලුවෙහි නැගී තුබූ තණ පැලැටි උදුරා වැලි ගෙණ අවුත් විසුරුවා දෑගැබ්මලු ව පිරිසිදු කිරීමත්, වනපසමලින් දෑගැබ පිදීමත් යන මේ ඈ පින්කම් පිරිසිදු සිතින් කළ බැවින් අන් කිසිවක්හටත් නො ලැබුනු මහත් පූජාසත්කාරයනට පාත්‍ර වූ සේක. මේ බලත්, ඉතා සුළු පින්කමක් වුවත් සුළු කොට ගැණීම සුදුසු නො වේ යි කිය යුතු ය. සුළු පින්කමින් මහත් සැපයක් ලැබිය හැකි බව මේ ගඞ්ගාරොහණ සමාගමයෙන් පැහැදිලි වන්නේ ය. මෙහි චතුර්දශතරඞ්ගයෙහි එන දනකථාව බලනු.

මෙහි මහත් සැපය, යි ආයේ නිවන් සැප ය යි. එක් බත් තැලියක් පිළියෙල කරවා ගෙණ වළඳන්නහුට ඉතා මද සැපයෙක් ම උපදනේ ය. එය හැර දමා පෙහෙවස් රක්නහුට හෝ දන් දෙන්නහුට මහත් වූ නිවන් සැපය පිණිස මග පිළියෙල වන්නේ ය. එහෙයින් මෙසේ සුළු සැපය හැරදැමීමෙන් මහත් වූ නිවන් සැපය ලැබිය හැකි බව දතයුතු ය.

**චජෙ මත්තාසුඛං ධීරො සම්පස්සං විපුලං සුඛං** = මහත් සැපය මොනවට දක්නා වූ නුවණැති පුරුෂ තෙමේ සුළු සැපය හැර දමන්නේ ය.

නුවණැත්තහු විසින් මහත් සැපයෙක් ම බලාපොරොත්තු විය යුතු ය. ඔහු විසින් සුළු සැපය හළ යුතු ය. මහත්සැපය හැර මද සැපයක් බලාපොරොත්තු වනුයේ නුවණැත්තේ නො වේ.

**ධීර** නම්: මෙහි මද සැපය හැර මහත් සැපය බලාපොරොත්තුවන්නේ ය.[1] **විපුලං, සුඛං** යන දෙපදයෙන් දැක්වුනේ නුවණැත්තහු විසින් බලාපොරොත්තු විය යුතු වූ උදාර සැපය වන නිවන් සැපය යි.[2]

**ගඞ්ගාරොහණවස්තුව නිමි.**

---

1. 2. 1 'දුස්සාහි ධීරා' යනු බලනු.
2. 14 6. 'දුක්ඛස්ස ච අතික්කමං' ,, ,,

# කුකුළුබිත්තර කෑ දැරිය

## 21 — 2

**සැවැත්** නුවරට නො දුරෙහි **පණ්ඩුපුර** නම් ගමෙක් වූයේ ය. එහි එක් කෙවුල් මිනිසෙක් වාසය කෙරෙයි. ඔහු එක් දවසක් සැවැත් නුවරට යන ගමනක දී අචිරවතී ගඟබඩින් කැසුබු බිත්තර කිහිපයක් ගෙණ සැවැත් නුවරට ගොස් එහි ගෙයක රැඳී ඒ බිත්තර තම්බවා කන්නේ එයින් එකක් එහි සිටි දැරියකට ද දුන්නේ ය. ඕ තොමෝ එය කෑ තැන පටන් අනික් දෑයක් කන්නට නො කැමැති වූවා ය. එහෙයින් ඈයගේ මවු තොමෝ කිකිළියක බිත්තර ලූ තැනකින් බිත්තරයක් ගෙණවුත් ඈයට දුන්නී ය. කුකුළුබිත්තරය කෑ ඕ තොමෝ රසතෘෂ්ණායෙහි බැඳුනී එතැන් පටන් තමා ම ගොස් බිත්තර ගෙණවුත් කන්නී ය. බිත්තර ලන කිකිළිය ද දින පතා බිත්තර ගෙණ යන මැය කෙරෙහි මද හැඟුම් ඇති ව තම බිත්තර ගෙණ ගොස් තම්බා කන මේ දැරිය කෙරෙහි වෛර බැඳ, "මම මැරී ගොස් යකින්නක ව මැයගේ දරුවන් කන්නට පොහොසත් ව උපදිම්වා" යි පතා සිට මැරී ගොස් එම ගෙයි ම බැළල් ව උපන්නී ය. බිත්තර කෑ දැරිය මිය ගොස් එහි ම කිකිළි ව උපන. ගෙයි උපන් ඒ කිකිළිය ලන හැම බිත්තර බැළල අවුත් කන්නී ය. බැළල මෙසේ දෙ තුන් වරක් ම බිත්තර කෑවා ය. ඒ ගමනේ කිකිළිය "තෙ වරක් ම මා දෑමූ බිත්තර කෑ මෝ දැන් මාත් මරා කනු කැමැත්තී ය, මෙයින් මැරී ගොස් පැටවුන් සහිත වූ මැය මරා කන්නට මටත් පිළිවන්කම ලැබේවා" යි සිතන්නී මැරී ගොස් ඒ අසල දිවි-දෙනක් ව උපන. බැළල ද මිය ගොස් මුවදෙන් ව උපන. මුවදෙන දරුවන් වැදූ කල්හි දිවිදෙන අවුත් පැටවුන් සමග මුවදෙන ද මරා කෑවා ය.

මෙසේ මොවුහු පන් සියයක් අත්බව්හි උනුන් කමින් මරමින් අන්හට දුක් දෙමින් එන්නාහු මේ අත්බවෙහි එකියක් යකින්නක් ව ද එකියක් සැවැත් නුවර කුලදුවක් ව උපන. මේ කතා පුවතෙහි සෙස්ස **ප්‍රථමතරඞගයෙහි** සිවුවන කතායෙහි කියූ ලෙසින් දත්-තේ ය. මෙහි දී ද බුදුරජානන් වහන්සේ "වෛරය මෛත්‍රියයෙන් සන්සිඳෙන්නේ ය, වෛරය වෛරයෙන් නො සන්සිඳෙන්නේ ය" යි වදූරා දෙදෙනාහට ම මේ ධර්මදේශනාව කළ සේක.

**පරදුක්ඛූපදානෙන අත්තනො සුඛමිච්ඡති,**
**වෙරසංසග්ගසංසට්ඨො වෙරා සො න පරිමුච්චතීති.**

අන්හට දුක් දීමෙන් (යමෙක්) තමාට සුව කැමැති වේ ද, හෙතෙමේ වෛර සංසර්ගයෙන් මිශ්‍රවූයේ වෛරයෙන් නො මිදෙමින්නේ ය.

**පරදුක්ඛූපදානෙන අත්තනො සුඛං ඉච්ඡති** = අන්හට දුක් දීමෙන් (යමෙක්) තමාට සුව කැමැති ද.

**වෙරසංසග්ගසංසට්ඨො වෙරා සො න පරිමුච්චති** = හෙතෙමේ වෛරසංසර්ගයෙන් මිශ්‍ර වූයේ වෛරයෙන් නො මිදෙන්නේ ය.

අන්හට දුක් දීමෙන් යමෙක් මෙලොව සුව විඳුනා කැමැති වේ ද, බැන්නවුනට බැණීමෙන් ඇන්නවුනට ඇණීමෙන් පහරවුනට පැහැරීමෙන් මැරීමෙන් යන මේ ඈලෙසින් උපන් වෛරයෙන් තදබද වූ වෛරයෙන් ඉල්පුනු වෛරයෙන් සැඩ වූ වෛරයෙන් කුළු වූ මිනිස් තෙමෙ කවරදකත් වෛරයෙන් නො ද මිදෙන්නේ ය. වෛරය නිසා හැමදා දුකට වැටෙන්නේ ය. ගින්න දිය ඇති තැනට පැමිණීමෙන් නිවී යන්නා සේ මහත් වූ වෛර ගින්න බුදුරජුන්-වෙත පැමිණ නිවී යන්නේ ය.

වෛර නම්: නව ආඝාතවස්තූන් නිසා උනුන්ගේ සිත්තුළ උපදනා සැඩබව ය. ඒ වනාහි දඬු පහර ලත් නයකු සේ අනිටු අරමුණු ලැබීමෙන් සිත කෙලෙසන්නේ ය.[1]

ධර්මදෙශනාවගේ අවසානයෙහි යකින්න සරණසීලයෙහි පිහිටා පන්සිල් සමාදන් ව ගෙණ වෛරයෙන් මිදුනා. අන් එකිය ද සෝ-වන් පලයෙහි පිහිටා ගතු. ධර්මදෙශනා තොමෝ පැමිණ සිටි පිරි-සට ද වැඩ සහිත වූ ය.

**කුක්කුටණ්ඩඛාදිකාවස්තුව නිමි.**

1. 1. 4. 'න හි වෙරෙන වෙරානි' යනු බලනු.

# නො කටයුත්තෙහි යෙදුනු භික්ෂූන් වහන්සේලා

## 21 — 3

භද්දිය නුවර වැසි භික්ෂූන් වහන්සේලා වහන් මරවැඩි සැරසීමෙහි යෙදී වාසය කළහ. එහෙයින් විනයයෙහි "එකල්හි භද්දිය භික්ෂූන් වහන්සේලා නොයෙක් ලෙසින් වහන් සැරසීමෙහි යෙදී වෙසෙත්, තණවහන් කෙරෙත්, අන්හු ලවා ද කරවත්, මුදුතණවහන් කරත්, කරවත්, බබුස්තණවහන් කරත්, කරවත්, කිතුල් කොළ වහන් කරත්, කරවත්, කමලතණවහන් කරත්, කරවත්, පලස්වහන් කරත්, කරවත්, උදෙසීම්, පිළිවිසීම් නො කෙරෙත්, අධිශීලය අධිචිත්තය අධිප්‍රඥාව සිස් කෙරෙත්"යි කියන ලදී.

අන්‍ය භික්ෂූන් වහන්සේලා භද්දිය භික්ෂූන් මෙසේ කරණ බව දැන නින්දා පරිභව කොට බුදුරජාණන් වහන්සේට එබව සැල කළහ. එකල්හි උන්වහන්සේ ඒ භික්ෂූන්ට ගරහා "මහණෙනි! තමුසේලා අන් වැඩක් කරන්නට ගොස් අන් වැඩක ම යෙදුනාහු"යි වදාරා මේ ධර්මදේශනාව කළ සේක.

**යං හි කිච්චං තදපවිද්ධං අකිච්චං පන කයිරති,**
**උන්නලානං පමත්තානං තෙසං වඩ්ඪන්ති ආසවා.**

**යෙසඤ්ච සුසමාරද්ධා නිච්චං කායගතා සති,**
**අකිච්චං තෙ න සෙවන්ති කිච්චෙ සාතච්චකාරිනො,**
**සතානං සම්පජානානං අත්ථං ගච්ඡන්ති ආසවාති.**

යමක් කටයුතු නම් එය හැරපියන ලද ද, නො කටයුත්ත වනාහි නො කෙරේ ද උසස් වූ මානනල ඇති ප්‍රමාදී වූ ඔවුන්ගේ ආස්‍රවයෝ වැඩෙන්නාහ.

යම් කෙනෙකුන් විසින් කායගතාසතිය නිතර මනා කොට වඩනා ලද ද කටයුත්තෙහි සතත ක්‍රියා ඇති ඔවුහු නො කටයුතු දැය නො කෙරෙත්. සිහි ඇති මනා නුවණැති ඔවුන්ගේ ආස්‍රවයෝ විනාශයට යෙත්.

**යං හි කිච්චං තං අපවිද්ධං** = යමක් කටයුතු නම් එය හැරපියන ලද ද.

මෙහි පැවිදි වූ ද සිට මහණහු විසින් කළයුතු සිල් රැකීම, වෙනෙහි විසීම, දුහඟරැකීම, භාවනායෙහි සිත් අලවා විසීම යන

මේ ඈ **කිච්ච** යන මෙයින් දැක්වුණේ ය. මේ හැම විස්තර යට කියන ලදි. මේ කියූ මහණකමට අයත් පරලොවට හිත වූ සිල් රැකුම් ඈ හැරදමන ලදුයේ **අපවිද්ධ** නම්.

**අකිච්චං පන කයිරති** = නො කටයුතු කෙරේ ද.

සිරුර සැරසීමට හිස තබා රැවුළු සිඳහැරීම, ඇඟපත මුහුණ සුවඳ සුණු ගැල්වීම, පාත්‍රය ඔපමට්ටම් කිරීම, සිවුරු සකස් කිරීම, පාවහන් මිරිවැඩි සිත්තම් කිරීම, පැන් බඳුන් පැන් තැලි හැඩ වැඩ යොදා සකස් කිරීම, හිස පීරීම, හිස සුවඳ කැවීම යන මේ ඈ **අකිච්ච** නම්. අද මෙන් එදාත් පැවිද්දන් විසින් කළයුතු සිල් රැකීම් ඈ හැරදමා නො කටයුතු සිරුරු සැරසීම් ආදියෙහි යෙදුනු දරදඬු පැවිද්දන් දුටු බුදුරජානන් වහන්සේ මෙය මෙසේ වදාළ සේක.

**උන්නලානං පමත්තානං තෙසං වඩ්ඪන්ති ආසවා** = උඩුහුරු වූ මානනල ඇති ප්‍රමත්ත වූ ඔවුන්ගේ ආස්‍රවයෝ වැඩෙත්.

තදින් නැඟී සිටි, ජාති-ගොත්‍ර-කුලපුත්‍රභාවාදිය නිසා දපුනු උඩහුරු වූ මානය ඇත්තේ **උන්නල** ය[1] සිහිනුවණින් වෙන් ව සිටියේ, කුසල් කිරීමෙහි පසුබට වනුයේ **පමත්ත** ය[2]. කාම - භව - දිට්ඨි-අවිජ්ජා යන මොවුහු **ආසව** නම්[3].

**යෙසං ච සුසමාරද්ධා නිච්චං කායගතා සති** = යම් කෙනකුන් විසින් කායගතාසතිය නිතර මනා කොට වඩනා ලද ද.

**කායගතා සති** නම්: කෙස්-ලොම්-නිය-දත් ආදි භෙද ඇති රූපකාය කරා ගියා වූ හෝ රූපකායයෙහි හෝ ගිය සිහිය යි. **"කෙසාදිභෙදං රූපකායගතං කායෙ වා ගතාති කායගතා සති"** යනු ඒ කියූ සැටියි. මෙහි 'කායගතසති'යි ශබ්දලක්ෂණ විසින් කිය යුතු වුව ද දීඝ කොට 'කායගතාසති'යි කියන ලද්දේ ය. මේ වනාහි කෙස්-ලොම් ආදී වූ කායකොට්ඨාසයන් අරමුණු කොට සිටි සිහිය යි. බුද්ධොත්පාදකාලයක විනා අන් කලෙක මෙය නො ලැබෙන්නේ ය. අන්තොටුවනට මෙය විෂය නො වේ. බෝසත්-වරු අන් තවුස් පිරිවැජියෝ ශරීරය අශුභය යි දනිතත්, කර්මස්ථාන භාවනා විසින් මෙය නො දක්නෝ ය. නො දන්නෝ ය.

එහි **ආනාපානපබ්බ - ඉරියාපථපබ්බ - චතුසම්පජඤ්ඤපබ්බ - පටිකූලමනසිකාරපබ්බ - ධාතුමනසිකාරපබ්බ - නව**

1. 1. 7 'අතික්කසාවො' යනු බලනු
2. 2. 1 'යෙ පමත්තා'' ,, ,,
3. 7. 4 'යස්සාසවා පරික්ඛීණා' ,, ,,

**සීවථිකාපබ්බ** යන තුදුස් කොටස් අතුරෙහි පටිකකූලමනසිකාර වශයෙන් යම් **ද්වත්‍රිංසාකාරකර්මස්ථානයක්** වදාළ සේක් ද එය මෙහිලා 'කායගතාසති'යි දතයුතු ය.

**කාය** නම්: ශරීරය යි. අශුචිරාශියෙක යන අරුත් විසින් ද පිළිකුල් වූ කෙස්-ලොම්-නිය-දත් ආදීනට හා චක්ඛුරොගාදී වූ නොයෙක් සිය ගණන් රොගයනට ද උත්පත්තිස්ථානය යන අරුත් විසින් ද ශරීරය, කාය යි කියනු ලැබේ. පත්ලෙහි පටන් උඩ, කෙසගෙහි පටන් යට, සමෙහි පටන් සරස බඹයක් පමණ වූ මේ සිරුරෙහි කිසිවක්හටත් මහත් උත්සාහයෙන් සොයතුදු මුතුඇටක්, මැණිකක්, වෛරළුමිණක්, අගිලක්, කොකුමක්, කපුරක්, සඳුනක්, වත්සුන්නක් සොයා ගන්නට නො ලැබෙන්නේ ය. ලැබෙනුයේ ඉතා තදින් දුගඳ වහනය වන්නා වූ ඉතා පිළිකුල් වූ දක්නට නොහැකි වූ අශුභයෙක් ම ය.

මේ කමටහන වඩනු කැමැති ආදිකර්මිකයොගීහු විසින් කලණ ඇදුරකු වෙත ගොස් මෙය මැනැවින් උගත යුතු ය. කමටහන උගන්වා ලන ඇදුරහු විසිනුදු යොගීහට මේ පිළිබඳ වූ සප්තවිධ උද්ග්‍රහකෞශල්‍යය හා දශවිධ මනසිකාරකෞශල්‍යය අනාකුල ව මැනැවින් උගැන්විය යුතු ය.

ඒ මේ උද්ග්‍රහකෞශල්‍යය සත්වැදෑරුම් වනුයේ **වචන-චිත්ත-වණ්ණ-සණ්ඨාන-දිසා අවකාස-පරිච්ඡෙද** විසිනි. ත්‍රිපිටකධරයකු වුව ද කමටහන මෙනෙහි කරණ කල්හි පළමු කොට වචනයෙන් ම හැදෑරිය යුතු ය. කමටහන උගැන්මෙහි දී තචපඤ්චකාදිය වෙන් වෙන් කොට පිරිසිඳ අනුලොම් – පිළිලොම් විසින් හැදෑරිය යුතු ය. ඒ මෙසේ දතයුතු ය.

එහි තචපඤ්චකය, **කෙසා–ලොමා-නඛා-දන්තා–තචො** යි අනු-ලොම් විසින්, **තචො-දන්තා-නඛා-ලොමා-කෙසා** යි පිළිලොම් විසින්,

වක්කපඤ්චකය, **මංසං-නහාරු-අට්ඨි-අට්ඨිමිඤ්ජා-වක්කං** යි අනුලොම් විසින්, **වක්කං-අට්ඨිමිඤ්ජා-අට්ඨි-නහාරු-මංසං-තචො-දන්තා-නඛා-ලොමා-කෙසා** යි පිළිලොම් විසින්,

පප්ඵාසපඤ්චකය, **හදයං-යකනං - කිලොමකං - පිහකං-පප්ඵාසං** යි අනුලොම් විසින්, **පප්ඵාසං-පිහකං-කිලොමකං-යකනං-හදයං-වක්කං-අට්ඨිමිඤ්ජා-අට්ඨි-නහාරු-මංසං-තචො-දන්තා-නඛා-ලොමා-කෙසා** යි පිළිලොම් විසින්,

මත්ථලුඞ්ගපඤ්චකය, **අන්තං-අන්තගුණං – උදරියං – කරීසං-මත්ථලුඞ්ගං** යි අනුලොම් විසින්, **මත්ථලුඞ්ගං-කරීසං – උදරියං – අන්ත**

ගුණං-අන්තං-පප්ඵාසං-පිහකං-කිලොමකං-යකනං-හදයං-වක්කං-අට්ඨිමිඤ්ජං-අට්ඨි-නහාරූ-මංසං-තචො-දන්තා-නඛා-ලොමා-කෙසා යි පිළිලොම් විසින්,

මෙදඡක්කය, පිත්තං-සෙම්හං-පුබ්බො-ලොහිතං-සෙදො-මෙදො-යි අනුලොම් විසින්, මෙදො-සෙදො-ලොහිතං-පුබ්බො-සෙම්හං-පිත්තං-මත්ථලුඞ්ගං-කරීසං-උදරියං-අන්තගුණං-අන්තං-පප්ඵාසං-පිහකං-කිලොමකං-යකනං-හදයං වක්කං-අට්ඨිමිඤ්ජා-අට්ඨි-නහාරූ-මංසං-තචො-දන්තා-නඛා-ලොමා-කෙසා යි පිළිලොම් විසින්,

මුත්තඡක්කය, අස්සු-වසා-ඛෙළො-සිඞ්ඝාණිකා-ලසිකා-මුත්තං යි අනුලොම් විසින්, මුත්තං-ලසිකා-සිඞ්ඝාණිකා-ඛෙළො-වසා-අස්සු-මෙදො-සෙදො-ලොහිතං-පුබ්බො-සෙම්හං-පිත්තං-මත්ථලුඞ්ගං-කරීසං-උදරියං-අන්තගුණං-අන්තං-පප්ඵාසං-පිහකං-කිලොමකං-යකනං-හදයං-වක්කං-අට්ඨිමිඤ්ජා-අට්ඨි-නහාරූ-මංසං-තචො-දන්තා-නඛා-ලොමා-කෙසා යි පිළිලොම් විසින් වචනයෙන් හැදෑරිය යුතු ය. මෙසේ සියක් කල් දහස් කල් සියදහස් කල් වචනයෙන් හදාරණ කල්හි කමටහන්පෙළ පුහුණු වන්නී ය. සිත හැන තැන නො ද දුවන්නේ ය. ඒ ඒ කොටස් ඔහුට පැහැදිලි වන්නේ ය. මෙසේ වචනයෙන් හදාරා පුහුණු කොට සිතින්ලා ද හැදෑරිය යුතු ය. වචනයෙන් කරණ හැදෑරීම සිතින් කරණ හැදෑරීමට ද සිතින් කරණ හැදෑරීම අශුභලක්ෂණ දැනීමට ද උපකාර වන්නේ ය.

එසේ ම කෙස් – ලොම් – නිය – දත් ආදීන්ගේ පැහැය නිරණය කිරීම වර්ණ වශයෙන් හැදෑරීම ය. කෙස්-ලොම්-නිය-දත් ආදීන්ගේ සටහන් 'මේ මේය' යි නිරණය කිරීම සණ්ඨාන වශයෙන් හැදෑරීම ය. ශරීරයෙහි නාභියෙන් උඩත්, නාභියෙන් යටත් කෙස් – ලොම් – නිය – දත් ආදී වූ ඒ ඒ කොටස් පිහිටියේ ය යි නිරණය කිරීම දිශා වශයෙන් හැදෑරීම ය. කෙස්-ලොම්-නිය-දත් ආදී වූ ඒ ඒ කොටස් අසුවල් දිශායෙහි පිහිටියේ ය යි නිරණය කිරීම අවකාශ වශයෙන් හැදෑරීම ය. කෙස් – ලොම් – නිය – දත් ආදී වූ කොටස් යටින් හා උඩින් හා සරසින් හා මෙ නම් දැයින් පිරිසිඳිනා ලද්දැ යි සභාග-පරිච්ඡෙද විසින් හා 'මේ කෙස්' මේ ලොම් නො වේ, මේ ලොම්, මේ කෙස් නො වේ ය' යි මිශ්‍ර නො කොට විසභාගපරිච්ඡෙද විසින් හා නිරණය කිරීම පරිච්ඡෙද වශයෙන් හැදෑරීම ය.

---

* කෙස් - ලොම් - නිය - දත් - සිවි - මස් - නහර - ඇට - ඇට මිදුළු-වකුගඩු-හදවත - අක්මා - දලබු - බඩදිව - පපුමස - අතුණු - අතුණු බහන - නො පැසුණු අහර - මල - පිත් - සෙම් - සැරව - ලේ - ඩහදිය - මෙදතෙල් - කඳුළු - වුරුණු තෙල් - කෙල - සොටු - සඳමිදුළු - මුත්‍ර - හිස් මොළ යනු සිංහල

මේ සත් වැදෑරුම් වූ උද්ග්‍රහ කෞශල්‍යය කමටහන් දෙන ගුරුන් වෙතින් උගත් පසු මේ කමටහන අසුවල් සූත්‍රයෙහි පිළිකුල් වශයෙන් අසුවල් සූත්‍රයෙහි ධාතු වශයෙන් දෙශනා කරණ ලද යි ද ගුරුවරයා විසින් කියා දිය යුතු ය. මේ වනාහි **සතිපට්ඨාන** සූත්‍රයෙහි පිළිකුල් වශයෙන් ආයේ ය. ධාතු වශයෙන් ආයේ **මහාහත්ථිපදොපම-මහාරාහුලොවාද** සූත්‍රයන්හි හා **ධාතුවිභඞ්ගයෙහි** ය. **කායගතාසති** සූත්‍රයෙහි දී ධ්‍යාන සතර විසින් බෙදුනේ ය. ධාතු වශයෙන් බෙදුනී විදර්ශනා ය. පිළිකුල් වශයෙන් බෙදුනී ශමථ ය.

මනසිකාරකෞශල්‍යය දස වැදෑරුම් වනුයේ **අනුපුබ්බ-නාතිසීඝ-නාතිසණිකා-වික්ඛෙපපටිබාහන-පණ්ණත්තිසමතික්කමන-අනුපුබ්බමුඤ්චන-අප්පණා-අධිචිත්තසුත්ත-සීතිභාවසුත්ත-බොජ්ඣඞ්ග කොසල්ලසුත්ත** විසිනි.

කමටහන පුහුණු කරන්නහු විසින් පුහුණුවට පටන් ගත් තැන සිට කෙස්-ලොම් ඈ දෙතිස් කොටස පිළිවෙළ නො ඉක්මවා මෙනෙහි කළ යුතු ය. එකක් හැර එකක් මෙනෙහි නො කළ යුතු ය. පෙති දෙ තිසක් ඇති ඉණිමගෙක නගින අදක්ෂ පුරුෂයා පෙත්තක් හැර පෙත්තක් නගිනුයේ ක්ලාන්ත ව ඇද වැටෙන්නේ ය. මත්තට නැග ගත නො හැක්කේ ය. එසේ එකක් හැර එකක් මෙනෙහි කරණ යොගී තෙමේ ද භාවනායෙන් ලැබිය යුතු වූ ආස්වාදය නො ලැබ ක්ලාන්ත වූ සිතැත්තේ වන්නේ ය. එහෙයින් භාවනා වඩන්නහු විසින් ඒ හැම එකක් පිළිවෙළ නො ඉක්මවා මෙනෙහි කළ යුතු ය. එසේ පිළිවෙළ නො ඉක්මවා මෙනෙහි කිරීම, **අනුපුබ්බ** විසින් මෙනෙහි කිරීම ය.

එසේ පිළිවෙළ නො ඉක්මවා මෙනෙහි කරන්නහු විසින් ඉතා ඉක්මනින් මෙනෙහි නො කළ යුතු ය. තුන් යොදුන් මගට පිළි-පන්නකු ලහි ලහියේ ගමන් නො කොට යා යුතු නො යා යුතු තැන් විචාරා ම දැන යා යුතු වන්නා සේ ම මේ යොගීහු විසිනුදු කමටහන මැනැවින් වැටහෙන ලෙසට විභාග වශයෙන් සිතට නැගෙන ලෙසට එය මෙනෙහි කළ යුතු ය. අතිශීඝ්‍ර වශයෙන් මෙනෙහි නො කළ යුතු ය. මේ අතිශීඝ්‍ර වශයෙන් මෙනෙහි නො කිරීම, **නාතිසීඝ** විසින් මෙනෙහි කිරීම ය.

ඉතා හෙමින් ද කමටහන මෙනෙහි නො කළ යුතු ය. එක් දවසින් තුන් යොදුන් මග ගෙවා යා යුතු එකක්හට අතර මග ගස්-වැල්-විල් බලමින් ලැසි ව යන කල්හි එක් දවසින් මග ගෙවා යා යුතු වුව ද ඒ පිණිස දෙ තුන් දවසක් ගෙවන්නට සිදු වන්නේ ය. එපරිද්දෙන් ඉතා ලැසි ව මෙනෙහි කරණ කල්හි කමටහනෙහි

කෙලවරෙක් දක්නට නො ලැබෙන්නේ ය. එය විශෙෂාධිගමයට කරුණු ද නො වන්නේ ය. මෙසේ ඉතා හෙමින් මෙනෙහි නො කිරීම, **නාතිසණිකා** විසින් මෙනෙහි කිරීමය.

කමටහන් හැරපියා නීල-පීතාදී වශයෙන් නන් සැහැවි ඇති රූපාදී වූ අරමුණෙහි හා අශුභ වශයෙන් ගත යුතු කෙස්-ලොම් ආදිය ශුභ වශයෙන් ගැණීමෙහි ද සිත නො නගා සිත ඒ ඒ අරමුණු කරා නො යවා කමටහනෙහි යොදා කමටහන වැඩිය යුතු ය. මේ රූපාදී වූ අරමුණුත් කෙස් – ලොම් ආදියත් පුථුත්තාරම්මණ නම් වෙත්. රූපාදී වූ අරමුණු වෙත් වෙත් වූ සැහැවි ඇති බැවින් එසේ නම් ලබත්. මෙහිලා සිතෙහි එකඟ බවක් නැති කල්හි යොගී තෙමේ කමටහනින් පිරිහෙන්නේ ය. එබැවින් ඒ කො තැනකිනුත් සිත නො යවා බැහැරි අරමුණෙහි සිත නො යොදා කමටහන මෙනෙහි කිරීම **වික්ඛෙපපටිබාහන** විසින් මෙනෙහි කිරීම ය.

'මේ කෙස්, මේ ලොම්, මේ නිය යන ඈ විසින් උන් උන් කෙරෙහි පැවැති ව්‍යවහාරය හැරපියා උන් කෙරෙහි වූ පිළිකුල් බවෙහි සිත බැඳිය යුතු ය. එසේ පිළිකුල්බවෙහි සිත බැඳ ව්‍යවහාරයෙහි නො පිහිටා කමටහන මෙනෙහි කිරීම' **පණ්ණත්තිසමතික්කමන** විසින් මෙනෙහි කිරීම ය.

කෙස් – ලොම් ඈ දෙ තිස් කොටසුන් අතුරෙහි යම් යම් කොටසෙක් නො වැටහේ නම් ඒ නො වැටහෙන කොටස් පිළිවෙළ හැරදමා මෙනෙහි කළ යුතු ය. මෙහි **'කෙසා'**යි මෙනෙහි කරත් ම ඒ මනසකාරය ගොස් **'මුත්තං'** යන අවසාන කොටසෙහි හැපී සිටියි. එසේ ම 'මුත්තං' යි පිළිලොම් විසින් මෙනෙහි කරත් ම 'කෙසා' යන්නෙහි වැදී ගන්නේ ය. මෙසේ මෙනෙහි කරන්නහුට ඇතැම් කොටස් වැටහෙන අතර ඇතැම් කොටස් නො වැටහෙන්නේ ය. එකල්හි වැටහෙන කොටස් ගෙණ එහි භාවනාව වැඩිය යුතු ය. දෙ කොටසෙක් වැටහේ නම් එයින් වඩා වැටහෙන කොටස ගෙණ එම මෙනෙහි කිරීමෙන් අර්පණා උපදවා ගත යුතු ය. මෙසේ මෙනෙහි කිරීම, **අනුපුබ්බමුඤ්චන** විසින් මෙනෙහි කිරීම ය.

අර්පණා වනු කොටසෙක්හි කොටසෙක්හි ය. කෙස් – ලොම් – නිය–දත් ඈ එක් එක් කොටසෙක එක් එක් අර්පණායෙක් වන්නේ ය. ඒ ඒ කොටස් විභූත ව වැටහෙත් ම ඒ අරමුණු කොට අර්පණා උපදී. මෙසේ අර්පණා උපදනා ලෙසට මෙනෙහි කිරීම, **අර්පණා** විසින් මෙනෙහි කිරීම ය.

මෙසේ භාවනායෙහි යෙදුනහු විසින් කලින් කල සමාධිනිමිත්ත, කලින් කල පග්ගහනිමිත්ත, කලින් කල උපෙක්ඛානිමිත්ත මෙනෙහි කළ යුතු ය. යොගී තෙමේ දිගට ම සමාධිනිමිත්ත මෙනෙහි කෙළේ

නම් ඔහුගේ සිත අලස බවට වැටෙන්නේ ය. පග්ගහනිමිත්ත ම මෙනෙහි කෙළේ නම් සිත නො සන්සුන් වන්නේ ය. උපෙක්ඛා නිමිත්ත ම මෙනෙහි කෙළේ නම් ආස්‍රවයන් නසනු පිණිස සමාධිමත් නො වන්නේ ය. කලින් කල විටින් විට සමාධි-පග්ගහ-උපෙක්ඛා නිමිති තුන මෙනෙහි කළ කල්හි සිත මොළොක් ද කටයුත්තට සුදුසු ද බබලන්නේ ද වේ. ආස්‍රවයන් නසනු පිණිස මැනැවින් එකඟ වූවෙක් ද වන්නේය. මෙසේ සිත එකඟ වූ කල්හි විශිෂ්ටඥානයෙන් දතයුතු වූ යම් යම් ධර්මයෙක් වේ නම් එය දැන ගැණීමට සිත නැමී සිටියේ නම් මුලින් ඇති විය යුතු වූ හෙතුවාසනාත් එක් වූ කල්හි එය අවබොධ කොට ගත හැකි වන්නේ ය. මේ වනාහි **අධිචිත්තසූත්‍ර** විසින් මෙනෙහි කිරීම ය.

සිතට නිගා කළ යුතු කල්හි නිගා කිරී ම, සිතට අනුබල දිය යුතු කල්හි අනුබල දීම, සිත සතුටු කළ යුතු කල්හි සතුටු කිරීම, සිත මැදහත් කළ යුතු කල්හි මැදහත් කිරීම, මගපලයනට නතුවීම, නිවනෙහි ඇලීම යන මේ තත්ත්ව විසින් සිත වඩා ගත් කල්හි අනුත්තර සීතිභාවය වූ නිවන අවබොධ කර ගැණීමෙහි සමත් වේ ය යි මෙනෙහි කිරීම, **සීතිභාව** විසින් මෙනෙහි කිරීම ය.

කමටහන වඩන්නහුගේ සිත යම් කලෙක හැකිළී සිටියේ නම්, භාවනාවට මැලි වේ නම් එකල්හි පස්සද්ධිසම්බොජ්ඣඞ්ගය වැඩීමට කාලය නො වේ ය, යි වදාළ ලෙසින් මෙනෙහි කිරීම, **බොජ්ඣඞ්ග සූත්‍ර** විසින් මෙනෙහි කිරීම ය. සංයුත්තනිකායයෙහි බොජ්ඣඞ්ග සංයුත්තය බැලිය යුතු ය.

මෙහි මෙසේ ඉතා සැකෙවින් කියූ සත් වැදෑරුම් වූ උද්ග්‍රහ කෞශල්‍යයත් දස වැදෑරුම් වූ මනසිකාරකෞශල්‍යයත් උගෙණ ඒ දෙවිධියෙන් පළමු කොට මේ කමටහන උගත යුතු ය. කමටහන් දුන් ඇදුරහු වසන තැන් හැර ගොස් කමටහන වඩනු කැමැත්තහු විසින් විස්තර වශයෙන් කමටහන කියවා ගෙණ සියලු ගැටතැන් පිරිසිදු කොට මෙහි ද්විතීයතරඞ්ගයෙහි 'ඛායිනො' යන්නට කළ පරිකථායෙහි කියූ ලෙසින් නො සුදුසු තැන් හැර සුදුසු සෙනසුනෙක වසමින් කුඩාපළිබොධ දුරු කොට ප්‍රතිකූලමනසිකාරයෙහි පිරියම් කළ යුතු ය.

මෙහි ලා පළමු කොට කෙශයෙහි නිමිති ගතයුතු ය. එසේ නිමිති ගන්නහු විසින් එක් කෙස්ගසක් හෝ කෙස්ගස් දෙකක් හෝ ගලවා ගෙණ අල්ලෙහි තබා එහි පැහැය ගැණ සිතින් සැලකිය යුතු ය. කෙස් සිඳ දැමූ තැනෙක හෝ දියබඳුනෙක හෝ කැඳබඳුනෙක හෝ වැටී ඇති කෙස්ගසක් බැලූ ව ද වරද නැත්තේ ය. කලු පැහැති කල්හි දක්නා ලද නම් කලු පැහැය යි ද, සුදු පැහැති කල්හි දක්නා ලද නම්

සුදු පැහැය යි ද, එ දෙකින් මුසු කල්හි දක්නා ලද නම් එහි වැඩි තරමින් පෙණෙන පැහැය ගැණ මෙනෙහි කළ යුතු ය. තචපඤ්චකයට අයත් අන් කොටස් ද කෙස් කොටස මෙන් ම ඇසින් බලා ඒ කොටස්හි නිමිති ගෙණ වර්ණ-සංස්ථාන-දිසා ඔකාස-පරිච්ඡෙද විසින් නිශ්චය කොට, නැවැත වර්ණ-සංස්ථාන-ගන්ධ-ආසය-ඔකාස යන පස් අයුරින් පිළිකුල් බව ව්‍යවස්ථා කළ යුතු ය.

කෙශයෝ ප්‍රකෘති වර්ණ වශයෙන් අමු පෙණෙල ඇට මෙන් කලු පැහැ ඇතියහ. සංස්ථාන වශයෙන් දික් වට තරාදිදඬුවෙක සටහන් ඇතියහ. දිශා වශයෙන් උඩ දිශායෙහි හට ගත්හ. අවකාශ වශයෙන් දෙ පස කන් සිළින් ද, ඉදිරි පස නලල් කෙළවරින් ද, පසු පස ගලවළුයෙන් ද, පිරිසිඳුනු හිස්කබල වසා සිටි තාක් සම, කෙශයන්ගේ අවකාශ ය යි. පරිච්ඡෙද වශයෙන් හිස වසා සිටි, වී ඇටගක් පමණ හමට ඇතුල් ව පිහිටා ගත්තාහු යට ඒ කෙස් වල ම මූලයෙන් ද මතු අහසින් ද අවට කෙස්ගස්වලින් ද පිරිසිඳින ලදහ. කෙස් ගස් දෙකක් එක් ව සිටියේ නො වේ, යනු සභාගපරිච්ඡෙදය වේ. කෙස් ලොම් නො වේ, ලොම් කෙස් නො වේ, අතික් තිස් එක් කොටස් හා නො මුසු බව, කෙස් අන් ම කොටසෙක යන බව විසභාගපරිච්ඡෙදය වේ.

කෙස් පැහැයෙන් ද පිළිකුල් ය. සිත්කලු වූ කැඳබඳුනෙක හෝ බත්පතෙක හෝ කෙස් ගසක් වැනි යමක් දුටහොත් මෙහි කෙස් ඇත, හැර දමවු'යි පිළිකුල් කරත්. මෙසේ කෙස් පැහැයෙන් පිළිකුල් ය. රෑ කෑම කනවිට කෙස් ගසක් වැනි වරා කෙන්දක් හෝ නියඳ කෙන්දක් හෝ මුව ගැටුනොත් පිළිකුල් කෙරෙත්. මෙසේ සටහන් වශයෙන් ද පිළිකුල් ය. තෙල් ගැල්වීම් සුවඳ කැවීම් ආදියෙන් සකස් නො කළ කෙස්වල ගඳ ඉතා පිළිකුල් ය. ගින්නෙන් දැවෙන කෙස්වල ගඳ එයට ද වඩා පිළිකුල් ය. ඉවසනු නො හැකිය. පැහැයෙන් සටහනින් කෙස් එතරම් පිළිකුල් නැතැ යි යම් තමකින් කිය හැකි වුව ද ගඳින් නම් කෙස් ඉතා ම පිළිකුල් ය. ගම් වැස්සන්ගේ මල-මූ දමන අපිරිසිදු තැන්වල හට ගැණෙන පලා කොළ දත්නවුනට ඉතා පිළිකුල් ය. කෑමට ගන්නට නො කැමැති ය. එමෙන් කෙස් ද ලේ-සැරව-මල-මූ-පිත්-සෙම් ආදිය වැහීමෙන් හට ගන්නේ ය. මෙසේ කෙස්, පිහිටි තැන් වශයෙන් ඉතා පිළිකුල් ය. අසුචි රැසෙක හට ගත් පුස් මෙන් කෙස් එක් තිස් කුණු ගොඩෙක හටගත්තේ ය. සොහොනෙහි කසළ ගොඩෙහි හට ගත් පලාකොළ සේ අගල් ආදියෙහි හට ගත් පියුම් මානෙල් සේ අපිරිසිදු තැන්හි හටගත් බැවින් පිළිකුල් ය. මෙසේ හට ගන්නා තැන් වශයෙන් ද පිළිකුල් ය. කෙස්වල පිළිකුල්බව වර්ණ-සංස්ථාන-ගන්ධ-ආසය-

අවකාස විසින් දක්නා සේ ම ලොම්-නිය-දත් ආදී වූ සෙසු කොටස්හි ද වණ්ණ-සණ්ඨානාදීන්ගේ වශයෙන් පිළිකුල්බව දත යුතු ය. වණ්ණ-සණ්ඨාන-දිසා-ඔකාස-පරිච්ඡෙද වශයෙන් ද එසේ සියල්ල වෙන් වෙන් කොට නිශ්චය කරගත යුතු ය. විස්තර කථාව විශුද්ධිමාර්ගයෙහි එන්නී ය.

කෙස් - ලොම් - නිය-දත්-සිවි-මස් නහර-ඇට-ඇටමිදුළු-වකුගඩු-හදවත-අක්මා-දලබුව-බඩදිව-පපුමස-අතුණු-අතුණු බහන-නො පැසුනු අහර-මල-හිස් මොළ-පිත්-සෙම්-සැරව-ලේ-ඩහදිය-මෙදතෙල් - කඳුළු-වුරුණුතෙල්-කෙල-සොටු-සඳමිදුළු - මූත්‍ර යන කොටස් දෙතිස පැහැයෙන් සටහනින් දිසායෙන් අවකාසයෙන් පිරිසිඳීමෙන් නිශ්චය කොට ගෙණ යට දැක් වූ පරිදි අනුපුබ්බ-නාතිසීඝාදී ක්‍රම විසින්, වණ්ණ-සණ්ඨාන-ගන්ධ-ආසය-අවකාස යන පස් අයුරින් පිළිකුල, පිළිකුලැ යි මෙනෙහි කරත් ම කෙසාදි ව්‍යවහාරය ඉක්මවීම් වශයෙන් පවත්නා භාවනායෙහි කෙළවර, ඒ සියලු කොටස් එක්වර ම පැහැදිලි ව වැටහෙත්තේ ය. එක නූලෙහි ඇවුණු දෙතිස් පැහැයෙකින් යුත් මල් දෙතිසක් ඇති මල් මාලාවක් දෙස බලන විට සියල්ල එක්වර ප්‍රකට වන්නාක් මෙන් යට මනසකාරකෞශල්‍යකථායෙහි 'කෙසා' යි මෙනෙහි කරත් ම යොගීහුගේ මනසකාරය ගොස් 'මුත්තං' යන අවසාන කොටසෙහි වැදී සිටින්නේ ය යි කීයේ මේ නිසා ය යි දතයුතු ය.

බැහැරි සිරුර පිළිබඳ මනසකාරය කරන්නහුට නම් යට කියූ සේ ම සියලු කොටස් ප්‍රකට ව පෙණී ගිය කල්හි යැම් ඊම් කරණ මිනිස් - තිරිසන් ආදී වූ, සත්ත්වයන් හැටියට නොව කොටස් රාශි වශයෙන් වැටහේ. ඔවුන් විසින් කනු බොනු ලබන ආහාර පානාදීහු ද ඒ කොට්ඨාසරාසීන් තුළ බහා ලන්නාක් මෙන් වැටහෙත්. අනතුරු ව යට කියූ සේ අනුපුබ්බ මුඤ්චනාදි වසයෙන් පිළිකුල, පිළිකුලැ'යි නැවැත නැවැත මෙනෙහි කරත් ම පිළිවෙළින් අර්පණා උපදින්නී ය.

මෙහිලා වණ්ණ-සණ්ඨාන-දිසා-අවකාස-පරිච්ඡෙද වසයෙන් වැටහීම උග්ගහනිමිත්ත ය. එ ම මුළුමනින් පිළිකුලැ යි වැටහීම පටිභාගනිමිත්ත ය. පටිභාගනිමිත්ත වඩනා කල්හි ප්‍රථමධ්‍යාන වශයෙන් අර්පණා උපදී.

යමෙක් තමාට දෙතිස් කොටසින් එක් ම කොටසෙක් පැහැදිලි වූයේ නම් ඒ එක් ම කොටසෙහි අර්පණාවට පැමිණ නැවැත අන් කොටසෙක අර්පණාවට පැමිණීමට උත්සාහය නො කෙරේ නම් ඔහුට එක් ම අර්පණාවක් උපදී. යමක්හට නොයෙක් කොටස් ප්‍රකට ව පෙණෙත් ද, හේ එක් කොටසෙක ධ්‍යානයට පැමිණ නැවැත අන්

කොටස්වල ද ධ්‍යානයට පැමිණීමට යොග කෙරේ නම්, ඔහුට කොටස් ගණනට ප්‍රථමධ්‍යාන උපදනේ ය. මෙසේ මේ කමටහන ප්‍රථමධ්‍යාන වශයෙන් සිද්ධ වන නමුදු සිහියේ බලයෙන් 'වණ්ණ-සණ්ඨාන' ආදී විසින් සැපයෙනුයේ 'කායගතාසති'යි කියනු ලැබේ.

කායගතාසති භාවනායෙහි යෙදුනෝ ඉතා දුර වන සෙනසු-නෙහි හා අධිකුසලයෙහි නො ඇල්මත් පස්කම් ගුණයෙහි ඇල්මත් යටපත් කොට සිටින්නේ ය. අනභිරතිය විසින් හෙතෙම නො වඩනා ලදුයේ වේ. උපන් අනභිරතිය යටපත් කරන්නේ ය. බිය හා බියසුලු අරමුණු මැඩලන්නේය. බියෙන් හා බිය දෙන අරමුණු වලින් යටපත් නො වන්නේ ය. උපනුපන් බිය හා බිය දෙන අරමුණු මැඩ ගෙණ සිටුනේ ය. ශීතොෂ්ණාදිය ඉවසන්නේ ය. කෙශාදීන් ගේ වර්ණභෙදය ගෙණ භාවනා කිරීමෙන් ධ්‍යාන ලබන්නේ ය එයින් ම ෂට් අභිඥප්‍රතිවෙධය ද කරන්නේ ය.

**"එකධම්මො භික්ඛවෙ! භාවිතො බහුලීකතො මහතො සංවෙගාය සංවත්තති, මහතො අත්ථාය සංවත්තති, මහතො යොගක්ඛෙමාය සංවත්තති, මහතො සතිසම්පජඤ්ඤාය සංව-ත්තති, ඤාණදස්සනපටිලාභාය සංවත්තති, දිට්ඨධම්මසුඛවිහා-රාය සංවත්තති, විජ්ජාවිමුත්තිඵලසච්ඡිකිරියාය සංවත්තති, කතමො එකධම්මො? කායගතාසති"** යි වදාළ මෙ ද මෙහි අනුසස් විසින් දත යුතු ය.

මහණෙනි! එක් ධර්මයෙක් වඩන ලද්දේ බහුල වශයෙන් සෙවුනා ලද්දේ මහත් සංවෙග පිණිස, මහත් අර්ථ පිණිස, මහත් යොගක්ෂෙම පිණිස, මහත් සිහි බුද්ධිය පිණිස, ඥනදර්ශනප්‍රතිලාභය පිණිස මේ අත් බැව්හි සැපවිහරණය පිණිස, විද්‍යා-විමුක්ති-ඵලප්‍රතිවෙධය පිණිස පවතී. ඒ කවර එක් ධර්මයෙක් ද, කායගතාසති, යී යනු එහි කෙටි අරුත්.

එහෙයින් නුවණැත්තේ මෙබඳු නොයෙක් අනුසස් ඇති කාය-ගතාසති භාවනායෙහි එක්වන් යෙදෙන්නේ ය. බුදුරජානන් වහ-න්සේ විසින් කායගතාසතිය වැඩීමෙහි අනුසස් නොයෙක් සූත්‍රයන් හිදී නොයෙක් ලෙසින් වර්ණනා කරණ ලද්දේ ය.

**අකිච්චං තෙ න සෙවන්ති කිච්චෙ සාතච්චකාරිනො** = නිතර කටයුතු දෑය කරණ ඔවුහු තුමූ නො කටයුතු දෑය නො කෙරෙත්.

මෙහි **අකිච්ච** නම්: සිරුර ඔපමට්ටම් කිරීම්, පා සිවුරු ආ පිරිකර සැරසීම් ය. **කිච්ච** නම්: වත් පිළිවෙත් පිරීම්, සිල් රැකුම්, වෙනෙහි විසුම්, දුහඟ සෙවුම්, භාවනා කිරීම් ආදී මහණකමට අයත් ක්‍රියා ය. **සාතච්චකාරී** නම්: මෙහි කායගතාසතිය වඩමින් නිරතුරු ව මහණකමට අයත් ක්‍රියාවන් ම කරන්නේ ය.

**සතානං සම්පජානානං අත්ථං ගච්ඡන්ති ආසවා** = සිහි ඇති මනා නුවණැත්තන්ගේ ආස්‍රවයෝ විනාශයට යෙත්.

**සතානං** යන මෙ පදයෙන් කියැවුනේ සමෘති අවිප්‍රවාසයෙන් යුත් අප්‍රමත්තයෝ ය. සිහියෙන් නො තොර ව සිහි ඇති ව වසත්නෝ ය.[1] **සම්පජාන** නම්: සාත්ථකසම්පජඤ්ඤ-සප්පායසම්පජඤ්ඤ-ගොචරසම්පජඤ්ඤ-අසම්මොහසම්පජඤ්ඤ යන චතුර්විධ සම්ප්‍රජන්‍යයෙන් යුක්ත වූයේ ය.

එහි "ඉදිරියට යම්" යි සිත උපන් කල්හි චිත්ත වශයෙන් ගොස් "මෙහි යෑමෙන් මට කවර වැඩෙක් දැ"යි අනර්ථය හැර අර්ථය පිළිගැණීම, **සාත්ථකසම්පජඤ්ඤ** නම්. **"අභික්කමචිත්තෙ උප්පන්නෙ චිත්තවසෙනෙව අගන්ත්වා කින්නු මෙ එත්ථ ගතෙන අත්ථො අත්ථි නත්ථීති අත්ථානත්ථං පරිග්ගණ්හිත්වා අත්ථපරිග්ගහණං සාත්ථකසම්පජඤ්ඤං"** යනු අටුවා. ඒ ගමන් බිමන්හි සත්‍රප්‍රාය - අසත්‍රප්‍රායයන් දැන ගැණීම, **සප්පායසම්පජඤ්ඤ** නම්. **"තස්මිං පන ගමනෙ සප්පායාසප්පායං පරිග්ගණ්හිත්වා සප්පාය පරිග්ගණ්හනං සප්පායසම්පජඤ්ඤං"** යනු අටුවා. මෙසේ පිළිගත් සාර්ථක-සප්පායසම්පජඤ්ඤ ඇත්තහු අටතිස් වැදෑරුම් කර්මස්ථානයන්ගෙන් තමාගේ සිතට රුචි වූ කමටහන් උගෙණ පිඬු සිඟා යෑම **ගොචරසම්පජඤ්ඤ** නම්. **"එවං පරිග්ගහිතසාත්ථකසප්පායස්ස පන අට්ඨතිංසාය කම්මට්ඨානෙසු අත්තනො චිත්තරුචියා කම්මට්ඨානසඞ්ඛාතං ගොචරං උග්ගහෙත්වා භික්ඛාචාරගොචරෙ තං ගහෙත්වා ගමනං ගොචරසම්පජඤ්ඤං"** යනු අටුවා.

**අත්ථං**, යනු මෙහි විනාශය කියත්තේ ය. සංස්කෘතයෙහි **'අස්තම්'** යි ද සිංහලයෙහි **'හක්'** යි ද සිටියේ ය. අව්‍යයෙකි. නාශන යෙහි හා අදර්ශනයෙහි ආයේ ය.

**ආසව** නම්: කාම-භව-මිච්ඡාදිට්ඨි-අවිජ්ජා යන මේ සතරය[2] කායගතාසතිය නිතර වඩන, කළ යුතු මහණදම්හි නිතර යෙදී වසන සිහි නුවණැති පැවිද්දන්ගේ හා සිහිනුවණින් යෙදී දැහැමි ලෙසින් දිවි ගෙවන ගිහියන්ගේ ද කාමාදි ආස්‍රවයෝ නැසී යන්නාහු යනු එකාන්තසිද්ධියෙකි.

ධර්මදෙශනාවගේ අවසානයෙහි ඒ භික්ෂූහු රහත් බැව්හි පිහිටියාහු ය. ධර්මදෙශනා තොමෝ පැමිණ සිටි පිරිසට ද වැඩ සහිත වූ ය.

**භද්දියභික්ෂුවස්තුව නිමි.**

---

1. 2. 1. 'සතිමතො' යනු බලනු.
2. 7. 4 'යස්සාසවා' ,, ,,

## ලකුණ්ටකභද්දිය ස්ථවිරයන් වහන්සේ

### 21 – 4

**එක්** දවසෙක බුදුරජුන් දක්නට බොහෝ ආගන්තුක භික්ෂුහු දෙව්රම් වෙහෙරට පැමිණියහ. ඔවුහු එහි දිවාස්ථානයෙහි වැඩහුන් බුදුරජුන් වෙත එළැඹ වැඳ එකත් පසෙක හුන්හ. ඒ වේලෙහි ලකුණ්ටක භද්දිය ස්ථවිරයන් වහන්සේ බුදුරජුන්ට නො දුරෙහි ගියහ. බුදුරජාණන් වහන්සේ එහි පැමිණ හුන් ඒ ආගන්තුක භික්ෂූන්ගේ සිත්හසර දැන "මහණෙනි! බලවු, මේ මහණ, ලකුණ්ටක භද්දිය මවුපියන් නසා නිදුක් ව යන්නේ ය"යි වදාළවිට ඒ භික්ෂුහු "බුදුරජාණන් වහන්සේ මේ කුමක් වදාරණ සේක් දැ"යි සැකයට වැටුනෝ එකෙකා උනුන් මුහුණ බලා "ස්වාමීනි! භාග්‍යවතුන් වහන්ස! මේ කුමක් වදාරණ සේක් දැ?"යි අසා සිටියහ. එකල්හි උන්වහන්සේ මේ ධර්මදේශනාව කළ සේක.

> **මාතරං පිතරං හන්ත්වා රාජානො ද්වෙ ච ඛත්තියෙ,**
> **රට්ඨං සානුචරං හන්ත්වා අනීඝො යාති බ්‍රාහ්මණොති.**

මව ද පියා ද ක්ෂත්‍රිය රජුන් දෙදෙනා ද නසා අය කැමියා සහිත වූ රට ද නසා බ්‍රාහ්මණ තෙමේ නිදුක් ව යන්නේ ය.

**මාතරං පිතරං හන්ත්වා රාජානො ද්වෙ ච ඛත්තියෙ** = මව ද පියා ද රජුන් දෙදෙනා ද නසා.

**මාතු – පිතු** යන ප්‍රකෘති දෙකින් **මාතරං, පිතරං** යි ආයේ **හන්ත්වා** යනු බලා ය. **"තණ්හා ජනෙති පුරිසං"** යි වදාළ බැවින් භවත්‍රයයෙහි සත්ත්වයන් උපදවන තෘෂ්ණාව **මාතා** නමි. **"තීසු භවෙසු සත්තානං ජනනතො තණ්හා මාතා නාම"** යනු ව්‍යක්ති–ය යි.[1] "අසුවල් රජුගේ රජ ඇමතිහුගේ පුත් වෙමි" යි පියා නිසා පුතුට මානය උපදනා බැවින් නවවිධ වූ අස්මිමානය **පිතා** නමි. මේ එහි ව්‍යක්තිය. **"අහං අසුකස්ස නාම රඤ්ඤො වා රාජමහා–මත්තස්ස වා පුත්තොස්මීති පිතරං නිස්සාය අස්මිමානස්ස උප්පජ්ජ–නතො අස්මිමානො පිතා නාම"** යනු[2].

මෙහි වූ **'ඛත්තියෙ'** යනු **'රාජානො'** යනු වෙසෙසා සිටියේ ය. දාන – ප්‍රියවචන – අර්ථචර්‍ය්‍යා – සමානාත්මතා යන සිවු සඟරාවතින් මහදනා තමන් කෙරෙහි රඳවනුයේ **රාජ** නමි. **"දානඤ්ච පිය–වචනඤ්ච අත්ථචරියා ච සමානත්තතා චාති චතූහි සඞ්ගහ–**

1. 14. 6 'දුක්ඛසමුප්පාදං' යනු බලනු.
2. 1 7 'අනික්කසාවො' ,, ,,

**වත්ථූහි අත්තනි ජනං රඤ්ජෙතී ති = රාජා"** යනු අන්වර්ථසමන්විතය යි. **"අතිතෙජවන්තතාය විසෙසෙන රජ්ජතෙ දිප්පතෙ ති"** යි කී බැවින් අතිශය තෙජවත් භාවයෙන් වෙසෙසින් බබලනු යි 'රාජ' නම්. මූර්ධාභිෂික්ත තෙමේ ම රාජා යි ගණු ලැබේ. ක්‍ෂත්‍රියජාති ඇතියේ **රාජන්‍ය – ක්‍ෂත්‍රිය** යි ගැණේ. මෙය මෙසේ කිහ.

"මුද්ධාභිසිත්තො රාජා ති කථිතො ඉතරො පන,
රාජඤ්ඤො ඛත්තියො චාති වුත්තො ඛත්තියජාතිකො" යි.

**"ඛත්තස්ස අපච්චං = ඛත්තියො"** යනු ද සිහියට ගන්නේ ය. ආදිකල්පිකමනුෂ්‍ය තෙමේ ක්‍ෂේත්‍රයනට අධිපති ව සිටියේ ක්‍ෂත්‍රිය යි ද කියනු ලැබේ. **"ක්‍ෂදති රක්‍ෂති ජනාන් = ක්‍ෂත්‍රඃ"** ජනයා රකිනුයේ **ක්‍ෂත්‍ර. "ක්‍ෂතාත් ත්‍රායතෙ ඉති = ක්‍ෂත්‍රඃ"** රණබිමෙහි ලා ක්‍ෂතයෙන් රකිනුයේ **ක්‍ෂත්‍ර.** ක්‍ෂත්‍ර ම **ක්‍ෂත්‍රිය** නම්. ක්‍ෂත්‍රියයෝ දෙන්නෝ ය. නො ද ඉල්ලන්නෝ ය. යාග කරන්නෝ ය. යාග නො ද කරවන්නෝ ය. ඉගෙණ ගන්නෝ ය. නො ද උගන්වන්නෝ ය. ප්‍රජාවන් රකින්නෝ ය. රණබිමෙහි පරාක්‍රමය දක්වන්නෝ ය. මොවුහු දෙශභෙදයෙන් නාම විසින් විවිධයහ. **ප්ලක්‍ෂද්වීපයෙහි** ක්‍ෂත්‍රියයෝ **පතඞ්ග** නම්. **ශාල්මලද්වීපයෙහි** ක්‍ෂත්‍රියයෝ **වීර්යධර** නම්. **කුසද්වීපයෙහි** වූවෝ **කොවිද** නම්. **ක්‍රෞඤ්චද්වීපයෙහි** වූවෝ **ඍෂභ** නම්. **ශාකද්වීපයෙහි** වූවෝ **සත්‍යව්‍රත** නම්. ගොත්‍ර විසිනුදු මොවුන්ගේ හෙද බොහෝ ය. ඒ හැම ග්‍රන්ථාන්තරයෙන් දත හැක්කේ ය.

මෙහි ලෝවැසියනට ආශ්‍රය වූ රජුන් මෙන් සියලු මිථ්‍යා-දෘෂ්ටීන්ට ආශ්‍රයස්ථාන වූ ශාශ්වත-උච්ඡේද දෘෂ්ටි දෙක ක්‍ෂත්‍රිය රජුන් දෙදෙනා කොට වදාළ සේක. මේ අටුවා: **"ලොකො විය රාජානං යස්මා සබ්බදිට්ඨිගතානි ඉමා සස්සතුච්ඡෙදදිට්ඨියො භජන්ති, තස්මා ද්වෙ සස්සතුච්ඡෙදදිට්ඨියො ද්වෙ ඛත්තියරාජානො"** යනු.[1]

**රට්ඨං සානුචරං හන්ත්වා** = අයකැමි සහිත රට ද නසා.

චක්ඛු – සොත – ඝාන – ජිව්හා – කාය – මන – රූප – සද්ද – ගන්ධ – රස – ඵොට්ඨබ්බ – ධම්ම යන ආධ්‍යාත්මික – බාහිර ආය-තන දොළොස, පැතිර පවත්නා අරුතින් රටක් වැනි නු යි **රට්ඨ.** ඒ ආයතනයන් ඇසුරු කොට පවත්නා නන්දිරාගය අනුචරයකු වැනි නු යි **අනුචර.** මේ අටුවා: **"ද්වාදසායතනානි විත්ථතට්ඨෙන රට්ඨ සදිසත්තා රට්ඨං නාම, ආයසාධකො ආයුත්තකපුරිසො විය තං නිස්සිතො නන්දිරාගො අනුචරො** නාම" යනු[2]

---

1. 1. 7. අතික්කසාමො' යනු බලනු.
2. 4. 1. 'කො ඉමං පඨවිං විජෙස්සති' ,, ,,

මෙහි දෙ තැනක යෙදී සිටි **හන්ත්වා** යන පූර්වක්‍රියා දෙකින් වදුරණ ලද්දේ තෘෂ්ණාවත් අස්මිමානයත් ආයතන ඇසුරු කොට පවත්නා නන්දිරාගයත් රහත්මගනුවණින් නැසී යන බව ය.

**අනීඝො යාති බ්‍රාහ්මණො** = බ්‍රාහ්මණ තෙමේ නිදුක් ව යන්නේ ය.

**නීඝ** නම්: පාපය යි. පින් නසන්නේ පාපය යි. අධිගමයෙහි වියසී රහිත වූයේ ද නීඝ යි කියනු ලැබේ. **"නිහන්ති පුඤ්ඤං හිංස නිති වා = නීඝො, නත්ථි අධිගමත්ථං ඊහා එත්ථාති = නීඝො"** යනු එයරුත් පැහැදිලි කරන්නේ ය. පින් නසාලන, අධිගමයෙහි පැවැති වියසීය සිඳලන පව් නැතියේ **'අනීඝ'** නම් වේ. 'බ්‍රාහ්මණො' යනු වෙසෙසන්නේ ය. **බ්‍රාහ්මණ** නම්: මෙහි පව් බැහැර කළ රහතුන් වහන්සේ ය.

තවත් දවසෙක බුදුරජුන් දැකීමට පැමිණි ආගන්තුක භික්ෂූන්-ගේ සිත්හසර දුටු බුදුරජානන් වහන්සේ එ වේලෙහි තමන් වහන් සේට නො දුරෙහි ගිය ලකුණ්ටකභද්දිය තෙරුන් දැක මේ ධර්මදෙ-ශනාව ද කළ සේක.

> **මාතරං පිතරං හන්ත්වා රාජානො ද්වෙ ච සොත්ථියෙ,**
> **වෙය්‍යග්ඝපඤ්චමං හන්ත්වා අනීඝො යාති බ්‍රාහ්මණොති.**

මව ද, පියා ද බමුණු රජුන් දෙදෙනා ද නසා ව්‍යාඝ්‍රසඤ්චාරමාර්ගය පස්වනු කොට ඇති නීවරණ ද නසා බ්‍රාහ්මණ තෙමේ නිදුක් ව යන්නේ ය.

මෙහි ද **මාතරං-පිතරං** යනු යට කියූ සේ දත දතු ය. **රාජානො - සොත්ථියෙ** යන දෙ පදයෙන් ශාශ්වත - උච්ඡේදදෘෂ්ටි ගැණේ. ශාශ්වත - උච්ඡේදදෘෂ්ටි දෙක බමුණු රජුන් දෙදෙනකු කොට වදාළෝ බුදුරජනන් වහන්සේ තමන් ධර්මේශ්වර බැවින් හා දෙශනා විධියෙහි දක්ෂ බැවිනි.

**සොත්ථිය,** යනු වෛදිකබ්‍රාහ්මණයන් කෙරෙහි ආයේ ය. මෙය සංස්කෘතයෙහි **ශ්‍රොත්‍රිය** නම්. **ශ්‍රොත්‍ර** යනු මෙහි වෙදය යි. **"ශ්‍රොත්‍රං වෙත්ති අධීතෙ වා = ශ්‍රොත්‍රියඃ"** වෙද හදාරණ්නුයේ ශ්‍රොත්‍රිය නම්. බ්‍රාහ්මණ වනුයේ උත්පත්තියෙනි. ද්විජ වනුයේ සංස්කාරවිධියෙනි. විප්‍ර වනුයේ විද්‍යාභ්‍යාසයෙනි. උත්පත්ති - සංස්කාරවිධි - විද්‍යාභ්‍යාස යන මෙයින් ශ්‍රොත්‍රිය වනුයේ ය. මේ එය කී සැටි:

> "ජන්මනා බ්‍රාහ්මණො ඥෙයඃ සංස්කාරෛර්ද්විජ උච්‍යතෙ,
> විද්‍යාභ්‍යාසී භවෙද්විප්‍රඃ ශ්‍රොත්‍රියස්ත්‍රිභිරෙව හි" යි.

**වෙය්‍යග්ඝපඤ්චමං හන්ත්වා** = ව්‍යාඝ්‍රසඤ්චාරමාර්ගය පස්වනු කොට ඇති නීවරණ ද නසා.

ව්‍යාඝ්‍රසඤ්චාරය ඇති භය සහිත වූ නො බැසිය හැකි මග වෙය්‍යග්ඝ නම්. **“එත්ථ ව්‍යග්ඝානුචරිතො සප්පටිභයො දුප්පටිපජ්ජො මග්ගො වෙය්‍යග්ඝො නාම”** යනු අටුවා. විචිකිච්ඡානීවරණය ද ඒ හා සමාන බැවින් **‘වෙය්‍යග්ඝ’** නම් වේ. වෙය්‍යග්ඝ නම් වූ ඒ විචිකිච්ඡානීවරණය පස්වනු වූයේ කාමච්ඡන්දාදිනීවරණයන්ට ය. **එහෙයින්** කාමච්ඡන්දාදිනීවරණ පඤ්චකය වෙය්‍යග්ඝපඤ්චමැ යි වදාළ සේක. **“විචිකිච්ඡානීවරණම්පි තෙන සදිසතාය වෙය්‍යග්ඝං නාමං, තං පඤ්චමං අස්සාති = වෙය්‍යග්ඝපඤ්චමං, නීවරණපඤ්චකං වෙය්‍යග්ඝපඤ්චමං නාම”** යනු අටුවා.[1] මෙ ද නැසිය යුත්තේ රහත්මග නැණින් ය. **හන්ත්වා** යනු වදාළෝ එහෙයිනි.

**අනීඝො යාති බ්‍රාහ්මණො** = බ්‍රාහ්මණ තෙමේ නිදුක් ව යන්නේ ය.

තෘෂ්ණාවත් අස්මිමානයත් මිථ්‍යාදෘෂ්ටියත් නීවරණත් නසා රහතුන් වහන්සේ නිවන්පුරයට වදනා සේක.

**ලකුණ්ටකභද්දියස්ථවිරවස්තුව නිමි.**

1. 6. 11. ‘චිත්තක්ලෙසෙහි පණ්ඩිතො’ යනු බලනු.

# යකුන්ගෙන් රැකුනු දරුවා

## 21 — 5

**රජගහ** නුවර සම්දිටු ගත්තකුගේ පුතෙක, මිසදිටු ගත්තකුගේ පුතෙකැ යි ලා බාල දරුවෝ දෙදෙනෙක් එක් ව නිතර පන්දු ගසත්තෝ ය. ඒ දෙදෙනා අතුරෙහි සම්දිටු ගත්තහුගේ පුත්‍රයා නූල් පන්ද යවනුයේ "බුදුරජුන්ට නමස්කාර වේවා" යි කියමින් පන්ද යවත්තේ ය. අනෙකා ද තීර්ථකයන්ගේ ගුණ සිහි කොට "රහතුන්ට නමස්කාර" යි පන්ද යවත්තේ ය. උන් දෙන්නා අතුරෙහි සම්දිටු ගත්තහුගේ පුත්‍රයා දිනත්තේ ය. අනෙකා පරදිත්තේ ය. පරදිත්තේ නො පරදිත්නහුගේ නමස්කාරය අසා "මෙතෙමේ මෙසේ සිහි කොට මෙසේ කියා පන්ද යවනුයේ මා පරද වත්තේ ය. මමත් උඟ මෙන් කරත්නෙමි" යි බුද්ධානුස්සතිය පුරුදු කෙළේ ය.

දවසක් ඔහුගේ පියා ගැල යොදා ගෙණ දර ගෙණ එන්නට වලට යන්නේ පුතු ද කැඳවා ගෙණ ගියේ ය. ගොස් එහි දී දර වලින් ගැල පුරවා ගෙණ තික්ම එන්නේ නුවරින් පිටත සොහොනක් ලඟ දී දිය පහසු තැනක ගොනුන් ලිහා හැර බත් කන්නට පටන් ගත්තේ ය. ඔහුගේ මුදා හළ ඒ ගොන්නු ද සවස් වේලෙහි නුවරට වදනා ගොන් රැලක් සමග එක් ව නුවරට ඇතුල් වූහ. ගැල්කරු ද ගොන් බලා ඇවිද නුවරට වැද සොයනුයේ රෑ වන්නට ලං ව තිබිය දී ගොනුන් දැක අල්වා ගෙණ එන්නේ වාසල් දොර වසන්නට පෙරාතු ව වාසල් දොරට පැමිණෙන්නට නො හැකි විය. ඔහු එහි ලඟා වන්නට පෙර දොර වසා තුබුනේ ය. එහෙයින් ඔහුගේ පුත්‍රයා එකලා ව ම රාත්‍රි කාලයෙහි ගැලයටට වී නිදි ගත්තේ ය. රජගහ නුවර ස්වභාවයෙන් ම යක් රකුස් ඈ අමනුෂ්‍යයෝ බොහෝ ය. මේ දරු ද සොහොන ලඟ නිදි ගත්තේ ය. එහි දී අමනුෂ්‍යයෝ දෙදෙනෙක් එ දරු දුටහ. උන්ගෙන් එකෙක් මිසදිටු ගත්තෙක. සසුනට පටහැනි ය. එකෙක් සම්දිටු ගත්තේ ය. මිසදිටුවා "මේ අපට ගොදුරෙක, මූ කම්හ" යි කී ය. එවිට සම්දිටුවා "වැඩෙක් නැත, එයනට රුචි නො වේවා" යි වළකා ලීය. එහෙත් උඟ වළකාලන ගමනේ දීත් කන්නට සිතා දරු පයින් ගෙණ ඇද්දේ ය. එ කෙණෙහි දරු ද පිබිද බුදුගුණ සිහි කොට "බුදුරජුන්ට නමස්කාර වේවා" යි හඬ නගා කීයේ ය. අමනුෂ්‍ය ද බියපත් ව ආපසු හැරී සිටියේ ය. සම්දිටු ගත් යක්ෂ තෙමේ "අප විසින් නො කටයුත්තෙක් කරණ ලද්දේ ය, එයට තට දඬුවම් කරම්හ" යි දරු රැක සිටියේ ය. නැවැත මිසදිටු ගත් යක්, නුවරට වැද රජගෙට ගොස් රජුගේ බොජුන්පත පුරවා බත්තලියක් ගෙණායේ ය. යක්කු දෙදෙන ම

දරුගේ මවුපියන් මෙන් එ දරු වඩා ගෙණ බත් කවා බත් ගෙණ ආ තලියේ ඒ සියලු පුවත ලියා "රජ තෙමේ ම මේ අකුරු දකීවා, අනෙකෙක් නො දකීවා" යි තලිය, ගැලෙහි තුබූ දර අස්සේ සඟවා තබා මුළු රැය දරුට රැකවල් ගෙණ සිට අලුයම නැගී ගියහ.

පසුදා රජගෙයි රජු වළඳනා බොජුන්පත සොරුන් විසින් පැහැර ගන්නා ලද්' යි මුළුනුවර මහත් සේ කොලාහලයෙක් විය. ආරක්‍ෂක පුරුෂයෝ මිනිසුනට පිටත යා නො දී වාසල සැම තැන දොර යතුරු ලා බලා එහි නො දක්නෝ නුවරින් බැහැර ඇත මෑත පරීක්‍ෂා කරන්නාහු ඒ ගැලෙහි දර අස්සේ තුබූ ඒ රන්තලිය දැක "මූ සොරුය යි දරු අල්වා ගෙණ ගොස් රජු ඉදිරියට පමුණුවා ලූහ. රජ තෙමේ එහි වූ අකුරු කියවා බලා "දරුව! මේ කිමැ?"යි ඇසී ය. දරු ද "දෙවයන් වහන්ස! මම නො දනිමි, මාගේ මවුපියෝ අවුත් රෑ මට බත් කවා රැකවල් ගෙණ සිටියහ, මමත් මාගේ මවුපියෝ මා රකිත්'යි බිය රහිත ව නිදා ගත්තෙමි, මෙ පමණක් ම මම දනිමි"යි කී ය. ඉක්බිති එ දරුගේ මවුපියෝ එහි ගියහ. රජ තෙමේ එ පුවත දැන ඒ තිදෙනාත් කැටුව බුදුරජුන් වෙතට ගොස් සියල්ල දන්වා "ස්වාමීනි! කිම? බුද්ධානුස්සතිය ම මහාජනයාහට රැකුම් පිණිස වන්නී ද?, නැත, ධම්මානුස්සති ආදීහුත් රැකුම් පිණිස වෙත් දැ?" යි ඇසුයේ ය. බුදුරජානන් වහන්සේ "මහරජ! බුද්ධානුස්සතිය ම පමණක් රැකුම් පිණිස වන්නී නො වේ, යම් කෙනකුන් විසින් බුද්ධානුස්සති ආදී වූ සවැදෑරුම් අනුස්සතීන්ගෙන් සිත වඩනා ලද නම් ඔවුනට අන්‍ය වූ රක්‍ෂාවරණයෙකින් හෝ මන්‍ත්‍රෞෂධයෙකින් වැඩෙක් නැතැ" යි වදාරා ඒ අනුස්සතීන් දක්වන සේක් මේ ධර්‍ම-දෙශනාව කළ සේක.

**සුප්පබුද්ධං පබුජ්ඣන්ති සදා ගොතමසාවකා,**
**යෙසං දිවා ච රත්තො ච නිච්චං බුද්ධගතා සති.**

**සුප්පබුද්ධං පබුජ්ඣන්ති සදා ගොතමසාවකා,**
**යෙසං දිවා ච රත්තො ච නිච්චං ධම්මගතා සති.**

**සුප්පබුද්ධං පබුජ්ඣන්ති සදා ගොතමසාවකා,**
**යෙසං දිවා ච රත්තො ච නිච්චං සඞ්ඝගතා සති.**

**සුප්පබුද්ධං පබුජ්ඣන්ති සදා ගොතමසවකා,**
**යෙසං දිවා ච රත්තො ච නිච්චං කායගතා සති.**

**සුප්පබුද්ධං පබුජ්ඣන්ති සදා ගොතමසාවකා,**
**යෙසං දිවා ච රත්තො ච අහිංසාය රතො මනො.**

**සුප්පබුද්ධං පබුජ්ඣන්ති සදා ගොතමසාවකා,**
**යෙසං දිවා ච රත්තො ච භාවනාය රතො මනො.**

යම් කෙනකුන්හට දහවලත් රැත් නිතර බුදුගුණ ඇරබැ උපදනා සිහිය ඇත්තේ ද, (ඒ) ගෞතමශ්‍රාවකයෝ හැම කල්හි මනා පිබිදී-මෙන් පුබුදින්නාහ.

යම් කෙනකුන්හට දහවලත් රැත් නිතර දහම්ගුණ ඇරබැ උප-දනා සිහිය ඇත්තේ ද, (ඒ) ගෞතමශ්‍රාවකයෝ හැම කල්හි මනා පිබිදීමෙන් පුබුදින්නාහ.

යම් කෙනකුන්හට දහවලත් රැත් නිතර සඟගුණ ඇරබැ උපදනා සිහිය ඇත්තේ ද, (ඒ) ගෞතමශ්‍රාවකයෝ හැම කල්හි මනා පිබි-දීමෙන් පුබුදින්නාහ.

යම් කෙනකුන්හට දහවලත් රැත් නිතර කය ඇරබැ උපදනා සිහිය ඇත්තේ ද (ඒ) ගෞතමශ්‍රාවකයෝ මනා පිබිදීමෙන් පුබු-දින්නාහ.

යම් කෙනකුන්ගේ සිත දහවලත් රැත් නිතර අහිංසාභාවනායෙහි ඇලුනේ ද (ඒ) ගෞතමශ්‍රාවකයෝ හැම කල්හි මනා පිබිදීමෙන් පුබුදින්නාහ.

යම් කෙනකුන්ගේ සිත දහවලත් රැත් භාවනායෙහි ඇලුනේ ද (ඒ) ගෞතමශ්‍රාවකයෝ මනා පිබිදීමෙන් පුබුදින්නාහ.

**සුප්පබුද්ධං පබුජ්ඣන්ති සදා ගොතමසාවකා** = සියලු කල්හි ගෞතමශ්‍රාවකයෝ මනා පිබිදීමෙන් පුබුදින්නාහ.

**ගොතමසාවකා,** යන සමාසයෙහි එන **ගොතම** ශබ්දයෙන් අපගේ සම්මා සම්බුද්ධරජාණන් වහන්සේ ගැණෙන සේක. උන් වහන්සේ **ගෞතම** ශබ්දයෙන් හඳුන්වන ලද සේක් උන්වහන්සේ ගේ වංශයෙහි ආදිම පුරුෂ ගෞතමර්ෂි බැවිනි. ගෞතමර්ෂි පරම්පරායෙහි පහළ වූ දස දහස් ගණනක් රාජපුරුෂයන් අතුරෙහි ශ්‍රෙෂ්ඨ ස්ථානය දිනුවෝ බුද්ධරජාණන් වහන්සේ ය. ගෞතමගේ පුත්‍රපෞත්‍රයෝ **ගොතම-ගෞතම** නමින් ප්‍රකට වූහ. ගෞතමර්ෂි තෙමේ සප්තර්ෂීන් අතුරෙහි එකෙකි. හරිවංශයෙහි සප්තර්ෂීහු මෙසේ දක්වන ලදහ.

"අත්‍රිර්විශිෂ්ඨො භගවාන් කාශ්‍යපශ්ච මහානෘෂිඃ,
ගෞතමශ්ච භරද්වාජො විශ්වාමිත්‍රස්තථෛව ච.

තථෛව පුත්‍රො භගවාන් ඍචීකස්‍ය මහාත්මනඃ
සප්තමො ජමදග්නිශ්ච ඍෂයඃ සාම්ප්‍රතං දිවි" යි.

තව ද පූර්වයුගයෙහි, එකත-ද්විත-ත්‍රිත යි සහෝදරයෝ තිදෙනෙක් වූහ යි ද, ඔවුන්ගේ තපස් තෙදින් හා කායසංයමයෙන් හා ඉන්ද්‍රිය දමනයෙන් හා ගෞතම පහළ වී ය යි මහාභාරතයෙහි කියන ලද්දේය. මේ එය:

"ආසන් පූර්වයුගෙ රාජන් මුනයො භ්‍රාතරස්ත්‍රයඃ,
එකතශ්ච ද්විතශ්චෛව ත්‍රිතශ්චාදිත්‍යසන්නිභාඃ

තෙෂාං තු තපසා ප්‍රීතො නියමෙන දමෙන ච,
අභවද්ගෞතමො නිත්‍යං පිතා ධර්මරතඃ සදා" යි.

ගෞතම, බ්‍රහ්මපුත්‍රයෙකැ යි කියන ලද්දේ ය.

ආදියෙහි ගෞතම නමින් පළට වූ මේ පුත්‍රපෞත්‍රපරම්පරායෙහි වූවෝ කලින් කල විවිධහෙතූන් නිසා ගොත්‍රනාම විසින් විවිධත්වයට පැමිණියහ. බුදුරජුන්ගේ පියමුතුපරපුර පසු කාලයෙහි ශාක්‍යවංශ නමින් හැඳුනුනේ ද එහෙයිනි. පූර්විකගොත්‍ර නාම විසින් ගෞතම යනුත් පශ්චිම නාම විසින් ශාක්‍ය යනුත් උන්වහන්සේ කෙරෙහි නැගුනේ ය. ඉක්ෂ්වාකු-සූර්‍ය්‍ය-චන්ද්‍ර ආදී ගොත්‍රයෝ ද ගෞතමගොත්‍රයට අයත් වෙති. මධ්‍යමකාලයෙහි උපන් කපිලමුනිහුගේ අසපුවෙහි වූ ශාකවෘක්ෂ ඇසුරු කොට ඒ අසල විසූ බැවින් පසු කාලයෙහි ශාක්‍ය නම් වූහ.

"ශාකවෘක්ෂප්‍රතිච්ඡන්නං වාසං යස්මාත් ප්‍රචක්‍රිරෙ,
තස්මාදික්ෂ්වාකුවංශ්‍යාස්තෙ භුවි ශාක්‍යා ඉති ශ්‍රුතාඃ"

යි එය කීහ.

"නො ගෙවෙන යශස් ඇති සූර්‍ය්‍යවංශයෙහි සුවාසූ දහසක් රජ දරුවනට කෙළවර **විජය** නම් රජෙක් විය. ඔහුට දරුමුනුබුරන් ඇතුළු ව රජදරුවෝ පසළොස් දෙනෙක් වූහ. මේ හැමට බාල සුදර්ශන නම් රජුගේ පුත්, ඉක්ෂ්වාකු නමින් පළ වූයේ ය. ඔහුගේ පුත්‍රපෞත්‍රපරම්පරාව එතැන් සිට එනමින් ප්‍රකට වූ ය. අප මහ බෝසත් තෙමේ මේ වංශයෙහි **මහාසම්මත** නම් ව **මඛාදෙව** නම් ව **නිමි** නම් ව **කුස** නම් ව **රාම** නම් ව ඉපිද ආයේ ය. මහාසම්මත වංශයෙහි වූ ඉක්ෂ්වාකු රජුගේ අගමෙහෙසියට පුත්‍රයෝ සතර දෙනෙක් ද දූවරු පස් දෙනෙක් ද වූහ. ඒ සහෝදරයෝ සිවු දෙන තම සොහොයුරියන් පස් දෙනා හා ඇමැතියන් අට දෙනකු ගෙණ මහත් පිරිසක් ද කැටුව හිමවතට අභිමුඛ ව ගොස් **රොහිණී** ගං-ඉවුරෙහි කපිල ඍෂීන් විසින් මෙහෙයන ලදු ව තමන්ට නිසි රාජකන්‍යාවන් නැති බැවින් හා රජදූන්ට නිසි රාජපුත්‍රයන් නැති බැවින් හා කුලවංශය රකිනු පිණිස බාලබුහුන අගමෙහෙසිය කොට

දෙවූ බුහුන මවුතනතුරෙහි තබා වැඩි මහලු සොහොයුරු රජබැව්හි තබා විසූහ. ඔහු **උල්කාමුඛ** නම් ය. උන් කතා කරන්නට පටන්ගත් කල්හි අන්ධකාරයෙහි දිලියෙන දඬුවැට පහනක් මෙන් ඔහුගේ මුවින් කාන්තිය නික්මෙන්නී ය. හේ උල්කාමුඛ වූයේ එහෙයිනි. ඔවුන් එසේ නුවරක් ඉදි කොට වසනබව අසා ඉක්ෂ්වාකු රජු තම දූ පුතුන් තම වංශය රක්නට සමර්ථයහ යි සතුටු ව **"සක්‍යා වත භො රාජකුමාරා පරමසක්‍යා වත භො රාජකුමාරා"** යි ඇනූ උදන් වාක්‍ය විසින් ශාක්‍ය නම් වූහ" යි ද පොතපතෙහි එන්නේ ය.

ඒමේ ගෞතමගොත්‍රයෙහි උපන් බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවකයෝ **ගොතමසාවකා** නම් වෙත්.[1]

**යෙසං දිවා ච රත්තො ච නිච්චං බුද්ධගතා සති** = යම් කෙනෙකුන් හට දහවලත් රෑත් නිතර බුදුගුණ ඇරබැ උපදනා සිහිය ඇත්තේ වේ ද.

දිවා රාත්‍රි දෙක්හි නිතර බුදුගුණ සිහි කරණ ගෞතමශ්‍රාවකයෝ හැම කල්හි බුදුගුණ සිතින් ගෙණ නිදා පුබුදින බැවින් සැපසේ නිදා සැපසේ පුබුදින්නාහ.

**"ඉතිපි සො භගවා අරහං"** යනාදී විසින් කියූ බුදුගුණ අරමුණු කොට උපදනා සිහිය **බුද්ධගතාසති** නම්. බුද්ධානුස්සති යනු ද මේ ය. **"බුද්ධං ආරබ්භ උප්පන්නානුස්සති = බුද්ධානුස්සති, බුද්ධගුණාරම්මණාය සතියා එතං අධිවචනං"** යනු පොතෙහි ආයේ ය. 'බුදුරජාණන් වහන්සේගේ අපරිමිත ගුණය නැවැත නැවැත සිහි කිරීම බුද්ධානුස්සතිය යි. බුදුරජුන්ගේ පමණ නො කළැකි ගුණ අරමුණු කළ සිහියට මේ නමෙකි, යනු අරුත්.

එහි කෙලෙසුන් කෙරෙන් දුරුවීම, කෙලෙස් සතුරන් නැසීම, සංසාරචක්‍රයෙහි දූවි බිඳ හැරීම, ආමිෂ-ප්‍රතිපත්තිපූජාවනට සුදුසු වීම, රහසිනුදු පව් නො කිරීම යන මේ රහත්ගුණයෙන් අඩු නැති ව පිරී සිටි සේක් බුදුරජාණන් වහන්සේ අර්හත් වන සේක. **"ආරකත්තා, අරීනං අරානං හතත්තා, පච්චයාදීනං අරහත්තා, පාප කරණෙ රහාභාවා = අරහං"** යන මෙයින් පැහැදිලි වනුයේ ඒ වග යි. යට කියන ලද්දේ ය.[2]

වෙනසක් නො කොට ඇති සැටියෙන් තතු ලෙසින් තමන් විසින් ම පරොපදෙශරහිත ව දතයුතු සියලු දහම්, දතයුතු දහම් වසයෙන්, පිරිසිඳ දතයුතු සියලු දහම්, පිරිසිඳ දතයුතු දහම් වසයෙන්, දුරලිය යුතු සියලු දහම්, දුරලිය යුතු දහම් වසයෙන්, වැඩිය

---

1. 4. 12. 'සම්මාසම්බුද්ධසාවකො' යනු බලනු.
2. 7. 9. 'යථාරහතෙකා' යනු බලනු.

යුතු සියලු දහම්, වැඩිය යුතු දහම් වසයෙන්, දැනීම-පිරිසිඳීම-දුරැලීම-වැඩීම යන මේ සමපත් සම්බුද්ධගුණයෙන් පිරිසිටි සේක් බුදුරජාණන් වහන්සේ **සම්‍යක්සම්බුද්ධ** වන සේක. **“සම්මා සාමං සබ්බධම්මානං බුද්ධත්තා පන සම්මාසම්බුද්ධො”** යනු නිරුක්ති.

එහි බුදුරජාණන් වහන්සේ විශිෂ්ටඥානයෙන් දතයුතු වූ චතුරාර්‍යසත්‍යය පූර්වභාගයෙහි විදර්ශනාප්‍රඥායෙන් හා අධිගමකාලයෙහි මාර්ගඥානයෙන් හා අපරභාගයෙහි සර්වඥතාඥානයෙන් හා දැන වදාළ සේක.

දුක්ඛ යි හාත්පසින් දතයුතු වූ දුඃඛසත්‍යය, හාත්පසින් දතයුතු විසින්, දුරැලිය යුතු ය යි දතයුතු වූ සමුදයසත්‍යය, දුරැලිය යුතු විසින්, ඇස්හමුවෙහි කළ යුතු ය යි දතයුතු වූ නිරොධසත්‍යය, ඇස්හමුවෙහි කළ යුතු විසින්, වැඩිය යුතු ය යි දතයුතු වූ මාර්ගසත්‍යය, වැඩිය යුතු විසින්, ලක්ඛණ-රස-පච්චුපට්ඨාන-පදට්ඨාන විසින් දතයුතු වූ සියලු ධර්ම එසේ, අනිත්‍ය-දුඃඛ-අනාත්ම ලක්‍ෂණ විසින් දතයුතු වූ දුක් සැහැවි ඇති ධර්ම එසේ, ප්‍රත්‍යක්‍ෂ කළයුතු වූ සතර ඵල නිර්වාණධර්ම එසේ, වැඩිය යුතු වූ ආර්‍ය අෂ්ටාඞ්ගික මාර්ගධර්ම එසේ පිළිවෙළින් දැනීම- වෙන් කොට ගැණීම-ඇස්හමුයෙහි කිරීම-වැඩීම කළ සේක. එය මෙසේ වදාළ සේක.

“අභිඤ්ඤෙය්‍යං අභිඤ්ඤාතං භාවෙතබ්බං ච භාවිතං,
පහාතබ්බං පහීණං මෙ තස්මා බුද්ධොස්මි බ්‍රාහ්මණ”යි.

බමුණ! මා විසින් වෙසෙසින් දතයුතු වූ දුඃඛසත්‍යය වෙසෙසින් දන්නා ලද්දේ ය. හාත්පසින් දුරැලිය යුතු වූ සමුදයසත්‍යය දුරුකරණ ලද්දේ ය. ඇස්හමුයෙහි කළ යුතු වූ නිරොධසත්‍යය ඇස්හමුයෙහි කරණ ලද්දේ ය. වැඩිය යුතු වූ මාර්ගසත්‍යය වඩන ලද්දේ ය, යනු අරුත්.

තවද චක්‍ෂුරායතනය දුඃඛසත්‍යය යි ද, එහි ඉපැත්මට මූලකාරණ වූ තෘෂ්ණාව සමුදයසත්‍යය යි ද, චක්‍ෂුරායතනයාගේ හා තෘෂ්ණාවගේ නො පැවැත් ම නිරොධසත්‍යය යි ද, ඒ නිරොධය ප්‍රතිවෙධ කරන්නා වූ ප්‍රතිපත්තිය මාර්ගසත්‍යය යි ද මෙසේ එක් එක් ධර්මය උද්ධරණය කිරීම් වශයෙන් දත් සේක්, බුදුරජාණන් වහන්සේ සම්‍යක් සම්බුද්ධ වන සේක.

සොතායතන - ඝානායතන-ජිහ්වායතන - කායායතන - මනායතන ද චක්‍ෂුරායතනයෙහිලා කියූ ලෙසින් දතයුතු ය. රූපායතනාදී වූ බාහිරායතන සය, චක්ඛුවිඤ්ඤාණාදී වූ විඤ්ඤාණකාය සය,

චක්ඛුසම්ඵස්සාදී වූ ඵස්ස සය, චක්ඛුසම්ඵස්සජාවෙදනාදී වූ වෙදනා සය, රූපසඤ්ඤාදී වූ සඤ්ඤා සය, රූපසඤ්චෙතනාදී වූ චෙතනා සය, රූපතණ්හාදී වූ තණ්හා සය, රූපවිතක්කාදී වූ විතක්ක සය, රූපවිචාරාදී වූ විචාර සය, රූපක්ඛන්ධාදී වූ ස්කන්ධ පසය, පඨවිකසිණාදී වූ කසිණ දසය, බුද්ධානුස්සති ආදී වූ අනුස්සති දසය, උද්ධුමාතකාදී වූ සඤ්ඤා දසය, කෙසාදී වූ කුණප කොට්ඨාස දෙතිසය, චක්ඛුරාදී වූ ආයතන දොළොසය, චක්ඛුධාතු ආදී වූ ධාතු අටළොසය, කාමභවාදී වූ භව නවය, පඨමජ්ඣානා දී වූ ධ්‍යාන සතරය, මෙත්තාදී වූ අප්පමඤ්ඤා සතරය, ආකාසානඤ්චායතනාදී වූ අරූපසමාපත්ති සතරය, ප්‍රතිලෝම වශයෙන් ජරාමරණාදී වූ ද, අනුලෝම වශයෙන් අවිද්‍යා දී වූ ද පටිච්චසමුප්පාදඞ්ග දෑයි එක් එක් ධර්මය උද්ධරණය කොට තමන් වහන්සේ ම මෙසේ අවබොධකළ සේක්, බුදුරජානන් වහන්සේ සම්‍යක් සම්බුද්ධ වන සේක.

විපස්සනාඤාණ-මනොමයිද්ධි-දිබ්බසොත-පරචිත්තවිජානන-පුබ්බෙනිවාසානුස්සති-දිබ්බචක්ඛු-ආසවක්ඛය යන මේ ඥානාෂ්ටකය විද්‍යා ය. විඳ ගතයුතු වූ නිවන්රසය තතු පරිදි ඇති ලෙසින් විඳ ගන්නා අරුතින් හෝ අවිදු අඳුරු නසාලන අරුතින් හෝ විද්‍යා නම්.

සීලසංවර-ඉන්ද්‍රියසංවර-භොජනෙමත්තඤ්ඤුතා-ජාගරියානුයොග-සද්ධා-හිරි-ඔත්තප්ප-බාහුසච්ච-විරිය-සති-පඤ්ඤා-චතුර්විධධ්‍යාන යන මේ ධර්මපසළොස චරණ ය. යම් ධර්මසමූහයක් කරණකොට ආර්‍යශ්‍රාවක තෙමේ නිවනට යන්නේ ද නිවනට යෑමට උපකාර වූ ඒ ධර්ම චරණ නම්. මේ අෂ්ටවිද්‍යා පඤ්චදශචරණධර්මයන් ගෙන් පිරී සිටි සේක්, බුදුරජානන් වහන්සේ **විද්‍යාචරණසම්පන්න** වන සේක. **"විජ්ජාහි ඉන චරණෙන ච සම්පන්නත්තා=විජ්ජාචරණසම්පන්නො"** යනු විවෘතිය.[1]

ශොභන ගමන් ඇතිබව සොඳුරු තැනට ගියබව, මනා කොට ගියබව, මනා තෙපුල් ඇතිබව යන මේ සුගතත්වගුණයෙන් පිරී සිටි සේක්, බුදුරජානන් වහන්සේ **සුගත** වන සේක. **"සොභනගමනත්තා, සුන්දරං ඨානං ගතත්තා, සම්මා ගතත්තා, සම්මා ච ගදත්තා සුගතො"** යනු අර්ථසමර්ථනය යි.

බුදුරජානන් වහන්සේගේ ගමන් හොබනේ ය. පිරිසිදු ය. නිවරද ය. ඒ නම්. ආර්‍යමාර්ගය යි. ඒ ආර්‍යමාර්ගයෙන් කිසි තැනෙක නො ලැගෙමින් නො ගැටෙමින් නිවන් දිගට ගිය බැවින් ශොභන ගමන් ඇති සේක්, උන්වහන්සේ සුගත නම් වෙති.

---

1. 10. 10. 'සම්පන්නවිජ්ජාචරණා' යනු බලනු.

ලොකය බිය සහිත ය. ලොකයා බියරහිත වන්නට නම් පඤ්ච ස්කන්ධලොකයෙන් එතෙර විය යුතු ය. එ තෙර ව පිහිටිය යුතු තැන නිවන ය. ඒ ය නිර්භයස්ථාන ය. සොඳුරු තැනත් ඒ ය. ඒ සොඳුරු තැනට ගිය බැවින් උන්වහන්සේ සුගත නම් වෙති.

සෝවන්මගින් නැසිය යුතු, සෙදගැමිමගින් නැසිය යුතු, අනැ-ගැමි මගින් නැසිය යුතු, රහත්මගින් නැසිය යුතු කෙලෙස් කිසිවක් යන්තමකිනුදු ඉතිරි නො කොට නසා ඔවුන් කරා පෙරළා නො පැමිණි බැවින් උන්වහන්සේ සුගත නම් වෙති. මේ මෙහිලා සාධක: **"සොතාපත්තිමග්ගෙන යෙ පහීනා තෙ කිලෙසෙ න පුනෙති, න පච්චෙති, න පච්චාගච්ඡතීති සුගතො, සකදාගාමිමග්ගෙන යෙ කිලෙසා පහීනා තෙ කිලෙසෙ න පුනෙති, න පච්චෙති, න පච්චාගච්ඡතීති සුගතො, අනාගාමිමග්ගෙන යෙ කිලෙසා පහීනා තෙ කිලෙසෙ න පුනෙති, න පච්චෙති, න පච්චාගච්ඡතීති සුගතො, අරහත්තමග්ගෙන යෙ කිලෙසා පහීනා තෙ කිලෙසෙ න පුනෙති, න පච්චෙති, න පච්චාගච්ඡතීති සුගතො"** යනු.

දීපඞ්කරපාදමූලයෙහි පටන් බෝමැඩ දක්වා සමත්‍රිංශත් පරමි ධර්මසඞ්ඛ්‍යාත සම්‍යක් ප්‍රතිපත්තියෙන් මුළු ලොවට හිත සුව එළවමින් ශාශ්වත-උච්ඡෙද වශයෙන් හෝ කාමසුඛ-අත්තකිලමථ වශයෙන් හෝ අන්තද්වයට නො පැමිණ ගිය බැවින් උන්වහන්සේ සුගත නම් වෙති.

තමන් වහන්සේ දන්නා යම් වචනයෙක් අසත්‍ය ද, අර්ථ-රහිත ද, අන්හට අප්‍රිය ද එබඳු වචන නො වදාරණ බැවින්, තමන් වහන්සේ දන්නා වචනයෙක් සත්‍ය ද, එහෙත් අර්ථරහිත ද, අන්-හට අප්‍රිය ද එබඳු වචන නො වදාරණ බැවින්, යම් වචනයෙක් සත්‍ය ද, අර්ථසහිත ද, අන්හට අප්‍රිය ද එබඳු වචන කීමෙහි ලා කල් බලන බැවින්, යම් වචනයෙක් අසත්‍ය ද, අර්ථ රහිත ද, එය අන්හට ප්‍රිය වුව ද නො වදාරණ බැවින්, යම් වචනයෙක් සත්‍ය ද, අනර්ථයෙන් යුක්ත ද, අන්හට ප්‍රිය වුව ද නො වදාරණ බැවින්, යම් වචනයෙක් සත්‍ය ද, අර්ථයෙන් යුක්ත ද, අන්හට ප්‍රිය ද එබඳු වචන කීමෙහිලා කල් බලන බැවින්, මෙසේ මනා තෙපුල් ඇති බැවින් උන්වහන්සේ සුගත නම් වෙති. මේ මෙහි සාධක:

**"යං තථාගතො වාචං ජානාති අභූතං අතච්ඡං අනත්ථ-සංහිතං සා ච පරෙසං අප්පියා අමනාපා, න තං තථාගතො වාචං භාසති.**

**යම්පි තථාගතො වාචං ජානාති භූතං තච්ඡං අනත්ථසංහිතං සා ච පරෙසං අප්පියා අමනාපා, න තං තථාගතො වාචං භාසති.**

**යං ච ඛො තථාගතො වාචං ජානාති භූතං තච්ඡං අත්ථසංහිතං සා ච පරෙසං අප්පියා අමනාපා, තත්‍ර කාලඤ්ඤූ හොති තථාගතො තස්සා වාචාය වෙය්‍යාකරණාය.**

**යම්පි තථාගතො වාචං ජානාති අභූතං අතච්ඡං අනත්ථසංහිතං සා ච පරෙසං පියා මනාපා, න තං තථාගතො වාචං භාසති.**

**යම්පි තථාගතො වාචං ජානාති භූතං තච්ඡං අනත්ථසංහිතං සා ච පරෙසං පියා මනාපා, තම්පි තථාගතො වාචං භාසති.**

**යං ච ඛො තථාගතො වාචං ජානාති භූතං තච්ඡං අත්ථසංහිතං සා ච පරෙසං පියා මනාපා, තත්‍ර කාලඤ්ඤූ හොති තථාගතො තස්සං වාචාය වෙය්‍යාකරණාය"** යනු.

ලොක නම්: ප්‍රධාන විසින් සඞ්ඛාරොපාදානස්කන්ධලොකය යි. එය!සවභාව වශයෙන්, සමුදය වශයෙන්, නිරොධ වශයෙන්, නිරොධොපාය වශයෙන් දැකීම යන ලොක විදූ ගුණයෙන් යුක්ත වූසේක් බුදුරජානන් වහන්සේ **ලොකවිදූ** වන සේක. සවභාව වශයෙන් දැක්ම නම්: දුඃඛ වශයෙන් දැකීම ය. සමුදය වශයෙන් දැක්ම නම්: දුක් හට ගැණිමෙහි හෙතු වූ තෘෂ්ණා වශයෙන් දැකීම ය. නිරොධ වශයෙන් දැක්ම නම්: යම් තැනෙක දුක් මුළුමනින් නිරුද්ධ වේ ද ඒ නිර්වාණ වශයෙන් දැකීම ය. නිරොධොපාය වශයෙන් දැක්ම නම්: ආය්‍ර්‍යමාර්ගී වශයෙන් දැකීම ය. මෙහි ලා පඤ්චොපාදානස්කන්ධ ලොකය ගැණෙන බවට "**යත්ථ ඛො ආවුසො න ජායති, න ජීයති, න මීයති, න චවති, න උපපජ්ජති. නාහං තං ගමනෙන ලොකස්සන්තං ඤාතෙය්‍යං දට්ඨෙය්‍යං පත්තෙය්‍යන්ති වදාමි. න චාහං ආවුසො අප්පත්වාව ලොකස්සන්තං දුක්ඛස්ස අන්තකිරියං වදාමි. අපිචාහං ආවුසො ඉමස්මිං යෙව ව්‍යාමමත්තෙ කළෙබරෙ සසඤ්ඤිම්හි සමනකෙ ලොකං ච පඤ්ඤපෙමි, ලොකසමුදයං ච ලොකනිරොධං ච ලොකනිරොධගාමිනිං ච පටිපදං පඤ්ඤපෙමි.**

ගමනෙන න පත්තබ්බො ලොකස්සන්තො කුදාචනං,
න ච අප්පත්වා ලොකන්තං දුක්ඛා අත්ථි පමොචනං.

තස්මා හවෙ ලොකවිදූ සුමෙධසො
ලොකන්තගූ වුසිතබ්‍රහ්මචරියො,
ලොකස්ස අන්තං සමිතාවි ඤත්වා
නාසිංසති ලොකමිමං පරං ච"

යනු සාධක

යම් තැනෙක ජාති-ජරා-මරණ නැත්තේ ද, චුති-උප්පත්ති නැත්තේ ද ඒ නිර්වාණසඞ්ඛ්‍යාතලොකාන්තය පියවි පාගමනින්

ගොස් දක්ක හැකිය යි මම නො කියමි. මේ සඤ්ඤ සහිත මනස් සහිත බඹයක් පමණ වූ සිරුරෙහි ම ලොකය ද ලොකසමුදය ද ලොකනිරොධය ද ලොකනිරොධගාමිනීප්‍රතිපදාව ද පණවමි.

කිසිකලෙක පාගමනින් ලොකයෙහි කෙළවරට නො යා හැකිය. ලොකයෙහි කෙළවරට නො ගොස් දුකින් මිදීම ද නො කළ හැකි ය.

එහෙයින් ලොකය දන්නා ලොකයෙහි කෙළවරට පැමිණ විසූ මගබඹසර ඇති කෙලෙස් සන්සිඳ වූ මනා නුවණැත්තේ ලොක-යෙහි කෙළවර දැන මෙලොව හා පරලොව හා නො පතන්නේ ය, යනු එහි කෙටි අරුත්.

මේ දෙශනායෙන් පෙණෙනුයේ ද 'ලොකවිදූ' යන තන්හි ලොක ශබ්දයෙන් ප්‍රධාන විසින් පඤ්චොපාදානස්කන්ධලොකය ගැණෙන බව ය. එහෙත් සංස්කාරලොක – සත්ත්වලොක – අවකාශ ලොක ද බුදුරජානන් වහන්සේ දත් සේකැ යි ගන්නට කිසිත් බාධකයෙක් නැත්තේ ය. උන්වහන්සේ ඒ ලොකත්‍රය ද හැම අයුරෙන් දත් සේක. එහෙයිනිදු ලොකවිදූහ. **"සබ්බථාපි විදිත-ලොකත්තා ලොකවිදූ"** යි කියේ ද එහෙයිනි.

සංස්කාරලොක නම්: ප්‍රත්‍යයයෙන් නිපදනා සංස්කාරය. ඉන්ද්‍රිය-බද්ධ – අනින්ද්‍රියබද්ධස්කන්ධ, **"පච්චයෙහි සංඛරීයන්ති ලුජ්ජන්ති පලුජ්ජන්ති"** යි කී බැවින් සංස්කාරලොක නම්. **"එකො ලොකො සබ්බෙ සත්තා ආහාරට්ඨිතිකා"** යන මෙහි ද දක්වූයේ සංස්කාර-ලොකය යි.

සත්ත්වලොක නම්: ඉන්ද්‍රියබද්ධස්කන්ධයන්ගේ සමූහසන්තාන-ය යි. දෘෂ්ටිගතිකයන්ගේ ශාශ්වතාදිවශයෙන් ආත්මය, ලොකය යන පිළිගැණුම් බොහෝසේ පැවතුම් විසින් සත්ත්වවිෂයක වේ. සංස්කාර-විෂයක නො වේ. සත්ත්වයෝ සත්ත්වලොක නම්. **"සස්සතො ලොකො අසස්සතො ලොකොති වා"** යන මෙයින් දක්වුනේ සත්ත්වලොකය යි.

අවකාශලොක නම්: අනින්ද්‍රියබද්ධරූපාදීන්ගේ සමූහසන්තාන ය යි. 'භාජනලොක' නමිනුදු මෙය කියැවෙන්නේ ය.

"යාවතා චන්දිමසූරියා පරිහරන්ති දිසා භන්ති විරොචනා,
තාව සහස්සධා ලොකො එත්ථ තෙ වත්තතෙ වසො"

මෙයිනුදු අවකාශලොකය කියත්. "සඳහිරු දෙදෙන යම්තාක් තැන් පරිහරණය කරත් ද, බබලමින් දිශා බබුලුවත් ද, ඒ තාක් තැන් එක් ලොකයෙකි. එබඳු දහසක් ලොකධාතුයෙහි තාගේ වසය පවතී" යනු එහි අරුත්.

බුදුරජාණන් වහන්සේ සංස්කාර - සත්ත්ව - අවකාශ යන මේ ලෝකත්‍රය ම කිසි තැනක් ඉතිරි නො කොට මුළුමනින් දත් සේක් ලෝකවිදූහ.

තමනට වඩා ශීල - සමාධි - ප්‍රඥා - විමුක්ති - විමුක්තිඥානාදි ගුණයන්ගෙන් උත්තරිතරයෙක් විශිෂ්ටතරයෙක් යමක්හට නැත්තේ ද හේ අනුත්තර. බුදුරජාණන් වහන්සේ මෙකී ගුණයන්ගෙන් දෙව්බඹුන් සහිත ලෝකය යටපත් කොට නැගී සිටි සේක්, **අනුත්තර** වන සේක. **“අත්තනො ගුණෙහි විසිට්ඨතරස්ස කස්සචි අභාවතො නත්ථි එතස්ස උත්තරො = අනුත්තරො”** යනු එය කියා ලන්නේ ය.

බුදුරජාණන් වහන්සේ ශීල - සමාධි - ප්‍රඥා - විමුක්ති - විමුක්ති ඥානදර්ශන යන සියලු ගුණයන්ගෙන් ලෝකය යටපත් කොට නැගී සිටිනා සේක. මේ සියලු ශීලාදිගුණයන්ගෙන් තමන් හා සමයක්හු නැති බැවින් අසමයහ. අසම වූ ඉකුත් ව ගිය බුදුරජුන් හා සම බැවින් අසමයහ. තමන් රූ බඳු පිළිරූ කරන්නට නො හැකි බැවින් අප්‍රතිමයහ. තමන් වහන්සේ වදාළ සතිපට්ඨානාදි ධර්ම එසේ නො වේ ය යි පටහැනිව කියන්නට කෙනකු නැති බැවින් අප්‍රතිභාගයහ. ‘තමුන්නාන්සේ බුදු නො වහු, මම බුදුමි’ යි කිය හැකි කෙනකු නැති බැවින් අප්‍රතිපුද්ගලයහ. මෙය මෙසේ වදාළ සේක. **“න ඛො පනාහං පස්සාමි සදෙවකෙ ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය අත්තනා සීලසම්පන්නතරං”** යි. “දෙවියන් මරුන් බඹුන් සහිත වූ ලෝකයෙහි මහණ බමුණු දෙව් මිනිසුන් සහිත ප්‍රජායෙහි මට වඩා ශීලයෙන් වැඩී සිටියකු මම නො දක්නෙමි” යනු අරුත්.

**අග්ගප්පසාද** සූත්‍රයෙහි දී “මහණෙනි! පා නැති දෙපා සිවුපා බොහෝ පා ඇත්තා වූ හෝ රූපී අරූපී සඤ්ඤී අසඤ්ඤී නෙවසඤ්ඤීනාසඤ්ඤී වූ හෝ යම් පමණ සත්ත්වකෙනෙක් වෙද්ද, ඔවුන් හැමට තථාගත අර්හත් සම්‍යක් සම්බුද්ධයෝ ම අග්‍රයහ” යි වදාළ සේක.

“න මෙ ආචරියො අත්ථි සදිසො මෙ න විජ්ජති,
සදෙවකස්මිං ලොකස්මිං නත්ථි මෙ පටිපුග්ගලො”

යනු වදාළෝ ද මෙ බව දක්වනු පිණිස ය. “මට ඇදුරෙක් නැත, මට සමානයෙක් නැත, දෙවියන් සහිත ලෝකයෙහි මට ප්‍රතිපුද්ගලයෙක් නැත’ යනු අරුත්.

බුදුරජානන් වහන්සේ අන් කාහටත් නො දැමිය හැකි **අජපාල - චූලෝදර - මහෝදර - අග්ගිසිඛ - ධූමසිඛ - ආරවාල - ධනපාලක** යන මේ ඈ බිහිසුණු තිරිසනුන්, **සච්චක - අම්බට්ඨ - පොක්ඛරසාති - සොණදණ්ඩ - කූටදන්ත** යන මේ ඈ තදමත් ඇති මිසදිටු ගත් බමුණන්, **ආලවක - සූචිරෝම - ඛරරෝම** යන මේ ඈ රුදුරු යකුන්, **සක්දෙව් - බකබඹ** යන මේ ඈ දෙව් බඹුන් දැමූහ. හික්මවූහ. ශරණයෙහි හා ශීලයෙහි හා පිහිටවූහ. එහෙයින් **"පුරිසදම්මෙ සාරෙතීති = පුරිසදම්මසාරථී"** යන අරුත් විසින් **පුරිසදම්මසාරථී** වන සේක.

තව ද බුදුරජානන් වහන්සේ නො දැමුනවුන් පමණක් ම දමනය කරණ සේක් නො වෙති. උන්වහන්සේ දැමුනවුන් ද විශුද්ධ ශීලාදියෙහි පිහිටුවමින් ධ්‍යානමාගීඵලාදිය ලැබීමට මග දක්වමින් දමනය කරණ සේක.

මෙහි දැක් වූ **අනුත්තර-පුරිසදම්මසාරථි** යන දෙ පදය එක් ව ගෙණ බුදුරජානන් වහන්සේ අන් කවරක්හටත් නො දැමිය හැකි වූවන් දැමූ බැවින් 'අනුත්තරපුරිසදම්මසාරථි' යි කියන ලදහ. ඇතුන්-අසුන් දමනය කරණුයේ උන් එක් ම දිසාවකට දුවවාලයි. බුදුරජානන් වහන්සේ එසේ දැමිය හැකියන් එක් ම දිසාවකට නො ද දුවවන සේක. උන්වහන්සේ එක් ඉරියව්වෙන් හුන් දමනය කට හැකි මිනිසුන් දෙවියන් බඹුන් අෂ්ටසමාපත්තීන් කරා නිරෝධ සමාපත්තිය කරා නිර්වාණය කරා සුදුසු පරිදි දුවවන බැවින් ගමන් කරවන බැවින් අනුත්තරපුරිසදම්මසාරථි ය හ.

මෙලොව පරලොව දියුණුව පිණිස සියලු දුක් නසා ලබන නිවන් පිණිස උනුනට සුදුසු පරිදි අනුශාසනා කිරීම ශාස්තෘභාවය යි. බුදුරජානන් වහන්සේ ඒ මේ ශාස්තෘභාවයෙන් පිරිගත් සේක් **ශාස්තෘ** වන සේක. **"දිට්ඨධම්මිකසම්පරායිකපරමත්ථෙහි යථාරහං අනුසාසතීති = සත්ථා"** යනු එයරුත කියන්නේ ය.

එහි දිට්ඨධම්මික නම්: මෙලොවින් වන හිතරුත ය. සම්පරායික නම්: පරලොවින් වන හිතරුත ය. පරමත්ථ නම්: නිවන ය. මේ තෙයරුතින් බුදුරජානන් වහන්සේ භව්‍යාභව්‍යයන් සුදුසු නො සුදුස්සන් දැන දෙව්මිනිසුනට අනුශාසනා කරණ සේක.

**සත්ථා** යන මෙ පදයෙන් සාර්ථවාහක ද කියනු ලැබේ. සාර්ථවාහක නම්: වෙළඳාම් පිණිස බඩු ගෙණ දෙශාන්තරයට යන වෙළඳ සමූහය යි. නැත, එහි ප්‍රධානයා ය. හේ, තමන් සමග යන සෙසු දෙනා චෞරකාන්තාර - ව්‍යාලකාන්තාර - දුර්භික්ෂකාන්තාර - නිරුදකකාන්තාර යන කාන්තාරවලින් එතෙර කරවා ක්ෂෙමභූමි

යට පමුණු වත්තේ ය. එමෙන් බුදුරජාණන් වහන්සේ සියලු සත්ත්වයන් සසර කතරින් එතෙර කරවන සේක් ජාති – ජරා – ව්‍යාධි – මරණ – සොක – පරිදෙව – දුක්ඛ – දෞර්මනස්ස – උපායාස කාන්තාර යන් එතෙර කර වන සේක. රාග – දෙස – මොහ – මාන – දිට්ඨි – කිලෙස – දුච්චරිත කාන්තාරයන් එතෙර කර වන සේක. නිර්භය වූ අමාමහනිවනට පමුණුවන සේක. එහෙයින් උන්වහන්සේ සාර්ථවාහක ය. **මහානිද්දේශයෙහි** ශාරිපුත්‍ර නිද්දේශය බලනු.

දෙව්මිනිසුනට අනුශාසනා කරණ සේකැ යි කියේ උත්කෘෂ්ට පරිච්ඡේද විසිනි. භව්‍යපුද්ගලයන්ගේ වශයෙනි. උන්වහන්සේ තිරිසන් ගිය සත්නට ද අනුශාසනා කරණ සේක. **ගග්ගරා** පොකුණු තෙර **චම්පා** නුවර වැසියනට ධර්මදෙශනා කරණ දවසෙක එක් මැඩියෙක් උන්වහන්සේගේ මධුරස්වරයෙහි නිමිති ගෙණ සිටියේ වසුපල්ලකුගේ සැරයටි දඬු කොණට යටවී කලුරිය කොට ධර්මස්වරයෙහි උපන් ප්‍රසාදබලයෙන් තව්තිසා දෙව්ලොව දොළොස් යොදුන් පමණ වූ රන්විමනෙක උපන්නේ ය. මෙසේ තිරිසන් ගියෝ ද බුදුරජුන්ගේ බණ අසා උපනිස්සය සම්පත් ලබා එයින් දෙවන තෙවන අත්බැව්හි මගපල ලබත්. එහෙයින් බුදුරජාණන් වහන්සේ දෙව්මිනිසුනට පමණක් නො ව තිරිසන් ගිය සත්නට ද ශාස්තෲ සේක.

දතයුතු දහම් යම් පමණ වේ ද, ඒ සියල්ල අවබොධ කල බැවින් බුදුරජාණන් වහන්සේ විමොක්ඛන්තිකඥාණ විසින් බුද්ධ වන සේක. සියලු කෙලෙසුන් කෙරෙන් මිදෙන බැවින් රහත්මග 'විමොක්ඛ' නමි. ඉන් අනතුරුව ලැබිය යුතු සබ්බඤ්ඤුතඥාණය 'විමොක්ඛන්තිකඥාණ' නමි. **"යම්පන අත්ථි ඤෙය්‍යං නාම සබ්බස්ස බුද්ධත්තා විමොක්ඛන්තිකඥාණවසෙන බුද්ධො"** යන මෙයින් බුද්ධ නම් කවරැ යි කීහ.

**සම්බුද්ධො – බුද්ධො** යන දෙපදයෙන් 'සම්බුද්ධො' යන පදය සංක්ෂෙප – විස්තර විසින් බුදුරජාණන් වහන්සේගේ චතුස්සත්‍යාවබොධය කී ය. 'බුද්ධො' යන පදය කියේ එයින් අන්‍ය වූ දතයුතු ධර්මයාගේ අවබොධය යි. තවද පූර්වවචනයෙන් බුදුරජුන්ගේ ප්‍රතිවෙධඥානයෙහි ආනුභාවය කියැ වේ. පශ්චිමවචනයෙන් කියැවෙනුයේ දෙශනාඥනයෙහි ආනුභාවය යි. තවද බුදුරජාණන් වහන්සේ චතුස්සත්‍යය, තෙමේ ද අවබොධ කල සේක. අන්හට ද අවබොධ කරවූ සේක. එහෙයින් ද බුද්ධ. **"බුජ්ඣිතා සච්චානීති** = බුද්ධො, **බොධෙතා පජායාති** = බුද්ධො, යනු කියේ එහෙයිනි.[1]

1. 14. 1 'තං බුද්ධමනන්තගොචරං' යනු බලනු

ඉසුරුබැව් ආදී වූ හගධම් ඇති සේක්, වනයෙහි ඉතා දුර සෙනසුන් සෙවුනු සේක්, අර්ථ – ධර්ම – විමුක්ති – රසභාග ඇති සේක් ලෞකික – ලොකොත්තර ධර්ම බෙදා දෙසූ සේක්, රාගාදී කෙලෙස් බිඳ හළ සේක්, භාග්‍ය ඇති සේක්, කායභාවනාදි විවිධ භාවනා ක්‍රම යත් වඩනාලද සිත් ඇති සේක්, භවයෙහි කෙළවරට පැමිණි සේක්, බුදුරජාණන් වහන්සේ භාග්‍යවත් සේක. මෙය කීහ මෙසේ:

''භගී භජී භාගී විභත්තවා ඉති
අකාසි භගහන්ති ගරූති භාග්‍යවා,
බහූහි ඤායෙහි සුභාවිතත්තො
භවන්තගො සො භගවාති වුච්චති'' යි.

තව ද 'භගවා' යන මෙ පදයෙහි අනෙක් වර්ණනා ක්‍රමයෙක් ද වේ. ඒ මෙසේ ය: ලෞකික-ලොකොත්තර සැප නිපදවන ශීලාදි පාරමීභාවයට පැමිණි කුසල් ඇති බැවින්, විස්තර විසින් ලොභ – දේස – මොහාදී වූ සිය දහස් ගණන් කෙලෙසුන්, සංක්‍ෂෙප විසින් කෙලශ – ස්කන්ධ – අභිසංස්කාර – දෙවපුත්‍ර – මෘත්‍යුමාර යන පස් මරුන් බිඳ හළ බැවින්, ඓශ්වර්ය – ධර්ම – යශස්ශ්‍රී – කාම – ප්‍රයත්න නම් වූ භගධර්මයන්ගෙන් යුක්ත බැවින්, කුශලාදි ධර්මයන් ස්කන්ධ – ආයතන – ධාතු – සත්‍ය – ඉන්ද්‍රිය – ප්‍රතීත්‍යසමුත්පාදාදී භෙදයෙන් හෝ දුඃඛාර්‍යසත්‍යය පීඩන – සඞ්ඛත – සන්තාප – විපරිණාම අරුත් විසින්, සමුදයාර්‍යසත්‍යය ආයූහන – නිදාන – සංයොග – පළිබොධ අරුත් විසින්, නිරොධාර්‍යසත්‍යය නිස්සරණ – විවෙක – අසඞ්ඛත – අමත අරුත් විසින්, මාර්ගසත්‍යය නීය්‍යාණික – හෙතු – දස්සන – ආධිපත්‍යය අරුත් විසින් බෙදා හෙළි කළ බැවින්, ඣාන – මෙත්තා – කරුණා – මුදිතා – උපෙක්ඛා – ඵලසමාපත්ති – කාය – චිත්ත – උපධිවිවෙක – සුඤ්ඤත – අප්පණිහිත – අනිමිත්තවිමොක්ඛ – ලොකිය – ලොකුත්තර උත්තරි මනුස්සධම්ම සෙවූ බැවින්, කාම – රූප – අරූප යන තුන් භවයෙහි වමාරා දැමූ තෘෂ්ණා ගමන් ඇති බැවින් භාග්‍යවත් සේක.

''භාග්‍යවා භග්ගවා යුත්තො භගෙහි ච විභත්තවා,
භත්තවා වන්තගමනො භවෙසු භගවා තතො''

යනු මේ හැම ගැබ් කොට ගත් ගාථා ය.

**භාග්‍යවා – භග්ගවා** යි මෙහි දැක්වූ දෙ පදයෙන් 'භාග්‍යවා' යන මෙයින් සිය පින් ලකුණෙන් හෙබි බුදුරජාණන් වහන්සේගේ රූපකායසම්පත්තිය ද 'භග්ගවා' යන මෙයින් ධර්මකායසම්පත්තිය ද දක්වන ලදි. තව ද එහි පළමු පදයෙන් සාමාන්‍ය මහජනයා විසින් බුහුමන් කරණු ලබන බව, ක්‍ෂත්‍රියාදිකුලප්‍රසූත ගෘහස්ථයන් විසින්

එළැඹිය යුතු බව, එළැඹ සිටි ගෘහස්ථයන්ගේ කායපීඩා දුරු කිරීමෙහි පොහොසත් බව, තමන් වෙත එළැඹියනට දෙව්මිනිස් සැප එළවීමෙහි සමත්බව දක්වා දෙවන පදයෙන් නුවණැති ලොකයා බුහුමන් කරණ බව, තවුස් ඈ පැවිද්දන් විසින් එළැඹිය යුතු බව, තමන් වෙත එළැඹියනට ලොවුතුරු සැප එළවීමෙහි සමත් බව දක්වූහ.

**'භගෙහි යුත්තො'** යන මෙයින් භග ධර්ම අතුරෙහි **ඓශ්වර්ය්‍ය,** අණිමා - ලඝිමා - ප්‍රාප්ති - ප්‍රාකාම්‍ය - මහිමා - ඊශිත්ව - වශිත්ව - යථාකාමාවසායිතා විසින් අටවැදෑරුම් ය යි සඞ්ඛ්‍යාතතත්ත්වකෞමුදියෙහි කියන ලදි.

"අණිමා ලඝිමා ප්‍රාප්තිඃ ප්‍රාකාම්‍යං මහිමා තථා,
ඊශිත්වඤ්ච වශිත්වඤ්ච යථාකාමාවසායිතා"

යනු එහි ආයේ ය.

සිය සිතෙහි ඉසුරුමත් බව, ලොකසම්මත සරීරයෙන් කැමැති දෑය මවා පෑම ඓශ්වර්ය්‍ය නම්. එය මෙසේ බෙදුනේ ය. සිය සිරුර ඉතා සියුම් බවට පැමිණවීම **අණිමා**. සිය සිරුර ඉතා සැහැල්ලු බවට පැමිණවීම **ලඝිමා**. සිය සිරුර මහත් කොට දක්වීම හෝ කැමැති තැනට පැමිණවීම **ප්‍රාප්ති**. ඉටා ගැණිම් ඈ විසින් කැමැති දෑය මවා පෑම **ප්‍රාකාම්‍ය**. අහසෙහි පයින් ගමන් කිරීම් ආදියෙහි මහත් බව **මහිමා**. තමාට වසඟ බව හෝ සිය වසයෙහි පැවැත්ම **ඊශිත්ව**. සෘද්ධිවිෂයයෙහි වශීභාවය **වශිත්ව**. අහසින් යන්නහුගේ හෝ අන් කිසිවක් කරන්නහුගේ හෝ යම් කිසි තැනෙක දී නිමාවට පැමිණීම **යථාකාමාවසායිතා**. මෙය කුමාරරූපාදිදර්ශනය යි ද කියත්. මේ අටවැදෑරුම් වූ ලොකසම්මත ඓශ්වර්ය්‍ය භාග්‍යවතුන් වහන්සේගේ සෘද්ධිවිධඥානයෙහි ඇතුළත් වූයේ අනන්‍යසාධාරණ ව සර්වාකාරපරිපූර්ණ ව සිටියේ ය. ශාසනික වූ හෝ බාහිරක වූ හෝ භග සඞ්ඛ්‍යාතඓශ්වර්ය්‍ය ඇති සේක් භගවත් නම්හ.

බාහිරක වූ භගධර්මයන්ගේ ආනුභාවයෙන් දෙවියෝත් සිද්ධයෝත් ඉතා සියුම් අත්බැව් ගෙණ සියලු තැන හැසිරෙන්නාහු ද කිසිවකුටත් දක්නට නො ලැබෙත්. **"යත්ප්‍රභාවාද්දෙවාඃ සිද්ධාශ්ච සූක්ෂ්මීභූය සර්වත්‍ර විචරන්ති"** යි එය කීහ.

බුදුරජානන් වහන්සේ බෝමුලදී ම සර්වඥතාඥානප්‍රතිලාභය හා ම මේ නාමප්‍රඥප්තිත් ලැබූ සේක. මවු පියන් විසින්, සහෝදර සහෝදරියන් විසින්, මිත්‍රාමාත්‍යයන් විසින්, නෑ සහ ලේ නෑයන් විසින්, මහණ බමුණන් විසින්, දෙව්බඹුන් විසින් උන්වහන්සේ කෙරෙහි මේ නාමප්‍රඥප්තිහු නො නඟන ලදහ.

මෙසේ භාග්‍යවතුන් වහන්සේ මේ මේ කාරණයෙන් තථාගත-පූර්ණ විසින් අර්හත් ය, මේ මේ කාරණයෙන් සම්‍යක් සම්බුද්ධ ය, මේ මේ කාරණයෙන් විද්‍යාචරණසම්පන්න ය, මේ මේ කාරණයෙන් සුගත ය, මේ මේ කාරණයෙන් ලෝකවිදූ ය, මේ මේ කාරණයෙන් අනුත්තර පුරුෂදම්‍යසාරථි ය, මේ මේ කාරණයෙන් දෙව්මිනිසුනට ශාස්තෘ ය, මේ මේ කාරණයෙන් බුද්ධ ය, මේ මේ කාරණයෙන් භගවත් ය යි බුදුගුණ සිහි කරන්නහුගේ සිත රාග-ද්වෙෂ-මොහ යන්ගෙන් නො පෙළෙන්නේ ය. ඔහුගේ සිත ඍජු ව ම බුදුගුණ අරමුණු කොට සිටින්නේ ය. රාගාදී වූ කෙලෙසුන්ගෙන් පෙළීමක් නැති බැවින් ඔහුගේ සිතෙහි කාමච්ඡන්දාදී වූ නීවරණයෝ යටපත් වෙති. කෙලින් ම කමටහනට අභිමුඛවීමෙන් සිතෙහි විතර්ක-විචාරයෝ බුදුගුණයට ම නැමී සිටිති. එසේ බුදුගුණ නිතර සිහි කරත් ම, උපචාරධ්‍යානය උපද වන ප්‍රීතිය උපදනී ය. සිතෙහි ප්‍රීතිය උපන් පසු ප්‍රීතිය ලං කොට සිටි පස්සද්ධියෙන් කායචිත්තදරථ සන්සිඳෙන්නේ ය. දරථ සන්සිඳීමෙන් පසු කායික - චෛතසික සුඛය උපදනේ ය. මෙසේ සුවපත් වූවහුගේ සිත බුදුගුණ අරමුණු කොට ම සමාධිගත වන්නේ ය. එ කෙණෙහි පිළිවෙළින් ධ්‍යානාඞ්ග පහළ වන්නේ ය. බුදුගුණ ගැඹුරු බැවිනුත් නන්වැදෑරුම් බුදුගුණ එකවිට සිහිකිරීමෙහි අදහස් පහළ වන බැවිනුත් මේ ධ්‍යානය අර්පණාවට නො පැමිණ උපචාරයට පමණක් පැමිණ සිටින්නේ ය. මෙසේ බුදුගුණ සිහිකිරීම නිසා උපදනා බැවින් මේ ධ්‍යානය, බුද්ධා-නුස්සති යි කියනු ලැබේ.

බුද්ධානුස්සතිභාවනායෙහි යෙදුනු යොගී තෙමේ බුදුරජුන් කෙරෙහි ගෞරව ඇතියේ වේ. යටත් පහත් පැවැතුම් ඇතියේ වේ. ශ්‍රද්ධායෙන් ස්මෘතියෙන් ප්‍රඥයෙන් පුණ්‍යයෙන් මහත්බවට පැමි-ණියේ වේ. නිතර සතුටින් වසනුයේ වේ. හැම බිය ඉවසනුයේ වේ. දුක් ඉවසීමට පොහොසත් වනුයේ වේ. ‘බුදුරජුන් හා එක් ව වසමි, යන අදහස් ඇතියේ වේ. බුද්ධානුස්මෘතියෙන් ඔදවැඩුනු ඔහුගේ ශරීරය සෑ ගෙයක් මෙන් පිදිය යුතු වේ. සිත බුද්ධභූමියට නැමී සිටියේ වේ. ‘පව්කමක් කරමි’යි සිතන්නා හා ම බුදුරජුන් තමන් ඉදිරියෙහි සිටින්නා සේ පෙණී යන්නේ ය. එයින් ලජ්ජා – භය ඇතියේ වේ මේ අත්බැව්හි මගපල අත්පත් නො වූයේ නම් මර-ණින් මතු එකාන්තයෙන් සුගතියෙහි උපදින්නේ ය.

**සුප්පබුද්ධං පබුජ්ඣන්ති සදා ගොතමසාවකා** = සියලු කල්හි ගෞ-තම ශ්‍රාවකයෝ මනා පිබිදීමෙන් පුබුදින්නාහ.

**යෙසං දිවා ච රත්තෝ ච නිච්චං ධම්මගතා සති** = යම් කෙනකුන් හට දහවලත් රෑත් නිතර දහම්ගුණ ඇරැබ උපදනා සිහිය ඇත්තේ වේ ද.

දිවා රාත්‍රි දෙක්හි නිතර දහම්ගුණ සිහි කරණ ගෞතමශ්‍රාවකයෝ හැම කල්හි දහම්ගුණ සිතින් සලකා ගෙණ නිදා පුබුදිනා බැවින් සුවසේ නිදා පුබුදින්නා හ.

**"ස්වාක්ඛාතො භගවතා ධම්මො"** යනාදී විසින් කියූ දහම් ගුණ අරමුණු කොට උපදනා සිහිය, **ධම්මගතා සති** නම්. ධම්මානුස්සති යනු ද මේ ය. **ධම්මං ආරබ්භ උප්පන්නානුස්සති ධම්මානුස්සති, ස්වාක්ඛාතතාදිධම්මගුණාරම්මණාය සතියා එතං අධිවචනං'** යනු පොතෙහි ආයේ ය. සපර්‍ය්‍යාප්තික නවලොකොත්තරධර්මයෙහි ගුණ නැවැත නැවැත සිහිකිරීම ධම්මානුස්සතිය යි. ධර්මයෙහි පමණ නො කළැකි ගුණ අරමුණු කළ සිහියට මේ නමෙකි, යනු අරුත්.

**ස්වාක්ඛාතො භගවතා ධම්මො**=භාග්‍යවතුන් වහන්සේ විසින් ධර්මය මනා කොට දෙසන ලද්දේ ය. මෙහි ලා පෙළදහම නවලොවුතුරු දහම ගැණේ. එහි පෙළදහම, මුල – මැද – අග යහපත් බැවින් හා අර්ථව්‍යඤ්ජන සහිත වූ සියල්ලෙන් පිරිපුන් වූ පිරිසිදු වූ බඹසර පවසන බැවින් හා මනා කොට දෙසන ලද ය. බුදුරජුන් එක් ගාථාවක් නමුත් දෙසන ලද නම් ඒ ගාථාව හැම අතින් මුල-මැද-අග කල්‍යාණ ය. එකානුසන්ධිකසූත්‍රයෙහි කාල දෙශාදිය දක්වන නිදානයෙන් මුල ද, '**ඉදමවොච භගවා,** යනාදී නිගමනයෙන් අග ද සෙසු මැද කොටසින් මැද ද කල්‍යාණ ය. නානානුසන්ධික සූත්‍රයෙහි ප්‍රථම අනුසන්ධියෙන් මුල ද, අවසාන අනුසන්ධියෙන් අග ද සෙසු මැද අනුසන්ධීන්ගෙන් මැද ද කල්‍යාණ ය.

සූත්‍ර – විනයපිටක දෙක නිදානයෙන් හා අර්ථොත්පත්තියෙන් යුක්ත වූයේ ආදි විසින් ද, විනෙයජනයන්ගේ අදහස් පරිදි දෙසන ලදුයේ ශීලාදී අර්ථයෙන් නො වෙනස් වනුයේ හෙතූදාහරණ සහිත වූයේ මධ්‍ය විසින් ද, අසන්නවුන්ගේ ශ්‍රද්ධාව වඩාලන නිගමනයෙන් යුක්ත වූයේ පර්‍ය්‍යවසාන විසින් ද කල්‍යාණ ය. මේ කීයේ ත්‍රිපිටකධර්මයෙහි ලා ලැබෙන සැටිය.

සියලු පර්‍ය්‍යාප්තිශාසනය එහි අර්ථය වූ ශීලවශයෙන් ආදියෙන් ද, ශමථ – විදර්ශනා – මාර්ගඵල වශයෙන් මධ්‍යයෙන් ද; නිවන් ලැබූ පසු කළයුත්තක් නැති බැවින් නිර්වාණයාගේ වශයෙන් පර්‍ය්‍යවසානයෙන් ද කල්‍යාණ ය. තව ද ශීල-සමාධි දෙකින් ආදිය හා විදර්ශනා-මාර්ග දෙකින් මධ්‍යය හා ඵල-නිර්වාණ දෙකින් පර්‍ය්‍යවසානය හා කල්‍යාණ ය.

'බුදුරජාණන් වහන්සේ මනා නුවණැති සේක යි ගැණීමෙන් බුද්ධසුබොධිතායෙන් ආදිය හා 'ධර්මය උන්වහන්සේගෙන් ප්‍රභව

ච් ය යි ගැණීමෙන් උපදනා ධර්මසුධර්මතායෙන් මද්‍ධ්‍යය හා 'සඞ්ඝ තෙමේ බුදුරජුන් වදාළ පිළිවෙත් අනුව වැටේ ය' යි ගැණීමෙන් උපදනා සඞ්ඝසුප්‍රතිපත්තිතායෙන් පර්‍ය්‍යවසානය හා කල්‍යාණ ය. අභිසම්බෝධියෙන් ආදිය හා ප්‍රත්‍යෙකබෝධියෙන් මද්‍ධ්‍යය හා ශ්‍රාවකබෝධියෙන් පර්‍ය්‍යවසානය හා කල්‍යාණ ය. ශ්‍රද්ධායෙන් ධර්මශ්‍රවණය කරන්නහුගේ තදඞ්ග විසින් නීවරණධර්ම යටපත් වන බැවින් ශ්‍රවණමාත්‍රයෙන් හිතයක් ම වන බැවින් ආදිය හා පිළිපැදීමෙන් ශමථ - විදර්ශනාසුඛ ගෙණ දෙන බැවින් පිළිවෙතින් මද්‍ධ්‍යය හා දහමට අනුව පිළිපත්නහුට ඒ පිළිවෙත පුරා අවසන්හි ෂඩඞ්ගොපෙක්‍ෂා වශයෙන් ඉටු අරමුණෙහි තාදීභාවය ගෙණ දීමෙන් ප්‍රතිපත්තිඵලයෙන් පර්‍ය්‍යවසානය හා කල්‍යාණය.

මෙසේ බුද්ධධර්මය ආදි-මජ්ඣ-පරියොසාන කල්‍යාණ බැවින් ස්වාක්‍යාත ය. බුදුරජානන් වහන්සේ ත්‍රිවිධ ශික්‍ෂා සඞ්ඛ්‍යාත ශාසන බ්‍රහ්මචර්‍ය්‍යය හා ආර්‍ය්‍යමාර්ග සඞ්ඛ්‍යාත මාර්ග බ්‍රහ්මචර්‍ය්‍යය නානානයින් වදාරණ සේක් එ දෙක තම තමාට සුදුසු පරිදි අර්ථසම්පත්තියෙන් යුක්ත බැවින්, **සඞ්කාසන-පකාසන-විවරණ-විභජන-උත්තානීකරණ-පඤ්ඤත්ති** යන සවැදෑරුම් අර්ථපදයන් හා එක්වීමෙන් අර්ථගම්භීරතා ප්‍රතිවෙධ ගම්භීරතායෙන් යුක්ත බැවින්, අර්ථපටිසම්භිදා - පටිභානපටිසම්භිදා විෂය බැවින්, පණ්ඩිතයන් විසින් දත යුතු බැවින් හා පරීක්‍ෂකජනයාගේ චිත්තප්‍රසාදය එළවන බැවින්, ගැඹුරු අදහස් ඇති බැවින් යන මෙ කරුණුවලින් සාර්ථ ය. තවද ශීලවිශුද්ධි ආදී වූ සම්‍යක් ප්‍රතිපත්තියෙන් අධිගමය ව්‍යක්ත වන බැවින් සාර්ථ ය.

මෙහි කියූ **සඞ්කාසන** නම්: සැකෙවින් අරුත් දැක්වීම ය. **පකාසන** නම්: පළමුවෙන් අරුත් හැඟවීම ය. **විවරණ** නම්: සැකෙවින් කියන ලද්ද විස්තර කිරීම ය. **විභජන** නම්: පළමු කියන ලද්ද නැවැත නැවැත බෙදා දැක්වීම ය. **උත්තානීකරණ** නම්: විවරණය තව ද ප්‍රකට කොට දැක්වීම ය. **පඤ්ඤත්ති** නම්: විභජනය උදාහරණ දක්වා ඇසූවන්ගේ සිත සතුටු වන ලෙසින් ප්‍රකාරයෙන් දැක්වීම ය. මෙයින් සඞ්කාසන පකාසන දෙකින් උද්දෙස ය, විවරණ-විභජන දෙකින් නිද්දෙස ය, උත්තානීකරණ - පඤ්ඤත්ති දෙකින් පටිනිද්දෙස ය දක්වන ලදහ. එහි උද්ඝටිතඥයන් සඳහා ය උද්දෙසය. විපච්චිතඥයන් සඳහා ය නිද්දෙස ය. නෙය්‍යයන් සඳහා ය පටිනිද්දෙසය.

ව්‍යඤ්ජනසම්පත්තියෙන් යුක්ත බැවින් හා, අක්ඛර - පද - ව්‍යඤ්ජන - ආකාර - නිරුත්ති - නිද්දෙසසම්පත්තියෙන් හා, ධම්මපටිසම්භිදා - නිරුත්තිපටිසම්භිදා විෂය බැවින් හා, ඇදහිය 'යුතු

බැවින් හා, ලෞකීය ජනයාහට චිත්තප්‍රසාදය එළවන බැවින් හා, ප්‍රකට පද ඇති බැවින් හා යන මෙ කරුණු වලින් සබ්‍යඤ්ජන ය. තවද පර්‍ය්‍යාප්තියෙන් ආගමය ව්‍යක්ත වන බැවින් සබ්‍යඤ්ජන ය.

**අක්ඛර** නම්: කොතෙක් ලියූ ව ද කියූ ව ද නො ගෙවෙන සටහන් ය. පිටකත්‍රයට පැමිණ ද ක්‍ෂය නො වන්නේ අක්ඛර යි න්‍යාසයෙහි දක්වන ලදි. මොවුහු සංස්කාර – විකාර – ලක්‍ෂණ – නිර්වාණ – ප්‍රඥප්ති සඞ්ඛ්‍යාත පංචවිධ ඥෙය්‍යපථයෙහි පවත්නෝ මතු මතුයෙහි දක්නා ලබන්නෝ අක්ඛරයහ යි ශබ්දනීතියෙහි කියන ලදි. එක් අකුරක් ඇති පද ද අක්ඛර යි ගණු ලැබේ. **පද** නම්: විභක්ත්‍යන්ත වූ අර්ථද්‍යෝතක වූ අක්‍ෂරපිණ්ඩය යි. **ව්‍යඤ්ජන** නම්: පදයන් විසින් කියනලද අර්ථය ප්‍රකාශ කරන්නේ ය. **ආකාර** නම්: පදයන් කරණ කොට වාක්‍යය විභාග කිරීම ය. **නිරුක්ති** නම්: ආකාරයෙන් කියන ලද නිර්වචනය යි. **නිර්දේශ** නම්: නිර්වචනය වඩාත් විස්තර කිරීම ය.

අඩු ය යි අඹුතුවෙන් එළවිය යුත්තක් නැති ව හැම අයුරින් පිරිපුන් ව සිටි බැවින් හා, ශීලාදිපඤ්චධර්මයෙන් යුක්ත ව සිටි බැවින් හා **කෙවලපරිපුණ්ණ** ය. වැඩි ය යි ඉවත් කළ යුතු තැනක් නැති ව සිටි බැවින් හා, දෘෂ්ටි – මානාදී වූ කෙලෙස් නැති ව සිටි බැවින් හා, නිවන් පිණිස පවත්නා බැවින් හා **පරිසුද්ධ** ය. මෙසේ සාර්ථ සව්‍යඤ්ජන – කෙවලපරිපූර්ණ–පරිශුද්ධ-බ්‍රහ්මචර්‍ය්‍යය ප්‍රකාශ කරණ බැවින් **ස්වාක්ඛාත** ය.

බුදුරජාණන් වහන්සේ වදාළ ධර්මයාගේ අර්ථවිපර්‍ය්‍යාසයෙක් කිසිදැකත් නො වන්නේ ය. එ හෙයින් මනා ව දෙශනා කරණ ලද්දේ ය යන අරුත් විසින් ස්වාක්ඛාත ය.

අන්‍යතීර්ථකයන් අනන්තරායකර ය යි කියූ ධර්ම අනන්තරායකර නො වන බැවින්, නිවන් පිණිස පවත්නේ ය යි කියූ ධර්ම නිවන් පිණිස නො පවත්නා බැවින් ඔවුන්ගේ ධර්ම පිළිබඳ අර්ථ වෙනස් වනුයේ දුරක්ඛාත ය.

බුදුරජාණන් වහන්සේ අනන්තරායකර ය යි වදාළ ධර්ම අනන්තරායකර ම බැවින්, නිවන් පිණිස පවත්නේ ය යි වදාළ ධර්ම නිවන් පිණිස ම පවත්නා බැවින් **ස්වාක්ඛාත** ය. මේ ස්වාක්ඛාතය කිසි කලෙක කිසිලෙසකින් වෙනස් නො වන්නේ ය. කරුණු මෙසේ බැවින් පර්‍ය්‍යාප්තිධර්මය ස්වාක්ඛාත පරිදි දත යුතු ය.

නිවනට අනුරූප වූ පිළිවෙත ද පිළිවෙතට අනුරූප වූ නිවන ද වදාළ බැවින් ලොකොත්තරධර්ම, **ස්වාක්ඛාත** ය. බුදුරජුන් විසින්

ශ්‍රාවකයන්ට නිවනට යන පිළිවෙත මැනැවින් පණවන ලද්දී ය. එහි ගඞ්ගාජලය හා යමුනාජලය එකට සැසඳෙන්නා සේ නිවන පිළිවෙත හා සැසඳෙන්නේ ය. මෙය මෙසේ කීහ: **"සුපඤ්ඤත්තා බො පන තෙන භගවතා සාවකානං නිබ්බානගාමිනී පටිපදා, සංසන්දති නිබ්බානං ච පටිපදා ච, සෙය්‍යථාපි නාම ගංගොදකං යමුනොදකෙන සංසන්දති සමෙති, එවමෙව සුපඤ්ඤත්තා බො පන තෙන භගවතා සාවකානං නිබ්බානගාමිනී පටිපදා, සංසන්දති නිබ්බානං ච පටිපදා ච"** යි.

ආර්‍ය්‍යමාර්ගය අන්තද්වයට නො පැමිණි මධ්‍යමප්‍රතිපදා වූ සේ ම මධ්‍යමප්‍රතිපදා යි කියන ලද බැවින් **ස්වාඛ්‍යාත** ය. ආර්‍ය්‍යඵල, සත් සුන් කෙලෙස් ඇතියේ ම සන්සුන් කෙලෙස් ඇතැ යි කියන ලද බැවින් **ස්වාඛ්‍යාත** ය. නිවන සස්සත – අමත – තාණ - ලෙණාදී ස්වභාව ඇතියේ ම ඒ වශයෙන් වදාළ බැවින් **ස්වාඛ්‍යාත** ය. මෙයින් ලොකොත්තරධර්මයන්ගේ ස්වාඛ්‍යාතභාවය කියන ලද්දේ ය.

**සන්දිට්ඨිකො** = මෙයින් කිසි තැනෙක ආර්‍ය්‍යමාර්ගය ද, කිසි තැනෙක නවලොකොත්තරධර්මය ද ගැණේ. ආර්‍ය්‍යමාර්ගය ස්වකීය සන්තාන යෙහි රාගාදීන් නැති කරණ බැවින් තමා විසින් ම දක්ක යුත්තේ ය යන අරුත් විසින් **සන්දිට්ඨික** ය. මේ මෙහි සාධක දෙශනා: **"රත්තො බො බ්‍රාහ්මණ! රාගෙන අභිභූතො පරියාදින්නචිත්තො අත්තබ්‍යාබාධායපි චෙතෙති, පරබ්‍යාබාධායපි චෙතෙති, උභයබ්‍යාබාධායපි චෙතෙති, චෙතසිකම්පි දුක්ඛං දොමනස්සං පටිසංවෙදෙති රාගෙ පහීනෙ නෙව අත්තබ්‍යාබාධායපි චෙතෙති, න පරබ්‍යාබාධායපි චෙතෙති, න උභයබ්‍යාබාධායපි චෙතෙති. න චෙතසිකම්පි දුක්ඛං දොමනස්සං පටිසංවෙදෙති, එවම්පි බො බ්‍රාහ්මණ! සන්දිට්ඨිකො ධම්මො හොති"** යනු.

"බමුණ! රාගයෙන් රත් වූ රාගයෙන් මැඩුනු රාගයෙන් යට කොට ගත් සිත් ඇත්තෝ තමහට පරහට වධ පිණිස සිතන්නෝ ය, සිත පිළිබඳ දුක් දොම්නස් විඳින්නෝ ය. රාගය පහව ගිය කල්හි තමාටත් පරහටත් වධ පිණිස නො සිතන්නෝ ය, සිත පිළිබඳ දුක් සොම්නස් නො විඳින්නෝ ය. බමුණ! මෙසේ ධර්මය සන්දිට්ඨික ය". යනු එහි ඉතා කෙටි අරුත්. මෙහි ධර්‍මැයි කීයේ මාර්ගධර්මය යි.

නවලොකොත්තරධර්මය යම් යම් කෙනකුන් විසින් අවබොධ කරණ ලද්දේ වේ ද, උන් උන් විසින් අනුන්ගේ ඇදහීමෙන් විශ්වාසයෙන් නො ගොස් ප්‍රත්‍යක්ෂ විසින් වැටහුනු නුවණින් තමා විසින් ම දක්ක යුතු බැවින් **සන්දිට්ඨික** ය. නොහොත් ප්‍රශස්ත වූ දෘෂ්ටිය **සන්දිට්ඨි.** නිවන් අරමුණු කළ ඒ මේ ප්‍රශස්තදෘෂ්ටියෙන් දිනනුයේ

**සන්දිට්ඨිකා** ය. ආර්යඵලයට කාරණ වූ සත්දෘෂ්ටියෙන් හා නිර්වාණ විෂය වූ සත්දෘෂ්ටියෙන් ද කෙලෙසුන් දිනන්නේ ය. එහෙයින් රථින් දිනන්නා රථයී වන්නා සේ නවලොකොත්තර ධර්ම සත්දෘෂ්ටියෙන් දිනනුයේ **සන්දිට්ඨික** ය. තවද දැකීම **දිට්ඨ** නම්. ඒ දිට්ඨ යනු ම **සන්දිට්ඨ** නම්. මනා දැකීම යන අරුත්. ඒ මනා දැකීමට සුදුසු වූයේ **සන්දිට්ඨික** ය. ලොකොත්තරධර්ම වනාහි භාවනාප්‍රතිවෙධ වශයෙන් ද ප්‍රත්‍යක්ෂප්‍රතිවෙධ වශයෙන් ද දකිනු ලබන්නේ ම සසරබිය නවතා ලන්නේ ය. එහෙයින් වස්ත්‍රයට සුදුසු වූයේ වාත්ථික වන්නා සේ ම මනා දැකීමට සුදුසු වූයේ **සන්දිට්ඨික** නම් වේ.

**අකාලිකො** = කල් නො යවා විපාක දෙනුයේ ය යන අරුත්. මෙයින් මාර්ගය ම ගණු ලැබේ. තමාගේ ඵලය දීමට කාලයෙක් නැත්තේ **අකාල.** අකාල ම **අකාලික** ය. මාර්ගධර්ම වනාහි පස් දවස් සත් දවස් ආ විසින් කල් ගෙවා ඵලය නො දෙනුයේ ය. ලෞකිකකුශලධර්ම එසේ පස් දවස් සත් දවස් ආ විසින් ගෙවා ඵල දෙනුයේ නමුත් ලොකොත්තරකුශලධර්ම තමාගේ පැවැත්මට අනතුරුව ම ඵල දෙනුයේ ය. මාර්ගචිත්තයට අනතුරුව ම අතරක් නො තබා ම ඵලචිත්තය උපදනා බැවින් එසේ කිය යුතු. තවද ඵල දීමට දුර වූ කල් ඇතියේ **කාලික.** ඒ නම්: ලෞකිකකුසලය යි. එය කල් ගෙවා විපාක දෙන බැවින් කාලික ය. ලොකොත්තර කුශලය මාර්ගයට අනතුරුව ම විපාක දෙන බැවින් **අකාලික** නම් වේ.

**එහි පස්සිකො** = එව, බලව, යන විධානයට සුදුසු වූයේ **එහි පස්සික** ය. නවලොකොත්තරධර්මය යි. නවලොකොත්තරධර්මය ඒකාන්තයෙන් විද්‍යමාන බැවින් හා, පිරිසිදු බැවින් හා, ඵලදායක බැවින් හා එසේ දක්වාලීමට සුදුසු ය. කිසි දෑයකුත් නැති ව හකුළු-වා ගත් හිස්මිට රන්රුවන් ඇතැ යි දක්වා 'මෙහි එව, මෙය බලව,යි කියන්නට නො සුදුස්සේ ය. අපිරිසිදු දෑයක් ගෙණ අත මිට මො-ළොවා 'එව, මෙය බලව' යි දක්වා ලන්නට ද නො හැකි ය. නො සුදුසු ය. ලොකොත්තරධර්මය වලාකුළුරහිත අහස පෙණෙන පුන්-සඳ මඬල සේ ඒකාන්තයෙන් විද්‍යමාන බැවින් හා පඬුවන් පලසෙ-හි ලූ දැරගම්ණක් සේ පිරිසිදු බැවින් හා 'එව බලව' යි කීමට සුදුසු ව සිටියේ ය.

**ඔපනයිකො** = සිත්හි එළැවිය යුත්තේ **ඔපනයික** ය. සෝවත් ආ මාර්ග හා ඵලධර්ම යි. එළවීම නම්: සිත්හි උපදවා ගැණීම ය. ඒ ය උපනය නම්. ගින්නෙන් ඇවිළ ගත් තමාගේ වස්ත්‍රය හෝ හිස ගැණ නො සිතා භාවනා වශයෙන් සිය සිත්හි තබා ගත යුත්තෝ **ඔපනයික** ය යි. නිවන වනාහි තමාගේ සිතින් ප්‍රත්‍යක්ෂ කිරීම්

මඟයෙන් ඇලීමට සුදුසු ය යන අරුත් විසින් **ඔපනයිකො** වේ. නැත, නිවනට පමුණුවන බැවින් මාර්ග ද ප්‍රත්‍යක්ෂ කටයුතු බවට පමුණුවන බැවින් ඵලධර්ම හා නිවන ද උපනෙය්‍ය ය. ඒ මේ උපනෙය්‍යය ම **ඔපනයිකො** යි දත යුතු ය.

**පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූහි** = 'මා විසින් මාර්ගධර්ම වඩන ලද්දේ ය, ඵලධර්ම අත්පත් කරණ ලද ය, නිවන සාක්ෂාත් කරණ ලද්දේ ය, උද්ඝටිතඥ ආදී විඥයන් විසින් තම තමා කෙරෙහි ම තම තමන්ගේ සිත්හි ලා ම දතයුතු ය.

උපාධ්‍යායයා වැඩූ මග ශිෂ්‍යයාගේ කෙලෙස් පහවීමට කරුණු නො වේ. උපාධ්‍යායයාගේ ඵලසමාපත්තියෙන් ශිෂ්‍යයා සුඛිත නො වත්තේ ය. උපාධ්‍යායයා ප්‍රත්‍යක්ෂ කළ නිවනින් ශිෂ්‍යයාගේ සත්සිඳීමෙක් නො වත්තේ ය. නව ලොවුතුරු දහම අන්හු හිස පැලඳි අබරණ සේ දක්ක හැකි නො වේ. නුවණැත්තන් විසින් තම තමන් කෙරෙහි ම තම තමන්ගේ සිත්හි ම දතයුතු ය. උපදවා ගත යුතු ය. සිත්හි ම ලා ලැබිය යුතු ය.

මේ ධර්මය නුවණැත්තවුනට අසු නො වේ. ඔවුනට ගොදුරු නො වේ. ඔවුන්ගේ සිත්, මෙහි නො බසිත්තේ ය. එහෙත් ස්වාක්ඛාත ය. කුමක් හෙයින් ස්වාක්ඛාත ද? යත්: සන්දිට්ඨික හෙයින් ස්වාක්ඛාත ය. කාලික බැවින් සන්දිට්ඨික ය. එහි පස්සික බැවින් අකාලික ය. යමෙක්, එහි පස්සික නම්, එය ඔපනයික ය යි මෙසේ ධර්මයෙහි ගුණ සිහි කරණ කල්හි සිහි කරන්නහුගේ සිත රාග-ද්වේෂ-මෝහයන්ගෙන් නො මැඩුනේ ධර්මය අරමුණු කොට ම නො ඇද ව සිටින්නේ ය. එයින් යටපත් වූ නීවරණ ඇති ඔහුට ධ්‍යානාඞ්ග උපදනේ ය. දහම් ගුණ ගැඹුරු බැවින් ද නන් වැදෑරුම් ගුණ සිතෙහි නැගෙන බැවින් ද සිත අර්පණාවට නො පැමිණෙන්නේ ය. උපචාරධ්‍යානයෙහි රැඳෙන්නේ ය. මෙසේ මේ ධ්‍යානය දහම් ගුණ අරමුණු කොට උපන් බැවින් දහම් ගුණ සිහි කිරීම නිසා උපදනා බැවින් ධම්මානුස්සති යි කියනු ලැබේ.

ධම්මානුස්සතිභාවනායෙහි යෙදුනු යොගී තෙමේ සිත්හි ලා කළ යුතු මෙබඳු ධර්මයක් දෙශනා කරන්නා වූ මෙබඳු මහත් අඞ්ගයන්ගෙන් පිරී ගත් ශාස්තෲවරයකු පෙර ද නො දිටිමි, දුනුදු නො දකිමි, මොවුන් හා සමයෙක් ලොවතුළ ම නැත්තේ ය, යි දහම්ගුණ දැකීමෙන් ම බුදුරජුන් කෙරෙහි ගෞරවය දක් වනුයේ වේ. යටත් පැවතුම් ඇතියේ වේ. ධර්මය කෙරෙහි ගරු බුහුමන් කරණුයේ ශ්‍රද්ධාදිගුණයන්ගෙන් මහත් බවට යනුයේ වේ. සිතේ සතුට බහුල කොට ඇතියේ බිය හා බිය දෙන අරමුණු ඉවසනුයේ වේ.

'ධර්මය හා එක් ව වසමි' යන සිත් ඇතියේ වේ. දහම් ගුණ සිහි කිරීමට තැන් වූ ඔහුගේ සිරුර ද සෑගෙයක් මෙන් පිදීමට සුදුසු වේ. හේ ධර්මාවබොධයට උත්සාහවත් වේ. ශික්ෂාපද ඉක්මවා යෑමට හෙතු ඇති කල්හි ද ධර්මයෙහි මහත් බව සැලකීමෙන් ඔහුට එහි ලා විළිබිය හට ගන්නේ ය. ඒ වේලෙහි ලොකොත්තරගුණයක් නො ලැබුයේ ද මරණින් මතු දෙව්ලොව උපදින්නේ ය.

**සුප්පබුද්ධං පබුජ්ඣන්ති සදා ගොතමසාවකා** = සියලු කල්හි ගෞතමශ්‍රාවකයෝ මනා පිබිදීමෙන් පුබුදින්නාහ.

**යෙසං දිවා ච රත්තො ච නිච්චං සඞ්ඝගතා සති** = යම් කෙනකුන්හට දහවලත් රෑත් නිතර සඟගුණ ඇරැබැ උපදනා සිහිය ඇත්තේ වේ ද,

දිවා රාත්‍රි දෙක්හි නිතර සඟ ගුණ සිහි කරණ ගෞතම ශ්‍රාවකයෝ හැම කල්හි සඟගුණ සිතින් ගෙණ නිදා පුබුදින බැවින් සැපසේ නිදා සැපසේ පුබුදින්නාහ.

"**සුපටිපන්නො භගවතො සාවකසඞ්ඝො**" යනාදී පිළින් කියූ සඟ ගුණ අරමුණු කොට උපදනා සිහිය, **සඞ්ඝගතාසති** නම්. සඞ්ඝානුස්සති යනු ද මේ ය. අෂ්ටවිධ ආර්‍ය්‍යපුද්ගලයන්ගේ මහත් පු ගුණය නැවැත නැවැත සිහි කිරීම සඞ්ඝානුස්සති නම්.

"**සුපටිපන්නො භගවතො සාවකසඞ්ඝො**" යනාදීන් වදාළ තැන භාග්‍යවත් බුදුරජානන් වහන්සේගේ ශ්‍රාවකසඞ්ඝ තෙමේ මනාව පිළිපන්නේ ය, යන අරුත්. ආර්‍ය්‍යමාර්ගප්‍රතිපත්ති නම් වූ සම්මාපටිපදාවට, නැවැත නො උපදනා සේ කෙලෙස් දුරු කරණ ප්‍රතිපත්ති නම් වූ අනිවත්තිපටිපදාවට, නිවනට අනුලොම් ව සිටුනා ප්‍රතිපත්ති නම් වූ අනුලොමපටිපදාවට, අවිරුද්ධ ප්‍රතිපත්ති නම් වූ අපච්චනීකපටිපදාවට, නිවනට අනුරූප ව සිටි ප්‍රතිපත්ති නම් වූ ධම්මානුධම්මපටිපදාවට මැනැවින් පිළිපන් ශ්‍රාවක සඞ්ඝ තෙමේ **සුපටිපන්න** ය. ස්වාක්ඛාතධර්මය, විනයයෙහි අනුශාසනා පරිදි පිළිපන් බැවින් ද, අවිරුද්ධ ප්‍රතිපදාවට පිළිපන් බැවින් ද **සුපටිපන්න** ය 'සාවකසඞ්ඝ' යනු යට කියන ලද්දේ ය. ආර්‍ය්‍යශීලයෙන් හා ආර්‍ය්‍ය දෘෂ්ටියෙන් සමාන වූ එකට පැහී සිටි ශ්‍රාවකගණය, සඞ්ඝ ය යි මෙහිලා ද ගන්නේ ය.

**උජුපටිපන්නො** = ඒ මේ ශ්‍රාවකසඞ්ඝ තෙමේ යම් ප්‍රතිපදාවකට පිළිපන්නේ නම්, ඒ ප්‍රතිපදාව මායාසාඨෙය්‍යාදි පාපධර්මයන් මූලසුන් කරණ බැවින් ඍජු ය. ගොමූත්‍රවංක සේ වක්බැව් නැති බැවින් අවඞ්ක ය. චන්ද්‍රරේඛාවංක සේ වක්බැව් නැති බැවින් අකුටිල ය.

නගුලිස් වංක සේ වක්බැව් නැති බැවින් අජිම්හ ය. එබඳු වූ ඍජු – අවංක – අකුටිල – අජිම්හ ප්‍රතිපදාවට පිළිපන්නේ **උජුපටිපන්න** ය. කාමසුඛල්ලිකානුයොග – අත්තකිලමථානුයොග යන දෙ කෙළවරට නො පැමිණ මද්‍ධ්‍යමප්‍රතිපදාවට පිළිපන් බැවින් ද, කායාදිද්වාරත්‍රයයෙහි කො තැනකත් ඇද කුද දුරු කිරීම පිණිස පිළිපන් බැවින් ද **උජුපටිපන්න** ය.

**ඤායපටිපන්නො** = ඒ මේ ශ්‍රාවකසඞ්ඝ තෙමේ යම් ප්‍රතිපදාවකට පිළිපන්නේ නම්, ඒ ප්‍රතිපදාව අවිරුද්ධභාවයෙන් නිවන දනී නුයි ඤාය ය. ඤාය නම් නිර්දෙෂ වූ උපායයි. ප්‍රධාන විසින් ඤාය යි ගණු ලබන්නේ නිවන ය. ඒ නිවන යමකින් පිළිපදිනු ලැබේ නම් එ ද ඤාය ය. එනම්: ආර්‍ය්‍යමාර්ගීය යි. ශ්‍රාවකසඞ්ඝ තෙමේ **ඒ මේ** ඤාය පිණිස පිළිපන් බැවින් **ඤායපටිපන්න** ය.

**සාමීචිපටිපන්නො** = ඒ මේ ශ්‍රාවකසඞ්ඝ තෙමේ යම් ප්‍රතිපදාවකට පිළිපන්නේ නම්, ඒ ප්‍රතිපදාව සතුන් සසර දුකින් මුදා හැරීමට බැහැර ලීමට පොහොසත් බැවින් **සාමීචි** ය. සතුන් සසර දුකින් මුදා හැරීමට පොහොසත් වූ ඒ මේ ප්‍රතිපදාවට පිළිපන් බැවින් ශ්‍රාවකසඞ්ඝ තෙමේ **සාමීචිපටිපන්න** ය. යම් පරිදි පිළිපන් කෙනෙක් ශ්‍රද්ධාවත් ලොකයා විසින් කරණු ලබන සැලකිලි ආදියට සුදුසු වෙත් ද එසේ පිළිපන් බැවින් ද **සාමීචිපටිපන්න** ය.

**ආහුණෙය්‍යො** = මෙහි, ගෙණවුත් දිය යුත්ත **ආහුන** නමි. දුර සිට ගෙණවුත් සිල්වතුන් විසයයෙහි දිය යුතු සිවු පසය හෝ ආහුන යි කියන ලදි. ඒ මේ ආහුනය පිළිගැන්වූවනට මහත් ඵල කරණයෙන් පිළිගැණීමට සුදුසු ව සිටියෝ **ආහුණෙය්‍ය** නම් වේ. ඒ නම්: යුග වශයෙන් සතරක් වූ පුද්ගල වශයෙන් අට දෙනෙක් වූ භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක වූ ආර්‍ය්‍යසඞ්ඝ තෙමේ ය. විස්තර යට කියන ලද්දේ ය.

දුර සිට හෝ අවුත් සියලු වස්තුව යම් තැනෙක හෝම කළ යුතු ද එතැන **'ආහවනීය'** ය. සක් දෙවිඳු ආදීන් විසින් හෝ පිදිය යුතු දනට සුදුසු වූයේ හෝ **ආහවනීය** ය. බමුණන්ගේ හෝම ගින්න මහත් ඵල ය යි, පිළිගෙණ ඔවුන් එයට ආහවනීය යි කියන්නා සේ ආර්‍ය්‍යසඞ්ඝ තෙමේ ද පුදන ලද්දේ මහත් ඵල දෙන බැවින් **ආහවනීය** යි කියනු ලැබේ.

මෙ ද දතයුතු ය.

''යො ච වස්සසතං ජන්තු අග්ගිං පරිචරෙ වනෙ,
එකම්පි භාවිතත්තානං මුහුත්තමපි පූජයෙ,
සා යෙව පූජනා සෙය්‍යා යං චෙ වස්සතං හුතං.

යනු. යම් මිනිසෙක් සිය වසක් මුළුල්ලෙහි වෙනෙහි වසමින් ගිනි දෙවි පුදන්නේ ද යම් මිනිසෙක් එක මොහොතකුත් වැඩූ විශෙෂ ගුණ ඇතියකු පුදන්නේ ද මුලින් කියූ ගිනිපිදීමට වඩා පසු ව කියූ වැඩූ ගුණ විශෙෂ ඇතියහු පිදීම ම උතුම් ය, හිතකර ය, යනු අරුත්.

**පාහුණෙය්‍යො** = මෙහි ආගන්තුකභොජනය **පාහුනා** නමි. එය නොයෙක් තැනින් එන තමන්ගේ හිත මිතුරු නෑ සහ ලේනෑයනට සඞ්ග්‍රහ කරණු පිණිස පිළියෙල කෙරෙණ භොජනය යි. එයට සුදුසු වූවෝ ද, සඞ්ඝයා වහන්සේ ය. එහෙයින් නෑයන් හිත මිතුරන් සඳහා පිළියෙල කළ ඒ භොජනය ද සඞ්ඝයා වහන්සේට ම පිදිය යුතු ය. සඞ්ඝ තෙමේ ම එය පිළිගැණීමෙහි සුදුසු ව සිටියේ ය. සඞ්ඝ තෙමේ අසඞ්ඛ්‍යගණනක් කල්ප ඉක්ම ගිය කල්හි ම දක්නට ලැබෙන්නේ ය. සඞ්ඝ තෙමේ කෙලෙසුන්ගෙන් විමුක්ත ය. මෙසේ පාහුනය පිළිගැණීමට සුදුසු ය, යන අරුත් විසින් **පාහුණෙය්‍ය** නම් වේ. කෙනෙක් මේ '**පාහුණෙය්‍ය**' යන්න පාහවනීය යි කියත්. හැමට පළමු ගෙණවුත් හෝම කළ යුතු ය, යනු එහි අරුත්. සඞ්ඝ පූජාකාරයට සුදුසු ය, සර්වප්‍රකාරයෙන් පිදිය යුතු ය, යන මෙයරුත්හි පාහුනෙය්‍ය යනු ද සඞ්ඝයා වහන්සේ කෙරෙහි නැගී සිටිනුයේ ය.

**දක්ඛිණෙය්‍යො** = මෙහි පරලොව සුව පතා දෙන දානය **දක්ඛිණා** නමි. ඒ මේ දක්ෂිණාවට සුදුසු වූයේ හෝ දක්ෂිණාවට හිත වූයේ හෝ **දක්ඛිණෙය්‍ය** ය. සඞ්ඝ තෙමේ ය. මහත් ඵල කරණයෙන් සඞ්ඝ තෙමේ ම දක්ෂිණාව පරිසිදු කරන්නේ ය.

**අඤ්ජලිකරණීයො** = මෙහි දෙහොත් මුදුනෙහි තබා ඇඳිලි බැඳ සියලු ලොකයා විසින් කරණු ලබන නමස්කාරය **අඤ්ජලිකරණ** නමි. ලොකයාගේ ඒ නමස්කාරයට සුදුසු ප්‍රධානස්ථානය සඞ්ඝ තෙමේ ය. එහෙයින් සඞ්ඝ තෙමේ **අඤ්ජලිකරණීය** නම් වේ.

**අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්ස** = ලොකයාගේ නිරුත්තර වූ පින්කෙත ය, යන අරුත්. සදෙවකලොකයාගේ පින් බිජුවට රොපණය කළයුතු එක් ම තැන සඞ්ඝ තෙමේ ය. රජුගේ හැල් හෝ යව හෝ පැලවෙන තැන, රජුගේ හැල් කෙත, යවකෙත, යි ද, ඇමැතියන්ගේ හැල් හෝ යව හෝ පැලවෙන තැන් ඇමැතියන්ගේ හැල්කෙත්, යවකෙත්, යි ද කියන්නා සේ සියලු ලොකයාගේ පින් පැලවෙන තැන, ලොකයාගේ පින්කෙත යි කියත්. ලොකයාට හිතසුව දෙන පින් නැග එනුයේ සඞ්ඝයා වහන්සේ පිදීමෙනි. එහෙයින් ලොකයාගේ අනුත්තරපුණ්‍යක්ෂෙත්‍රය සඞ්ඝ තෙමේ ය.

මෙහි ඉතා සැකෙවින් කියූ සුපටිපන්නතාදි සඞ්ඝගුණ සිහි-කරන්නහුගේ සිත රාග-ද්වෙෂ-මොහයෙන් නො මැඩෙන්නේ ය.

නො ඇද ව සිටින්නේ ය. නීවරණ යටපත් වන්නේ ය. සඞ්ඝගුණ ගැඹුරු බැවින් හා නන් වැදෑරුම් සඞ්ඝගුණ සිහි වන බැවින් හා ධ්‍යානය අර්පණාවට නො නගින්නේ ය. උපචාරධ්‍යානයෙහි රැඳී ගන්නේ ය. මෙය සඞ්ඝගුණ සිහි කිරීමෙන් ලත් බැවින් සඞ්ඝානුස්සති යි කියනු ලැබේ.

සඞ්ඝානුස්සතිභාවනායෙහි යෙදුනු යොගී තෙමේ සඞ්ඝයා කෙරෙහි ගෞරව ඇතියේ යටත් පහත් පැවැතුම් ඇතියේ වේ. ඔහුගේ ශ්‍රද්ධාදිඉන්ද්‍රියයෝ මහත් බවට පැමිණෙන්නෝ ය. සිතේ සතුට බහුල කොට ඇතියේ බිය හා බිය උපදවන අරමුණු ඉවසනුයේ වේ. 'සඞ්ඝයා හා එක් ව වසමි, යන සිත් ඇතියේ වේ. මොහුගේ සිරුර සඞ්ඝයා රැස්ව හිඳිනා පොහෝගෙයක් මෙන් පිදීමට සුදුසු වන්නේ ය. සඞ්ඝගුණාධිගමයෙහි සිත නැමී ගන්නේ ය. ශික්ෂාපද ඉක්මවීමෙහි සිත නැගෙන් ම සඞ්ඝයා හමුවෙහි පෙණී ගියා සේ විලිබිය එළැඹැ සිටින්නේ ය. ඒ වේලෙහි ලොකොත්තර ගුණයක් නො ලැබුයේ ද මරණින් මතු දෙව් ලොව උපදින්නේ ය.

**සුප්පබුද්ධං පබුජ්ඣන්ති සදා ගොතමසාවකා** = සියලු කල්හි ගෞතමශ්‍රාවකයෝ මනා පිබිදීමෙන් පුබුදින්නාහ.

**යෙසං දිවා ච රත්තො ච නිච්චං කායගතා සති** = යම් කෙනෙකුන්හට දහවලත් රැත් නිතර කය අැරැබැ උපදනා සිහිය ඇත්තේ වේ ද.

දිවා රාත්‍රි දෙක්හි නිතර කයෙහි පිළිකුල්බව සිහි කරණ ගෞතම ශ්‍රාවකයෝ හැම කල්හි කයෙහි පිළිකුල්බව අරමුණු කොට උපන් සිහියෙන් යුක්ත ව නිඳා පුබුදිනා හෙයින් සැපසේ නිඳා සැපසේ පුබුදින්නාහ. කායගතාසතිය යට කියන ලදි.[1]

**සුප්පබුද්ධං පබුජ්ඣන්ති සදා ගොතමසාවකා** = සියලු කල්හි ගෞතමශ්‍රාවකයෝ මනා පිබිදීමෙන් පුබුදින්නාහ.

**යෙසං දිවා ච රත්තො ච අහිංසාය රතො මනො** = යම් කෙනකුන්ගේ සිත දහවලත් රැත් කරුණායෙහි ඇලුනේ වේ ද.

දිවාරාත්‍රි දෙක්හි කරුණාභාවනායෙහි ඇලුනු සිත් ඇති ගෞතමශ්‍රාවකයෝ සියලු කල්හි සැපසේ නිඳා සැපසේ පුබුදින්නාහ.

මෙහි **'අහිංසාය'** යන්නෙන් කරුණාභාවනාව ගැණේ.[1] **'මනො'** යන්නෙන් සිත කියන ලද්දේ ය.[2]

---

1. 21. 'නිච්චං කායගතා සති' යනු බලනු
1. 19. 4 'අහිංසා' යනු බලනු.
2. 1. 1. 'මනො' ,, ,,

**සුප්පබුද්ධං පබුජ්ඣන්ති සදා ගොතමසාවකා** = සියලු කල්හි ගෞතමශ්‍රාවකයෝ මනා පිබිදීමෙන් පුබුදින්නා හ.

**යෙසං දිවා ච රත්තො ච භාවනාය රතො මනො** = යම් කෙනකුන්ගේ සිත දහවලත් රෑත් මෛත්‍රීභාවනායෙහි ඇලුනේ වේ ද.

දිවාරාත්‍රි දෙක්හි මෛත්‍රීභාවනායෙහි ඇලුනු සිත් ඇති ගෞතම ශ්‍රාවකයෝ මෙත් සිත නො හැර ම සැපසේ නිදා සැපසේ පුබුදින්නාහ.

මෙහි **'භාවනාය'** යන්නෙන් සාමාන්‍ය ලෙසින් හැම භාවනාවක් ම කියැවෙන්නී නමුදු මෙහිලා ගත යුතු මෛත්‍රීභාවනා ය. එ ද යට 'අහිංසා' යන්නට කළ පරිකථායෙහිලා කියනලදී.

බුද්ධානුස්සති – ධම්මානුස්සති – සඞ්ඝානුස්සති – කායගතාසති – කරුණා – මෙත්තා යන කර්මස්ථාන වැඩීමෙහි යෙදුනවුන් කෙලෙස් වසඟ නොවන බැවින් සැපසේ නිදා සැපසේ පුබුදින බව මෙයින් වදාළ සේක.

ධර්මදෙශනාවගේ අවසානයෙහි එ දරු තෙමේ මවුපියන් සමග සෝවාන් පලයෙහි පිහිටියේ ය. එයට අනතුරු ව පැවිදි වූ ඒ සියල්ලෝ රහත් බවට පැමිණියාහු ය. ධර්මදෙශනා තොමෝ පැමිණ සිටි පිරිසට ද වැඩ සහිත වූ ය.

**දාරුසාකිකපුත්‍රවස්තුව නිමි.**

# වැද්දූරට වැසි භික්ෂු නමක්

## 21 — 6

**වැද්දූරට** වැසි භික්ෂු නමක් විසල් පුරයෙහි වූ එක්තරා වන ලැහැබෙක එකලා ව වාසය කරන්නේ ය. ඒ කාලයෙහි එක් දවසෙක එහි මුළු රැය පුරා පැවැති මහත් උත්සවයෙක් වී ය. මේ මහණ ඒ උත්සවයෙහි මහජනයා විසින් කරණු ලබන නන්වැදෑරුම් නැටුම් ගැයුම් තැළුම් හඬ අසා අඬමින්

"වලැ ලූ දූවකඩෙව් – වසමු අපි වලැ එකලා,
දූන් මෙබඳු රැහි – අපට වැඩි පව්ටෙක් කො ද?"

යි මෙය කීයේ ය.

මෙ තෙමේ වැදෑරට රජදරුවෙක් වූයේ වාර විසින් තමාට පැමිණි රජකම හැරදමා පැවිදි ව වනයෙහි විසී ය. එ දවස් එහි වැස්සෝ විසල් පුරයෙහි අගනුවර, සිවුමහරජය එකාබද්ධ කළා සේ ධ්වජපතාකාදියෙන් මනා කොට සරසා ඉල්මස මැදිපොහෝ දව-සෙහි කාර්තිකෝත්සවය පැවැත් වූහ. රැ මුළුල්ලෙහි එහි බෙර – මිහිඟු බෙර – පණාබෙර – ගැටබෙර – පටහ – මද්දල – ආතත – විතත – ඝන – සුසිර – වීණාදීන්ගේ හඬ හැම තැනින් ඇසෙන්නට වන. එහි රජවරු සත් දහස් සත් සිය දෙනෙක්, එ පමණ ම ඔවුන්ගේ යුවරජසෙනාපතීහු නුවර මංමාවත්හි එද, හැසිරෙන්නට වත්හ. මේ මහණ, සැටරියන් පමණ දික් වූ මහසක්මනෙහි සක්මන් කරණුයේ අහස මැද සිටි පුන්සඳ දූක සක්මන් කෙළවර තුබූ හේත්තු පුවරුවෙහි වැතිර ගෙණ අබරණ ලා සැරසීමක් නැති ව සිටි බැවින් තමන් වෙනෙහි හැරදූමූ දරකඩක් මෙන් සිතා "අනේ! මට වඩා පහත් ලෙසින් දිවි යවන එකෙක් මෙහි වේ ද්‍ෙ" යි සිතන්නට වූයේ ය. සැහැවියෙන් ආරණ්‍යකඞ්ගාදිගුණයෙන් යුක්ත වූවත් මේ මහණ, එ කෙණෙහි රාගය නිසා හටගත් සසුනෙහි නො ඇල්-මෙන් පෙළුනේ මෙසේ සිතුයේ ය. මෙසේ කීයේ ය. මෙය අසා සිටි එ වන අරක් ගත් දෙවියකු විසින් "මේ මහණ සංවේගයට පමුණුවන්නෙමි" යි සිතා කියූ,

"වලැ ලූ දූවකඩෙව් – වසහි තෝ වලැ එකලා,
සග් ගියහු පතනා – තිරිසනුන් සේ ඒ තට,
බොහෝ දෙන කැමැතී – වෙති යනු දනුව තෝ දූන්"

මේ ගය අසා පසුදා බුදුරජුන් වෙත එළැඹැ වැඳ එකත් පසෙක හුන්නේ ය. බුදුරජානන් වහන්සේ එ පුවත දූන ගිහිගෙය දුක්බව දක්වනු කැමති සේක් දුක් පසක් එක් කොට මේ ධර්මදෙශනාව කළ සේක.

**දුප්පබ්බජ්ජං දුරභිරමං දුරාවාසා ඝරා දුඛා,**
**දුක්ඛො සමානසංවාසො දුක්ඛානුපතිතද්ධගූ,**
**තස්මා න චද්ධගූ සියා දුක්ඛානුපතිතො සියාති.**

පැවිදිවීම දුෂ්කර ය. (සසුනෙහි) සිත් ඇලවීම දුෂ්කර ය. ගෘහයෝ දුක් වූ වාස ඇත්තාහ. දුක්හ. අසමානයන් හා එක් ව විසීම දුක් ය. සසර අදත්මගට පිළිපන්නෝ දුකින් ලුහුබඳිනා ලදහ. එහෙයින් සසර අදත්මගට පැමිණියෙක් නො වන්නේ ය. දුකින් ලුහුබඳින ලද්දෙක් නො ද වන්නේ ය.

**දුප්පබ්බජ්ජං** = පැවිදිවීම දුෂ්කර ය. පැවිදිවීම අපහසුවෙන් කළ යුතු ය.

පැවිදි වන්නහු විසින් මඳ වූ හෝ බොහෝ වූ හෝ භොග සම්පත්තිය ද නෑ සහලේ නෑ ආදී වූ ඥාතිවර්ගයා ද හැරදමා ඒ සියල්ල පැවිද්දට පටහැනිය යි සලකා පැවිදි වියයුතු බැවින් පැවිදිවීම පහසු නැත. සියලු ගිහිපවත් හැරදමා පැවිදි වියයුතු ය. ඒ වනාහි සිතට දුකෙකි. **“අප්පං වා මහන්තං වා භොගක්ඛන්ධඤ්චෙව ඤාතිපරිවට්ටඤ්ච පහාය ඉමස්මිං සාසනෙ උරං දත්වා පබ්බජ්ජං නාම දුක්ඛං”** යනු අටුවා.

**දුරභිරමං** = සිත් ඇලවීම නො පහසු ය. උගහට ය.

පැවිදි ව ගෙණ පිඩු සිඟීමෙන් ජීවිකාවෘත්තිය පවත්වමි, යි අප්‍රමාණ වූ ශීලස්කන්ධය රැකීමෙන් ධර්මානුධර්මප්‍රතිපත්තිය පිරිය යුතු බැවින් ද සසුනෙහි සිත් ඇලවීම අපහසු ය. උගහට ය. **“එවං පබ්බජිතෙනාපි භික්ඛාචරියාය ජීවිතවුත්තිං ඝටෙන්තෙන වා අපරිමාණසීලක්ඛන්ධගොපනධම්මානුධම්මපටිපත්තිපූරණවසෙන අභිරමිතුං දුක්ඛං”** යනු අටුවා.

**දුරාවාසා ඝරා දුඛා** = ගෘහයෝ දුක් වූ වාස ඇත්තාහ. දුක්හ.

ගිහිගෙයි වසන්නහු විසින් රාජකාරිය ඉසිලිය යුතු ය. නො පිරිහෙළා කළ යුතු ය. තමාට සතුරු ව සිටියවුනට කළමනා කාරිය ඉසිලිය යුතු ය. අඹුදරුවනට කළමනා කාරිය නො අඩු ව කළ යුතු ය. පිරිවරදෙනාට කළමනා කාරිය ඔවුන් සිත් ගන්නා ලෙසින් කළ යුතු ය. මහණබමුණන්හට සඞ්ග්‍රහ කළ යුතු ය. අසල් වැසි- යනට උදවු උපකාර කළ යුතු ය. දුගීමගීයාචකාදීනට දිය යුතු ය. මෙසේ ඇති බැවින් ගෘහවාසය සිදුරු කළයක් මෙන් ද, මහමුහුද මෙන් ද නො පිරවිය හැකි ය. එහෙයින් ගිහි ගෙයි විසීම දුෂ්කර ය. දුක් ය. කොතෙක් කළ ද පිරිමැසිය නො හැකි ය. දව රෑ දෙක්හි වසතුව සැපයිය යුතු ය. වසතුව නැත්තහු අඹුදරුවන්ගේ තාඩන

පීඩනවලට යටත් විය යුතු ය. අව්වට වැස්සට පින්නට රැකෙන්නට නො පිළිවන. මෙසේ බැවින් ගෘහවාසය දුක් ය. මේ අටුවා: **"යස්මා පන ඝරං ආවසන්තෙන රාජූනං රාජකිච්චං ඉස්සරානං ඉස්සරකිච්චං වහිතබ්බං. පරිජනා චෙව ධම්මිකා ච සමණබ්‍රාහ්මණා සඞ්ගහෙතබ්බා. එවං සන්තෙ ඝරාවාසොපි ඡිද්දඝටො විය මහාසමුද්දො විය ච දුප්පූරො. තස්මා ඝරාවාසො නාමෙසො දුරාවාසො දුක්ඛො"** යනු.

**දුක්ඛො අසමානසංවාසො** = නො සම වූ අදහස් ඇත්තවුන් හා එක් ව විසීම දුක් ය.

ජාති - ගොත්‍ර - කුල - භෝගාදියෙන් සමාන ව ද, "තෝ කවරෙහි? මම කවරෙකිම්?" යනාදීන් බැණ විවාදයට බසින්නා වූ ගිහියා ද, ශීලාචාර බහුශ්‍රැතාදියෙන් සමාන ව ද, "තෝ කවරෙහි? මම කවරෙකිම්?" යි යනාදීන් බැණ නැගෙණ පැවිද්ද ද යන මේ නො සම වූ අදහස් ඇති ගිහි පැවිද්දන් හා එක්ව විසීම දුක් ය. මේ අටුවා: **"ගිහිනො හි වා යෙ ජාතිගොත්තකුලභොගෙහි, පබ්බ-ජිතා වා සීලාචාරබාහුසච්චාදීහි සමානාපි හුත්වා කොසි ත්වං? කොසම් අහන්ති? ආදීනි වත්වා අධිකරණපසුතා හොන්ති, තෙ අසමානා නාම. තෙහි සංවාසො නාම දුක්ඛො"** යනු.

**දුක්ඛානුපතිතා අද්ධගූ** = සසර නැමැති දිග් මගට පැමිණියෝ සසරදුකින් ලුහුබඳින ලද්දාහු වෙත්.

මෙහි **අද්ධගූ** නම්: මග යන්නෝ ය. එහෙත් මෙහිලා සසර මග යන්නෝ ම ගැණෙත්. සංසාරමාර්ගවිස්තරය පඤ්චමතරඞ්ග යෙහි **"දීඝො බාලානං සංසාරො"** යන්නෙහි කියන ලදි. සසරෙහි දිගින් දිගට ඉපද ඉපද මැරි මැරී යන්නෝ සසර දුකින් ලුහු බැඳුනෝ ය. සසරදුකින් මැඩුනෝ ය. ජාති - ජරා - මරණාදී වූ දුක්වලින් නො ද මිදුනෝ ය.

**තස්මා න ච අද්ධගූ සියා දුක්ඛානුපතිතො සියා** = එහෙයින් සසර අදත්මගට පැමිණියෙක් නො වන්න. සසරදුකින් ලුහු බැඳුනෙක් නො වන්න.

සසරදුකින් ලුහුබැඳුනු බවත් සසර දිගින් දිගට ඉපිද ඉපිද මැරි මැරී යැමත් දුක් වේ ද, එහෙයින් සසරෙහි සැරිසරා යන්නකු සසර දුකින් බැඳුනකු නො විය යුතු ය.

ධර්මදෙශනාවගේ අවසානයෙහි ඒ මහණ තෙමේ පස් තැනෙක් හි ලා දක්වා වදාළ දුකෙහි කලකිරුණේ පස් වැදෑරුම් ඔරම්භාගීය සංයොජනයන් සිඳ බිඳ පලවා හැර රහත් බැව්හි පිහිටියේ ය.

**වජ්ජිපුත්‍රකභික්ෂුවස්තුව නිමි**

# චිත්තගහපතියා

## 21 — 7

**චිත්තගෘහපතිහු** පිළිබඳ කථාවස්තුව මෙහි පංචමතරඞ්ගයෙහි **"අසන්තං භාවනමිච්ඡෙය්‍ය"** යනාදී ගාථාවර්ණනායෙහි ලා විස්තර විසින් කියන ලදි. ගාථාව පිළිබඳ පරිකථා ද එහි ම ආවා ය. මෙ තැන්හි අනඳ මහතෙරුන් විසින් "කිම; සවාමීනි! බුදුරජානන් වහන්සේ වෙත එන් ම මොහුට මේ මහාලාභසත්කාරය උපදින්-නේ ද, නැතහොත් අන් තැන්හි යන කල්හිත් මේ උපදින්නේ ද?"යි අසා සිටි කල්හි බුදුරජානන් වහන්සේ "ආනන්ද! මා වෙත ආවත්, අන් තැනක ගියත් මොහුට මේ ලාභසත්කාර ලැබෙන්නේ ය, මේ චිත්තගහපති ශ්‍රද්ධාවත් ය, තුනුරුවන්හි ප්‍රසන්න ය, සිල්වත් ය, මෙබන්දෙක් කො තැනක ගියේ ද, යම් යම් තැනක් සෙවුනේ ද, ඒ හැම තැන්හිදී ම ඔහුට මහත් සත්කාර ලැබෙන්නේ ය"යි වදාරා මේ ධර්මදෙශනාව කළ සේක.

**සද්ධො සීලෙන සම්පන්නො යසොභොගසමප්පිතො,**
**යං යං පදෙසං භජති තත්‍ථ තත්‍ථෙව පූජිතොති.**

සැදැහැති ශීලයෙන් යුක්ත වූ යසසින් හා භොගයෙන් ඔදවැඩි වූ පුද්ගල තෙමේ යම් යම් පෙදෙසක් සෙවුනේ ද, ඒ හැම තැන්හිදී ම පුදන ලද්දේ ය.

**සද්ධො** = සැදැහ ඇත්තේ ය.

**ශ්‍රද්ධා** නම්: තමන් හා එක් ව යෙදෙන අන්‍ය වූ චිත්ත - චෛතසිකධර්ම, අරමුණෙහි ලා පහද වන්නා වූ එකාන්තකුශලචෛතසික-යෙකි. මේ ය ලෞකික-ලොකොත්තර විසින් දෙපරිදි වූවා. සෝවන් ඈ මග පල සිත්හි යෙදී නිවන් අරමුණෙහි සිත පහද වන්නී ලොකොත්තරශ්‍රද්ධා ය. ලෞකික සිත්වල යෙදී බුද්ධ-ධම්ම-සඞ්ඝ ගුණයෙහි සිත පහන් කරවමින් කම්පල අදහන්නී ලෞකිකශ්‍රද්ධා ය.

ඕ **සම්පසාදන-සම්පක්ඛන්දන** ලක්ෂණ ඇත්තී ය. රාගාදී වූ කෙලෙස් යටපත් කොට අරමුණු විෂයයෙහි සිත පහන් කරවීම **සම්පසාදන** නම්. දිය පහද වන මැණික, කැළඹුනු මඩසහිත දියෙහි ලූ කල එහි මඩ බොර සන්සිඳී දිය පහන් වනු මෙන් සම්ප්‍ර-සාදනලක්ෂණ ශ්‍රද්ධාව සිතෙහි වූ රාගාදී වූ කෙලෙස් යටපත් කොට සිත පහ ද වන්නී ය.

දන් සිල් ඈ පින්කම් කිරීමෙහි දී උපදනා මසුරුබැව් ඈ කෙලෙස් අබිබවා ඉදිරියට ඒම, සම්පක්ඛන්දන නම්. යුදබිම වන් පළපුරුදු යුද්ධභටයා නො බිය ව සතුරු පිරිස් ඉදිරියට පැමිණ ඔවුන් අබිබවා සිටින්නා සේ සම්ප්‍රස්කන්දනලක්‍ෂණ ශ්‍රද්ධා ව මසුරු-බැව් ආදිය යටපත් කොට ඉදිරියට යන්නී ය. සතුන් සතන්හි සීලමූලයෙන් පිහිටියා වූ මෝ ශ්‍රද්ධා තොමෝ මත්තෙහි සීල-චිත්ත-දිට්ඨි-කඞ්ඛාවිතරණ-මග්ගාමග්ගඤාණදස්සන - පටිපදාඤාණදස්සන විසුද්ධීන්ගෙන් වැඩී ගිය ඤාණදස්සනවිසුද්ධිය උපදවාලීමෙන් අනෙක විධ පටිසම්භිදාභිඥාවන්ගෙන් බර වූ රහත්ඵලය නිපදවන්නී ය. මේ සාධක සූත්‍ර: **"සද්ධාජාතො උපසඞ්කමති, උපසඞ්කමන්තො පයිරුපාසති, පයිරුපාසන්තො සොතං ඔදහති, ඔහිතසොතො ධම්මං සුණාති, සුත්වා ධම්මං ධාරෙති, ධතානං ධම්මානං අත්ථං උපපරික්ඛති, අත්ථං උපපරික්ඛතො ධම්මා නිජ්ඣානං ඛමන්ති, ධම්මනිජ්ඣානක්ඛන්තියා සති, ඡන්දො ජායති, ඡන්දජාතො උස්සහති, උස්සහිත්වා තුලයති, තුලයිත්වා පදහති, පහිතත්තො සමානො කායෙන චෙව පරමසච්චං සච්ඡිකරොති, පඤ්ඤාය ච නං අතිවිජ්ඣ පස්සති"** යනු. මෙසේ ලෞකික-ලොකොත්තර ශ්‍රද්ධායෙන් ශ්‍රද්ධාවත් වූයේ **'සද්ධො'** යි කියන ලද්දේ ය.

**සීලෙන සම්පන්නො** = සීලයෙන් යුක්ත වූ.

සීලය, **අගාරිය** - **අනගාරිය** විසින් දෙපරිදි වූයේ මෙහිලා අගාරිය නම් වූ ගිහියන් පිළිබඳ සීලය ගැණේ. ඒ නම්: පඤ්චසීල දසසීල අටඨඞ්ගසීල යි. **"උපාසක-උපාසිකානං නිච්චසීලවසෙන පඤ්චසික්ඛාපදානි සති වා උස්සාහෙ දස, උපොසථඞ්ගවසෙන අට්ඨාති ඉදං අගාරියසීලං නාම"** යනු සාධක. අගාරිය සීලය, චාරිත්තසීල - වාරිත්තසීලාදීන්ගේ වශයෙන් ද භෙදයට ගියේ ඇත.[1]

**යසොභොගසමප්පිතො** = යශසින් හා භොගයෙන් යුක්ත වූ පුද්ගල තෙමේ.

මෙහි **යශස්** යනු අනාථපිණ්ඩික සිටු ආදීන්ගේ පිරිවර බඳු අගාරික යසසෙහි නැගී සිටියේ ය. **"යාදිසො අනාථපිණ්ඩිකාදීනං පඤ්චඋපාසකසතපරිවාරසඞ්ඛාතො අගාරියයසො, තාදිසෙනෙව යසෙන"** යනු අටුවා.

ධනධාන්‍යාදිභොග, ශ්‍රද්ධා-ශීල-හ්‍රී-අපත්‍රපා-ශ්‍රැත-ත්‍යාග-ප්‍රඥා යන සප්තාර්‍යධනය යි, දෙපරිදි වූ භොගසම්පත්තිය මෙහිලා ගණු ලැබේ. මෙසේ යශසින් හා භොගසම්පත්තියෙන් යුක්ත වූ පුද්ගල තෙමේ **යසොභොගසමප්පිත** නම්.

---

1. 4. 10 'සීලවන්තං ගන්ථො' යනු බලනු.

**යං යං පදෙසං භජති** = යම් යම් පෙදෙසක් සෙවනය කෙරේ ද.

**තත්‍ථ තත්‍ථ එව පූජිතො** = ඒ ඒ තන්හි ම පුදන ලදුයේ වේ.

මෙ තෙමේ පූර්වදිශාදීන් අතුරෙහි යම් යම් ප්‍රදෙශයකට එළැ-ඹෙ ද, ඒ සියලු තන්හි දී ම දෙව්මිනිසුන් විසින් නොයෙක් පුද පඬුරු එළවීමෙන් මහත් ලාභසත්කාරයෙන් පුදන ලද්දේ ය. පුදනු ලබන්නේ ය.

**චිත්‍රගෘහපතිවස්තුව.**

# චූලසුභද්‍රා

## 21 — 8

**උග්ග** නුවර වැසි **උග්ග** නම් සිටුපුත් තෙමේ, අනේපිඬුසිටු බාලකල පටන් ඉතා ලඟින් ඇසුරු කළ ඔහුගේ හොඳ ම මිතුරෙක් විය. මේ දෙදෙන එක් ම ඇදුරුකුලයෙහි ශිල්ප උගත්හ. ඒ කාලයෙහි එහි දී ඒ දෙදෙන ''අප කවදා හෝ වයසට පැමිණ දෙමවුපියන්ගේ නියමය ලෙස, ඔවුන් කියන ලෙසට බිරියන් ගෙණ පවුල් දිවි ගෙවත්, අප නිසා දූ පුතුන් උපන්නොත් මගේ පුතුට තමුසේගේ දුවත්, තමුසේගේ පුතුට මාගේ දුවත් ආවාහ-විවාහ වශයෙන් කර කාර බැන්ද යුතු ය''යි ගිවිස ගත්හ. ශිල්ප නිමවා සියරට ගිය ඔවුහු වැඩිවිය පැමිණියාහු තම තමන්ගේ නුවර සිටුතනතුරු ද ලැබූහ.

මේ අතර එක් දවසෙක උග්ග සිටු තෙමේ වෙළඳුම් පිණිස ගැල් පන් සියයක බඩු පටවා ගෙණ සැවැත් නුවර අනාථපිණ්ඩික සිටු මැදුරට ගියේ ය. එ වේලෙහි අනාථපිණ්ඩික සිටු තෙමේ සිය දුවනිය වූ චූලසුභද්‍රාවට කතා කොට, ''දුව! මේ ඇවිත් සිටින්නේ ඔබගේ පියා, උග්ග සිටුතුමා, මොහුට කළ යුතු හැම දෙයක් ඔබට භාර යි, කළයුතු හැම දෙයක් අඩු නැතිව ඔබ විසින් ම කළ යුතු ය''යි නියම කෙළේ ය. චූලසුභද්‍රා ද 'යහපතැ' යි පිළිගෙණ සිටානන් පිණිස බත් මාලු එළවලු හැම එකක් තමන්ගේ අතින් ම උයා පිළියෙල කරන්නී ය. මල් ගඳ විලවුන් පිළියෙල කොට තබන්නී ය. කෑම ගන්නා වේලාව ලං වූ කල්හි නානදිය පිළියෙල කරවා දී නාන තැන් පටන් සියලු වතාවත් කරන්නී ය. උග්ග සිටු තෙමේ ඇයගේ ආචාරසම්පත්තිය දැක පහන් වූයේ දවසක් එහි අනාථපිණ්ඩික සිටු හා පිළිසඳර කතායෙහි යෙදී හුන්නේ ''අපි එදා ළදරුකාලයෙහි ශිල්ප උගන්නා අවදියේ මේ අන්දමේ නියමයක් කර ගත්ත මෝ වෙමු''යි එදා කර ගත් ඒ ගිවිසුම සිහි කරවා තම පුතුට චූලසුභද්‍රාව බිරිය කොට දෙන ලෙසට ඉල්ලා සිටියේ ය.

උග්ගසිටු තෙමේ මිසදිටු ගත්තෝ සැදැහ නැත්තේ ය. එහෙයින් අනාථපිණ්ඩික සිටු තෙමේ මේ පුවත බුදුරජානන් වහන්සේට දන්වා සිටියේ ය. උන්වහන්සේ, උග්ගසිටුහුගේ හෙතුසම්පත් දැක, 'යහපතැ'යි අනුමත කළ කල්හි සිටුබිරිය සමගත් කතා කොට චූල සුභද්‍රාව, උග්ගසිටු පුත්හට කරකාර බැඳ දෙන බවට ගිවිස ගත්තේය. මෙසේ ගිවිස ඒ පිණිස දවස් නියම කොට විශාඛාව කරකාර බැඳ දී යවන ධනඤ්ජය සිටුහු මෙන් සියදුවනියට මහත් සත්කාර කොට ලඟට කැඳවා ''දුව! නැදිමයිලන් ලඟ වසන්නිය විසින් ඇතුළත ගිනි පිටතට නො දිය යුතු'' යනාදීන් ධනඤ්ජය සිටුහු

විසින් විශාඛාවට අවවාද කළ ලෙසින් ම ඒ අවවාද දසය ම කියා දී "තොප විසින් මාගේ දුවනිය අතින් යම් කිසි වරදෙක් වූයේ නම් එය විනිශ්චය කොට පිරිසිදු කළ යුතු ය"යි කෙලෙඹියන් අටදෙනකු ඇපකරුවන් කොට ඇය ශරණ යන දවසෙහි බුදුපාමොක් මහා සඟනට මහදන් දී පෙර අත්බැව්හි සිය දුවනිය කළ පින්කම්වල ඉෂ්ටඵලය ලොකයාට ප්‍රකට කොට දක්වන්නා සේ මහත් වූ ලාභ සත්කාරයෙන් යුක්ත කොට දුවනිය කරකාර බැඳ දුන්නේ ය.

ඇය මඟුල්පෙරහරින් උග්ග නගරයට පැමිණි කල්හි නෑදිමයිලන් සමග එ නුවරවැසි මහාජන තෙමේ ඇයට පෙරගමන් කෙළේ ය. ඕ තොමෝ ද තමන්ගේ ශ්‍රීසම්පත්තිය පළට කරන්නට විශාඛාව මෙන් මුළු නුවර වැස්සන්ට තමන් පෙණෙන සේ මඟුල් රියෙන් නුවරට පිවිස නුවරුන් විසින් එවූ පඬුරු තෑගි බෝග පිළිගෙණ උනුන්ට ගැළපෙන පරිදි ඒවා එකෙනෙකාට යවන්නී මුළු නුවර තමන්ගේ ගුණයෙන් එකට බැඳුනක් කළා ය. මඟුල් දවස්හි නෑදිමයිලෝ අචෙලකයනට සත්කාර කරන්නෝ "මෙහි අවුත් අපගේ ශ්‍රමණයන් වහන්සේට වඳින්නැ"යි ඇයට දන්වා යැවූ හ. ඕ තොමෝ ලජ්ජායෙන් නග්නයන් දක්නට නො හැකි ව යන්නට නො කැමැති වූ ය. එහෙත් නෑදිමයිල්හු නග්නයන් එහි ආ හැම දවස්හි "වඳින්නට එන්නැ"යි දන්වා යවන්නාහ. ඕ තොමෝ ඔවුන්ගේ බස් පිළිගෙණ එක දවසකුත් නග්නයන් දක්නට නො ගියා ය. නෑදිමයිලෝ කිපියාහු, කෙලෙඹියන් අටදෙන කැඳවා "මැය මේ ගෙයින් බැහැර කරවූ" යි කියා සිටියහ. කෙලෙඹියෝ චූලසුභද්‍රාවගේ නිදොස්බව සිටුහට දැන්වූහ. සිටු තෙමේ "මෝ තොමෝ මාගේ ශ්‍රමණයන් ලජ්ජා නැත්තවුනැයි සලකා නො වඳින්නී ය"යි සිටුබිරියට ද දැන්විය. සිටුබිරිය, "අපගේ ලේලිය තමන්ගේ මහණුන් පිළිබඳ ගුණය මහත් සේ කියා, ඔවුනට මහත් සේ පසසා ය"යි ඇය ඉදිරියට කැඳවා

"කෙබඳු ඔබ මහණහු – දැඩිසේ ඔවුන් පසසා,
කෙබඳු සිල් ඇතියෝ – කෙබඳු හැසුරුම් ඇතියහ?
පුළුවුත් මෙ මාහට – කියවූ සිල් සමහැසුරුම්"

යි පිළිවිසූ ය.

ඉක්බිති සුභද්‍රා තොමෝ ඇයට බුදුරජුන්ගේ හා බුදුසව්වන්ගේ ගුණ කියා ලන්නී,

"සන්හුන් ඉඳුරැති – සන්හුන් සිතැත්තෝ වෙති,
උන්ගේ ගමන් සන්හුන් – සිටුම් ඈ හැම සන්හුන්.

යට ලූ දෙ ඇස් ඇති - පමණ දූත බණනාසුලු,
මගේ මහණහු මෙබඳු - (ලොවට පින්කෙත් වූවෝ,)

කාවිසිමූතිතිදෙර - සුදුය නො කැලැති සුවිසුදු,
මගේ මහණහු මෙබඳු - (ලොවට පින්කෙත් වූවෝ)

ඇතුළත පිටත සුදු - නිමල් සක්මුතුකැලුමැත්,
සුදුගුණෙන් පිරිපුන් - එබන්දහ මා සමණහු.

ලැබුමෙන් උඩඟු ලෝ - නො ලැබුමෙන් ඇද වැටුනේ,
ලැබුම් නො ලැබුම් දෙක්හි - එක්වැනිය මා සමණහු,

යසසින් උඩඟු ලෝ - ඇද වැටුනේ ය අයසින්,
යස අයස දෙක්හි - එක්වැනිය මා සමණහු,

තුතියෙන් උඩඟු ලෝ - ගැරහුමෙන් ඇද වැටුනේ,
තුති ගැරහුම්හි මා - සමණහු සම ව සිටියෝ.

සැපෙන් උඩඟුය ලෝ - දුකින් ඔදබිඳ වැටුනේ,
නො කැපියහ සැපදුකැ - එබන්දහ මා සමණහු.''

යනාදිලෙසින් කියා නැන්දනිය සතුටු කළා ය.

එකල්හි නැන්දනිය ''ලේළි! ඔබගේ මහණුන් අපටත් දක්වාලන්නට හැකි දැ?''යි ඇසූ කල්හි ''හැකි ය'' යි කිවු ය. නැවැත නැන්දනිය ''එසේ නම් අපි පමණක් ම ඔවුන් දකිමු ද, එසේ පිළිවෙලක් කරව'' යි කී කල්හි සුභද්‍රා තොමෝ 'යහපතැ'යි බුදුපාමොක් මහසඟනට මහදන් සරහා පහය මතුමහලෙහි සිට දෙව්රම දිසාවට මූණ දී මැනවින් පසඟ පිහිටුවා වැඳ බුදුගුණ සිහි කොට සුවඳකැවූ මලින් දුමින් පුද ''සවාමීනි! හෙට දන් පිණිස බුදුපාමොක් බික්සඟුන් පවරමි, මේ සලකුණෙන් මාගේ බුදුරජානන් වහන්සේ දන් පිණිස පැවරුබව දන්නා සේක්වා''යි සමන්මල් අට මිටක් අහසට වීසි කළා ය. ඒ මල් අහසින් ගොස් සිවු පිරිස් මැද දහම් දෙසමින් වැඩහුන් බුදුරජානන් වහන්සේ මතුයෙහි මල් වියනක් ව සැදී සිට ගත. එ කෙණෙහි ම අනේපිඬු සිටු තෙමේ ද බණ අසා අවසන්හි පසුද දනය පිණිස ආරාධනා කෙළේ ය. ''සිට! හෙට පිණිස දනයෙක් මාවිසින් ඉවසන ලද''යි වදාළ කල්හි ''සවාමීනි! මට කලින් මෙහි ආවෝ නැත, ආරාධනා කළෝ කවුරු දැ''යි ඇසීය. ''සිට! චූලසුභද්‍රාව විසින් පවරණ ලද''යි වදාළ විට සිටු තෙමේ ''සවාමීනි! සුභද්‍රාව මෙයට එක් සිය විසියොත්නකින්

ඔබ්බෙහි වසන්නී ය'' යි කී ය. ''ඔව්, සිට! සත්පුරුෂයෝ ඉතා දුර සිටියෝ ද අබිමුව සිටින්නන් සේ පෙණෙති''යි වදාරා මේ ධර්ම දෙශනාව කළ සේක.

**දූරෙ සන්තො පකාසෙන්ති හිමවන්තොව පබ්බතො,**
**අසන්තෙත්ථ න දිස්සන්ති රත්තිං ඛිත්තා යථා සරා.**

සත්පුරුෂයෝ දුරැ සිටියාහු ද හිමවත් පව්ව මෙන් පළට වෙති. මෙහි අසත්පුරුෂයෝ රැ විදුනා ලද ඊයක් මෙන් නො පැණෙත්.

**දූරෙ සන්තො පකාසෙන්ති හිමවන්තො පබ්බතො ඉව** = සත්-පුරුෂයෝ දුරැ සිටියාහු ද හිමවත් පව්ව මෙන් පළට වෙති.

**සන්ත** නම්: රාගාදී වූ කෙලෙසුන් සින්සිඳ වූ බුද්ධාදී වූ උත්තමයෝ ය. මෙහි වනාහි පෙර බුදුරජුන් දවස කළ මහපින්කම් බලයෙන් වූ ප්‍රාර්ථනාසිද්ධි ඇති උත්සන්න වූ කුසල් මුල් හා වැඩූ භාවනා ද ඇති පින්වත්හු ගැණෙත්. **''රාගාදීනං සන්තතාය බුද්ධාදයො සන්තා නාම, ඉධ පන පුබ්බබුද්ධෙසු කතාධිකාරා උස්සන්නකුසලමූලා භාවිතභාවනා සන්තොති අධිප්පෙතා''** යනු අටුවා.[1]

**හිමවන්ත** යන්නෙන් තුන් දහසක් යොදුන් අයම්විතරැති පන් සියයක් යොදුන් උස ඇති සුවාසූදහසක් කුළින් සැදුම් ලත් පර්වතය ගැණේ. හිම බොහෝ බැවින් හෝ හිම වමනය කරණුයේ හෝ මේ පව්ව හිමවත් නම් වී. සම්භවජාතකට්ඨකථායෙහි **''හිමවාති හිමපාතසමයෙ හිමයුත්තත්තා හිමවා, ගිම්හකාලෙ හිමං වමතීති හිමවාති වුත්තං''** යනු ද දක්නට ලැබේ.

ශාක්‍ය-කොළිය දෙපසින් පැවිදි වූ භික්ෂූන් සසුනෙහි උකටලී වූ කල්හි උන්ගේ ඒ උකටලීබව මග හරවා ලන්නට බුදුරජානන් වහන්සේ ඒ භික්ෂූන් හිමවතට කැඳවා ගෙණ ගොස් අහසෙහි වැඩ සිට ම ඔවුන්ට එහි විසිතුරු පෙන්වාලූ සේක. ඒ මේ හිමවත රත්පවු - රිදීපවු - මැණික්පවු - ඉඟුල්පවු - අඳුන්පවු-දියමන්තිපවු ආදී වූ නොයෙක් දහස් ගණන් පර්වතයන්ගෙන් පිරී සිටියේ ය. ගඞ්ගා-යමුනා-අචිරවතී සරභූ-මහී ආදී ගඞ්ගාවන්ගෙන් විසිතුරු වූයේ ය. කණ්ණමුණ්ඩ-රථකාර-සීහප්පපාත-ඡද්දන්ත - මන්දාකිනී -කුණාල අනොතත්ත ආදී වූ විල්වලින් සොභමාන වූයේ ය. සිංහ ව්‍යාඝ්‍ර හස්ති ආදීනට වාසස්ථාන වූයේ ය. සිය ගණන් ආරාමයන් ගෙන් සිත්කලු වූයේ ය. සිය දහස් ගණන් පක්ෂිසමූහයාගෙන් අතුරු සිදුරු නැති ව පිරී ගත් මල්රුක් පලරුක්වලින් සැදුම් ලද්දේ ය. නානාවිධ වූ ඖෂධ වෘක්ෂලතායෙන් ආකීර්ණ වූයේ ය.

---

1 4. 9. 'සතං ච ගන්ධො' යනු බලනු.

මෙසේ නොයෙක් ලෙසින් විචිත්‍ර වූ හිමවත් පර්වතය දුටු ඒ භික්ෂූන්ගේ උකටලීබව සන්සිඳී ගියේ ය. එහි දී ඔවුනට බුදුරජාණන් වහන්සේ කුණාලජාතකය දෙසූ සේක. කුණලජාතකය බැලිය යුතුයි. **'සබ්බතො'** යනු කියන ලදී.[2]

**අසන්තෙත්ථ න දිස්සන්ති රත්තිං ඛිත්තා යථා සරා** = මෙහි අසත්පුරුෂයෝ රෑ විදිනා ලද ඊයක් මෙන් නො පැණෙත්.

**අසන්ත** නම්: මෙලොව ජීවිතය පමණක් උසස් කොට සලකා එය සතප්පන්නට දැහැමි ව හෝ නො දැහැමි ව වස්තුව උපයා තමන් කා බී වෙසෙන පරලොව ගැණ නො සිතන ගිහියාත්, ආමිෂයෙහි ගිජු ව ගෙදොර දොර කන්නට බොන්නට අඳින්නට නැති බැවින් සසුන්වත් පැවිද්දූත් ය. **"දිට්ඨධම්මගරුකා විතිණ්ණපරලොකා ආමිසචක්ඛුකා ජීවිකත්ථාය පබ්බජිතා බාලපුග්ගලා අසන්තො නාම"** යනු අටුවා.

එබඳු අසන්තයෝ අඥපුද්ගලයෝ පූර්වවාසනා නැතියෝ බුදු-රජාණන් වහන්සේගේ දකුණු දණමඩල ලඟ වැඩී හුන්නෝ ද බුදු නුවණට නො පෙණෙන්නාහ.

කාලපක්ෂයෙහි තුදුස්වක්දිනය, ඝනවනලැහැබ ය, මේඝ-පටලය, මධ්‍යමරාත්‍රිය යන මේ සිව් අඟින් යුත් රැයෙහි විදිනා ලද ඊතලය විදින්නහුගේ අතින් මිදුනු ඇසිල්ලෙහි ම ඔහුට නොපෙණී යන්නාසේ ය මේ අසන්ත අඥපුද්ගලයා බුදුරජාණන් වහන්සේට නො පෙණී යනුයේ. **"තෙ එත්ථ බුද්ධානං දක්ඛිණස්ස ජාණු-මණ්ඩලස්ස සන්තිකෙ නිසින්නාපි රත්තියං චතුරඞ්ගසමන්නා-ගතෙ අන්ධකාරෙ ඛිත්තසරං විය හි තථාරූපං උපනිස්සයභූතස්ස පුබ්බහෙතුනො අභාවෙන න පඤ්ඤායන්ති"** යනු අටුවා.

ධර්මදෙශනාවගේ අවසානයෙහි බොහෝ දෙන සෝවාන්පලාදි-යට පැමිණියාහු ය.

සක්දෙව් රජ තෙමේ චූලසුභද්‍රාව විසින් කළ මේ ආරාධනාව බුදුරජුන් ඉවසා වදාරණ ලදැ'යි දැන විස්කම් දෙව්පුත් ගෙන්වා "කූළු ගෙවල් පන් සියයක් මවා හෙට බුද්ධප්‍රමුඛ සඞ්ඝයා වහන්සේලා උග්‍ර නගරයට වැඩම කරවාලව"යි අණ කෙළේ ය. විස්කම් දෙව්පුත් ඒ අණින් කූළුගෙවල් පන් සියයක් මවා ගෙණ ගොස් දෙව්රම මහ වෙහෙර දොරටුවෙහි සිටියේ ය. බුදුරජාණන් වහන්සේ සුභද්‍රාවන් කියූ ගුණ පළට වන පරිදි රහතුන් පන් සියයක් ම ගෙණ පිරිවර සහිත ව කූළුගෙවලින් උග්‍ර නගරයට වැඩි සේක.

2. 9. 11. 'පබ්බතානං' යනු බලනු

පිරිවර සහිත වූ උගග සිටු තෙමේ ද සුභද්‍රාව කී පරිද්දෙන් ම බුදුරජුන් වඩනා මග බලා සිටියේ මහත් වූ බුද්ධානුභාවයෙන් වඩනා බුදුරජුන් දැක පහන් සිත් ඇතියේ සුවඳ මල් ආදියෙන් පුදමින් පිරිවරසහිත වූ බුදුරජුන් පිළිගෙණ වැඳ මහදන් පුදා නැවැත නැවැතත් පවරා සතියක් ම මහදන් දුන්නේ ය. බුදු-රජාණන් වහන්සේ ද ඔවුන්ගේ අදහස් බලා අදහසට අනුරූප පරිදි ධම්දෙශනා කළ සේක. උගගසිටු ඇතුළු වූ සුවාසූදහසක් දෙනාට එහිදී ධම්ාවබොධය වූයේ ය. ඉක්බිති බුදුරජාණන් වහන්සේ චූලසුභද්‍රාවට අනුග්‍රහ පිණිස ''තමුසේ මෙහි නතර වවු''යි අනුරුද්ධ තෙරුන් එහි නවතා සැවැත් නුවරට වැඩි සේක. එතැන් සිට ඒ නුවර සැදැහැති පහන් මිනිසුන්ගෙන් පිරී ගත්තේ ය.

**චූලසුභද්‍රාවස්තුව නිමි.**

# එකවිහාරික ස්ථවිරයන් වහන්සේ

## 21 – 9

**එකවිහාරික** ස්ථවිරයන් වහන්සේ එකලා ව ම නිදන්නේ ය, එකලා ව ම හිඳින්නේ ය, එකලා ව ම සක්මන් කරන්නේ ය, එකලා ව ම සිටින්නේ ය,යි සිව් පිරිස් අතර ප්‍රකට වූයේ ය. එකල්හි භික්ෂූන් වහන්සේලා; "ස්වාමීනි! මේ මහණ තනි ව ම නිද යි, තනි ව ම හිඳි යි, තනිය ම සක්මන් කර යි, තනි ව ම සිටී ය" යි බුදුරජානන් වහන්සේට දන්වා සිටියහ. එයැසූ බුදුරජානන් වහන්සේ "සාධු, සාධු" යි ඒ මහණහුට සාධුකාර දී "මහණහු නම් විවේකයෙන් කල් දවස ගෙවන්නකු විය යුතු ය" යි විවේකයෙහි අනුසස් දක්වා මේ ධර්මදේශනාව කළ සේක.

**එකාසනං එකසෙය්‍යං එකො චරමතන්දිතො,**
**එකො දමයමත්තානං වනන්තෙ රමිතො සියා'ති.**

එකලා ව හිඳීම සෙවුනේ ය. එකලාව හොවීම සෙවුනේ ය. නොමැලි ව එකලා ව හැසිරෙමින් එකලා ව තමා දමනය කරන්නා වූ මහණ තොමේ ගමින් දුර වනයෙහි ඇලුනේ වන්නේ ය.

**එකාසනං** = එකලා ව හිඳීම (සෙවුනේය) තනි ව හිඳින්නේ ය.

ගණසඞ්ගණිකායෙන් දුරු වූයේ ද කෙලශසඞ්ගණිකායෙන් දුරු නො වූයේ එකලා ව හුන්නේ නො වේ. භික්ෂූන් දහසක් මැද වුව ද මුල් කමටහන නො හැර එය මෙනෙහි කරමින් ම හිඳීම **එකාසන** නම් වේ. **"භික්ඛුසහස්සමජ්ඣෙපි හි මූලකම්මට්ඨානං අවිජහිත්වා තෙනෙව මනසිකාරෙන නිසින්නස්ස ආසනං එකාසනං නාම"** යනු අටුවා.

**එකසෙය්‍යං** = එකලා ව හොවීම (සෙවුනේය) තනි ව නිදන්නේ ය.

ජනසමූහයෙන් වෙන් ව එකලා ව නිදන්නේ නො වේ. ලොවාමහාපාය වැනි මහා පහයෙක දහස් ගණන් භික්ෂූන් මැද පණවනු ලද විසිතුරු පසතුරුණු ඇති කොට්ට මෙට්ට වලින් යුත් මාහැඟි යහනෙක සිහි එළවා මුල් කමටහන මෙනෙහි කරමින් දකුණැලයෙන් හොවීම **එකසෙය්‍යා** නම් වේ. **"ලොහපාසාදසදිසෙපි ච පාසාදෙ භික්ඛුසහස්සමජ්ඣෙ පඤ්ඤත්තෙන විචිත්තපච්චත්ථරණූපධානෙ මහාරහෙ සයනෙ සතිං උපට්ඨපෙත්වා දක්ඛිණෙන පස්සෙන මූලකම්මට්ඨානමනසිකාරෙන නිපන්නස්ස භික්ඛුස්ස සෙය්‍යා එකසෙය්‍යා නාම"** යනු අටුවා.

**අතන්දිතො එකො චරං** = නො මැලි ව එකලා ව හැසිරෙමින්. හැසිරෙණුයේ.

කෙණ්ඩාබලයෙන් පිඩු සිඟා ගෙණ දිවි ගෙවන බැවින් නො මැලි ව සිවු ඉරියව්වෙහි එකලාව ම හැසිරෙමින්.

**තන්දි** නම්: අලසබවය. නිර්දේශයෙහි එය මෙ සේ ආයේය. **"තන්දිනති යා තන්දි තන්දියනා තන්දිමනකතා ආලස්‍යං ආලස්‍යා යනා ආලසායිතත්තං"**යි. යම් තන්ද්‍රායෙක් තන්ද්‍රාකාරයෙක් තන්ද්‍රා යෙන් මඩනාලද බවෙක් ආලස්‍යයෙක් අලසබවෙක් ආලස්‍යාකාර-යෙක් ආලස්‍යයෙන් මඩනා ලද සිත් ඇති බවෙක් වේ ද, ඒ ය තන්දි, යනු අරුත්. ථිනමිද්ධනීවරණයාගේ ඉපැත්මට හෙතුවන ධර්ම අතු-රෙහි මේ තන්දි නම් වූ අලසබවට වඩා බලගතු අන් එක ද ධර්මය-කුත් බුදු ඇසින් නො දුටුබව ද බුදුරජානන් වහන්සේ වදාළ සේක. මේ ඒ වදාළ සැටි:- **නාහං භික්ඛවෙ! එකධම්මම්පි සමනුපස්සාමි යෙන අනුප්පන්නං වා ථිනමිද්ධං උප්පජ්ජති, උප්පන්නං වා ථින-මිද්ධං භියෙ‍්‍යාභාවාය වෙපුල්ලාය සංවත්තති, යථයිදං භික්ඛවෙ! අරති තන්දි විජම්භිකා භත්තසම්මදො චෙතසො ච ලීනත්තං, ලීනචිත්තස්ස භික්ඛවෙ! අනුප්පන්නං චෙව ථිනමිද්ධං උප්පජ්ජති, උප්පන්නං ච ථිනමිද්ධං භියෙ‍්‍යාභාවාය වෙපුල්ලාය සංවත්තති"** යනු.

මෙහි **අරති** නම්: ප්‍රාන්තසෙනාසනයන්හි හෝ ශමථ-විදර්ශනාදි අධිකුශලධර්මයෙක නො ඇලීම ය. **තන්දි** නම්: අලසබව ය. අලස බැවින් මැඩුනු සිත් ඇතිබව ය. **විජම්භිකා** නම්: ඇඟමැලිකැඩීම ය. **භත්තසම්මද** නම්: වැළඳුවහුට වන බත්මත ය. සිරුර කටයුත්-තෙහිලා නො සුදුසුබව ය. **ලීනත්ත** නම්: සිතෙහි හැකිළීම ය. අරමුණෙහි නො පැතිර සිටි ගති ය.

මෙ ද මෙහිලා දත්තේ ය:-

එක් දවසක් දෙවියෙක් බුදුරජුන් වෙත පැමිණ මෙසේ කී ය:

"නිද්දා තන්දි විජම්භිකා අරති භත්තසම්මදො,
එතෙන නප්පකාසති අරියමග්ගො ඉධ පාණිනං" යි.

නිදීම-අලසබව-ඇඟමැලිකැඩීම-නො ඇලීම-බත්මත යන මොවුන් නිසා මෙලොව සත්ත්වයනට ආර්‍ය්‍යමාර්ගය පැහැදිලි නො වේ, යන අරුත්. එකල්හි බුදුරජානන් වහන්සේ ඔහුට මෙසේ වදාළ සේක:

"නිද්දං තන්දිං විජම්භිකං අරතිං භත්තසම්මදං,
විරියෙන නං පණාමෙත්වා අරියමග්ගො විසුජ්ඣති" යි.

නිදීම–අලසබව–ඇඟමැලිකැඩීම–නො ඇලීම-බත්මත යන මොවුන් වීර්‍ය්‍යයෙන් දුරු කිරීමෙන් ආර්‍ය්‍යමාර්‍ගය පිරිසිදු වන්නේ ය, යන අරුත්. **අරති-තන්දි විජම්භිකා-භත්තසම්මද-චිත්තලීනත්ත** යන මෙතැන් අක්‍ෂර විසින් වෙනස් වෙනස් ව ගියේ ද ආශය විසින් අලසබව ම කියා ලන්නේ ය.

සැවැත් නුවර වැසි තිසක් පමණ කුලපුත්‍රයෝ දවසක් බුදුරජුන් වෙත පැමිණ වැඳ එකත් පස් ව හිඳ බණ අසා පැවිදි ව නැවත උපසපන්බව ද ලබා කමටහන් ගෙණ පිටත් ව ගියහ. ඔවුනතුරෙහි කුටුම්බියපුත්‍ර නම් වූ තිස්ස ස්ථවිර තෙමේ කුසීත වූයේ හළුවැර ඇතියේ රසයෙහි බැඳුනේ මෙසේ තිසී ය: “මම වල් වැද කමටහන් වඩන්නට පිඬු සිඟා යන්නට අපොහොසත්මි, එහෙයින් මට මේ වනගමනින් වැඩෙක් වන්නේ නො වේ, මම මෙහි ම රැඳී රසට මසට මොකවත් කා බී ඉන්නෙමි”යි කමටහන් වඩන්නට නො ගොස් එහි ම රැඳුනේ ය. තවත් එබඳු ම කිහිප දෙනෙක් ඒ තෙරුන් හා ම ගමැ රැඳුහාහ. ඒ තිස් නමගෙන්, වන වැද විදර්ශනා වඩා රහත් වූ කීපදෙනා වහන්සේ තමන් ලැබූ ඒ මහත් ගුණය බුදුරජාණන් වහන්සේට දන්වා ලමු”යි බුදුරජුන් වෙත ගොස් වැඳ එකත් පස් ව හිඳ තම තමන් ලැබූ ගුණ විශෙෂයන් උන්වහන්සේට දන්වා සිටියහ. එකල්හි බුදුරජාණන් වහන්සේ ඔවුනට පැසසූහ. කුටුම්බිය ස්ථවිර තෙමේ බුදුරජුන්ගේ ඒ ස්තුතිකථාව අසා “මමත් මහණදම් කරමි”යි තමන්ගේ පිරිවෙණට වැද රාත්‍රියෙහි අධික කොට වැඩූ වීර්‍ය්‍යයෙන් වෙහෙසට පත් ව මැදියම් රැයෙහි පුවරුවක් මත නින්දට වැටුනේ එයින් පෙරළී බිම වැටී කලවේ ඇට කැඩී වෙදනායෙන් පෙළෙන්නට වූයේ ය. ඔහුට අනුව වැටුනු අනික් දෙනා වහන්සේට ද කුටුම්බියපුත්‍රයනට උවැටන් කරන්නට වූ බැවින් වනයට යා ගත නො හැකි වූහ. බුදුරජාණන් වහන්සේට උවටැන් කරණ වේලෙහි එහි පැමිණි ඔවුන්ගෙන් උන්වහන්සේ “මහණෙනි! තමුසේලා ඊයේ කමටහන් වඩන්නට වනයට යන බව කියා ගියහු නො වහු දැ?”යි අසා වදාළ කල්හි “එසේ ය, ස්වාමීනි! එහෙත් අපට සහාය වූ කුටුම්බියපුත්ත, නො වේලේ අධික වෙගයෙන් මහණදම් කරණුයේ නින්දෙන් පෙරළී බිම වැටී කලවේ ඇට බිඳ ගත්තේ ය, උන් නිසා අපට වනයට යා ගත නො හැකි වීය”යි දන්වා සිටියහ. එවිට බුදුරජාණන් වහන්සේ “මහණෙනි! මෙ තෙමේ සුදුසු වේලෙහි වීර්‍ය්‍යය නො කොට සිට නො කල්හි යෙදූ අධිකවීර්‍ය්‍යය හෙතු කොට තමුසේලාගේ ගමනට අන්තරාය කළේ අද පමණක් නොවේ ය”යි වදාරා ඒ අතීත පුවතද ගෙණ හැර දැක්වූ සේක.

“යටගිය දවස අප මහාබෝසත් තෙමේ ගන්ධාර රට තක්සලා නුවර දිසාපාමොක් ඇදුරු ව මාණවකයන් පන් සියයක් හට ශිල්ප ඉගැන් වීය. එහි දවසක් වලට ගොස් දර කඩන මාණවකයන් අතුරෙහි කුසීත මාණවකයෙක් ලුණුවරණ ගසක් දැක මල් ගසෙකැයි සිතා ඇසිල්ලක් නිදා හිඳ දර කඩා ගෙන යෙමි යි උතුරුසළුව අතුට එහි වැතිර ගොරවමින් නිදන්නට වන. සෙසු දෙනා දර කඩා මිටි බැඳ ගෙණ යන්නාහු නිදි ගත්තහුට පයින් ඇණ නැගිටුවා ගියහ. ඔහු තින්දෙන් නැගිට නිදිගැට නො යාදීම ගසට නැගී අත්තක් ගෙණ තමා දෙසට ඇද බින්දේය, එවිට බිඳී ආ අත්තෙහි කෙළවර ඇසෙහි වැදී ඇස හිල් විය, එක් අතකින් ඇස වසා ගෙණ අනික් අතින් තෙත් දර කඩා මිටි කොට බැඳ වහා ගෙණ ගොස් බහා තුබූ දර මිටි මත්තෙහි බැහූයේ ය, එ දවස එක් ගමෙක මිනිස්සු බමුණන් ලවා ශාන්ති කරවා ගෙණ දක්ෂිණාවක් දෙම්හ යි ඇදුරන් පැවරූහ ඇදුරු තෙමේ මාණවකයන් අමතා ‘හෙට දක්ෂිණාවක් පිණිස යා යුතු ව තිබේ, එහෙයින් උදෑසන ම කැඳ පිසවා ගෙණ වළඳා ගොස් තොපට ලැබෙන කොටසුත් අපට පැමිණෙන කොටසුත් ඇර ගෙණ එවු’සි කී ය, එයැසූ මාණවකයෝ කෙල්ල පුබුදුවා අපට කැඳ පිස දෙව සි කීහ, කෙලි ද කැඳ පිසනු පිණිස දර ගන්නී මතුයෙහි තුබූ ලුනුවරණ දඬු ගෙණ ගින්නෙහිලා දල්වන්නී දල්වාගත නො හැකි වූ ය, ඉරද නැංගේ ය, එවිට මාණවකයෝ ඉතා දහවල් වූ බැවින් යා නො හැකි යි ඇදුරන් වෙත ගියහ, ඇදුරු ‘නොගියහු දැ?’යි විචාල විට ‘නො ගියෙමු’යි කීහ, කරුණු කිමැ’යි විචාළවිට ‘ස්වාමීනි අසුවල් කුසීත මාණවකයා දරට ගොස් ලුනුවරණ ගසක් යට නිදා හිඳ පසුව නැගිට ගසට නැගී ඇසත් හිල් කොට ගෙණ ලුණුවරණ දර ගෙණවුත් අප බහා තුබූ දර මතුයෙහි බහා තුබුතේ ය, කැඳ පිසන්නී වියලි දරැයි සිතා ගින්නෙහි ලා පිසන්නී ඉර උදාවන තුරු ගිනි මොලොවා ගත නො හැකි වූ ය, මේ නිසා ගමන වළකිනැ’සි කීහ, ඇදුරු ‘ගමෙක් පළමු කළමනා දෙය පසුව කළමනායි සිතා පරීක්ෂා නො කොට අමු ලුණුවරණ දර කඩා ගෙණ ආ මේ මාණවකයා මෙන් පසු තැවීමට පැමිණ ශොක කරන්නේද ඔහු එලොව මෙලොව දෙක්හි හැම සැපතින් පිරිහෙන්නේය’’සි කීයේ ය. මේ ඒ යටගිය කතා පුවත ය.

**අතන්දිත** නම්: එලොව මෙලොව දෙක්හි හැම සැපතින් පිරිහීමට හෙතුවක් වූ අලසබව කම්මැලිකම හැර වැර යොදා නැගී සිටියේය.

**“අත්තහිතපටිපත්තියං යථාබලං පරහිතපටිපත්තියං ච උට්ඨානවන්තො අතන්දිතො”**යි අටුවා බැවින් ආත්මහිත සම්‍යක්ප්‍රතිපත්තියෙහි හා පරහිත ප්‍රතිපත්තියෙහි ශක්තිය වූ පරිදි ශක්තිය ඇති

පරිදි නැඟී සිටුනා උත්සාහය ඇතියේ **අතන්ද්‍රිත** යි ගතයුතු වෙත්. ඒ මේ උත්ථානවීර්‍ය්‍යය ශීලසම්පදාදීනට කරුණු වූ වීර්‍ය්‍යසම්පදා යි කියන ලදී. **"අතන්දිතොති ඉමිනා සීලසම්පදාදීනං කාරණභූතං විරියසම්පදං දස්සෙති"** යන මෙයින් කියේ ඒ ය.

එක් දවසක් **චන්දන** දෙව්පුත් බුදුරජුන් වෙත පැමිණ "මෙහි කවරෙක් රෑ දෙවෙහි අනලස් ව චතුරොඝය තරණය කෙරේ ද? කවරෙක් යට පිහිටක් නැති මතු එල්බීමක් නැති ගැඹුරෙහි නො-ගිලේ ද?"යි ඇසීය. මේ මෙහි පාලිය.

"කොසූධ තරතී ඔඝං රත්තින්දිවමතන්දිතො,
අප්පතිට්ඨෙ අනාලම්බෙ කො ගම්භීරෙ න සීදති" යනු.

බුදුරජාණන් වහන්සේ ඔහුට:-

"සබ්බදා සීලසම්පන්නො පඤ්ඤවා සුසමාහිතො,
ආරද්ධවිරියො පහිතත්තො ඔඝං තරති දුත්තරං.

විරතො කාමසඤ්ඤාය රූපසංයොජනාතිගො,
නන්දීරාගපරික්ඛීණො සො ගම්භීරෙ න සීදති" යි

පිළිතුරු දුන් සේක.

හැමදා සිල්වත් වූ නුවණැති එකඟ වූ සිත් ඇති ඇරඹූ වැර ඇති නිවන් පිණිස මෙහෙය වූ සිත් ඇති පුද්ගල තෙමේ තරණයට දුෂ්කර වූ චතුරොඝය තරණය කරන්නේ ය.

කාමසංඥායෙන් වැළකුනු රූපසංයොජන ඉක්මවා ගිය ගෙවී ගිය නන්දිරාගය ඇති හෙතෙමේ ගැඹුරෙහි නො ගිලෙන්නේය, යනු එහි අරුත්.

මෙ ද මෙහිලා දතයුතුය:-

"අප්පලාභොපි චෙ භික්ඛු සලාභං නාතිමඤ්ඤති,
තං වෙ දෙවා පසංසන්ති සුද්ධාජීවං අතන්දිතං" යනු

ප්‍රත්‍යයලාභී වූ ද මහණ තෙමේ ඉදින් ගෙ පිළිවෙළින් සිඟා ලත් තමාගේ ලාභය හෙළා නො දක්නේ ද පිරිසිදු වූ ජීවිකාව ඇති කොණ්ඩාබලයෙන් ජීවත් වන බැවින් අකුසීත වූ ඒ මහණහුට ඒ කාන්තයෙන් දෙවියෝ ද පසසත්, යනු අරුත්.

**අත්තානං එකො දමයං** = තමා එකලා ව ම දමනය කරන්නා වූ මහණතෙමේ

රාත්‍රිස්ථාන – දිවාස්ථානයන්හි එකලා ව වෙසෙමින් කමටහන් මෙනෙහි කිරීමෙහි යෙදී කෙලෙසුන් නසා මගපල පසක් කිරීම, තමා දමනය කිරීම නම් වේ. මෙසේ කමටහන් වඩා කෙලෙසුන් නසන්නේ දමයන්‍ත නම්. **"ජඝඝාබලං නිස්සාය ජීවිතක්ඛයෙන අකුසිතො හුත්වා චතුරිරියාපථෙසු එකකො ව විචරනෙනා රත්තිට්ඨානදිවාට්ඨානෙසු කම්මට්ඨානං අනුයුඤ්ජිත්වා මග්ග-ඵලාධිගමවසෙන එකොව හුත්වා අත්තානං දමෙනතා"** යනු අටුවා.

**වනනෙන රමිතො සියා** = ගැඹුරු වනයෙහි ඇලුනේ වන්නේ ය.

වනාන්ත නම්: ස්ත්‍රීපුරුෂාදීන්ගේ ශබ්ද නැති වනයෙහි දුර සෙනසුන යි. ආත්මදමනය කරන්නහු විසින් එකලා ව හිඳී ම එකලා ව හොවීම එකලා ව සිටීම එකලා ව හැසිරීම කළ යුතු ය. ජනසමූහයෙන් වෙන් විය යුතු ය. කෙලෙසුනට යටත් නො විය යුතු ය. නො මැලි ව පිඩු සිඟා ලද දූයෙකින් යැපෙමින් රසමසෙහි නො ගිජු ව වනසෙනසුනෙහි සිත් එලවා විසිය යුතු ය. ආකීර්ණ විහරණ ඇත්තහුට ආත්මදමනය නො කට හැකි ය.

ධර්මදෙශනාවගේ අවසානයෙහි බොහෝ දෙන සෝවාන්පලාදි-යට පැමිණියාහු ය. එතැන් පටන් එකවිහාරිකභාවය ම පැනී ය.

**එකවිහාරිකස්ථවිරවස්තුව නිමි.**

සකලජන ධර්මාර්ථසංග්‍රහාභිලාෂී **පණ්ඩිත** අම්බලම්ගොඩ
**ධම්මකුසල** ස්ථවිරයන් කළ **සද්ධර්මසාගර** නම් වූ
**ධර්මපදවර්ණනා**යෙහි ප්‍රකීර්ණවර්ගාත්මක වූ
එකවිංශතිතමතරඞ්ගය නිමියේ ය.

විද්‍යාලඞ්කාරවිශ්වවිද්‍යාලය,
1966. 10. 6

**අතීතයෙහි** වැදගත් ශ්‍රද්ධාබුද්ධි සම්පන්න බෞද්ධ රජදරුවන්ගේ කාලවල මෙබඳු විශාලධර්මපුස්තකයක් නිෂ්පාදනය කරන පණ්ඩිත බහුශ්‍රැත භික්ෂූන් වහන්සේලාට ගම්වරවලින් පිදීම ඉතිහාස ගත කරුණක් බව පූජාවලීධර්මප්‍රකරණය ගැන කළ උපහාර වලින් සලකා ගත හැකි ය. මෙකල මෙබඳු පොත් ගැන වත්මන් රජය කරුණාවෙන් බුද්ධිමත් ව සලකතොත් පුස්තකාලයවල සාහිත්‍ය ග්‍රන්ථයක් වශයෙන් හා ධර්මග්‍රන්ථයක් වශයෙන් ද තබන්නට හැකි-වනුයෙන් එය ධර්මසාහිත්‍යසේවයක් වෙනවාට නො අනුමානයි. පිරිවෙනක් මගින් සිදු කරන්නට යෙදෙන ලෝක ශාසනික සේවයට වඩා සද්ධර්මසාගර නම් වූ ධර්මපදවර්ණනාව සිදුකරන්නට යෙදෙන ලෝකශාසනිකසේවය ඉතා වැදගත් කොට සැලකිය හැකි ය.

අප මිත්‍ර ධර්මශාස්ත්‍රවිශාරද පඬිවරයෙක් වූ **අම්බලම්ගොඩ ධම්මකුසල** නායක ස්ථවිරපාදයන් වහන්සේට මේ ධර්මපද වර්ණනාව නිමවාලීමෙහි නිරුපද්‍රැතාවය හා ධර්මදානමය කුශලයෙන් නිවන් සැපත් ලැබේවා!!

මේ බවට, ශාසනෝදයකාමී

කැලණියේ විද්‍යාලංකාර විශ්වවිද්‍යාලයේ සම්මාන උපකුලපති,
ත්‍රිපිටක වාගීශ්වරාචාර්ය උපාධ්‍යාය ධුරන්ධර,
ආගමචක්‍රවර්ති අභිසම්මතාත්‍ය පණ්ඩිත (ඩීලිට්)
**කිරිවත්තුඩුවේ ධර්මකීර්ති ශ්‍රී ප්‍රඥාසාරාභිධාන**
කොළඹ හලාවත දෙදිශාවේ ප්‍රධානසංඝනායක
ස්ථවිරයන් වහන්සේ ය.

## ද්වාවිංශතිතමවර්ගීයකථාසූචි


| පිට | වර්ගය | | වස්තුව |
|---|---|---|---|
| 2303 | 22 | 1 | සුන්දරීපරිව්‍රාජිකාවගේ මරණය |
| 2309 | ,, | 2 | කාසාවකණ්ඨයෝ. |
| 2310 | ,, | 3 | ගිනියම් කළ යගුළි ගිලීම. |
| 2313 | ,, | 4 | පරඹුවන් කරා ගිය බෙම. |
| 2316 | ,, | 5 | ඇවැත් මැඩ විසූ මහණෙක්. |
| 2320 | ,, | 6 | දූස්සට කළ අපරාධය |
| 2322 | ,, | 7 | ආගන්තුක භික්ෂූහු. |
| 2325 | ,, | 8 | පසු පස නො වැසූ නිගණ්ඨයෝ. |
| 2328 | ,, | 9 | දෙව්රම් වෙහෙරට ගිය ළමයි. |


## ත්‍රයෝවිංශතිතමවර්ගීයකථාසූචි


| පිට | වර්ගය | | වස්තුව |
|---|---|---|---|
| 2331 | 23 | 1 | මාගන්දිය අල්ලස් දී කළ ගැහැට. |
| 2335 | ,, | 2 | ඇතුන් හේ කිරීම දත් මහණෙක්. |
| 2337 | ,, | 3 | පුතුන් බසට රැවටුනු මහලු බමුණා. |
| 2344 | ,, | 4 | කොසොල් රජුගේ බත් බුදීම්. |
| 2346 | ,, | 5 | යකින්නක කළ ගැහැටෙක්. |
| 2352 | ,, | 6 | බද්ධෙරක ඇතා. |
| 2354 | ,, | 7 | පාරිලෙය්‍යක ඇතා. |
| 2360 | ,, | 8 | මවුපියනට කැම්බීම් සැපයූ භික්ෂූන්වහන්සේ. |

## චතුර්විංශතිතමවර්ගීයකථාසූචි

| පිට | වර්ගය | වස්තුව | |
|---|---|---|---|
| 2367 | 24 | 1 | කපිලමත්ස්‍යයා |
| 2375 | ,, | 2 | ඌරියකගේ පෙරළිය. |
| 2383 | ,, | 3 | සිවුරු හළ මහණෙක්. |
| 2385 | ,, | 4 | සිරගෙයි ලූ හොරු. |
| 2388 | ,, | 5 | ඛෙමා. |
| 2391 | ,, | 6 | උග්‍රසෙන සිටුපුත්. |
| 2397 | ,, | 7 | කෙල්ලකගේ බසට රැවටුනු මහණෙක්. |
| 2413 | ,, | 8 | මරු නැගු හඬ. |
| 2425 | ,, | 9 | උපක ආජීවක. |
| 2427 | ,, | 10 | දෙවියන් අතර පැනනැගුනු ප්‍රශ්න සතරෙක්. |
| 2432 | ,, | 11 | අපුත්‍රක සිටු. |
| 2436 | ,, | 12 | අඞ්කුරගේ දානය. |

## පඤ්චවිංශතිතමවර්ගීයකථාසූචි

| පිට | වර්ගය | වස්තුව | |
|---|---|---|---|
| 2441 | 25 | 1 | ඇස් කන් නාස් ඈ දොරටු වැසූ භික්ෂූන් වහන්සේ. |
| 2448 | ,, | 2 | ගල් කැටක් දමා ගසා හංසයකු මැරූ මහණ. |
| 2452 | ,, | 3 | කොකාලික. |
| 2456 | ,, | 4 | ධර්මාරාම ස්ථවිරයන් වහන්සේ. |
| 2458 | ,, | 5 | විපක්ෂසෙවකභික්ෂු නමක්. |
| 2461 | ,, | 6 | පඤ්චග්‍රදායකබ්‍රාහමණ. |
| 2464 | ,, | 7 | බුදුරජුන්ගේ සාධුකාරය. |
| 2479 | ,, | 8 | පිපී පරවීගිය මල් දකීමෙන් නැගු වීර්‍යය. |
| 2480 | ,, | 9 | සන්තකායස්ථවිරයන් වහන්සේ. |
| 2482 | ,, | 10 | නඞ්ගලකුලස්ථවිරයන් වහන්සේ. |
| 2485 | ,, | 11 | වක්කලිස්ථවිරයන් වහන්සේ. |
| 2487 | ,, | 12 | සුමනසාමණේරයන්ගේ ආනුභාවය. |

# ෂඩ්විංශතිතමවර්ගීයකථාසූචි


| පිට | වර්ගය | වස්තුව | |
|---|---|---|---|
| 2501 | 26 | 1 | ප්‍රසාදබහුල බ්‍රාහ්මණයෙක්. |
| 2506 | ,, | 2 | බුදුරජුන් වෙත පැමිණි භික්ෂූන් වහන්සේලා. |
| 2508 | ,, | 3 | මරුට දෙසූ දහමෙක්. |
| 2510 | ,, | 4 | තමන් බමුණැයි සිතාගත් බමුණෙක්. |
| 2512 | ,, | 5 | බුදුරජුන්ගේ සරීරොභාසය. |
| 2516 | ,, | 6 | බමුණකුගේ ඉල්ලීමෙක්. |
| 2518 | ,, | 7 | ශාරිපුත්‍ර මහාස්ථවිරයන් වහන්සේගේ ඉවසීම |
| 2523 | ,, | 8 | මහාප්‍රජාපතිගෞතමිය නිසා උපන් කතාවක්. |
| 2525 | ,, | 9 | සැරියුත් තෙරුන්ගේ ගුරුන් පිදීම. |
| 2526 | ,, | 10 | ජටිල බ්‍රාහ්මණයා. |
| 2528 | ,, | 11 | කුහක බමුණෙක්. |
| 2531 | ,, | 12 | කිසාගොතමී. |
| 2533 | ,, | 13 | තමා බමුණුයි සිතූ බමුණෙක්. |
| 2535 | ,, | 14 | උග්ගසෙන සිටුපුත්. |
| 2537 | ,, | 15 | චූල්ලරොහිත-මහාරොහිත බ්‍රාහ්මණයෝ. |
| 2539 | ,, | 16 | අක්කොසකභාරද්වාජබ්‍රාහ්මණයා නැගූ ප්‍රශ්න |
| 2542 | ,, | 17 | සැරියුත් මහතෙරුන්ගේ මෑනියන්ද කියූ රළුබස්. |
| 2545 | ,, | 18 | මිනිසුන් රහතුන් වහන්සේ ගැණ කළ කතාවක්. |
| 2547 | ,, | 19 | පැවිදි වූ දූසයෙක්. |
| 2548 | ,, | 20 | ඛෙමා ස්ථවිරාවෝ. |
| 2550 | ,, | 21 | තිෂ්‍ය ස්ථවිරයන් වහන්සේ. |
| 2554 | ,, | 22 | රහත් නමකට තැළූ පව්ටු මිනිසෙක්. |

| පිට | වර්ගය | වස්තුව | |
|---|---|---|---|
| 2557 | 26 | 23 | කෝපයෙන් ගැටුනු බැමිණිය. |
| 2561 | ,, | 24 | මහාපන්ථක තෙරුන් චූලපන්ථක තෙරුන්ට සැලකූ හැටි. |
| 2563 | ,, | 25 | පිළින්දිවච්ඡමහාස්ථවිරයන් වහන්සේ. |
| 2566 | ,, | 26 | උතුරු සළුවක් ගත් මහණෙක්. |
| 2567 | ,, | 27 | සැරියුත් මහතෙරුන්ට කළ නිගාවක්. |
| 2569 | ,, | 28 | මුගලන් මහතෙරුන්ට දෙසූ ධර්මදෙශනාවක්. |
| 2571 | ,, | 29 | පින් පව් නැසූ රේවත සාමණේරයන් වහන්සේ. |
| 2573 | ,, | 30 | චන්ද්‍රාභස්ථවිරයන් වහන්සේ. |
| 2578 | ,, | 31 | සීවලීමහාස්ථවිරයන් වහන්සේ. |
| 2581 | ,, | 32 | සුන්දර සමුද්ද තෙරුන්ට වෙසඟනක කියූ කපට බස්. |
| 2586 | ,, | 33 | (1) ජටිලස්ථවිරයන් වහන්සේ. |
| 2605 | ,, | 33 | (2) ජෝතිය ස්ථවිරයන් වහන්සේ. |
| 2607 | ,, | 34 | නළුවෙස්. |
| 2609 | ,, | 35 | නට පුත්‍රයා. |
| 2611 | ,, | 36 | වඞ්ගීසස්ථවිරයන් වහන්සේ. |
| 2616 | ,, | 37 | විශාඛ–ධම්මදින්නා දෙදෙන. |
| 2619 | ,, | 38 | ඇතුනට බිය නොවූ අඞ්ගුලිමාල ස්ථවිරයන් වහන්සේ. |
| 2621 | ,, | 39 | උණුදිය හා උක්පැණි පිඩු බ්‍රාහ්මණයා. |

# නිරයවග්ගය

# සුන්දරී පරිබ්‍රාජිකාවගේ මරණය

## 22 — 1

**එක්** කලෙක අප තිලෝගුරු සම්මා සම්බුදුරජානන් වහන්සේට හා උන්වහන්සේගේ ශ්‍රාවකසඞ්ඝයා වහන්සේට පස් මහානදියෙහි ගලා බස්නා මහෝදිය කඳක් සේ විවිධ ලාභසත්කාරයෝ දසතින් ගලා එන්නට වූහ. එකල්හි අන්‍යතොටු පිරිවැජියෝ ඉර උදාවන කල්හි නො පෙණී යන කණාමැදිරියන් සේ මහාජනයා මැද නො පෙණී ගියෝ එක් තැනෙක රැස් ව "ශ්‍රමණගෞතමයා උපන් දා පටන් අපි නැසී ගිය ලාභසත්කාර ඇතියමෝ වම්හ, කිසිවෙකුත් අප ඇති බව ද නො දන්නේ ය, එහෙයින් කවරක්හුගේ වහලින් මොහුට අයසක් උපදවමු ද, මොහුට ලැබෙන ලාභසත්කාර කෙසේ වළකා ලමු ද" යි සාකච්ඡා කළහ. මෙසේ සාකච්ඡාවට බට මොවුනට සුන්දරියගේ වහලින් මෙය කට හැකි ය,යි සිත් විය.

මේ අතර දවසෙක සුන්දරිය උන් වෙත ගොස් වැඳ සිටියා ය. එහෙත් අන්‍යතොටුවෝ ඇය හා කිසිත් නො බැණ නිහඬ ව සිටියහ. ඕ නැවැත නැවැතත් වැඳ සිටියා වචනමාත්‍රයකුත් නො ලැබුනු බැවින් "ස්වාමීනි! කිම, ඔබවහන්සේලා කිසිවකු විසින් පෙළන ලදහු දැ"යි ඇසූ ය. "බුහුන! අප පෙළා අප කන බත උදුරා කන අපට ලැබෙන හැම ලාභසත්කාර පැහැර ගෙණ සිටින ශ්‍රමණ ගෞතම තිට නො පැණේ දැ" යි ඇසූ කල්හි "මා විසින් මෙහිලා කුමක් කළ යුතු දැ?" යි ඕ ඇසූ ය. එකල්හි ඔවුහු "බුහුන! තී මනාරූ ඇතියා දුටුවන් සිත් ගන්නීහි, මනා සොවුන්බැව් ඇතියා වෙහි, එහෙයින් තිට ශ්‍රමණ ගෞතමයා හට පහර ගසනු හැකි ය, අයසක් ඉපදවිය හැකි ය, තී කියනු ලබන්න මහජනයා පිළිගණ්නු ඇත, ඒ නිසා ගෞතමයාහට අයසක් උපදවා එය මහාජනයාට ගන්වා ඌ පිරිහුන ලාභ-සත්කාර ඇතියකු කරව" යි කීහ. ඕ ද "යහපතැ" යි එබස් අසා එතැන් පටන් මල් ගඳවිලවුන් කපුරු තකුල් ලමඟ ආදිය ගෙණ සවස මහාජනයා දෙව්රමට ගොස් බණ අසා පෙරළා එන වේලාව බලා ඔවුනට පෙණෙන සේ අඳුරු වැටී එත්, දෙව්රමට මුහුණ දී යන්නී ය. කවරකු හෝ "කොහි යෙහි දැ"යි ඇය විචාළොත් "මම ශ්‍රමණ ගෞතම වෙත යමි, ගඳකිළියෙහි නිදන්නට එන්නැ යි ඔහු මට දන්වා ඇත, එහෙයින් ඔහු හා එක් ව ගඳකිළියෙහි නිදන්නට යමි" යි කියා ගොස් අන්‍යතොටු අරමකට වැද නිදා හිඳ පාන් වන්නට කලින් දෙව්රමට යන මගට බැස නුවර බලා යන්නීය. "සුන්දරි! කොහි ගියා දැ?"යි කවරකු විසින් හෝ අසන ලද්දී නම් මම දෙව්රමට ගියෙමි, ශ්‍රමණ ගෞතමයා හා

අඹුසැමියන් සේ ගඳකිළියෙහි නිදා, හිඳ උන් නලවා එම්" යි කියන්නී ය. කිහිප දවසක් සුන්දරිය මෙසේ කරත්, තීර්ථකයෝ මුදල් දී නුවරවැසි බේබද්දන් පොළොඹා සුන්දරිය මරා මළකුණ ගෞතමයාගේ ගඳ කිළිය සමීපයෙහි මල් කසළ හස්සේ සඟවා තබමු යි කියා බේබද්දන් යැවූහ. ඔවුහු දවසෙක මඟ රැක සිට සුන්දරිය අල්ලා මරා මල්කසළ හස්සේ සඟවා තබා ගියහ. එයින් කිහිප දවසක් ගිය තැන තීර්ථකයෝ "කිහිප දවසක සිට සුන්දරිය දක්නට නැතැ" යි රජුට දන්වාලූහ. රජු "සුන්දරියගේ මේ අතුරුදහන්වීම ගැණ සැක උපදවත් ද" යි විචාළ විට මේ දවස්හි රාත්‍රිකාලයෙහි සුන්දරිය වාසය කළා දෙව්රමෙහි ය, ඉන් පසු මැ ආගිය අතක් දැන ගන්නට නැත, මැ දුටුවෙක් ද නැතැ" යි තීර්ථකයෝ කියා සිටියහ. එවිට රජ තෙමේ "සුන්දරිය සොයවූ"යි නිලධරයනට නියම කෙළේ ය. තීර්ථකයෝ ද සුන්දරිය සෙවීමෙහි උත්සාහවත් ව සිය පිරිස් සමඟ දෙව්රමට ගොස් තැන තැන සොයා යන්නෝ මල් කසළ දමා තුබූ තැනට ගොස් මල් කසළ අවුස්සා "මෙන්න මළකඳ" යි සඟවා තුබූ මළකුණ ගෙණ ඇඳක තබා නුවර මැදට ගෙණ අවුත් "ගෞතමගේ වල්කම් පව්කම් වසා ගන්නට ඔහුගේ ශ්‍රාවකයෝ සුන්දරිය මරා මල් කසළ හස්සේ සඟවා තැබූහ" යි රජුට දන්වා යැවූහ. එවිට රජ තෙමේ "එසේ නම් එබව නුවර වැස්සනට දන්වාලවූ"යි දන්වා යැවී ය. ඔවුහු "බලවූ, ශ්‍රමණ ශාක්‍ය පුත්‍රයන්ගේ ජඩකම්" යි නුවර මංමාවත්හි සෑම තැන ඇවිද නැවැත රජගෙදරට ගියහ. රජ තෙමේ සුන්දරියගේ මළකඳ අමුසොහොනෙහි මැස්සක තබ්බවා රැකවල් කර වීය. ආර්‍ය්‍යශ්‍රාවකයන් හැර සැවැත් නුවර වැසි සෙසු දෙනා "ශ්‍රමණ ශාක්‍ය පුත්‍ර ය යි කියා ගන්නා මූන්ගේ වැඩවල හැටි, බලවූ, අනුන් දෙන බත් කා මූන් කරණ වැඩ, මූන් කරණ නො හොබිනා වැඩ සල්ලාලයෝ බේබද්දෝ නො කරත්" යි කියමින් නුවර ඇතුළත පිටත වසන භික්ෂූන්ට ඇණුම් බැණුම් කරමින් හැසිරෙන්නට වූහ. භික්ෂූන් මෙ පුවත අසා බුදුරජුන් වෙත ගොස් දන්වා සිටි කල්හි "මහණෙනි! එසේ නම් බැණ ඇවිදින මිනිසුන්ට තමුසේලා මෙසේ කියවූ" යි වදාරා මේ ධර්මදෙශනාව කළ සේක.

අභූතවාදී නිරයං උපෙති
යො චාපි කත්වා න කරොමීති චාහ,
උභොපි තෙ පෙච්ච සමා භවන්ති
නිහීනකම්මා මනුජා පරත්ථ.

බොරු කියනසුලු පුද්ගල තෙමේ ද නැවැත යමෙක් (පව්කම්) කොට නො කෙළෙමි යි කියා ද (හෙතෙමේ ද) නිරයට පැමිණෙයි. ලාමක ක්‍රියා ඇති ඒ මිනිස්සු දෙදෙනා ම මෙයින් සැව පරලොවදී සම වෙත්.

**අභූතවාදී** = බොරු කියනසුලු පුද්ගල තෙමේ ද.

නො වූ, නො සිදු වූ දෑය, වූ, සිදුවූ දෑය හැටියට කියා පාන්නේ **අභූතවාදී** ය. අනුන්ගේ දෙසක් වරදක් නො දැක ම නින්දා අපහාස කිරීමෙහි බලාපොරොත්තුවෙන් නො කියූ නො කළා වූ දෑය "කීහ, කළහ" යි කියන්නේ ය. **"පරස්ස දොසං අදිස්වාව මුසාවාදං කත්වා තුච්ඡෙන පරං අබ්භාචික්ඛන්තො"** යනු අටුවා.[1]

**නිරයං උපෙති** = නරකයට පැමිණේයි. නරකයෙහි උපදියි.[2]

**යො ච අපි කත්වා න කරොමි ඉති ච ආහ** = නැවැත යමෙක් පව්කම් කොට නො කෙළෙමි යි කියා ද.

**උභො අපි තෙ පෙච්ච සමා භවන්ති නිහීනකම්මා මනුජා පරත්ථ** = ලාමකක්‍රියා ඇති ඒ මිනිස්සු දෙදෙන ම මෙයින් සැව පරලොව දී සම වෙත්.

බොරු කියනුයේ ද නිරයට යන්නේ ය. පව්කම් කොට නො කෙළෙමි' යි කියනුයේ ද නිරයට යන්නේ ය. පහත් ක්‍රියා ඇති ඒ මිනිස්සු දෙදෙන ම මිය ගොස් පරලොව දී ගති වශයෙන් සම වන්නාහ. ඔවුහු දෙදෙන නිරයෙහි ඉපැදීමෙන් ගති වශයෙන් සමාන වූවාහු ද විපාක වින්ද යුතු කාල වශයෙන් නම් සමාන නො වෙත්. පව්කම් බොහෝ කොට බොහෝ කලක් ද පව්කම් මඳ වශයෙන් කොට මඳ කලක් ද නිරයෙහි පැසිය යුතු බැවිනි. විපාක කාල වශයෙන් ඔවුන් සමාන නො වන්නේ ය. **"තෙ උභොපි ජනා පරලොකං ගන්ත්වා නිරයං උපගමනෙන ගතියා සමා භවන්ති ගතියෙව තෙසං පරිච්ඡින්නා. ආයු පන තෙසං න පරිච්ඡින්නං. බහුං හි පාපකම්මං කත්වා චිරං නිරයෙ පච්චන්ති. පරිත්තං කත්වා අප්පකමෙව කාලං. යස්මා තෙසං උභින්නම්පි ලාමකමෙව කම්මං. පෙච්ච පරත්ථ ච ඉතො ගන්ත්වා තෙ නිහීනකම්මා පරලොකෙ සමා භවන්ති"** යනු අටුවා.

**නිහීනකර්මී** ඇතියෝ නම් සතුන් මැරීම් හොරකම් කිරීම් ආදී වූ එලොව මෙලොව දෙක්හි දුක් දෙන පව්කම් කරන්නෝ ය.

ධර්මදේශනාවගේ අවසානයෙහි බොහෝ භික්ෂූහු සෝවාන් ඵලාදියට පැමිණියාහු ය. රජ තෙමේ නැවැතත් "සුන්දරිය මරා-ලූවන් සොයා බැඳ ගෙණ එවූ" යි රාජපුරුෂයන් යෙදූයේ ය. රාජ පුරුෂයන් රජ අණ පරිදි ඔවුන් සොයා ඇවිදිනා කල්හි සුන්දරිය

1. 1 10 'පාපකාරී, යනු බලනු
2. 1 12 'දුග්ගතිං ගතො, යනු බලනු.

මැරීමට මුදල් ගත් බේබද්දෝ ඒ මුදලින් මත්පැන් බී උනුන් අරගල කරන්නට වූහ. එකෙක් එකකුහට "තෝ එක්පහරින් ම සුන්දරිය මරා මලකුණ මල්කසළ හස්සේ සඟවා එයට ලැබුනු කුලියෙන් මත් පැන් බී අරගල කරන්නෙහි, අල්ලස් ගෙණ මිනී මරන්නෙහි, තට එය අරුමයෙක් නො වේ"යි හඬ නගා කියන්නට වූයේ ය. රාජපුරුෂයෝ උන් අල්ලා බැඳ ගෙණ ගොස් රජුට දක්වූහ. "සුන්දරිය මැරුවෝ තෙපි ද?" යි ඇසූ කල්හි "දෙවයන් වහන්ස! එසේය"යි කීහ. "කවරක්හුගේ බසට ද?"යි ඇසූ කල්හි "දෙවයන් වහන්ස! අන්තොටුවන්ගේ බසටැ" යි කීහ. එවිට රජ තෙමේ අන්තොටුවන් ගෙන්වා "තෙපි නුවර සැම තැන ගොස් ශ්‍රමණගෞතම හට නින්‍දා පරිභව උපදවනු කැමැති ව අප විසින් සුන්දරිය මරවන ලද්දී ය, මෙහිලා ශ්‍රමණ ගෞතම අතවත් ඔහුගේ ශ්‍රාවකයන් අත වත් දොසෙක් නැතැ"යි කියාලවු"යි නියම කෙළේ ය. අන්තොටුවෝ එසේ කියමින් නුවර මුළුල්ලෙහි හැසුරුණාහ. කියාලූ දෙයක් පිළිගන්නෝ එද පිළිගත්හ. අන්තොටුවෝ මරණදඬුවම් ලැබූහ. බුදුරජානන් වහන්සේට ලැබුනු ලාභ සත්කාරයෝ වඩාත් මහත් ව ගියහ.

**සුන්දරීපරිබ්‍රාජිකාවස්තුව නිමි**

# කාසාවකණ්ඨයෝ

## 22 — 2

**දවසෙක මෞද්ගල්‍යායන** මහාස්ථවිරයන් වහන්සේ **ලක්ෂණ** මහාස්ථවිරයන් වහන්සේ සමග ගිජ්ඣකූළ පව්වෙන් බස්නා සේක් අටඨිසඞ්ඛලික ප්‍රෙතයන්ගේ අත්බැව් දැක සිනා පහළ කළ සේක. ඒ දුටු ලක්ෂණ මහාස්ථවිරයන් වහන්සේ සිනාසීමෙහි හෙතු විචාළ කල්හි “ඇවැත්නි! සිනාසීමෙහි හෙතු කියන්නට මේ දැන් කාලය නො වේ, බුදුරජුන් වෙත දී එය විචාරවු” යි කියා දෙදෙනා වහන්සේ ම බුදුරජුන් වෙත ගියහ. එහිදී ලක්ෂණ ස්ථවිරයන් වහන්සේ විසින් විචාරණු ලැබූ මෞද්ගල්‍යායන ස්ථවිරයන් වහන්සේ අටඨිසඞ්ඛලික ප්‍රෙතයන් දුටුබව කියා, “ඇවැත්නි! ගිජ්ඣකූළ පව්වෙන් බසිද්දී මම අහස යන මහණකු දුටුවෙමි, ඔහුගේ සිරුර ගිනිනෙන් ඇවිළුනේ ය, මෙසේ ගිනි ගෙණ දිලියෙන පා සිවුරු කාබාන් ආදිය ගත් මහණ-මෙහෙණ-හෙරණ-හෙරණි-සිඛමත් ලෙසින් ඇවිදුනා ප්‍රෙතයන් දිටිමි” යි කීහ. එකල්හි බුදුරජානන් වහන්සේ මොවුන් හැම දෙනා කසුප් බුදුරජුන්ගේ සසුනෙහි පැවිදි ව පැවිද්දට සුදුසු ලෙසින් නො ද පිළිපැද දුසිල්කම් කළ බව වදාරා, ඒ වේලෙහි එහි රැස්ව හුන් පවිටු අදහස් ඇති මහණුන්හට දුසිල් ව විසීමෙන් අපායයෙහි පැසී ඉතුත් පව්කම් නො ගෙවුනු බැවින් ප්‍රෙත ව ඉපද පෙර කළ පව්කම්වල විපාක විඳුනාබව දක්වමින් මේ ධර්මදෙශනාව කළ සේක.

**කාසාවකණ්ඨා බහවො පාපධම්මා අසඤ්ඤතා,**
**පාපා පාපෙහි කම්මෙහි නිරයං තෙ උපපජ්ජරෙති.**

ගෙල වෙළා ගත් කහකඩ ඇති පවිටු සැහැවි ඇති නො හික්මුනු කයවචන ඇති පුද්ගලයෝ බොහෝ වෙත්. ඒ පවිටෝ තමන් කළ පව්කම් හෙතුයෙන් නිරයෙහි උපදිත්.

**කාසාවකණ්ඨා** = කසාවතින් ගෙල වෙළා ගත් ගෙල ලූ කහවත් ඇති.

**කාසාවකණ්ඨ** නම්: ගෙලැ සිවුරු ලාගෙණ මහණුන් සේ හැසිරෙණ පවිටෝ ය. ශාසනායුෂය පිරිහී යත්, එවක ඇති වන මහණෝ විනය ශික්ෂාපදයනට පටහැනි ව සිවුරු දරන්නෝ ය. කායවාක් සංයමය නැත්තෝ ය. පිඬු සිඟා යන්නෝ පාත්‍රය එව්කයෙහි බහා ගෙල එල්ලා ගෙණ යන්නෝ ය. කල් යත් මොවුහු පාත්‍රය අල්ලෙහි හෝ උරහිසෙහි තබා ගෙණ ලබුකබල් ගත් තීර්ථකයන් මෙන් පිඬු සිඟා යන්නෝ ය. සිවුරු රඳන් ගන්වන කල්හි විනය ශික්ෂාවන් නො තකා තමන් කැමැති සේ රඳන් ගන්වති. ඔටු ඇට පැහැය සේ

මදක් කසාවත් කොට ගත් සිවුරු ඇඳ පොරවන්නෝ ය. තවත් ඉදිරියට යත්, රදත් නො ගත්වා පඬු නො පොවා කඩෙහි දවලු පමණක් කපා හැර දියෙන් තෙමා කලල් කොට අඳින්නෝ ය. නැවැත දවලු පමණක් සිඳ පිරිවැජියන් මෙන් රෙදිකඩ දෙපට කොට හිණවට පටක් දවටා පටකින් උරහිස වසා පෙරව ගෙණ දඩබිමට යන්නවුන් සේ "අපි මහණෝ වෙමු"යි කියා කල් ගෙවන්නෝ ය. තවත් ඉදිරියට යත්, "මෙ පමණකිනුත් කම් කිමැ"යි රෙදිකඩ හැඳගෙණ කහකඩක් ගෙලවට දවටා ගෙණ; නැත, හිස වසා ගෙණ "අපි මහණෝ" යි කියා ඇවිදින්නෝ ය. එයිනුත් අඹුදරුවන් සහිත ව සුව සේ ජීවත්විය නො හැකි ව සීසෑම් වෙළ හෙළඳුම් ආදී වූ ගිහියන් අයත් කටයුතුවලින් දිවි ගල වන්නෝ ය. මෙබන්දේ ය කාසාවකණ්ඨකයෝ.

**බහවො** = බොහෝ (වෙත්)

**පාපධම්මා** = පව්වූ සැහැවි ඇති.

පැවිද්දන්ට නො හොබිනා පහත් අදහස් ඇත්තෝ පහත් කියුම් කෙරුම් ඇත්තෝ ලාමක හැසිරීම් ඇත්තෝ **පාපධම්ම.** යමක්හට පහත් අදහස් වන්නේ නම්, ඒ වන්නේ තමන් පිළිබඳ දුස්සීලභාව හෙතුයෙනි. **"පාපධම්මාති දුස්සීලතාය එව හීනජ්ඣාසයතාය ලාමකසභාවා"** යනු අටුවා.

**අසඤ්ඤතා** = කය වචන සිත්හි හික්මීමක් නැති.

කායිකසංවරාදීන් අතුරෙහි මොන ම සංවරයකුත් නැති අවිනීත වූ බාලජනයෝ **අසඤ්ඤත. "කායිකසංවරාදීසු කස්සචි සංවරස්ස අභාවෙන අසංයතා අවිනීතා බාලජනා"** යනු ධාර්මික වචනයි. කයින් පව්කම් කරන්නෝත් වචනයෙන් පව්කම් කරන්නෝත් සිතින් පව්කම් කරන්නෝත් අසඤ්ඤතයෝ ය. සිවුරු කරලා ගත් පහත් අදහස් ඇති කය වචන දෙකින් නො හික්මුනු පැවිද්දෝ නියම පැවිද්දන්ගේ ලක්‍ෂණ ගෙණ නියම පැවිද්දන් සේ පෙණී සිට රට මුළා කොට බඩ වඩා ගන්නෝ ය. මේ මෙය වදාළ සැටි:

"න වණ්ණරූපෙන නරො සුජානො
න විස්සසෙ ඉත්තරදස්සනෙන,
සුසඤ්ඤතානං හි වියඤ්ජනෙන
අසඤ්ඤතා ලොකම්මං චරන්ති"

මිනිස් තෙමේ රූසටහනින් මැනැවින් නො දත හැකි ය. දක්ක පමණින් නො ඇදහිය හැකි ය. හික්මීමක් නැත්තෝ හික්මුන වුන්ගේ ලක්‍ෂණ ගෙණ හැඩහුරුකම් පෙන්වමින් මහජනයා මැද හැසිරෙන්නෝ ය.

**පාපධම්මා** = පහත් අදහස් ඇති ලාමක වූ.

**අසඤ්ඤතා** = කය වචන සිත යන තුන් තන්හි හික්මීමක් නැති.

**කාසාවකණ්ඨා** = කරලා ගත් සිවුරු ඇත්තෝ.

**බහවො** = බොහෝ වෙත්, හි අරුත් ගත්තේ ය.

**පාපා පාපෙහි කම්මෙහි නිරයං තෙ උපපජ්ජරෙ** = ඒ පව්ටෝ (තමන් කළ) පව්කම්වලින් නිරයෙහි උපදින්නෝ ය.[1]

මොවුහු තමන් කළ පව්කම් හෙතුවෙන් බොහෝ කලක් නිරයෙහි ඉපද පැසී එයින් චුත ව විපාකාවශෙෂ වශයෙන් ප්‍රෙත යොනියෙහි දුක් විඳින්නාහ.

ධම්දෙශනාවගේ අවසානයෙහි බොහෝ දෙන සෝවන් පලාදියට පැමිණියාහු ය.

**කාසාවකණ්ඨ වස්තුව නිමි.**

1, 1, 12 'දුග්ගතිං ගතො' යනු බලනු

# ගිහිසම් කළ යගුලි ගිලීම

## 22 — 3

**බුදුරජාණන්** වහන්සේ විසල්පුර මහාවනයෙහි කූටාගාරශාලා යෙහි වැඩ වසන එක් දවසෙක බොහෝ ගණනක් භික්ෂූහු වග්ගුමුදු ගංතෙර වස් එළඹුනාහ. ඒ වස් කාලයෙහි මුළු වැදූරට දුර්භික්ෂයෙන් තදින් පෙළෙන්නට වන. එහි මිනිසුනට කෑම් බීම් ඇඳුම් කැඩුම් සපයා ගැණීම ද අපහසු විය. වස් විසූ ඒ භික්ෂූහු ද එයින් පෙළෙන්නට වූහ. එකල්හි ඔවුහු දිවි පවත්වා ගැණීම පිණිස ගිහින්ගේ වැඩ කරන්නට පණිවුඩ ගෙණ යන්නට මෙහෙවර කරන්නට සිතා නැවැත ඒ හැමට වඩා නැති සිල් පෙන්වා නැති ගුණ හඟවා එකෙකා ඒ ඒ ධ්‍යානලාභීන් කොට එකෙකා සෝවන් ය, සෙදගැමි ය, අනාගැමි ය, රහත් ය, යි දක්වා මිනිසුන් රවටා දිවි ගැලවීම පහසු ය යි කතිකා කොට එසේ කරන්නට පටන් ගත්හ. රටවැසි මිනිස්සු ද මුන් කියූ ඒ හැම කතාවක් සත්‍ය ය යි පිළිගෙණ "අපට වූයේ ලාභයෙක, මෙහි වස් එළැඹි වසන භික්ෂූහු සිල්වත්හ, කලණදහම් ඇතියහ, මෙයට පෙර මෙ බඳු ගුණවත් භික්ෂූහු මෙහි වස් නො එළැඹියාහු ය" යි තමන් නො කා නො බී මවුපියන්ට අඹුදරුවන්ට හිතමිතුරන්ට සහ ලේ නෑයන්ට නො දී ඉකා අමාරුවෙන් සපයා ගත් දූය රසට මිහිරට උයා පිහා මොවුනට ගෙණ ගොස් දෙන්නාහ. ඒ කෑ බී ඔවුහු ටික දවසක් ගිය තැන පැහැ ඇතියෝ පිණා ගිය ඉඳුරන් ඇතියෝ පහන් මුවපැහ ඇතියෝ පහන් සිවිපැහැ ඇතියෝ වූහ. ඒ භික්ෂූහු මෙසේ රසට මිහිරට හොඳින් කා බී වැඩී වස නිමවා බුදුරජුන් දක්නට විසල්පුර මහාවනයෙහි කූටාගාරශාලාවට ගොස් බුදුරජුන් වැඳ එකත් පසෙක හුන්හ. එකල්හි බුදුරජුන් විසින් සුවදුක් විචාළ ඔවුහු "ස්වාමීනි! අපි සැපසේ වුසුම්හ, අපට රසට මිහිරට පිළියෙල කළ කෑම් බීම් අඩු නැතිව ලැබින, කෑම් බීම්වලින් වෙහෙසට පත් නො වූම්හ, එහෙයින් අපි සමගි ව වාදවිවාද නැති ව වුසුම්හ" යි කියා සිටියහ.

බුදුරජාණන් වහන්සේ "මහණෙනි! තෙපි කෙසේ නම් වාද විවාද නැතිව සුවසේ වුසූ වහු ද? කෑම් බීම් කෙසේ ලැබූ වහු ද?" යි අසා වදාළ කල්හි ඔවුහු එහිදී කළ කියූ සැටි නො සඟවා දන්වාළුහ. බුදුරජාණන් වහන්සේ "කිම, මහණෙනි! තෙපි වැදූරට වැසියනට සැබවක් ම කී වහු ද?" යි අසා වදාළ විට, "නැත ස්වාමීනි! අහර පැන් ගැහටක් නැතිව ලබා ගැණීමෙහි අදහසින් අප වෙත නැති ගුණ ඇති ලෙසට බොරු කීම්හ" යි කීහ. "හිස් පුරුෂයෙනි! අධම පුරුෂයෙනි! තෙපි කෙසේ නම් බඩ නිසා බඩ කරුණු කොට තමන්

සිල් ඇතියන් කොට උසස් ගුණ දහම් ඇතියන් කොට බොරු කී වනු ද? නැති සිල් පෙන්වා නැති ගුණ හඟවා බඩ වඩා ගැණුමට වඩා ගෙරි කපන කැත්තෙන් තොපි බඩ කපා ගත්තහු නම් කොතරම් හොඳ ද, බඩ වඩා ගැණීමට සිතා නැති සිල් පෙන්වීම නැති ගුණ ඇඟවීම මහත් පාපයෙක්, බඩ කපා ගැණීම නිසා වන්නේ මරණයට පැමිණීම හෝ මරණය වැනි දුකට පත්වීම ය, එයින් නිරයෙහි ඉපැත්මෙක් නො වන්නේ ය, මහණෙනි! මෙය එසේ මෙසේ කාරියෙක් නො වේ, රට රවටා බඩ වඩා ගැණීම් හෙතුවෙන් දිවි ගලවන්නන්ට නිරයෙහි ඉපද කල්ප ගණනක් නිරයදුක් විඳින්නට සිදුවනු ඒකාන්ත ය, එය වළකාලනු නො හැකි ය, මහණෙනි! මේ සොරු පස් දෙනෙක් වෙත්: එකෙක් ගම්නියම්ගම් රජදනාවුහි හැසිරෙමින් බොරු කියා ගිහි පැවිද්දන් රවටා සිවුරු–පිඬුපා–සෙනසුන්–බෙහෙත් ගිලන්පස–ගරු සැලකිලි බුහුමන් ලබන්නේ ය. මේ පළමුවන සොරා ය. දෙවන සොරා බුදුරජුන් වදාළ තෙවළාදහම් මැනැවින් උගෙණ පුහුණු කොට එය තමාගේ ය යි කියන්නේ ය. තෙවන සොරා රහත් මහණක්හට මුල් රහිත පරිජි ඇවතින් චොදනා කරන්නේ ය. සිවුවන සොරා සඟසතු අරම්–අරම්වතු–වෙහෙර–වෙහෙරවතු–ලූඩ කඩම්–ඇඳ–පුටු–බිසි–කොට්ට–මෙට්ට–ඇඳ ඇතිරිලි–තඹ පිත්තල යකඩ බඩු–වෑ–පොරෝ–කෙටේරි–උදලු–නියන්–වැල්–හුණ දඬු–තණකොළ–මැටි–ලී බඩු–මැටිබඳුන්–නැඹිලි–පොල්–පුවක් ආදිය ගෙදරට නෑයන්ට හිතවතුන්ට දී ඔවුන් තමන් වෙතට නතු කර ගන්නේය. බැඳ ගන්–නේ ය. පස්වන සොරා තමන් වෙත නැත්තා වූ ධ්‍යානවිමොක්ෂාදි උත්තරි මනුෂ්‍යධර්ම තමන් වෙත ඇතැ යි කියන්නේ ය, මහණෙනි! මේ තෙමේ ය දරුණු ම සොරා. යමෙක් අන් පරිද්දෙකින් දිවි පවත්වන තමා අන් පරිද්දෙකින් උසස් කොට දක්වා සොරකමින් සිවුපසය ලබන්නේ නම්, ඒ ලබා ගැණීම් ලිහිණිවැද්ද ලිහිණින් රවටා මරා කන්නාක් වැනිය'' යි නොයෙක් ලෙසින් ඒ භික්ෂූන් ගරහා මේ ධර්මදෙශනාව කළ සේක.

**සෙය්‍යො අයොගුළො භුත්තො තත්තො අග්ගිසිඛූපමො,**
**යං චෙ භුඤ්ජෙය්‍ය දුස්සීලො රට්ඨපිණ්ඩං අසඤ්ඤතොති.**

හික්මීමක් නැති දුස්සීලයෙක් ඉඳින් යම්හෙයකින් රටවැස්සන් විසින් සැදැහයෙන් දෙන ලද අහර වළඳන්නේ නම් (එයට වඩා) ගින්නෙන් ඇවිළ ගත් ගිනිසිළක් බඳු වූ ලෝගුළියක් වළඳනා ලද්දේ උතුම් වේ.

සෙය්‍යො = ප්‍රශස්ත ය. උතුම් ය.

මෙ තෙමේ අතිශයින් ප්‍රශස්තය යන අරුත්හි **'සෙය්‍යො'** යනු යෙදෙන්නේ ය. **"අයඤ්ච පසත්ථො, අයඤ්ච පසත්ථො, සබ්බෙ ඉමෙ පසත්ථා, අයං ඉමෙසං අතිසයෙන පසත්ථොති=සෙය්‍යො"** යනු වාක්‍ය ය ය.

**අයොගුළො** = යගුළ. යවට.

**භුත්තො** = වළඳනාලදුයේ.

**තත්තො** = තැවුනු. ගිනියම් කළ. ගිනිගත්.

**අග්ගිසිඛූපමො** = ගිනිසිළක් බඳු. ගිනිදූල්ලක් බඳු.

**යං චෙ භුඤ්ජෙය්‍ය** = ඉදින් යම්හෙයකින් වළඳු නම්.

**දුස්සීලො** = සිල් නැත්තා වූ පුද්ගලයෙක්.[1]

**රට්ඨපිණ්ඩං** = රටවැස්සන් විසින් පුදනලද අහර.

පරලොව හඳහා ශ්‍රද්ධායෙන් පුජාබුද්ධියෙන් යුක්තව රට වැසියන් විසින් සිල්වතුන් කෙරෙහි පිරිනමන සිවුපසය මෙහි රට්ඨපිණ්ඩ යි ගණු ලැබේ. නෑ පරපුර හැර රට ඇසුරු කොට පැවිද්දා විසින් ලත් පිණ්ඩපාතය ද 'රට්ඨපිණ්ඩ' යි කියනු ලැබේ. **"ඤාතිපරිවට්ටං පහාය රට්ඨං නිස්සාය පබ්බජිතෙන පරෙසං ගෙහතො ලද්ධත්තා පිණ්ඩපාතො රට්ඨපිණ්ඩො නාම"** යනු සාධකසූත්‍ර.

**අසඤ්ඤතො** = කය වචන සිතින් නො හික්මුනු.

මෙහි ඉච්ඡාචාරයෙහි සිටි කොහොත්වතින් ලොකය රවටනුයේ **අසඤ්ඤත.** මේ එය කිහු සැටි:- **"ඉච්ඡාචාරෙ ඨිතො කුහනාය ලොකං වඤ්චෙන්තො පුග්ගලො"** යි.

දුස්සීලයන් විසින් සැදැහැතියන් දුන් රට්ඨපිණ්ඩය වැළඳීමට වඩා ගිනියම් කළ යගුළි ගිලීම උතුම්ය යි වදාළෙ‍ෝ යගුළි ගිලීමෙන් වන මරණය හෝ මරණය සමාන දුක එක් අත්බැවෙක්හි ම වනු මිස එය ජාතියෙන් ජාතියට දිගට නො යන බැවිනි. දුස්සීල ව සිට අන්හු රවටා ලබා ගන්නා සිවුපසය වැළඳීම එසේ නො වේ. එය සිය දහස් ගණින් ජාතීන්හි නිරයෙහි ඉපද නන් වැදෑරුම් කටුක දුක් විඳීමට කරුණු වන්නේ ය.

ධර්මදේශනාවගේ අවසානයෙහි බොහෝ දෙන සෝවන්පලාදි- යට පැමිණිහු ය.

**වග්ගුමුදාතීරිය භික්ෂු වස්තුව නිමි.**

---

1, 8, 9. 'දුස්සීලො' යනු බලනු.

# පරඹුවන් කරා ගිය ඛෙම

## 22 — 4

ඛෙම නම් සිටුපුත්, අනේපිඬු සිටුහුගේ බෑනනුවෝ ය. හෙතෙමේ දුටුවන් පහදවන රූ ඇත්තේ ය. ස්ත්‍රීහු බොහෝසෙයින් ඔහු දැක කාමවෙගයෙන් කුල්මත් වූවෝ සියතතු දරා ගැණීමෙහි අපොහොසත් වූහ. ඛෙම තෙමේ ද පරඹුවන් කෙරෙහි ඇලුනේ නිතර එවුන් කරා ගියේ ය. දිනක් පරඹුවන් කරා යන මොහු රාත්‍රියෙහි රාජපුරුෂයන්ට හසු විය. රාජපුරුෂයෝ ඔහු අල්ලා ගෙණ ගොස් රජුට දැක් වූහ. රජ තෙමේ "මේ නිසා මොහුට දඬුවමක් කෙළෙම් නම් එය මහසිටුහට ලජ්ජාවට කරුණු වන්නේ ය"යි කිසිත් විනිශ්චයක් නො කොට මුදා හැරියේ ය. එහෙත් ඛෙම තෙමේ පරඹුවන් කරා යෑම අත් නො හළේ ය. තුන් පසුත් දෙතුන් විටක් ම මොහු අල්ලා රජු ඉදිරියට පැමිණි වූහ. එහෙත් රජ තෙමේ ඒ හැමවරම කිසිත් නො බැණ පිටත් කොට හැරියේ ය. මහසිටුතෙමේ මෙ පුවත අසා ඔහු ද රැගෙණ බුදුරජුන් වෙත ගොස් මෙය දන්වා "ස්වාමීනි! මොහුට බණ ටිකක් දෙශනා කරණු මැනැවැ"යි ඇයැද සිටියේ ය. බුදුරජානන් වහන්සේ පරඹුවන් ගැණීමෙන් එලොව මෙලොව දෙක්හි වන දරුණු විපාකයන්ගේ බිහිසුණු බව දක්වමින් මේ ධර්ම දෙශනාව කළ සේක.

**චත්තාරි ඨානානි නරො පමත්තො**
**ආපජ්ජති පරදාරූපසෙවී,**
**අපුඤ්ඤලාභං න නිකාමසෙය්‍යං**
**නින්දං තතියං නිරයං චතුත්ථං.**

**අපුඤ්ඤලාභො ච ගතී ච පාපිකා**
**භීතස්ස භීතාය රතී ච ථොකිකා,**
**රාජා ච දණ්ඩං ගරුකං පණෙති**
**තස්මා නරො පරදාරං න සෙවෙ.**

පරඹුවන් සෙවුනාසුලු පමා වූ මිනිස් තෙමේ අකුසල් ලැබීම, කැමැති සේ නො නිදීම, තෙවන වූ නින්දාව, සිවුවන වූ නිරයෙහි ඉපැත්ම යන දුක් කරුණු සතරට පැමිණේ.

අකුසල් ලැබීම ද, ලාමකගතිය ද (ඔහුට) වේ. බියපත් වූවහුගේ බියපත් ස්ත්‍රිය සමග කරණ කාමරතිය ද ස්වල්ප වේ. රජ තෙම් ද බරදඬුවම් පණවයි. එහෙයින් මිනිස් තෙමේ පරඹුවන් සෙවනය නො කරන්නේ ය.

**චත්තාරි ඨානානි** = කරුණු සතරකට.

**නරො පමත්තො** = පමා වූ මිනිස් තෙමේ.[1, 2]

**ආපජ්ජති** = (කරුණු සතරකට) පැමිණේ.

**පරදාරූපසෙවී** = පරඹුවන් සෙවුනා සුලූ.[3]

**අපුඤ්ඤලාභං** – අකුසල් ලැබීමට.

**"පුඤ්ඤපටිපක්ඛාති = අපුඤ්ඤානි"** පිණට ප්‍රතිපක්ෂවූවෝ අපුඤ්ඤ නම් වෙත්. යම් කිසි ධර්මජාතියකින් සත්වසන්තානය අපවිත්‍ර කෙරේ නම් ඒ ධර්මජාතිය අපුඤ්ඤ නම් වේ. අකුසල නමින් කියැවෙනුයේ ද මේ ය.

**න නිකාමසෙය්‍යං** = කැමැතිසේ නිදි නො ලැබීමට. නො නිදීමට.

පමාවූවහුට, සිහියෙන් තොර වූ වහුට තමා කැමැති සේ සුවසේ නිදි නො ලැබෙන්නේ ය. හේ නින්දට ගියේ නපුරු සිහින දක්නේ ය. නත් දෙඩන්නේ ය. හඬ නගන්නේ ය. පෙරළෙන්නේ ය. තතනනුයේ ය. බියවනුයේ ය.

**නින්දං තතියං** = තෙවන වූ නින්දාවට.

ගැරහීම, අවමන් කිරීම, නුගුණකීම, බැණීම, නින්දා ය. මේ වනාහි ලොකධර්මයෙකි. ලොකධර්ම අටෙකි. නින්දාව ඉන් එකෙකි. නින්දාවෙන් මිදුනෙක් ලොකයෙහි නැත. එහෙත් නින්දාවට බිය විය යුතු ය. කරුණු ඇති ව හෝ කරුණු නැති ව නින්දාකිරීම ගැරහීම ලොකයාගේ සවභාවය යි. එහිදී නො සැලිය යුතු ය.[3]

**නිරයං චතුත්ථං** = සිවුවැනි වූ නරකයට.[4]

සිහිනුවණින් තොර ව වසන අනුන් අයත් ගැණුන් හා කාමසෙවනය කරණ පව්වූ මිනිසා ඒ හෙතුයෙන් අකුසල් සිදුකර ගැණීම, තමා කැමැතිසේ නිදි නො ලැබීම, මෙ ලොවදී ම ගැරහුම් ලැබීම නිරයෙහි ඉපැත්ම යන මේ දුක් සතරට පැමිණෙන්නේ ය යි මෙයින් වදාළ සේක.

**අපුඤ්ඤලාභො ච** = අකුසල් ලැබීම ද.

**ගති ච පාපිකා** = ලාමක උපත ද.

1. 4. 3. 'ව්‍යාසත්තමනසං නරං' යනු බලනු.
2. 2. 1. 'යෙ පමත්තා' ,, ,,
3 1. 10. 'පාපකාරී' ,, ,,
3. 6. 6. 'නින්දා පසංසාසු' ,, ,,
4. 1. 12. 'දුග්ගතිංගතො' ,, ,,

මෙහි **'ගති'** යන්නෙන් මරණින් මතු කෙරෙණ සත්වයන් පිළිබඳ උපත කිය වේ **'පාපිකා'** යනු එය වෙසෙසන්නේය. ලාමක උපත, පහත් උපත, නපුරු උපතැයි **'ගති'** යනු, ඒ හා සම්බන්ධ-වීමෙන් අරුත් දෙන්නේ ය. නරක - තිරිසන් - ප්‍රේත - අසුර යන මෙතැන්හි ලබන උපත **'පාපිකා, ගති'** යන්නෙන් දක්වන ලද්දේ ය.

**භීතස්ස භීතාය රතී ච ථොකිකා** = බියපත්වූවහුගේ බියපත් ස්ත්‍රිය සමග කරණ කාමරතිය ද ස්වල්ප වේ.

'කිසිවෙක් අල්වා පහර දේ ද'' යන යන බියෙන්, සැකයෙන් බියපත් ව වෙවුල වෙවුලා එයට නිසි තැන් නැති ව නිසි කල් නො ලැබ, එසේ ම බියපත් වූ ස්ත්‍රියක හා කාමසංසර්ගයෙහි යෙදෙන පුරුෂයාහට එයින් ලැබෙන කාමාස්වාදය ද සිත් සේ පවත් වන්නට නො පිළිවන් බැවින් ස්වල්පමාත්‍ර ම වේ.

**රාජා ච දණ්ඩං ගරුකං පණෙති** = රජතෙමේ ද බරදඬුවම් පණවයි

ප්‍රමත්ත වූ පරඹුවන් හා පරපුරුෂයන් සෙවනය කරණ පුරුෂ - ස්ත්‍රීනට පරලොව සිවු අපායෙහි ඉපද දුක් විඳින්නට පෙරාතුව මෙලොව දී ම රජවරු දෙතිස් කම් කටොලු වශයෙන් පවත්නා බර දඬුවම් දෙන්නෝ ය.[1]

**තස්මා නරො පරදාරං න සෙවෙ** = එහෙයින් මිනිස් තෙමේ පරඹුවන් සෙවනය නො කරන්නේ ය.

ධර්මදෙශනාවගේ අවසානයෙහි ඛෙම සෝවන්පලයෙහි පිහිටි-යේ ය. එතැන් පටන් ඔහු අතින් එබඳු ලාමක වැඩෙක් නොවී ය. මහාජන තෙමේ ද මොහුගෙන් ගැහැටක් නො ලැබ සුවසේ හුන්නේ ය.

ඛෙම තෙමේ පෙර කසුප් බුදුරජුන් දවස ශ්‍රෙෂ්ඨ මල්ලවයෙක්ව ඉපද රන්කම් කළ පතාකා දෙකක් බුදුරජුන්ගේ ධාතු වඩා කළ රන් සෑයකට පුද "නෑ සියලේ නෑ ගෑණුන් හැර සෙසු ගෑණු මා දැක මා කෙරෙහි ඇලෙත්වා''යි පැතී ය. මේ මොහු පෙර කළ කර්මය යි. ඒ පැතුම් බලයෙන් උපනුපන් තැන්හි ඔහු දුටු පරඹුවෝ ඔහු හා කාමසංසර්ගයෙන් නො බැඳී සිටින්නට, සිටි සේ සිටින්නට නො පිළිවන් වූහ.

**ඛෙම වස්තුව නිමි.**

1. 14 6. 'දුක්ඛසමුප්පාදං' යනු බලනු.

# ඇවැත් මැඩ විසූ මහණෙක්

## 22 — 5

**එක්** උපසපන් මහණෙක් නො දැන තණගසක් බිඳ දැමූයෙ පසු ව කුකුස් උපදවා අන් උපසපන් මහණක්හු වෙත ගොස් "යමෙක් නො දැන තණගසක් බිඳ දැමී නම්, එයට කි නම් වරදෙක් සිදු වේ දැ"යි අසා තමා නො දැන ගසක් සිඳ දැමූ බව දන්වා සිටියේ ය. එවිට ඒ මහණ 'තමුන්නාන්සේ තණගසක් සිඳලීමෙන් කුමක් සිදු වේය යි සිතූ වහු ද? මෙහි දෙසා ගන්නට තරම් වරදෙක් නැතැ"යි විචාළ මහණහුට කියා තෙමේත් දැතින් තණ දෙමිටක් කඩා ගත්තේ ය. සෙසු මහණෝ එපුවත බුදුරජුන්ට දන්වාලූහ. එවිට උන්වහන්සේ ඒ මහණහුට නොයෙක් ලෙසින් ගරහා මේ ධර්‍ම දෙශනාව කළ සේක.

**කුසො යථා දුග්ගහිතො හත්ථමෙවානු කන්තති,**
**සාමඤ්ඤං දුප්පරාමට්ඨං නිරයාය උපකඩ්ඪති.**

**යං කිඤ්චි සිථිලං කම්මං සඞ්කිලිට්ඨඤ්ච යං වතං,**
**සඞ්කස්සරං බ්‍රහ්මචරියං න තං හොති මහප්ඵලං.**

**කයිරං චෙ කයිරාථෙනං දළ්හමෙනං පරක්කමෙ,**
**සිථිලො හි පරිබ්බාජො භිය්‍යො ආකිරතෙ රජං.**

වැරදි ලෙසට අතට ගත් කුසතණ පත යම් සේ අත ම කපා ද, එමෙන් වරදවා ගත් මහණකම (ඒ මහණකම් කළ පුද්ගලයා) නිරයට ඇද දමන්නේ ය.

ලිහිල් කොට කරණ ලද යම් කුශල කර්‍මයෙක් වේ ද, සකිලිටි වූ යම් ව්‍රතයෙක් වේ ද, සැකයෙන් හැසිරිය යුතු වූ යම් බඹසරෙක් වේ ද ඒ සියල්ල මහත්ඵල නො වේ.

ඉදින් යම් කුශල කර්‍මයක් කරන්නේ නම් (එය හොඳින් ම) කරන්නේ ය. ඒ කුශල කර්‍මය තර කොට ම කරන්නේ ය. යම්හෙයකින් සිපිල වූ මහණකම බොහෝ සෙයින් රාගාදිරජස් වගුරුවා ද එහෙයිනි.

**කුසො** = කුසතණපත.

සියුම් මුවහත් ඇති කිසි තණපතෙක් **'කුස'** යි ගණු ලැබේ. තල්පතක් හෝ ගත වරද නැත. **"යං කිඤ්චි තිඛිණධාරං තිණං, අන්තමසො තාලපණ්ණම්පි"** යනු අටුවා.

**දුග්ගහිතො** = වැරදි ලෙසට අතට ගන්නා ලද්දේ.

**ගඤ්ඣං එව අනුඛනන්ති** = අත ම කපා හරී ද.

**ගඤ්ඣ** නම්: එක් ශරීරාවයවයෙකි. යමකින් ගණී නම් ඒ 'ගඤ්ඣ' යි කියනු ලැබේ. **"ඝරන්ති අනෙනාංති = ගඤ්ඣං"** යනු විවෘතියි. කමේන්ද්‍රියයෙකි.

**සාමඤ්ඤං** = ශ්‍රමණභාවය. මහණකම.

ශික්‍ෂාත්‍රය සංගෘහිත ශාසන ධර්මයට මුල් වනුයේ ශීලවිසුද්ධිය බැවින් මෙහිලා ශීලවිශුද්ධිය, ශීලවිපත්ති ආදියට නො හසු කොට රක්නා ශීලය **'සාමඤ්ඤ'** යි කියනු ලැබේ. මේ මහණකම දිවි නො තකා මැනැවින් රැකියේ ම ප්‍රධාන විසින් ගැණෙන මාර්ග-ඵල සඞ්ඛ්‍යාත ශ්‍රමණ භාවයට පැමිණීමෙන් දුක් කෙළවර කරන්-නේ ය[1].

**දුප්පරාමට්ඨං** = වරදවා ගන්නාලද වැරදි ලෙසින් රැකි.

සීලවිපත්ති – ආචාරවිපත්ති -- දිට්ඨිවිපත්ති – ආජීවවිපත්ති යන විපත්තීන්ගෙන් විපතට පත් ශීලය, ශ්‍රමණභාවය **'දුප්පරාමට්ඨ'** නම් වේ.

සීලවිපත්ති නම්:– උපසපත් භික්‍ෂූන් විසින් දිවි හැර රැකිය යුතු වූ ප්‍රථම – ද්විතීය ආපත්තිස්කන්ධ දෙක්හි වූ සිකපද මැඩ ඇවැතුනට පැමිණීම ය. **"පඨමං ති ද්වෙ ආපත්තික්ඛන්ධං සීල-විපත්ති නාම"** මෙය මෙහි අදහස් කරණ ලද ය. උවසු උවැසි හෙරණ හෙරණීන් විසින් නො කටයුතුය යි වදාළ, එහිලා දක් වූ සිකපද මැඩීම ද සීලවිපත්ති යි.

ආචාරවිපත්ති නම්:– කායවාක් දුශ්චරිතයන්හි යෙදීම ය. ඉතිරි ආපත්තිස්කන්ධ පසෙහි වූ සිකපද නො රැකුම ය. **"අවසෙසං පඤ්ච ආපත්තික්ඛන්ධං ආචාරවිපත්ති නාම"**. කවුරුන්ගේ හෝ නො මනා හැසිරීම ආචාරවිපත්ති යි.

දිට්ඨිවිපත්ති නම්:– **"රූපං අත්තතො සමනුපස්සති"** යනාදි විසින්, **"නත්ථි දින්නං"** යනාදි විසින් හා **"සස්සතො ලොකො ඉදමෙව සච්චං මොඝමඤ්ඤං"** යනාදී විසින් ආ දෘෂ්ටිය යි. **"රූපං අත්තතො සමනුපස්සතීති ආදිනයප්පවත්තා දිට්ඨි ච, නත්ථි දින්නන්ති ආදිනයප්පවත්තා දිට්ඨි ච, සස්සතො ලොකො ඉදමෙව සච්චං මොඝමඤ්ඤන්ති ආදිනයප්පවත්තා දිට්ඨි ච දිට්ඨිවිපත්ති නාම"**.

---

1. 1. 14. 'සාමඤ්ඤස්ස' යනු බලනු.

ආජීවවිපත්ති නම්:– ආජීවය හේතු කොට පැණ වූ සික‍පද ඉක්මවා යෑම ය. **"ආජීවහෙතු පඤ්ඤත්තානි ඡ සික්ඛාපදානි ආජීවවිපත්ති නාම".** සාමාන්‍ය විසින් වැරදි දිවිපෙවෙත ආචාර විපත්ති යි.

**නිරයාය උපකඩ්ඪන්ති** = නිරයට අදනේ ය. නරකයෙහි උපද-වන්නේ ය.

වැරදි හැටියට අතට ගත්, සියුම් මුවහත් ඇති කුසතණපත අතට ගත්තහුගේ අත කපන්නා සේ, වැරදිලෙසින් රැකි මහණ කම ද වැරදිලෙසින් රැකි මහණකමින් මහණැයි කියා ගන්නා මහණහු නිරයට ඇද දමන්නේ ය. ඒ නො වැළකිය හැකි ය.

**යං කිඤ්චි සිථිලං කම්මං** = ලිහිල් කොට කළ යම් කුශල කර්මයෙක් වේ ද.

"දෙම් ද, නො දෙම් ද, කෙරෙම් ද, නො කෙරෙම් ද" යි පසු බැස බැස සිත සිතා කරණ දානාදිකුශල කර්ම, **ලිහිල් කොට කරණ ලද කුශලකර්ම** යි ගැණේ.[1]

**සඞ්කිලිට්ඨං ච යං වතං** = සකිලිටි වූ යම් ව්‍රතයෙක් වේ ද.

ශීලව්‍රත – ධුතාඞ්ගව්‍රත විසින් ව්‍රත ය දෙපරිදි ය. එහි ශීලව්‍රතය වෙසඟනන් වසන තැන්, මළසැමියන් හෝ නොරට ගිය සැමියන් ඇති ගෑණුන් වසන තැන්, දීග නො ගොස් ගෙයි ම මහලු ව ඉන්නා ගෑණුන් වසන තැන්, නපුංසකයන් වසන තැන්, මෙහෙණන් වසන තැන් යන නො එළැඹිය යුතු තන්හි හැසිරීමෙන් ශීලව්‍රතය කිලිටි වන්නේ ය.

ධුතාඞ්ගව්‍රතය කිලිටි වනුයේ "මේ නිසා ලොකයා මට සැලකීම් දක්වන්නේ ය"යි ලාභාශාවෙන් ආරණ්‍යකාදී වූ ධුතාඞ්ග රැකීමෙනි[2].

**සඞ්කස්සරං බ්‍රහ්මචරියං** = සැකයෙන් හැසිරිය යුතු වූ යම් බඹසරෙක් වේ ද.

පොහෝ පවුරුණු ආදී වූ සඞ්ඝකර්ම කරන්නට රැස් වූ භික්ෂු සඞ්ඝයා දැක "**ඒකාන්තයෙන් මොවුහු** මාගේ හැසිරීම දැක සඞ පිරිසෙන් බැහැර කරණු පිණිස උත්ක්ෂෙපණීය කර්මය කරන්නට රැස්වූවාහු වෙති"යි මෙසේ තමා විසින් ශඞ්කායෙන් යුක්තව හැසිරිය යුතු හෙයින් හෝ යම් කිසිවක්හු විසින් විහාරයෙහි කරණ

1. 12. 16. 'දතං' යනු බලනු.
2. 1. 14. 'අනුධම්මචාරී' " "

ලද අනාචාරයක් දක "මේ අනාචාරය අසවල් මහණහු විසින් කරණ ලද්දේ වනැ" යි අනුන් විසින් සැකයෙන් සිහි කටයුතු පැවැතුම් ඇතිහෙයින් හෝ සැකයෙන් හැසිරිය යුතු වූ මහණකම **'සඞ්කස්සර බ්‍රහ්මචරිය'** නම්. මෙහි වූ **'සාමඤ්ඤං, බ්‍රහ්මචරියං'** යන දෙපදයෙන් ම කියැ වෙනුයේ මහණකම ය[1].

**න තං හොති මහප්ඵලං** = ඒ සියල්ල මහත්ඵල නො වේ.

සිථිල කොට කළ කුශලකර්මය, සකිලිටි වූ ව්‍රතය, සැකයෙන් හැසිරිය යුතු වූ විනය දහමට නො සරුප් වූ ශ්‍රමණභාවය යන මේ සියල්ල ප්‍රතිසන්ධි ප්‍රවෘත්ති විපාක විසින් මහත්ඵල ඇත්තේ නො වේ. එ හෙයින් ම ඔවුන් සගත්නත්හට ද ඵලයෙක් නො වන්නේය.

**කයිරා චෙ කයිරාථෙනං** = ඉදින් (කුශල කර්මයක්) කරන්නේ නම් එය (මනාකොට ම) කරන්නේ ය.

**දළ්හං එනං පරක්කමෙ** = එය තර කොට ම කරන්නේ ය.

**සිථිලො හි පරිබ්බාජො** = යම් හෙයකින් බණ්ඩාදිභාවයට ගිය මහණකම[1].

**භිය්‍යො ආකිරතෙ රජං** = බොහෝ කොට රාගාදිරජස් වගුරුවාද (එහෙයිනි)

යම්කිසි කර්මයක් කරන්නහු විසින් ඒ කර්මය කිසිත් හෙතුවකින් නො පසු බැසම නො නැවතීම දැඩිව ගෙණ මනාකොට ම කළ යුතු ය. අතරතුර ඇවැත්වලට පැමිණීම් ඈ විසින් නො මනාකොට කරණලද මහණකම සිත්තුළ පවත්නා රාගාදී වූ රජස් කෙලෙස් බැහැර කිරීමෙහි අපොහොසත් වේ. එබඳු මහණකම ඔහු මතුයෙහි තව තවත් අන්‍ය වූත් කෙලෙස් රජස් වගුරු වන්නේය.

ධර්මදෙශනාවගේ අවසානයෙහි බොහෝ දෙන සෝවන් පලාදියට පැමිණියාහු ය. ඒ මහණ ද ආයතිසංවරයෙහි පිහිටා පසුව විදර්ශනා භාවනා වඩා රහත්බවට පැමිණියේ ය.

**දුර්වචභික්ෂුවස්තුව නිමි.**

---

1. 11. 9. 'අරිත්වා බ්‍රහ්මචරියං' ,, ,,
2. 3. 14. 'ගිහි පබ්බජිතා' ,, ,,

# දාසියට කළ අපරාධය

## 22 — 6

සිය සැමියා ගෙයි වසන දාසිය අඹු කොට හැසිරෙණු දුටු එක්-තරා ගැණියක් ක්‍රෝධයෙන් නැගී ගියා ඒ දාසිය අල්ලා ගෙණ ඇයගේ අතපය බැඳ කන් නාස් කපා ගෙට පැමිණියවුනට නො ද පෙණෙන අයුරු ගබෙක දමා දොර වසා තමා කළ ඒ සැහැසිකම වසා ගන්නට "හිමි! බණ අසන්නට විහාරයට යමු"යි හිමියාත් ගෙණ විහාරයට ගොස් බණ පිරිස් මැදට වැද හුන්නී ය. ඒ වේලෙහි ඇයගේ නෑයෙක් එහි පැමිණියේ ගෙයි කිසිවකුත් නො දැක වසා තුබූ දොර ඇර බැලී ය. එහි දී දාසියට කරණ ලද ඒ අපරාධ දුටු ඔහු අතපය ලිහා ඇය එයින් මුදා හැරියේ ය. ඕ ද බැඳුමෙන් මිදුනී ඉතා අපහසුවෙන් දුක්වෙදනායෙන් පෙළෙමින් විහාරයට ගොස් බණ පිරිස මැදට වැද එපුවත බුදුරජාණන් වහන්සේට දන්වා සිටියා ය. බුදුරජාණන් වහන්සේ දාසියගේ කීම අසා "මා කළ මේ දුශ්චරිතය, අපරාධය අන්‍යයෝ නො දනිති යි සවල්පමාත්‍ර වූ ද දුශ්චරිතයෙක් නම් නො කටයුතු ය, අනුන් නො දනිතත් අනුන්ගේ දැනුම ගැණ නො සලකා කළ යුත්තේ සුචරිතයෙක් ම ය, දුශ්චරිතය සඟවා කරණ ලද්දේ නමුත් පසු ව දව ර දෙක්හි සිහියට නැග දුශ්චරිතය කළහුගේ සිත තවන්නේ ය, පෙළන්නේ ය, කළ සුචරිතය ඉතා කුඩා වුව ද එයින් උපදනේ සතුටෙක් ම ය"යි වදාරා මේ ධර්මදෙශනාව කළ සේක.

**අකතං දුක්කතං සෙය්‍යො පච්ඡා තපති දුක්කතං,**
**කතඤ්ච සුකතං සෙය්‍යො යං කත්වා නානුතප්පතීති.**

අකුශලය නො කරණ ලද්දේ උතුම් ය. අකුශලය පසුව (කළහුගේ සිත) තවයි. යමක් කොට පසුව නො තැවේ ද, එබඳු කුශලය කරණ ලද්දේ ම උතුම් වේ.

**අකතං දුක්කතං සෙය්‍යො** = අකුශලය නො කරණ ලද්දේ උතුම් ය. නො කළ අකුශලය උතුම් ය.

අපායයෙහි ඉපැත්මට කරුණු වන කුදු මහත් පව්කම්, වරද සහිත ක්‍රියා **'දුක්කත'** නම්. පව්කම් සතුන් මැරීම් ඈ විසින් නත් වැදෑරුම්ය.[1]

**පච්ඡා තපති දුක්කතං** = අකුශලය පසුව සිත තවන්නේ ය.

---

1. 1. 10. 'පාපකාරී' යනු බලනු.

යමෙක් මොන හෙතුවෙකින් හෝ අකුශලයක් වැරදි වැඩක් කෙළේ නම් එය සිහිවත් ම ඒ පාපකාරී පුද්ගලයා නිතර තැවෙත්-තේ ය. නිතර දැවෙත්තේ ය.[1]

**කතඤ්ච සුකතං සෙය්‍යො** = කුශලය කරණ ලද්දේ ම උතුම් ය.

**යං කත්වා න අනුතප්පති** = යමක් කොට නො පසු තැවේ ද.

යමක් කොට පසුතැවිල්ලට නො ද පැමිණේ නම් එබඳු වූ සුගතිගතියෙහි ඉපැත්මට කරණු වන කුදුමහත් පින්කම්, වැරදි නැති ක්‍රියා '**සුකත**' නම්. සතුන් මැරීම් ආ පව්කමින් වැළකීමෙන් හා දන්පින් කිරීමෙන් දිවි ගෙවන්නහුට කවදාවත් කොතැන දීත් තැවීමෙක් දැවීමෙක් නො වන්නේ ය. ඒ කළ පින්කම් සිහිවත් ම සතුටින් පිණා යන්නේ ය. එලොව මෙලොව දෙක්හි ම සතුටු වන්නේ ය. එහෙයින් පින්කම් කිරීම උතුම් වේ.[2]

මෙහි '**තපති**' යන ක්‍රියාපදය '**අනු**' යන්නකින් වැඩී ඇත්තේ ය. එකල්හි '**අනුතපති**' යි එක් ම ක්‍රියාවෙක් වේ. ඒ හා **න** යනු ද එක් කොට 'නො තැවේ'යි අරුත් කියන්නේ ය. '**න**' යනු නිපාතයි. වැළකීමෙහි වේ. '**අනු**' යනු උපසර්ගයි. 'පසු' යනු අරුත්හි වේ. 'න අනුතපති' යන්නට 'නො පසු තැවේ'යි අරුත් දෙනුයේ එහෙයිනි.

ධර්මදෙශනාවගේ අවසානයෙහි ඒ උපාසකයාත් ඒ ගැණීත් දෙදෙන ම සෝවන්පලයට පැමිණියාහු ය. දුස්ස ද දුසභාවයෙන් මුදා ධර්මයෙහි හැසිරෙන්නියක කළහ.

**ඊර්ෂ්‍යායෙන් මැඩුනු ස්ත්‍රියගේ කථාවස්තුව නිමි.**

---

1. 1. 13. 'උභයත්ථ තප්පති' ,, ,,
2. 1. 13. 'භිය්‍යො නන්දති සුග්ගතිං ගතො' ,, ,,

# ආගන්තුක භික්ෂූහු

## 22 — 7

බොහෝ ගණනක් ආගන්තුක භික්ෂූහු පිටිසර ගමෙක වස් එළැඹ එහි මුල් මසැ සුවසේ විසූහ. දෙවන මසැ සොරු අවුත් ඔවුන්ගේ ගොදුරුගම පැහැර ගම් වැසි මිනිසුන් බොහෝ ගණනක් බලාත්කාරයෙන් බැඳගෙණ ගියහ. සෙසු මිනිස්සු එතැන් පටන් එහි සොරුන්ගේ පැමිණීම වළකාලනු පිණිස එගම දෙර පවුරු අටලු ආදියෙන් සකස් කරන්නාහු භික්ෂූන්ට සුදුසු පරිදි මැනැවින් උපස්ථාන කරන්නට ඉඩකඩ නො ලැබූහ. භික්ෂූහු ද අපහසුවෙන් වස් කාලය ගෙවා වස් හමාර කොට බුදුරජුන් දැකීමට සැවැත් නුවර ජේතවනාරාමයට ගොස් බුදුරජුන් වැඳ එකත් පස්හි හුන්හ. එකල්හි බුදුරජාණන් වහන්සේ ඔවුන් හා කළ පිළිසඳර කතා ඇති සේක් "මහණෙනි! කොහොම ද, සුවසේ විසූහුද?" යි අසා වදාළ සේක. "ස්වාමීනි! වස් තෙමසින් පළමු මස, නම් සුවසේ විසූම්හ, දෙවන මසැ සොරු අවුත් ගම පැහැර ගෙණ ගියහ, එතැන් පටන් එහි ඉතිරි ටික දෙන ගම රැකුම්හි යෙදුනාහු අපට උපස්ථාන කිරීමට ඉඩ කඩ නො ලැබූහ, එහෙයින් එතැන් සිට තරමක අපහසුවෙන් අපි කල් ගෙවූම්හ" යි ඒ භික්ෂූන් දක්වා සිටි කල්හි "මහණෙනි! එය ලොකුවට සැලකිය යුත්තෙක් නො වේ, පහසුවෙන් සැපයෙන් හැමදා වසන්නට කාටත් නො ලැබෙන්නේ ය, මහණෙනි! ඒ මිනිස්සු යම්සේ ගම රැක ගැණීමෙහි යෙදුනාහු ද, එපරිද්දෙන් මහණනු විසිනුදු ආත්මභාවය රැක ගන්නට වටී ය" යි වදාරා මේ ධර්මදේශනාව කළ සේක.

**නගරං යථා පච්චන්තං ගුත්තං සන්තරබාහිරං,**
**එවං ගොපෙථ අත්තානං ඛණො වෙ මා උපච්චගා,**
**ඛණාතීතා හි සොචන්ති නිරයම්හි සමප්පිතා'ති.**

පසල්හි පිහිටි නුවරෙක් ඇතුළත පිටත සහිතව රක්නා ලද්දේ යම්සේ වේ ද එසේ තමා රකිවු. යම්හෙයකින් ක්‍ෂණසම්පත් ඉක්මවා ගියාහු නරකයෙහි උපන්නාහු ශොක කෙරෙත් ද එහෙයින් ක්‍ෂණය තෙමේ එකාන්තයෙන් (තොප) ඉක්ම නො යේවා.

**නගරං** = නුවරෙක්.[1]

**පච්චන්තං** = රට කෙළවර පිහිටි. පිටිසර.

1. 11. 5. 'අට්ඨීනං නගරං' යනු බලනු.

හැදුනු වැඩුනු හොඳ සිරිත් විරිත් නැති මෙලච්ඡයන් වසන දෙශය **'පච්චන්ත'** නමි. මැදුම් දෙසින් පිටත්හි වූ දෙශය යි. **"විසිට්ඨාචාරරහිතා මිලක්ඛදෙසා, මජ්ඣිමදෙසස්ස බහිද්ධා-භාගෙ ජාතො"** යනු කොෂයි.

**ගුත්තං** = රක්නාලද.

**සන්තරබාහිරං** = ඇතුළත පිටත සහිතව.

**එවං ගොපෙථ අත්තානං** = එසේ තමා (සිත) රකිවු.

'සොරුන්ට ඇතුල් වන්නට නො හැකි සේ දොරටු පවුරු ඈ තර කිරීමෙන් ඇතුළත හා දොරටු අටලු පදනම් අගල් ඈ තර කිරීමෙන් පිටත හා රක්නාලද නුවරක් සේ ආධ්‍යාත්මිකායතනැයි කියූ චක්ෂුරාදී වූ සදොරට අරමුණු වන බාහිරායතනැ යි කියූ රූපාදී සාරම්මණෙහි රාගාදී කෙලෙසුනට උපදනට ඉඩ නො තබා සිහියෙන් යුක්ත ව මෙසෙමින් තමාගේ සිත රැක ගණිවු, යනු මේ වදාළ සේ ය. මේ මෙය අට්ඨුවායෙහි කී සැටි:– **"යථා භික්ඛවෙ! තෙහි මනුස්සෙහි තං පච්චන්තනගරං ද්වාරපාකාරාදීනි ථිරානි කරොන්තෙහි සන්තරං, ද්වාරට්ටාලඋද්ධුමපරිඛාදීනි ථිරානි කරොන්තෙහි සබාහිරං සුගුත්තං කතං, එවං තුම්හෙපි සතිං උපට්ඨපෙත්වා අජ්ඣත්තිකානි ඡද්වාරානි පිදහිත්වා ද්වාරරක්ඛිතං සතිං අවිස්සජ්ජෙත්වා යථා ගය්හමානානි බාහිරානි ඡ ආයතනානි අජ්ඣත්තිකානං උපඝාතාය සංවත්තන්ති, තථා අගහිතානිපි ථිරානි කත්වා තෙසං අප්පවෙසාය ද්වාරරක්ඛිතං සතිං අප්පහාය විචරන්තා අත්තානං ගොපෙථ"**යි.

මෙහි ප්‍රධාන විසින් **"සො චක්ඛුනා රූපං දිස්වා න නිමිත්තග්ගාහී හොති නානුබ්‍යඤ්ජනග්ගාහී, යත්වාධිකරණමෙනං චක්ඛුන්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣා දොමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං, තස්ස සංවරාය පටිපජ්ජති රක්ඛති චක්ඛුන්ද්‍රියං, චක්ඛුන්ද්‍රියෙ සංවරං ආපජ්ජති, සොතෙන සද්දං සුත්වා – ඝානෙන ගන්ධං ඝායිත්වා ජිව්හාය රසං සායිත්වා – කායෙන ඵොට්ඨබ්බං ඵුසිත්වා – මනසා ධම්මං විඤ්ඤාය න නිමිත්තග්ගාහී හොති නානුබ්‍යඤ්ජනග්ගාහී – මනින්ද්‍රියෙ සංවරං ආපජ්ජති"** යි වදාළ ඉන්ද්‍රියසංවරය ගැණේ.

**ඛණො වෙ මා උපච්චගා** = ක්ෂණය තෙමේ එකාන්තයෙන් (තොප) ඉක්ම නො යේවා.

**ඛණාතීතා හි සොචන්ති නිරයම්හි සමප්පිතා** = යම් හෙයකින් ක්ෂණසම්පත් ඉක්මවා ගියාහු නරකයෙහි උපන්නාහු ශොක කෙරෙත් ද, එහෙයිනි.

යමෙක් මෙසේ ආධ්‍යාත්මිකායතනැ යි කියූ චක්ෂුරාදී වූ සදෙරට අරමුණු වන බාහිරායතනැ යි කියූ රූපාදි වූ සාරමුණෙහි රාගද්වෙෂමොහාදී වූ කෙලෙසුනට ඉපදීමට කිසි ලෙසකින් ඉඩ නො තබා සිහියෙන් යුක්තව වෙසෙමින් තම සිත නො රකී නම් බුද්ධොත්පාද කාලය, මද්‍ධ්‍යදෙශයෙහි උත්පත්තිය, සම්‍යග්දෘෂ්ටිය, චක්ෂුරාදී වූ ඉඳුරන්ගේ නො විකල බව යනාදී වූ මේ සියලු දුර්ලභක්ෂණයෝ ඔහු ඉක්මවා යත්. මෙ කියූ ක්ෂණ ඉක්ම වූවෝ යම් හෙයකින් අපායයෙහි ඉපිද බොහෝ කලක් ශෝක කෙරෙත් ද එහෙයින් අෂ්ට දුෂ්ටක්ෂණයෙන් මිදී දුකසේ ලත් මේ බුද්ධොත්පාද-කාලය තොප නොඉක්ම යේවා. දාන – ශීල – භාවනාදීන්ගේ වශයෙන් ප්‍රතිපත්ති පුරා තොප විසින් මේ බුද්ධොත්පාදකාලයෙන් ප්‍රයොජන ගතයුතුය.[1]

ධම්දෙශනාවගේ අවසානයෙහි ඒ භික්ෂූහු උපන් සංවෙග ඇත්තාහු රහත් බැව්හි පිහිටියාහු ය.

**ආගන්තුකභික්ෂුවස්තුව නිමි.**

1. 4. 8. 'එවං ජානාහ මවෙච' යනු බලනු.

# පසුපස නො වැසූ නිගණ්ඨයෝ

## 22 — 8

**දවසක්** භික්ෂූන් වහන්සේලා නිගණ්ඨයන් දැක "ඇවැත්නි! මේ නිගණ්ඨයෝ පසුපස නො වැසූවෝ ද ඉදිරිපස වසා සිටුනා බැවින් නූලක් පමණකුත් ඇඟ නැති ව ඇවිදුනා මුළුමනින් නිරුවත් වූ අචේලකයනට වඩා ඉතා හොඳ ය, මොවුහු ලජ්ජා ඇතියහ'යි සිතම්හ"යි කතාවක් ඉපද වූහ. භික්ෂූන් කළ මේ කතාව ඇසූ නිගණ්ඨයෝ "අපි සිරුරු අවයව වසන්නට රෙදි නො අඳින්නෙමු, ලජ්ජාව නිසා රෙදි අඳින්නමෝ නො වම්හ, වැලි පස් දූලි ආදීහු ද පණැති සත්වයෝ ය, අප මෙන් දිවි ගලවන්නෝ ම ය, එහෙයින් ඔවුහු තුමූ අපගේ කෑම බඳුන්හි වැටෙනු වළක්වා කෑම බඳුන් රක්නා පිණිස ඉදිරිපස රෙදි කඩින් වසා ගනිමු"යි කියා ඔවුන් හා වාද විවාද වශයෙන් බොහෝ සේ කතා කළහ.

එකල්හි භික්ෂූන් වහන්සේලා බුදුරජුන් වෙත ගොස් පසෙක හිඳ මේ ප්‍රවෘත්තිය දන්වාලූහ. බුදුරජාණන් වහන්සේ "මහණෙනි! ලජ්ජා නො ඉපදවිය යුතු තැන ලජ්ජා උපදවා, ලජ්ජා ඉපදවිය යුතු තැන ලජ්ජා නො උපද වන්නෝ සිවු අපාය පිහිට කොට ඇති මිථ්‍යාග්‍රාහ ඇත්තාහු ම ය"යි වදාරණ සේක් මේ ධර්මදේශනාව කළ සේක:

> **අලජ්ජිතායෙ ලජ්ජන්ති ලජ්ජිතායෙ න ලජ්ජරෙ,**
> **මිච්ඡාදිට්ඨිසමාදානා සත්තා ගච්ඡන්ති දුග්ගතිං.**
>
> **අභයෙ භයදස්සිනො භයෙ චාභයදස්සිනො,**
> **මිච්ඡාදිට්ඨිසමාදානා සත්තා ගච්ඡන්ති දුග්ගතිං.**

ලජ්ජා නො කටයුත්තෙහි යම් කෙනෙක් ලජ්ජිත වෙත් ද, ලජ්ජා කටයුත්තෙහි ලජ්ජිත නො වෙත් ද, මිසදිටු දැඩි ව ගත් (ඒ) සත්වයෝ දුගතියට යන්නාහු ය.

බිය නො විය යුත්තෙහි බිය දක්නා සුලු වූ ද, බිය විය යුත්තෙහි බිය නො දක්නා සුලු වූ ද, මිසදිටු දැඩි ව ගත් (ඒ) සත්වයෝ දුගතියට යන්නාහු ය.

**අලජ්ජිතායෙ** = ලජ්ජා නො කටයුතු තන්හි.

පිඩු සිඟා ගන්නා, පිඩු වළඳන්නට ගන්නා බඳුන් ලජ්ජා නො කටයුතු තැන් ය. එබඳුන් කොතෙක් වේලාන් සඟවා තැබූ ව ද සිඟා යන්නට බත් කන්නට ඉදිරියට ගත යුතු බැවින් එබඳුන් ලජ්ජා කටයුතු තැන් නො වේ.

ඇතැම් නිගණ්ඨයෝ "වැලි පස් දූලි, දිවි ඇති සත්හු ය, ඉදින් බත් බුදින්නට ගන්නා බත් බඳුනෙහි ඔවුහු වැටුනාහු නම් දිවි ඇති සතුන් නැසුවා නම් වේ"යි බත් බඳුන් වසාගෙණ ඇවිදින්නෝ ය. එහෙත් පව් විසින් ගෙණ එය ලජ්ජිත වීමට තැනෙක් නො වේ.

**ලජ්ජනති** = ලජ්ජිත වෙත් ද, හටගත් ලජ්ජා ඇත්තෝ වෙත් ද.

**ලජ්ජිතාමයෙ** = ලජ්ජා කටයුතු තැන්හි.

ලජ්ජාව නසන තැන් ලජ්ජා කටයුතු තැන් ය. ප්‍රධාන විසින් ලජ්ජා කටයුතු තැන් සිරුර පිළිබඳ ය. එහි ද ප්‍රධාන වනුයේ ගැණු-පිරිමින්ගේ රහසඟ ය. එතැන් ඒකාන්තයෙන් ලජ්ජා කටයුතු තැන් ය. තව ද දෙකිසිළි – දෙ ඌර – දෙබාහු – දෙදන – ආතිසඳ යන මෙතැන්ද ලජ්ජා කටයුතු තැන්ය. ගැණුන් පිළිබඳ පියොවුරු ද ලජ්ජා කටයුතු තැනෙක. මෙසේ වතුදු මුළු සිරුර ම ලජ්ජා කටයුතු තැන සේ ගත යුතු ය.

**න ලජ්ජරෙ** = ලජ්ජිත නො වෙත් ද.

මෙ කියූ තැන් ලජ්ජා කටයුතු තැන් සේ මිනිසුන් මනා පැවතුම් ඇතියවුන් වූ ද සිට වනාවරයුගය ඉක්ම ගිය තැන් සිට සම්මත වුව ද ඇතැම් තීර්ථකයෝ "ලජ්ජා ස්ථාන වැසුහේ නම් අපගේ තපස් බිඳෙති"යි පාපයෙහි ලජ්ජායෙනැ යි කියා රහසඟ නො වසා ඇවිදින්නෝ ය.

මෙ දවස ද ලජ්ජාස්ථාන නො වැසීම තපසකැයි ගත් තීර්ථක යන් සේ 'තපසකැ'යි කියාත් නො ගෙණ රහසඟ ඈ ලජ්ජා කටයුතු තැන් රෙදි පිළියෙන් නො වසා ගැණුන් හා පිරිමින් උනුන් රාගයෙන් පොළොඹවා ගන්නට ලජ්ජා කටයුතු තැන් නො වසන, ලජ්ජා කටයුතු තැන් පෙන්වන නිරුවතින් ප්‍රසිද්ධස්ථානයන්හි දවස් ගෙවන ගැණු – පිරිමි වෙති යි පළට ව ඇත්තේ ය. ඒ එසේ නම් ඒ ගැණු – පිරිමි මිනිස් රුවින් පෙණී සිටිනා තිරිසන් ගියෝ ය. මිනිස්සු නො වෙත්. ඇතැම් කෙනෙක් සිතා ම ලජ්ජා ස්ථාන පෙණෙන සේ දුහුල් පිළියෙන් යන්තමකට සිරුර වසා ගණිත්. ධනයෙන්, කුලයෙන්, බලයෙන්, තනතුරෙන්, කොතරම් උසස් තැන් ගෙණ සිටියෝ ද මෙතැන්හි හටගත් ලජ්ජා නැත්තාහු නම් ඔවුහු හැම කෙනෙක් බලු-බළල්-ගෙරි-සරක්-එළු-බැටළු-කුකුළු-හූරු-වග-වලස් ඈ තිරිසන් ගියෝ ම ය. තිරිසන්හුම ය.

**මිච්ඡාදිට්ඨිසමාදානා** = මිසදිටු දූෂි ව ගත්.

ලජ්ජා නො කටයුතු තැන් ලජ්ජා කටයුතු තැන් කොට, ලජ්ජා කටයුතු තැන් ලජ්ජා නො කටයුතු තැන් කොට ගැණීම මිථ්‍යාදෘෂ්ටිය යි. එසේ ගන්නෝ '**මිච්ඡාදිට්ඨිසමාදානා**' නම්. "තෙන

**තෙසං අලජ්ජිතබ්බෙන ලජ්ජිතං ලජ්ජිතබ්බෙන අලජ්ජිතං තුච්ඡ ගහණභාවෙන චෙව අසුද්ධඨ්ගහණභාවෙන ච මිච්ඡාදිට්ඨී හොති තං සමාදිසිත්වා පන විචරනතා තෙ මිච්ඡාදිට්ඨිසමාදානා''** යනු අටුවා.

**සත්තා ගච්ඡන්ති දුග්ගතිං** = සත්වයෝ දුගතියට යත්නාහ.[1]

රූප-ශබ්ද-ගන්ධ-රස-ස්ප්‍රෂ්ටව්‍ය යන පංචකාමයෙහි ඇලී ගත්තෝ **'සත්ත'** නම්. මොවුහු මිච්ඡාදිට්ඨිසමාදාන හෙතුවෙන් අපායයට යත්තෝ ය. නිච්ඡන්දරාගීහු ද රූඪී විසින් සත්ත යි කියනු ලැබෙත්.

**අභයෙ භයදස්සිනො ච** = නො බියවිය යුත්තෙහි බිය දක්නා සුලු වූ ද.

ආහාරභාජනය නිසා රාග - දෙස - මොහ - දිට්ඨි - කිලෙස - දුච්චරිත - භය කිසිවකුත් නො ද උපදනා බැවින් ආහාරභාජනය **'අභය'** නම්. එහෙත් ආජීවකයෝ රජස් නම් වූ ප්‍රාණීහු අහර-බඳුනෙහි වැටුනෝ නම් අපි සතුන් නැසුවෝ වම්හ'' යි අහරබඳුන් වසා ගෙණ ඇවිදිත්. ඔවුහු එසේ අහරබඳුන් බිය විය යුතු තැන් කොට ගත්හ. එහෙයින් එබන්දෙ **'අභයෙ භයදස්සී'** නම් වෙත්.

**භයෙ ච අභයදස්සිනො** = බිය විය යුත්තෙහි බිය නො දක්නා සුලු වූ ද.

රහසඟ ඈ නිසා රාගාදීන් උපදනා බැවින් රහසඟ **'භය'** නම්. එහෙත් ආජීවකයෝ රහසඟ වැසිය යුතු බිය විය යුතු තැනක් කොට නො ගණිත්. ''ලජ්ජා විය යුතු තැන් ඉදින් වැසුවෝ නම් අපගේ තපස් බිඳී යත්තේ ය''යි බියෙන් එතැන් නො වසා අවිදුනාහ. එහෙයින් එබන්දෙ **'භයෙ ච අභයදස්සී'** නම් වෙත්.

**මිච්ඡාදිට්ඨිසමාදානා** = මිසදිටු දැඩි ව ගත්.

මෙසේ නො බිය විය යුතු තැන්, බිය විය යුතු තැන් කොට බිය විය යුතු තැන්, නො බිය විය යුතු තැන් කොට ගැණීම මිථ්‍යා දෘෂ්ටිය යි. එසේ ගත්තෝ **'මිච්ඡාදිට්ඨිසමාදාන'** නම් වෙත්.

**සත්තා ගච්ඡන්ති දුග්ගතිං** = සත්වයෝ දුගතියට යත්නාහ.

මෙසේ මේ මිසදිටු ගත් අඥනසත්වයෝ මරණින් මතු අපාය යෙහි උපදිත්නාහ.

මේ ධම්දෙශනාව ඇසූ නිගණ්ඨයෝ ධම්දෙශනාවගේ අවසාන-යෙහි කලකිරුණු සිතැත්තාහු පැවිදි වූහ. පැමිණ සිටි පිරිසට ද ධම්දෙශනා තොමෝ වැඩ සහිත වූ ය.

**නිගණ්ඨ වස්තුව නිමි.**

---

1. 1. 12 'දුග්ගතිං' යනු බලනු.

# දෙව්රම්වෙහෙරට ගිය ළමයි

## 22 — 9

**අන්‍යතීර්ථක ශ්‍රාවකයෝ** තම තමන්ගේ පුත්‍රයන් සම්‍යග්දෘෂ්ටික උපාසකයන්ගේ පුත්‍රයන් සමග කෙළිසෙල්ලම් කරණවුන් දැක, ඔවුන් කෙළිසෙල්ලම් කොට ගෙවලට ආකල්හි ශ්‍රමණ ශාක්‍ය පුත්‍රයන් නො වඳින ලෙසටත් ඔවුන් වසන වෙහෙරට නො යන ලෙසටත් දිවුරවා ගත්හ. ඒ කුඩා දරුවෝ දවසක් දෙව්රම් වෙහෙර පිටත දොර කොටුව අසල සෙල්ලම් කරන්නෝ හටගත් පවස් ඇති ව සම්දිටු ගත් දරුවකුහට "මිත්‍රය! හටගත් පවස් ඇත්තමෝ ය, දෙව්රම් වෙහෙර පැන් පොකුණෙන් අපට බොන්නට පැන් ටිකක් ගෙණැවිත් දෙන්නැ" යි කියා එ දරු විහාරයට යැවූ හ. ඔහු විහාරයට ගොස් බුදුරජුන් දැක වැඳ තමන් ආ කාරණය උන්වහන්සේට දැන්වී ය. බුදුරජානන් වහන්සේ "දරු! ඔයා පැන් බී ගොස් පැන් බොන්නට එ දරුවන් මෙහි එවන්නැ" යි වදාළ සේක. සම්දිටුදරු පැන් බී ගොස් පැන් බොන්නට බලාපොරොත්තුවෙන් සිටි දරුවන් සියලු දෙනා විහාරයට පිටත් කර යැවී ය. ඔවුහු නො පැකිළ විහාරයට ගොස් පැන් බීහ. බුදුරජානන් වහන්සේ ඔවුන් කැඳවා ඔවුනට හැළපෙන වැටහෙන බණක් වදුරා නො සැලෙන සැදැහැතියන් කොට සරණ සිල්හි පිහිටුවා වදාළ සේක. ඔවුහු ගෙවලට ගොස් මෙ පුවත මවුපියන්ට දැන්වූහ. මවුපියෝ "අපගේ දරුවෝ මිසදිටු ගත්හ" යි දොම්නසට පැමිණ හඬා වැලපෙන්නට වූහ. එ දුටු අසල් වැසි නුවණැති මිතිස්සු උන්ගේ දොම්නස දුරලන්නට නොයෙක් ලෙසින් බණ කීහ. කරුණු කියා පෑහ. එයැසූ ඔවුහු "තම දරුවන් හැම දෙනා ශ්‍රමණ ගෞතමයාට භාර දෙමූ" යි නියම කොට ගෙණ නෑ සමූහයාත් කැටුව එවුන් විහාරයට කැඳවා ගෙණ ගියහ. එ වේලෙහි බුදුරජානන් වහන්සේ ඔවුන්ගේ අදහස් බලා ධර්‍ම දෙශනා කරණ සේක් මේ ධර්‍මදෙශනාව කළ සේක.

**අවජ්ජෙ වජ්ජමතිනො වජ්ජෙ චාවජ්ජදස්සිනො,**
**මිච්ඡාදිට්ඨිසමාදානා සත්තා ගච්ඡන්ති දුග්ගතිං.**

**වජ්ජං ච වජ්ජතො ඤත්වා අවජ්ජං ච අවජ්ජතො,**
**සම්මාදිට්ඨිසමාදානා සත්තා ගච්ඡන්ති සුග්ගතින්ති.**

නිවරද කරුණෙහි වරදැ යි අදහස් ඇති වරද කරුණෙහි නිවරදැ යි දැකුම් ඇති මිසදිටු සමාදන් ව ගත් සත්‍වයෝ දුගතියට යත්නාහ.

වරද වරද වශයෙන් ද, නිවරද නිවරද වශයෙන් ද, දැන සම්දිටු සමාදන් ව ගත් සත්‍වයෝ සුගතියට යත්නාහ.

**අවජ්ජෙ වජ්ජමතිනො** = නිවරද කරුණෙහි වරදය යි ගත් අදහස් ඇති.

අවජ්ජ නම්: මෙහි දශවස්තුකසම්‍යග්දෘෂ්ටිය හා එය ඉපදීමට කරුණු වූ ධර්මදෙශනාය.[1]

**වජ්ජෙ ච අවජ්ජදස්සිනො** = වරදෙහි නිවරදැ යි දැකුම් ඇති.

**වජ්ජ** නම්: දශවස්තුකමිථ්‍යාදෘෂ්ටිය හා එහි ඉපැත්මට කරුණු වූ ධර්මදෙශනාය[2]. මෙහිලා දසමිච්ඡත්තවත්හු ද ගැණේ. **මිච්ඡාදිට්ඨි – මිච්ඡාසඞ්කප්ප – මිච්ඡාවාචා – මිච්ඡාකම්මන්ත – මිච්ඡාආජීව – මිච්ඡාවායාම – මිච්ඡාසති – මිච්ඡාසමාධි – මිච්ඡාඤාණ – මිච්ඡාවිමුත්ති** යන මේය මිච්ඡත්තවත්හු. “මට හිතසුව එළවන්නෝ වන්නාහ”යි වන බලාපොරොත්තුව එසේ නො වීමෙන් ද අශුභාදීන්හි ශුභැ යි ගැස් විපරීත පැවැත්මෙන් ද උපදනා මිථ්‍යා ස්වභාව ඇත්තෝ ‘මිච්ඡත්ත’ යි කියනු ලැබෙත්.

**මිච්ඡාදිට්ඨිසමාදානා** = මිසදිටු සමාදන් ව ගත්.

නිවරද කියුම් කෙරුම් සිතුම් ආදිය වරදය යි ද, වරද කියුම් කෙරුම් සිතුම් ආදිය නිවරදය යි ද ගැණිම සාමාන්‍ය විසින් මිසදිටු යි කියනු ලැබේ. එය දැඩි ව අදහා ගත්තෝ මෙහි ‘**මිච්ඡාදිට්ඨි සමාදානා**’ නම්.

**සත්තා ගච්ඡන්ති දුග්ගතිං** = සත්වයෝ දුගතියට යන්නාහ.[3]

මිසදිටු ගත්තේ මරණින් පසු අපායයෙහි උපදනේ ය. එහි අවුරුදු දහස් ගණනක් මුළුල්ලෙහි නන්වැදෑරුම් වූ කටුක දුක් විඳුනේ ය. කවදා හෝ එයින් මිදී මිනිස් ව උපදනේ නම් මිසදිටු ඇත්තේ ම වේ. නියම මග නො දත්තේ එහිදී ද පව්කම් කොට නැවැත නැවැතත් අපායයෙහි ම උපදනේ ය. ඔහුට සසරදුකින් මිදීමෙක් නැත්තේ ම ය.

ආනන්තරියකර්මය කළහුට අපායයෙහි ඉපද දුක් විඳීමට නියමිත කාලයෙක් ඇත්තේ ය. එහෙත් නියත මිසදිටු ගත්තහුට එබිලා කාලසීමායෙක් නැත්තී ය. සසර දුකින් මිදීමෙක් ඔහුට නැත්තේ ය. සුගතිගතියෙක ඉපැත්මෙක් නො වන්නේ ය. කල්ප විනාශයෙහි දී ආපායික සත්වයෝ ද අපරාපරිය වේදනීය කර්මයන්ගේ වශයෙන් බඹලොව උපදනාහු ද නියත මිසදිටු ගත්තහුට

1. 14. 6. ‘අරියං අට්ඨංගිකං මග්ගං’ යනු බලනු.
2. 1. 7. ‘අනික්කසාවො’ ,, ,,
3. 1. 12. ‘දුග්ගතිං’ ,, ,,

කල්පවිනාශයෙහි ද එසේ බඹලොව ඉපැත්මෙක් නැත. හේ කල්ප විනාශයෙහි ලොව නැසෙන විට පිට සක්වළ උපදනේ ය. එ ද නැසෙත්, අහසැ එක් පෙදෙසෙක ඉපද කම් පරිදි දුක් විඳියි. **"මිච්ඡාදිට්ඨිකස්ස භික්ඛවෙ ද්වින්නං ගතීනං අඤ්ඤතරා ගති පාටිකඞ්ඛා නිරයො වා තිරච්ඡානයොනි වා'ති"** යනුත් **"නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි යං එවං මහාසාවජ්ජං, යථයිදං භික්ඛවෙ මිච්ඡාදිට්ඨි මිච්ඡාදිට්ඨිපරමානි භික්ඛවෙ වජ්ජානි"** යනුත් වදාළෝ මිසදිටුවෙහි ඇති බිහිසුණුබව දක්වීම සඳහා ය.

**වජ්ජං ච වජ්ජතො ඤත්වා අවජ්ජං ච අවජ්ජතො** = වරද වරද වශයෙන් ද නිවරද නිවරද වශයෙන් ද දැන.

දසවත්ථුකමිච්ඡාදිට්ඨි, එයට කරුණු වූ ධර්මදේශනා වරද වශයෙන් ද දසවත්ථුකසම්මාදිට්ඨි, එයට කරුණු වූ ධර්මදේශනා නිවරද වශයෙන් ද දැන ගෙණ අදහා ගැණීමෙන්.

**සම්මාදිට්ඨිසමාදානා** = සම්දිටු සමාදන් ව ගත්.

**සත්තා ගච්ඡන්ති සුගතිං** = සත්වයෝ සුගතියට යත්නාහ.[4]

ධර්මදේශනාවගේ අවසානයෙහි ඒ සියල්ලෝ ම තුන් සරණෙහි පිහිටා නැවැත නැවැතත් බණ අසන්නෝ සෝවන් පලයෙහි පිහිටියාහුය.

**නිර්ථශ්‍රාවකවස්තුව නිමි.**

සකලජන ධර්මාර්ථි සඞ්ග්‍රහාභිලාෂී **පණ්ඩිත** අම්බලම්ගොඩ **ධම්මකුසල** ස්ථවිරයන් කළ **සද්ධර්මසාගර නම් වූ ධර්මපදවර්ණනා**යෙහි නිරයවර්ගාත්මක ද්වාවිංශතිතම තරඞ්ගය නිමියේ ය.

4. 1. 13. 'සුගතිං' යනු බලනු

# නාගවර්ගය

# මාගන්දිය අල්ලස් දී කළ ගැහැට

## 23 — 1

අප්‍රමාදවග්ගයෙහි එන මාගන්දිය කථායෙහි කියූ පරිදි මාගන්දී තොමෝ කිසිවක් කර ගත නො හී ශ්‍රමණගෞතමයාහට කළ යුත්ත කරන්නෙ'මි යි නුවර වැස්සන්හට "ශ්‍රමණගෞතම නුවර තුළට වැද හැසිරෙණු දුටුවොත් ඔහු අල්ලා ඔහු ඉදිරියට ගොස් දාසිදාස්කම්කරුවන් හා එක් ව ඇණුම් බැණුම් කොට නුවරින් පන්නා හරිවු'යි අල්ලස් දුන්නී ය.

තුනුරුවන්හි නො පහන් අල්ලසට ගිජුවූ මිසදිටුවෝ නුවරට වන් බුදුරජුන් දැක, ලුහුබැඳ පසු පස්සේ යමින් "සොරෙක්, බාල-යෙක්, මූඪයෙක්, ඔටුවෙක්, ගොණෙක්, කොටළුවෙක්, තිරිසනෙක් වෙහි, තට සුගතියක් නැත, දුගතිය ම කැමැති විය යුතු ය"යි දශ ආක්‍රොශ වස්තුවෙන් ආක්‍රොශ කරන්නට පරිභව කරන්නට පටන් ගත්හ. ආනන්ද ස්ථවිරයන් වහන්සේ එයසා බුදුරජුන්ට ලංව "ස්වාමීනි! මෙනුවරුන් කරණ මේ ඇණුම් බැණුම් ඉවසනු බැරි ය, එහෙයින් අන් නුවරකට වඩිනා සේක්වා" යි දන්වා සිටි කල්හි "ආනන්ද! යන්නමෝ කොතැනක දැ?"යි අසා වදාළ සේක. "ස්වාමීනි! කොතැනක හෝ අන් නුවරකට යමු" යි කීහ. "හා හොඳයි, ආනන්ද! එහිදීත් මිනිසුන් ඇණුම් බැණුම් කළොත් එතැනදී කොතැනක යන්නමෝ දැ?"යි අසා වදාළ විට ආනන්ද ස්ථවිරයන් වහන්සේ එවරත් අන් නුවරකටැ, යි කීහ. "ආනන්ද! එසේ යනු නො හැකි ය, එය කළ නො හැකි ය, සුදුසු ද නො වේ, යම් තැනක අධිකරණයෙක් උපන්නේ නම් එහි දී ම ඒ අධිකරණය සන්සිඳවා ඉන්පසු අන් තැනකට යා යුතු ය" යි වදාරා "ආනන්ද! ඇණුම් බැණුම් කරන්නෝ කවුරුහ?" යි ඇසූහ. "ස්වාමිනි! දාසිදස් කම්කරු පටන් හැම කෙනෙක් ම ඇණුම් බැණුම් කරති"යි කීහ. "ආනන්ද! යුදබිමට වන් ඇතු සිවු දිගින් එන සියලු ඊ පහර ඉවසිය යුතු ය, එය ඌ අයත් ය, එමෙන් බොහෝ දුසිල් මිනිසුන් විසින් කරණ කියන ඇණුම් බැණුම් ඉවසීම මා අයත් ය"යි වදාරා තමන් වහන්සේ ඇරැබැ දහම් දෙසන සේක් මේ ධර්මදෙශනාව කළ සේක.

**අහං නාගොව සඞ්ගාමෙ චාපාතො පතිතං සරං,**
**අතිවාක්‍යං තිතික්ඛිස්සං දුස්සීලො හි බහුජ්ජනො.**

**දන්තං නයන්ති සමිතිං දන්තං රාජාභිරූහති,**
**දන්තො සෙට්ඨො මනුස්සෙසු යොතිවාක්‍යං තිතික්ඛති.**

**වරමස්සතරා දන්තා ආජානීයා ච සින්ධවා,**
**කුඤ්ජරා ච මහානාගා අත්තදන්තො තතො වරන්ති.**

යම් හෙයකින් බොහෝ වූ මහාජන තෙමේ දුශ්ශීල වේද, (එහෙයින්) යුදබිම දී දුන්නෙන් ගිලිහී අවුත් ඇඟ හුනු ඊතලය (ඉවසන) ඇතකු මෙන් මම (අනුන් කියන) රළුබස් ඉවසන්නෙමි.

දැමුනු ඇතු හෝ අසු සමිතියට පමුණු වත්. රජ තෙමේ ද දැමුනු ඇතුට හෝ අසුට නගී යි. යමෙක් රළුබස් ඉවසා ද දැමුනා වූ හෙතෙමේ මිනිසුන් අතුරෙහි ඉතා උතුම් වේ.

අශ්වතරයෝ ද ආජානීය අශ්වයෝ ද සෛන්ධවයෝ ද කුඤ්ජර නම් වූ මහාඇත්තු ද දැමුනාහු ම උතුම් වෙත්. ඒ හැමට වඩා තමා දැමුනේ ම උතුම් වේ.

**අහං නාගො ඉව සඞ්ගාමෙ චාපාතො පතිතං සරං අතිවාක්‍යං තිතික්ඛිස්සං** = යුදබිම දී දුන්නෙන් ගිලිහී අවුත් (ඇඟ වැදුනු) ඊතලය (ඉවසන) ඇතු මෙන් මම රළුබස් ඉවසන්නෙමි.

**නාග** යනු මෙහි ඇතුන් කෙරෙහි වැටේ. මූත්ගේ ඉපැත්ම බොහෝ සෙයින් කලුහෙල් සමීපයෙහි වන බැවින් ඇත්තු 'නාග'යි හඳුන්වනු ලැබෙත්. **නාග** යනු අනික් ශබ්දයක් හා සමස්ත ව පරව සිටියේ ශ්‍රෙෂ්ඨාර්ථය කියත්තේ ය. පුරුෂ ශ්‍රෙෂ්ඨ තෙමේ පුරිසනාග නම්.

**සඞ්ගාම** නම්: යුදබිම ය. **චාප** නම්: දුන්න ය. **සර** නම්: ඊතල ය. **අතිවාක්‍ය** නම්: අනාර්‍යව්‍යවහාර ය. **"යා වාචා ලාමකජනෙහි වුත්තා වීතික්කමදීපනී අජ්ඣාචාරවීතික්කමසාධනී, සා වාචා අරියජනෙහි වත්තබ්බමරියාදං අතික්කමන්තො අතිවාක්‍යං"** මැනැවින් හැදී වැඩී ගිය ආර්‍යජනයන්ගේ උතුම්බස් ඉක්ම වූ පහත් මිනිසුන්ගේ, ගුණනුවණින් නො වැඩුනා වූන්ගේ මර්මච්ඡේදක පරා පෙළන පරොස්බස් අතිවාක්‍ය නැමැයි මෙයින් පැහැදිලි ය.[1]

**"යථා සඞ්ගාමාවචරො සුදන්තො මහානාගො ඛමො සත්තිප්පහාරාදීනං චාපතො මුඤ්චිත්වා අත්තනි පතිතෙ සරෙ අවිහඤ්ඤමානො තිතික්ඛති, එවමෙවං අතිවාක්‍යං තිතික්ඛිස්සං සහිස්සාමි"** යනු අටුවා. යම්සේ යුද්ධයෙහි දක්ෂ වූ යුද පුහුණු කළ මොනවට දැමුනු මහා ඇත් තෙමේ කඩු අඩයටි තෝමර සැත් පහර ඉවසා ද, දුන්නෙන් මිදී අවුත් තමා ඇඟ වැටුන ඇඟ වැදුනු ඊතල නො සැලී නො හැපෙමින් ඉවසා ද එපරිද්දෙන් අනුන් කියන පරොස්බස් ඉවසන්නෙමි, යනු **'තිතික්ඛිස්සං'** යන මෙහි අරුත්[2].

1. 13. 3. 'එකං ධම්මං අතීතස්ස' යනු බලනු
2 14. 4 'තපො තිතික්ඛා' ,, ,,

**දුස්සීලො හි බහුජ්ජනො** = යම් හෙයකින් බොහෝ වූ මහාජන තෙමේ දුශ්ශීල වේ ද.

දුශ්ශීල වූ මේ ලෞකිය මහාජනයා තමන්ට රිසි පරිදි කටට නැගෙන නැගෙන සේ පරොස්බස් නපුරු වචන කියා මා ගටමින් හැසිරේ නම් ඔවුන් කියන ඒ පරොස්බස් ඉවසීම එකිලා මැදහත් වීම මා අයත් ය. ලෞකිය මහාජනයා බොහෝසෙයින් දුශ්ශීල බැවිනි.[1]

**දන්තං නයන්ති සමිතිං** = දැමූනහු සමිතියට පමුණුවත්.

මෙහි **දන්ත,** යන්නෙන් ගැණෙනුයේ මැනැවින් හික්මුනු හිමියාගේ බස් දැන හැසිරෙණ කීකරු හිලෑ ඇත්-අස් ගෙරිසරක් ආදීහු ය. **සමිති** නම්: බොහෝ දෙනාගේ එක්වීම ය. බොහෝ දෙනා එක් වන තැන් ද ගැණේ. උයන් කෙළි ආදියෙහි බොහෝ දෙනා රැස් වූ තැනට යන්නෝ, හොඳට හික්මුනු හීලෑ වූ ඇත්-අස් ආදීන් යෙදූ රියෙන් යන්නෝ ය. **"උය්‍යාන කීළා මණ්ඩලාදීසු හි මහාජනමජ්ඣං ගච්ඡන්තා දන්තං එව ගොණජාතිං වා අස්සජාතිං වා යානෙ යොජෙත්වා නයන්ති"** යනු අටුවා.

**දන්තං රාජා අභිරූහති** = රජ තෙමේ දැමූනහු පිට නගියි.

රජුන් විසින් ධනිකයන් විසින් වාහන වශයෙන් ගණු ලබන්නෝ ද කීකරු වූ කලබල නැති ඇත් අස් ආදීහු ම ය.

**දන්තො සෙට්ඨො මනුස්සෙසු යො අතිවාක්‍යං තිතික්ඛති** = යමෙක් රළුබස් ඉවසා ද දැමුනා වූ හෙතෙමේ ඉතා උතුම් වේ.

දැමුනු හික්මුනු හොඳට ගුණයෙන් වැඩුනු මිනිසුන් අතුරෙහිදු ශ්‍රෙෂ්ඨ වනුයේ සිවු මගින් කෙලෙස් නැසුයේ ය. හේ ය පරොස් බස් ඉවසීමෙහි ඉතා සමත්. **"මනුස්සෙසුපි චතූහි අරියමග්ගෙහි දන්තො නිබ්බිසෙවනොව සෙට්ඨො"** යනු අටුවාව එය කියා.

**සෙට්ඨො** යනු 'සෙය්‍යො' යනුසේ ය. **ඉට්ඨ** ප්‍රත්‍යය විසින් වෙනසි.[2] **මනුස්ස** නම්: සමෘති - ශූරභාව - බ්‍රහ්මචර්‍ය්‍යාදී වූ ගුණයන් ගෙන් තෙද ගැණුනෝ ය.[3]

**වරං අස්සතරා දන්තා ආජානීයා ච සින්ධවා කුඤ්ජරා ච මහානාගා** = අශ්වතරයෝ ද ආජානීය අශ්වයෝ ද සෛන්ධවයෝ ද කුඤ්ජර නම් මහා හස්තීහු ද දැමූනාහු උතුම් වෙත්.

---

1. 12. 6 'යස්ස අච්චන්තදුස්සීලතං' යනු බලනු.
2. 22. 6. 'සෙය්‍යො' ,, ,,
3. 1. 13. 'සුගතිං' ,, ,,

එහි **අස්සතර** නම්: කොටළුවට දාව වෙළෙඹ කුස උපන් අශ්ව තෙමේ ය.[1] අසුන් හික්මවන්නහුගේ අදහස් දැන ඒ අනුව වහා ක්‍රියා කරණ අශ්ව, **ආජානීය** නම්.[2] සින්ධු දෙශයෙහි උපන් අශ්ව, සින්ධව නම්. **කුඤ්ජ** නම් ඇත්හනු හෝ ඇත් දත් ය. හනු හෝ දත් ඇතියේ **කුඤ්ජර**. පොළොව සාරණ්නුයේ හෝ කඳුමුදුන්හි ඇලුනේ හෝ කුඤ්චනාද කරණ්නුයේ හෝ කුඤ්ජර යි ද කියනු ලැබේ. මහත් සිරුරක් ඇති ඇත්තෙමේ ය හේ. **"කුඤ්ජර සන්ධාංනං මහානාගං"**යි කීයේ එහෙයිනි. **කුඤ්ජර** ශබ්දය අනික් පදයක් හා පරව යෙදුනේ ශ්‍රෙෂ්ඨාර්ථය දෙන්නේ ය. මෙ කියූ අශ්වතරයෝ සෛන්ධවයෝ ආජානෙයයෝ කුඤ්ජර නම් මහාහස්තීහු දැමුනෝ ම හීලෑ වූවෝ ම උතුම් ය. නො දැමුනෝ උතුම් නො වෙත්.

**අත්තදන්තො තතො වරං** = ඒ හැමට වඩා තමා දැමුනේ උතුම් වේ.

ඔවුන් හැම දෙනාට වඩා චතුර්විධ මාර්ගයෙන් තමා දමනය කළ මිනිස් තෙමේ ම ඉතා උතුම් වේ. මෙතෙමේ ම දුශ්ශීල දුෂ්ටලොකයාගේ ඇණුම් බැණුම් නො සැලී නො කිපී ඉවසීමෙහි සමර්ථ වන්නේ ය.

ධර්මදෙශනාවගේ අවසානයෙහි අල්ලස් ගෙණ මාවත් කඩපිල් දෙමං තුන්මං සිවුමං හන්දිවල සිට ඇණුම් බැණුම් කළ හැම දෙන සෝවන් පලයට පැමිණියහ.

**තමන් ඇරබෑ වදාළ ධර්මකථා වස්තුව නිමි.**

---

1. 'ශුනකිකල්පතරුව' බලනු
2. 14. 7. 'පුරිසාජඤ්ඤ' ,, ,,

# ඇතුන් හේ කිරීම දත් මහණෙක්

## 23 — 2

පෙර ඇතැදුරෙක් වූ මහණෙක් දවසක් තවත් මහණුන්ද කැටුව **අචිරවතී** ගංඉවුරට ගියේ එහිදී ඇතුන් හික්මවන්නකු දුටුයේ ය. තමන් අදහස් කළ කරුණු ඇතුට උගන්වාලන්නට නො සමත් වූ ඇතරුවා දුටු ඒ මහණ තමන් ලඟ සිටි මහණුන් අමතා "ඇවැත්නි! මේ ඇතු හික්මවන්නා ඇතුගේ අසවල් තැනට හෙණ්ඩුවෙන් විදින්නේ නම් ඔහුට තමන් අදහස් කළ කරුණු වහා ම ඇතුට උගන්වා ගත හැකි ය" යි කීයේ ය. ඇතරුවා ද මේ මහණහු කියූ ඒ කතාව අසා සිට එසේ කොට ඇතු හික්මවා ගත්තේ ය. එහි සිටි සෙසු මහණෝ පෙරළා අවුත් මේ පුවත බුදුරජාණන් වහන්සේට සැලකළහ. උන්වහන්සේ ඒ මහණ ගෙන්වා "මහණ! තා මෙසේ කීයේ හැබෑද?"යි අසා වදාළ කල්හි "ස්වාමීනි! හැබෑ ය" යි පිළිතුරු දුන්නේ ය. ඉක්බිති බුදුරජාණන් වහන්සේ "මොඝ පුරුෂය! තට දැමුනු ඇත් යානයෙන් හෝ ඉන් අන් යානයකින් හෝ ඇති ඵලය කුමක් ද, තෝ මේ යානයන්ගෙන් මෙතෙක් නො ගිය විරූ තැනට යන්නට සමර්ථ නො වූයෙහි ය, එහෙයින් ඇතු දමන්නට ගුරුහරු-කම් කියා පෑමෙන් තට ඇති වැඩේ කුමක් ද, තා විසින් කළ යුත්තේ තමා දැමීම ය, තමා හික්මවා ගැණීම ය, එසේ කරන්නැ"යි වදාරා මේ ධර්මදෙශනාව කළ සේක.

**න හි එතෙහි යානෙහි ගච්ඡෙය්‍ය අගතං දිසං,**
**යථාත්තනා සුදන්තෙන දන්තො දන්තෙන ගච්ඡති.**

දැමුනු පුරුෂ තෙමේ, දැමුනු ඉතා හොඳින් දැමුනු සිත කරණකොට නො ගිය විරූ දෙසට යම්සේ යේ ද, එසේ මේ යානයන්ගෙන් නො ම යන්නේ ය.

**න හි එතෙහි යානෙහි ගච්ඡෙය්‍ය අගතං දිසං** = මේ ඇත්-අස් ඈ යානයන්ගෙන් නො ගිය විරූ නිවන් දෙසට නො ම යන්නේ ය.

**එතෙහි,** යන්නෙහි ප්‍රකෘතිය **'එත'** යනු ය. එය භාෂායෙහි යෙදෙනුයේ මදක් ඈත්හි එහෙත් ඇසට පෙණෙන වස්තූන් දැක්වීම පිණිස ය. **ඉම** ශබ්දය ලඟ කියන්නේ ය. **එත** ශබ්දය එයට වඩා මදක් ඈත කියන්නේ ය.

**"එතසද්දො සමීපපච්චක්ඛවචනො, ඉමසද්දො අච්චන්තසමීපපච්චක්ඛවචනො"** යනු ශාබ්දික වචනයි.

යමකින් යේ නම් ඒ යාන. වාහන යොග්‍ය යනාදීහු ද යානාංගයෙහි යෙදෙන්නෝ ය. ඇත් – අස් ඈ යානයන්හි වැටෙත් වහන් ද මෙහි ඇතුළත් ය. **"යානං හත්ථාදි, අනතමසො උපාහනං උපාදය"** යනු කීයේ එහෙයිනි.

මෙහි නිවන **"අගතං දිසං"**යි වදාළ සේක. කිසිම පුද්ගලයකු විසින් සිහිනෙනුදු නො ගිය විරූ තැන 'අගත' නම්. **"කෙනචි පුග්ගලෙන සුපිනකෙනනපි අගතපුබ්බත්තා අගතනති සඞ්ඛාතං නිබ්බානදිසං"** යනු අටුවා.

**යථා අත්තනා සුදනෙතන දනෙතා දනෙතන ගච්ඡති** = දැමුනු පුරුෂ තෙමේ දැමුනු ඉතා හොඳින් දැමුනු සිත කරණකොට යම්සේ යේ ද.

ප්‍රථමාර්ථය හා එක් කොට අරුත් ගන්නේ ය. **දනෙතන** = පූර්වභාගයෙහි ඉන්ද්‍රිය දමනයෙන් දැමුනු, **සුදනෙතන** = අපරභාග = යෙහි ආර්‍ය මාර්ග භාවනායෙන් ඉතා හොඳින් දැමුනු, **අත්තනා** = සිත කරණකොට, **දනෙතා** = දැමුනු නුවණැති පුද්ගල තෙමේ දාන්ත භූමියට යම්සේ යන්නේ ද ඇත් – අස් ඈ කිසිත් යානයකින් ඒ නො ගිය විරූ දාන්ත භූමියට කිසිවකුටත් යා නො හැකිය.

ධර්මදෙශනාවගේ අවසානයෙහි බොහෝ දෙන සෝවාන් ඵලාදියට පැමිණියාහු ය.

**හත්ථාචාරියපුබ්බක භික්ෂුවස්තුව නිමි**

# පුතුන් බසට රැවටුනු මහලු බමුණා

## 23 — 3

**එදා, සැවැත්** නුවර අටලක්‍ෂයක් පමණ මුදලින් පොහොසත් වූ බමුණෙක් විසූයේ ය. ඒ බමුණු, වැඩි විය පැමිණි තමන් ගේ පුතුන් සතර දෙනාට තමනට කැපෙන බමුණු කුලවලින් ම සරණ පාවාදීලා එකෙකාට ලක්‍ෂය බැගින් සාරලක්‍ෂයක් දායාද කොට ද දුන්නේ ය. ටික දවසක් ගිය තැන ඔහුගේ අඹු ද කලුරිය කළා ය. එකල්හි පුත්තු සතර දෙන එක් තැන් ව "යම්ලෙසකින් පියා අන් අඹුවක ගෙණාවේ නම් ඇය කුසැ උපදිනවුනටත් අපට මෙන් දායාද දෙන්නේ ය, එසේ වී නම් අපගේ කුලයත් බිඳ වැටෙන්නේ ය. අපට ම ලැබෙන්නට තිබෙන ඉතිරි සාරලක්‍ෂයත් නො ලැබී යන්නේ ය, එහෙයින් අපි ම පියාට උවටැන් කරමු"යි නියම කොට ගෙණ ඒ සතර දෙන ඉතා ආදරයෙන් සැලකිලි දක්වා කවමින් පොවමින් ඇඳුම් පැලඳුම් රෙදිපිළී සපයා දෙමින් නෑවීම් සේදීම් අත්පා මැඩීම් තෙල් ගැල්වීම් හිස පිරීම් ඈ කරමින් ටික දවසක් උවැටන් කළහ.

දවසක් බමුණු දාවල නිදා හිඳ නැගිට සිටි කල්හි ඔවුහු සිවු දෙන බමුණාට ලංව අත් පා මඩිමින් එකෙකා වෙන වෙන ම ගෙයි විසීමෙහි දෙස් කියා "අපි ඔබවහන්සේට මේ දූන් කරණ ලෙසට දිවි තිබෙන තුරු උවැටන් කරන්නෙමු, ඔබ අතේ ඉතිරි ව තිබෙන මුදල් ද දෙන්නැ"යි ඉල්ලා සිටියහ. බමුණා ද පුතුන් අදහා ගෙණ උන්ගේ බසට රැවටී එකෙකාට ලක්‍ෂය ලක්‍ෂය බැගින් වෙන තුබූ සාරලක්‍ෂයත් අඳින්නට පොරොවන්නට පිළී දෙකක් ලඟ තබා ගෙණ අන් සියලු වතුපිටි ගේදෙර ඇඳ පුටු රන් රිදී තඹ පිත්තල හැළි වළන් ආදියත් සිවු කොටසක් කොට බෙදා දුන්නේ ය.

මුත් අතුරෙහි වැඩි මහලු පුත් කීපදවසක් කියූ ලෙසට උවැටන් කෙළේ ය. දවසක් ගඟට ගොස් නාලා එන බමුණු දුටු වැඩි මහලු ලේලිය දොරකඩ සිට බමුණා එහි නවතා ගෙණ "ඇයි, මෙහි? අපේ එක්කෙනා වැඩි මහල් පුත් යි ඔහුට අන් තිදෙනාට වඩා සියයක් ලක්‍ෂයක් තබා තුට්ටුවක් පමණකුත් දුන්නෙහි ද? හැම එකාට දුන්නේ ලක්‍ෂය ලක්‍ෂය බැගින් නො වේ ද? ඇයි, මෙහි? අනික් පුතුන්ගේ ගෙවලට යන මග නො දනිහි ද?"යි බමුණා එතැනින් පන්නා හැරියා ය. බමුණා ද කිපී බැණ වැදී දෙවන පුතුගේ ගෙට ගියේ ය. එහිදී ද කිහිප දවසකට පසු දෙවන පුතුගේ බිරිය ද "දූන් මෙහි උන්නා ඇති, සැලකුම් කාටත් එකවගේ ය, අපට අමුතුවෙන් දූයක් දුන්නේ ද නැත,

ඇයි, මෙතෙක් දවස් මෙහි? යන තැනක යන්නැ''යි බමුණා එතැනින් ද පන්නා හැරියා ය. තෙවන සිවුවන දෙපුතුන්ගේ අඹුවෝත් බමුණා පිටමං කළහ.

මෙසේ එක පුතකුගෙනුදු පිහිටක් නො ලත් බමුණා කන්නට බොන්නට ඉන්නට මගක් නො මැති ව අළු ගාගත් සිරුරු අවයව ඇති ව පිරිවැජි පැවිද්දෙන් පැවිදි ව පිඬු සිගා ගෙණ කන්නේ ය. කල් යැමෙන් දිරුම් කඩට ගියේ කටුක අම්හිරි කෑම් බීම් වලින් හා කඩ පිළ අතැන මෙතැන වැටී දුකසේ නිදීමෙන් මැලවී ගිය සිරුරු ඇතියේ වී ය. දවසක් සිඟා කා අවුත් කඩපිළක වැටී නිදා නැගිට තමන් ගැණ සිතන්නට වන. දිගින් දිගට තමන් ගැණ සිතූ ඔහුට පුතුන්ගෙන් නම් පිහිටක් නො වන බව පෙණී ගියේ ය. එකෙණෙහි ම ඔහුට ''ශ්‍රමණගෞතම අනුන් දැක කර බාගන්නෙක් නො වේ, බැම හකුළා ගන්නෙක් නො වේ, මූණ බලා කතා කරන්නේ ය, මිහිරිකතා ඇත්තේ ය, සැපදුක් විචාරන්නේ ය, එහෙයින් ශ්‍රමණ ගෞතමයන් වෙත ගියොත් පිළිසඳරක් ලබා ගත හැකිය''යි සිත් විය. එදා පාත් වූ සැටියේ ම බමුණා අඳින වත හා පොරෝණා වත හිඟ දවටා ගෙණ සිඟන පොලොත්තත් රැගෙණ හැරම්ටි වාරුවෙන් බුදුරජුන් වෙත ගියේ ය. බුදුරජානන් වහන්සේ තමන් වෙත ආ බමුණා හා පිළිසඳර කතා කොට ''බමුණ! බොහෝසේ දිරුම් කඩට ගියෙහි, ඇයි? ඇයි, රෙදිවැරලි?''යි අසා වදාළ සේක. ''භවත් ගෞතමයන් වහන්ස! මට පුත්තු සතර දෙනෙකි, ඔවුහු තම අඹුවන් ලවා මට ඇණුම් බැණුම් ගැහැට කරවා උන්ගේ ගෙවලින් පන්නා දැමූහ'' යි කී විට බුදුරජානන් වහන්සේ ''එසේ නම් මහාජනයා රැස් වන තැන් බලා ගොස් එතැන්හි තාගේ පුතුන් ද ඇවිත් සිටියොත් මේ ගී ඉගෙණ කියව''යි ගී කීපයක් උගන්වා වදාළ සේක. මේ ඒ ගී:

''උපන් යම් කෙනකුන් – කරණ කොට තුටු වූයෙම්,
මෙහි යම් කෙනෙක්හට වැඩ – පැතූයෙම් දැන් ඔවුහු.

සියඹුවන් බසිති – මුසපත් ව ගිය බැවිනි,
හූරන් බියෙන් හඬවන – බලු සේ මා හඬවති.

නො සත් ලමු වූ ඒ – දරුවෙස් දූරු රකුසෝ
පිත! පිත! කියත් දූන් මට – මහලු මා හැර සිටිති.

උන් පින් මහල්ලා – පිරිබොවෙහි නො ද නිසි වූ,
ජිණු අසකු සේ අහරින් – හළෝ ගෙන් ගෙට හිඟතේ.

දරුවෝ මගේ ඒ – අකීකරු වෙත් මට දූත්,
සැරයටි කඩ ම පිහිට ය – උත්ට වැඩියෙත් වැඩද.

මේ සැරයටි දඬුව – බල්ලත් ගොනුත් රළු වූ
පත්නා හැරීමෙන් මා – රකී නිතර ම විපතින්.

අඳුරෙහි පෙරටු වේ – ගැඹුරු දියැ මට පිහිට ය,
නො වැටී සිටින්නෙම් මම – සැරයටි පිහිට ලැබුමෙන්''

බමුණා බුදුරජුන් වෙතින් මේ ගී කීපය උගෙණ බමුණන් රැස්වන දිනයන්හි ඒ ඒ තැන රැස්වීම්වලට ගොස් පුතුන් සියලු දෙනා ද මාහැඟි ඇඳුම් ආයිත්තම් ඇගලා සැරසී බමුණන් මැද මාහැඟි අසුන්හි හිඳිනවුන් දුටු විට දූත් මේ ගී කීමට කාලය, යි අත් දෙක ඔසොවා ''පින්වත්නි! මම තමුන්නාන්සේලා ඉදිරියෙහි ගී කීපයක් කියන්නට කැමැත්තෙමි''යි කිය යි. ''හා! හොඳයි, කියන්න, අසනු කැමැත්තෙමි'' යි රැස්ව හුන්නවුන් කියන ලදුයේ නම් හිටිවන ම බුදුරජුන් වෙතින් උගත් ගී කීපය බමුණා හඩ නගා කියන්නේ ය.

ඒ කාලයෙහි **''යමෙක් මවුපියන් සතු දේපල කමින් මවු-පියන් පෝෂණය නො කරන්නේ නම් ඔහු එල්ලුම් ගස් යැවිය යුතුය''**යි මහාජනයා අතර සම්මත වූ ව්‍යවස්ථායෙක් වී ය. මෙය දැන සිටි ඒ බ්‍රාහමණ පුත්‍රයෝ දවසක් තම පියා කියූ මේ ගී අසා තැති ගත්තෝ එහිදී ම තම පිය බමුණුගේ පාමුල වැඳ වැටී ''පියේ! අපට දිවි දුන මැනැ වැ''යි ඉල්ලා සිටියහ. **දූ දරුවන් මවුපියනට කොතරම් ගැහැට කළත් දූ දරුවන්ගේ විපතෙහි මවුපියෝ තැවෙන්නාහ. හඬන්නාහ. වැලපෙන්නාහ. මොළොක් සිත් ඇතියෝ වන්නාහ.** බමුණු ද දූ පුතුනට වන්නට යන විපත දැන උන් කෙරෙහි මොළොක් සිත් ඇති ව ''පින්වත්නි! මාගේ පුතුනට කිසි ගැහැටක් නො කරණු මැනැව, ඔවුහු කෑම් බීම් ඇඳුම් කැඩුම් දෙමින් කවමින් පොවමින් නාවමින් මා පොෂණය කරණ බව කියති''යි කීයේ ය. එවිට සභායෙහි සිටි මිනිස්සු ''තෙපි අද පටන් තමාගේ පියාට නො සලකන්නහු නම් තොප සිවුදෙනා එල්ලුම් ගස් යවන්නට සිදුවනු ඇත, එහෙයින් ඔහුට හොඳින් උවැටන් කරවු''යි දන්වා සිටියහ. එ වේලෙහි ම ඔවුහු පියා කර පිට හිඳුවා ගෙණ ගෙට ගෙණ ගොස් සිරුර තෙල් ගා ඇඟ උලා සුවඳසුණු ගා නාවා රෙදි පිළී අන්දවා තම අඹුවන්ට ''අද පටන් මේ පියාට හොඳින් සැලකිල්ලෙන් උවැටන් කළ යුතු ය, පියාට කළ යුතු වතාවත් කිසිවක් අඩු නො කොට කලට වේලාවට කළ යුතු ය,

ඒ නිසිවක් අඩුව ගියොත් තෙපි දඬුවම් ලැබිය යුතු වන්නාහු ය''යි කිහ. එතැන් සිට ඇලා ඔහුට කටට රසට මිහිරට කෑම පිළියෙල කොට දුන්හ.

බ්‍රාහ්මණ ද මිහිරි කෑම් බීම් හා සැපපහසුකම් ඇති ඉඳුම් හිටුම් ලබා කිහිප දවසක් ඉකුත් ව යත් ම තරව ගිය සිරුරු ඇතියේ දැකුම්කලු ඉඳුරන් ඇතියේ හයිබල ඇතියේ තමාගේ ඇඟ පත දෙස බලා 'මට මේ සියල්ල ලැබුනේ ශ්‍රමණ ගෞතමයන් නිසා ය''යි පඬුරු පිණිස පිළිසඟලක් පිළියෙල කොට ගෙණ බුදුරජුන් වෙත ගියේ ය. ගොස් කළ පිළිසඳර ඇත්තේ එකත් පසෙක හිඳ ඒ පිළි-සඟල බුදුරජුන්ගේ පාමුල්හි තබා ''අපි බ්‍රාහ්මණයෝ වම්හ, ගුරුන් පිදීමෙහි නියැලුනෝ වම්හ, ශ්‍රමණ ගෞතම මට ගුරු ව සිටියේ ය, එහෙයින් මේ ගුරු පූජාවක් ගෙණ ආයෙමි, මේ ආචාර්‍ය්‍යධනය පිළිගත මැනැවැ''යි ඇයද සිටියේ ය. බුදුරජාණන් වහන්සේ ඔහුට අනුකම්පා පිණිස එය පිළිගෙණ බණ වදාළ සේක. බණ කෙළවර බ්‍රාහ්මණ තෙමේ ශරණශීලයෙහි පිහිටා ''භවත් ගෞතමයන් වහන්ස! මාගේ දරුවෝ දිනපතා මට බත්සලාක සතරක් දෙන්-නෝ ය, එයින් දෙබතෙක් මට සෑහෙන්නේ ය, දෙබතක් ඔබ වහන්සේට දෙමි''යි කීය එකල්හි බුදුරජාණන් වහන්සේ ''බ්‍රාහ්මණ! හොඳයි, අපි අප කැමැති තැනකට යන්නමෝ වම්හ''යි වදාරා බමුණා පිටත් කොට යවා වදාළ සේක. බමුණා ගෙට ගොස් පුතුන් අමතා ''පුතෙනි! ශ්‍රමණගෞතම මාගේ හොඳ යාළුවා, තොප මට දෙන නිති බත් සතරින් දෙකක් මම ඔහුට දුනිමි, ඔහු තොපගේ ගෙවලටත් පැමිණියොත් ඔහුට කළ යුතු සඬග්‍රහයෙහි නො පමා වහු''යි දන්වා සිටියේ ය. ඔවුහු ද ''යහපතැ''යි එය පිළිගත්හ. පසුදා බුදුරජාණන් වහන්සේ පිඬු පිණිස වඩනා සේක් වැඩිමහල් පුතුගේ ගෙදොරට වැඩි සේක. ඔහු බුදුරජුන් දැක, පාත්‍රය ගෙණ ගෙට වැඩම කරවා මාහැඟි පලඟෙක වඩා හිඳුවා මිහිරට පිළියෙළ කළ බත් මාළු පිළිගැන් වී ය. බුදුරජාණන් වහන්සේ මෙසේ පිළිවෙළින් අනික් පුතුන් තිදෙනාගේ ගෙවලට ද වැඩි සේක. ඔවුහු ද එසේ ම සත්කාර කළහ.

මේ කාලයෙහි දවසෙක වැඩිමහල් පුතුගේ ගෙයි මගුල් උළෙ-ළෙක් වී ය. එකල්හි ඔහු පියබමුණු අමතා ''පියේ! මේ මගුලෙහි පළමු මගුල් බත කවරක්හට දෙමු දැ?'' යි ඇසී ය. ''අනෙකකු ගැණ මම නො දනිමි, ශ්‍රමණ ගෞතම මාගේ යාළුවා, මේ බත දීමට ඔහු හැර අන් සුදුස්සෙක් මට නො පැණේ, ඒ නිසා හෙට දනයට පන්සියයක් දෙනකුන් සමඟ එන්නට ශ්‍රමණ ගෞතමට ආරාධනා කරව''යි කීවිට ඔහු එසේ කෙළේ ය. පසුදා බුදුරජාණන් වහන්සේ

පන්සියයක් දෙනා වහන්සේත් කැටුව ඔහුගේ ගෙට වැඩි සේක. බමුණුපුත්, සියගෙය පිරිබඩ ගන්වා නොයෙක් සැරසිල්ලෙන් සැර සිලි කොට අසුන් පණවා එහි බුද්ධප්‍රමුඛසඞ්ඝයා වහන්සේ වඩා හිඳුවා දිය නො මුසු මීපැණි යොදා පිළියෙල කළ කිරිබතින් ද තවත් නොයෙක් මිහිරි අහරින් ද උන්වහන්සේලා වැළඳ වී ය. වළඳනා වේලෙහි බ්‍රාහ්මණපුත්‍රයෝ සිවු දෙන බුදුරජුන් වෙත හිඳ "භවත් ගෞතමයන් වහන්ස! අපි අපේ පියාට ඉතා හොඳින් සාත්තුසප්පායම් සපයන්නෙමු, ඉතා හොඳින් පියා පිළිදැගුම් කරන්නෙමු, පියාට කරණ සාත්තුසප්පායම්වල කිසිත් පමායෙක් නැත, අන් හැම වැඩ පසුවට තබා පියාගේ කටයුතු කරන්නෙමු, ඔහුගේ ඇඟපත මුණකට දෙස බලනු මැනැවි, ඔහු දැන් සුවපත් ව සිටුනෝය" යි කීහ. බුදුරජානන් වහන්සේ "ඒ ඉතා යහපත, තොප විසින් කරණු ලබනුයේ ඉතා හොඳ වැඩෙක්, මවුපියන් පිළිදැගුම් කිරීම පැරණි පඬිවරුන් විසින් ඉතා සැලකිල්ලෙන් කරණ ලද, මෙලොව පරලොව දෙක්හි තමන්ට සැප පිණිස පවත්නා යහපත් ක්‍රියාවෙකැ" යි ඒකාදසනිපාතයෙහි එන මාතුපොසකනාගරාජ ජාතකය විස්තර විසින් වදාරා මේ ධර්මදේශනාව කළ සේක.

**ධනපාලකො නාම කුඤ්ජරො**
**කටුකප්පභෙදනො දුන්නිවාරයො,**
**බද්ධො කබලං න භුඤ්ජති**
**සුමරති නාගවනස්ස කුඤ්ජරොති.**

ධනපාලක නම් ඇත් තෙමේ තියුණු මද ඇතියේ නො වැළැකිය හැකියේ බැඳුනේ ආහාර නො බුදියි. ඇත් තෙමේ ඇතුන් වසන වනය ම සිහි කරයි.

**ධනපාලකො නාම කුඤ්ජරො** = ධනපාලක නම් ඇත් තෙමේ.

**කටුකප්පභෙදනො දුන්නිවාරයො** = තියුණු මද ඇතියේ නො වැළැකිය හැකියේ.

**බද්ධො කබලං න භුඤ්ජති** = බැඳුනේ අහර අනුභව නො කෙරේ

**සුමරති නාගවනස්ස කුඤ්ජරො** = ඇත් තෙමේ ඇතුන් වසන වනය සිහි කරයි.

"අප මහබෝසත් තෙමේ එක් කලෙක ඇත්කුලයෙක උපන. ඔහුගේ මවු ඇතින්න අන්ධ ය. මහබෝසත් ඇය කන්දක් පාමුල තුබූ ගල්ගුහාවක රඳවා පලාපල ගෙණවුත් දී පොෂණය කෙළේය. එකල බරණැසින් අවුත් වල් වැදුනු වැද්දෙක් මං මුළාව ගියේ

මහහඬින් මොර දෙන්නට වූයේ ය. එයැසූ මහසත් එහඩ ඔස්සේ ගොස් වැද්දා සිටි තැනට පැමිණ වැද්දා පිට නංවා ගෙණ අවුත් බරණැසට යන මගට බස්වා වල් වැදූයේ ය. එ දවස බරණැස් රජුගේ මගුලැත් කළුරිය කෙළේ වන. රජ තෙමේ 'මගුලැත් බවට සුදුසු ඇතකු ඉන්නා තැනක් සොයා බලා කියවු'යි නුවර බෙර ලැවූයේ ය. එකල්හි ඒ වැද්දා රජු කරා ගොසින් මගුලැත් බවට සුදුසු ඇත්රජකු හිමාලය කඳුපාමුල වනයෙහි ඉන්නාබව රජුට දන්වා මග තොරතුරු ද කියා මග කියාලන්නට යාහැකි බව ද දන්වාලී ය. රජ තෙමේ වැද්දා මග කියන්නා කොට ඔහු සමග ඇතරුවන් එහි යැවී ය. ඇතැරුවෝ වන වැද ඇතු අල්ලා බැඳ ගෙණ බරණැසට ඉගෙණ ආහ. ඇත් තෙමේ 'මට මේ ගැහැට සිදු වූයේ මා මග කියා යැවූ වැද්දා නිසා ය' යි දතුයේ ද, ඌට කිසිත් අනතුරක් නො කෙළේ ය. මවු ඇතින්න එකලා වූවා හඬලන්නට වූ ය. රජ, මිහිරි රසැති නන් වැදෑරුම් රජබොජුන් ඇතුට යැවී ය. එහෙත් ඇත් තෙමේ මෑනියන්ගේ වියොගයෙන් වූ දුකින් පෙළුනේ ඒ කිසිවක් නො ද කෑයේ ය. බැම්මෙහි සිටියේ ඇත්වනය ම සිහි කෙළේ ය. කන්නට බොන්නට මගක් නැති ව එකලා වූ මවු ඇතින්න ගැණ සිහි කරමින් කෑම් බීම් කිසිවක් නො ගත්තේ ය. මෙසේ දවස් කිහිපයක් කෑම නො කා සිටි ඇතු බැම්මෙන් මුදා හළහ. බැම්මෙන් මිදී මවු ඇතින්න වෙත ගිය ඇත් තෙමේ දවස් කිහිපයක් කන්නට බොන්නට දෑයක් නැති ව සාපිපාසායෙන් පෙළුනු මෑනියන් දිවි තිබෙනතුරු මැනැවින් රැක බලා ගත්තේ-ය''යි මෙහි විස්තර කථාව දන්නට මාතුපොසක ජාතකය බැලිය යුතුය.

තියුණු මද ඇතියේ **කාමුකාසපභෙදකා** නම්. මද වැහෙන කාලයෙහි ඇතුන්ගේ දෙකන් සිළු පැළී යන්නී ය. ඒ කාලයෙහි ඇතුන් අකුසු තෝමර කුන්තවලින් දමන්නට නො හැකි ය. එයින් පෙළනු ලබන්නෝ චඬාන් චණ්ඩ වෙත්. මෙසේ චණ්ඩ වන බැවින් ම ඇත්තු **දුන්නිවාරිය** ද වෙත්.

වැළඳිය නො හැකි බත්, **කබල** නම්. පිඩු පිඩු කොට කන ආහාරය යි. එය කුකුළු බිජුවට පමණැයි ද කියත්. තව ද කන්නහුගේ මුව පමණින් පිඩු කොට ගණු ලබන්න ද කබල යි කියනු ලැබේ.

"**සුමරති නාගවනස්ස**" යන මෙහි සමරණාර්ථ ධාතුන්ගේ යොගයෙහි කර්මාර්ථය ෂෂ්ඨිවිභක්තියෙන් සිටියේ ය. එසේ සිටීම භාෂා ධර්මතාය. **"මාතු සරති, මාතරං සරති, න තෙසං කොචි සරති සත්තානං කම්මපච්චයා"**යනු තවත් නිදසුන්. මෙතැන්හි කර්මාර්ථයෙහි ද්විතියා ද වන්නී ය.

පාලිශාබ්දිකයන් විසින් **'සුමරති'** යන ක්‍රියාපදය සිද්ධකිරී-මෙහිලා **'සර × චින්තායං'** යන ධාතුවෙන් පලමු කොට **'සරති'**යි සිද්ධ කොට නැවැත එය **'ස × රති'**යි දෙකඩ කිරීමෙන් යකාරයට අකාරයට උකාරයත් ඉන් පරව මකාරාගමයත් කොට **'සුමරති'**යි සිද්ධ කරණ ලද්දේ ය. මෙහිලා **'සමර × චින්තායං'** යන ධාතු-වෙන් **ති** ප්‍රත්‍යය යොදා සකාරයට අකාරයට උකාරය කිරීමෙන් මෙය සිදු කිරීම ශාස්ත්‍රීය වශයෙන් හා ආගමික වශයෙන් නො සුදුසු දැයි සලකා බැලිය යුතුය. **සමර** ධාතුව **සමා** ධාතුවට නෑකම් කියන්නේ ය විමසා ගත යුතුය. පොත්පත්හි ආ බැවින් මෙහි **'සමරති'** යනු **'සුමරති'**යි මෙසේ යෙදුනේ ය.

බුදුරජාණන් වහන්සේ තමන් වහන්සේගේ මේ පූර්විකචරිත කථාව ගෙණ හැර දක්වා බණ වදුරත් වදුරත් ම ඒ සියල්ලෝ කඳුළු පිරුණු ඇස් ඇතියෝ මොළොක් වූ සිත් ඇතියෝ නතු කළ සිත් ඇතියෝ වූහ. එකල්හි බුදුරජාණන් වහන්සේ ඔවුනට හිත වූ දහම් දැන වදාළෝ චතුස්සත්‍යය දෙශනා කළ සේක.

ධර්මදෙශනාවගේ අවසානයෙහි බ්‍රාහමණ තෙමේ පුතුන් සිවු දෙනාත් ලේලියන් සිවු දෙනාත් සමග සෝවන් පලයෙහි පිහිටියේ ය.

**අන්‍යතර බ්‍රාහමණපුත්‍රවස්තුව නිමි.**

# කොසොල්රජුගේ බත් බුදීම

## 23 — 4

**කොසොල්** මහරජ තෙමේ එක් කලෙක මගධ නැළියෙන් සහල් සොළොස් නැළියකින් පිසූ බත්, ඒ බතට සෑහෙන පමණට පිසූ එළවළුත් සමග බුදිත්තේ ය. රජ දවසක් උදෑසන බත් අනුභව කොට බත්මත සන්සිඳෙන්නට පෙරාතුව ම බුදුරජුන් වෙත ගොස් බඩ බර වූ බැවින් ගිලන් සෑහැවි ඇතියේ සුසුම් ලමින් එහා මෙහා පෙරළෙමින් හුන්නේ ය. බුදුරජාණන් වහන්සේ ඔහුගේ ඒ විලාසය දැක "මහරජ! බත්මත තිබිය දීම ආවහු?" යි අසා වදාළ කල්හි "සවාමීනි! එසේ ය, කෑම ගත් වේලෙහි පටන් මට මහාදුකෙකැ"යි කී ය. "මහරජ! පමණ ඉක්මවා බඩෙහි පමණ ගැණ නො තකා ආහාර අනුභව කිරීමෙන් ලැබෙන දුක ඉතා මහත් ය" යි වදරා මේ ධර්මදෙශනාව කළ සේක.

**මිද්ධී යදා හොති මහග්ඝසො ච**
**නිද්දායිතා සම්පරිවත්තසායී,**
**මහාවරාහොව නිවාපපුට්ඨො**
**පුනප්පුනං ගබ්භමුපෙති මන්දො.**

යම් කලෙක පුරුෂ තෙමේ ථිනමිද්ධයෙන් මැඩුනේ වේ ද, බොහෝ කොට කන්නේ වේ ද, ඌරුකෑමෙන් පොෂණය කරණ ලද මහ ඌරකු මෙන් නිදනුයේ පෙරළි පෙරළී වැද හෝනේ වේ ද, ඒ අඥ තෙමේ නැවැත නැවැත මවුගැබට පැමිණේ.

**මිද්ධී යදා හොති මහග්ඝසො ච** = යම් කලෙක පුරුෂ තෙමේ ථිනමිද්ධයෙන් මැඩුනේ වේ ද, බොහෝ කොට කන්නේ වේ ද.

මෙහි **මිද්ධී,** යනු ථිනමිද්ධයෙන් මැඩුනහු කෙරෙහි ආයේ ය. **ථින** නම්: සිතෙහි පණ නැතිබව ය. **මිද්ධ** නම්: කයෙහි පණ නැතිබව ය. කයෙහි පණ නැති බව සිතෙහි පණ නැති බවටත්, සිතෙහි පණ නැති බව කයෙහි පණ නැති බවට ත් කරුණු ව සිටුනා බැවින් මෙ දෙක එක්වට උපදනේ ය. මිද්ධය කියූ තැන ථිනයත්, ථිනය කියූ තැන මිද්ධයත් ගතයුතු ය. එහෙයින් මිද්ධී යන මෙයට ථින මිද්ධයෙන් මැඩුනේය යි කියන ලදි.[1]

**මහග්ඝස** නම්: ආහාරහත්ථක – අලංසාටක – තත්‍රවට්ටක – කාකමාසක – භුත්තවමිතක යන මොවුන් මෙන් බඩ පමණ ඉක්මවා බත් ගලින්නේ ය.[2]

---

1. 6. 11. 'චිත්ත කෙලසෙහි' යනු බලනු.
2. 1. 6. 'භොජනම්හි ච මත්තඤ්ඤුං' ,, ,,

**නිද්දායිතා සම්පරිවත්තසායී මහාවරාහො ඉව නිවාපපුට්ඨො** = උඟුරුකෑමෙන් පුස්නාලද මහඋඟුරකු මෙන් නිදන්නේ වේ ද, පෙරළි පෙරළී වැද හෝනේ වේ ද.

**නිද්දායිතා** නම්: කුඩා කල පටන් කා බී වැඩී ගිය මහගම්-හූරකු සේ ගොරොව ගොරොවා හුන් සිටි තැන නිදන්නේ ය.

කඳබඩ බර ව ගිය බැවින් තර ව ගිය බැවින් ඉතා මද වේලාව-කුදු එක් ඉරියව්වෙකින් සිටිනු නො හැකි ව හැම අතට පෙරළි පෙරළී නිදන්නේ **'සම්පරිවත්තසායී'** ය.

කඳබඩ මහත් ව ගිය බැවින් හුන් සිටි තැනින් සෙලවෙන්නට නො හැකි ව සිටුනා මහගම්හූරු **'මහාවරාහ'** නම්:

කුඩු - දම්කොඩ - නිවුඩු කැඳ - දෙවුන්දිය ආදී වූ උඟුරුකෑම **නිවාප** නම්: එය කා බී පොහොනියට ගියේ එයින් පුස්නාලදුයේ **'නිවාපපුට්ඨ'** ය.

**පුනප්පුනං ගබ්භං උපෙති මන්දො** = එකල්හි ඒ අඥ තෙමේ නැවැත නැවැත මවුගැබට පැමිණේ.

ථින මිද්ධයෙන් මැඩුනු නිතර නිදන බඩ පමණ ඉක්මවා බත් බුදින මහගම්හූරකු සේ හුන් සිටි තැන නිදන කඳබඩ මහත් බැවින් පෙරළි පෙරළී සුසුම් ලමින් ගොරොව ගොරොවා නිදන අනිත්‍ය - දුඃඛ - අනාත්ම විසින් තිලකුණු මෙනෙහි නො කොට හැකි වූ එහෙයින් අඥාන වූ මිනිසා පුනපුනා පිළිසිඳ ගැණීම් විසින් මවුගැබට පැමිණෙන්නේ ය. "නැවැත නැවැත මවුගැබට පැමි-ණෙන්නේ ය" යනු සසර දිගින් දිගට ජාතියෙන් ජාතිය උපදින්-නේ ය, යනු ය.

ධම්දෙශනාවගේ අවසාන යෙහි බුදුරජාණන් වහන්සේ රජුට උපකාර පිණිස "හැම කල්හි සිහි ඇති බොජුනෙහි පමණ දත් මිනිසාගේ බතින් හට ගන්නා වූ වෙදනාවෝ තුනී ව යන්නාහ, වැළඳූ බොජුන ද ආයුෂ රැක දෙමින් වහා දිරා යන්නේ ය" යන අර්ථවත්=

"මනුජස්ස සදා සතීමතො මත්තං ජානතො ලද්ධභොජනෙ,
තනු තස්ස භවන්ති වෙදනා සනිකං ජීරති ආයු පාලයං"

යන මේ ගාථාව උත්තරමාණවකයාහට උගන්වා "රජු අහර ගන්නා තැන සිට මෙය කියව, එවිට අහර ගැණීම අඩු කරණු ඇතැ" යි වදාළ සේක. මාණවක එසේ කෙළේ ය. රජු ද අහර ගැණීම අඩු කරණුයේ නැළියක බතින් සෑහීමට පත් වූයේ ය. එයින් සුවපත් වූයේ බුදුරජුන් කෙරෙහි විස්වස් ඇතියේ අසදිස මහාදානය පැවැත් වී ය.

**ප්‍රසෙනජිත් කොශල රාජවස්තුව නිමි.**

# යකින්නක කළ ගැහැටෙක්

## 23 — 5

**සැවැත්** නුවර විසූ එක්තරා උපාසිකාවකට එක් ම පුත්‍රයෙක් සිටියේ ය. හේ නමින් **සානු** ය. උපාසිකාව ඒ පුතු පැවිදි කර වූ ය මොහු පැවිදි වූ තැන් පටන් මැනැවින් සිල් රැකියේ වත්ත සම්පන්න විය. ආචාර්යෝපාධ්‍යායයන්ගේ හා ආගන්තුක භික්ෂූන් පිළිබඳ කුදු මහත් වතාවත ද නො පිරිහෙළා කෙළේ ය. මසකට අටදවසක් ඉතා අලුයමින් නැඟී සිට පැන් මලුවෙහි පැන් පෙරා තබා මලුමංපෙත් බණමඩු හැම ද තිමවා සවස පාන් දල්වා බණට සැරසී "බණ අසන්නට එන සේක්වා" යි මිහිරි හඬ නගා කියන්නේ ය. එහඬ ඇසූ භික්ෂූන් වහන්සේලා බණ අසන්නට එති රැස් වෙති. රැස්ව සානුගේ ශක්තිය දන්නා ඒ භික්ෂූහු "හෙරණ! පද විසින් බණ කියන්නැ" යි ඔහුට ආරාධනා කරත්. සානු හෙරණ ද "මාගේ හදවත රිදෙන්නේ ය, ඇඟ ගැහෙන්නේ ය" යි කිසිත් අමාරු අපහසුකමක් නො කියා බණ අසුනට නැඟී අහස්ගඟ ගලා බස්නා සේ පදවිසින් බණ කියා බණ අසුනෙන් බිමට බසින් ම "මාගේ මවුපියනට මේ ධර්මදේශනායෙහි පින් පවරමි" යි කියා ලන්නේ ය. එහෙත් උන්ගේ මවුපියෝ සානු හෙරණුන් පින් පැවරූබව නො දනිත්. එයට පෙර අනතුරු අත්බවෙහි මවු තොමෝ යකින්නක් ව ඉපද සිටියා ය. දෙවියන් සමග බණ අසන්නට පැමිණ සිටි ඕතොමෝ බණ අසා හෙරණුන් දුන් පින් "පුතේ! මම ඔබ දුන් පින් අනුමෝදන් වෙමි" යි කියන්නී ය.

**සිල්වත් මහණ ම දෙවියනට ප්‍රිය වේ. මිනිසුනට ප්‍රිය වේ. යක්රකුස්ඈනට ප්‍රිය වේ. මෙසේ දෙවියන් මරුන් සහිත ලෝකයාගේ සිත් වඩනුයේ සිල්වත් මහණ තෙමේ ම ය. ලොවට පින් කෙත් වනුයේ සිල්වත් මහණ තෙමේ ම ය.** ඒ හෙරණුන් කෙරෙහි දෙවියෝ ද විළිබියෙන් යුක්තව ආදර බහුමන් කරති. ඔවුහු හෙරණුන් මහබඹු සේ ගිනිකඳක් සේ සලකත්. එසේ ම ඒ යකින්න කෙරෙහි ද හෙරණහුගේ මවු යි ගරු කරත්. ධර්මශ්‍රවණය කරණ යක්රකුස් ආදීහු සානුමාතෘ වූ යකින්නට අග්‍රාසනය අග්‍රෝදකය අග්‍රපිණ්ඩය දෙත්තෝ ය. මහේශාඛ්‍ය යක්ෂයෝ ද ඇය දැක මාර්ගයෙන් ඉවත් වෙත්. හුන් තැනින් නැඟී සිටිත්. ටික දවසක් ගිය තැන, ඒ හෙරණ වැඩීමට ගියේ මෝරා ගිය ඉඳුරන් ඇතියේ සසුනෙහි උකටලී ව ඒ උකටලිය හැර ගත නො හී වැඩුනු කෙස්රැවුළු තිය ඇතියේ කිලිටි ව ගිය හඳනා පොරෝණ සිවුරු හැඳ පොරොවා ගෙණ කාටත් නො දන්වා එකලාව ම මවු ඉන්නා තැනට ගියේ ය. උපාසිකා ද පුතු දැක වැඳ "දරුව! පෙර

දවස්හි මෙහි ආයෙහි ආචාර්යෝපාධ්‍යායයන් සමග හෝ තරුණ හෙරණුන් සමග ය, අද එකලාව ආයෙහි කුමක් නිසා?''යි ඇසූ ය. හෙරණ තමන් සසුනෙහි කලකිරී සිටුනාබව කී ය. එවිට උපාසිකා නොයෙක් ලෙසින් ගිහිගෙයි අවුල් වියවුල් ගැහට කියා පුතුට අවවාද කරන්නී ද, ගිහිගෙයි දෙස් හගවාලන්නට නො හැකි වූවා තමන්ගේ ශක්තියෙන් ම ඉබේට ම ගිහිගෙයි දෙස් වටහා ගණු ඇතැ' යි සිතා ''පුතේ! ඉන්න පොඩ්ඩක්, ඔබට කැඳබත් පිළියෙල කරණවා, කැඳබත් ගත් පසු ඔබගේ කැමැත්ත ලෙසින් ඇඳුම් කැඩුම් ගෙණවුත් දෙනවා'' යි වාඩි වෙන්නට අසුනක් පිළියෙල කොට දුන්නී ය. හෙරණ ද මවුගේ බස් අසා හුන්නේ ය. උපාසිකා මොහොතක් යත් ම කැඳ අවුළුපත් පිළියෙල කොට දුන්නී ය. උපාසිකාව හෙරණුන්ට නො දුරෙහි හිඳ බත් පිසන්නට සහල් සෝදනවේලෙහි පෙර අත්බවෙහි මවු වූ යකින්න, ''හෙරණ කොහි ද, කොතැන ගියේ ද, වළඳන්නට දූයක් ලබා ද, නො ලබා ද''යි බලන්නී සිවුරු හරණට ඉන්නා බව දැන ''මට දෙවියන් අතර ලජ්ජාවක් නුපදීවා, යන්නෙමි මම එහි, හෙරණුන්ට සිවුරු හැර යන්නට ඉඩ නො තබමි'' යි හෙරණුන් හුන් තැනට අවුත් හෙරණුන්ගේ සිරුරෙහි ආවිෂ්ට ව බෙල්ල අඹරා මූණ පිටිකර දෙසට හරවා කටින් කෙළ වැගිරෙන්නට සළස්වා බිම හෙළාලූ ය. උපාසිකා තොමෝ පුතුගේ ඒ වියරුව දැක හාල් ගැරීම නවතා අවුත් හෙරණුන් වැළඳ ගෙණ අඩමින් ඔඩොක්කුවෙහි හොවා ගත්තී ය. නුවරවැස්සෝ වහා දුව අවුත් බිලියම් කළහ. තෙල් – නූල් මැතුරූහ. ප්‍රෙතයන් යකුන් උදෙසා තටු දැමූහ. ඒ අතර උපාසිකාව අඩමින් වැලපෙමින්.

''තුදුස් පසළොස්වක් – අඩමස්හි අටවක්හි,
පැළවිය නම් පක්හි – අටගින් සුසැදි පේවස්.

වෙසෙති යම් කෙනෙක් – බඹසරත් හැසිරෙත් නම්,
උන් හා යක්කු කිසිදු – නො ද කෙළිති යනු මවිසින්.

ඇසිනි බස් රහතුන් – එ කරුණ ද දැන් දනිමි,
සානු හෙරණුන් හා අද – යක්කු කෙළිති එනමුත්''

යනු කිවූ ය.

හෙරණුන් සිරුරෙහි ආවිෂ්ට ව හුන් යකින්න මෙය සා,

''තුදුස් පසළොස්වක් – අඩමස්හි අටවක්හි,
පැළවිය නම් පක්හි – අටගින් සුසැදි පේවස්.

වෙසෙතී යම් කෙනෙක් – බඹසරත් හැසිරෙත් නම්,
උන් හා යක්කු නො කෙළිති – යනු රහත් බස් සොඳුරු”

යි කියා නැවැත,

“සානු! හෝ බුදුරජු – දුරු නො කර” යනු යක් බසි,
හමු නො හමු දෙක්හි ඉන් – පව්කම් කිසිත් නො කරව.

පව්කමක් යම්කිසි – කරති හෝ කරණෙහි නම්,
අහස පැන යන ඒ තට – දුකින් මිදුමෙක් නැත්තේ.”

යනුත් කියා හෙරණුන් මූදුලූ ය.

එකෙණෙහි හෙරණ, ඇස් දල්වා කෙස් විසුරුවා හුස්ම හුස්මා බිම පෙරළෙමින් හඬා වැළපෙන මව දෙස බලා එහි රැස්ව සිටියවුන් දැක තමන් යකකු විසින් ගත්බව නො දත්තේ “මම මුලින් පුටුවෙක හුන්නා, මාගේ අම්මා මට නො දුරෙහි සහල් ගරමින් හුන් බව මම දත්තවා, දැන් මම බිම, මේ මොන වියරු–වෙක් දැ” යි බිම වැතිර ගෙණ ම,

“යම් මළ එකකු ගැණ – හඬා වැළපෙහි අම්මේ!
එ මම දිවි ඇතියෙම් වෙමි – නො පෙණෙම් ද තිට අම්මේ!

දිවි ඇතියහු ද මා – දැක දැක හඬනා අම්මේ!
කුමකට හඬා අම්මේ! – පැණැතියෙම් නො ම වෙම් දෝ”.

යි මවට කියේ ය. ඉක්බිති අම්මා වස්තුකාම ක්ලේශකාමයන් හැර දමා පැවිදි වූ මහුගේ නැවැත සිවුරු හැරලනු පිණිස ඊමෙහි දෙස් දක්වන්නී,

“පළමු කම්සැප හැර – ගොසින් නැවැත ද ගිහිබව,
පතා ඒ නම් යමෙකෙක් – හේ මළ එකෙක් වනුයේ.

“පුතේ! එහෙයිනී ඔබ – මළ එකකු මෙන් දිස්නේ,
හඬමි මම දැන් ඔබ ගැණ – දිවියැතිසේ ද නො පෙණේ.”

යි කිවූ ය. මෙසේ ද කියා ගිහිගෙය උණුහළු නිරය වැනි කොටත් මහානිරය වැනි කොටත් ගිහි ව විසීමෙහි දෙස් දක්වන්නී.

“උණුහළු නිරයෙනී – නැගුනු ඔබ දැන් නැවැතත්,
වැටෙනු රිසියෙහි වෙහි ඒ – උණුහළු නිරාදුක්හි.

පුත! නිරාදුකිනී – නැගුනු ඔබ දැන් නැවැතත්,
වැටෙනු රිසියෙහි වෙහි ඒ – නිරාදුකැ බිහිසුණු වූ.”

යනු කියා සිටියා ය.

නැවැත මවු තොමෝ "පුතේ! ඔබට යහපතෙක් ම වේවා, මාගේ පුත් තෙමේ ගිහිගෙයි ගිනිවලින් නො දැවේවා, ගිනිගත් ගෙයකින් වුවමනා දැය බැහරට ගන්නා සේ ඔබ බුදුසසුනෙහි පැවිදි කරවන ලද්දෙහි ය, ගිහිගෙට නැවැත බසින්නට ගිහිගෙයි කිඳා බස්නට රිස්සෙහි නම් වහා දුවවු, අප රකිවු යි මේ කාරණය කවරක්හු ලවා හඬනගා කියවමු ද, කවරක්හු ලවා ගත්වමු දැ" යි දක්වන්නට,

"දුවහු යන මේ තට – කවරකුට දැන් අවමන්,
කරවමු ද ගිනිගත් – ගෙයින් පිටතට ගත් බඩු,
නැවැත දවනට රිසියහු – වහු ද ඔබ දැන් මෙලෙසින්."

යනු කියා පැය.

සානු, මව මෙසේ කියද්දී සිතා බලා "මට ගිහි බැවින් වැඩෙක් නැතැ" යි කී කල්හි මවු තොමෝ "පුත! යහපතැ" යි සතුටුව පිණ්ඩි බොජුන් වළඳවාලා නැවැත, "පුතේ! ඔබට දැන් වයස කොපමණ වේ දැ?" යි අසා පිරිපුන් වයස් ඇතිබව දැන තුන් සිවුරු පිළියෙල කළා ය. හෙරණ තෙමේ පිරිපුන් වයස් ඇතියේ පිරිපුන් පා සිවුරු ඇතියේ උපසපත් වී ය.

මෙසේ උපසපත් වූ නො බෝ කල් ඇති ඔහුගේ සිතට නිග්‍රහ කිරීමෙහි උත්සාහවත් වූ බුදුරජාණන් වහන්සේ "නන්වැදෑරුම් අරමුණුවල ඇලීම් ගැටීම් මිදීම් ඈ විසින් බොහෝ කල් හැසිර පළ පුරුදුකම් ඇති මේ සිතට නිග්‍රහ නො කරන්නහුට සිත හික්මවා නො ගන්නහුට කිසිදැකත් යහපතක් නම් නො ලැබිය හැකි ය, ඒ නිසා මත් ඇතුන් අකුස්සෙන් හික්මවා ගන්නට උත්සාහ කරන්නා සේ සිතට නිග්‍රහ කිරීමෙහිලා උත්සාහ කළයුතුය" යි වදාරා මේ ධර්මදෙශනාව කළ සේක.

ඉදං පුරෙ චිත්තමචාරි චාරිකං
යෙනිච්ඡකං යත්ථකාමං යථාසුඛං,
තදජ්ජහං නිග්ගහෙස්සාමි යොනිසො
හත්ථිප්පභින්නං විය අඞ්කුසග්ගහො.

මේ සිත පෙර කැමැති අයුරින් කැමැති අරමුණෙක සුවසේ සැරිසරා ඇවිද්දේ ය. මදවැහෙන ඇතකු නිගන්නා අකුස්සක් ගත් අත් ඇති ඇතරුවකු මෙන් මම අද ඒ සිතට නුවණින් නිගන්නෙමි.

ඉදං පුරෙ චිත්තං අචාරි චාරිකං යෙන ඉච්ඡකං යත්ථ කාමං යථාසුඛං = මේ සිත පෙර කැමැති අදුරින් කැමැති අරමුණෙක සුවසේ සැරිසරා ඇවිද්දේ ය.

**විත්ත** නම්: අරමුණු සිතන ශක්තිය යි.[1] ඒ මේ සිතට නිග්‍රහ කරන්නට පෙර රූප ශබ්ද-ගන්ධාදී වූ නොයෙක් අරමුණුවල රාග -ද්වෙෂාදීන්ගේ වශයෙන් යම් ලෙසකින් ඇලෙමින් හැපෙමින් ගැටෙමින් පවත්නා කැමැත්තේ වී නම් ඒ ඒ ලෙසින් සැරිසරමින් ජාතියෙන් ජාතියට යමින් හැසුරුණේ ය. **යෙන, ඉච්ඡකං, චාරිකං, අචරි,** යි පද යොදා ගත් කල්හි මෙයරුත ලැබෙන්නේ ය. එසේ ම රූපාදී වූ යම් යම් අරමුණෙක පවත්නා කැමැත්තේ වී නම් රූපාදී වූ ඒ ඒ අරමුණුවල යම් සේ හැසිරේ නම් එසේ හැසිරෙන්නහුට සැපයෙක් වේ නම් ඒ අයුරින් බොහෝ කලක් සැරසරා ඇවිද්දේ ය. **'යත්ථකාමං, යථා සුඛං, චාරිකං, අචරි,** පද යොදුලීමෙන් මෙයරුත ගැණෙන්නේ ය.

**තං අජ්ජ අහං නිග්ගහෙස්සාමි යොනිසො හත්ථිප්පභින්නං විය අඞ්කුසග්ගහො** = වැගිරෙණ මදදිය ඇති ඇතකු අකුස්සෙන් හික්මවා ගන්නා ඇතරුවකු මෙන් මම අද නුවණින් ඒ සිතට නිග්‍රහ කරන්නෙමි.

**'යොනිසො'** යන මෙහි 'නුවණින් මෙනෙහි කිරීමෙන්' යනු අරුත්. යොනිසො මනසිකාරයෙනැ යි කී සේ ය. **'යොනි'** යනු ඛන්ධකොට්ඨාසකාරණ සන්‍නිමිත්ත ඥාන යනාදී අරුත් කිහිපයෙක එන්නේ ය. මෙහිලා ඥානයෙහි ආයේ ය. **'යොනි'** යනු හා එක් ව සිටි **'සො'** යනු ප්‍රත්‍යයයෙකි. එය ප්‍රකාරාර්ථයෙහි වේ. ප්‍රකාර නම්: හැම දෙනාහට පොදුව සිටියහු ඒ පොදු බැවින් වෙන් කිරීම ය. **"සාමඤ්ඤස්ස භෙදකො විසෙසො පකාරො"** යනු ශාබ්දික වචනයි.

**යොනිසොමනසිකාර** නම්: අනිත්‍යාදීන්හි අනිත්‍ය වශයෙන් පිහිටා සිට ගෙණ මෙනෙහි කිරීම ය. අනිත්‍යාදිවස්තූන්හි අනිත්‍යාදී වශයෙන් නැබුරු වීමෙන් සිත්හි නගින ආවර්ජනා ය.[2]

නො පැමිණි රහත්බව ඇති උතුම් වූ නිවන පතමින් වෙසෙන්නහුට සියසතන්හි උපන් මේ යොනිසො මනසිකාරය නිවන් ලැබීමට බලගතු උපකාරයෙක් ව සිටුනේ ය. ඒ පිණිස නිවන් පතන්නහුට මෙතරම් බලගතු පිහිටෙක් නැත්තේ ය. නුවණින් මෙනෙහි කරණුයේ අකුසල් දුරු කරන්නේ ය. කුසල් වඩන්නේ ය. **"සෙඛස්ස භික්ඛවෙ භික්ඛුනො අප්පත්තමානසස්ස අනුත්තරං යොගක්ඛෙමං පත්ථයමානස්ස විහරතො බාහිරං අඞ්ගන්ති කරිත්වා න අඤ්ඤං එකඞ්ගම්පි සමනුපස්සාමි එවං බහූපකාරං**

---

1. 3. 1. 'චපලං චිත්තං' යනු බලනු.

2. 13. 5. "සො ඉමං ලොකං පභාසෙති"

යථයිදං භික්ඛවෙ යොනිසො මනසිකාරො, යොනිසො භික්ඛවෙ මනසිකරොතො අකුසලං පජහති කුසලං භාවෙති'' යනු සාධක සූත්‍ර යි.

තව ද මෙ ද දතයුතු ය.

> ''යොනිසො මනසිකාරො ධම්මො සෙඛස්ස භික්ඛුනො,
> නාඤ්ඤො එවං බහුකාරො උත්තමත්ථස්ස පත්තියා,
> යොනිසො පදහං භික්ඛු ඛයං දුක්ඛස්ස පාපුණෙ''

යනු. නුවණින් මෙනෙහි කිරීම, යොනිසො මනසිකාරය ශෛක්‍ෂ භික්‍ෂුහට රහත්බව ලැබීම පිණිස උපකාර ව සිටියේ ය. රහත්බව පිණිස එසේ උපකාර ව සිටි අන් එක ද ධර්මයකුත් මම නුවණින් නො දකිමි. භික්‍ෂු තෙමේ නුවණින් වැර වඩනුයේ නිවනට පැමි-ණෙන්නේ ය, යනු එහි අරුත්.

ධර්මදෙශනාවගේ අවසානයෙහි සානු භික්‍ෂු නම සමග බණ ඇසීමට පැමිණ සිටි බොහෝ දෙවතාවුනට ධර්මාවබෝධය වූයේ ය. ඒ ආයුෂ්මත් සානු තෙමේ ද තෙවළා බුදුවදන් උගෙණ මහාධර්ම කථිකයෙක් ව අවුරුදු එක්සිය විස්සක් ආයු ගෙවා මුළු මහත් දඹදිව කළඹා පිරිනිවියේ ය.

## සානුශ්‍රාමණෙරවස්තුව නිමි

# බද්ධෙරක ඇතා

## 23 — 6

කොසොල් රජුට බද්ධෙරක නම් ඇතෙක් සිටියේ ය. ඌ යොවුන් වියෙහි මහබලැති ව සිටියේ ද මහලු වියෙහි ජරායෙන් හා වාතරොගයෙන් මැඩෙන්නට වන. දවසක් මහත් දියවිලකට බැස මඩෙහි ලැගුනේ ගොඩ නගින්නට නො හැක්කේ වී ය. ඒ දුටු මිනිස්සු "මෙබඳු මහත් බල ඇති ව සිටි ඇතා ද දුබලබවට පැමිණියේ වනැ" යි තැන තැන කතා කරන්නට වූහ. රජ තෙමේ එය අසා "යව, ඒ ඇතු මඩින් ගොඩ ලන්නැ" යි ඇතැදුරුට නියම කෙළේ ය. ඇතැදුරු ගොස් එතැන රැස් වූ මිනිසුන් දෙපිලට බෙදා යුදට සැරසුනවුන් සේ දක්වා යුදබෙර ගැස් වී ය. මාන්නයෙන් තදබද වූ ඇතා ඉතා වෙගයෙන් නැගිට ගොඩබිමට අවුත් සිට ගත. එය දුටු භික්‍ෂූන් වහන්සේ ලා බුදුරජුන් වෙත ගොස් උන් වහන්සේට එය දන්වා ලූහ. "මහණෙනි! ඒ ඇත් තමන් පියවි මඩ වගුරෙන් ගොඩ නැගී ගත්තේ ය, තමුසේලා මෙතෙක් කෙලෙස් මඩ වගුරෙන් නො නැගී සිටියහු එහි වැටී ලැගී සිටිනහු ය, එහෙයින් තමුසේලාත් නුවණින් වීයඹී කොට තම තමන් ඒ කෙලෙස් මඩ වගුරෙන් නැගී සිටිවූ" යි වදාරා මේ ධම්දෙශනාව කළ සේක.

**අප්පමාදරතා හොථ සචිත්තමනුරක්ඛථ,**
**දුග්ගා උද්ධරථත්තානං පඞ්කෙ සන්නොව කුඤ්ජරො'ති**

නො පමාබවිහි ඇලුනෝ වවූ. සිය සිත රකිවූ. මඩෙහි ලැගුනු ඇතකු මෙන් තමන් කෙලෙස් දුදුලෙන් ගොඩ නගවූ.

**අප්පමාදරතා හොථ** = අප්‍රමාදයෙහි ඇලුනෝ වවූ. සිහිනුවණින් නො වෙන් ව වසවූ.[1]

**සචිත්තං අනුරක්ඛථ** = සිය සිත රකිවූ.

රූපාදී අරමුණුවල ඇලී බැඳී තමන්ගේ සිත වරදට නො පමුණුවා රැක ගණිවූ. ඒ සඳහා කරණ උත්සාහය සම්‍යක් ප්‍රධාන නම්. ක්‍ෂණමාත්‍රයකුත් නො හැර එක්වන් පැවැත්ම '**රක්ඛථ**' යනු හා එක් වූ 'අනු' යන්නෙන් වදළ සේක.

**දුග්ගා උද්ධරථ අත්තානං** = කෙලෙස් දුදුලෙන් තමන් ගොඩ නගාලවූ.

---

1. 2. 1. 'අප්පමාදෙ' යනු බලනු

**දුර්ග** නම්: මඩ නිසා දිය නිසා වන නිසා කඳු නිසා කණු කටු නිසා චණ්ඩ මෘගයන් නිසා නො යා හැකි අමාරුවෙන් යා යුතු පඞ්ක දුර්ග – ජලදුර්ග – වනදුර්ග – ගිරිදුර්ග – කණ්ටකදුර්ග – ව්‍යාලදුර්ගාදිය යි. **"දුඃඛෙන ගච්ඡන්ත්‍යත්‍රෙති = දුර්ගම්"** යනු නිරුක්ති. එහිලා මත්ස්‍ය-පුරාණයෙහි මෙසේ කී හ.

> **"ධන්වදුර්ගං මහීදුර්ගං නරදුර්ගං තථෛවච**
> **වාර්ක්ෂඤ්චෛවාම්බුදුර්ගඤ්ච ගිරිදුර්ගඤ්ච ෂඩ්විධම්"**යි.

භාෂායෙහි දුර්ගශබ්ද දෙකක් ඇත්තේ ය. එකෙක් නපුංසක ලිඞ්ගික ය. එකෙක් පුංලිඞ්ගක ය. නපුංසක දුර්ග ශබ්දය දුදුලු කියන්නේ ය. පුංලිඞ්ගික ශබ්දය අසුර හෙදයක් කියන්නේ ය.

මෙහිලා 'දුර්ග' යි වදාළේ කෙලෙස් ය. කෙලෙස් නිසා සත්ත්වයනට ලෙහෙසියෙන් පහසුවෙන් යා නො හැකි ය. යා යුත්තේ ඉතා අපහසුවෙන් කෙලෙස් මැඩ ගෙණ ය. එහෙයින් ක්ලේශයෝ ක්ලේශදුර්ග නම් වෙත්. ඒ මේ ක්ලේශදුර්ගයෙන් තමා නගා සිට විය යුතු ය.

**පඞ්කෙ සන්නො ඉව කුඤ්ජරො** = මඩෙහි ගැලුනු ඇතකු සේ.[1]

මඩෙහි ගැලුනු ඇත් අතින් පයින් වෑයම් කොට මඩ වගුරෙන් නැගී ගොඩ බිම පිහිටා ගන්නා සේ තමුසේලා ද කෙලෙස් වගු-රෙන් තමන් නගා නිවන් නැමැති ගොඩ බිම පිහිටුවාල වූ, යනු අරුත්.

ධර්ම දෙශනාවගේ අවසානයෙහි ඒ භික්ෂුහු රහත්බැව්හි පිහිටා ගත්හ.

**බද්දේරක හස්තිවස්තුව නිමි.**

---

1. 23. 1. **'කුඤ්ජරෙ,'** යනු බලනු.

# පාරිලෙය්‍යක ඇතා.

## 23 — 7

**පාරිලෙය්‍යක** මහා ඇතුගෙන් උවැටන් ලබමින් බුදුරජාණන් වහන්සේ පාරිලෙය්‍යක වනයෙහි වැඩ වසන බව දඹදිව පළට ව ගියේ ය. එකල්හි සැවැත් නුවර වැසි **අනාථපිණ්ඩික සෙට්ඨි විශාඛා** මහාඋපාසිකා ආදී වූ උසස් කුලයන්හි වූවෝ අනඳ තෙරුන්ට "ස්වාමීනි! අපට බුදුරජාණන් වහන්සේ දක්වාලනු මැනැවැ" යි දන්වා යැවූහ. දිසාවැසි පන්සියයක් පමණ භික්ෂූන් වහන්සේලා ද පැවරූ වස් ඇතියෝ අනඳ තෙරුන් කරා ගොස් "ඇවැත්නි! බුදුරජාණන් වහන්සේ වෙතින් බණ අසා අදට බොහෝ කලෙක් ගත වී තිබේ, එහෙයින් අපට උන්වහන්සේගෙන් බණක් අසන්නට සලසා ලන්නැ" යි ඉල්ලා සිටියහ. එවිට ආනන්ද ස්ථවිරයන් වහන්සේ ඒ භික්ෂූන් ද කැටුව පාරිලෙය්‍යක වනය බලා පිටත් ව ගියහ. "තෙමසක් එකලා ව වැඩ හුන් බුදුරජුන් වෙතට මෙතෙක් දෙනා සමග යෑම නො සුදුසු ය, එහෙයින් මා තනි ව ම යා යුතුය" යි උන් වහන්සේ ඒ භික්ෂූන් මග නවතා එකලා ව ම බුදුරජුන් වෙතට ගියහ. පාරිලෙය්‍යක ඇත් තෙමේ අනඳ තෙරුන් දැක දඬුකඩක් සොඬෙන් ගෙණ ඉදිරියට පැන්නේ ය. බුදුරජාණන් වහන්සේ එය දැක "පාරිලෙය්‍යක! බැහැර වෙව, නො ද වළකාලව, මෙතෙමේ මාගේ උපස්ථාය කැ" යි වදාළ විට ඇතු දඬුකඩ එහි ම දමා පාසිවුරු ගන්නට ඉදිරියට ගියේ ය. තෙරණුවෝ ඔහුට පාසිවුරු නො දුන්හ. එකල්හි ඇත් තෙමේ "මෙතෙමේ උගත් වත් පිළිවෙත් ඇතියේ නම් බුදුරජුන් වැඩ හිඳිනා ගල්තලායෙහි තමන්ගේ පාසිවුරු නො තබන්නේය" යි සිතමින් බලා සිටියේ ය. උන් වහන්සේ තම පා-සිවුරු බිම තැබූහ. **වත් පිළිවෙත් සරු වූ මහණ කිසිවිටෙකත් තමන්ගේ පා සිවුරු ඈ කිසිවක් ගුරුන් වැඩි මහල් තෙරුන් වැඩ හිඳිනා පුටුවක ඇඳක කලාලයක නො තබන්නේ ය.** තෙරුන් බුදුරජුන් වැඳ එකත් පස්හි හුන් කල්හි උන්වහන්සේ "ආනන්ද! තමුසේ ආවහු එකලා ව දැ?" යි අසා වදාළ සේක. "මම ආයෙම් භික්ෂූන් පන්සියයක් දෙනා සමගය" යි කී කල්හි ඒ නමලා කොහි දැ?" යි ඇසූහ. "ස්වාමීනි! බුදුරජුන්ගේ අදහස් නො දන්නා බැවින් ඔවුන් බැහැර නවතා ආයෙමි" යි කී කල්හි "ඔවුන් කැඳවා-ලවූ" යි වදාළා හු ය. ආනන්ද ස්ථවිරයන් වහන්සේ ඔවුන් කැඳවූහ. බුදුරජාණන් වහන්සේ ඒ භික්ෂූන් සමග පිළිසඳර කතා කොට අවසන් කළ කල්හි "ස්වාමීනි! භාග්‍යවතුන් වහන්සේ බුදු බැවින් සියුමැලි සේක, රජ බැවින් සියුමැලි සේක, තෙමසක් එකලා ව සිටීමෙන් හිඳීමෙන් බුදුරජාණන් වහන්සේ විසින් අන්‍යයන් විසින්

කළ නො හැක්කෙක් ම කරණ ලද්දේ ය, යටත් පිරිසයින් වත් සපයත්නෙක් වත් නො වූයේ ය, යනු අපගේ දැනීම ය''යි ඒ භික්ෂූන් කී කල්හි "මහණෙනි! මේ පාරිලෙය්‍යක ඇතු මාගේ සියලු වතාවත් කටයුතු එකකුත් නො පිරිහෙළා හොඳින් කළා, ඒ කටයුතුවලින් මට කිසිත් අපහසුවෙක් වූයේ නැත, මෙබඳු යහළුවකු ඇතියහුට ඔහු හා එක් ව විසීම ඉතා පහසු ය, හිතක රය. සුදුසු ය, එබඳු යහළුවකු නැතියහුගේ එකලා ව විසීම යහපති''යි වදාරා මේ ධර්ම-දෙශනාව කළ සේක.

**සචෙ ලභෙථ නිපකං සහායං**
**සද්ධිඤ්චරං සාධුවිහාරි ධීරං,**
**අභිභුය්‍ය සබ්බානි පරිස්සයානි**
**චරෙය්‍ය තෙනත්තමනො සතීමා.**

**නො චෙ ලභෙථ නිපකං සහායං**
**සද්ධිඤ්චරං සාධුවිහාරි ධීරං,**
**රාජාව රට්ඨං විජිතං පහාය**
**එකො චරෙ මාතඞ්ගරඤ්ඤෙව නාගො.**

**එකස්ස චරිතං සෙය්‍යො**
**නත්ථි බාලෙ සහායතා,**
**එකො චරෙ න ච පාපානි කයිරා**
**අප්පොස්සුක්කො මාතඞ්ගරඤ්ඤෙව නාගො.**

නුවණැති සමග හැසිරෙණ මනා හැසිරීම් ඇති ධෘතිමත් වූ යහළු-වකු ඉදින් ලබන්නේ නම්, සියලු උවදුරු මැඩ ඔහු සමග සතුටු සිතැතියේ සිහි ඇති ව හැසිරෙන්නේ ය.

නුවණැති සමග හැසිරෙණ මනා හැසිරීම් ඇති ධෘතිමත් වූ යහළු-වකු ඉදින් නො ලබන්නේ නම් දිනා ගත් රට හැර ගිය මහාජනක රජු මෙන් ද වනයෙහි තනි ව වසන මාතඞ්ග නම් පාරිලෙය්‍යක ඇතු මෙන් ද තනි ව හැසිරෙන්නේ ය.

තනි ව හැසිරෙන්නහුගේ ඒ තනි ව හැසිරීම ශ්‍රෙෂ්ඨ ය. අඥනයා කෙරෙහි යහළුබව නැත. වනයෙහි තනි ව වසන මාතඞ්ග නම් පාරිලෙය්‍යක ඇතු මෙන් උත්සාහරහිත ව තනි ව හැසිරෙන්නේ ය. පව් නො ම කරන්නේ ය.

**සචෙ ලභෙථ නිපකං සහායං සද්ධිං චරං සාධුවිහාරිං ධීරං** = නුවණැති සමග හැසිරෙණ මනා හැසිරීම් ඇති ධෘතිමත් වූ යහළු-වකු ඉදින් ලබන්නේ නම්.

**නිපක** නම්: ප්‍රඥ ඇතියේ ය. මුළුමතින් කුසල් දහම් මුහු කර වන්නේ ය. ප්‍රතිපක්ෂධර්මයන්ගෙන් තමා රක්නේ ය. කිසුණු

පිරියම්හි දක්ෂ වූයේ ය. කමටහන් පරිහරණයෙහි ප්‍රවීණ වූයේ ය මනානුවණැයි කියූ සම්ප්‍රජන්‍යයෙන් හා කම්ස්ථාන පරිහරණ ප්‍රඥයෙන් යුක්ත වූයේ ය. මේ මෙය ව්‍යක්ත කරණ අට්ඨකථා: **"නිපකොති ඤාණී පුග්ගලො, නියොසකො කුසලධම්මෙ පාචෙතීති = නිපකො, පටිපක්ඛධම්මෙ අත්තානං නිපාති රක්ඛතීති = නිපකො, සම්පජානොති = නිපකො, කසිණපරිකම්මාදිකුසලොති = නිපකො, කම්මට්ඨානපරිහරණකුසලොති = නිපකො, සම්පජඤ්ඤසඞ්ඛාතෙන ච කම්මට්ඨානපරිහරණපඤ්ඤාය ච සමන්නාගතොති = නිපකො"** යනු.

**'නිපක'** යන්නෙහි ප්‍රවෘත්තිනිමිත්ත **'නෙපක්ක'** ය යි. **නෙපක්ක** නම්: ප්‍රඥ ය. ඕ ද සාමාන්‍යප්‍රඥවක් නො වූ. සර්වාර්ථසිද්ධියෙහි ලා පරිහරණය කළ යුතු ස්ථානොචිත වූ පාරිහාරියප්‍රඥ ය. තව ද මෝ තොමෝ ඉදිරියට යෑම, ආපසු ඊම, ඉදිරිය බැලීම, හාත්පස බැලීම යනාදී වූ මෙතැන් සාත්ථකසම්ප්‍රජන්‍යාදීන්ගේ වශයෙන් පිරිසිඳ දක්වන්නී ය. එසේ ම කමටහන් ඉගෙණීම, පිළිවිසීම, ඇරඹීම, මෙනෙහි කිරීම, නිමිති ගැන්මෙහි නිපුණබව, හළ ආතමාලය ඇති බව අතරතුර නො හැකිළීම, ඉඳුරන් සමකිරීම, වීර්‍ය්‍ය සමබවට පැමිණවීම යනාදී ක්‍රියාවන් පිරිසිඳ දක්වන්නී ය. එහෙයින් මෝ ප්‍රඥ, **'සබ්බකිච්චපරිණායිකා'** යි ද හඳුන්වනු ලබන්නී ය.

තව ද තියුණු වූ විශදබවට පැමිණි සිහිය ද **නෙපක්ක**යි කියනු ලැබේ. මේ එය කියූ සැටි: **"තික්ඛවිසදභාවප්පත්තා හි සති නෙපක්කන්ති වුච්චති"** යි. එහිලා **"පරමෙන සතිනෙපක්කෙන සමන්නාගතො"** යනු සාධක විසින් ගණිත්. එහෙත් ප්‍රධාන විසින් නෙපක්ක නම්. ප්‍රඥ ය. සිහියෙන් තොර ප්‍රඥවක් නො වන බැවින් සිහිය ද නෙපක්ක යි කියන ලදි. ප්‍රඥව ගැණීමෙන් සිහිය ද ගැණෙන්නී ය.

**සහාය** නම්: සියලු කටයුතුවල තමන් හා එක් ව යන්නේ ය. සමග එන්නේ ය. **"සහ අයති කිච්චෙසූති = සහායො, සහ එති ගච්ඡතීති = සහායො"** යනු එහිලා කීහ. **සන්දිට්ඨ, සම්භත්ත** විසිතුදු මෙතෙමේ දෙපරිදි වේ. එහි නෑයකු මෙන් උනුන් විස්වස් විසින් දුටුවිරූයේ **සන්දිට්ඨ.** නෑයකු මෙන් උනුන් විස්වස් විසින් සෙවනය කරණුයේ **සම්භත්ත.** මේ මෙයට ප්‍රතිෂ්ඨා: **"සො විය බන්ධෙ විය අඤ්ඤමඤ්ඤං විස්සාසවසෙන දිට්ඨා දිට්ඨපුබ්බා = සන්දිට්ඨා, සො විය බන්ධවො විය අඤ්ඤමඤ්ඤං විස්සාසවසෙන භජතීති = සම්භත්තා"** යනු.[1]

---

1 6. 3. 'භජෙථ මිත්ත කල්‍යාණ' යනු බලනු.

යහපත් දුටුවන් පහදවන අකලඞ්ක ගති පැවැතුම් ඇතියේ **'සාධුවිහාරී'** නම්. සාධුවිහාරී යනු, **"අප්පණාවිහාරෙණ වා උපචාරෙන වා සමන්නාගතො"**යි යන මෙයින් වඩාලාක් ව්‍යක්ත කරණ ලද්දේ ය. අර්පණාසමාධියෙන් හෝ උපචාර සමාධියෙන් හෝ යුක්ත වූයේ සාධුවිහාරී යනු අරුත්. එයට පහතින් හෝ එයට වැඩියෙන් හෝ නිබොරු වූ කිසිත් කරුණක් නිසා වෙනස් නො වන්නා වූ ස්ථිර වූ සිත් ගන්නා සුලු ගති පැවැතුම් ඇතියේ සාධුවිහාරී යි ගන්නට බාධකයෙක් මෙහි නැත්තේ ය.

**ධීර** නම්: ධෘතිමත් තෙමේ ය. හේ ද නො සැලෙන පැරකුම් ඇතියේ ය. **"කාමං තචො ච න්හාරු ච"** යන ඈ ලෙසින් කියූ වැර ඇතියේ ය.[1]

**පරිස්සය** නම්: උවදුරු ය. ප්‍රාකට – ප්‍රතිච්ඡන්න විසින් ඒ දෙපරිදි වේ. සිංහ ව්‍යාඝ්‍රාදි චණ්ඩ මෘගයන්ගෙන් වන්නා වූ උපද්‍රව ප්‍රකට උවදුරු ය. රාගභය – දොසභයාදීන්ගේ වශයෙන් වන්නා වූ උපද්‍රව ප්‍රතිච්ඡන්න උවදුරු ය. ඒ ප්‍රතිච්ඡන්න උපද්‍රව මෙහි ලා ගැණේ. කයසිත හෝ කය සිත පිළිබඳ සැපත නසනුයේ පරිස්සය නම්. **"බාහිරානං සීහබ්‍යග්ඝාදීනං අබ්භන්තරානං ච කාමච්ඡන්දාදීනං කායචිත්තුපද්දවානං එතං අධිවචනං"** යනු අට්ඨකථා ය. තව ද මෙ කියූ උපද්‍රවයෝ සත්‍වයන් මැඩ ගන්නා බැවින්, කුශල ධර්මයන්ගේ අන්තරාය පිණිස පවත්නා බැවින්, ඒ අත්බැව්හි මේ ලාමකඅකුශලධර්ම ආත්මභාවය ඇසුරු කොට පවත්නා බැවින්, පරිස්සය නම් වෙත්. නිද්දෙසයෙහි ඒ මෙසේ ආයේ ය. **"කෙනට්ඨෙන පරිස්සයා? පරිසහන්තීති=පරිස්සයා, පරිහානාය සංවත්තන්තීති = පරිස්සයා, තත්‍රාසයාති=පරිස්සයා"** යනු විසින්. නිද්දෙසයෙහි කාමසුත්තනිද්දෙසය බැලිය යුතු ය.

**අත්තමන** නම්: ප්‍රීතිප්‍රමෝද්‍යසෞමනස්‍යයෙන් පැතුරුණු සිතැතියේ ය. **"අත්තමනොති පීතිපාමොජ්ජසොමනස්සෙන ඵුටචිත්තො"** යනු විසින් එය කීහ.

**සතිමා** = සිහි ඇතියේ ය.[2]

**නො චෙ ලභෙථ නිපකං සහායං සද්ධිංචරං සාධුවිහාරිං ධීරං** = නුවණැති සමග හැසිරෙණ මනා හැසිරීම් ඇති ධෘතිමත් වූ යහළුවකු ඉදින් නො ලබන්නේ නම්.

**රාජා ඉව රට්ඨං විජිතං පහාය** = දිනූ රට හැර ගිය රජු මෙන් (ද)

---

1. 2. 1. 'ප්‍රසහති ධීරා' යනු බලනු.
2. 2. 2. 'සතිමන්තො, ,, ,,

දිනූ බිම් පෙදෙස් ඇති මහාජනක රජ තෙමේ "මේ රාජ්‍යය මහත් වූ ප්‍රමාදස්ථානයෙකි, එහෙයින් මට මේ රාජ්‍යයෙන් කිනම් වැඩෙක් දැ"යි තමන් දිනූ රට හැර දමා එකලා ව ම මහවල් වැද තවුස්පැවිද්දෙන් පැවිදි ව සිවු ඉරියව්වෙහි ම එකලා ව හැසුරුණේ ය. (මහාජනක ජාතකය බලනු)

**එකො චරෙ මාතඞ්ගාරඤ්ඤෙ නාගො ඉව** = වනයෙහි තනි ව වසන මාතඞ්ග නම් පාරිලෙය්‍යක ඇතු මෙන් (ද) තනි ව හැසිරෙන්නේ ය.

**'එකො'** යනු එකලා – තනි ව යන අරුත් ඇත්තේ ය. ඒ මේ එක ශබ්දය සඞ්ඛ්‍යා – අතුල්‍ය – අසහාය – අන්‍ය – මිශ්‍ර යන අරුත්හි භාෂායෙහි එත්තේ ය. සඞ්ඛ්‍යා – අතුල්‍ය – අසහාය යන අරුත්හි හෙන කල්හි එකවචන වේ. **"එකො රුක්ඛො, සබ්බලොකස්ස එකො රාජා, එකො අරඤ්ඤං පවිසිත්වා"** යනු පිළිවෙළින් එයට නිදසුන් ය. අන්‍ය – මිශ්‍ර අරුත්හි හෙන කල්හි බහුවචන වේ. **අපණ්ණකං ඨානමෙකෙ, පඤ්චාලො ච විදෙහො ච උභො එකා භවන්තු තෙ"** යනු එඅරුත් දෙක්හි පිළිවෙළින් නිදසුන් ය. **"එකා භවන්තු"** යනු **"මිස්සී භවන්තු"** යනු වේ.

**මාතඞ්ග** නම්: ඇත් තෙමේ ය. මහත් වූ සිරුරෙක් ඇත්තේ ද එහෙයිනි. ඒ වනාහි පාරිලෙය්‍යක ඇතු කෙරෙහි ම වෙසෙසින් නැගී සිටියේ නො වේ. පොදු විසින් හැම ඇතකු ම එයින් ගත හැකි ය. වසතු විසින් පාරිලෙය්‍යක ගැණේ.

තව ද "මම ඇතුන් ඇතින්නන් ඇත්නාම්බන් ඇත්පැටවුන් හා ගැටී එක් ව වසන්නෙම් ඔවුන් විසින් තණ අග් කා දමා ඉතිරි වූ තණ මල් කම්, මා සිඳ බිඳ දමූ ලා දලු කොළ ඇති අතු කැබැලි එව්හු කත්. උන් කා ඉතිරි වූ නටු කැබැලි මම කම්, උන් කැලඹූ මඩවතුර බොම්, ඇතින්නෝ මා දියට බස්නා විටත් දියෙන් ගොඩ නගිනා විටත් මාගේ ඇඟ ගටමින් යෙත්. එහෙයින් මම මූන්ගෙන් වෙන් ව එකලා ව වසන්නෙම් යෙහෙකැ" යි සිතා ඇත් සමූහය හැරගිය බැවින් පාරිලෙය්‍යක, මාතඞ්ග නම් වීය යි අටුවාව කියා ලන්නී ය.

ඒ මෙසේ ය:– **"අහං ඛො ආකිණ්ණො විහරාමි හත්ථීහි හත්ථිනීහි හත්ථිකලභෙහි හත්ථිච්ඡාපෙහි ඡින්නග්ගානි චෙව තිණානි ඛාදාමි ඔභග්ගොභග්ගං ච මෙ සාඛාභඞ්ගං ඛාදන්ති ආවිලානි ච පානීයානි පිවාමි ඔගාහා ච මෙ උත්තිණ්ණස්ස හත්ථිනියො කායං උපනිඝංසන්තියො ගච්ඡන්ති, යන්නූනාහං ගණම්හා**

වූපකට්ඨො විහරෙය්‍ය’’ති එවං පටිසංචික්ඛිත්වා ගමනතො මාතඞ්ගොති ලද්ධනාමො එසො ඉමස්මිං අරඤ්ඤෙ අයං හත්ථිනාගො යූථං පහාය සබ්බිරියාපථෙසු එකකො සුඛං චරති’’ති.

**එකස්ස චරිතං සෙය්‍යො** = එකලා වූවහුගේ එකලා හැසිරීම උතුම් වේ.

පැවිදි වූ තැන් පටන් එකලාබවෙහි ඇලුනු පැවිද්දගේ ඒ එකලාබව තනි ව විසීම ඉතා උතුම් යි කී සේ යි.

**නත්ථි බාලෙ සහායතා** = අඥානයා කෙරෙහි යහළුබව නැත.[1]

**එකො චරෙ න ච පාපානි කයිරා, අප්පොස්සුක්කො මාතඞ්ගා අරඤ්ඤෙ නාගො ව** = වනයෙහි තනි ව වසන මාතඞ්ග නම් පාරිලෙය්‍යක ඇතු මෙන් උත්සාහරහිත ව තනි ව හැසිරෙන්නේ ය.[2]

‘‘කරුණු මෙසේ බැවින් තමුසේලා ද ගුණ නුවණින් වැඩුනු යහළුවකු නො ලබන්නාහු නම්, ගුණ නුවණින් පිරිහුනු අඥානයන් හා එක් නො වී එකලා ව හැසිරෙව්. අඥාන වූ පව්ටන් හා එක් වීම එලොව මෙලොව දෙක ම නසාලන බැවින් නුවණැත්තෝ කවදාත් පව්ටන් හා එක් නො වෙත්’’ යි දක්වමින් බුදුරජාණන් වහන්සේ ඒ භික්ෂූන්ට මේ ධර්මදෙශනාව කළ සේක.

ධර්මදෙශනාවගේ අවසානයෙහි ඒ පන්සියයක් භික්ෂූන් වහන්සේලා රහත්බැව්හි පිහිටියාහු ය.

**දිශා වැසි භික්ෂු වස්තුව නිමි.**

1. 4. 2 ‘නත්ථි බාලෙ සහායතා’ යනු බලනු
2. 23. 1. ‘අහං නාගොව’ ,, ,,

## මවුපියනට කැම්බීම් සැපයූ භික්ෂූන් වහන්සේ

### 23 — 8

එක් කලෙක රජදරුවෝ, මිනිසුන් තළා පෙළා මිනිසුන් අයත් වස්තුව පැහැර ගනිමින් එකාධිකාරයෙහි පිහිටා රාජ්‍යය කළහ. බුදුරජාණන් වහන්සේ ඒ රාජ්‍යයන්හි නොයෙක් ලෙසින් ගැහට කොට බලාත්කාරකම් කොට අල්ලා පෙළන තළන මිනිසුන් දැක උන් කෙරෙහි කරුණායෙන් රාජ්‍යය කරන්නවුනට මිනිසුන් නො තළා නො පෙළා නො මරා නො හඬවා නො පරදවා නො දිනවා නො සොස්වා පිටුවහල් නො කොට දැහැමින් සෙමෙන් රාජ්‍යය කරන්නට නො හැකි දැ'' යි සිතා වදාළ සේක. පවිටු මරු බුදුරජුන්ගේ මේ අදහස දැන "ශ්‍රමණ ගෞතම තෙමේ දැහැමින් සෙමෙන් රාජ්‍යය කරන්නට නො හැකිදැ, යි සිතා බලන්නේ ය. ඔහු දැන් රාජ්‍යය කරවනු කැමැත්තේ ය, රාජ්‍යය නම්, පමාවට තැන් ය, එහෙයින් ශ්‍රමණ ගෞතම එය කරවතොත් මට ඔහු අල්ලා ගත හැකි ය, ඒ නිසා මෙහිලා ඔහු උත්සාහවත් කරමි'' යි බුදුරජුන් වෙත ගියේ ය. ගොස්, "ස්වාමීනි! භාග්‍යවතුන් වහන්සේ රාජ්‍යය කරවන්වා, ස්වාමීනි! සුගතයන් වහන්සේ මිනිසුන් නො හඬවා නො තළා දැහැමින් සෙමෙන් රාජ්‍යය කරවන්වා'' යි කියා සිටියේ ය. ඉක්බිති බුදුරජාණන් වහන්සේ "තෝ මෙහිලා මා පිළිබඳ කුමක් දක්නෙහි ද? තෝ කුමක් නිසා මට මෙසේ කියා දැ?''යි අසා වදාළ විට "ස්වාමීනි! භාග්‍යවතුන් වහන්සේ විසින් සතර ඍද්ධිපාදයෝ මැනැවින් වඩනලදහ, භාග්‍යවතුන් වහන්සේ කැමැති වන සේක් නම් හිමවත් පර්වතය සුවර්ණපර්වතයක් කිරීමෙහි සමර්ථ වන සේක, මමත් මිල-මුදලින් කළයුතු හැම දෙයකට උදවු දෙන්නෙමි, එහෙයින් රාජ්‍යය කරවනු'' යි කියාලී ය. ඉක්බිති බුදුරජාණන් වහන්සේ,

"පබ්බතස්ස සුවණ්ණස්ස ජාතරූපස්ස කෙවලි,
ද්විත්තාපි නාලමෙකස්ස ඉති විද්වා සමං චරෙ.

යො දුක්ඛමද්දක්ඛි යතො නිදානං
කාමෙසු සො ජන්තු කථං නමෙය්‍ය,
උපධිං විදිත්වා සඞ්ගොති ලොකෙ
තස්සෙව ජන්තු විනයාය සික්ඛෙ''

යන මේ ගාථා වදාරා මරු තැති ගන්වා "පවිට! තාගේ අවවාදය අනෙකෙක, තා සමග මාගේ අත් කතාවක් නැත, මෙසේ අවවාද කරමි'' යි දන්වා මේ ධර්මදෙශනාව කළ සේක.

**අත්ථම්හි ජාතම්හි සුඛා සහායා**
**තුට්ඨී සුඛා යා ඉතරීතරෙන,**
**පුඤ්ඤං සුඛං ජීවිතසඞ්ඛයම්හි**
**සබ්බස්ස දුක්ඛස්ස සුඛං පහානං.**

**සුඛා මත්තෙය්‍යතා ලොකෙ**
**අථො පෙත්තෙය්‍යතා සුඛා,**
**සුඛා සාමඤ්ඤතා ලොකෙ**
**අථො බ්‍රහ්මඤ්ඤතා සුඛා**

**සුඛං යාව ජරා සීලං සුඛා සද්ධා පතිට්ඨිතා,**
**සුඛො පඤ්ඤාය පටිලාභො පාපානං අකරණං සුඛන්ති.**

කටයුත්තක් උපන් කල්හි යහළුවෝ සැප වෙත්. තමා සතු දැයෙකින් යම් සතුටෙක් වේ ද, එය සැප ය. මරණාසන්නකාලයෙහි පිණ සැප ය. සියලු දුක් නැසීම සැප ය.

ලොකයෙහි මව කෙරෙහි මනා පිළිපැදීම සැප ය නැවැත පියා කෙරෙහි මනා පිළිපැදීම සැප ය. ලොකයෙහි මහණුන් කෙරෙහි මනා පිළිපැදීම සැප ය. නැවැත රහතුන් කෙරෙහි මනා පිළිපැදීම සැප ය,

ජරාව තෙක් සීලය සැප ය. ශ්‍රද්ධාව පිහිටියා සැප ය. නුවණ ලැබීම සැප ය. පව් නො කිරීම සැප ය.

**අත්ථම්හි ජාතම්හි සුඛා සහායා** = යම් කිසි වැඩක් ඇති කල්හි යහළුවෝ සැපයහ.

පැවිද්දකුට සිවුරු මැසීම්, පා පිළිස්සීම් ආදී වූත්, අධිකරණ සන්සිඳවීම් ආදී වූත් කටයුත්තක්, ගිහියකුට සීසෑම්, වෙළෙඳාම්, ආදී වූත්, බලවත් පක්‍ෂ ගෙණ මැඩලීම් ආදී වූත් කටයුත්තක් ඇති විටක, යම් කෙනෙක් ඒ ඒ කටයුතු සපයන්නට සාදා දෙන්නට සන්සිඳවන්නට උන් උන්ට උපකාර කරන්නට පොහොසත් වෙත් ද එබඳු සහායයෝ යහළුවෝ සැප වෙත්.[1]

**තුට්ඨී සුඛා යා ඉතරීතරෙන** = තමා සතු දැයෙකින් යම් සතුටෙක් වේ ද, එය සැප ය.

ගිහියෝ තමන් වෙත වූ තමන් සතු වතුපිටිවලින් ඉඩකඩම් වලින් මිලමුදල්වලින් සෑහීමට නො ගොස් ගෙවල් බිඳීම් මංපැහැරීම් ඈ කෙරෙත් ද, පැවිද්දෝ දැහැමි ව ලත් සිවුපසයෙන් සෑහීමට

1. 23. 7. 'නිපකං සහායං' යනු බලනු

නො ගොස් වෙදකම් කිරීම්, නැකැත් කීම්, කපුකම් කිරීම්, දෙවි දූස්සන් යක් දෙස්සන් වීම් ආදී වූ අනෙසනයන්හි යෙදෙත් ද, ඒ ගිහිපැවිද්දෙ කිසිදකත් ඒ නො පණත්කම්වලින් සැපයක් නම් නො ලබත්. ස්වල්ප වූ හෝ මහත් වූ හෝ තමා සතු තමා වෙත ඇති දෑයෙන් උපදනා සතුට ම ගිහි පැවිද්දනට සැප වේ. තුට්ඨි නම්: සතුට ය. එය දෙලොස් වැඩුරුම් ය.[1]

**පුඤ්ඤං සුඛං ජීවිතසඞ්ඛයම්හි** = මරණය ලං වූ කල්හි තමන් කළ පිණ සැප වේ.

මෙලොව දිවි යවත්නවුනට ද, මෙලොව දිවි යවා මෙයින් ච්‍යුත ව පරලොව යන්නවුනට ද, පරලොව ගියහුට ද පිණම පිහිට වන බැවින් පිණ සැප වේ.[2] මෙහි පංචම තරඞ්ගයෙහි සත්සිය එක්සැටවන පිටුවෙහි එන පටිසැඩි විස්තරය බලනු.

**සබ්බස්ස දුක්ඛස්ස සුඛං පහානං** = සියලු දුක් නැසීම සැප වේ.

මෙහි **"දුක්ඛස්ස පහානං"** යි වදළෙ ර් අර්හත්වය යි. සියලු සසර දුක් නැසී යනුයේ අර්හත්වයෙනි.[3]

**සුඛා මත්තෙය්‍යතා ලොකෙ** = ලොකයෙහි මව කෙරෙහි මනා සේ පිළිපැදීම සැප වේ.

**අථො පෙත්තෙය්‍යතා සුඛා** = නැවැත පියා කෙරෙහි මනා සේ පිළිපැදීම සැප වේ.

**මත්තෙය්‍යතා - පෙත්තෙය්‍යතා** නම්: මවුපියන් කෙරෙහි සම්‍යක් ප්‍රතිපත්තිය යි. මෙදෙකින් ගැණෙනුයේ මවුපියන් කෙරෙහි කළයුතු වූ උවැටන ය. මවුපියෝ දූ පුතුන් තමනට උවැටන් නො කරණබව දත්තෝ නම් තමන් සතුදෑය පොළොවෙහි සඟවා තබත්. අන්හට හෝ දෙත්තෝ ය. මෙසෙයින් දූ පුත්හු මෙලොවින් පිරිහෙන්නෝ ය. ලොකයාගෙන් නිඳා ලබන්නෝ ය. මවුපියන්ගේ දායාදයට අහිමි වන්නෝ ය. මරණින් මතු ගූථ නරකයෙහි උපදින්නෝ පරලොවින් පිරිහෙන්නෝ ය.

බුදුරජානන් වහන්සේ මවුපිය උවැටන මහත් සේ පැසසූහ. මහත් තැන තැබූහ. එහිලා මෙය දත යුත්තේ ය: සැවැත් නුවර එක් සිටුපුත්‍රයෙක් බුදුරජුන්ගෙන් බණ අසා පැහැද පැවිදි වූයේ ය. මොහුගේ මේ පැවිද්දෙන් මොහුගේ මවුපියෝ අනාථ වූවාහු

1. 5. 2. 'සභායතා' යනු බලනු
2. 9. 1. 'පුඤ්ඤං' ,, ,,
3. 11. 6 'දුක්ඛං, දුක්ඛස්සච අතික්කමං' ,, ,,

සිඟාකමින් අනුන්ගේ ගෙවල පිළිකණුවල දවස් යැවූහ. මෙය දත් ඒ මහණ "මම දොළොස් අවුරුද්දක් විතා වැද වෑයම් කොටත් මාගී ඵලයක් ලබන්නට නො හැකිවීමි, මට පැවිද්දෙන් වැඩෙක් නැත, සිවුරු හැරදමා ගොස් මවුපියන් රැක බලා ගන්නෙමි" යි සිතා දෙව්රමට ගියේ ය. එහි දී ඔහුට බුදුරජාණන් වහන්සේ මාතෘ පොෂක සූත්‍රයෙන් බණ වදාළ සේක. මහණ, ඒ බණ අසා "මම ගිහි ව මවුපියන් රැක බලා ගන්නට සිතා ආයෙමි නමුත් බුදුරජා-නන් වහන්සේ ගිහි වුවත් පැවිදි වුවත් මවුපියන් පිළිදගින්නට හැකි ය සි වදාළ බැවින් පැවිදි ව සිට ම මවුපියන් පිළිදගින්නෙමි"යි සිතා පසුදා පිඩු සිඟා ගොස් ලැබුනු කැඳ බත් ආදිය මවුපියන්ට ගෙණ ගොස් දුන්නේ ය. ඉන්නට තැනක් ද පිළියෙල කොට දී දවරු දෙක්හි මවුපියන් පිළිදැග්ගේ ය. ඔහු, ඔහුට ලැබෙන හැම දෑයක් මවුපියන්ට දෙන්නේ ය. වැසියෙන් යමක් ලැබුනොත් තෙමේත් වළඳන්නේ ය. රෙදිපිළියක් ලැබුනොත් එය මවුපියන්ට දී තමා ඔවුන් හැඳ පොරොවා බැහැරට දමන රෙදිකඩ එක් කොට මසා පඬු පොවා හඳින්නේ ය. මෙසේ ඒ මහණ නො කා නො බී කළ ඒ මවුපිය උවටැනෙන් පෙළුනේ වැහරී ගියේ ය. එය දත් අන් මහණෝ ඔහුට ගරහා මෙය බුදුරජුන්ට දන්වා ලූහ. උන් වහන්සේ ඒ මහණ ගෙන්වා "යහපතැ" යි සාධුකාර දී "මහණ! තමුසේ යමක්හට උපස්ථාන කරහු නම් ඔවුහු තමුසේගේ කවුරු දැ?" යි අසා "මවුපියෝ" යි කී කල්හි නැවැතත් තුන් විටක් සාධුකාර දී වදාළ සේක. "මහණ! තමුසේ මා ගියමග ගියහු කදිම ය, මමත් පෙර මවුපියන් පිළිදැග්ගෙමි" යි වදාළ බුදුරජාණන් වහන්සේ මහානිපාතයෙහි **සුවණ්ණ සාමජාතකය** දෙසූ සේක. මවු පිය උවටැනෙහි අනුසස් දක්නට **සුතනුජාතක - නන්දිමිග-ජාතක - ගිජ්ඣජාතකාදිය** බැලිය යුතු ය.

"යො මාතරං වා පිතරං වා මච්චො ධම්මෙන පොසති,
දෙවාපි නං තිකිච්ඡන්ති මාතාපෙත්තිභරං නරං.

යො මාතරං වා පිතරං වා මච්චො ධම්මෙන පොසති,
ඉධ චෙව නං පසංසන්ති පෙච්ච සග්ගෙ පමොදති."

යනු ද මෙහිලා දතයුතු ය. යම් මිනිසෙක් දැහැමින් සෙමෙන් මව හෝ පියා හෝ දැහැමින් පොෂණය කෙරේ නම් ඔහුට දෙවියෝ ද ගරුබුහුමන් කරන්නෝ ය. උවදුරුවලින් රැක ගන්නෝ ය. එසේ ම ඔහුට මෙලොව දී ම පසසන්නෝ ය. මරණින් මතු දෙව් ලොව උපදින්නෝ ය, යනු එහි කෙටි අරුත්.

මවුපිය උවටැනෙහි අනුසස් ඉතා බොහෝ බැවින් දූ පුතුන් විසින් ඉතා අලුයම නැගී සිට මුවදොනා දිය හා දැහැටිදඬු දී

නැවැත කවා පොවා නාවා හිස තෙල් ගා ඇඳුම් කැඩුම් දී නිතර දෙවේලෙහි සොයා බැලිය යුතු ය. වැඳුම් පිදුම් කළ යුතු ය. මෙසේ මවු පිය උවටැනෙහි යෙදී ගත් දූ පුත්තු එලොව මෙලොව දෙක්හි ම යහපත දකින්නෝ ය. එහෙයින් මවුපියන් කෙරෙහි මනාව පිළිපැදීම සැපය, සිද, උතුම් මඟුලෙකැ, සිද වදාළ සේක.

මෙ ද දත යුතු ය: **“ද්වින්නාහං භික්ඛවෙ න සුප්පතිකාරං වදාමි, මාතුච්ච පිතුච්ච, එකෙන භික්ඛවෙ අංසෙන මාතරං පරිහරෙය්‍ය, එකෙන අංසෙන පිතරං පරිහරෙය්‍ය, වස්සසතායුකො වස්සසතජීවී. සො ච නෙසං උච්ඡාදනපරිමද්දනන්හාපන සම්බාහනෙන, තෙපි තත්ථෙව මුත්තකරීසං චජෙය්‍යුං, නත්වෙව භික්ඛවෙ මාතාපිතුන්නං කතං වා හොති පතිකතං වා”** යනු හා,

මහණෙනි! මවට හා පියාට හා ප්‍රත්‍යුපකාර කිරීම පහසු ය සි මම නො කියමි. අවුරුදු සියයක් ආයු ඇති ව අවුරුදු සියයක් ජීවත්වන්නෙක් එක් උරහිසක මවත් එක් උරහිසක පියාත් නංවා ගෙණ බිම නො තබා ම පිළිදගින්නේ වේ ද, හේ ම මවුපිය දෙදෙනාගේ සිරුරු ඉලීම් පරිමැදීම් නැවීම් මිරිකීම්වලින් උවැටන් කරන්නේ ද, මවුපියන් දෙඋරහිසමත හිඳ ම මළ මූ පහකරත්, එය ඉවසන්නේ ද ඒ කිසිවකින් මවුපියන්ට උපකාර ප්‍රත්‍යුපකාර කට හැකි නො වේ, යනු එහි කෙටි අදහස ය.

**“ඉමිස්සා ච භික්ඛවෙ මහාපඨවියා පහූතසත්තරතනාය මාතාපිතරො ඉස්සරාධිපච්චෙ රජ්ජෙ පතිට්ඨාපෙය්‍ය, නත්වෙව භික්ඛවෙ මාතාපිතුන්නං කතං වා හොති පතිකතං වා. තං කිස්ස හෙතු: බහුකාරා භික්ඛවෙ මාතාපිතරො පුත්තානං ආපාදකා, පොසකා, ඉමස්ස ලොකස්ස දස්සෙතාරො”** යනුත්.

මහණෙනි! බොහෝ සත්රුවන් ඇති මේ මහාපොළොවෙහි මවු පියන් සක්විති රජයෙහි පිහිටු වන්නේ නමුත් මවුපියන්ට උපකාර කරණ ලද්දේ හෝ ප්‍රත්‍යුපකාර කරණ ලද්දේ හෝ නො වේ ම ය. කුමක් හෙයින්ද? යත්: මවුපියෝ දූ පුතුනට බොහෝ උපකාර ඇතියහ. දූ පුතුන් වඩන්නෝ ය: පොෂණය කරන්නෝ ය. මේ ලොකය දක්වන සුල්ලෝ ය.

**“සබ්‍රහ්මකානි භික්ඛවෙ තානි කුලානි, යෙසං පුත්තානං මාතාපිතරො අජ්ඣාගාරෙ පූජිතා හොන්ති, සපුබ්බාචරියකානි භික්ඛවෙ තානි කුලානි, යෙසං පුත්තානං මාතාපිතරො අජ්ඣාගාරෙ පූජිතා හොන්ති, සාහුනෙය්‍යකානි භික්ඛවෙ තානි කුලානි, යෙසං පුත්තානං මාතාපිතරො අජ්ඣාගාරෙ පූජිතා හොන්ති”** යනුත්.

මහණෙනි! දූ පුතුන් විසින් මවුපියෝ සියගෙයි පුදන ලද්දාහු වෙත් ද ඒ කුලයෝ බ්‍රහ්මයා සහිතය හ, පූර්වාචාර්යයන් සහිතය හ, ආහුනෙය්‍යයන් සහිතය හ, යනු එහි ඉතා කෙටි සිංහලය යි.

“බ්‍රහ්මාති මාතාපිතරො පුබ්බාචරියාති වුච්චරෙ,
ආහුනෙය්‍යා ච පුත්තානං පජාය අනුකම්පකා.

තස්මා හි නෙ නමස්සෙය්‍ය සක්කරෙය්‍යාථ පණ්ඩිතො,
අන්නෙන අථ පානෙන වත්ථෙන සයනෙන ච
උච්ඡාදනෙන නහාපනෙන පාදානං ධොවනෙන ච

තාය නං පාරිචරියාය මාතාපිතුසු පණ්ඩිතා,
ඉධ චෙව නං පසංසන්ති පෙච්ච සග්ගෙ ච මොදති”

මවුපියෝ දූ පුතුනට බ්‍රහ්මයන් යි ද පූර්වාචාර්යයන් යි ද ආහුනෙය්‍යයන් යි ද දූ පුතුනට අනුකම්පා කරන්නාහ යි ද කියනු ලැබෙත්.

එහෙයින් නුවණැත්තේ ඔවුන් නමදනේ ය. නැවැත ආහාරයෙන් පානයෙන් වස්ත්‍රයෙන් යහනින් ඇඟ ඉලීමෙන් නැවීමෙන් පා දෙවීමෙන් සඞ්ග්‍රහ කරන්නේ ය.

මවු පියන් කෙරෙහි වූ ඒ මෙහෙ කිරීමෙන් නුවණැත්තෝ ඒ දූ පුතුන් පසසත්. ඔවුහු පරලොව ගියෝ ස්වර්ගයෙහි ද සතුටු වෙත්, යනු මෙහි අදහසි.

ශ්‍රද්ධා නැති මවුපියන් ශ්‍රද්ධාසම්පත්තියෙහි, මසුරුවූවන් ත්‍යාග සම්පත්තියෙහි, නුවණ නැත්තවුන් ප්‍රඥාසම්පත්තියෙහි පිහිටු වන්නේ ම මවුපියන් කළ උපකාරයට උපකාර කළේත් ප්‍රත්‍යුපකාර කළේත් එයට අධික ව උපකාර කළේත් වන්නේ ය යි දතයුතු ය.

**සුඛා සාමඤ්ඤතා ලොකෙ** = මහණුන් කෙරෙහි මනා සේ පිළිපැදීම සැප වේ

සියලු දුක් ගෙවා නිවන් ලැබීමෙහි එක් ම බලාපොරොත්තු ඇති ව ගිහිබව හැර කිසිත් දූයෙක නො ගැටී මහණදම් පිරීමෙන් පව් සන්සිඳුවීමෙහි යෙදුනෝ ශ්‍රමණයෝ ය. මෙහි උන්වහන්සේලාට සිවුපසයෙන් කරණ පුදසැලකිලි වැඳුම් පිදුම් ආදිය **සාමඤ්ඤතා** නම්. **“සාමඤ්ඤතාති පබ්බජිතෙසු සම්මාපටිපත්ති”** යනු කීයේ ඒ වග ය.[1] එසේ කරණු ලබන්නහුට ඒ පිදීම් වැඳීම් සැප පිණිස පවත්නා බැවින් මහණුන් කෙරෙහි මනා සේ පිළිපැදීම සැපය යි වදාළ සේක.

**අථො බ්‍රහ්මඤ්ඤතා සුඛා** = නැවැත රහතුන් කෙරෙහි මනා සේ පිළිපැදීම සැප වේ.

---

1. 1. 14. ‘සාමඤ්ඤස්ස හොති’ යනු බලනු

පව් බැහැර කළ මුළුමනින් පව් සෝදාහළ උත්තමයෝ බ්‍රාහ්මණයෝ ය. ඔවුහු නම් බුදු පසේබුදු බුදුසව්වෝ ය. සිවුපසය පිදීමෙන් උන්වහන්සේලා පිළිදගුම් කිරීම පොෂණය කිරීම මෙහි බ්‍රහ්මඤ්ඤතා නම්. **"බ්‍රහ්මඤ්ඤතාති බාහිතපාපෙසු බුද්ධපච්චෙකබුද්ධ බුද්ධසාවකෙසු සම්මා පටිපත්තියෙව"** යනු අටුවා.

**සුඛං යාව ජරා සීලං** = ජරාව තෙක් සීලය සැප වේ.

පන්සිල් – අටසිල් – දසසිල් ඈ හැම සීලයෙක් ජරාව තෙක් ම මහලු ව මැරෙණ තෙක් ම සැප වේ. "අනේ! මෙතෙමේ සිල්වතැ"යි දෙවියන් සහිත ලොකයාගෙන් ලැබෙන පැසසුම් රැකුම් වැඳුම් පිදුම් ගරුබුහුමන් සීමා රහිත ය. දෙවියනට ප්‍රිය වූයේත් මිනිසුනට ප්‍රිය වූයේත් යක් රකුස් ඈනට ප්‍රිය වූයේත් සිල් ඇත්තේ ය. සිල්වත් තෙමේ ම සමාජයෙහි තෙජස්වී ය. නො පසු බස්නේ ය.[1]

**සුඛා සද්ධා පතිට්ඨිතා** = ශ්‍රද්ධා ව පිහිටියා සැප වේ.

ලෞකික – ලොකොත්තර විසින් දෙ පරිදි වූ ශ්‍රද්ධා ව මනා ව පිහිටියා සැප වේ.[2]

**සුඛො පඤ්ඤාය පටිලාභො** = නුවණ ලැබීම සැප වේ.

ලෞකික – ලොකොත්තර ප්‍රඥාවගේ පිළිලැබීම සැප වේ. ලෞකිකකුශලචිත්තයන්හි යෙදෙන විදශීනාප්‍රඥාව ලෞකික ය. මගපල සිත්වල යෙදෙන ප්‍රඥාව ලොකොත්තර ය. ලොකොත්තර ප්‍රඥාප්‍රතිලාභයෙන් ම සසර දුක් නැසී යන්නේ ය. ලොකොත්තර ප්‍රඥාප්‍රතිලාභයට ලෞකිකප්‍රඥාව නිදෙස් අරමුණෙහි ලා වැඩිය යුතු ය.[3]

**පාපානං අකරණං සුඛං** = පව් නො කිරීම සැප වේ.

පව් කිරීමට මුල් වන ලොභ–ද්වෙෂ–මොහයන් චතුර්විධමාර්ග ඥානයෙන් මුලසුන් කිරීම පව් නො කිරීම වේ. එය හැම සැපයකට මුල් වන්නේ ය. එහෙයින් පව් සිඳහැරීම සැපය යි වදාළ සේක.

ධර්මදෙශනාවගේ අවසානයෙහි බොහෝ දෙවියනට ධර්මාවබොධය වූයේ ය.

**මාරවස්තුව නිමි.**

සකලජනධර්මාර්ථසඬ්ග්‍රහාභිලාෂී **පණ්ඩිත** අම්බලම්ගොඩ **ධම්මකුසල** ස්ථවිරයන් කළ **සද්ධර්මසාගර** නම් වූ **ධර්මපදවර්ණනා**යෙහි නාගවර්ගාත්මක ත්‍රයෝවිංශතිතම තරඞ්ගය නිමියේ ය.

---

1. 4. 10. 'සීලවතං ගන්ධො' යනු බලනු
2. 10. 10. 'සද්ධාය' ,, ,,
3. 2. 5 'පඤ්ඤාපාස.දං' ,, ,,

# බ්‍රාහ්මණවග්ගය

# කපිල මත්ස්‍යයා

## 24 — 1

යට ගිය දවස කසුප් බුදුරජුන් පිරිනිවන් පා වදාළ කල්හි කුලදරු දෙබෑ කෙනෙක් ගෙන් නික්ම උන්වහන්සේගේ ශ්‍රාවකයන් සමීපයෙහි පැවිදි වූහ. උන් දෙන්නා අතුරෙහි වැඩි මහල්ලා ශොධන නම් වී ය. බාලයා කපිල නම් ය. මවු තොමෝ සාධිනී නම්. බාල බුහුන නමින් තාපනා ය. ඈලා ද මෙහෙණන් කෙරෙහි පැවිදි වූහ. මෙසේ පැවිදි වූ උන් අතුරෙහි දෙබෑයෝ ආචාය්‍ය්‍ර - උපාධ්‍යායනට කළමනා වත් පිළිවෙත් කොට දවසක් ගුරුන් වෙත එළැඹ "ස්වාමීනි! මේ ශාසනයෙහි ධුර කෙතෙක් දැ?"යි විචාරා ග්‍රන්ථධුර-විදර්‍ශනාධුර විසින් ධුර දෙකෙකැ යි කියූ කල්හි වැඩි මහල්ලා "විදර්‍ශනා ධුරය පුරමි" යි පස් අවුරුද්දක් ගුරුන් වෙත රැඳී රහත්බව තෙක් කමටහන් උගෙණ වන වැද උත්සාහ කොට රහත්බවට පැමිණියේ ය. බාලයා "මම තරුණයෙමි, මහලු ව ගිය කල්හි විදර්‍ශනා ධුරය පුරන්නෙමි" යි ග්‍රන්ථධුරය පටන් ගෙණ තෙවළා දහම් උගත්තේ ය. පය්‍ය්‍ර්‍ාප්තිය නිසා ඔහු පිරිවරින් මහත් විය. මහත් වූ පිරිවර නිසා ලාභසත්කාරත් මහත් ව උපන. හෙතෙමේ උගත් කම නිසා හටගත් මදයෙන් මත් ව ලාභාශායෙන් මැඩුනේ අතිපණ්ඩිතමානයෙන් අනුන් විසින් කියූ කැපය නො කැපය යි ද, නො කැපය කැපය යි ද කියන්නේ ය. එසේ ම නිවරද වරද ය යි ද, වරද නිවරද ය යි ද කියන්නේ ය. මෙසේ කියත්, ප්‍රියශීලී භික්ෂූන් විසින් "ඇවැත්නි, කපිල! මෙසේ නො කියව" යි ධර්‍මවිනය පෙන්වා අවවාද කරණු ලබන්නේ ද "තෙපි කුමක් දන්නහු? තෙපි හිස් මිටි වැනියහු" යි ඈ කියා ඔවුනට ගරහමින් අවමන් කරමින් හැසිරෙන්නේ ය.

එකල්හි ඔහුගේ සහෝදර ශොධන තෙරුන්ට ද මේ වග සැලකළහ. ශොධන ස්ථවිර තෙමේ ඔවුන් කී කතාව අසා කපිලයන් වෙතට ගොස් "කපිල! තාගේ කතාව වරද සහිත ය, තොප වැන්නවුන්ගේ ධර්‍ම විනයානුකූල පැවැත්ම ශාසනයෙහි ආයුෂය ය, එහෙයින් මනා පැවැත්ම හැර දමා කැප දැය බැහැර කරමින් අකැප දැය කැප ය යි ගණිමින් පැසුළු දනා නො මග යවමින් නො හැසිරෙව, එසේ නො කියව" යි අවවාද කෙළේ ය. කපිල තෙමේ සහෝදරයාගේ අවවාද ද නො පිළිගත්තේ ය. ඒ දුටු ශොධන ස්ථවිර තෙමේ නැවැත නැවැතත් දෙතුන් විටක් එසේ ම අවවාද කොට අවවාද නො පිළිගත්තහු දැක "මෙ තෙමේ මා කියන්න නො පිළිගන්නේය" යි සිතා "ඇවැත්නි! කපිල මා කළ අවවාද නො පිළිගණිහි නම් ඕනෑ හැටියක් කොට පෙණී සිටුව"යි

කියමින් යන්නට ගියේය. අන්‍ය වූ ප්‍රියශීලී භික්ෂූන් වහන්සේලා ද ඔහු හා තුබූ ආශ්‍රය අත් හළහ. එතැන් පටන් කපිල තෙමේ පිළිකුල් හැසිරීම් ඇතියේ පිළිකුල් හැසිරීම් ඇත්තන් පිරිවරා ගෙණ වසනුයේ දවසක් පොහෝගෙයි පා මොක් උදෙසමි යි තල් වැට ගෙණ ධර්මාසනයෙහි හිඳ ''ඇවැත්නි! මෙහි රැස් වූ භික්ෂූන්ට පාමොක් වණපොත් දැ?'' යි විචාරා 'මොහුට මෙයට පිළිවදන් දීමෙන් කවර වැඩෙක් දැ'' යි නිහඬව හුන් භික්ෂූන් දැක ''ඇවැත්නි! ධර්මය කියා එකෙක්, විනය ය කියා එකෙක් නැත, එහෙයින් ප්‍රාතිමොක්ෂය ඇසුව ද නො ඇසුව ද වැඩෙක් නැතැ'' යි ආසනයෙන් නැගී සිටියේ ය.

මෙසේ මේ කපිල තෙමේ කසුප් බුදුරජුන්ගේ පර්‍ය්‍යාප්තිශාසනය පසු බැස්ස වී ය. ශොබන සථවිරයන් වහන්සේ ද පිරිනිවියහ. කපිල ආයු කෙළවර මැරී ගොස් අවීචිමහානිරයයෙහි උපන. ඔහුගේ මව හා බුහුන හා දෙදෙන කපිලයා වැති ව ප්‍රියශීලී භික්ෂූන්ට ඇණුම් බැණුම් ගැරහුම් කොට සිට මැරී ගොස් නිරයයෙහි උපන්හ. ඒ කාලයෙහි පන් සියයක් පමණ පුරුෂයෝ ගම් පැහැරීම් ඈ නො පණත්කම් කරමින් සොරකමින් දිවි පවත් වන්නෝ දනවු වැසි මිනිසුන් විසින් ලුහුබඳනා ලදුව වන වැද එහි ද කිසිත් පිළිසරණක් නො දක්නාහු වන වැසි මහණකු දැක වැඳ ''ස්වාමීනි! අපට පිහිටවනු මැනැවැ'' යි කියා සිටියහ. එකල්හි ඒ සථවිර තෙමේ ''මිනිසුනට සීලය තරම් අන් පිහිටෙක් නැත, එහෙයින් තෙපි සියල්ලෝ පන්සිල් සමාදන් වහු'' යි කී ය. ඔවුහු ද පන්සිල් සමාදන් වූහ. නැවැත සථවිර තෙමේ ''තෙපි දැන් සිල්වත්, එහෙයින් දිවි ගිය ද සිල්පද නොයික්මවා එය රැක ගණිවු, කිසිවකු කෙරෙහි නපුරු සිතිවිලි නො උපදවා මෙත් සිතින් වසවු'' යි අවවාද කෙළේ ය. ඔවුහු ''යහපතැ''යි ඒ අවවාද පිළිගත්හ. ඒ අතර ඔවුන් ලුහු බැඳ ආ දනවුවැස්සෝ එතැනට ගොස් ඇත මැත සොයන්නෝ ඒ සොරුන් දැක උන් අල්ලා ඇණ කොටා මරා දැමූහ. එකකුත් ඉතිරි නො කළහ. මැරුම් කෑ ඔවුහු සියල්ලෝ සමාදන් ව ගත් සිල් බෙලෙන් දෙව්ලොව උපන්හ. එහි සොරදෙටු, දෙටු දෙව්පුත් වී ය. ඔවුහු අනුලොම් පිළිලොම් විසින් එක් බුද්ධාන්තරයක් ගෙවා දෙව්ලොව සැරිසරා අප බුදුරජුන් දවස සැවැත් නුවර දොර සමීපයෙහි වූ පන්සියයක් පමණ කෙවුල් ගෙවල් ඇති කෙවුල් ගමක උපන්හ. දෙටු දෙව්පුත් දෙටු කෙවුලාගේ ගෙයි උපන්නේ ය. අන්හු අන් කෙවුල් ගෙවල උපන්හ. මොවුන් හැමගේ මවුකුස පිළිසිඳ ගැණුම හා මවුකුසින් බිහිවීම එක් ම දවසෙහි සිදු වූයේ ය. කෙවුල් දෙටු තෙමේ ''මෙගම අද උපන් දරුවෝ තවත් වෙත් දැ'' යි සොයා තවත් දරුවන් ඉන්නා

බව අසා "ඔවුන් මා පුතුට යහළුවන් විය යුතු ය" යි ඒ දරුවන් හදා වඩා ගන්නට ඔවුන්ගේ මවු පියනට ඇඳුම් කෑඩුම් කෑම් බීම් ඈ හැම දෑයක් දෙවූයේ ය. ඔවුහු වැලිකෙළියෙහි පටන් යහළු වූවෝ පිළිවෙළින් වැඩී විය පැමිණියහ. දෙටු කෙවුලාගේ පුත් ම ඔවුන්ගේ ප්‍රධානයා විය.

කපිල, එක් බුද්ධාන්තරයක් අවීචිමහානරකයෙහි පැසී නො ගෙවී ඉතිරි ව තුබූ කර්මයාගේ විපාක වශයෙන් ඒ කාලයෙහි **අචිරවතී** ගඞ්ගායෙහි රන්වන් වූ පළමුව සිල් රැක පසුව බොරු කියා හැසුරුණු බැවින් තදින් දුගඳ හමන මුව ඇති මාළුවෙක් ව උපන්නේ ය. දවසක් ඒ කෙවුල් දරුවෝ මසුන් අල්ලන්නට දැල් කඹ ආදිය ගෙණ ගඟට ගොස් එහි දැල් දැමූහ. මේ කපිල මසු ඒ දැලෙහි බැඳුනේ ය. දැල ගොඩට ඇද ගත් කල්හි එහි බැඳී හුන් මසු දැක කෙවුල් ගම් වැස්සෝ "අපගේ දරුවන් පළමු කොට දැමූ දැලට රන්වන් මසෙක් බැඳුනේ වන, මේ නිසා රජ්ජු ද අපට බොහෝ මිල මුදල් තෑගි බෝග දෙනු ඇතැ" යි හඬ නගා කියන්නට වූහ. ඔවුහු මසු බඳුනෙක දමා දිය වක්කර බඳුන ඔසොවා ගෙණ රජ මාලිගාවට ගෙණ ගියහ. රජ්ජු ද බඳුන ඔසොවා ගෙණ ආවුන් දෙස බලා "කිමැ?" යි විචාළ කල්හි "දෙවයන් වහන්ස! මසෙකැ" යි කීහ. රජ්ජු එහි හුන් රන්වන් මසු දැක "මේ මසු රන්වන් වූයේ කුමක් නිසා?යි මෙය දන්නාහු බුදුරජාණන් වහන්සේ ය" යි බඳුන පිටින් මසු ගෙන්වා ගෙණ බුදුරජුන් වෙත ගියේ ය. මසු කට හරිත් ම මුළු දෙව්රම් වෙහෙර දුගඳින් පිරී ගියේ ය. ඉක්බිති රජ තෙමේ "ස්වාමීනි! මේ මසු රන්වන් වන්නටත් කටින් දුගඳ හමන්නටත් හෙතු කවරේ දැ?" යි ඇසී ය. "මහරජ! මූ පෙර කසුප් බුදුරජුන්ගේ සසුනෙහි කපිල නමින් ප්‍රසිද්ධ වූ ත්‍රිපිටක ධර්මයෙහි නුවණැති උගත් මහණෙක් වී ය, එයින් මහත් පිරිවර ඇතියේ ලාභාශායෙන් මැඩුනේ තමන් කියන බස් නො ද පිළිගන්නවුනට ඇණුම් බැණුම් ගැරහුම් කරමින් උන්වහන්සේගේ සසුන ද පිරිහෙළූයේ ය, හේ ඒ පාපකර්මයෙන් අවීචියෙහි ඉපද පැසී නො ගෙවී ඉතිරි වූ පාපකර්මයාගේ විපාක වශයෙන් දැන් මත්ස්‍යයෙක් ව ඉපද සිටුනේ ය, යම්හෙයකින් මූ එදා බොහෝ කලක් බුදුවදන් අන්හට කියා වූයේ ද; එකල්හි බුදුරජුන්ගේ ගුණ කීයේ ද, එහෙයින් මූ රන්වන් වූයේ ය, එදා සිල්වත් මහණුන්ට ඇණුම් බැණුම් ගැරහුම් කළ බැවින් ඒ පාප කර්මයෙන් දැන් මූගේ කටින් දුගඳ හමන්නේ ය, මහරජ! මේ වග මූ ලවා ම කියවම් දැ" යි අසා වදාළ කල්හි "ස්වාමීනි! යහපති, කියවාලනු මැනැවැ" යි කී ය. ඉක්බිති බුදුරජාණන් වහන්සේ "තෝ කපිලයෙහි? ස්වාමීනි! එසේ ය මම කපිලයෙමි, කොහි සිට ආයෙහි? ස්වාමීනි! අවීචිමහා

නිරයෙහි ඉපද සිට, තාගේ දෙටුබෑ වූ සාධන කොහි? සවාමීනි! පිරිනිවියේය ඔහු, තාගේ මව වූ සාධනී කො තැන? සවාමීනි! ඇයත් නිරයේ, තාගේ කනිටු බුහුන තාපනා? ඇත් නිරයේ, දැන් කො තැන සත්නෙහි? සවාමීනි! නැවැතත් අවීචියටැ''යි ඔහු ලවා ම මෙසේ කියූ වූ සේක. කපිල බුදුරජුන්ගේ ඇසිම්වලට මෙසේ පිළිතුරු දී විපිළිසරින් මැඩුනේ ඒ දියබඳුනෙහි හිස ගසා එතැන ම මැරී ගොස් නැවැතත් නිරයෙහි උපන්නේ ය. මහාජන තෙමේ සංවෙගයට පැමිණියේ ය. ලොම් නැගුනු සිරුරු ඇත්තේ වී ය. භාග්‍යවතුන් වහන්සේ එවේලෙහි එහි රැස් වූ මහාජනයාගේ සිත් හැසිරීම් බලා එතැනට සුදුසු පරිදි **"ධම්මචරියං බ්‍රහ්මචරියං එතදාහු වසුත්තමං"** යන සූත්‍රනිපාතයෙහි කපිල සූත්‍රය වදාරා මේ ධර්මදෙශනාව කළ සේක.

**මනුජස්ස පමත්තචාරිනො තණ්හා වඩ්ඪති මාලුවා විය,**
**සො පලවතී හුරාහුරං ඵලමිච්ඡංව වනස්මිං වානරො.**

**යං එසා සහතෙ ජම්මී තණ්හා ලොකෙ විසත්තිකා,**
**සොකා තස්ස පවඩ්ඪන්ති අභිවට්ඨංව බීරණං.**

**යො චෙ තං සහතී ජම්මිං තණ්හං ලොකෙ දුරච්චයං,**
**සොකා තම්හා පපතන්ති උදබින්දූව පොක්ඛරා.**

**තං වො වදාමි භද්දං වො යාවන්තෙත්ථ සමාගතා,**
**තණ්හාය මූලං ඛණථ උසීරත්ථොව බීරණං,**
**මා වො නලංව සොතොව මාරො භඤ්ජි පුනප්පුනන්ති.**

පමාව හැසිරෙණ සුලු මිනිසාට තෘෂ්ණා තොමෝ මාලුවා වැලක මෙන් වැඩේ. හෙතෙමේ වනයෙහි ගෙඩි කනු කැමැති වන වඳුරකු මෙන් භවයෙන් භවයට පැන දුවත්තේ ය.

ලාමක වූ විසත්තිකා නම් මේ තෘෂ්ණා තොමෝ ලොකයෙහි යමකු මැඩලා ද ඔහුට නැවැත නැවැත (වැස්සෙන්) තෙමනලද බෙරු තණ මෙන් ශොකයෝ වැඩෙත්.

ලොකයෙහි යමෙක් ලාමක වූ නො ඉක්මවිය හැකි වූ මේ තෘෂ්ණාව මැඩලා ද ඔහු කෙරෙන් ශොකයෝ පොකුරුපතින් (ගිලිහෙන) දියබිඳු මෙන් ගිලිහී වැටෙත්.

යම් පමණ දෙනෙක් මෙහි රැස් වූවාහු ද ඒ තොපට වැඩෙක් වේවා. එහෙයින් තොපට කියමි. සුවඳහොටමුලින් ප්‍රයොජන ඇතියේ යම් සේ බෙරුතණ සාරා ද එමෙන් තෘෂ්ණාවගේ මූල උදුරවු. සැඩපහර, හුණබට පඳුරක් මෙන් මාර තෙමේ තොප නැවැත නැවැත නො මඩීවා.

**මනුජස්ස පමත්තචාරිනො** = පමාව හැසිරෙණ සුලු මිනිසාට.

**මනුජ** යනු, මිනිස්හට නමෙකි. සත්ත්වයන් පිළිබඳ හිතාහිත දන්නේ මනුජ නැමැයි කියනලදී. මේ ඒ කීම:- **"මනනි ජානාති සත්තානං හිතාහිතන්ති = මනුජො"** යනු. ආදිකල්පික මනු ගෙන් උපන් බැවිනුදු 'මනුජනම් වී ය' යි ද කියනු ලැබේ.

**පමත්තචාරී** නම්: සිහියෙන් තොරබව ලකුණු කොට සිටි පමා-යෙන් ප්‍රමත්ත ව දවසරිනුයේ ය. එබඳු පුද්ගලයාහට ධ්‍යානයෙක් නැත. විදර්ශනා මාර්ගඵල ද නැත්තේ ය.[1]

**තණ්හා වඩ්ඪති මාලුවා විය** = තෘෂ්ණාව මාළුවා වැල මෙන් වැඩේ.

රුකෙක ඒති දූවටී වැඩෙන මාළුවා වැල තමන් විසින් වෙළා ගත් රුකෙහි විනාශය පිණිස වන්නා සේ සදොර උපදනා රූප තෘෂ්ණාදී වූ සවැදෑරුම් තෘෂ්ණාව විස්තාර ව ගියා ප්‍රමත්තව හැසිරෙණ සිහිනුවණින් තොර මිනිසාගේ විනාශය පිණිස වැඩේ.[2]

**සො පලවති හුරාහුරං ඵලං ඉච්ඡං ඉව වනස්මිං වානරො** = හෙතෙමේ වනයෙහි ගෙඩි කනු කැමැති වන වඳුරකු මෙන් භව-යෙන් භවයට පැන දුවන්නේ ය.

**හුරං** යනු, නිපාතයි. මේ, ඒ නිපාත දෙකක් එක් වූ තැනෙකි. පරලොව කියන්නේ ය. අරුත් විසින් සප්තම්විභක්ත්‍යර්ථයෙහි ය. එහෙයින් භවයෙක්හි භවයෙක්හි කිව ද, භවයෙන් භවයට යි කිව ද එක සේ ය.

වඳුරා, **වානර** නම්. මිනිස් රූසටහන් ඇති බැවින් 'වානර' යි කියනු ලැබේ. **"නරො වියාති වානරො, වාසද්දො ඉවසො"** යනු එහිලා කීහ. තව ද **වාන** නම්: ගමන යි. ඒ වාන සඞ්ඛ්‍යාත ගමන යමක්හට ඇත්තේ නම් හේ 'වානර' යි ද කියනු ලැබේ.

රුක්පල කැමැති වූ වඳුරා වෙනෙහි වසනුයේ රුකක අත්තක් අල්ලා ගෙණ ම හිඳින්නේ ය. පළමු අල්ලා ගත් අත්ත අත හරි-ණුයේ අන් අත්තක් අල්ලා ගෙණ ය. අත්තක් අල්ලා නො ගෙණ නම් නො හිඳින්නේ ය. හිඳිනු නො හැක්කේ ය. එමෙන් තෘෂ්ණා වශික මනුෂ්‍ය තෙමේ ද භවයෙන් භවයට යනු යේ තෘෂ්ණායෙන් රූපාදී වූ යම්කිසි අරමුණක් ගැණීමෙනි. අරමුණක් නො ගෙණ

1. 2. 1. 'පමත්තා' යනු බලනු

2. 14. 6. 'දුක්ඛසමුප්පාදං' යනු බලනු

නම් භවයෙහි උත්පත්තියෙක් නො වේ. **"භුරාභුරං ධාවති භන්ත චිත්තං"** යන මෙයට කළ අර්ථකථාවිස්තරයෙන් ද එබව පැහැ-දිලි ය. ඒ මෙසේ ය: **"අනවට්ඨිතචිත්තො කදාචි රූපෙ කදාචි සද්දෙති ආදිනා තස්මිං තස්මිං ආරම්මණෙ අස්සාදදිට්ඨිවසෙන අපරංපරං පරිබ්භමති"** යනු. සිහි නුවණින් නො පිහිටි සිත් ඇතියේ කිසිවිටෙක රූපයෙහි කිසිවිටෙක ශබ්දයෙහි යනාදී ලෙසින් ඒ ඒ අරමුණෙහි තෘෂ්ණාදීන්ගේ වශයෙන් පරිභ්‍රමණය කරන්නේ ය, යනු එහි අරුත්.

**යං එසා සහතෙ ජම්මී තණ්හා ලොකෙ විසත්තිකා** = ලාමක වූ විසත්තිකා නම් තෘෂ්ණාව ලොකයෙහි යමකු මැඩලා ද

**ජම්මී – විසත්තිකා** යන දෙපදය **තණ්හා** යනු වෙසෙසා සිටියේ ය. මේ පදයෝ එකලා ව ද තෘෂ්ණාව කියා පාන්නෝ ය. තෘෂ්ණායෙන් මැඩුනහුට හොඳ නො හොඳ දෙක වෙන් කොට ගත නො හැකි ය. එහෙයින් තෘෂ්ණාව **'ජම්මී'** යි කියනු ලැබේ. ලාමක බැවින් ජම්මී. හොඳ නො හොඳ තැන්, සෙවියයුතු නො සෙවිය යුතු තැන් නො විමසා හැම තැන පැතිරී සිටියා තෘෂ්ණාව විසත්තිකා නම්.

**සොකා තස්ස පවඩ්ඪන්ති අභිවට්ඨං ඉව බීරණං** = ඔහුට නැවැත නැවැත වැස්සෙන් තෙමනලද බෙරුතණ මෙන් ශොකයෝ වැඩෙත්.

ඉතා ලාමක වූ හොඳ නො හොඳ තැන් නො විමසා හැම තැන පැතිර සිටුනා සඳෙර නිසා උපදනා තෘෂ්ණාව මේ ලොක-යෙහි යම් කිසි සත්වයකු යටපත් කොට ගෙණ පවතී ද, ඒ දුඃඛාලයා පිළිබඳ ශොකයෝ නැවැත නැවැත වැඩෙත්. තෙමුනු බෙරුතණ වැඩී පැතිරී යන්නා සේ වැඩෙන්නාහ.

**යො චෙ තං සහතී ජම්මිං තණ්හං ලොකෙ දුරච්චයං** = ලොක-යෙහි යමෙක් ලාමක වූ නො ඉක්මවිය හැකි වූ මේ තෘෂ්ණාව මැඩලා ද. යටපත් කෙරේ ද.

**සොකා තම්හා පපතන්ති උදබින්දූ ඉව පොක්ඛරා** = පොකුරු පතින් ගිලිහෙන දියබිඳු මෙන් ඔහු කෙරෙන් ශොකයෝ ගිලිහී වැටෙත්.

සසර උපත මුල් කොට ඇති සිතෙහි උපදනා තැවිල්ල **ශොක** නම්[1] **පොක්ඛර** නම්: මෙහි පියුම්පත ය. එය දියෙන් වැඩෙනුයේ දියෙහි හටගත්තේ හෝ 'පොක්ඛර' යි කියනු ලැබේ. වීණාද්‍රෝණී මුඛයෙහි හා හස්තිකරාග්‍රයෙහි ද වැටේ.

---

1. 2. 5. 'අසොකො' යනු බලනු.

මේ ලෝකයෙහි යම්කිසි පුද්ගලයෙක් ලාමක වූත් නො ඉක්මවිය හැකි වූත් තෘෂ්ණාව නසාලන්නේ නම්, නෙළුම් කොළයෙහි වැටුනු දිය එහි නො රැඳී එයින් ගිලිහී වැටෙන්නා සේ ඒ පුද්ගලයා කෙරෙන් ශෝකයෝ ඈද වැටෙන්නාහ. පහව යන්නාහුය.

**තං වො වදාමි භද්දං වො යාවන්තෙත්ථ සමාගතා** = යම් පමණ දෙනෙක් මෙහි රැස් වූවාහු ද, ඒ තොපට යහපතෙක් වේවා එහෙයින් තොපට කියමි.

**යාවන්තෙතා** = යම් පමණ කෙනෙක්, **එත්ථ** = මෙහි, **සමාගතා** = රැස් වූවාහු ද, **වො** = ඒ තොපට, භද්දං = යහපතෙක්, (වේවා) **තං** = එහෙයින්, **වො** = තොපට, **වදාමි** = කියමි, යනු පද විසින් අරුත්.

මෙහි **වො** යනු, තුම්හ ශබ්දයට වූ ආදෙශ විශෙෂයෙකි. **නො** යන ආදෙශ විශෙෂයෙහි ලා කියූ සේ දත්තේ ය. **භද්ද** නම්: යහපත් ය. **යාවන්තෙතා** යනු, පරිමාණාර්ථයෙහි ආයේ ය.

"කපිල මත්ස්‍යයා ගෙණ යම් පමණ කෙනෙක් මෙහි ආවාහු ද ඒ තොප හැමට වැඩෙක් ම වේවා. කපිල මත්ස්‍යයා මෙන් විනාශයට නො පැමිණෙවු. එහෙයින් මම තොපට අවවාදයක් කරමි" යනු ආශය.

**තණ්හාය මූලං ඛණථ උසීරත්ථො ඉව බීරණං** = බබුස් තණමුලින් ප්‍රයොජන ඇත්තේ බබුස් තණ යම් සේ සාරා ද, එසේ තෘෂ්ණාවගේ මූල සාරවු. මුල උදුරා දමවු.

**උසීර** – **බීරණ** යන මෙයින් කියනු ලබනුයේ එක් ම තෘණ විශෙෂයෙකි. ඒ නම්: අද සැවැන්දරා ය. සැවැන්දරායෙන් ප්‍රයොජන ගණුයේ **උසීරත්ථ** නම්.

සැවැන්දරායෙන් ප්‍රයොජන ඇතියේ උදැල්ලක් ගෙණ සැවැන්දරා මුල් උදුරන්නා සේ, තෙපි ද රහත්මගනුවණින් සංසාරයෙහි භවයෙන් භවයෙහි උත්පත්තිය දෙන තෘෂ්ණාවගේ මූලය වූ අවිද්‍යාව උදුරා දමවු, යනු ඒ මාගේ අවවාදය ය.

**මා වො නලං ඉව සොතො මාරො භඤ්ජි පුනප්පුනං** = (ගඟ දිය සැඩපහර ගං ඉවුර හටගත්) හුණ පඳුරක් (මැඩ ගෙණ යන්නා) සේ මාර තෙමේ තොප නැවැත නැවැතත් නො මඬීවා.

**සොත** නම්: මෙහි දියසැඩපහර ය. 'සොත' යනු, **'සොතායතනං, සොතින්ද්‍රියං'** යනාදී තන්හි මාංසස්‍රොතයෙහි ද, **'සොතෙන සද්දං සුත්වා'** යනාදී තන්හි ශ්‍රොත්‍ර විඥානයෙහි ද,

**'දිබ්බාය සොතධාතුයා'** යනාදී තන්හි ඤාණස්‍රොතයෙහි ද, **'දිට්ඨි සොතො'** යනාදී තන්හි දිට්ඨිකිලෙසාදී වූ පස්වැදෑරුම් ධම්මයෙහි ද, **'ගඞ්ගාය නදියා වුය්හමානං දාරුක්ඛන්ධං'** යනාදී තන්හි දියපහරෙහි ද, **'අරියසොතං'** යනාදී තන්හි ආයෳී මාර්ගයෙහි ද, **'පුරිසස්ස විඤ්ඤාණසොතං පජානාති'** යනාදී තන්හි චිත්තසන්තතියෙහි ද, හෙන්නේ ය.

**මාර** නම්: මෙහි කිලෙසමාර – මච්චුමාර – දෙවපුත්තමාර යන මාරයෝ තිදෙන ය.[1] ගහබඩ හටගත් හුණපඳුරක් හෝ බටපඳුරක් හෝ උදුරා යවන වෙගයෙන් ගලා බස්නා මහ ගඟ දියපහරක් සේ මාර තෙමේ තොප නැවැත නැවැත සසර උපදවමින් නො ද පෙළාවා'යි වදාළ සේක.

ධම්මදෙශනාවගේ අවසානයෙහි කෙවුල්පුත්හු සංවෙගයට පැමිණ දුක් කෙළවර කිරීම පතමින් බුදුරජුන් වෙත පැවිදි ව වැඩි දවස් නො යවා ම දුක් කෙළවර කොට නො සැලෙන විහාරසමාපත්තිධම්මපරිභොගයෙන් එක් ම පරිභොග ඇතියෝ වූහ.

**කපිලමත්ස්‍යවස්තුව නිමි.**

---

1 1. 6. 'මාරො' යනු බලනු

# ඌරියකගේ පෙරළිය

## 24 — 2

සම්මා සම්බුදුරජාණන් වහන්සේ දවසක් රජගහ නුවරට පිඩු සිඟා වැඩිය සේක. ඒ වැඩිය ගමනේ දී එහි ඌරුපැටියක දැක සිනා පහළ කළ සේක. සිනා පහළ කිරීමේ දී උන්වහන්සේගේ ශ්‍රී මුඛයෙන් නිකුත් වූ දන්තකාන්තිමණ්ඩලය දුටු ආනන්ද ස්ථවිරයන් වහන්සේ "ස්වාමීනි! කුමක් හෙයින් බුදුරජාණන් වහන්සේ සිනා පහළ කළ සේක් දැ?" යි ඇසූහ. "ආනන්ද! අර ඌරුපැටියා දකිහි දැ'යි අසා වදාළ කල්හි "එසේ ය, ස්වාමීනි! දකිමි"යි පිළිතුරු දුන්හ. "ආනන්ද! ඔය ඌරුපැටියා කකුසඳ බුදුරජුන්ගේ සසුන් පවත්නා කල්හි එක් අසුන්හලක් අවට බත්උළු කුණුරොඩු ඇහිඳ කන කිකිළියක් ව ඉප ද සිටියා ය. එහි දී මේ තොමෝ එක් යොගාවචර මහණකු විදසුන් කමටහන් පිරිවහන හඬ අසමින් හුන්නී එයින් චුත ව ගොස් රජගෙදරක රජදුවක් ව උපන්නී ය. නම උබ්බරී ය. ඕ තොමෝ එහි දී අසුචිපිඩෙක කැටි ව හුන් පණුරැසක් දැක එහි පුළුවක සංඥව උපදවා භාවනා කොට ප්‍රථමධ්‍යානය ලබා ගත්තා ය. ඕ එහි ද ආයු ඇති තාක් දිවි ගෙවා එයින් චුත ව බඹලොව උපන්නී ය. එහි ද ආයු ගෙවා එයින් චුත ව භවගති වශයෙන් පෙරළී පෙරළී එන්නී දැන් මෙහි ඌරියක් ව ඉප ද සිටින්නී ය. මෑගේ මේ පෙරළිය දැකීමෙන් මට සිනා නැඟිනැ" යි වදාළ සේක. එයසා එහි අනඳ තෙරුන් ප්‍රධාන කොට සිටි භික්ෂූන් වහන්සේලාට මහත් සංවෙගයෙක් උපන. බුදුරජාණන් වහන්සේ ඔවුනට තව තවත් සංවෙග උපදවමින් භව තෘෂ්ණායෙහි දෙස් දක්වමින් ඇතුළු වීථියෙහි වැඩ සිට ගෙණ මේ ධර්මදෙශනාව කළ සේක.

**යථාපි මූලෙ අනුපද්දවෙ දළ්හෙ**
**ඡින්නොපි රුක්ඛො පුනරෙව රූහති,**
**එවම්පි තණ්හානුසයෙ අනූහතෙ**
**නිබ්බත්තති දුක්ඛමිදං පුනප්පුනං**

**යස්ස ඡත්තිංසති සොතා මනාපස්සවනා භුසා,**
**වාහා වහන්ති දුද්දිට්ඨිං සඞ්කප්පා රාගනිස්සිතා.**

**සවන්ති සබ්බධි සොතා ලතා උබ්භිජ්ජ තිට්ඨති,**
**තං ච දිස්වා ලතං ජාතං මූලං පඤ්ඤාය ඡින්දථ.**

**සරිතානි සිනෙහිතානි ච සොමනස්සානි භවන්ති ජන්තුනො**
**තෙ සාතසිතා සුඛෙසිනො තෙ වෙ ජාතිජරූපගා නරා.**

**තසිණාය පුරක්ඛතා පජා පරිසප්පන්ති සසෝව බාධිතො,**
**සංයොජනසඞ්ගසත්තා දුක්ඛමුපෙන්ති පුනප්පුනං චිරාය.**

**තසිණාය පුරක්ඛතා පජා පරිසප්පන්ති**
**සසෝව බාධිතො,**
**තස්මා තසිණං විනොදයෙ භික්ඛු ආකඞ්ඛී**
**විරාගමත්තනොති.**

යම් සේ මුල, උවදුරකට නො පත් කල්හි (එහෙයින් ම) දෘඪව සිටි කල්හි අගින් කපා දමූ රුක නැවැතත් හට ගණී ද, එසේ ම තෘෂ්ණා අනුශය මුලුසුන් නො කළ කල්හි මේ දුක නැවැත නැවැතත් උපදී.

යමක්හට සතිස් වැදෑරුම් වූ තෘෂ්ණාස්‍රොතසින් යුක්ත වූ මන වඩන්නා වූ රූපාදී වූ අරමුණෙහි වැගිර පවත්නා වූ තෘෂ්ණාව බලවත් වේ ද, නුවණ නැති ඒ පුද්ගලයා රාගය ඇසුරු කළ විතර්කයෝ බලවත් වූවාහු අපායයට පමුණුවත්.

තෘෂ්ණාප්‍රවාහයෝ සියලු තන්හි වැගිරෙත්. තෘෂ්ණා ලතා තොමෝ නැගී සිටියි. හටගත් ඒ තෘෂ්ණා ලතාව දැක ප්‍රඥයෙන් මුල සිඳිවූ. අරමුණෙහි වගුළා වූ ද තෙත් වූ ද සොම්නස්හු සත්ව යාහට වෙත්. ඔවුහු තුමූ පස්කම් සැපය හා ගිය සිතුට ඇසුරු කළාහු සැප සොයන සුළුලෝ වෙත්. එබඳු සත්වයෝ ඒකාන්ත-යෙන් ජාති – ජරාවනට පැමිණෙන්නෝ වෙත්.

තෘෂ්ණායෙන් පිරිවරණ ලද සත්වයෝ බඳනාලද සාවකු මෙන් බියපත් වෙත්. සංයොජන හා සඞ්ගවලින් බැඳුනාහු බොහෝ කලක් නැවැත නැවැත දුකට පැමිණෙත්.

තෘෂ්ණායෙන් පිරිවරණ ලද සත්වයෝ බඳනාලද සාවකු මෙන් බිය පත් වෙත්. එහෙයින් නිවන කැමැති වන මහණ තෙමේ තෘෂ්ණාව දුරු කරන්නේ ය.

**යථා අපි මූලෙ අනුපද්දවෙ දළ්හෙ** = යම් සේ රුක් මුල උවදුරු නැති ව දෘඪ ව පිහිටා ගත් කල්හි.

මෙහි **'මූලෑ'** යි කියන ලද්දේ රුක් මුල ය. අටුවාව කියන ලෙසට සිවු දෙසට ඇදී ගිය මුල් සතර හා කෙළින් ම පොළොව යටට ඇදී ගිය මුදුන් මුලත් යන මුල් පස ම මෙහි මුල ශබ්දයෙන් ගත යුතු ය. යම් කිසිවක් නිසා රුක නො වැටී පොළොව පිහිටා සිටී නම් ඒය මූලය. **"මූලන්ති පතිට්ඨන්ති රුහන්ති රුක්ඛා එතෙ-නාති = මූලං"** යනු අර්ථ නිරූපණය යි.

ඒ මේ මූල ශබ්දය **'යාව මජ්ඣන්තිකො කාලෙ ඡායා ඵරති නිවාතෙ'** යනාදී තන්හි නක්‍ෂත්‍ර විෂයයෙහි ද, **'පණ්ණානි පතන්ති එතකාවතා රුක්ඛමූලන්ති'** යනාදී තන්හි සමීපයෙහි ද, **'මූලානි උද්ධරෙය්‍ය අන්තමසො උසීරනාලමත්තානිපි'** යනාදී තන්හි මූලමූලයෙහි ද, **'ලොභො අකුසලමූලං'** යනාදී තන්හි හෙතුයෙහි ද, **'කම්මමූලං කිණ්ඨවාන'** යනාදී තන්හි පඹුරෙහි ද හෙන්නේ ය. මෙහි රුක් මුලෙහි නැගී සිටියේ ය.

**අනුපද්දවෙ** = උවදුරකට නො පත් කල්හි. මෙහි උවදුරු නම්: කැපීම්, පැළීම්, පිළිස්සීම්, පණුවන් කෑම් ඈය. වෙත පැමිණ පෙළන්නේය යනු උපද්‍රව යන්නෙහි අරුත්. එබඳු පෙළීමෙක් නැතියේ **අනුපද්දව.** මෙහි කී කැපීම්, පෙළීම් ඈ රුක්මුල් කඳ කොළ ඈ පිළිබඳ උවදුරු ය. රාග - ද්වෙෂ - මෝහාදී උපද්‍රව මෙහිලා නො ගැණේ.

**ඡින්නොපි රුක්ඛො පුන එව රූහති** = අගින් කැපූ ද රුක නැවැත හට ගණී (ද) නැවැත වැඩේ (ද)

කැපීම්, පැළීම්, පිළිස්සීම්, පණුවන් කෑම් ඈ උවදුරකට නො පත් මූල ශක්තිමත් වූ යම්කිසි නුග ඇසතු ඈ වනදෙටු රුකෙක් මුල් ඉතිරි වන සේ පොළොව මතු පිටින් කපා හරිණලද්දේ නම් නැවැත ඒ රුක රිකිළි හට ගෙණ අතුපතරින් වැඩී යන්නේ ය. එසේ නැවැත වැඩී යනු, මුල් නො සිඳ මුල් තබා පොළොව මතු පිටින් රුක කපා දුටු බැවිනි. ඒ ය මේ පාදයෙන් දක්වා වදාළෙ.

**එවං අපි තණ්හානුසයෙ අනූහතෙ** = එසේ ම තෘෂ්ණානුශය මුළුමනින් නො නැසූ කල්හි.

තණ්හා ම **තණ්හානුසය** නම්. කාමරාග - භවරාග - පටිඝ - මාන - දිට්ඨි - විචිකිච්ඡා - අවිජ්ජා යි අනුසයෝ සත්වැදෑරුම් වෙත්. **"අනුසෙන්තීති=අනුසයා"** යන විවරණය විසින් කාරණයක් ලැබ කාරණයක් ඇති කලහි උපදින ධර්ම අනුසය යි ගත යුතුය. **"අනු අනු සෙන්තීති=අනුසයා"** යන විවරණය විසින් මගනුවත් ලබනා තුරු ම විනාශයට නො ගොස් කාරණයක් ඇති කල්හි නැවැත නැවැත උපදින ධර්ම අනුසය යි ගතයුතුය. මෙහි උපදින ධර්‍ම'යි කියේ සවරූප වශයෙන් ඉපදීමක් නිසා නොව ඉපදීමට සුදුසුබව ගැණීමෙනි. පර්‍ය්‍යුත්ථාන - ව්‍යතික්‍රම අවස්ථාවනට නො පැමිණ සිතෙහි නිදන ලෙසින් හෝ පවත්නෝ අනුසයෝ ය. අනුසය - පරියුට්ඨාන - වීතික්කම විසින් කෙලශයන් පිළිබඳ අවස්ථා තුනෙක් වේ. මගනුවණින් කෙලෙස් නසනතුරු නො සිදී කරුණක් එළැඹ

සිටි කල්හි නැගී එන, එතෙක් සිතෙහි නිදන ලෙසින්, ලැග සිටින ලෙසින් පවත්නා අවස්ථාව අනුශයාවස්ථා ය. ලෞකික ගුණ කොතෙක් ලැබුව ද කෙලශයන්ගේ අනුශයාවස්ථාව නො සිඳී පවත්නී ය. සිතෙහි ඒ ඒ කෙලෙස් ජවන් සමග එක් ව පවත්නා අවස්ථාව පර්‍ය්‍යුත්ථානාවස්ථාව ය. කායාඞ්ග-වාචාඞ්ගචලනය කරණ අවස්ථාව ව්‍යතික්‍රමාවස්ථාව ය. මේ සත් වැදෑරුම් අනුසයන් අතුරෙහි තණ්හානුසය වශයෙන් ගැණෙනුයේ කාමරාග – භවරාග යන අනුසය දෙක ය. අටුවා කතාවත්හි **“ථාමගතට්ඨෙන කාමරාගාදයො සත්ත, තෙහි ථාමගතත්තා පුනප්පුනං කාමරාගාදීනං උප්පත්තිහෙතුභාවෙන අනුසෙන්ති සෙවන්ති අනුසයා, සන්තානං අනු අනුසෙන්ති පවත්තන්තීති අනුසයාති ලද්ධනාමං කාරණභාවෙ උප්පජ්ජනාරහා ථාමගතා යෙ කිලෙසා, තෙ පාපධම්මා. ථාමගතට්ඨෙන අප්පහීනට්ඨෙන ච අනුසෙන්තීති අනුසයා”**යි, අනුසය යනු පැහැදිලි කළහ. මෙ කියූ තණ්හානුසය නැසිය යුත්තේ අර්හත්මාර්ග ඥානයෙනි. එ නුවණින් තණ්හානුසය නො නැසූ කල්හි යන අරුත ‘අනූහතෙ’ යන්නෙන් ගැණේ.

**නිබ්බත්තතී දුක්ඛං ඉදං පුනප්පුනං** = මේ දුක නැවැත නැවැත උපදී.

ඒ ඒ භවයෙහි ජාති – ජරා – ව්‍යාධි – මරණාදී වූ දුක් අතර නො තබා උපදනේ ය. ජාති – ජරා ආදීන්ගේ භවයක් පාසා මෙසේ ඉපැත්ම වනුයේ මුළුමනින් තෘෂ්ණාව නො නැසූ බැවිනි.

**යස්ස ඡත්තිංසති සොතා මනාපස්සවනා භුසා** = යමක් හට ස්‍රොතස් සතිසකින් යුක්ත වූ මන වඩන්නා වූ රූපාදී වූ අරමුණෙහි වැගිර සිටියා වූ තෘෂ්ණාව බලවත් වේ ද.

මෙහි චක්ඛු – සොත – ඝාන – ජිව්හා – කාය – මන යන ආධ්‍යාත්මිකායතනයන් විෂය කොට සිටි කාමතණ්හා විසින් සයෙක, භවතණ්හා විසින් සයෙක, විභවතණ්හා විසින් සයෙකැ යි බෙදෙන තෘෂ්ණාවිචරිත අටළොස හා, එසේ ම රූප – සද්ද – ගන්ධ – රස – ඵොට්ඨබ්බ – ධම්ම යන බාහිරායතනයන් විෂය කොට සිටි කාමතණ්හා විසින් සයෙක, භවතණ්හා විසින් සයෙක, විභවතණ්හා විසින් සයෙකැ යි බෙදෙන තෘෂ්ණාවිචරිත අටළොස ද යි යන සතිස **‘ඡත්තිංසතිසොත’** යෝ ය. වෙගයෙන් ගලා බස්නා සැඩ පහර **සොත** නමින් කිය වේ. මෙ කියූ තණ්හාවිචරිතයෝ තද්ගතික තත්සමාන බැවින් ‘සොත’ යි කියනු ලැබෙත්.

රූප-ශබ්ද-ගන්ධාදී වූ සිත් ගත් මන වඩන අරමුණෙහි වැගි-රෙන්නී පවතින්නී වැහෙන්නී **‘මනාපස්සවණ’** නම්. තෘෂ්ණා ය.

**"මනාපෙසු රූපාදීසු ආරම්මණෙසු ආසවන්ති පවත්තන්තීති මනාපස්සවණා"** යනු අටුවා. මෙසේ සතිස් වැදෑරුම් වූ තෘෂ්ණා-විචරිතයන්ගෙන් යුක්ත වූ මන වඩන අරමුණෙහි නිතර වැහෙන තෘෂ්ණාව යත්නමකින් නො ව බලවත් ව වැහෙනබව **'භුසා'** යන මෙයින් කියැ වේ.

**වාහා වහන්ති දුද්දිට්ඨිං සඞ්කප්පා රාගනිස්සිතා** = රාගය ඇසුරු කළ විතර්කයෝ බලවත් වූවාහු නුවණ නැති ඒ පුද්ගලයා අපායයට පමුණුවත්.

මෙහි **'දුද්දිට්ඨි'** නම්: විපන්න බුද්ධි ඇති පුද්ගල තෙමේ ය. **'සඞ්කප්ප'** නම්: විතර්කයෝ ය. මේ විතර්කයෝ ධ්‍යානයක් විදර්ශනා-වක් ඇසුරු නො කොට රාගය ඇසුරු කොට සිටියෝ ය. **'රාගනිස්සිතා'** යන මේ පදයෙන් වදාළෝ ඒ බව ය. මොවුහු රූපාදී වූ අරමුණු විෂය කොට සත්වසන්තානයෙහි පුන පුනා උපදනෝ වෙගවත්හ යි **'වාහා'** යන්නෙන් පැහැදිලි කළහ.

**වහන්ති සබ්බධි සොතා** = තෘෂ්ණා ප්‍රවාහයෝ සියලු තන්හි වැගිරෙත්.

මේ තෘෂ්ණාගඞ්ගාප්‍රවාහයෝ චක්ෂුර්ද්වාරාදියට හමු වන රූපාදී වූ සවැදෑරුම් අරමුණුවලින් කාමාදී වූ සියලු භවයන්ගෙන් වැගිරෙන බැවින් කාමභවාදී භවයන්හි හැම තැන පවත්නාහු වෙති. **"ඉමෙ තණ්හාසොතා චක්ඛුද්වාරාදීනං වසෙන සබ්බෙසු රූපාදීසු ආරම්මණෙසු සවණතො සද්ධිං රූපතණ්හා-පෙ-ධම්මතණ්හාහි සබ්බභවෙසු වා සවණතො සබ්බධි සවන්ති නාම"** යනු සාධක කථාය.

**ලතා උබ්භිජ්ජ තිට්ඨති** = තෘෂ්ණාලතා තොමෝ ඉපද නැගී සිටියි.

භවයෙන් භවය වෙළන බැවින් මසන බැවින් ලතා නම් වූ තෘෂ්ණාව රූපාදිය අරමුණු කොට චක්ෂුරාදී වූ සදොරින් ඉපද නැගී සිටින්නී ය.

**තං ච දිස්වා ලතං ජාතං මූලං පඤ්ඤාය ඡින්දථ** = හටගත් ඒ තෘෂ්ණාලතාව දැක ප්‍රඥයෙන් (එහි) මුල සිඳිවු.

එසේ හටගත් ඒ තෘෂ්ණා ලතායෙහි **"එත්ථ එසා තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති"** යි මෙසේ දැක වෙනෙහි හටගත් වැලක් ආයුධයකින් කපන සිඳින එකකු මෙන් මාර්ග ප්‍රඥයෙන් මුලින් ම සිඳලිය යුතුය යනු, වදාළ සේක. 'පඤ්ඤාය' යනු කියන ලදි.[1]

---

1 2. 5. 'පඤ්ඤාපාසාදං' යනු බලනු.

**සරිතානි සිනෙහිතානි ච සොමනස්සානි භවන්ති ජන්තුනො** = සත්ත්වයාහට වගුළා වූ ද තෙත් වූ ද සොම්නස්හු වෙත්.

තෘෂ්ණාවට යටත් වූ තෘෂ්ණාවෙන් අඩ වූ සත්ත්වයාහට රූපාදී වූ අරමුණෙහි පැතිර සිටියා වූ සිවු පසයෙහි පැවැති තෘෂ්ණාසෙනහයෙන් සෙනහවත් වූ සොම්නස්හු වන්නාහු ය.

අතිශය ප්‍රියභාවය **'සිනෙහ'** නම්. එයින් වැකුණෝ, එයින් තෙත් වූවෝ **'සිනෙහිතානි'** යි යන මෙයින් ගණු ලැබෙත්. මෙහි ඔව්හු නම්: සොමනස්සයෝ යි. සොමනස්ස නම්: සිත පිළිබඳ සැපය යි. සිතෙහි හටගන්නා ප්‍රීතිය ය. 'ජන්තු' යනු යට කියන ලදි.[1]

**තෙ සාතසිතා සුඛෙසිනො** = සැප සොම්නස් ඇසුරු කළ ඒ සත්ත්වයෝ සැප සොයන සුල්ලෝ වෙත්.

**සාතසිතා** = සැප සොම්නස් ඇසුරු කළෝ. **සුඛෙසිනො** = කය සිත දෙකට සැප සොයන සුල්ලෝ. **"තෙ තණ්හාවසිකා පුග්ගලා සාතනිස්සිතා සුඛනිස්සිතා ච හුත්වා සුඛෙසිනො සුඛපරියෙසිනො භවන්ති"** යනු අටුවා.

**තෙ වෙ ජාතිජරූපගා නරා** = එබඳු සත්ත්වයෝ ඒකාන්තයෙන් ජාතිජරාවනට පැමිණෙන්නෝ වෙත්.

හුදෙක් තෘෂ්ණාවට යටත් වූ සත්ත්වයෝ ජාතිජරාවනට ම පැමිණෙන්නෝ නො වෙත්. ඔවුහු සසර ඇති තාක් දුක්වලට පැමිණෙන්නෝ ය යි වදාළ සේක.[2]

**තසිනාය පුරක්ඛතා පජා පරිසප්පන්ති සසො ව බාධිතො** = තෘෂ්ණාවෙන් පිරිවරණලද සත්ත්වයෝ බඳනාලද සාවකු මෙන් බිය පත් වෙත්.

සත්ත්ව තෙමේ යම් චිත්ත ශක්තියක් කරණ කොට කාමවස්තූන් වැළඳීමෙහි ආශා ඇතියේ වේ ද, ඒ ආශාව ඉපදීමට කරුණු වූ චිත්ත ශක්තිය **තසිනා** ය. ඒ නම් තෘෂ්ණා ය. **"සාය තසන්ති සා තසිනා"** යනු ත් **"තාසකරණෙන තසිනාති සඞ්ඛං ගතා තණ්හා"** යනුත් කීයේ ඒ බව ය. තැතිගැනුම් කරණ බැවිනුදු තණ්හා, තසිනා ය.

**සංයොජනසඞ්ගසත්තා** = සංයොජන හා සඞ්ගවලින් බැඳුනාහු.

**දුක්ඛං උපෙන්ති පුනප්පුනං චිරාය** = බොහෝ කලක් නැවැත නැවැතත් දුකට පැමිණෙත්.

---

1. 13. 9. 'ජන්තුනො' යනු බලනු
2. 14. 6. 'දුක්ඛං' ,, ,,

දශවිධසංයොජනයෙන් හා සප්තවිධසඞ්ගයෙන් සසර ඇලී ගිය සත්වයෝ බොහෝ කලක් මුළුල්ලෙහි නො ගිණිය හැකි ඉතා දිගු කලක් නැවැත නැවැතත් ජාත්‍යාදිදුඃඛයනට පැමිණෙත්.[1]

**තසිණාය පුරක්ඛතා පජා පරිසප්පන්ති සසො ව බාධිතො =** තෘෂ්ණායෙන් පිරිවරණලද සත්වයෝ බඳනාලද සාවකු මෙන් බිය පත් වෙත්.

**තස්මා තසිණං විනොදයෙ භික්ඛු ආකඞ්ඛී විරාගං අත්තනො =** එහෙයින් තමනට නිවන කැමැති මහණතෙමේ තෘෂ්ණාව දුරු කරන්නේ ය.

තෘෂ්ණාව සත්වයාහට අපා දුක් හා සැම තැන ජාති – ජරා – මරණාදී වූ දුක් දෙන බැවින් ඒ මේ ෂඩ්ද්වාරික තෘෂ්ණාව රාග විගමන නම් වූ නිවන පතන, කැමැති වන මහණ තෙමේ අර්හත්මාර්ග ඥානයෙන් දුරු කරන්නේ ය.

ධර්මදෙශනාවගේ අවසානයෙහි බොහෝ දෙන සෝවන්පලාදියට පැමිණියාහු ය.

ඒ ඌරු පැටියා ද එයින් ච්‍යුත ව ගොස් **සුවර්ණභූමියෙහි** රජ ගෙයක ඉපද, එයින් ච්‍යුත ව **බරණැස**, එයින් ච්‍යුත ව **සූප්පාරක පට්ටනයෙහි** අස්වෙණ්ද ගෙයක, එයින් ච්‍යුත ව **කාවීරපට්ටනයෙහි** බඩු විකුණන්නකුගේ ගෙයක, එයින් ච්‍යුත ව **අනුරාධපුරයෙහි** අධිපතියකුගේ ගෙයක, එයින් ච්‍යුත ව අනුරාධපුරයට දකුණෙහි පිහිටි **භොකකන්ත** ගම **සුමන** නම් කෙලෙඹියක්හට දූ ව උපන්නීය. නම **සුමනා** ය. ඇයගේ පියා එගම හැර ගොස් **දීඝාමඩුල්ලෙහි මහාමුනි** නම් ගමෙහි නවාතැන් ගත්තේ ය. **දුටුගැමුණු** රජුගේ **ලකුණ්ටක අතිම්බරු** නම් ඇමැති තෙමේ යම්කිසි කටයුත්තක් සඳහා එගමට ගියේ ඒ **සුමනා** දැක ඇය කෙරෙහි ඇලුම් ඇති ව මහත් වූ මගුල් උලෙළක් කොට ශරණ පාවා ගෙණ **මහාපුණ්ණ** ගමට පැමිණියේ ය.

ඒ කාලයෙහි **කොළපවුමහවෙහෙර** වැසි **මහාඅනුල** සථවිර-යන් වහන්සේ එහි පිඬු සිඟා වැඩිය ගමනේ, ඒ ගෙදෙරට ද වැඩියාහු ඇය දැක "ඇවැත්නි! ඌරු පැටියා ලකුණ්ටක අතිම්බරු ඇමැතියාගේ බිරිය බවට පැමිණීම මහා පුදුමයෙකැ" යි තමන් හා කැටුව ගිය භික්ෂූන්ට කීහ. එබස් ඇසූ ඕ තොමෝ ජාතිස්මරණ ඥානය ලැබ ඉකුත් ව ගිය තතු උගුළා බලා උපන් සංවෙග ඇතියා හිමියාට දන්වා මහත් පෙරහරින් ගොස් **සංචබලක** සථවිරාවන්ගේ

---

1. 2. 8. 'සංයොජනසංයුත්තා' යනු බලනු
2. 13. 4 'තාසං සඞ්ගං විජානතං' ,, ,,

සමීපයෙහි පැවිදි ව **තිස්සමහාවිහාරයෙහි දී, සතිපට්ඨාන** සූත්‍ර දෙශනාව අසා සෝවන්පලයෙහි පිහිටා ගත්තු. පසු ව දෙමළ යුද්ධය අවසානයෙහි මවුපියන් විසූ භොකන්තග ගමට ගොස් එහි වසන්නී **කල්‍යාණ** මහාවිහාරයෙහි දී **ආශීර්විෂොපම** සූත්‍ර දෙශනාව අසා රහත්බවට පැමිණියා ය. ඕ තොමෝ පිරිනිවන් පානා දවසෙහි මහණ මෙහෙණන් විසින් පුළුවුස්නා ලද්දී මෙහෙණන්හට මේ සියලු පුවත කියා එහි රැස් වූ භික්‍ෂුසඞ්ඝයා මැද මණ්ඩලාරාම වාසී වූ **ධම්මපදභාණක** මහතෙරුන්ට "මම පෙර මිනිසත් බවෙන් ච්‍යුත ව කිකිළියක් ව උපන්මි, එහිදී උකුස්සකු අතින් ගෙල සිඳීම් ලබා ජීවිතක්‍ෂයට පැමිණ රජගහනුවර උපන්නී පරිබ්‍රාජිකාවන් වෙත පැවිදි ව සිටියා මැරී ගොස් ප්‍රථමධ්‍යානභූමියෙහි උපන්මි, එහි ද කල් ගෙවා කුලුරිය කොට සිටුගෙදරක ද, එහි මැඩී කල් නො ගෙවා ච්‍යුත ව ඊරියක් ව ද, එයින් ච්‍යුත ව සුවර්‍ණභූමියෙහි ද, එයින් බරණැස ද, එයින් සුප්පාරක පටුනෙහි ද එයින් කාවීර පටුනෙහි ද, එයින් අනුරාධපුරයෙහි ද, එයින් භොකන්තග ගම ද, යි මෙසේ කිකිළි ව උපන් අත්බවේ සිට මෙතැනට සුගති දුගති අත්බැව් තෙළෙසක උපත ලබා දූන් සසර කලකිරී සිටියා වෙමි, එහෙයින් සියල්ලෝ මා ගැණ බලා අප්‍රමත්ත වවූ" යි කියා සිවු පිරිස සංවෙගයට පමුණුවා පිරිනිවියා ය.

**සූකරපොතිකාවස්තුව නිමි.**

# සිවුරු හල මහණෙක්

## 24 — 3

**මහාකාශ්‍යප** මහාස්ථවිරයන් වහන්සේගේ සද්ධිවිහාරික භික්ෂු නමක් සිවු දුහැන් උපදවා ගෙණ සිටියේ ද, තම මාමණ්ඩිය වූ රන්කරුගේ ගෙයි විසූ රන්කරු කෙල්ලක දැක ඇය කෙරෙහි පිළිබඳ සිත් ඇති ව සිවුරු හැර දමා එහි ගියේ ය. මිනිස්සු, අලස ව වැඩපල කිරීමට නො කැමැති නිකමට කා බී සිටි මේ හිරළු ගෙසින් පන්නා දැමූහ. ඉන් පසු පවිටු මිතුරන් හා එක් වූ ඔහු සොරකම් කරමින් මංපහරමින් දිවි යැවී ය. දවසක් සොරකම් කොට රාජපුරුෂයන් අතට හසු වූ මොහු, රාජපුරුෂයෝ අත් පිටි හයා දැඩි ව බැඳ සිවුමංහන්දි ගානේ ගෙණ යමින් කසවලින් තළමින් වධකස්ථානයට ගෙණ ගියහ.

එ දවස මහාකාශ්‍යප මහාස්ථවිරයන් වහන්සේ පිඬු සිඟා වඩනා සේක් දැඩි ව බැඳ දකුණු දොරින් බැහැරට ගෙණ යන ඒ හිරළු දැක ඔහු කෙරෙහි අනුකම්පායෙන් එහි මදක් නතර ව සිට බැමි බුරුල් කරවා "තා විසින් පෙර පුරුදු කරණලද කමටහන දැන් නැවැතත් සිහි කරව"යි අවවාද කළ සේක. ඔහු ද උන් වහන්සේගේ අවවාදයට නතු ව සිහි උපදවා එහිදී ද චතුර්ථධ්‍යානය උපදවා ගත්තේ ය. රාජපුරුෂයෝ ඒ අතර ඔහු ගෙණ ගොස් එල්ලුම්ගසට නංවා ගෙළ මළපුඩු දැමූහ. එහෙත් ඔහුට එයින් බියෙක් තැතිගැන්මෙක් නො වී ය. එහි සිටු පස්හි රැස් ව හුන් නොයෙක් දෙනා ඔහු වෙතට කඩු අඩයටි තෝමර ආදී වූ නොයෙක් පන්නයේ ආයුධ දමා ගැසූහ. එහෙත් ඒ කිසිවකින් තැති නො ගත් ඔහු දැක "බලවු, මේ මිනිහා, සිය ගණන් නොයෙක් මාදිලියේ අවි ගත් මේ මිනිසුන් මැද නො බිය ව සිටින, නො සැලී සිටින, මේ නම් මහා පුදුමයෙකැ"යි මහහඬ නගා කියමින් රජු වෙත ගොස් එ පුවත දන්වා සිටියහ. රජ තෙමේ එය අසා "ඔහු වහා මුදා හරිවු" යි නියම කෙළේ ය. බුදුරජානන් වහන්සේ වෙතට ද ගොස් මෙය සැල කළහ. උන් වහන්සේ ආලොකයක් පතුරුවා ඔහුට දහම් දෙසන සේක් මේ ධර්මදෙශනාව කළ සේක.

**යො නිබ්බනථො වනාධිමුත්තො වනමුත්තො**
**වනමෙව ධාවති,**
**තං පුග්ගලමෙථ පස්සථ මුත්තො බන්ධනමෙව ධාවතීති.**

යමෙක් වන රහිත වූයේ වනයෙහි ඇලුනේ වනයෙන් මිදුනේ නැවැත වනයට ම දුවා ද, මිදුනේ බන්ධනයට ම දුවා ද එවු, ඒ පුද්ගලයා බලවු.

**යො නිබ්බනථො වනාධිමුත්තො, වනමුත්තො වනංඑව ධාවති**= යමෙක් වනරහිත වූයේ වනයෙහි ඇලුනේ වනයෙන් මිදුනේ ඒ වනයට ම දුවා ද.

ගිහිබැව්හි ආලය යි කියූ වනථය, ගිහිගෙය හැර දමා පැවිදි වූ දිව්‍යවිහාරසඞ්ඛ්‍යාත තපොවනයෙහි ඇලුනා වූ යමෙක් ගෘහවාස බන්ධනසඞ්ඛ්‍යාතතෘෂ්ණාවනයෙන් මිදී සිට නැවැතත් ඒ තෘෂ්ණා වනයට ම දුවා ද සිවුරු හැර යේ ද.

**තං පුග්ගලං එථ, පස්සථ මුත්තො බන්ධනං එව ධාවති** = ගිහි බැඳුමෙන් මිදුනේ ඒ බැඳුමට ම දුවා ද, එවු, විපතට වැටුනු ඒ පුද්ගලයා බලවු.

**නිබ්බනථ** නම්: ගිහිකම්හි ආලය හැර දමා පැවිදි වූයේ ය. වන වැද සමාපත්තීන්ට සම වැද විසීමෙහි ඇලුනේ **වනාධිමුත්ත** ය. තෘෂ්ණායෙන් මිදී සිටියේ **වනමුත්ත** ය. මෙහි **වන** නම්: ගෘහවාස බන්ධනසඞ්ඛ්‍යාත තෘෂ්ණා යි[1]

**පුග්ගල,** යනු පුරුෂ – සත්ව යන අරුත් ඇතියේ ය. **බන්ධන** නම්: මෙහි ගිහිගෙයි බැඳීම ය.

මේ ධර්මදෙශනාව අසා හෙතෙමේ රාජපුරුෂයන් මැද එල්ලුම් ගස අග හුන්නේ ම උදය – ව්‍යය සිහි කොට තිලකුණු නගා සංස්කාරයන් සම්මර්ශනය කරණුයේ සෝවාන්පලයට පැමිණ සම– වත් සුව විඳිනුයේ අහසට නැග අහසින් ම බුදුරජුන් වෙත ගොස් වැඳ රජුන් සහිත පිරිස මැද දී ම රහත්බවට පැමිණියේ ය.

**විබ්භන්තක භික්ඛු වස්තුව නිමි.**

---

1 20 8. 'වනං ඡින්දථ' යනු බලනු

# සිරගෙයි ලු හොරු

## 24 — 4

**එක්** කලෙක නගරාරක්‍ෂක රාජපුරුෂයෝ උමංබිඳීම්, මං පැහැරීම්, මිනීමැරීම් ඈ කරමින් තැන තැන යන සොරුන් අල්ලා කොසොල් රජු වෙතට පැමිණ වූහ. රජ තෙමේ ඔවුන් දඬුකඳෙහි ගැස් වී ය. රැහැණින් හැකිල්ලෙන් බැන්ද වී ය. මෙ දවස අවට දනවූ වැසි භික්‍ෂූන් වහන්සේලා බුදුරජුන් දක්නට අවුත් බුදුරජුන් දැක වැඳ පසුදා සැවැත්නුවරට පිඩු සිඟා ගියාහු සිරගෙය බැලීමට ද ගියහ. එහි දී දඬුකඳ ගසා රැහැණින් හැකිල්ලෙන් බැඳ දමා හුන් සොරුන් දැක පිණ්ඩපාතයෙන් හැරී අවුත් එදා ම සවස බුදුරජුන් වෙත ගියහ. ගොස් වැඳ "ස්වාමීනි! අද අපි පිණ්ඩපාතය ගිය ගමනේ දී සිරගෙයි වැටී දුක් විඳිනා සිරකරුවන් බලන්නට සිර ගෙට ද ගියෙමු; එහි දී අන්‍දුබන්‍ධනාදියෙන් බැඳී තදවී මහත් දුක් විඳිනා සොරු බොහෝ ගණනක් අපට දක්නට ලැබින, ඔවුනට ඒ බැඳුම් කඩා සිඳ දමා යනු ද නො හැකි ය, ඉවසිය හැකි දුකෙක් නො වේ ඔවුන් විඳිනේ; ස්වාමීනි! ලොකයෙහි මේ බැඳුම්වලටත් වඩා තවත් තර බැඳුම් දැඩි බැඳුම් තිබේ දැ?" යි ඇසූහ.

"මහණෙනි! සිරගෙයි බැඳුම් මොන මහත් බැඳුම් ද, වතු පිටි ගේ දෙර මිල මුදල් රන් රිදී ආදියෙහි හා අඹු දරුවන් කෙරෙහි ආශ්‍රයෙන් බැඳෙන කෙලෙස් බැඳුම් ඉතා දැඩි ය, ඉතා මහත් ය, නො සියහෙන දුක් දෙන්නේ ය, මේ කෙලෙස් බැඳුම්, සිරගෙයි බැඳුමට වඩා සිය දහස් ගුණයෙන් මහත් ය, ලෙහෙසියෙන් පහසු- වෙන් නො බිඳිය හැකි මේ කෙලෙස් බැඳුම් නුවණැති පැරණියෝ සිඳ බිඳ දමා වතුපිටි ගේදෙර මිලමුදල් අඹුදරු නෑසියන් හැර දමා හිමවතට වැද පැවිදි වූහ" යි අතීත පුවතක් ගෙණ හැර දැක්වූ සේක.

"පෙර බරණැස, බඹදත් රජු රජය කරණ කල්හි මහසත් තෙමේ එක් දුප්පත් ගැහැවිකුලයෙක උපන්නේ ය, වයසින් වැඩී යත් ම පියා කලුරිය කෙලෙන් මහසත් ඒ ඒ තැන ගෙවල කුලී වැඩ කොට උපයා ගත් මිල මුදලින් මව පිළිදැගුම් කෙළේ ය, ඒ අතර මවු තොමෝ මහසතුන් නො කැමැතිබව කියද්දී ම ඔහුට කුලදුවක ගිවිස්සා ගෙණ වුත් ශරණ කොට දුන්නී ය, පුතුගේ ශරණයෙන් ටික දිනකදී ඕ කලුරිය කළා ය, ඒ කාලයෙහි බෝසත් බිරියගේ කුස, දරුගැබෙක් හට ගත්තේ ය, බෝසත්, සිය බිරිය කුස දරුගැබක් හට ගත්බව නො දැන බිරිය අමතා 'සොඳුර! කුලී වැඩ කොට හෝ පිළිවන් ලෙසකින් නී දිවි රැක ගන්න. මට මේ දිවියෙන් වැඩෙක් නැත, මම පැවිදි වන්නෙමි, මට එයට

කැමැත්ත දෙන්නැ’ යි කීය, එවිට භාර්‍යා තොමෝ ‘හිමියෙනි! මා කුස දරුගැබෙක් පිහිටා ඇත, එ දරු බිහි වූ පසු දරු ද බලා ගොස් පැවිදි වනු මැනැවැ’ යි කිවු ය, බෝසත් ‘ඒ යහපතැ’ යි බිරිය කියූ බස් පිළිගෙණ පැවිද්ද කල් තැබී ය, බිරිය ද දරු ප්‍රසූත කළා, ඉන් පසු බෝසත්, ‘සොඳුර! නී ඉතා පහසුවෙන් ගැහැටක් නො ලබා දරු වැදූ, දැන් ඉතින් මම පැවිදි වන්නෙම් දැ?’ යි ඇසූ විට ‘තව පොඩ්ඩක් නවතිනු මැනැව, දරු කිරෙන් වළකිනතුරු බලාපොරොත්තු වන්නැ’ යි ඉල්ලූ ය. එ බස් ද පිළිගෙණ ගමන් වළකා සිටිය දී ම බිරිය කුස තවත් දරු ගැබෙක් පිහිටියේ ය, ඒ අතර බෝසත් තෙමේ ‘මාගේ අදහසට මෑ නතු කර ගන්නට නො හැකි බව පෙණේ, එහෙයින් මැයට නො දන්වා ම පැන ගොස් පැවිදි වන්නෙම්’යි සිතා බිරියට නො දන්වා ම මහ රෑ නින්දෙන් නැගිට ගෙන් නික්ම ගියේ ය, එසේ නික්ම ගිය ඔහු නගරාරක්‍ෂක නිලධරයන්ගේ අතට හසු විය, එවිට බෝසත් මම වැන්දඹු මවක පිළිදගින්නෙක්මි, මා මුදාහළ මැනැවැ’ යි කියා ඔවුන්ගෙන් මිදී ටික දිනක් එක් තැනක වැස හිමවතට වැදී ඉසි පැවිද්දෙන් පැවිදි ව අභිඥසමාපත්තීන් උපදවා ධ්‍යානක්‍රීඩායෙන් යුක්ත ව කල් ගෙවී ය, බෝසත් තවුස් එහි මෙසේ වසනුයේ ‘මම මෙලොව කිසිවක්හටත් ලෙහෙසියෙන් පහසුවෙන් නො සිඳිය හැකි අඹුදරුවන් කෙරෙහි බැඳීම, උන් කෙරෙහි කෙලෙස් විසින් බැඳීම සිඳ හළෙමි’යි උදන් ඇණී ය’’යි මේ ඉකුත් වත ගෙණ හැර දක්වා ඔහු විසින් උදන් ඇණූ උදානය ප්‍රකාශ කරණ සේක් බුදු රජානන් වහන්සේ මේ ධර්මදෙශනාව කළ සේක.

**න තං දළ්හං බන්ධනමාහු ධීරා**
**යදායසං දාරුජං බබ්බජඤ්ච,**
**සාරත්තරත්තා මණිකුණ්ඩලෙසු**
**පුත්තෙසු දාරෙසු ච යා අපෙක්ඛා.**

**එතං දළ්හං බන්ධනමාහු ධීරා**
**ඔහාරිනං සිථිලං දුප්පමුඤ්චං,**
**එතම්පි ඡෙත්වාන පරිබ්බජන්ති**
**අනපෙක්ඛිනො කාමසුඛං පහායාන්ති.**

යකඩින් කළ දැවයෙන් කළ බබුස්තණින් කළ (යම් බන්ධනයෙක් වේ ද) ඒ හැම බන්ධන නුවණැත්තෝ දැඩි බැඳුම්ය යි නො කියත්. මැණික්වල හා කොඩොල්හි නොහොත් මිණිඔබා කළ කොඩොල්හි තදින් ඇලුනා වූ නොහොත් සාරබව නිසා ඇලුනා වූ යම් තෘෂ්ණායෙක් වේ ද, පුතුන් කෙරෙහි හා අඹුවන් කෙරෙහි හා යම් බලාපොරොත්තුවෙක් වේ ද,

නුවණැත්තෝ මේ බන්ධනය යට බලා යන ලිහිල් වූ නො මුදලිය හැකි දැඩි බැඳුමැ යි කියත්. මේ බැඳුම් ද සිඳ දමා බලාපොරොත්තු නැතියෝ කම්සැප හැර දමා පැවිදි වෙත්.

**න තං දළ්හං බන්ධනං ආහු ධීරා යං ආයසං දාරුජං බබ්බජං ච** = නුවණැත්තෝ යකඩින් කළ දැවයෙන් කළ බබුස් තණින් කළ යම් බන්ධනයෙක් වේ ද ඒ බන්ධන දැඩි බැඳුම්ය යි නො කියත්.[1]

**සාරත්තරත්තා මණිකුණ්ඩලෙසු පුත්තෙසු දාරෙසු ච යා අපෙක්ඛා** = මැණික්වල හා කන් අබරණෙහි හා නොහොත් මැණික් ඔබ්බා කළ කන් අබරණෙහි ද දූ පුතුන් කෙරෙහි ද, අඹුවන් කෙරෙහි ද යම් බලාපොරොත්තුවෙක් වේ ද.

**එතං දළ්හං බන්ධනං ආහු ධීරා ඔහාරිනං සිථිලං දුප්පමුඤ්චං** = නුවණැත්තෝ මේ බන්ධනය යට බලා යන ලිහිල් වූ නො මුදලිය හැක්කා වූ දැඩි බැඳුම්ය යි කියත්.

**එතං පි ඡෙත්වාන පරිබ්බජන්ති අනපෙක්ඛිනො කාමසුඛං පහාය** = මේ බැඳුම ද සිඳ දමා බලාපොරොත්තු නැයි ව කම්සැප හැර දමා පැවිදි වෙත්.

බුද්ධාදී වූ ධීරයෝ යකඩින් කළ හැසිළි බැඳුම්, දඬුයෙන් කළ දඬුකඳ ගැසීම්, බබුස්තණ ඈ අඹරා කළ රැහැන් බැඳුම් යන මෙ හැම බැඳුමක් කඩු සැත් ආදියෙන් සිඳ බිඳ දැමිය හැකි බැවින් මේ එක ද බැඳුමක් දැඩි බැඳුම්ය යි දුක් උපදවන බැඳුම්ය යි නො වදරත්.

මැණික් ගැණ, කන් අබරණ ගැණ, නැත, මැණික් ඔබ්බා කළ කළ කන් අබරණ ගැණ යම් කෙනෙක් තදින් ඇලී සිටිත් නම්, ඔවුන්ගේ එ තැන්හි ඇලීමත්, එසේ ම අඹුදරුවන් කෙරෙහි යම් තෘෂ්ණාවක් වේ නම්, ඒ කෙලෙස් බැඳුමත් දැඩි බැඳුම්ය යි වදරත්. එහෙයින් ධීරයෝ සත්වයා අපායයට හෙළන, බැඳි තැන සිවි මස් නො සිඳ ලේ නො සොල්වා බැඳි බව ද නො දන්වා හැම කටයුතු කරන්නට ඉඩ පහසු සලසන බැවින් ලිහිල් වූ එක් වරකුත් උපන් කෙලෙස් බැඳුම් ඩැහ ගත් තැනින් කට හරවා ගත නො හැකි කැසුබුවකු මෙන් ගලවා ගත නො හැකි බැවින් උනාලන්නට නො හැකි වූ මේ කෙලෙස් බැඳුම්, නුවණ නැමැති කඩුවෙන් කපා හැර සියලු කම්සැප හැර දමා නිවන් පිණිස පැවිදි වන්නාහු ය.

ධර්මදෙශනාවගේ අවසානයෙහි බොහෝදෙන සෝවන්පලාදි-යට පැමිණිහු ය.

**බන්ධනාගාර වස්තුව නිමි.**

1. 2. 1 'ධීරා' යනු බලනු.

# ඛෙමා

## 24 — 5

**බිම්සර** රජුගේ අගමෙහෙසී වූ **ඛෙමා** තොමෝ පෙර **පියුමතුරා** බුදුරජුන්ගේ සිරිපාමුල්හි පැතූ පැතුම් ඇතියා, දුටුවන් පහදවන රූ ඇතියා වූ ය. "බුදුරජාණන් වහන්සේ රූපයෙහි දොස් දක්වන්නාහ" යි අසා ඕ තොමෝ බුදුරජුන් වෙත යෑමට නොකැමැතියා වූ ය. රජ තෙමේ ඇය රූප මදයෙන් මත් ව සිටුනා බව දැන **වෙළුවන** උයන් වැණුම් ඇතුළත් කොට ගී කීපයක් කරවා නැට්ටුවනට හා ගී ගයන්නවුනට ද දෙවා ඔවුන් ලවා ගායනා කරවී ය. තැන තැන ඒ ගී ගයනු ඇසූ ඇයට, වෙළුවනය මෙයට කලින් නො දක්නා ලද්දක් සේ ද, වෙළුවන වැණුම් නො අසන ලද්දක් සේ ද වැටහින. එවිට ඕ තොමෝ "මේ උයන් වැණුම් කිනම් උයනක් සඳහා දැ" යි ඇසූ ය. "උත්තමාංගෙනි! ඔබවහන්සේගේ වෙළුවන උයන සඳහාය" යි කී කල්හි එහි යනු කැමැතියා වූ ය. බුදුරජාණන් වහන්සේ ඛෙමා බිසොව තමන් වහන්සේ වෙත එන බව දැන පිරිස මැද වැඩහිඳ දහම් දෙසන සේක් තල්වැට ගෙණ තමන් වහන්සේ වෙත සිට පවන් සලන මනා රූ ඇති දුටුවන් සිත් ඇද ගන්නා වූ කාන්තාරූපයක් මවා වදාළ සේක. ඛෙමා, පිරිස මැදට පිවිසෙන්නී ම ඒ කාන්තාව දැක "සම්මා සම්බුදු රජාණන් වහන්සේ රූපයෙහි දොස් වදාරති යි කියත්, උන්වහන්සේ වෙත සිට පවන් සලන මේ කාන්තාව කොතරම් හැඩහුරුකම් ඇතියා ද, රූ සපුව කාගේත් සිත් ගන්නී ය, මට මැයට සොළොස් කලාවෙන් කලාභාගයකටත් ලංවන්නට නො පිළිවන, මෑ ඒ තරමට රූ සපුවෙන් උසස් ය, මවිසින් මෙයට කලින් කවදාකත් මෙබඳු කාන්තාරූපයක් නො දක්නා ලද ය, මෙහිලා ඇතැම් දෙන බුදුරජාණන් වහන්සේට බොරුවෙන් නිගා කරති" යි සිතා බුදුරජුන්ගේ බණකතාවටත් කන් නො දී ම ඒ කාන්තාරූපය දෙස ම බලා සිටියා ය. එකල්හි බුදුරජාණන් වහන්සේ ඛෙමාගේ සිත් හසර බලා "ඛෙමා! තී රූපයෙහි හරෙක් ඇතැ යි සිතූ ය, දැන් මැයගේ රූපයෙහි නිසරුබව බලව, ඛෙමා! මේ රූපය මෝඩයන්ට ම ප්‍රිය ය, මෝඩයන් විසින් ම පතන ලද ය, ලෙඩ ආරෙක, අපිරිසිදු ය, කුණුකසළ ගොඩෙක, ඉහළිනුත් වැගිරෙන්නේ ය, පහළිනුත් වැගිරෙන්නේ ය, පණුකැදැල්ලෙකැ" යි වදාළ සේක. මෙසේ වදාළ කල්හි ඛෙමා තොමෝ සෝවන්පලයෙහි පිහිටා ගතු. නැවැතත් බුදුරජාණන් වහන්සේ ඇයට "ඛෙමා! රාගයෙන් රත් වූ ද්වේෂයෙන් දූෂිත වූ මෝහයෙන් මූළා වූ මේ සත්වයෝ තමන්ගේ සිත්හි අතර නො තබා දවා රැ දෙක්හි ගලා බස්නා තෘෂ්ණා

ප්‍රවාහය ඉක්මවාලන්නට නො හැකි ව එහි ලැගී බැඳී විපතට වැටෙත්ය'' යි වදාරා මේ ධම්දෙශනාව කළ සේක.

**යෙ රාගරත්තානුපතන්ති සොතං**
**සයංකතං මක්කටකොව ජාලං,**
**එතම්පි ඡෙත්වාන වජන්ති ධීරා**
**අනපෙක්ඛිනො සබ්බදුක්ඛං පහාය.**

රාගයෙන් රත් වූ යම් කෙනෙක්, තමන් කළ දැල අනුව සිටුනා මකුළුවා මෙන් තමන් උපදවා ගත් තෘෂ්ණා සැඩපහරෙහි වැටෙත් ද, (ඔවුහු තෘෂ්ණා සැඩ පහර ඉක්ම වන්නට නො හැකි වෙත්) නුවණැත්තෝ මේ තෘෂ්ණාස්‍රොතස ද සිඳ දමා බලාපොරොත්තු රහිත ව සියලු දුක් පහ කොට නිවනට වදිත්.

**යෙ රාගරත්තා අනුපතන්ති සොතං සයංකතං මක්කටකො ඉව ජාලං** = රාගයෙන් රත් වූ යම් කෙනෙක්, තමන් කළ දැල අනුව යන එහි වැද හෝනා මකුළුවා මෙන් තමන් උපදවා ගත් තෘෂ්ණාස්‍රොතසෙහි වැටෙත් ද, (ඔවුහු තෘෂ්ණාස්‍රොතස ඉක්ම වන්නට නො හැකි වෙත්.)

**එතං අපි ඡෙත්වාන වජන්ති ධීරා අනපෙක්ඛිනො සබ්බදුක්ඛං පහාය** = නුවණැත්තෝ මේ තෘෂ්ණා බන්ධනය ද සිඳ දමා වස්තුකාම-ක්ලේශකාමයන්හි බලාපොරොත්තු රහිත ව සියලු දුක් දුරු කොට නිවනට පැමිණෙත්.

මෙහි **''සබ්බං දුක්ඛං''**යි වදාළෙන් සසර වසනතාක්, පංචස්කන්ධය දරණතාක් විඳිය යුතු ජාතිදුක්ඛ - ජරාදුක්ඛ - ව්‍යාධිදුක්ඛ - මරණදුක්ඛ - අප්පියසම්පයොගදුක්ඛ - පියවිප්පයොගදුක්ඛ - ඉච්ඡාවිඝාතදුක්ඛ යනාදී වූ පස්කඳ ඇසුරු කොට සිටි දුක් ය. පස්කඳ ම දුක් වේ. එහෙයින් පස්කඳ දරණතාක් නිවන් ලබන්නට නො හැකි ය. එසේ ම සත්ත්වයන් විසින් පස්කඳ සතප්පන්නට පිළිදැගින්නට ගන්නා හැම දූයෙක් ම දුක් ය. එහෙයින් නිවන් ලබන්නට පස්කඳත් ඒ හැම දූයකුත් හැරදැමිය යුතු ය.

මකුළුවා තමන් ඇඳගත් හූ දැලෙහි මැද නැබ මඬලෙහි වැදහෙව දැල කෙළවර වැටී බැඳෙන පළඟැටියකු හෝ මැස්සකු දැක එතැනට වහා දුව ගොස් ඌ අල්ලා විද ඌගේ ලේටික බී නැවැත ගොස් නැබ මඬලෙහි වැද හෝනේ ය. එමෙන් රාගයෙන් රත් වූ ද්වෙෂයෙන් දුෂ්ට වූ මොහයෙන් මූඪ වූ සත්ත්වයෝ තමන් උපදවා ගත් ඒ තෘෂ්ණාව ඉක්මවා යන්නට අපොහොසත් වෙත්. **''යථා නාම මක්කටකො සුත්තජාලං කත්වා මජ්ඣට්ඨානෙ නාභිමණ්ඩලෙ**

නිපන්නො පරියන්තෙ පතිතං පටඞ්ගං වා මක්ඛිකං වා වෙගෙ-න ගන්ත්වා විජ්ඣිත්වා තස්ස රසං පිවිත්වා පුන ගන්ත්වා තස්මිංයෙව ඨානෙ නිපජ්ජති, එවමෙව රාගරත්තා දොසදුට්ඨා මොහමූළ්හා සයංකතං තණ්හාසොතං අනුපතන්ති. තෙ තං සමතික්කමිතුං න සක්කොන්ති" යනු අටුවා.

නුවණැත්තෝ වනාහි මේ දැඩි වූ තෘෂ්ණාබන්ධනය සිඳ හැර වස්තුකාම-ක්ලේශකාමයන්හි නිරාලය ව රහත්මග නුවණින් සියලු දුක් නසා නිවන්පුර වදනාහ, යනු තිග.

මක්කට = වඳුරු ය. මක්කටක = මකුළු ය. වඳුරා මෙන් අතුපතර තමන් ඇඳ ගත් හූ දැලෙහි හැසිරෙණුයේ 'මක්කටක' නම්. "මක්කටකො විය සාමායං අත්තනො තන්තුමයි චරතීති=මක්කට-කො" යනු විචෘතිසි.

ධර්මදෙශනාවගේ අවසානයෙහි ඛෙමා රහත්බවෙහි පිහිටා ගත්‍ය. ධර්මදෙශනා තොමෝ මහාජනයාට ද වැඩ සහිත වූ ය. ඉක්බිති බුදු-රජාණන් වහන්සේ රජු අමතා "මහරජ! මේ ඛෙමා පැවිදි වන්නට හෝ පිරිනිවෙන්නට සුදුසු ව සිටුනී ය"යි වදාළ කල්හි "ස්වාමීනි! ඛෙමා පැවිදිකරවනු මැනැවැ, පිරිනිවීමෙන් කම් නැතැ යි දන්වා සිටියේ ය. ඛෙමා පැවිදි ව අග්‍රශ්‍රාවිකාවක් වූ ය.

ඛෙමා ස්ථවිර වස්තු නිමි.

# උග්ගසෙන සිටුපුත්

## 24 — 6

**පන්සියයක් නළුවෝ** අවුරුද්දෙන් සමසක් ම **රජගහා** නුවරට පැමිණ එක්තැන සත්දවස බැගින් කෙළිනළු දක්වා බොහෝ රන් රිදී ලබාගෙණ යත්. තවත් ඒ අතරතුර කෙළිනළු බලන්නවුන් විසින් විටින් විට උන් ඉදිරියට දමන මිලමුදල්වල පමණෙක් ද නැත. මිනිස්සු මැසි පිට මැසි බැඳ හිඳ කෙළිනළු බලත්. එහිදී **එක් නළුදුවක්** හුණදණ්ඩකට නැගී ඒ මත්තෙහි පෙරළි පෙරළී කෙළවරට නැග අහසෙහි සක්මන් කරමින් නටන්නටත් ගී කියන්නටත් පටන් ගත්තා ය. එ වේලෙහි උස් මැස්සක් මත නැගී යහළුවන් සමග නැටුම් බලමින් උන් **උග්ගසෙන** සිටුපුත් තෙමේ ඇයගේ අත්පා සැලීම් අත්පා විසුරුවීම් ආදිය දැක ඇය කෙරෙහි උපන් ආලය ඇති ව ගෙට ගොස් ඇය ගැණ සිතමින් “මේ නිළිය ලැබෙතොත් ඉදිරියට ජීවත් විය හැකි ය, නැත, මෙහි ම මැරෙමි”යි කෑම් බිම් වලකා ඇඳ වැතිර නිදි ගත්තේ ය. මවුපියෝ එසේ නිදන පුතා දැක වෙතට ගොස් “පුතා! ඇයි, නිදනි? උඹට කුමක් වුවමනා ද”යි ඇසූහ. එවිට හේ “අර නැටුම්හලෙහි අත්පා විදහමින් නැටූ නිළිය බිරිය කොට මෙහි පමුණුවා ගන්නට ලැබෙතොත් ඉදිරියට ජීවත් විය හැකි ය, නො ලැබෙතොත් ජීවත්වනු අපහසු ය”යි සිතේ නැගි අදහස නො සඟවා කී ය. “ඇයි, පුතේ! එසේ කියනි? එසේ හිනන්නට කියන්නට එපා, අපි උඹට අපේ කුලයට අපේ පොහොසත් කමට සරිලන කුල කතක බිරිය කොට පාවා දෙන්නෙමු, ඒ නිසා පිසක් ඉවසන්නැ”යි මවු පියන් කී විට සිටුපුත් එයට කන් නො දී “නිළිය ම ඕනෑ ය”යි කියමින් නිදන්නට වන. එහිලාත් බොහෝ කරුණු කියාත් මෙහි වරද ඔහුට ඒත්තු ගැන්වීමෙහි අපොහොසත් වූ ඔහුගේ පියා යහළුවකු ගෙන්වා කහවණු දහසක් දී “එදා අර නැටුම්හලෙහි අහසට නැග නැටූ නළුදුව ගෙණවුත් මාගේ පුතුට බිරිය කොට පාවා දෙන්නැ” යි කියා යහළු නළුදුවගේ පියා වෙත යැවී ය. ඔහු නළුදුවගේ ගෙට ගොස් උග්ගසෙනගේ අදහස් නළුදුවගේ පියා ඉදිරියෙහි කියා සිටියේ ය. එ වේලෙහි ඔහු “මාගේ දුව කහවණුවලට දෙන කෙල්ලක් නො වේ, කහවණුවලට ඇය නො දෙමි, ඔහුට මැය නො ලැබ ජීවත් විය නො හැකි නම්, දෙන් නෙම්, හැබැයි, අප සමග විසිය යුතු ය, අප සමග හැසිරිය යුතු ය, එසේ අප සමග හැසිරෙන්නට කැමැති නම් දුව දීමට කැමැත්-තෙමි”යි නළුදුවගේ පියා කී ය. මගුල්කපු පෙරළා ගොස් එබව උග්ගසෙනගේ පියාට දැන්වී ය. මවුපියෝ මගුල්කපු කී කතාව උග්ගසෙනට දැන් වූහ. උග්ගසෙන ඔවුන් හා හැසිරෙන්නට කැමැති

බව කී කල්හි ඔහුගේ යහළුවෝත් නෑදෑයෝත් ගමන වළකාලන්නට නොයෙක් ලෙසින් කරුණු කීහ. ඒ කියූ කිසිවක් නොපිළිගෙණ උග්ගසෙන නළුගෙට ගොස් එහි නවාතැන් ගත්තේ ය. නළු ද තම දුව බිරිය කොට ඔහුට පාවා දී ඔහු හා ම ගම් නියම්ගම් රජදනවුහි නළුසිප් දක්වමින් හැසුරුණේ ය. මද දවසක් යත් ම නළුදුවට උග්ගසෙන නිසා පුතෙක් උපන්නේ ය. ඕ තොමෝ හඬන පුතු නළවන්නී "ගැල්රකින්නාගේ පුතා, බඩුඅදින්නාගේ පුතා, කිසිවක් නො දන්නහුගේ පුතා, බත් බුදින්නාගේ පුතා, නො හඬා ඉන්නැ" යි කියමින් පුතු නළවන්නී ය. උග්ගසෙන ද ගැල් ලිහා ගොනුන් මුදාහළ තැනට ගොනුන්ට දෙන්නට තණ ගෙණ යත්තේ ය. ශිල්ප දක් වූ තැන්වල දී ලැබුනු බඩු මූට්ටු කර තබා අදින්නේ ය. දරදිය ගෙට ගෙණෙන්නේ ය. හැළිවළත් පිහත් කෝප්ප සෝදන්නේ ය. උයන්නේ ය. පිහන්නේ ය. ඒ නිසා ම නළුදුව, ගැල් රකින්නාගේ පුතා නො හඬා ඉන්න, යනාදිය කියමින් පුතු නැළවූවා ය.

උග්ගසේන, තමන් ගැණ තම බිරිය මෙසේ ගී කියා පුතු නළවන බව අසා දවසක් බිරිය අමතා "ඔයා කියන දරුනැළවිලි ගී මට රිදවන පිණිස ගොතා කියන දරුනැළවිලි නො වේ දැ" යි ඇසී ය. "ඔවු, ඒවා ඔයා ගැණ ගොතා ගත් ඒවා" යි කී විට "එසේ නම් මම ඔයා හැර යමි, ඔයාට මා ප්‍රිය නො වන බව පෙණේ" යි උග්ගසෙන කී ය. එවිට "ඔයා මා හැර ගියත් නො ගියත් මට කම් නැත, ගියත් කමෙක් නැත, නො ගියත් කමෙක් නැත, මෙය මාගේ වුවමනාවට කන දීගයෙක් නො වේ, ඔහේගේ ඇවිටිල්ල නිසා මෙය සිදු විය, මා නො ලැබුනොත් දිවි නසා ගන්නාබව ඔහේ කීයේ නො වේ ද, මාගේ ඉල්ලීමක් නිසා මෙය කෙරුණේ නො වේ, එහෙයින් ඕනෑ තැනක ගියාට මගෙන් වරදෙක් නැත, කිසිවක් නො දන්නා මෝඩයකුගෙන් මට වැඩෙක් නැතැ" යි කියා පළමු සේ ම දරුනැළවිලි කියා පුතු නැළවූ ය. මේ නළු ගැණිය තමාගේ රූ සපුවත් වත්පොහොසත් කමත් නිසා සිටුපුත් සිය ගෙයි වැඩ කරු කොල්ලකු තරම් කොටත් නො සිතූ ය. ඒ වේලෙහි "මැයට මේ මානය කුමක් නිසා වී දැ" යි සිතන උග්ගසෙන "ශිල්ප දන්නා නිසා මේ උපන, වේවා, මමත් ශිල්ප උගන්නෙමි" යි සිතා මාමණ්ඩිය වෙත ගොස් ඔහු දන්නා තාක් ශිල්ප උගෙණ ගම් නියම්ගම් ඈ හි ශිල්ප දක්වමින් පිළිවෙළින් රජගහා නුවරට පැමිණියේ ය. එහි දී "අදින් සත් දවසක් ගිය තැන උග්ගසෙන සිටුපුත් නුවර වැස්සන්ට ශිල්ප දක් වන්නේ ය" යි දන්වීම් පළකරවී ය. නුවර වැස්සෝ මැසි පිට මැසි බන්දවා සත්වනදා එහි රැස් වූහ. උග්ගසෙන ද එදා හැටරියනක් පමණ දිගැති උණ ගසකට නැඟී එහි මුදුන සිට ගත්තේ ය.

එදවස බුදු රජාණන් වහන්සේ ලොව බලා වදාරණ සේක් උග්‍රසෙන දැක "ඔහුට ඉදිරියෙහි වන්නේ කිමැ" යි බැලූ සේක. එකල්හි "හෙට උග්‍රසෙන ශිල්ප දක්වමි යි උණගසක් මුදුනට නගින්නේ ය, ඔහු බලන්නට මිනිස්සු ද එහි රැස් වන්නාහ, මම එහි දී සිවුපැදිගයක් දෙශනා කරන්නෙමි, එය ඇසීමෙන් සුවාසූ දහසක් දෙනාට ධර්මාවබොධය වන්නේය, උග්‍රසෙනත් රහත්බැව්හි පිහිටා ගන්නේ ය" යි දැන වදාළ බුදු රජාණන් වහන්සේ පසුදා කල් බලා භික්ෂුසඞ්ඝයාගෙන් පිරිවරණ ලදු ව රජගහා නුවරට පිඩු සිඟා, වැඩිය සේක. උග්‍රසෙන, බුදු රජුන් ඇතුල් නුවරට වැඩම වන්නට පෙරාතුව ම කෙළිනළු බලන්නට එහි රැස්වූවන්ට මහා හඬ නගන් නට ඇඟිලි පා ඉඟි කොට උණගස මතුයෙහි සිට අහසෙහි ම සත් වරක් කරණම් ගසා බැස උණදඬු මතුයෙහි ම සිට ගත්තේ ය. බුදු රජාණන් වහන්සේ නුවරට ඇතුල්වන සේක් එහි රැස් ව හුන් පිරිස උග්‍රසෙන වෙත නො බලා තමන් වහන්සේ දෙස ම බලන ලෙසට ඉටා වදාළ සේක. ඒ අතර උග්‍රසෙන, ඒ පිරිස දෙස බලා පිරිස තමන් දෙස නො බලනබව දැන දෙම්හසට පැමිණ "අවුරුද්දකට වරක් සමසකට වරක් දක්වන මේ කෙළිනළු නො බලා මිනිස්සු බුදු රජුන් දෙස ම බලන්නාහ, මාගේ මේ කෙළිනළු දැක්වීම හිස් වැඩෙ කැ" යි සිතී ය. බුදු රජාණන් වහන්සේ ඔහුගේ සිත දැන මුගලන් මහතෙරුන් අමතා "මුගලන! යන්න, සිටුපුත්හට කෙළිනළු දක්වන්න කියව" යි වදාළ විට උන්වහන්සේ ගොස් උණගස යට සිට සිටුපුත් අමතා,

"මහ බලැයි නළුපුත් – උග්සෙන් බලව මෙපිරිස,
එ බැවින් රඟ කිරීමෙන් – මහදන සතුටු කරවා"

යි කියා සිටියහ.

සිටුපුත් මහතෙරුන්ගේ මේ ප්‍රකාශය අසා තුටුසිත් ඇතියේ "බුදුරජාණන් වහන්සේත් මාගේ කෙළිනළු බලනු කැමැති සේක් වනැ" යි සිතා උණගස මතුයෙහි සිටියේ ම

"මහගුණැති මහඉදු - මුගලන් සමිඳ! එබැවින්,
මෙ පිරිස් මැද ද රඟ පා – මහදන සතුටු කරවමි"

යි කිය මෙසේ කියා උණගස මුදුනෙන් අහසට නැගී අහසෙහි දී ම තුදුස් වරක් කරණම් ගසා බැස උණගස මුදුනෙහි සිට ගත්තේ ය. ඉක්බිති බුදු රජාණන් වහන්සේ "උග්‍රසෙන! නුවණැත්තහු විසින් කළ යුත්තේ අතීත – අනාගත – වර්තමාන සකන්ධයන්හි ඇලීම හැර දමා ජාති ජරා මරණාදී වූ දුක්වලින් මිදීම ය" යි වදාරා මේ ධර්ම-දෙශනාව කළ සේක.

**මුඤ්ච පුරෙ මුඤ්ච පච්ඡතො මජ්ඣෙ මුඤ්ච භවස්ස පාරගූ,**
**සබ්බත්ථ විමුත්තමානසො න පුන ජාතිජරං උපෙහිසි.**

අතීත පඤ්චස්කන්ධයෙහි පැවැති තෘෂ්ණාව මුදා හරුව. අනාගත පඤ්චස්කන්ධයෙහි පැවැති තෘෂ්ණාව මුදා හරුව. වර්තමාන පඤ්චස්කන්ධයෙහි පැවැති තෘෂ්ණාව මුදාහරුව. භවයෙහි පරතෙරට ගිය තෝ හැම තැන මිදුණු සිත් ඇතියෙහි නැවැත ජාතිජරාවනට නො පැමිණෙන්නෙහි ය.

**මුඤ්ච පුරෙ** = අතීත පඤ්චස්කන්ධයෙහි පැවැති තෘෂ්ණාව මුදාහරුව.

**මුඤ්ච පච්ඡතො** = අනාගත පඤ්චස්කන්ධයෙහි තෘෂ්ණාව මුදාහරුව.

**මජ්ඣෙ මුඤ්ච** = වර්තමාන පඤ්චස්කන්ධයෙහි තෘෂ්ණාව මුදාහරුව.

සත්වයනට අතීත පඤ්චස්කන්ධය නිසා අනාගත පඤ්චස්කන්ධය නිසා වර්තමාන පඤ්චස්කන්ධය නිසා උපදනා ආශාව, නිකාන්තිය, එහි ගැලීම, එය පැතීම, එහි නැගී සිටීම, බැසගැණීම, පැහැසීම, උද්වේගය යන හැම තෘෂ්ණාවයෙක් ම හැර දැමිය යුතුය.

**භවස්ස පාරගූ** = (තෝ) භවයෙහි පරතෙරට ගියෙහි ය.

**භවස්ස,** යන මෙපදයෙන් ප්‍රධාන විසින් කියවෙනුයේ කාමභව – රූපභව අරූපභව යන භවත්‍රය යි. සඤ්ඤාභව – අසඤ්ඤාභව – නෙවසඤ්ඤානාසඤ්ඤාභව – එක වොකාරභව – චතු වොකාරභව – පඤ්චවොකාරභව යන මේ භවයෝ ද මෙහි ම සඞ්ග්‍රහයට යෙති. මේ භව සියල්ල එක් ව ගෙණ උපපත්තිභවයයි කියනු ලැබේ. මෙතැන්හි කර්මයෙන් හටගත් උපාදින්නසකන්ධයෝ ම භව නාමයෙන් ගැණෙත්. කාමභවයෙහි පහළ වන උපාදින්නසකන්ධ කාමභව නම් සෙසු රූප භවාදීන් ගැණ ද මෙසේ දතයුතුය. සකන්ධයන් අතර කර්මයෙන් හටගන්නා කොටස ම උපාදින්නසකන්ධය යි ගැණේ.

භව ශබ්දය වෘද්ධි – **සම්පත්ති පුණ්‍ය – සකන්ධ – අවකාශ – සංසාර ශාස්වත** යනාදි නොයෙක් අරුත්හි හෙන්නේය. ග්‍රන්ථාන්තරයෙන් ඒ දතයුතු ය.

**සබ්බත්ථ විමුත්තමානසො න පුන ජාතිජරං උපෙහිසි** = හැම තැන මිදුණු සිතැතියෙහි, නැවැත ජාතිජරාවනට නො පැමිණෙන්නෙහි ය.

මෙසේ අතීත අනාගත වර්තමාන සකන්ධයන්හි ආශා නිකාන්ති ආදිය හැර අභිඥා – පරිඥා – පහාණ – භාවනා – සච්ඡිකිරියා

යන මොවුන්ගේ වශයෙන් ත්‍රිවිධ භවයෙහි පරතෙරට ගියෙහි, එහෙයින් සකන්ධ ධාතු ආයතන විසින් භෙදයට ගිය සියලු සංසකාර ධර්මයන්හි මිදුණු සිතැති ව වසන්නෙහි, නැවත ජාතිජරාමරණාදී වූ දුක්වලට කවදාත් නො පැමිණෙන්නෙහි, යි වදාළ සේක.

ධර්මදෙශනාවගේ අවසානයෙහි සුවිසූ දහසක් සත්‍වයනට ධර්මාවබොධය වූයේ ය.

සිටුපුත් තෙමේ උණගස මතුයෙහි සිටියේ ම පිළිසිඹියාවත් සමග රහත්බවට පැමිණ උණගසින් බැස බුදුරජුන් වෙත ගොස් මනාකොට පසඟ පිහිටුවා වැඳ පැවිද්ද ඉල්ලා සිටියේ ය බුදුරජානන් වහන්සේ දකුණත දිගු කොට "මහණ! මෙහි එන්නැ" යි අඞගා වදාළ ඇසිල්ලෙහි සිටුපුත් අට පිරිකර දරා ගත් සැටවස් පිරුණු මහතෙර නමක් සේ බුදුරජුන් ඉදිරියෙහි පෙණී සිටියේ ය. එකල්හි භික්ෂූන් වහන්සේලා "ඇවැත්නි! උගගසෙන! සැටරියන් දිගැති උණගස මතුයෙහි සිට බිමට බස්නා විට "ඔබට බියෙක් ගැහීමෙක් තැති ගැණීමෙක් නො හට ගත්තේ ද?" යි විචාළ කල්හි "සවාමීනි! මට එබඳු කිසිත් බියෙක් ගැහීමෙක් නො වී ය" යි කී ය. භික්ෂූන් වහන්සේලා බුදු රජුන් වෙත ගොස් "සවාමීනි! උගගසෙන බොරු කියා තමා පිළිබඳ රහත් බවක් කියාලන්නේ ය" යි දන්වා සිටි විට බුදු රජානන් වහන්සේ "මහණෙනි! මාගේ පුත්‍ර වූ උගගසෙන වැනි සිඳහල සසර බැඳුම් ඇති භික්ෂූහු කිසි තැනෙක බියට පත් නො වන්නාහ, තැති නො ගන්නාහ" යි වදාරා බ්‍රාහමණවර්‍ගයෙහි එන,

"සබබසංයොජනං ඡෙත්වා යො වෙ න පරිතසසති,
සඞගාතිගං විසංයුත්තං තමහං බ්‍රෑමි බ්‍රාහමණතති"

යන මේ ධර්මදෙශනාව කළ සේක. දෙශනාවසානයෙහි බොහෝ දෙනාට ධර්මාවබොධය වූයේ ය.

දවසක් ධර්මසභායෙහි රැස් වූ භික්ෂූන් වහන්සේලා "ඇවැත්නි! මෙසේ රහත් වන්නට හෙතුසමපත් ඇති ව සිටි මහණක්හට නළු දුවක නිසා නළුවන් හා එක් ව හැසිර දිවි හෙවන්නට වීමේ හෙතුව කුමක් ද? රහත් වන්නට වාසනාව කෙසේ ලැබී දැ?" යි කතා කරන්නට වූහ. ඒ අතර බුදු රජානන් වහන්සේ එහි වැඩම කොට "මහණෙනි! තමුසේලා කුමක් ගැණ කතා කරන්නහු දැ?" යි අසා උගගසෙනයන් ගැණ ය, යි දන්වා සිටි කල්හි "මහණෙනි! ඒ නම මේ දෙකට ම සුදුසු වැඩ කෙළේය" යි වදාරා ඒ දක්වන්නට එහි ඉකුත් පුවත මෙසේ වදාළ සේක.

"පෙර කසුප් බුදුරජුන් පිරිනිවි කල්හි උන්වහන්සේගේ ධාතු ගෙණ ඒ ධාතු නිදන් කරන්නට මිනිස්සු සෑයක් ගොඩ නගන්නට පටන් ගත්හ, එකල්හි බරණැස් නුවර වැසි කුලපුත්‍රයෝ කෑයුතු බිදිය යුතු දෑය ගැල්වල නගා ගෙණ සෑයෙහි වැඩ කරන්නට එහි ගියහ, ඒ යන ගමනේ දී ඔවුනට පිඩු සිඟා යන මහතෙරනමක් මුණ ගැසුනේ ය, උන් අතර සිටි එක් කුලදුවක් තෙරුන් දැක තම හිමියාට කතා කොට 'ආයර්‍ය්‍යයන් වහන්සේ නමක් පිඩු සිඟා වඩනාහ, අපගේ ගැලෙහි ද කෑයුතු බිදිය යුතු බොහෝ දෑය ඇත්තේ ය, වහා ඉදිරියට ගොස් උන්වහන්සේ ගේ පාත්‍රය ගෙණ එන්න, උන්වහන්සේට වැලඳිය හැකි යමක් පිළිගන්වමු"සි කිවු ය. ඔහු ද වහා ගොස් පාත්‍රය ඉල්ලා ගෙණ අවුත් වැලඳිය හැකි නොයෙක් දෑයින් පාත්‍රය පුරවා ගෙණ ගොස් තෙරුන්ට පිළිගන්වා වැඳ "ස්වාමීනි! මේ පිණෙන් අපි ඔබවහන්සේ අවබෝධ කළ ධර්මයට හිමි වන්නෙමුවා' යි පැතුහ, උන්වහන්සේ ද අනාගතය බලා ඔවුන්ගේ පැතීම සමෘද්ධ වන බව දැන සිනහ පහළ කළහ, උපාසිකාව එය දැක, "හිමියෙනි! හාමුදුරුවන් වහන්සේ සෙන්නාහ, නටන්නකු වන්නට බැරි නැතැ' යි කීවා ය. හිමි ද 'සොඳුර!' විය හැකිය, යි කීයේ ය, මේ එවුන්ගේ පූර්වකර්මය යි, ඔවුහු එහි ආයුෂ ඇතිතාක් දිවි ගෙවා කලුරිය කොට දෙව්ලොව ඉපද ඉන් ච්‍යුත වූහ, ඒ ච්‍යුත වීමෙහි දී උපාසිකාව නළුවන්ගේ ගෙයක මෙසේ උපත ලැබූ ය, උපාසක සිටුගෙයක උපන්නේ ය, ඔහු 'සොඳුර! එසේ විය හැකිය' යි උපාසිකාවට පිළිවදන් විසින් කී බැවින් නළුවන් සමග ගම්නියම්ගම්හි හැසුරුණේ ය, රහත්නමක්හට දුන් පිණ්ඩපාතය නිසා රහත් වූයේය" යනු. නිළිය ද මාගේ හිමියාට යම් ගතියෙක් වේ නම් මාගේ ද ඒ ගතිය මැයි පැවිදිව රහත් වූය.

**උග්ගසෙනශ්‍රෙෂ්ඨිවස්තුව නිමි.**

# කෙල්ලකගේ බසට රැවටුණු මහණෙක්

**24 — 7**

තරුණ භික්ෂු නමක් ලහගෙයි දී තමන්ට ලැබුනු ලහයෙන් ලහකැඳක් ලබා ගෙණ වළඳන්නට අසුන්හලට ගොස් එහි පැන් නො තුබුනු බැවින් පැන් ගෙණ එන්නට ලඟ තුබූ ගෙයකට ගියේ ය. එහි සිටි තරුණ කෙල්ලක්, ඒ මහණහු දුක උන් කෙරෙහි උපන් සෙනහ ඇතියා පැන් දී "ස්වාමීනි! නැවැතත් පැන් වුවමනා විටක මෙහි වඩිනු මැනැවැ"යි කියා සිටියා ය. ඒ මහණ එතැන් පටන් පැන් වුවමනා හැම දවසෙහි ම එහි යන්නේ ය. කෙල්ල ද ඔහුගේ පාත්‍රය ගෙණ පාත්‍රය පුරවා පැන් දෙන්නී ය. මෙසේ කල් යත් අතරතුරෙහි කැඳත් පිළියෙල කොට දීලා නැවැත දවසෙක ගෙයි ම වඩා හිඳුවා බතුත් පිළියෙල කොට වළඳවා මහණහු වෙත හිඳ "ස්වාමීනි! අපේ මේ ගෙයි මිනිසුනට දිවි යවන්නට වුවමනා හැම දෑයෙක් ඇත්තේ ය, කෑම් බීම් ඇඳුම් කැඩුම් මිලමුදල් ආදියෙන් මෙහි කිසි අඩුවෙක් නැත, අපට අයත් ඉඩ කඩම් වතුපිටි කුඹුරු හේන් ද බොහෝ ය, නැත්තේ ඒවා රැක බලා ගෙණ නිසි සේ තව තවත් දියුණු කොට වැඩ ගන්නා පිරිමියෙක් පමණැ"යි කීවා ය. මහණ තෙමේ කෙල්ලගේ මේ කතාව අසා කිහිප දවසක් යත් ම සසුනෙහි නො ඇලී ගියේ ය. සිවුරු හැර යන්නට සිතමින් කල් ගෙවී ය.

දවසක් ආගන්තුක ව පැමිණි භික්ෂූන් වහන්සේලා මේ මහණහු දුක "ඇවැත්නි! වැහැරී ගියෙහි කුමක් නිසා?, මස් ලේ වියලී ඇට නහර ඉල්පුනු සිරුරු ඇතියෙහි ඇයි දැ?"යි විචාළාහු ය. "ස්වාමීනි! මට දුන් සසුනෙහි ඇල්මෙක් නැත, මම එහි කලකිරී සිටිමි, නොයෙක් අදහස් මා සිත නැගෙන්නේ ය, රෑට නිදීමෙක් නැත, කෑම් බීම් පවා මට රුචි නො වේ ය"යි කීයේ ය. එවිට ඒ භික්ෂූන් වහන්සේලා ඒ මහණ, ඔහුගේ ආචාර්‍ය්‍යෝපාධ්‍යායයන් වෙතට පමුණුවාලූහ. ආචාර්‍ය්‍යෝපාධ්‍යායයෝ ඔහු බුදුරජුන් වෙතට ගෙණ ගොස් ඒ කාරණය උන්වහන්සේට සැලකොට සිටියහ. බුදුරජාණන් වහන්සේ "මහණ! තමුසේ සසුනෙහි කලකිරුණහු සැබෑ දැ?"යි අසා වදාළ කල්හි "එසේ ය, ස්වාමීනි!"යි ඔහු පිළිවදන් දුන්නේ ය. "මහණ! තමුසේ මා වැනි ධාර්මික වීර්‍ය්‍යවත් බුදුවරයකුගේ සසුනෙහි පැවිදි ව සෝවනැ යි හෝ සෙදගැමි යි හෝ කියවා නො ගෙණ කුමක් නිසා උකටැළියෙකැ යි කියවා ගත්තහු ද? තමුසේ කළහු සැහැසි කමෙකැ"යි වදාරා "උකටළී වන්නට කරුණු කිමැ?"යි විචාළ සේක. "ස්වාමීනි! තරුණ කෙල්ලක් අපේ ගෙයි මිනිසුනට සහතින් ජීවත් වන්නට වුවමනා හැම දෑයෙක් ම ඇත්තේ ය, කෑම් බීම් ඇඳුම් පැළඳුම් යාන වාහන මිල මුදල් ඈ කිසිවකින් අපට

අඹුවෙක් නැත, අඹු නම් ඒවා රැක බලා ගෙණ නිසිසේ වැඩ ගන්නට දන්නා පිරිමියෙක් පමණැ යි මා වෙත හිඳ මට කීවා ය, එයින් මාගේ සිත ඇය කෙරෙහි නැමී ගියේ ය, ඇලී ගියේ ය, සසුන කෙරෙහි තුබූ ඇලීම බැඳීම එයින් නැති ව ගියේ ය''යි කී කල්හි ''මහණ! ඒ තරුණ කෙල්ලගේ කතාවත් කිරියාවත් ගැණ පුදුම වන්නට ඉඩෙක් නැත, ඈ, පෙර මුළු දඹදිව දුනුවායන්ට අග්‍ර වූ **ධනුග්ගහ** පණ්ඩිතයා හැර දමා ඒ ඇසිල්ලෙහි දුටු හොරකු කෙරෙහි පෙම් බැඳ ධනුග්ගහ ජීවිතක්ෂයට පමුණුවාලූ ය''යි වදාළ සේක. එකල්හි ''ස්වාමීනි! එ පුවත අපට පැහැදිලි කර දෙනු මැනැවැ''යි භික්ෂූන් විසින් ආරාධිත වූ බුදුරජාතන් වහන්සේ ඒ අතීතප්‍රවෘත්තිය ගෙණ හැර දක්වූ සේක.

''මහණෙනි! එක් කලෙක මේ මහණ තෙමේ **චුල්ලධනුග්ගහ** නම් පණ්ඩිත විය. මෙ තෙමේ **තක්සලා** නුවර **දිසාපාමොක්** මහ ඇදුරු වෙත ගොස් ධනුශ්ශිල්පය මැනැවින් උගත්තේ ය, මොහුගේ ඉගෙණුමෙහි තුටු පහටු වූ දිසාපාමොක් ඇදුරු සිය දුවනිය මොහුට පාවා දුන්නේ ය, එදා මොහුට බිරිය වූවා මේ කෙල්ලය, මෙ තෙමේ එදා මේ කෙල්ල ගෙණ බරණැසට යන ගමනේ දී එක් වල්කඩෙකදී තමන් අත තුබූ ඊතල පණසකින් සොරුන් පණස් දෙනකු මරා දැමී ය, ඊතල අවසන් වූ බැවින් එහි සිටි, සොරදෙටු මරාගත නො හැකි වූ මෙ තෙමේ සොරදෙටු අල්ලා බිම හෙළා බිරියට කතා කොට 'සොඳුර! කඩුව ගෙණ එව'යි කී ය. ඕ තොමෝ කඩුව ගෙණැවිත් තම හිමියාට නො දී සොරදෙටු දුටු ඇසිල්ලෙහි ම පෙම් බැඳ බිම වැටී හුන් සොරදෙටු අතට කඩු මිට දී කඩු කොපුව පමණක් හිමියා අත තැබූ ය, කඩුව ගත් සොරදෙටු එදා ධනුග්ගහ පණ්ඩිත වූ මේ මහණ මරා හෙළුයේ ය, ඉන් පසු සොරදෙටු මැය ගෙණ යනුයේ අතරමග දී ගඟක් දැක එහි ඉවුරෙහි නැවතී සිට, මැ මා ලවා පෙර පුරුදු හිමියා මැරවූවා සේ ම අන් එකකු දැක ඌ කෙරෙහි පෙම් බැඳ මා ද මරවන්නී ය, එහෙයින් මැයගෙන් මට වැඩෙක් නැතැ'යි සිතා 'සොඳුර! මා මේ බඩු එ තෙරට ගෙණ ගොස් තබා ඔයා ගෙණ යන්නට එනතුරු මෙහි රැදී සිටුව'යි ඇය ඇඳ තුබූ රෙදි කඩ උනා අන් රෙදි පිළිත් පලන් අබරණත් එහි බහා පොට්ටනියක් කොට බැඳ ගෙණ පීනා මෙගොඩට පැමිණ ඈ හැර දමා ගියේ ය, ඇඳ තුබූ රෙදිකඩටත් අහිමි වූ ඒ ගැණිය නිරුවතින් අසල තුබූ කැලෑරොදකට වැදී හුන්නී ය,

ඒ වේලෙහි සක්දෙව්, මැය දැක පඤ්චශිඛ–මාතලි දෙව් පුතුන් කැඳවා, අසවල් ගඟ අසල කැලෑරොදෙහි සැඟවී ඉන්නා ගැහැණිය වෙහෙසන්නට වුව මැනව, එහෙයින් පඤ්චසිඛ උකුසු වෙසක් ගන්න, මාතලී මත්ස්‍ය වෙශයක් ගන්න, මම කැණහිල් වෙසක්

ගෙණ කටින් දඩමස් කැටියක් ඩැහැගෙණ ගං ඉවුරට යන්නෙමි, එවිට පඤ්චසිඛ උකුසු වෙසින් අහසෙහි එහා මෙහා පියාඹින්න, මම කට තුබූ දඩමස් කැටිය හැර දමා මසු ඩැහැ ගන්නට යන්නෙමි, පඤ්චසිඛ මා හැර දැමූ මස් කැටිය උකුසු වෙසින් අවුත් ඩැහැ ගණුව, මාතලී වහා දියට පැන යව'යි කීයේ ය, මෙසේ නියම කොට ගෙණ තිදෙන ම අවුත් ඒ ගැහැණියගේ ඉදිරියෙහි පෙණී ගියහ, කැණහිල් මස් කැටිය ඩැහැ ගෙණ ගං ඉවුරෙහි යන කල්හි ගොඩට පැන සැලෙන ගැහෙන මසු දැක කට තුබූ මස් කැටිය බිම හෙලා මසු අල්ලා ගන්නට පැන්නේ ය, මසු දියෙහි ගැලුනේ ය, උකුස්සා මස් කැටිය ඩැහැ ගෙණ අහසට නැංගේ ය, කැණහිල් මසු හා මස් කැටිය හා දෙක ම නො ලැබ කලබල වී ගහ අසබඩ හුන් ගෑණියගේ මුණ බලන්නට වන, ඕ තොමෝ කැණහිල් දැක සිනාසෙන්නට වූ ය, ඒ දුටු කැණහිල් 'මෙ තැන නැටීමෙක් ගී කීමෙක් කෙළිනළුවෙක් නැත, කුමක් නිසා සෙන්නෙහි ද?''යි ඇයගෙන් විචාළේ ය, 'තා කටින් ඩැහැ ගෙණ ආ මස් කැටිය බිම දමා මසු අල්ලා කමි'යි ගිය බැවින් මස් කැටිය තට නැති විය, මස් කැටිය උකුසු ගසා ගෙණ ගියේ ය, මසු දියට පැන්නේ ය, මෙය දුටු මට සිනා ආයේ වැනැ'යි ඈ කීවා ය, එවිට, තී මට සිනාසෙහි, තී පළමු දීග කැ සැමියාත් තිට නැති විය, නැවැත ගත් අළුත් හිමියාත් නැති විය, දැන් දෙන්නා ම නැති ව එකලාව ඉන්නා තී මට සිනාසෙහි, මේ කම් කරණ ලද්දේ තී විසිනැ'යි ඇයට නින්දා කොට සක්දෙව් දෙව්ලොවට ගියේ ය''යි **චුල්ලධනුග්ගහජාතකය** මෙසේ වදාළ සේක.

''මහණ! එදා චුල්ලධනුග්ගහ පණ්ඩිත වූවහු තමුසේ ය. ඒ ගෑණිය මෙදා මේ කෙල්ල ය, කැණහිල් වෙසින් අවුත් ඇයට නිග්‍රහ කළ සක්දෙව් මම වෙමි''යි ද වදාරා මෙසේ ඒ ගෑණිය, දුටු ඇසිල්ලෙහි එකකු කෙරෙහි පෙම් බැඳීමෙන් මුළු දඹදිව විසූ අග්‍ර පණ්ඩිතයකු ජීවිතයෙන් තොර කළා ය, මහණ! ඒ ගැහැණිය ඇරැබ උපන් තාගේ තෘෂ්ණාව සිඳහරුව''යි අවවාද කොට මත්තෙහි දහම් දෙසන සේක් මේ ධර්ම දේශනාව කළ සේක.

**විතක්කපමථිතස්ස ජන්තුනො තිබ්බරාගස්ස සුභානුපස්සිනො**
**භීය්‍යො තණ්හා පවඩ්ඪති එස ඛො දළ්හං කරොති බන්ධනං.**

**විතක්කූපසමෙ ච යො රතො අසුභං භාවයති සදා සතො,**
**එස ඛො ව්‍යන්තිකාහිති එස ඡෙජ්ජති මාරබන්ධනන්ති.**

විතර්කයන් විසින් මඩනාලද සිත් ඇති දැඩි කාම රාග ඇති ශුභ වශයෙන් බලන සුළු වූ සත්වයාහට තෘෂ්ණාව බොහෝ සෙයින් වැඩෙයි. මෙ තෙමේ වනාහි තෘෂ්ණාබන්ධනය දැඩි කෙරෙයි.

යමෙක් විතර්කයන් සන්සිඳවීමෙහි ඇලුනේ වේ ද, හැම කල්හි සිහි ඇතියේ අශුභය වඩා ද, මෙ තෙමේ වනාහි තෘෂ්ණාව නසන්නේ ය. මෙ තෙමේ මාරබන්ධනය සිඳින්නේ ය.

කාම-ව්‍යාපාද-විහිංසා විතර්කයෝ මෙහි **විතක්ක** නම්. වස්තු-කාමක්ලේශයන් පැතීම් විසින් උන් හා එක් වූ කල්පනාව කාම හැඟීම කාමවිතර්ක. **"කාමපටිසංයුත්තො විතක්කො = කාම විතක්කො, යො හි කිලෙසකාමසහිතො හුත්වා වත්ථුකාමෙසු පවත්තති"** යනු අටුවා. "මේ සත්ත්වයෝ නැසෙත්වා හෝ වැනසෙත්වා හෝ මුල් සිඳී යෙත්වා හෝ යි අන්හු කෙරෙහි උපදනා ව්‍යාපාදය හා එක් වූ කල්පනාව ව්‍යාපාද විතර්ක. **"ව්‍යාපාදපටිසංයුත්තො විතක්කො = ව්‍යාපාදවිතක්කො, ඉමෙ සත්තා හඤ්ඤන්තු වා උච්ඡිජ්ජන්තු වා විනස්සන්තු වා මා වා අහෙසුන්ති චින්තනකාලෙ පන සත්තෙසු උප්පජ්ජති"** යනු එහි සාධක. අතින් පයින් කැටින් කැබිලිතියෙන් දඬුයෙන් මුගුරෙන් සැතින් රැහැණින් යන එක්තරා එකෙකින් හෝ අන් අන් එකෙකින් හෝ සත්ත්වයන් වෙහෙසට පත්කිරීමෙහිලා උපදනා කල්පනාව විහිංසාවිතර්ක. **"විහිංසාපටිසංයුත්තො විතක්කො = විහිංසාවිතක්කො, ඉධෙකච්චෙ පාණිනා වා ලෙඩ්ඩුනා වා දණ්ඩෙන වා සත්ථෙන වා රජ්ජුයා වා අඤ්ඤතරඤ්ඤතරෙන වා සත්තෙ විහෙඨෙන්ති, තදා සත්තෙසු උප්පජ්ජති"** යනු ආගම ය.

මෙහි ව්‍යාපාදවිහිංසාවිතර්කයෝ සත්ත්වයන් කෙරෙහි හා සංස්කාරයන් කෙරෙහි සත්ත්වසංස්කාරයන් එල්බ ගෙණ උපදනාහ. කාමවිතර්කය, ප්‍රියමනාප වූ සත්ත්වයන් හෝ සංස්කාරයන් ගැණ වැරදි ලෙසින් සිතා මතා බලන්නහුට උපදනේ ය. අප්‍රිය වූ අමනාප වූ සත්ත්වයන් ගැණ හෝ සංස්කාරයන් ගැණ කිපී බලන අවස්ථායෙහි පටන් එවුන් නැසෙන තෙක් ම ව්‍යාපාද විතර්කය ඉපද සිටුනේ ය. විහිංසා විතර්කය සංස්කාරයන් කෙරෙහි නො උපදී. කාමවිතර්කාදීන්ගේ හා කාමසඞ්කප්පාදීන්ගේ අරුත් විසින් වෙනසෙක් නැත්තේය. කාමවිතක්ක - කාමසඞ්කප්ප යි කියන ලද්දේ අරුත් විසින් එකෙක් ම ය.

මෙ කියූ විතර්කයෝ තිදෙන මිනිසා නියම තතු දන්නා නුවණින් බැහැර කොට අන්ධයකු කරන්නෝ ය. නුවණැස නැති කරන්නෝ ය. අඥයකු කරන්නෝ ය. කර්මස්වකතාප්‍රඥා-ධ්‍යාන ප්‍රඥා-විදර්ශනාප්‍රඥා යන ත්‍රිවිධ ප්‍රඥාවන් නසන්නෝ ය. දුඃඛපක්ෂයෙහි වූ කෙලෙස් නිවාලනු පිණිස නො පවත්නෝ ය. බුදුරජාණන් වහන්සේ මෙය මෙසේ වදාළ සේක. **"තයොමෙ භික්ඛවෙ අකුසලවිතක්කා අන්ධකරණා අචක්ඛුකරණා අඤ්ඤාණකරණා පඤ්ඤානිරොධිකා විඝාතපක්ඛිකා අනිබ්බානසංවත්තනිකා"** යි.

**ජන්තුනො**=සත්ත්වයාහට.

කියන ලද්දේය. **'විතක්කපමථිතස්ස, තිබ්බරාගස්ස, සුභානුපස්සිනො'** යන තෙපදයෙන් එය වෙසෙසන්නේ ය. එහෙයින් එය විශෙෂ්‍ය නම් වේ.

**තිබ්බරාගස්ස**=දැඩි රාගය ඇති.

**තිබ්බරාග** නම්: මෙහි ප්‍රිය වූ රූප-ශබ්ද-ගන්ධ-රස-ස්පෘෂ්ටව්‍ය-ධර්ම යන අරමුණුවල දැඩි ඇල්මෙන් බැඳුනේ ය. මෙ කියූ ධර්මයන් ගේ යටට ම ගිලී සිටියේ ය. මැඩුනේ ය.

**සුභානුපස්සිනො**=ශුභ විසින් බලන සුලු.

සිත් ගන්නා අරමුණුවල ස්ත්‍රී-පුරුෂාදී නිමිති හා අතුල් මැනැව, පතුල් මැනැව, පියොවුරු මැනැව, මුණ හොබනේ ය, උදරය කදිම ය, දත් කාන්තිමත් ය, යනාදි ලෙසින් කුඩා නිමිති ද ගෙණ එහි ම සිත හසුරුවමින් එය ම යහපතැ යි ගන්නේ **සුභානුපස්සි** නම.[1]

**භිය්‍යො තණ්හා පවඩ්ඪති** = තණ්හාව බොහෝ සේ වැඩේ.

**එසො ඛො දළ්හං කරොති බන්ධනං** = මෙතෙමේ වනාහි තෘෂ්ණා බන්ධනය දැඩි කරන්නේ ය.

ත්‍රිවිධ විතර්කයෙන් තදින් මැඩුනා වූ ප්‍රිය රූපාදී වූ අරමුණෙක දැඩි ව ඇලුනා වූ ස්ත්‍රී-පුරුෂාදී නිමිති හා අතුල් පතුල් තන බඩතුර මුණ දත් තොල් ඇස් නාස් ඈ කුඩා නිමිතිත් යහපතැ යි එක්වන් දක්නා සුලු වූ සත්වයාහට ධ්‍යානාදීන් අතුරෙහි එකකුත් නො වැඩෙතුදු සදෙර උපදනා තෘෂ්ණාව තදින් වැඩෙන්නී ය. මෙබඳු සත්වතෙමේ තව තවත් තෘෂ්ණාබන්ධනය දැඩි කරන්නේය යි වදාළ සේක.

**විතක්කූපසමෙ ච යො රතො** = යමෙක් විතර්කයන් සන්සිඳවීමෙහි ඇලුනේ වේ ද.

මෙහි **'විතක්කූපසම'** යි ගණු ලබනුයේ දශඅශුභය අරමුණු කොට උපන් ප්‍රථමධ්‍යානය ය. ප්‍රධාන විසින් එය විතර්කයන් සින්සිඳුවීමෙහිලා කරුණු වන බැවින් එසේ ගැණෙන්නේ ය. එය විතක්කූපසම ද වේ.

**අසුභං භාවයති සදා සතො** = හැම කල්හි සිහි ඇතියේ අශුභය වඩා ද.

---

1. 1. 7. 'සුභානුපස්සිං' සනු බලනු.

මෙහි **අසුභ** නම්: ප්‍රධාන විසින් ප්‍රථමධ්‍යානය ය. අශුභ දශයෙකි. **උද්ධුමාතක – විනීලක – විපුබ්බක – විච්ඡිද්දක – වික්ඛායිතක – වික්ඛිත්තක – හතවික්ඛිත්තක – ලොහිතක – පුළුවක – අට්ඨික** විසින්. මෙහි කෙටිකතාවක් ප්‍රථම තරඞ්ගයෙහි **‘අසුභානුපස්සී’** යනු ලක් කොට දක්වන ලද්දේ ය

එහි මරණින් පසු සුළං පිරුණු සමක් මෙන් අනුක්‍රමයෙන් නැගුනු ඉදිමී ගිය මළසිරුර **උද්ධුමාත** නම්. උද්ධුමාතය ම උද්ධු-මාතක. පිළිකුල් බැවින් කුත්සිත වූ උද්ධුමාතය හෝ උද්ධුමාතක නම් වේ. මෙහි වූ ක ප්‍රත්‍යය ස්වාර්ථයෙහි හෝ කුත්සිතාර්ථයෙහි ය. එබඳු ඉදිමුනු මළසිරුර බලා මාගේ සිරුර ද මෙබඳු සැහැවි ඇත්තේය යි අනිත්‍ය විසින් නුවණින් සලකා කරණ භාවනාව **උද්ධුමාතක අසුභභාවනා** ය.

සුදු රතු පැහැ ආදියෙන් මුසු වූ පැහැ ඇත්තා වූ හෝ පෙර තුබූ පැහැයෙන් පෙරළී ගිය පැහැ ඇත්තා වූ හෝ මළසිරුර **විනීල** නම්. විනීලය ම පිළිකුල් බැවින් විනීලක. උස් වූ මස් ඇති තැන රතු පැහැ ඇත්තා වූ ද සැරව රැස්ව සිටි තැන සුදු පැහැ ඇත්තා වූ ද බොහෝ සෙයින් නිල් පැහැති තැන නිල්පට පෙරවියාක් වැනි වූ මළසිරුර විනීලක නම් වේ. බොහෝ සෙයින් නිල් වූ ඒ මළසිරුර බලා මාගේ සිරුර ද මෙබඳු සැහැවි ඇත්තේය යි නුවණින් සලකා කරණභාවනාව **විනීලක අසුභභාවනා** ය.

බිඳී පැළී සිදුරුව ගිය තැන්වලින් වැගිරෙණ සැරව ඇති මළ-සිරුර **විපුබ්බ** නම්. විපුබ්බය ම පිළිකුල් බැවින් හෝ නින්දිත බැවින් විපුබ්බක නම් වේ. නව දොරින් වැගිරෙණ සැරව ඇති මළසිරුර බලා මාගේ සිරුර ද එබඳු සැහැවි ඇත්තේය යි නුවණින් සලකා කරණ භාවනාව **විපුබ්බක අසුභභාවනා** ය.

මැදින් දෙපළු ව වෙන් ව ගිය මළසිරුර **විච්ඡිද්ද** නම්. විච්ඡිද්දය ම පිළිකුල් බැවින් හෝ නින්දිත බැවින් විච්ඡිද්දක නම් වේ. මෙබඳු සැහැවි ඇති මළසිරුර බලා මාගේ සිරුර ද මෙබඳු සැහැවි ඇත්-තේය යි නුවණින් සලකා කරණ භාවනාව **විච්ඡිද්දක අසුභ භාවනා** ය.

බලු කැණහිල් ආදීන් විසින් කනලදු ව නොයෙක් අයුරින් තැන තැන විසුරුණු අවයව ඇති මළසිරුර **වික්ඛිත්ත** නම්. වික්ඛිත්තය ම පිළිකුල් බැවින් හෝ නින්දිත බැවින් වික්ඛිත්තක නම් වේ. අත්, අත් තැනෙක, පා, අත් තැනෙක, හිස, අත් තැනෙකැ යි මෙසේ ඒ ඒ තැන විසිර ගිය මළසිරුර බලා මාගේ සිරුර ද මෙබඳු සැහැවි ඇත්තේ ය යි නුවණින් සලකා කරණ භාවනාව **වික්ඛිත්තක අසුභ භාවනා** ය.

කුදු මහත් අවයවයන්හි කාකපාද සිටිනා සේ සතුරන් විසින් ආයුධ වලින් ඇණ කොටා පෙර කියූ සේ තැන තැන විසිර ගිය මළසිරුර **හතවික්ඛිත්තක** නම්. හතවික්ඛිත්තය ම පිළිකුල් බැවින් හෝ නින්දිත බැවින් හතවික්ඛිත්තක නම් වේ. ඒ මේ හතවික්ඛිත්තකය බලා මාගේ සිරුර ද මෙබඳු සැහැවි ඇත්තේ ය යි නුවණින් සලකා කරණ භාවනාව **හතවික්ඛිත්තකඅසුභභාවනා** ය.

ඔබිනොබ ලේ වගුරුවන ලද මළසිරුර **ලෝහිතක** නම් ලෝහිතය ම පිළිකුල් බැවින් හෝ නින්දිත බැවින් ලෝහිතක නම් වේ. ඒ මේ ලෝහිතකය බලා මාගේ සිරුර ද මෙබඳු සැහැවි ඇත්තේ ය යි නුවණින් සලකා කරණ භාවනාව **ලෝහිතක අසුභභාවනා** ය.

කා වැගිරෙණ නොයෙක් පණු සමූහයෙන් අවුල් වූ මළසිරුර පිළිකුල් බැවින් හෝ නින්දිත බැවින් **පුළුවක** නම් වේ. ඒ මේ පුළුවකය බලා මාගේ සිරුර ද මෙබඳු සැහැවි ඇත්තේ ය යි නුවණින් සලකා කරණ භාවනාව **පුළුවකඅසුභභාවනා** ය.

සිරුරෙහි වූ හැම ඇට, පිළිකුල් බැවින් හෝ නින්දිත බැවින් **අට්ඨික** නම් වේ. ඇටසැකිල්ලෙක් හෝ එක් ම ඇටයෙක් මෙයින් ගැණෙන්නේ ය. ඒ මේ අට්ඨිකය බලා මාගේ සිරුර ද මෙබඳු සැහැවි ඇත්තේය යි නුවණින් සලකා කරණ භාවනාව **අට්ඨිකඅසුභභාවනා** ය.

මෙ කියූ මේ අශුභකර්මස්ථාන අතුරෙහි උද්ධුමාතකය වඩනු කැමැති යෝගාවචරයා විසින් ඒ පිළිබඳ කරුණු මැනැවින් ඉගැන්විය හැකි කල්‍යාණමිත්‍රආචාර්යවරයකු වෙත ගොස් මැනැවින් ඒ කරුණු උගත යුතු ය. සොහොනට යන සැටි සැලකීම, මළ සිරුර හාත්පස නිමිති සැලකීම, එකොළොස් අයුරකින් නිමිති ගැණීම, යන එන මග සැලකීම ආදී එහි ලා පිළිපැදිය යුතු සැටි එකකුත් නො හැර හැම සැටියෙක් ම උගත යුතු ය. අසුභනිමිත්ත උගත්හු විසින් නො මුළාවූවහු එළඹ සිටි සිහි ඇතියහු සංවර වූ ඉන්ද්‍රිය ඇතියහු බැහැර නො ලූ සිතින් යුක්ත වූවහු ආ මග සලකමින් උද්ධුමාතකය වෙත යා යුතු ය. උද්ධුමාතකනිමිත්ත තුබූ පෙදෙසෙහි පිහිටි ගල් තුඹස් රුක් පඳුරු වැල් ආදිය සනිමිත්ත-සාරම්මණ කළ යුතු ය. නිමිති සහිත කොට අරමුණු සහිත කොට සභාගත්වයෙන් සලකුණු කළ යුතු ය එය **වණ්ණ** – **ලිඞ්ග** – **සණ්ඨාන** – **දිසා** – **ඔකාස** – **පරිච්ඡෙද** – **සන්ධි** – **විවර** – **නින්න** – **ථල** – **සමන්ත** යන එකොළොස් අයුරෙන් මැනැවින් ගන්නා ලද්දක් විමසන ලද්දක් නිශ්චය කරණ ලද්දක් කළ යුතු ය. මොහු විසින් අසුභනිමිත්ත සිහි කරමින් ම සක්මන් කළ යුතු ය. අසුභ නිමිත්ත සිහි කරමින් ම හිඳිය යුතු ය. හාත්පස නිමිති සලකුණු

කර ගැණීම නො මුළාබව පිණිස වන්නේ ය. ආ ගිය මග සැලකීම කර්‍මස්ථානවීථියට මැනැවින් පිළිපැදීම පිණිස වන්නේ ය. එකොළොස් අයුරකින් නිමිති ගැණීම අසුභාරම්මණයෙහි සිත එළවා බැඳීම පිණිස වන්නේ ය.

**වර්‍ණ** වශයෙන් නිමිති ගැණීම නම්: මේ සිරුර කලුපැහැති-යකුගේ, සුදුපැහැතියකුගේ, මගුරුපැහැතියකුගේ, යි වෙන් කොට වටහා ගැණීම ය. **ලිඞ්ග** වශයෙන් නිමිති ගැණීම නම්: ස්ත්‍රී ලිඞ්ග – පුරුෂ ලිඞ්ග වශයෙන් නො සලකා මේ සිරුර පළමු වයසෙහි සිටියකුගේ, මැදි වයසෙහි සිටියකුගේ, පැසුළු වයසෙහි සිටියකුගේ, යි නියම කොට ගැණීම ය. **සංස්ථාන** වශයෙන් නිමිති ගැණීම නම්: මේ මෙහි හිස් සටහන, මේ ගෙල සටහන, මේ අත් සටහන, මේ උදර සටහන, මේ කටි සටහන, මේ කෙණ්ඩා සටහ-නැ යි නියම කොට ගැණීම ය. **දිශා** වශයෙන් නිමිති ගැණීම නම්: සිරුරෙහි නැබින් යට යටදිශා, නැබින් උඩ උඩදිශා යි නියම කොට ගැණීම ය. **අවකාශ** වශයෙන් නිමිති ගැණීම නම්: මේ අවකාශයෙහි අත්, මේ අවකාශයෙහි පා, මේ අවකාශයෙහි මැදුම් කය, නොහොත් මම මේ අවකාශයෙහි වෙමි, අසුභය මේ අවකාශ-යෙහි යි නියම කොට ගැණීම ය. **පරිච්ඡේද** වශයෙන් නිමිති ගැණීම නම්: මේ සිරුර යට පතුලින් උඩ, කෙසගින් සරසා සිවියෙන් පිරිසිඳින ලද ය, මෙතැන් දෙතිස් කුණපයෙන් පිරු-ණේ ය යි නියම කොට ගැණීම ය.

පුරුෂයාහට ස්ත්‍රී ශරීරය ද, ස්ත්‍රියට පුරුෂ ශරීරය ද විසභාග වේ. විසභාගයෙහි අසුභාරම්මණය නො වැටහෙන බැවින් කෙලෙසුන් ගේ ඉපැත්මට කරුණු වන බැවින් සත්ප්‍රාය නො වේ. එහෙයින් සභාගාරම්මණයෙහි ම නිමිති ගත යුතු ය. පෙර බුදුරජුන් වෙත කමටහන් පුරුදු කළ, සොසානිකාදිධුතාඞ්ග පරිහරණය කළ මහණ දම් වැඩූ මද කෙලෙස් ඇති කුලපුත්හට එහිලා ප්‍රතිභාග නිමිත්ත වැටහෙන්නේ ය. නො වැටහෙන්නේ නම් මෙහි කියූ වර්‍ණාදිවශයෙන් නිමිති ගන්නා කල්හි ඒ වැටහෙනු ඇත්තේ ය. එසේත් නො ද වැටහෙන්නේ නම් සන්ධි ආදී විසින් නිමිති ගත යුත්තේ ය.

ඉදිමුනු සිරුරෙහි බොහෝ සෙයින් සන්ධි නො පෙණේ යන බැවින් එක් සිය අසූවක් සන්ධි වශයෙන් නිමිති ගැණීම පහසු නො වේ. එහෙයින් එහි දසරු සන්ධි, වැලමිටි සන්ධි, මණිබන්ධ සන්ධි යන දකුණත සන්ධි තුන ය, එසේ ම වමත සන්ධි තුන ය. කටිසන්ධි, දණසන්ධි, බොලටසන්ධි යන දකුණු පා සන්ධි තුන ය, එසේ ම වමත පා සන්ධි තුනය යි මෙතැන් නියම කර ගත යුතු ය. එසේ නියම

කර ගැනීම **සන්ධි** විසින් නිමිති ගැනීම ය. දකුණත හා දකුණැල අතර විවරය, වමත හා වමැල අතර විවරය, දෙපා අතර විවරය, බඩ හා පෙකණිය අතර හෝ උදර අතර විවරය, කන් විවරය යි මෙසේ නියම කර ගැනීම **විවර** විසින් නිමිති ගැනීම ය. සිරුරෙහි වළතැන්, ඇස්වළ හෝ ඇතුළු මුව හෝ ගලවළව හෝ නැත, මම වළතන්හි වෙමි, සිරුර ගොඩ තන්හිය යි නියම කර ගැනීම **නිම්න** විසින් නිමිති ගැනීම ය. සිරුරෙහි උස් තැන් දණ හෝ ළය හෝ නළල හෝ, නැත, මම ගොඩ තන්හි වෙමි, සිරුර මිටි තන්හි ය, යි නියම කර ගැනීම **ස්ථල** වශයෙන් නිමිති ගැනීම ය. මුළු සිරුරෙහි නුවණ මෙහෙයා ප්‍රකට ව වැටහෙන තැන නුවණින් අල්ලා ගෙණ 'උද්ධුමාතක' යි සිත පිහිට විය යුතු ය. එසේත් නිමිත්ත නො වැටහේ නම් උදරය කෙළවර කොට ඇති උඩු සිරුරු පෙදෙස තදින් ඉදිමෙන බැවින් එහි 'උද්ධුමාතක' උද්ධුමාතක යි සිත පිහිටුවීම **සාමන්ත** වශයෙන් නිමිති ගැනීම යි. මෙසේ මේ එකොළොස් අයුරින් නිමිති ගන්නේ අසුභාරම්මණයෙහි සිත එළවා බඳින්නේ ය. මේ යොගීහට එකල්හි ඇස දල්වා බැලීමෙන් උද්ග්‍රහ-නිමිත්ත උපදනේ ය. ඒ උද්ග්‍රහ නිමිත්තයෙහි සිත මෙහෙයීමෙන් ප්‍රතිභාග නිමිත්ත උපදනේ ය. එහි එසේ සිත මෙහෙයීමෙන් අර්පණාවට පැමි-ණෙන්නේ ය. අර්පණායෙහි සිට විදසුන් වඩා රහත් වන්නේ ය.

ඒ මේ උද්ග්‍රහනිමිත්ත විරූප ව පිළිකුල් ව බිහිසුණු ව වැට-හෙන අතර ප්‍රතිභාගනිමිත්ත කුස පුරා කා නිදන තරබාරු වූ අඟ පසඟ ඇති පුරුෂයකු සේ සිතෙහි නඟින්නේ ය. ප්‍රතිභාගනිමිත්ත පහළවත් ම අසුභභාවනානුභාවයෙන් බැහැර වූ කාමසංඥාව දුරු වූ බැවින් විෂ්කම්භන විසින් **කාමච්ඡන්දය** දුරුව යන්නේ ය. ලේ වියලී මෙන් සැරව ද නැති ව යන්නා සේ අනුනය ප්‍රහාණයෙන් **ව්‍යාපාදය** ද, ආරබ්ධ වීර්‍ය්‍යය ඇති බැවින් **ථීනමිද්ධය** ද, විපිළිසර-යට පටහැනි වූ ශාන්තධර්මානුයොගයෙන් **උද්ධච්චකුක්කුච්චය** ද, අධිගතවිශෙෂය තමාට ප්‍රත්‍යක්ෂ වූ බැවින් ඒ ප්‍රතිපත්තිය වදාළ බුදුරජුන් කෙරෙහි හා ප්‍රතිපත්තිය කෙරෙහි ද එහි ඵලය කෙරෙ-හි ද වූ **විචිකිච්ඡාව** ද යන පඤ්චනීවරණයන්ගේ ප්‍රහාණය වේ. ඒ හා ම ඔහුට ප්‍රතිභාගනිමිත්තෙහි සිත නැංවීම ලකුණු කොට සිටි **විතර්කය** ද, නිමිත්ත පිරිමැදීම කෘත්‍යය කොට සිටි **විචාරය** ද, විශෙෂාධිගම හෙතුයෙන් වන **ප්‍රීතිය** ද, සන්සිඳීම නිමිති කොට සිටි **සුඛය** ද, සුඛය **නිමිති** කොට සිටි **එකාග්‍රතාව** ද යන ධ්‍යානාඞ්ග පහළ වන්නේ ය. ප්‍රතිභාගනිමිත්තෙහි සිත හසුරු වන්නේ අර්පණාවට පැමිණ ඒ අර්පණායෙහි සිට විදර්ශනා වඩනුයේ අර්හත් ඵලය අවබොධ කරන්නේ ය. (මේ දනු පිණිස අප්‍රමාද වර්ගයෙහි **'ඣායිනො'** යන්නෙහි පරිකථාව බලනු.)

ශෙෂය මෙසේ දත යුතුයි. විනීලකාදි අසුභ නිමිති උගන්නහු විසිනුදු නො මුළා වූවහු එළැඹ සිටි සිහි ඇතියහු සංවර වූ ඉඳුරන් ඇතියහු බැහැර නො ලූ සිත් ඇතියහු ආ ගිය මග සලකමින් එකලා ව නිමිති ඇති තැනට යා යුතුය, යනාදීන් උද්ධුමාතකයෙහි කියූ පරිදි උද්ධුමාතක පදය වෙනුවට විනීලකාදි පද සුදුසු සේ යොදා යට කියූ සේ විනිශ්චය දත යුතුය.

එහි **විනීලක** අසුභනිමිත්තෙහි යොග කරන්නහු විසින් 'විනීලක පටිකකූල ය, විනීලකපටිකකූල ය'යි මෙනෙහි කළ යුතුය. එකල්හි මෙහිලා ලැබෙන උග්ගහනිමිත්ත බොහෝ සෙයින් සුදු පැහැති පැල්ලම් ඇත්තක් ව සිතෙහි නැග සිටින්නේ ය. පටිභාග නිමිත්ත රතු සුදු නිල් පැහැ අතුරෙහි අධික වූ පැහැයෙක් වේ නම් ඒ වශයෙන් සිතට වැටහෙනු ඇත.

**විපුබ්බක** අසුභනිමිත්තෙහි යොග කරන්නහු විසින් 'විපුබ්බක පටිකකූල ය, විපුබ්බකපටිකකූල ය'යි මෙනෙහි කළ යුතුය. එකල්හි මෙහිලා ලැබෙන උග්ගහනිමිත්ත සැරව ගාන්නා සේ ද පටිභාග නිමිත්ත නිසල ව සන්සුන් වූවක් සේ ද සිතෙහි නැග සිටින්.

**විච්ඡිද්දක** අසුභනිමිත්තෙහි යොග කරන්නහු විසින් 'විච්ඡිද්දකපටිකකූලය. විච්ඡිද්දකපටිකකූල ය'යි මෙනෙහි කළ යුතු ය. එකල්හි මෙහිලා ලැබෙන උග්ගහනිමිත්ත මැදින් කපා හළ සේ ද පටිභාගනිමිත්ත පිරිපුන් වූවක් සේ ද සිතෙහි නැග සිටින්. විච්ඡිද්දකය යුදබිමෙක හෝ සොරුන් වසන වෙනෙහි හෝ රජුන්, සොරුන් මරවාලන සොහොන්හි හෝ චණ්ඩමෘගයන් විසින් මිනිසුන් කා දමන වනයෙහි හෝ ලැබෙන්නේ ය. එබඳු තැනකට ගොස් නොයෙක් තැන වැටුනු කුණපය, එක් ම සැලකීමෙන් වැටහීමට එන්නේ නම් එසේ සැලකිය යුතු ය. නො වැටහේ නම් කුණපය සියතින් නො අල්වා වෙනෙකෙකු ලවා එක්තැන් කරවා ගත යුතු ය. සියතින් නො ඇල්ලිය යුතුය. සියතින් ගන්නා කල්හි විශ්වාසයට පැමිණෙන්නේ ය. කිසිවෙක් ඒ පිණිස නො ලැබේ නම් යම් කිසි දඬුකඩෙකින් එකඟුල් අතර ඇතිවන සේ එය එක් තැන් කොට යට කියූ සේ මෙනෙහි කළ යුතු ය.

**වික්ඛායිතක** අසුභ නිමිත්තෙහි යොග කරන්නහු විසින් 'වික්ඛායිතකපටිකකූල ය, වික්ඛායිතකපටිකකූල ය'යි මෙනෙහි කළ යුතු ය. එකල්හි මෙහිලා ලැබෙන උග්ගහනිමිත්ත ඒ ඒ තැන කඩා කන ලද්දක් සේ ද, පටිභාගනිමිත්ත පිරිපුන් ව ගියා සේද සිතෙහි නැග සිටින්.

**වික්ඛිත්තක** අසුභනිමිත්තෙහි විච්ඡිද්දකයෙහි කියූ සේ අඟලක් අතර කරවා ගෙණ හෝ අතර කර ගෙණ 'වික්ඛිත්තක පටික්කූල ය,

විකඛිතතකපටික්කූල ය යි මෙනෙහි කළ යුතු ය. එකල්හි මෙහිලා ලැබෙන උග්ගහනිමිත්ත ප්‍රකට වූ අතර ඇත්තක් සේ ද පටිභාග නිමිතත පිරිපුන් සේ ද සිත්හි නැඟී සිටිත්.

**හතවික්ඛිත්තක** අසුභ නිමිතත, විච්ඡිද්දකඅසුභනිමිතත ලැබෙන තැන්හි ලැබෙන්නේ ය. එබැවින් එහි යොග කරන්නහු විසින් එහි කියූ එබඳු කුණපයක් ඇති තැනකට ගොස් යට කියූ සේ අඟලක් අතර කරවා ගෙණ හෝ කර ගෙණ හතවිකඛිතතකපටික්කූල ය, හතවිකඛිතතකපටික්කූල ය යි මෙනෙහි කළ යුතු ය. එකල්හි මෙහිලා ලැබෙන උග්ගහනිමිතත පහර දුත් තැන් පෙණෙන සේ ද, පටිභාගනිමිතත පිරිපුන් සේ ද සිත්හි නැඟී සිටිත්.

**ලොහිතක** අසුභ නිමිත්තෙහි යොග කරන්නහු විසින් 'ලොහිතක පටික්කූල ය, ලොහිතකපටික්කූල ය යි මෙනෙහි කළ යුතු ය. එකල්හි මෙහිලා ලැබෙන උග්ගහනිමිතත සුළඟින් සැලෙන රතු පැහැති පතාකාවක සේ ද පටිභාග නිමිතත නො සැලෙන්නක් සේ ද සිත්හි නැඟී සිටිත්. ලොහිතකය, යුද්ධමණ්ඩලාදියෙහි දී වැදුනු පහරින් අත්පා ආදිය සිඳී ගිය කල්හි ද, ගඩ පොළ ආදිය පැළුනු කල්හි ද එහි මුඛයෙන් වැගිරෙණ කල්හි ද ලැබෙන්නේ ය.

**පුළවක** අසුභනිමිත්තෙහි යොග කරන්නහු විසින් 'පුළවක පටික්කූලය, පුළවක පටික්කූලය'යි මෙනෙහි කළ යුතු ය. එකල්හි මෙහිලා ලැබෙන උග්ගහනිමිතත සැලෙන්නක් සේ ද, පටිභාග නිමිතත හැල්බත් පිඩක් සේ ද සිත්හි නැඟී සිටිත්. පුළවකය, දෙතුන් දිනක් ඉක්මගිය පසු නවවිධ වණමුඛයෙන් පණු කැලත් කඩා හැලෙන කල්හි ද ලැබෙන්නේ ය. එය, බලු – කැණහිල් – මිනිස් – ගෙරි – මී – ඇත් – අස් – පිඹුරු ආදීන්ගේ සිරුරු තරමට ම හැල්බත් රැසක් සේ සිටියි. එබඳු තැනෙක හෝ 'පුළවකපටික්කූල ය, පුළවකපටික්කූල ය' යි මෙනෙහි කළ හැකිය. **චූලපිණ්ඩපාතික තිස්ස** තෙරුන්ට **කාලුදිගා** වැවේදී ඇත්කුණපයෙක මේ නිමිත්ත ලැබුනේ ය.

**අට්ඨික** අසුභනිමිතත වනාහි **"සො පස්සෙය්‍ය සරීරං සිවථිකාය ඡඩ්ඩිතං අට්ඨිසංඛලිකං සමංසලොහිතං නහාරුසම්බන්ධං"** යනාදී විසින් නොයෙක් අයුරින් දැක්වූනේ ය. එබැවින් එබන්දක් ඇති තැනකට යට කියූ සේ ගොස් හාත්පස ගස් ගල් ආදී විසින් සනිමිතත සාරම්මණ කොට අට්ඨිකය, සවභාව විසින් සලකා වණ්ණ දී වූ එකොළොස් අයුරින් නිමිත්ත දත යුතු ය. එය, වණ්ණ විසින් සුදු ය යි බලත් හොත් නිමිත්ත නො වැටහෙන්නේ ය. එසේ වනුයේ ඔදාතකසිණය හා මිශ්‍ර වන බැවිනි. එහෙයින් එය, පිළිකුල් වශයෙන් ම බැලිය යුතු ය. ලිඞ්ග, යනු මෙහි අත් පා ආදියට

ලැබෙන නමෙකි. එබැවින් අත්, පා, හිස, බඩ, බාහු, කටි, කලවා, කෙණ්ඩ යි ලිඞ්ග විසින් නියම දැන දිග, කොට, වට, සිවුරැස්, කුඩා, මහත් විසින් සණ්ඨාන වශයෙන් ව්‍යවස්ථා කළ යුතු ය. දිසා-ඔකාස යට කියූ සේ ඒ ඒ ඇටවල කෙළවර විසින් පිරිසිඳීම වන්නේ ය එය දැන ව්‍යවස්ථා කොට පැහැදිලි ව වැටහෙන්නක් අරමුණු කොට ගෙණ අපිණාවට පැමිණිය යුතු ය. ඒ ඒ ඇටවල උස් – මිටිතැන් ථල – නින්න වශයෙන් නියම හෙයින් දැන "මම වළතැන ය, ඇට, ගොඩ තැන ය, මම ගොඩ තැන ය, ඇට වළතැන ය· යි ප්‍රදෙශ වශයෙන් නියම කොට දෙ ඇට දෙ ඇට ගැළපුනු තැන් සන්ධි විසින් නිශ්චය කළ යුතු ය. එසේ ම ඇට අතර විවර–අවිවර වශයෙන් දැන සියලු ඇට සැකිල්ලෙහි හෝ ඇටඉෙක නුවණ යොද, "මෙ තැන මේ ඇට ය" යි නිරණය කරගත යුතු ය. මෙසේත් පැහැදිලි ව නො වැටහේ නම් නළල් ඇටයෙහි සිත පිහිට විය යුතු ය. මේ අට්ඨිකයෙහි මෙන් සෙසු අසුභාරම්මණයන්හි ද එකොළොස් අයුරින් නිමිති ගැණීම යෙදෙන යෙදෙන පරිදි කළ යුතු ය.

මෙසේ එක් ඇටයක හෝ ඇටසැකිල්ලෙක නිමිති ගෙණ එහි යොග කරන්නහු විසින් 'අට්ඨිකපටික්කූලය, අට්ඨිකපටික්කූල ය'යි මෙනෙහි කළ යුතු ය. එකල්හි මෙහිලා ලැබෙන උග්ගහනිමිත්ත පෙණෙන විවර ඇති ව ද, පටිභාගනිමිත්ත පිරිපුන් ව ද සිත්හි නැග සිටින්. මෙහි උග්ගහනිමිත්ත පටිභාගනිමිත්ත යන නිමිති දෙක එක් සමාන ය යි අටුවායෙහි කීම එක් ඇටයක් පිළිබඳ වූයේ නම් සුදුසු ය. එක් ඇටයෙක වුව ද උග්ගහනිමිත්ත බිය දන වන්නක් විය යුතු ය. පටිභාගනිමිත්ත සොම්නස දනා වන්නක් විය යුතු ය. භාවනා විශෙෂයෙන් මට සිලිටි ව වැටහී උපචාරධ්‍යානය එළවන බැවිනි.

අසුභ අතුරෙහි කවරක් හෝ අරමුණු කොට ධ්‍යාන ලබා ගත් යොගී තෙමේ වීතරාගයකු සේ ලොල් බැවින් තොර ව වසන්නේ ය. මේ මෙසේ නම් එය දසවිධ කොට වදාළේ කුමක් හෙයින? යත්: එසේ වදාළේ ශරීරය උද්ධුමාතකාදි වූ ඒ ඒ ස්වභාවයනට පත්වීම් වශයෙන් හා රාග චරිත පුද්ගලයන්ගේ විභාග වශයෙනි. මළ සිරුර පිළිකුල් බවට පැමිණෙන්නේ ම උද්ධුමාතක භාවයට හෝ විනීල-කාදීන් අතුරෙහි එක්තරා අවස්ථාවකට හෝ පැමිණෙන්නේ ය. උන් අතුරෙහි යම් යම් අයුරු ඇති අසුභයක් ලැබිය හැකි නම්, ඒ ඒ අසුභයෙහි උද්ධුමාතකපටික්කූලය, විනීලකපටික්කූලය යනාදී විසින් නිමිති ගත යුතු ය. අසුභය දසවිධ කොට වදාළේ මෙසේ මළ සිරුර ඒ ඒ ස්වභාවයනට පැමිණෙන බැවිනි.

**උද්ධුමාතකය,** සිරුරු සටහන්හි විපන්න කියාලන්නෝ ශරීර සණ්ඨාන රාගීනට සත්ප්‍රාය වේ.

**විනීලකය,** සිරුරු සිවි පැහැයෙහි විපත කියා ලන්නේ ශරීර වර්ණයෙහි රාග ඇත්තවුනට සත්ප්‍රාය වේ.

**විපුබ්බකය,** සිරුරෙහි දුර්ගන්ධය කියා ලන්නේ මල් සුවඳ ඈ කැවීම් විසින් නැගුනු ශරීරගන්ධ රාගීනට සත්ප්‍රාය වේ.

**විච්ඡිද්දකය,** ඇතුළත සිදුරු ඇති බව කියා ලන්නේ සිරුරෙහි අඟපසඟ පිළිබඳ ඝනභාවයෙහි උපදනා රාග ඇත්තවුනට සත් ප්‍රාය වේ.

**වික්ඛායිතකය,** මස් වැඩියෙන් නැගී සිටි තැන්හි නැසෙන සැටි කියා ලන්නේ තන කලවා ඈ හි මස් වැඩීම නිසා උපදනා රාග ඇත්තවුනට සත්ප්‍රාය වේ.

**වික්ඛිත්තකය,** අඟ පසඟ ඒ ඒ තැන වැටීමෙන් විසිර යැම කියා-ලන්නේ අඟපසඟ පිළිබඳ ලීලායෙහි රාග ඇත්තවුනට සත්ප්‍රාය වේ.
**හතවික්ඛිත්තකය,** අඟපසඟ වෙන් වෙන් ව කැඩී බිඳී යැම කියා-ලන්නේ ශරීරාවයවයන්හි එක් ව සිටීමෙහි ලා උපදනා රාග ඇත්තවුනට සත්ප්‍රාය වේ.

**ලෝහිතකය,** ලෙයින් වැකීමෙන් වූ පිළිකුල් බව කියා ලන්නේ සැරසීම්වලින් හටගත් ශෝභායෙහි රාග ඇත්තවුනට සත්ප්‍රාය වේ.
**පුළවකය,** සිරුර නන්වැදෑරුම් පණුවන්ට සාධාරණ ව සිටිබව කියා ලන්නේ සිරුර මම ය, මාගේ ය, යි ඇලුම් කරණවුනට සත්ප්‍රාය වේ.

**අට්ඨිකය,** සිරුරෙහි වූ ඇට පිළිබඳ පිළිකුල් බව කියා ලන්නේ දන්තසම්පත්තියෙහි ඇලුම් ඇත්තවුනට සත්ප්‍රාය වේ. මෙසේත් රාගචරිත පුද්ගලයන්ගේ භෙද විසින් අසුභය දසවිධ කොට වදාරණ ලද්දේ ය.

දසවිධ වූ ම අසුභාරම්මණය පිළිකුල් ය. එහෙයින් එහි සිත පිහිටුවාලීම දුෂ්කර ය. සිත පිහිටුවා ගත හැක්කේ විතර්ක බලයෙනි. විතර්කය නැත්තේ නම් සිත නො පිහිටයි. ගසා ගෙණ යන මහ සැඩ වතුර ඇති ගඟෙක ඔරු පාරු නැව් ආදිය සිටවා ගත හැක්කේ රිටේ බලයෙනි. මේ ද එබඳු ය. එබැවින් දසවිධ අසුභය ම අරමුණු කොට භාවනා කිරීමෙන් ලද හැක්කේ ප්‍රථමධ්‍යානය පමණි. විතර්ක නැති බැවින් ද්විතීයධ්‍යානාදිය නො ලද හැකි ය.

පිළිකුල් වූ මේ අරමුණෙහි “මම එකාන්තයෙන් මේ පිළිවෙතින් ජරාමරණයෙන් මිදී ගන්නෙමි”යි අනුසස් දක්නා බැවින් ද, නීවරණසන්තාප නසාලීමෙන් ද යෝගීහට ප්‍රීතිසෞමනස්‍යය උපදනේ ය. ‘‘මම මෙයින් බොහෝ වැටුප් ලබන්නෙමි’’යි මල මූ

අදින්නහුට රැස් කර ගත් ගුථ රාශියෙහි සතුටු සොම්නස් උපදනා සේ ද, සත්හුත් ලෙඩ රෝදූක් ඇත්තහුට වමන විරේචනයෙහි සතුටු සොම්නස් උපදනා සේ ද මේ දතයුතු ය.

දසවිධ වූ අසුභය ලක්ෂණ විසින් එකොක් ම ය. අසුභයාගේ ලක්ෂණ අපිරිසිදු බව, දුගඳ බව, නින්දිත බව, පිළිකුල් බව යන මේ ය. මෙය මළසිරුරෙහි පමණක් ම නො වත්නේ ය. සත්‍රියකගේ දත් ඇට දැකීමෙන් මිහින්තලා වෙහෙර වැසි මහාතිස්ස තෙරුන්ට සේ ඇතු පිට නැගී ගමන් ගත් රජු දැකීමෙන් සඞ්ඝරක්ඛිත තෙරුන්ට උවැටන් කළ හෙරණුන්ට සේ ජීවමානශරීරයෙහි ද වත්නේ ය. මළසිරුර සේ ම ජීවමානශරීරය ද අසුභ ය. ජීවමානශරීරයෙහි අශුභලක්ෂණ අමුතුවලා දැමූ සැරසිලිවලින් වැසී යන බැවින් නො ද පෙණෙත්නේ ය. එය, සැහැවියෙන් ම දත් ඇට අධික කොට ඇති තුන්සියයක් ඇටින් නැගුණේ එක්සිය අසූවක් සන්ධියෙන් ගැළපුනේ ය. නව සියයක් නහරින් බැඳුනේ ය. නව සියයක් මස් වැදූල්ලෙන් ඇලවුනේ ය තෙත් මිනිස් සමින් හාත් පසින් වැළඳ ගන්නා ලද්දේ ය. සිවියෙන් වැසුනේ ය කුදුමහත් සිදුරු ඇති-යේ ය. මේදතෙල් පිරුණු සැළියක මෙන් නිතර උඩින් යටින් වැගිරෙන්නේ ය. පණුකැලන් විසින් සෙවුනා ලද්දේ ය. ලෙඩට තැන් ය. දුකට වාසනු ය. පැළී ගිය පැරණි ගෙඩියක් මෙන් නවවිධ වණමුඛයෙන් නිතර කුණු වැගිරෙන්නේ ය. දෙ ඇසින් කබ දෙකන්බිලින් කන්කදුරු, දෙනාස්පුටින් සොටු, මුවින් අහර පිත සෙම ලේ, අධොමාගී දෙකින් මල මූ, නවානූ දහසක් රොමකූප-යෙන් අසුච්ඛහදිය වැගිරෙන්නේ ය. නීලමැසි ආදීහු පිරිවරව සිටිත්. දැහැටි කෑම, මුව සේදීම, හිසතෙල් ගෑම, දිය නෑම, ඇඳුම් පෙරවුම් කිරීම යන මෙයින් පිළිදැගුම් නො කොට තිරුවත් ව නො පීරූ අවුල් වූ රළු කෙස් ඇති ව ගමින් ගම ඇවිදුනා රජුගේ ද අසූචි බැහැර ලන සැඩොලාගේ ද මෙහි වෙනසෙක් නැත්තේ ය. අපිරිසිදු බැවින් දුගඳ බැවින් නින්දිත බැවින් පිළිකුල් බැවින් රජ-කුගේ හා සැඩොලකුගේ හා වෙනසෙක් නැත්තේ ය. දැහැටි වළඳ මුව සෝද, නන්වන් පිළියෙන් විළිතැන් වසා නන්වැදූරුම් සුවඳ විලවුන් ගල්වා මල් අබරණාදියෙන් සැරසී මම ය, මාගේ ය'යි ගත යුතු තැනට මෙය පෙරළා ගණිත්. මෙසේ ආගන්තුක අලඞ්කාර-යෙන් වැසී යන බැවින් සිරුර පිළිබඳ ඇති සැටි අශුභලක්ෂණ නො දත් මූඪපුරුෂයෝ අපිරිසිදු වූ දවරු නිතර දුගඳ වහනය කරණ මල මූ ඈ අසූචියෙන් පිරුණු සත්‍රී ශරීරය රස විඳිය යුතු තැනක් කොට මාහැඟි කොට සලකා එහි හැපෙත්. එය වැළඳ ගණිත්. එයට යටත් වෙත්. මූඪ සත්‍රීහු ද මෙබඳු වූ පුරුෂශරීරයෙහි හැපෙත්. එය වැළඳ ගණිත්. එයට යටත් වෙත්.

කෙස්–ලොම්–නිය–දත් – කෙළ – සොටු – මල – මූ ඈ අතුරෙහි සිරුරෙන් බැහැරට වැටුනු කිසිවකුත් කිසි කෙනෙක් අතින් පයින් තබා කෝටුවකිනුත් කැබලිත්තකිනුත් එසින් අන් කිසිවකිනුත් පහසන්නට කැමැත්තාහු නො වෙත්. එබන්දක් දුක පෙළෙත්. ලජ්ජිත වෙත්. හැකිළෙත්. පිළිකුල් කෙරෙත්. සිරුරෙහි ලැගුනු දැයත් බැහැරට වැටුනු දැය සේ ම පිළිකුල් වුව ද මොහඳුරෙන් වැසුනු ආත්මස්නෙහයෙන් රත් වූ ස්ත්‍රී–පුරුෂයෝ, එය ඉෂ්ට ය, කාන්තය, නිත්‍යය, ශුභය, සුඛය, ආත්මය,යි ගණිත්. එසේ ගත්තෝ කැලේ පිපී ගිය කැලරුක දුක එසින් නො ගිලිහුනු නො වැටුනු මල් බලා ‘මේ එල්ලෙන්නේ මස්වැදිලි’යි වෙහෙසට පත්වන දිරුම් කඩට ගිය සිවලුන් සමාන වෙත්. එබැවින් නුවණැති යොගියා විසින් ජීවමාන ශරීරය චේවා, මෘතශරීරය චේවා, අශුභලක්ෂණ පෙණෙන කොතැනක හෝ නිමිති ගෙණ කර්මස්ථානය අභ්‍යාසවට පමුණුවා ගතයුතු ය. විස්තර විශුද්ධිමාර්ගයෙහි එන්නේ ය.

එහි මෙහිලා මෙසේ කීහ:–

‘‘යථා හි පුප්ඵිතං දිස්වා – සිගාලො කිංසුකං වනෙ,
මංසරුක්ඛො මයා ලද්ධො – ඉති ගන්ත්වාන වෙගසො.

පතිතං පතිතං පුප්ඵං – ඩසිත්වා අතිලොලුපො,
නයිදං මංසං අදුං මංසං – යං රුක්ඛස්මින්ති ගණ්හති.

කොට්ඨාසං පතිතං යෙව – අසුභන්ති තථා බුධො,
අගහෙත්වාන ගණ්හෙය්‍ය – සරීරට්ඨම්පි නං තථා.

ඉමං හි සුභතො කායං – ගහෙත්වා තත්‍ථ මුච්ඡිතා,
බාලා කරොන්තා පාපානි – දුක්ඛා න පරිමුච්චරෙ.

තස්මා පස්සෙය්‍ය මෙධාවී – ජීවිනො වා මතස්ස වා
සභාවං පූතිකායස්ස සුභභාවෙන වජ්ජිතං’’ යි.

ඒකාන්ත කුශලචෛතසිකයක් වූ සමෘතිය යමක්හට ඇතියේ ද හේ සත නම්.[1]

**සති** ශබ්දයෙන් අස්ත්‍යර්ථයෙහි ණ ප්‍රත්‍යය ව සිද්ධය.

**එසො ඛො ව්‍යන්තී කාහිති** = මෙ තෙමේ වනාහි නසන්නේ ය.

‘‘මෙ තෙමේ කුමක් නසන්නේද?’’යි නගිනා ප්‍රශනයට ‘‘භවත්‍රය පිළිබඳ තෘෂ්ණාව නසන්නේය’’ යනු පිළිතුර වන්නේ ය.

---

1. 2. 2. ‘සතිමතො’ යනු බලනු.

කාමවිතක්කාදිය සත්සිඳවාලන දස අසුභය අරමුණු කොට උපන් ප්‍රථමධ්‍යානයෙහි ඇලුනු, හැමකල්හි සිහි ඇති ව අශුභධ්‍යානය වඩනුයේ භවත්‍රය පිළිබඳ තෘෂ්ණාව නසා ලන්නේ ය.

**"ව්‍යන්තී කාහිති"** යන මෙය, **"තීසු භවෙසු උප්පජ්ජනකං තණ්හං විගතන්තං කරිස්සති"**යි අටුවා කළහ. **'ව්‍යන්තී කාහිති'** යන මේ යොගයෙන් කියනුයේ පෙර කෙළවර නො කරණ ලද්දක් කෙළවර කරන්නේය, යනු යි. එය **"අව්‍යන්තං ව්‍යන්තං කරිස්ස-තීති = ව්‍යන්තී කාහිති"**යි ශාබ්දිකයන් විසින් ව්‍යක්ත කරණ ලදැ ය. **"කරිස්සති"** යන ක්‍රියාපදය **"කාහිති"**යි මෙහි සිද්ධියට ආයේ ය. ආයේ **කර** ධාතුවෙන් පරව යෙදුනු **'ස්සති'** යන්නහුගේ **'ස්ස'** යන්න ලොප් කොට හැර කර ධාතුවට **'කාහ'** යනු ආදෙශ කොට **ඉ** යන්නක් ද ආගම විසින් ගැණිමෙති.

**එසො ඡෙජ්ජති මාරබන්ධනං** = මෙ තෙමේ මාරබන්ධනය සිඳින්-නේ ය.

කම්-කෙලශ-විපාක යන ත්‍රෛභූමකවෘත්තය සිඳ හරිණුයේ යට කියූ ගුණ ඇති පුද්ගල තෙමේ ය.[1]

ධම්දෙශනාවගේ අවසානයෙහි ඒ මහණ තෙමේ සෝවන් පලයෙහි පිහිටියේ ය. ධම්දෙශනා තොමෝ පැමිණ සිටි පිරිසට ද වැඩ සහිත වූ ය.

**දහරභික්ඛුවස්තුව නිමි.**

---

1. 3. 1. 'මාරජධයං' යනු බලනු.

# මරු නැගූ මහාහඬ

## 24 — 8

බොහෝ ගණනක් තෙරවරු දවසක් දෙව්රම් මහාවෙහෙරට පැමිණ රාහුල තෙරුන් නිදි ගත් තැනට ගොස් උන්වහන්සේ නිදි ගත් තැනින් නගා හැර එතැන් ගෙණ නිදි ගත්හ. රාහුල ස්ථවිරයන් වහන්සේ එතැනින් නැගිට ගොස් නිදන්නට තැනක් සොයනුවෝ සුදුසු තැනක් නො දැක බුදුරජුන්ගේ ගඳකිළි පිල්කඩෙහි නිදි ගත්හ. උපසම්පත්තියෙන් අවුරුද්දක් පමණකුත් නො ඉක්මවා සිටි උන්වහන්සේ රහත් කෙනෙක් වූහ. මේ අතර වසවත් මරු ගඳකිළි පිල්කඩෙහි හොත් ආයුෂ්මත් රාහුල තෙරුන් දැක "මෙතෙමේ මහණ ගොයුම්හුගේ රිදෙන ඇඟිල්ලක වැනි ය, ගඳකිළියෙන් පිටත පිළෙහි නිදන්නේ ය, තෙමේ ගඳකිළිය තුළ නිදන්නේ ය, ඇඟිල්ල රිදවාපූ කල්හි මහණ ගොයුම් ද රිදවන ලද්දේ වනැ" යි සිතා මහත් ඇත් වෙසක් ගෙණ අවුත් තෙරුන්ගේ හිස හොඬින් වෙළා මහත් හඬින් මොර දුන්නේ ය. බුදුරජාණන් වහන්සේ ගඳකිළියෙහි වැඩ හුන් සේක් ම හඬ තළන්නහු මාරයා බව දැන "මාරය! තා වැනි දහසක් දෙනා විසිනුදු මාගේ පුතුට බියක් උපදවන්නට නො හැකි ය, මාගේ පුතු නො තැති ගන්නේ ය, පහ වූ තෘෂ්ණා ඇතියේ ය, මහාවැර ඇතියේ ය, මහානුවණැතියේ ය" යි වදාරා මේ ධර්මදෙශනාව කළ සේක.

**නිට්ඨං ගතො අසන්තාසී වීතතණ්හො අනඞ්ගණො,**
**අච්ඡින්දි භවසල්ලානි අන්තිමොයං සමුස්සයො.**

**වීතතණ්හො අනාදානො නිරුත්තිපදකොවිදො,**
**අක්ඛරානං සන්නිපාතං ජඤ්ඤා පුබ්බාපරානි ච,**
**සවෙ අන්තිමසාරීරො මහාපඤ්ඤො මහාපුරිසොති**
**වුච්චතීති.**

(යමෙක්) නිෂ්ඨාවට ගියේ වේ ද, නො තැති ගන්නා සුලු වේ ද, පහ වූ තෘෂ්ණා ඇත්තේ වේ ද, එහෙයින් ම රාගාදිඅඞ්ගණ නැත්තේ වේ ද, භවගාමී වූ ඒ සියලු කෙලෙස්හුල් සිඳ හළේ ද, (ඔහුගේ) මේ අන්තිම ආත්මභාවය යි.

යමෙක් පැහූ තෘෂ්ණා ඇත්තේ වේ ද, ආත්ම ආත්මීය වශයෙන් ගැණුම් නැත්තේ වේ ද, නිරුක්තිපදයන්හි දක්ෂ වේ ද, අක්ෂරයන්ගේ සමූදය හා පූර්වාපරාක්ෂරයන් දන්නේ වේ ද අන්තිමශරීරයෙහි පිහිටි හෙතෙමේ එකාන්තයෙන් මහාප්‍රාඥ යි ද මහාපුරුෂ යි ද කියනු ලැබේ.

**නිට්ඨං ගතො** = (යමෙක්) නිෂ්ඨාවට ගියේ ද. කෙළවරට පැමිණියේ වේ ද.

මෙහි **‘නිෂ්ඨා’** නම්: අර්හත්ඵලය යි. **“ඉමස්මිං සාසනෙ අරහත්තං නිට්ඨං”** යනු අටුවා. අර්හත්වය නිෂ්ඨා යි කියනු ලබනුයේ අර්හත්ඵලලාභයෙන් සසර ඉපැත්ම කෙළවරවන බැවිනි. අර්හත් ඵලයට පැමිණියේ නැවැත කවදකත් සසර නො ද උපදනේ ය. මෙතෙමේ මාර්ගක්ෂණයෙහි නිෂ්ඨාවට යන්නේ, අර්හත්ඵලක්ෂණයෙහි අවසන් කළ කිස ඇති බැවින් සියලු අයුරින් නිෂ්ඨාවට ගියේ වේ. **“එවං මග්ගක්ඛණෙ නිට්ඨං ගච්ඡන්තො අරහත්තඵලක්ඛණෙ පරියොසිතකිච්චතාය සබ්බාකාරෙන තීසු රතනෙසු නිට්ඨං ගතො”** යි පොතෙහි ඒ ආයේ ය.

ඒ ඒ දෘෂ්ටිගතිකයන් විසින් තම තමන්ගේ ලබ්ධි වශයෙන් පණවා ගත් නිෂ්ඨා ද ඇත. බ්‍රාහමණයන්ගේ ලබ්ධියෙහි බඹලොව නිෂ්ඨා ය. තාපසයනට ආභස්සරය නිෂ්ඨා ය. පරිව්‍රාජකයනට සුභකිණ්හය නිෂ්ඨා ය. ආජීවකයනට අනන්තමානස ය නිෂ්ඨා ය. මෙසේ ලබ්ධි විසින් නිෂ්ඨා ගෙණ හැර දක්වා ඒ හැම නිෂ්ඨා අතුරෙහි අර්හත්වය ද දක්වූහ. **“බ්‍රාහමණානං හි බ්‍රහමලොකො නිට්ඨා, තාපසානං ආභස්සරා, පරිබ්බාජකානං සුභකිණ්හා, ආජීවකානං අනන්තමානසොති එවං පරිකප්පිතො අසඤ්ඤිභවො”** යනු අර්ථකථා ය. රාග ද්වෙෂ මොහයන්ගෙන් රත් වූ දූෂිත වූ මුළු වූ බාහිරකයනට නිෂ්ඨාවක් වන්නී නම් බලු කැණහිල් ආදීනට ද නිෂ්ඨා වන්නී ය.

**අසන්තාසී** = නො තැති ගන්නා සුලු වූයේ ද.

තම සිත් තුළ නගින රාගද්වෙෂාදී සන්ත්‍රාසයක් නැති බැවින් ද ජීවිතාශාව නැසූ බැවින් ද සිංහ ව්‍යාඝ්‍රාදීන්ගෙන් කිසි දකත් නො තැති ගන්නේ **‘අසන්තාසී’** නම්. **“අබ්භන්තරෙ රාගසන්තාසාදීනං අභාවෙන අසන්තාසනකො”** යනු එහිලා දත යුතු ය. තව ද නො ලැබ්මෙන් යශස් පිරිහීමෙන් ගැරහුම් ලැබීමෙන් දුකට වැටීමෙන් නො තැති ගන්නේ ද **අසන්තාසී** ය. මේ එය කියූ සැටි: **“අලාභෙන අයසෙන නින්දාය දුක්ඛෙන අසන්තාසී නාම”** යනු. මෙයින් පෙණෙනුයේ නිෂ්ඨාවට ගියනු අෂ්ටලොකධර්මයනට අයත් මෙ කියූ ධර්මයන්ගෙන් නො තැති ගන්නා බව ය.

**විතතණ්හා** = පහ වූ තෘෂ්ණා ඇත්තේ වේ ද.

කාමතණ්හා භවතණ්හා–විභවතණ්හා යන ත්‍රිවිධ තෘෂ්ණාව පහ කොට සිටියේ **වීතතණ්හ**.[1]

---

1. 14. 6. ‘දුක්ඛසමුප්පාදං’ යනු බලනු.

**අනඞ්ගණො** = රාගාදි අඞ්ගණ නැත්තේ වේ ද.

අනඞ්ගණ සූත්‍රයෙහි තමන් බලාපොරොත්තු වන දැය නො ලැබීමෙන්, තමන්ගේ අදහස් ඉටු නො වීමෙන් සිතේ පහළ වන කොපය හා නො සතුට අඞ්ගණ නමැ යි ආයේ ය.[1]

**අච්ඡිදි භවසල්ලානි** = භවගාමී වූ කෙලෙස්හුල් සිඳ හළේ ද.

රාග - දෙස - මෝහ - මාන - දිට්ඨි - සොක - දුච්චරිත විසින් හුල් සතෙකි. **"සත්ත සල්ලානි රාගසල්ලං දොසසල්ලං මොහසල්ලං මානසල්ලං දිට්ඨිසල්ලං සොකසල්ලං දුච්චරිතසල්ලන්ති"** යනු දෙශනා ය.

රාගය ම රාගසල්ල නම්. පෙළීම දනවන බැවින් ඇතුළත විදින බැවින් බැහැරලීම නො පහසු බැවින් රාගාදීහු සල්ල යි කියනු ලැබෙත්. **"රාගොච පීළාජනකතාය අන්තො තුදනතාය දුන්නීහරණතාය සල්ලන්ත්වාති රාගසල්ලං"** යනු අටුවා. යමක්හුගේ සිත්හි රාගාදීහු වෙත් නම්, ඒ හෙතුයෙන් ඔහු දව රෑ දෙක්හි පෙළෙන්නේ ය. රිදුම් ලබන්නේ ය. මෙසේ සත්වයා පෙළන රාගාදී වූ හුල් උදුරා බැහැරලනුයේ රහත්මග නුවණ ය. මේ හුල් රහත්මග නුවණින් සිඳහළ යුතු ය.

යමෙක් වනාහි වර්තමාන ජීවිතයෙහි නිෂ්ඨාවට පැමිණියේ නො නැති ගත්තා සුලු වූයේ පහ කළ තෘෂ්ණා ඇතියේ රාගාදි අඞ්ගණ රහිත වූයේ භවයෙහි උපත දෙන කෙලෙස් හුල් සිඳ හළේ ද හෙතෙමේ ඉදිරියෙහි උපත නො ලබන්නේ ය.

**වීතතණ්හො** = පහ කළ තෘෂ්ණා ඇත්තේ ද.

**අනාදනො** = ආතම - ආත්මීය වශයෙන් ගැණුම් නැත්තේ ද.

එක ද සංස්කාරයකුත් 'මම ය, මාගේ ය' යි තෘෂ්ණා දෘෂ්ටි වශයෙන් නො ගන්නේ **'අනාදන'** නම්. **"ඛන්ධාදීසු නිග්ගහණො"** යනු අටුවා. **"අප්පටිසන්ධිකො අනාදනොති"** කියූ බැවින් භවයෙහි පිළිසිඳ ගැණීම් නැත්තේ අනාදනැ යි දතයුතු ය.

**නිරුත්තිපදකොවිදො** = නිරුක්තිපදයෙහි දක්ෂ වූයේ ද.

අත්ථ - ධම්ම - නිරුත්ති - පටිභාන යන පටිසම්භිදා සතරෙහි දක්ෂ වූයේ **'නිරුත්තිපදකොවිද'** නම්.

**පටිසම්භිදා** = නම් කිමැ යි පහදා දෙන විභඞ්ගාර්ථකථාවෙහි **"පටිසම්භිදාති = පභෙදා"** යනු ආයේ ය. පටිසම්භිදා යන්නෙන්

1. 9 9. 'අනඞ්ගණසුත්ත' යනු බලනු

ප්‍රභේදය යන අරුත දෙන බව මෙයින් පෙණේ. පටිසම්භිදා යන මේ පදය කෙනෙක් **පටි, සං, පූර්ව විද, ඤාණෙ,** යන ධාතුවෙන් ද, කෙනෙක් **පටි, සං, පූර්ව භිද, විදාරණෙ,** යන ධාතුවෙන් ද නිපදවත්. **"පටිසම්භිජ්ජතීති = පටිසම්භිදා"** යන අර්ථ සමර්ථනයෙන් සමර්ථනය කරණුයේ මෙය 'භිද/විදාරණෙ' යන ධාතුවෙන් නිපන් බව ය. විභාග කෙරේ නුයි හෝ, විභාගයට පැමිණේ නුයි හෝ, විභාග කරණු ලැබේ නුයි හෝ යනු එහි අරුත්. **"සභාවනිරුත්තිං විභාවෙන්තානං එව තං තං සද්දපච්චවෙක්ඛනානන්තරං තං තං පභේදනිච්ඡයහෙතුභාවතො නිරුත්තිං භින්දන්තානං පටිභිජ්ජනානං එව උපපජ්ජති"** යනු එහිලා සාධක විසින් දක්වන්නාහුය. මෙය මෙහිලා වඩා ව්‍යක්ත ව සිටියේ ද, **'විද/ඤාණෙ'** යන ධාතුවෙන් නිපදවා ගැණීමෙහි ය. එසේ නිපදවා ගැන්මෙහි ද අර්ථවිරොධයෙක් නො ලැබේ.

එහි **"අත්ථෙ ඤාණං = අත්ථපටිසම්භිදා"** යි වදාළ බැවින් අර්ථයන්ගේ ප්‍රභේදයා සලකා ගැන්මෙහි අරුත් මතු කර ගැන්මෙහි සමර්ථ වූ නුවණ 'අත්ථපටිසම්භිදා' නම් වේ. අටුවායෙහි ලා මෙය මෙසේ කීහ: **"අත්ථප්පභෙදස්ස සල්ලක්ඛණවිභාවනවවත්ථාන-කරණසමත්ථං අත්ථෙ පභෙදගතං ඤාණං = අත්ථපටිසම්භිදා"** යනු විසින්. අර්ථප්‍රභේදයාගේ හෙවත් ඵලවිශේෂයාගේ සැලකීම, ප්‍රකට කිරීම, නියම කිරීම යන මෙහි සමර්ථ වූ අර්ථයෙහි හෙවත් ඵලයෙහි ප්‍රභේද විසින් පැවැති නුවණ 'අත්ථපටිසම්භිදා' යනු එහි අරුත්.

අත්ථ නම්: නිබ්බත්තක – ඤාපක – සම්පාපක යන හෙතූන් අනුව ගිය නුවණින් අවබොධ කරණු ලබන හෙතුඵලය යි. **"හෙතුඵලං හි යස්මා හෙතු අනුසාරෙන අරියති අධිගම්යති පාපුණී-යති, තස්මා අත්ථොති වුච්චති"** යනු අර්ථ කථා ය.

ඒ මේ අර්ථය, ප්‍රත්‍යයොත්පන්නධර්ම – නිර්වාණ – භාෂිතාර්ථ – විපාක – ක්‍රියා විසින් පස්වැදෑරුම් ය. **"පභෙදතො පන යං කිඤ්චි පච්චයසමුප්පන්නං නිබ්බානං භාසිතත්ථො විපාකො ක්‍රියාති, ඉමෙ පඤ්ච ධම්මා අත්ථොති වෙදිතබ්බා"** යනු විසින් එය පොතෙහි ආයේ ය.

මෙහි **ප්‍රත්‍යයොත්පන්නධර්ම** නම්: දුඃඛාදී වූත් ජාති ජරා මරණාදී වූත් හෙතුඵල ධර්මයෝ ය. **නිර්වාණ** නම්: දුකට හෙතු වූ තෘෂ්ණාදීන්ගේ අනුත්පාදනිරොධයෙන් ලැබෙන සන්සිඳීම ය. **භාෂිතාර්ථ** නම්: සූත්‍ර – ගෙය්‍ය – වෙය්‍යා කරණාදී වූ නවාඞ්ග ශාස්තෘශාසනයාගේ අර්ථය ය. **විපාක – ක්‍රියා** නම්: කුශලාකුශල විපාක සිත් හා ක්‍රියා සිත් ය.

මෙසේ මේ පස්වැදෑරුම් වූ අර්ථසඞ්ඛ්‍යාතඵලය ප්‍රත්‍යවේක්ෂා කරන්නහුට එම අර්ථසඞ්ඛ්‍යාතඵලයෙහි ප්‍රභේද විසින් ප්‍රතිවේධය සිද්ධ කරණ නුවණ 'අත්ථපටිසම්භිදා' නම්. **"තං අත්ථං පච්චවෙක්ඛන්තස්ස තස්මිං අත්ථෙ පභෙදගතං ඤාණං අත්ථපටිසම්භිදා"** යනු එහි ලා දතයුතු ය.

**"ධම්මෙ ඤාණං = ධම්මපටිසම්භිදා"** යි වදාළ බැවින් ධර්මයන්ගේ ප්‍රභේදය සලකා ගැන්මෙහි, ධර්ම මේ මේ ය යි මතු කර ගැන්මෙහි සමර්ථ වූ නුවණ 'ධම්මපටිසම්භිදා' නම් වේ. අටුවායෙහි මෙය මෙසේ කීහ: **"ධම්මප්පභෙදස්ස සල්ලක්ඛණවිභාවනවවත්ථානකරණසමත්ථං ධම්මෙ පභෙදගතං ඤාණං ධම්මපටිසම්භිදා"** යනු විසිනි. හෙතුප්‍රභේදයාගේ හෙවත් හෙතුවිශේෂයාගේ සැලකීම, ප්‍රකට කිරීම, නියම කිරීම යන මෙහි සමර්ථ වූ හෙතුයෙහි ප්‍රභේද විසින් පැවැති නුවණ 'ධම්මපටිසම්භිදා' යනු එහි අරුත්.

ධම්ම නම්: සැකෙවින් ප්‍රත්‍යය ය. ඒ ධර්මසඞ්ඛ්‍යාත ප්‍රත්‍යය, යම් හෙයකින් ඒ ඒ අර්ථ සඞ්ඛ්‍යාත ඵලය නිපදවා ද, පවත්වා ද, පමුණුවා ද එහෙයින් ධර්ම යි කියනු ලැබේ. මේ මෙය කියූ සැටි: **"ධම්මොති සඞ්ඛෙපතො පච්චයො, සො හි යස්මා තං තං විදහති පවත්තෙති පාපෙති ච තස්මා ධම්මොති වුච්චති"** යි.

ඒ මේ ධර්මය, ප්‍රභේද විසින් ඵල නිපදවන හෙතු ය – ආර්‍ය්‍යමාර්ගය – පර්‍ය්‍යාප්ති ය – කුශල ය – අකුශල ය යි පස් වැදෑරුම් ය. **"පභෙදතො පන යො කොචි ඵලනිබ්බත්තකො හෙතු අරියමග්ගො භාසිතං කුසලං අකුසලන්ති ඉමෙ පඤ්ච ධම්මා ධම්මොති වෙදිතබ්බො"** යනු විසින් පොතෙහි ආයේ ය.

මෙහි හෙතු – කුශල – අකුශල යන මේ තුන, තම තමන්ට අනුරූප වූ ඵලවිපාක උපදවන බැවින් නිබ්බත්තක හෙතු විසින්, භාෂිතය, අර්ථය පහදලන බැවින් ඤාපක හෙතු විසින්, ආර්‍ය්‍යමාර්ගය, නිවනට පමුණුවන බැවින් සම්පාපක හෙතු විසින් ගණු ලැබේ.

මෙසේ මේ පස්වැදෑරුම් වූ ධර්මසඞ්ඛ්‍යාතප්‍රත්‍යය ප්‍රත්‍යවේක්ෂා කරන්නහුට ඒ ධර්මසඞ්ඛ්‍යාතප්‍රත්‍යයයෙහි ප්‍රභේද විසින් ප්‍රතිවේධය සිඩ කරණ නුවණ 'ධම්මපටිසම්භිදා' නම්. **"තං ධම්මං පච්චවෙක්ඛන්තස්ස තස්මිං ධම්මෙ පභෙදගතං ඤාණං ධම්මපටිසම්භිදා"** යනු අර්ථකථාය.

**"නිරුත්තාභිලාපෙ පභෙදගතං ඤාණං නිරුත්තිපටිසම්භිදා"** අත්ථපටිසම්භිදායෙහි කියූ පස්වැදෑරුම් අර්ථයෙහි හා ධම්මපටිසම්භිදායෙහි කියූ පස්වැදෑරුම් ධර්මයෙහි හා තතු දැනුමෙහි එක්වත්

උපකාරක ව සිටි ශබ්දව්‍යවහාරයෙහි ප්‍රභේදගත වූ නුවණ 'නිරුත්ති පටිසම්භිදා' ය. "**නිරුත්තිපභෙදස්ස සල්ලක්ඛණවිභාවන වවත්ථානකරණසමත්ථං නිරුත්තාභිලාපෙ පභෙදගතං ඤාණං නිරුත්ති පටිසම්භිදා**" යනු අර්ථකථා ය. ස්වභාවනිරුක්ති ප්‍රභේදයාගේ හෙවත් ස්වභාවනිරුක්ති විශේෂයාගේ සැලකීම, ප්‍රකට කිරීම, නියම කිරීම යන මෙහි සමර්ථ වූ ස්වභාවප්‍රඥප්තීන්ගේ අභිලාපයෙහි උසුරුවීමෙහි යෙදෙන ශබ්දප්‍රභේදයෙහි පැවති නුවණ 'නිරුත්තිපටිසම්භිදා' නම්.

මෙහි '**නිරුක්ති**' නම්: සියලු භාෂාවන්ගේ ප්‍රභවස්ථානය වූ සියලු භාෂාවනට මූලභූත වූ මාගධභාෂා ය. මේ ම ය සභාව නිරුත්ති. "**සා පනායං සභාවනිරුත්ති මාගධභාසා, අඤ්ඤං නාමපඤ්ඤත්ති**" යනු ආචාර්‍ය්‍යවචන යි. බ්‍රහ්මලොකයෙහි මෝ හැම කල්හි නො වෙනස් ව පවත්නී ය. කල්පාරම්භයෙහි බ්‍රහ්මලොකයෙන් භූලොකයට බට බ්‍රහ්මයෝ තම අදහස් කියාලූවෝ මේ ස්වභාවනිරුක්තියෙනි. කල් යත් මිනිස් බවට ගිය මොවුහු නොයෙක් තැන්, වසන තැන් කොට ගෙණ වෙන් වෙන් ව ගියාහුය. එයින් මුලදී එක් ලෙසින් පැවැති ස්වභාවනිරුක්ති නම් වූ මාගධභාෂාව ද නොයෙක් ලෙසින් වෙනස් ව ගියා ය. මෙසේ එකෙනෙකට දූරස්ථ වූ ප්‍රදෙශ වාසස්ථාන කොට ගැණීමෙන් ඒ මුල් මිනිස්පරපුර හැම ලෙසකින් විවිධත්වයට ගියා සේ මූලප්‍රකෘතිය වූ මාගධ භාෂාව ද වෙනස් වූවා ය. එයින් බොහෝ වෙනස් කම් ඇති විවිධ භාෂාවෝ ඒ ඒ තැන්හි උපන්හ. සම්බුදුරජානන් වහන්සේ හැම කල්හි නො වෙනස් ව පවත්නා මාගධභාෂාව ම ධර්මාර්ථයන් පවසනු පිණිස යොදා ගත් සේක. සියලු දෙනාගේ ස්වාභාවිකභාෂාව බැවිනුත් දහම් දෙසීමට පහසු බැවිනුත් මාගධභාෂායෙන් ම දහම් දෙසනා සේක. මේ වනාහි බුදුවරුන්ගේ ධර්මතායෙකි.

මාගධභාෂාසඞ්ඛ්‍යාතස්වභාවනිරුක්තියෙහිඇතුළත් ශබ්ද අසා මේ ස්වභාවනිරුක්තිය, මේ ස්වභාවනිරුක්තිය නො වේ ය යි දැන ගන්නා බැවින් නිරුත්තිපටිසම්භිදා තොමෝ ශබ්දය අරමුණු කොට වූවා, ප්‍රඥප්තිය අරමුණු කොට නො වූවා ය. මේ අටුවා: "**එවමයං නිරුත්තිපටිසම්භිදා සද්දාරම්මණා ජාතා, න පඤ්ඤත්ති ආරම්මණා, කස්මා, යස්මා සද්දං සුත්වා අයං සභාව නිරුත්ති, අයං න සභාවනිරුත්තීති ජානාති**" යනු.

නිරුත්තිපටිසම්භිදාවට පැමිණි ආර්‍ය්‍යපුද්ගලයා වනාහි '**ඵස්සො**' යනාදී වූ ක්‍රමානුකූල වචනයක් ඇසූ කල්හි මෙය ස්වභාව නිරුක්තිය යි ද '**ඵස්සා**' යනු හෝ '**ඵස්සං**' යනු හෝ ඇසූ කල්හි මෙය ස්වභාවනිරුක්තිය නො වේ ය යි ද දන්නේ ය. 'ඵස්සො' යනු

පුංලිඞ්ගික ප්‍රථමෛක වචනාන්ත ය. 'එසො' යනු ස්ත්‍රීලිඞ්ගික ප්‍රථමෛකවචනාන්ත ය. 'එසසං' යනු නපුංසකලිඞ්ගිකප්‍රථමෛක වචනාන්ත ය. 'එසසා-එසසං' යනු අසවභාව නිරුක්තිය යි වෙන් වෙන් වශයෙන් දැන ගැණීමට උපකාර වූ ශබ්දයන් අරමුණු කොට නිරුක්තිපටිසම්භිදා ව උපදනී ය.

නිරුක්තිපටිසම්භිදාවට පත් ආයර්‍යයන්හට මාගධභාෂායෙන් පාළියට නැගූ බුද්ධවචනයක් කණ වැටුනු පමණින් ක්‍රම සිය දහස් ගණනින් එහි අර්ථය වැට හෙන්නේ ය. එසේ ම එබඳු ආයර්‍ය පුද්ගලයා අන් කිසි භාෂා ශාස්ත්‍රාදියක් නො උගත්තේ ද ශබ්දයක් ඇසූ ඇසිල්ලෙහි ඒ ශබ්දය අරමුණු කොට උපදනා මනොද්වාරික චිත්තවීථියෙන් ශබ්දයාගේ සිද්ධිය හා ශබ්දාර්ථය ද යථාර්ථ විසින් ම මැනැවින් දැන ගන්නේ ය. පුහුදුනවුන් උගත් දැය නිරුක්තිපටිසම්භිදාව පිණිස නො පවත්නේ ය. එය එයට උපනිශ්‍රයප්‍රත්‍යය විසින් ප්‍රත්‍යය වන්නේ ය.

**"ඤාණෙසු ඤාණං පටිභානපටිසම්භිදා"** අර්ථධර්මාදී වූ පටිසම්භිදා ඥාණයන්හි උපන් ප්‍රත්‍යුත්පන්න බුද්ධිය **'පටිභානපටිසම්භිදා'ය. "පටිභානප්පභෙදස්ස සලක්ඛණ විභාවන වවත්ථාන කරණ සමත්ථං පටිභානෙ පභෙදගතං ඤාණං පටිභානපටිසම්භිදා"** යනු අර්ථකථාය. අර්ථ-ධර්ම-නිරුක්ති යන තෙවැදෑරුම් වූ පටිසම්භිදාඥාණයන්ගේ ප්‍රභෙදය සැලකීම, ප්‍රකට කිරීම, නියම කිරීම යන මෙහි සමර්ථ වූ පටිභානපටිසම්භිදායෙහි ප්‍රභෙද විසින් පැවැති නුවණ 'පටිභානපටිසම්භිදා'ය යනු එහි අරුත්.

තවද **"ඤාණෙසු ඤාණන්ති සබ්බත්ථකඤාණං ආරම්මණං කත්වා ඤාණං පච්චවෙක්ඛන්තස්ස පභෙදගතං ඤාණං පටිභානපටිසම්භිදා"**යි කියූ බැවින් සියලු අර්ථ ධර්මාදීන් අරමුණු කොට ඇති නුවණ, තෙවැදෑරුම් වූ පටිසම්භිදාඥාණය ප්‍රත්‍යවෙක්ෂා කරන්නහුට ප්‍රභෙද විසින් පැවැති නුවණ පටිභානපටිසම්භිදා යි ප්‍රෞඪොක්තිය අනුව ගතයුතු ය. යම්කිසි පටිසම්භිදාඥාණයකින් ඉතිරි පටිසම්භිදා ඥාණ තුනෙහි කෘත්‍යය දනී ද, ඒ ඒ ඥාණයන්හි මේ ආකාරයෙන් පැවැති ඥාණය පටිභානපටිසම්භිදා යි මෙයින් කියනලද ය. මෙහි **'සබ්බත්ථකඤාණ'**යි කියේ අර්ථධර්මාදීන්හි පැවැති නුවණ ය. පටිභානපටිසම්භිදා තොමෝ අන්‍ය පටිසම්භිදාඥාණයන්ගේ කෘත්‍යය දැන ගණු විනා ඔවුන් පිළිබඳ ඔවුනට අයත් කෘත්‍යයන් සිද්ධ කිරීමෙහි සමර්ථ නො වේ.

ප්‍රත්‍යයයන්ගෙන් නිපැදෙන ප්‍රත්‍යයසමුත්පන්නය, මාර්ගඵලයනට අරමුණු වූ නිවනය, බුදුවදන් පිළිබඳ අර්ථය, විභාගය, ක්‍රියාය

යන මේ පස්වැදෑරුම් වූ ධර්මය යි කියන ලද අර්ථය ප්‍රත්‍යවෙක්ෂා කරන්නහුට ඒ අර්ථයෙහි ප්‍රභෙද බවට ගිය ඤාණයාගේ කෘත්‍යය, ප්‍රත්‍යයසමුත්පන්නාදී වූ ධර්ම පස ප්‍රත්‍යවෙක්ෂා කිරීමය යි යම් කිසි ඤාණයකින් වැටහී යේ ද, යම් ඤාණයකගේ බලයෙන් දැන ගණී ද, ඒ ඤාණය 'පටිභානපටිසම්භිදා' නම්. මෝ පටිසම්භිදාතොමෝ ඒ ඒ අර්ථප්‍රභෙදය සැලකීම, ප්‍රකට කිරීම, නියම කිරීම යනු විසින් ඒ ඒ අර්ථයෙහි ප්‍රභෙදයට ගිය ඤාණයාගේ කෘත්‍යය මේ ය යි දැන ගන්නී ය. අත්ථපටිසම්භිදාව අර්ථප්‍රභෙදය සැලකීම් ආදී වූ කෘත්‍යය සිදු කරන්නී ය.

ඵල නිපදවන හෙතු ය, ආර්යමාර්ග ය, බුද්ධවචන ය, කුශල ය, අකුශල ය යන ධර්ම පස ප්‍රත්‍යවෙක්ෂා කරන්නහුට ඒ ධර්ම පසෙහි ප්‍රභෙදයට ගිය ඤාණයාගේ කෘත්‍යය, ඒ ධර්ම පස සැලකීම, ප්‍රකට කිරීම, නියමකිරීම ය යි යම් ඤාණයකින් වැටහී යේ ද ඒ ඤාණය පටිභානපටිසම්භිදා නම්.

යට කියූ අර්ථපඤ්චකයෙහි හා ධර්මපඤ්චකයෙහි සවභාව නිරුක්ති-ශබ්දය අරමුණු කොට ප්‍රත්‍යවෙක්ෂා කරන්නහුට, ඒ සවභාව නිරුක්ති කියා පෑමෙහි ප්‍රභෙදයට ගිය ඤාණයාගේ කෘත්‍යය, ශබ්දය අරමුණු කොට අර්ථධර්මයන් පිළිබඳ නිරුක්ති කීමය යි යම් ඤාණයකින් වැටහී යේ ද ඒ ඤාණය 'පටිභානපටිසම්භිදා' නම්. **"යෙන ඤාණෙන තානි ඤාණානි ජානාති, ඉමානි ඤාණානි ඉදමත්ථජෝතකානීති ඤාණෙසු ඤාණං පටිභානපටිසම්භිදා"** යනු විසින් විභඞ්ග පාළියෙහි මෙය කියන ලද්දේ ය. 'මේ ඤාණයෝ මේ අර්ථ ප්‍රකාශ කෙරෙති'යි යම් ඤාණයකින් දැන ගණී ද ඒ ඤාණය පටිභානපටිසම්භිදා යි, කොටින් දතයුතු ය.

සිවුවැදෑරුම් වූ මේ පටිසම්භිදාවෝ **ශෛක්ෂ්‍ය - අශෛක්ෂ්‍ය** භූමි දෙක්හි ද ප්‍රභෙදයට යන්නෝ ය. එහි ස්‍රොතාපත්ත්‍යාදි මාර්ග ඵලත්‍රයයෙන් වැඩී ගිය චිත්තපරම්පරායෙහි ලා ප්‍රභෙද ප්‍රතිවෙධයෙහි සමර්ථ වූවා සෙඛපටිසම්භිදා ය. අර්හත්මාර්ගඵල දෙකින් වැඩී ගිය චිත්තපරම්පරායෙහි ලා ප්‍රභෙදප්‍රතිවෙධයෙහි සමර්ථ වූවා අසෙඛ පටිසම්භිදා ය. එහි **ශාරිපුත්‍ර - මෞද්ගල්‍යායන - මහාකාශ්‍යප - මහාකාත්‍යායන - මහාකොට්ඨිතා** දී වූ අසූ මහාශ්‍රාවකයන්ගේ පටිසම්භිදාවෝ අසෙඛ භූමියෙහි ප්‍රභෙදයට ගියහ. **ආනන්ද - චිත්ත ගහපති - ධම්මික උපාසක - උපාලිගහපති - ඛුජ්ජුත්තරා** දී වූ උපාසක - උපාසිකාවන්ගේ පටිසම්භිදාවෝ සෙඛ භූමියෙහි ප්‍රභෙදයට ගියහ.

**අධිගම - පරියත්ති - සවණ - පරිපුච්ඡා - පුබ්බයොග** යන මෙකරුණු පසින් පටිසම්භිදාවෝ පළට වත්නාහ. එහි අධිගම

නම්: මාර්ගඵල – පටිසම්භිදා – ත්‍රිවිද්‍යා – ෂඩභිඥා යන මොවුහු ය. පරියත්ති නම්: ත්‍රිපිටක බුද්ධ වචනය ය. සවණ නම්: සකස් ව බණ ඇසීම ය. පරිපුච්ඡා නම්: අර්ථකථා ඇස්වීම ය. පුබ්බයොග නම්: පෙර අත්බැව්හි කමටහන් වැඩීම පුරුදු පුහුණු කළ බව ය. අර්හත් ඵලයට පැමිණියහුගේ, ත්‍රිපිටක බුද්ධ වචනය උගත්තහුගේ, සකස් කොට බණ ඇසූවහුගේ, උගත් පාලිධර්මයාගේ අරුත් ඇස්වූවහුගේ, ඉකුත් භවයෙහි කමටහන් වැඩීම පුරුදු පුහුණු කළහුගේ පටිසම්භි-දාවෝ පළට වත්නාහ.

අධිගමය හෙවත් රහත්පලයට පැමිණීමෙන් **පුනබ්බසු** කෙලෙඹිපුත් **තිස්ස** තෙරුන්ගේ, බුදුවදන් උගැන්මෙන් **තිස්සදත්ත** තෙරුන්ගේ, සකස් කොට බණ ඇසීමෙන් **සුධර්ම** හෙරණුන්ගේ, බුදුවදන්හි අරුත් ඇස්වීමෙන් **තිස්සදත්ත** තෙරුන්ගේ පටිසම්භි-දාවෝ විශද වූහ.

පිළිසැඹියා නුවණ ලබන්නහුට ඒ පිණිස වෙන ම යෙදිය යුතු කමටහනෙක් නැත්තේ ය. සෙඛයන්ගේ පටිසම්භිදාවට පැමිණීම ස්‍රොතාපත්ත්‍යාදී වූ සෙඛඵල විමුක්තිය කෙළවර ද, අසෙඛයන්ගේ පටිසම්භිදාවනට පැමිණීම අරහත්තඵලවිමුක්තිය කෙළවර ද වන්නේ ය. බුදුරජාණන් වහන්සේට රහත්පලයට පැමිණීම සමග ම දශබලඥානය ලැබෙන්නා සේ සෙඛ – අසෙඛ වූ හැම ආර්‍ය්‍යයන් වහන්සේට ම ආර්‍ය්‍යඵලයට පැමිණීම සමග ම පටිසම්භි-දාවෝ ලැබෙන්නාහ.

පිළිසැඹියාවන් ගැණ දතයුතු කරණු අතුරෙහි මෙහි දක්වන ලද්දේ ඉතා ම ටිකෙකි. එද ඉතා ම කෙටියෙනි. තවත් මෙහිලා **ප්‍රභේද – ආරම්මණ – කාල – අජ්ඣත්තබහිද්ධාරම්මණ – ඵල** ඈ විසින් දතයුතු කරුණු බොහෝ ඇත්තේ ය. එ හැම විභඞ්ග පාළි – පටිසම්භිදාමග්ග – විභඞ්ගට්ඨකථාදිය බලා දතයුතු ය. උගත යුතු ය.

**අක්ඛරානං සන්නිපාතං ජඤ්ඤා පුබ්බපරාණි ච** = අක්ෂරයන්ගේ සමුදය හා පූර්වාපරාක්ෂරයන් දන්නේ ද.

අ – ඉ – උ යනාදීහු ශබ්දයෝ ය. ඔවුහු සිතෙහි හටගන්නා අදහස් අන්හට හඟවාලීමෙහි කැමැත්ත ඇති කල්හි වායොධාතු ශක්තියෙන් උපදිති. කණට ගොදුරු වෙති. පදයනට අවයව වෙති. ඉදිරියෙහි සිටියවුනට සිය අදහස් එසේ හට ගැණෙන ශබ්ද කිහිපයක් එකවට උසුරුවීමෙන් හැඟවිය හැකි වුව ද ශබ්දයන් ඇසට ගොදුරු නො වන බැවින් ඉදිරියෙහි නො සිටියවුනට ශබ්ද කියා පෑමෙන් සිය අදහස් හැඟවිය නො හැකි ය. ඔවුනට හැඟවිය

යුත්තේ ඇසට ගොදුරු වන සැටියෙන් ලියා පෑමෙනි. එහෙයින් ඒ ඒ රටවැස්සන් විසින් සිය අදහස් අනභිමුඛයනට හැඟවීමෙහි දී හට ගන්නා ඒ ඒ ශබ්ද ලියා දැන්වීම පිණිස උපදවා ගත් සඞ්කේතයෝ **අක්ඛර - අකුරු** යි කියනු ලැබෙත්. මෙහි ගැණෙනුවෝ බුදුවදන් පැවසීමෙහි ලා යෙදෙන සඞ්කේතයෝ ය. මේ සඞ්කේතයෝ පිටකත්‍රයට පැමිණ ක්‍ෂය නො වෙත්නු යි යන අරුත් තබා අක්ඛර යි හඳුන්වනු ලැබෙත්. පාළියෙහි, අක්ඛර යි හඳුන්වනු ලබන ඒ සඞ්කේත එක්සාළිසක් ලැබෙන බව **"අක්ඛරාපාදයො එකචත්තාළීසං"** යන මේ ආරම්භයෙන් කියනු ලැබේ. **අ, ආ, ඉ, ඊ, උ, ඌ, එ, ඔ, ක, ඛ, ග, ඝ, ඞ, ච, ඡ, ජ, ඣ, ඤ, ට, ඨ, ඩ, ඪ, ණ, ත, ථ, ද, ධ, න, ප, ඵ, බ, භ, ම, ය, ර, ල, ව, ස, හ, ළ, අං** යන මේය ඒ එක්සාළිස. මෙසේ ප්‍රමාණ විසින් එක්සාළිසක් සඞ්කේතයෝ පිටකත්‍රයට පැමිණ ක්‍ෂය නො වෙත් ද, එහෙයින් අක්ඛර නම් වෙත්. **"න ඛරන්තීති = අක්ඛරා, පමාණතො එකචත්තාළීසමත්තා පිටකත්තයම්පි පත්වා න ඛීයන්තීති අත්ථො"** යි ඇදුරන් විසින් එයරුත් පැහැදිලි කරණ ලද්දේ ය.

මෙහි වෙසෙසින් පාලිභාෂිය වචන ලියා පෑ මෙහි ලා උපකාර වන සලකුණු ක්‍ෂය නො වන අරුතින් හා රළු පරළු නො වන අරුතින් අක්ඛර යි කියනු ලැබේ. **"අක්ඛයට්ඨෙන අක්ඛරට්ඨෙන ච අක්ඛරං"** යනු ආචාර්‍ය්‍ය වචනයි. යමෙක් ක්‍ෂය වේ නම්, ගෙවී යේ නම්, රළු වේ නම්, තදබවට යේ නම්, එය **'ඛර'** නම්. **"යං හි ඛයං ගච්ඡති, පරිහායති, තං ඛයන්ති වුච්චති, යම්පන ඛරං හොති ථද්ධං, තං ඛරණන්ති වුච්චති"** යනු ශබ්දානුශාසනා යි.

මේ අක්‍ෂර වනාහි සංස්කාර – විකාර – ලක්‍ෂණ – නිර්වාණ – ප්‍රඥප්ති නම් වූ ඥෙයපථයෙහි පවත්නේ ද, විනාශයට ගෙවී යෑමට නො යන්නේ ය. නො ද පිරිහෙන්නේ ය. මතු මතුයෙහි දක්නා ලබන්නේ ය. ඉතා සියුම් වූ ගැඹුරු වූ සඞ්කේතයන්හි පවා පෙරළෙනුයේ රළුබවට හෝ තදබවට නො යන්නේ ය. ඉතා මොළොක් ව අර්ථ විසින් පවත්නේ ය. ප්‍රමාණ විසින් එක්සාළිසක් පමණ වූ මේ අක්‍ෂර කෙළවරක් නො දත හැකි අර්ථයනට පැමිණියේ ද නාශයට නම් නො යන්නේ ය. එහෙයින් අක්ඛර නම්. අක්‍ෂර ද ඉතා විස්තාර ව සිටියේ ය. ශබ්දලක්‍ෂණ ග්‍රන්ථයන්ගෙන් ඒ දතයුතු ය.

මෙසේ අර්ථවත් වූ ද ශබ්දශාස්ත්‍රවිධියෙන් දතයුතු වූ ස්වර – ව්‍යඤ්ජන – හ්‍රස්ව – දීර්ඝ – වර්ගී – අවර්ගී – ඝොෂ – අඝොෂ – ශිථිල – ධනිත – නිඃශ්‍රිත – අනිඃශ්‍රිතාදී වශයෙන් හා ස්ථාන – කරණ –

ප්‍රයත්නාදිවශයෙන් විවිධභෙද ඇත්තා වූ ද අක්‍ෂරයන්ගේ ඒ ඒ අරුත්හි එක්ව නැගී සිටීම, අරුතට පමණ ලෙසින් එක්වීම මෙහි **සන්නිපාත** නම් වේ.

ශබ්දය අර්ථය හා නිත්‍යසම්බන්ධය ඇත්තේ ය. **"නිච්චෝ සද්දත්ථසම්බන්ධෝ"** යි එය කීහ. එහි ද ප්‍රධාන වනුයේ අර්ථය ය. **"අක්ඛරසඤ්ඤතො අත්ථං"** යි ආ යුතු වුව ද, **"අත්ථං අක්ඛරසඤ්ඤතො"** යි ආයේ ද අර්ථයාගේ ම ප්‍රධානභාවය දක්වනු පිණිස ය. **"අත්ථං හි නාථෝ සරණං අවොච"** යනුත් දතයුතු ය. අර්ථය ප්‍රධාන බැවින් අර්ථය රැකෙන සේ අකුරු යෙදිය යුතු ය. එක්තැන් කළයුතු ය. ඒ නො සලකා පූර්වාක්‍ෂර - පරාක්‍ෂර ගැණ නො විමසා අකුරු යොදන ලද්දේ නම්, එයින් යථාර්ථය වැසී ගොස් විරුද්ධාර්ථ මතු වන්නේ ය. **"සිථිලධනිතාදි අක්ඛර විපත්තියං හි සති අත්ථස්ස දුන්නයතා හොති"** යනු කීයේ එහෙයිනි.

අර්ථයක් නැති තැන අක්‍ෂරයන්ගේ සන්නිපාතයෙක් නම් නැත්තේ ය. අක්‍ෂරසන්නිපාතය වනුයේ විද්‍යමාන අර්ථයෙහි ම ය එහෙයින් කීය:-

"අවිජ්ජමානකෙ අත්ථෙ න තං සක්කා ඨපෙතවෙ,
විජ්ජමානෙ පනත්ථම්හි සක්කාක්ඛරෙ ඨපෙතවෙ" යි.

පර්‍ය්‍යාප්ති - ප්‍රතිපත්ති - ප්‍රතිවෙධ නම් වූ ජිනශාසනයාගේ අධිගමය, එක් එක් අක්‍ෂරයෙහි හා අක්‍ෂරසන්නිපාතස්වරූප වූ ශබ්ද රූපයක් කෙරෙහි ද නිරවුල් දැනීම මුල් කොට සිටියේ ය. එහෙයින් ලෞකික - ලොකොත්තරාදිභෙද ඇති වචනාර්ථය අක්‍ෂර කරණ කොට ගෙණ ම ලැබිය යුතු බැවින් නුවණැත්තේ අර්ථය බලා ම අකුරු යොදන්නේ ය. එසේ යෙදූ අකුරු බලා ම අකුරු නො හැර ම එයින් යථාර්ථය ගන්නේ ය. මෙ ද මෙසේ කීහ:-

"තස්මා අත්ථවසෙනෙව ධීරො පෙසෙය්‍ය බ්‍යඤ්ජනං,
බ්‍යඤ්ජනස්සෙව අනොක්කම්ම අත්ථං නිය්‍යාත පණ්ඩිතො"

යනු විසින්. බ්‍යඤ්ජනශබ්දය මෙහි අක්‍ෂරපර්‍ය්‍යාය වේ. චතුර්විධ ප්‍රතිසම්භිදාවන් අතුරෙහි අර්ථප්‍රතිසම්භිදාව ආදිම වූවා ද, අර්ථය ම ප්‍රධාන බැවිනි. මේ එය කියූ සැටි:

"පටිසම්භිදානමෙතාසං චතුන්නං ආදිසම්භවො,
අත්ථො සො ගහිතො තෙන ජිනවුත්තානුසාරිනා" යි.

ශබ්දයෙහි මුලකුර පූර්වාක්‍ෂර නම්. අගකුර අපරාක්‍ෂර නම්. එදෙක සඳහා **"පුබ්බාපරානි"** යනු යෙදුනේ ය. "පුබ්බාපරානි" යනු

**“ජඤ්ඤා”** යන ක්‍රියාපදයට යටත් ව සිටියේ ය. එහෙයින් පූර්වාපරාක්ෂරයන් හෙවත් පූර්වාපරාක්ෂරයන්ගේ යෙදීම දන්නේ ය, යනු අරුත්.

මෙහි පූර්වාක්ෂරයෙන් අපරාක්ෂරයත් අපරාක්ෂරයෙන් පූර්වාක්ෂරයත් දැන ගන්නේ ය. යම් ශබ්දයෙක මූලකුර පෙණේ නම්, මැදකුරු හා අගකුරු නො පෙණේ නම්, මේ මූලකුරට මෙනම් අකුරු මැදකුරු හා අගකුරු විය යුතුය යි ද, අගකුර පෙණේ නම්, මේ අකුර, මූලකුරු හා මැදකුරු විය යුතුය යි ද දන්නේ ය. මේ මෙසේ දැනීම පූර්වාක්ෂරාපරාක්ෂර දැනීම ය යි කියනු ලැබේ. **“පුබ්බක්ඛරෙන අපරක්ඛරං, අපරක්ඛරෙන පුබ්බක්ඛරං ච ජානාති, පුබ්බක්ඛ-රෙන අපරක්ඛරං ජානාති නාම, ආදිම්හි පඤ්ඤායමානෙ මජ්ඣ පරියොසානෙසු අපඤ්ඤායමානෙසු ඉමෙසං ආදි අක්ඛරානං ඉදං මජ්ඣං ඉදං පරියොසානන්ති ජානාති, අපරක්ඛරෙන පුබ්බක්ඛරං ජානාති නාම, අන්තෙ පඤ්ඤායමානෙ ආදිමජ්ඣෙසු අපඤ්ඤායමානෙසු ඉමෙසං අන්තක්ඛරානං ඉදං මජ්ඣං අයං ආදීති ජානාති, මජ්ඣෙ පඤ්ඤායමානෙපි ඉමෙසං මජ්ඣක්ඛරානං අයං ආදි අයං අන්තොති ජානාති”** යනු අටුවා.

**සො වෙ අන්තිමසාරීරො මහාපඤ්ඤො මහාපුරිසො ඉති වුච්චති** = අන්තිම ශරීරයෙහි සිටි පැසුළු සිරුරු දරණ ඒ පුද්ගල තෙමේ ඒකාන්තයෙන් මහාප්‍රාඥ ය, මහාපුරුෂ ය යි කියනු ලැබේ.

මුළුමනින් භවසංයෝජන නසාලූ පුද්ගල තෙමේ ඉදිරි භවයෙහි උපතක් නො ලබනුයේ කෙළවර සිරුරෙහි සිටියේ **‘අන්තිමසාරීර’** නම්. **“ආයති පුනබ්භවාභාවතො පච්ඡිමසරීරෙ ඨිතො අන්තිම-සාරීරොති”** යනු අර්ථකථා ය.

**මහාපඤ්ඤ** නම්: මෙහි, මහත් වූ අර්ථ – ධම්ම – නිරුක්ති – පටිභානපටිසම්භිදාවන් හා මහත් වූ ශීලස්කන්ධාදිපංචවිධ ධර්ම-ස්කන්ධයන් පිරිසිඳ දන්නා වූ ප්‍රඥායෙන් යුක්ත වූයේ ය. මේ අටුවා: **“මහන්තානං අත්ථධම්මනිරුත්තිපටිභානපටිසම්භිදානං සීලක්ඛ-න්ධාදීනං ච පරිග්ගාහිකාය පඤ්ඤාය සමන්නාගතත්තා මහාපඤ්ඤො”** යනු.

**මහාපුරිස** නම්: මෙහි, අර්හත්ඵලවිමුක්තියෙන් විමුක්ත වූයේ ය. **“විමුත්තචිත්තොනාසවාහං සාරිපුත්ත වදාමි”** යනු දෙශනා.

ධර්මදේශනාවගේ අවසානයෙහි බොහෝ දෙන සෝවාන්ඵලාදි-යට පැමිණියාහු ය. පවිටු මරු ද ශ්‍රමණ ගෞතම තෙමේ මා දනී ය යි එහි ම අතුරුදහන් වූයේ ය.

**මාරවස්තුව නිමි.**

# උපක ආජීවක

## 24 — 9

බුදුරජාණන් වහන්සේ අධිගතසර්වඥතාඥානය ඇති සේක් බෝමැඩ සත්සති ගෙවා පාසිවුරු ගෙණ දම්සක් පවත්වනු පිණිස බරණැස බලා නික්මුනු සේක. අටළොස් යොදුන් මගට පිළිපන් බුදුරජාණන් වහන්සේ අතර මග දී මගැ එන උපක ආජීවකයා දුටු සේක. උපක ද බුදුරජුන් දැක "ඇවැත්නි! තමුන්නාන්සේගේ ඇස් කන් නාස් ඈ ඉඳුරෝ ඉතා පහන්හ, සිරුරු සිවිය ඉතා පිරිසිදු ය! කාන්තිමත් ය, ඉතා කදිම ය, ඇවැත්නි! තමුන්නාන්සේගේ පැවිද්ද කා උදෙසා ද? කවුරුන් වෙත පැවිදි වූ වහු ද? ශාස්තෘ කවුරු ද? කවරක්හුගේ ධර්මය රුස්නහු ද?"යි විචාළේ ය. එවිට බුදුරජාණන් වහන්සේ "මට උපාධ්‍යායයෙක් නැත, ආචාර්‍ය්‍යයෙක් නැතැ"යි වදාරා මේ ධර්මදෙශනාව කළ සේක.

**සබ්බාභිභූ සබ්බවිදූහමස්මි**
**සබ්බෙසු ධම්මෙසු අනූපලිත්තො,**
**සබ්බඤ්ජහො තණ්හක්ඛයෙ විමුත්තො**
**සයං අභිඤ්ඤාය කමුද්දිසෙය්‍යන්ති.**

මම සියල්ල මැඩලූයෙම් සියල්ල දන්නෙම් සියලු ධර්මයන්හි නො ඇලුනෙම් සියලු ධර්මයන් බැහැර කෙළෙම් අර්හත්ඵලයෙහි විමුක්තයෙම් වෙමි. (ඒ මම) තෙමේ සියලු ධර්මයන් දැන කවරක්හු උදෙසම් ද.

**සබ්බාභිභූ** = කාමාවචර - රූපාවචර - අරූපාවචර යන සියලු ත්‍රෛභූමකධර්මයන් මුළුමනින් යටපත් කොට සිටියේ ය.

**සබ්බවිදූ** = දන්නාලද සියලු කාමාවචර - රූපාවචර - අරූපාවචර - ලොකොත්තරධර්ම ඇතියේ ය.

**සබ්බෙසු ධම්මෙසු න උපලිත්තො** = සියලු ත්‍රෛභූමකධර්මයන්හි තෘෂ්ණාදෘෂ්ටි වශයෙන් නො ඇලුනෙම් වෙමි.

**සබ්බඤ්ජහො** = සියලු ත්‍රෛභූමකධර්මයන් හැර සිටියෙම් වෙමි.

**තණ්හක්ඛයෙ විමුත්තො** = අර්හත්ඵලයෙහි, මිදුනෙම් වෙමි.

**'තණ්හක්ඛයවිමුත්ත'** නම්: මෙහි තෘෂ්ණාක්ෂය යි කියන ලද අර්හත්මාර්ගයාගේ අවසානයෙහි නිපද වූ බැවින් අර්හත්ඵලය ද තෘෂ්ණාක්ෂය යි කියනු ලැබේ. ඒ මේ අර්හත්ඵලයෙහි අර්හත්ඵලවිමුක්තියෙන් මිදී සිටියේ ය. **"තණ්හක්ඛයෙනාති උප්පාදිතෙ තණ්හක්ඛයසඞ්ඛාතෙ අරහත්තෙ අසෙක්ඛාය විමුත්තියා විමුත්තො"** යනු අටුවා.

**සයං අභිඤ්ඤාය කං උද්දිසෙය්‍යං**- (මම) තෙමේ දැන කවරක්හු උදෙසම් ද.

මම ම අභිධෙය්‍යාදිප්‍රභෙද විසින් දතයුතු වූ සිවු සස්දහම් විශිෂ්ටඥානයෙන් දැන සිටිනෙම් අන් කවරක්හු මාගේ උපාධ්‍යායයා කොට මාගේ ආචාය්‍ය්‍යීයා කොට දක්වම් ද. එබන්දෙක් මට නැත.

මෙහිලා බුදුරජාණන් වහන්සේ මෙසේ ද වදාළ සේක:-

''න මෙ ආචරියො අත්‍ථි සදිසො මෙ න විජ්ජති,
සදෙවකස්මිං ලොකස්මිං නත්‍ථි මෙ පටිපුග්ගලො''

මට ලොකොත්තරධර්මයෙහි ඇදුරෙක් නැත. මට සමානයෙක් විද්‍යමාන නො වේ. දෙවියන් සහිත ලොකයෙහි මාහට සම පුද්ගලයෙක් නැත.

''අහං හි අරහා ලොකෙ අහං සත්‍ථා අනුත්තරො,
එකො'මහි සම්මාසම්බුද්ධො සීතිභූතොස්මි නිබ්බුතො''

ලොකයෙහි මම රහත් වෙමි. මම ම නිරුත්තර වූ ශාස්තෘ වෙමි. මම ම සම්‍යක්සම්බුද්ධ වෙමි. (සියලු කෙලෙස්ගිනි නිවීමෙන්) සිහිල් වූ යෙමි. එහෙයින් ම නිවුනෙමි.

''මාදිසා වෙ ජිනා හොන්ති යෙ පත්තා ආසවක්ඛයං,
ජිතා මෙ පාපකා ධම්මා තස්මාහං උපකා ජිනො''

යම් කෙනෙක් කාමාදී ආස්‍රවයන් ක්‍ෂය කිරීමට පැමිණියෝ ද මා වැනි ඔවුහු 'ජින' නම් වෙති. උපකය! මා විසින් පාපධර්මයෝ දිනනලදහ. එහෙයින් මම ජින නම් වෙමි, යනු අරුත්.

ධර්මදෙශනාවගේ අවසානයෙහි උපක තෙමේ බුදුරජුන්ගේ බසට නො ද සතුටු ව නො ද පිළිකෙව් කොට හිස සොලොවා දිව ඇද දක්වා අඩිපාරක් දිගේ ගොස් වැදිගෙදරකට වන්නේ ය.

**උපකාජීවකාවස්තුව නිමි.**

# දෙවියන් අතර පැන නැගුනු ප්‍රශ්න සතරෙක්.

## 24 — 10

තව්තිසා වැසි දෙවියන් අතර "දානයන් අතුරෙහි කවර නම් දානයෙක් උතුම්? රස අතුරෙහි කවර නම් රසයෙක් උතුම්? රති අතුරෙහි කවර නම් රතියෙක් උතුම්? කුමක් හෙයින් තෘෂ්ණාක්‍ෂය නම් වූ අර්හත්වය ශ්‍රෙෂ්ඨ ද?"යි යන මේ ප්‍රශ්න සතරෙක් උපන. එහෙත් දෙවියෝ ඒ ප්‍රශ්න විසඳා ගැණීමෙහි අපොහොසත් වූහ. එක් දෙවියෙක් අන් දෙවියකු අතින්, ඒ දෙවි අන් දෙවියකු අතින් යන මේ ලෙසින් උතුන් විචාළෝ ද එකෙකුගෙනුත් ඒ ප්‍රශ්නයනට පිළිතුරු නො ලැබ ඔවුහු දස දහස් සක්වළ දෙලොස් අවුරුද්දක් පමණ තැන තැන හැසුරුණාහ. නැවැත ඔවුහු සිව් මහරජුන් වෙත ගියහ. සිව් මහරජදරුවෝ දෙවතාසන්නිපාතය දැක "මේ සන්නිපාතය කුමක් නිසා?"යි ඔවුන් විචාළහ. "දෙවයන් වහන්ස! අප අතර නැගි ප්‍රශ්න සතරෙක් ඇත්තේය, ඒ එකකටත් මෙතෙක් පිළිතුරු සපයා ගත නො හැකි විය, එහෙයින් අපි ඒ ප්‍රශ්නයනට පිළිතුරු ලබා ගණු පිසියෙන් ඔබවහන්සේලා වෙත ආම්හ"යි දෙවි-යන් කී විට වරම්රජහු "ඒ ප්‍රශ්න සතර කියාලවු"යි කීහ. එකල්හි එහි රැස් වූ දෙවියෝ "දාන අතුරෙහි කවර නම් දානයෙක් උතුම්? රස අතුරෙහි කවර නම් රසයෙක් උතුම්? රති අතුරෙහි කවර නම් රතියෙක් උතුම්? කුමක් හෙයින් තෘෂ්ණාක්‍ෂය නම් වූ අර්හත්වය ශ්‍රෙෂ්ඨ ද"යි තමන් අතර නැගි ඒ ප්‍රශ්න සතර කියා එයට පිළිතුරු ඉල්ලා සිටියහ. වරම්රජහු "අපිදු මේ ප්‍රශ්නයනට පිළිතුරු දෙන්නට නො දනුම්හ, සක්දෙව් රජ තෙමේ දහසක් දෙනා විසින් සිතා ලූ මොන යම් ම ප්‍රශ්නයක් වුව ද ඒ හැම ප්‍රශ්නයක් මොහො-තකින් විසඳන්නට සමර්ථ වූයේ ය, ඔහු අප හැමට වඩා පිණෙන් ඉසුරින් නුවණින් බලයෙන් මහත් ව සිටුනේ ය, එවු, එහි යන්-නට"යි දෙවගණයාත් ගෙණ සක්දෙව්රජහු වෙත ගියහ. සක්දෙව් රජ මහත් වූ දෙවසමූහයා දැක "මෙතරම් මහත් දෙවසමූහයෙක් මෙහි ආයේ කුමටැ"යි විචාළ විට වරම්රජහු ඒ ප්‍රශ්න සක්දෙව් රජුට දන්වා සිටියහ. ඉක්බිති සක්දෙව් රජ තෙමෙ "මේ ප්‍රශ්න විසඳා කියාලන්නට දන්නෙක් අප අතර නැත, බුදුරජාණන්-වහන්සේ හැර අනෙකෙක් මේ ප්‍රශ්න විසඳීමෙහි සමර්ථ නො වේ, බුදු රජාණන් වහන්සේට ම මෙය විෂය වන්නේ ය, මෙය විසඳීමෙහි සමර්ථ බුදු රජාණන් වහන්සේ ම ය, උන්වහන්සේ මේ දවස කො-තැන්හි වැඩ වසන සේක් ද?"යි ඇසී ය. "දෙව්රම් මහවෙහෙර"යි උන් කී කල්හි සක්දෙව්, එදා රෑ ම මුළු දෙව්රම් මහවෙහෙර

බබුලුවා ගෙණ දෙව් පිරිසත් ගෙණ බුදුරජුන් වෙත ගොස් වැඳ එකත් පසෙක වී සිටියේ ය. එ කල්හි උන්වහන්සේ "මහරජ! මහත් වූ දෙව්පිරිසකුත් ගෙණ මෙහි ආවහු කුමක් නිසා?"යි අසා වදාළ විට "ස්වාමීනි! භාග්‍යවතුන් වහන්ස! මේ දෙවියෝ ප්‍රශ්න සතරක් පිළියෙල කොට අවුත් එයට පිළිතුරු කියන්නැ'යි මාගෙන් ඉල්ලා සිටිත්, මෙයට පිළිතුරු දීමෙහි මා අපොහොසත් බව කියා බුදුරජානන් වහන්සේ හැර අනෙකෙක් මෙහි සමර්ථ නො වේ ය'යි දන්වා මුන් ගෙණ මෙහි ආයෙමි, එහෙයින් අපට ඒ ප්‍රශ්න විසඳා දෙනු මැනැවැ"යි කියේ ය. "මහරජ! මෙහි අරුත් දන්නට මෙයට පිළිතුරු සපයා ගන්නට මෙහි පැමිණීම විය-යුතු ම ය, මා පැරුම් පුරා මහාපරිත්‍යාග කොට සර්වඥතාඥනය අත්පත් කරගත්තා ලද්දේ ද ඔබ වැන්නවුන් විසින් අසන ප්‍රශ්න විසඳා ඔබ වැන්නන්ගේ සැක සිඳ හරිණු පිණිස ය, ඔබ ඇසූ ප්‍රශ්න අතුරෙහි පළමු ප්‍රශ්නයට, දාන අතුරෙහි ධර්මදානය ශ්‍රේෂ්ඨ ය, දෙවන ප්‍රශ්නයට, රස අතුරෙහි ධර්මරසය ශ්‍රේෂ්ඨ ය, තෙවන ප්‍රශ්නයට, රති අතුරෙහි ධර්මරතිය ශ්‍රේෂ්ඨ ය, සිවුවන ප්‍රශ්නයට තෘෂ්ණාක්ෂය ය රහත් බවට පමුණු වන බැවින් ශ්‍රේෂ්ඨය, යනු පිළිවෙළින් පිළිතුරු ය"යි වදාරා මේ ධර්මදේශනාව කළ සේක.

> **සබ්බදානං ධම්මදානං ජිනාති**
> **සබ්බං රසං ධම්මරසො ජිනාති,**
> **සබ්බං රතිං ධම්මරතී ජිනාති**
> **තණ්හක්ඛයො සබ්බදුක්ඛං ජිනාතීති.**

ධර්මදානය සියලු දානයන් දිනන්නේ ය. ධර්මරසය සියලු රසයන් දිනන්නේ ය. ධර්මරතිය සියලු රතීන් දිනන්නේ ය. අර්හත්ඵලය සියලු දුක් දිනන්නේ ය.

**සබ්බදානං ධම්මදානං ජිනාති** = ධර්මදානය සියලු දානයන් දිනන්-නේ ය.

යමෙක් සිල්වත් ගුණවත් දක්ෂිණාර්හයකහට දැහැමින් සෙමෙන් ලත් දශ දානවස්තූනට අයත් යම් ම දෑයක් පූජා බුද්ධියෙන් පුදා ද, දේ ද ඒ පුදන්නහුගේ කුසල් සිත්හි උපදනා චේතනා මාත්‍රය දාන නම් වේ. ආමිසදාන ය යි.[1] "සබ්බදානං" යන මෙයින් ගැණෙ-නුයේ ඒ ය.

පූජාසත්කාර කීර්තිප්‍රශංසා ලැබීමෙහි ආශා නැති ව හුදෙක් නිවන් ලැබීමෙහි එක් ම අදහස් ඇති ව දහම් දෙසන්නහුට උපදනා කුසලචිත්තවීථියෙහි ජවනක්ෂණ සත හා යෙදෙන කුශල චේතනා මාත්‍රය **ධම්මදාන** නම්.

1. 13. 10. 'දානං' යනු බලනු

ඉදින් සමෙක් සක්වල ගැබ මුළුල්ලෙහි බඹලොව දක්වා දණින් දණ ගාවා අතරක් නො තබා වැඩ හුන් බුදු – පසේබුදු – මහරහතුන් වහන්සේලාට කෙහෙල් ගොබ වැනි පිළියෙන් කළ සිවුරු පුදන්-නේ ද, ඒ මහාදානයෙහි සිවූ පැදිගයකින් කරණ අනුමෝදනා ධම්දෙශනාව ම ශ්‍රෙෂ්ඨ වන්නී ය. ඒ ආමිසදානානිසංසය, අනු-මෝදනාධම්දෙශනාවෙන් ලැබෙන ආනිසංසය සොළොස් වරක් සොළොසට බෙදූ ලැබෙන කොටස පමණටත් නො එන්නේ ය. නො අගනේ ය. එහි අනුමෝදනා ධම්දෙශනාව ම ශ්‍රෙෂ්ඨ ව සිටුනී ය. ආමිසදානයෙන් ලැබෙන ආනිසංසය අභිබවා සිටුනී ය. එහෙයින් ධම්දෙශනා කිරීම, ධම්ය උගැන්වීම, ධම්ශ්‍රවණය යන මේ ධාර්මික ක්‍රියාවෝ මහත් අනුසස් ඇතියහ. එසේ ම අන්හු ලවා කරවන ධම්ශ්‍රවණය ද අනුසස් අතින් නැගී සිටින්නේ ය.

එබඳු පිරිසක්හට ම පා පුරා දුන් ප්‍රණීත ආහාරදානයට ද වඩා පා පුරා දුන් ගිතෙල්-මී-සකුරු ඈ බෙහෙත් දානයට ද වඩා අනුරපුර මහවෙහෙර වැනි නොයෙක් සිය දහස් ගණන් විහාරා-රාම කරවා ලොහොපහය වැනි නොයෙක් සිය දහස් ගණන් ප්‍රාසාද කරවා දුන් සෙනාසන දානයට ද වඩා අනාථපිණ්ඩිකාදීන් විසින් වෙහෙර විහාර ගොඩ නැංවීමෙහි ලා කළ මහාධනපරිත්‍යාගයනට ද වඩා සටක් පිරිසකින් සිවූ පැදිගයකින් අනුමෝදනා වශයෙන් කරණ ලද ධම්දානය ම ශ්‍රෙෂ්ඨ වන්නේ ය. මෙබඳු මහත් පරිත්‍යාග කරන්නෝ ද ධම්ය අසා ම තුන් සිත පහදා ගෙණ ම දාන කරන්නෝ ය. ඉදින් මේ සත්‍වයෝ දහම් නො අසන්නාහු නම් කෙණෙස්සක් පමණ කැඳක් සැන්දක් පමණ බතක් නො දෙන්-නෝ ම ය. මේ හෙතුවෙන් සියලු ආමිසදානයට වඩා ධම්දානය ම ශ්‍රෙෂ්ඨ වේ.

තවද බුදු – පසේබුදුරජුන් හැර කපක් මුළුල්ලෙහි වට වැස්සෙහි දියබිඳු ගැණ කියන්නට සමර්ථ වූ නුවණින් යුත් ශාරිපුත්‍රාදී වූ මහාශ්‍රාවකයෝ පවා සවශක්තියෙන් ස්‍රොතාපත්තිඵලාදියට පැමි-ණෙන්නට අසමර්ථ වූවාහු අස්සජි ආදී වූ මහතෙරුන් විසින් වදාළ ධම්ය අසා ම ස්‍රොතාපත්තිඵලය සාක්ෂාත් කළහ. බුදුරජානන් වහන්සේගෙන් බණ අසා ශ්‍රාවකපාරමීඥානය ලැබූහ. කරුණු මෙසේ බැවින් ධම්දානය අන් සියලු ආමිසදානයන් ඉක්මවා සට කොට නැගී සිටින්නේ ය.

**සබ්බං රසං ධම්මරසො ජිනාති** = ධම්මරසය සියලු රසයන් දිනන්නේ ය.

ලවනාම්ල තික්ත කටුක කෂාය මධුර යි ප්‍රධාන විසින් රසය සවැදෑරුම් ය. ලොකයෙහි ඇති තාක් රසවිශෙෂයෝ මේ ෂට්රසයෙහි

ඇතුළත් වෙති. ඇතුළත් වූවෝ නම්: සැකෙවින් ඛන්ධ පත්‍ර-තච-මූල පුෂ්ප-ඵල රසාදීහු ය. මේ ලවණාම්ලාදි රස හා උඩත් පිරිසෙයින් දෙවියන්ගේ සුධාභෝජන රසය ද සත්වයන් සසරෙහි හෙළා දුක් විඳුවන්නට කරුණු වන්නේ ය. ලොකයෙහි ඇති තාක් ඒ රස **"සබ්බං රසං"** යන්නෙන් ගැණුනේ ය.

**'ධම්මරස'** නම්:- සප්තත්‍රිංශත්බොධිපාක්ෂිකධර්ම හා නව ලොකොත්තර ධර්ම යි. ඒ මේ ධර්මරසය සත්වයන් ජරාමරණ නැතිය වුන් කරණ බැවින් සියලු රසයනට වඩා ශ්‍රෙෂ්ඨ වේ. සියලු රස අබිබවා සිටියේ ය.

**සබ්බං රතිං ධම්මරති ජිනාති** = ධර්මරතිය සියලු රතීන් දිනන්නේය.

අඹු-දරු-දැසි-දස්-ධන-ධාන්‍ය-නෘත්‍ය-ගීත-වාදිතාදියෙහි වූ නන් වැදෑරුම් ඇලුම් **"සබ්බං රතිං"** යන්නෙන් ගැණේ. ඒ සියලු රතීහු සත්වයනට සසර ඉපද දුක් විඳීමට කරුණු වෙත්.

ලාභසත්කාරයෙහි බලාපොරොත්තු රහිත ව නිවන් ලැබීමෙහි එක් ම අදහසින් දහම් දෙසන්නහුට ද එසේ ම ත්‍රිශරණාධ්‍යාශයෙන් දහම් අසන්නහුට හා දහම් උගන්වන්නහුට ද උපදනා ප්‍රීතිය **'ධම්මරති'** නම්. එය ඔදවැඩිබව උපදවන්නී ලොමු ඩැහ ගන්වමින් සසර දුක් කෙළවර කොට රහත්බව අවසන් කොට සිටියා සියලු රතීන්ට වඩා ශ්‍රෙෂ්ඨ වේ. සියලු රතීන් යටපත් කොට සිටියා ය.

**තණ්හක්ඛයො සබ්බදුක්ඛං ජිනාති** = අර්හත්ඵලය සියලු දුක් දිනන්නේ ය.

කාමතණ්හා-භවතණ්හා-විභවතණ්හා යන සියලු තෘෂ්ණාවන් නසාලන බැවින් අර්හත්මාර්ගය **'තණ්හක්ඛය'** නම්. ඒ අර්හත්මාර්ගඥානාවසානයෙහි තදනු කුලව උපදනා අර්හත්ඵලය ද 'තණ්හක්ඛය,යි ගැණේ. ඒ මේ අර්හත්ඵලය සියලු සසරදුක් මුළුමනින් නසාලන බැවින් සියලු දුක් ජය ගන්නේ සියල්ලනට ශ්‍රෙෂ්ඨ වේ. ඇති තාක් දුක් නසා ලනුයේ අර්හත්ඵලය යි.[1]

මෙසේ බුදුරජානන් වහන්සේ මේ ගාථායෙහි අරුත් වදරත් ම අසූසාරදහසක් ප්‍රාණීන්ට ධර්මාවබොධය වූයේ ය. ඉක්බිති සක්දෙව් බුදුරජානන් වහන්සේගේ මේ ධර්මකථාව අසා වැඳ "ස්වාමීනි! මෙතරම් ශ්‍රෙෂ්ඨ වූ ධර්මදානයෙහි පින් අපට නො ද දෙවන සේක්

---

1. 14 6. 'දුක්ඛසමුප්පාදං, යනු බලනු
,, ,, ,, 'දුක්ඛස්සච අතික්කමං, ,, ,,

කුමක් නිසා ය; සවාමීනි! මෙතැන් පටන් කොතැනක හෝ බණක් වදාළොත් බණ අවසන්හි එහි පින් අපටත් පමුණුවන ලෙසට භික්ෂුසඞ්ඝයාහට අනුදැන වදාළ මැනැවැ''යි ඉල්ලා සිටියේ ය. බුදුරජනාන් වහන්සේ ඔහුගේ බස් අසා භික්ෂුසඞ්ඝයා රැස් කරවා ''මහණෙනි! සක්දෙව් මෙහි මා වෙත ආයේ ය, ආයේ එකලාව නොවෙ යි, ඔහුගේ පිරිවර වූ දෙවසමූහයාත් කැටුව ය, අවුත් දන අතුරෙහි කවර නම් දනයෙක් උතුම්?, රස අතුරෙහි කවර නම් රසයෙක් උතුම්?, රතීන් අතුරෙහි කවර නම් රතියෙක් උතුම්?, කුමක් හෙයින් අහීත්වය ශ්‍රෙෂ්ඨ ද? යන මේ ප්‍රශන සතර ඇසී ය, මම එයට නියම විසින් පිළිතුරු දුනිමි, මාගේ ඒ පිළිතුරු කථාව ඇසූ අසූ සාරදහසක් දෙනාට ධර්මාවබෝධය වූයේ ය, එතැන දී සක්දෙව් කො තැනක හෝ ධර්මදෙශනාවක් කරණලද්දී නම් එහි දී ඔවුනටත් පින් පවරනු මැනවයි මාගෙන් ඉල්ලී ය, මෙය තමුසේලා විසින් සිහියේ තබා ගතයුතු ඉල්ලීමෙකි, එහෙයින් අද පටන් තමුසේලා මහාධර්මශ්‍රවණයක් හෝ ප්‍රකෘති ධර්මශ්‍රවණයක් හෝ රැස් ව හිඳ කරණ ධර්මකථාවක් හෝ යටත් පිරිසයින් අනුමොදනා ධර්මදෙශනාවක් හෝ පවත්වන්නාහු නම් ඒ හැම තැන දී සියලු සතුන්ට එහි පින් පමුණුවා ලවු''යි නියම කළ සේක.

**ශක්‍රප්‍රශන වස්තුව නිමි.**

# අපුත්තක සිටු

## 24 — 11

**අපුත්තක** සිටු, කලුරිය කළ බව ඇසූ **කොසොල්** රජ තෙමේ ඔහුගේ ධනයට හිමිකම් කියන දරුමලුන් කිසිවක්හු නොවූ බැවින් සිටු අයත් සියලු ධනය රජසතු කොට ගෙණ එන්නට අණ කෙළේ ය. නිලධරයෝ රජුගේ අණ පරිදි අපුත්තක සිටු අයත් සියලු ධනය ගෙණ අවුත් රාජකීය භාණ්ඩාගාරයෙහි ලා තැන්පත් කළහ. ඉන් පසු රජ තෙමේ බුදු රජුන් වෙත ගොස් වැඳ සිටි කල්හි උන්වහන්සේ "මහරජ! මේ මහදවල් කොහි සිට එන්නහු ද?"යි අසා වදාළ සේක. "ස්වාමීනි! සැවැත් නුවර සිටු කලුරිය කෙළේ ය, ඔහුට දරුමල්ලෝ නැත, ඔහුගේ ධනයට හිමිකම් කියන කෙනෙක් ද නැත, මම ඔහු අයත් සියලු දේපල රජය සතු කොට ගෙන්වා භාණ්ඩාගාරයෙහි තැන්පත් කරවා අවසන් කොට බුදුරජානන් වහන්සේ දැක වැඳ යන්නට මෙහි ආයෙමි"යි කී ය. (මෙහි විස්තර කථාව සූත්‍රයෙහි ආලෙසින් දතයුතුය.)

"ස්වාමීනි! අපුත්තක සිටු, රත්මලායෙහි ලා කෑමට සත් අග රස බොජුන් තමන් වෙත එළවා තැබූ කල්හි 'මිනිස්සු මෙලෙසට අනුභව කෙරෙත් ද, තෙපි මේ ගෙයි මා හා මෙසේ සෙල්ලම් කරහු ද'යි කැම්බිම් ගෙණවුත් තැබූවන්ට සැරවැර කොට පලවා හැර, 'මිනිසුන් කන්නේ මෙසේ ය'යි කියමින් කාඩි හොදි හා හැනූ නිවුඩු හාලෙන් පිසූ බත් අනුභව කරන්නේ ය, මන වඩන රෙදි පිළී යාන වාහන සෙරෙප්පු කුඩ එළවා තැබූ කල්හි ඒ එළවා තැබූවන් පන්නා හැර, ඝන වැහැරි ඇඳ පරණ දිරූ කරත්තයක නැගී පත් කුඩයක් හිස දරා ගමන් බිමන් කරන්නේ ය"යි රජ තෙමේ බුදුරජානන් වහන්සේට දන්වා සිටියේ ය.

ඉක්බිති බුදුරජානන් වහන්සේ "මහරජ! ඔය අපුත්තක සිටු පෙර **තගරසිඛී** පසේ බුදුරජුන් පිඬු සිඟා ආ වේලෙහි පිණ්ඩපාතය දෙන්නට බිරියට නියම කොට තෙමේ හුනස්නෙන් නැගිට බැහැර ගිය කල්හි ඔහුගේ බිරිය සැදැහැතියා 'මා මේ ගෙට ආවාසින් පසු මොහුගේ කටින් දෙන්නැ'යි යන බසක් ඇසුවා අද ය, එයින් අද මාගේ මනදෙළ පිරී ගියේ වනැ'යි පසේ බුදුරජුන්ගේ පාත්‍රය ගෙණ එය පිණි බොජුනෙන් පුරවා බුදුරජුන්ට පිළිගැන්නූ ය, පිණ්ඩපාතය දෙන්නැ යි කියා ගෙයින් බැහැර ගිය සිටු මග රැක සිට පිණ්ඩපාතය ගෙණ යන බුදුරජුන් වෙත ලං ව 'ශ්‍රමණය! මොකවත් ටිකක් ලද ද,' යි අසමින් පාත්‍රය දෙස බලා පිළිසරට පැමිණ මේ අගනා ආහාරපාන ටික දැසි දස්සනට හෝ වැඩකරුවනට දෙන

ලද නම් මට උත්ගෙන් හොඳට වැඩ ගන්නට තුබුනේ ය, මෙතෙමේ මෙය ගෙණ ගොස් කාබී නිදි ගත්තේ ය, මා කළේ මෝඩකමෙකැ'යි සිතී ය, මෙතෙමේ පෙර සසර සැරිසරණ කාලයෙහි මළා වූ සහොදරයකුගේ ලදරු පුතකු තම ඇඟිල්ල එල්බ ඇවිදුනා දවසෙක 'මේ අපගේ තාත්තාගේ කරත්ත ය, මේ ගොනාත් තාත්තාගේ, යනාදී විසින් කියූ බස් අසා මූ කුඩා දවසෙහි මෙසේ නම්, වැඩි විය පැමිණි කල්හි ගෙයි ඇති දේපල මිල මුදල් රන් රිදී කවරක්හට වේ ද?'යි අසහනයට පැමිණ එදරු කැලෑවකට ගෙණ ගොස් ගහක් මුල දී බොටුව අල්ලා අඹරා මුලපලා අලයක් පෙති ගසන්නා සේ පෙති ගසා මරා එහි දමා ගියේ ය, මහරජ! මෙ තෙමේ තගරසිඛී බුදුරජුන්ට දුන් පිණ්ඩපාතදානයාගේ විපාක විසින් සත් වරක් කාම සවගීයෙහි උපන, ඒ කර්මයාගේ විපකාවශෙෂවිසින් ම මේ සැවැත් නුවර ම සත් වරක් සිටු තනතුරු ලැබී ය, මහරජ! මෙතෙමේ පිණ්ඩපාතය දී පසුව දුන් පිණ්ඩපාතය බලා 'අයිසෝ, මේ අගනා ආහාරපාන ටික දැසි දස්සනට හෝ වැඩකරුවනට දෙන ලද නම් මට උත්ගෙන් හොඳට වැඩ ගන්නට තුබුනේ ය'යි විපිළිසරයට පැමිණියේ ද ඒ විපාකයෙන් හොඳට කන්නට බොන්නට හොඳට අඳින්නට ඉන්නට මහත් පස්කම් සැප විඳින්නට මොහුගේ සිත නො නැමුනේ ය, මහරජ! මේ සිටු ධනහෙතුවෙන් තමාගේ එක් ම සහෝදරයාගේ පුතු මරා දැමීමේ හෙතුවෙන් අවුරුදු කෙළ ගණනක් නිරයෙහි පැසුනේ ය, ඒ කර්මයාගේ විපාකාවශෙෂ විසින් මේ ජාතියත් සමග ජාති සතෙක ම පිළිවෙළින් දූපුතුන් නො ලැබී ය, එහෙයින් මෙසේ ඔහු අයත් දේපල රාජසන්තක වී ය, මහරජ! මේ සිටුගේ පෙර පින් ගෙවී ගියේ ය, අළුත් පිණක් ද නො කෙළේ ය, මහරජ! මෙතෙමේ අද මහාරෞරුවනිරයෙහි පැසෙත්තේ ය''යි වදාළ සේක.

ඉක්බිති රජ තෙමේ බුදුරජාණන් වහන්සේගේ මේ ප්‍රකාශය අසා ''ස්වාමීනි! පුදුම යි, කණගාටු යි, බැරෑරුම් වැඩෙක්, මෙසේ දේපල රැසක් තිබිය දී තමා ද නො කෑයේ ය, අන්හට නො ද දුන්නේ ය, බුදුරජාණන් වහන්සේ මේ සමීප විහාරයෙහි වැඩ ඉන්ද දී ත් කිසිත් පින්කමක් නො කොට පරලොව ගියේ ය'' යි කී ය. ''මහරජ! ඔවු, ඔබගේ කතාව හරි, **කිසිත් නො දත් අඥ පුරුෂයෝ වතුපිටි ගේ දොර මිලමුදල් රන්රිදී ආදිය ලබාත් පරලොව ගැණ නො සිතන්නෝ ය, නිවන නො සොයන්නෝ ය, නො කා නො බී නො දී රැස්කර ගත් දේපල නිසා උපන් තෘෂ්ණාව මේ මෝඩ මිනිසුන් බොහෝ කාලයක් සසරෙහි හෙළා නසාලන්නී ය**''යි වදාරා මේ ධර්මදෙශනාව කළ සේක.

**හනන්ති භොගා දුම්මෙධං නො ච පාරගවෙසිනො,**
**භොගතණ්හාය දුම්මෙධො හන්ති අඤ්ඤෙව අත්තනං.**

භොගයෝ අඥයා නසත්. පරතෙර සොයන සුළු පුද්ගලයන් නො ම නසත්. අඥ තෙමේ අනුන් නසන්නකු මෙන් භොග තෘෂ්ණායෙන් තමා නසයි.

**හනන්ති භොගා දුම්මෙධං** = භොගයෝ නුවණ නැතියහු නසත්.

මුතු මැණික් මිල මුදල් රෙදිපිළි ඇඳපුටු කොට්ට මෙට්ට ඇඳ ඇතිරිලි ආදිය හා දාසි දස් ඇත් අස් ගව මහිෂ ගේදොර ඉඩකඩම් ආදිය '**භොග**' නම්. උපභොග-පරිභොග විසින් භොගයෝ දෙපරිදි වෙත්. "**උප සමීපෙ කත්වා භුඤ්ජතෙති = උපභොගො**" යනු ව්‍යුත්පත්ති හෙයින් තමන් වෙත තබා ගෙණ ප්‍රයොජන ගණු ලබන මුතු මැණික් මිල මුදල් රෙදි පිළි අබරණ ආදිය උපභොග නම්. "**පරි දූරෙ කත්වා භුඤ්ජතෙති = පරිභොගො**" යන ව්‍යුත්පත්ති-යෙහි ලා මඳක් ඈත්හි තබා ප්‍රයොජන ගණු ලබන දාසි දස් ඇත් අස් ගව මහිෂාදීහු පරිභොගැ යි ගැණෙත්. මෙ කියූ දෙවැදෑරුම් වූ භොගයෝ නුවණ නැති මිනිහා අපායයෙහි ලා නසත් විනාශයට පමුණුවත්. දැහැමින් හෝ නො දැහැමින් පිණෙන් හෝ ශක්තියෙන් ඉපැයුනු උපයා ගත් වස්තූන් කෙරෙහි තෘෂ්ණාවෙන් බැඳී සිටියේ දියයුතු තැන නො දෙනුයේ කෑයුතු තැන නො කනුයේ ඒ වස්තූන් කෙරෙහි වූ තෘෂ්ණායෙන් මරණින් මතු දුගතියෙහි උපදින්නේ ය. "භොගයෝ නුවණ නැතියහු නසිති"යි වදාළෝ එහෙයිනි.

මෙ කල ද දැහැමිව හෝ නො දැහැමිව උපයා ගත් භොගයන් නිසි තැන නො දී නිසි තැන නො යොදා නො ද කමින් එහි තෘෂ්ණා-යෙන් බැඳී සිටුනා ධනධාන්‍යයෙන් අටු කොටු පුරවා ගත් ධනවත් ගිහිපැවිද්දෝ නො වත්නාහු නො වෙත්. මොවුහු ද අපුත්‍රක සිටු මෙන් භොගයන් විසින් අපායයෙහි හෙළා නසනු ලබන්නෝ ය. භොගයන් නිසා මෙලොව ම මොවුහු සිරගෙවල බැඳෙති. ඇණුම්, බැණුම් ලබති. රැදුවල සොරසතුරු බියෙන් තැති ගෙණ වෙසෙති. නිදි නො ලබති. එය රැක්මෙහි කඩු ඈ ආයුද ගත් අත් ඇති ව වෙසෙත්.

'**දුම්මෙධ**' නම්:- නුවණ නැත්තේ ය. තෘෂ්ණායෙන් මැඩුනේ ම ගැණෙන්නේය. නුවණ නැති බැවින් ම උපභොග පරිභොගයන් කෙරෙහි තෘෂ්ණායෙන් බැඳි සිටින්නේ ය. කෑනකම් කරන්නේ ය.[1]

**නො ච පාරගවෙසිනො** = පරතෙර සොයන සුල්ලන් නො ම නසත්.

---

1. 2. 4. 'දුම්මෙධිනො' යනු බලනු.

**පාරගවෙසිනො** = පාරගවෙසීහු නම්: නිවන් සොයන සුළු නුවණැතියෝ ය. **පාර,** යනු මෙහි නිවනට නමෙකි. නිවන සසර දුක් නැවිලි සත්සිඳවී මෙහිලා සමඤ්ඤ ව සිටි එක් ම තැන බැවින් 'පාර' යි කියනු ලැබේ. **"පාරෙති සඞ්ඛතාති සංසාරදුක්ඛ සන්තාපං සමෙතූනති=පාරං"** යනු ආචාර්‍ය්‍ය වචන යි. ඒ මේ පාර සඞ්ඛ්‍යාතනිර්වාණය සොයන සුල්ලෝ පාරගවෙසීහු ය. ඔවුහු දැහැමි ව භොග උපයති. එසේ උපයා ගත් භොග නිසි තැන යොදති. දානාදී පින්කම් කරති. පරවැඩ පිණිස යොදති. දරුමල්ලන් නෑදෑ හිතවතුන් සතප්පති. ඔවුන් හා කා බී සතුටු වෙති. මෙලොව සැප විඳිති. අවසානයෙහි නිවන් සුව වළඳත්. එහෙයින් එබන්දන් ආයත් භොගයෝ එවුන් නො නසත්. ඒ එකාන්තය.

**භොගතණ්හාය දුම්මෙධො හන්ති අඤ්ඤෙව අත්තනං** = නුවණනැත්තේ අනුන් නසන්නකු සේ භොග තෘෂ්ණායෙන් තමන් නස යි.

මෙහි **'අත්තනං'** යනු ද්විතීයාවිභක්ති ඒකවචනයෙන් යෙදී සිටියේ ය. **'හන්ති'** යන ක්‍රියා පදයට කර්මය වේ. එහෙත් 'අත්තනං' යනු පාලිභාෂිය නාම මාලාවක ද්විතීයා විභක්තියෙහි ලා දක්නට නො ලැබිනි. 'අත්තානං' යන ද්විතීයෛකවචනය හ්‍රස්ව කොට ගතයුයුතු ද නැත. එහෙයින් 'අත්තනං' යන ද්විතීයෛකවචනය දෙශනා පාලියෙහිලා ගතයුතු සේ පෙණේ. මෙය ම එයට නිදසුන්ය. විමසිය යුතු ය.

අඳ තෙමේ භොග තෘෂ්ණායෙන් කැත කමින් මැඩුනේ ප්‍රාණ-වධාදි වශයෙන් බොහෝ අකුසල් කරණුයේ මෙරමා නසන්නකු සේ තමා නසන්නේ ය. තමා අපායයෙහි හෙළන්නේ ය.

ධර්මදෙශනාවගේ අවසානයෙහි බොහෝ දෙන සෝවන් පලා-දියට පැමිණියාහු ය.

**අපුත්‍රකශ්‍රෙෂ්ඨී වස්තුව නිමි.**

# අඞ්කුරයගේ දානය

**24 — 12**

ඉන්දක තෙමේ, පිඬු සිඟා ඇතුළු ගමට පිවිසැ සිටි අනුරුද්ධ මහතෙරුන් දුටු කඹස්ට දෙන්නට ආ සැන්දක් පමණ බත්පිඩ උන්වහන්සේට පිළිගැන් වී ය. එසේ අනුරුද්ධ මහතෙරුන්ට බත් හැන්ද පිදීමෙන් ඉන්දක ලත් පිණ, අඞ්කුර විසින් අවුරුදු දසදහසක් මුළුල්ලෙහි දොළොස් යොදුන් තැන ලිප් බඳවා දුන් මහාදානයට වඩා ඉතා මහත් පල ඇත්තේ වී ය. කතා පුවත **"යෙ ඣාන-පසුතා ධීරා"** යන ගාථායෙහි ලා ආයේ ය. ඉන්දක අරබයා මෙය වදාළ සේක. එහි දී බුදුරජාණන් වහන්සේ අඞ්කුර අමතා "අඞ්කුර! දන්දීම සොයා බලා පරීක්ෂා කොට කළයුතු ය, එසේ සොයා බලා පරීක්ෂා කොට දෙන දානය සරු කෙතෙක වපුළ බත් බිජුවට සේ මහත් පල ඇත්තේ වන්නේ ය, ඔබ එසේ නො කළහු ය, එයින් ඔබගේ දානය මහත් පල ඇතියේ නො වී ය" යි මෙය පවසනු පිණිස:

"විචෙය්‍ය දානං දාතබ්බං යත්ථ දින්නං මහප්ඵලං,

විචෙය්‍ය දානං සුගතප්පසත්ථං
යෙ දක්ඛිණෙය්‍යා ඉධ ජීවලොකෙ,
එතෙසු දින්නානි මහප්ඵලානි
බීජානි වුත්තානි යථා සුඛෙත්තෙ"

යනු වදාරා මත්තෙහි මේ ධර්මදෙශනාව කළ සේක.

**තිණදොසානි ඛෙත්තානි රාගදොසා අයං පජා,**
**තස්මා හි වීතරාගෙසු දින්නං හොති මහප්ඵලං.**

**තිණදොසානි ඛෙත්තානි දොසදොසා අයං පජා,**
**තස්මා හි වීතදොසෙසු දින්නං හොති මහප්ඵලං.**

**තිණදොසානි ඛෙත්තානි මොහදොසා අයං පජා,**
**තස්මා හි වීතමොහෙසු දින්නං හොති මහප්ඵලං.**

**තිණදොසානි ඛෙත්තානි ඉච්ඡාදොසා අයං පජා,**
**තස්මා හි විගතිච්ඡෙසු දින්නං හොති මහප්ඵලන්ති.**

ක්ෂෙත්‍රයෝ (කුඹුරු) තෘණදෙෂ ඇත්තාහු ය. (එසේ ම) මේ සත්ව ප්‍රජාව රාගදෙෂ ඇත්තී ය. එහෙයින් පහ වූ රාග ඇතියවුන් කෙරෙහි දුන් දන ම මහත්පල ඇත්තේ වේ.

ක්‍ෂෙත්‍රයෝ තෘණදොෂ ඇත්තාහු ය. (එසේ ම) මේ සත්ත්වප්‍රජාව ද්වෙෂදොෂ ඇත්තී ය. එහෙයින් පහ වූ ද්වෙෂදොෂ ඇතියවුන් කෙරෙහි දුන් දන ම මහත් පල ඇත්තේ වේ.

ක්‍ෂෙත්‍රයෝ තෘණදොෂ ඇත්තාහු ය. (එසේ ම) මේ සත්ත්වප්‍රජාව මොහදොෂ ඇත්තී ය. එහෙයින් පහ වූ මොහදොෂ ඇතියවුන් කෙරෙහි දුන් දන ම මහත්පල ඇත්තේ වේ.

ක්‍ෂෙත්‍රයෝ තෘණදොෂ ඇත්තාහු ය. (එසේ ම) මේ සත්ත්වප්‍රජාව ඉච්ඡාදොෂ ඇත්තී ය. එහෙයින් පහ වූ ඉච්ඡාදොෂ ඇතියවුන් කෙරෙහි දුන් දන ම මහත් පල ඇත්තේ වේ.

**තිණදොසානි ඛෙත්තානි** = කුඹුරු තණදොස් ඇත්තා හ.

**‘තිණ’** නම්: ගව මහිෂාදීන් විසින් කනු ලබන තණකොළ වල් පැලෑටි ආදිය යි. **“තිණ්යතෙ තිණනභෙණතියි ගොණාදිහි ආදීයතෙ හඤ්ඤතීයතෙති = තිණං”** යන විවෘතාති විසින් ඒ දත්තා ලද්දේ ය. තණ වල් පැලෑටි නැගීමෙන් ප්‍රකෘතියෙන් සරු කෙත් ද නිසරු වන්නේ ය. එබැවින් තෘණ, **තෘණදොෂ** යි ගණිත්. කරමැටි බොරළු ගල් කැට ආදිය නිසාත් කෙත් දූෂිත වන බැවින් නිසරු වන බැවින් ඒ කරමැටි ආදියත් තෘණ දෙෂයෙහි ඇතුළත් ය.

**‘ඛෙත්ත’** නම්: හැල් – වී – හමු – තිරිඟු – වරා – යව – තණ – උඳු – මුං ආ වපුරණ ගොඩගොයම් මඩගොයම් කරණ තැන් ය. **“බීජානි ඛිපීයන්ති ඛිපන්තාසමිනති වා ඛෙත්තං”** යන විද්‍යාමෙන් එය පැහැදිලි ය.

**රාගදොසා අයම්පජා** = මේ සත්ත්වප්‍රජාව රාගදොස ඇත්තී ය.

කුඹුරු, තණ වල් පැලෑටි කරමැටි ආදිය නැගීමෙන් දූෂිත වන්නා සේ නිසරු වන්නා සේ මේ ලොකයෙහි ඇති තාක් සත්ත්වයෝ රාගයෙන් දූෂිතයහ. රාගයෙන් රත් ව ගියහ. මනවඩන සිත්කලු රූපශබ්දාදිය අරමුණු කොට රූපශබ්දාදියෙහි එල්බ ගැණීමෙන් සිතෙහි උපදනා ඇල්ම බැඳීම **‘රාග’** නම්[1] පෘථග්ජන සන්තානයෙහි ඉතා පහසුවෙන් උපදනා මේ ඇල්ම සසරදුකින් ගැලවී යන තුරු ම් අග්‍රීත්මාග්‍රීඥනය ලබනා තෙක් ම සත්ත්වයා දූෂිත කරන්නේ ය. සත්ත්වයා නො මග යවන්නේ ය. අයුත්තෙහි යොදන්නේ ය.

**තස්මා හි වීතරාගෙසු දින්නං හොති මහප්ඵලං** = එහෙයින් පහ වූ රාග ඇතියවුන් කෙරෙහි දුන් දන ම මහත් පල ඇත්තේ වේ.

අග්‍රීත්මාග්‍රීඥනයෙන් රාගය නසා සිටි රහතුන් වහන්සේලාට දෙන ලද දනය ම ප්‍රතිසන්ධි – ප්‍රවෘත්තිවිපාක දනයෙන් මහත් පල

1. 15, 4. ‘නත්ථි රාගසමො අග්ගි’ යනු බලනු.

ඇත්තේ වේ. රාගයෙන් දූෂිත වූවනට රාගයෙන් රත් වූවනට දෙනලද දානය එබඳු මහත් පල මහත් අනුසස් ඇත්තේ නො වේ.

**තිණදොසානි ඛෙත්තානි** = කුඹුරු තණදෙස් ඇත්තාහ.

**දොසදොසා අයං පජා** = මේ සත්‍වප්‍රජාව ද්වේෂදෙෂ ඇත්තී ය.

කුඹුරු, තණදෙසින් ගැවසී ගත්තා සේ මේ ලොකයෙහි ඇති තාක් සත්‍වයෝ ද්වේෂයෙන් දුෂ්ටයහ. ද්වේෂයෙන් දූෂිතයහ.

සිත් නො ගත් සිත් නො ද පිණවන අරමුණු කරණ කොට සිත්හි උපදනා සැඩගතිය **'දොස'** නම්.[1] මෙ ද සසරදුක් නසාලන තුරු ම මුල් නො තබා සිතින් ගලවාලනතුරු ම සත්‍වයා දූෂිත කරන්නේ ය. සත්‍වයා මිනීමරුවකු කරන්නේ ය. සැඩ ගතිය සිත්හි නැඟී ආවිට මව මරන්නේ ය. පියා මරන්නේ ය. රහතුන් මරන්නේ ය. අන්හු මරණු කියනු ම කිම;

**තස්මා හි වීතදොසෙසු දින්නං හොති මහප්ඵලං**=එහෙයින් පහ වූ ද්වේෂ ඇතියවුන් කෙරෙහි දුන් දන ම මහත් පල ඇත්තේ වේ.

අඬීතාමාගීඥනයෙන් ද්වේෂය නසා සිටි රහතුන් වහන්සේලාට දෙනලද දානය ම ප්‍රතිසන්ධි - ප්‍රවෘත්තිවිපාක දානයෙන් මහත් පල ඇත්තේ වේ. ද්වේෂයෙන් දුෂ්ට වූවනට ද්වේෂයෙන් චණ්ඩ වූවනට දෙනලද දානය එබඳු මහත් පල මහත් අනුසස් ඇත්තේ නො වේ.

**තිණදොසානි ඛෙත්තානි** = කුඹුරු තණදෙස් ඇත්තාහ.

**මොහදොසා අයං පජා** = මේ සත්‍වප්‍රජාව මොහදෙස ඇත්තී ය.

කුඹුරු, තණදෙසින් ගැවසී ගත්තා සේ මේ ලොකයෙහි ඇති තාක් සත්‍වයෝ මොහයෙන් දූෂිතයහ. මොහයෙන් මුළා වූහ. මොහයෙන් අන්ධයහ.

අරමුණු තතු නො දැනීම අරමුණුවල සත්‍වයන් මුළා කරණ කුසල් - අකුසල් - හොඳ - නො හොඳ - යුතු - අයුතු - ගුණ - අගුණ නො වැටහෙන ගතිය **'මොහ'** නම්.[2] මෙ ද සසර දුක් ගෙවාලන තුරු ම, මුල් නො තබා සිතින් උදුරා දමන තුරු ම සත්‍වයා දූෂිත කරන්නේ ය. සත්‍වයා ජඩ කරන්නේ ය. ගොත් කරන්නේ ය.

**තස්මා හි වීතමොහෙසු දින්නං හොති මහප්ඵලං** = එහෙයින් පහ වූ මොහ ඇතියවුන් කෙරෙහි දුන් දන ම මහත් පල ඇත්තේ වේ.

---

1. 1, 7. 'අභික්කන්තසාමො' යනු බලනු.
2. 14. 6. 'දුක්ඛසමුප්පාදං' ,, ,,

අගීනමාගීඥනයෙන් මොහය නසා සිටි රහතුන් වහන්සේලාට දෙන ලද දනය ම ප්‍රතිසන්ධි - ප්‍රවෘත්තිවිපාකදනයෙන් මහත් පල ඇත්තේ වේ. මොහයෙන් මූඪ වූවනට මොහයෙන් ජඩ වූවනට දෙන ලද දනය එබඳු මහත් පල මහත් අනුසස් ඇත්තේ නො වේ.

**තිණදෙසානි ඛෙත්තානි** = කුඹුරු තණදෙස් ඇත්තාහ.

**ඉච්ඡාදෙසා අයං පජා** = මේ සත්‍වප්‍රජාව ඉච්ඡා දෙස ඇත්තී ය.

**ඉච්ඡා,** යනු තෘෂ්ණාවට නමෙකි. තෘෂ්ණාව, කුදු මහත් කිසිවක් නො හැර හැම දයක් සොයන බැවින් හැම දයක් පතන බැවින් ඉච්ඡා නම් වේ. මෙ ද සසරදුක් නසාලන තුරු ම මූල් නො කඩා සිඳ හරිණ තුරු ම සත්‍වයා දූෂිත කරන්නේ ය. සත්‍වයා කුදු මහත් හැම දයෙහි ප්‍රෙතයකු කරන්නේ ය. කෑතකම් කරන්නකු කරන්නේ ය.[1]

**තස්මා හි විගතිච්ඡෙසු දින්නං හොති මහප්ඵලං** = එහෙයින් පහ වූ ඉච්ඡාදෙස ඇතියවුන් කෙරෙහි දුන් දන ම මහත් පල ඇත්තේ වේ.

අගීනමාගීඥනයෙන් ඉච්ඡාව නසා සිටි රහතුන් වහන්සේලාට දෙනලද දනය ම ප්‍රතිසන්ධි - ප්‍රවෘත්තිවිපාක දනයෙන් මහත්පල ඇත්තේ වේ. ඉච්ඡායෙන් බඩජහරි වූවනට ඉච්ඡායෙන් කෙල වගුරන්නවුනට දෙන ලද දනය එබඳු මහත් පල මහත් අනුසස් ඇත්තේ නො වේ.

අගීනමාගීඥනයෙන් සිදුවන කෙලෙස් නැසීම එකවට ම වනු මුත් රාගය නැසී ගියපසු ද්වෙෂයත් ද්වෙෂය නැසී ගියපසු මොහයත් නැසී යනු නො වන්නේය.

අගීනමාගීඥනය තමා රාගද්වෙෂමොහාදී වූ සත්‍වයන්ගේ සිත් තුළ කෙලවරක් නො කියැකි කාලයක පටන් තදබද ව සිටුනා සියලු ම කෙලෙස් එකවට සිඳලන්නේය. ශ්‍රාවකයන්ගේ අවබෝධය පහසු කරණු පිණිස බුදුරජානන් වහන්සේ රාග දෙස මොහ ඉච්ඡා යන මේ කෙලෙස් සතර වෙන් වෙන් කොට දක්වා වදාළ සේක. අගීනමාගීඥනයෙන් රාගය මුළුමනින් නැසී ගිය පසු දෙෂමොහයන්ගේ ඉතිරිවීමෙක් නො වන්නේ ය. හෙන පහරින් මුළුගස ඇද වැටෙන්නා සේ අගීනමාගීඥනයෙන් සියලු කෙලෙස් නැසී යන්නේ ය. එහෙයින් රාග දෙෂ මොහ ඉච්ඡා යන කෙලෙස්

---

1. 14, 6. 'දුක්ඛසමුප්පාදං' යනු බලනු

නසා සිටි මහරහතුන් වහන්සේට ම දෙනලද දානය ප්‍රතිසන්ධි ප්‍රවෘත්තිවිපාක වශයෙන් ප්‍රධාන විසින් මහත් පල වේය, යි දත යුතු ය.

මේ මෙසේ වත් ම චතුර්විධ මාර්ගඥනය පිණිස පිළිවෙත් පුරන අන්සච්චකුහට ද මහරහතුන් වහන්සේගේ ගුණයෙහි බැඳී සිට දෙනු ලබන දානය ද මහත් පල වනු පිණිස බුදුරජාණන් වහන්සේ විසින් ශාසනක්ෂේත්‍රය සකස් කොට වදාළෝ ය.

මේ ගාථා සතරෙහි යෙදී සිටි 'හි' යනු නිපාත ය. එය රාග–ද්වේෂ–මෝහ–තෘෂ්ණාක්ලේශ ධර්ම නසා සිටි මහරහතුන් වහන්සේට දෙනලද දානය ම මහත් පල මහත් අනුසස් ඇත්තේය යනු එකාන්ත විසින් තීරණය කරන්නේ ය. නිශ්චිත කරන්නේ ය. එහි වෙනසක් නො වන බව කියා ලන්නේ ය.

**අඞ්කුරවස්තුව නිමි.**

සකලජනධර්මාර්ථසඞ්ග්‍රහාභිලාෂී **පණ්ඩිත** අම්බලම්ගොඩ **ධම්මකුසල** ස්ථවිරයන් කළ **සද්ධර්මසාගර** නම් වූ **ධර්මසද්වර්ණනා**යෙහි තෘෂ්ණාවර්ගාත්මක චතුර්විංශතිතම තරඞ්ගය නිමියේ ය.

# භික්ෂුවර්ගය

# ඇස් කන් නාස් ඇ දෙරටු රැකි භික්ෂූන් වහන්සේ

## 25 — 1

**සැවැත්** නුවර වැසි පස් නමක් භික්ෂූන් වහන්සේලා, එක් නමක් චක්ෂුර්ද්වාර ය, එක් නමක් ශ්‍රොත්‍රද්වාර ය, එක් නමක් ඝ්‍රාණ ද්වාර ය, එක් නමක් ජිව්හාද්වාර ය, එක් නමක් කායද්වාර ය'යි ඒ ඒ ද්වාරයන් වෙන් වෙන් ව රැකිහ. දවසක් මේ පස් දෙනා වහන්සේ එක් තැන් ව "මම ඉතා දුකසේ රැකිය යුතු වූ දෙර රකිමි, මම රකින්නෙමි ඉතා අපහසුවෙන් රැකිය යුතු දෙරැ"යි උනුන් වාදයට වැටී බුදුරජුන් වෙතින් මෙය දැන ගණිමු"යි බුදුරජුන් වෙත ගියහ. ගොස් වැඳ එකත් පසෙක්හි සිට "ස්වාමීනි! අපි එකෙකා එකෙක දෙරටු රකින්නමෝ තම තමන් රක්නා දෙරටුව ම දුක සේ රැකිය යුතු ය'යි අදහස් කොට සිටින්නෙමු, ස්වාමීනි! අප අතුරෙහි කවරෙක් ඉතා අපහසුවෙන් රැකිය යුතු වූ දෙරටු ව රක්නේ දැ?"යි ඇසූහ. එකල්හි බුදුරජානන් වහන්සේ උන්ගෙන් එක් නමකුත් බැහැර නො කොට "මහණෙනි! මේ සියලු දෙරටු ඉතා පරීක්ෂායෙන් දුකසේ ම රැකිය යුතු ය, තව ද තමුසේලා දැන් පමණක් ම මේ පස් දෙරෙහි සංවර නැති ව විසූවෝ නො වහු, පෙරත් මෙහි සංවර නැත්තෝ වූ වහු ය, එසේ අසංවෘත වූ බැවින් ම නුවණැත්තන්ගේ අවවාදයෙහි නො පිහිටා ක්‍රියා කොට විනාශයට පැමිණියහු"යි වදාළ සේක. "ස්වාමීනි! ඒ කවදා දැ?"යි ඒ භික්ෂූන් ඇසූ කල්හි උන්වහන්සේ "මහණෙනි! යටගිය දවස තමුසේලා පස් දෙන රජ කුලයෙහි ඉපද සිටියෝ ආයුධ ගත් අත් ඇති ව මහසතුන් පිරිවරා ගෙණ තක්සලා නුවර වටලා ගන්නට මග බැස ගියහු, අතර මගදී තමුසේලා රකුසියන් විසින් උන් උන් පොලොඹවා ගන්නට පෑ රූපයෙහි ද උන් කියූ ගීතිකායෙහි ද උන්ගේ ශරීරගන්ධයෙහි ද උන් එළවා ලූ දිව‍බොජුන් රසයෙහි ද උන්ගේ ඇඟ පසඟ පහසෙහි ද ඇලී ගත්තහු ඇස් කන් නාස් ඈහි සංවර නැත්තහු මහ සතුන්ගේ අවවාදයෙහි නො පිහිටා මහසතුන් හැර පසු බැස්සහු රකුසියන් විසින් අල්ලා කන ලද්දහු ජීවිතක්ෂයට පැමිණියහු ය, ඒ රූපාදී වූ අරමුණුවල නො ඇලුනා වූ ඒ හැම තැන්හි සංවෘත වූ මම මා පසු පස එළවා ආ දෙව්වෙස් ගත් ඒ යකින්න කියූ බස් නො පිළිගෙණ සුව සේ තක්සලාවට ගොස් එහි රජකම් කෙළෙමි" යි ජාතකය ගළපා "මහණෙනි! මහණහු විසින් නම් සියලු දෙරටු රැකිය යුතු ම ය, මේ දෙරටු රකින්නේ ම සියලු දුකින් මිදේ ය"යි වදාරා මේ ධර්මදේශනාව කළ සේක.

**චක්ඛුනා සංවරො සාධු සාධු සොතෙන සංවරො,**
**ඝානෙන සංවරො සාධු සාධු ජිව්හාය සංවරො.**

**කායෙන සංවරො සාධු සාධු වාචාය සංවරො,**
**මනසා සංවරො සාධු සාධු සබ්බත්ථ සංවරො,**
**සබ්බත්ථ සංවුතො භික්ඛු සබ්බදුක්ඛා පමුච්චතීති.**

ඇසින් සංවරය යහපති. කණින් සංවරය යහපති. නැහැයෙන් සංවරය යහපති. දිවෙන් සංවරය යහපති.

කයින් සංවරය යහපති. වචසින් සංවරය යහපති. මනසින් සංවරය යහපති. හැම තැන සංවරය යහපති. හැම තැන සංවෘත වූ මහණ සියලු දුකින් මිදෙයි.

**චක්ඛුනා සංවරො සාධු** = ඇසින් සංවරය යහපත් වේ.

ඇසට ගොදුරු වූ ඇසට පෙණෙන ඉෂ්ටරූපයෙහි නො ඇලෙන කල්හි අනිෂ්ටරූපයෙහි ද්වේෂිත නො වන කල්හි විසම බැලීමෙන් මොහය නො ද උපදවන කල්හි ඇස්දෙර සංවරය වන්නේ ය. ඇස්දෙර රැකුනේ නම් භික්මුනේ නම් වන්නේ ය.

**සාධු සොතෙන සංවරො** = කණින් සංවරය යහපත් වේ.

කණට ගොදුරු වූ කණේ වැටුනු ඉෂ්ටශබ්දයෙහි නො ඇලෙන කල්හි අනිෂ්ටශබ්දයෙහි ද්වේෂිත නො වන කල්හි විසම බැලීමෙන් මොහය නො ද උපදවන කල්හි කන්දෙර සංවරය වන්නේ ය. කන් දෙර රැකුනේ නම් භික්මුනේ නම් වන්නේ ය.

**ඝානෙන සංවරො සාධු** = නැහැයෙන් සංවරය යහපත් වේ.

නාසයට ගොදුරු වූ නාසයෙහි ගැටුනු ඉෂ්ටගන්ධයෙහි නො ඇලෙන කල්හි අනිෂ්ටගන්ධයෙහි ද්වේෂිත නො වන කල්හි විසම බැලීමෙන් මොහය නො ද උපදවන කල්හි නාස්දෙර සංවරය වන්නේ ය. නාස්දෙර රැකුනේ නම් භික්මුනේ නම් වන්නේ ය.

**සාධු ජිව්හාය සංවරො** = දිවෙන් සංවරය යහපත් වේ.

දිවට ගොදුරු වූ දිවෙහි වැදුනු ඉෂ්ටරසයෙහි නො ඇලෙන කල්හි අනිෂ්ටරසයෙහි ද්වේෂිත නො වන කල්හි විසම බැලීමෙන් මොහය නො ද උපදවන කල්හි දිව්දෙර සංවරය වන්නේ ය. දිව්දෙර රැකුණේ නම් භික්මුනේ නම් වන්නේ ය.

සංවරය හෝ අසංවරය ඉපැදෙනුයේ චක්ෂුර්ද්වාරාදීන්හිමය. ඔබ්බෙහි මෙය ජවනවීථියෙහි ලැබෙන්නේ ය. එහි අකුසල

වීථියෙහි අසද්ධා-අක්ඛන්ති-කොසජ්ජ-මුට්ඨස්සච්ච-අඤ්ඤාණ යන මුත් ලැබීමෙන් අසංවරය වන්නේ ය. කුසලවීථියෙහි සද්ධා-ඛන්ති-විරිය-සති-ඤාණ යන පස ලැබීමෙන් සංවරය වන්නේ ය.

මෙසේ චක්ඛු-සොත-ඝාන-ජිව්හා යන දොරටු සතරට මන වඩන්නා වූ ද මන නො වඩන්නා වූ ද රූප-සද්ද-ගන්ධ-රස යන අරමුණු සතර හමු වූ කල්හි සිහි එළවා නුවණින් මෙනෙහි කොට ඒ රූපාදිය අරමුණු කොට උපදනා ජවනවීථියෙහි ලොභ-දොස-මොහයන් නො ද උපදවා කෙලෙසුන් කෙරෙන් සිත රැක ගැණීම සංවරය යි දතයුතු ය.

**කායෙන සංවරො සාධු** = කයින් සංවරය යහපත් වේ.

ප්‍රසාදකාය යි ගැණෙන කායද්වාරයට මන වඩන්නා වූ හෝ මන නො වඩන්නා වූ පහසක් හමු වූ කල්හි අයොනිසොමනසිකාර හෙතුයෙන් ජවනක්‍ෂණයෙහි උපදනා ලොභ ද්වෙෂ මොහාදී වූ නන්වැදෑරුම් වූ කෙලෙසුන්ගේ වශයට නො යාදීමෙන් ද කාය විඥප්ති යි කියූ කායද්වාරයෙන් ජවනක්‍ෂණයෙහි සිද්ධ වන පාණාතිපාත - අදින්නාදාන - කාමමිච්ඡාචාර යන ත්‍රිවිධකාය-දුශ්චරිතයෙන් දුරුවීමෙන් ද කායද්වාරයෙහි සංවරය වන්නේ ය. කායද්වාර ය රැකුනේ නම් නික්මුනේ නම් වන්නේ ය.

**වාචාය සංවරො සාධු** = වචසින් සංවරය යහපත් වේ.

වාග්විඥප්ති යි කියූ වාග්ද්වාරයෙන් සිද්ධ වන මුසාවාද - පිසුණ වචන - ඵරුසවචන - සම්ඵප්පලාප යන චතුර්විධ වාග්දුශ්චරිත-යෙන් වැළකීමෙන් වාග්ද්වාරයෙහි සංවරය වන්නේ ය. වාග්ද්වාර ය රැකුනේ නම් භික්මුනේ නම් වන්නේ ය.

**සබ්බත්ථ සංවරො සාධු** = හැම තැන සංවරය යහපත් වේ.

චක්ඛු - සොත - ඝාන - ජිව්හා - කාය - මන යන මොවුනට ගොදුරු වන රූපාදී අරමුණුවල ලොභ-දොස-මොහාදී වූ කෙලෙ-සුන්ට ඉපදීමට ඉඩ නො තබා සිහි නුවණින් යෙදී මෙ හැම තැන් හා වචනයෙන් සිදු වන පව්කම් වලින් වැළකී වාග්ද්වාර ය රැක ගැන්ම සියලු තැන්හි සංවරය වන්නේ ය. සියලු තැන් රැකුනේ නම් භික්මුනේ නම් වන්නේ ය.

සංවර අටෙකි. චක්ඛුසංවර - සොතසංවර - ඝානසංවර - ජිව්හාසංවර - පසාදකායසංවර - චොපනකායසංවර - වාචා සංවර - මනොසංවර යි. මේ හැම සංවරය **'සබ්බත්ථ'** යන මෙහි ඇතුළත් ව සිටියේ ය. මෙහි විස්තර විභාගය, අත්ථසාලිනී ධම්ම සඞ්ගණී අටුවායෙහි එන්නේ ය. බැලිය යුතු ය.

**සබ්බත්ථ සංවුතො භික්ඛු සබ්බදුක්ඛා පමුච්චති** = හැම තැන රැක ගත් මහණ සියලු දුකින් මිදෙයි.

මෙහි ඉතා සැකෙවින් කියූ සදොර හා වාග්ද්වාර ය රැක ගත් මහණ තෙමේ සසර දුකින් මිදී ගත්තේ ය. එසේ නො වූයේ සසර දුකින් නො ද මිදෙන්නේ ය.

**භික්ඛු,** යනු සසුන් පැවිද්ද ලැබූ තැන් පටන් රහත් පලය ලබා සකන්ධපරිනිර්වාණය තෙක් ඒ ඒ අරුත් විසින් මහණහු කෙරෙහි නැගී සිටියේ ය. ඒ අරුත් සමහරෙක් මෙසේ ය.

**"සමඤ්ඤාය = භික්ඛු"** ප්‍රඥප්තියෙන් ව්‍යවහාර විසින් භික්ඛු නම්. බතින් පැවරීම් ආදියෙහි භික්ෂූන් ගණින කල්හි හෙරණුන් ද ගණනට ගෙණ භික්ෂූන් සියයෙක, භික්ෂූන් දහසෙකැයි කියත්-තේ ය. මෙහි හෙරණ තෙමේ ව්‍යවහාරමාත්‍ර විසින් භික්ඛු යි නැගී සිටියේ ය.

**"පටිඤ්ඤාය = භික්ඛු"** 'මෙහි කවරෙකැ'යි විචාළ කල්හි 'මම භික්ෂුයෙමි' පිළිතුරු කරණුයේ ප්‍රතිඥා මාත්‍ර විසින් භික්ඛු නම්. මේ ප්‍රතිඥාව අනඳ මහතෙරුන් විසින් කළ බැවින් ධාර්මික ය. භික්ෂුත්වය ඇති බැවිනි. දුසිල් මහණුන් විසින් 'අපි භික්ෂු වම්හ'යි කරණ ප්‍රතිඥාව අධාර්මික ය. දුසිල්හට භික්ෂුත්වය නැති බැවිනි.

**"භික්ඛතීති = භික්ඛු"** පිඬු සිඟන සැහැවි ඇතියේ භික්ඛු නම්.

**"භික්ඛාචරියං අජ්ඣුපගතොති = භික්ඛු"** මද වූ හෝ බොහෝ වූ හෝ ධන ධාන්‍යරාශිය හැර දමා ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදි ව සීසෑම් ගෙරිරැකීම් ආදියෙන් කෙරෙණ දිවි පැවැතුම් හැරදමා මහණ වෙස් දැරීමෙන් පිඬු සිඟා යනුයේ, පරා අයත් දිවි පැවැතුම් ඇති බැවින් වෙහෙර මැදට කරින් ගෙණවුත් දුන් බත වළඳනුයේ කෙණ්ඩාබලයෙන් පිඬු පිණිස හැසිර ලත් බොජුන නිසා පැවිද්දෙහි හට ගත් උත්සාහ ඇතියේ භික්ෂාචරණාර්ථ විසින් භික්ඛු යි නැගී සිටියේ ය.

**"භින්නපටධරොති = භික්ඛු"** අගය – පහස – පැහැය වෙනස් වීමෙන් බුන් පිළී දරණුයේ භික්ඛු නම්. රත්මසු දහසක් වටිනාකම් ඇති වස්ත්‍රයෙක් සැතකින් කඩ කඩ කොට සිඳින ලද්දේ පලමු පැවැති වටිනා කමින් අඩකුත් නො වටිනා බවට යන්නේ ය. සුවපහස් ඇත්තා වූ ද වස්ත්‍රය නූල්වලින් ගෙත්තම් කරණ ලද්දේ නැසී ගිය පහස් ඇත්තේ රළු පහස් ඇති බවට පැමිණෙන්නේ ය.

ගෙත්තම් කිරීමෙහි දී අත් මල ඩහ මල රජස් ආදියෙන් ද අව- සානයෙහි රඳන් ගැන්වීමෙන් හා කප් බිඳු තැබීමෙන් ද වෙනස් වූ පැහැය ඇත්තේ පියවි පැහැය හැර සිටියේ වේ. මෙසේ ගිහින්ගේ ඇඳුම් කැඩුම්වලට වෙනස් වූ කසාවණින් රැඳු සිවුරු දරණුයේ **භික්ඛු** යි නැගී සිටියේ ය.

**"භින්දති පාපකෙ අකුසලෙ ධම්මෙති = භික්ඛු"** සෝවන් මගින් සක්කාය දිට්ඨි-විචිකිච්ඡා-සීලබ්බතපරාමාස- ලොභ-දොස යන පස් වැදෑරුම් පාපධර්ම නසනුයේ, සෙදගැමි මගින් ලොභ-දොස-අහිරික -අනොත්තප්ප යන සිවුවැදෑරුම් පාපධර්ම නසනුයේ, අනගැමි මගින් ලොභ-දොස-අහිරික-අනොත්තප්ප යන පාපධර්ම නසනුයේ, රහත්මගින් රූපරාග - අරූපරාග - මොහ - මාන - ථීන - උද්ධච්ච - අහිරික - අනොත්තප්ප යන පාපධර්ම නසනුයේ **භික්ඛු** යි නැගී සිටියේ ය. මෙයින් චතුර්විධ මාර්ගස්ථ පුද්ගලයෝ ගැණෙත්.

**"භින්නත්තා පාපකානං අකුසලානං ධම්මානං = භික්ඛු"** ස්‍රොතා පන්නපුද්ගල, සෝවන්මගින් යට දැක් වූ පාපධර්ම පසක් නසා සිටියේ ය. සකෘදාගාමිපුද්ගල, සෙදගැමි මගින් පාපධර්ම සතරක් නසා සිටියේ ය. අනාගාමීපුද්ගල, අනගැමි මගින් පාපධර්ම සතරක් නසා සිටියේ ය. අර්හත්පුද්ගල, රහත් මගින් පාපධර්ම අටක් නසා සිටියේ ය. එහෙයින් මේ චතුර්විධ ඵලස්ථ පුද්ගල තෙමේ ලාමක වූ අකුශල ධර්ම නසා සිටියේ **භික්ඛු** යි නැගී සිටියේ ය.

**"ඔධිසො කිලෙසානං පහාණා = භික්ඛු"** මාර්ගසීමා-ක්ලෙශසීමා යි සීමා දෙකෙකි. සීමා, ඔධි නම්. සොතාපන්නපුද්ගලයා විසින් චතුර්විධ ආර්‍ය්‍යමාර්ගයන් අතුරෙහි එක් ම මාර්ගසීමාවක් කරණ කොට කෙලෙස් නසන ලද්දේ ය. මාර්ග සතරින් ම නො නසන ලද ය. සකෘදාගාමී අනාගාමී පුද්ගලයන් කෙරෙහි ද මෙසේ දත යුතු ය. සොතාපන්නපුද්ගලයා, ප්‍රහීණ කළ යුතු කෙලෙස් අතු- රෙහි කෙලෙසුන් සීමා කොට ගෙණ ම කෙලෙස් නැසී ය. මෙසේ මාර්ගසීමා - ක්ලෙශසීමා දෙකින් කෙලෙසුන් නසා සිටියේ **භික්ඛු** යි නැගී සිටියේ ය.

**"අනොධිසො කිලෙසානං පහාණා = භික්ඛු"** රහතුන් වහන්සේ මාර්ගසතරින් ම **පිරිසිඳීමක්** නැතිව ම කෙලෙස් නසා සිටියහ. එක් ම මාර්ගසීමාවකින් නො ද නැසූහ. නැසිය යුතු කෙලෙසුන් පිළිබඳව ද පිරිසිඳීමක් නො කොට ම කෙලෙස් නැසූහ. මෙසේ මාර්ගසීමා - ක්ලෙශසීමා රහිත ව පිරිසිඳීමක් නැති ව කෙලෙසුන් නසා සිටි බැවින් රහත් තෙමේ **භික්ඛු** යි නැගී සිටියේ ය.

**"සෙක්ඛො = භික්ඛු"** කල්‍යාණ පෘථග්ජනයා සමග සප්තවිධ ආර්‍ය්‍ය පුද්ගලයෝ ත්‍රිවිධශික්‍ෂාවන්හි හික්මෙනුවෝ **භික්ඛු** යි නැගී සිටියහ.

**"අසෙක්ඛො = භික්ඛු"** ශෛක්‍ෂ්‍යපුද්ගලයන්ගේ ධර්මයන් ඉක්මවා රහත්ඵලයෙහි සිටි, හෙතුඵලයෙන් මතුයෙහි හික්මිය යුතු දහමක් නැතියේ **භික්ඛු** යි නැගී සිටියේ ය.

**"නෙවසෙක්ඛනාසෙක්ඛො = භික්ඛු"** පුහුදුන් මහණ ත්‍රිවිධ ශික්‍ෂාවන්හි නො ම හික්මෙනුයේ, ත්‍රිවිධ ශික්‍ෂාවන් අවසන් කොට නො හික්මී සිටියේ **භික්ඛු** යි නැගී සිටියේ ය.

**"අග්ගො = භික්ඛු"** ශීලසමාධිප්‍රඥාවිමුක්තිසඞ්ඛ්‍යාත අග්‍රභාවයට පැමිණ සිටියේ **භික්ඛු** යි නැගී සිටියේ ය.

**"භද්‍රො = භික්ඛු"** කල්‍යාණපෘථග්ජනයා පටන් අර්හත්පුද්ගලයා තෙක්, උතුම් වූ ශීලසමාධිප්‍රඥාවිමුක්තිවිමුක්තිඥානදර්ශනයෙන් යුක්ත වන බැවින් හද්‍ර වූයේ **භික්ඛු** යි නැගී සිටියේ ය.

**"මණ්ඩො = භික්ඛු"** පහන් වූ ගිතෙලක් මෙන් නො කැලත් වූයේ වෙසෙසින් පහන් වූයේ **භික්ඛු** යි නැගී සිටියේ ය.

**"සාරො = භික්ඛු"** ශීලසාරාදිසාරයන්ගෙන් යුක්ත වූයේ නිල් ගුණය හා එක් වූ නිල් පැහැති වතක් මෙන් ශීලාදිහර ඇතියේ පහ වූ කෙලෙස් මල ඇතියේ **භික්ඛු** යි නැගී සිටියේ ය.

මෙහි කියූ මෙයරුත් අතුරෙහි **"භින්දති පාපකෙ අකුසලෙ ධම්මෙති = භික්ඛු, ඔධිසො කිලෙසානං පහාණාති = භික්ඛු, සෙක්ඛො = භික්ඛු"** මෙ තුන් අරුතින් සප්තවිධ ශෛක්‍ෂ්‍යයෝ භික්‍ෂු නම් වෙති යි ද, **"භින්නත්තා පාපකානං අකුසලානං ධම්මානන්ති = භික්ඛු, අනොධිසො කිලෙසානං පහාණාති – භික්ඛු, අසෙක්ඛො = භික්ඛු, අග්ගො = භික්ඛු, මණ්ඩො = භික්ඛු"** යන මේ පසරුතින් රහතුන් වහන්සේ භික්‍ෂු නම් වෙති යි ද කියන ලදහ. **"නෙවසෙක්ඛනාසෙක්ඛ"** යන මෙයරුතෙහි පෘථග්ජන තෙමේ ගැණෙන්නේ ය. අන් හැම තැනින් මතු වන්නෝ කල්‍යාණ පෘථග්ජන – සප්තශෛක්‍ෂ්‍ය – ක්‍ෂීණාශ්‍රව යන මෙ තුන් දෙන ය.

**"සමග්ගෙන සඞ්ඝෙන ඤත්තිචතුත්ථෙන කම්මෙන අකුප්පෙන ඨානාරහෙන උපසම්පන්නො=භික්ඛු"** උපසම්පදා කර්මයට සුදුසු වූ භික්‍ෂූන් පැමිණ සිටි කල්හි ඡන්දය ගැණීමට සුදුසු වූ භික්‍ෂූන්ගේ ඡන්දය ගෙණ ආ කල්හි හමු වූ භික්‍ෂූන් නො වළහා උපසම්පදා කර්මයෙහි සමග වූ කල්හි අනන්තිම පරිච්ඡෙදයෙන් උපසම්පන්න

භික්ෂූන් පස් නමකින් පමණ වන සඞ්ඝයා වහන්සේ විසින් වත්ථු - ඤත්ති - අනුසාවණ - සීමා - පරිසසම්පත්තීන් සම්පූර්ණ කොට ශාස්තෘශාසනයට අනුරූප වූ ඤත්තිචතුත්ථකර්මයෙන් උපසපත් කරණ ලද්දේ භික්ඛු නම් වේ. මෙයින් දැක්වූනේ උපසම්පදායෙන් භික්ෂුභාවයට පැමිණියේ ය. භික්ෂුභාවය නම්: උපරිභාවය ය. ඒ මේ උපරිභාවයට උපසම්පත්තිය මූල් වේ. උපසම්පත්තිය ලෞකික සම්පත්තීන් අතුරෙහි උසස් තැන සිටියා.

මෙහි ආ **උපසම්පන්න,** යන වචනයෙන් එහි භික්ඛූපසම්පදා - සරණගමනූපසම්පදා - ඔවාදපටිග්ගහණූපසම්පදා - පඤ්හබ්‍යාකරණූපසම්පදා - ගරුධම්මපටිග්ගහණූපසම්පදා - දූතෙනූපසම්පදා - අට්ඨවාචිකූපසම්පදා - ඤත්තිචතුත්ථකම්මූපසම්පදා යන අටවැදෑරුම් උපසම්පදාවෝ ගැණෙත්. විස්තර කියන ලද්දේ ය.

අභීත්ඵලසථභික්ෂූන් වහන්සේ හැර අනෙක් හැම දෙනා වහන්සේ චක්ඛු - සොත - ඝාන - ජිව්හා - කාය - මන යන සදෙර රැකියෝ ම සසර දුකින් මිදෙන්නෝ ය.

රූපාදී වූ අරමුණු ඇතුළට වැද ගන්නා ඇස් කන් නාස් ඈ ස දෙරින් එක් දෙරක් පමණක් රැක ගැණීම නිවන් පිණිස නො පවත්නේ ය. එක් දෙරක් රැක ගෙණ අන් දෙර නො රැකි කල්හි ඒ නො රැකි දෙරින් නන් වැදෑරුම් කෙලෙස් සිතට වැද ගන්නේ ය. එකල්හි රැක ගත් දෙර ද ඒ හෙතුයෙන් ම විවෘත වන්නේ ය. එහෙයින් සියලු කල්හි සියලු තැන්හි සිහි එළවා ම විසිය යුතු ය මේ ස දෙර රැකිය යුත්තේ සිහියෙනි. සිහියෙන් යුක්තවූයේ අප්‍රමත්ත යි කියනු ලැබේ. අප්‍රමාද සඞ්ඛ්‍යාත වූ සිහිය නිවනට කරුණු වන්නේ ය.

ධර්මදෙශනාවගේ අවසානයෙහි ඒ පස්දෙනා වහන්සේ සෝවාන් පලයෙහි පිහිටා ගත්හ. ධර්මදෙශනා තොමෝ පැමිණ සිටි පිරිසට ද වැඩ සහිත වූ ය.

**පඤ්චභික්ඛුවත්ථුව නිමි.**

# ගල්කැටක් දමාගසා හංසයකු මැරූ මහණ

## 25 — 2

**සැවැත්** නුවර වැසි යහළුවෝ දෙ දෙනෙක් භික්ෂූන් වෙත පැවිදි ව ලැබූ උපසපත්බැව් ඇතියෝ නිතර නිතර එක් ව ම හැසිරෙත්. ඔවුහු දවසක් **අචිරවතී** ගඟගාවට ගොස් නාලා අව්ව තපිමින් සතුටු සාමීචිකථායෙහි යෙදී සිටියහ. ඒ යහළු මහණුන් දෙ දෙනා අතුරෙහි තරුණ මහණ අහස පියාඹා යන හස්පැටවකු දැක ගල්කැටක් ගෙණ "අර පියාසර කරණ හස්පැටවාගේ ඇසට ගසමි"යි අනෙකාට කී ය. "එය තට කළ නො හැකි ය"යි ඒ මහණ කී කල්හි "මේ පැත්තෙහි ඇස තිබේවා, අනෙක් පැත්තෙහි ඇසැට ගසන්නෙමි"යි තුන්හුලස් ගල්කැටක් ගෙණ "බලා සිටින්නැ"යි කියා හංසයාගේ පසු පසට දමා ගැසී ය. ගල එන හඬ අසා හංසයා හැරී බලත් ම නැවැත වටකුරු ගල්කැටක් ගෙණ හංස-යාට එල්ල කොට දමා ගැසී ය. ඒ ගල්කැටය හැරී බැලූ ඇසට වැදී අනික් ඇස ද පසා කර ගෙණ එළියට ආයේ ය. හංසයා ද මරහඬ තළමින් ඔවුන්ගේ පාමුල ඇද වැටුනේ ය. එහි සිටි අනෙක් භික්ෂූන් වහන්සේලා එය දැක "ඇවැත්නි! බුදුසසුනෙහි පැවිදි ව ගෙණ ප්‍රාණඝාතය කරන්නා වූ තොප විසින් කරණ ලද්දේ නො හොබිනා සැහැසි කමෙකැ"යි ගරහා උන් අල්ලා ගෙණ ගොස් බුදුරජුන්ට දැක් වූහ. උන්වහන්සේ "ඇත්ත ද, මහණ! තා විසින් සතෙක් මරණ ලද්දෙහි?"යි අසා වදාළ කල්හි "ස්වාමීනි! එසේ ය"යි ඒ මහණ නො සඟවා කී ය. "මහණ! නිවන් පිණිස පවත්නා බුදුසසුනෙහි පැවිදි ව මෙසේ කෙළෙහි කුමක් නිසා ය? අබුද්ධොත්පාදයෙහි ද ගිහි ව වසන පැරණි පඬිවරු ඉතා කුඩා වූත් පව්කම්හි විළිබිය ඇති ව වරද නැත්ත, වරද ඇත්තක් සේ සිතා කුකුස් කළහ, තෝ මෙබඳු සසුනෙක පැවිදි ව ද කුකුස් පමණකුත් නො කෙළෙහි ය"යි වදාළ කල්හි එ තැන රැස් වූ භික්ෂූන් වහන්සේලා "ස්වාමීනි! එය අපට වදාරණු මැනැවැ"යි ඉල්ලා සිටියහ. බුදුරජාණන් වහන්සේ එ පුවත මෙසේ වදාළ සේක.

"යටගිය දවස කුරුරට ඉඳුපත් නුවර ධනඤ්ජය නම් රජෙක් රජය කෙළේ ය, බෝසත් තෙමේ ඔහුගේ මෙහෙසිය කුස පිළිසිඳ ගත්තේ මවු කුසින් බිහි ව නුවණැති බවට පැමිණ ශිල්ප උගන්නට තක්සලා නුවරට ගියේ ය, ගොස් ශිල්ප උගෙණ පෙරළා ආ කල්හි ඔහු පියරජු විසින් යුවරජ තනතුරෙහි තබන ලද්දේ ය, පසු දවස පියරජුගේ ඇවෑමෙන් මහරජබවට පැමිණි බෝසත් තෙමේ දස රජදම් නො වරදවා කුරුධර්මයෙහි පිහිටා දැහැමින් රජය කෙළේ ය, එහි කුරුධර්ම රැකීම නම්:- පන්සිල් රැකීම ය. බෝසත් රජ තෙමේ

කුරුධම් නම් වූ පඤ්චසීලය පිරිසිදු කොට එක් ම සිකපදයකුත් නො කඩ කොට රකින්නේ ය, බෝසත් පඤ්චසීලය නො කඩ කොට රකින්නා සේ බෝසත්හුගේ මවු, අගමෙහෙසි, යුවරද වූ මලනු, පෙරෙවිබමුණු, ඉඩම් ඇමැති, රියැදුරු, සිටු, ගොවිකම් ඇමැති, දොරටුපලු, නුවර හොබවන වණ්ණදාසී යන එකොළොස් දෙන කුරුධම්ය මැනැවින් රැකියහ, එකල්හි කලිඟුරට දන්තපුර-යෙහි කලිඟු රජ, රජය කෙළේ ය, ඒ කාලයෙහි ඔහුගේ රටෙහි වැසි බිත්දුවෙක් නො ද වැටුනේ ය, මහසත්හට අඤ්ජන වසභ නම් මහපිණැති මගුලැතෙක් වූයේ ය, එ දත් දන්තපුර වැස්සෝ ‘කුරුරට ඉඳුපත් නුවර රජුගේ මගුලැත් මහපිණැත්තේ ය, මේ කුළක් වැනි ය, ඌ මෙහි ගෙණ ආවොත් වැසි වස්නේ ය,’සි සිතා රජුට දන්වා සිටියහ, රජතෙමේ එබස් අදහා ඇතු ගෙණ ඊම පිණිස දන්ත පුරයට බමුණන් යැවී ය, ඔවුහු එහි ගොස්,

“දන සැදැ සිල් ගුණ – දන්නා ඔබගෙ, දුන්වත්,
මේ ඇතුට කහවණු අපි – පෙරළිකරමෝ කළිඟු!”

සි දන්වා ඇතු ඉල්ලා සිටියහ,

මෙසේ කියා ඇතු ගෙණ ආවාහු ද, වැසි නො වට, ඉඳුපත් නුවර රජ කුරුධම්ය රක්නේ ය, වැසි වස්නේ එහෙයිනැ’යි දැන කලිඟුරජ, එරජු රක්නා කුරුධම්ය රන් තහඩුවක ලියවා ගෙණ එවු’යි එවර බමුණන් හා ඇමැතියන් හා යැවී ය, ඔවුන් එහි ගොස් කුරුධම්ය රන්තහඩුවෙක ලියවා දෙනු මැනැවැ යි ඉල්ලා සිටි කල්හි රජු මුල් කොට සිටි ඒ එකොළොස් දෙන තමන්ගේ සීලයෙහි කුකුස් උපදවා අපගේ සීලය අපිරිසිදු වනු ඇතැ’යි සිතා ඔවුන්ගේ ඉල්ලීම පිළිකෙව් කළහ, කලිඟුරටින් ගිය බමුණන් හා ඇමැතියන් හා ‘මේ පමණෙකින් සීලභෙදයෙක් නො වේ ය’යි නැවැත නැවැතත් ඉල්ලා සිටි කල්හි තම තමන් රැකි සිල් රන්පට ලියවා ඔවුනට දුන්හ, කලිඟු රජ තෙමේ රන්තහඩුවෙහි ලියවා ගෙන්වා ගත් කුරුධම්ය දැක එය සමාදන් ව ගෙණ මැනැවින් රැක්කේ ය, එකල්හි වැසි වස්නට පටන් ගත, රට ද උවදුරු නැත්තේ වී ය, කෑම්බීම් ආදියෙන් රට පිරී ඉතිරී ගියේ ය”සි.

බුදුරජාණන් වහන්සේ යටගිය ඒ පුවත මෙසේ වදාරා, කෙළවර “එද ගණිකා = උපුල්වන් මෙහෙණී ය, දොරටුපල් = පුණ්ණ ය, ඉඩම් ඇමැති = කච්චායන ය, ගොවිකම් ඇමැති = මොග්ගල්ලාන ය, සිටු = ශාරිපුත්‍ර ය, රියැදුරු = අනුරුද්ධ ය, පෙරෙවි බමුණු = කාශ්‍යප ය, යුවරජ = ආනන්දපණ්ඩිත ය, මෙහෙසි = රාහුල මාතා ය, මවු = මහාමායා දෙවී ය, කුරුරජ = බෝසත් ය යි ජාතකය ගළපා

"මහණෙනි! පෙර නුවණැත්තෝ ඉතා මද වූ ද කුකුසක් උපන් කල්හි තමන්ගේ සීලභෙදය ගැණි සැක ඉපද වූහ, තෝ මා වැනි බුදුකෙනෙකුන්ගේ ශාසනයෙහි පැවිදි ව ගෙණ ද ප්‍රාණඝාතය කරන්නෙහි, ඉතා බැරෑරුම් වූ පාපකර්මයක් කෙළෙහි ය, මහණහු අත්වලින් පාවලින් වචනයෙන් හික්මුනකු වියයුතු ය, යි වදරා මේ ධර්මදෙශනාව කළ සේක.

> **හත්ථසඤ්ඤතො පාදසඤ්ඤතො**
> **වාචාය සඤ්ඤතො සඤ්ඤතුත්තමො,**
> **අජ්ඣත්තරතො සමාහිතො**
> **එකො සන්තුසිතො තමාහු භික්ඛුනති.**

(යමෙක්) අතින් සංයත ද, පයින් සංයත ද, වචනයෙන් සංයත ද, කයින් සංයත ද, කමටහන්හි ඇලුනේ ද, සමාධියෙහි පිහිටියේ ද, එකලාව හැසිරෙන්නේ ද, තුටුසිත් ඇතියේ ද, ඔහු භික්ෂු යි කියත්.

**හත්ථසඤ්ඤතො** = අතින් සංයත වූයේ. හික්මුනේ.

අත්නැටවීම් කෙලවීම් ආදියෙන් හා අතින් අන්හට පැහැරීම් ගැසීම් ආදියෙන් වැලකුනේ **'හත්ථසඤ්ඤත'** නම්. හස්තවිකාර නැතියේ ය. **"හත්ථකීලාපනාදීනං වා හත්ථෙන පරෙසං පහරණාදීනං වා අභාවෙන හත්ථසඤ්ඤතො"** යනු අර්ථකථා.

**පාදසඤ්ඤතො** = පයින් සංයත වූයේ. හික්මුනේ.

පානැටවීම් සැලීම් ආදියෙන් හා පයින් අන්හට පහරදීම් ආදියෙන් වැලකුනේ **'පාදසඤ්ඤත'** නම්. පාදවිකාර නැතියේ ය.

**වාචාය සඤ්ඤතො** = වචනයෙන් සංයත වූයේ. හික්මුනේ.

මුසාවාද – පිසුණවචන – ඵරුසවචන – සම්ඵප්පලාප යන චතුර්විධ වාග්දුශ්චරිතයෙන් වැළකුනේ **'වාචාය සඤ්ඤත'** නම්. මෙ තෙමේ බොරුබස්, පරා බිඳහෙළන බස්, පරා සිත් පහරණ බස්, අරුත් නොර බස් නො කියන්නේ ය. **"මුසාවාදාදීනං අකරණෙන වාචාය සඤ්ඤතො"** යනු අර්ථකථා.

**සඤ්ඤතුත්තමො** = කයින් සංයත වූයේ. හික්මුනේ.

කය සැලීම් හිස එසවීම් බැම බිඳීම් ආදී වූ කායවිකාර නැතියේ **'සඤ්ඤතුත්තම'** නම්. **"කායචලන සීසුක්ඛිපන භමුවිකාරාදීනං අකරණෙන"** යනු අර්ථකථා.

**අජ්ඣත්තරතො** = කමටහන් වැඩීමෙහි ඇලුනේ.

ගොචරජ්ඣත්ත නම් වූ සතිපට්ඨානාදිකර්මස්ථානභාවනායෙහි ඇලුණේ බැඳී සිටියේ **'අජ්ඣත්තරත'** නම්. **"ගොචරජ්ඣත්තසංඛාතාය කම්මට්ඨානභාවනාය රතො"** යනු අර්ථකථා.

**සමාහිතො** = සමාධියෙහි පිහිටියේ. සමාධියෙන් යුක්ත වූයේ **'සමාහිත'** නම්.[1]

**එකො** = එකලා වූයේ. තනි ව හැසිරෙණුයේ.

**සන්තුසිතො** = මොනවට සතුටු වූයේ.

සතර ඉරියව්වෙහි ම තනි ව හැසිරෙණුයේ, විදර්ශනාවට පටන් ගත් තැන් පටන් තමා අධිගමයෙන් හා නැත, චීවරාදිප්‍රත්‍යයෙහි යථාලාභසන්තොෂාදියෙන් සතුටු වනුයේ **'සන්තුසිත'** නම්.[2] **"එකවිහාරී හුත්වා සුට්ඨුතුසිතො විපස්සනාචාරතො පට්ඨාය අත්තනො අධිගමෙන තුට්ඨමානසො"** යනු අර්ථකථා.

හස්තසංයමයෙන් පාදසංයමයෙන් වාක්සංයමයෙන් කායසංයම යෙන් යුක්ත වූ කමටහන් වැඩීමෙහි ඇලුනු සිත් ඇති එකඟබව ඇති එකලා ව හැසිරෙණ විදසුන් වැඩීමෙහි පටන් සතුටු වූ මහණ, භික්ෂු යි බුද්ධාදී වූ ආර්‍යයෝ කියත්.

පෘථග්ජනකල්‍යාණයා පටන් සියලු ම ශෛක්ෂ්‍යයෝ තම තමන්ගේ අධිගමයෙන් සතුටු වන්නෝ ය. අශෛක්ෂ්‍ය වූ රහතුන් වහන්සේ සතුටු වූවාහු නම් වෙත්. **"පුථුජ්ජනකල්‍යාණකං හි ආදිං කත්වා සබ්බෙපි සෙඛා අත්තනො අධිගමෙන සන්තුස්සන්තීති සන්තුසිතා, අරහා පන එකන්තසන්තුසිතොව"** යනු අර්ථකථා.

ධර්මදෙශනාවගේ අවසානයෙහි බොහෝ දෙන සෝවන්පලාදි-යට පැමිණියාහු ය.

**හංසඝාතකභික්ෂුවස්තුව නිමි.**

---

1. 1. 8. 'සාරෙ' යනු බලනු.
2 5 2. 'තණ්හාලෙසභායතා' ,, ,,

# කොකාලික

## 25 — 3

**කොකාලික** පිළිබඳ කතා පුවත "අථඛො කොකාලිකො භික්ඛු යෙන භගවා තෙනුපසඞ්කමි" යනාදී විසින් අා සූත්‍රයෙහි හා තදට්ඨ කථායෙහි හා දක්ක හැකි ය. කොකාලික, පදුමනිරයයෙහි උපන් කල්හි ධම්සභායෙහි "අතෝ! කොකාලික මහණ, තමන්ගේ කට නිසා විනාශයට පැමිණියේ ය, ඔහු දෑගසව්වන් වහන්සේට ඇණුම් බැණුම් කරත් ම පොළොව පැළී ගොස් විවර ව ගියාය, ඔහු දැන් නිරයට වදිනු එකාන්ත ය"යි කතාවක් හට ගැණිනි. ඒ වේලෙහි බුදුරජාණන් වහන්සේ එහි වැඩම කොට "මහණෙනි! තමුසේලා දැන් මෙහි කතා කරමින් හුන්නාහු කුමක් ද?" යි අසා දැන "මහණෙනි! කොකාලික තමාගේ කට නිසා නිරය වැදුනේ මේ දැන් පමණක් නො වේ, පෙරත් කොකාලික මහණ තමාගේ කට නිසා නටුයේ ය"යි වදාළ විට භික්ෂූන් වහන්සේලා "ස්වාමීනි! එපුවත අසනු කැමැත්තම්හ, වදාළ මැනැවැ"යි අරාධනා කළහ. උන්වහන්සේ එය මෙසේ වදාළ සේක.

"යටගිය දවස හිමවත් පෙදෙස එක් විලෙක ඉදිබුවෙක් විසී ය, හස් පැටවු දෙදෙනෙක් ගොදුරු සොයා යන්නාහු ඒ ඉදිබුවා දැක උහු හා විශ්වාසයට පැමිණියාහු ය, දවසක් හස් පැටවු දෙදෙන ඉදිබුවාට කතා කොට "යහළු! අපේ මේ හිමවත සිත් කුළු පවු තෙලෙහි රන්ගුහායෙක සිත්කලු පෙදෙසෙක් ඇත්තේ ය, අප හා එහි යන්නට එව'යි කීහ, එකල්හි ඉදිබු 'මම ඔතරම් දුර බැහැර කෙසේ යන්නෙම් ද''යි ඇසී ය, "කට රැක ගෙණ යා හැකි නම් අපි තා ගෙණ යන්නෙමු"යි හස් පැටවුන් දෙ දෙනා කී කල්හි 'මම කට රැක ගන්නම්, මට එය කළ හැකි ය, ගෙණ යමු'යි කී ය, ඉක්බිති හස් පැටවු දෙදෙන යහපතැයි දඬුකඩක් ගෙණ ඉදිබුවාගේ කටට දී උහු දඬුකඩ මැදින් කටින් අල්ලා ගත් පසු තුමූ දෙකෙළවර කටින් ඩැහ ගෙණ අහසට නැග පියාඹා ගියහ, හස් පැටවුන් දෙදෙනා එසේ ගෙණ යන ඉදිබුවා දුටු ගම්දරු කොල්ලෝ 'හංසයෝ දෙදෙනෙක් ඉදිබුවකු දඬුකඩෙක එල්ලා ගෙණ යන්නාහ, බලවු'යි කෑකෝ ගසන්නට වූහ, එයැසූ ඉදිබු, යමක් කියන්නට සිතා කට හරිත් ම ඩැහැ ගත් දඬුකඩින් කට ගැලවී ගොස් බරණැස් නුවර රජගෙදෙර මිදුලෙහි ඇද වැටී සිසී කඩට බිඳී ගියේ ය, හංසයන්ගේ පියාඹා යන ගමන ඉක්මන් බැවින් බරණැස් නුවර රජගෙදෙර මිදුලට ලඟා වත් ම මෙය සිදු වූයේ ය''යි. යටගිය පුවත මෙසේ වදාරා,

ඉදිබු බස් බණතේ – තමා නැසුනේ එකතින්,
මුවෙන් ඒ ගත් දඬුකඩ – හැර බස් කියා නැසුනේ.
මෙ දැන නරවැරසෙට් – කුසල් බස් බණතේ හිත,
සුබැසි ද නො කල්හි සී – නුවණැති නො බැණ සිටුනේ,
බොහෝ කොට බිණුමෙන් ඒ – නැසුනු ඉදිබු දක්නෙහි"

යන මේ දුකනිපාතයෙහි බහුභාණී ජාතකය විස්තර කොට "මහණෙනි! මහණහු කට රැක ගත්තකු සම ව හැසිරන්නකු උඩඟු නො වූවකු නිවුනු සිත් ඇතියකු විය යුතු ය"යි වදාරා මේ ධර්මදේශනාව කළ සේක.

**යො මුඛසඤ්ඤතො භික්ඛු මන්තභාණී අනුද්ධතො,**
**අත්ථං ධම්මං ච දීපෙති මධුරං තස්ස භාසිතන්ති.**

මුඛයෙන් සංයත වූ නුවණින් දැන කියන සුලු වූ උඩඟු නො වූ යම් මහණෙක් අර්ථයත් ධර්මයත් දක්වා ද, ඔහුගේ වචනය මිහිරි ය.

**යො මුඛසඤ්ඤතො භික්ඛු මන්තභාණී අනුද්ධතො** = මුඛයෙන් සංයත වූ නුවණින් දැන කියන සුලු උඩඟු නො වූ යම් මහණෙක්.

'තෝ දසයෙහි, සැඩොලෙහි, දුසිල් වෙහි, යනාදී විසින් උතුනට ජාත්‍යාදියෙන් ගටා නො බණනුයේ බොරුබස්, කේලාම් බස්, පරොස් බස්, නිසරු බස් නො බණනුයේ '**මුඛසඤ්ඤත**' නම්. "**දාසචණ්ඩාලාදයොසි ත්වං දුජ්ජානො, ත්වං දුස්සීලොසි ආදීනං අවචනතාය මුඛෙන සඤ්ඤතො**" යනු අර්ථ කථා.

මන්තා නම්: ප්‍රඥා. සරු බසක් වුව ද හිත බසක් වුව ද නුවණින් විමසා බලා කල් දැන පමණට කියන සුලු වූයේ '**මන්තභාණී**' ය. සමහර තැනෙක මෙය '**මත්තභාණී**' යි ද එන්නේ ය.

එකඟ වූ සිත් ඇතියේ නො ද විසුරුණු සිත් ඇතියේ '**අනුද්ධත**' ය. පමණට කියන සුලු වූයේ '**මත්තභාණී**' ය. යො-**මුඛසඤ්ඤතො**-මන්තභාණී-**අනුද්ධතො** යන මෙපදයෝ 'භික්ඛු' යනු වෙසෙසා සිටියෝ ය.

**අත්ථං ධම්මං ච දීපෙති මධුරං තස්ස භාසිතං** = අර්ථයත් ධර්මයත් දක්වා ද ඒ මහණහුගේ බස් මිහිරි ය.

මෙහි භාෂිතාර්ථය **අත්ථ** නම්. දේශනාධර්මය **ධම්ම** නම්. ඒ මේ භාෂිතාර්ථය හා දේශනාධර්මය හා පරිමණ්ඩලපදබ්‍යඤ්ජනයෙන් ප්‍රකාශ කිරීම '**දීපෙති**' යන ක්‍රියා පදයෙන් දක් වේ.

මුඛසංයතා දී වූ ගුණයෙන් වෙසෙසුනු මහණහුගේ වචනය මිහිරි වේ. යමෙක් පාලිය නො කියා අර්ථය ම කියා නම් එ ද, අර්ථය නො කියා පාලියම කියා නම් එ ද, අර්ථයත් පාලියත් යන දෙක ම නො කියා නත් දෙඩවා නම් එ ද මිහිරි නො වේ. යමෙක් පාලියට අනුකූලව අර්ථයත් අර්ථයට අනුගත වූ පාලියත් කියා නම් ඔහුගේ වචනය මිහිරි ය සි වදාළ සේක.

නො පිරික්සා තැන නො බලා කල්වේලා නො බලා පිරිස් නො බලා කටට පැමිණියක් ම කියන්නේ, එලොව මෙලොව දෙකින් පිරිහෙන්නේ ය. එහෙයින් කියන්නේ නම් පිරික්සා තැන බලා කල්වේලා බලා පිරිස බලා කියන්නේ ය. කිය යුතුය.

එහෙත් හැමදා නිහඬ ව නො සිටින්නේය. නො සිටිය යුතුය. නිහඬ ව නො සිටින්නේ ද පරාපෙළන තමන් හෙළාලන බස් නො කියන්නේ ය. නො කියයුතු ය. පැමිණි කල් ඇත්තේ ම නො විසුරුණු බස් කියන්නේ ය. කියයුතු ය. එහිලා:

“නාතිවෙලං පභාසෙය්‍ය න තුණ්හී සබ්බදා සියා,
අවිකිණ්ණමිදං වාචං පත්තෙ කාලෙ උදීරයෙ”

යන මෙය සිත්හිලා දැරිය යුතුය. මෙසේ වාක්සංයමයෙන් යුක්ත වූයේ හැම තැන තෙද ඇතියේ වන්නේ ය.

ධර්මදේශනාවගේ අවසානයෙහි බොහෝ දෙන සෝවන් පලා-දීයට පැමිණියාහු ය.

**කොකාලික වස්තුව නිමි.**

# ධර්මාරාම ස්ථවිරයන් වහන්සේ.

## 25 — 4

**බුදුරජාණන්** වහන්සේ “සිවු මසක් ගිය තැනේ දී මාගේ පිරිනිවීම වන්නේය”යි වදාළ කල්හි නොයෙක් දහස් ගණන් භික්ෂූන් වහන්සේලා බුදුරජුන් පිරිවරා උන්වහන්සේ නො හැර හැසුරුණාහ. එහි දී පෘථග්ජන භික්ෂූහු හඬන්නට වැලපෙන්නට වූහ. රහතුන් වහන්සේලාට එහි ලා ධර්මසංවේගය උපන. සියල්-ලෝ ම “අපි කුමක් කරමෝ දැ”යි තැන තැන කැටි කැටි ව ඇවිදින්නට වූහ. ධර්මාරාම නම් එක් භික්ෂූන් වහන්සේ නමක් ඔවුන් හා එක් නො වී එකලා ව හුන්හ. ඒ දුටු භික්ෂූන් වහන්සේලා ධර්මාරාම තෙරුන් වෙත ගොස් “ඇවැත්නි! තමුන්නාසේ අප හා එක් නො ව නො බැණ කුමක් කරන්නහු?”යි ඇසූහ. එහෙත් උන්වහන්සේ ඔවුන්ට කිසිවක් නො කියා “මම නො පැහූ රාග ඇතියෙම් වෙමි, බුදුරජාණන් වහන්සේත් සිවු මසක් ගිය තැන පිරිනිවන් පානා සේක, බුදුරජුන් ජීවත් ව වැඩ සිටිය දී ම රහත් වන්නට ඕනෑ”යි එකලා ව ම සමූහය හැර දමා ඔවුන් වෙත නො ගොස් බුදුරජුන් දෙසූ දහම් ආවර්ජනය කරමින් සිතමින් සිහි කරමින් කල් ගෙවූහ. එකල්හි භික්ෂූන් වහන්සේලා බුදුරජුන් වෙත ගොස් “ස්වාමීනි! ධර්මාරාම තෙරුන්ගේ සිතෙහි බුදුරජාණන් වහන්සේ කෙරෙහි ස්වල්පමාත්‍ර වූ ද සෙනහයෙක් නැත්තේ ය, බුදුරජාණන් වහන්සේගේ පිරිනිවීම ගැණ කුමක් කළ යුතු දැ යි අප හා කතා නො කරන්-නාහ”යි සැලකොට සිටියහ. එවිට බුදුරජාණන් වහන්සේ ධර්මාරාම තෙරුන් කැඳවා “ධර්මාරාම! සැබෑ ද, තමුසේ මා පිරිනිවන් පානා බව දැනත් අන් සබ්‍රම්සරුන් හා ඒ ගැණ කිසිත් නො බැණ සිටින්නහු?”යි අසා වදාළ සේක. ධර්මාරාම තෙරණුවෝ “ස්වාමීනි! සබ්‍රම්සරුන්ගේ කීම සැබෑ”ය යි කීහ. “ඇයි, උන් හා ඒ ගැණ කිසිත් කතා නො කරන්නහු?”යි අසා වදාළ කල්හි “ස්වාමීනි! මම පුහුදුනෙක්මි, නො පැහූ රාග ඇතියෙම්මි, බුදුරජාණන් වහන්සේත් සිවු මසක් ගිය තැනේ දී පිරිනිවන් පානා සේක, ඉන් පසු අපට පිහිට වන්නෝ කවරහු, ඒ නිසා මම බුදුරජුන් ජීවත් ව වැඩ සිටිය දී ම රහත් වෙමි යි සිතා දැඩි උත්සාහයෙකින් බුදුරජුන් වදාළ දහම් සිතමින්, සිහි කරමින් දවස් යවමි” යි ධර්මාරාම තෙරුන් කී කල්හි බුදුරජාණන් වහන්සේ “යහපත, යහපතැ”යි සාධුකාර දී “මහණෙනි! මා කෙරෙහි සෙනහය ඇති අන් සව්වන් ද ධර්මාරාම වැන්නන් විය යුතු ය, මල්ගඳ ආදියෙන් මා පුදන්නෝ මා නො ද පුදන්නෝ ය, ධර්මානුධර්මප්‍රතිපත්තියෙහි පිළිපන්නෝ ම මා පුදති”යි වදාරා මේ ධර්මදෙශනාව කළ සේක.

**ධම්මාරාමො ධම්මරතො ධම්මං අනුවිචින්තයං,**
**ධම්මං අනුස්සරං භික්ඛු සද්ධම්මා න පරිහායතීති.**

ධර්මය වාසස්ථාන කොට සිටි ධර්මයෙහි ඇලුනු ධර්මය නැවැත නැවැත සිතන්නා වූ ධර්මය නැවැත නැවැත සිහි කරන්නා වූ මහණ තෙමේ සද්ධර්මයෙන් නො පිරිහෙන්නේ ය.

**ධම්මාරාමො** = ශමථවිදර්ශනාධර්ම වාසස්ථාන කොට සිටි. ශමථ විදර්ශනා ධර්ම අරම් කොට ඇති.

ශමථවිදර්ශනාධර්ම තමන්ගේ වාසස්ථානය කොට ගත්, තමන්ගේ සිත රුඳ වූ තැන් කොට ගත් මහණ තෙමේ **'ධම්මාරාම'** නම්. පංචනීවරණාදී වූ කෙලෙස් සන්සිඳවීම ශමථය ය. **"නීවරණානි සමෙතීති = සමථො"** යනු ආචාර්‍ය්‍යවචන යි. පරිත්ත - මහග්ගත විසින් ඒ දෙපරිදි ය. උපචාරයට පැමිණියේ පරිත්ත ය. අර්පණාවට පැමිණියේ මහග්ගත ය. ශමථය ලෞකික ය. විස්තර කථාව යට කියන ලදි. පඤ්චනීවරණධර්ම හා විතර්කාදිධ්‍යානාඞ්ග සන්සිඳුවා අෂ්ටසමාපත්ති උපදවා ගැණීම ශමථයෙන් ලැබෙන ඵලය වේ. අෂ්ටසමාපත්ති උපදවා ගන්නහුට ඉදිරියෙහි සිත වැඩීමෙන් පඤ්චාභිඥාවන් උපදවා මරණින් මතු බඹලොව ඉපදිය හැකි ය. මේ ලෞකිකධ්‍යාන බුද්ධොත්පාදයෙහි මෙන් ම අබුද්ධොත්පාදයෙහි ද ලැබෙන්නේ ය. එයට තිසි මගින් සිත වැඩිය යුතු ය.[1]

සංස්කාරධර්ම පිළිබඳ අනිත්‍ය - දුඃඛ - අනාත්ම යන ත්‍රිලක්ෂණ සිතට නගා එහි ලා නිතර නිතර සිත පුරුදු කිරීම **විදර්ශනා** ය.[2]

**ධම්මරතො** = ශමථවිදර්ශනාධර්මයෙහි ඇලුනු.

**ධම්මං අනුවිචින්තයං** = ශමථවිදර්ශනාධර්මය නැවැත නැවැත සිතන්නා වූ.

**ධම්මං අනුස්සරං භික්ඛු** = ශමථවිදර්ශනාධර්මය නැවැත නැවැත සිහි කරන්නා වූ මහණ තෙමේ.

**සද්ධම්මා න පරිහායති** = සද්ධර්මයෙන් නො පිරිහෙයි.

මෙහි සද්ධර්ම යි කියේ සත්තිස් බෝපැකිදම් හා නවලොවුතුරු දහම් ය. යට කියන ලදී.[3]

1. 1, 9. 'එවං අභාවිතං චිත්තං,' යනු බලනු.
2. 2, 1. 'ඣායිතො' ,, ,,
2. 20, 2. 'සබ්බෙ සංඛාරා' ,, ,,
3. 2, 1. 'අරියානං ගොචරෙ' ,, ,,

සප්තත්‍රිංශත් බෝධිපාක්ෂිකධර්මයන්ගෙන් හා නවලෝකෝත්තරධර්මයෙන් නො පිරිහෙන්නට නම් සිල්වත් ව සිට ගෙණ මේ ධර්මාරාම තෙරුන් මෙන් ශමථ විදර්ශනා ධර්මයන්හි එක්වන් යෙදී - ගැන්ම ය - නැත, ලෞකිකජීවිතයෙහි බැඳුනු සිතැති ව ලාභාපෙක්ෂායෙන් කරණු ලබන කිසිවකින් එහිලා සාරණ කිසිද උත්සාහයකින් ගිහි පැවිදි කිසිවක්හටත් මෙ කියූ බෝපැකි දම් හා නවලොව්තුරු දහම් නො ද ලැබිය හැකි ය. බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පානා වග දැන දැනත් එහිලා සිත නො යොදවා ධර්මානුධර්මප්‍රතිපත්තියෙහි යෙදී සිටි ධර්මාරාම තෙරුන්ට උන්වහන්සේ සාධුකාර දී වදාළෝ ධර්මානුධර්මප්‍රතිපත්තියෙහි යෙදී ගැණීම ම ශ්‍රේෂ්ඨ බැවිනි. සසර බිය වශයෙන් ගෙණ සසරින් නිදහස් වනු කැමැති ගිහි පැවිදි හැම දෙනා විසින් කළයුත්තේ මේ ය.

ධර්මදෙශනාවගේ අවසානයෙහි ඒ මහණ තෙමේ රහත් බැව්හි පිහිටා ගත්තේ ය. ධර්මදෙශනා තොමෝ පැමිණ සිටි පිරිසට ද වැඩ සහිත වූ ය.

**ධර්මාරාම ස්ථවිර වස්තුව නිමි.**

# විපක්ෂසෙවක භික්ෂු නමක්

## 25 — 5

**විපක්ෂසෙවකභික්ෂු** නමක්හට දෙවදත්තපක්ෂයෙහි වූ මහණෙක් සහාය ව අත දී සිටියේ ය. ඒ දෙවදත්තපාක්ෂික භික්ෂු තෙමේ, දවසක් අන්‍ය භික්ෂූන් හා එක් ව පිඩු සිඟා ගොස් බත්කිස අවසන් කොට එන තම යහළු වූ විපක්ෂ සෙවක භික්ෂු නම දැක "කො තැනක ගියෙහි?"යි ඇසුයේ ය. "පිඩු සිඟා යන්නට අසුවල් තැනට ගියෙමි"යි ඒ නම කී කල්හි "ඔබට පිණ්ඩපාතය ලැබුනේ දැ?"යි නැවැත විචාළේ ය. "එසේ ය, ලැබුනේ ය"යි ඔහු කී ය. එවිට දෙවදත්තපාක්ෂික භික්ෂු තෙමේ "අපට නම් මෙහි ලාභසත්කාර බොහෝ සේ ලැබෙත්තේ ය, කෑම් බීම්වලින් අපට කිසි ම අඩුවෙක් නැත, එක දවසට ලැබෙන බත්සැළි ගණන ම පන් සියයෙකි, එක් සැළියෙහි බත් දස දෙනකුට කාලා අවසන් කරන්නට නො හැකි ය, එහෙයින් කිහිප දවසක් අප හා මෙහි රැඳෙන්නැ"යි කී ය. ඔහු ද ඒ කීම පිළිගෙණ කිහිප දවසක් එහි නැවතී හිඳ තමන්ගේ ආවාසයට පෙරළා ගියේ ය. එකල්හි ඒ දුටු භික්ෂූන් වහන්සේලා බුදුරජුන් වෙත ගොස් "ස්වාමීනි! මේ මහණ, දෙව්දත්හට ලැබෙන ලාභසත්කාර එහි ගොස් රැඳී සිට වළඳන්නේ ය, මෙ තෙමේ දෙවදත්තපාක්ෂිකයෙකැ"යි දන්වා සිටියහ. ඉක්බිති බුදුරජානන් වහන්සේ ඒ මහණහු ගෙන්වා "හැබෑ ද, මහණ! මේ නමලා කියන කාරණ ය?" යි අසා වදාළ කල්හි "ස්වාමීනි! එසේ ය, මම මාගේ යහළු එක්තරා මහණකු නිසා කිහිප දවසක් ඔවුන්ගේ පන්සලෙහි නැවතී සිටියෙමි, එහෙත් මම දෙව්දත්හුගේ ලබ්ධිය රුචි කරන්නෙක් නො වෙමි, ඔහුගේ පක්ෂයෙහි වූවෙක් නො වෙමි"යි කියා සිටියේ ය. එකල්හි බුදුරජානන් වහන්සේ තමූසේ කොයිලෙසිනුත් උන්ගේ ලබ්ධිය රුචි නො කරන්නහු සැබෑ ය, එහෙත් දුටු දුටුවන් පස්සේ දුටු-දුටුවන්ගේ ලබ්ධිය ගෙණ හැසිරෙන්නකු මෙන් හැසිරෙන්නහු ය, තමූසේ දැන් පමණක් ම මෙසේ කළහු නො වහු ය, පෙරත් කෙළේ මෙසේ ය"යි වදාළ සේක. එවිට භික්ෂූන් වහන්සේලා "ස්වාමීනි! මේ මහණහුගේ අද සැටි අප විසින් ම දක්නාලද ය, පෙර එද මොහු උන් උන් පස්සේ ගිය සැටි අපට වදාරණු මැනැවැ"යි ඇයද සිටියහ. එකල්හි බුදුරජානන් වහන්සේ,

"හොබනා මූව නමැති – ඇත්රජු සොරුන් බසසා,
කිපියේ කැකුළු වූයේ – සොරුබසට නැමුනේ වී.
කාවිසිමුනි තිදෙර – රැකි සිල්වතුන් බසසා,
මගුලැත් උතුම් සියලු – සත්ගුණ රැඳී සිටියේ"

සි මහිලාමුඛජාතකය විස්තර විසින් වදාරා "මහණෙනි! මහණ තමන් ලත් ලාභයෙන් ම සතුටු විය යුතු ය, අනුන් අයත් ලාභය නො ද පැතිය යුතු ය, ඒ පැතීම නො සුදුසු ය, පරලාභ පතන්නහුට ධ්‍යාන විදර්ශනා මාර්ගඵල ධර්ම අතුරෙහි එක ද ධර්මයෙකුත් නො ද උපදනේ ය, තමන් ලැබූ ලාභයෙහි සතුටු වන්නහුට ම ධ්‍යානාදිධර්ම උපදනේ ය" යි වදාරා මේ ධර්මදේශනාව කළ සේක.

**සලාභං නාතිමඤ්ඤෙය්‍ය නාඤ්ඤෙසං පිහයං චරෙ,**
**අඤ්ඤෙසං පිහයං භික්ඛු සමාධිං නාධිගච්ඡති.**

**අප්පලාභොපි චෙ භික්ඛු සලාභං නාතිමඤ්ඤති,**
**තං වෙ දෙවා පසංසන්ති සුද්ධාජීවං අතන්දිතන්ති,**

ස්වකීයලාභයට අවමන් නො කරන්නේ ය. අනුන්ගේ ලාභය පතමින් නො හැසිරෙන්නේ ය. අනුන්ගේ ලාභය පතන්නා වූ ඒ මහණ තෙමේ සමාධියට නො පැමිණෙන්නේ ය.

ලාභී නො වූ ද මහණ තෙමේ ඉදින් තමාගේ ලාභයට අවමන් නො කෙරේ ද පිරිසිදු වූ දිවිවැටුම් ඇති කුසීත නො වූ ඒ මහණහුට ඒකාන්තයෙන් දෙවියෝ ද පසසත්.

**සලාභං න අතිමඤ්ඤෙය්‍ය**– තමන් අයත් ලාභය පහත් කොට නො සිතන්නේ ය.

උස් පහත් කම් නො සලකා උස් පහත් කුලයෙහි ගෙපිළිවෙළින් හැසිර එක් විසි අනෙසනයෙන් තොර ව දැහැමි ව ලැබූ තමා අයත් මඳ වූ ත් බොහෝ වූ ත් රූක්ෂ වූ ත් ප්‍රණීත වූ ත් චීවරාදී වූ සිව්පසයට අවමන් නො කරන්නේ ය. යමෙක් උස් පහත් කුල පිළිවෙළින් හැසිර ලැබිය යුතු සිව්පසය හැරදමා එක් විසි අනෙසනයෙන් දිවිවැටුම් කරණුයේ තමන් ලත් සිව්පසයට අවමන් කරන්නේ නම් වේ. එහෙයින් ගෙවල දොර දොර සිට ලබන මොනතරම් දෑයක් වුව ද එය පහත් කොට නො සැලකිය යුතු ය. එයට අවමන් නො කටයුතු ය.

**න අඤ්ඤෙසං පිහයං චරෙ**= අනුන් අයත් ලාභය පතමින් කැමැති වෙමින් නො හැසිරෙන්නේ ය.

අනුන්ට ලැබෙන අනුන් අයත් වූ බොහෝ වූ ත් ඇඟපතට දිවට හිත වූ ඇඟපත දිව පිණවන දෑයට කෑදරකම් දක්වමින් අනුන් අයත් ඒ දෑය පතමින් නො හැසිරෙන්නේ ය. නො හැසිරිය යුතු ය.

**අඤ්ඤෙසං පිහයං භික්ඛු** = අනුන්ගේ ලාභය පතන්නා වූ මහණ තෙමේ.

**සමාධිං න අධිගච්ඡති** = සමාධියට නො පැමිණෙන්නේ ය.

අනුන් අයත් ලාභයට කෑදරකම් දක්වමින් හැසිරෙණ මහණ සිවුරු මැසීම් ආදී කටයුතුවලට කරණ උත්සාහයකට මුත් උපචාර-අර්පණා-මාර්ග-ඵල යන මේ කිසිත් ගුණයකට නො පැමිණෙන්නේ ය, මේ කිසිත් ගුණයක් නො ලබන්නේ ය. සමාධි විස්තරය යට කියන ලදී[1]

**අප්පලාභො අපි චෙ භික්ඛු සලාභං න අතිමඤ්ඤති** = ලාභී නො වූ ද මහණ තෙමේ ඉදින් තමන් ලත් ලාභයට අවමන් නො කරන්නේ නම්.

ප්‍රණීත වූ චීවර – පිණ්ඩපාත – සෙනාසන – ගිලාන ප්‍රත්‍යය යන සිවුපසය නො ලබන මහණ **'අප්පලාභ'** නම් වේ. එහෙත් මේ මහණ ගෙපිළිවෙළින් ගොස් රූක්ෂ – ප්‍රණීත විසින් තමන් ලැබූ දෑයට අවමන් නො කරන්නේ ය. එය පහත් කොට නො සලකන්නේ ය. ලද දෙයින් ම සතුටු වන්නේ ය.

**තං වෙ දෙවා පසංසන්ති සුද්ධාජීවං අතන්දිතං** = පිරිසිදු වූ දිවිපැවැතුම් ඇති කුසීත නො වූ ඒ මහණහුට එක නතයෙන් දෙවියෝ පසසත්.

පිරිසිදු දිවිපැවැතුම් ඇතියේ **'සුද්ධාජීව'** නම්. මෙ තෙමේ කුලයන්ගේ උස් පහත්කම් නො සලකා ගෙපිළිවෙළින් පිඬු සිඟා ලත් දෑයින් දිවි වැටුම් කරන්නේ ය. එහෙයින් **''සාරජීවිතාය සුද්ධාජීවං''** යනු අටුවාව කීවා. මෙ තෙමේ ආජීවපාරිශුද්ධිශීලයෙන් **සිල්වත් යි** ගන්නේ ය.

සියලු ඉරියව්වල නො පසු බස්නේ, නො මැලි වූයේ අටවැදෑරුම් කුසීතවස්තූන්ගෙන් තොර වූයේ **'අතන්දිත'** නම්. **''ජඞ්ඝාබලං නිස්සාය ජීවිතකප්පනෙන අකුසීතතාය අතන්දිතං''** යනු විසින් කියේ ඒ ය.[2] ජඞ්ඝා බලය නිසා පිඬු සිඟා ගොස් ලැබෙන දෑයෙන් දිවිවැටුම් කරණ සිල්වත් මහණහුගේ ජීවිතය පිරිසිදු ය. ආලොකාවත් ය. එබඳු මහණහුට දෙවියෝ බ්‍රහමයෝ යක්ෂයෝ රාක්ෂයෝ මනුෂ්‍යයෝ වඳිති, පුදති, යනු එකානතා ය.

ධර්මදෙශනාවගේ අවසානයෙහි බොහෝ දෙන සෝවන්-පලාදියට පැමිණියාහු ය.

**විපක්ඛසෙවක භික්ඛුවත්ථුව නිමි.**

1. 10, 10 'සමාහිතා' යනු බලනු
2. 1, 6. 'කුසීතං' ,, ,,
   2, 9. 'අතන්දිත' ,, ,,

# පඤ්චග්ගදායක බ්‍රාහ්මණ

## 25 — 6

**පඤ්චග්ගදායක** බ්‍රාහ්මණ තෙමේ ගොයම්, කෙතෙහි තිබියදී ම **ඛෙත්තග්ග** නම් දානයක, ගොයම් කපා කමතෙහි ලූ කල්හි **ඛලග්ග** නම් දානයක, ගොයම් පාගා වී එක් තැන් කළ කල්හි **ඛලභණ්ඩග්ග** නම් දානයක, බත් පිසන්නට සහල් සැළියෙහි ලූ කල්හි **කුම්භග්ග** නම් දානයක, බත් පිස බත් තලියෙහි ලූ කල්හි **පාතග්ග** නම් දානයකැයි එක් ම ගොයමෙහි දන් පසක් දෙන්නේ ය. බත් කන වේලෙහි පැමිණියවුනට බත් නො දී නම් තෙමේ නො කන්නේ ය. මේ නිසා මොහු පඤ්චග්ගදායක යි ප්‍රසිද්ධ වූයේ ය. බුදුරජාණන් වහන්සේ මේ බමුණාටත් බමුණු බිරියටත් සෝවන් – සෙදගැමි – අනගැමි පල තුන ලැබීමට තුබූ වාසනාශක්තිය දැක බමුණා බත් කන වේලෙහි බමුණු ගෙදරට වැඩ ගෙදොර වැඩ සිටි සේක. බමුණා ද ගෙට මූණ ලා දොරකඩ හිඳ බත් අනුභව කෙළේ ය. එහෙයින් ගෙදොර වැඩ සිටි බුදුරජාණන් වහන්සේ ඔහු විසින් නො දක්නා ලදහ. බැමිණිය එහි ඔහුට බත් එළවමින් සිටියා බුදුරජුන් දැක "මේ බමුණු එක් ම ගොයමෙහි ඒ ඒ අවස්ථා බලා දන් පසක් දීලා අවසන් කොට දැන් බත් අනුභව කරන්නේ ය, ශ්‍රමණ ගෞතමත් මෙහි අවුත් සිටී යි, යම් ලෙසකින් බමුණු ශ්‍රමණ ගෞතම දුටුයේ නම් තමන්ගේ බත්පිඩ මොහුට දෙන්නේ ය, එසේ වී නම් මට තව වරක් බත් පිසන්නට සිදු වන්නේ ය, නැවැතත් බත් පිසනු ද අපහසු ය, එහෙයින් බමුණුට ශ්‍රමණ ගෞතම නො පෙණෙන සේ සිට ගණිමි" යි බුදුරජුන් දෙසට පිටු පා බමුණාගේ පසු පසට වී පුන්සඳ වසන්නියක සේ බුදුරජුන් වසාලමින් නැමී සිටගත්තා ය. එසේ සිට වරින්වර "ශ්‍රමණ ගෞතම ගියේ දැ"යි හොර ඇසින් බුදුරජුන් දෙස බලන්නී ය. බුදුරජාණන් වහන්සේ ද එහි ම වැඩ සිටියහ. බැමිණිය බමුණාට ඇසේ දෝ යන බියෙන් 'අරුණු' යි කියාගත නො හී වටපිට බලා මදක් පසු බැස ඉතා හීන් හඬින් අරුණු යි කීවු ය. එකෙණෙහි බුදුරජාණන් වහන්සේ 'නො යමි' යි හිස සැලූ සේක. උන්වහන්සේ හිස සලා ලූ කල්හි බැමිණියට සිනහ ගියේ ය. ඒ හා ම බුදුරජාණන් වහන්සේ බමුණු ගෙය තුළට ආලෝක ධාරාවක යැවූ සේක. බමුණු ද පිටුපා හුන්නේ ම බැමිණියගේ සිනාහඬ අසා සවණක් බුදුරැස් ද දැක හැරී බැලූයේ බුදුරජුන් දුටුයේ ය.

බුදුවරු වනාහි ගමෙහි හෝ වෙනෙහි වසන හෙතු සම්පත් ඇතියනට තමන් නො දක්වා පෙරළා නො වඩින සේක. බමුණු බුදුරජුන් දැක "රජපුත්‍රයා මෙහි අවුත් සිටින බව මට නො කීමෙන්

නී විසින් කරණ ලද්දේ මා නසාලීමෙක, ඉතා බැරැරුම් සැහැසි කමෙකැ''යි අඩක් කා තුබූ බත්තලිය ගෙණ බුදුරජුන් වෙත ගොස් ''භවත් ගෞතමයන් වහන්ස! මම පස් විටක් ම අගබත් දී අවසන් කොට මේ බත බුදින්නෙමි, මේ බත් තලියත් ආ කෙනකුන්හට දෙන්නට සිතා මැදින් වෙන් කොට තබා එක් කොටසක් ම මම කෑයෙමි, දෙන්නට සිතා වෙන් කළ කොටස ඉතිරි ව තිබේ, මාගේ මේ බත් කොටස පිළිගන්නාහු දැ?'' යි ඇසී ය. බුදුරජාණන් වහන්සේ ''තාගේ ඉඳුල් බතින් මට වැඩෙක් නැතැ'' යි නො වදුරා ම ''බමුණ! අග බතත් සුදුසු මටම ය, අඩක් කා ඉතිරි කළ බතත් සුදුසු මට ම ය, අනතිම බත් පිඩත් මට ම සුදුසු ය, බමුණ! අපි අනුන් දෙන දැයින් දිවි යවන ප්‍රෙතයන් වැනියම්හ'' යනු වදාරා,

''අත්හු දුන් අග මැද – බතිනි සෙසු ලමු බතිනී,
දිවි යවන ඒ පෙයිනෙව් – යම් බත් පිඩක් ලැබුනෙ ද,
එබත් පිඩ නො ලැබුන – නමුත් ගැරහුම් නො කරණ,
ඔහුට මුනි යී කියතී – පසසති දනෝ නුවණැති''

යන මේ ගය දෙසූ සේක.

බමුණු එය අසා පහන් සිත් ඇතියේ ''ඉතා පුදුමයෙක, දීපසවාමි වූ රාජපුත්‍ර තෙමේ 'තාගේ ඉඳුල් බතින් මට ප්‍රයොජන නැතැ' යි නො කියා මෙලෙස කියන්නේ ය'' යි මිදුලෙහි සිටියේ ම ''භවත් ගෞතමයන් වහන්ස! ඔබ වහන්සේ තමන්ගේ ශ්‍රාවකයන් භික්‍ෂුහු යි කියහු, කො පමණකින් භික්‍ෂුහු වෙත් දැ?''යි මේ ප්‍රශ්නය බුදුරජුන් අතින් විචාළේ ය. එවිට බුදුරජාණන් වහන්සේ ''කෙබඳු දහමෙක් මොහුට හිත වන්නේ දැ''යි විමසන සේක්, ''මේ දෙ දෙන ම කසුප් බුදුරජුන් දවස නාමරූපධර්ම පිළිබඳ දහම් දෙසන්නවුන් අතින් නාම රූප පිළිබඳ දහම් අසා ඇතියහ, එහෙයින් නාමරූප ධර්ම කථාව නො හැරම මොවුනට දහම් දෙසන්නට වටී ය'' යි දැන ''බමුණ! නාමධර්මයන්හි හා රූපධර්මයන්හි නො ඇලෙනුයේ එහි නො ගැලෙනුයේ එහි ශොක නො කරණුයේ භික්‍ෂු නම් වේ''යි වදාරා මේ ධර්මදෙශනාව කළ සේක.

**සබ්බසො නාමරූපස්මිං යස්ස නත්ථි මමායිතං,**
**අසතා ච න සොචති සවෙ භික්ඛූති වුච්චතීති.**

යමක්හට නාම-රූප දෙක්හි මුළුමනින් මමත්වයෙක් නැත්තේ ද (ඒ නාම – රූප) නැසී යෑම් හෙතුවෙන් ශොක නො කෙරේ ද හෙතෙමේ එකාන්තයෙන් භික්‍ෂු යි කියනු ලැබේ.

**සබ්බසො නාමරූපස්මිං යස්ස නත්ථි මමායිතං** = යමක්හට නාම රූපදෙක්හි මමත්වයෙක් නැත්තේ ද,

යමක්හට රූප - වේදනා - සඤ්ඤා - සංඛාර - විඤ්ඤාණ යන පඤ්ච ස්කන්ධයෙහි මම ය, මාගේ ය'යි ආත්ම - ආත්මීය වශයෙන් ගැන්මෙක් මුළුමනින් නැත්තේ ද.

මේ ස්කන්ධ පස, නාම - රූප විසින් දෙ කොටසකට බෙදනු ලැබේ. රූප කොටස එක් ම රූපස්කන්ධ ය යි ද වේදනා - සංඥා - සංස්කාර - විඥාන යන මේ කොටස් සතර එක් ස්කන්ධ ය යි ද බෙදන ලද්දේ ය. විස්තර කථාව යට කියන ලදි.[1]

**'සබ්බසො'** මුළුමනින්, එකකුත් නො හැර, නාමයෙහි ඇතුළත් එක ද ධර්මයකුත් රූපයෙහි ඇතුළත් එක ද ධර්මයකුත් නො හැර යන අරුත් ගන්නේ ය.

සංක්ෂේප විසින් එකුන් අනූවක් වූ මධ්‍යම විසින් එක්සිය විස්සක් පමණ වූ විස්තර විසින් බොහෝ වූ චිත්තයෙහි ද, දෙ පණසක් පමණ වූ චෛතසිකයෙහි ද, භූතෝපාදාය විසින් අටවිසි වැදෑරුම් වූ කලාප විසින් එක් දහස් පන්සිය එකක් පමණ වූ රූපයෙහි ද යන මේ ධර්මයන්හි ආත්ම ආත්මීය වශයෙන් කරණ මමායනය **'මමායිත'** නම්. නාම - රූපධර්මයන්හි මමායනය කරණුයේ රූපාදී වූ ස්කන්ධ පස ආත්ම වශයෙන් ගෙණ මමායනය කරන්නේ ය. එසේ ම රූපාදී වූ ස්කන්ධ පස තමා සතු ය යි ගෙණ ආත්මීය වශයෙන් මමායනය කරන්නේ ය. එසේ කරණු ලබන මමායනය යමක්හට නැත්තේ ද, එසේත්,

**අසතා ච න සොචති ස වෙ භික්ඛූති වුච්චති** - (ඒ නාම රූප) නැසීයෑම් හෙතුවෙන් ශොක නො කෙරේ ද, හෙතෙමේ ඒකාන්තයෙන් භික්ෂු යි කියනු ලැබේ.

නාම - රූප දෙක නැසී ගිය කල්හි 'මාගේ රූපය නැසී ගියේ ය, මාගේ වේදනාව නැසී ගියා ය, මාගේ සංඥාව නැසුනී ය, මාගේ සංස්කාර නැසුනේ ය, මාගේ විඥානය වැනසුනේ ය'' යි ශොක නො කරන්නේ ද, නැසෙන වැනසෙන සැහැවි ඇති ධර්ම නැසී ගියේ යි දක්නේ ද, මෙසේ විද්‍යමාන වූ නාම රූප දෙක්හි මමත්වයෙන් තොර වූයේ ඒ නැසීමෙන් ශොක නො කරණුයේ 'භික්ෂු'යි කියනු ලැබේ. රහතුන් වහන්සේ ය.

ධර්මදෙශනාවගේ අවසානයෙහි දෙ මහල්ලෝ ම අනගැමි පලයෙහි පිහිටියාහු ය. ධර්මදෙශනා තොමෝ පැමිණ සිටියවුනට ද වැඩ සහිත වූ ය.

**පඤ්චග්ගදායක බ්‍රාහ්මණ වස්තුව නිමි.**

---

1. 4. 1. **'කො ඉමං පඨවිං විජෙස්සති'** යනු බලනු.

# බුදුරජුන්ගේ සාධුකාරය

## 25 — 7

එක් කලෙක ආයුෂ්මත් **මහාකාත්‍යායන** මහාස්ථවිරයන් වහන්සේ **අවන්ති** ජනපදයෙහි **කුරරඝර** නම් නුවර අසල පිහිටි පර්වතයෙක වැඩ වාසය කළ සේක. එකල එහි **කුටිකණ්ණ සෝණ** නම් උපාසකයෙක් විසී ය. ඔහු මහාකාත්‍යායන මහ තෙරුන්ගේ ධර්මකථායෙහි පැහැදී තෙරුන් වෙත පැවිදිවනු කැමැති ව තෙරුන් වෙත ගොස් "මා පැවිදි කරණු මැනැවැ"යි ඉල්ලා සිටියේ ය. "සෝණ! දිවි තිබෙන තුරු එක් වේලක් වළඳමින් කසටින් රැඳූ සිවුරු දරමින් අවු පිනි වැසි නො බලා පිඩු සිඟා යමින් නෑ පිරිස් ද හැරදමා බිම දඬු ඇඳ නිදමින් රසෙක් වේව යි නො රසෙක් වේව යි ලැබූ දැයක් වළඳමින් කළයුතු මහණකම පහසු නැතැ"යි මහතෙරුන් වහන්සේ දෙ වරක් ම සෝණගේ ඉල්ලීම ප්‍රතික්ෂෙප කළහ. එහෙත් ඔහු පැවිදිවීමෙහි වඩවඩාත් උත්සාහවත් ව තෙරුන් සතුටු කර ගෙණ තෙරුන් වෙත ම පැවිදි වී ය. පැවිදි වූයේ ද දක්ෂිණාපථයෙහි උපසපන් මහණුන් නො සිටි බැවින් තුන් අවුරුද්දක් ම උපසම්පත්තිය ලබන්නට නො හැකි ව සිටියේ ය. තුන් අවුරුද්දක් ගිය තැන, උපසපන් මහණුන් ලැබ උන් හමුවෙහි උපසපන් වූයේ ය. ඉත්පසු බුදුරජුන් දක්නු කැමැති ව දෙව්රමට යන්නට අදහස් කොට උපාධ්‍යාය ස්ථවිරයන් වහන්සේගෙන් එයට අවසර ඉල්ලී ය. උන්වහන්සේ අවසර දුන්හ. අවසර ලත් සෝණ තෙමේ ගුරු තෙරුන් දුන් ලියුමක් ද රැගෙණ දෙව්රමට ගොස් බුදුරජුන් හමු ව දැක වැඳ ආ ගිය තොරතුරු කියා උන්වහන්සේ හා පිළිසඳරකතායෙහි යෙදුනේ ය. ඒ අවසන්හි බුදුරජුන් හා එක් ම ගඳකිළියෙහි නිදන්නට ලැබූ අනුදැනුම් ඇති සෝණ, බොහෝ වේලාවක් එළිමහනෙහි සක්මන් කොට කල් ගෙවා මැදියම ගඳකිළියට වැද තමන්ට ලැබුනු සෙනසුනෙහි රෑමැදියම ගෙවාලී ය. පැසුළු යාමයෙහි නැගී සිට බුදුරජුන්ගෙන් ලත් අවසරය ඇති ව සූත්‍රනිපාත යෙහි අෂ්ටකවර්ගීය මුළුමනින් මිහිරි හඬින් කියේ ය. බුදුරජාණන් වහන්සේ ඒ මිහිරි බණ දෙසුම් අසා කෙළවර අනුමෝදනා කරණ සේක් "සෝණ! ඉතා කදිම ය, සෝණගේ බණදෙසුමැ"යි සාධුකාර දුන් සේක. බුදුරජුන්ගේ ඒ සාධුකාරය අසා බුමාටු දෙවියෝ නාගයෝ ගුරුළෝ ද සාධුකාර දුන්හ. බඹලොව තෙක් මෙසේ එක් ම සාධුකාරයෙක් වී ය. එකෙණෙහි ම ජේතවනයෙන් එක්සිය විසි යොත්නකින් ඔබ්බෙහි වූ කුරරඝර නුවර විසූ තෙරුන්ගේ මවු උවැසියගේ ගෙයි අරක් ගෙණ සිටි දෙවි ද මහත් සේ හඬ නගා

සාධුකාර දුන්නෝ ය. එයසා උවැසි, ‘‘කවරෙක් සාධුකාර දේ දැ?’’යි ඇසූ ය. ‘‘බුහුන! මම වෙමි’’යි කී විට ‘‘තෝ කවරහි?’’යි උවැසිය ඇසූ ය. ‘‘මම, තීගේ ගෙයි අරක් ගෙණ සිටිනා දෙවි’’යි කී ය. ‘‘මෙයට කලින් කිසිදු කත් සාධුකාර නො දුන් ඔබ කුමක් නිසා අද සාධුකාර දෙන්නහු?’’යි ඇසූ විට ‘‘එදෙවි, මම සාධුකාර දුන්නෙම් නිට නො වෙමි’’යි කී ය. ‘‘එසේ නම් කාහට?’’යි ඇසූ කල්හි ‘‘තීගේ පුත් සොණකුටිකණ්ණ තෙරුන්ට ය’’යි කී ය. ‘‘මාගේ පුත් කුටිකණ්ණ සාධුකාර ලබන්නට කුමක් කෙළේ දැ’’යි ඇසූ විට ‘‘ඔහු අද බුදුරජුන් සමග ගඳකිළියෙහි හිඳ බුදුරජුන්ට දහම් දෙසූයේ ය, එ දහම් ඇසූ බුදුරජාණන් වහන්සේ එයට සතුටු ව අනුමෝදනා වශයෙන් ‘ඉතා යහපතැ’යි වදාරා සාධුකාර දුන් සේක, සාධුකාර දුන්නෝ බුදුරජාණන් වහන්සේ ම පමණක් නො වෙති, භූමාටු දෙවියන් පටන් බඹලොව දක්වා පැතිර සිටි දෙවියෝ බ්‍රහ්මයෝ නාගයෝ ගුරුළෝ යනාදී වූ හැම කෙනෙක් සාධුකාර දුන්හ, මේ වනාහි බඹලොව දක්වා නැගී එක් ම සාධු නාදයෙක් වී ය’’යි කීයේ ය. දෙවියන්ගේ මේ කතාව අසා පිණා ගිය උවැසිය, නැවැත ‘‘කිමෙක් ද, මාගේ පුත් බුදුරජාණන් වහන්සේට දහම් දෙසී ද, නැත, බුදුරජාණන් වහන්සේ මපුත්හට දහම් දෙසූ සේක් ද?’’යි ඇසූ ය. ‘‘නැත, තීගේ පුත් බුදුරජුන්ට දහම් දෙසී ය’’යි කියත් ම උපන් පස් වණක් ප්‍රීතිය උවැසියගේ මුළු සිරුර පැතිර වසා සිටියා ය. ඉක්බිති ඇයට ‘‘මපුත් බුදුරජුන් සමග එක ගඳකිළියෙහි හිඳ බුදුරජුන්ට දහම් දෙසන්නට සමර්ථ වේ නම්, මටත් බණ කියන්නට පොහොසත් වනු ඇත, පුතු මෙහි ආ විට බණ කියවා ගෙණ බණ අසන්නෙමි’ යි සිත් විය.

සොණ ස්ථවිරයන් වහන්සේ බුදුරජුන් සාධුකාර දුන් කල්හි ‘‘මාගේ උපාධ්‍යායයන් වහන්සේ දුන් ලියුම බුදුරජුන්ට පිළිගන්වන්නට දැන් මේ සුදුසු කාල ය’’යි බුදුරජුන් වෙත එළැඹැ ඒ ලියුම පිළිගැන්වී ය. පිළිගන්වා ‘‘ස්වාමීනි! පැසුළු දනව්වෙහි දසවග සඟුන් වුව ද නො ලැබිය හැකි බැවින් විනයධර ස්ථවිරයන් ප්‍රධාන උපසපන් පස් නමක්හට මාලු පැවිදිකම් කිරීමට අනුදැන වදාළ මැනැවැ’’යි ඉල්ලී ය. ඒ ඉල්ලීම මුල් කොට වරපසක් ලබාගෙණ කිහිප දවසක් බුදුරජුන් වෙත රැඳී සිටියේ ‘‘උපාධ්‍යායයන් වහන්සේ දකිනු කැමැත්තෙමි’’යි බුදුරජුන් විචාරා වැඳ අවසර ගෙණ උපාධ්‍යායයන් වෙත ගියේ ය. කාත්‍යායන මහාස්ථවිරයන් වහන්සේ පසුදා සොණ තෙරුන් ද ගෙණ පිඬු සිඟා යන ගමනේ සොණගේ මවු උවැසිය විසූ ගෙදොරට වැඩියහ. ඕ තොමෝ පුතු දැක තුටු සිත් ඇතියා වඩා හිඳුවා වළඳවාලා ‘‘පුත! ඔබ වහන්සේ බුදුරජුන් සමග එක ගඳකිළියෙහි හිඳ උන්වහන්සේට දහම්දෙසූ බව

මට දැනගන්නට ලැබී ඇත, ඒ සැබෑ දැ?''යි ඇසූ ය. ''මැනියෙනි! මෑනියන්ට මෙය කීවෝ කවුරු දැ?''යි ඇසූ විට ''මේ ගෙයි රැකවලෙහි සිටුනා දෙවි, මහත් හඬින් සාධුකාර දුන්නා, ඒ වේලෙහි මේ කවරැ?''යි මම ඇසීමි, ඔහු මමැ'යි කියා පුතා දෙසූ දහම් අසා බුදුරජුන් සාධුකාර දුන්බව ද කිව්වා, දෙවියා කියූ එබස් ඇසූ මට, මාගේ පුත් බුදුරජුන්ට දහම් දෙසන්නට සමර්ථ නම් මටත් බණ කියන්නට සමර්ථ වනු ඇතැ'යි සිතීමි, දරුව! බුදුරජුන් ඉදිරියෙහි බණ කියනලද නම් මටත් බණ කියන්න, මම බණ අසනු කැමැත්තෙමි''යි උවැසිය ආරාධනා කළා ය. සොණ ස්ථවිරයන් වහන්සේ ඒ ආරාධනාව ඉවසූහ. බණ කියන දවසෙහි ඕ තොමෝ භික්ෂුසඞ්ඝයා වහන්සේට දන් පිළිගන්වා පුද පූජා ද කොට බණ අසන්නෙමි යි එක් ම දැස්සක් ගෙය බලාගන්නට රඳවා තබා අන් සියලු පිරිවර ද ගෙණ ඇතුළු නුවර කර වූ ධර්ම සභාමණ්ඩපය වෙත ගියා ය.

ඒ කාලයෙහි නව සියයක් පමණ හොරු උපාසිකාවගේ ගෙයි රන්රිදී මුතු මැණික් මිල මුදල් බොහෝ ඇතිබව දන්නෝ ඉඩක් බලමින් හුන්හ. ඒ ගෙය පවුරු සතකින් වට කරණලද ය. දොරකොටු සතකින් ද යුක්ත ය. එහි ඒ ඒ තැන ඉතා නපුරු කීන බල්ලෝ ද බැඳ තබන ලදහ. ගෙයි පියසි අගින් දිය වැටෙන තැන ගෙය වට කොට අගලක් කනවා එහි ඊයම් පුරවා තබන ලදය. ඒ ඊයම් දවල අව්වෙන් දැවී උණුවී ලෝදියක් මෙන් සිටියි. රාත්‍රියෙහි තියුණු ව කැකුළු ව සිටියි. ඒ අතර ඉතා මහත් වූ යකඩ කූරු ඝන කොට පිහිටුවා ඇත. මෙසේ රැකවල මහත් බැවින් උපාසිකාව කො තැනකත් නො ගොස් ගෙයි ම හුන් බැවින් මෙතෙක් සොරුනට ගෙය බිඳ ගන්නට අවසරයෙක් නො ලැබුනේ ය. මෙ දවස උපාසිකාව බණ අසන්නට ගිය බව දත් සොරු, අගලට යටින් උමගක් සාරා ගෙට ඇතුල් ව 'උපාසිකාව අප ගෙට ඇතුල් වූ බව දැන හුන් තැනින් නැඟිට එන්නී නම් කඩුවෙන් ගසා මරා දමව'යි කියා සොරදෙටු බණ අසන උපාසිකාව වෙතට යැවූහ. සොරදෙටු ගොස් ඇය ලඟ ම බණ අසන්නකු සේ බලා සිටියේ ය. සොරු ගෙයි, පහන් දල්වා කහවණු තැබූ ගබඩාවෙහි දොර විවෘත කළහ. ගෙයි රැකවලට සිටි දැස්ස සොරුන් දැක බිය පත් ව සොරුන්ට නො පෙණී උපාසිකාව වෙතට වහා දුව ගොස් ''අම්මේ! සොරු ගෙට ඇතුල් ව කහවණු ගබඩාවෙහි දොර විවෘත කළහ''යි දැන් වූ ය. එවිට උපාසිකා තොමෝ ''සොරුන් තමන් දුටු කහවණු ගන්නා වේ, මම බණ අසන්නෙමි, මාගේ බණ ඇසීමට අනතුරු නො කොට ගෙට ගොස් හිඳුව''යි දැස්ස ගෙට යැවූ ය. සොරු ගබඩාවෙහි තුබූ කහවණු ගෙණ පොදි බැඳ,

නැවැත රිදීකාසි එකතු කොට තුබූ අල්මරි පෙට්ටගම් සියල්ල කඩා රිදීකාසි පොදි බඳින්නට පටන් ගත්හ. දූස්ස එවරද දුව ගොස් එබව උපාසිකාවට දන්වාලූ ය. "සොරු කැමැති තරමක් ගණිත්වා"යි කියා උපාසිකාව එවරත් දූස්ස හරවා යැවූ ය. රිදීකාසි පොදිබැඳ අවසන් කළ සොරු අනතුරුව රන්කාසි තුබූ කාමරයෙහි දොර කඩා රන්කාසි පොදි බැන්දූහ. එවරත් දූස්ස දුව ගොස් එබව කිවූ ය. "මට කරදර නො කොට ගෙට යව, මෙයට කලින් දෙවරක් දුව ඇවිත් නී මට කරදර කළා, බණ අසා ගන්නට ඉඩ දෙව, සොරුන් කැමැති සේ කැමැති දෑයක් ගත්තාට මට කමෙක් නැත, ඉතිරි වන දෑයකින් අපට ජීවත් විය හැකි ය, බණ අවසන් වනතුරු මම නො එන්නෙමි, නැවැත ආවොත් හිට දඬුවම් කරමි"යි ඒ තෙවනවරත් දූස්ස පෙරළා යැවූ ය. උවැසිය ළඟ බණ අසන්නකු සේ රැඳී සිටි සොරදෙටු උවැසිය කියූ මේ කතා අසා "මෙබඳු ගුණවත් ගැහැණියක අයත් දෑය පැහැර ගන්නවුන්ගේ හිසමත හෙන වැටී හිස සී සී කඩව බිඳී යනු වරදින්නේ නැතැ"යි සොරුන් වෙත ගොස් "වහා ම උවැසියගේ බඩුමුට්ටු මිලමුදල් ආදිය පෙර තුබූ තැන්වල ම තැන්පත් කරවූ"යි නියම කෙළේ ය. සොරු ද පොදි බැඳ තුබූ කහවණු ගෙණවුත් පොදි ලිහා තුබූ තන්හි ම ඒවා තැබූහ. රන් රිදී ගෙණවුත් ඒවා ද තුබූ තන්හි තැන්පත් කළහ. ධර්මය තෙමේ ධර්මයෙහි හැසිරෙන්නවුන් රකින්නේ ය, යනු ධර්මතාසිද්ධියෙකි.

"දහම් දම් සැරිහු – රකී යනු එකතින් වේ,
පුරුදු කළ දහම් ඒ – දෙලොව සුව එළවනුයේ.

පුරුදු කළ දහමෙහි - මෙයනුසස් වේ නියමය,
දම් සැරි තෙමේ දුගියට - නො යයි දහමනුසසිති."

ඉන් පසු සොරු ද ගොස් බණ දෙසන තැන සිට ගත්හ. සොණ සථවිරයන් වහන්සේ බණ වදුරා රැ පාන් වූ කල්හි බණ අසුනෙන් බැස සිටියහ. එකෙණෙහි සොරදෙටු තෙමේ උවැසියගේ දෙපාමුල වැටී "ආයඹාවෙනි! මට කමන්නැ"යි කී ය. එකල්හි "දරුව! එසේ කියන්නෙහි කුමක් නිසා?"යි ඇසූ ය. "මම ගුණවත් ඔබ කෙරෙහි වෛරයෙන් ඔබ මරණු කැමැති ව මෙහි රැඳී සිටියෙමි"යි සොරදෙටු කී කල්හි "දරුව! හා එසේ නම් තට කමන්නෙමි"යි ඕ තොමෝ කීවා ය. සෙසු සොරු ද එසේ කියා උපාසිකාව කමා කළහ. "කමන්නෙමි"යි කී කල්හි "ආයඹාවෙනි! අපට කමන්නහු නම් ඔබගේ පුතුන් ලඟ අප පැවිදි කරවන්නැ"යි සොරු සැම දෙන ඉල්ලා සිටියහ. ඉක්බිති උපාසිකා තොමෝ සොණතෙරුන් වැඳ

“දරුව! මොවුහු හොරු ය, මොවුහු මාගේ ගුණයෙහි හා ඔබවහන්සේගේ ධර්මකථායෙහි පහන් ව ගියෝ පැවිද්ද ඉල්ලා සිටිති, එහෙයින් මොවුන් පැවිදි කරණු මැනැවැ’’යි දැන් වූ ය. ස්ථවිරයන් වහන්සේ ද යහපතැ යි ඔවුන් පැවිදි කොට සීලයෙහි පිහිටුවාලූහ. ඔවුන් උපසපන් කොට ද ඔවුන්ට වෙන වෙන ම කමටහන් ද දුන්හ. ඒ නවසියයක් භික්ෂූහු වෙන් වෙන් ව කමටහන් නවසියයක් උගෙණ හැම දෙන කන්දක් මුදුනට නැගී එහි වූ ගස්යට සෙවණෙහි හිඳ කමටහන් වඩන්නට පටන් ගත්හ. එ දවස බුදුරජානන් වහන්සේ එක්සිය විසියොත්තකින් ඈත්හි වූ දෙව්රම් මහවෙහෙර වැඩහුන් සේක් ම ඒ මහණුන් ගුණ බලා චය්‍යාවශයෙන් ඔවුනට බණ නියම කොට ආලෝකධාරාවක විහිදුවා මූණු බලා හිඳ කියන්නා සේ මේ ධර්මදෙශනාව කළ සේක.

**මෙත්තාවිහාරී යො භික්ඛු පසන්නො බුද්ධසාසනෙ,**
**අධිගච්ඡෙ පදං සන්තං සඞ්ඛාරූපසමං සුඛං.**

**සිඤ්ච භික්ඛු ඉමං නාවං සිත්තා තෙ ලහුමෙස්සති,**
**ඡෙත්වා රාගඤ්ච දොසඤ්ච තතො නිබ්බාන මෙහිසි**

**පඤ්ච ඡින්දෙ පඤ්ච ජහෙ පඤ්ච චුත්තරි භාවයෙ,**
**පඤ්ච සඞ්ගාතිගො භික්ඛු ඔඝතිණ්ණොති වුච්චති.**

**ඣාය භික්ඛු මා ච පාමදො මා තෙ**
**කාමගුණෙ භමස්සු චිත්තං,**
**මා ලොහගුළං ගිලී පමත්තො මා කන්දි**
**දුක්ඛමිදන්ති ඩය්හමානො.**

**නත්ථි ඣානං අපඤ්ඤස්ස පඤ්ඤා නත්ථි අඣායතො,**
**යම්හි ඣානඤ්ච පඤ්ඤා ච සවෙ නිබ්බානසන්තිකෙ.**

**සුඤ්ඤාගාරං පවිට්ඨස්ස සන්තචිත්තස්ස භික්ඛුනො,**
**අමානුසීරති හොති සම්මා ධම්මං විපස්සතො.**

**යතො යතො සම්මසති ඛන්ධානං උදයබ්බයං,**
**ලභතී පීතිපාමොජ්ජං අමතං තං විජානතං.**

**තත්‍රායමාදි භවති ඉධ පඤ්ඤස්ස භික්ඛුනො,**
**ඉන්ද්‍රියගුත්ති සන්තුට්ඨී පාතිමොක්ඛෙ ච සංවරො.**

**මිත්තෙ භජස්සු කල්‍යාණෙ සුද්ධාජීවෙ අතන්දිතෙ,**
**පටිසන්ථාරවුත්‍යස්ස ආචාරකුසලො සියා,**
**තතො පාමොජ්ජබහුලො දුක්ඛස්සන්තං කරිස්සති**

යම් මහණෙක් තෙමේ මෙත් විහරණ ඇතියේ බුදුසසුන්හි පහන් වූයේ ද, ඒ මහණ තෙමේ සංස්කාරයන් සන්සිඳුවන්නා වූ සැප වූ ශාන්තපදය ලබන්නේ ය. ශාන්තපදයට පැමිණෙන්නේ ය.

මහණ! මේ නැව ඉසපිය. තා විසින් ඉසපියනලද මේ නැව සැහැල්ලු ව වහාම නිවනට පැමිණෙන්නී ය. රාගබන්ධනය ද ද්වේෂ බන්ධනය ද සිඳහැර ඉනික්බිති නිවනට පැමිණෙන්නෙහි ය.

පසක් සිඳ හරින්නේ ය. පසක් දුරු කරන්නේ ය. පසක් මත්තෙහි වඩන්නේ ය. සඞ්ග පස ඉක්මවා ගිය මහණ තෙමේ ඔඝයෙන් එතෙර වූයේ ය යි කියනු ලැබේ.

මහණ! ධ්‍යාන වඩව. නො ද පමා වෙව. තාගේ සිත පස් කම් ගුණයෙහි නහමක් බමව. පමා වූයේ ලෝගුලි නො ගිල. දැවෙමින් මේ දුකැයි නො හඬව.

ප්‍රඥාව නැත්තහුට ධ්‍යානයෙක් නැත. ධ්‍යාන නො කරන්නහුට ප්‍රඥාව නැත. යමක්හු කෙරෙහි ධ්‍යානයත් ප්‍රඥාවත් ඇත් ද, හෙතෙමේ ඒකාන්තයෙන් නිවන සමීපයෙහි වේ.

ශූන්‍යාගාරයට පිවිසියා වූ සන්හුන් සිත් ඇත්තා වූ ධර්මය මනා කොට විදර්ශනා කරන්නා වූ මහණහුට මිනිසුන් පිළිබඳ නො වූ ඇල් මෙක් වේ.

යම් යම් කලෙක රූපාදිස්කන්ධයන්ගේ උදය - ව්‍යය නුවණින් සලකා ද එකල්හි ප්‍රීතිය හා ප්‍රාමෝද්‍යය ලබයි. එය නුවණැතියනට අමෘතය වේ.

මේ ශාසනයෙහි නුවණැති මහණහුට එහි මෙය මුල් කරුණ වේ. එනම්: ඉන්ද්‍රියසංවරය ද සන්තෝෂය ද ප්‍රාතිමෝක්ෂයෙහි සංවරය ද යන මේ ය.

පිරිසිදු දිවිපැවතුම් ඇති නො මැලි වූ කලණ මිතුරන් සෙවනය කරව. පිළිසඳර පැවැතුම් ඇත්තෙක් වන්නේ ය. ආචාරයෙහි දක්ෂයෙක් වන්නේ ය. ඒ හෙතුවෙන් ප්‍රාමෝද්‍යය බහුල කොට ඇති තෝ දුක් කෙළවර කරන්නෙහි ය..

**මෙත්තාවිහාරී යො භික්ඛු පසන්නො බුද්ධසාසනෙ** = යම් මහ-ණෙක් මෙත්විහරණ ඇතියේ බුදුසසුන්හි පහන් වූයේ ද.

මෙත් කමටහන්හි යොග කරණුයේ ද මෙත් වඩා චතුෂ්කනය විසින් ප්‍රථමද්ධ්‍යානාදිධ්‍යානත්‍රය හෝ පඤ්චකනය විසින් ධ්‍යාන චතුෂ්කය උපදවා ගෙණ සිටියේ '**මෙත්තාවිහාරී**' නම්.

**"මෙත්තාකම්මට්ඨානෙ කම්මං කරොන්තොපි මෙත්තාවසෙන තිකචතුක්කජ්ඣානෙ නිබ්බත්තෙත්වා ඨිතොපි මෙත්තාවිහාරී-යෙව නාම"** යනු අටුවා. මෙත් කමටහන් කතාව යට කියන ලදී[1]

ශීල - සමාධි - ප්‍රඥා සඞ්ඛ්‍යාත ශාසනධර්මය **'බුද්ධශාසන'** නම්. බුදු රජාණන් වහන්සේ විසින් දෙවියන් සහිත ලෝකය සසර දුකින් මුදලනු පිණිස දේශනා කළ ධර්මසමූහය නම් මේ ය. විස්තර කථාව යට කියන ලද ය.[2] තුනුරුවන් කෙරෙහි හා ශීල - සමාධි - ප්‍රඥා-වන්හි සැදැහැ ඇතියේ ඇදහීම් ඇතියේ විශ්වාසය ඇතියේ **පසන්න** නම්. **සද්ධාසම්පන්නතාය පසන්නො"** යනු ආචාර්‍ය්‍යවචනයි.

**අධිගච්ඡෙ පදං සන්තං සඞ්ඛාරූපසමං සුඛං** = සංස්කාරයන් සන්සිඳු වන්නා වූ ශාන්තපදය ලබන්නේ ය. ශාන්තපදයට පැමිණෙන්නේ ය.

මෙහි **පදං, සන්තං** යන දෙ පදයෙන් ම ගැණෙනුයේ නිවන ය. සසර දුකින් පීඩිත වූවන් විසින් පිළිපැදිය යුතු බැවින්, ආර්‍ය්‍යයන් විසින් පිළිපැදිය යුතු ලැබිය යුතු තත්ත්වය **'පද'** නම්. නිවන ය ඒ. **"සංසාරදුක්ඛපීළිතෙහි පටිපජ්ජිතබ්බත්තා = පදං, අරියෙහි පටිපජ්ජිතබ්බත්තා, ගන්තබ්බත්තා = පදං, නිබ්බානං"** යනු අටුවා.

නො සන්සිඳුනු සැහැවි ඇති රාගාදිකෙලෙශයන්ගේ හා සියලු සංස්කාරයන්ගේ අභාවයෙන්, ඔවුන්ගේ සන්සිඳීමෙන් ප්‍රශස්ත භාවයෙන් නිවන **'සන්ත'** නම්. **"අනුපසන්තසභාවස්ස රාගාදි-කිලෙසස්ස සබ්බසඞ්ඛාරස්ස ච අභාවෙන වූපසමභාවෙන පසත්ථභාවෙන ච සන්තං"** යනු, මේ මෙය කියූ සැටියි.

නිවන දුක්සැහැවි ඇති සියලු සංස්කාරයන්ගේ සන්සිඳීමෙහි හෙතු බැවින් **'සඞ්ඛාරූපසම'** නම්. **"දුක්ඛධම්මානං සබ්බසඞ්ඛාරානං උපසමහෙතුතාය සඞ්ඛාරූපසමං"** යනු අටුවා. එහෙයින් ම අත්‍යන්ත සුඛ වූයේ නිවන **'සුඛ'** නම්. මේ වනාහි පරමසුඛය ය. මෙසේ වූ ප්‍රණීත වූ නිවන ලබන්නේ යනු, **'අධිගච්ඡෙ'** යන ක්‍රියාපදයෙහි අරුත් ය.[3]

**සිඤ්ච භික්ඛු ඉමං නාවං සිත්තා තෙ ලහුං එස්සති** = මහණ! මේ නැව ඉසපිය. තා විසින් ඉසපියනලද මේ නැව සැහැල්ලු ව වහා ම නිවනට පැමිණෙන්නී ය.

1 19, 4. 'අහිංසා' යනු බලනු
2. 14, 4. 'එතං බුද්ධාන සාසනං' ,, ,,
3. 14, 6 'දුක්ඛස්ස ච අතික්කමං' ,, ,,

සාමාන්‍යලොකයා විසින් **'නාවං – නෞකා – නැව,**යි සම්මත කරගෙණ ඇති යානවිශෙෂය මෙහි නො යෙදේ. එය ගඞ්ගා සමුද්‍රාදිය තරණය කරණු පිණිස කාෂ්ඨාදියෙන් තනා ගන්නා ලද ය. **"නද්‍යාදිසන්තරණාර්ථකාෂ්ඨාදිනිර්මිතයානවිශෙෂඃ = නෞකා"** යනු කොෂ යි.

මෙහි **නාවං,** යන ද්විතීයාවිභක්ත්‍යන්තපදයෙන් ගැණෙනුයේ ආත්මභාවසඞ්ඛ්‍යාතනෞකා ය. ඒ මේ ආත්මභාවසඞ්ඛ්‍යාත නෞකාව කාමවිතර්කාදිමිථ්‍යාවිතර්කයන්ගෙන් පිරී ඉතිරී බර ව සිටියා ය. මිථ්‍යාවිතර්ක නැමැති ජලය උනා පිරී බරව සිටි මේ නෞකාව සසරසයුරෙහි ගැලී යන්නී ය. ගොඩලනු පහසු නැත. එහෙයින් නිර්වාණසඞ්ඛ්‍යාතපරතීරයට යනු කැමැත්තහු විසින් ඒ මිථ්‍යා-විතර්කජලය මුළුමනින් මදකුත් ඉතිරි නො කොට ඉසපිය යුතු ය. ඉසපියන්නැයි වදාළේ එහෙයිනි.

මහමුහුදෙහි ගමන් ගත් නැවක, සිදුරුවලින් ඇතුළට දිය වදනා සිදුරු වසා දමා ඇතුළට වත් දිය ඉසපියනලද නම් නැව සැහැල්ලු ව ගොසින් මුහුදෙහි නො ගැලී වහා පටුන් තොටට පැමිණෙන්නී යම්සේ ද එපරිද්දෙන් මිථ්‍යාවිතර්කජලයෙන් පිරී ගිය ආත්මභාවනෞකාව, ඇස් – කන් – නාස් ඈ සිදුරු, සමාති සංවරයෙන් වසා විදර්ශනාහස්තයෙන් ඉසපී කල්හි සැහැල්ලුබවට පැමිණ සසරමුහුදෙහි නො ගැලී නිවන්පරතෙරට වහා පැමිණෙන්නී ය. මේ අටුවා: **"යථා මහාසමුද්දෙ උදකසෙසව භරිතනාවං ඡිද්දානි පිදහිත්වා උදකස්ස සිඤ්චනතාය සිත්තා සල්ලහුකා හුත්වා සමුද්දෙ අනොසීදිත්වා සීඝං සුපට්ටනං ගච්ඡති, එවං නාවාසි අයං මිච්ඡාවිතක්කඋදකභරිතං අත්තභාවනාවං චක්ඛුද්වාරානි ඡිද්දානි සතිසංවරෙන පිදහිත්වා උප්පන්නස්ස මිච්ඡාවිතක්කඋද-කස්ස සිඤ්චනතාය සිත්තා සල්ලහුකා සංසාරවට්ටෙ අනොසීදිත්වා සීඝං නිබ්බානං ගමිස්සති"** යනු.

**ඡෙත්වා රාගං ච දොසං ච තතො නිබ්බානං එහිසි** = රාග-බන්ධනයත් ද්වෙෂබන්ධනයත් සිඳ හැර ඉතික්බිති නිවනට පැමිණෙන්නෙහි ය.

**"රාගො බන්ධනං, දොසො බන්ධනං"** යනු වදාළෙන් රාග ද්වෙෂයත් සත්වයා සසර බැඳ තබන බන්ධන බැවිනි. අපාය ගමනීය වූ රාගද්වෙෂයෝ ස්‍රොතාපත්තිමාර්ගයෙන් ද, ඖදාරික වූ කාමරාග ද්වෙෂයෝ සකෘදාගාමිමාර්ගයෙන් ද රාග ද්වෙෂයෝ අනවශෙෂ ව ඉතිරි නැති ව අනාගාමිමාර්ගයෙන් ද භවරාගය අර්හත්මාර්ග-යෙන් ද ප්‍රහීණ වෙත්. සිඳ හැරිය යුතු වෙත්. යම් කිසි මහණකු,

යම් කිසි මෙහෙණක, යම් කිසි උවසුවකු, යම් කිසි උවැසියක පිළිබඳ වූ රාගද්වෙෂයෝ මාර්ගයෙන් ප්‍රහීණ නො වූවාහු ද, ඒ තාක් ඒ මහණ ඒ මෙහෙණ ඒ උවසු ඒ උවැසි කෙලෙස්මරුට බැඳුනෝ ය. එහෙයින් වදාළෝ **"බන්‍ධො මාරස්ස"** යනු. කෙලෙස්මරු විසින් බඳනාලද මොවුහු අභිසංස්කාරාදී වූ මරුන් විසින් ද බඳනා ලද්දාහු වෙත්. රාගද්වෙෂාදිකෙලශයන් සිඳහැරිය පසු ආත්මභාවසඞ්ඛ්‍යාත නෞකාව නිරුපධිශෙෂනිර්වාණයට පැමිණෙත්නී ය.

**පඤ්ච ඡින්දෙ** = පසක් සිඳින්නේ ය.

සක්කායදිට්ඨි - විචිකිච්ඡා - සීලබ්බතපරාමාස - කාමරාග - ව්‍යාපාද යන කාමලොකයෙහි උපත දෙන, කාමලොකයෙහි සත්ත්වයන් යොදාලන සංයොජන පස, පය බැඳි රැහැණක් සැතකින් කපා හරින්නකු මෙන් යට තුන් මගින් සිඳ හරින්නේ ය. සිඳ හැරිය යුතු ය.

**පඤ්ච ජහෙ** = පසක් දුරු කරන්නේ ය.

රූපරාග - අරූපරාග - මාන - උද්ධච්ච - අවිජ්ජා යන රූපලොක - අරූපලොකයන්හි උපත දෙන රූපාරූපලොකයන්හි සත්ත්වයන් යොදාලන සංයොජන පස, ගෙලබැඳි රැහැණක් ගලවා හරින්නකු මෙන් රහත්මගනුවණින් දුරු කරන්නේ ය. දුරු කළ යුතු ය.[1]

**පඤ්ච උත්තරි භාවයෙ** = මත්තෙහි පසක් වඩන්නේ ය.

දෙව්ලොවට පමුණුවන සංයොජනයන් ප්‍රහාණය කරණු පිණිස ලොකොත්තරකුශලචිත්තයෙහි උපදනා සද්ධා - විරිය - සති - සමාධි - පඤ්ඤා යන ඉන්ද්‍රිය පස, ඉතා තදින් ඉතා ඕනෑකමින් වැඩිය යුතු ය. නගා ගත යුතු ය. දියුණු කළ යුතු ය. අස්සද්ධා - කොසජ්ජ - මුට්ඨස්සච්ච - උද්ධච්ච - අවිජ්ජා යන මොවුන් මැඩලීමෙහි ලා අධිපති වෙත් නුයි ඉන්ද්‍රිය නම් වෙත්. ශ්‍රද්ධාදීහු යට කියන ලද හ. ශ්‍රද්ධාදි ඉන්ද්‍රියයන්ගේ වැඩීම වනුයේ දෙව්ලොව බඹලොව උපත දෙන සංයොජන පස, සුන් වී ගිය පසු ය. ප්‍රහාණය කළ විට ය.

**පඤ්ච සඞ්ගාතිගො භික්ඛු** = සඞ්ග පස ඉක්මවා ගිය මහණ තෙමේ.

පඤ්චස්කන්ධය, සත්ව - පුද්ගල විසින් බෙදා ගෙණ සංස්කාරයන් විෂයයෙහි ඇලීම **'සඞ්ග'** නම්. රාග - දෙස - මොහ - මාන - දිට්ඨි යන මේ පස ය මෙහි සඞ්ග. මොවුන් ඉක්මවා ගියේ **'පඤ්ච-**

---

1. 2, 8. 'සංයොජනං' යනු බලනු

**සඞ්ගාතිග'** නම්. **“රාගදොසමොහමානදිට්ඨිසඞ්ගානං අතික්කමෙන පඤ්චසඞ්ගාතිගො”** යනු අටුවා. සමහර තැනෙක සඞ්ග සතෙක් ද වන්නේ ය.[1]

**ඔඝතිණ්ණො ති වුච්චති** = ඔඝ තරණය කෙළේ ය යි කියනු ලැබේ.

කාම – භව – දිට්ඨි – අවිජ්ජා යන මොවුහු ඔඝයෝ ය. මෙ කියූ ඔඝයනට හසු නො වී උන් මැඩ ගෙණ රාගාදිසඞ්ගයන් ඉක්මවා ගිය මහණ ම ඔඝයන්ගෙන් එතෙරට ගියේ **'ඔඝතිණ්ණ'** නම්.[2]

**ඣාය භික්ඛු** = මහණ! ධ්‍යාන වඩව. ශමථවිදර්ශනා භාවනාවෙහි යෙදී වසව.

ආලම්බනොපනිජ්ඣාන-ලක්ඛණූපනිජ්ඣාන යන දෙපරිදි වූ ධ්‍යාන වඩ ව, යනු සුගතොවාදය යි. ආලම්බනොපනිජ්ඣාන නම්: අෂ්ටසමාපත්තීහු ය. ලක්ඛණූපනිජ්ඣාන නම්: විදර්ශනා මාර්ග ඵලයෝ ය.[3]

**මා ච පමාදො** = නො ද පමා වෙව.

කාය සුචරිතාදි ත්‍රිවිධ සුචරිතයෙහි හා ධ්‍යානභාවනායෙහි පමා නො වන්න. පමා නො විය යුතු ය.[4]

**මා තෙ කාමගුණෙ භමස්සු චිත්තං** = තාගේ සිත පස්කම් ගුණයෙහි නො බමව.

රූප – ශබ්ද – ගන්ධ – රස – ස්ප්‍රෂ්ටව්‍ය යන මෙ පස කාම රාගයට කරුණු බැවින් සත්වයන් සසර බැඳ තබන බැවින් **'කාම ගුණ'** නම්.[5]

**මා ලොහගුළං ගිලී පමත්තො** = පමා වූයෙහි ලෝගුලි නො ගිල.

සිහියෙන් තොර ව ප්‍රමත්ත ව පස්කම්ගුණයෙහි ගිජු වූයේ නරකයෙහි ඉපද ගිනියම් කළ ලොහොගුලි ගිලින්නේ ය, යනු ඒකාන්ත ය. එහෙයින් එසේ ලොහොගුලි ගිලින්නකු නො විය යුතු ය. සිහියෙන් තොර වූයේ පස්කම්ගුණයෙහි ගිජු වූයේ එහිලා වැර කරණුයේ **'පමත්ත'** නම්.[6]

---

1. 13, 5 'කාමෙ සඞ්ගො' යනු බලනු
2. 2, 3. 'යං ඔඝො නාභිකීරති' ,, ,,
3. 2, 1. 'ඣායිනො' ,, ,,
4. 2, 1. 'පමාදෙ' ,, ,,
5. 4, 2 'ඡෙත්වාන මාරස්ස පපුප්ඵකානි' ,, ,,
6. 2, 1. 'පමත්තො' ,, ,,

**මා කන්දි දුක්ඛං ඉදං ඉති ඩය්හමානො** = දැවෙමින් මේ දුකැයි නො හඬ.

ප්‍රමත්ත ව පව්කම් කිරීමෙන් අපායයෙහි උපන් නිරිසත් තෙමේ නිරයගින්නෙන් දැවී දැවී 'මේ දුක ය, මේ දුකයැ'යි කියමින් හඬන්නේ ය. නිරය වනාහි හට ගත් තැන ම හට ගත් ගින්නෙන් අතර නැත්තේ ය. එහි ගිනිදැල් නැති තැනෙක් නැත්තේ ය. ගිනි නිවෙන ක්ෂණමාත්‍රයෙකුත් නැත්තේ ය. නිරයපාලයෝ නිරිසත් හුගේ මුව යවුල් බහා අරවා එහි ගිනි ගෙණ දිලිසෙන යගුලි බහා ලන්නෝ ය. එහෙයින් මෙසේ මොන ලෙසකිනුත් නො කියැකි දුකින් පිරී ගත් නිරයයෙහි ඉපද ගින්නෙන් දැවෙමින් ගිනියම් කළ යගුලි ගිලිමින් නො හැඬිය යුතු ය'යි මෙයින් වදාළ සේක. නිරය යෙහි ඉපැත්මට කරුණු වනුයේ පව්කම් ය. එහෙයින් පව්කම් නො කටයුතු ය.

**නත්ථි ඣානං අපඤ්ඤස්ස** = ප්‍රඥාව නැත්තහුට ධ්‍යානයෙක් නැත.

වීර්‍ය්‍යය හා එක් ව ගිය ධ්‍යාන උපදවන නුවණ නැත්තහුට ධ්‍යානයෙක් නම් නැත. යමකු පිළිසිඳ ගන්නා වේලෙහි පිළිසිඳ ගන්නා සිත්හි අලොභ - අදොස - අමොහ යන කුශලහෙතුත්‍රය යෙදුනේ නම් හෙතෙමේ ත්‍රිහෙතුක නම් වේ. ඒ ප්‍රතිසන්ධිය ඥාන-සම්ප්‍රයුක්තකාමාවචරකුශල විපාක ය. මෙයින් උපන්නේ ම ධ්‍යාන වැඩීමෙහි පොහොසත් වූ නුවණැත්තෝ ය. මෙසේ ත්‍රිහෙතුකප්‍රතිසන්ධිය නො ලැබුයේ මේ දිවියෙහි ධ්‍යාන වැඩීමට නො සුදුසු ය. අහෙතුක-ද්විහෙතුක ප්‍රතිසන්ධියෙන් උපන්නහුට කොතෙක් උත්සාහ කළ ද ධ්‍යාන නො ලැබිය හැකි ය. **'අපඤ්ඤස්ස'** යනුවෙන් ගැණෙනුයේ මෙ තෙමේ ය. එහෙත් මේ අත් බැව්හිද ඒ පිණිස උත්සාහවත් වියයුතු ය. එය ප්‍රයොජනය පිණිස නො වන්නේ නො වේ.

**පඤ්ඤා නත්ථි අඣායතො** = ධ්‍යාන නො කරන්නහුට ප්‍රඥාව නැත.

ධ්‍යානභාවනා නො කරන්නහුගේ සිත සමාහිත නො වන්නේ ය. සිතෙහි එකඟවීමෙක් නැත්තේ ය. එසේ එකඟ නො වූ සිත් ඇත්තහුට නාම - රූපධර්මයන්ගේ ඇති සැටිය දන්නා නුවණ ද නො වන්නේ ය. නාම - රූපධර්මයන්ගේ ඇති සැටිය දැන ගත හැකියේ විදර්ශනාඥානයෙනි. **"සමාහිතො යථාභූතං පජානාති"** යනු වදාළේ එහෙයිනි. ධ්‍යාන නැත්තහුට ඒ විදර්ශනා ඥානය ලබන්නට නො හැකි ය. **'පඤ්ඤා'** යනු මෙහි විදර්ශනා ප්‍රඥා ය.[1]

1. 20, 4. 'යදා පඤ්ඤාය පස්සති' යනු බලනු.

**යම්හි ඣානං ච පඤ්ඤා ච සො වෙ නිබ්බානසන්තිකෙ** = යමකු කෙරෙහි ධ්‍යානයත් ප්‍රඥවත් ඇත් ද හෙතෙමේ ඒකාන්ත-යෙන් නිවනසමීපයෙහි වේ.

මෙ කියූ ධ්‍යානයෙන් හා ප්‍රඥයෙන් යුක්ත පුද්ගල තෙමේ ම ඒකාන්තයෙන් නිවන සමීපයෙහි සිටියේ ය. නිවන වහා ලබනුයේ මෙ තෙමේ ය.

**සුඤ්ඤාගාරං පවිට්ඨස්ස** = ශූන්‍යාගාරයට පිවිසියා වූ.

විවික්තාවකාශ '**සුඤ්ඤාගාර**' නම්. හේ වනාහි ජනයාගෙන් තොර බිමයේ ය. මෙහි අරණ්‍යයත් වෘක්ෂමූලයත් හැර පර්වතය – කන්දරය – ගිරිගුහාය – සුසානය – වනප්‍රස්ථය – අභ්‍යවකාශය – පලාලපුඤ්ජය යන මේ ස්ථාන ශූන්‍යාගාරයෙහිලා ගණිත්. පැවිද්-දනට පැවිදිකම් කිරීමට සුදුසු ව සිටි මෙතැන් ජනසම්බාධයෙන් තොර වූ බැවින් ශූන්‍යාගාර යි කියනු ලැබේ. මෙතැන් සෙවුනහුට කායවිවේකය ලැබෙන්නේ ය.

**සන්තචිත්තස්ස භික්ඛුනො** = සන්සුන් සිත් ඇති මහණහුට.

විවික්තාවකාශයට වැද කර්මස්ථාන නො හැර කර්මස්ථාන මෙනෙහි කරමින් හුන් එහෙයින් ම නිවුනු සිතැති මහණහුට, යන අරුත්.

**අමානුසී රති හොති සම්මා ධම්මං විපස්සතො** = ධර්මය මනා කොට විදසුන් නුවණින් බලන්නහුට මිනිසුන් පිළිබඳ නො වූ ඇල්මෙක් වේ.

විදර්ශනාඥනයෙන් දැකිය යුත්තෝ නාමරූපධර්මයෝ ය. ඒ මේ නාමරූපධර්ම අනිත්‍යාදිවශයෙන් හෙතු සහිත ව මැනැවින් දක්නා වූ මහණහුට අමානුෂිකරතිය උපදනී ය. නාම – රූපධර්ම යට කියන ලදි.[1]

මෙහි විදර්ශනාඥනයෙහි යෙදීමක් නැති අන්‍යපෘථග්ජනයන් විසින් නො ලැබිය හැකි මිනිසුන් පිළිබඳ නො වන අමානුෂික ප්‍රීතිය හා අෂ්ටසමාපත්තිසඞ්ඛ්‍යාතදිව්‍යරතිය ද '**අමානුසීරති**' යන් නෙන් ගැණේ. **"සම්මා හෙතුනා නයෙන ධම්මං විපස්සන්තස්ස අවිපස්සනාසඞ්ඛාතා අමානුසී රති, අට්ඨසමාපත්තිසඞ්ඛාතා දිබ්බාපි රති හොති"** යනු අටුවා.

**යතො යතො සම්මසති ඛන්ධානං උදයබ්බයං** = යම් යම් කලෙක රූපාදිස්කන්ධයන්ගේ උදය – ව්‍යය සලකා ද.

---

1. 20, 4 'සබ්බෙ සඞ්ඛාරා' යනු බලනු

**ලභති පීතිපාමොජ්ජං අමතං තං විජානතං** = එකල්හි ප්‍රීතිය හා ප්‍රාමෝද්‍යය ලබයි. එය නුවණැතියනට අමෘතය වේ.

පඨවිකසිණ – ආපොකසිණාදී වූ අටතිස් අරමුණෙහි පරිකර්ම-භාවනා කරන්නා වූ මහණ තෙමේ යම් යම් ආකාරයෙකින් හෝ පෙරවරු පස්වරු ආදී වූ යම් යම් කලෙක්හි හෝ තමා කැමති වන ලද කමටහනෙක යොග කරමින් රූප-වේදනාදී වූ ස්කන්ධ පසෙහි උදය = හටගැණීම, “**අවිජ්ජා සමුදයා රූපසමුදයො**” යනාදී වූ පස් විසිඅයුරෙන් හා ව්‍යය = විනාශය, “**අවිජ්ජානිරොධා රූපනිරොධො**” යනාදී වූ පස් විසි අයුරෙන් හා යන සම පණස් අයුරෙන් සලකා බලා ද, එකල්හි ඒ මහණ තෙමේ ධර්මය නිසා උපන් ප්‍රීතිය හා ප්‍රමුදිතභාවය ද ලබන්නේ ය. ප්‍රත්‍යය සහිත නාම-රූපධර්මයන් ප්‍රකට ව වැටහෙන කල්හි උපදනා ඒ ප්‍රීතිය හා ප්‍රමුදිතභාවය අමාමහනිවනට කරුණුවන බැවින් ‘අමෘත’ නම් වේ. මේ අටුවා: **අට්ඨතිංසාය ආරම්මණෙසු කම්මං කරොන්තො යෙන යෙනාකාරෙන පුරෙභත්ත පච්ඡාභත්තාදීසු වා කාලෙසු යස්මිං යස්මිං අත්තනො අභිරුචිතකාලෙ අභිරුචිතෙ කම්මට්ඨානෙ කම්මං කරොන්තො සම්මසති, උදයබ්බයන්ති පඤ්චන්නං ඛන්ධානං පඤ්චවීසතියා ලක්ඛණෙහි උදයං, පඤ්චවීසතියා ලක්ඛණෙහි වයං, එවං ඛන්ධානං උදයබ්බයං සම්මසන්තො ධම්මපීතිං ධම්මපාමොජ්ජං ච ලභති, අමතන්ති තං සප්පච්චයෙ නාමරූපෙ පාකටෙ හුත්වා උපට්ඨහන්තෙ, උප්පන්නං පීති-පාමොජ්ජං අමතමහානිබ්බානසම්පාපකත්තා විජානතං පණ්ඩිතානං අමතං එවාති අත්ථො**” යනු.

චිත්තතර්පණය, **පීති** නම්. ප්‍රමුදිත වූ පුද්ගලයාගේ හෝ සිතෙහි තත්ත්වය **පාමොජ්ජ** නම්. ප්‍රමුදිතභාවය වැඩී ගියේ ම පීති නම් වේ.

**තත්‍ර අයං ආදි භවති ඉධ පඤ්ඤස්ස භික්ඛුනො** = මේ ශාසනයෙහි නුවණැති මහණහුට එහි උදය – ව්‍යය සැලකීමෙහි දී මේ සිවු පිරිසිදු සීලය මුල් කරුණ වේ.

බුදුසසුන්හි නුවණැති මහණහුට සිවු පිරිසිදු සීලය පූර්වකාරණය වන බැවින් පළමු කොට එහි පිහිටා ගතයුතු ය. ඔහුගේ ජීවිතය චතුපාරිසුද්ධිසීලය ය. සීලයෙහි නො පිහිටා සිල්වත් නො වී ශමථ – විදර්ශනා භාවනා නො වැඩිය හැකි ය. යමෙක් සීලයෙහි නො පිහිටා එසේ කරන්නේ නම් ඔහුගේ ඒ උත්සාහය සිස් ය. අචිරස්ථිත ය. සීලයෙන් තොරවූවහුට බුදුසසුනෙහි ආස්වාදයෙක් නැත්තේ ය. හැම ගුණයකට සීලය මුල් ව සිටියේ ය. එහෙයිනි බුදුරජාණන් වහන්සේ වදාළේ “**තත්‍රායමාදිභවති**” යනු.

**ඉන්ද්‍රියගුත්ති** = ඉන්ද්‍රියසංවරය ද, ඉඳුරන් රැකීම ද.

චක්ඛු-සොත-ඝාන-ජිව්හා-කාය-මන යන සදෙරින් සිතට වැද ගන්නා වූ රූප-ශබ්ද-ගන්ධ-රස-සප්‍රෂ්ටව්‍ය-ධර්ම යන සවැදෑරුම් අරමුණෙහි රාගාදි කෙලෙස් නො ද උපදවා සිහි එළවා චක්ෂුරාදී වූ දොරටු රැක ගැණිම **'ඉන්ද්‍රියගුත්ති'** නම්.[1]

**සන්තුට්ඨි** = සිවුපසයෙහි ලද පමණින් සතුටුවීම.

මෙයින් ආජීවපාරිශුද්ධිශීලය හා ප්‍රත්‍යයසන්නිශ්‍රිතශීලය කියන ලද ය. ආජීවපාරිශුද්ධිශීල නම්: මිථ්‍යාජීවයෙන් වැළකී දිවිරැකීම ය. ප්‍රත්‍යයසන්නිශ්‍රිතශීල නම්: ප්‍රත්‍යවෙක්ෂා කොට සිවුපසය වැළඳීම ය.

**පාතිමොක්ඛෙ ච සංවරො** = ප්‍රාතිමොක්ෂශීලයෙහි සංවරය හික්මීම.

ප්‍රධානශීලය, ප්‍රාතිමොක්ෂශීලය යි. ශික්ෂාපදශීලය යි කියනුයේ ද මේ ය.[2]

**මිත්තෙ භජස්සු කල්‍යාණෙ** = කලණ මිතුරන් සෙවනය කරව.

**සුද්ධාජීවෙ** = පිරිසිදු දිවිවැටුම් ඇති.

**අතන්දිතෙ** = නො කුසීත වූ. අලස නො වූ.

සිවු පිරිසිදු සිල්හි පිහිටා එක්විසි අනෙස්නෙන් දුරුව ගෙපිළිවෙළින් පිඬු සිඟා ගොස් ලැබෙන සිවු පසයෙන් දිවි යවන නො කුසීත වූ දශකථාවස්තුලාභී වූ කල්‍යාණ මිත්‍රයන් සෙවනය කරව, යනු සුගතොවාදය ය.

**පටිසන්ථාරවුත්ති අස්ස** = පිළිසඳර පැවැතුම් ඇතියේ වන්නේ ය. පිළිසඳරකතා කරන්නකු වියයුතු ය.

ලොකයෙහි දෙ සිදුරෙක් ඇත්තේ ය. ඒ සිදුරු දෙකින් එක් සිදුරෙක්, පුටුවක් ඇතිරියකින් වසාලන්නා සේ වෙනසක් නො පෙණෙන පරිදි ආමිෂයෙන් වැසිය යුතු ය. ආමිෂයෙන් සිදුරු නො තබා ලොකය වසාලීම ආමිසපටිසන්ථාර නම්. ඒ වනාහි ලොකයට ආමිෂයෙන් කරණ සඞ්ග්‍රහය යි. ආමිසපටිසන්ථාරයෙන් ලොකය වසන්නහු විසින් තමන් ලත් ආමිෂය නො පහසා ඉඳුල් නො කොට එයින් කොටසක් නො ගෙණ ම මවුපියන්ට මහණවෙස් දරන්නවුන්ට වතාවත් කරන්නවුන්ට රජුට සොරුනට දිය යුතු ය. පහසා අතපත ගා දුන් කල්හි රජවරු සොරු නො ද

1. 1, 6. 'ඉන්ද්‍රියෙසු සුසං වුතං' යනු බලනු
2. 14, 4. පාතිමොක්ඛෙච ,, ,,

සතුටු වන්නෝ ය. සමහර විටෙක ඔවුන් ඒ නිසා ගැහැට ද කරණු හැකි ය. තමන් දත් ධර්මය අනුනට සකස් ව උගැන්වීම කියාදීම ධම්මපටිසන්ථාර නම්. ඒ වනාහි තමන් දන උගත් ධර්මය අනුනට උගන්වා කියා දී අනුන් උගතුන් කිරීම ය. මේ ආමිස – ධම්මපටිසන්ථාර ඇතිගේ **‘පටිසන්ථාරවුත්ති’** නම්.

**ආචාරකුසලො සියා** = ආචාරයෙහි දක්‍ෂයෙක් වන්නේ ය. ආචාර-යෙහි දක්‍ෂයකු විය යුතු ය.

මෙහි සීලය හා වතපිළිවෙත **ආචාර** නම්. එහි දක්‍ෂ වූයේ සිල් රකිනුයේ වත්පිළිවෙත් කරණුයේ **‘ආචාරකුසල’** නම්.

**තතො පාමොජ්ජබහුලො දුක්ඛස්ස අන්තං කරිස්සසි** = ඒ හෙතුයෙන් ප්‍රමුදිතභාවය බහුල කොට ඈත්තෙහි දුක් කෙළවර කරන්නෙහි.

පිළිසඳර පැවැතුම් ඇති බැවින් ද ආචාරයෙහි දක්‍ෂ බැවින් ද උපන් ධර්මයෙහි ප්‍රමුදිතභාවය බහුල කොට ඇතියේ සියලු සසරදුක කෙළවර කරන්නේ ය.

බුදුරජානන් වහන්සේ විසින් මෙසේ වදාළ මේ ගාථා අතුරෙහි එක් එක් ගාථායෙහි කෙළවර එක් සියය එක් සියය බැගින් භික්‍ෂූන් වහන්සේලා හුන් හුන් තැන්හි ම සිවුපිළිසැඹියාවන් ලබා රහත් වූහ. උන්වහන්සේලා හැම දෙන අහසට නැගී අහසින් ම එක්සිය-විසියොදුන් පමණ වූ කාන්තාරය පසු කොට දෙව්රමට ගොස් බුදුරජුන්ගේ රන්වන් සිරුරට තුති පුදමින් වැඳ සිටියහ.

**සම්බහුලභික්‍ෂුවස්තුව නිමි.**

# පිපි පරවීගිය මල් දැකීමෙන් නැඟූ වීයඝීය

## 25 — 8

**පන් සියයක්** භික්ෂූන් වහන්සේලා බුදුරජුන් වෙතින් කමටහන් උගෙණ වන වැද මහණදම් කරන්නාහු අළුයම පිපී එදවස ම පරවී නටුවෙන් ගැලවී වැටෙන ඉද්දමල් දැක "මේ මල් නටුවෙන් ගැලවී වැටෙන්නට පෙරාතු ව අපි රාගාදි කෙලෙසුන්ගෙන් මිදී ගන්නෙමු" යි වැර ඇරඹූහ. ඒ අතර බුදුරජාණන් වහන්සේ ඒ භික්ෂූන් බලා "මහණෙනි! මහණහු විසින් නම් නටුවෙන් ගැලවී වැටෙන මල්මෙන් සසර දුකින් ගැලවී ගන්නට මිදී ගන්නට උත්සාහ කටයුතු ය" යි වදුරා ගඳකිළියෙහි වැඩ හුන් සේක් ම ආලෝකධාරාවක විහිදුවා මේ ධර්මදෙශනාව කළ සේක.

**වස්සිකා විය පුප්ඵානි මද්දවානි පමුඤ්චති,**
**එවං රාගඤ්ච දොසඤ්ච විප්පමුඤ්චෙථ භික්ඛවො'ති.**

සමන් මල් වැල, පරවී මැලවී ගිය මල් යම්සේ නටුවෙන් මුදා හෙළා ද, මහණෙනි! එසේ රාගය ද ද්වෙෂය ද මුදා හරිවු.

**වස්සිකා විය පුප්ඵානි මද්දවානි පමුඤ්චති** = සමන් වැල, පරවී මැලවී ගිය මල් යම්සේ නටුවෙන් මුදා හෙළා ද,

**එවං රාගං ච දොසං ච විප්පමුඤ්චෙථ භික්ඛවො** = මහණෙනි! එපරිද්දෙන් රාගය ද ද්වෙෂය ද මුදා හරිවු. [1, 2]

මහණෙනි! අළුයම පිපුනු ඉද්දමල් බඳු වදමල් ආදිය එ දවස ම සවස යම්සේ පරවී ගැලවී වැටේ ද, එසේ තමුසේලාත් තම තමන්ගේ සිත්හි පවත්නා වූ රාග ද්වෙෂාදී වූ කෙලෙස් සිත් සතන්වලින් මුදා හළ යුතු ය යි බුදුරජාණන් වහන්සේ මෙසින් වදාළ සේක.

ධර්මදෙශනාවගේ අවසානයෙහි ඒ භික්ෂූන් වහන්සේලා රහත් බැව්හි පිහිටා ගත්හ.

**පඤ්චශත භික්ෂු වස්තුව නිමි.**

---

| | | | |
|---|---|---|---|
| 1. 1, 9. | 'රාගො' | යනු | බලනු |
| ,, ,, 14. | 'රාගං' | ,, | ,, |
| 2. 1, 1. | 'ධම්මා' | ,, | ,, |
| ,, 1, 7. | 'අසක්කාරෝ | ,, | ,, |

# සන්තකාය ස්ථවිරයන් වහන්සේ

## 25 – 9

**සන්තකාය** ස්ථවිරයන් වහන්සේ කවදාවත් කො තැනකදීත් කිසි කරුණක් නිසාත් අත්පා සෙලවීමක් නො කළ සේක. හැම වේලෙහි උන්වහන්සේ සන්හුන් අත්බැව් ඇති ව ම විසූහ. උන් වහන්සේගේ පැවැතුම් ජනප්‍රිය වූයේ ය. පෙර ජාතියෙහි සිංහ ව ඉපද සිට මෙහි උපන්හ. සිංහයෝ එක් දවසක් ගොදුරු ගෙණ රිදී රන් මැණික් පබළු ගුහාදීන් අතුරෙහි එක්තරා එකකට වැද සත් දවසක් රක්ගල් තලායෙහි හිරියල් සුණු මතු පිට නිදන්නාහ. සත්වනදා නින්දෙන් නැගිට වැදහොත් තැන බලා නගුට හෝ කන්පතක් හෝ අත්පා හෝ සලා ඒ හෙතුවෙන් රක්ගල්තලායෙහි හිරියල් සුණු විසිර ඇති බව දකිත් ද, මෙය තාගේ ජාතියට, ගොත්‍රයට නො සුදුසු ය'යි නැවැත සතියක් කෑම් බීම් හැර නිරාහාර ව නිදන්නෝ ය. යම් ලෙසකින් හිරියල් සුණු නො විසිර ඇති බව දකිත් ද, මෙය තාගේ ජාතියට ගොත්‍රයට සුදුසු ය'යි ගුහායෙන් නික්ම සිරුර කිලිපොලා දසදිග බලා තෙවරක් සිංහනාද කොට ගොදුරු සොයා යන්නෝ ය. සන්තකාය ස්ථවිරයන් වහන්සේ එබඳු වූ සිංහයොනියෙන් මිදී මෙ දවස මෙහි උපත ලැබූහ. උන්වහන්සේගේ සන්හුන් පැවැතුම් දුටු භික්ෂූන් වහන්සේලා බුදුරජුන් කරා ගොස් "ස්වාමීනි! අප විසින් මෙයට කලින් සන්තකාය ස්ථවිරයන් වහන්සේ වැනි සන්හුන් පැවැතුම් ඇත්තෙක් නො දක්නා ලද විරූ ය, හුන් සිටි කිසි තැනක දී උන්වහන්සේගේ අත්පා සෙලවීමෙක් අපට දක්නට ලැබුනේ නැත, සිරුර කිලිපොලාලීමෙක් ද දක්නට නො ලැබුනේ ය" යි දන්වා සිටියහ. එයැසූ බුදුරජානන් වහන්සේ "මහණෙනි! මහණහු නම් සන්තකාය නම මෙන් කය-වචන-සිත යන තිදොරින් සන්හුන් විය යුතු ය"යි වදාරා මේ ධර්‍මදෙශනාව කළ සේක.

**සන්තකායො සන්තවාචො සන්තවා සුසමාහිතො,**
**වන්තලොකාමිසො භික්ඛු උපසන්තොති වුච්චති**

සන්සුන් කය ඇති සන්සුන් වචන ඇති සන්සුන් සිත් ඇති මනාසේ සන්සුන් වූ වමාරා දැමූ පස්කම්ගුණ ඇති මහණ තෙමේ සන්සුන් යි කියනු ලැබේ.

**සන්තකායො** = සන්හුන් කය ඇති.

සතුන් මැරීම් ආදී වූ කායද්වාරයෙන් සිදු වන පව්කමින් වැළකී සිටියේ '**සන්තකාය**' නම්. මේ අටුවා:– "**පාණාතිපාතා-දීනං අභාවෙන සන්තකායො**" යනු.

**සන්තවාචො** = සන්හුන් වචන ඇති.

බොරු බස් බිණීම් ආදී වූ වාග්ද්වාරයෙන් සිදු වන පව්කමින් වැළකී සිටියේ **'සන්තවාච'** නම්. මේ අටුවා:- **"මුසාවාදාදීනං අභාවෙන සන්තවාචො"** යනු.

**සන්තවා** = සන්සුන් සිත් ඇති.

පරා අයත් දැයෙහි ගිජුකම් ආදී වූ මනොද්වාරයෙන් සිදු වන පව්කමින් වැළකී සිටියේ **'සන්තවා'** නම්. "මේ අටුවා: **"අභිජ්ඣාදීනං අභාවෙන සන්තං"** යනු.

**සුසමාහිතො** = මනාසේ සන්සුන් වූ.

කායාදිද්වාරත්‍රය මැනැවින් සන්හුන් බැවින් කායාදිද්වාරත්‍රයෙන් සිදුවන පව්කම් නැත්තේ **'සුසමාහිත'** නම්. මේ අටුවා:- **"කායාදීනං තිණ්ණම්පි සුට්ඨුසමාහිතත්තා සුසමාහිතො"** යනු.

**වන්තලොකාමිසො භික්ඛු** = වමාරා දැමූ පස්කම් ගුණ ඇති මහණ තෙමේ.

සෝවන්-සෙදගැමි-අනගැමි-රහත් යන සිවු මඟින් වමාරා දැමූ නසා හැරිය ලොකාමිෂය ඇත්තේ **'වන්තලොකාමිස'** නම්. මේ අටුවා: **"චතූහි මග්ගෙහි වන්තලොකාමිසස්ස වන්තත්තාය වන්තලොකාමිසො"** යනු.

**උපසන්තො ඉති වුච්චති** = සන්සුන් යි කියනු ලැබේ.

සිත් සතන්හි වූ රාගාදී වූ කෙලෙසුන් ඉතා සන්සුන් බැවින් **'උපසන්ත'** නම්. මේ අටුවා: **අබ්භන්තරෙ රාගාදීනං උපසන්තත්තාය උපසන්තො"** යනු.

කායාදිද්වාරත්‍රයයෙන් පව්කම් නො කරණ ආර්‍ය්‍ය මාර්ගයෙන් නසාලූ කම්සැපසෙවුම් ඇති කම්සැපසෙවුම් මුළුමනින් හැර සිටියා වූ එහෙයින් හොඳට තැන්පත් වූ මහණ තෙමේ ම ඉතා සන්සුන් යි කියයුතු ය.

ධර්මදෙශනාවගේ අවසානයෙහි ඒ ස්ථවිර තෙමේ රහත් බැව්හි පිහිටියේ ය. ධර්මදෙශනා තොමෝ පැමිණ සිටි පිරිසට ද වැඩ සහිත වූ ය.

**සන්තකාය ස්ථවිර වස්තුව නිමි.**

# නඞ්ගලකුල ස්ථවිරයන් වහන්සේ

## 25 — 10

**දුප්පත්** මිනිහෙක් අනුනට බැලමෙහෙ කොට ජීවත් වෙයි. භික්ෂුනමක්, දවසක් කිළිටි දිරූ රෙදි කඩක් ඇඳගෙණ නඟුලක් කර ගසා ගෙණ යන ඒ මිනිහා දැක "ඔය්! තමුසේට මෙසේ අනුනට බැලමෙහෙ කොට ජීවත්වීමට වඩා පැවිදි ව මහණදම් කිරීම නරක දැ?යි ඇසී ය. එවිට ඒ මිනිහා "ස්වාමීනි! ඉතා දුකසේ ජීවත් වන මා කවුරු පැවිදි කෙරෙත් දැ?"යි විචාළේ ය. "ඇයි, එසේ කියන්නෙහි? තමුසේ පැවිදි වන්නට කැමැති නම් මම තමුසේ පැවිදි කරන්නෙමි"යි ඒ භික්ෂුනම කී ය. "ස්වාමීනි! අවසර, හොඳම යි, ඔබවහන්සේ මා පැවිදි කරණ සේක් නම් පැවිදි වන්නෙමි"යි කැමැත්ත දැක් වූ කල්හි, ඒ භික්ෂුනම ඔහු ජේතවනයට ගෙණ ගොස් සියතින් ම නාවා භිසරුවුළු සිඳහැර මලුවෙහි දී ම පැවිදි කොට ඇඳ තුබූ රෙදි මාලුකඩත් නඟුලත් මලුවෙහි කෙළවරක තුබූ ගසක අත්තක තැබ්බ වී ය. පැවිද්දෙන් දවස් කිහිපයක් ගෙවා උපසපන් වූ ඒ මහණ උපසපන් වූ කාලයෙහි දී ම නඞ්ගලකුලස්ථවිර යි ප්‍රසිද්ධියට ගියේ ය. බුදුරජානන් වහන්සේට ලැබුනු ලාභ සත්කාරයෙන් ජීවත් වන ඒ මහණ මද කලක් යත් ම සසුනෙහි උකටලී ව උකටලීබව හැරගත නො හී "සැදැහවතුන් දෙන සිවුරු වැළඳ ගෙණ හිඳීම නො සුදුසු ය"යි කඩමාලු රඳවා තුබූ ගස මුලට ගොස් "විළිනැත්ත! තෝ මේ කඩමාල්ල දවටා ගෙණ සිවුරු හැර දමා බැලමෙහෙ කොට ජීවත්වනු කැමැත්තෙහි"යි තමත් තමන්ට මෙසේ අවවාද කරත් ම ඇති ව තුබූ උකටලී බව තුනී ව ගියේ ය. එයින් ඔහු පෙරළා ආයේ ද නැවැතත් කීප දවසක් යත් ම උකටලී ව කඩමාලු තුබූ තැනට ගොස් ඒ වරත් පෙරසේ ම තමාට තෙමේ අවවාද කෙළේ ය. එ කල්හි අන්‍ය භික්ෂූන් වහන්සේලා ගස මුලට යන එන මොහු දැක "ඇවැත්නි! නඞ්ගල! කුමක් නිසා නිතර ගස මුලට යහු දැ?"යි ඇසූහ. "ස්වාමීනි! ගුරුන් වෙත යමි"යි හේ කී ය. මෙසේ කියා නැවැත නැවැතත් එහි ගියේ කඩමාල්ල හා නඟුල ම කමටහන් දෙන ගුරුන් කොට ගෙණ රහත් වූයේ ය. භික්ෂූන් වහන්සේලා ඔහු හා කෙළිකවටකම් කරමින් "ඇවැත්නි! නඞ්ගල! තා යන එන මඟ දැන් නො යා යුතු තැනක් මෙන් වල් ගැසී ඇත, අපට පෙණෙනුයේ තා දැන් ගුරුන් වෙත නො යන්නා සේ ය"යි කීවිට "ස්වාමීනි! එසේ ය, බැඳීමක් එක්වීමක් තුබූ දවස්වල මම එහි ගියෙමි, දැන් ඒ බැඳීම් එක්වීම් හැම එකක් සිඳී ගොස් ඇත, එහෙයින් දැන් එහි නො යමි"යි කීය. භික්ෂූන් වහන්සේලා ඔහුගේ මේ කතාව අසා "මෙ තෙමේ බොරු

කියා තමන් රහත් වූ සැටියක් කියා පාන්නේ ය''යි සිතා බුදු-රජාණන් වහන්සේට නඞ්ගලකුල තෙරුන්ගේ මේ කතාව දන්වා දූහ. එකල්හි බුදුරජාණන් වහන්සේ ''මහණෙනි! මාගේ පුත් බොරු නො කියන්නේ ය, ඔහු, තෙමේ තමාට චොදනා කොට පැවිදිකිසෙහි මුදුනට පැමිණියේ ය''යි වදාරා මේ ධර්මදේශනාව කළ සේක.

**අත්තනා චොදයත්තානං පටිමාසෙථ අත්තනා,**
**සො අත්තගුත්තො සතිමා සුඛං භික්ඛු විහාහිසි.**

**අත්තා හි අත්තනො නාථො අත්තා හි අත්තනො ගති,**
**තස්මා සඤ්ඤමයත්තානං අස්සං භද්‍රංව වාණිජො.**

තෙමේ ම තමාට චොදනා කරව. තෙමේ ම තමා විමසව. මහණ! එසේ වූ තෝ තමා විසින් ම රක්නාලද්දෙහි. සිහි ඇත්තෙහි සුවසේ වසන්නෙහි. යම්හෙයකින් තෙමේ තමාට පිළිසරණ වේ ද, එහෙයින් උතුම් අසකු රක්නා වෙළඳකු මෙන් තමා මිනාකොට රකුව.

**අත්තනා චොදය අත්තානං** = තෙමේ තමාට චොදනා කරව.

මහණ! නිවන් පිණිස පවත්නා මේ උතුම් සසුනෙහි පැවිදිව ගෙණ කළ කම් කියූ බස් සිතූ සිතිවිලි යහපත් ද, අයහපත් ද, නිවන් පිණිස පවත්නේ ද, නො පවත්නේ ද, තමාට වැඩ පිණිස වන්නේ ද, නො වන්නේ ද, සගසුව පිණිස වන්නේ ද, නො වන් නේ ද, අපාදුක් පිණිස වන්නේ ද, නො වන්නේ දැයි තෝ ම තට චොදනා කරව.

**පටිමාසෙථ අත්තනා** = තෙමේ තමා විමසව. පරීක්‍ෂා කර බලව.

මහණ! වත්පිළිවෙත් කරන්නහුට, බණදහම් උගන්නහුට, කමටහන්හි යෙදෙන්නහුට, දව රෑ දෙක ඉක්ම යේ ද, නැත, එසේ වත්පිළිවෙත් නො කරන්නහුට, බණදහම් නො උගන්නහුට, කමටහන්හි නො යෙදෙන්නහුට, දව රෑ දෙක ඉක්ම යේ දැ යි තෙමේ ම තමා ගැණ විමසා බලව.

**සො අත්තගුත්තො සතිමා සුඛං භික්ඛු විහාහිසි** = මහණ! එසේ වූ තෝ තමන් විසින් ම රක්නාලද්දෙහි. සිහි ඇත්තෙහි. සුවසේ වසන්නෙහි.

මෙසේ තමන් තමාට අවවාද කරණ කල්හි, තමන් තමන් ගැණ විමසන කල්හි තමන් විසින් ම තෙමේ රක්නා ලද්දේ වේ. සිහි ඇත්තේ වේ. සතර ඉරියව්වෙහි ම සුවසේ වසන්නේ වේ. මෙ තෙමේ ම **'අත්තගුත්ත'** නම්.

**අත්තා හි අත්තනො නාථො අත්තා හි අත්තනො ගති** = යම් හෙයකින් තෙමේ තමාට පිහිට ද යම් හෙයකින් තෙමේ තමාට පිළිසරණ ද.

**තස්මා සඤ්ඤමය අත්තානං අස්සං භද්‍රං ඉව වාණිජො** = එහෙයින් උතුම් අසකු රක්නා වෙළෙඳකු මෙන් තමා මනා කොට රකුව. දමව. හික්මවා ගණුව.

මෙරමා අත්බවෙහි පිහිටා කුසල් කොට සවර්ගීය පිහිට කොට ඇත්-තකු හෝ මාර්ගීය වඩා සාක්ෂාත් කළ ඵල ඇත්තකු හෝ වන්නට නො හැකි ය. එසේ නම් අන් කවර නම් එකෙක් අන් කවර නම් එකක්හට එහි පිහිට වන්නේ ද, පිළිසරණ වන්නේ ද, එහෙයින් තෙමේ ම තමාට පිහිට වේ. තෙමේ ම තමාට පිළිසරණ වේ. උතුම් අශ්වජාතියකු නිසා ලාභ ලබන අස්වෙළෙන්ද, ඌට විසම තැන හැසිරෙන්නට නො දී දවසට තෙවරක් නාවා කවා පොවා පිළිදගුම් කරන්නේ යම්සේ ද, එසේ තෝ ද නූපන් අකුසලයනට උපදනට නො දී පමා බැවින් සිහි මූළායෙන් උපන් අකුසල් දුරු කරමින් තමා රකුව. එකල්හි තට ලොවී ලොවුතුරු සැප සිඬ කට හැකි ය. එහෙයින් එසේ කළ යුතු ය.

ධර්මදෙශනාවගේ අවසානයෙහි බොහෝ දෙන සෝවාන් පලාදියට පැමිණියාහු ය.

**නඞගලකුල ස්ථවිරවස්තුව නිමි.**

# වක්කලි ස්ථවිරයන් වහන්සේ

## 25 — 11

වක්කලි ස්ථවිරයන් වහන්සේ සැවැත් නුවර බ්‍රාහ්මණ කුලයෙක ඉපිද වැඩි විය පැමිණියාහු දවසක් පිඬු සිඟා වඩින බුදුරජාණන් වහන්සේ දුටහ. එහි දී උන්වහන්සේගේ දෙහශොභාව බලා ඒ දැකීමෙන් සෑහීමට නො පැමිණ "පැවිදි වූයෙම් නම් නිතර බුදුරජුන් දක්ක හැකි ය"යි බුදුරජුන් වෙත ගොස් පැවිදි වූහ. ඉන් පසු යම් තැනක සිටි කල්හි බුදුරජුන් දක්ක හැකි නම් එ තැනට ගොස් හැදෑරීම් කමටහන් වැඩීම් කමටහන් මෙනෙහි කිරීම් හැර දමා බුදුරජුන් දෙස බලමින් සිටිත්. බුදුරජාණන් වහන්සේ වක්කලි තෙරුන්ගේ නුවණ මෝරා යන තුරු කිසිත් නො බැණ සිට නුවණ මෝරා ගිය පසු "වක්කලි! දෙතිස් කුණු කොටසින් පිරී ගත් මාගේ සිරුර දෙස බලබලා ඉඳීමෙන් තමූසේට ලැබෙන ප්‍රයොජනය කුමක් ද? වක්කලි! යමෙක් නුවණැසින් ධර්මය දකී නම් හේ මා දක්තේ වන්නේ ය" යි අවවාද කළ සේක. මෙසේ අවවාද කරණ ලද්දාහු ද වක්කලි ස්ථවිරයන් වහන්සේ බුදුරජුන් නො දැක ඉන්නට අපොහොසත් වූහ. ඉක්බිති බුදුරජාණන් වහන්සේ "මේ මහණ සංවෙගයක් නො ලබා ධර්මාවබොධය නො කරන්නේ ය"යි වස් වසන දවස ළං ව තිබිය දී රජගහා නුවරට වැඩම කොට වස් වසන දවසෙහි "වක්කලි! මෙතැනින් පලා යව"යි නෙරපා හැරිය සේක.

ඉක්බිති වක්කලි ස්ථවිරයන් වහන්සේ, "බුදුරජාණන් වහන්සේ මා හා කතා නො කරණසේකැ"යි සංවෙගයට පැමිණියහ. එහෙයින් තෙමසක් ම බුදුරජුන් ඉදිරියෙහි සිටින්නට අපොහොසත් වූ ඒ ස්ථවිරයන් වහන්සේ "බුදුරජුන් නො දක්නා මේ ජීවිතයෙන් මට වැඩෙක් නැත, කන්දක් මුදුනට නැගී එයින් පැන දිවි නසා ගණිමි"යි ගිජ්ඣකූළ පව්ව මුදුනට නැංගාහ. බුදුරජාණන් වහන්සේ ඔහු විඳින වෙහෙස දැක "මේ මහණ මා වෙතින් අස්වැසිල්ලක් නො ලැබුයේ නම් මාගී ඵලයන් ලබා ගැණීමට ඇති වාසනාව ද නසා ගන්නේ ය"යි තමන් වහන්සේ පෙණෙන පරිදි ආලොක ධාරාවක පතුරුවා හැරිය සේක. ඒ ආලොකධාරායෙන් බුදුරජුන් දුටු වක්කලි තෙරුන්ගේ මහත් වූ ශොකය බුදුරජුන් දුටු කෙණෙහි ම පහව ගියේ ය. බුදුරජාණන් වහන්සේ වියලී ගිය විලක් මහත් දිය පහරකින් පුරන්නා සේ වක්කලි තෙරුන්ට ප්‍රීතිප්‍රාමොද්‍යය බලවත් සේ උපදවාලන්නට මේ ධර්මදෙශනාව කළ සේක.

**පාමොජ්ජබහුලො භික්ඛු පසන්නො බුද්ධසාසනෙ,**
**අධිගච්ඡෙ පදං සන්තං සඞ්ඛාරූපසමං සුඛන්ති.**

ප්‍රාමෝද්‍යය බහුල කොට ඇති බුදුසසුන්හි පහන් වූ මහණ තෙමේ සංස්කාරයන් සන්සිඳු වන්නා වූ එහෙයින් සැප වූ ශාන්ත පදයට පැමිණෙන්නේ ය. ශාන්ත පදය ලබන්නේ ය.

**පාමොජ්ජබහුලො භික්ඛු පසන්නො බුද්ධසාසනෙ** = ප්‍රාමෝද්‍යය බහුල කොට ඇති මහණ තෙමේ බුදුසසුන්හි පහන් වූයේ.

**අධිගච්ඡෙ පදං සන්තං සඞ්ඛාරූපසමං සුඛං** = සංස්කාරයන් සන්සිඳු වන්නා වූ එහෙයින් ම සැප වූ ශාන්ත පදයට පැමිණෙන්නේ ය.

ප්‍රකෘතියෙන් ප්‍රාමෝද්‍යය බහුල කොට ඇති මහණ තෙමේ බුදුසසුන්හි පැහැදීම රුචි කරන්නේ ය. ඔහු මෙසේ බුදුසසුන්හි පහන් වූයේ සියලු සංස්කාරයන් මුළු මනින් සන්සිඳු වන්නා වූ එහෙයින් ඒකාන්තයෙන් සැප වූ ශාන්තපද නම් වූ නිවනට පැමිණෙන්නේ ය. නිවන් ලබන්නේ ය.

මේ ධර්මදේශනාව කළ බුදුරජාණන් වහන්සේ වක්කලි තෙරුන් දෙසට ශ්‍රීහස්තය දිගු කොට,

“බුදුහු දෙස බලමින් – එව නො බව වක්කලි! මෙහි
උදුරා හරිමි මම තා – මඩෙරුණු ඇතකු සේ දූන්.

බුදුහු දෙස බලමින් – එව නො බව වක්කලි! මෙහි,
උදුරා හරිමි මම තා – රාහුගිලගත් හිරුසේ

බුදුහු දෙස බලමින් – එව නො බව වක්කලි මෙහි
උදුරා හරිමි මම තා – රාහු ගිලගත් සඳු සේ”

යන මේ තුන් ගය වදාළ සේක.

වක්කලි ස්ථවිරයන් වහන්සේ, “බුදුරජාණන් වහන්සේ මා විසින් දක්නා ලද සේක, මෙහි එව,යි මා කැඳවන සේකැ” යි බලවත් ප්‍රීතිය උපදවා ගමන් මග නො දක්නාහු බුදුරජුන්ගේ ඉදිරියෙහි අහසට නැග පළමු පා, තන්දෙහි තිබිය දී ම බුදුරජුන් වදාළ ගාථාවන් ආවර්ජනා කරන්නාහු අහසෙහි දී ම ප්‍රීතිය යටපත් කොට පිළිසැඹියාවන් සමග රහත්බව ලැබූහ. ඉන් පසු බුදුරජුන්ට නමස්කාර කරමින් අහසින් බැස බුදුරජුන් ඉදිරියෙහි පෙණී සිටියහ. ටික දවසකට පසු බුදුරජාණන් වහන්සේ වක්කලි තෙරුන් ශ්‍රද්ධාධිමුක්තක භික්ෂූන් අතුරෙහි අග්‍රස්ථානයෙහි තැබූ සේක.

**වක්කලිස්ථවිර වස්තුව නිමි**

# සුමනසාමණේරයන්ගේ ආනුභාවය

**25 — 12**

**පියුමතුරා** බුදුරජානන් වහන්සේගේ කාලයෙහි එක් කුල-පුත්‍රයෙක්, පියුමතුරා බුදුරජුන් විසින් භික්‍ෂු නමක් තම සසුන්හි දිව්‍යැස් ඇතියවුන් අතුරෙහි අග තැන්හි තබනු දුටුයේ ය. දැක ඒ සැපත පතමින් බුදුරජුන් පවරා සත් දවසක් බුදුපාමොක් මහ සඟනට මහදන් දී අවසානයෙහි බුදුරජුන් ඉදිරියෙහි හිඳ "ස්වාමීනි! මමත් එන දවස බුදු කෙනකුන්ගේ සසුන්හි දිව්‍යැස් ඇතියවුන් අතුරෙහි අග්‍ර වන්නට ප්‍රාර්ථනා කරමි"යි ප්‍රාර්ථනා තැබී ය. ඉක්බිති බුදුරජනන් වහන්සේ එ වේලෙහි කල්පලක්‍ෂයකින් ඔබ බලන සේක් ඔහුගේ පැතීම සමෘද්ධ වන බව දැක "මෙයින් කල්ප ලක්‍ෂයකින් ඔබ්බෙහි **ගෞතම** නම් බුදුකෙනකුන්ගේ සසුන්හි දිව්‍යැස් ඇතියවුන් අතුරෙහි අග්‍ර වූ **අනුරුද්ධ** නම් ස්ථවිර වන්නේ ය"යි වදාළ සේක. ඔහු ද ඒ සම්පත්තිය හෙට ම ලැබෙන්නක් සේ සිතා පින්කම් කෙළේ ය. පියුමතුරා බුදුරජුන් පිරිනිවි කල්හි "දිව්‍යැස් ලැබීමට උපකාර වූ පින්කම් කවරේ දැ?"යි භික්‍ෂූන් විචාරා සත් යොත්නක් පමණ වූ රන්සෑයක් වට කොට නොයෙක් පහන් රුක් දහස් ගණනක් කරවා පහන් පූජා කෙළේ, ඒ අත්බැවින් මිදී දෙව්ලොව උපන්නේ ය කල්පලක්‍ෂයක් මෙසේ දෙව් මිනිසුන් අතුරෙහි සැරිසැරූ හෙ තෙමේ මේ කාලයෙහි බරණැස් නුවර දිළිඳු කුලයෙක උපන්නේ **සුමන** සිටානන්ගේ අසුන්ට තණකොළ ගෙණ එන්-නෙක් ව ජීවිකාව කෙළේ ය. නම **අන්නභාර** නම් වී ය.

සුමන සිටු තෙමේ ද එනුවර නිතර මහදන් දෙන්නෙක් වූයේ ය. මේ කාලයෙහි එක් දවසක් **උපරිට්ඨ** නම් පසේ බුදු රජානන් වහන්සේ **ගන්ධමාදන** පර්වතයෙහි නිරෝධසමාපත්තියට සමවැද ඉන් නැගී සිට "කවරක්හට මම අද සඞ්ග්‍රහ කරන්නෙම්-දැ"යි බලා වදාළ සේක. "අද මා විසින් අන්නභාරයාහට අනුග්‍රහ කළ යුතු ය, දැන් ඔහු වනයෙන් තණ ගෙණ එන්නේ ය" යි උන් වහන්සේ පා සිවුරු ගෙණ සෘද්ධියෙන් අවුත් අන්නභාරයාගේ ගෙදොර මිදුලෙහි වැඩ සිටි සේක. අන්නභාර හිස් පාත්‍රයක් අතේ ඇති ව සිටි උන්වහන්සේ දැක "කිමෙක් ද, ස්වාමීනි! වැළඳිය යුතු කිසිවක් ලැබුහු දැ?" යි ඇසි ය. "පිණැත්ත! ලබන්නමෝ"යි උන් වහන්සේ වදාළ විට "මදක් බලාපොරොත්තු වනු මැනැවැ" යි තණකොළකද පසෙක දමා ගෙට දුව ගොස් "සොඳුර! මට තැබූ බත් කොටස තිබේ දැ?"යි බිරියගෙන් අසා "හිමියෙනි! ඇතැ" යි ඇය කී විට ආපසු පසේ බුදුරජුන් වෙත දුව ගොස් පාත්‍රය ගෙණ

“දෙනු කැමැති කල්හි දෙන්නට දෑයෙක් මට නැත්තේ ය, දිය යුතු දෑයක් ඇති කල්හි දෙන්නට සුදුස්සෙක් නැත්තේ ය, අද නම් වැඩිදුර නො ගොස් සොයා නො බලා ම දෙන්නට සුදුස්සෙක් මුණ ගැසුනේ ය, දෙන්නට නිසි දෑයෙක් ද ඇත්තේ ය, අද නම් වූයේ මහත් ලාභයෙකැ” යි ගෙට ගොස් තමන්ට කන්නට තුබූ බත් කොටස පාත්‍රයෙහි බහා ගෙණවුත් පසේ බුදුරජුන්ගේ අත තබා,

“මේ දත් පිණෙනි මට – දිළිඳුබව නො ම වේවා,
නැත යන රළු වදන් කිසි – බවයෙක්හි නොම වේවා”

සවාමිනි! මේ කටුක දිළිඳු දිවියෙන් මිදෙම්වා, නැත යන බසකුත් නො ම අසන්නෙම් වා”යි ප්‍රාර්ථනා තැබී ය.

එකල්හි පසේ බුදුරජානන් වහන්සේ “පිණැත්ත! එසේ වේවා” යි අනුමෝදනා කොට ගන්ධමාදනපර්වතයට වැඩි සේක. ඒ වේලෙහි සුමන සිටුහුගේ සේසත අරක් ගත් දෙවියා උපරිට්ඨ පසේබුදු රජුන් කෙරෙහි පිහිටුවනලද දානය බලා “අනේ, යහපත, මේ නම් පරමදානයකැ”යි තුන් වරක් සාධුකාර දුන්නේ ය. සිටු, දෙවියා හැඳින තෝ “මෙතෙක් කල් මා දත් දෙනු නො දුටු-වෙහි දැ?”යි ඇසූ කල්හි “මම ඔබගේ දානයට සාධුකාර නො දෙමි, ඔබගේ දානය අන්නභාරයාගේ දානය තරම් උතුම් නො වේ, අන්නභාරයා විසින් උපරිට්ඨ පසේ බුදුරජුන්හට දුන් පිණ්ඩපාතය ම උතුම් ය, එහි පැහැද මා විසින් මේ සාධුකාරය පවත්වනලද්දැ”යි කියේ ය. සිටු “මෙය මහත් අරුමයෙක, මෙය මහත් පුදුමයෙක, මම මෙතෙක් කල් දෙන්නෙම් දෙවියන් ලවා සාධුකාර දෙවාලන්-නට නො හැකි වීමි, මා නිසා ජීවත් වන ඉන්නට සරණක් නැති කන්නට බතක් නැති මාගේ අසුන්ට තණ අදින මේ දිළින්දා එක් ම පිණ්ඩපාත දානයෙන් දෙවියන් ලවා සාධුකාර දෙවී ය, ඔහුගේ, දෙවියන්ගේ ප්‍රසාදයට ලක් වූ ඒ දානයට නිසි සැලකිල්ලක් කොට ඒ පිණ්ඩපාතය මාසතු කර ගණිමි”යි සිතා ඔහු කැඳවී ය. කැඳවා “අද තා විසින් කිසිවක්හට යම් කිසි දෑයෙක් දෙන ලද දැ?”යි ඇසී ය. “සිටාන! එසේ ය, මම අද මට තුබූ බත්පත උපරිට්ඨ පසේ බුදුරජුන්ට පිදීමි”යි කී කල්හි “එසේ නම් කහවණුවක් ගෙණ ඒ පිණ්ඩපාතය මාසතු කරව”යි කී ය. “හිමියෙනි! ඒ නම් කළ නො හැකි ය”යි කී විට සිටු, ඒ කහවණුව කහවණු දහස දක්වා වැඩි කොට පිණ්ඩපාතය ඉල්ලී ය. එහෙත් අන්නභාර, කහවණු දහසටත් පිණ්ඩපාතය නො ද දුන්නේ ය. එ කල්හි සිටු “හා, වේවා, හොඳයි, එසේ නම් මේ කහවණු දහස ගෙණ එහි පිත් අපටත් පමුණුවාලව”යි කී ය. අන්නභාර, “පසේ බුදුරජුන්-ගෙන් එය අසා දැන ගණිමි”යි වහා දුව ගොස් බුදුරජුන් වෙත

පැමිණ "ස්වාමීනි! සුමන සිටු කහවණු දහසක් ගෙණ බුදුරජාණන් වහන්සේට පිදූ පිණ්ඩපාතයෙහි පින් ඉල්ලන්නේ ය, ඒ ගැණ මම කුමක් කරම් දැ?"යි ඇසී ය. එකල්හි උන්වහන්සේ "නුවණැතිය! ගෙවල් සියයක් ඇති ගමෙක මිනිහෙක් තම ගෙයි පහනක් දල් වන්නේ ය, අන් ගෙවල වැස්සෝ අවුත් තමන්ගේ ම තෙලින් තෙමූ පාන් වැටියක් තෙල පානෙන් දල්වා ගෙණ යන්නෝ ය, එසේ දල්වා ගත් කල්හි ඒ මුලින් දල් වූ පහනෙහි එලිය අඩු වේ ය යි, නැත, වැඩි වේ ය යි කියයුතු දැ?"යි ඔහු අතින් විචාළ සේක. ඔහු "ස්වාමීනි! එයින් මුල් පහනෙහි එලිය අඩු නො වන්නේ ය"යි කීවිට "නුවණැතිය! එ පරිද්දෙන් යමෙක් වැඩියක් නොව කැඳහැන්දෙක් වේව, යි බත් හැන්දෙක් වේව, යි දන් දීලා එහි පින් යම්තරම් දෙනකුට දෙනුයේ නම් එකෙක් තරමින් ඒ පිණ වැඩෙන්නේ ය, ඔබ විසින් දෙන ලද්දේ එක් ම පිණ්ඩපාතයෙකි, සිටානන්ට එහි පින් දුන්විට එය දෙකෙක් වන්නේ ය, ඉන් එකෙක් ඔබට ය, එකෙක් සිටුහට ය"යි බුදුරජාණන් වහන්සේ උපමාවක් දක්වා වදාළ සේක. එකල්හි අන්නභාර "ස්වාමීනි! යහපතැ"යි බුදුරජුන් වැඳ සිටුහු වෙතට දුව ගොස් "සිටාන! මා දුන් පිණ්ඩපාතදානයෙහි පින් අනුමෝදන් වනු මැනැවැ"යි කියා සිටියේ ය. "හොඳ යි, එසේ නම් මේ කහවණු ගන්නැ"යි කී විට "මම පිණ්ඩපාතය නො විකුණෙමි, ශ්‍රද්ධායෙන් ම ඔබතුමාට පින් පවරම්"යි කී ය. "සිටු තෙමේ මම ඔබ දෙන පින් ගත්නම්, මම මේ දෙන්නෙම් පිණ්ඩපාත මිල-යෙක් නො වේ, ඒ නිසා මා දෙන මේ පඬුර අමුත්තක් නො සිතා පිළිගන්න, මා මේ කරණු ලබනුයේ ඔබගේ ගුණයට උපහාර-යෙකැ"යි කහවණු දහස දීලා "මෙ තැන් පටන් තණකොළ කපා ඇවිදිනු මට රුචි නො වේ, එහෙයින් ඒ පිණිස වෙහෙස විය යුතු නැත, සැය වෙහෙසා සියතින් වැඩ නො කරව, අර පෙණෙනා කඩපලෙහි ගෙයක් ගොඩ නගා ගෙණ හොඳින් හිඳුව, යමෙක් වුවමනා නම් ඒ හැම මාගෙන් ගණුව"යි කීයේ ය.

නිරොධසමාපත්තියෙන් නැගී සිටි පසේ බුදුරජුන්ට පිදූ පිණ්ඩපාතය එ දවස ම විපාක දෙන්නේ ය. එහි විපාක විසින් රජ තෙමේ ද එ පුවත අසා අන්නභාරයා ගෙන්වා පිණ්ඩපාත දානයෙහි පින් ගෙණ ඔහුට භොගසම්පත් දී සිටුතනතුරු ද දුන්-නේ ය. සිටුතනතුරු ලත් අන්නභාර, සුමන සිටුහට සහාය ව සිට පින් කොට ඒ අත්බවෙන් මිදී දෙව්ලොව ඉපද ජාතියෙන් ජාතිය දෙව්මිනිසුන් අතර ම සැරිසරණුයේ අප බුදුරජුන් දවස කිඹුල්වත් පුරයෙහි **අමිතොදන** ශාක්‍යයන්ගේ ගෙයි පිළිසිඳ ගත්තේ ය. මවුපියෝ ඔහුට **අනුරුද්ධ** යි නම් කළහ. අනුරුද්ධ ඉතා සියුමැලි ය මහානාම ශාක්‍යයාගේ බාල මලනු ය. බුදුරජුන්ගේ සුලු පියාගේ

පුතනු ය. මහා පිණැත්තේ ය. එහි භද්දිය ආදී වූ අන් කැත් කුමරුන් හා එක් ව කැවුම් ඔට්ටු කොට ගුලකෙළියට වැටුනු අනුරුද්ධ තෙමේ එයින් පැරදුනේ කැවුම් එවන්නැ'යි මවට දන්වා යැවූයේ ය. එවිට මවු තොමෝ ලොකු රත්තලියක් ගෙණ එය කැවුම් වලින් පුරවා යැවූ ය. ඒ කැවුම් කා නැවැත කෙළනා කල්හි එ වර ද පැරදුනේ කැවුම් එවන්නැ යි කියා යැවී ය. මෙසේ තෙවරක් ම පැරදී තෙවරක් ම කැවුම් ගෙන්වා ගත්තේ සිවුවන වරත් කැවුම් එවන්නැ යි දන්වා යැවූ විට මවු තොමෝ පිළියෙල කොට තුබූ කැවුම් අවසන් වූ බැවින් කැවුම් නැතැයි කියා යැවූ ය. 'නැතැ' යි යන බස කවදාකත් නො අසා සිටි අනුරුද්ධ, "යව, නැති කැවුම් ගෙණ එව"යි කැවුම් ගෙණෙන්නහු පිටත් කොට හැරියේ ය. ඔහු ගොස් "ආයසීං! නැති කැවුම් දෙන්නැ"යි ඉල්ලා සිටි විට, ඕ තොමෝ "මා පුත් උපන්දා සිට මෙතෙක් කල් 'නැත' යන මෙ බස අසා නැත, එහෙයින් 'නැත' යන්නෙහි තේරුම කෙසේ හඟවම් දැ"යි සිතා රත්තලියක් ගෙණ සෝදා එය අන් රත්තලියකින් වසා "මෙය ගෙණ ගොස් මපුත් හට දෙව"යි කියා යැවූ ය. එ වේලෙහි එ නුවර අරක් ගත් දෙවියෝ "මේ කුමරු අන්නභාර කාලයෙහි උපරිට්ඨ පසේ බුදුරජුන්ට තම බත් කොටස පුදා 'නැත' යන බස කණ නො වැටේවා යි ප්‍රාර්ථනා වක් තබා ඇත, අපි ඒ දැන මෙහි දී මැදහත් වන්නමෝ නම් අපගේ හිස් පැළී යනු ඇතැ"යි සිතා රත්තලිය මුව විට තෙක් ම දිව කැවුමෙන් පුරවාලූහ. කැවුම් ගෙණ ගියේ තලිය ගෙණ ගොස් අනුරුද්ධ කුමරුන් ලඟ තබා පියන් පත හැරියේ ය. එකෙණෙහි කැවුම් සුවඳ මුළු නුවර පැතිර ගත්තේ ය. කැවුමක් කට ගෑ ඇසිල්ලෙහි ම සත් දහසක් රස නහර පිණා ගියේ ය. එ කල්හි අනුරුද්ධ තෙමේ "මෙයට පෙර මාගේ අම්මාට මා ප්‍රිය නො වූවකු සේ ය පෙණෙන්නේ, මෙයට පෙර අම්මා මට මෙබඳු රසැති නැති කැවුම් නො පිසූ ය"යි ගෙට ගොස් "අම්මේ! අම්මාට මම ප්‍රිය නො වෙම් දැ?"යි ඇසී ය. "පුත! කුමක් අසහු, මාගේ ඇසට මාගේ හදවතට වඩා පුතා මට ප්‍රිය"යි කී විට "එසේ නම් අම්මේ! මම අම්මාට ප්‍රිය වෙම් නම් මෙතෙක් දවස් මෙබඳු නැති කැවුම් නො දෙන ලද්දේ කුමක් නිසා?"යි ඇසී ය. ඉක්බිති ඕ තොමෝ කැවුම් ගෙණ ගියහු අනින් "දරුව! තා ගෙණ ගිය තලියෙහි කිසි දෑයෙක් තුබුනේ ද?"යි ඇසූ ය. "ආයසීං! ඔව්, මුළු තලිය කැවුම් වලින් පිරී තුබුනී ය, මා විසින් නම් මේ ජීවිතයේ දී මෙයට පෙර කිසි දවසෙක මෙ බඳු කැවුම් දැක නැතැ"යි කීවිට "මපුත් මහපිණැත්තේ ය, දෙවියන් විසින් මේ දිව කැවුම් යවන ලදැ"යි සිතූ ය. අනුරුද්ධ "අම්මේ! මෙබඳු කැවුම් මා විසින් මෙයට පෙර

කා නැත, ඒ නිසා මෙ තැන් පටන් මට නැති කැවුම් ම පිළියෙල කරන්නැ''යි කියූ ද පටන් මවු තොමෝ රන්තලියක් සෝද එය අන් තලියකින් වසා යවන්නී ය. දෙවියෝ ඒ හිස් තලියෙහි මූව විට තෙක් ම දිව කැවුම් බහන්නාහ අනුරුද්ධ ගිහි ගෙයි වසන්නේ, නැත, යන බසෙහි තේරුම නො දැන ම දිව කැවුම් අනුභව කෙළේ ය.

බුදුරජුන්ට පිරිවර පිණිස කුල පිළිවෙළින් ශාක්‍ය කුමාරයන් පැවිදි වන කල්හි මහානාම ශාක්‍යයා ''මල්ලි! අපගේ ගෙයින් මෙතෙක් කිසිවෙක් පැවිදි වූයේ නො වේ. ඒ නිසා මල්ලී හෝ මා පැවිදි විය යුතු ය''යි කී කල්හි ''මම සියුමැළි ය, පැවිදි වන්නට මට නො පිළිවනැ''යි අනුරුද්ධ කුමරු කීයේ ය. ''එසේ නම් මල්ලී කර්මාන්ත උගෙණ ගෙයි කටයුතු කරන්න, මම පැවිදි වන්නෙමි''යි මහානාමයන් කියූ විට අනුරුද්ධ ''ගෙයි කටයුතු නම් කිමැ?''යි ඇසුයේ ය. බත් උපදනා තැනත් නො දන්නා අනුරුද්ධ, කර්මාන්ත නම් කිමැ යි දන්නේ ද?, එහෙයින් හේ මෙසේ කියේ ය.

දවසක්, අනුරුද්ධ – භද්දිය – කිම්බිල යන තිදෙන බත් උපදනේ කො තැනක දැයි සාකච්ඡා කළහ. කිම්බිල, ''බත් කොටුවේ උපදී ය''යි කී ය. ඔහු කොටුවෙහි ලන වී දැක බත් කොටුවෙන් උපදී ය යි සිතා මෙසේ කී ය. එවිට භද්දිය, ''බත් උපදනා තැන තමුසේ නො දන්නහු ය, බත් උපදනේ සැළියෙනැ''යි කීයේ ය. එසේ කීයේ සැළියෙන් ගෙණ බත් බදුනට බෙදනු දැකීමෙන් ය. එවිට අනුරුද්ධ, ''ඔබ දෙපොල ම බත් උපදනා තැන නො දන්නහු ය, රියනක් පමණ උස් වූ කැකුළක් ඇති රන්තලියෙහි බත් උපදී ය''යි කී ය. අනුරුද්ධ, කිසි දවසෙක වී කොටන්නන්, බත් පිසන්නන්, දැක නැත. තලියෙහි ලා ඉදිරියෙහි තැබූ බත්තලිය පමණක් ම ඔහු විසින් දක්නාලද බැවින් තලියෙහි ම බත් උපදී ය යි හේ අදහස් කෙළේය. ඒ නිසා මෙසේ කීයේ ය. මෙසේ බත් උපදනා තැනත් නො දන්නා මහපිණැති කුලපුත්, කෙසේ නම් කර්මාන්ත ගැණ දනී ද?, එහෙයින් කර්මාන්ත නම් කිමැ?'යි ඇසී ය. මහානාම ශාක්‍ය තෙමේ ''අනුරුද්ධ! මෙහි එව, ගිහි ගෙයි විසීම පිණිස අවශ්‍යයෙන් උගත යුතු කටයුතු කරණ සැටි උගෙණ ගන්නැ''යි ළහට ගෙන්වා ගෙණ ''මල්ලි! පළමු කොට කුඹුර හැවිය යුතු ය'' යනාදී විසින් සහෝදරයා විසින් කියූ කර්මාන්තයන්ගේ කෙළවරක් නො පෙණෙන බව දත් අනුරුද්ධ, ''මට ගිහිගෙයින් වැඩෙක් නැතැ''යි මවගෙන් අවසර ඉල්ලා ගෙණ භද්දිය ප්‍රධාන කොට සිටි ශාක්‍ය

කුමරුන් පස්දෙනා සමග නික්ම ගොස් **අනුපිය** නම් අඹවෙනෙහි වැඩ හුන් බුදුරජුන් වෙත ගොස් පැවිදි වී ය. පැවිදි ව මනාව පිළිපැද ත්‍රිවිද්‍යාවන් සාක්ෂාත් කොට හුනස්නෙහි හුන්නේ ම දිවැසින් හස්තාමලකන්‍යායයෙන් දශසහශ්‍රීලොකධාතුව දක්නට සමර්ථ වූයේ,

> “මම පෙර විසූ කඳ – පිළිවෙළ දනිමි දිවැස ද,
> පිරිසිදු කැරිණි තෙවිදු – ඇතියෙමි ඉදුහ පත්මි,
> බුදුරජුන්ගේ ඒ – අනුසසුන මා කැරිණි”

යි උදන් ඇනී ය.

ඉන්පසු “මා විසින් කුමක්හුගේ විපාක විසින් මේ සැපත ලද දූ”යි බලනුයේ “පියුමතුරු බුදුරජුන් දවස මහදන් පවත්වා උන්වහන්සේගේ සිරිපාමුල්හි ප්‍රාර්ථනා තබා නැවැත නැවැත පින් කරමින් සසර සැරිසරණුයෙම් එක් කලෙක බරණැස් නුවර ඉපද එහි සුමන සිටු නිසා දිවි යවනුයෙම් අන්නභාර නම් වීමි”යි දැන:–

> “වීමි පෙර කද දින - දිළිඳු අන්බරු මිනිහෙක්,
> උපරිට්ඨ පසේ බුදුනට – දිනී පිඬු පා ඒ පෙර”

යි මෙසේ ප්‍රකාශ කෙළේ ය.

ඉක්බිති අනුරුද්ධ ස්ථවිරයන් වහන්සේ “ඒ කාලයෙහි උපරිට්ඨ පසේ බුදුරජුන්ට මා දුන් පිණ්ඩපාතයෙහි පිණ යමෙක් මට කහවණු දහසක් දී අනුමෝදන් වූයේ ද, මාගේ යහළු වූ ඒ සුමන සිටු තෙමේ දැන් කො තැනක ඉපද සිටී දැ”යි බැලූහ. එහි දී “ඔහු දැන් වින්ධ්‍යවනයෙහි කඳුපාමුලෙක පිහිටි නියම්ගමෙහි **මහාමුණ්ඩ** නම් උපාසකයාගේ දෙ පුතුන් අතුරෙහි **චූලසුමන** නම් ව ඉපද සිටී ය”යි දැක නැවැත “මා එහි ගියොත් මාගේ ඒ ගමනින් වැඩෙක් වේ ද, නො වේ දැ”යි බැලූහ. “මා එහි ගිය විට සත් අවුරුදු වයසැති එ දරු මා වෙත පැවිදි වන්නේ ය, කර අගදී ම රහත් බවට පැමිණෙන්නේ ය”යි දැක අතුළ් වස ළං ව තිබිය දී ම අහසින් ගොස් ගම්දොර බැස සිටියහ. පෙරත් තෙරුන් දැක පැහැද සිටි මහාමුණ්ඩ තෙමේ ඒ වේලෙහි පිඬු සිඟා යන්නට සිවුරු ගැටවටු ගන්වන තෙරුන් දැක පුතු අමතා, “පුත! මාගේ ආර්‍ය්‍ය වූ අනුරුද්ධ ස්ථවිරයන් වහන්සේ මෙහි වැඩම කොට සිටිත්, අනෙකකු උන්වහන්සේගේ පාත්‍රය ගන්නට පෙරාතුව පුතා ගොස් පාත්‍රය ගන්න, මම අසුන් පණවමි”යි තෙරුන් වෙත පුතු යැවී ය. චූලසුමන ගොස් පාත්‍රය ඉල්ලා ගත්තේ ය. උපාසක තෙමේ තෙරුන්, ඇතුළ

ගෙයි වඩා හිඳුවා මැනැවින් වළඳවා ඉදිරියෙහි එන වස් තෙමස එහි වසන්නට ආරාධනා කෙළේ ය. ස්ථවිරයන් වහන්සේ එය ඉවසූහ. උපාසක, එක් දවසක් කරණ උපස්ථානයක් සේ වස් තුන්මස මැනැවින් උපස්ථාන කොට මහාපවාරණදිනයෙහි තුන් සිවුරු උක්හකුරු තලතෙල් සහල් ආදිය ගෙන්වා තෙරුන් පා මුල තබා ''ස්වාමීනි! මේ හැම දූය පිළිගන්නා සේක්වා''යි ඇය ද සිටියේ ය. ''උපාසක! මට මෙයින් වැඩෙක් නැතැ''යි වදාළ විට, ඔහු නැවැත නැවැතත් ''ස්වාමීනි! මෙය වස්සාවාසික පූජාවශයෙන් ලැබිය යුත්තෙක, එහෙයින් පිළිගත මැනැවැ''යි ඉල්ලා සිටියේ ය. එ වරත් උන්වහන්සේ ''උපාසක! මට කම් නැතැ''යි ඉල්ලීම පිළිකෙව් කළහ. ''ස්වාමීනි! මෙසේ මා ඉල්ලා සිටිය දී ත් ඔබ වහන්සේගේ මේ ප්‍රතික්ෂෙප කිරීම කුමක් නිසා?''යි ඇසූ කල්හි ''උපාසක! මේ දූය විනාශ විය නො දී රැක බලා ගන්නට කැපකරු හෙරණ කමක් වත් මා ළඟ නැතැ''යි උන්වහන්සේ කීහ. එවිට උපාසක, 'ස්වාමීනි! එසේ නම් මා පුත් මහාසුමන හෙරණකු කර ගන්නැ''යි කී ය. ''මහා සුමන නො ව චූලසුමන දෙතොත් ඔහු පැවිදි කරන්නෙමි''යි කී විට ''හොඳ යි, ස්වාමීනි! චූලසුමන පැවිදි කර ගන්නැ''යි උපාසක කියා සිටියේ ය. ස්ථවිරයන් වහන්සේ චූලසුමන පිළිගෙණ පැවිදි කළහ. පැවිදි කරන්නට හිසකෙස් සිඳ නිමාවත් ම චූලසුමන රහත් වී ය. ඉන් පසු ස්ථවිරයන් වහන්සේ හෙරණුන් හා අඩමසක් එහි ම වැස ''බුදුරජුන් දක්නට යා යුතු ය''යි හෙරණුන්ගේ නෑයනට දන්වා අහසින් ම ගොස් හිමවත් පෙදෙසෙහි වනකිළියකට බටහ.

අනුරුද්ධ ස්ථවිරයන් වහන්සේ සැහැවියෙන් ම පටන් ගත් වැර ඇතියහ. එහි පෙර යමත් පැසුළු යමත් සක්මන් කරණ උන්වහන්සේට මහත් බඩ රුදාවෙක් හට ගැණුනේ ය. එයින් ගිලන් වූ වෙහෙසට පත් උන්වහන්සේ දැක ''ස්වාමීනි! හාමුදුරුවන් වහන්සේට ඇති වෙහෙස කුමක් ද?, එහාට මෙහාට ඇඹරෙණු කුමක් නිසා?'' යි හෙරණුන් විචාළවිට බඩ රුදාවෙක් හට ගෙණ මා පෙළා ය''යි කීහ. ''මෙයට පෙරත් බඩරුදා හටගෙණ තිබේ ද?''යි ඇසූ විට ''එසේ ය, හටගෙණ තිබේ ය''යි කීහ. ''එයට කළ පිළියම් කිමැ?''යි ඇසූ විට අනුරුද්ධ ස්ථවිරයන් වහන්සේ ''අනවතප්තවිලෙහි පැන් ටිකක් වැළඳූ විට මෙය සන්සිඳී ගොස් පහසුකම් ලැබෙන්-නේ ය''යි කීහ. ''එසේ නම් මම ගොස් පැන් ගෙණ එන්නෙමි''යි හෙරණුන් කීවිට ''ඔය නමට එය කළ හැකි ද?''යි ඇසූහ. ''එසේ ය ස්වාමීනි! මට ගෙණ ආ හැකි'' යි කී කල්හි ''අනවතප්තවිලෙහි මා ගුණ දන්නා මා හඳුනන පන්නක නම් නාරජෙක් ඇත්තේ ය,

ඔහුට කියා බෙහෙත් පිණිස පැන් කළයක් ගෙණෙව" යි යන්නට අවසර දුන්හ. හෙරණ, තෙරුන් වැඳ අහසට නැගී යොදුන් පන් සියයක් ඔබ්බෙහි වූ අනවතප්තාවිලට ගියේ ය. එ දවස නාරජ තෙමේ නා නළුවන් පිරිවරා දිය කෙළි කෙළනා පිණිස සැරසී හුන්නේ ය. නාරජ, අහසින් එන හෙරණුන් දැක "මේ මුඩු මහණ, තමන්ගේ පා දූවිලි මා හිස වගුරුවමින් අහස හැසිරෙන්නේ ය, අනවතප්තාවිලෙන් පැන් ගෙණ යැමට මෙ තෙමේ ආයේ වන, මොහුට පැන් නො දෙමි"යි පණස් යොදුන් පමණ වූ අනවතප්තවිල මහමලාවකින් සැළියක් වසාලන්නා සේ පෙණගොබින් වසා හොත්තේ ය. හෙරණ, නාරජුගේ සැටි දැක මෙ තෙමේ කිපී ගත්තේ ය'යි දැන:

"මහතෙද මහබලැති – නාරජ අසව මා බස්,
දෙනු පැන් පිරු කළයක් – ආයෙම් බෙහෙත් පිණිස ය"

යි මේ ගය කීයේ ය.

මෙයැසූ නාරජ,

"ගඟ නමින් පළවූ – මහනදක් ඇත පෙරදිග,
ඕ ගලා යා මුඳට – ගෙණ යව එයින් පැන් තෝ"

යනු කී ය. හෙරණ, මෙයසා "මේ නාරජ, තම කැමැත්තෙන් පැන් නො දෙන්නේ ය, මම මාගේ බලය පෙන්වා මිනිස් බව දක්වා මූ මැඩ පැන් ගෙණ යමි" යි සිතා "නාරජ! මාගේ උපාධ්‍යායන් වහන්සේ අනවතප්තාවිලෙන් පැන් ටිකක් ගෙණ එව, යි මා මෙහි යෙදූ සේක, එහෙයින් මම මේ විලෙන් ම පැන් ගෙණ යමි, ගඟ නදියෙන් පැනක් ගෙණ එන්නට මට නො වදාළ සේක, පහ වෙව, මා නො වළකාලව" යි

"මෙයින් පැන් ගෙණ යමි – වැඩැතියෙම් මෙ පැනින් ම ය,
නාරජ තට බැලැති නම් – මා මෙයින් වළකාලනු"

යි කියා සිටියේ ය. එවිට නාරජ,

"හෙරණ! තට හැකි නම් – විකුම් පැරකුම් තා බස්,
පිළිගණිමි මම සතුටින් – හැකි නම් ගණුව මා පැන්"

යනු කී ය.

ඉක්බිති හෙරණ තෙමේ "මහරජ! ඉදින් හැක්කේ නම් පැන් ගෙණ යව යි තෙවරක් ම තෝ මට කීයෙහි ය, එහෙයින් පැන් ගෙණ යමි" නාරජු ගිවිස්වා "බුදු සසුනෙහි මහත් බව දක්වා මාවිසින්

පැන් ගෙණ යා යුතු ය'' යි සිතා පලමු කොට ආකාශසථ දෙවියන් වෙත ගියේ ය. දෙවියෝ උන්වහන්සේ වෙත අවුත් වැඳ ''ස්වාමීනි! මෙහි වැඩියහු කිනම් කාරියක් නිසාදැ?'' යි ඇසූහ. ''මේ අනවතප්ත විල මතුයෙහි වසන පන්නක නාරජු හා මාගේ යුද්ධයෙක් වන්නේ ය, එහි අවුත් අප දෙදෙනාගේ දිනුම් පැරදුම් බලා ගණිවු'' යි හෙරණ කියේ ය. මේ ලෙසින් හෙරණ තෙමේ සිවු මහරජුන් හා සක්කාසුයාම සන්තුසිත නිම්මාණරති පරනිම්මිතවසවත්ති දෙවියන් කරා ද, ඉන් ඔබ්බෙහි පිළිවෙළින් මහබඹුන් කරා ද ගොස් මෙපුවත දන්වා දිනුම් පැරදුම් බලන්නට එවු'' යි ඒ හැම දෙනාට කියා සිටියේ ය. මෙසේ හෙරණ තෙමේ එක් ම මොහොතින් අසංඥයන් හා අරූපී බ්‍රහ්මයන් හැර හැම බ්‍රහ්මයන් කරා මෙ බව දැන්වී ය. හෙරණහුගේ ඉල්ලීම පිළිගත් සියලු දිව්‍යබ්‍රහ්මයෝ අනවතප්තවිල නළෙක පිරූ පිටිසුණු මෙන් අහස අතර නැති ව පුරා රැස් ව සිටියාහ. දෙව්බඹුන් අහස පුරා රැස් ව සිටි කල්හි හෙරණ තෙමේ නාරජුට,

''මහතෙද මහබලැති – නාරජ! අසව මා බස්,
දෙනු පැන් පිරූ කළයක් – ආයෙම් බෙහෙත් පිණිස ය''

යනු කීයේ ය.

එකල්හි නාරජ,

''හෙරණ! තට ඇත් නම් – විකුම් පැරකුම් තා බස්,
පිළිගණිම් මම සතුටින් - හැකි නම් ගණුව මා පැන්''

යි හෙරණහුට කී ය.

ඉක්බිති හෙරණ, නාරජුගෙන් තෙවරක් ම පිළින ගෙණ අහස සිටියේ ම දෙළොස් යොදුන් පමණ වූ බඹ අත්බවක් මවා ගෙණ අහසින් බැස නාරජුගේ පෙණ ගොබය මිරිකා යටිකුරු කොට තදින් පෙළුයේ ය. ඒ වේලෙහි ශක්තිමත් පුරුෂයකු විසින් මැඩලූ කඹුරු උඳුනෙහි බැඳි සමක් මෙන් නාරජුගේ පෙණ ගොබය මැඩලූ ඇසිල්ලෙහි ගැලවී ගොස් හැඳිතලයක් සේ බොකු ගැසී හැකිළී ගියේ ය. මෙසේ පෙණගොබය බොකු ගැසී හැකිළී ගිය කල්හි එහි ඒ ඒ තැනින් තල් කඳන් පමණ වූ දියවැල් ගලන්නට වන හෙරණ, අහසැ සිට ම පැන් කළය පුරවා ගත්තේ ය. දිව්‍ය බ්‍රහ්මයෝ සාධුකාර දුන්හ. නාරජ, උපන් විළි ඇති ව හෙරණහුට කිපී ගත්තේ ය. ඔහුගේ ඇස් ගඬු ඔළිඳ ඇට පැහැය ගත්තේ ය. කොපයෙන් ගැසෙන්නට වන. කොපය ඉවසා ගත නො හැකි වූ නාරජ, ''මූ දෙව්බඹුන් රැස් කොට මාගේ පෙණ ගොබයෙහි නැග

මා ලජ්ජාවට පත් කෙළේ ය, මූ අල්වා කට තුළට අත බහා මූගේ හදමස් හෝ මිරිකා උපුටා හරිමි' පා අල්වා මුහුදින් එතෙරට හෝ දමා ගසමි'' යි ඉතා වෙගයෙන් ලුහු බැත්දේ ද හෙරණුන්ට ලං වන්නට අපොහොසත් වී ය. හෙරණ ගොස් උපාධ්‍යායයන් වහන්සේට පැන් පිළිගන්වා "ස්වාමීනි! පැන් වළඳනු මැනැවැ" යි දන්වා සිටි කල්හි නාරජ පසු පස එළවා අවුත් "ස්වාමීනි! සුමන සාමණේරයා මා නො දුන් පැනක් ම ගෙණ පැන ආයේ ය, එහෙයින් පැන් නො වළඳනු මැනැවැ"යි කීයේ ය. "එසේ ද, හෙරණ! නො දුන්නක් ද ගෙණ ආ වහු?"යි විචාළ කල්හි "නැත, ස්වාමීනි! මා ගෙණ එන ලද්දේ නො දුන් පැනෙක් නො වේ, මොහු විසින් දෙන ලද්දක් ම ගෙණ ආ යෙමි, එහෙයින් පැන් වළඳනු මැනැවැ"යි හෙරණ තෙමේ කීයේ ය. රහත් හෙරණෝ බොරු නො කියති යි දන්නා ස්ථවිරයන් වහන්සේ පැන් වැළඳූහ. එකෙණෙහි ම උන් වහන්සේගේ රොගය සන්සිඳී ගියේ ය. නැවැත නාරජ, "ස්වාමීනි! මේ සාමණේරයා ලොව ඇති තාක් දෙව් බඹුන් රැස් කොට උන් ඉදිරියෙහි මා ලජ්ජාවට පත් කෙළේ ය, මම මූගේ හදවත පළා ලන්නෙමි, නැත, පා දෙකින් අල්ලා මූ මූදෙන් එතරට දමා ගසන් නෙමි'' යි කී විට "මහරජ! හෙරණ ඔබ සිතන තරමේ ලෙහෙසි පහසු එකෙක් නො වේ, මහත් ආනුභාව ඇත්තේ ය, එහෙයින් ඒ නමට පටහැනි නො වව, තට හෙරණුන් හා හැපෙන්නට පිළිවන් කමෙක් නැත, හෙරණුන් කමා කරවා ගෙණ යව'' යි කී සේක. නා රජ ද හෙරණුන්ගේ මහත්කම දත්තේ ම ය. එහෙත් ලජ්ජාව නිසා දිගට ලුහුබැඳ ආයේ ය. මහතෙරුන්ගේ වචනයෙන් හෙරණුන් කමා කරවා ගෙණ හෙරණුන් හා මිතුරුව, "යම් දවසෙක අනවතප්තවිලෙහි දියෙන් වැඩෙක් වේ නම් ඔබ-වහන්සේ එහි නො වැඩ මට දන්වා එවූ කල්හි මම එය ගෙණවුත් දෙමි'' යි කියා ගියේ ය. මහාස්ථවිරයන් වහන්සේ ද හෙරණුන් ගෙණ බුදුරජුන් දක්නට වැඩිය සේක.

බුදුරජානන් වහන්සේ තෙරුන් එන බව දැන මෘගාරිමාතෘ ප්‍රාසාදයෙහි තෙරුන් බලා වැඩ හුන් සේක. සෙසු භික්ෂූන් වහන්-සේලා ද එන තෙරුන් දැක ඉදිරියට ගොස් පා සිවුරු පිළිගත්හ. ඇතැම් කෙනෙක් හෙරණුන්ගේ හිසින් කණින් බාහුවෙන් අල්ලා සොලොවා "හෙරණ පැටව! සස්නෙහි නො කළකිරුණෙහි දැ?''යි ඇසූහ. බුදුරජානන් වහන්සේ ඔවුන්ගේ ඒ ක්‍රියා දැක "මේ මහණුන්ගේ ක්‍රියාව ඒකාන්තයෙන් ඉතා සැහැසි ය, බිහිසුණු ය, විෂඝොර සර්පයකු ගෙලින් අල්ලා ගන්නා සේ හෙරණහු අල්ලන්-නෝ ය, මොවුහු හෙරණහුගේ සැටි නො දන්නෝ ය, ඒ නිසා අද මම සුමන හෙරණුන්ගේ සැටි ඒ තමගේ ගුණ මහත්කම

මේ නාමලාට කියා දෙමි”යි සිතා වදාළ සේක. ඒ අතර ම අනුරුද්ධ ස්ථවිරයන් වහන්සේ අවුත් බුදුරජුන් වැඳ හුන් කල්හි බුදුරජාණන් වහන්සේ ඒ තෙරුන් සමග පිළිසඳර කථායෙහි යෙදුනු සේක. ඒ නිමවා අනඳ තෙරුන් අමතා “ආනන්ද! මම අනවතප්ත විලෙහි දියෙන් පා දෙවනු කැමැත්තෙමි, එහෙයින් හෙරණුන්ට කළගෙඩි දීලා යවා ඒ විලෙන් දිය ගෙන්වාලවු” යි වදාළ සේක. එවිට ආනන්ද ස්ථවිරයන් වහන්සේ වෙහෙර විසූ පන් සියයක් පමණ හෙරණුන් රැස් කර වූහ. ඔවුනතර මේ සුමන සාමණේර තෙමේ ම හැමට බාල ව සිටියේ ය. ආනන්ද ස්ථවිරයන් වහන්සේ හැමදෙනා ට වැඩිමහලු වූ හෙරණහු අමතා “හෙරණ! බුදුරජාණන් වහන්සේ අනවතප්තවිලෙහි දියෙන් සිරිපා දෙවනු කැමැති සේක, එහෙයින් කළයක් ගෙණ ගොස් අනවතප්ත විලෙන් දිය කළයක් ගෙණ එව” යි කීහ ඒ හෙරණ, “එය කළ නො හැකි ය” යි පසු බැස්සේ ය. ඉක්බිති ස්ථවිරයන් වහන්සේ සෙසු හෙරණුන් ද විචාළාහු ය. ඒ සාමණේරයෝ ද දිය ගෙණ එන්නට යැමට අකැමැති වූහ. අනතුරු ව “මෙහි රහත් හෙරණෝ නැද්ද?”යි විචාළ විට ඔවුහු “ඇත්තාහ, මේ මල් ගොටුව අප සඳහා පිළියෙල කළ එකෙක් නො වේ, මෙය සුමන සාමණේරයන්ට පිළියෙල කළ මල් ගොටුවකැ”යි එයට නො කැමැති වූහ. පුහුදුන් හෙරණෝ තමන් අපොහොසත් බැවින් ම නො කැමැති වූහ. කෙළවර සුමන සාමණේරයන්ගෙන් අසන්නට වාරය පැමිණි කල්හි ආනන්දස්ථවිරයන් වහන්සේ “හෙරණ! බුදුරජානන් වහන්සේ අනවතප්තවිලෙහි දියෙන් සිරිපා දෙවනු කැමැතියහ, එහෙයින් කළයක් ගෙණ ගොස් ඒ විලෙන් දිය කළයක් ගෙණ එව”යි කීහ. හෙරණ, බුදුරජුන් දිය ගෙන්වන කල්හි නො ගෙණ එන්නට පිළිවන් කමෙක් නැත, එහෙයින් ගෙණ එන්නෙමි” යි බුදුරජුන් වැඳ “ස්වාමීනි! මා ලවා අනවතප්තවිලෙන් දිය ගෙන්වන සේක් දැ”යි අසා “එසේ ය, සුමනැ!”යි වදාළ කල්හි විශාඛා මහා උපාසිකාවන් විසින් ගහරන් ඔබ්බවා කරවන ලද වෙහෙරසතු කළවලින් කළගෙඩි සැටක දිය ගන්නා කළයක් අතින් ඔසොවා කර තබා ගැණීමෙන් වැඩෙක් නැතැ යි එය අතින් එල්බ ගෙණ අහසට නැගී හිමවත බලා ගියේ ය. නාරජ, එන්නා වූ හෙරණුන් දුර දීම දැක ඉදිරියට ගොස් “ස්වාමීනි! මාවැනි දසයකු ඉන්ද දී කුමක් නිසා කළයක් ඔසොවා ගෙණ මෙහි ආ වහු ද, දියෙන් ප්‍රයොජන ඇසිවිට මට දන්වා එවිය යුතු නො වේ දැ?”යි කළය ගෙණ පැන් පුරවා කර තබා ගෙණ “ස්වාමීනි! පෙරටුව වඩිනු මැනැව, මම පැන් කළය ගෙණෙමි” යි කී ය. එකල්හි සාමණේර තෙමේ “මහරජ! සිටුව, බුදුරජුන් විසින් මෙහි අණකරණ ලද්දෙම් මම වෙමි” යි නාරජු

තවතා පැන් පිරූ කළය කළකට්ටින් අල්ලා ගෙණ අහස නැග ආයේ ය. බුදුරජානන් වහන්සේ එසේ එන හෙරණුන් දෙස බලා "මහණෙනි! හෙරණුන්ගේ විලාශය බලවු, හෙරණ අහස යන රන්වන් හස්පැටවකු සේ බබලා" යි භික්ෂූන්ට දක්වා වදාළ සේක. හෙරණ, බුදුරජුන් වෙත පැමිණ පැන් කළය තබා බුදුරජුන් වැඳ සිටි කල්හි "සුමන! කෙතෙක් වස් ඇතියහු ද?" යි විචාළ සේක. "ස්වාමීනි! මම සත්වස් ඇතියෙම් වෙමි" යි හෙරණුන් කී කල්හි "සුමන! එසේ නම් අද පටන් උපසපන් වහු" යි ආවෙණික කොට දැයප්‍රුපසම්පදාව දුන් සේක. **මේ ශාසනයෙහි සොපාක-සුමන යන හෙරණහු දෙනම සත් වැසි ව උපසම්පදා ව ලැබුවෝ වෙති.** සොපාක හෙරණ ද, සුමන හෙරණුන් මෙන් පෙර බුදුරජුන් වෙත කළ අධිකාර ඇති ව එනුයේ ඒ ඒ භවයන්හි රැස් කළ පින්-බෙලෙන් සිද්ධාර්ථ බුදුරජානන් වහන්සේගේ කාලයෙහි බ්‍රාහ්මණ කුලයෙහි ඉපද ගත්තේ ය. නුවණැති වූයේ ද බමුණන් පිළිබඳ ධර්මශාස්ත්‍රයන්හි කෙළවරට පැමිණියේ කාමයෙහි දොස් දැක ගිහි ගෙය හැරදමා, තවුස්පැවිද්දෙන් පැවිදි ව එක්තරා පර්වතයක් ඇසුරු කොට වාසය කෙළේ ය. බුදුරජානන් වහන්සේ එහි ඔහු මැරෙන්නට ලංව සිටුනා බව දැක ඔහු වෙත වැඩම කළ සේක. හේ බුදුරජුන් දැක පහන් සිත් ඇතියේ තමන් සිත්තුළ නැගී මහත් ප්‍රීතිය පසනු පිණිස මල්වලින් අසුනක් පිළියෙල කොට උන්වහන්සේට වැඩ හිඳින්නට සැලසී ය. එහි වැඩහුන් බුදුරජා-නන් වහන්සේ අනිත්‍යතාප්‍රතිසංයුක්ත වූ ධර්මකථාවක් වදාරා උන් බලාසිටිය දී ම අහසින් වැඩිය සේක. හේ පෙර තමන් ගත් නිත්‍යග්‍රාහය දුරු කොට අනිත්‍යසංඥාව ලෙහි තබා කළුරිය කොට දෙව්ලොව උපන්නේ ය. මෙසේ මේ තෙමේ නැවැත නැවැත දෙව්මිනිස් දෙගතියෙහි සැරිසරණුයේ අපගේ බුදුරජුන් දවස රජගහා නුවර සොපාකකුලයෙහි උපන්නේ ය. ජාතිවශයෙන් සොපාක යි ප්‍රසිද්ධ වූයේ ය. එහෙත් සමහර කෙනෙක් මෙ තෙමේ වෙණදකුලයෙහි උපන්නේ ය යි ද නාම මාත්‍ර විසින් සොපාක නම් වී ය යි ද කියත්. මෙහි ඉපද සිවු මසක් ගෙවී යත් ම මොහුගේ පියා කළුරිය කෙළේ ය. එතැන් සිට මොහු වැඩුයේ මොහුගේ සුළු පියා ය. සත් වයස් ඇති සොපාක, "තමන්ගේ පුතු හා කලහ කෙරේය" යි සුළුපිය තෙමේ සොපාකට කිපී ගත්තේ සොපාක සොහොනකට ගෙණ ගොස් දෙඅත් එකතු කොට රැහැනකින් බැඳ එම රැහැනින් ම මළසිරුරෙක දැඩි කොට බැඳ "සිවල්ලු මූ කාදමත්වා" යි කියා ගියේ ය. එහෙත් සොපාක පශ්චිම භවික-සත්වයකු වූ බැවින් නො මැරී සිටියේ ය. සිවල් ආදී සත්තු ද ඔහුට ළං නො වූහ. සොපාක අඩ රැයක් ම:-

"කා හි මෙ අගති අස්ස කො වා බන්ධු අබන්ධුනො,
සුසාංනමජ්ඣෙ බද්ධස්ස කො මෙ අභයදායකො"

යනු විසින් විලාප කියමින් සිටියේ ය.

බුදුරජානන් වහන්සේ ඒ වේලෙහි ලොව බලා වදාරණ සේක් ඔහුගේ ලෙහි තුබූ රහත්විමේ වාසනාශක්තිය දැක ආලෝකයක් පතුරුවා ඔහුට සිහි එළවමින්:-

"එහි සොපාක! මා භාසි ඔලොකස්සු තථාගතං,
අහං තෙ තාරයිස්සාමි රාහුමුඛෙව චන්දිමං"

යි දහම් දෙසූ සේක. සොපාක බුද්ධානුභාවයෙන් සිඳුනු බැඳුම් ඇතියේ ගාථා කෙළවර සෝවන් ව ගඳකිළිය ඉදිරියෙහි සිට ගත්තේ ය.

සොපාකගේ මවු තොමෝ පුතු නො දැක සුලුපියා විචාරා ඔහුගෙන් කිසිවක් දැන ගත නො හැකි වූවා ඒ ඒ තැන සොයා ඇවිදිත්නී "බුදුවරු වනාහි අතීතානාගතප්‍රත්‍යුත්පන්නකාලයන් ගැණ දන්නා සේකැ"යි පුතු ගැණ තොරතුරු අසා දැන ගන්නට බුදුරජුන් වෙත ගියා ය. බුදුරජානන් වහන්සේ ඍද්ධියෙන් සොපාක සඟවා සිටි සේක. එකල්හි ඕ තොමෝ "ස්වාමීනි! ඔබ වහන්සේ මා පුතු ගැණ කිසිවක් දන්නා සේක් දැ?"යි ඇසූ ය. එකල්හි බුදුරජානන් වහන්සේ:-

"න සන්ති පුත්තා තාණාය න පිතා නපි බන්ධවා,
අන්තකෙනාධිපන්නස්ස නත්ථි ඤාතීසු තාණතා"

යි දහම් දෙසූහ. ඕ තොමෝ එය අසා සෝවන් වූ ය. සොපාක රහත්බවට පැමිණියේ ය. ඉක් පසු භාග්‍යවතුන් වහන්සේ ඍද්ධිය හළ සේක. ඕ තොමෝ පුතු දැක තුටුපහටු වූවා පුතු රහත් වූ බව ද අසා පැවිදි කරවා ගියා ය

සොපාක, ගඳකිළි සෙවනැල්ලෙහි සක්මන් කරණ බුදුරජුන් වෙත එළැඹ වැද උන්වහන්සේ අනුව සක්මන් කෙළේ ය. බුදු-රජානන් වහන්සේ ඔහුට උපසම්පදාව අනුදනු කැමති ව "එක නාම කිං" යනාදී වූ ප්‍රශ්න දසයක් අසා වදාළ සේක. හෙතෙමේ ද බුදුරජානන් වහන්සේ ගේ අදහස් ගෙණ සර්වඥතාඥනය හා සසඳා ඒ ප්‍රශ්න විසඳී ය. එහෙයින් ඒ ප්‍රශ්නයෝ කුමාරප්‍රශ්න නම් වූහ. බුදුරජානන් වහන්සේ ඔහුගේ ප්‍රශ්නව්‍යාකරණයෙන් සතුටු වූ සේක් උපසම්පදාව අනුදන වදාළ සේක. ඒ මේ උපසම්පදා තොමෝ ප්‍රශ්නව්‍යාකරණොපසම්පදා නම් වූ ය. මෙසේ සුමන හෙරණුන් උපසම්පදාව ලැබූ පසු "ඇවැත්නි! මහාපුදුමයෙක, මේ ළදරු

හෙරණහුගේ ආනුභාවය ඉමහත් ය, අප මෙයට පෙර මෙබඳු මහත් ආනුභාව ඇතියෙක් නො දක්නා ලදද ය"යි භික්ෂූන් වහන්සේලා ධර්මසභායෙහි කතා කරන්නට වූහ. ඒ අතර ධර්මසභාවට වැඩම කළ බුදුරජාණන් වහන්සේ "මහණෙනි! කතා කරන්නාහු කුමක් ගැන ද?"යි අසා "සුමන සාමණේරයන්ගේ මහත් ආනුභාවය ගැන ය"යි සැලකළ කල්හි "මහණෙනි! මාගේ ශාසනයෙහි ළදරු මහණ තෙමේ ද මැනැවින් පිළිපදිනුයේ මෙබඳු මහත් සම්පත් ලබා ය"යි වදාරා මේ ධර්මදෙශනාව කළ සේක.

**යො හවෙ දහරො භික්ඛු යුඤ්ජති බුද්ධසාසනෙ,**
**සො ඉමං ලොකං පභාසෙති අබ්භා මුත්තොව චන්දිමා ති.**

යම් ළදරු මහණෙක් තෙමේ බුදුසසුන්හි යෙදේ ද, ඒ මහණ තෙමේ වලායෙන් මිදුනු සඳමෙන් මේ ලෝකය ඒකාන්තයෙන් ඉතා තදින් බබුළුවන්නේ ය.

**යො හවෙ දහරො භික්ඛු යුඤ්ජති බුද්ධසාසනෙ** = යම් ළදරු මහණෙක් තෙමේ බුදුසසුන්හි යෙදේ ද.

**සො ඉමං ලොකං පභාසෙති අබ්භා මුත්තො චන්දිමා ඉව** = ඒ මහණ තෙමේ වලායෙන් මිදුනු සඳමෙන් මේ ලෝකය බබුළුවන්නේ ය.

**දහරො,** යනු මෙහි සත්වැසි බාල මහණහු කෙරෙහි නැඟී සිටියේ ය. එහෙත් **"දහරො ච මහන්තො ච"** යන මෙහි හා **"දහරො යුවා සුසු කාළකෙසො"** යනාදී තැන්හි ද තරුණයා කෙරෙහි ආයේ ය.

යම් ළදරු මහණෙක් බුදුරජුන් වදාළ අප්‍රමාද ප්‍රතිපත්තියෙහි හා ශමථ-විදර්ශනා භාවනාවන්හි තදින් යෙදී වසා ද, ඒ මහණ තෙමේ වලාපටලින් මිදුනු පුන්සඳ අවකාශ ලෝකය බබුළු වන්නා සේ අර්හත්මාර්ගඥානාලෝකයෙන් ස්කන්ධ-ධාතු-ආයතන සංඛ්‍යාත වූ මේ ලෝකය ඒකාන්ත විසින් ප්‍රකර්ෂයෙන් බබුළු වන්නේ ය.

**'අබ්භා මුත්තො'** යනු යට කියන ලදී.[1]

ධර්මදෙශනාවගේ අවසානයෙහි බොහෝ දෙන සෝවන් ඵලාදියට පැමිණියාහු ය.

**සුමනශ්‍රාමණේර වස්තුව නිමි.**

සකලජන ධර්මාර්ථ සංග්‍රහාභිලාෂී **පණ්ඩිත** අම්බලම්ගොඩ **ධම්මකුසල** ස්ථවිරයන් කළ **සද්ධර්මසාගර** නම් වූ **ධර්මපදවර්ණනා**යෙහි භික්ෂුවර්ගාත්මක පඤ්චවිංශතිතම තරඞ්ගය නිමියේ ය.

---

1. 13. 5. 'අබ්භා මුත්තො' යනු බලනු.

# බ්‍රාහ්මණවර්ගය

## ප්‍රසාදබහුල බ්‍රාහමණයෙක්

### 26 – 1

ප්‍රසාදබහුල බ්‍රාහමණයෙක් බුදුරජුන් වෙතින් බණ අසා පහන් සිත් ඇතියේ භික්ෂූන් සොළොස් නමකට තමන්ගේ ගෙයි නිතිබත් පිහිටු වී ය. එ බමුණු භික්ෂූන් ගෙට වැඩිය කල්හි පාත්‍ර ගෙණ ''පින්වත් රහතුන් වහන්සේ වඩින්වා, පින්වත් රහතුන් වහන්සේ වැඩ හිඳින්වා''යි යම් කිසිවක් කියනුයේ නම් අභීතණ්වාද යෙන් යුත් බසක් ම කියන්නේ ය. ඔවුන් අතුරෙහි සිටි පෘථග්ජනභික්ෂූන් වහන්සේලා ''මෙ තෙමේ අප කෙරෙහි රහත් ය යන අදහස් ඇතියේ''ය යි ද, රහතුන් වහන්සේලා ''මෙ තෙමේ අප රහතුන් බව දනී ය''යි ද සිතූහ. මෙසේ ඒ සියලු දෙනා වහන්සේ ම කුකුස් කරන්නෝ ඔහුගේ ගෙට නිතිබත් පිණිස නො වැඩියහ. බ්‍රාහමණ තෙමේ දුක් ඇතියේ නො සතුටු සිත් ඇතියේ ''ස්වාමීන් වහන්සේලා මාගේ ගෙට නො වඩින්නාහු කුමක් නිසා''යි දැන ගණු රිසියෙන් විහාරයට ගොස් බුදුරජුන් වැඳ එ පුවත සැල කොට සිටියේ ය. එ කල්හි බුදුරජාණන් වහන්සේ භික්ෂූන් අමතා ''මහණෙනි! තමුසේලා බමුණාගේ ගෙට සිඟා නො යන්නාහු කුමක් නිසා?''යි අසා වදාළ සේක. භික්ෂූහු බමුණාගේ ගෙට නො යැමෙහි හෙතුව බුදුරජුන්ට දන්වා සිටියහ. එවිට බුදුරජාණන් වහන්සේ ''මහණෙනි! තමුසේලා අභීතණ්වාදය ඉවසහු ද?''යි අසා වදාළ කල්හි ''ස්වාමීනි! අපි එය නො ඉවසමු'' යි කීහ. එවිට ''මහණෙනි! මෙය මිනිසුන් විසින් පහන් සිතින් කියන්නෙකි, පහන් සිතින් කියන බසෙහි ඇවැත් නැත, තව ද මෙය බමුණාගේ රහතුන් කෙරෙහි වූ අධික වූ ප්‍රෙමයෙකි, එහෙයින් තමුසේලා ද තෘෂ්ණා නැමැති සැඩපහර සිඳ හැර රහත් වන්නට වැර කරවු''යි වදාරා මේ ධර්‍මදෙශනාව කළ සේක.

**ඡින්ද සොතං පරක්කම්ම කාමෙ පනුද බ්‍රාහ්මණ!,**
**සඞ්ඛාරානං ඛයං ඤත්වා අකතඤ්ඤූසි බ්‍රාහ්මණාති.**

බ්‍රාහමණය! පරාක්‍රම කොට තෘෂ්ණාස්‍රොතස සිඳ ලව. කාමයන් දුර ලව. බ්‍රාහමණය! සංස්කාරයන්ගේ විනාශය දැන අකෘතඥ යෙක් වන්නෙහි.

**ඡින්ද සොතං පරක්කම්ම කාමෙ පනුද බ්‍රාහමණ!** = බ්‍රාහමණය! පරාක්‍රම කොට තෘෂ්ණාස්‍රොතස සිඳ ලව. දුර ලව.

සීමා නියමයක් නො දත හැකි කලක් මුළුල්ලෙහි ඇස් - කන් - නාස් ඈ දොරටු සයෙන් අතර නො තබා ගලා යන තෘෂ්ණා ස්‍රොතස සුලුපටු වැරයෙකින් සිඳහරිණු නො හැකි ය. ඒ පිණිස

මහත් වූ ම උත්සාහයෙක් කළ යුතු ය. ඒ මේ උත්සාහය ද නුවණ හා එක්විය යුතු ය. එසේ නුවණින් යුක්ත වූ උත්සාහයෙන්, උත්සාහ ඇතියහු විසින් ම තෘෂ්ණාව සිඳ හැරිය යුතු ය. ඒ සඳහා ම වස්තු කාමයන් නිසා නගිනා ක්ලේශකාමයන් වස්තුකාමයන් සිතින් බැහැර කළ යුතු ය.

මෙහි **'සොත'** නම්, තෘෂ්ණාවය. ලොව පුරා සිටුනා සත්වයන් ඒ ඒ භවයට ඇද ගෙණ ගසා ගෙණ යන බැවින් තෘෂ්ණාව සැඩ පහරක් වැනි බැවින් සොත නම් වූ ය. ආදියක් නො පෙණෙන කාලයක සිට නො සිඳ පැවැත එන ෂඩ්ද්වාරික වූ ඒ මේ තෘෂ්ණා ස්‍රොතස ස්වල්පවීය්‍ර්යයෙකින් නො සිඳිය හැකි බැවින් අධික වීය්‍ර්යයෙන් හෙවත් ඥානසම්ප්‍රයුක්ත වූ සම්‍යක් ප්‍රධාන වීය්‍ර්යයෙන් ම සිඳ හැරිය යුතු ය,යි **'පරක්කම'** යන ක්‍රියා පදයෙන් දක්වා වදාළ සේක.

ආරම්භධාතු – නික්කමධාතු – පරක්කමධාතු යි මෙහි අවස්ථා තුනෙක් වන්නේ ය. එහි ප්‍රථමාරම්භ වීය්‍ර්යය **'ආරම්භධාතු'** නම් කුසීතකමින් නික්ම ගිය එයට වඩා බලවත්තර වීය්‍ර්යය **'නික්කම ධාතු'** නම්. මතු මත්තෙහි විශෙෂය එළවන බැවින් එ දෙකට ම වඩා බලවත්තම වීය්‍ර්යය **'පරක්කමධාතු'** නම්. ආරම්භය කාමයන් දුරලනු පිණිස ය. නික්කමය ක්‍රොධය උගුළුවාලනු පිණිස ය. පරක්කමය සසර බැඳුම් සිඳලනු පිණිස ය,යි අටුවායෙහි කියන ලද්දේ ය. 'පරක්කම' යන මේ ක්‍රියාපදයෙන් ගැණෙනුයේ මේ තෙ වැනි ව කියූ පරාක්‍රමවීය්‍ර්ය ය.

**'කාමෙ'** නම්, වස්තුකාම ක්ලේශකාමයෝ ය. යට කියන ලදී.[1] **'පනුද'** යනු, ක්‍රියා පද යි. 'බැහැර කරව' යන අරුත්. **'නුද'** යන ක්‍රියා පදය **'ප'** යන උපසර්ගයෙන් වැඩී සිටියේ ය. එහෙයින් කාමයන් කිසිවක් ඉතිරි නො කොට බැහැර ලව යන අරුත් ගන්නේ ය. ප යනු, **ආදිකර්‍ම – උදීර්ණ–භාග–ඓශ්වය්‍ර්ය – සම්භව වියොග – නියොග – තෘප්ති – ශුද්ධි – ඊප්සා – ශක්ති – ශාන්ති – පූජා – අග්‍ර – දර්ශන** යන අරුත්හි එන්නේ ය. මෙහි භාගාර්ථ යෙහි ආයේ ය.

**'බ්‍රාහ්මණ'** යන මෙයින් **"ඛීණාසවානං ආලපනමෙතං"** යි කියූ බැවින් රහතුන් වහන්සේ ගැණෙන්නෝ ය. රහතුන් වහන්සේ ය ප්‍රධාන විසින් බ්‍රාහ්මණ. එහි ලා යුක්ති මෙසේ දතයුතු ය.

බුදුරජානන් වහන්සේ බුදුවීමෙන් පස්වන සතියෙහි **අජපාල** න්‍යග්‍රොධ මූලයෙහි සමාධියෙන් නැගිට වැඩ හුන් සේක.

1, 2. 4. 'මා කාමරතිසන්ථවං' යනු බලනු.

එ වේලෙ හි හුහුඞ්ක ජාතික වූ එක්තරා බමුණෙක් උන්වහන්සේ වෙත එළැඹැ එකත් පසෙක සිට "භවත් ගෞතමයන් වහන්ස! කොතෙකින් බමුණෙක් වේ ද? බමුණු බව කරණ දහම් කවරේ දැ?"යි ඇසී ය. බුදුරජානන් වහන්සේ "යම් බමුණෙක් බැහැර ලූ පාපධර්ම ඇත්තේ ද, ක්‍රොධ මාන විසින් හුහුංකාර නැත්තේ ද, කෙලෙස් කසට නැත්තේ ද, සංයත වූ සිත් ඇත්තේ ද, සිවු මග නුවණින් නිවනට පැමිණියේ ද, වැස නිම කළ මගබඹසර ඇත්තේ ද, යමකුගේ සිත්හි කිසි අරමුණෙක ලා නැඟ එන රාගාදීහු නැත් ද හෙ තෙමේ මම බ්‍රාහමණ වෙමි යි බ්‍රහමවාදය දහම් නයින්, කියන්නේ ය"යි එයට පිළිතුරු විසින් වදාළ සේක.

මේ ඒ දෙශනාව:

"යො බ්‍රාහමණො බාහිතපාපධම්මො
නිහුහුඞ්කො නික්කසාවො යතත්තො,
වෙදන්තගූ වුසිතබ්‍රහමචරියො
ධම්මෙන සො බ්‍රහමවාදං වදෙය්‍ය
යස්සුස්සදා නත්ථි කුහිඤ්චි ලොකෙ" යනු.

තව ද දවසෙක බුදුරජානන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන වේලෙහි **ශාරිපුත්‍ර – මහාමෞද්ගල්‍යායන – මහාකාශ්‍යප – මහාකාත්‍යායන – මහාකොට්ඨිත – මහාකප්පින – මහාචුන්ද – රෙවත – ආනන්ද** යන මහාස්ථවිරයන් වහන්සේලා තමන් වහන්සේ වෙත එනු දැක එහි සිටි භික්ෂූන් අමතා "මහණෙනි! මේ බමුණෝ එති, මේ බමුණෝ එති"යි වදාළ සේක. එ කල්හි එහි සිටි භික්ෂු නමක් "ස්වාමීනි! කොතෙකින් බමුණෙක් වේ ද? බමුණු බව කරණ දහම් කවරේ දැ?" ඇසී ය. එකල්හි බුදුරජානන් වහන්සේ "ත්‍රිවිධ දුශ්චරිත, ද්වාදශවිධ අකුශල චිත්තොත්පාද, දශ අකුශල කර්මපථ යන නන්වැදෑරුම් වූ ලාමකධර්මයන් සමුච්ඡේදප්‍රහාණ විසින් බැහැර කොට සිටි සෑම වේලෙහි රූපාදී වූ සවැදෑරුම් අරමුණුවල සිහියෙන් යුක්ත ව සිවු ඉරියවු ගෙවන චතුර්විධ ආර්‍යමාර්ගඥාන-යෙන් සිඳ හළ සංයොජන ඇති සිවු සස් දහම් අවබොධ කළ එහෙයින් ම ආර්‍යජාති ඇති භාග්‍යවතුන් වහන්සේගේ ඖරස පුත්‍රයෝ මේ සත්වලොකයෙහි පරමාර්ථ විසින් බ්‍රාහමණ නම් වෙති. ජාතිගොත්‍ර නාම විසින් බ්‍රාහමණ නම් නො වෙති"යි මුලින් දෙසනා ලද කරුණු ම අන් ලෙසකින් පිළිතුරු විසින් වදාළ සේක.

මේ එය වදාළ සැටි:

"බාහිත්වා පාපකෙ ධම්මෙ යෙ චරන්ති සදා සතා,
ඛීණසංයොජනා බුද්ධා තෙ වෙ ලොකස්මිං බ්‍රාහමණාති" යනු.

**"බාහිතපාපත්තා = බ්‍රාහ්මණෝ"** යනු මේ කියූ ආයර්‍ය ගුණ ඇති අපගේ ආර්‍යයන් කෙරෙහි නැගුනේ ය.

**"බ්‍රහ්මං අණතීති = බ්‍රාහ්මණෝ"** යනු පව්කම් බැහැර නො කළ එක්තරා පුහුදුන් මිනිස් කොටසක් මිනිසුන් කෙරෙන් උසස් කොට දක්වනු සඳහා උන් විසින් ම යොදා ගන්නා ලද්දේ ය.

ආර්‍ය බ්‍රාහ්මණයන් අතුරෙහි බුදුරජාණන් වහන්සේ ම පරමාර්‍ථ විසින් බ්‍රාහ්මණ වන සේක. උන්වහන්සේ සර්‍වාකාර පරිපූර්‍ණ වූ දානසංයමාදී වූ වත් පිළිවෙත්හි හා තපශ්චරණයෙහි නිරවශෙෂ-යෙන් පරතෙරට ගිය සේක. මැනැවින් වැස නිම කළ මගබඹසර ඇති සේක. ආර්‍යමාර්‍ගඥානයෙහි කෙළවරට ගිය සේක. සුවිශුද්ධ-විද්‍යාචරණ ඇති සේක. මුළුමනින් සෝදා හළ පාපමල ඇති සේක. නිරුත්තර වූ ආර්‍යමාර්‍ගීය පවත්වාලන සේක. අති පරිශුද්ධ වූ ශාසනබ්‍රහ්මචර්‍යය ප්‍රකාශ කරණ සේක. එහෙයිනි බ්‍රාහ්මණයන් අතුරෙහි උන්වහන්සේ ප්‍රධාන වන සේක්.

පරයෝ **"බ්‍රහ්ම, වෙදඃ, තං අධීතෙ = බ්‍රාහ්මණඃ"** යනු විසිනුදු විවරණය කරත්. බ්‍රහ්ම නම්, වෙදය යි. එය හදාරණුයේ බ්‍රාහ්මණ නම් යනු අරුත්. මහබඹහුගේ පුත්‍ර නු යි බ්‍රාහ්මණ නම් වෙති යි ද ඔවුහු කියත්. මේ එය: **"ප්‍රජාපතෙඃ අපත්‍යං බ්‍රාහ්මණඃ"** යනු. ජාතියෙන් කුලයෙන් පැවැත්මෙන් වෙදාධ්‍යයනයෙන් ශ්‍රැතියෙන් යන මෙයින් යුක්ත වූයේ බ්‍රාහ්මණැ යි පරයන් විසින් කියන ලදී.

"ජාත්‍යා කුලෙන වෘත්තෙන ස්වාධ්‍යායෙන ශ්‍රැතෙන ච,
එභියුක්තො හි යඃ නිත්‍යං ස ද්විජ උච්‍යතෙ"

යනු එහිලා අයේ ය. මොවුහු තමන් බ්‍රහ්මයාගේ කටින් උපන් බැවින් බ්‍රාහ්මණ නම් වී ය යි ද කියා ගණිත්. **"බ්‍රාහ්මණඃ මුඛාජ්ජාතඃ = බ්‍රාහ්මණඃ"** යනු ඒ කීම ය.

ශාල්මලද්වීප-කුශද්වීප-ක්‍රෞඤ්චද්වීප - ශාකද්වීප - පුෂ්කරද්වීප යන ද්වීප විසින් ස වැදෑරුම් කොට, අධ්‍යයන-යජන-දාන යන ධර්‍ම විසින් තෙ වැදෑරුම් කොට, අධ්‍යාපන-යාජන-ප්‍රතිග්‍රාහක යන ජීවිකාවෘත්ති විසින් තෙ වැදෑරුම් කොට, බ්‍රහ්මචාරී - ගෘහස්ථ - වානප්‍රස්ථ-සන්‍යාසී යන ආශ්‍රම විසින් සිවු වැදෑරුම් කොට ද බමුණෝ බෙදා දක්වන ලදහ. මුන් පිළිබඳ කතා ව ඉතා දිග ය. මහාභාරත, වහ්නිපුරාණ, කල්කිපුරාණ, පද්මපුරාණාදියෙහි ඒ දක්ක හැකි ය.

බුදුරජාණන් වහන්සේ ජාතිගොත්‍ර විසින් වෙන් කට හැකි බමුණෙක් නැතැ යි වදාළ සේක. බ්‍රහ්මයාගේ කටින් උපන්නෙක් නැතැ යි

වදාළ සේක. වේදය හදාරණ බැවින් බමුණු වූවෙක් නැතැ යි වදාළ-සේක. ලොකයෙහි ලා 'බ්‍රාහමණ' යනු ව්‍යවහාරමාත්‍රයෙහි සිටී ය යි වදාළ සේක. නියම අරුත් විසින් මොවුහු බ්‍රාහමණ නො වෙති යි වදාළ සේක.

**සඞ්ඛාරානං ඛයං ඤත්වා අකතඤ්ඤූ අසි බ්‍රාහමණ!** = බ්‍රාහමණය! සංස්කාරයන්ගේ විනාශය දැන අකෘතඥයෙක් වන්නෙහි ය.

**'සඞ්ඛාර'** නම්: පඤ්චස්කන්ධය යි ද එහි විනාශය විදර්ශනාඥානයෙන් දැන අකෘත නම් වූ නිවන අරමුණු කිරීම් විසින් දැකීම් හෙතුවෙන් දැනීම් හෙතුවෙන් **'අකෘතඥ'** නම් වන්නේ ය. නිවන සංස්කාර හෙතුවෙන් හට ගත්තේ නො වේ. එහෙයින් අකෘත ය. ප්‍රත්‍යය-යන්ගේ බලයෙන් ප්‍රත්‍යයයන්ගේ එක්වීමෙන් හට ගත් ලොකයෙහි ඇති තාක් සජීවාජීව වස්තූහු සංස්කාර නම් වෙත්. සංස්කාර-යන්ගේ විනාශය වනතුරු ම සත්ත්වයා භවයෙන් භවය උපත ලබමින් ගමන් කරන්නේ ය. **"අකතඤ්ඤූති එවං සන්තෙ ත්වං සුවණ්ණාදිසු කෙනචි අකතස්ස නිබ්බානස්ස ජානනතො අකතඤ්ඤූ නාම"** යනු අටුවා. රත්රිදී ඈ කිසිවකින් දිව්‍යබ්‍රහ්මාදී කිසිවකු විසින් නො කළ හෙයින් කිසිත් හෙතුවකින් නූපන් හෙයින් නිවන 'අකත' නම් වීය යනු එහි අදහස ය.[1]

ධම්දෙශනාවගේ අවසානයෙහි බොහෝ දෙන සෝවන්-පලාදියට පැමිණියාහු ය.

**ප්‍රසාදබහුල බ්‍රාහ්මණවස්තු නිමි.**

1. 7. 8 'අකතඤ්ඤූ' යනු බලනු.

# බුදුරජුන් වෙත පැමිණි භික්ෂූන් වහන්සේලා

## 26 – 2

බුදුරජාණන් වහන්සේ දෙව්රම් මහවෙහෙර වැඩවසන එක් දවසෙක දිසාවැසි භික්ෂූන් වහන්සේලා තිස් නමක් පැමිණ බුදුරජුන් වැඳ පසෙකට වී හුන්හ. ඒ වේලෙහි එහි වැඩහුන් සැරියුත් මහතෙරණුවෝ ඒ භික්ෂූන්ට රහත් වන්නට තුබූ හෙතුසම්පත් දැක බුදුරජුන් වෙත එළැඹ "ස්වාමීනි! ධර්ම දෙකෙක් වේ ය යි කියනු ලැබේ, ස්වාමීනි! ඒ ධර්ම දෙක කවරේ ද?"යි ඇසූහ. "ශාරිපුත්‍ර! ඒ දෙක, ශමථවිදර්ශනා"යි වදාරා මේ ධර්මදෙශනාව කළ සේක.

**යදා ද්වයෙසු ධම්මෙසු පාරගූ හොති බ්‍රාහ්මණො,**
**අථස්ස සබ්බෙ සංයොගා අත්‍ථං ගච්ඡන්ති ජානතො.**

බ්‍රාහ්මණ තෙමේ යම් කලෙක දෙ වැදෑරුම් වූ ධර්මයෙහි පරතෙරට ගියේ වේ ද, එකල්හි සිවු සස්දහම් මනා කොට දන්නා වූ ඒ බ්‍රාහ්මණයාගේ සියලු සංයොගයෝ විනාශයට යන්නාහු ය.

**යදා ද්වයෙසු ධම්මෙසු පාරගූ හොති බ්‍රාහ්මණො**=බ්‍රාහ්මණ තෙමේ යම් කලෙක ධර්ම දෙකෙක පරතෙරට ගියේ වේ ද.

**'ද්වයෙසු ධම්මෙසු'** යන මෙයින් ශමථ-විදර්ශනා ධර්ම දෙක්හි, යන අරුත් ගැණේ. යට කියන ලදි[1]

**පාරගූ** නම්: පරතෙරට ගියේ ය. අභිඤ්ඤාපාරගූ-පරිඤ්ඤාපාරගූ-පහානපාරගූ-භාවනාපාරගූ – සච්ඡිකිරියාපාරගූ – සමාපත්තිපාරගූ යන මොවුහු මෙහි ඇතුළත් වෙත්. තමන් ලත් නුවණින් ඤාත පරිඤ්ඤායෙන් නිවනට ගියේ **'අභිඤ්ඤාපාරගූ'**. සියලු ධර්මයන් තීරණපරිඤ්ඤායෙන් ඉක්මවා ගියේ **'පරිඤ්ඤාපාරගූ'**. සමුදය පාක්ෂික වූ සියලු කෙලෙස් පහානපරිඤ්ඤායෙන් ඉක්මවා ගියේ **'පහානපාරගූ'**. භාවනායෙන් සසරකෙළවරට පැමිණ මාර්ගයන්ගේ වශයෙන් නිර්වාණපාරයට ගියේ **'භාවනාපාරගූ'**. ඵලනිර්වාණ වශයෙන් ප්‍රත්‍යක්ෂ කිරීමෙන් ඵලනිර්වාණපාරයට ගියේ **'සච්ඡිකිරියා පාරගූ'**. අටවැදෑරුම් සමාපත්තීන්ගේ පාරයට ගියේ **'සමාපත්ති පාරගූ'**. රහතුන් වහන්සේ ය. **"තිණ්ණො පාරගතො ථලෙ තිට්ඨති බ්‍රාහ්මණො"ති ඛො භික්ඛවෙ, අරහතො එතං අධිවචනං, සො අභිඤ්ඤාපාරගූ පරිඤ්ඤාපාරගූ පහානපාරගූ භාවනාපාරගූ සච්ඡිකිරියාපාරගූ සමාපත්තිපාරගූ"**ති යනු දෙශනා ය. යමෙක් පාරයට යනු කැමැත්තේ නම් හේද පාරගූ.

1. 20. 2. 'සබ්බෙ සඞ්ඛාර අනිච්චාති' යනු බලනු.

යමෙක් පාරයට යේ නම් හේ ද පාරගූ. යමෙක් පාරයට ගියේ නම් හේ ද පාරගූ. **යොපි පාරං ගන්තුකාමො සොපි පාරගූ, යොපි පාරං ගච්ඡති සොපි පාරගූ, යොපි පාරං ගතො සොපි පාරගූ"** යනු ද දතයුතු ය. මෙහි ද **බ්‍රාහ්මණ,** රහතුන් වහන්සේ ය.

**අථ අස්ස සබ්බෙ සංයොගා අත්ථං ගච්ඡන්ති ජානතො** = එකල්හි සිවු සස්දහම් දන්නා වූ බ්‍රාහ්මණයාගේ සියලු සංයොගයෝ විනාශයට යන්නාහ.

දුඃඛසත්‍යය දතයුතු ය, සමුදය සත්‍යය දුරු කළ යුතු ය, නිරොධ සත්‍යය ප්‍රත්‍යක්‍ෂ කළයුතු ය, මාර්ගසත්‍යය වැඩිය යුතු ය, යනු විසින් චතුරාර්‍ය්‍යසත්‍යයන් සත්‍යඥානාදීන්ගේ වශයෙන් දන්නා වූ ඒ ක්‍ෂීණාස්‍රවබ්‍රාහ්මණයාගේ සියලු සංයොගයෝ මුළුමනින් නැසී යන්නාහ.

මෙහි **'සංයොග'** නම්: කාමයොග-භවයොග-දිට්ඨියොග-අවිජ්ජා යොග යන මේ ය. සත්වයන් සසර යොදන බැවින් 'සංයොග' නම්. මේ කාමයොගාදීන්ගේ මුඛයෙන් සෙසු කෙලෙස් ද ගන්නා ලද ය. එහෙයින් කාමයොගාදීන් හා සෙසු කෙලෙස්හු ද නැසී යන්නාහ.[1]

ධම්දෙශනාවගේ අවසානයෙහි ඒ සියලු භික්‍ෂුහු රහත්බැව්හි පිහිටියාහු ය.

**සම්බහුල භික්‍ෂුවස්තුව නිමි.**

1. 2. 1, 'යොගක්ඛෙමං' යනු බලනු.

# මරුට දෙසූ දහමෙක්

**26 – 3**

**දවසක්** මාර තෙමේ මිනිස් වෙසක් මවාගෙණ බුදුරජානන් වහන්සේ වෙත එළැඹ, "සවාමීනි! පාර, පාර යි කියනු ලැබේ, සවාමීනි! මේ පාර නම් කිමැ?"යි ඇසී ය. එවිට බුදුරජානන් වහන්සේ "මෙ තෙමේ මාරයා"යි දැන "පව්ට! පාරය කිමැ,යි සෙවීමෙන් තට ඇති ප්‍රයොජනය කිම? එය පහ කළ රාගය ඇත්තවුන් විසින් සෙවිය යුත්තෙක, පැමිණිය යුත්තෙකැ"යි වදරා මේ ධර්මදෙශනාව කළ සේක.

**යස්ස පාරං අපාරං වා පාරාපාරං න විජ්ජති,**
**වීතද්දරං විසංයුත්තං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණන්ති.**

යමක්හට පාරයත් අපාරයත් පාරය හා අපාරයත් නැත්තේ ද පහ වූ කෙලෙස් දැවිලි ඇති සියලු කෙලෙසුන් කෙරෙන් මිදුනු ඔහු, මම බ්‍රාහමණැ යි කියමි.

**යස්ස පාරං අපාරං වා පාරාපාරං න විජ්ජති** = යමක්හට එතෙරත් මෙතෙරත් එතෙරමෙතරත් නැත්තේ ද.

මෙහි **'යස්ස'** යනු, රහතුන් වහන්සේ සඳහා යෙදුනේ ය. **'පාර'** නම්: ආධ්‍යාත්මික ෂඩායතනැ යි කියූ චක්ඛු – සොත – ඝාන – ජිව්හා – කාය – මන යන ආයතනයෝ ය. **'අපාර'** නම්: බාහිර ෂඩායතනැ යි කියූ රූප – සද්ද – ගන්ධ – රස – ඵොට්ඨබ්බ – ධම්ම යන ආයතනයෝ ය. **'පාරාපාර'** නම්: ආධ්‍යාත්මික – බාහිර ද්වාදශායතනයෝ ය. සාමාන්‍යයත් විසින් එතෙර, පාර යි ද, මෙතෙර අපාර යි ද පිළිගන්නා ලද්දේ ය.

**වීතද්දරං විසංයුත්තං තං අහං බ්‍රෑමි බ්‍රාහ්මණං** = මම පහ වූ කෙලෙස්පෙළීම් ඇති සියලු කෙලෙසුන් කෙරෙන් මිදුනු ඔහු බ්‍රාහමණැ යි කියමි.

තවද යම් කෙනෙක්හට තමන් කෙරෙහි "මම මි"යි දෘෂ්ටිග්‍රාහයෙක් නැත්තේ ද ආත්මීයවස්තූන් කෙරෙහි "මේ මාගේ"යි තෘෂ්ණාග්‍රාහයෙක් නැත්තේ ද සියලු තෘෂ්ණා දෘෂ්ටි ආදීන්ගෙන් මිදී සිටි කෙලෙස් පීඩාවලින් මිදී සිටි ඔහු මම බ්‍රාහමණැ යි කියම්'යි වදාළ සේක.

**'වීතද්දර'** නම්: රහතුන් වහන්සේ ය. පහ වූ කෙලෙස්පෙළීම් ඇතියෝ උන්වහන්සේ ය. **වීත + දර** යන ශබ්ද දෙදෙනාගේ සමාසය 'වීතද්දර' යනු ය. දර ශබ්දය, කායදහ – චිත්තදහ –

කෙලශදහ යන මෙ තැන්හි වැටේ. **“ආදිත්තං වත මං සන්තං සන්තසිත්තාංව පාවකං වාරිනා විය ඔසිඤ්චං සබ්බං නිබ්බාපයෙ දරං”** යන මෙහි කායදහ–චිත්තදහ දෙක්හි ආයේ ය. **“වීතද්දරො වීතසොකො වීතසල්ලො සයං අභිඤ්ඤාය අභාසි බුද්ධො”** යන මෙහි කෙලශදහයෙහි ආයේ ය. මෙහි ද හුනුයේ කෙලශදහයෙහි ය. අර්හත්මාර්ගඥානයෙන් සියලු කෙලෙස් මුළුමනින් ඉතිරි නො කොට සිඳ හැරියේ ‘වීතද්දර’ නම් වේ. **“අග්ගමග්ගෙන සබ්බකිලෙසානං සමුච්ඡින්නත්තා වීතද්දරො, විගතකිලෙසදරථොති අත්ථො”** යනු අටුවා.

රහතුන් වහන්සේ **‘විසංයුත්ත’** නම් ද වේ. මෙහි ඇති තාක් කෙලෙස්වලින් මිදී සිටියෝ උන්වහන්සේ ය. ලොකය හා හැනී සිටි සියලු සංයොජන, සියලු කෙලෙස් මුළුමනින් සිඳලූ බව කෙලෙසුන්ගෙන් මිදී සිටි බව යන මෙයින් යුක්ත වූයේ බ්‍රාහමණ යි ද කියනු ලැබේ.

මේ අටුවා: **“ලොකපටිබද්ධානං සබ්බසං සංයොජනානං සබ්බසං කිලෙසානං සම්මදෙව සමුච්ඡින්නත්තා විසංයුත්තො, තතො විසංයුත්තොති අත්ථො”** යනු.

**‘වීතද්දරං, විසංයුත්තං’** යන දෙපදය **‘තං’** යනු වෙසෙසා සිටියේ ය.

ධර්මදෙශනාවගේ අවසානයෙහි බොහෝ දෙන සෝවාන්පලාදියට පැමිණියාහු ය.

**මාරවස්තුව නිමි.**

# තමන් බමුණු යි සිතා ගත් බමුණෙක්

**26 — 4**

"බුදුරජ තෙමේ තමන්ගේ ශ්‍රාවකයන් බමුණු කොට කියා ලන්නේ ය, මම ද ජාති ගොත්‍ර විසින් බමුණු වෙමි, එහෙයින් මට ද බමුණු යි කියන්නට වටී ය" යි සිතා ගත් එක්තරා බමු-ණෙක් බුදුරජුන් වෙත එළැඹ "මමත් බමුණු වෙමි, එහෙයින් මටත් බමුණු යි කියන්නට වටී ය" යි කියා සිටියේ ය. එවිට බුදු රජාණන් වහන්සේ "මම ලොකයා විසින් අරුත් නො සලකා සම්මත කර ගත් ජාති ගොත්‍ර නාම ඇත්තකු බමුණු යි නො කියමි, මම ජාති ගොත්‍ර නාම විසින් බමුණු යි කියා ගන්නවුන් බමුණුය යි නො පිළිගණිමි, උත්තමාර්ථයට පැමිණ රහත්බව ලබා සිටින්නහුට බමුණුය යි කියමි" යි වදාරා මේ ධර්ම දෙශනාව කළ සේක.

**ඣායිං විරජමාසීනං කතකිච්චං අනාසවං,**
**උත්තමත්ථං අනුප්පත්තං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණන්ති.**

මම, ධ්‍යාන කරණ සුලු වූ රජස් නැති එකලා ව වෙනෙහි හුන් කළකිස ඇති ආශ්‍රව නැත්තා වූ උත්තමාර්ථයට පිළිවෙළින් පැමිණි ඒ රහත්හු බ්‍රාහ්මණය යි කියමි.

**ඣායිං** = ධ්‍යාන කරණ සුලු.

ආලම්බනොපනිජ්ඣානයෙන් හා ලක්ඛණොපනිජ්ඣානයෙන් ධ්‍යාන කරණ සුලු වූයේ ඣායී නම්.[1]

**විරජං** = රජස් නැති.

තදඞ්ග – විෂ්කම්භන – සමුච්ඡේද – ප්‍රතිප්‍රශ්‍රබ්ධි – නිඃශරණ යන විමුක්තීන්ගෙන් සෝදා හළ රාගාදී වූ රජස් ඇතියේ **'විරජ'** නම්.[2]

**ආසීනං** = එකලා ව හුන්.

ගණයා හා එක් ව විසීම් කෙලෙසුන් හා හැනී සිටීම් හැර දමා කයින් හා සිතින් හා හැම එකෙකින් ඈත් ව ගැඹුරු වල්හි එකලා ව හුන්නේ **'ආසීන'** නම්.[3]

**කතකිච්චං** = කළකිස ඇති.

1. 2, 1. 'ඣායිනො' යනු බලනු
2. 1, 14. 'සුවිමුත්තචිත්තො' " "
3. 5, 15. 'විවෙකමනු බ්‍රෑහයෙ' " "

සෝවන් ඈ සිවු මග නුවණින් පරිඥාද – පහාන – සච්ඡි-කිරියා – භාවනා යන ක්‍රම විසින් එක් එක් ආයසීසත්‍යයක්හුගේ ප්‍රතිවෙඩයෙන් කළකිස ඇතියේ **'කතකිච්ච'** නම්.[1]

පෘථග්ජන කල්‍යාණයා පටන් සපත ශෛක්ෂයයෝ සිවු මගින් කළ යුතු කටයුතු කරත්තෝ ය. කොට අවසත් නො කොළෝ ය. රහතුන් වහන්සේ ඒ සියලු කටයුතු සිවු මගින් කොට අවසන් කළෝ ය. උන්වහන්සේට එහිලා මත්තෙහි කළයුත්තෙක් නැත්-තේ ය. එහෙයිනි උන්වහන්සේ කතකිච්ච.

**අනාසවං** = ආස්‍රව නැත්තා වූ.

කාම – භව – දිට්ඨි – අවිජ්ජා යන චතුරාස්‍රවයන් චතුර්විධ ආයසීමාගීයෙන් සුදුසු පරිදි නසා සිටියේ පැහූ ආස්‍රව ඇතියේ **'අනාසව'** නම්.[2]

**උත්තමං අඝං අනුප්පත්තං** = උතුම් වූ අඪීයට පිළිවෙළින් පැමිණි.

මෙහි **'උත්තමත්‍ථ'** නම්: රහත් බව ය. **"උත්තමත්‍ථං අර-හත්තං"** කියේ එහෙයිනි. ඒ මේ රහත්බවට පැමිණිය යුත්තේ පිළිවෙළිනි. එය **'පත්ත'** යනු හා එක් ව සිටි **'අනු'** යන උපසගීය කියා ලත්තේ ය. අනු උපසගීය, **පශ්චාද්භාව – අධිෂ්ඨාන – සාමීප්‍ය – සාදෘශ්‍යය – අනුබන්ධ – විසගී – සාදෘශ්‍ය – ආභිමුඛ්‍ය – ලක්ෂණ – හීන – ක්‍රම** යන අරුත්හි එත්තේ ය. මෙහි සිටියේ ක්‍රමාඪීයෙහි ය.

පළමු කොට සෝවන් මගින් කෙලෙස් කොටසක්, දෙවනු ව සෙදගැමි මගින් කෙලෙස් කොටසක්, තෙවනු ව අනගැමි මගින් කෙලෙස් කොටසක්, සිවුවනු ව රහත් මගින් කෙලෙස් කොටසක් යන මෙලෙසින් සියලු කෙලෙස් නැසීමෙන් උත්තමාඪී නම් වූ රහත් බව ලැබිය යුතු ය. රහත්බවට වඩා උත්තමාඪීයක් නො වන බැවින් රහත්බව උත්තමාඪී සි වදාළ සේක.

ධම්දෙශනාවගේ අවසානයෙහි ඒ බ්‍රාහමණ තෙමේ සෝවන් පලයෙහි පිහිටියේ ය. ධම්දෙශනා තොමෝ පැමිණ සිටි පිරිසට ද වැඩ සහිත වූ ය.

**අන්‍යතරබ්‍රාහමණවස්තුව නිමි.**

---

1. 14, 6. 'දුක්ඛං දුක්ඛසමුප්පාදං' යනු බලනු.
2. 7, 4. 'යසසාසවා' ,, ,,

# බුදුරජුන්ගේ සරීරෝභාසය

**26 — 5**

**පසේනදි** කොසොල් රජ තෙමේ මහාපවාරණ දිනයෙහි සව්-බරණින් සැරසී ගඳමල් ඈ පිදෙව්ලි ගෙණ විහාරයට ගියේ ය. ඒ වේලෙහි **කාලුදායී** සථවිරයන් වහන්සේ ධ්‍යානයට සමවැද පිරිස් කෙළවර හුන්හ. උන්වහන්සේගේ සිරුර ඒ වේලෙහි මන වඩන්නේ රන්වන් ව බැබලුනේ ය. **ආනන්ද** සථවිරයන් වහන්සේ බැස යන සූය්‍ය්‍යීයාගේත් නැග එන චන්ද්‍රයාගේත් ආලෝකය බලා, නැවැත කොසොල් රජුගේ ශරීරශොභාවත් කාලුදායී තෙරුන්ගේ ශරීරශොභාවත් බුදුරජුන්ගේ ශරීරශොභාවත් බැලූහ. එහි දී ආනන්ද සථවිරයන් වහන්සේට ඒ සියලු ශොභාවන් මැඩ ඉක්මවා බුදුරජානන් වහන්සේගේ ශරීරශොභාව ම උසස් ව නැගී සිටුනා බව පෙණී ගියේ ය. ඉක්බිති තෙරුන් වහන්සේ බුදුරජුන් වැඳ "ස්වාමීනි! සූය්‍ය්‍යීයාගේ, චන්ද්‍රයාගේ, කොසොල් රජුගේ, කාලුදායී තෙරුන්ගේ, හා බුදුරජුන්ගේ ශොභාවන් බලා සිටි මට බුදු-රජුන්ගේ ශොභාව ම අන් හැම කෙනකුන්ගේ ශොභා යටපත් කොට ඉතා උස් ව බබලන බව පෙණී ගියේ ය, බුදුරජුන්ගේ ශොභාව ම මා සිත් ගත්තී ය, බුදුරජුන්ගේ ශොභාව ම සියලු ශොභාවන් මැඩ ගෙණ සිටියා ය"යි සැලකළහ. එ කල්හි බුදුරජාණන් වහන්සේ "ආනන්ද! හිරු දවල්හි ම බබලන්නේ ය, සඳ රෑ දවස ම බබලන්නේ ය, රජ තෙමේ අබරණ ලා සැරසී සිටි කල්හි ම බබලන්නේ ය, රහත් තෙමේ පිරිස් හැර දමා එකලා ව සමාපත්තිය තුළ සිටියේ ම බබලන්නේ ය, බුදුවරයෝ වනාහි රෑ දවල් දෙක්හි ම පස්වැදෑරුම් තෙදින් බබලන්නාහ"යි වදාරා මේ ධර්‍මදෙශනාව කළ සේක.

> **දිවා තපති ආදිච්චො රත්තිං ආභාති චන්දිමා,**
> **සන්නද්ධො ඛත්තියො තපති ඣායී තපති බ්‍රාහ්මණො,**
> **අථ සබ්බමහොරත්තිං බුද්ධො තපති තෙජසා.**

හිරු දවල බබලයි. සඳ රෑයෙහි බබලයි. රජ තෙමේ අබරණින් සැරසුනේ බබලයි. ක්ෂීණාස්‍රව බ්‍රාහමණ තෙමේ ධ්‍යාන කරන්නේ බබලයි. එහෙත් බුදුරජ තෙමේ සියලු රෑ දවල තෙදින් බබලයි.

**දිවා තපති ආදිච්චො** = හිරු දවල බබලයි.

**'ආදිච්ච'** යනු, සූය්‍ය්‍යීයාට නමෙකි. සූය්‍ය්‍යීයා ගැණ සූය්‍ය්‍යීයාගේ පහළවීම ගැණ අපගේ බෞද්ධග්‍රන්ථයන්හි ද සැකෙවින් කරුණු දක්නට ලැබේ. ඒ ඒ ආචාය්‍ය්‍යීවරයන් විසින් සූය්‍ය්‍යීයා ගැණ දක්වා

ඇති කරුණු බුද්ධභාෂිතය යි නො ගත යුතු ය. බෞද්ධග්‍රන්ථයන්හි එන ඒ කරුණු සමහර විටෙක බැහැරලන්නට නො සිදු වනුයේ ද නො වේ. **“අදිතියා පුත්තො = ආදිච්චො”** යනු විසින් කෙරෙණ අර්ථ විවරණයත්, **“ආදිකප්පිකෙහි ඉච්චිතබ්බා ගහන බ්බොති = ආදිච්චො”** යනු විසින් කෙරෙණ අර්ථ විවරණයත් පිළිගත යුතු ය යි කියනු සිත් නො ගත්තේ ය. එහි ‘අදිතියගේ පුත් ආදිච්චය’ යනු ප්‍රථමයෙහි අරුත් ය. මුල දී ආදිත්‍යයන් පස් දෙනකු වූ බවත් පසුව **ධාතෘ - මිත්‍ර - අර්යමන් - රුද්‍ර - වරුණ - සූර්ය - භග - විවස්වත් - පූෂන් - සවිතෘ - ත්වෂ්ටෘ - විෂ්ණු** යි දොළොස් දෙනකු වූ බවත් කියත්. ‘ආදිකල්පිකයන් විසින් එළැඹිය යුත්තේ ආදිච්චය’ යනු දෙවැන්නෙහි අරුත් ය.

සූර්යයා මුළුමනින් වහනිගොලයක් බැවින් **“ආතපෙසා දිප්පතීති = ආදිච්චො”** යනු විසින් කරණලද විවරණය මෙහිලා පිළිගත යුතු සේ පෙණේ. ‘හාත්පසින් තදින් බබලා නු යි ආදිච්චය, යනු එහි අරුත්. සූර්යයා ස්වභාව විසින් පහළ වූයේ ය. කිසිවකුගේ මැවීමෙක් නො වේ. කිසිවකුගේ ප්‍රසූතියෙක් නො වේ. එහෙයින් කිසිවකුගේ පුත්‍රයෙක් ද නො වේ. සූර්යයා ගිනියම් ව බබලන ධාතුස්කන්ධයකින් නිපන් ගොලාකාර වස්තුවෙකි. ඒ මේ ගොලාකාර වස්තුව පසු කාලයෙහි වෛදිකයෝ වෛදිකසූක්ත යන්ගෙන් දෙවියකු කළහ. වෛදිකයන් විසින් සූර්යයා කෙරෙහි නැගූ ඒ දෙවත්වය පසු කාලයෙහි බෞද්ධයන් විසිනුදු පිළිගෙණ ඇත. **“සූරියොති සූරියවිමානවාසී දෙවපුත්තො, පඨමකප්පික මනුස්සානං හි ලොභාදිපාපධම්මසමායොගෙන සරීරාලොකන්තරධානා සංවිග්ගමානසානං ජනානං සූරභාවං ජනයන්තො උප්පන්නො පුරිසො”** යනු අපගේ අටුවායෙහි ආයේ ය. ‘සූර්යයා සූර්යවිමානවාසි දෙවපුත්‍රයෙකි, ප්‍රථම කල්පික මනුෂ්‍යයන්ගේ සිත්තුළ කැටි වූ ලොභාදිපාපධර්මයන්ගේ බලයෙන් ඔවුන්ගේ ශරීරාලොකය අතුරුදහන් ව ගිය පසු එයින් සංවෙගයට පැමිණි ඔවුනට සූරභාවය දනවමින් උපන් පුරුෂැ’ යි යනු එහි අරුත්. ඇතැම් අර්ථකථාවෝ ‘ආදිච්ච’ යනු සූර්යපර්යායවචන මාත්‍රයෙකැ යි කියත්. **“වෙවචනමත්තමෙව එතං සූරියසද්දස්ස සාමඤ්ඤතො”** යනු ඒ ය.

ආදිත්‍ය නමින් තෙජස්වී පුරුෂයෙක් ආදිකල්පික මනුෂ්‍යයන් අතර වූයේ ය, යනු හා, ඔහු ගෞතම ගොත්‍ර ඇත්තේ ය යනු ද අර්ථකථාවන්හි දක්නට ලැබේ. **“භගවාපි ගොතමගොත්තො, ආදිච්චොපි ගොතමගොත්තො”** යන අටුවා පෙළින් බුදුරජානන් වහන්සේත් ආදිත්‍යයනුත් ගෞතමගොත්‍ර ඇතියන්බව පැහැදිලි

වන බැවින් ආදිච්ච නමින් පූර්වපුරුෂයකු වූ බව පිළිගත හැකි ය. එකල්හි නම්, එහි ලා 'අදිතියගේ පුත්‍ර ආදිච්ච' යි ගත හැකි ය. එහෙත් ඒ මේ වහ්නිගෝලය නො වේ. අනෙකෙකි. ආදිත්‍ය ගෝත්‍රයෙහි උපන් මහානුභාවවත් ගෞතම ඍෂියා පටන් මෙම ආදිත්‍ය ගෝත්‍රය, ගෞතම ගෝත්‍ර නමින් ප්‍රකට වූයේ ය. බුදුරජුන් කෙරෙහි යෙදුනු **'ආදිච්චබන්ධු, ආදිච්චගොත්ත,** යනාදී වූ නාමයෝ ද මේ බව කියාලන්නෝ ය. 'සූර්‍යයා අදිතියගේ පුතා' යි ගණිතොත් යුගාන්තයෙහි පහළ වෙති යි කියන සප්ත සූර්‍යයෝ ද අදිතියගේ පුත්හු' යි ගත යුතු වන්නේ ය. එසේ ගත යුතු දැ යි සිතා බැලිය යුතු ය.

**'තපති'** යන ක්‍රියාපදයෙන් දෙනුයේ බබලා යන අරුත ය. බබලන්නේ ආදිත්‍ය තෙමේ ය. ගිනියම් ව බබලන ධාතුස්කන්ධයෙකින් ගොලාකාර ව නිපන්නේ ය.

**'රත්ති'** නම්: නිහඬ කාලය යි. **"ර සද්දෙ නීයති පරිවජ්ජති එත්ථාති = රත්ති"** යනු විවරණය යි. මෙහි ශබ්ද හාත්පසින් සිඳිනු ලැබේ නු යි 'රත්ති' නම්. හාත්පසින් තදින් බබලාතු යි **'අභාති'** නම්. **'භාති'** යනු භා එක් වූ **ආ** යන උපසර්ගය, මෙහි ශක්තියෙහි වැටේ. **"ආභාති ගගනෙ චන්දිමා"** යනු ද එයට නිදසුන් ය. **ප්‍රාප්ති-ඉච්ඡා-බන්ධන-භය-ව්‍යාප්ති-ශ්ලෙෂ-අභිවිධි-සාදෘශ්‍ය-කෘච්ඡ-ආදිකර්ම-ග්‍රහණ-නිලය-සාමීප්‍ය-වික්‍රියා-නිමන්ත්‍රණ-නිවෘත්ති-ආශිස්-ආදාන-අනතර්භාව-ස්පර්ද්ධා-ආභිමුඛ්‍ය-උත්ඝීවකර්ම-විස්මය-ප්‍රතිඥා-නිර්දේශ-ශක්ති-මර්‍යාදා** යන මේ අර්ථයන්හි මෙය යෙදෙන්නේ ය.

සියලු උපක්ලේශයන්ගෙන් මුළුමනින් මිදුනු සඳ රාත්‍රිකාලයෙහි ඉතා තදින් දැඩි ව බබලන්නේ ය.[1]

**සන්නද්ධො ඛත්තියො තපති** = රජ තෙමේ අබරණින් සැරසුනේ බබල යි.

රන් රිදී මුතු මැණික්වලින් විසිතුරු වූ සියලු රජබරණින් සැරසුනේ සිවුරඟ සෙනඟින් පිරිවැරුණේ **'සන්නද්ධ'** නම්. 'ඛත්තියො' යන්නට විශෙෂණ ව සිටියේ ය.[2]

**ඣායී තපති බ්‍රාහ්මණො** = බ්‍රාහ්මණතෙමේ ධ්‍යාන කරන්නේ බබලයි.

---

1. 13, 5. 'අබ්භා මුත්තොව චන්දිමා' යනු බලනු
2. 21, 4. 'ඛත්තියෙ' ,, ,,

ආලම්බනොපනිජ්ඣාන - ලක්ඛණොපනිජ්ඣාන යන දෙවධ ධ්‍යානයෙන් ධ්‍යාන කරණුයේ 'ඣායී' නම්.[1] මුළුමනින් ප්‍රහීණ කළ කාමාදිආස්‍රව ඇති බාහිතපාපී වූ රහතුන් වහන්සේ 'බ්‍රාහ්මණ' නම්.[2]

**අථ සබ්බං අහොරත්තං බුද්ධො තපති තෙජසා** = එහෙත් සියලු දවරැති බුදුරජ තෙමේ බබලයි.

හිරු දවල බැබලෙයි. රාත්‍රියෙහි නම් ඔහු ගිය මග ද නො පෙණේ. සඳු පංචවිධ උපක්ලේශයන්ගෙන් මිදුනේ ම රාත්‍රියෙහි පමණක් බැබලෙයි. දවල නො බැබලෙයි. රජ තෙමේ රාජාභරණ පැළඳ සිවුරඟ සෙනග පිරිවරා සිටියේ ම බැබලෙයි. අප්‍රසිද්ධ වෙශයෙන් සිටියේ නො බැබලෙයි. ක්ෂීණාස්‍රව බ්‍රාහ්මණ තෙමේ ගණියා හැර දමා ගෙණෙන් බැහැර ව සමවත් සමවැදුනේ ම බැබලෙයි. බුදුරජානන් වහන්සේ රෑදෙවෙහි තමන් වහන්සේගේ ශීලතෙජසින් නිශ්ශීලයන් මැඩ, ගුණතෙජසින් නිර්ගුණයන් මැඩ, ප්‍රඥතෙජසින් මන්දබුද්ධිකයන් මැඩ, කුශලතෙජසින් අකුසලුන් මැඩ, ධර්මතෙජසින් අධර්මයන් මැඩ නිරතුරු ව ආයුඃකල්පය මුළුල්ලෙහි ම බැබලෙන සේක. 'බුද්ධො' යනු කියනලදී.[3]

ඉතා දුකසේ ලැබිය යුතු වූ මිනිසත්බව ලබා ඉඳුරන්ගේත් පිරිපුන්බව ඇතුව සිටුනා හැම කෙනෙක් ශීලයෙන් සමාධියෙන් ප්‍රඥයෙන් වැඩී ආත්මභාව සඞ්ඛ්‍යාත වූ මේ ලොකය බබුලුවන්නට උත්සාහ කළයුතු ය යි. වදාළ සේක.

ධර්මදෙශනාවගේ අවසානයෙහි බොහෝ දෙන සෝවන්පලාදියට පැමිණියාහුය.

**ආනන්දසථවිරවස්තුව නිමි.**

---

1. 2, 1. 'ඣායිනො' යනු බලනු
2. 26, 1. 'බ්‍රාහ්මණ' ,, ,,
3. 14, 1. 'තං බුද්ධමනන්තගොචරං' ,, ,,

# බමුණකුගේ ඉල්ලීමෙක්

## 26 — 6

**තීර්ථකයන්** වෙත පැවිදි වූ එක්තරා බ්‍රාහමණයෙක් "ශ්‍රමණ ගෞතම තෙමේ තමන්ගේ ශ්‍රාවකයන් ම පැවිද්දන් කොට කියන්නේ ය, මමත් පැවිද්දෙක්මි, මාත් පැවිද්දකු කොට කියා ලන්නට වටී ය"යි සිතා බුදුරජුන් වෙත එළැඹ "ගෞතමයන් වහන්ස! මමත් පැවිද්දෙක්මි, එහෙයින් මාත් පැවිද්දකු කොට කියාලන්නැ"යි දන්වා සිටියේ ය. එ කල්හි බුදුරජානන් වහන්සේ "මම පැවිදිගුණයක් නැති ව පැවිදිවෙස් ගත් පමණින් පැවිද්දකු ය යි නො කියමි, යමෙක් කෙලෙස්මල බැහැර කෙළේ නම් ඔහු ම පැවිද්දෙක් වන්නේ ය"යි වදාරා මේ ධම්දෙශනාව කළ සේක.

**බාහිතපාපොති බ්‍රාහ්මණො සමචරියාය සමණොති වුච්චති,**
**පබ්බාජයත්තනො මලං තස්මා පබ්බජිතොති වුච්චතීති.**

යම් හෙයකින් බැහැර කළ පව් ඇත්තේ බ්‍රාහමණ ය යි ද, සමසේ හැසිරීමෙන් ශ්‍රමණය යි ද කියනු ලැබේ ද, එමෙන් යමෙක් තමාගේ රාගාදී වූ කෙලෙස්මල පහ කෙරේ ද එහෙයින් හේ ප්‍රව්‍රජිත ය යි කියනු ලැබේ.

**බාහිතපාපො ඉති බ්‍රාහ්මණො** = බැහැර කළ පව් ඇත්තේ බ්‍රාහමණ ය යි ද.

සියලු පව් සමුච්ඡෙදප්‍රහාණයෙන් ප්‍රහාණය කොට සිටියේ මෙහි 'බ්‍රාහ්මණ' නම්. **"අත්තනො සන්තානතො පාපකො ධම්මො සමුච්ඡෙදප්පහාණෙන පජහිතබ්බං සීඝතො"** යනු අටුවා.1

**සමචරියාය සමණො ඉති වුච්චති** = සමසේ හැසිරීමෙන් ශ්‍රමණ-ය යි ද කියනු ලැබේ ද.

මේ බ්‍රාහමණ තෙමේ ම සන්සිඳ වූ පව් ඇති බැවින් කාය විෂමාදිවිෂමහැසිරීම්වලින් දුරු වූ බැවින් ශ්‍රමණ ය යි කියනු ලැබේ. **"සො එව සමිතපාපත්තා සමචරියාය ච සමණො"** යනු අටුවා.2

**පබ්බාජයති අත්තනො මලං** = (යමෙක්) තමාගේ රාගාදී වූ කෙලෙස්මල පහ කෙරේ ද.

**තස්මා පබ්බජිතො ඉති වුච්චති** = එහෙයින් (හේ) ප්‍රව්‍රජිත ය යි කියනු ලැබේ.

---

1. 26, 1. 'බ්‍රාහ්මණ' යනු බලනු.
2 14, 4. 'සමණො' ,, ,,

යමෙක් තම සන්තානයෙහි ආදිය නො දත හැකි කාලයක සිට බැඳී පවත්නා රාගද්වෙෂාදී වූ සියලු කෙලෙස්මල තදඞ්ග විමුක්ති - විෂ්කම්භනවිමුක්ති - සමුච්ඡෙදවිමුක්ති - ප්‍රතිප්‍රශ්‍රබ්ධි විමුක්ති - නිශශරණවිමුක්ති යන විමුක්තීන්ගේ බලයෙන්, සෝ- වන් - සෙදගැමි - අනගැමි - රහත්මග යන සිවු මගනුවණින් පහ කොට සිටයේ ද සිතින් බැහැර කොට සිටියේ ද ශීල සමාධි ප්‍රඥ ධර්‍මයන් ගෙන් කෙලෙස් පුරුක් බිඳ හැර සිටියේ ද හේ ප්‍රව්‍රජිතය' යි කියනු ලැබේ යනු අදහසි.[1]

ධර්‍මදෙශනාවගේ අවසානයෙහි ඒ බ්‍රාහමණ තෙමේ සසුන් පැවිද්දෙන් පැවිදි ව සෝවත්පලයෙහි පිහිටා ගත්තේ ය. ධර්‍ම දෙශනා තොමෝ පැමිණ සිටි පිරිසට ද වැඩ සහිත වූ ය.

**අන්‍යතර බ්‍රාහමණ වස්තුව නිමි.**

1. 14, 4 'පබ්බජිතා' ,, ,,

# ශාරිපුත්‍ර මහාස්ථවිරයන් වහන්සේගේ ඉවසීම

## 26 — 7

**දවසක්** එක් තැනෙක රැස් ව සිටි මිනිස්සු "අනේ, පුදුම යි, අපගේ ආයුෂ්මතුන් වහන්සේ හැම එකක් ඉවසන සේක, කවුරුන් ඇණුම් බැණුම් කළ ද කවුරුන් පහර දුන්න ද ඔවුන් කිසිවකුත් කෙරෙහි ස්වල්පමාත්‍ර විසිතුදු උන්වහන්සේ නො කිපෙන සේකැ"යි සැරියුත් මහතෙරුන්ගේ ගුණමහත්කම ගැණ කතා කරන්නට වූහ. ඔවුන් අතර සිටි එක් බමුණෙක් මෙයසා "මේ නො කිපෙන්නා කවරෙක් ද?" යි ඇසී ය. එ කල්හි ඔවුහු "මේ අපගේ සැරියුත් මහතෙරණුවෝ"යි කීහ. "ඔහු කිපෙන්නෙක් නො වන්නේ ද?"යි බමුණා ඇසූ විට, "බමුණ! උන්වහන්සේ කාහටත් නො කිපෙන සේකැ" යි කීහ. එවිට බමුණු "හා හොඳ යි, ඔය කියන නො කිපෙන්නහු, මම කුප්පවාලම්" යි කීයේ ය. "පිළිවන්කම තිබේ නම් කුප්පවාලව" යි කී කල්හි බමුණා "වේවා, මොහුට කරණ හැටි දන්නෙම් මමැ" යි සිතා මහතෙරුන් පිඬු සිඟා යද්දී උන්-වහන්සේගේ පසු පස ගොස් මිට මොලොවා පිට හරහට මහත් පහරක් ගැසී ය. මහතෙරණුවෝ "මේ කිමැ"යි නො සලකා ම වැඩිය සේක. එකෙණෙහි බමුණාගේ මුළු සිරුර දැවෙන්නට වන. සිරුර වසා මහත් දැහයෙක් උපන. ඉක්බිති බමුණා "අනේ! මේ ආයුෂ්මතුන් වහන්සේ මහාගුණවතෙක් වන සේකැ"යි දුව ගොස් මහතෙරුන්ගේ පාමුල වැටී "ස්වාමීනි! මට කමන්නැ" යි කියා සිටියේ ය. "ඇයි, ඒ මෙසේ කියන්නහු?"යි උන්වහන්සේ ඇසූ කල්හි "මම ඔබවහන්සේ විමසනු පිණිස ඔබවහන්සේගේ පිටට මිට මොලොවා පහරක් ගැසීමි"යි කී ය. එහි දී මහතෙරුන් "වේවා ඔබට මම කමන්නෙමි"යි කීවිට "ස්වාමීනි! මට කමන්නෝ නම් මාගේ ගෙයි වැඩ හිඳ දන් ටිකක් වළඳන සේක්වා"යි තෙරුන්ගේ පාත්‍රය ගත්තේ ය. උන්වහන්සේ ද ඔහුට පාත්‍රය දුන්හ. බමුණාගේ ගෙට වැඩියහ. වැඩ බමුණා පිළියෙළ කොට පිළිගැන්නූ දන් වැළඳූහ.

සැරියුත් මහතෙරුන් වහන්සේට බමුණා පහර දුන්බව අසා කොපයට පත් මිනිස්සු "මේ බමුණු වසලයා අපගේ නිරපරාධී වූ හාමුදුරුවන් වහන්සේට පහර දෙනලද ය, මූට දඬුවම් පමණක් කොට මූ මුදා හරිණු සුදුසු නැත, මෙතැනදී ම මූ මරාදැමිය යුතු ය"යි දඬුමුගුරු ගල් ගඩොල් ගත් අත් ඇති ව බමුණා වසන ගෙට දුව ගොස් ගෙය වට කොට සිට ගත්හ. මහතෙරණුවෝ දන් වළඳා නැගිට යන්නාහු බමුණාගේ අතට පාත්‍රය දුන්හ. ගෙය වට කොට

සිටි මිනිස්සු පාත්‍රයත් අතින් ගෙණ තෙරුන් සමග යන බමුණු දැක "ස්වාමීනි! ඔබවහන්සේ පාත්‍රය ගෙණ බමුණු නවතාලනු මැනැවැ"යි කීහ. "ඇයි, එසේ කියහු?" යි ඇසූ කල්හි "ස්වාමීනි! මේ බමුණු රොඩියා ඔබවහන්සේට පහර දෙන ලද්දැ යි දැන ගන්නට ලැබිනි, ඒ නිසා මූට කළයුත්ත කරන්නට අපට ඉඩ දුන මැනැව, පාත්‍රය මූගේ අතින් ගණු මැනැවැ"යි ඉල්ලා සිටියහ. එවිට උන්වහන්සේ "මොක ද, බමුණා පහර දුන්නේ මේ උපාසක-වරුන්ට ද, මට ද" යි ඇසූහ. "ඔබවහන්සේට ය"යි ඔවුහු කීහ. "හරි, කාරණය එසේ ය, එහෙත් බමුණා මා කමා කර ගත්තේය, මම ඔහුට කමාව දුනිමි, ඒ නිසා උපාසකවරු තම තමන්ගේ ගෙවලට යන්නැ"යි ආපසු ඔවුන් ගෙවලට යවා බමුණාත් නවතා මහතෙරණුවෝ විහාරයට වැඩියහ. ඒ වේලෙහි වෙහෙර වැසි භික්ෂූන් වහන්සේලා "සැරියුත් මහතෙරණුවෝ ඒ මොහොතෙහි ම තමන්ට පහර දුන් බමුණාගේ ගෙයි හිඳ බමුණා දුන් දන් වළඳා ආහ, මූ මේ මහතෙරුන්ට මෙසේ පහර දුන්නේ නම් ඉදිරියෙහි කාහට පහර දෙන්නට ලජ්ජිතවන්නේ ද, මින් පසු මූ අන් මහණුන්ටත් පහර දෙනු ඇත, මහතෙරුන් කළේ මේ කිමෙක් දැ"යි තෙරුන්ට අවමන් කෙරෙණ ලෙසට කතා කරන්නට වූහ. බුදුරජානන් වහන්සේ ඒ වේලෙහි ඒ භික්ෂූන් රැස් ව හුන් තැනට වැඩ "මහණෙනි! තමුසේලා මෙහි රැස් ව කුමක් කතා කරහු දැ?"යි ඇසූහ. "සැරියුත් මහතෙරුන් තමන්ට පහර දුන් බමුණාගේ ගෙයි ඒ මොහොතෙහි ම දන් වළඳා දැක් වූ පහත්කම ගැණ ය" යි භික්ෂූන් කියා සිටි කල්හි "මහණෙනි! හැබෑ බමුණෙක් නම්, කවරදාකත් අන් බමුණකුට මොනා හිංසාවක් ඇණුමක් බැණුමක් කළත් පහර දෙන්නේ නැත, මෙතැන, ගිහි බමුණකු විසින් හැබෑ නියම බමුණකුට පහර දීමෙක් සිදු වී තිබේ, කිසිත් කරුණක් නැති ව මේ ගිහි බමුණා නියම බමුණකුට දෙන ලද මේ පහර ඒ ගිහි බමුණාගේ සිත්හි නැගි ක්‍රොධය නිසා වූයේ ය, තමන්ගේ ව්‍යාඝයට තමන්ගේ සිත්හි නගිනා මේ ක්‍රොධය නැසී යනුයේ අනාගාමි මාර්ගයෙනැ"යි වදරා මේ ධර්මදෙශනාව කළ සේක.

**න බ්‍රාහ්මණස්ස පහරෙය්‍ය නාස්ස මුඤ්චෙථ බ්‍රාහ්මණො,**
**ධි බ්‍රාහ්මණස්ස හන්තාරං තතො ධි යස්ස මුඤ්චති.**

**න බ්‍රාහ්මණස්සෙතදකිඤ්චි සෙය්‍යො**
**යදා නිසෙධො මනසො පියෙහි,**
**යතො යතො හිංසමනො නිවත්තති**
**තතො තතො සම්මතිමෙව දුක්ඛන්ති.**

බ්‍රාහ්මණ තෙමේ බ්‍රාහ්මණයකුට නො පහරන්නේ ය. බ්‍රාහ්මණ තෙමේ තමාට පහර ගැසූවහුට නො කිපෙන්නේ ය. බ්‍රාහ්මණයාහට පහර දෙන්නහුට නින්‍දා කරමි. යමෙක් ඒ පහර දෙන්නහුට කිපේ ද, ඒ පහර දෙන්නහුට වඩා ඔහුට නින්‍දා කරමි.

මේ එකට එක නො කිරීම බ්‍රාහ්මණයාහට ස්වල්පමාත්‍ර වූ උතුම් බවෙක් නො වේ. නොහොත් යම් කලෙක (ක්‍රෝධ කරන්නහුගේ) සිතට ප්‍රිය වූ ක්‍රෝධ සිතිවිලිවලින් යම් වැළැක්මෙක් වේ ද, මෙය බ්‍රාහ්මණයාහට ස්වල්පමාත්‍ර වූ උතුම් බවෙක් නො වේ. යම් යම් හෙතුවෙකින් ක්‍රෝධචිත්තය නවතී ද ඒ ඒ හෙතුවෙන් සසර දුක සන්සිඳෙන්නේ ම ය.

**න බ්‍රාහ්මණස්ස පහරෙය්‍ය** = බ්‍රාහ්මණයාහට පහර නො දෙන්නේ ය.

දෙවන පාදයෙහි පෙණෙන **'බ්‍රාහ්මණො'** යනු මෙහි හෙළා 'බ්‍රාහ්මණ තෙමේ බ්‍රාහ්මණයකුට පහර නො දෙන්නේ ය'යි අරුත් ගතයුතු ය. නැසූ ආශ්‍රව ඇති පැහූ පව් ඇති ක්‍ෂීණාශ්‍රව බ්‍රාහ්මණයෙක් තෙමේ එකාන්ත විසින් එබඳු බ්‍රාහ්මණයකුට වත් ජාතියෙන් ගොත්‍රයෙන් බ්‍රාහ්මණැයි සම්මතවූවකුට වත් මොන ම කරුණක් නිසා හෝ අත් පා දඬු මුගුරු සැත් ආදි කිසිවකින් පහර නො දෙන්නේ ය. ඒ තබා පරොස් බස් කියා හෝ ඇණුම් බැණුම් නො කරන්නේ ය. ක්‍රෝධ සිතිවිල්ලක් පමණකුත් නො ද උපද වන්නේ ය. **"ඛීණාසවබ්‍රාහ්මණොහමස්මීති ජානනෙතා ඛීණාසවස්ස වා අඤ්ඤතරස්ස වා ජාතිබ්‍රාහ්මණස්ස න පහරෙය්‍ය"** යනු අටුවා. මෙහි **"බ්‍රාහ්මණං පහරෙය්‍ය"** යි යෙදිය යුතු තැන්හි **"බ්‍රාහ්මණස්ස පහරෙය්‍ය"** යි යෙදුනේ උපපද විභක්ති විසිනි. කාරක විභක්ති හැර පදාන්තර යොගයෙහි කළ තාක් විභක්තීහු උපපද විභක්ති නම්. "ගාමස්ස ගතො" යනුමෙනි.

**න අස්ස මුඤ්චෙථ බ්‍රාහ්මණො** = බ්‍රාහ්මණ තෙමේ මොහුට කොප නො කරන්නේ ය.

ක්‍ෂීණාශ්‍රවබ්‍රාහ්මණ තෙමේ තමාට මොන ම කරුණක් නිසා හෝ පහර දුන්නහුට, ඇණුම් බැණුම් කළහුට කිසිදු නො කිපෙන්නේ ය. රැවුම් ගෙරවුම් නො කරන්නේ ය. **"සොපි පහටො ඛීණාසවො බ්‍රාහ්මණො අස්ස පහරිතවා ඕතස්ස වෙරං න මුඤ්චෙථ තස්මිං කොපං න කරෙය්‍ය"** යනු අටුවා.

**ධි බ්‍රාහ්මණස්ස හන්තාරං** = බ්‍රාහ්මණයාහට පහර දෙන්නහුට නින්‍දා කරමි. නින්‍දා වේවා.

කවදාත් කිසිත් කරුණක් නිසාත් අන්හට නො කිපෙන අන්හට නො බණින ගැහුවත් නො ගහන බැන්නත් නො බණින ක්ෂීණාස්‍රව බ්‍රාහ්මණයාහට පහර දෙනුයේ දෙවියන් සහිත ලොකයාගේ පිළිකුලට සථාන වන්නේ ය. මෙලොව පරලොව දියුණුවෙන් ඈද වැටෙන්නේ ය. එබඳු තැනැත්තෝ මෙලොව දී ම නින්දා කටයුතු ය. එහෙයින් ඔහුට නින්දා කරමි. ඔහුට නින්දා වේවා.

**තතො ධි යො අස්ස මුඤ්චති** = යමෙක් ඒ පහර දෙන්නහුට කිපේ ද, ඊට වඩා (ඔහුට) නින්දා කරමි. නින්දා වේවා,

යමෙක් තමාට පහර දුන්නහුට කිපේ ද, එසේ කිපියේ පහර දුන්නහුට වඩා පහත් ය. ලාමක ය. එහෙයින් පහර දුන්නහුට යමෙක් කිපේ නම් ඔහුට නින්දා කරමි. නින්දා වේවා.

**න බ්‍රාහ්මණස්ස එතං කිඤ්චි සෙය්‍යො** = මේ එකට එක නො කිරීම බ්‍රාහ්මණයාගේ සවල්පමාත්‍ර වූ උතුම් බවෙක් නො වේ.

**යදා නිසෙධො මනසො පියෙහි** = (නොහොත්) යම් කලෙක සිතට ප්‍රිය වූ ක්‍රොධ සිතිවිලිවලින් (යම්) වැළක්මෙක් වේ ද (එතං අකිඤ්චි සෙය්‍යො න) මෙය සවල්පමාත්‍ර වූ උතුම් බවෙක් නො වේ.

තමාට අත් පා දඬු මුගුරු ඈ යමකින් පහර දුන්නහුට පෙරළා පහර නො දීම, දා ගොත් කුලමල ඈ කියා ගටා බිණුවහුට පෙරළා එසේ නො බිණීම රහතුන් වහන්සේගේ මහත් ගුණයෙක් වේ. එසේ නො පැහැරීම, එසේ නො බිණීම රහතුන් වහන්සේ පිළිබඳ සවල්පමාත්‍ර වූ ගුණයෙක් නො ව මහත් වූත් උතුම් වූත් ගුණයෙක් වේ. නොහොත් ක්‍රොධ කරන්නහුගේ සිතට ප්‍රිය වූයේ ක්‍රොධය ඉපදවීම ය. සිතට ප්‍රිය ව ඒ ක්‍රොධ සිතිවිලි ඉපදවීමෙන් වැළක්ම රහතුන් වහන්සේ පිළිබඳ ඉතා මහත් ඉතා උතුම් ගුණයෙක් වේ.

මේ ක්‍රොධ සිතිවිලි නිසා මිනිස්සු මවුපියනට ද පහර දෙන්නෝ ය. නොයෙක් කුලමල කියා ඇණුම් බැණුම් කරන්නෝ ය. මවුපියන් මරා දමන්නෝ ය. තුමූ ගෙල වැල ලා ගන්නෝ ය. බුද්ධාදී උතුමන්ට අපරාධ කරන්නෝ ය. එහෙයින් ඒ බිය උපදවන ක්‍රොධ සිතිවිලිවලින් සිත වළකා ගැණීම අවශ්‍යයෙන් විය යුතු ම ය. සිතෙහි උපදනා ඒ ක්‍රොධයට නිග්‍රහ කිරීම ක්‍රොධයෙන් සිත වළකා ගැණීම සුලු ගුණයෙක් නො වේ. එය ඉතා ම උසස් ඉතා ම උතුම් ගුණයෙක් වේ. මේ අටුවා: **"යං ඛීණාසවස්ස අක්කොසන්තං වා අප්පච්චක්කොසනං, පහරන්තං වා අප්පටිප්පහරණං එතං තස්ස ඛීණාසවබ්‍රාහ්මණස්ස න කිඤ්චි සෙය්‍යො, අප්ප-**

**මත්තකම්පි සෙය්‍යො න හොති. කොධනස්ස හි කොධුප්පා-දෙව මනසො පියො නාම, තෙහි කොධුප්පාදෙහි මනුස්සා මාතාපිතූසුපි බුද්ධාදීසුපි අපරජ්ඣන්ති, තස්මා යො එසො අවස්සං තෙහි මනසො නිසෙධො, කොධවසෙන උප්පජ්ජමානස්ස චිත්තස්ස නිග්ගහො, එතං න අකිඤ්චි සෙය්‍යො, අධිමත්තකමෙව සෙය්‍යොති අත්ථො”** යනු.

**යතො යතො හිංසමනො නිවත්තති** = යම් යම් කරුණෙකින් ක්‍රොධචිත්තය නවතී ද.

**තතො තතො සම්මති එව දුක්ඛං** = ඒ ඒ කරුණෙකින් සසර දුක සන්සිඳෙන්නේ ය.

‘**හිංසමනො**’ යන්නෙන් ක්‍රොධචිත්තය ගැණේ. ඒ මේ ක්‍රොධ චිත්තය අනාගාමි මාර්ගයෙන් ප්‍රහීණ වනුයේ යම් යම් කරුණෙකින් නවත්නේ වේ ද, ඒ ඒ කරුණෙන් සසරදුක සන්සිඳී යන්නේ මය. මේ අටුවා: **“හිංසමනොති කොධමනො, සො තස්ස යතො යතො වත්ථුතො අනාගාමිමග්ගෙන සමුග්ඝාතං ගච්ඡන්තො නිවත්තති, තතො තතො වත්ථුතො සකලම්පි වට්ටදුක්ඛං නිවත්තතියෙව”** යනු.

ධර්මදේශනාවගේ අවසානයෙහි බොහෝ දෙන සෝවන්පලාදි-යට පැමිණියාහු ය.

**ශාරීපුත්‍රස්ථවිර වස්තුව නිමි.**

# මහාප්‍රජාපතී ගෞතමී නිසා උපන් කතාවක්

## 26 – 8

**මහාප්‍රජාපතී** ගෞතමී තොමෝ, සම්මා සම්බුදු රජාණන් වහන්සේ විසින් නො උපන් වස්තුයෙහිලා "සිය වස් ගිය මෙහෙණි විසිනුදු එ දවස උපසපන් වූ මහණ වැන්ද යුතු ය"යි පණවා වදාළ:-

"උපසම්පත්තියෙන් අවුරුදු සියය ඉක්මවා සිටි මෙහෙණ ද එ දවස උපසපන් වූ මහණ වැඳිය යුතු ය, දැක නැඟී සිටිය යුතු ය, ඇඳිලි බැඳිය යුතු ය, සැලකිලි දැක්විය යුතු ය,

මෙහෙණ, මහණුන් නැති ආවාසයෙහි වස් නො විසිය යුතු ය,

මෙහෙණ, අඩ මසක් පාසා මහණ සඟුන් වෙතින් පොහොය පිළිවිසිය යුතු ය, අවවාද ලැබීමට එළැඹිය යුතු ය,

වස් විසූ මෙහෙණ, මහණ මෙහෙණ සඟුන් වෙත දුටු කරුණින් ඇසූ කරුණින් සැක කළ කරුණින් පවාරණය කළ යුතු ය,

ගරු, ඇවැතකට පැමිණි මෙහෙණ, මහණ මෙහෙණ සඟුන් වෙත පසළොස් දිනක් මානතෙහි හැසිරිය යුතු ය,

අවුරුදු දෙකක් තුළ කරුණු සයෙක හික්මුනු සිත් ඇති හික්මන විසින් මහණ මෙහෙණ සඟුන් වෙත උපසම්පදුව සෙවිය යුතු ය,

මෙහෙණ, මහණක්හට මොන ම කරුණකිනුත් ආක්‍රොශ නො කළ යුතු ය,

අද පටන් මහණුන් කෙරෙහි මෙහෙණන්ගේ අවවාද විසින් කෙරෙණ වදන් මග වසන ලද්දේ ය, මෙහෙණන් කෙරෙහි මහණුන්ගේ අවවාද විසින් කෙරෙණ වදන් මග නො වසන ලද්දේ ය" යන අෂ්ටගරුධර්ම, සැරසීම සැහැවි කොට ගත් පුරුෂයකු සුවඳවත් මල්දමක් හිසෙන් පිළිගන්නා සේ පිළිගැණී-මෙන් පිරිවර සහිත ව උපසම්පදා ව ලැබූ ය. ඇයට එහි දී අන්‍ය වූ උපාධ්‍යායයෙක් හෝ ආචාර්‍ය්‍යයෙක් නො වී ය. මෙසේ උපසම්පදාව ලැබූ ඒ ස්ථවිරාවන් නිසා පසු කාලයෙහි "මහාප්‍රජාපතී ගෞතමියට උපාධ්‍යායයෙක් නැත, ආචාර්‍ය්‍යයෙක් නැත, ඕ තොමෝ තමන් සියතින් ම සිවුරු හැඳ ගත්තී ය"යි කතාවක් උපන. එයින් අන්

මෙහෙණෝ ඇය කෙරෙහි කුකුස් උපදවා ඇය සමග පොහෝ-පවුරුණු කිරීම හැරදමා බුදුරජුන් වෙත ගොස් උන්වහන්සේට ඒ කාරණය සැල කළහ. ඉක්බිති බුදුරජනන් වහන්සේ ඒ මෙහෙණන්ගේ කතාව අසා "මහාප්‍රජාපති ගෞතමියට අෂ්ට-ගරුධම් දෙනලද්දේ මා විසිනි, එහෙයින් මම ම ඇයගේ ආචාර්‍ය්‍ය වෙමි, මම ම ඇයගේ උපාධ්‍යාය වෙමි, කායදුශ්චරිතාදියෙන් තොරවූ රහතුන් කෙරෙහි කුකුස් නො කටයුතු ය"යි වදාරා මේ ධම් දෙශනාව කළ සේක.

**යස්ස කායෙන වාචාය මනසා නත්ථි දුක්කතං,**
**සංවුතං තීහි ඨානෙහි තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං.**

යමක්හට කයින්, වචනයෙන්, සිතින් සිදු වන අකුශලයෙක් නැත්තේ ද, මෙ කියූ තුන් තැනින් රැකුනා වූ ඔහු, මම බ්‍රාහමණැ යි කියමි.

**යස්ස කායෙන වාචාය මනසා නත්ථි දුක්කතං**=යමක්හට කයින්, වචනයෙන්, සිතින් සිදුවන අකුශලයෙක් නැත් ද.

ප්‍රාණඝාතාදීන්ගේ වශයෙන් කයින්, මෘෂාවාදදීන්ගේ වශයෙන් වචනයෙන්, අභිධ්‍යාදීන්ගේ වශයෙන් සිතින් කෙරෙණ අකුසල් **දුක්කත** නම්.[1]

**සංවුතං තීහි ඨානෙහි තං අහං බ්‍රෑමි බ්‍රාහමණං** = මේ තුන් තැනින් රැකුනු ඔහු මම බ්‍රාහමණැ යි කියමි.

මෙ තුන් දෙරින් සිදු වන අකුශලයන්ගේ වැළක්වීම පිණිස රැක ගත් තුන්දෙර ඇති සිහි නුවණ හා යෙදූ තුන්දෙර ඇති පුද්ගල තෙමේ බ්‍රාහමණ නම් වේ.

ධම්දෙශනාවගේ අවසානයෙහි බොහෝ දෙන සෝවාන්-පලාදියට පැමිණියාහු ය.

**මහාප්‍රජාපති ගෞතමී වස්තුව නිමි.**

1. 1. 10. 'පාපකාරී' යනු බලනු.

# සැරියුත් තෙරුන්ගේ ගුරුන් පිදීම

## 26 – 9

**ශාරීපුත්‍ර** මහාස්ථවිරයන් වහන්සේ අස්සජි මහ තෙරුන් වෙතින් දහම් අසා සෝවන්පලයට පැමිණී දා සිට අස්සජි මහාස්ථවිරයන් වහන්සේ වැඩ වසන දිශාවට ඇඳිලි බැඳ වැඳ හිස දමා නිදන්නාහ. භික්ෂූහු "ශාරිපුත්‍ර මිස දිටුවෙක, අදත් දිශානමස්කාරය කෙරෙති"යි සලකා බුදුරජුන් වෙත ගොස් ඒ බව සැලකළහ. එකල්හි බුදුරජාණන් වහන්සේ සැරියුත් මහතෙරුන් කැඳවා "ශාරීපුත්‍ර! සැබෑ ද, දිශානමස්කාරය කරහු?"යි ඇසූහ. "ස්වාමීනි! බුදුරජාණන් වහන්සේ දන්නා සේකැ"යි කී කල්හි උන් වහන්සේ "මහණෙනි! ශාරීපුත්‍ර, දිශානමස්කාරයක් නො කරන්නේ ය, ඒ තැන අස්සජි තැනගෙන් දහම් අසා සෝවන්පලයට පැමිණී දා පටන් ඒ තම ගුරුවරයාට නමස්කාර කරන්නේ ය, යම් මහණෙක් යමකු ඇදුරු කොට ගෙණ බණදහම් උගන්නේ ද, උගණී ද, මස්තෙහි උගන්නේ ද ඒ මහණහු විසින් ගිනිදෙවි පුදන බමුණකු ඒ ගිනිදෙවි පුදන්නා සේ වඳින්නා සේ තමන්ගේ ඒ ගුරුවරයා සකස් කොට පිදිය යුතු ය, වැඳිය යුතු ය"යි වදුරා මේ ධර්‍මදෙශනාව කළ සේක.

**යස්මා ධම්මං විජානෙය්‍ය සම්මාසම්බුද්ධදෙසිතං,**
**සක්කච්චං තං නමස්සෙය්‍ය අග්ගිහුත්තංව බ්‍රාහ්මණො'ති.**

යමක්හු කෙරෙන් සම්මා සම්බුදුරජුන් විසින් දෙසූ ධර්‍මය (යමෙක්) දැන ගන්නේ ද ගිනිදෙවි පුදන බමුණකු මෙන් ඒ ඇදුරු සකස් කොට වඳින්නේ ය.

**යස්මා ධම්මං විජානෙය්‍ය සම්මාසම්බුද්ධදෙසිතං**=යමක්හු වෙතින් සම්මා සම්බුදු රජුන් විසින් වදාළ ධර්‍මය දැන ගන්නේ ද උගන්නේ ද. **සක්කච්චං තං නමස්සෙය්‍ය අග්ගිහුත්තං ඉව බ්‍රාහ්මණො** = ගිනිදෙවි පුදන බමුණකු මෙන් ඒ ගුරුවරයා සකස් ව වඳින්නේ ය. වැඳිය යුතු ය.

හීන වූ හෝ මධ්‍යම වූ හෝ උත්තම වූ හෝ ස්ථවිර වූ හෝ මධ්‍යම වූ හෝ නවක වූ හෝ යමකු වෙතින් බුදුරජුන් වදාළ පාලි ධර්‍මයෙන් යටත් පිරිසෙයින් එක් ගාථාවක් ගාථාර්ධයක් උගත්තේ නම්, සකසා පරිචරණවිධි පැවැත්වීමෙන් හා බිලියම් කිරීමෙන් ගිනිදෙවි පුදන බමුණකු මෙන් ඒ ධර්‍මාචාර්‍යවරයා සකස් ව නමස්කාර කරන්නේ ය. ඔහු වසන දෙසට ද ආදරබුහුමන් සහිතව වැඳ වැටිය යුතු ය.

ධර්‍මදෙශනාවගේ අවසානයෙහි බොහෝ දෙන සෝවන්පලාදියට පැමිණියාහු ය.

**ශාරිපුත්‍රස්ථවිර වස්තුව නිමි.**

# ජටිලබ්‍රාහ්මණයා

## 26 – 10

ජටිල බ්‍රාහ්මණ තෙමේ “මම මවුපසින් හා පියපසින් පිරිසිදු වූ බ්‍රාහ්මණකුලයෙහි උපන්මි, එහෙත් ශ්‍රමණගෞතම තෙමේ තමන් ගේ ශ්‍රාවකයන් ම බ්‍රාහ්මණැ යි කියන්නේ ය, බ්‍රාහ්මණකුලයෙහි උපන් මා බ්‍රාහ්මණයකු කොට නො කියන්නේ ය, මා ද බමුණකු කොට දක්වන්නට වටී ය”යි සිතා බුදුරජුන් වෙත ගොස් එය දන්වා සිටියේ ය. එකල්හි බුදුරජාණන් වහන්සේ ‘‘බ්‍රාහ්මණ! මම දළමඬුලු දැරීම් පමණින් හෝ දැගොත් පමණින් හෝ කෙනකු බ්‍රාහ්මණය යි නො කියමි, එසේ නො කියන්නෙම් කියන්නට යුක්තියක් නැති බැවිනි, දළමඬුලු දැරීම් හා ජාතිගොත්‍ර බ්‍රාහ්මණභාව-යෙහි ලා ගැණෙන කරුණු නො වේ, ඔහු ව්‍යවහාරමාත්‍රයෙන් බමුණු ය, මම මුළුමනින් සිවුසස්දහම් දැන ගත්තහු ම බ්‍රාහ්මණ ය යි කියමි”යි වදාරා මේ ධර්ම දෙශනාව කළ සේක.

**න ජටාහි න ගොත්තෙන න ජච්චා හොති බ්‍රාහ්මණො,**
**යම්හි සච්චඤ්ච ධම්මො ච සො සුචී සො ච බ්‍රාහ්මණොති.**

දළමඬුලු කරණ කොට බ්‍රාහ්මණ නො වේ. ගොත්‍රය කරණ කොට බ්‍රාහ්මණ නො වේ. ජාතිය කරණ කොට බ්‍රාහ්මණ නො වේ. යමකු කෙරෙහි ප්‍රතිවෙධ කළ සත්‍යය ද ධර්මය ද වේ නම් හෙ තෙමේ පවිත්‍ර වූයේ නමුදු වේ. හෙ තෙමේ බ්‍රාහ්මණ නමුදු වේ.

**න ජටාහි** = දළමඬුලු කරණ කොට බ්‍රාහ්මණ නො වේ.

‘**ජටා**’ නම්, මෙහි තාපසාදීන්ගේ ලග්න කෙශය යි. **“අන්‍යොන්‍ය සංලග්න කෙශෙ, ව්‍රතීනාං ශිඛායාම්”** යනු කොෂ යි. බැහැරි තවුසෝ කෙලෙස් තැවීම පිණිස ව්‍රතසමාචරණයකැ යි කියා යම් කිසි මැලියමක් යොදා හිසකේ සියල්ල එකට ලග්න කෙරෙත්. කෙශයන්ගේ ඒ ලග්න කිරීම මෙහි ජටා යි කියනු ලැබේ. ජටා යනු හුණ බට ආදීන්ගේ ශාඛා ජලයෙහි හා තෘෂ්ණායෙහි ද වැටේ. මෙසේ වූ ලග්නකෙශය කරණ කොට බමුණෙක් නම් නො වේ.

**න ගොත්තෙන** = ගොත්‍රය කරණ කොට බ්‍රාහ්මණ නො වේ.

‘**ගොත්ත**’ නම්, පූර්ව පුරුෂයන් කියා පාන දරුමුනුබුරු ආදී වූ දරුකැල ය. **“පුත්‍ර පෞත්‍ර ප්‍රභෘතිකමපත්‍යං ගොත්‍රම්”** යනු එහිලා කියේ ය. පෙරදිග ලොකයෙහි පූර්වපුරුෂයන් කියාලන **ශාණ්ඩිල්‍ය කාශ්‍යප-වාත්ස්‍ය** ආදී වූ ගොත්‍ර සූවිස්සක් ඇති බව මනුසංහිතා යෙහි කියන ලදී. ඒ මේ පූර්වපුරුෂයන් කියා පෑමෙන් පූර්ව පුරුෂයන්ගේ නමින් පෙණී සිටීමෙන් බමුණෙක් නම් නො වේ.

**න ජච්චා හොති බ්‍රාහ්මණො** = ජාතිය කරණ කොට බමුණෙක් නො වේ.

අවයව සටහනින් දැන ගැණීම ඇත්ති, අවයව සටහන් දැන ගැණීමට කාරණ වූවා **ජාති** නම්. ඒ නම්, මනුෂ්‍යත්වාදිය යි. ඒ එකලා මනුෂ්‍යත්වයෙන් බමුණෙක් නම් නො වේ.

**යම්හි සච්චං ච ධම්මො ච සො සුචී සො ච බ්‍රාහ්මණො** = යමකු කෙරෙහි සත්‍යය ද ධර්මය ද වේ නම්, හෙතෙමේ පවිත්‍ර වූයේ නමුදු බ්‍රාහමණ නමුදු වේ.

යම් පුද්ගලයකු කෙරෙහි චතුරාර්‍ය්‍යසත්‍යය සොළොස් අයුරෙකින් ප්‍රතිවෙධ කොට ගත් සත්‍යඥනය හා නවලොකොත්තරධර්මය කැවී තිබේ නම් හෙතෙමේ පවිත්‍ර නමුත් බ්‍රාහමණ නමුත් වේ.

ස්‍රොතාපත්ති ආදි එක් එක් මාර්ගයෙකින් දුඃඛ – සමුදය – නිරොධ – මාර්ග යන චතුස්සත්‍යය පරිඥා – පහාන – සච්ඡිකිරියා – භාවනා යන සිවු අයුරින් ප්‍රතිවෙධ කටයුතු ය. ඒ මේ ප්‍රතිවෙධය මෙසේ මාර්ග සතර පිළිබඳ වන විට සොළොස් අයුරු වන්නේ ය. මාර්ග සතරත් නිර්වාණයත් මෙහි **'ධම්ම'** නම්.

ධර්මදෙශනාවගේ අවසානයෙහි බොහෝ දෙන සෝවන්පලාදි යට පැමිණියාහු ය.

**ජටිලබ්‍රාහ්මණ වස්තුව නිමි.**

# කුහක බමුණෙක්

## 26 — 11

**වවුල්වත** රැකි එක්තරා කොහොන් බමුණෙක් **විසල්** පුර දොරටුවෙහි කුඹුක් ගසකට නැගී දෙපයින් එහි අත්තක් අල්ලා ගෙණ යටලූ හිස් ඇති ව එල්බ ගෙණ "මට කිඹුල්වත් දෙනුන් පන්සියයක් දෙවු, මට කහවණු දෙවු, මට සේවිකාවක දෙවු, ඉදින් නො දෙන්නහු නම් මෙයින් පැන මැරී මෙ නුවර පාලු කරන් නෙමි"යි කිය යි. මේ අතර භික්ෂු සඞ්ඝයාත් පිරිවරා ගෙණ බුදුරජුන් නුවරට වදනා වේලෙහි බුදුරජුන් හා එක් ව ගිය භික්ෂූන් වහන්සේලා නුවරට වදනා වේලෙහිත් නුවරින් නික්ම එන වේලෙහිත් එසේ වවුලකු මෙන් එල්බ හුන් ඒ කොහොන් බමුණු දුටහ. නුවර වැස්සෝ ද උදෑසන පටන් එසේ දෙපයින් කුඹුක් අත්ත එල්බ හුන් බමුණා බිම ඇද වැටී නුවර පාලු කරන්නේ ය, යි සිතා, නුවර නැසී යේ ය, යන බියෙන් ඌ ඉල්ලූ හැම දෑයක් ම දුන්හ. ඉන් පසු කොහොන් බමුණු ගසින් බැස ඒ දුන් සියල්ල ගෙණ ගියේ ය.

භික්ෂූන් වහන්සේලා වෙහෙර සීමායෙහි දී දෙනක හඬන්නා සේ හඬ හඬා යන බමුණු දැක හැඳින "බමුණ! තා ඉල්ලූ දෑය ලද දෑ?"යි ඇසූහ. "එසේ ය, ලදිමි"යි කී විට උන්වහන්සේලා විහාරයට ගොස් ඒ පුවත බුදුරජානන් වහන්සේට සැල කළහ. "මහණෙනි! මේ මිනිහා කුහක හොරකු සේ හැසිරෙණුයේ අද පමණක් ම නො වේ. මෙ තෙමේ පෙරත් කුහක සොරෙක් ව ම හැසුරුණේ ය, දැන් මොහු මෙසේ මිනිසුන් රවටන්නේ ය, අද මෙන් එදා මොහුට නුවණැති මිනිසුන් රවටා ගන්නට නො හැකි වී ය"යි වදාරා ඒ ඉකුත් පුවත ද දක්වා වදාළ සේක.

"යට ගිය දවස **කසීරට** එක් ගමක් ඇසුරු කොට කුහක තවුසෙක් විසී ය, ඒ ගම එක් පවුලෙක් ඔහුට උපස්ථාන කෙළේ ය, එහි දවල කෑමට පිළියෙල කරණ කෑම් බීම්වලින් කොටසක් තම පුතුනට දෙන්නා සේ ඔහුට දෙන්නේ ය, සවසට පිළියෙල කරණ බතෙන් මාලුයෙන් කොටසක් තබා පසු දා උදෑසන දෙන්නේ ය, දවසක් ඒ ගෙදර වැස්සෝ තලගොයිමසක් ලදින් එය හොඳට දුරු මිරිස් යොදා පිස එයින් කොටසක් අරගෙණ තබා පසුදා උදෑසන ගෙණ ගොස් තවුසාට දුන්හ, තවුසා තලගොයි මස් කාලා රසයෙහි බැඳී 'මේ මස් මොනවා දැ'යි ගෙදර වැස්සන් අතින් ඇසී ය, ඔවුහු 'තලගොයි මසැ'යි කීහ, පසුදා තවුසා පිඬු සිඟා ගොස් ගිතෙල්, දී, ලුනු, මිරිස්, කුළුබඩු සපයා ගෙණ

වූත් තමන් වසන පන්සල් කිළියෙහි තබා වටපිට බලමින් හුන්නේ ය, ඒ වේලෙහි පන්සල අද්දර තුඹසෙක වසන තඹ තලගොයෙක් විටින් විට තවුසා වඳින්නට මෙන් පන්සලට බඩ ගා එන්නට පුරුදුව සිටියේ ය, තලගොයි මස් කා තලගොයි මස් රසෙහි බැඳී හුන් තවුසා තලගොයා මරන්නට සිතා පොලු කැල්ලක් සඟවා තබා තුඹසට නො දුරෙහි තැනෙක නිදන්නකු සේ රැඳී සිටියේ ය, තුඹසෙන් නික්ම පන්සල පැත්තට බඩ ගා ඇදී යන ගොයා තවුසාගේ විලාශය දැක තමා මරන්නට සිතා තවුසා සූදානම් ව හිඳින බව වැටහීමෙන් එහි ම රැඳුනේ ය, තවුසා ද ගොයා ඉදිරියට නො ගොස් එහි ම රැඳෙනු දැක ගොයා මරන්නට සඟවා තුබූ පොලු කැල්ල ගෙණ ගොයාට දමා ගැසී ය, එහෙත් එය අන් තැනක වැටුනේය, ගොයා ද තුඹසට වැද සැඟ වී සිට හිස තුඹසෙන් මදක් එළියට දමා ආපසු බලා,

"මහණෑ යි සිතා මම් – නො හික්මුනු තා වෙත පත්,
තෝ නො මහණකු සේ දූත් – ගැසුවෙහි දඬින් ඒ මට,

දුමෙද! කිම තාගේ – දළමඹුලු දිවිසම් කඩ?
තා සිත කෙලෙස් බිහිලී – පිටත තෝ පිරිමදිහී"

සි තවුසාට එල්ල කොට කී ය, ඉක්බිති තවුසා එයසා තමා සතු දූයෙකින් ගොයා පොළඹවා ගන්නට සිතා,

"ගොසිරදුනි! මෙහි එව – තෙල් ලුනු තිප්පිලි යොදා,
මැනැවින් සකස් කළ බෝ – රසැති ඇල්බත් වළඳවූ"

යි කියා පෑයේ ය, ඒ ඇසූ ගොයා 'තවුස! තා මෙසේ කියත් ම මට තා වෙතින් පලා යන්නට ම සිතේ ය'යි කියා නැවත,

"බඩ සයින් ගැඹුරු – තුඹසට ම මම වදිමි,
මට නො සැප වූ තෙල් ලුනු – තිප්පිලි ඇතැයි කියහී"

යි කියා නැවැතත් මම මෙතෙක් කල් තා මහණකැ යි ගණන් ගෙණ සිටියෙමි, තෝ දූත් මා මරා කන්නට දඬු කඩක් දමා ගැසූයෙහි, ඒ දඬු කඩ දමා ගැසූ තෝ මහණෙක් නො වූ යෙහි, තා වැනි ගොනකුට දළමඹුලෙන් බුර සහිත අඳුන් දිවිසමෙන් ලැබෙන ප්‍රයොජනය කුමක් ද? තාගේ ඇතුළත කෙලෙස්වලින් පිරී ගත්තේ ය, හුදෙක් පිටත ම ඔපලන්නෙහි ය, සි කීයේ ය.

බුදුරජානන් වහන්සේ මෙසේ මේ යට ගිය කතාව ගෙණ හැර පා "අද මේ කුහක බමුණා, එදා ඒ කුහක තවුසා ය, එදා ඒ තලගොයා අද මම වෙමි"යි ජාතකයක් ගළපා එදා ගොඩ

පණ්ඩිතයා විසින් ඔහුට සඞ්ග්‍රහ කළ කරුණු දක්වන සේක් මේ ධර්මදේශනාව වදාළ සේක.

**කිං තෙ ජටාහි දුම්මෙධ! කිං තෙ අජිනසාටියා,**
**අබ්භන්තරං තෙ ගහනං බාහිරං පරිමජ්ජසි.**

අඥය! තට දළමඹුලෙන් කුමන ප්‍රයොජනයෙක් ද, තට අඳුන් දිවිසමෙන් කුමන ප්‍රයොජනයෙක් ද, තාගේ ඇතුළත කෙලෙසුන් ගෙන් ගැවසී ගත්තේ ය. (තෝ) පිටත පිරිමදිනෙහි ය.

**කිං තෙ ජටාහි දුම්මෙධ!** = අඥය! තට දළමඹුලෙන් කුමන ප්‍රයොජනයෙක් ද.

සියුම් ධර්මාර්ථයන් දන්නා නුවණත් කෙලෙසුන් හිංසා කරණ නුවණත් නැතියේ **'දුම්මෙධ'** නමි.[1]

**කිං තෙ අජිනසාටියා** = තට අඳුන් දිවිසමෙන් කුමන ප්‍රයොජනයෙක් ද.

**අබ්භන්තරං තෙ ගහනං** = තාගේ ඇතුළත කෙලෙසුන්ගෙන් ගැවසී ගත්තේ ය.

**බාහිරං පරිමජ්ජසි** = පිටත පිරිමදිනෙහි ය.

"පව්ටු තවුස! මම තා ගුණවතෙකැයි සිතා තා වෙත පැමිණි යෙමි. එහෙත් තාගේ කිසි තැනෙක ගුණයෙක් නැත. තා වැනි කිසිත් ගුණයක් නැති පව්ටුන් විසින් දරණු ලබන දළමඹුලෙන් ඇති ප්‍රයොජනයෙක් නැත, තා හඳනා ලද නිය සහිත අඳුන් දිවිසමින් ඇති ප්‍රයොජනයෙක් නැත, තාගේ ඇතුළත රාගාදී වූ සියලු කෙලෙස් වලින් පිරී ගත්තේ ය, එසේ වූ තෝ දළමඹුලු අඳුන් දිවිසම් ඇ තවුස් පිරිකරින් පිටත ම ඔපමට්ටම් කරන්නෙහි ය."

ධර්මදෙශනාවගේ අවසානයෙහි බොහෝ දෙන සෝවාන් පලාදියට පැමිණියාහු ය.

**කුහක බ්‍රාහ්මණ වස්තුව නිමි.**

---

1. 2. 6, 'දුම්මෙධිනො' යනු බලනු.

# කිසාගෝතමී

## 26 — 12

එක් දවසක් සක්දෙව් රජ තෙමේ පෙරයම දස පැය ඉක්ම ගිය පසු දෙදෙව් ලොව දෙවියන් පිරිවරා ගෙණ බුදුරජුන් වෙත එළැඹැ වැඳ සිහිකටයුතු සිත් ගන්නා සුලු බණ කතාවක් අසමින් එකත් පසෙක හුන්නේ ය. ඒ වේලෙහි කිසාගොතමී තොමෝ බුදුරජුන් දක්නා පිණිස අහසින් ආවා සක්දෙව්ඳු දැක බුදුරජුන් වෙත නො ගොස් මග නැවතී ගත්තා ය. සක්දෙව්ඳු මග නැවතුනු කිසාගොතමිය දැක ‘‘සවාමීනි! මෙහි එන්නට අවුත් බුදුරජාණන් වහන්සේ දැක හැරී යන ඕ කවරි?’’ යි ඇසී ය. බුදුරජාණන් වහන්සේ ‘‘මහරජ! ඕ කිසාගොතමී, මාගේ දූ, පියුමතුරා බුදුරජුන් දවස හංසවතී නුවර කුලගෙයක උපන්නී ඒ බුදුරජුන් දෙසූ ධර්මදෙශනාවක් අසා එහි දී බුදුරජුන් විසින් එක් මෙහෙණක රළුසිවුරු දරණ මෙහෙණින් අතර අගතැන තබනු දැක පින් කොට ඒ තනතුර පැතූය, ඕ කල්පලක්ෂයක් දෙව්මිනිස් දෙගතියෙහි සැරිසරන්නී මෙ දවස සැවැත් නුවර දිළිඳු කුලයෙක උපන්නී වැඩි විය පැමිණියා විවාහජීවිතයට ඇතුළත් වූ ය, ටික දවසක් ගිය තැන පුතකු ද වැදූ ය, එ දරු දුවපැන ඇවිදිමින් කෙළින වයසෙහි සිටියේ කළුරිය කෙළේ ය, එයින් ඇයට මහත් ශොකයෙක් උපන, මළපුතු කර තබා ගෙණ ‘මාගේ පුතුට බෙහෙතක් කියව’ යි හැසිරෙන්නට වන, එකල එක් නුවණැති මිනිහෙක් ඇය මා වෙතට පමුණුවාලී ය, එහි දී මම ඇයට දහම් දෙසා ඇයගේ සිත් තුළ නැගී තුබූ ශොකය සන්සිඳ වී මි, ඉන්පසු,

> ‘‘තං පුත්ත පසුසම්මත්තං බ්‍යාසත්තමනසං නරං,
> සුත්තං ගාමං මහොඝොව මච්චු ආදය ගච්ඡති’’

යන ගයින් දහම් දෙසීමි, එහි අවසනැ ඕ සෝවාන්පලයට පැමිණියා පැවිද්ද ඉල්ලූ ය, මම ඇයට පැවිද්ද අනුදැනීමි, ඉන් පසු මෙහෙණවරකට ගොස් පැවිදි වූවා, උපසම්පදාව ද ලබා නො බෝ දවසක දී විදශීනා වඩා රහත් බවට පැමිණියා රළු සිවුරු දරමින් හැසුරුණී ය, ටික දවසක් ගිය තැන ඕ පවුල් සිවුරු දරණ මෙහෙණින් අතර අගතැන්පත් වූ ය’’ යි වදාරා මේ ධර්මදෙශනාව කළ සේක.

> **පංසුකූලධරං ජන්තුං කිසං ධමනිසන්ථතං,**
> **ඒකං වනස්මිං ඣායන්තං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණන්ති.**

පවුල් සිවුරු දරන්නා වූ කෘශ වූ නහර වැලින් ගැවසී ගත් සිරුර ඇති වනයෙහි එකලා ව ධ්‍යාන කරන්නා වූ ඒ පුද්ගලයා මම බ්‍රාහ්මණයැයි කියමි.

**පංසුකූලධරං ජන්තුං** = පවුල් සිවුරු දරණ පුද්ගලයා.

සොහොන් කසලගොඩ ආදියෙහි දමූ ඒ ඒ තැනින් අවුලා ගත් රෙදි කඩින් සකස් කොට ගත් සිවුර **'පංසුකූල'** නම්. එබඳු සිවුරක් දරණුයේ **පංසුකූලධර.**[1]

**කිසං ධමනිසන්ථතං** = කෘශ වූ නහර වැලින් ගැවසී ගත්.

මස් ලේ වියලී ගියේ **'කිස'** නම්. නහර ඉල්පී සිටි සිරුරු ඇතියේ **'ධමනිසන්ථත'** නම්.

පංසුකූලිකයෝ තමාට අනුරූප වූ පිළිවෙත් පුරන්නෝ මස් ලේ වියලී ගියෝ වෙත්. එහෙයින් ම ඔවුහු නහර ඉල්පී සිටි උඩට මතු වූ නහර ඇතියෝ වෙත්. **''පංසුකූලිකා හි අත්තනො අනුරූපං පටිපදං පූරෙන්තා අප්පමංසලොහිතායෙව හොන්ති ධමනිසන්ථතගත්තා ච''** යනු අටුවා.

**එකං වනස්මිං ඣායන්තං තං අහං බ්‍රෑමි බ්‍රාහ්මණං** = වනයෙහි එකලා ව ධ්‍යාන කරන්නා වූ, ඔහු මම බ්‍රාහ්මණ යි කියමි.

මෙහි **'එකං'** යන්නෙන් ගණසඞ්ගණිකාව හැර විවෙකයෙන් කල් ගෙවනුයේ ද ද්විවිධධ්‍යානයෙන් ධ්‍යාන කරණුයේ **'ඣායන්තං'** **යන්නෙන් ද ගැණේත්.**

මම, පවුල් සිවුරු දරණ වියලී ගිය මස් ලේ නිසා ඉස්මතු වූ නහරින් යුත් සිරුරු ඇති දුර වනසෙනසුනෙහි එකලා ව හිඳ ධ්‍යාන කරන්නහු බ්‍රාහ්මණ යි කියමි.

ධර්මදෙශනාවගේ අවසානයෙහි බොහෝ දෙන සෝවන් පලාදියට පැමිණියාහු ය.

**කිසාගෞතමී වස්තුව නිමි.**

---

1. 7, 6. 'සුබබතො' යනු බලනු

# තමා බමුණු යි සිතූ බමුණෙක්

## 26 — 13

"ශ්‍රමණ ගෞතම තෙමේ තම ශ්‍රාවකයන් බ්‍රාහමණයන් කොට පිරිස්මැද කියා පාන්නේ ය, මම ද උපන්මි බ්‍රාහමණයොනියෙහි ම ය, එහෙයින් මා ද බ්‍රාහමණ කොට කියන්නට වටී ය" යි සිතා ගත් එක්තරා බමුණෙක් බුදුරජුන් වෙත එළැඹැ "මා බමුණු කොට නො කියන්නට ඇති කරුණු කිමැ?" යි අසා සිටියේ ය. ඉක්බිති බුදුරජානන් වහන්සේ "මම, යමකු බ්‍රාහමණයොනියෙහි උපන් පමණින් බ්‍රාහමණැ යි නො කියමි, යමෙක් රාග ද්වෙෂ මොහාදී වූ කෙලෙස් නැත්තේ නම්, උපාදන විසින් දැඩි ගැණිම් නැත්තේ නම්, පව් නැත්තේ නම්, මම ඔහු බ්‍රාහමණැ යි කියමි" යි වදරා මේ ධර්‍මදෙශනාව කළ සේක.

**න චාහං බ්‍රාහමණං බ්‍රෑමි යොනිජං මත්තිසම්භවං,**
**භොවාදී නාම සො හොති සචෙ හොති සකිඤ්චනො,**
**අකිඤ්චනං අනාදනං තමහං බ්‍රෑමි බ්‍රාහමණං.**

මම යොනිමාර්‍ගයෙන් උපන්, බැමිණි මවක ගේ කුස හට ගත්තකු බමුණු යි නො කියමි. ඉදින් හෙතෙමේ පළිබොධ සහිත වේ නම් භොවාදී නම් වේ. පළිබොධ නැති දැඩි ගැණිම් නැති ඔහු, මම බමුණු යි කියමි.

**න ච අහං බ්‍රාහමණං බ්‍රෑමි යොනිජං මත්තිසම්භවං** = මම යොනියෙන් උපන් බ්‍රාහමණ ජාතික මවකගේ කුස උපන්නකු බමුණු යි නො කියමි.

**'යොනිජ'** නම්: මවගේ යොනිමාර්‍ගයෙන් උපන්නේ ය. මෙහි **'යොනි'** යි කියේ ස්ත්‍රීලක්‍ෂණයයි[1] **'මත්තිසම්භව'** නම්: බැමිණි මවකගේ කුස උපන්නේ ය.

**භොවාදී නාම සො හොති සචෙ හොති සකිඤ්චනො** = ඉදින් හෙ තෙමේ පළිබොධ සහිත වේ නම් 'භොවාදී' නම් වේ.

**'භොවාදී'** යන මෙහි **'භො'** යනු ආලපනාර්‍ථයෙහි නිපාතයෙකි. බ්‍රාහමණ ජාතිකයකු කවුරුන් හෝ තමාට මුණ ගැසුනු කල්හි ඔවුනට **'භො භො'** යි අමතන්නෝ ය. මේ ඇමතීම බ්‍රාහමණ ජාතිකයන්ගේ ජාතික සම්ප්‍රදායයෙකි. එහෙයින් බමුණෝ 'භොවාදී' නම් වූහ. **"භොති බ්‍රාහමණජාතිකානං ජාතිසමුදාගතං ආලපනං"** යනු අටුවා. තවද, **'සුභාසුභකථනත්‍ථං භො හොති**

1. 23. 5. 'යොනිසො' යනු බලනු

**වචනං වදති සිලෙනාංනි = හොවාදී"** යනු ද මෙහිලා දත යුතු ය. 'හො' යනු එකවචන බහුවචන දෙක්හි සාධාරණ විසින් යෙදෙන්නේ ය.

**'සකිඤ්චන'** නම්: පළිබොධ සහිත වූයේ ය. **"රාගො කිඤ්චනං"** යනාදී ලෙසින් වදාළ රාග ද්වෙෂ මොහයෝ කිඤ්චනයෝ ය.[1]

**අකිඤ්චනං අනාදනං තං අහං බ්‍රෑමි බ්‍රාහමණං** = පළිබොධ නැති දැඩි ගැණුම් නැති ඔහු, මම බමුණු යි කියමි.

**'අකිඤ්චන'** නම්: රාගද්වෙෂාදි කිඤ්චන නැතියේ ය. **'අනාදන'** නම්: තෘෂ්ණා දෘෂ්ටි ආදි උපාදාන නැතියේ ය.

බැමිණියකගේ කුස පිළිසිඳ ගෙණ බැමිණියකගේ යොනි මාර්ගයෙන් බිහිවූවෙක් එ පමණින් බ්‍රාහමණ නම් නො වේ. ජාති විසින් බ්‍රාහමණ වූ හෙතෙමේ පළිබොධ සහිත නම් හොවාදී නම් වේ. අර්ථ විසින් බ්‍රාහමණ නො වේ. රාගාදි පළිබොධ හා කාමූපාදනාදිය නැත්තේ ම බ්‍රාහමණ වේ.

ධර්මදෙශනාවගේ අවසානයෙහි ඒ බ්‍රාහමණ තෙමේ සෝවාන් පලයෙහි පිහිටියේ ය. ධර්මදෙශනා තොමෝ පැමිණ සිටි පිරිසට ද වැඩ සහිත වූ ය.

**අන්‍යතර බ්‍රාහමණ වස්තුව නිමි.**

---

1. 15, 2. 'කිඤ්චනං' යනු බලනු

# උග්ගසෙන සිටු

## 26 — 14

**උග්ගසෙන** සිටු පිළිබඳ කතා පුවත **"මුඤ්ච පුරෙ මුඤ්ච පච්ඡතො"** යි අා ගාථාවර්ණනායෙහි විස්තර විසින් කියන ලදි. එ කල්හි වනාහි "ස්වාමීනි! උග්ගසෙන නො බාමි යි කියා, ඔහු බොරුවෙන් රහත්බව හඟවා" යි භික්ෂූන් දන්වා සිටි කල්හි බුදුරජානන් වහන්සේ "මහණෙනි! මාගේ පුතු වැනි සිඳ හළ භව බැඳුම් ඇතියෝ කො තැනකත් බිය නො වෙති"යි වදාරා මේ ධර්ම දේශනාව කළ සේක.

> **සබ්බසංයොජනං ඡෙත්වා යො වෙ න පරිතස්සති,**
> **සඞ්ගාතිගං විසංයුත්තං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණනති.**

යමෙක් සියලු සංයොජන සිඳ හැර (සිටි බැවින්) ඒකාන්තයෙන් නො තැති ගණී ද සඞ්ගයන් ඉක්මවා ගිය කෙලෙසුන්ගෙන් මිදුනු ඔහු මම බ්‍රාහමණෑ යි කියමි.

**සබ්බසංයොජනං ඡෙත්වා** = සියලු සංයොජනයන් සිඳහැර (සිටි බැවින්)

**'සංයොජන'** නම්: බවබැඳුම් ය. සත්වයා සසරෙහි යොදන්නේ ය. ඒ දසයෙකි. සක්කායදිට්ඨි-විචිකිච්ඡා-සීලබ්බතපරාමාස යන සංයොජන තුන හා සියලු සංයොජනයන්ගේ අපායගාමී ශක්තිය සිඳී යනු ස්‍රොතාපත්තිමාර්ගීයෙන් වන්නේ ය. කාමරාග ව්‍යාපාද දෙදෙනාගේ දරදඬුගතිය සකෘදගාමිමාර්ගීයෙන් නැසෙත් ම අනාගාමිමාර්ගීයෙන් එ දෙක සිඳී යන්නේ ය. ඉතිරි වූ රූපරාග අරූපරාග-මාන-උද්ධච්ච-අවිජ්ජා යන මොවුහු අර්හත්මාර්ගීයෙන් මුලසුන් ව යත්.[1]

**යො වෙ න පරිතස්සති** = යමෙක් ඒකාන්තයෙන් නො තැති ගණී ද.

කුමකින් නො තැති ගණී ද? යත්:– "ආහාර නො ලබමි, පාන නො ලබමි, වස්ත්‍ර නො ලබමි, කුලය නො ලබමි, ගණයා නො ලබමි, ආවාසය නො ලබමි, ලාභ නො ලබමි, යශස් නො ලබමි, පැසසුම් නො ලබමි, සැප නො ලබමි, චීවර – පිණ්ඩපාත– සෙනාසන – ග්ලාන ප්‍රත්‍යය, බෙහෙත් පිරිකර නො ලබමි, ගිලන් උවටැන් කරන්නකු නො ලබමි, අප්‍රකටයෙම් වෙමි"යි

1. 2. 8. 'සංයොජනං' යනු බලනු.

නො තැති ගන්නේ ය. නො බිය වන්නේ ය. තැති ගැණුමට නො පැමිණෙන්නේ ය. නො බියසුලු නො සැලෙනසුලු නො තැති ගන්නා සුලු නො පලායන සුලු වන්නේ ය. පහ වූ බිය අරමුණු ඇතියේ පහවූ ලොමූ දහ ඇතියේ වෙසෙන්නේ ය.

මේ මෙහි පාලි:– **"අන්නං වා න ලභාමි, පානං වා න ලභාමි, වත්ථං වා න ලභාමි, කුලං වා න ලභාමි, ගණං වා න ලභාමි, ආවාසං වා න ලභාමි, ලාභං වා න ලභාමි, යසං වා න ලභාමි, පසංසං වා න ලභාමි, සුඛං වා න ලභාමි, චීවරං වා න ලභාමි, පිණ්ඩපාතං වා න ලභාමි, සෙනාසනං වා න ලභාමි, ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරං වා න ලභාමි, ගිලානුපට්ඨාකං වා න ලභාමි, අප්පඤ්ඤාතොම්හීති න තසෙය්‍ය, න උත්තසෙය්‍ය, න පරිතසෙය්‍ය, න භායෙය්‍ය, න සන්තාසං ආපජ්ජෙය්‍ය, අපිරු අසස අචඡම්භී අනුබ්භාසී පහීනභයභෙරවො විගතලොමහංසො විහරෙය්‍ය"** යනු.

**සඞ්ගාතිගං** = සඞ්ගයන් ඉක්මවා ගියා වූ.

පඤ්චස්කන්ධය, සත්ත්වපුද්ගලාදීන්ට නගා සංස්කාරයන් විෂය-යෙහි ඇලීම **'සඞ්ග'** නම්[2] සඞ්ග සතෙකි.

**විසංයුත්තං** = කෙලෙසුන්ගෙන් මිදුනු. වෙන් වූ.

චතුර්විධයොගයන්ගේ අභාව හෙතුයෙන් විසංයුක්ත ය. කාම යොග – භවයොග – දිට්ඨියොග – අවිජ්ජායොගයෙහි විසංයුක්ත වනුයේ.

**තං අහං බ්‍රෑමි බ්‍රාහ්මණං** = ඔහු මම බ්‍රාහ්මණැ යි කියමි.

රහතුන් වහන්සේ සංයොජනයන් නැසූ බැවින් තැති නො ගන්නෝ ය. කිසිද සංස්කාරයක් කෙරෙන් නො බාන්නෝ ය. රාගාදිසඞ්ගයන් ඉක්මවා ගියෝ ය. කිසි තැනක නො බැඳුනෝ ය. එහෙයින් උන්වහන්සේ ම බ්‍රාහ්මණ නම්.

ධර්මදෙශනාවගේ අවසානයෙහි බොහෝ දෙන සෝවාන් ඵලාදියට පැමිණියාහු ය.

**උග්‍රසෙනවස්තුව නිමි.**

---

1. 2, 8. 'සංයොජනං' යනු බලනු
2. 13, 4. 'සඞ්ගා' ,, ,,

# චූල්ලරෝහිත-මහාරෝහිත බ්‍රාහ්මණයෝ

## 26 — 15

අප බුදුරජාණන් වහන්සේ දවස **චූල්ලරෝහිත-මහාරෝහිත** නමින් ප්‍රකට වූ බ්‍රාහ්මණයෝ දෙ දෙනෙක් වූහ. ඔවුනට ගොන්නු දෙ දෙනෙක් ද සිටියහ. ඒ දෙ දෙන එක් දවසක් "මාගේ ගොන් හයිබල ඇත්තේ ය, තාගේ ගොන් හයිබල නැත්තේ ය" යි විවාද කරන්නට වූහ. "ගොන් දෙන්නාගේ හයිබල බලන්නට ගැල් බැඳ දක්කා බලමූ"යි දෙ දෙනා ම තියම් කර ගෙණ **අචිරවතී** ගඟබඩට ගෙණ ගොස් ගැලක වැලි පුරවා ගොනුන් විය යොදාලූහ. ඒ වේලෙහි භික්ෂූන් වහන්සේලා ද ගඟට නාන්නට ගොස් සිටියහ. බමුණෝ ද ගොන් මෙහෙයූහ. ගැල, බර බැවින් නො සැලී සිටි-යේ ය. වියබාන් කැඩී ගියේ ය. නාන්නට ගිය භික්ෂූන් වහන්සේලා එ දැක විහාරයට ගොස් එ පුවත බුදුරජාණන් වහන්සේට සැල කළහ. උන්වහන්සේ "මහණෙනි! මේ විය හා බාන් බැහැරි ඒවා ය, හයිබලැති කවුරු හෝ ඒවා කඩා බිඳ දමනු ඇත, මහණනු විසින් තමා තුළ වූ ක්‍රොධ නැමැති දළවර ද තෘෂ්ණා නැමැති වරපට ද සිඳලන්නට වටී ය" යි වදාරා මේ ධම්දෙශනාව කළ සේක.

> **ඡෙත්වා නද්ධිං වරත්තඤ්ච සන්දාමං සහනුක්කමං,**
> **උක්ඛිත්තපළිඝං බුද්ධං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං.**

දැඩි රැහැණ ද වරපට ද අනුක්‍රම සහිත වූ මහදම ද සිඳ හැර සිටියා වූ උදුරා දැමූ හිදිබා ඇති සිවු සස්දහම් දත්තා වූ ඔහු, මම බමුණු යි කියමි.

**ඡෙත්වා නද්ධිං වරත්තං ච සන්දාමං සහනුක්කමං** = දැඩි රැහැණ ද වරපට ද අනුක්‍රම සහිත වූ මහදම ද සිඳ හැර සිටියා වූ.

මෙහි **'නද්ධි'** නම්: ක්‍රොධය යි. ක්‍රොධය තෙමේ රැහැණකින් වියගහ, ඒරියා කදෙහි බැඳ තබන්නා සේ පරාපකාරය සිත්හිලා තදින් දැඩි ව බඳින්නේ ය. එහෙයින් ක්‍රොධය 'නද්ධි' නම්. **"නහ්‍යතෙ බන්ධියතෙති යථා සා නද්ධි"** යනු නිරුක්ති.

**'වරත්ත'** නම්: මෙහි තෘෂ්ණා ය. රැහැන්පටින් ඒ ඒ දැය බැඳ තබන්නා සේ තෘෂ්ණා තොමෝ සත්‍වයා සසර බැඳ තබන්නී ය. එහෙයින් තෘෂ්ණාව 'වරත්ත' නම්.

**"වරන්ති බන්ධන්ති අනෙනාති = වරත්තං"** යනු නිරුක්ති.

---

1. 1, 7. 'අනික්කසාවො' යනු බලනු.

**'සන්දාම'** යනු, මෙහි දෙ සැට මිසදිටු ය. මහදමකින් නොයෙක් දෙනා දැඩිලෙස එකට බැඳ තබන්නා සේ දෙ සැට මිසදිටු, මිසදිටු ගත්තවුන් සසර දැඩි ව බැඳ තබන්නී ය. එහෙයින් දෙ සැට මිසදිටු 'සන්දාම' නම්.[1] **"යන්ත්‍ර සාසම්ං බහලපගහහයුතෙතන අනෙකං බන්ධයනෙත"** යනු අර්ථවිවරණ යි.

**'අනුසකම'** නම්: ශරීරගත ව පවත්නා මී විෂක් යම් යම් ආහාර පාන විහරණ කරණ කොට නැවැත නැවැත නැගී එන්නා සේ, තමාගේ නැගී සිටීමට සැහෙන කරුණක් අරමුණක් එළැඹැ සිටි කල්හි නැගී සිටුනා සිත් සතන්හි හෝනා සත්වැදෑරුම් අනුශයධර්මයෝ ය.

**උක්ඛිත්තං පළිසං බුද්ධං තං අහං බ්‍රෑමි බ්‍රාහ්මණං** = උදුරා දැමූ හිදිබා ඇති සිවු සස් දහම් දත්තා වූ ඔහු, මම බමුණු යි කියමි.

**'උක්ඛිත්තපළිස'** උදුරා හළ කණයම ඇත්තේ ය. පළිසෑ යි කියේ කණයම ය. මේ නම්, ගෙට වැද්ද නො දෙන්නට ඇතුළතින් දොරලෑලි සවිකරණු සඳහා යොදන අගුල හෝ දොරපොල්ල ය. කණය ම දොර වැසූ කල්හි එහි වැදීම වළකින්නේ ය. එමෙන් යමෙක් අවිද්‍යාවෙන් වැසී ගියේ නම් ඔහුගේ නිවන් ගමන වළකින්නේ ය. එහෙයින් අවිද්‍යාව පළිසය වැනි ය. මෙහි පළිසෑ යි කියේ අවිද්‍යා ය. ඒ මේ අවිද්‍යා නැමැති පළිසය අර්හත්මාර්ගඥානයෙන් උදුරා දැමූයේ 'උක්ඛිත්තපළිස' නම් වේ.

**'බුද්ධ'** නම්: චතුරාර්යසත්‍යය මුළුමනින් තතු විසින් දතුයේ ය.[2] ක්‍රොධයත් තෘෂ්ණාවත් අනුශය සහිත වූ දෙසැට මිසදිටුත් අවිද්‍යාවත් මුල් සුන් කොට නසා සිවු සස් දහම් තතු පරිදි දැන සිටි රහතුන් වහන්සේ ම බ්‍රාහ්මණ වන සේකැ යි මෙයින් වදාළ සේක.

ධර්මදෙශනාවගේ අවසානයෙහි පන් සියයක් භික්ෂූන් වහන්සේ රහත් බැව්හි පිහිටියාහු ය. ධර්මදෙශනා තොමෝ පැමිණ සිටි පිරිසට ද වැඩ සහිත වූ ය.

**බ්‍රාහ්මණවස්තුව නිමි.**

---

1. 1, 7, 1. 'අභික්කසාංචො' යනු බලනු
2. 14, 1. 'තං බුද්ධමනන්තගොචරං' ,, ,,

# අක්කොසකභාරද්වාජබ්‍රාහමණයා නැගූ ප්‍රශ්න

## 26 — 16

**අක්කොසක** භාරද්වාජබ්‍රාහමණයාගේ බෑ වූ **භාරද්වාජ** බ්‍රාහමණයාහට **ධනඤ්ජානී** නම් බිරියක් වූ ය. සෝවන්පලයට පැමිණ සිටි ඕ තොමෝ කිවිසියා ද කැස්සා ද පැකිළ ගියා ද ඒ හැම තැන දී ම "භාග්‍යවත් වූ අහීත් වූ සම්මා සම්බුදු රජාණන් වහන්සේට නමස්කාර වේවා"යි උදන් අනන්නී ය. ඕ තොමෝ දවසක් බමුණකු එහි වළඳනා වේලෙහි පා පැකිළී ගියා "සම්මා සම්බුදු රජානන් වහන්සේට නමස්කාර වේවා"යි මහහඬින් උදන් ඇනූ ය. බමුණා එයසා කිපුනේ "මේ සැඩොලිය හැම තැන හැම වේලෙහි හැම ගැස්මක දී ම යම්තම් කරුණකට ඒ මුඩු මහණහුගේ ගුණ කියා උඟට නමස්කාර කරන්නී ය, දැන් මම ගොස් තීගේ ඔය ශාස්තෘවරයා හා වාද කරන්නෙමි"යි කීයේ ය. එකල්හි ඕ තොමෝ "යව, මේ මුළු තුන් ලොව කිසි තැනක ඒ භාග්‍යවතුන් හා වාද කොට ජය ගත් එකකු මම නො දකිමි, ඒ නිසා වාද තබා උන්වහන්සේ වෙත ගොස් උන් වහන්සේගෙන් ප්‍රශ්නයක් විචාරා බලව"යි කිවු ය. ඉක්බිති බමුණා බුදුරජුන් වෙත ගොස් නො වැඳ පසෙක සිට, "ගෞතම! කුමක් නසාලීමෙන් සුවසේ හොවී ද? කුමක් නසා ශොක නො කෙරේ ද? කිනම් ධර්මයක්හුගේ නැසීම රුස්නේ ද?"යි යන මේ ප්‍රශ්න අසා සිටියේ ය. එ කල්හි බුදුරජාණන් වහන්සේ "ක්‍රොධය නසාලීමෙන් සුවසේ හොනේ ය, ක්‍රොධය නසා ශොක නො කරන්නේ ය, බමුණ! යම් හෙයකින් ක්‍රොධය නසා ශොක නො කෙරේ ද, එහෙයින් ආයර්‍ය්‍යයෝ ක්‍රොධය නැසීම පසසන්නාහ"යි ඔහුට පිළිතුරු දුන් සේක.

එකෙණෙහි ම බ්‍රාහමණ තෙමේ බුදුරජුන් කෙරෙහි පැහැද පැවිදි ව රහත්බවට පැමිණියේ ය. ඔහුගේ බාල සහොදර වූ අක්කොසක භාරද්වාජ තෙමේ "සහොදරයා පැවිදි වී ය"යි අසා කිපියේ බුදුරජුන් වෙත ගොස් උන්වහන්සේට නො සැබි රළු බසින් ආක්‍රොශ කෙළේ ය. එහි දී බුදුරජුන් විසින් ආගන්තුකයනට කෑම් බීම් දීමේ උපමාවෙන් කරුණු ගන්වන ලද බ්‍රාහමණ තෙමේ උන්වහන්සේ කෙරෙහි ප්‍රසන්න ව පැවිදි ව රහත් වූයේ ය. තවත් මොහුට **සුන්දරිකභාරද්වාජ** – **විලිඞ්ගිකභාරද්වාජ** යි බාල සහෝදරයෝ දෙ දෙනෙක් ද වූහ. ඒ දෙ දෙනා ද බුදුරජුන්ට ආක්‍රොශ කරමින් සිටියෝ උන්වහන්සේ විසින් හික්මවන ලදු ව රහත් වූහ. මේ අතර දවසක "ඇවැත්නි! බුදුගුණ නම් එකාන්තයෙන් මහත් අසිරි ය, සහොදරයන් සතර දෙනකුන් ඉදිරියට අවුත් ඇණුම් බැණුම් කරද්දීත් බුදුරජනන් වහන්සේ ඔවුනට කිසිත් නො බැණ

ඔවුනට පිහිට වූහ''යි ධම්සභායෙහි කතාවක් උපන. ධම්සභාවට වැඩම කළ බුදුරජානන් වහන්සේ භික්‍ෂූන් කළ ඒ කතාව අසා "මහණෙනි! ඉවසීමෙහි බලයෙහි මුදුන් අත්තට පැමිණ සිටුනා මම, මට දෙස් පරොස් කියන්නවුන් කෙරෙහි නො කිපී දෙස් පරොස් නො කියා ඔවුනට පිහිට වීමෙහි සමත් වෙමි''යි වදාරා මේ ධම්දෙශනාව කළ සේක.

අක්කොසං වධබන්ධං ච අදුට්ඨො යො තිතික්ඛති,
ඛන්තිබලං බලාණීකං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණනති.

යම් පුද්ගලයෙක් ආක්‍රොශය හා වධ බන්ධන ඉවසා ද ක්‍ෂාන්තිය බල කොට ඇති ක්‍ෂාන්තිය බල ඇණි කොට ඇති ඔහු, මම බමුණු යි කියමි.

**අක්කොසං** = ආක්‍රොශය (ද).

සොරෙක, බාලයෙක, මූඪයෙක, ඔටුවෙක, ගොනෙක, කොට-එවෙක, තිරිසනෙක, නිරිසතෙක, තට සුගතියෙක් නැත, තට දුගතිය ම කැමැති විය යුතු ය, යන මෙලෙසින් අනුන් ගැටීම අනුනට ගැරහීම ආක්‍රොශය යි.[1]

**වධබන්ධං ච** – වධ හා බන්ධන ද.

අත් පා දඬු මුගුරු අවි ගල් ගඩොල් ආදියෙන් අනුන් තැළීම පෙළීම පහරදීම '**වධ**' නම්. හැකිල්ලෙන් රැහැණින් යොතින් බැඳීම් මාංචු දැමීම් සිරගෙයි ලෑම් ආදිය '**බන්ධන**' නම්.

**අදුට්ඨො යො තිතික්ඛති** = නො කිපි සිත් ඇති යමෙක් ඉවසා ද.

ද්වෙෂයෙන් දූෂිත නො වූයේ නො කිපි සිත් ඇතියේ දශවිධ ආක්‍රොශයත් අනුබන්ධන රජ්ජුබන්ධනාදියත් ඉවසන්නේ ය.

**ඛන්තිබලං** = ක්‍ෂාන්තිය බල කොට ඇති. ශක්තිමත් වූ ක්‍ෂාන්තිය ඇති.

මෙරමා විසින් කරණ කියන තමාට නො රුස්නා හැම එකක් ඉවසීමෙහි ශක්තිය '**ඛන්තිබල**' නම්. යමක්හුගේ ඉවසීම මොන ලෙසකිනුත් නො සැලේ නම් එබඳු නො සැලෙන ඉවසීම ඇතියේ ක්‍ෂාන්තිය බලකොට සිටියේ ය.[2]

**බලාණීකං** = ක්‍ෂාන්තිය බල ඇණි කොට සිටි.

---

1. 1, 3. 'අක්කොච්ඡමං' යනු බලනු.
2. 14, 4 'ඛන්තිපරමං තපොතිතික්ඛා' ,, ,,

මෙහි නැවැත නැවැත උපදනා එම ක්‍ෂාන්තිය ම බලඇණි කොට සිටියේ **'බලාණීක'** නම්. හස්ත්‍යානීක – හයානීක – රථානීක – පත්තානීක යි අනීක සතරෙක් යුද්ධසෙනාඞ්ගයෙහි ලා කියන ලද්දේ ය. එහි පුරුෂයන් දොළොස් දෙනකු හා ඇතුන් තුන් දෙනකු ඇති බල ඇනිය 'හස්ත්‍යානීක' නම්. පුරුෂයන් තුන් දෙනකු හා අශ්වයන් තුන් දෙනකු ඇති බලඇනිය 'හයානීක' නම්. පුරුෂයන් සතර දෙනකු හා රිය තුනක් ඇති බලඇනිය 'රථානීක' නම්. ආයුධ ගෙණ සිටි පුරුෂයන් සතර දෙනෙක් 'පත්තානීක' නම්. මෙසේ කියන ලද්දේ අන්තිම කෙළවර ගෙණ ය.

"හත්ථිද්වාදසපොසොති පුරිසො තුරගො රථො,
චතුපොසොති එතෙන ලක්ඛණෙනාධමන්තතො.
හත්ථානීකං හයානීකං රථානීකං තයො තයො,
ගජාදයොතු සත්ථාතු පත්තානීකං චතුජ්ජනා"

යනු කොෂාගත ය. මෙහි ක්‍ෂාන්තිබලානීකය කියන ලද්දේ ය. මුලින් කියූ බලඇනි හා මෙහි සම්බන්ධයෙක් නැත්තේ ය. මේ පවත්තේ කෙලෙස් සතුරන් පරදවා ජය ගැණීමට ය. ඒ පවත්තේ සතුරු මිනිසුන් පරදවා කෙරෙණ දිග්විජය සඳහා ය. මෙහිලා ක්‍ෂාන්තිබලානීකය ම උසස් වන්නේ ය. අන් හැම බලඇනියක් යටපත් කොට සිටියේ ය.

**තං අහං බ්‍රෑමි බ්‍රාහමණං** = මම ඔහු බමුණු යි කියමි.

ආක්‍රොශ – අන්‍දුබන්ධන – රජ්ජුබන්ධන යන සියල්ල නො කිපි සිත් ඇති ව ඉවසන ඉවසීම බලය කොට සිටි ඉවසීම බල සෙනග කොට ගත් ඒ ක්‍ෂිණාස්‍රවයා මම බමුණු යි කියමි යි මෙයින් වදාළ සේක.

ධර්මදෙශනාවගේ අවසානයෙහි බොහෝ දෙන සෝවන්පලාදි-යට පැමිණියාහු ය.

**ආක්‍රොශකභාරද්වාජවස්තුව නිමි.**

# සැරියුත් මහතෙරුන්ගේ මෑනියන්දෑ කියූ රළු බස්

## 26 — 17

**ශාරිපුත්‍ර** මහාස්ථවිරයන් වහන්සේ, පන් සියයක් දෙනා වහන්සේන් ගෙණ සිඟා වඩනා සේක් **නාලක** ගම මෑනියන්දෑගේ ගෙට සිඟා වැඩිය සේක. එහි දී මෑනියන්දෑ උන්වහන්සේ ගෙයි වඩා හිඳුවා වළඳවන වේලෙහි උන්වහන්සේට "එම්බල! ඉඳුල් කන්න! ඉඳුල් බතක් පමණකුත් ලබන්නට නො හැකි ව කබලක් ගෙණ අනුන්ගේ ගෙපිළිකණුවල හැසිර හැඳි තලෙන් පොඩි කළ කැඳ බොන්නට අසූ කෙළක් ධනය හැර දමා පැවිදි වූයෙහි, එයින් තෝ මා ද නැසූයෙහි, දැන් වත් බඩ පුරා හොඳට කව"යි ඇණුම් බැණුම් කළහ. උන්වහන්සේ කැටුව ගිය භික්ෂූන් වහන්සේලාට ද කෑම් බීම් දෙමින් "තමුන්නාන්සේලා විසින් මා පුත් දාසයෙක් කරණ ලද්දේ ය, එහෙත් හොඳට කවු, බොවු"යි නිගා කළහ. මහාස්ථවිරයන් වහන්සේ භික්ෂාව ගෙණ කිසිත් නො බැණ විහාරයට වැඩියාහ. එකල්හි රාහුල ස්ථවිරයන් වහන්සේ බුදුරජාණන් වහන්සේට දන් වළඳන්නට ආරාධනා කළහ. උන්වහන්සේ "රාහුල! සිඟා ගියහු කොහි දැ?"යි අසා වදාළ කල්හි "ස්වාමීනි! මුත්තනියන්ගේ ගමටැ"යි කීහ. "රාහුලගේ උපාධ්‍යායයන්හට මුත්තනිය කුමක් කියූ දැ?"යි ඇසූ කල්හි "මුත්තනිය මාගේ උපාධ්‍යායයන් වහන්සේට ඉතා තදින් ඇණුම් බැණුම් කළා ය"යි කීහ. නැවැත බුදුරජාණන් වහන්සේ, "කුමක් කියා ඇණුම් බැණුම් කළා දැ?"යි ඇසූ කල්හි රාහුල ස්ථවිරයන් වහන්සේ, මුත්තනිය ඇණුම් බැණුම් කළ සැටි කියාලූහ. "හොඳ යි, මුත්තනිය එසේ පරොස් බස් කියා ඇණුම් බැණුම් කරද්දී තමුසේගේ උපාධ්‍යායයා ඒ ඇණුම් බැණුම් වලට කුමක් කීයේ දැ?"යි ඇසූ විට "ස්වාමීනි! මාගේ උපාධ්‍යායයන් වහන්සේ එයට වචන මාත්‍රයකුත් නො කියා එහිලා බිහිරකු සේ ගොළුවකු සේ, සිටගත්හ" යි කියා සිටියහ. මේ කතාව අසා සිටි භික්ෂූන් වහන්සේලා "ඇවැත්නි! බලවු, සැරියුත් මහතෙරුන්ගේ ගුණය ඉතා මහත් ය, ඉතා අසිරි ය, උන්වහන්සේ, තම මව පරොස් බසින් බැණ දොඩද්දීත් කිසිත් නො බැණ නිහඬව සිටියහ, ඒ කිසිවකට ද නො කිපුනාහ"යි දම්සබාවට රැස්වී කතා කරන්නට වූහ. ඒ වේලෙහි දම්සබාවට වැඩම කළ බුදුරජාණන් වහන්සේ මේ කතාව අසා "මහණෙනි! රහත්හු කිසිදාක කිසිවකට කිසිවකුට නො බණන්නෝ ය, නො දොඩන්නෝ ය, නො කිපෙන්නෝ ය"යි වදාරා මේ ධර්‍මදෙශනාව කළ සේක.

**අක්කොධනං වතවන්තං සීලවන්තං අනුස්සුතං,**
**දන්තං අන්තිමසාරීරං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණන්ති.**

නො කිපෙන සුලු ව්‍රත ඇති සිල්වත් වූ තෙත් නො වූ දැමුනා වූ පැසුළු සිරුරු දරණ ඔහු, මම බමුණු යි කියමි.

**අක්කොධනං** = නො කිපෙන සුලු. ක්‍රොධ නො කරන්නා වූ.

කිසිත් කරුණක් නිසා කිසිවකු කෙරෙහි කිසිදුකත් නො කිපෙනුයේ **'අක්කොධන'** නම්.

**වතවන්තං** = ව්‍රත ඇති.

පංසුකූලිකඞ්ගාදී වූ තෙලෙස් ධුතාඞ්ගයන් අතුරෙහි තම ශක්ති පමණින් යම් කිසි ධුතාඞ්ගයක් සමාදන් ව නො කඩ කොට පුරණුයේ දරණුයේ **'වතවන්ත'** නම්.[1]

කාමසංඥ – ව්‍යාපාදසංඥ – විහිංසාසංඥ – දෘෂ්ටිසංඥවන්හි ඇලී ගත් සත්ත්‍වයා දැඩි ව ගත් ව්‍රතයෝ ඉතා බොහෝ ය. හස්ති – අශ්ව – ගො – කුක්කුර – කාක – වාසුදෙව – බලදෙව – පූර්ණභද්‍ර – මණිභද්‍ර – අග්නි – නාග – සුපර්ණ – යක්ෂ – අසුර – ගන්ධර්ව – මහාරාජ–චන්ද්‍ර – සූර්ය – ඉන්ද්‍ර – බ්‍රහ්ම – දෙව – දිශාව්‍රතයනාදීහු ය ඔවුහු. නිර්දේශයෙහි මෙසේ ආහ:– **"වතන්ති හත්ථිවතං වා අස්සවතං වා ගොවතං වා කුක්කුරවතං වා කාකවතං වා වාසුදෙවවතං වා බලදෙවවතං වා පුණ්ණභද්දවතං වා මණිභද්දවතං වා අග්ගිවතං වා නාගවතං වා සුපණ්ණවතං වා යක්ඛවතං වා අසුරවතං වා ගන්ධබ්බවතං වා මහාරාජවතං වා චන්දවතං වා සූරියවතං වා ඉන්දවතං වා බ්‍රහ්මවතං වා දෙවවතං වා දිසාවතං වාති"** යනු විසින්.

මෙහි දැක් වූ මේ එක ද ව්‍රතයෙක් භවවිමුක්තිය පිණිස නො වන්නේ ය. ඒ පිණිස වනුවෝ පංසුකූලිකඞ්ගාදී වූ ව්‍රතයෝය ඒ පංසුකූලිකඞ්ගාදිය සමාදන් ව ගත්තේ ම මෙහි 'වතවන්ත'යි දතයුතු ය. පින් උපදවන උපවාසාදික්‍රියා ව්‍රත නමැ යි කී හ. පරවාදීන් විසින් මොවුහු පින් උපදවන ක්‍රියා යි දක්වන ලද නමුත් ඒ එසේ නො වෙත්. පින් උපද වන්නෝ ධුතඞ්ගාදීහු ය.

**සීලවන්තං** = සිවු පිරිසිදු සීලයෙන් සිල්වත් වූ.

පාතිමොක්ඛසංවරසීලය – ඉන්ද්‍රියසංවරසීලය – ආජීවපාරිශුද්ධි සීලය – පච්චයසන්නිස්සිතසීලය යන සිවුපිරිසිදු සීලයෙන් සිල්වත්

1. 7. 6. 'සුබ්බතො' යනු බලනු.

වූයේ **'සීලවන්ත'** නම්. මෙ තෙමේ මේ කියූ සීලයන්ගෙන් නො තොර ව සිටියේ ජීවිත හෙතුයෙනුදු මේ සිල් නො කඩ කරණ්නුයේ ය.[1]

**අනුස්සුතං** = තෙත් නො වූ.

තෘෂ්ණා නැමැති පින්නෙන් තෙත් නො වූයේ **'අනුස්සුත'** නම්. චක්ෂුරාදී වූ සදෙර උපදනා කාම තණ්හාදීන්ගේ වශයෙන් එක් සිය අටක් ප්‍රභෙදයෙන් ප්‍රභෙදවත් වූ තෘෂ්ණායෙන් නො තෙත් වූයේ ය.[2]

**දන්තං** = දැමුනු.

චක්ෂුරාදිෂඩින්ද්‍රිය දමනයෙන් දැමුනේ, පිරිසිදු කායසමාචාරාදිය ඇතියේ අත්පා කුකුස් නැතියේ **'දන්ත'** නම්.

**අන්තිමසාරීරං** = පැසුළු සිරුරු ඇති.

ඉදිරියෙහි උපතක් නැතියේ **'අන්තිමසාරීර'** නම්. උපතට හෙතු වන සියලු කෙලෙස් සිවු මග නුවණින් නසා සිටි බැවින් කෙලශරහිතසකන්ධ ඇතියේ ය.

**තං අහං බ්‍රෑමි බ්‍රාහ්මණං** = මම ඔහු බමුණු යි කියමි.

නො කිපෙනසුලු සමාදන් ව ගත් ධූතාඞ්ග ඇති සිවු පිරිසිදු සීලයෙන් සිල්වත් වූ තෘෂ්ණා රහිත වූ දැමුනු ඉඳුරන් ඇති පැසුළු සිරුරු ඇති රහතුන් වහන්සේ බ්‍රාහ්මණ වන සේක'යි මෙයින් වදාළ සේක.

ධර්මදෙශනාවගේ අවසානයෙහි බොහෝ දෙන සෝවන් පලාදියට පැමිණියාහු ය.

**ශාරීපුත්‍ර වස්තුව නිමි.**

1. 4, 10. 'සීලවතං' යනු බලනු
2. 14, 6. 'දුක්ඛසමුප්පාදං' ,, ,,

# මිනිසුන් රහතුන් වහන්සේ ගැණ කළ කතාවක්

## 26 — 18

**"මධුවා මඤ්ඤති බාලො"** යන ගාථා වර්ණනායෙහි මෙහි විස්තර කථාව ආවා ය. කලකට පසු මහාජන තෙමේ "රහතුන් වහන්සේලාත් කාමසෙවනය කරත් ද, කාම සෙවනය නො කරත් ද, උන්වහන්සේලා වියලී ගිය වෘක්ෂයෝ නො වෙත්, තුඹස් ද නො වෙත්, තෙත් වූ සිතින් යුත් සිරුරු ඇතියහ, එහෙයින් උන්වහන්සේලාත් කම් සැප විඳින්නාහ''යි ධර්මශාලායෙහි රැස් ව කතා කරන්නට වි ය. බුදුරජාණන් වහන්සේ ධර්මශාලාවට වැඩම කළ වේලෙහි මේ කතාව අසා "මහණෙනි! රහත්හු කම් සැප නො විඳින්නෝ ය, කාමවස්තූන් සෙවනය නො කරන්නෝ ය, පියුම්පතෙහි වැටුනු දියබිඳු එහි නො ඇලේ ද, නො රැඳේ ද, පෙරළී ගොස් බිම වැටේ ද, ඉදිකටු අග තුබූ අබැට එහි නො සිටී ද, එසේ රහත්හුගේ සිත්හි දෙ වැදෑරුම් වූ කාමය මොන ලෙසකිනුත් නො ඇලෙන්නේ ය, නො පිහිටන්නේ ය''යි අනුසන්ධි ගළපා ධර්මදෙශනා කරණ සේක් මේ ධර්මදෙශනාව කළ සේක.

**වාරි පොක්ඛරපත්තෙව ආරග්ගෙරිව සාසපො,**
**යො න ලිම්පති කාමෙසු තමහං බ්‍රෑමි බ්‍රාහ්මණන්ති.**

පියුම් පතෙහි දිය මෙන් ද ඉදිකටු අග අබැටක් මෙන්ද යමෙක් කාමයන්හි නො ඇලේ ද ඔහු, මම බමුණු යි කියමි.

**වාරි පොක්ඛරපත්තෙ ඉව ආරග්ගෙ ඉව සාසපො** = පියුම් පතැ දිය මෙන් ඉදිකටු අග අබැටක් මෙන්.

**යො න ලිම්පති කාමෙසු** = යමෙක් කාමවස්තූන්හි නො ඇලේ ද.

**තං අහං බ්‍රෑමි බ්‍රාහ්මණං** = ඔහු මම බමුණු යි කියමි.

**'වාරි'** නම්: ජලය යි, ජලය 'වාරි' යි කියනු ලබනුයේ පවස වළකා ලන බැවිනුත් වළතැන්, ගොඩතැන් නො සලකා එකසේ හැම තැන ගලා යන බැවිනුත් ය. **"වාරයති නින්නොන්නතමිති = වාරි, වාරයති පිපාසමිති වා"** යනු නිරුක්ති.

**'පොක්ඛරපත්ත'** නම්: මෙහි නෙළුම් කොළ ය යි. 'පොක්ඛර' ශබ්දය, නෙළුම් ගස, නෙළුම් මල, නෙළුම් කොළ ය, නෙළුම් කැකුළ, වීණාද්‍රොණිමුඛ ය, වාද්‍යභාණ්ඩමුඛ ය, ශරීර ය යනාදී අරුත් ද දෙන්නේ ය. ජලයෙන් වැඩෙන බැවින් ජලයෙහි හට ගන්නා බැවින් නෙළුම් ගස 'පොක්ඛර' යි කියනු ලැබේ. 'පොක්ඛර' යනු හා එක් වූ 'පත්ත' ශබ්දයෙන් නෙළුම් කොළය කිය වේ.

**'ආරග්ග'** නම්: ඉදිකටු අග යි. **'ආර'** යනු ආකර, ආකාර, ශස්ත්‍ර, කෙත, නියර, ඇල, වෙග, ජන්ම යනාදී අරුත්හි ද එන්නේ ය. මෙහි ලෝහයෙන් කළ ඉදිකටු ව කියනු ලැබේ. ඒ හා එක් වූ 'අග්ග' ශබ්දය, ආදි, භාග, කොටි, අභිමුඛ, උත්තම යනාදී අරුත්හි ද වැටේ. මෙහි නැගී සිටියේ කොටි යන අරුත්හි ය. කොටි නම්: මෙහි කෙළවර ය. **'සාසප'** නම්: අබ ය. වා සෙම් ආදී දෝෂයන් නසා ශරීරයෙහි ක්‍රියාත්මක වන බැවින් සාසප නම් වී ය.

**යො න ලිප්පති කාමෙසු** = යමෙක් කාම වස්තූන්හි නො ඇලේ නම්.

**තං අහං බ්‍රූමි බ්‍රාහ්මණං** = ඔහු මම බමුණු යි කියමි.

යමෙක් පියුම් පතෙහි දිය මෙන් ඉදිකටු අග අබැටක් මෙන් වස්තුකාමක්ලේශකාමයන්හි නො ඇලේ ද හේ බ්‍රාහ්මණ නම් වන්නේ ය.

ධර්මදේශනාවගේ අවසානයෙහි බොහෝ දෙන සෝවාන් ඵලාදියට පැමිණියාහු ය.

උප්පලවණ්ණ ස්ථවිරා වස්තුව නිමි.

## පැවිදි වූ දාසයෙක්

### 26 — 19

**එක්තරා** බමුණකු වෙත සිටි දාසයෙක් ශික්‍ෂාපද පණවන්නට පෙරාතු ව පලා ගොස් පැවිදි ව රහත් බවට පැමිණියේ ය. බමුණු ඔහු නො දැක සිට දවසෙක බුදුරජුන් හා පිඬු සිඟා යන්නහු දැක දෙපා අතර දී සිවුරෙන් අල්ලා ගත්තේ ය. එවිට බුදුරජාණන් වහන්සේ ගමන් නවතා "බමුණ! ඇයි, මේ කුමක් කරන්නහු? ඇයි, මේ නම ඩැහැ ගත්තහු?" යි අසා වදාළ කල්හි "පින්වත් ගෞතම- යන් වහන්ස! මූ මාගේ දාස යා" යි කියේ ය. "බමුණ! මෙතෙමේ බහා තුබූ බර ඇතියේ" යි වදාළ විට බමුණා ඔහු රහත් යි දැන ගත්තේ ය. එවිට බමුණු "භවත් ගෞතමයන් වහන්ස! එසේ ද?" යි ඇසී ය. "ඔව් මෙතෙමේ බර බහා තබා සිටී ය" යි වදාරා මේ ධම්දෙශනාව කළ සේක.

**යො දුක්ඛස්ස පජානාති ඉධෙව ඛයමත්තනො,**
**පන්නභාරං විසංයුත්තං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං.**

යමෙක් මේ අත්බැව්හි ම තමාගේ දුක පිළිබඳ විනාශය දනී ද, බහා තැබූ බර ඇති මිදුනා වූ ඔහු, මම බමුණු යි කියමි.

**යො දුක්ඛස්ස පජානාති ඉධ එව ඛයං අත්තනො** = යමෙක් මේ ආත්මභාවයෙහි දී ම තමාගේ දුක පිළිබඳ විනාශය දනී ද.

**පන්නභාරං විසංයුත්තං තං අහං බ්‍රෑමි බ්‍රාහ්මණං** = මම බහා තැබූ බර ඇති මිදුනා වූ ඔහු, බමුණු යි කියමි.

**දුක්ඛස්ස** = පංචස්කන්ධදුඃඛයාගේ, යනු අරුත්. රූප – වේදනා – සංඥා – සංස්කාර – විඥාන යන පස පංචස්කන්ධය යි. මුළුමනින් එය දුඃඛපිණ්ඩයෙකි. යථාර්‍ෂ විසින් දුඃඛපිණ්ඩය වූ පඤ්චස්කන්ධය දිව්‍ය බ්‍රහ්ම මනුෂ්‍ය නරක තිර්‍ය්‍යක් ප්‍රෙත අසුරාදීන්ගේ වශයෙන් මුළු ලොකය මුළා කරන්නේ ය. යමෙක් මේ අත්බවේ දී ම ඒ පංච- ස්කන්ධයාගේ විනාශය, මේ අත්බව හැර ඉදිරියෙහි ලබන අත් අත් බවෙක් මට නැතැ යි හොඳ හැටි දනී ද, බහා තැබූ ස්කන්ධභාරය ඇති ඉදිරියෙහි ගෙණ යන ස්කන්ධභාරයක් නැති හැම කෙලෙසුන්- ගෙන් මිදී සිටි ඔහු බ්‍රාහ්මණ නම් වන්නේ ය.

ධම්දෙශනාවගේ අවසානයෙහි ඒ බ්‍රාහ්මණ තෙමේ සෝවාන් පලයෙහි පිහිටියේ ය.

**අන්‍යතර බ්‍රාහ්මණ වස්තුව නිමි.**

# ඛෙමා ස්ථවිරාවෝ

## 26 — 20

දඹසෙනා සක්දෙව් රජ තෙමේ රූ පළමු යම ගෙවී යත් ම දෙව් පිරිස ද ගෙණ බුදුරජුන් වෙත පැමිණ සිහිකට යුතු සිත්හි එළවිය යුතු ධර්මකථාවක් අසමින් හුන්නේ ය. එවේලෙහි ඛෙමා ස්ථවිරා තොමෝ බුදුරජුන් දක්නට අහසින් ආවා සක්දෙවිඳුන් හුන්බව දැක බුදුරජුන් වැඳ ආපසු යන්නට හැරී ගතු. සක්දෙවිදු ඒ ස්ථවිරාවන් දැක "ස්වාමීනි! මෙහි එන්නට අවුත් අහස සිට ම බුදුරජුන් වැඳ ආපසු හැරී යන අරුන් දැ කවුරු ද?" යි විචාළේ ය. "මහරජ! ඛෙමා, මාගේ දූ, පියුමතුරා බුදුරජුන් දවස හංසවතී නුවර උපන්නී ඒ බුදුරජුන්ගේ අගසවු වූ සුජාත තෙරුන් පිඬු සිඟා යන්නාහු දැක අග්ගලා තුනක් පුදා එ දවස ම තම කෙස්වැටියත් කපා විකොට එයින් ලත් මුදලින් ඒ තෙරුන්ට දන් දී අනාගතයෙහි බුද්ධොත්පාදයෙක ඔබවහන්සේ මෙන් මමත් මහානුවණැතියා වෙම්වා යි පැතූ ය, එතැන් සිට නොයෙක් පින්කම් කරමින් කල්පලක්ෂයක් දෙව් මිනිස් දෙගතියෙහි සැරිසරන්නී කසුප් බුදුරජුන් දවස කිකී නම් කාසි රජුන්ගේ ගෙයි පිළිසිඳ ගත්තී ය, එහි දී ඇයට සහෝදරියෝ සත් දෙනෙක් වූහ. මෝ අවුරුදු විසිදහසක් කුමරබඹසර රක්නී සහොදරියන් හා එක් ව පිරිවෙණක් ගොඩ නංවා බුදුරජුන්ට පිදූ ය, එ තැන් සිට එක් බුද්ධාන්තරයක් ගෙවා මෙ දවස සාගල නුවර රජකුලයෙහි ඉපද නමින් ඛෙමා නම් වූ ය. වැඩි විය පැමිණියා බිම්සර රජුට අගමෙහෙසි වූවා ය, රූසපුවෙන් අගතැන් පත් වූ මෝ 'බුදුරජ' රූසපුවෙහි දොස් කියන්නේ ය'යි අසා කලක් මා දක්නට නො පැමිණියා ද රාජපුරුෂයන් විසින් මා වෙත පමුණුවන ලද්දී ය, එහි දී මම ඇයට දහම් දෙසීමි, දම් දෙසුම් කෙළවර මෝ සිව්පසින් සිව්යා පිළිසැඹියාවන් සමග රහත්බවට පැමිණියා ය, නැවැත රජුගෙන් අවසර ගෙණ පැවිදි වූවා පසු කාලයෙහි මා වෙතින් නුවණැති මෙහෙණන් අතර අගතැන ද ලැබූ ය, මහනුවණැතියා මග නොමග දැනීමෙහි සමත්" යි වදාරා මේ ධර්මදේශනාව කළ සේක.

**ගම්භීරපඤ්ඤං මේධාවිං මග්ගාමග්ගස්ස කෝවිදං,**
**උත්තමත්ථං අනුප්පත්තං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණන්ති.**

ගැඹුරු වූ නුවණැති විදසුන් නුවණැති මගනොමග දැනීමෙහි දක්ෂ වූ අර්හත්වයට පැමිණියා වූ ඔහු, මම බමුණු යි කියමි.

**ගම්භීරපඤ්ඤං** = ගැඹුරු වූ නුවණැති.

**'ගම්භීරපඤ්ඤ'** නම්: ගැඹුරු වූ නුවණැතියේ ය. රූප - වේදනා - සංඥා - සංස්කාර - විඥාන යන ස්කන්ධපඤ්චකය බෙදිය හැකි කොටස්වලට වෙන් කොට එකකුත් නො හැර බෙද, බැලීම පහසු වැඩෙක් නොවේ. ඔවුන්ගේ අනිත්‍ය - දුඃඛ - අනාත්මලක්ෂණ සිතට නගා ගැණීම ද එසේ ම අපහසු ය. අවබොධයට දැන ගැණීමට ඉතා අපහසු වූ ගැඹුරු වූ ස්කන්ධයන්ගේ පතුලට ම කැවී ගිය නුවණ **'ගම්භීරපඤ්ඤා'** නම්. ඒ ඇතියේ ගම්භීරපඤ්ඤ.[1]

**මෙධාවිං** = විදසුන් නුවණැති.

විදසුන් නුවණ මෙහි 'මෙධා' නම්. ඒ ඇතියේ **මෙධාවී.**

**මග්ගාමග්ගස්ස කොවිදං** = මග නො මග දැනීමෙහි දක්ෂ වූ.

"මේ දුගතිමග ය, මේ සුගතිමගය, මේ නිවණට මග ය, මේ නිවනට නො මග ය යනාදී විසින් මග නො මග දැනීමෙහි දක්ෂ වූයේ ය **මග්ගාමග්ගස්ස කොවිද.**

**උත්තමං අත්ථං අනුප්පත්තං** = අර්හත්වයට පිළිවෙළින් පැමිණි.[2]

**තං අහං බ්‍රෑමි බ්‍රාහ්මණං** = ඔහු මම බමුණු යි කියමි.

ස්කන්ධයන් කෙරෙහි බැස ගත් නුවණැති පඤ්චස්කන්ධය අනිත්‍යාදී විසින් දක්නා නුවණැති මග නො මග දැනීමෙහි දක්ෂ වූ අර්හත්වයට පැමිණි ඔහු බ්‍රාහ්මණ නම් වන්නේ ය.

ධර්මදෙශනාවගේ අවසානයෙහි බොහෝ දෙන සෝවාන් ඵලාදියට පැමිණියාහු ය.

**ඛේමා භික්ෂුණී වස්තුව නිමි.**

---

1. 20. 2. 'සබ්බෙ සංඛාරා' යනු බලනු.
2. 26. 4. 'උත්තමත්ථං' ,, ,,

# තිෂ්‍ය ස්ථවිරයන් වහන්සේ

## 26 — 21

තිෂ්‍ය ස්ථවිරයන් වහන්සේ බුදුරජුන් වෙතින් කමටහන් උගෙණ වන වැද සැප සෙනසුනක් සොයා ඇවිදින්නාහු ඉදිරියට නෙරා ගිය ගල්තල්ලක් දැක එහි නැවතී ගත්හ. එහි නවාතැන් ගත් ඇසිල්ලෙහි උන්වහන්සේගේ සිත එකග වී ය. "මෙහි දී මම මහණකම මුදුන් පමුණුවා ගණිමි"යි ද සිතූහ. ගල්තල්ලෙහි අරක් ගෙණ හුන් දෙවතා දුව "ආයේ සිල්වත් භික්ෂු නමෙක, මොහු හා එක් තැන විසීම මට දුකෙක, කම් නැත, මොහු මෙහි එක් රැයක් ම හිඳ යනු ඇතැ"යි සිතා දරුවන් හැර ගෙණ ගල් තල්ලෙන් බැහැරට ගියා ය. තෙරුන්නාන්සේ පසු දා උදෑසන ම ගොදුරු ගමට පිඬු සිඟා වැඩියහ. එහි දී උන්වහන්සේ දුටු උපාසිකාවක් දරුසෙන් උපදවා ගෙයි වඩා හිඳුවා වළඳවා "තමන් නිසා මෙහි තෙමසක් වැඩ වසනු මැනැවැ" යි ආරාධනා කළා ය. තිෂ්‍ය ස්ථවිරයන් වහන්සේ "මේ උපාසිකාව නිසා මට භවයෙන් මිදී ගන්නට හැකි ය" යි ආරාධනාව පිළිගෙණ පෙරළා එම ගල්තල්ලට ම ගියහ. දෙවතා දූ ආපසු එන තෙරුන් දැක "එකාන්තයෙන් කවුරුන් විසින් හෝ මෙතෙමේ මෙහි නවතින්නට ආරාධනා කරණ ලදුයේ වන්නේ ය, හෙට හෝ අනිද්දා හෝ යනු ඇතැ"යි සිතූ ය. මෙසේ තෙරුන්ගේ එහි නැවැත්මෙන් අඩමසක් ගෙවී ගිය කල්හි "මොහු මේ ඇතුළු වසත් මෙහි ම වසන හැඩ පෙණේ, සිල්වතකු සමග දරුවන් ද ගෙණ එක් තැන විසීම ඉතා අපහසු ය, මොහුට බැහැර යන්නට ද කියන්නට නො හැකි ය" යි සිතූ දෙව් දූ නැවැත සීලයෙහි වත් දොසෙක් තිබේ දැ'යි දිවැසින් බැලූ ය. සීලයෙහි ද දොසක් නො දැක "මොහුගේ සීලය පිරිසිදු ය, සීලයෙහි දොසෙක් නැත, මොහුට වෙනලෙසකින් අයසක් ඉපදවිය යුතු ය" යි සිතා දෙව් දූ උපාසිකාවගේ වැඩිමාල් පුතුගේ සිරුරෙහි ආවිෂ්ටව කර අඹරා ලූ ය. එකෙණෙහි ඒ දරුගේ ඇස් ඉදිරියට නෙරා ආයේ මතු වී සිටියේ ය. කටින් ලේ ගලන්නට වන. උපාසිකා තොමෝ "අනේ, මේ වූයේ කිමැ" යි මොර දෙන්නට වූ ය. ඉක්බිති දෙව්දූ නො පෙණී සිට "මූ ගන්නා ලද්දේ මා විසිනි, බලිතොවිල්වලින් වැඩෙක් නැත, බිලියම් ද වුවමනා නැත, තොපගේ කුලූපග තෙරුන් ලවා වැල්මී කැබැල්ලක් ගන්වා ගෙණ ඒ ලා තෙලක් පිස ඒ තෙලින් මූට නස්‍යයක් කරව, එසේ කළ කල්හි මූ හැර යමි" යි කිවූ ය. උපාසිකාවන් "මූ මැරුණත් හාමුදුරුවන් ලවා වැල් මී නො ගන්වමි" යි කී කල්හි, "වැල් මී ගන්වාලන්නට නො හැකි නම් මොහුගේ නැහැයෙහි පෙරුම්කායම්

කුඩු ටිකක් බහන්නට තෙරුන්ට කියව”යි කීවා ය. “එ ද තෙරුන් ලවා නො කරවමි”යි උපාසිකාවන් කී කල්හි “එසේ නම් තෙරුන්ගේ පාදෙවූ දියත්තක් ගෙණ තෙරුන් ලවා ම මූගේ හිසෙහි ඉස පියවාලව”යි කීවා ය. “එය නම් කළ හැකි ය”යි තෙරුන් ගෙට වැඩිය වේලෙහි වඩා හිඳුවා කැඳ අවුළුපත් පිළිගන්වා වළඳමින් හුන් උන්වහන්සේගේ පා සෝදා දිය ගෙණ “ස්වාමීනි! මේ දිය මා දරුගේ හිසැ ඉසිම් දැ”යි අසා “ඉසින්නැ”යි කී කල්හි දිය ගෙණ දරුගේ හිසෙහි ඉස්සා ය.

දෙව් දූ එකෙණෙහි ම එ දරු මුදාහැර ගොස් ගුහාදොර සිට ගත. තෙරුන්නාන්සේ ද දන් වළඳා අවසන් කොට හුනස්නෙන් නැගිට නො හළ කමටහන් ඇත්තාහු කාගියාසී මෙනෙහි කරමින් ම එතැනින් නික්ම ආහ. උන්වහන්සේ ගුහාදොරට එත් ම දෙව් දූ “වෙදා! මෙහි නො එව”යි කිවූ ය. “තෝ කවරහි”යි තෙරුන් ඇසූ කල්හි “මම මෙහි අරක් ගෙණ සිටුනා දෙව් දූ වෙමි”යි ඕ පිළිතුරු දුන්නී ය. ඉක්බිති තෙරුන්නාන්සේ “මා වෙදකම් කළ තැනෙක් ඇත් දැ”යි උපසපත් වූ දා සිට තමන් ගැණ සිතන්නාහු තමන්ගේ සීලයෙහි කිසිත් කැලලක් නො දැක “මට මා වෙදකමක් කළ තැනෙක් නො පෙණේ, කුමක් නිසා මැ මෙසේ කියා දැ”යි සිතා ඇයගෙන් එය ඇසූහ. දෙව් දූ “නො දකිහි වෙදකම් කළ තැනක්”යි ඇසූ විට “නො දකිමි”යි උන්වහන්සේ කීහ. “මම තට කියමි”යි දෙව් දූ කී කල්හි “කියව”යි කීහ. “පෙර කළ කටයුතු තිබේවා, අද අමනුෂ්‍යයකු විසින් යටපත් කොට ගත් උපස්ථායිකා පුත්‍රයාගේ හිසෙහි ඔබවහන්සේගේ පා දෙවූ දිය නො ඉස්වා වූහු දැ?”යි ඇසූ විට “ඉස්වාලීමි” යි උන් වහන්සේ කීහ. නැවැත දෙව් දූ “කිම් මෙය නො දන්නෙහි දැ?”යි කී කල්හි “මේ ගැණ ද තෝ කියහි?”යි ඇසූහ. “ඔව්, මම කියන්නෙමි මේ ගැණ ය”යි කීවිට “පුදුම ය, මාගේ සිත මැනවින් පිහිටා තිබේ, මාගේ චරිතය ද සසුනට සුදුසුසේ වැඩී සිටියේ ය, දෙව්දුව මාගේ සිලයෙහි කැලලක් නො දැක දරුගේ හිසෙහි ඉස්මාපූ දියත්ත ම දක්නා ලදැ”යි තමන්ගේ සීලය නිසා උන්වහන්සේට බලවත් ප්‍රීතියෙක් උපන. ස්ථවිරයන් වහන්සේ එම ප්‍රීතිය යටපත් කොට පියවරකුත් නො නගා සිටි පියෙහි ම සිට රහත්බවට පැමිණ “මා වැනි පිරිසිදු මහණකු කෙලෙසා තිට මේ තැන වසන්නට නො හැකි ය, එහෙයින් වහා මෙ තැනින් නික්ම යව”යි දන් වන්නට,

“පිරිසිදු මා විසුම් – නිමල් තපසැති මා තෝ,
නො කෙලෙසා දූන් මෙවනින් – නික්ම යව අන් තැනකට”

යි උදන් ඇනූහ.

තිෂ්‍ය ස්ථවිරයන් වහන්සේ තෙමසක් එහි ම වැස පැවැරූ වස් ඇති ව බුදුරජුන් වෙත ගියහ. ඒ වේලෙහි භික්ෂූන් විසින් "ඇවැත්නි! ඔබගේ පැවිදි කිස මුදුන් පැමිණියේ දැ"යි ඇසූ විට ඒ ගුහාවෙහි වස් විසූ තැන් පටන් සිදු වූ සියලු තොරතුරු දන්වා ලූහ. භික්ෂූන් වහන්සේලා නැවැත "ඇවැත්නි! දෙව් දූ මෙසේ කියත්, ඇයට නො කිපියහු දැ"යි ඇසූ කල්හි "නො කිපියෙමි"යි කීහ. එවිට භික්ෂූන් වහන්සේලා බුදුරජුන් වෙත ගියහ. ගොස් වැඳ "ස්වාමීනි! තිෂ්‍ය ස්ථවිර තෙමේ තමන් රහත් යි කියා ගන්නේ ය, දෙව් දූ ගැහැට කරද්දීත් ඇයට නො කිපියෙමි යි කියන්නේ ය" යි සැල කොට සිටියහ. "මහණෙනි! ඒ මාගේ පුත් කාහටත් නො කිපෙන්නේ ය, ගිහින් සමග පැවිද්දන් සමග ඒ තමාගේ එක්වීමෙක් නැත, මෙ තෙමේ කිසිවකු කෙරෙහි ඇලුමක් බැඳුමක් ඇත්තේ නො වේ, මෙ තෙමේ ආශා නැතියේ ය, ලද දෑයින් සතුටු වන්නේ ය"යි වදාරා මේ ධර්මදෙශනාව කළ සේක.

**අසංසට්ඨං ගහට්ඨෙහි අනාගාරෙහි චූභයං,**
**අනොකසාරිං අප්පිච්ඡං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණන්ති**

ගිහියන් සමග ද පැවිද්දන් සමග ද යන දෙපස වූවන් හා සංසර්ග නැති, ගෙයි නො හැසිරෙණ ආශා නැති ඔහු, මම බමුණු යි කියමි.

**අසංසට්ඨං ගහට්ඨෙහි අනාගාරෙහි ච උභයං** = ගිහියන් සමගත් පැවිද්දන් සමගත් යන දෙපස වූවන් සමග සංසර්ග නැති.

දස්සනසංසග්ග-සවණසංසග්ග – සමුල්ලාපසංසග්ග – සම්භොග-සංසග්ග – කායසංසග්ග යන සංසර්ග නැතියේ '**අසංසට්ඨ**' නම්. මෙ තෙමේ මේ කිසි එකෙකින් ගිහිපැවිද්දන් හා එක්වීමක් නැත්තේ ය. ඇලීමක් නැත්තේ ය. බැඳීමක් නැත්තේ ය.

එහි දුටුවන් පහදවන මනා රූ ඇති ගැණියක හෝ පිරිමියකු දැකීමෙන් එවුන්ගේ රූපයෙහි කාමාස්වාද විසින් උපදනා රාගය '**දස්සනසංසග්ග**' නම්. ගැණියක ගැණ හෝ පිරිමියකු ගැණ යමකු විසින් කියනු ලබන්නක් අසා, නැත, එවුන් විසින් ම කියනු ලබන ගීහඬක් හෝ කටහඬක් හෝ සිනාහඬක් ඇසීමෙන් එ හඬ කාමාස්වාද වශයෙන් ගැණීමෙන් උපදනා රාගය '**සවණසංසග්ග**' නම්. මෙ කියූවන් මුණ ගැසී මෙවුන් හා කරණ අල්ලාපසල්ලාපයෙහි උපදනා රාගය '**සමුල්ලාපසංසග්ග**' නම්. ගැණියක සතු පිරිමියකු සතු ඇඳුම් කැඩුම් සිවුරු පිරිකර ඈ යමක් කාමාස්වාද වශයෙන් හැඳ පැළඳ ගැණීමෙන් උපදනා රාගය '**සම්භොගසංසග්ග**' නම්. ගැණුන්ගේ හෝ පිරිමින්ගේ අත් පා ඇල්ලීමෙන්

හෝ ඇඟපත පැහැසීමෙන් උපදනා රාගය **'කායසංසඟ'** නම්. යමක්හුගේ සිත්හි මේ එකෙකුත් නූපදනේ නම් හේ 'අසංසට්ඨ'යි කියනු ලැබේ.

**'ගහට්ඨ'** නම්: ගෙයි සිටියේ ය. ගෙයින් නො නික්මුනේ ය. සීසෑම්, ගෙරි රැකීම්, වෙළහෙළඳම් ඇතියේ ය. **'ගහ'** යි පස්කම් සැපයට නමෙකි. ඒ විසින් පස්කම් සැපයෙහි බැඳුනේ ය.[1]

**'අනාගාර'** නම්: දුරුකළ ගේ ඇතියේ ය. සීසෑම්, ගෙරි රැකීම්, වෙළහෙළඳම් ඈ ගිහියන් අයත් දිවිරැකුම් මං නැතියේ ය. **'උභයං'** යනු **'උභයෙහි'**යි ගතයුතු ය. මේ එහි යුකති. **"තතියත්ථෙ-පඨමා"** යනු විභක්තිවචනවිපයසීාස ය යි.

**අනොකසාරිං අප්පිච්ඡං තං අහං බ්‍රෑමි බ්‍රාහ්මණං** = ගෙයි නො හැසිරෙණ ආශා නැති ඔහු, මම බමුණු යි කියමි.

**'අනොකසාරී'** නම්: ඔක නම් වූ රූපායතනාදී වූ සවැදෑරුම් වූ ආයතනයන්හි තෘෂ්ණා වශයෙන් හැසිරීම් නැත්තේ ය. මේ තෙමේ පිරිසිදු සිල් ඇතියේ චතුර්විධ ගනොතාෂයෙහි පිහිටා ගත්තේ සප්‍රත්‍යයනාමරූපධර්මයන් පිරිසිඳ දැන අනිත්‍යාදී වශයෙන් සංස්කාරයන් සම්මර්ශනය කරණ්නුයේ විදර්ශනා වඩා ඉන් පසු පිළිවෙළින් චතුර්විධමාර්ගඥනයෙන් සංයොජනයන් ප්‍රහීණ කෙළේ ය. එබැවින් **අනොකසාරී** නම් වේ. 'ඔක' යනු ගෙට නමෙකි. මෙහි 'ඔක' යන්නෙන් ෂඩායතන කියන ලද්දේ ය.

**'අප්පිච්ඡ'** නම්: තෘෂ්ණා නැතියේ ය.

ගිහි පැවිද්දන් හා කාමාසවාද විසින් කිසින් එකතුවීමක් නැති සවැදෑරුම් ආයතනයන්හි තෘෂ්ණා වශයෙන් හැසිරීමක් නැති තෘෂ්ණා රහිත වූ ඔහු බ්‍රාහ්මණ නම් වන්නේ ය.

ධර්මදෙශනාවගේ අවසානයෙහි බොහෝදෙන සෝවන් පලාදියට පැමිණියාහු ය.

**තිෂ්‍ය ස්ථවිර වස්තුව නිමි.**

1. 11, 5. 'ගහකාරකං' යනු බලනු.

# රහත් නමකට නැළු පව්ටු මිනිසෙක්

## 26 — 22

**එක්තරා** මහණ කෙනෙක් බුදුරජුන් වෙතින් උගත් කමටහන් ඇතියෝ වන වැද එහි වඩා උත්සාහ කොට වැසි දවස් නො යවා රහත් වූහ. ඉත් පසු තමන් ලත් ඒ රහත් ගුණය බුදුරජුන්ට සැලකරන්නට වනයෙන් නික්ම මග බැස ආහ. ඒ අතර එක් ගමක වැසි ගැහැණියක් තම හිමියා සමග කලහ කොට හිමියා ගෙයි නැති වේලෙහි මවුපියන් වෙත යන්නට මග බැස එන්නී ඒ තෙරුන් දැක "මුන්වහන්සේ කැටුව යෙමි" යි තෙරුන් පසු පස ගියා ය. එහෙත් සඵ්විරයන් වහන්සේ ඇය නො දුටහ. ඇයගේ හිමි ගෙට ආයේ බිරිය නො දැක මවු පියන් වෙත ගියා වනැ"යි සිතා තෙමේ ඇය සොයා ගියේ ය. අතර මග දී ඇය දැක "මැට එකලා ව මේ මහවන මැද යන්නට නො හැකි ය, මැ කවරක්හු නිසා යන්නී දැ"යි වටපිට බැලී ය. වටපිට බලත්, එ මග වඩිනා තෙරුන් දැක "මැ ගෙණ නික්මුනේ මෙ තෙමේ ය"යි සිතා තෙරුන්ට තරවටු කෙළේ ය. එවිට ඒ ස්ත්‍රිය "මේ පින්වතුන් වහන්සේ මා නො දුටහ, මා උන්වහන්සේ පසු පස එන බව උන්වහන්සේ නො දත්හ, මා හා කිසිවක් කතා නො කළහ, එහෙයින් උන්වහන්සේට ඇණුම් බැණුම් නො කළ යුතු ය"යි කීවූ ය. "කිමෙක් ද, තී තමන් ඩැහැගෙණ යන්නහු ගැණ කියා ද, තීගේ ඔය බොරු බස් මම නො පිළිගණිමි, තිට කළ යුත්ත මූට කරමි"යි ඒ මෝඩ මිනිසා බිරිය කෙරෙහි උපන් ක්‍රොධයෙන් ගැසි ගැසී මුගුරක් ගෙණ එයින් තෙරුන්ට තළා බිරිය ගෙණ පෙරළා ගියේ ය. තෙරුන්ගේ සිරුර හැම තැන ලේ කැටි වී ඉල්පී සිටියේ ය. උන්වහන්සේ විහාරයට ගියහ. භික්ෂූන් වහන්සේලා උන්වහන්සේගේ සිරුර පිරිමදින්නාහු සිරුරෙහි ඉල්පී සිටි තැන් දැක "සිරුර තැන තැන ඉල්පී ගොස් ඇත, ගඩු හටගත්තා සේ පෙණේ, මෙසේ වූයේ කුමක් නිසා දැ?"යි ඇසූහ. උන්වහන්සේ තමන්ට මගදී වූ ඒ ගැහැට ඔවුනට කීහ. එවිට භික්ෂූන් වහන්සේලා "ඇවැත්නි! ඒ පව්ටු මිනිසා මෙසේ පහර දෙන විට ඔබ වහන්සේ ඔහුට කුමක් කීවහු දැ; කිම, ඔහු කෙරෙහි ක්‍රොධයෙක් නො උපන්නේ දැ?" යි ඇසූහ. උන්වහන්සේ "ඇවැත්නි! ඒ පව්කාරයා කෙරෙහි මට බින්දුමාත්‍ර වූත් ක්‍රොධයෙක් නො ද උපනැ"යි කීවිට භික්ෂූහු ඒ වේලෙහි ම බුදුරජුන් වෙත ගොස් එ පුවත සැලකොට "ස්වාමීනි! මේ මහණ, තමන්ගේ ඇඟ පත තිල්වන් ව ඇඟපත පැළී යන තුරු ම පහර දුන්නහු කෙරෙහි මා සිත් තුළ ක්‍රොධයෙක් නො උපනැ යි බොරු කියා රහත් වූ

සැටියක් පෙන්වන්නේ ය”යි සැල කළහ. බුදුරජාණන් වහන්සේ ඒ භික්ෂූන්ගේ කතාව අසා “මහණෙනි! රහත්හු නම් බහා තැබූ දඬු මුගුරු ඇතියෝ ය, බොරු නො කියන්නෝ ය, ඔවුහු තමන් තළා පෙළා ගැහැට කරන්නවුන් කෙරෙහි කිසිදු ක්‍රොධ නො කරන්නෝ ය”යි වදාරා මේ ධර්මදේශනාව කළ සේක.

**නිධාය දණ්ඩං තසු භූතෙසෙසු ථාවරෙසු ච,**
**යො න හන්ති න ඝාතෙති තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං.**

බිය සහිත වූ ද බිය රහිත වූ ද සත්වයන් කෙරෙහි කායදණ්ඩය බහා තබා යමෙක් කිසිවකු නො නසා ද, නො නස්වා ද ඔහු, මම බමුණුයි කියමි.

**නිධාය දණ්ඩං භූතෙසු තසෙසු ථාවරෙසු ච** = බිය සහිත වූ ද බිය රහිත වූ ද සත්වයන් කෙරෙහි දඬු මුගුරු බහා තබා.

**යො න හන්ති න ඝාතෙති** තං අහං **බ්‍රෑමි බ්‍රාහ්මණං** = යමෙක් තෙමේ කිසිවකු නො නසා ද (මෙරමා ලවා) නො නස්වා ද ඔහු, මම බමුණු යි කියමි.

මෙහි **‘දණ්ඩ’** නම්: දඬුමුගුරු කඩු කිරිච්චි ආදිය ය. **“අදණ්ඩ දණ්ඩකෙහිපි තාලෙන්ති”** යනාදී තන්හි සේ ය. **“කාය දුච්චරිතං කායදණ්ඩො, වචීදුච්චරිතං වචීදණ්ඩො, මනො දුච්චරිතං මනොදණ්ඩො”** යනාදී තන්හි කායාදිදුච්චරිතයෙහි ආයේ ය. සමහර තැනෙක රජුන් විසින් පණවනු ලබන වධහිංසාද **දණ්ඩ** යි කියනු ලැබේ.

**‘භූතෙසු’** ‘සත්වයන් කෙරෙහි,’ යනු අරුත්. ‘භූත’ ශබ්දය **“භූතස්මිං පාචිත්තියං”** යනාදී තන්හි විද්‍යමානයෙහි ද, **“භූත මිදන්ති භික්ඛවෙ සමනුපස්සථ”** යනාදී තන්හි ස්කන්ධපංචක-යෙහි ද, **“චත්තාරො ඛො භික්ඛු මහාභූතා හෙතූ”** යනාදී තන්හි පෘථිවීධාත්වාදියෙහි ද, **“යො ච කාලඝසො භූතො”** යනාදී තන්හි ක්ෂීණාස්‍රවයා කෙරෙහි ද, **“සබ්බෙව නික්ඛිපිස්සන්ති භූතා ලොකෙ සමුස්සයං”** යනාදී තන්හි සකල සත්වයන් කෙරෙහි ද, **“භූතගාමපාතව්‍යතාය පාචිත්තියං”** යනාදී තන්හි වෘක්ෂලතාදීන් කෙරෙහි ද **“භූතං භූතතො සඤ්ජානාති”** යනාදී තන්හි චාතුර්මහාරාජිකයන්ගේ යට පෙදෙස්හි වූ සත්වයන් කෙරෙහි ද **“යානීධ භූතානි සමාගතානි”** යනාදී තන්හි අමනුෂ්‍යයන් කෙරෙහි ද පවත්නේ, මෙහි සකලසත්වයන් කෙරෙහි නැගී සිටියේ ය.

**තසෙසු, ථාවරෙසු,** යන දෙ පදය **‘භූතෙසු’** යනු වෙසෙසා සිටියේ ය. තෘෂ්ණායෙන් තැති ගන්නෝ **‘තස’** නම් වෙත්. තෘෂ්ණා

සහිත වූ භය සහිත වූවනට මේ නමෙකි. **"තසා තසන්තීති = තසං, සතණ්හානං සභයානං එතං අධිවචනං"** යනු අටුවා. මොවුනතුරෙහි දීඝ – මහන්ත – මජ්ඣිම – රස්සක – අණුක – ථූල – දිට්ඨ – අදිට්ඨ – දූර – අවිදූර – සම්භවෙසී යනු විසින් හඳුන්වන සත්ත්වයෝ **වෙත්**.

එහි දීඝ **සත්ත්වයෝ** නම්, බඹ සිය ගණන් දික් වූ සිරුරු ඇති නාග මච්ඡ ගොධාදීහු ය. **මහාසත්ත්වයෝ** නම්, දියෙහි හැසිරෙණ මත්ස්‍යාදීහු, ගොඩ හැසිරෙණ හස්තිනාගාදීහු, අමනුෂ්‍යයන් අතුරෙහි වූ අසුරාදීහු ය. රාහු අසුරිඳුගේ ශරීරය උසින් යොදුන් සාරදහස් අට සියයෙකි. දෙ බාහු ව යොදුන් එක් දහස් දෙසියයෙකි. බැම අතර හා ඇඟිලි අතර පණස් පණස් යොදුනෙකි එක් අත්ලක් යොදුන් දෙසියයෙකි. **මධ්‍යමසත්ත්වයෝ** නම්, අශ්ව ගව මහිෂාදීහු ය. **හ්‍රස්වක සත්ත්වයෝ** නම්, ඒ ඒ සත්ත්ව ජාතීන් අතුරෙහි දීඝසත්ත්වයනටත් මධ්‍යමසත්ත්වයනටත් පහත් ව සිටි වාමනකාදීහු ය. **අණුකසත්ත්වයෝ** නම්, මසැසට ගොදුරු නො වන දිවැසට පමණක් පෙණෙන * සත්ත්වජාතීහු ය. **සථූලසත්ත්වයෝ** නම්, පිරිමඬුලු වූ සිරුරු ඇති මච්ඡකච්ඡපසිප්පිසම්බුකාදීහු ය. **දිට්ඨසත්ත්වයෝ** නම්, තම ඇසට පෙණෙන්නෝ ය. **අදිට්ඨසත්ත්වයෝ** නම්, පරසමුද්‍ර පරසෙල පරචක්කවාලයන්හි වූවෝ ය. **දූරසත්ත්වයෝ** නම්, අන්හු සිරුරෙහි වසන්නෝ ය. **අවිදූරසත්ත්වයෝ** නම්, තම සිරුරෙහි වසන්නෝ ය. **සම්භවෙසීසත්ත්වයෝ** නම්, පහ නො කළ භව සංයොජන ඇති බැවින් මතු භවයෙහි ඉපැත්ම සොයන ශෛක්ෂ්‍ය – පෘථග්ජනයෝ ය. තවද අණ්ඩජ-ජලාබුජයෝ ද සංසේදජ – ඔප පාතිකයෝ ද ප්‍රථමචිත්තක්ෂණයෙහි දී සම්භවෙසීහු ය. උපන් ඉරියව්වෙන් සිටින්නෝ ද සම්භවෙසීහු ය.

**'ථාවර'** නම්: ප්‍රහීණ කළ තෘෂ්ණාභය ඇති රහතුන් වහන්සේ ය. ස්ථිතිප්‍රාප්ත බැවින් කො තැනකත් කිසිවකිනුත් නො සැලී ස්ථිරව පිහිටා ගත්තෝ ය. යමෙක් මෙසේ තෘෂ්ණාභය සහිත වූත් සියලු සතුන් කෙරෙහි පහ වූ ක්‍රොධ ඇතියේ එහෙයින් ම අත් පා දඬු මුගුරු ආදියෙන් පහරදීම් දුරු කොට සැහැසි බවෙන් දුරුව සිටියේ, තෙමේ කිසි ද කරුණක් නිසා කිසි ද සතකු නො නසා ද, අන්හු ලවා නො නස්වා ද ඔහු බ්‍රාහ්මණ නම් වන්නේ ය.

ධර්මදෙශනාවගේ අවසානයෙහි බොහෝ දෙන සෝවාන් ඵලාදියට පැමිණියාහු ය.

**අන්‍යතර භික්ෂු වස්තුව නිමි.**

# කොපයෙන් ගැවුනු බැමිණිය

## 26 — 23

**බුදුරජුන්** දෙව්රම් මහවෙහෙර වැඩ වසන දවසෙක එක්තරා බැමිණියක් සතර නමක් උදෙසා දන් පිළියෙල කොට බමුණාට කතා කොට "වෙහෙරට ගොසින් සඞ්ඝයා වෙතින් තෙරුන් සතර නමක් වැඩමවා ගෙණ එන්නැ" යි බමුණා වෙහෙරට පිටත් කොට යැව්වා ය. බමුණා වෙහෙරට ගොස් "මට වැඩිමහලු මහණුන් සතර නමක් දුන මැනැවැ" යි සඞ්ඝයා වෙතින් ඉල්ලා සිටියේ ය. **සංකිච්ච** සාමණේර, **පණ්ඩිත** සාමණේර, **සොපාක** සාමණේර, **රේවත** සාමණේර යන සත් අවුරුදු වයසැති සාමණේර සතර නම බැමිණියගේ දානය පිණිස බත් උදෙසත්නාහුගේ නියමය පිට බමුණුගෙට වැඩියහ. බැමිණිය මාහැඟි අසුන් පණවා මග බලා සිටියා කුඩා හෙරණුන් දැක කිපියා ලිපෙහි ලූ ලුනු ඇට පුපුරන්නා සේ කොපයෙන් පුපුර පුපුරා "තෝ වෙහෙරට ගොස් තමන්ට මූනුබුරු තරමටත් නො පොහොනා කුඩා දරුවන් සතර දෙනකු ගෙණ ආයෙහි ඇයි දැ?"යි බමුණාට තරවටු කළා ය තරවටු කොට පිළියෙල කොට තුබූ අසුන්වල ඒ සතර නමට හිඳින්නට ඉඩ නො දී මිටි පුටු සතරක් පණවාලා මෙහි හිඳිවූ" යි කියා "යව, වෙහෙරට ගොස් වැඩිමහලු තෙරුන් සතර නමක් වැඩමවා ගෙණ එව"යි නැවැතත් බමුණා වෙහෙරට පිටත් කොට යැවූ ය.

බමුණා ද විහාරයට ගියේ සැරියුත් මහතෙරුන් දැක උන්-වහන්සේට "අපගේ ගෙට වඩිනු මැනැවැ"යි ආරාධනා කෙළේ ය. උන්වහන්සේ බමුණු ගෙට වැඩියහ. ඒ වේලෙහි එහි හුන් හෙරණුන් සතර නම දැක "තමූසේලාට වළඳන්නට දැයෙක් ලැබුනා දැ?" යි ඇසූහ. ඔවුන් "නො ලැබුනේ ය"යි කී කල්හි පිළියෙල කොට ඇති බතත් සතර දෙනකුට ම පමණය යි දැන උන්වහන්සේ "මාගේ පාත්‍රය ගෙණෙව" යි බමුණා අත තුබූ තමන් වහන්සේගේ පාත්‍රය ගෙන්වා ගෙණ එතැනින් බැහැර වැඩිය සේක. බැමිණිය, සැරියුත් තෙරුන් දන් නො වළඳා හිස්පය ගෙණ පෙරළා වඩිනහු දැක "තෙරුන් කීයේ කිමැ?"යි බමුණා අතින් විචාළා ය. එ කල්හි බමුණා "මෙහි වැඩ ඉන්නා මේ සතර නමට පමණක් සෑහෙන පමණින් පිළියෙල කොට ඇති බත ඒ සතර නමට ම ලැබිය යුතු ය" යි කියා ගියබව කීයේ ය. එසේ නම් වහා ගොස් අන් මහතෙර නමක් කැඳවා ගෙණ එන්නැ" යි බමුණා නැවැතත් විහාරයට යැවූ ය. බමුණා, එවර විහාරයට ගොස් මුගලන් මහතෙරුන්ට ආරාධනා කොට උන්වහන්සේ ගෙට කැඳවා ගෙණ ආයේ ය. එහි වැඩම කළ උන්වහන්සේ බඩගින්නෙන් පෙළුනු හෙරණුන් දැක

තමන් වහන්සේගේ පාත්‍රය ගෙණ පෙරළා විහාරයට වැඩිය සේක. ඉක්බිති බැමිණිය, “මොවුහු වළඳනු නො කැමැත්තෝ ය, එහෙයින් බමුණන් හෝම කරණ තැනට ගොස් මහලු බමුණකු කැඳවා ගෙණ එව” යි බමුණා බමුණන්ගේ යාග ස්ථානයට යැවූ ය.

හෙරණ සතර නම ද උදෑසන පටන් කිසි අහරක් නො ලැබ බඩගින්නෙන් පෙළෙමින් බමුණු ගෙදර ම නැවතී හුන්හ. එවේලෙහි උන්වහන්සේලාගේ ගුණතෙදින් සක්දෙව්දුන්ගේ අසුන උණු වී ගියේ ය. සක්දෙව් දිවැස් යොමා බලනුයේ උදෑසන සිට එහි හුන් හෙරණුන් බඩගින්නෙන් පෙළෙන බව දැක “මා දූත් එහි යා යුතු ය” යි දිරුම් කඩට ගිය බමුණු වෙසක් මවා ගෙණ බමුණන් හෝම කරණ තැනට ගොස් එතැන බමුණන්ගේ ප්‍රධාන ආසනයෙහි හිඳ ගත්තේ ය. බමුණා ඔහු දැක “මාගේ බැමිණිය මූ දැක සතුටුවනු ඇතැ” යි සිතා “එන්න, අපගේ ගෙට යන්නටැ” යි ඒ බමුණු මහල්ලා කැඳවා ගෙණ ගියේ ය. බැමිණිය ද දුර දීම බමුණු මහල්ලා දැක සතුටු ව අසුන් දෙකෙක අතුරණ ඇතිරිලි එක් ම අසුනෙක අතුරා “සවාමීනි! මෙහි වැඩ හිඳිනු මැනැවැ” යි කියා සිටියා ය. සක්දෙව් බමුණු වෙසින් ම ගෙට ඇතුල් වූයේ හෙරණුන් සතර නම දැක පසඟ පිහිටුවා වැඳ උන්වහන්සේලා වැඩ හුන් අසුන් කෙළවර බිම පලක් බැඳ හුන්නේ ය. බැමිණිය බිම හුන් ඔහු දැක “අනේ, මේ කිම, ඔබ විසින් කැඳවා ගෙණ එන ලද්දේ කවරෙක් ද, ඔබගේ පියා තරම් මහලු මේ මහල්ලා ගෙණ එන ලද්දේ කුමට ය, තමන්ගේ මුනුබුරු තරම් වන හෙරණුන් වඳින්නා වූ මොහුගෙන් අපට කම් කිම, වහාම මොහු සිටිය තැනකට ගෙණ ගොස් හැර දමන්නැ” යි ගුගුළා ය. ඒ වර බමුණා කඳින් අතින් කිසිල්ලෙන් අල්ලා බැහැර කරන්නට උත්සාහ කෙළේ ද, ඔහු හුන් තැනින් නගා ගන්නට නො හැකි වී ය. බමුණු මහල්ලා එ තැනින් නැගී සිටින්නට නො කැමැති වී ය. එවිට බැමිණිය “එන්න, ඔයා එක් අතකින් අල්ලා ගන්න, මම එක් අතකින් අල්ලා ගණිමි” යි බමුණු බැමිණියෝ එක් ව අල්ලා ගෙණ පිටට ගුටි බාමින් ගෙයින් පිටතට ඇද ගෙණ ගියහ. සක්දෙව් ද හුන් තැන ම හිඳ අත කර කැවී ය. ඔවුහු හැරී බැලුවෝ හුන් තැන ම හුන් බමුණු මහල්ලා දැක හඬා මොරගා අතහැර දැමූහ. එකෙණෙහි සක්දෙව් තමන් සක්දෙව් බව දන් වී ය. අනතුරු ව පිළියෙල කොට තුබූ බත ඔවුන් පස් දෙනාහට ම දුන්නී ය. පස් දෙන ම ආහාර ගත්හ. ආහාර ගෙණ එකෙක් ගෙයි කැණිමඩල බිඳ ගෙණ නික්ම ගියේ ය. එකෙක් පියසි ඉදිරිපස බිඳගෙණ ගියේ ය. එකෙක් පසුපස බිඳගෙණ ගියේ ය. සක්දෙව් තවත් තැනක් බිඳ ගෙණ ගියේ ය. එතැන් සිට ඒ ගෙය පස් සිදුරුගේ ය යි පළට විය.

හෙරණුන් විහාරයට ගිය කල්හි එහි විසූ භික්ෂූන් වහන්සේලා "ඇවැත්නි! බමුණු ගෙදර තොරතුරු කෙසේ ද?" යි ඇසූහ. උන්-වහන්සේලා "එය අපගෙන් නො විචාරණු මැනැව, අප දුටු තැන් පටන් ඒ බැමිණිය ගිත්නෙහි ලූ ලුනු කැට මෙන් ක්‍රොධයෙන් පිපිරි පිපිරී අපට හිඳින්නට වත් නො දී වහා ම බමුණකු කැඳවා ගෙණ එව, යි තම හිමියා පිටත් කළා ය. ඔහු අපගේ උපාධ්‍යාය-යන් වහන්සේ එහි වැඩමවා ගෙණ ගියේ ය, උන් වහන්සේ අප දැක 'මේ හෙරණුන්ට බත් ලැබිය යුතු ය යි තමන් වහන්සේගේ පාත්‍රය ඉල්ලා ගෙණ එතැනින් නික් ම ආහ, අනතුරුව අන් මහලු බමුණකු ගෙණ එන්නැ'යි කී විට මුගලන් මහතෙරුන් කැඳවා ගෙණ ගියේ ය, උන්වහන්සේ ද අප දැක පෙරළා ආහ, ඉන් පසු බැමිණිය මොවුහු වළඳනු නො කැමතියහ,යි කියා බමුණන් හෝම කරණ තැනින් මහලු බමුණකු ගෙණ එන්නැ,යි බමුණා යැවූ ය, බමුණා ද එහි ගොස් බමුණු වෙස් ගෙණ සිටි සක්දෙවිඳුන් කැඳවා ගෙණ ආයේ ය, ඔහු එහි පැමිණි පසු අපට කැම බීම් දුන්නී ය"යි කීහ. "කිම, එසේ කරන්නා වූ ඒ දෙපොලට තමුන්නාන්සේලා උරණ නො වූ වහු දැ?"යි විචාරා "උරණ නො වූ වමු"යි කී කල්හි "මොවුහු බොරු කියමින් තමන් රහත්හ යි කියා ගණිති"යි සිතා බුදුරජුන් වෙත ගොස් එබව සැලකළහ. එකල්හි බුදුරජාණන් වහන්සේ "මහණෙනි! රහත්හු තමන්ට විරුද්ධ ව නැඟී සිටියවුනට කවදාත් කවර කරුණක් නිසාත් විරුද්ධ ව නැඟී නො සිටිති"යි වදාරා මේ ධර්මදෙශනාව කළ සේක.

**අවිරුද්ධං විරුද්ධෙසු අත්තදණ්ඩෙසු නිබ්බුතං,**
**සාදානෙසු අනාදානං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං.**

විරුද්ධ වූවන් අතුරෙහි විරුද්ධ නො වූ ද ගත්නාලද දඬු ඇත්තවුන් අතුරෙහි නිවීගියා වූ ද ගැණුම් සහිතයන් අතුරෙහි ගැණුම් නැත්තා වූ ද, ඔහු මම බමුණු යි කියමි.

**අවිරුද්ධං විරුද්ධෙසු** = විරුද්ධ වූවන් අතුරෙහි විරුද්ධ නො වූ.

ආඝාත–පටිඝාත–පටිඝ–පටිවිරොධ – කොප – පකොප – සම්ප-කොප–දොස–පදොස–සම්පදොස–බ්‍යාපත්ති – මනොපදොස–කොධ–කුජ්ඣනා–දුස්සනා – විරොධ – චණ්ඩික්ක–අසුරොප–අනත්තමනතා යනාදි පදයන්ගෙන් කියූ අරුත් ඇති ව සිතෙහි උපදනා ක්‍රොධය යමක්හු විසින් ප්‍රහීණ කරණ ලද්දේ ද සන්හිඳුවන ලද්දේ ද නැවැත ඉපැත්මට නො සුදුසු කරණ ලද්දේ ද මාර්ගඥනාග්නියෙන් දවනලද්දේ ද හේ **'අවිරුද්ධ'** නම්. **'විරුද්ධ'** නම්: මෙ කියූ ක්‍රොධ ඇතියේ ය.

**අත්තදණ්ඩෙසු නිබ්බුතං** = ගත්තාලද දඬු ඇත්තවුන් අතුරෙහි නිවිගියා වූ.

අනුනට වධහිංසා කිරීමෙන් නො වැලකුනු බැවින් පරවධ-හිංසා පිණිස ගත්තාලද දඬුමුගුරු ගල්මුල් අවිගත් අත් ඇතියේ **'අත්තදණ්ඩ'** නම්. එබන්දන් අතර නිවිසිත් ඇතියේ බහා තැබූ දඬුමුගුරු ඈ ඇතියේ **'නිබ්බුත'** නම්.

**සාදානෙසු අනාදානං** = ගැණීම් සහිතයන් අතුරෙහි ගැණීම් නැත්තා වූ.

රූප-වෙදනා - සංඥා - සංසකාර - විඥාන යන සකන්ධපංචකය "මම මි, මා අයත්"යි තණ්හුපාදාන-දිට්ඨුපාදානාදීන්ගේ වශයෙන් ගත්තේ **'සාදාන'** නම්. එසේ නො ගත්තේ **'අනාදාන'** ය.

**තං අහං බ්‍රෑමි බ්‍රාහ්මණං** = මම ඔහු බමුණු යි කියමි.

ආඝාත ප්‍රතිඝාතාදීන්ගේ වශයෙන් නැඟී සිටුනා ක්‍රොධයෙන් විරුද්ධ වූ ලොකීය මහාජනයා අතර එබඳු ආඝාත සිත් නැත්තා වූ ද අනුන් තලා පෙළා වධහිංසා කරන්නට දඬුමුගුරු ඈ අතට-ගත්තවුන් අතුරෙහි බහා තැබූ දඬුමුගුරු ඈ ඇත්තා වූ ද පංච-සකන්ධය, මම මි මාගේ,යි ගෙණ එය සැතැප්පවීමෙහි යෙදී සිටින්නවුන් අතුරෙහි එබඳු ගැණීම් නැත්තා වූ ද ඔහු බ්‍රාහ්මණ නම් වන්නේ ය.

**ශ්‍රාමණෙරවස්තුව නිමි.**

# මහාපන්ථකතෙරුන් චූලපන්ථකතෙරුන්ට සැලකූසැටි

## 26 — 24

**මහාපන්ථක** ස්ථවිරයන් වහන්සේ සාර මසක් වැයම් කොට ද එක් ගාථා පදයකුත් පුහුණු කරවා ලන්නට නො හැකි වූ බැවින් **චූලපන්ථක** ස්ථවිරයන් වහන්සේට කතා කොට "චූලපන්ථක! තමුසේට මේ ශාසනප්‍රතිපත්ති රැකීමට පිළිවන්කමක් ඇතිබව නො පෙණේ, එහෙයින් තමුසේ ශාසනයට නො සුදුස්සහු ය, ගිහි සම්පතිනුත් පිරිහී ගියහු ය, ඒ නිසා මෙහි විසීමෙන් තට වැඩෙක් නො වන්නේ ය, මෙ තැනින් බැහැර ගොස් ඉදිරියෙහි දිවි ගලවන්නට සැහෙන යමක් කර ගණීවූ" යි වෙහෙරින් පිටතට ඇද දමා වෙහෙර දොර වසා තැබූහ. එකල්හි භික්ෂූන් වහන්සේලා ධර්‍ම ශාලාවෙහි රැස් ව "ඇවැත්නි! මහාපන්ථක තෙරුන් විසින් චූලපන්ථක තෙරුන් දොරට ඇද දමා දොර වසන ලද්දේ ය, මෙයින් රහතුන්ටත් ක්‍රොධය උපදනාබව පෙණේ ය" යි කතා කරන්නට වූහ. එහි වැඩම කළ බුදුරජානන් වහන්සේ මෙය අසා "මහණෙනි! රහතුන්ට රාගාදී වූ කෙලෙස් නැත්තේ ය, මා පුතු විසින් චූලපන්ථක බැහැර කරණ ලද්දේ ක්‍රොධයෙන් නො වේ, අරුත් පෙරටු කොට දහම් පෙරටු කොට බැහැර කරණ ලදැ" යි වදාරා මේ ධර්‍ම දෙශනාව කළ සේක.

**යස්ස රාගො ච දොසො ච මානො මක්ඛො ච පාතිතො,**
**සාසපොරිව ආරග්ගා තමහං බ්‍රෑමි බ්‍රාහ්මණනති.**

යමක්හු විසින් රාගයත් දෙසයත් මානයත් මක්ඛයත් ඉදිකටු අගින් ගිලිහෙන අබැටක් මෙන් හෙළන ලද ද ඔහු, මම බමුණු යි කියමි.

**යස්ස රාගො ච දොසො ච මානො මක්ඛො ච පාතිතො** = යමක්හු විසින් රාගයත් දෙසයත් මානයත් මක්ඛයත් හෙළන ලද ද.

කාමරාගාදීන්ගේ වශයෙන් **රාගය** තෙවැදෑරුම් ය. "මේ සත්‍වයෝ නැසෙත්වා" යන ඈ විසින් යම් අරමුණෙක්හි ගැටෙමින් උපදනා **ද්වෙෂය** නවාඝාතවස්තූන්ගේ වශයෙන් නවවැදෑරුම් ය. "ශ්‍රෙෂ්ඨයාට ශ්‍රෙෂ්ඨ වෙමි" යන ඈ විසින් උපදනා **මානය** නව වැදෑරුම් ය. යට කියන ලද්දේ ය. **මක්ඛය** අනුන් විසින් කරණලද උපකාර මකා දැමීම ලකුණු කොට සිටියේ ය. අනුන් කළ උපකාර නසාලන්නේ ය.

මක්ඛය අසත්ගුණයෙකි. එයින් පළමු කොට කෙරෙණුයේ මකුගුණ ඇත්තහු සද්ගුණයෙන් මැකී යෑම ය. අසුචියෙන් අන් හට පහර දෙනු කැමැත්තේ පළමු කොට අසුචි තමන් ගේ අතට ගන්නේ ය. ඒ අතට ගත් අසුචියෙන් ඔහු ම පළමු කොට මැකෙන්නේ ය. ඔහු අත අසුචි තැවරෙන්නේ ය. එමෙන් මක්ඛයෙන් යුත් තැනැත්තහුගේ සද්ගුණ මැකී යන්නේ ය.

මේ අටුවා:- **යදිපි හි සො ගූථං ගහෙත්වා පරං පහරන්තො විය අත්තනො කරං පඨමතරං මක්ඛතියෙව, තථාපි පරෙසං ගුණමක්ඛනාධිප්පායෙන පවත්තනතබ්බතා පරගුණමක්ඛනං ති වුච්චති, තථාහි සො උදකපුඤ්ඡනීව නහාතස්ස සරීරගතං උදකං පරෙසං ගුණෙ මක්ඛති පුඤ්ඡති විනාසෙති. පරෙහි වා කතානං මහන්තානම්පි කාරානං ඛෙපනතො ධංසනතො මක්ඛොති** වුච්චති, යනු.

**සාසපො ඉව ආරග්ගා තං අහං බ්‍රෑමි බ්‍රාහ්මණං** = ඉදිකටු අගින් ගිලිහී වැටෙන අබැටක් මෙන් හෙළන ලද ද ඔහු, මම බමුණු සි කියමි.

යමකු විසින් රාග දෙස මොහ මාන මක්ඛ යන කෙලෙස් ඉදිකටු අග නො රඳා ගිලිහී වැටෙන අබැටක් මෙන් හෙළන ලද ද ඔහු බ්‍රාහ්මණ නම් වන්නේ ය.

ධර්මදෙශනාවගේ අවසානයෙහි බොහෝ දෙන සෝවාන්පලාදී-යට පැමිණියාහු ය.

**මහාපන්ථක ස්ථවිර වස්තුව නිමි.**

 

# පිලින්දිවච්ඡ මහාස්ථවිරයන් වහන්සේ

## 26 — 25

**පිලින්දිවච්ඡ** මහාස්ථවිරයන් වහන්සේ ගිහි පැවිදි ගෑණු පිරිමි දෙව් මිනිස් ඈ හැම කෙනෙක්හට "වසලය! යව, වසලය! යව" යි වසල වාදයෙන් කතා කරත්. දවසක් භික්ෂූන් වහන්සේලා බුදු රජුන් වෙත ගොස් "ස්වාමීනි! පිලින්දිවච්ඡ මහාස්ථවිරයන් වහන්සේ උස් පහත්කම් ද ගොත් පැවිදි නො පැවිදි දෙව් මිනිස් බැව් නො සලකා හැම කෙනෙක්හට වසල ය! වසල ය! යි වසලවාදයෙන් කතා කෙරෙති" යි සැලකළහ. එ කල්හි බුදුරජාණන් වහන්සේ පිලින්දිවච්ඡ තෙරුන් ගෙන්වා "වච්ඡ! තමුසේ හැම දෙනාහට වසල, වසලෑ, යි කියන්නහු සැබෑ ද?" යි අසා වදාළ සේක. "ස්වාමීනි! එසේ ය" යි උන්වහන්සේ පිළිතුරු දුන්හ. එවිට බුදුරජාණන් වහන්සේ පිලින්දිවච්ඡ තෙරුන්ගේ අතීතතත්ත්වය බලා වදාරා "මහණෙනි! පිලින්දිවච්ඡට අවමන් නො කරවු, පිලින්දිවච්ඡගේ වසල වාදයට නො කිපෙවු, මහණෙනි! පිලින්දිවච්ඡ, ද්වේෂයෙන් මැඩුනේ නො වේ, කිසිවකු හා තරහ ඇත්තේ නො වේ, ඒ නමගේ සිතෙහි කොපයෙක් නැත්තේ ය, මහණෙනි! පිලින්දිවච්ඡ ද පන් සියයක් ම පිළිවෙළින් බමුණු කුලයෙහි ඉපද ගත්තේ ය, බමුණන්ගේ ඒ වසල වාදය පිලින්දිවච්ඡටත් බොහෝ කලක සිට පුරුදු වී තිබේ, මහණෙනි! රහතුන්ගේ මුවෙහි රළු බසෙක් පරොස් බසෙක් අනුන්ගේ මර්මඝටන බසෙක් කිසිදුකත් නැත්තේ ය, මා පුත් බොහෝ කලක පටන් තමන්ට පුරුදු වූ බසින් කතා කෙරේ ය" යි වදාරා මේ ධර්ම දෙශනාව කළ සේක.

**අක්කකාසං විඤ්ඤාපනිං ගිරං සච්චං උදීරයෙ,**
**යාය නාභිසජෙ කඤ්චි තමහං බ්‍රෑමි බ්‍රාහ්මණන්ති.**

යම්කිසි වචනයකින් කිසිවකු නො කුප්වා ද (යමෙක්) එබඳු වූ රළු නො වූ වැඩ හඟ වන්නා වූ සැබෑ තෙපුල් කියන්නේ ද ඔහු, මම බමුණු යි කියමි.

**අක්කකාසං** = රළු නො වූ. මිහිරි වූ. මටසිලිටි වූ.

යම් ද ඒ බසෙකින් මෙරමා සිත සැහැසි කෙරේ ද, මෙරමා සිත්හි කොප උපදවා ද ජීවනස්ථාන ගටා ද එබඳු බස් **'කක්කාස'** නම් එසේ මෙරමාගේ ජීවනස්ථාන නො ගටන බස් **'අක්කකාස'** නම් වේ.

**විඤ්ඤාපනිං** = හිතවැඩ හඟ වන්නා වූ.

මේ කුසල්, මේ අකුසල්, මේ වරද, මේ නිවරද, මේ යායුතු මග, මේ නො යායුතු මග, මේ හිතවැඩ, මේ අහිත වැඩැ යි වෙන් කොට හිතවැඩ දන්වන්නා වූ බස් **'විඤ්ඤපනි'** නම්.

**ගිරං සච්චං උදීරයෙ** = සැබෑ තෙපුල් කියන්නේ නම්.

**උදීරයෙ** = 'කියන්නේ ය' යනු අරුත්. එහි වූ **'උ'** යනු උපසර්ග යි. එය, **ප්‍රාබල්‍ය – වියොග – ලංඝ – ඌර්ධ්වකර්ම – ප්‍රකාශ – උත්සවාසථ්‍ය – මොක්‍ෂ – අභාව – බන්ධන – ප්‍රාධාන්‍ය – ශක්ති** යන අරුත්හි එන්නේ ය. මෙහි ප්‍රකාශයෙහි සිටියේ ය.

**යාය න අභිසජෙ කංචි තමහං බ්‍රෑමි බ්‍රාහමණං**=යම් වචනයකින් කිසිවකු නො කුප්වා ද ඔහු, මම බමුණු යි කියමි.

**අභිසජෙ** = කුප්වා, ලග්ගවා, කුපිත කෙරේ යනු අරුත්. එහි වූ **'අභි'** යනු උපසර්ගයි. එය, **පූජා – ආභිමුඛ්‍ය – භාග – සාදෘශ්‍ය – ප්‍රයොග – ඉච්ඡා – ව්‍යාධි – නාගතා – සාරූප්‍ය – වචන – අදන – ආම්නාය** යන අරුත්හි එන්නේ ය. මෙහි ආයේ ප්‍රයොගයෙහි ය.

යම් වචනයකින් කිසිවකු කොප ඉපදවීම් වශයෙන් නො ලග්ගවාද කුපිත නො කෙරේ ද, එබඳු නො රළු එලොව මෙලොව වැඩ පහදා ලන්නා වූ සබෑ බස් කියන ඔහු, බ්‍රාහමණ නම් වන්නේනේ ය.

ධර්මදෙශනාවගේ අවසානයෙහි බොහෝදෙන සෝවන්පලාදි-යට පැමිණියාහු ය.

**පිලින්දිවච්ඡ ස්ථවිර වස්තුව නිමි.**

# උතුරුසළුවක් ගත් මහණෙක්

## 26 — 26

**සැවැත්** නුවර වැසි මිසදිටු ගත් එක්තරා බමුණෙක් සිරුර ගඳගැණිම් බියෙන් උතුරුසළු ව ගලවා පසෙක තබා ගෙට මූණ ලා හුන්නේ ය. ඒ අතර එක් රහත් මහණෙක් බත්කිස නිමවා විහාර යට යනුයේ ඒ සළු ව දැක වට පිට බලා කිසිවකු නො දැක "මෙය හිමියන් නැති එකෙක් වනැ"යි පවුල් හැඟීමෙන් හැර ගත්තේ ය. එවිට සළු ව හිමි බමුණා සළු ව ගත් තෙරුන් දැක බැණ දෙඩා වෙතට ගොස් "මුඩු මහණ! මාගේ සළු ව ගත්තෙහි ඇයි දැ?" යි ඇසී ය. උන්වහන්සේ "සළුව ඔබගේ දැ?" යි අසා "එසේ ය" යි කී කල්හි "මම වට පිට බලා කිසිවකු නො දුටු බැවින් මේ සළුව හිමියකු නැති එකෙක් වනැ යි පවුල් හැඟීමෙන් ඇර ගතිමි, ඔබගේ නම් ගණුව" යි එය ඔහුට දී විහාරයට ගොස් මේ පුවත භික්ෂූන්ට දැන් වූහ. භික්ෂූන් වහන්සේලා කවටකම් කරමින් "කොහොම ද, ඇවැත්නි! සළු ව දිග ද, කොට ද, දළ ද; මටසිලිටි දැ?" යි ඇසූහ. එවිට උන්වහන්සේ "දිග වුවත් කොට වුවත් දළ වුවත් මටසිලිටි වුවත් මාගේ එහි ඇල්මෙක් නැත, පවුල් හැඟීමෙන් ගතිමි"යි කීහ. භික්ෂූන් වහන්සේලා එයසා බුදුරජුන් වෙත ගොස් "ස්වාමිනි! මේ මහණ බොරු කියා තමන් රහත්, යි හඟවන්නේ ය" යි සැල කළහ. එකල්හි බුදුරජාණන් වහන්සේ "මහණෙනි! මේ නම කියන්නේ ඇත්ත ය, රහත්හු කවදාකත් අනුන් අයත් දැයක් නො ගණිති" යි වදාරා මේ ධර්මදෙශනාව කළ සේක.

> **යො'ධ දීඝං ච රස්සං වා අණුං ථූලං සුභාසුභං,**
> **ලොකෙ අදින්නං නාදියති තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං.**

යමෙක් මෙලොව දික් වූ හෝ ලුහුඬු වූ හෝ කුඩා වූ හෝ මහත් වූ හෝ යහපත් වූ හෝ අයහපත් වූ හෝ නො දුන් දැයක් නො ගණී ද ඔහු, මම බමුණු යි කියමි.

**යො ඉධ දීඝං වා රස්සං වා අණුං ථූලං සුභාසුභං** = යමෙක් මෙලොව දික් වූ හෝ ලුහුඬු වූ හෝ කුඩා වූ හෝ මහත් වූ හෝ යහපත් වූ හෝ අයහපත් වූ හෝ.

මෙහි '**දීඝං – රස්සං**' යන දෙ පදය වස්ත්‍රාභරණාදීන්ගේ වශයෙන් ද '**අණුං – ථූලං**' යන දෙ පදය මණි මුක්තාදීන්ගේ වශයෙන් ද, '**සුභාසුභං**' යනු මාහැඟි නො මාහැඟි වස්තූන්ගේ වශයෙන් ද යොදා ගත යුතු ය.

**ලොකෙ අදින්නං න ආදියති තං අහං බ්‍රෑමි බ්‍රාහමණං** = (මෙ ලොව) නො දුන් දූය නො ගණී ද ඔහු, මම බමුණු යි කියමි.

මෙහි **'ලොකෙ'** යනු **'ඉධ'** යනු හා එක් කොට අරුත් ගත යුතු ය. **'අදින්න'** නම්: වස්තු හිමියා විසින් කයින් හෝ වචනයෙන් හෝ නො දුන් වස්තු හිමියා විසින් රැකි දූය ය.[1] එබඳු දූයක් සොරසිත් උපදවා පැහැර ගැණීම, 'අදින්නාදාන'ය යි. මෙය එලොව මෙලොව දෙක්හි හැම දුක් එල කොට සිටියේ ය. අදින්නාදායී පුද්ගල, අපාදුක් විඳ මිනිස් ලොව උපත්තේ ධන ධාන්‍ය ලාභයෙන් පිරිහෙන්නේ ය. පස්කම් සැපතින් ඇද වැටෙන්නේ ය. උත්සාහයෙන් කය වෙහෙසා දුකින් උපයා ගත් යම් දූයෙක් වේ නම් ඒ හැම රජ-සොර-දිය-ගිනි-සතුරු යන උවදුරුවලින් නැසී යන්නේ ය. නො දුන් දෙය පැහැර ගත්තේ හැම කල්හි සැකයෙන් දිවි ගෙවන්නේ ය. දෙරට පිළුට නො ද බසින්නේ ය. හැම කෙනෙකුන් කෙරෙහි ම යටත් ව දවසරින්නේ ය. එහෙයින් නො දුන් දූය ගැණීමෙන් වෙන්විය යුතුය.

මෙලොව යමෙක් වස්ත්‍රාභරණාදීන්ගේ වශයෙන් දික් වූ හෝ ලුහුඬු වූ හෝ, මණි මුක්තාදීන්ගේ වශයෙන් කුඩා වූ හෝ මහත් වූ හෝ, මහඟු නො මහඟු වස්තූන්ගේ වශයෙන් මනා වූ හෝ නො මනා වූ හෝ අන්සතු දූයක් සොර සිතින් නො ගණී ද ඔහු බ්‍රාහමණ නම් වන්නේ ය.

ධර්මදෙශනාවගේ අවසානයෙහි බොහෝ දෙන සෝවත්පලාදි-යට පැමිණියාහු ය.

**අන්‍යතරසථවිර වස්තුව නිමි.**

---

1. 1, 10. 'පාපකාරී' යනු බලනු.

# සැරියුත් මහතෙරුන්ට කළ නිගාවක්

**26 — 27**

**ශාරීපුත්‍ර** මහාසථවිරයන් වහන්සේ භික්ෂූන් පන් සියයක් පිරිවරා ගෙණ දනව්වෙහි එක්තරා විහාරයෙක වස් එළැඹියහ. මිනිස්සු උන්වහන්සේ දැක වස් විසූවනට දිය යුතු පිදෙවිලි පුදන්නෙමු'යි පිළින කළහ. මහතෙරුන් වහන්සේ වස් පවරා ඒ ඒ විහාරයන්හි වස් විසූවන්ට ලැබෙන පුද පිරිකර ලැබෙන්නට පෙරාතු ව ම බුදුරජුන් දක්නට යන්නාහු "උපාසකවරුන් වස්සා-වාසික පරිෂ්කාර ගෙණා කල්හි පිළිගෙණ බෙදා, මා හා එක් ව යන වැඩිමාලු මහණුන්ගේ හා හෙරණුන්ගේ පිරිකර කොටස් එවා ලවූ, එවන්නට පිළිවෙළෙක් නො වූයේ නම් නො නැසෙන ලෙසින් තැන්පත් කොට ඒ බව කියා ලියුමක් එවවූ''යි කියා බුදුරජුන් වෙත ගියහ. ඒ අතර භික්ෂූන් වහන්සේලා "අදත් මේ තරම් උසස් තැනක සිටින්නා වූ සැරියුත් මහතෙරුන්ගේ සිත්හි ආබභිකම ඒ ඒ දැය කෙරෙහි ආශා ව දැඩි ව රැඳී තිබේ, වස්සාවාසික, ලැබුනු කල්හි තමන්ගේ සද්ධිවිහාරිකයනට වස්සාවාසිකය එවා ලවූ, නැත, තැන්පත් කොට තබා දන්වාලවූ සි නියම කොට ගියහ''යි කතා කරන්නට වූහ. බුදුරජානන් වහන්සේ භික්ෂූන් කරණ කතාව අසා "මහණෙනි! මා පුත් සැරියුත්හට ආශාවක් නැත, මිනිසුන්ට පිණෙන්, දහර හෙරණුන්ට ධාර්මික ලාභයෙන් පිරිහීමක් නො වනු පිණිස ඒ තැන එසේ කියන ලද''යි වදාරා මේ ධම්දෙශනාව කළ සේක.

**ආසා යස්ස න විජ්ජන්ති අස්මිං ලොකෙ පරම්හි ච,**
**නිරාසයං විසංයුත්තං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණන්ති.**

යමක්හට මෙ ලොව ද පරලොව ද ආශාවෝ නැත්තාහු ද තෘෂ්ණා රහිත වූ සියලු කෙලෙසුන්ගෙන් මිදුනා වූ ඔහු, මම බමුණු යි කියමි.

**ආසා යස්ස න විජ්ජන්ති අස්මිං ලොකෙ පරම්හි ච** = යමක්හට මෙලොව හා පරලොව ආශාවෝ නො වෙත් ද.

**නිරාසයං විසංයුත්තං තං අහං බ්‍රෑමි බ්‍රාහ්මණං** = තෘෂ්ණා රහිත වූ සියලු කෙලෙසුන්ගෙන් මිදුනු ඔහු, මම බමුණු යි කියමි.

**'ආසා'** නම්: තෘෂ්ණා ය. අරමුණු අනුභව කරණ බැවින් අර-මුණු යටපත් කොට එහි බැස සිටින බැවින් අරමුණු කරා ගොස් එය

වළඳන බැවින් තෘෂ්ණා, ආසා නමැයි කියන ලදී. එය රූපාශාය, ශබ්දාශාය, ගන්ධාශාය, රසාශාය, සප්‍රෂ්ටව්‍යාශාය, ලාභාශාය, ධනාශාය, පුත්‍රාශාය, ජීවිතාශාය යි රූපාදී වූ අරමුණුරස විඳීම් විසින් නන් වැදෑරුම් ය. යම් ශක්තියක් කරණ කොට ලොකයෙහි ඇතිතාක් රූප ශබ්ද ගන්ධරසාදී වූ උස් පහත් අරමුණු කෙරෙහි බැඳේ ද ලැගේ ද ගැලේ ද ඒ ශක්තිය **'ආසා'** නම්. **"ආවිසන්ති එතායාති = 'ආසා'** යනු අරුත් විදෑහීම ය.

මෙ ද සලකන්නේය:-

"ආසාය කසතෙ ඛෙත්තං බීජං ආසාය වප්පති,
ආසාය වාණිජා යන්ති සමුද්දං ධනහාරකා,
යාය ආසාය තිට්ඨාමි සා මෙ ආසා සමිජ්ඣතු.

යනු. ආශාව නිසා කෙත සායි, ආශාව නිසා බිජුවට වපුරයි, ධනය රැස් කරණ වෙළෙන්දෝ ආශාව නිසා මුහුදට යත්, යම් ආශායෙකින් මම මෙහි සිටිම් ද මාගේ ඒ ආශාව සමෘද්ධවේවා, යනු අරුත්. මෙහි ආශා යි කීයේ කත්තුකම්‍යතා ඡන්දය යි. ආශාව වැනි බැවිනි. මේ වනාහි කාලුදායි තෙරුන් ගේ පැතීමෙකි. ඒ මේ ආසා නැත්තෝ **'නිරාසය'** නම්. සත්වයා සසර බැඳ තබන සත්වයා කෙලෙසන රාගාදීන් කෙරෙන් මිදුනෝ **'විසංයුත්තා'** නම්.

යමක්හට මෙලොවැ පරලොවැ දෙක්හි ම මිනිස් සැප දෙව් සැප කෙරෙහි ආසා නැත්තී ද සියලු කෙලෙසුන්ගෙන් මිදුනා වූ **ඔහු බ්‍රාහ්මණ නම් වන්නේ ය.**

ධර්මදෙශනාවගේ අවසානයෙහි බොහෝ දෙන සෝවන් පලාදියට පැමිණියාහු ය.

**ශාරීපුත්‍ර වස්තුව නිමි.**

# මුගලන් මහතෙරුන්ට දෙසූ ධර්මදේශනාවක්

## 26 — 28

**“යස්සාලයං න විජ්ජන්ති”** යනාදී වූ ධර්මදේශනා තොමෝ මුගලන් තෙරුන් ඇරැබැ දෙශනා කරණ ලද්දී ය. එහි කතා පුවත ශාරීපුත්‍ර මහාසථවිරකථාවස්තුයෙහි කී සෙයින් දත යුතු ය. මෙහි වනාහි බුදුරජානන් වහන්සේ මුගලන් මහතෙරුන්ට කිසින් තැනෙක කිසින් දෑයෙක තෘෂ්ණාවක් නැති බව දක්වා මේ ධර්ම දෙශනාව කළ සේක.

> **යස්සාලයං න විජ්ජන්ති අඤ්ඤාය අකථංකථී,**
> **අමතොගධං අනුප්පත්තං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණන්ති.**

යමක්හට ආලයෝ නැත්තාහු ද, දූන කෙසේ කෙසේ දූ යි පැවැති සැක කතා නැත්තී ද, නිවනට බැස නිවනට පිළිවෙළින් පැමිණියා වූ ඔහු, මම බමුණු යි කියමි.

**යස්ස ආලයං න විජ්ජන්ති අඤ්ඤාය අකථංකථී** = යමක්හට ආලයෝ නැත්තාහු ද දූන කෙසේ කෙසේ දූයි පැවැති සැක කතා නැත්තී ද.

**අමතොගධං අනුප්පත්තං තං අහං බ්‍රෑමි බ්‍රාහ්මණං** = නිවනට බැස නිවනට පිළිවෙළින් පැමිණි ඔහු, මම බමුණු යි කියමි.

**‘ආලය’** නම්: තෘෂ්ණා ය. පස් කම් ගුණයෙහි සත්වයන් පුන පුනා රඳවන බැවින් අලවන බැවින් ඕ ආලය නම් වූ ය. පංචකාමය ද ආලය යි ගැණේ. ලොකයෙහි ඇති තාක් පෘථග්ජනසත්වයෝ තෘෂ්ණාව නිසා පස්කම්හි ඇලෙති. එහෙයින් පස්කම් ද ආලය නම් වේ. එක්සිය අටක් වූ තෘෂ්ණා විචරිතයෝ සත්වයන් අලවති. එහෙයින් ඔවුහු ද ආලය යි කියනු ලැබෙත්. පංචකාමසඞ්ඛ්‍යාත වූත් තෘෂ්ණාසඞ්ඛ්‍යාත වූත් ආලයයන් කරණ කොට ගෙණ සත්වයෝ කෙළිත් නු යි ආලයාරාමයහ. එහි ඇලෙත් නු යි ආලයරතයහ. එහි මුදිත වූවාහු යි ආලයසම්මුදිත යහ.

මල්පලින් බර වූ ගස්වැල්වලින් ගැවසී ගත් උයනකට වන් පුරුෂ, එහි සිත් අලවා වෙසේ ද එයින් නික්ම එන්නට නො කැමැති වේ ද එපරිද්දෙන් මේ කාමාලය තෘෂ්ණාලයන් කරණ කොට ගෙණ ද සත්වයෝ සංසාරවෘත්තයෙහි අතිශයින් ඇලෙත්. අතිශයින් සතුටුවූවාහු වෙත්. සසර ම ගැටෙන්නට සසර ම

ගැලෙන්නට කැමැති වෙත්. එයින් ගැලවී ගන්නට නො ද කැමැති වෙත්. බුදුරජාණන් වහන්සේ එබඳු සත්වයන් බලා ආලයරාමා, ආලයරතා, ආලයසම්මුදිතා යනු වදාළ සේක.

බුද්ධ-ධම්ම-සඞ්ඝ-සික්ඛා-පුබ්බන්ත-අපරන්ත-පුබ්බන්තාපරන්ත-ඉදප්පච්චයතාපටිච්චසමුප්පන්නධම්ම යන මේ අට තැන දැන එහි සැක දුරු කර සිටියේ **'අකථංකථී'** නම් වේ. **"අට්ඨවත්ථූනි යථාභූතං ජානිත්වා අට්ඨවත්ථුකාය විචිකිච්ඡාය නිබ්බිචිකිච්ඡං"** යනු අටුවා.[1]

**'අමත'** නම්: නිවන ය. මෙහි මරණයක් නැති බැවින් කෙලෙසුන්ට ප්‍රතිපක්ෂ බැවින් නැසීමක් නැති බැවින් නිවන අමත නම් විය. ඒ මේ නිවනට නැමී සිටියේ බැස සිටියේ **'අමතොගධ'** නම් 'අනුප්පත්තං' යනු කියන ලදී.

යමක්හට කිසි තැනෙක කිසි දැයෙක තෘෂ්ණා සඞ්ඛ්‍යාත ආලයෝ නැද්ද, යමෙක් බුද්ධාදිවස්තු අට, ඇති සැටියෙන් දැන කෙසේ කෙසේ දැ යි පැවැති සැකය මුළුමනින් තරණය කොට සිටියේ ද, මෙසේ තෘෂ්ණා රහිත වූ සැක නැත්තා වූ මගපල සිත් වලට අරමුණු කිරීම් විසින් නිවනට බැස නිවනට පැමිණි ඔහු බ්‍රාහ්මණ නම් වන්නේ ය.

**මහාමෞද්ගල්‍යායන මහාස්ථවිර වස්තුව නිමි.**

---

1. 1. 7. 'අනික්කසාවො' යනු බලනු.

# පින් පව් නැසූ රෙවත සාමණේරයන් වහන්සේ

## 26 — 29

මෙහි කතා පුවත **"ගාමෙ වා යදි වා රඤ්ඤෙ"** යි ආ ගාථා වර්ණනායෙහි විස්තර විසින් කියන ලදී. බුදුරජානන් වහන්සේ **පූර්වාරාමයෙහි** වැඩ වසන දවසෙක **භික්ෂූන්** වහන්සේලා ධර්ම සභාවට රැස් වී "අනේ! පුදුම යි, තෙරණුවන්ගේ ලැබීම, අනේ! පුදුම යි, තෙරණුවන්ගේ පිණ, එකලා වූවහු විසින් පන් සියයක් භික්ෂූන්ට පන්සියයක් කුළු ගෙවල් කරණ ලදැ"යි කතා කරන්නට වූහ. භික්ෂූන් කතා කරමින් හුන් තැනට වැඩම කළ බුදුරජානන් වහන්සේ "තමුසේලා කුමක් ගැණ කවරකු ගැණ කතා කරන්නහු දැ?"යි අසා වදාළ කල්හි "රෙවත තෙරණුවන් ගැණ ය"යි ඔවුහු කීහ. එතැන දී "මා පුතුට පිණෙකුත් නැත, පවෙකුත් නැත, ඒ තැන පින් පව් දෙක ම නසා සිටුනේ ය"යි වදාරා මේ ධර්මදෙශනාව කළ සේක.

**යොධ පුඤ්ඤඤ්ච පාපඤ්ච උභො සඞ්ගං උපච්චගා,**
**අසොකං විරජං සුද්ධං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං.**

මෙලොව යමෙක් පිණත් පවත් දෙක ද සඞ්ග ද ඉක්මවා ගියේ ද ශොක රහිත වූ පහ වූ රජස් ඇති පිරිසිදු වූ ඔහු, මම බමුණු යි කියමි.

**යො ඉධ පුඤ්ඤං ච පාපං ච උභො සඞ්ගං උපච්චගා** = මෙලොව යමෙක් පිණත් පවත් දෙක හා සඞ්ගත් ඉක්මවා ගියේ ද.

**අසොකං විරජං සුද්ධං තං අහං බ්‍රෑමි බ්‍රාහ්මණං** = ශොක රහිත වූ පහ වූ රජස් ඇති පිරිසිදු වූ ඔහු, මම බමුණු යි කියමි.

**'පුඤ්ඤ'** නම්, දානසීලචෙතනා ය. සිත් සතන් පිරිසිදු කරණ බැවිනි.[1] **'පාප'** නම්, **සත්වයා** සතර අපායයෙහි හෙළන ප්‍රාණඝාතාදි දුශ්චරිත ය.[2] **'සඞ්ග'** නම්, රාගද්වෙෂාදීහු ය. සංස්කාර යන් කෙරෙහි ඇලුම් කරවන බැවිනි.[3] මෙ කියූ පින් පව් සඞ්ග රහත් මග නුවණින් ඉක්මවා ගියේ ය, යනු **'උපච්චගා'** යන්නෙන් කිය වේ. 'උපච්චගා' යන මෙහි යෙදී සිටි **'උප'** යනු උපසර්ග යි. **සාමීප්‍ය-සාමර්ථ්‍ය-ව්‍යාප්ති-ආචාර්‍යයීකරණ - දෙෂාඛ්‍යාන - දාන දාක්ෂිණ්‍ය-විප්සා-ආරම්භ - පූජා - තද්ධර්ම - අධ්‍යයන - මරණ** යන අරුත්හි හෙන්නේ ය. මෙහි සිටියේ තද්ධර්මාර්ථයෙහි ය.

---

1. 4. 8. 'සතතබ්බං කුසලං' යනු බලනු.
2. 1. 10. 'පාපකාරී' ,, ,,
3. 13. 4. 'සබ්බී සඞ්ගා විජානතං' ,, ,,

මග නුවණින් නැසූ සොක ඇතියේ **අසොක**. මග නුවණින් නැසූ රාගාදී රජස් ඇතියේ **විරජ**. එහෙයින් හැමතින් පිරිසිදු වූයේ **සුද්ධ**. මේ තෙපදයෙන් නිවන කිය වෙන්නේ ය.

රහතුන් වහන්සේලා පින් කරතුදු අවිද්‍යාදී වූ කෙලෙස් නසා සිටි බැවින් උන්වහන්සේලාට පින් කරණ අවස්ථායෙහි උපදනා සිත් කුසල් සිත් නොව හුදෙක් ක්‍රියා සිත් ය. විපාක නැත්තේ ය. මේ ක්‍රියාසිත් ඒ ඒ කෘත්‍යසිද්ධ කිරීම් වශයෙන් මුත් විපාක ඉපද වීම් වශයෙන් නො පවත්නේ ය. **"තං තං කිච්චසාධනවසෙන පවත්තාපකරණමත්තමෙව හොති. තස්මා ක්‍රියාතිවුත්තං"** යනු අටුවා. තව ද මේ ක්‍රියාසිත් රහතුන්වහන්සේ හා පසේබුදුරජානන් වහන්සේ පිළිබඳ වේ. **"ඉදං චිත්තං අසෙක්ඛානං අසාධාරණං ඛීණාසවස්සෙව පාටිපුග්ගලිකං ඡසු ද්වාරෙසු ලබ්භති"** යනු අටුවා. එහෙයින් රහතුන්ට පින් පව් නැතැ යි වදළ සේක.

ධර්මදෙශනාවගේ අවසානයෙහි බොහෝ දෙන සෝවන් පලාදියට පැමිණියාහු ය.

**රේවත ස්ථවිර වස්තුව නිමි.**

# චන්ද්‍රාභ ස්ථවිරයන් වහන්සේ

## 26 — 30

**පෙර** බරණැස් නුවර වැසි වෙළෙන්දෙක් පිටිසර ගම්මානයකට ගොස් ගම්දෙර නවාතැන් ගෙණ එහි හැසිරෙණ ගොපළු කොළුවන් දැක උන් අතින් "දරුවෙනි! වන වැද කඳු පාමුල්හි වැඩපල කරණ කිසිවෙක් මෙ ගම වෙසේ ද?"යි ඇසී ය. උන් "වෙසේ ය"යි කී කල්හි "ඔහුගේ නම කුමක් ද?"යි ඇසී ය. නම කීහ. අනතුරු ව ඒ වන කැමියාගේ බිරිඳගේ හා දූ පුතුන්ගේ නම් ඇසී ය. ඔවුහු උන් හැම දෙනාගේ නම් ද කීහ. "ඔහුගේ ගේ තිබෙන්නේ කොහි ද?"යි ඇසූ විට ගේ තිබෙන තැනත් කීහ.

ඉක්බිති වෙළෙන්ද සැපපහසු ඇති රියෙක නැගී ගොපළු කොළුවන් කියූ මගසලකුණු අනුව ගොස් ඒ ගෙදෙරට පැමිණ රියෙන් බැස ගෙට ඇතුල් වී වන කැමියාගේ බිරියට නම කියා අඬ ගැසී ය. ඕ තොමෝ "කතා කරන්නේ නෑයෙක් වනැ"යි සිතා වහා එළියට බැස හිඳින්නට අසුනක් පිළියෙල කොට දුන්නී ය. වෙළෙන්ද එහි වාඩි වී ගෙයි ප්‍රධානයාගේ නම කියා "මාගේ යහළු කොහි ද?"යි ඇසී ය. වන කැමිබිරිය ඔහු වලට ගියබව කී කල්හි "කෝ පුතා, අසුවලා, කොහේ ද ගියේ?, දූ, ගියා කොතැනැ?"යි එහි හැම දෙනාගේ නම් කියමින් "මේ රෙදිපිළිත් මේ අබරණත් ඒ අපගේ දූ පුතුන්ට දෙන්න, මේ රෙදිපිළිත් අබරණත් මාගේ යහළුවාට දෙන්නැ"යි කියා වනකැමි බිරියට ද එසේ ම රෙදිපිළි හා අබරණ දුන්නේ ය. ඕ තොමෝ ඔහුට මහත් සේ සත්කාර කොට හිමියා ගෙට ආ කල්හි "හිමි! ඔබගේ මේ යහළුවා මෙහි ආ වේලෙහි පටන් අප හැමදෙනාගේ නම් කියමින් මේ මේ අයට මේ මේ රෙදිපිළි අබරණ බෙදා දෙන්නැ යි කියා මට දුන්නේ ය"යි කීවා ය. ඔහු ද එයසා ඔහුට සත්කාර කෙළේ ය.

එදා රෑ වෙළෙන්ද නිදන්නට ඇඳට නැග "යහළුව! වනයෙහි කඳුපාමුල වැඩ කරණ ඔබට එහි වැඩියක් දකින්නට ලැබුනේ මොන අන්දමේ ගස් කොළන් ද?"යි ඇසූ විට, "වැඩියක් මට දකින්නට ලැබුනේ රතු අතු හා රතු පැහැති කොළ ඇති ගස්වගයෙකැ"යි කී ය. "ඒ ගස් බොහෝ තිබේ ද?"යි ඇසූ විට 'ඔවු, එහි සැම තැන බොහෝ සෙයින් තිබෙන්නේ මේ ගස් ය"යි වන කැමියා කීයේ ය. "එසේ නම් ඒ ගස් හෙට මට පෙන්වාලව"යි කී කල්හි දෙ දෙනා ම පසුදා නින්දෙන් නැගිට කා බී වනයට ගියහ. එහි දී වනකැමි ඔහුට ඒ ගස් පෙන්වාලී ය. වෙළෙන්ද ඔහු සමග ම ඒ රත්සඳුන් ගස් කපා අතුපතර කොළ සැස දමා කඳන්

සියල්ල ගැල් පන් සියයෙක පටවා ගෙණ එනුයේ "යහළුව! මාගේ ගෙය බරණැස් නුවර අසුවල් තැන ය, කලින් කල ඉඩ පහසු ඇති විට එහි එන්න, එන විට කෑම් බීම් ඇඳුම් කැඩුම් කිසිවක් ගෙණෙනු වුවමනා නැත, කැමැති නම් කරදරයෙක් නො වේ නම් රතුකොළ ඇති මේ ගස් කිහිපයක් කපා දඬු පමණක් ගෙණ එන්නැ"යි කියා ගියේ ය. වන කැමි ද "යහපතැ"යි අතරතුරෙහි එහි යන්නේ රත්සඳුන් දඬු ගෙණ ගොස් ඔහුට දෙන්නේ ය. වෙළෙන්ද ඒ පිණිස වනකැමියාට සෑහෙන පමණින් බොහෝ මිලමුදල් ද දෙන්නේ ය.

ඉන් මෑතකාලයෙහි කසුප් බුදුරජුන් පිරිනිවි කල්හි බරණැස් නුවර වැසි සැදැහවත් මිනිස්සු උත්වහන්සේ ගේ ධාතු වඩා රත් දාගැබක් ගොඩ නැගූහ. එ දවස ඒ වනකැමි බොහෝ සඳුන් දඬු ගෙණ බරණැස තම යහළුවාගේ ගෙට ගියේ ය. වෙළෙන්ද තම යහළු පිළිගෙණ සත්කාර කොට ඒ ගෙණ ආ සඳුන් දඬු කුඩා කැබලි කොට කපා අඹරවා පාත්‍රයක් පුරවා "යහළු! එන්න, බත් පිසනතුරු දාගැබ වෙත ගොස් වැඳුම් පිදුම් කොට එමු"යි ඔහු ද කැඳවා ගෙණ දාගැබ වෙත ගියේ ය. ගොස් සඳුන් කල්කයෙන් දාගැබ පිදී ය. වනකැමි ද දාගැබ මැද සඳුන් කල්කයෙන් සඳමඬලක් කොට එයින් දාගැබ පිදූයේ ය. වනකැමියා කළ එක් ම පින්කම මෙපමණ ම වී ය. වනකැමි, මේ පින්කම කොට මඳ කලක් ගෙවා කළුරිය කොට දෙව්ලොව ඉපද එක් බුද්ධාන්තරයක් දෙව්සැප විඳ මේ බුද්ධොත්පාදයෙහි රජගහනුවර බ්‍රාහ්මණමහාසාරකුලයෙහි ඉපද ගත්තේ ය. උපන් ද සිට ඔහුගේ පෙකෙණියෙන් සඳමඬල සේ රැස් විහිදෙන්නට වන. එහෙයින් ඔහුට මවුපියෝ චන්‍ද්‍රාභ යි නම් කළහ. මේ සඳරැස් විහිදීම වනාහි, එද ඔහු සඳුන් කල්කයෙන් සඳමඬලක් වැනි මණ්ඩලයක් කොට රත්දාගැබ පිදීමෙහි අනුසස් විසින් නිපන්නේ ය.

ඉක්බිති බමුණෝ මෙය දැන "අපට මූ ගෙණ ගොස් පෙන්වා ලොව රවටා කන්නට හැකි ය"යි සිතා මවු පියන්ට කරුණු කියා තරමක් වැඩී සිටි එ දරු ගෙණ යානයෙක හිඳුවා "යමෙක් මෙ දරුගේ සිරුර පහසන්නේ නම් හෙ තෙමේ මෙබඳු මෙබඳු මහත් යසිසුරු ලබන්නේ ය" යි කියමින් තැන තැන හැසිරෙන්නට වූහ කහවණු සියයක් දහසක් දුන්නෝ ම මොහුගේ සිරුර පහසන්නට අවසර ලැබූහ. මෙසේ කියමින් හැසිරෙණ බමුණෝ සැවැත් නුවරට ගොස් නුවරටත් දෙව්රම් මහවෙහෙරටත් අතර තැනෙක නවාතැන් ගත්හ. සැවැත් නුවර වැසි පස් කෙළක් පමණ ආර්‍ය්‍ය ශ්‍රාවකයෝ පෙරවරුයෙහි දන් දී පස්වරුයෙහි සුවඳමල් රෙදිපිළී

බෙහෙත් පිරිකර ගෙණ බණ අසන්නට විහාරයට යත්තෝ ය. එසේ යන ඔවුන් දුටු බමුණෝ "මේ කො තැන යන්නහු?" යි අසා "බණ අසන්නට බුදුරජුන් වෙත යමු"යි ඔවුන් කී කල්හි "මෙහාට එනු මැනැවි, ඔගේ යැමෙන් වැඩෙක් නැත, අපගේ චන්‍ද්‍රාභ බමුණු කුමරුන්ගේ ආනුභාවය තරම් ආනුභාවයෙක් කාහටත් නැත, මේ කුමරුන්ගේ සිරුර පහස්නෝ මේ මේ යසිසුරු ලබති, එහෙයින් ඇවිත් බලවු"යි කීහ. එයසා ආර්‍ය්‍ය ශ්‍රාවකයෝ "බොරු නො කියවු, තොපගේ බමුණු කුමරුගේ ආනුභාවය අපි දනිමු, එය අප බුදුරජුන්ගේ ආනුභාවය ඉදිරියෙහි කද්‍යෝපැණියකුගේ ආනුභාවය තරම් ය, එය ඔය කියන තරමේ ආනුභාවයෙක් නො වේ, බුදුරජානන් වහන්සේගේ ආනුභාවය ඉතා මහත් ය"යි කීහ. මෙසේ විවාදයට වැටුනු ආර්‍ය්‍යශ්‍රාවක-බ්‍රාහමණ දෙපක්‍ෂයෙහි වූවෝ තම තමන්ගේ හැඟීම්, පිළිගැණීම් උනුන් ලවා ගන්වන්නට නො හැකි ව චන්‍ද්‍රාභබ්‍රාහමණ කුමරුන්ගේ හා බුදුරජුන්ගේත් ආනු-භාවය බලමු"යි චන්‍ද්‍රාභයන් ද ගෙණ විහාරයට ගියහ. බුදුරජානන් වහන්සේ උන් තමන් වහන්සේ වෙත ලං ලං වත් ම චන්‍ද්‍රාභයන්ගේ සඳරැස් අතුරුදහන් කළ සේක. චන්‍ද්‍රාභ, බුදුරජුන් ඉදිරියෙහි අඟුරු පසෙක උන් කවුඩකු මෙන් ශොභා රහිත වූයේ ය. ඉක්බිති බමුණෝ, කුමරු බුදුරජුන් වෙතින් අන් තැනකට ගෙණ ගියහ. ඉන්පසු චන්‍ද්‍රාභගේ ශොභාව නැවැත නැගී ගත. නැවැත වරකුත් බුදුරජුන් වෙතට ඔහු ගෙණ ආහ. ඒ වරත් ශොභාව නැසී ගියා ය. මෙසේ බුදුරජුන් ඉදිරියෙහි තමන් සිටිනා කල්හි තමන්ගේ ශොභාව නැසී යන බවත් බුදුරජුන් ඉදිරියෙන් බැහැර ගිය කල්හි ශොභාව නැගී සිටුනා බවත් තෙවරක් ම දුටු චන්‍ද්‍රාභ තෙමේ "මේ තෙමේ සඳරැස් අතුරුදහන් කිරීමෙහි මන්ත්‍රයක් දන්නේ වනැ" යි සිතා "කිම, තමුන්නාසේ මාගේ ශොභාව අතුරුදහන් කිරීමට මන්ත්‍රයක් දන්නහු ද?"යි ඇසී ය "ඔවු, දනිමි"යි බුදුරජුන් වදාළ කල්හි "එසේ නම් එය මටත් දෙනු මැනැවැ" යි ඉල්ලී ය. නො පැවිදියනට ඒ මන්ත්‍රය දිය නො හැකි ය" යි වදාළ කල්හි චන්‍ද්‍රාභ තෙමේ "මේ මන්ත්‍රය ගත හොත් මම දඹදිව සියල්ලන් අබිබවා සිටින්නෙමි, දඹදිව ශ්‍රෙෂ්ඨයා වන්නෙමි, ඒ නිසා තමුන්නාසේලා මා මන්ත්‍රය ඉගෙණ ගන්නා තුරු දවස් කිහිපයක් මෙහි කො තැනක හෝ නවාතැන් ගෙණ සිටිවු, මම දවස් කිහිපයකින් මන්ත්‍රය උගන්නෙමි" යි බමුණන්ට කියා බුදුරජුන් වෙත ගොස් පැවිද්ද ලබා උපසපන් ද වූයේ ය. ඉක්බිති ඔහුට කායගතාසති කමටහන උගන්වා වදාළ සේක. ඔහු "මේ කිමැ?" යි විචාළ කල්හි "මෙය මන්ත්‍රයට පිරියම් ය, පළමු කොට මෙය උගත යුතු ය, මෙය නො උගන්නහුට මන්ත්‍රය නො පිහිටා"යි වදාළ සේක. බමුණෝ ද

අතරතුර ගොසින් "මන්ත්‍රය උගන්නෙහි දැ?"යි ඔහු විචාරන්-
නෝ ය. චන්ද්‍රාභ ද "තවම නො උගත්තෙමි"යි කියමින් කමටහන්
වඩනුයේ කිහිප දවසක් යත් ම රහත් බවට පැමිණියේ ය. නැවැතත්
බමුණන් අවුත් "මන්ත්‍ර උගත්තේ දැ? යි විචාළ කල්හි "ඔවු, මන්ත්‍ර
උගතිමි, තෙපි යවු, මම මෙහි ම රැඳෙමි, මෙ තැනින් නො යන
සැහැවි ඇතියෙමි වීමි" යි චන්ද්‍රාභ කීයේ ය. එය අසා සිටි භික්ෂූන්
වහන්සේලා බුදුරජුන් වෙත ගොස් "ස්වාමීනි! චන්ද්‍රාභ බොරු කියා
තමන් රහත් යි හඟවන්නේ ය" යි සැලකළ කල්හි බුදුරජාණන්
වහන්සේ "මහණෙනි! ඇසි, තමුසේලා එසේ කියහු? මේ දූත්,
මා පුත් චන්ද්‍රාභගේ තෘෂ්ණාව මුළුමනින් ක්ෂය ව ගියා ය. මොහු
කියනුයේ සැබවක් මැ"යි වදාරා මේ ධර්මදෙශනාව කළ සේක.

**චන්දංව විමලං සුද්ධං විප්පසන්නමනාවිලං,**
**නන්දීභවපරික්ඛීණං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණන්ති.**

පුන්සඳ මෙන් නිර්මල වූ පිරිසිදු වූ වෙසෙසින් පහන් වූ නො
කැළඹුනා වූ භවයෙහි සතුට දන වන තෘෂ්ණාව ක්ෂය කළා වූ ඔහු,
මම බමුණුයි කියමි.

**චන්දං ඉව විමලං සුද්ධං විප්පසන්නං අනාවිලං** = පුන්සඳ මෙන්
පිරිසිදු වූ වෙසෙසින් පහන් වූ නො කැළඹුනා වූ.

සඳ නිර්මල වනුයේ වලාපටල, පින්න, දුම්, රජස්, රාහු යන
උවදුරු පසින් වෙන්වීමෙනි. ඒ මේ වලාපටලාදියෙන් මිදුනු
සඳ සේ මිදී සිටියේ මලරහිත වූයේ **විමල** ය. කෙලෙස් කිලිටි
පහව ගියේ **සුද්ධ ය.** එහෙයින් ම පහන් සිතැතියේ **විප්පසන්න ය.**
කෙලෙස් මඩ බොර නැති බැවින් නො කැළඹුනු සිතැතියේ
**අනාවිල** ය.

**නන්දීභවපරික්ඛීණං තං අහං බ්‍රෑමි බ්‍රාහ්මණං** = භවයෙහි සතුට
දන වන තෘෂ්ණාව ක්ෂය කළා වූ ඔහු, මම බමුණු යි කියමි.

**'නන්දි'** නම්, තෘෂ්ණා ය. භවයෙහි ඇලීම උපදවන බැවිනි.
සත්වයා භවයෙහි අලවන්නී තෘෂ්ණා ය. එය තෘෂ්ණාවෙහි එක්තරා
ගති විශෙෂයෙකි. **භවපත්ථනා** යනු ද මෝ ය.[1] භවය, කාමභව
රූපභව – අරූපභව විසින් තෙවැදෑරුම් ය. ඒ මේ භවයෙහි ඇලීම
**'නන්දීභව'** නම්. නන්දීභවය ක්ෂය කෙළේ **නන්දීභවපරික්ඛීණ.**

තෘෂ්ණාව **'නන්දි'**යි කියනු ලබන්නී කාම – රූප – අරූප–
භවයන්හි සත්වයා අලවන බැවිනි. භවයෙහි සත්වයා ඇලී සිටිනුයේ

1. 14. 6. 'දුක්ඛසමුප්පාදං' යනු බලනු.

යම් ශක්තියකින් නම් ඒ අභීය ගෙණ තෘෂ්ණාව නන්දී නම් වූ ය. එක් අරමුණෙක්හි එක් වරක් උපන් තෘෂ්ණාව නන්දී යි ද නැවැත නැවැත උපන් තෘෂ්ණාව නන්දිරාග යි ද කියනු ලැබේ. මේ අටුවා:- **"යස්මා කස්මාචි ගවෙසනතා සත්තා එතාය නන්දන්ති සයං වා නන්දතීති නන්දි, තස්මිං එකස්මිං ආරම්මණෙ සකිං උප්පන්නතා-තණ්හා නන්දි, පුනප්පුනං උප්පජ්ජමානා නන්දිරාගොති වුච්චති"** යනු. නන්දී යන මෙයින් රූප-ශබ්ද-ගන්ධ-රස-ස්ප්‍රෂ්ටව්‍ය යන අරමුණු කෙරෙහි උපන් තෘෂ්ණාව රූපනන්දී - සද්දනන්දී-රසනන්දී-ගන්ධ නන්දී-ඵොට්ඨබ්බනන්දී යි ද වෙන් වෙන් කොට ද දක්වන ලද ය. මේ අටුවා:- **"රූපාදීසු වා ආරම්මණෙසු තත්‍ර තත්‍ර අභිනන්දිනී රූපාභිනන්දිනී සද්ද-ගන්ධ-රස-ඵොට්ඨබ්බාභිනන්දිනීති අත්ථො, තත්‍ර තත්‍ර අභිනන්දිනීපි පාඨො"** යනු.

තවද සමහර තැනෙක නන්දී යන මෙයින් සුඛසංඥා - ආත්ම - සංඥා හා තෘෂ්ණාසම්ප්‍රයුක්තදෘෂ්ටිය ද ගණු ලැබේ.

වලාපටලාදියෙන් මිදුනු නිර්මල වූ පූර්ණචන්ද්‍රයා සේ කෙලෙස් මල මුදලූ බැවින් නිර්මල වූ සිත් ඇති සියලු කෙලෙස් කිලිටි පහකළ බැවින් පිරිසිදු වූ සිත් ඇති එහෙයින් වෙසෙසින් ම පහන් වූ සිත් ඇති කෙලෙස් කිලිටි නැති බැවින් නො කැළඹුනු සිත් ඇති ඔහු, බ්‍රාහමණ නම් වන්නේ ය.

ධර්මදෙශනාවගේ අවසානයෙහි බොහෝ දෙන සෝවන් පලා-දියට පැමිණියාහු ය.

**චන්ද්‍රාභස්ථවිරසත්‍ව නිමි.**

# සීවලි මහාස්ථවිරයන් වහන්සේ

## 26 — 31

**සුප්පවාසා** නම් කොලිය දුවනි තොමෝ එක් අවස්ථායෙක සත් අවුරුදු සත් මස් සත් දවසක් දරු ගැබ උසුලා ගෙණ සත් දවසක් ම මූළ්‍ලා වූ දරු ගැබි ඇතියා තියුණු වූ රළු වූ දුක් වෙදනා වෙන් පෙළෙන්නට වන. එසේ දුකෙන් පෙළුනු ඕ තොමෝ "යම් උතුමෙක් මෙබඳු දුක් දුරු කිරීමට දහම් දෙසා ද, ඒ භාග්‍යවත් තෙමේ එකාන්තයෙන් සම්‍යක් සම්බුද්ධ ය, යමෙක් මෙබඳු දුක් දුරු කිරීම පිණිස පිළිපන්නේ ද ඒ භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සඞ්ඝ තෙමේ ද එකාන්තයෙන් සුප්‍රතිපන්න ය, යම් තැනෙක මෙබඳු දුකෙක් නො වේ ද, ඒ මේ නිවන එකාන්තයෙන් සුඛය,යි මේ ත්‍රිවිධ විතර්කයෙන් දුක් ඉවසමින් තම හිමියා බුදුරජුන් වෙත යැවූ ය. ඔහු, බුදුරජුන් වෙත ගොස් "ස්වාමීනි! මා මේ බුදුරජුන් වඳිනු සුප්පවාසාවගේ වචනයෙනැ" යි බුදුරජුන් වැඳ පසෙකට වී හුන්නේ ය. එකල්හි බුදුරජානන් වහන්සේ "සුප්පවාසා තොමෝ සුව ඇතියා වේවා, සුව ඇතියා නීරොග පුතු බිහි කෙරේවා" යි වදාළ ඇසිල්ලෙහි ම සුව ඇතියා නීරොග ව හුන් පුතු බිහි කළා ය. ඉන් පසු සත් දවසක් බුද්ධ ප්‍රමුඛ මහාසඞ්ඝයා වහන්සේට මහදන් දුන්නී ය. පුත් කුමරු ද උපන් දා සිට ධබරාව ගෙණ සඞ්ඝයා වහන්සේට පැන් පෙරා පිළිගැන් වී ය. පසුකාලයෙහි ගෙන් නික්ම පැවිදි ව රහත් වූයේ ය.

දවසක් දම්සබාවට රැස් වූ භික්ෂූන් වහන්සේලා "ඇවැත්නි! බලනු මැනැවි, මේ මහණ රහත් වන්නට හෙතු සම්පත් ඇති ව සිටියේ ද, මෙතෙක් කල් මවුකුස විඳි දුක ඉමහත් ය, කියනු බැරි දුකක් මවු කුසෙහිදී මොහු වින්දේ ය, කෙතරම් දුකෙක් මේ මහණහු විසින් ගෙවා දමන ලද දැ" යි කතා කරන්නට වූහ. ඒ අතර දම්සබාවට වැඩම කළ බුදුරජානන් වහන්සේ "මහණෙනි! තමුසේලා මෙහි කුමක් ගැණ කතා කරහු දැ?" යි විචාරා "සුප්ප-වාසා පුත් මහණහු ගැණ ය"යි කී කල්හි "මහණෙනි! ඔවු, මාපුත් මේ මහත් දුකින් මිදී දැන් නිවන් ලබා සිටී ය"යි වදාරා මේ ධර්‍ම දෙශනාව කළ සේක.

**යො ඉමං පළිපථං දුග්ගං සංසාරං මොහමච්චගා,**
**තිණ්ණො පාරගතො ඣායී අනෙජො අකථංකථී,**
**අනුපාදාය නිබ්බුතො තමහං බ්‍රෑමි බ්‍රාහ්මණන්ති.**

යමෙක් මේ මඩ සහිත මග ද දුර්ගය ද සසර ද මොහය ද ඉක්මවා ගියේ ද එතෙර වූයේ ද පරතෙරට ගියේ ද ධ්‍යාන කරන්නේ ද

තෘෂ්ණා නැත්තේ ද කිසිවක් දැඩි ව නො ගෙණ නිවුනේ ද ඔහු, මම බමුණු යි කියමි.

**යො ඉමං පලිපථං දුග්ගං සංසාරං මොහං අච්චගා** = යමෙක් මේ මඩ සහිත දුර්ගයත් සසරත් මෝහයත් ඉක්මවා ගියේ ද.

ගොහොරු මඩ සහිත මග **'පලිපථ'**යි කියනු ලැබේ. **පලිපපථ** යන මෙහි මැද සිටි පකාරය නිරුක්ත විධියෙන් ලොප් ව ගොස් 'පලිපථ' යි සිටියේ ය. නො යා හැකි තැන් **දුග්ග.**[1] චුතිපටිසන්ධි වශයෙන් ස්කන්ධාදීන්ගේ පැවැත් ම **සංසාර.**[2] සිවු සස් දහම් දැනීමට ඉඩ නො දෙන මග අවුරණ සත්වයන් අරමුණෙහි ලා මුලා කරණ ශක්තිය **මොහ.**[3]

**අච්චගා** = 'ඉක්මවා ගියේ' යන අරුත්. **'අගා'** යනු හා එක් ව සිටි **'අති'** යනු උපසර්ග යි. එය, **අතිශය–භෘශ–වික්‍රාන්ත–අතික්‍රමණ – වෘද්ධි** යන අරුත්හි එන්නේ ය. මෙහි අතික්‍රමණාර්ථයෙහි නැගී සිටියේ ය.

**තිණ්ණො පාරගතො ඣායී අනෙජො අකථංකථී** = එතෙර වූයේ පරතෙරට ගියේ ධ්‍යාන කරන්නේ තෘෂ්ණා නැත්තේ සැක නැත්තේ.

කාමෞඝාදිචතුර්විධ ඕඝයෙන් එතෙර වූයේ **තිණ්ණ.**[4] නිවන් නැමැති පරතෙරට ගියේ **පාරගත.**[5] ආලම්බනොපනිධ්‍යානලක්ෂණොපනිධ්‍යාන යන දෙවැදෑරුම් ධ්‍යානයෙන් ධ්‍යාන කරණුයේ **ඣායී.**[6] **'එජා'**යි තෘෂ්ණාවට නමෙකි. සත්වයන් ඒ ඒ භවයෙහි උපතට ඇදලන බැවින් හා සත්වයන් අරමුණෙහි කම්පිත කරණ බැවිනි. ඒ **තෘෂ්ණාසඞ්ඛ්‍යාතඑජාව** මුළුමනින් නසා සිටියේ **අනෙජ.** බුද්ධාදී වූ අට තැන කෙසේ කෙසේ දැයි පැවති සැක නැතියේ **අකථංකථී.**[7]

**අනුපාදාය නිබ්බුතො තං අහං බ්‍රූමි බ්‍රාහ්මණං** = (යමෙක්) කිසිවක් දැඩි ව නො ගෙණ නිවුනේ (ද) ඔහු, මම බමුණු යි කියමි.

---

1. 23, 6. 'දුග්ග' යනු බලනු.
2. 5, 1. 'දීඝො බාලානං සංසාරො' " "
3. 1, 7. 'අතික්කන්තසාවො' " "
4. 2, 3. 'යං ඔඝො නාභිකීරති' " "
5. 14. 6. 'දුක්ඛස්ස ච අතික්කමං' " "
6. 2, 1. 'තෙ ඣායිනො' " "
7 26, 28. 'අනුපාදාය අකථංකථී' " "

කාම - දිට්ඨි - සීලබ්බත - අත්තවාද යන උපාදානයන්, දැඩි ව ගැණුම්, මුළුමනින් නසා ලූ බැවින් කිසිම සංස්කාරයක් 'මම ය, මාගේ ය' යි නො ගෙණ ක්ලේශ පරිනිර්වාණයෙන් පිරිනිවියේ **අනුපාදායනිබ්බුත.**[1]

දැඩි ව ගැණීම **'උපාදාන'** නම්. රූප-ශබ්දාදි අරමුණු දැඩි ව ගැණීම් වශයෙන් එහි රස විඳීම කළ බලවත් වූ තෘෂ්ණාව කාමූපාදානය යි.

පින් පව් දෙක්හි ඵලවිපාක නැත, මහායාගාදියෙහි ඵලවිපාක නැත, අමතා දීමෙහි ඵලවිපාක නැත, යනාදීන් විසින් ගත් දැඩිගැණීම දිට්ඨුපාදානය යි.

ශීලයෙන් ශුද්ධිය වේ, ව්‍රතයෙන් ශුද්ධිය වේ, ශීල ව්‍රතයෙන් ශුද්ධිය වේ, යි දැඩිව ගැණීම සීලබ්බතුපාදාන ය යි.

රූපය ආත්ම වශයෙන් බලයි, ආත්මය රූපවත් ය යි බලයි ආත්මයෙහි රූපය පිහිටියේය යි බලයි, රූපයෙහි හෝ ආත්මය වේ ය යි බලයි, යනාදී ලෙසින් දැඩිව ගැණීම අත්තවාදූපාදාන ය යි. යට කියන ලද්දේ ය. මෙ කියූ උපාදානයන් මුළුමනින් නසා ලූයේ 'අනුපාදායනිබ්බුත නම් වේ.

යමෙක් රාගාදී කෙලෙස් මඩ සහිත වූ මාර්ගය ද, කෙලෙස් නැමැති දුර්ගය ද ස්කන්ධධාතු ආයතනයන්ගේ පටිපාටිය යි කියූ සංසාරය ද සත්වයන් අරමුණෙහි මුළා කරන්නා වූ මෝහය ද ඉක්මවා ගියේ ද, චතුරෝඝයෙන් එතෙර වූයේ ද, නිවනට පැමිණියේ ද, ධ්‍යාන කරන්නේ ද, තෘෂ්ණා රහිත වූයේ ද, සැක නැත්තේ ද, උපාදාන විසින් 'මම ය, මාගේ ය' යි නො ගෙණ කෙලෙස් පිරිනිවීමෙන් පිරිනිවියේ ද, ඔහු බ්‍රාහ්මණ නම් වන්නේ ය.

ධර්මදේශනාවගේ අවසානයෙහි බොහෝ දෙන සෝවත්පලාදි-යට පැමිණියාහු ය.

**සීවලිස්ථවිර වස්තුව නිමි.**

1. 1, 14. 'අනුපාදියනො' යනු බලනු

# සුන්දරසමුද්ද තෙරුන්ට වෙසඟනක කියූ කපට බස්

## 26 — 32

**සැවැත්** නුවර සතළිස් කෙළක් පමණ මහත් ධනසම්පත් ඇති කුලයෙක **සුන්දරසමුද්ද** නම් කුලපුත්‍රයෙක් වී ය. ඔහු දවසෙක පස් වරුයෙහි සුවඳමල් ගෙණ බණ අසන්නට දෙව්රම් මහවෙහෙරට යන ජනසමූහයක් දුටුයේ ය. දැක "මේ අය සුවඳමලුත් ගෙණ කොතැනක යෙත් ද?"යි ඇසී ය. ඔවුන් "බණ අසන්නට බුදුරජුන් වෙත යමු" යි කී කල්හි "මමත් යමි" යි ඔවුන් කැටුව දෙව්රමට ගොස් පිරිස් කෙළවර හිඳ ගත්තේ ය. එ කල්හි බුදුරජාණන් වහන්සේ ඔහු දැක ඔහුගේ අදහස් බලා අනුපිළිවෙළ කතාව වදාළ සේක. එය අසා සුන්දර සමුද්ද "දෙවූ සකක් වැනි පිරිසිදු වූ බඹසර හැසිරෙන්නට ගිහියකුට මොනලෙසකිනුත් නො හැකි ය" යි පැවිදිවීමෙහි තර අදහස් ඇතියේ බණ පිරිස නැගී ගිය කල්හි බුදුරජුන් වෙත ගොස් පැවිද්ද ඉල්ලා සිටියේ ද, "තථාගත සම්බුදු-වරයෝ පැවිදිවීමට මවුපියන් විසින් නො අනුදත් දරුවන් පැවිදි නො කෙරෙති" යි අසා ගෙට ගොස් රට්ඨපාලාදිකුලපුත්‍රයන් මෙන් මහත් උත්සාහයෙන් පැවිදි වීමට අවසර ලබා ගත්තේ ය. ඉන් පසු ඔහු බුදුරජුන් වෙත ගොස් පැවිදි ව උපසම්පදාව ලබා "මට මෙහි විසීමෙන් වැඩෙක් නො වේ ය"යි එතැනින් නික්ම රජගහානුවරට ගොස් එහි පිඬු සිඟා වළඳමින් කල් ගෙවූයේ ය.

සුන්දර සමුද්ද තෙරුන්ගේ මවුපියෝ සැවැත් නුවර එක් උත්සව දිනයෙක වටිනා ඇඳුම් කැඩුම් ආයිත්තම් ලා සැරසී සැණකෙළි කෙළනා ඔහුගේ යහළු කුමරුන් දැක "අනේ! අපගේ පුතුට මේ මහත් වාසනාව නැතැ" යි සිතා හඬන්නට වූහ. එ වේලෙහි වෙසඟනක් තෙරුන්ගේ හඬන මව දැක "මැනියෙනි! ඇයි කුමක් නිසා හඬා ද?"යි විචාළා ය. "ගෙය හැර ගිය මා පුතු සිහිවී හඬමි"යි කී විට වෙසඟන "ඔහු දැන් කොහි ද?" යි අසා "භික්ෂූන් වෙත පැවිදි වී ය" යි කී කල්හි ඔහු සිවුරු හරවාගෙණ එනු නරක ද?" යි මවගෙන් ඇසුවා ය. "කළ හැකි නම් හොඳ යි, කළ හැකි නො වේ, ඔහු එයට කැමැති නැත, ඒ නිසා ය මෙහි නො සිට රජගහා නුවරට ගියේ" යි කීවිට "අම්මාට එය බරෙක් නො වේ, මම ඔහු සිවුරු හරවා ගෙණ එන්නෙමි, හොඳ යි, මා එසේ කළොත් අම්මා මට කරණ සඞ්ග්‍රහය කුමක් ද යි කියව"යි කීවා ය. "සිවුරු හරවා ගෙණ ආවොත් ඔහු තිට සැමියා කොට මේ ගෙයි ඇති හැම දෙයක් පාවාදෙමි" යි කී විට එසේ නම් "ඒ පිණිස මග වියදම්

දෙව’’ යි මගවියදම් ඉල්ලා ගෙණ රජගහා නුවරට ගියා ය. ගොස් සුන්දරසමුද්‍ද තෙරුන් පිඬු සිඟා යන කඩපලෙහි නවාතැනට ගෙයක් ගෙණ එහි නැවතුනී ය. පසුදා උදෑසන ම මිහිරි අහරක් පිළියෙල කොට තෙරුන් පිඬු සිඟා එනු බලා සිටියා උන්වහන්සේ එහි ආ කල්හි එය පිළිගැන්නූ ය. සුන්දරසමුද්‍ද තෙරණුවෝ එය පිළිගෙණ තමන් වසන ආවාසයට ගියහ. මෙසේ කිහිපදවසක් ගිය කල්හි “ස්වාමීනි! මෙහි ම හිඳ වළඳනු මැනැවැ’’යි උන්වහන්සේගේ පාත්‍රය ගත්තා ය. උන්වහන්සේ ද ඇයට පාත්‍රය දුන්හ. එවිට වෙසඟන “ස්වාමීනි! පිඬුසිඟා ගෙණ අවුත් මෙහි ම හිඳ වළඳනු මැනැව, මෙහි නැවතී පිඬුසිඟා යෑමත් පහසු ය, එහෙයින් මෙහි ම රැඳී ගත මැනැවැ’’යි කියා ගෙයි පිටත පිළෙහි අසුන් පිළියෙළ කොට දී හිඳුවා වළඳවන්නට වූ ය. මෙසේ කොට ටික දවසක් ගිය තැන ඕ තොමෝ කෙළ ඇවිදුනා කුඩා කොල්ලන් ගෙන්වා ඔවුන්ට කැවුම් පෙවුම් දී “දරුවෙනි! අප ගෙයි පිටත පිළෙහි හිඳ වළඳනා තෙරුන් පිඬු සිඟා ගෙණ අවුත් පිළෙහි හිඳ වළඳන වේලෙහි මෙහි අවුත් මා එපා ය යි කියද්දීත් මාගේ ඒ වළකාලීම ගණනට නො ගෙණ පිළ අසල මිදුලෙහි සෙල්ලම් කරමින් දූලි නංවාලවු’’යි කොල්ලන්ට කීවා ය. ඒ කොල්ලෝ පසුදා වෙසඟන කී ලෙසට තෙරුන් පිටත පිළෙහි හිඳ වළඳන වේලෙහි ඇය වළකාලන කල්හිත් එහි සෙල්ලම් කරමින් දූලි නැගූහ. පසුදා ඕ තොමෝ “ස්වාමීනි! මේ කොල්ලෝ මාගේ කීම නො සලකා මෙහි සෙල්ලම් කරමින් දූලි නගන්නාහ, පිළ හිඳ වළඳනු නො හැකි ය, මෙහි ගෙට ඇතුල්ව හිඳ වළඳනු මැනැවැ’’යි ගෙයතුළට ගෙණ වැළඳ වූ ය. නැවැත කොලුවන්ට කෑම් බීම් දී සඞ්ග්‍රහ කොට “තෙපි මා එපා, එපා,යි වළකනවිටත් එය නො සලකා තෙරුන් වළඳන වේලෙහි මහහඬ නගමින් එහා මෙහා දුව පනිමින් සෙල්ලම් කරවු’’යි ඔවුනට නියම කළා ය. කොල්ලෝ එසේ දුව පනිමින් මහහඬ නැගූහ. එයට පසු වෙසඟන “ස්වාමීනි! මෙය මහත් ගැහැටෙක්, මෙතැන හිඳ ද වළඳනු අපහසු ය, කොල්ලෝ කිසිත් නො සලකා අරගල කරන්නාහ, ස්වාමීනි! උඩුමාලටවත් යමු දැ’’යි කියා තෙරුන් කැඳවා ගෙණ උඩුමාලට යන ගමනේ තෙරුන් පෙරටු කොට, තොමෝ තෙරුන්ගේ පසු පස යමින් යටමාලෙහි දොරගුළු ලා තෙරුන් ගෙණ උඩුමාලට ඇතුල් වූ ය.

සුන්දරසමුද්‍ද ස්ථවිරයන් වහන්සේ සපදානචාරිකධුතාඞ්ගය උත්කෘෂ්ට වශයෙන් පුරන්නෝ ද රසතෘෂ්ණායෙහි බැඳුනෝ වෙසඟන බස් පිළිගෙණ එම ගෙයි සත්වන මාලට ම නැඟී ගත්හ. ඉන් පසු ඕ තොමෝ තෙරුන් වඩා හිඳුවා උන්වහන්සේ කියන බස් යට කොට කියන්නට පටන් ගත්‍ත. ඇඟපත අඹරන්නට පටන් ගත්‍ත.

විළිබිය හැර සිට ගතු. නටන්නට බෙර ගසන්නට අඬන්නට සිනාසෙන්නට මූණ බලන්නට උකුළ නටවන්නට රහසඟ පෙන්වන්නට කලවා පෙන්වන්නට තන බඩතුර පෙන්වන්නට කිසිලි දක්වන්නට ඇස් මරන්නට බැම ඔසොවන්නට තොල් ලොවින්නට දිව දික් කරන්නට දිව නටවන්නට හැඳිරෙදිකඩ ලිහන්නට තර කොට හඳින්නට හිසකේ උනන්නට හිසකේ බඳින්නට පටන් ගතු. මෙසේ ස්ත්‍රීමායම් දක්වමින් තෙරුන් ඉදිරියෙහි සිට,

"ලතුඹත් පා ඇති – වෙසඟන නැඟී මිරිවැඩි,
තෙර මට තිසි දහරහී – මම දහරිම් ය නට තිසි.

එබැවින පසු ව අපි – දිරූ සැරයට පිහිටැනී,
දෙ දෙන ම පැවිදි වෙමූ යි – කියූ තිරිමායම් පා"

යි මෙසේ කිවූ ය.

ඉක්බිති සුන්දරසමුද්ද තෙරුන්ට "අහෝ, කිසිවක් ගැණ නො සලකා මා කළ නපුර"යි මහත් සේ සංවේග උපන. ඒ මොහොතෙහි බුදුරජාණන් වහන්සේ පන් සාළිස් යොජනයක් ඈත්හි දෙව්රම් මහවෙහෙර වැඩහුන් සේක් මේ අරගලය දැක සිනා පහළ කළ සේක. ආනන්ද ස්ථවිරයන් වහන්සේ එ දැක "ස්වාමීනි! භාග්‍යවතුන් වහන්ස! කුමක් නිසා සිනා පහළ කළ සේක් දැ?"යි විචාළ කල්හි "ආනන්ද! මේ දැන් රජගහා නුවර සත්මහල් පහයෙක උඩ මාලෙහි සුන්දර-සමුද්ද මහණහුගේ හා වෙසඟනකගේ මහත් යුද්ධයෙක් වේ ය"යි වදාළ සේක. "ස්වාමීනි! එහි කාහට ජය වේ දැ? කාහට පරාජය වේ දැ?"යි ඇසූ කල්හි "සුන්දරසමුද්ද ජය ගන්නේ ය, වෙසඟන පැරද යන්නී ය"යි තෙරුන් ජය ගන්නා බව වදාරා එහි වැඩහුන් සේක් ම ආලොකධාරාවක විහිදුවා "මහණ! දෙ පරිදි වූ කාමයෙහි බලාපොරොත්තු නැති ව කාමයන් හැරදමා යන්නේ ය"යි වදාරා මේ ධර්ම දෙශනාව කළ සේක.

**යොධ කාමෙ පහාත්වාන අනාගාරො පරිබ්බජෙ,**
**කාමභවපරික්ඛීණං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණන්ති.**

මේ ලොකයෙහි යමෙක් කාමයන් පහ කොට හැර දූමූ ගෙය ඇතියේ පැවිදි වේ ද කාමයන් හා භවයන් ක්ෂය කොට සිටි ඔහු, මම බමුණු යි කියමි.

**යො ඉධ කාමෙ පහාත්වාන අනාගාරො පරිබ්බජෙ** = මේ ලොකයෙහි යමෙක් කාමයන් පහ කොට, හැර දූමූ ගෙය ඇතියේ පැවිදි වේ ද,

**'කාම'** නම්, වස්තුකාම ක්ලේශකාමයෝ ය. කාමරාගයට අරමුණු වූ රූප - ශබ්ද - ගන්ධ - රස - ස්ප්‍රෂ්ටව්‍ය යන මොවුහු වස්තු කාම නම්. සිත් ගන්නා රූපාදීන් අරමුණු කොට සිතේ නගිනා රාගය ක්ලේශ කාම නම්.[1] මෙ කියූ දෙවැදෑරුම් කාමයන්ගේ පහ කිරීම චතුර්ථ මාර්ගඥානයෙනි. එහෙයින් **'පහාතවාන'** යන්නෙහි අරුත් මාර්ගඥානයෙන් පහ කොට, නසාලා යනු යි.

**'අනාගාර'** නම්, ගෙය හැර ගියේ ය. **"අනාගාරොති පරිච්චත්තාගාරො"** යනු අටුවා. ගොවිකම්, ගෙරි රැකීම්, වෙළඳාම්, ධන සැපයීම් ආදී වූ ගිහියන් පිළිබඳ කටයුතු හැර සිටියේ 'අනාගාර'යි කියන ලදී. ඒ මේ ගෙරිරැකීම් ආදිය යම් තැනෙක නැත් ද එ තැන අනාගාර ය යි කියනු ලැබේ. පැවිද්ද යි.

**පරිබ්බජෙ** = පැවිදි වන්නේ ය. පැවිද්දට පැමිණි යන අරුත්. මෙහි **'වජෙ'** යනු හා එක් ව සිටි **'පරි'** යනු උපසර්ග යි. එය, **සමන්තතොභාව - ව්‍යාප්ති - දොෂාඛ්‍යාන - උපරම - භූෂණ - පූජා - වර්ජන - ආලිඞ්ගන - නිවසන - ශොක - වීප්සා** යන අරුත්හි එන්නේ ය. මෙහි ආයේ සමන්තතොභාවයෙහි ය.

**කාමභවපරික්ඛීණං තං අහං බ්‍රෑමි බ්‍රාහ්මණං** = කාමයන් හා භවයන් ක්ෂය කොට සිටි ඔහු, මම බමුණු යි කියමි.

වස්තුකාම - ක්ලේශකාමයනුත්, කාමභව - රූපභව - අරූප භවයනුත් ක්ෂය කොට සිටියේ **'කාමභවපරික්ඛීණ'** නම්.

මෙලොව යමෙක් වස්තුකාම - ක්ලේශකාමයන් නසා හැර දමා ශාසනිකයෙක් ව පැවිදි වේ ද, කාමාශා - භවාශා නසාලූ ඔහු බ්‍රාහමණ නම් වන්නේ ය.

ධර්මදෙශනාවගේ අවසානයෙහි සුන්දරසමුද්‍ර ස්ථවිරයන් වහන්සේ රහත්බවට පැමිණ සෘද්ධි බලයෙන් ගෙයි කැණිමඬල බිඳ අහසට නැග බුදුරජාණන් වහන්සේගේ ශ්‍රී ශරීරයට තුති පුද දෙමින් අවුත් බුදුරජුන් වැඳ සිටියහ.

ඒ අතර දම්සබා මඩුවෙහි භික්ෂූන් අතර "ජිව්හා විඥානයෙන් විඳිය යුතු වූ යම්තම් රසයක් නිසා ඇසිල්ලෙකින් නැසෙන්නට ගිය සුන්දරසමුද්‍ර බුදුරජනන් වහන්සේගේ පිහිට ලබා බුදුරජුන්ට පින් සිදු වන්නට යම්තමකින් බේරී ගත්තේ ය"යි කතාවක් උපන. එයැසූ බුදුරජනන් වහන්සේ "මහණෙනි! මම මොහුට පිහිට වූයෙම්

---

1. 6. 11. 'කාමෙ' යනු බලනු.

අද පමණක් නො වෙමි, පෙරත් මම රසතෘෂ්ණායෙන් බැඳුනු සිත් ඇති මොහුට පිහිට වූයෙමි"යි වදාළවිට එහි රැස්ව හුන් භික්ෂූන් වහන්සේලා "ස්වාමිනි! එය අපි නො දනිමු, එය අපට පැහැදිලි කරණ සේක්වා" යි ඇයැ ද සිටියහ.

ඉක්බිති බුදුරජානන් වහන්සේ,

අවසැ සඳරා ලමු – මිතුරැ සසගෙහි සඳරා,
ලමු වේය එ දෙකට වැඩි – ලමු වේ රසෙහි සඳරා.

සංජය උයන්පල් – ගෙයැසුරෙහි සිටි වාමුව,
බැඳගෙණ රස තණෙහි – තමන් වසයට ගත්තේ"

යනු විසින් එකක නිපාතයෙහි වාතමෘග ජාතකය විස්තර කොට "එ කල්හි වාතමෘග වූයේ මේ සුන්‍දරසමුද්‍ද ය, මේ ගය වදරා ඕහු නිදහස් කොට යැවූ රජුගේ ඇමැති වූ යෙමි මමැ" යි ජාතකය ගළපා වදාළ සේක.

සුන්‍දරසමුද්‍ද ස්ථවිර වස්තුව නිමි.

# ජටිල ස්ථවිරයන් වහන්සේ

**26 — 33** (1)

**යටගිය** දවස බරණැස් නුවර බෑ කෙලඹියෝ දෙදෙනෙක් එක් ව උක් හේනක් වැවූහ. දවසක් බාලසහෝදරයා උක්හේනට ගොස් උක්ගස් මෝරා තිබෙනු දැක "එකක් අය්යාට ය, එකක් මට ය" යි උක්ගස් දෙකක් කපා පැණි නො වැගිරෙණ ලෙසට කැපූ තැන කොළපත් තබා තද කොට බැඳ ගෙණ ආයේ ය. ඒ කාලයෙහි යන්ත්‍රයෙහිලා උක් මිරිකන සිරිතෙක් නො වූයේ ය. උක්ගස මුලින් හෝ අගින් කපා කැපූ කොන් යටි හුරු කොට අල්ලා ගත් කල්හි ධමරායෙන් වැගිරෙණ දියක් සේ උක්රොඩු පමණක් ඉතිරි කොට උක්පැණි වැගිරෙන්නේ ය. කෙලෙඹි, හේනෙන් කපා ගත් උක්ගස් දෙක බැඳ ගෙණ මග බැස එන වේලෙහි **හිමාලය** වනයෙහි **ගන්ධමාදන** පර්වතයෙහි **නන්දමූලක** ලෙන වසන පසේබුදු කෙනෙක් සමාපත්තියෙන් නැගී සිට "මම අද කවරක්හට අනුග්‍රහ කරම් දැ"යි බලා වදාළ සේක. එ වේලෙහි උන්වහන්සේගේ නුවණට උක්ගස් දෙක කර තබා ගෙණ මග යන මේ කෙලෙඹි හසු විය. කෙලෙඹි, තමන් වහන්සේට පූජාවක් කරන්නට පොහොසත් ව සිටුනා බව ද දුටහ.

ඉක්බිති උන්වහන්සේ පා සිවුරු ගෙණ සෘද්ධිබලයෙන් අහස නැග අවුත් ඔහු ඉදිරියෙහි පෙණී සිටියහ. ඔහු, උන්වහන්සේ දැක පහන් සිත් ඇතියේ තමන්ගේ උතුරුසළු ව ඉතා උස් බිම් පෙදෙ-සක අතුරා "ස්වාමීනි! මෙහි වැඩ හිඳුනු මැනැවැ"යි පසේබුදුරජුන් එහි වඩා හිඳුවා පාත්‍රය ගෙණ උක්ගස කැපූ තැන බැඳ තුබූ කොළ පත් ලිහා හැර පාත්‍රයට උඩින් අල්ලා ගෙණ සිටියේ ය. එකෙණෙහි උක්පැණි වැගිර පාත්‍රය පිරී ගියේ ය. පසේ බුදුරජාණන් වහන්සේ එහි ම වැඩහිඳ උක්පැණි වැළඳූ සේක. එ කල්හි කෙලෙඹි "අනේ, යහපති, ආර්‍ය්‍යයන් වහන්සේ උක්පැණි වැළඳූ සේක, මට වන්නේ මහත් වැඩෙක්, මාගේ අය්යා උක්පැණිවලට මුදල් ඉල්ලා සිටියොත් මුදල් දෙන්නෙමි, නැත, පින් ඉල්ලා සිටියොත් පින් දෙමි'යි සිතා නැවැතත් "ස්වාමීනි! මට පාත්‍රය දෙනු මැනැවැ" යි පාත්‍රය ඉල්ලා ගෙණ අය්යාට ගෙණ යමින් තුබූ උක්ගස ද කැපූ තැන බැඳ තුබූ කොළපත් ඉවත් කොට පෙර සේ පාත්‍රයට උඩින් අල්ලා සිටියේ ය. ඒ වර ද උක්පැණියෙන් පාත්‍රය පිරී ගත්තේ ය. ඒ පැණි පාත්‍රය ද පසේ බුදුරජුන්ට පිළිගැන්වී ය. එහි දී ඔහුට "අය්යා රවටාලම්"යි වඤ්චාසහගතචිත්තාමාත්‍රයෙකුත් නො ද උපන්නේ ය.

පසේ බුදුරජාණන් වහන්සේ පළමු පිළිගැන්නූ උක්පැණි වළඳා සිටි බැවින් දෙවන වර පිළිගැන්නූ උක්පැණි අනෙක් පසේ

බුදුරජුනට බෙදා දෙනු කැමැති ව නො වළඳා වැඩ හුන් සේක. කෙලෙඹි, උක්පැණි පය පිළිගත් ලෙසින් හා අල්ලා ගෙණ සිටි ලෙසින් උන්වහන්සේගේ අදහස දැන පසඟ පිහිටුවා වැඳ "ස්වාමිනි! මා විසින් පිදූ මේ අග්‍රරසයාගේ පිණෙන් දෙව් මිනිස් දෙ ගතියෙහි සැපත් විඳ කෙළවර ඔබවහන්සේ ලැබූ නිවන් රසය මටත් ලැබේවා" යි පැතී ය. උන්වහන්සේ ඔහුට "එසේ වේවා" යි වදාරා නැවැත "**ඉච්ඡිතං පත්ථිතං**" යනාදි ගාථා දෙකින් අනුමෙවෙනි කොට කෙලෙඹියාට තමන් පෙණෙන සේ ඉටා ඔහු බලා ඉන්දදී ම අහසින් ගන්ධමාදන පර්වතයට වැඩ එහි හුන් පන් සියයක් පසේ බුදුවරුනට ඒ උක්පැණි බෙදා දුන්හ. ඔහු ඒ පෙළහර බලා තුටු සිත් ඇතියේ සහොදරයා වෙත ගියේ ය. ඔහු "කොහි ගියෙහි දැ?" යි ඇසූ විට උක්හේන බලන්නට ගිය බව කී ය. "උක්හේන බලන්-නට ගියා නම් උක්ගස් දෙක තුනක් නො ගෙණායෙහි ඇයි දැ?" යි ඇසී ය. "අය්‍යාටත් මටත් උක්ගස් දෙකක් කපා ගෙණ ආයෙමි, මග බැස එන ගමනේ පසේබුදු කෙනකුන් දුටු වෙමි, දැක මගදී ම උන්වහන්සේ වඩා හිඳුවා මා කපා ගත් උක්ගසේ පැණි උන් වහන්සේට පිළිගැන්වීමි, අය්‍යාට මුදල් හෝ පින් දෙමි යි සිතා අය්‍යාට ගෙණා උක්ගසේ පැණිත් පසේබුදුන්ට ම පිදීමි" යි මලනුවන් කී කල්හි "පසේ බුදුරජානන් වහන්සේ ඒ උක්පැණි වලට කුමක් කළාහු දැ?" යි ඇසී ය. "මාගේ උක්ගසේ පැණි උන්වහන්සේ එ තැනදී ම වැළඳූහ, අය්‍යාගේ උක්ගසේ පැණි පාත්‍රයට ගෙණ අහසින් ගොස් ගන්ධමාදන පර්වතයෙහි වැඩ හුන් පන් සියයක් පසේ බුදුවරුනට බෙදා දුන්හ, මම ද පැණි බෙදා දෙනු දිටිමි" යි මලනු තෙමේ කීයේ ය. එය කියත් කියත් ම වැඩිමාලු කෙලෙඹියාගේ සිරුර අතර නැති ව ප්‍රීතියෙන් පිණා ගියෙන් ඔහු "පසේ බුදුරජුන් අවබොධ කළ ධර්මය මටත් අවබොධ වේවා" යි පැතුයේ ය. මලනුවන් විසින් මෙහි දී දිව්‍ය – මනුෂ්‍ය – නිර්වාණ යන ත්‍රිවිධ සම්පත්තිය ම පතන ලද්දී ය. වැඩිමලා විසින් එක්වරින් ම රහත්බව පතන ලද්ලද් ය. මේ මොවුන් පෙර කළ කුශලකර්මය යි.

ඒ දෙබෑයෝ ආයු ඇති තාක් සිට ඒ දිවියෙන් ගැලවී ගොස් දෙව්ලොව ඉපද එක් බුද්ධාන්තරයක් ගෙවූහ. ඔවුන් එසේ දෙව්-ලොව දෙව් සැප විඳුනා කල්හි **විපස්සී** සම්මා සම්බුදුරජානන් වහන්සේ ලොව පහළවූ සේක. ඒ දෙ දෙන ද දෙව්ලොවින් ච්‍යුත ව **බන්ධුමතී** නුවර එක් ම කුල ගෙයක වැඩිමලා වැඩිමල්ව ම බාලයා බාලව ම පිළිසිඳ ගත්හ. උන් අතුරෙහි වැඩිමලාට **සෙනා** යි ද බාලයාට **අපරාජිත** යි ද නම් කළහ. උන් වැඩිවිය පැමිණ පවුල් කමින් සිටිය දී බුද්ධ – **ධම්ම – සඞ්ඝ** යන ත්‍රිවිධරත්නය ලොව

පැතිරී ගියේ ය. මේ කාලයෙහි ධම්ඝෝෂක තනතුර ලබා සිටියහු "දන් දෙවු, පින් කරවු; අද අටවක් පෝය, අද තුදුස්වක් පෝය, අද පසළොස්වක් පෝය, එහෙයින් පෙහෙවස් රකිවු, බණ අසවු"සි යන ඇ විසින් කියා ඇවිදුනා කල්හි එයසා බන්‍ධුමතී නුවර වැස්සෝ පෙරවරුයෙහි දන්පින්කම් කොට පස්වරුයෙහි සුවඳ මල් ගෙණ බණ අසන්නට විහාරාරාමයන් කරා යන්නාහ. එසේ බණ අසන්නට පන්සල් යන මහජනයා දුටු සෙන "කොහි යහු දැ?"යි උන් විචාරා "බණ අසන්නට බුදුරජුන් වෙත යමු"යි කී කල්හි "මමත් යෙමි" යි උන් හා එකතු ව පන්සලට ගොස් එහි බණ සාලායෙහි බණ අසන්නට හුන් පිරිස් කෙළවරට වී හුන්නේ ය. බණපිරිස දෙසා බලා වදාළ බුදුරජානන් වහන්සේ පිණෙන් මෝරා සිටි සෙනගේ අදහස් දැන ඔහුට සරිලන අනුපිළිවෙළ කතාව වදාළ සේක. බුදුරජුන් වදාළ එ දහම් ඇසූ සෙනගේ සිත පැවිදිවීමට නැමී ගියේ ය. එහෙයින් එහි උත්සාහවත් වූ සෙන එ වේලෙහි ම පැවිද්ද ඉල්ලා සිටියේ ය. එවිට බුදුරජානන් වහන්සේ "ඇසිය යුතු දැන්විය යුතු කිසියම් නෑ කෙනෙක් ඇද් දැ?" යි අසා වදාළ විට ඔහු "ස්වාමීනි! ඇතැ"යි කීය. "එසේ නම් උන් කරා ගොසින් විචාරා අවසර ගෙණ පැවිද්ද පිණිස උන්ගේ කැමැත්ත ගෙණ එව" යි වදාළ සේක. සෙන ද මල්බෑයා වෙත ගොස් "මල්ලි! මේ අපගේ ගෙයි ඇතිතරම් සියලු ධනධාන්‍යාදිය ඔබට පවරමි, ඒ සියල්ල මල්ලිට භාර කරමි, මට මොකකුත් වුවමනා නැත, මේ සියල්ල භාර ගෙණ නිසි අන්දමට යොදා ප්‍රයොජන ගන්නැ"යි කීවිට බාල බෑ වූ අජිත "අය්යා කුමක් කරන්නට කොහි යන්නට සූදනම් දැ?" යි ඇසී ය. හේ "මම බුදුරජුන් වෙත පැවිදි වෙමි"යි කී ය. "අය්යා මේ කියන්නේ කුමක් ද, මට මව මළවිට මව මෙන් පියා මළවිට පියා මෙන් සිටුනා එක ම අය්යා ඔබ, ඒ ඔබ මේ කුමක් කියහු? මේ ගෙයි ඇති වස්තුව ටික නො වේ, ඉමහත් ය, මුතු මැණික් මිල මුදල් වතුපිටි ඉතා බොහෝ ය, එහෙයින් පැවිදි වන්නට වුවමනා නැත, ගිහි ව සිට ඕනෑ තරම් පින් කළ හැකි ය, මෙසේ නො කළ මැනැව, මා තනිකඩයකු නො කළ මැනැව, මා හැර නො යනු මැනැවැ" යි අජිත බැගෑ හඬින් කියා සිටියේ ය. සෙන, මා බුදුරජුන් වෙතින් ඇසූ බණට අනුව පිළිපැදීම ගිහියකුට කළ නො හැකි ය, ඒ නිසාය මම පැවිදි වන්නෙමි, එයට කණස්සලු නො වන්න, මල්ලී ගේදොර දරුපවුල් රැක බලා ගෙණ හොඳින් කා බී දන්පින්කම් කරමින් දුප්පත් මිනිසුනට කෑම් බීම් වලින් මිල මුදලින් රෙදිපිළියෙන් උපකාර කරන්න, ඔවුන්ගේ ලෙඩට දුකට විපතට පිහිට වන්නැ" යි තම මලනු සනසාලා බුදුරජුන් වෙත ගොස් පැවිද්ද ඉල්ලී ය. උන්වහන්සේ ඔහු පැවිදි

කරවා උපසපත් ද කරවූහ. හෙතෙමේ පැවිද්දෙන් වැඩි දවස් නො යවා ම සසර බැඳුම් මුළුමනින් බිඳ දමා සියලු කෙලෙස් මුලුසුන් කොට රහත්බවට ද පැමිණියේ ය.

ඉක්බිති අජිත සිය සොහොයුරු තෙරුන් වෙත ගොස් පැවිදි වූ සහෝදරයාට සත්කාර කරන්නට බුද්ධප්‍රමුඛ මහාසඞ්ඝයා වහන්සේට සත් දවසක් දන් පිළියෙල කොට පුද, බෑයා වැඳ, ‘‘ඔබ සසර දුකින් නිදහස් වූ වහු ය, මම පස්කම් ගුණයෙන් බැඳී සිටිමි, එ හැර දමා ගොස් පැවිදි වන්නට ඉඩ නැත, එහෙයින් ගිහි ව සිට කළ හැකි ලොකු ම පින්කමක් මට කියන්නැ’’ යි ඉල්ලී ය. එ කල්හි සෙන සර්විරයන් වහන්සේ ‘‘මල්ලි! එසේ නම් බුදුරජාණන් වහන්සේට වැඩ හිඳින්නට ගඳකිළියක් කරව’’යි කීහ. ඔහු ‘යහපතැ’යි පිළිගෙණ කම්කරුවන් ලවා නන්වැදෑරුම් වූ වටිනා ලීදඬු ලෑලි ගෙන්වා වඩුවන් ලවා ලීදඬු සස්වා රන් එබ්බූ එක් ටැඹෙක, රිදී එබ්බූ එක් ටැඹෙක, මැණික් එබ්බූ එක් ටැඹෙකැ යි මෙසේ ගඳකිළිය පිණිස ගත් සියලු ලීදඬු රුවන්කමින් විසිතුරු කරවා උන් ලවා ම ගඳකිළිය කරවා සත්රුවන් එබ්බූ පියසි උළුවලින් ම ගඳකිළිය වස්වාලී ය.

මේ අතර අපරාජිත යනා නම් ඇති ඔහුගේ බෑනනු කෙනෙක් මාමා වෙත පැමිණ ‘‘මාමේ! මමත් මෙහි වැඩ කරන්නට කැමැත්තෙමි, මට එයට ඉඩ දෙනු මැනැව, මටත් මෙහි පින් දෙනු මැනැවැ’’ යි ඉල්ලා සිටියහ. ‘‘බෑනා! මේ පින්කම එකලා ව මා විසින් ම කළයුතු ය, මෙයට අනෙකකුගේ සම්බන්ධය මම බලාපොරොත්තු නො වෙමි, අනෙකකුගේ උපකාරයෙක් මෙයට වුවමනා නැත, බෑනාගේ ඉල්ලීම ඉටු කරන්නට නො හැක්කෙමි’’ යි දෙවු අජිත කීයේ ය. බෑනා බොහෝ කොටත් ඉල්ලා සිටියේ ද මාමා එහි පින් දෙන්නට නො කැමැති වූ බැවින් ගඳකිළිය ඉදිරියෙහි වැඩ හිඳ දහම් දෙසන්නට සප්තරත්නමය කූටාගාර ශාලා නම් වූ ධර්මමණ්ඩපයක් කර වී ය. අප බුදුරජුන් දවස මෙණ්ඩක සිටු ව උපන්නේ මෙ තෙමේ ය. ගඳකිළියෙහි මහවාකවුළු තුන සත්රුවනින් කරවන ලද ය. ඒ ඉදිරියෙහි යටපත්ලෙහි සුණු පිරියම් කළ පොකුණු තුනක් කරවා සිවුදෑ ගඳින් යුත් දිය පුරවා අපරාජිත ගැහැවි තෙමේ පස්වණක් පියුම් ගස් රොපණය කරවී ය. බුදුරජුන් ගඳකිළිය තුළ වැඩ හුන් කල්හි සුළඟින් නැගුනු රේණු උන්වහන්සේගේ සිරුරෙහි වැටී පැතිරී යනු පිණිස ගඳකිළිය මුදුන් කොත්හි කර වූ ඉකිළිය රන්මුවා ය. කැරලි, පබළුමුවා ය. කොත් කැරැල්ලට පහතින් සොයාලූ පියසිළුළු මිණිමුවා ය. මෙසේ ඒ ගඳකිළිය පිල් විදහා නටන මොනරකු මෙන් ශොභමාන ව සිටියේ ය. සත්රුවන් අතුරෙහි ලොකු රුවන් ගල්

පොඩි කරවා සිනිඳු කොටත් සිනිඳු රුවන්ගල් තුබූ ලෙසටත් ගෙණ ගඳකිළිය වට කොට බැඳි පවුරු වළල්ලෙහි ඇතුළත මලුව, පය තැබූ ඇසිල්ලෙහි දණ තෙක් එරී යන තරමට පුරවාලී ය.

මෙසේ ගඳකිළිය කරවා අවසන් කළ අපරාජිත තෙමේ සිය බෑ තෙරුන් වෙත එළැඹැ "ස්වාමීනි! ගඳකිළිය ගොඩ නංවා නිම කරවාලීමි, ගඳකිළියෙහි සියලු වැඩ අවසන් වී ය, මම දූන් එය බුදුරජුන් පරිභොග කරණු බලාපොරොත්තු වෙමි, උන්වහන්සේ එය පරිභොග කළ විට මට මහත් පිණෙක් අයත් වන්නේ ය, එහෙයින් එලෙසක් කරවාලනු මැනැවැ" යි කියා සිටියේ ය. ඉක්බිති සෙන සප්විරයන් වහන්සේ බුදුරජුන් වෙත එළැඹැ "ස්වාමීනි! මාගේ බෑ කෙලෙඹියා විසින් බුදුරජාණන් වහන්සේට වැඩ හිඳින්නට ගඳකිළියක් කරවන ලද්දී ය, ඔහු දූන් එය බුදුරජුන් පරිභොග කරණු බලාපොරොත්තු වන්නේ ය"යි සැල කළහ. බුදුරජාණන් වහන්සේ හුනස්නෙන් නැගිට ගඳකිළිය ඉදිරියට වැඩ ගඳකිළිය වට කොට බහා තුබූ රුවන් රැස දෙස බලමින් දොර කොටුවෙහි රැඳී සිටි සේක. එ කල්හි කෙලෙඹි තෙමේ "ස්වාමීනි! ගඳකිළිය තුළට වඩිනු මැනැවැ" යි ඇයදී ය. එහෙත් උන්වහන්සේ ගඳකිළිය තුළට නො වැඩිය සේක. තුන් යලක් ම කෙලෙඹි තෙමේ "ගඳකිළිය තුළට වඩින සේක්වා"යි අයදනා ලද්දැහු නමුත් නො වැඩිය සේක. බුදුරජාණන් වහන්සේ එහි ම වැඩ සිට තෙවන වර කෙලෙඹියාගේ බෑ තෙරුන් දෙස බලා වදාළ සේක. සෙන සප්විරයන් වහන්සේ බුදුරජුන් බැලූ අයුරෙන් උන් වහන්සේගේ අදහස් දූන මල්බෑයා අමතා "මෙහි එන්න, මේ සත් රුවන්හි ආරක්ෂාව සත්රුවන් රැකබලා ගැණීම තමා අයත්බව බුදුරජුන්ට සැලකොට උන්වහන්සේට සුවසේ වැඩ වදුරන්නට ආරාධනා කරව" යි කීහ. කෙලෙඹි ද බෑ තෙරුන්ගේ බස් පිළි ගෙණ බුදුරජුන් පසඟ පිහිටුවා වැඳ "ස්වාමීනි! මිනිස්සු ගස්මුල්හි වාසය කොට එහි ආලය නො කොට බලාපොරොත්තු නැති ව එතැනින් නැගී යන්නාහ, ඔරු පාරු අඟුල්වලට නැග ගඟින් එතෙර ව ඒ ඔරු පාරු අඟුල්වල ආලය හැරදමා යන්නාහ, එපරිද්දෙන් බුදුරජාණන් වහන්සේ මේ කිසිවක් රැකිය යුතු ය,යි නො සිතා එය බරට නො ගෙණ මෙහි වැඩ විසුව මැනැවැ" යි කියා සිටියේ ය. කුමක් නිසා බුදුරජාණන් වහන්සේ මෙසේ වැඩ සිටි සේක් ද? යත්:- බුදුවරුන් වෙත උදය සවස රෑ නිතර එන යන මිනිසුන් මේ රුවන් දූක මෙයින් යමක් ගෙණ යන විට එය අපට වළකා ලන්නට නො හැකි ය, පිරිවෙණ රුවනින් පිරීසිටුනා කල්හි තමන් වහන්සේගේ උපසථායකයනුත් රුවන් ගෙණ යනු බලා එය ද වළකාලනු නො හැකි ය, රුවන් ගෙණ යන්නවුන්

නො වළකන කල්හි කෙළෙඹියා ද මා කෙරෙහි අසහනයෙන් වෛර බැඳ අපාගත වන්නේ ය යන මේ කරුණු සලකා උන් වහන්සේ එහි වැඩ සිටි සේක. "ස්වාමීනි! රුවන් රැස බලා ගැණීම මා පිළිබඳ ය, බුදුරජානන් වහන්සේ සුවසේ වැඩ හිඳුනු මැනැවැ"යි කෙළෙඹියා සැලකොට සිටි කල්හි උන්වහන්සේ ගඳකිළිය තුළට පිවිසි සේක. කෙළෙඹි තෙමේ, හැමතින් රැසවල තබා රැසවල සිටියවුනට "ඔඩොක්කුවලින් හෝ මලු පැස්වලින් රුවන් ගෙණ යන්නට ඉඩ නො දෙවු, යමෙක් යමක් අතින් ගෙණ යේ නම් ඔවුන් නො වළකාලවු" යි දැන් වී ය. තව ද ඔහු "මා විසින් ගඳ කිළි පිරිවෙණ සත්රුවනින් පුරවන ලද්දේ ය, බුදුරජුන් වෙත පැමිණ බණ අසා යන දුප්පත් මිනිසුන්ට දෑත පුරා රුවන් ගෙණ යෑමට අවහිරයෙක් නැත්තේ ය, පොහොසතුනට ගෙණ යා හැක්කේ එක් අතකින් එක්විට ගත් රුවන් පමණ ය, ඉන් වැඩියක් ගෙණ යෑමට අවසර නැතැ" යි නුවර පුරා අණ බෙර ලැවූයේ ය. "සැදැහැවත් මිනිස්සු මෙහි පැමිණ දහම් අසන්නාහු වෙත්, සැදැහැ නැත්තාහු ධන ලොභයෙන් මෙහි පැමිණ දහම් අසා දුකෙන් මිදෙන්නාහු වෙත්" යි කෙළෙඹියාහට මෙසේ අදහස් වූ බැවින් ඔහු මෙසේ රට පුරා පළට කොට හැරියේ මහාජනයාට හිත වැඩ පිණිස ය. මහාජන තෙමේ ද කෙළෙඹියාගේ විධානය පරිදි මෙහි පැමිණ දහම් අසා ආපසු යන් ම රුවන් ද ගෙණ ගියේ ය. මෙසේ ගෙණ යෑමෙන් එහි බහා තුබූ රුවන් නිමාවට ගිය කල්හි නැවැත නැවැතත් තුන්වරක් ම දණ පමණින් රුවන් එහි ලැවී ය. බුදුරජුන්ගේ සිරිපා මුල්හි තිඹිරි ගෙඩියක් තරම් වූ මිණිරුවනක් තැබී ය. උන්වහන්සේගේ ශ්‍රී ශරීරයෙන් නික්මෙන රන්වන් රැස් සමග මිණිරුවනින් නික්මෙන රැස් එක් වූ කල්හි බලා සිටිනවුනට ඒ බැලීමෙහි සෑහීමක් නො වනු පිණිස හේ එසේ කෙළේ ය. මහාජන තෙමේ නො නින්ව ම රැස් දෙස ම බලා සිටියේ ය.

දවසක් මිසදිටු ගත් බමුණෙක් බුදුරජුන්ගේ පා මුල්හි බහා තුබූ ඒ මාහැඟි මිණිරුවන හැර ගන්නට සිතා බුදුරජුන් වඳින්නට යනෙන මිනිසුන් අතරට වැදී විහාරයට ඇතුල් වී ය. එහි සිටි කෙළෙඹි ඔහු ඇතුල් වන සැටියෙන් ම මැණික පැහැර ගන්නට සිතා ඇතුල් වන්නේ ය යි සලකා "අනේ; මූ මෙය නො ගන්නේ නම් යෙහෙකැ"යි ද සිතී ය. බමුණු ද බුදුරජුන් වඳින්නකු මෙන් පා මුල වැටී අත පොවා මැණික හැරගෙණ ඉණ තබා ගෙණ පලා ගියේ ය. කෙළෙඹි ඒ බමුණු කෙරෙහි සිත පහදා ගන්නට අපොහොසත් වූයේ දම් දෙසුම් අවසන්හි බුදුරජුන් වෙත ගොස් "ස්වාමීනි! මම තෙවරක් ම ගඳකිළිය වට කොට දණ පමණින් රුවන් ලැවීමි, ඒ රුවන් ගත්තවුන් කෙරෙහි මෙතෙක් කිසිත්

නො සතුටෙක් නූපන්නේ ය, ඔවුන් රුවන් ගෙණ යත් ගෙණ යත් ම මාගේ සිත වඩ වඩාත් පහන් වී ය, එහෙත් 'අද මේ මැණික පැහැර නො ගන්නේ නම් යහපතැ'යි සිතමින් සිටි මම එය පැහැර ගත් බමුණු දුක ඔහු කෙරෙහි සිත පහදා ගන්නට අපොහොසත් වීමි''යි දන්වා සිටියේ ය. බුදුරජාණන් වහන්සේ ඔහුගේ බස් අසා "ඈයි, උපාසක! තමා අයත් දෑය අන්හට ගෙණ යා නො හැකි ලෙසක් කරන්නට උපදෙස් දුන්නේ නො වෙම් දෑ''යි වදාළ විට ඔහු බුදුරජුන් දුන් උපදෙස්හි පිහිටා උන්වහන්සේ වැඳ "සවාමීනි! අද පටන් රජදරු කෙනෙක් හෝ සොරු හෝ මා නො කැමැති කරවා මා අයත් දුවලුහුයක් පමණකුත් පැහැර ගැණිමෙහි සමත් වූවෝ නො වෙත්වා, මා අයත් දෑය ගින්නෙනුදු නො දැවේවා, ජලයෙනුදු ගසා ගෙණ නො යේවා''යි පැතුයේ ය. බුදු රජාණන් වහන්සේ ද "ඒ එසේ වනු ඇතැ''යි ඔහුට අනුමෙවෙනි බණ වදාළ සේක. කෙළෙඹි තෙමේ ගඳකිළි උළෙළ පවත්වනුයේ එක් ලක්‍ෂ අටසැට දහසක් හිඝුන් වෙහෙරට වඩා හිඳුවාලා නව වසක් මුළුල්ලෙහි මහදන් දී කෙළවර ඔවුන් හැම දෙනා වහන්සේට තුන් සිවුරු පිදී ය. සඞ්ඝනවකයා ලත් සිවුරු පිළී මසු දහසක් අගනේ විය.

කෙළෙඹි දිවි ඇති තාක් මෙසේ පින්කම් කොට එයින් ච්‍යුත ව දෙව්ලොව ඉපද විපස්සී බුදුරජුන් දවස පටන් අප බුදුරජුන් දවස දක්වා දෙව්මිනිසුන් අතර සැරිසරමින් ආයේ, මෙ දවස රජගහා නුවර සිටුගෙයක පිළිසිඳ ගත්තේ ය. එසේ පිළිසිඳ ගත් ඔහු නව මස් දෙපෝයක් මවුකුස විසී ය. ඔහු මවු කුසින් බිහි වූ දවසෙහි මුළු නුවර හැම තැන තුබූ කුදු මහත් සියලු ආයුධ දිලිහී ගියේ ය. ගැණු පිරිමි හැමදෙනා පැළඳ තුබූ අබරණ ද ආලෝකය විහිදුවා බැබලෙන්නට වන. මුළු නුවර එකාලොක විය. සිටු තෙමේ පසුදා උදෑසන රජුට උවටැන් කරන්නට රජමැඳුරට ගියේ ය. එ කල්හි බිම්සර රජ "සිට! අද සියලු ආයුධ දිලිහී ගියේ ය, නුවර ද එකාලොක විය, තමුසේ, මෙසේ වන්නට ඇති හෙතුව කිමැ'යි දනිහු දෑ?''යි ඇසී ය. "දෙවයන් වහන්ස! මාගේ ගෙයි ඔබ වහන්සේට දසයෙක් උපන, ඔහු මහාපින්වතෙක, ඔහුගේ පින් තෙදින් මෙසේ වී ය''යි සිටු තෙමේ කීයේ ය. "මොක ද, ඌ සොරෙක් වේ දෑ?''යි ඇසූ විට "දෙවයන් වහන්ස! නැත, සොරෙක් නො වන්නේ ය, මහ පිණැත්තේ ය, කළ හොඳ පැතුම් ඇත්තේ ය''යි කී විට රජ තෙමේ "එසේ නම් එදරු හොඳින් රැකවල් තබා වඩව, මේ මුදල එදරුට කිරි මිල පිණිස වේවා''යි දවසට මසු දහස බැගින් දෙන්නට භාණ්ඩාගාරයට නියම කෙළේ ය. දරුට නම් තබන දවසෙහි ඔහු උපන්දා මුළු නුවර එකාලොක වූ බැවින්

**ජෝති** යි නම් කළහ. වැඩි වියට පැමිණි ඔහුට ගෙයක් ගොඩ නැගීමට ගෙපල් පිරිසිදු කරත් ම ශක්‍රභවනය උණු වී ගියේ ය. සක්දෙව් “මේ කුමක් නිසා”යි බලනුයේ “ජෝතිය කුමරුට ගෙයක් ගොඩ නැගීමට ගෙබිම් ඉදි කරති”යි **දැක** “මෙ තෙමේ මොවුන් ගොඩ නගන ගෙයි නො වසන්නේ ය, එහෙයින් මා දත් එතැනට යා යුතු ය”යි වඩු වෙසක් මවා ගෙණ ගෙබිම් පිරිසිදු කරණ තැනට ගොස් එහි සිටියවුන් අතින් “තෙපි කුමක් කරහු?”යි ඇසී ය. “ජෝතිය කුමරුට ගෙයක් ගොඩ නැගීමට බිම් සකස් කරමු”යි කී කල්හි “ඔහුට ගෙයක් ගොඩ නැගීම තොපට කළ නො හැකි ය, ඔහු තොප කළ ගෙයක හිඳින්නෙක් නො වේ, පහවවු”යි කියා සොළොස් කිරියක් පමණ වූ බිම්පෙදෙසක් බැලී ය. එකෙණෙහි ඒ බිම්පෙදෙස කිසිණු මඬුල්ලක් සේ සමතල වී ය. නැවැත, සක්දෙව් මෙ තැන පොළොව පළා ගෙණ සත්රුවන්මුවා සත්මාල් පායෙක් නැගේවා, පහය මැදි කොට හාත්පස සත්රුවන්මුවා පවුරු වළලු සතෙක් නැගේවා, ඒ පවුරු කෙළවර කප්රුක් නැගේවා, පහයෙහි සතර කොණ නිදන් සැළි සතරෙක් නැගේවා”යි මෙසේ විටින්විට ඉටී ය. තමා ඉටූ පරිදි ඒ සියල්ල නැගී සිට ගත. එහි එක් නිදන් සැළෙක් යොදුනක් පමණ ය. එකෙක් තුන් ගවු පමණ ය. එකෙක් අඩ යොදුන් පමණ ය. එකෙක් ගව්වක් පමණ ය. බෝසතුන්ට පහළ වූ නිදන් සැළිවල මුවවිටි ද මේ මුවවිටි තරම් විය. යට පෙදෙස් පොළොව කෙළවර කොට සිටියේ ය. ජෝතිය කුමරුන්ට පහළ වූ නිදන් සැළිවල මුවවිටි තරම නො දක්වන ලද්දේ ය. සැළි සතර ම මුව සිඳ දැමූ තල් ගෙඩියක් සේ පිරිපුන්ව ම සිටියේ ය. පහය සිවු කොන්හි නාඹ තල් කඳන් වැනි උක්ගස් සතරෙක් පොළොවෙන් නැගී සිට ගත්තේ ය. ඒ ගස්වල කොළ මිණිමුවා ය. පුරුක් රන්මුවා ය, පෙර කළ කුශල කර්මයාගේ මහත් විපාක විසින් මොවුහු පහළ වූහ. දොර කොටු සතෙහි යක්ෂයෝ සත් දෙනෙක් රැකවල සිටියහ. මුල් දොර කොටුවෙහි **යමකචොලි** යක්ෂ තෙමේ යකුන් දහසක් පමණ වූ තම පිරිවර ගෙණ රැකවලෙහි යෙදී ගත්තේ ය. දෙවන දොර කොටුවෙහි **උත්පල** යක්ෂ තෙමේ දෙදහසක් පමණ පිරිවර යකුන් ගෙණ අරක් ගෙණ සිටියේ ය. තෙවන දොර කොටුවෙහි **වජ්‍ර** යක්ෂ තෙමේ යකුන් දහසක් සමග රැඳී ගත්තේ ය. සිවුවන දොරටුවෙහි **වජ්‍රබාහු** යක්ෂ තෙමේ සාර දහසක් යකුන් ගෙණ සිටියේ ය. **ශකට** යක්ෂ තෙමේ පන්දහසක් යකුන් ගෙණ පස්වන දොරටුව රැක සිටියේ ය. **කටත්ථ** යක්ෂ තෙමේ සවන දොරටුවෙහි සදහසක් යකුන් ගෙණ සිටියේ ය. **දිශාමුඛ** යක්ෂ තෙමේ සත් දහසක් යකුන් හා අරක් ගෙණ සිටියේ සත්වන දොරටුවෙහි ය. පහය ඇතුළත පිටත දැඩි රැකුම් වීය.

"ජෝතිය සිටුහට සත්රුවන්මුවා පහයෙක්, පවුරු වළලු සතෙක්, දොරකොටු සතෙක් හා නිදන් සැළි සතරෙක් උපනැ"යි ඇසූ බිම්සර රජ තෙමේ ඔහුට සිටු සේසත් යැවී ය. එ තැන් සිට ඔහු **ජෝතියසෙට්ඨි** නම් වී ය. ඔහු සමග එක් ව පින්කම් කළ සත්‍රිය උතුරුකුරු දිවයිනෙහි උපන. දෙවියෝ ඇය ගෙණවුත් සිටු ගෙයි සිරියහන් ගැබෙහි තැබූහ. දෙවියන් විසින් ගෙණ ආ ඇය සහල් නැළියක් හා මැණික් ගල් තුනක් ගෙණ ආ ය. ඔවුනට දිවි තිබෙන තුරු ම ඒ සහල් නැළියෙන් ම බත් පිළියෙල වී ය. ගැල් සියයක් සහලින් පුරවනු කැමැත්තෝ නම් ඒ සහල් නැළියෙන් ම ගැල් පුරවති. එහෙත් සහල් නැළියෙහි අඩු බවෙක් නො වේ. සහල් නැළිය සහල් නැළිය තරම් ව ම සිටි යි. බත් පිසන විට සහල්, සැළියෙහි ලා මැණික් ගල් තුන උඩ තැබූ කෙණෙහි ම එගල් ගිනි ඇවිළ දල් වී බත් පැසුනු පසු තුමූ ම නිවී යෙත්. ඒ සලකුණෙන් බත් පැසුනු බව දැන ගණිත්. මාළු පිණි පිසන කල්හි ද එසේ ය. මෙසේ මැණික් ගල් ගින්නෙන් ම බත් මාළු පිණි පිසනු ලැබේ. මැණික්වල ආලොකයෙන් ම නිදත්. ගින්නෙක පහණෙක ආලොකයක් ඔවුහු නො දත්හ.

ජෝතිය සිටුහුගේ සම්පත්තිය මේ බඳුය යි මුළු දඹදිව පළට ව ගියේ ය. මිනිස්සු යානවාහන නැගී සම්පත් බලන්නට නොයෙක් දෙසින් දහස් ගණනින් ගලා එන්නට වූහ. සිටු තෙමේ ඒ ඒ ආ ආ හැම දෙනාට උතුරුකුරු සහලින් ම බත් පිසවා දෙවන්නේ ය. "කප්රුක්වලින් තමන් කැමැති වස්ත්‍රාභරණ ගණිත්වා, තුන් ගවු පමණ වූ නිදන් සැළිවලින් යැපෙන පමණට ධනය ද ගණිත්වා"යි අණ කෙළේ ය. දඹදිව් වැසි සියලු දෙනා ධනය ගතුදු නිදන් සැළිවල අඟලක් පමණ වුත් අඩු බවෙක් නම් නො වී ය. මේ වනාහි විපස්සී බුදුරජුන්ගේ ගඳකිළි පිරිවෙණෙහි රුවන් විසුරුවාලීමෙහි ආනිසංසය වේ.

මෙසේ නොයෙක් මාදිලියේ ගැණු පිරිමි දරු දැරියන් තම තමන් කැමති තාක් වස්ත්‍රාභරණ හා මිල මුදල් ගෙණ යන කල්හි බිම්සර රජ තෙමේ ජෝතිය සිටුහුගේ පහය දකිනු කැමැත්තේ ද මිනිසුන්ගේ යැම ඊම අතුරු සිදුරු නැති ව පැවැති බැවින් එයට කල් බලා සිටියේ ය ටික දවසක් ගිය තැන මිනිසුන්ගේ පැමිණීම අඩු විය ඒ දුටු රජ තෙමේ ජෝතිය සිටුහුගේ පියාට "තමුසේගේ පුත් ජෝතිය සිටුහුගේ පහය බලන්නට කැමැත්තෙමි"යි දන්වා සිටියේ ය. ඔහු ද, "දෙවයන් වහන්ස! යහපතැ"යි කියා ගොස්, "පුත! අපගේ මහාරජානන් වහන්සේ ඔබගේ පහය බලන්නට කැමැති බව මට දැන් එවා තිබේ ය"යි දන්වා සිටි කල්හි ඔහු ද—

''යහපති, දෙවයන් වහන්සේ පහය බලන්නට වැඩම කරණ සේක්වා''යි දන්වා යැවී ය. එවිට රජ තෙමේ මහත් වූ පිරිවර ගෙණ සිටු මැදුර බලන්නට ගියේ ය. එහි දී පළමු දෙරකඩ හැමද කුණු කසළ බැහැර ලන දසිය, රජුට අත දුන් කල්හි රජ තෙමේ සිටු බිරිය යන හැඟීමෙන් ලජ්ජිත වනුයේ ඇයගේ අත නො ඇල්ලී ය. අන් දෙරකඩ සිටි දස්සෝන් සිටුහුගේ බිරියහ'යි සලකා රජ තෙමේ ඔවුන්ගේ අත් ද නො ගත්තේ ය. සිටු ඉදිරියට අවුත් පසු පසට වී ''දෙවයන් වහන්සේ ඉදිරියෙහි වඩින සේක්වා''යි කියා සිටියේ ය. එහි දී රජුට පහයෙහි මිණිමුවා බිම, බඹ සිය ගණනක් ගැඹුරු වූ මහා වළකඩක් සේ වැටහින. රජ තෙමේ ''මෙය මා මෙහි හෙළා අල්ලා ගන්නට සැරූ වළකඩෙ-කැ''යි සිතා ඉදිරියෙහි පියවරකුත් තබන්නට මැලි වී ය. සිටු තෙමේ ''දෙවයන් වහන්ස! මෙය වළකඩෙක් නො වේ, බිය වන සේක් නම් මට පිටුපසින් වඩින සේක්වා, මම පෙරටු වෙමි''යි තෙමේ පෙරටු විය. සිටු එසේ පෙරටු වී බිම පා තබා යත් මා රජ ද නො බිය ව යනුයේ යට මාලේ පටන් පහය බලමින් පහය තුළ හැසුරුණේ ය. රජු සමග ගිය අජාසත් කුමරු ද පියාගේ ඇඟිල්ල එල්බ ගෙණ පහය තුළ ඇවිදිනේ ''මාගේ පියා පින්වත් නො වේ, මහා මෝඩයකු සේ පෙණේ, මේ ගැහැවි සත්රත්මුවා පහයෙක වෙසෙයි, මාගේ පියා රජ වූයේ ද දවදඬුවලින් කළ දිරූ ගෙයක වසන්නේ ය, මා රජ වුවොත් මම මොහුට මේ පහයෙහි වසන්නට ඉඩ නො දෙමි, මෙය රජ සතු කරමි''යි සිතමින් ඇවිද්දේ ය. රජු පහයෙහි මාලෙන් මාලට නැග පහය සැම තැන ඇවිද උඩ මාලට නගින් ම දවල බත් අනුභව කරණ කාලය ලංව සිටියේ ය. රජ තෙමේ ''සිට! මෙහිදී ම බත අනුභව කරන්නට ඕනෑ ය''යි කීයේ ය. ''දේවයන් වහන්ස! යහපති, එය මට මහත් සතුටෙක්, එසේ නම් එය මාගේ මහත් පිණෙක්, දෙවයන් වහන්සේට දූන් බත පිළියෙල වී තිබේ''යි කී කල්හි රජ තෙමේ සුවඳ දිය සොළොස් කළයක් නාලා සිටු හිඳිනා මණ්ඩපයෙහි පැණ වූ රුවන් පලඟෙහි හිඳ ගත්තේ ය. එවිට සිටු, රජුට අත දෝනා පැන් දී ලක්ෂයක් අගනා රන්තලියකට උණු කිරිබත් වඩා රජුගේ ඉදිරියෙහි තැබුයේ ය. රජ තෙමේ බත් ය යි සිතා වළඳන්නට පටන් ගත්තේ ය. සිටු ''දෙවයන් වහන්ස! මේ බත් නො වේ, දියගතිය සහිත කිරිබත් ය යි කියා අන් රන්තලියකට බත් බෙදූ, ඒ බත්තලිය මුලින් තැබූ තලිය උඩ තැබී ය. මතුයෙහි තුබූ බත් තලිය උණුසුම් ව තුබූ බැවින් රජුට එය පහසුවෙන් වළඳන්නට හැකි විය. රජ තෙමේ මිහිරි අහර වළඳනුයේ එහි පමණ නො දත්තේ ය. එය දුටු සිටු, රජුට වැඳ දෙහොත් මුදුන් දී

"දෙවයන් වහන්ස! වැළඳූ පමණ සෑහෙයි, මෙයට වැඩියෙන් වළඳනු නො මැනැවි, වැඩියෙන් වළඳනා ලද නම් දිරවා ගත නො හෙන්නේ ය"යි කී ය. "ඇයි, ගෑහැවිය! තාගේ බත එසේ බර කොට කියහු?"යි විචාළ කල්හි "දෙවයන් වහන්ස! අපට බරෙක් නැත, දෙවයන් වහන්සේගේ සියලු බලසෙනගට ද මේ බත් ම මේ මාළු පිණිස ම සෑහෙන්නේ ය, අමුතුවෙන් ඔවුනටැ යි බත් මාළු පිළියෙල කිරීමෙක් නැත, එහෙත් මම නින්දාවට බිය වෙමි"යි කීයේ ය. රජු "කුමක් නිසා?"යි විචාළ විට "යම් ලෙසකින් රජුගේ කයෙහි ගිලන් බවෙක් වූයේ නම් ඊයේ රජතුමන් ජෝතිය සිටුගේ ගෙයි දී බත් වළඳන ලද්දේ ය, ඒ වේලෙහි සිටු විසින් යම් කිසිවක් කරණ ලද්දේ වනැ යි යමක්හු විසින් කියන ලද්දේ නම් මම එයට බිය වෙමි"යි කී ය. "ගෑහැවිය! එසේ නම් බත්තලිය මෙ තැනින් ගණුව, දිය ගෙණෙව"යි දිය ගෙන්වා ගෙණ අත කට සෝදා ගත්තේ ය. රජු බත් වළඳා අවසන් කළ කල්හි සියලු රජ පිරිස ද ඒ බත් ම අනුභව කළහ. අමුතු බතෙක් ඔවුන් සඳහා පිළියෙළ නො වූයේ ය.

අනතුරු ව රජ තෙමේ පිළිසඳර කතායෙහි යෙදුනේ සිටු අමතා "කිම, මේ ගෙයි සිටු බිරියක් නැද්දැ?"යි ඇසී ය. "දෙවයන් වහන්ස! ඇතැ" යි කී විට "ඕ දැන් කොහි ද?" යි විචාළේ ය. "ඕ සිරියහන් ගැබෙහි, දෙවයන් වහන්සේ මෙහි වැඩිය බව ඕ නො දනී"යි කී විට රජ තෙමේ කිම, "මම උදෑසන ම පිරිවර සහිත ව මෙහි ආයෙමි, මෙතෙක් වේලාත් මා මෙහි ආ බව ඈ නො දනී?" යි ඇසී ය. සිටු තෙමේ බිරිය වෙත වහා ගොස් "අපගේ රජතුමා මෙහි යහපත් වූයේ ය, නිට රජු දැක ගන්නට නො වටීදැ?"යි විචාළේ ය. ඕ තොමෝ හිමියාගේ බස් අසා වැදහෙව ම "හිමි! රජ නම් කවරෙකැ" යි ඇසූ ය. "අපගේ නායක, අපගේ ඊශ්වර රජ ය" යි කී කල්හි සිටු බිරිය "අප විසින් පෙර පින්කම් කරණ ලද්දේ නො සතුටු සිතින් විය යුතු ය, යම්තමකින් විය යුතු ය, අප යටත් කර ගත් නායකයෙක් වූයේ එහෙයිනි, කම්පල නො අදහා පින් කොට අපි සම්පත් නො ලබා ම අන්හට යටත් ව උපන්නමෝ වම්හ, අප විසින් කම්පල නො අදහා ම දන් දෙන ලද්දේ වන්නේ ය, මේ අන්හට යටත්වීම ඒ නපුරු පින්කමේ විපාකැ"යි කිවූ ය. එසේ කියා "හිමි! මම දැන් කුමක් කරම් දැ?"යි විචාළා ය. සිටු තෙමේ "සොඳුර! තල් වැටක් ගෙණ ගොස් රජුට පවන් සලව" යි කී ය. ඕ එසේ කළා ය. එකල්හි රජුගේ නළල් පටෙහි බැඳ තුබූ මැණික් ගල්වලින් නැගුනු දුම් සුළඟ ඇයගේ ඇස්වල වැදුනේ ය. ඇස්වලින් කඳුළු කඩා වැටින. රජ තෙමේ එ දැක "මහ සිට! මාගම්හු නුවණ නැතියහ, මෝ තොමෝ "රජ තෙමේ මාගේ හිමියා අයත් සැපත පැහැර ගත්තේ ය, යි සිතා බියෙන් හඬන්නී ය, ඈය සනසව,

තාගේ යසිසුරෙන් මට වැඩෙක් නැතැ යි කීයේ ය. "දෙවයන් වහන්ස! මෝ හඞත්නී එබඳු හැඟීමෙකින් නො වේ, දෙවයන් වහන්සේගේ නලල් පටින් නැගි දුම් සහිත සුළඟ ඇයගේ ඇස්වල වැදීමෙන් කඳුළු ගලා යයි, මෝ කවදකත් පහණක් වේව යි ගින්නක් වේව යි නො බලා මැණික් එළියෙන් ම ආහාර ගණී යි, හිඳී යි, නිද යි, දෙවයන් වහන්සේ පහන් එළියෙන් ම කටයුතු කරණ සේක් වන්නාහ" යි කී විට රජ තෙමේ "සිට! එසේ ය යි කීයේ"ය. "දෙවයන් වහන්ස! එසේ නම් අද පටන් මැණික් එළියෙන් හිඳිනු මැනැවැ"යි කියා තියඹරා ගෙඩියක් තරම් වූ අනගි මිණිරුවනක් රජුට දුන්නේ ය. රජ තෙමේ පහය බලා "ජෝතිය සිටුගේ සම්පත්තිය ඉමහත් ය"යි කියා පෙරළා ගියේ ය.

මේ වනාහි ජෝතිය සිටුගේ උත්පත්ති කථා ය.

දූත් මෙ තැන් සිට ජටිල සිටුහුගේ උත්පත්ති කථාව දත යුතු යː– බරණැස් නුවර මනා රූ ඇති සිටුදුවක් වූ ය. ඇයගේ මවුපියෝ ඇය පසළොස් සොළොස් හැවිරිදි කාලයෙහි රැකවල පිණිස එක් දූස්සක් නිල කොට සත් මහල් පහයෙහි සිරියහන් ගැබෙහි වාසය කරවූ හ. අහසින් යන එක් විද්‍යාධරයෙක් දවසක් වාකවුළු දෙර හැර පිටත බලමින් හුන් ඇය දැක උපන් සනා ඇතියේ වාකවුළු දෙරින් ඇතුල් ව ඇය හා කාමසන්වය කෙළේ ය. ඕ එයින් වැඩි දවස් නො යවා දරුගැබක් ලැබූ ය. රැකවල සිටි දැසිය එය දැක "ආයෑ! මේ කිමැ?" යි විචාළා ය. සිටුදුව "කාහටත් නො කියව මෙ ය"යි කිවූ ය. එයින් බිය වූ දැසිය එය කාහටත් නො කියා තිහඬ වූ ය. සිටුදුව දස මසක් ඉක්මවා පුතකු වැදූ ය. ඉන් පසු ඕ තොමෝ අළුත් බඳුනක් ගෙන්වා එ දරු එහි නිදි කරවා බඳුන වසා ඊමතුයෙහි මල්දම් තබා දැසිය අමතා "මෙය හිස තබා ගෙණ ගොස් ගඟෙහි පා කොට හරුව, යමකු මේ කිමැ?" යි විචාරණ ලද්දී නම් මාගේ සවාමිදුවට බිලියමකැ යි කියව" යි දැසියට අණ කළා ය. ඕ එසේ කළා ය.

යටිගඟ තොටෙක නාමින් සිටි ගැණු දෙ දෙනෙක් ගඟදියෙහි පාවී යන ඒ අළුත් සැළිය දැක එකියක් "තෙල සැළිය මාගේ ය"යි කිවූ ය. එකියක් "සැළිය තුළ යමෙක් තිබේ නම් එය මට ය"යි කිවූ ය. ඒ දෙ දෙනා මෙසේ කියා සැළිය ගොඩට ගෙණ වහුන් හැර එහි හුන් දරු දැක "බඳුන මට අයත් ය"යි කියූ ගැහැණිය "දරු අයත් විය යුතු මාහටැ"යි ද, "සැළිය තුළ යමෙක් වේ නම් ඒ මා අයත් ය"යි කියූ ගැහැණිය කෙළින් ම දරු මා අයත් විය යුතු ය"යි ද කලහ කරන්නට වූහ. කලහ කරමින් අධිකරණ ශාලාවට ගොස් විනිසකරුවන් ඉදිරියෙහි මෙය කියා සිටියහ. ඔවුහු ද මෙය

20

විනිශ්චය කිරීමෙහි අපොහොසත් ව ඇලා රජු වෙතට පැමිණ වූහ. රජ තෙමේ ඇලාගේ බස් අසා "තී දරු ගන්න, තී බඳුන ගන්නැ"යි නියම කෙළේ ය. යම් තැනැත්තියක විසින් දරු ලද්දේ නම් ඕ තොමෝ මහාකාත්‍යායන තෙරුන්ගේ උපස්ථායිකා වූවා දරු තෙරුන් වෙත පැවිදි කරන්නෙමි, යි ඉතා ආදරයෙන් රැක බලා වැඩූ ය. දරු උපන්දා ගැබ්මල සෝදා නො හළ බැවින් කෙස් එකට බැඳී අවුල් ව සිටියේ ය. එහෙයින් ඔහු ජටිල නම් වි ය. එ දරු පයින් ඇවිදිනා කාලයෙහි මහාස්ථවිරයන් වහන්සේ උපාසිකාවගේ ගෙට පිඬු සිඟා වැඩිය සේක. උපාසිකා තොමෝ මහතෙරුන් වඩා හිඳුවා දන් වැළඳ වූ ය. ඒ අතර මහතෙරුන් වහන්සේ දරු දැක "කිම, උපාසිකාවට දරුවෙක් ලැබුනේ ද?" යි අසා වදාළ කල්හි "ස්වාමීනි! එසේ ය, මම මේ දරු හදා වඩන්නෙමි, හාමුදුරුවන් වහන්සේ වෙත පැවිදි කිරීමට ය, එහෙයින් මෙ දරු පැවිදි කරගණු මැනැවැ"යි එ දරු මහතෙරුන්ට භාර කළා ය. උන්වහන්සේ දරු ගෙණ යන්නාහු "මොහුට ගිහිසැප වැළඳීමට පින් තිබේ දැ"යි බලනුවෝ, "මේ තෙමේ මහාපිණැතියෙක, මහසැපත් අනුභව කරන්නේ ය, තව ම ඉතා ළදරු ය, නුවණ ද මෝරා නො ගියේ-ය" යි දැක දරු ගෙණ තක්සලාවෙහි එක් උපස්ථායකකුලයකට ගියහ. එහි සිටි උපස්ථායක තෙමේ තෙරුන් වැඳ දරු දැක "ස්වාමීනි! ඔබවහන්සේට දරුවෙක් ලැබුනේ දැ"යි ඇසී ය. "ඔවු, මට ලැබුනු මේ දරු මෙහි රඳවා ගෙණ වඩවු"යි තෙරුන් කී කල්හි ඔවුහු දරු එහි රඳවා ගෙණ දරුපෙම් උපදවා මැනැවින් පොෂණය කෙළේ ය.

ඔහුගේ ගෙයි දෙළොස් අවුරුද්දක් එකතු වූ බඩු රැසක් නො විකෙණී තුබුනේ ය. වෙණෙදා, බැහැර ගම් බලා යන දවසෙක ඒ සියලු බඩු කඩපිළට ගෙණ ගොස් තබා දරු ද එහි රඳවා "මේ බඩු ව මෙතෙක් මිල ගෙණ දෙව, මේ බඩුවට මෙතෙක් මිල ගණුව" යි ඒ ඒ බඩුවල ගණන් මිමි කියා ගියේ ය. දරු කඩපිළ රැඳුනු දා ම නුවර අරක් ගෙණ සිටි දෙවියෝ දුරු මිරිස් ලුනු ටිකක් පමණකුත් ගන්නට බලාපොරොත්තු වන ගැණු පිරිමි හැම එකකු අන් කඩපිලකට යන්නට නතු නො කොට එ දරු හුන් කඩපිළට ම නතු කොට යැවූහ. එහි දෙළොස් අවුරුද්දක් ම නො විකෙණී ගොඩ ගැසී තුබුනු ඒ බඩු සියල්ල එක දවසින් විකිණී ගියේ ය. දවස් දෙක තුනක් යවා පැමිණි කෙළෙඹි සිස් ව තුබූ කඩපිළ දැක "ඇයි, දරු! නා කඩපිළෙහි තුබූ බඩු නිකමට විනාශ කරණ ලද දැ?" යි ඇසූ විට "එක බඩුවකුත් නො නැසූ වෙමි, පියා කියූ ලෙසට සියල්ල වික්කෙමි, මේ අසුවල් බඩුව විකුණා ලැබුනු මුදල, මේ අසුවල් බඩුවට ලැබුනු මුදලැ"යි එක් කොට තුබූ මුදල්

සියල්ල ඔහුට භාර කෙළේ ය. එ දරු කෙරෙහි පහන් වූ කෙළෙඹි "මෙ තෙමේ වටිනා පිරිමියෙකැ, කො තැනක ගියත් රැකී ගත හැකි ය"යි සිතා වැඩිවිය පැමිණ සිටි තම දුව ඔහුට පාවා දීලා "මා පුතුට හිඳින්නට ගෙයක් ගොඩ නැගිය යුතු ය"යි කම්කරුවන් ගෙන්වා ගේ ගොඩ නගන්නට කම්කරුවන්ට නියම කෙළේ ය. ඔවුන් ගෙය ගොඩ නගා අවසන් කළ කල්හි "පුතා ගොස් පුතාට ගොඩ නැගූ ගෙයි නවාතැන් ගණුව" යි ගෙය පාවා දුන්නේ ය. ඔහු ගෙවදින දවසෙහි එක් පියවරක් එළිපත තබත් ම ගෙයි පිටුපස පොළොව බිඳ ගෙණ අසූරියන් පමණ උස් වූ රන්කන්දෙක් නැගී සිටියේ ය. රජ තෙමේ ජටිලගේ ගේ පිටුපස පොළොව පළාගෙණ රන්කන්දෙක් මතුවී ඇතැ'යි අසා ඔහුට සිටුසේසත යැවී ය. එතැන් සිට ජටිල, **ජටිලසෙට්ඨි** නම් වූයේ ය.

ඔහුට පුත්‍රයෝ තිදෙනෙක් වූහ. ඔවුන් වැඩිවිය පැමිණි කල්හි සිටු තෙමේ මහණ වන්නට සිතා "ඉදින් අප හා යසිසූරෙන් සමාන සිටු කුලයෙක් වේ නම් මට මහණ විය හැකි ය, නැත, මහණ වන්නට නො හැකිවනු ඇත, එහෙයින් මේ දඹදිව යසිසූරෙන් අප හා සමාන සිටුකුල ඇද්දැ" යි විමසනු පිණිස රන්මුවා උළු කැටක් ද රන් කැවිටි ලීයක් ද රන් හවඩියක් ද කරවා මිනිසුන්ට දී මේවා ගෙණ ගොස් කිසිවක් විමසන්නා සේ දඹදිව මුළුල්ලෙහි ඇවිද අපගේ සම්පත් හා සමාන සම්පත් ඇති සිටුකුල ඇද්ද, නැද්දැ යි දැන එවු"යි මිනිසුන් යැවී ය. ඔවුහු ඒවා ගෙණ ගොස් සැම තැන ඇවිද විමසා බලනුවෝ භද්දිය නගරයට ගියහ. එ කල්හි මෙණ්ඩක සිටු තෙමේ ඔවුන් දැක "ඔය්! තමුසේලා කුමක් කරමින් මෙහි ඇවිදින්නහු දැ?" යි ඇසී ය. "එක්තරා කරුණක් ගැණ දැන ගණු පිණිස සොයා ඇවිදුම්හ" යි උන් කී කල්හි "මොවුහු රන් උළු කැටක් රන් කැවිටි ලියක් රන්හවඩියක් අතේ ඇති ව කිසිවක් විමසන්නට හැසිරෙන්නෝ නො වෙති, මොවුහු රට ගැණ සොයා ඇවිදුනාහ" යි සිතා "අපගේ ගේ පිටුපසට ගොස් බලවු" යි කීයේ ය. ඔවුහු ද එහි ගියාහු අට කිරියක් පමණ තැන පොළොව බිඳ නැගී සිටි ඇත් අස් ගොන් තරම් වූ ඇළයෙන් ඇළය පැහැර සිටුනා සියලු සැපතින් පිරුණු කුස ඇති ගන රන්මුවා එළුවන් දැක උන්ගේ අතරින් අතර ඇවිද බලන්නට වූහ. මෙණ්ඩක සිටු "තමුසේලා යමක් බලමින් ඇවිදින්නහු නම් එය දක්නා ලද දැ" යි ඇසී ය. "ස්වාමීනි! නො දක්නා ලදැ" යි කී කල්හි "එසේ නම් යවු" යි ඔවුන් පිටත් කොට යැවී ය. ඔවුහු භද්දිය නගරයෙන් නික්ම ගොස් තමන්ගේ සිටු ඉදිරියෙහි පෙණී සිටියහ. එකල්හි සිටු තෙමේ "පින්වත්නි! අපගේ කුලයට සැපතින් සරිලන කුලයෙක් දක්නා ලද දැ?"යි විචාළේ ය. "ස්වාමීනි! ඔබ වහන්සේට

කුමක් තිබේ ද, හද්දිය නුවර මෙණ්ඩක සිටාණන්ගේ සම්පත්තිය මෙතෙකැ යි කියන්නට නො හැකි ය, ඒ ඉතා මහත් ය''යි මෙණ්ඩක සිටුගේ සම්පත්තිය පිළිබඳ සියලු තොරතුරු කියා සිටියහ.

එයැසූ ජටිල සිටු තෙමේ සතුටු ව ''එක් සිටු කුලයක් ලදිමි, තවත් එබඳු කුලයෙක් වේ දැ''යි සොයා බලන්නට ලක්ෂයක් අගනා කම්බිලියක් දී නැවැතත් ඔවුන් පිටත් කොට යැවූයේ ය. ඔවුහු පළමු වාරයෙහි මෙන් ඒ කම්බිලිය ගෙණ රජගහා නුවරට ගොස් ජෝතිය සිටුහුගේ මාලිගාවට නො දුරෙහි තැනක ගිනිමැලයක් කොට හුන්හ. එහි රැස් වූ මිනිසුන් ''මේ කිමැ?''යි ඇසූ විට ''අප ළඟ මහත් වටිනාකම් ඇති පලසෙක් ඇත්තේ ය, වටිනාකම මහත් බැවින් එය මිල දී ගන්නට පොහොසත්කම් ඇති එකෙක් ද නැත්තේ ය, හැර ගෙණ ඇවිදුනා කල්හි සොරුන් විසින් එය දක්නා ලද නම් ඔවුන් අප මරා දමා එය පැහැර ගණු ඇත, ඔවුනට බියෙන් පලස ගිනිබත් කරන්නට බලාපොරොත්තු වම්හ''යි කීහ. ජෝතිය සිටු, මොවුන් ගැණ අසා මුන් ගෙන්වා ''තෙපි කුමක් කරහු?''යි ඇසූ කල්හි ඔවුහු ඒ තොරතුරු කීහ. එවිට ''තොපා ළඟ තිබෙන පලසෙහි වටිනාකම කොතරම් දැ?''යි ඇසී ය. ඔවුන් එය ලක්ෂයක් අගනේ ය, යි කී විට ලක්ෂය දෙවා එය රැගෙණ ''දොර කොටුව හැමද කසළ බැහැර ලන දාසියට මෙය දෙවු''යි ඔවුන් අත ම එය යැවූයේ ය. ඕ ද පලස ගෙණ බලා හඬමින් සිටු වෙතට ගොස් ''කිම, හිමියෙනි! මා අත වරදෙක් වේ නම් මට තළන්නට මා මරා දමන්නට නො වටී ද, කුමක් නිසා මෙබඳු දළ පලසක් මා වෙත එවූහු ද, මේ දළපිළීකඩ මම කෙසේ අඳිම් ද, කෙසේ පොරොවම් දැ''යි විචාළා ය. ''මම මෙය තී වෙත එවූයෙම් අඳින්නට වත් පොරොවන්නට වත් නො වේ, මෙය බිස්සක් සේ කුඩාවට හකුළා තී වැද හෝනා යහන ළඟ තබා වැද හෝනා වේලා යෙහි සුවඳ දියෙන් පා සෝදා, සේදූ පා පිසදමන්නට ගණු පිණිස ය, එයටත් මෙය නො සුදුසු දැ?''යි සිටු තෙමේ ඇසූයේ ය. එවිට දාසිය ''හිමියෙනි එය නම් කළ හැකි ය''යි පලස ගෙණ ගියා ය.

පලස විකිණීමට රජගහා නුවරට ගිය මිනිස්සු පලස මෙසේ විකුණා මේ තොරතුරු අසා දැන තමන්ගේ සිටු වෙතට ගියහ. උන් දුටු සිටු තෙමේ ''කිම, අපට සරිලන සිටු කුලයෙක් වේ දැ?''යි ඇසී ය. ''එහෙම යි, සවාමීනි! රජගහානුවර උසස් සිටු කුලයෙක් ඇත්තේ ය, ඔබතුමාට ඇති වත්පොහොසත්කම කුමක් ද, ඔබගේ සම්පත්තිය මොන ලෙසකිනුත් රජගහානුවර සිටුහුගේ සම්පත්තියට ළං කරණු නො හැකි ය, රජගහානුවර සිටුහුගේ සම්පත්තිය ම ඉතා මහත් ය, පින්කම්හි විපාක බලන්නට නම් එහි යා යුතු ය''යි සියලු තොරතුරු දන්වා සිටියහ.

ඔවුන්ගේ බස් අසා සතුටු වූ සිටු තෙමේ "දැන් ඉතින් පැවිදි වන්නට ඉඩ ලබා ගණිමි" යි රජු වෙත ගොස් "දෙවයන් වහන්ස! මම පැවිදිවනු කැමැත්තෙමි, එයට අවසර දෙනු මැනැවැ"යි පැවිද්දට අවසර ඉල්ලී ය. "හොඳ යි, මහසිට! පැවිදි වන්නැ"යි රජ තෙමේ අවසර දුන්නේ ය. ඉක්බිති සිටු තෙමේ ගෙට ගොස් පුතුන් ඉදිරියට කැඳවා රන් මිටක් ඇති විදුරුතලයක් ඇති උදැල්-ලක් දෙවු පුතු අතට දීලා "පුතේ! ගෙයි පිටුපස පිහිටි රන් කන්දෙන් රන් පිඩක් කපා ගෙණ එව"යි කියේ ය. දෙවුපුත් උදැල්ල ගෙණ ගොස් රන් කන්දට පහර දුන්නේ ය. ඒ උදැලූ පහර ගල්තල්ලකට පහට කලක් මෙන් වී ය. ඉන් පසු ඔහුගේ අතින් උදැල්ල ගෙණ දෙවන පුතුට දී යැවී ය. ඔහු ද රන් කන්දට පහරත් ම එද පෙර සේ වී ය. නැවැත ඔහුගේ අතින් උදැල්ල ගෙණ බාල ම පුතු අතට දුන්නේ ය. ඔහු ගොස් රන් කන්දට පහර දෙත්, කොටා රැස් කොට තුබූ මැටි රැසකට කොටන්නා සේ රන් කන්ද සුණු වී ගියේ ය. ඉක්බිති සිටු තෙමේ ඔහු කැඳවා "මෙතෙක් පමණැ"යි කියා දෙවු - මැදි පුතුන් දෙ දෙනා ගෙන්වා "මේ රන් කන්ද පහළ වූයේ තොප දෙ දෙනා නිසා නො වේ, මාගේ හා තොපගේ බාල මලනුවන්ගේ ත් පින්පල වසයෙනි, එහෙයින් බාල මලනුවන් හා එක් ව මේ සම්පත් බෙදා වළඳවූ"යි කියේ ය. රන් කන්ද උන් දෙ දෙනා නිසා පහළවීමත් ජටිල උපන් දිනයෙහි ම දියෙහි පා කොට යැවීමත් කි නම් කර්මයක්හුගේ විපාක විසින් වූයේ ද? යත්: පෙර සසර ඇවිදුනා කාලයෙහි කළ කර්මයන්ගේ වශයෙනි.

කසුප් සම්මා සම්බුදු රජාණන් වහන්සේගේ පිරිනිවීමෙන් පසු උන්වහන්සේගේ ධාතු වඩා දාගැබක් ගොඩ නගන කාලයෙහි එක් රහත් භික්ෂූන් වහන්සේ නමක් සෑය ගොඩ නගන තැනට ගොස් සෑ කර්මාන්තයෙහි අඩු වැඩි දුය බලා "උපාසකයෙනි! කුමක් නිසා මෙහි උතුරුදිග මූණතෙහි වැඩ නො කෙරේ ද?" යි විචාළ කල්හි ඔවුහු "එය මූළුමනින් කොට නිමවාලන්නට තිබෙන රන් මද හෙයිනැ"යි කිහ. එවිට උන්වහන්සේ "හොඳ යි, උපාසකයෙනි! මම ඇතුළු ගමට ගොස් මහාජනයා සමාදන් කරවා රන් එකතු කොට ගෙණ එන්නෙමි, එහෙයින් අත පසු නො කොට ඉතා ඕනෑකමින් කර්මාන්ත කර ගෙණ යවු" යි වදාරා ගමට වැද ගෙයක් ගානේ යමින් "මවුපියෙනි! තොපගේ සෑයෙහි එක් මූණතක වැඩ නිමවාලන්නට රන් නැත, එය ගොඩ නගා ගැණීමට අපි අපොහොසත් වූමු නම් අපි හැම දෙන මහත් පිණෙකින් පිරි-හෙන්නමෝ ය, නො කා නො බී හෝ රන් සපයා ගෙණ මේ සෑයෙහි ඉතිරි වැඩ අපවිසින් ම කර ගත යුතු ය, රන් නැතැ යි

පසුබට වීම අප වැන්නන්ට සුදුසු නො වේ, එහෙයින් එතිලා උත්සාහවත් වවු, උත්සාහවත් වන්නහු නම් එයට වුවමනා සියලු ම රන් සපයා ගත හැකි ය, හැම දෙන මෙතිලා නැගී සිටිය යුතු ය මෙය සුලු පින්කමෙකැ යි නො සිතිය යුතු ය, දෙව් සැපත් විඳ නිවන් සැප ලැබීමට මෙය හෙතුවනු ඒකාන්ත ය, ඒ නිසා එයට හැකි පමණින් රන් දෙවු''යි මහාජනයාට කියමින් මහාජනයා සමාදන් කරවමින් එක් රන්කරු ගෙදරකට වැඩියාහ. ඒ වේලෙහි ඒ ගෙයි රන්කරු තෙමේ සිය බිරිය හා කලහ කරමින් හුන්නේ ය. උන්වහන්සේ ඒ ගැණ නො සලකා "තමුසේලා කරවීමට පටන් ගත් සෑයෙහි උතුරු දිග මූණත කරවීමට රන් නැත, එහෙයින් රන් එකතු කර දෙව''යි කීහ. එ වේලෙහි රන්කරු, බිරිය හා කලහ කොට කෝපයෙන් සැඩ ව සිටියේ "තොපගේ බුදුන් දියෙහි දමා පා කොට හරිවු''යි කීයේ ය. රන්කරු එසේ කී කල්හි එය අසා සිට ඔහුගේ බිරිය "මොනවා මේ කියති, මෙහි දී දක්වන ලද්දේ සැහැසිකමෙක්, මෙවා විඳින්නට වේවි, මට කිපුණු ඔයාට කරන්නට තුබුනේ මට බැණීම හෝ ගැසීම ය, කුමක් නිසා බුදුරජුන් කෙරෙහි කිපුනෙහි දැ?''යි කීවා ය. රන්කරු, බිරියගේ බස් අසා තැති ගත්තේ "ස්වාමීනි! මට කමන්න, මම ඔබ වහන්සේගේ දසයෙක් මි''යි තෙරුන්ගේ පා මුල වැඳ වැටී හොත්තේ ය. "උපාසක! ඔබ මට කිසිත් ඇණුමක් බැණුමක් නො කෙළෙහි, කෙළෙහි දෙවාති දෙව වූ බ්‍රහ්මාතිබ්‍රහ්ම වූ තිලෝගුරු බුදුරජාණන් වහන්සේට ය, බුදුරජාණන් වහන්සේ ආර්යයන් අතුරෙහි ශ්‍රෙෂ්ඨ වන සේක, ශීලසමාධි ප්‍රඥා විමුක්ති විමුක්ති ඥානදර්ශනාදිගුණයන්ගෙන් අගතැන් පත් වූ සේක, එකී මහත් ගුණයන්ගෙන් උන්වහන්සේට ලංවිය හැකි දෙවියකු බ්‍රහ්මයකු තබා ආර්යයෙකුදු මුළු තුන් ලොව නො තැනකත් නැත්තේ ය, එබඳු වූ බුදුරජාණන් වහන්සේට කරණ ඇණුම් බැණුම්වලින් ලැබෙන දුර්විපාකය ඉතා බිහිසුණු ය, නපුරු ය, ඉවසිය නො හැකි ය, අනිටු විපාක ඇතියේ ය, යටත් පිරිසයින් සෝවන් වූ ගිහියෙකුට වුව ද කරණ ඇණුම් බැණුම් ද ඉතා දරුණු ය, ඇණුම් බැණුම් කෙළේ මරණින් මතු අපායයෙහි ම උපදින්නේ ය, ආනන්තර්යකර්ම කළහු මරණින් පසු ලබන උත්පත්තිය ආපායික වන්නා සේ ආර්යයන් වහන්සේට ඇණුම් බැණුම් කළෝ ද දෙවන අත්බවේ දී අපායයෙහි උපදින්නෝ ය, එහෙයින් තා විසින් කළ මේ ඇණුම් බැණුම් සුලු විපාක ඇතියේ නො වේ, මහත් දරුණු විපාක ඇතියේ ය, මෙය, කල්පගණනක් අපාදුක් විඳීමට හෙතු වන අත දෙන මහාපාපයෙක, තට අපායයෙහි ඉපැදෙන්නට සිදු වන්නේ ය, එහෙයින් බුදුරජුන් කමා කර ගණුව''යි උන් වහන්සේ කීහ. එවිට ඔහු "ස්වාමීනි! කුමක්

කොට කමා කරම් දැ?''යි ඇසී ය. ''වියතක් පමණට රත්මල් යෙලයාළුක් සාදා ඒ මල් නිදන් ගැබ තුළ තැන්පත් කොට නෙත් වත් ඇති ව නෙත් හිස කෙස් ඇති ව සිට සෑය වෙත වැඳ වැටී ''සවාමීනි! භාග්‍යවතුන් වහන්ස! භාග්‍යවතුන් වහන්සේගේ දූසයකු වූ මා විසින් කොපයෙන් කියූ බසට කමා වන සේක්වා යි කමා කර ගණුව''යි තෙරුන් කී කල්හි ඔහු රත්මල් තනන්නේ, වැඩිමාලු පුතු කැඳවා ''පුත! මම බුදුරජුන්ට තරහයෙන් නපුරු වචන කීමි, එහෙයින් මේ රත්මල් තනා ගෙණ ගොස් සෑය පුද්‍ ධාතු නිධානයෙහි තබා බුදුරජුන් කමා කරවා ගන්නෙමි, පුතාත් මට මෙයට උපකාර කරන්නැ''යි කියේ ය. ඔහු ''තරහයෙන් එසේ ඇණුම් බැණුම් කළේ තාත්තා ය, අපි නො වෙමු, ඒ නිසා තාත්තා ම එය කළ යුතු ය''යි කී විට දෙවන පුතු ද ගෙන්වා ඔහුට ද තමාට සහාය වන්නැ, යි රත්කරු ඉල්ලී ය. දෙවන පුතා ද පියාගේ ඉල්ලීම පිළිකෙවූ කෙළේ ය. එවර බාල පුතු ගෙන්වා තමාට මෙයට උපකාර ඉල්ලී ය. බාල පුතා ''පියා විසින් කළයුතු කටයුතු කළ යුත්තේ දූ පුතුන් විසිනි, ඒවා දූ පුතුනට භාර ය, එහෙයින් මා එය කළයුතු ය''යි පියාගේ ඉල්ලීම පිළිගෙණ පියාට සහාය ව සිට රත්මල් තැනී ය. රත්කරු වියතක් පමණට දිග පලල ඇති රත්මල් යෙලයාළක් කොට නිමවා නෙත් වත් ඇඳ නෙත් කෙස් ඇති ව ඒවා ගෙණ ගොස් ධාතුනිධානයෙහි තබා බුදුරජුන් කමා කරවූ යේ ය. මේ හෙතුයෙන් සත් වරක් උපන්දා ම දියෙහි වැටුනේ ය. මේ වනාහි මොහුගේ අවසාන ආත්ම භාවය යි. මේ අත්බැවේදීත් එහි විපාක විසින් දියෙහි වැටුනේ ය. මොහුගේ දෙටු – මැදි දෙ පුත්හු රත්මල් තනන කාලයෙහි එයට කිසිත් උපකාරයක් නො කළහ. එහි සහාය වන්නට නො කැමැති වූහ. ඒ නිසා තම ගේ පිටුපස පහළ වූ රත්කන්ද ඔවුන් දෙ දෙනාට හිත පිණිස පහළ නො වූයේ ය. බාලපුතු හා ජටිල මල් තැනීමේ දී එක් ව රත්මල් තැනූ බැවින් ඔවුන් දෙ දෙනා පිණිස රත්කන්ද පහළ වී ය.

මෙසේ මෙ තෙමේ පුතුනට අනුශාසනා කොට අවවාද දී බුදු රජුන් වෙත ගොස් පැවිදි ව කිහිප දවසකින් ම රහත්බවට ද පැමිණියේ ය. බුදුරජානන් වහන්සේ පසු කාලයෙහි භික්ෂූන් සමග පිඩු පිණිස හැසිරෙණ සේක් ඔහුගේ පුතුන්ගේ ගෙදෙරට වැඩි සේක. ගෙදෙර වැස්සෝ අඩ මසක් ම බුද්ධප්‍රමුඛ මහාභික්ෂුසඞ්ඝයා හට මහදන් දුන්හ. භික්ෂූන් වහන්සේලා ද දම්සබා මඩුවෙහි මූන් ගැණ කතාවක් ඉපද වූහ. බුදුරජානන් වහන්සේ ඒ කතාව අසා ''මපුත්හට ඔවුන් කෙරෙහි තෘෂ්ණාවක් හෝ මානයෙක් නැතැ'' යි වදාරා මේ ධර්මදෙශනාව කළ සේක.

**යොධ තණ්හං පහාත්වාන අනාගාරො පරිබ්බජෙ,**
**තණ්හාභවපරික්ඛීණං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණන්ති.**

මේ ලොකයෙහි යමෙක් තෘෂ්ණාව පහ කොට හැර දමූ ගෙය ඇතියේ පැවිදි වේ ද, තෘෂ්ණාව හා භවයත් ක්ෂය කොට සිටි ඔහු, මම බමුණු යි කියමි.

**යො ඉධ තණ්හං පහාත්වාන අනාගාරො පරිබ්බජෙ**=මේ ලොක-යෙහි යමෙක් තෘෂ්ණාව නසා හැර දමූ ගෙය ඇතියේ පැවිදි වේ ද.

**'තණ්හා'** නම්: ඇස් - කන් - නාස් ඈ ස දොරට හමුවන රූප ශබ්ද ගන්ධාදී වූ අරමුණු නිසා උපදනා ප්‍රභෙද විසින් අටෝරාසි-යක් වූ ලොභය යි.[1]

තෘෂ්ණාව නසා ගිහි ව විසීමෙහි ආදීනව සලකා ගිහිගෙය සසර බැඳුම ය, කෙලෙස් උපදනා තැනැ,යි ගෙණ සලකා එය හැර ගියේ **'අනාගාර'** නම්.[2]

**තණ්හාභවපරික්ඛීණං තං අහං බ්‍රෑමි බ්‍රාහ්මණං** = තෘෂ්ණාව හා භවයත් නසා සිටි ගෙවා සිටි ඔහු, මම බමුණු යි කියමි.

අටෝරාසියකට බෙදුනු තෘෂ්ණාව හා කාමභවාදි වශයෙන් බෙදුනු භවයත් මුළුමනින් ගෙවා සිටියේ **'තණ්හාභවපරික්ඛීණ'** නම්.

මෙලොව යමෙක් තෘෂ්ණාව නසා සියලු දූය හැරදමා ශාස-නිකයෙක් ව පැවිදි වේ ද තෘෂ්ණාව හා භවයත් නසා දැමූ ඔහු බ්‍රාහ්මණ නම් වන්නේ ය.

ධර්මදෙශනාවගේ අවසානයෙහි බොහෝ දෙන සෝවාන්පලාදි-යට පැමිණියාහු ය.

**ජටිල වස්තුව නිමි.**

---

1. 14. 6. 'දුක්ඛසමුප්පාදං' යනු බලනු.
2. 26, 32. 'අනාගාරො පරිබ්බජෙ' ,, ,,

# ජෝතිය ස්ථවිරයන් වහන්සේ

## 26 — 33 (2)

**අජාසත්** කුමරු දෙව්දත් තෙරුන් හා එක් ව පියා මරා රාජ්‍යය පැහැර ගත්තේ ය. ඉන් පසු ජෝතිය සිටුහුගේ ප්‍රාසාදය පැහැර ගණිමි යි යුද්ධයට සැරසී නික්ම ගත්තේ ය. එහි ජෝතිය සිටු ගෙදොර වට කොට ගොඩ නගා තුබූ මිණිපවුරෙහි වැටුනු පිරිවර සහිත වූ තමන්ගේ සෙවණැල්ල ඇත දී ම දැක වැඩිදුර නො විමසා "මට විරුද්ධ ව ගැහැවි තෙමේ යුද්ධයට සැරසුනේ බල සෙනග ගෙණ නික්මුනේ වනැ"යි සිතා ඉදිරියට යන්නට නො පිළිවන් ව එහි ම සිට ගත. සිටු තෙමේ එදා පෙහෙ ව ගෙණ උදෑසන ම බත් අනුභව කොට විහාරයට ගොස් බණ අසමින් බුදුරජුන් වෙත හුන්නේ ය. ඔහුගේ පහයෙහි රැකවල් ගෙණ සිටි යමකොළි යක්‍ෂ තෙමේ බල සෙනග ගෙණ අජාසත් රජු දැක ඉදිරියට පැන කො තැනක යෙහි දැ'යි ගුගුරන්නට වූයේ ය. බල සෙනග සහිත වූ අජසත් රජ තෙමේ බියෙන් තැති ගෙණ දුවන්නට වන. බල සෙනග ද දිසා විදිසාවන්හි දිවූහ. යක් රජු විසින් ලුහුබඳනා ලද අජාසත් රජ තෙමේ විහාරයට පැන ගත්තේ ය. බුදුරජුන් වෙත බණ අසමින් හුන් සිටු තෙමේ දුව ආ රජු දැක, "මොක ද, දෙවයන් වහන්ස!"යි හුන් තැනින් නැගී සිටියේ ය. "කිම, ගැහැවිය! ඔබ මා හා යුද්ද වදින්නට සිය පිරිසට අණ කොට සිය පිරිස යොදා, මෙහි අවුත් බණ අසන්නකු සේ හිඳින්නහු?"යි රජ තෙමේ ඇසී ය. "මොක ද, දෙවයන් වහන්ස! මාගේ පහය පැහැර ගන්නට වන් ගියහු දැ?"යි සිටු ඇසූ කල්හි "ඔවු, එසේ කරන්නට සිතා ගියෙමි"යි කීයේ ය. "දෙවයන් වහන්ස! එය කළ හැකි වැඩෙක් නො වේ, මා නො කැමැත්තෙන් ඔබවහන්සේ තබා ඔබවහන්සේ වැනි සිය දහස් ගණනකටත් ඒ වැඩේ නම් නො කළ හැකි ය"යි සිටු කී විට "කිම, ඔබ මෙහි රජහු දැ"යි ඇසී ය. "මම රජ නො වෙමි, එහෙත් මා නො කැමැත්තෙන් රජකුට සොරකුට මා අයත් දැවල්ලක නූල් පටකුත් ගන්නට නො හැකි ය"යි සිටු තෙමේ කීයේ ය. එවිට රජ තෙමේ "හොඳ යි, වේවා; බලමු නො ගන්නා සැටි"යි කී ය. සිටු තෙමේ "දෙවයන් වහන්ස! එසේ නම් මාගේ මේ දෙයතෙහි ඇඟිලි දසයෙහි මුදු විස්සෙක් ඇත, මම මේ එකකුත් ඔබවහන්සේට නො දෙනු කැමැත්තෙමි, හැකි නම් ගණු මැනැවැ"යි දෙයත දිගු කෙළේ ය. රජ තෙමේ වනාහි බිම උළුයෙන් හිඳ උඩ පනිනුයේ අටළොස්රියනක් පමණ උඩට නැගීමට සමත් වේ. බිම කෙළින් සිට පනිනුයේ අසූරියනක් පමණ උඩට නගින්නේ ය. එතරම් මහත් බල ඇති රජ තෙමේ

සිටුගේ දෙයතෙහි ඇඟිලි ගෙණ මුදු ගැලවීමට එහා මෙහා පෙරළෙමින් උත්සාහ කෙළේ ද එක් මුද්දකුත් ගලවා ගන්නට අසමත් වූයේ ය. එවිට සිටු "දෙවයන් වහන්ස! සළුපටක් බිම අතුරව"යි කියා ඇඟිලි දිග හැර ඇඟිලි බිමට නතු කොට සිටියේ ය. මුදු විස්සම ගැලවී සළුව මතු පිට වැටුනේ ය. "මා අයත් දෑයක් මා නො කැමැත්තෙන් ගත නො හැකි ය"යි රජුට කියා සිටු තෙමේ රජුගේ ක්‍රියායෙන් උපන් සංවේග ඇතියේ "දෙවයන් වහන්ස! මට පැවිදි වන්නට අවසර දෙනු මැනැව"යි ඇයද සිටියේ ය. රජු ද "මොහු පැවිදි වූ කල්හි ගැහැටක් අරගලයක් නැති ව පහය ගන්නට හැකි ය"යි සිතා එක් බසට ම "හා! හොඳ යි, පැවිදි වෙවු"යි අවසර දුන්නේ ය. සිටු ද පැවිදි වූයේ වැඩි දවස් නො යවා ම රහත් බවට පැමිණ ජෝතිය ස්ථවිරයයි ප්‍රසිද්ධියට පැමිණියේ ය. ඔහු රහත් වූ ඇසිල්ලෙහි ම ඒ සියලු සම්පත් අතුරුදහන් වූ ය. දෙවියෝ සතුලකාය නම් ඔහුගේ බිරිය ගෙණ ගොස් උතුරුකුරු දිවයිනෙහි ම තැබූහ. දවසක් භික්‍ෂූන් වහන්සේලා ජෝතිය තෙරුන් අමතා "ඇවැත්නි! ජෝතිය! තමුන්නාන්සේගේ ඒ පහයෙහි හෝ ඒ ස්ත්‍රිය කෙරෙහි තෘෂ්ණා වක් වේ ද?"යි ඇසූහ. ජෝතිය තෙරුන් "ඒ කිසිවක්හු කෙරෙහි තෘෂ්ණාවක් බැඳීමෙක් නැතැ"යි කී කල්හි බුදුරජුන් වෙත ගිය ඒ භික්‍ෂූන් වහන්සේලා "ස්වාමීනි! ජෝතිය ස්ථවිරයෝ බොරු කියා රහත්බව හඟවති"යි සැලකළහ. "මහණෙනි! ඒ නම කීයේ බොරු නො වේ, මා පුත්හට ඒ කිසිවක්හු කෙරෙහි තෘෂ්ණාවක් නැතැ"යි වදාරා මේ ධර්මදෙශනාව කළ සේක.

**යොධ තණ්හං පහාතාන අනාගාරො පරිබ්බජෙ,**
**තණ්හාභවපරික්ඛීණං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණන්ති.**

මේ ලොකයෙහි යමෙක් තෘෂ්ණාව පහ කොට හැර දමූ ගෙය ඇතියේ පැවිදි වේ ද, තෘෂ්ණාව හා භවයත් ක්‍ෂය කොට සිටි ඔහු, මම බමුණු යි කියමි.

මේ ගාථායෙහි විස්තරාර්ථ යට කියූ ජටිල තෙරුන් කතා පුවතෙහි කී ලෙසින් දතයුතු ය.

ධර්මදෙශනාවගේ අවසානයෙහි බොහෝ දෙන සෝවාන් ඵලාදියට පැමිණියාහු ය.

**ජෝතිය ස්ථවිර වස්තුව නිමි.**

# නළුවෙක්

## 26 — 34

**එක්තරා** නළුවෙක් නළු නැටුම් දක්වමින් ගම් නියම්ගම්හි හැසිරෙණුයේ බුදුරජුන් වෙත පැමිණ බණ අසා පැවිදි ව රහත් වූයේ ය. ඔහු, බුද්ධ ප්‍රමුඛ භික්ෂු සඞ්ඝයා සමග පිඬු සිඟා ගිය දවසෙක භික්ෂූන් වහන්සේලා කෙළින නළුවකු දැක "ඇවැත්නි! අර නළු, තමුන්නාන්සේ කෙළි නැටුම් කළා සේ කෙළි නැටුම් කරන්නේ ය, එහි ඔබට ඇල්මෙක් වේ ද?"යි ඇසූහ. උන්වහන්සේ "කෙළි නළුයෙහි මට ඇල්මෙක් නැතැ"යි කීහු. එ කල්හි ඒ භික්ෂූන් වහන්සේලා බුදුරජුන් වෙත ගොස් "ස්වාමීනි! මේ උන්නාන්සේ බොරු කියා තමන් රහත් යි හඟවති"යි සැලකළහ. ඔවුන්ගේ බස් ඇසූ බුදුරජනන් වහන්සේ "මහණෙනි! මාගේ පුත් හට කෙළි නළු විසයයෙහි එබඳු ඇල්මෙක් නැත්තේ ය, මා පුත් සියලු යොගයන් දුරු කර සිටුනේ ය"යි වදාරා මේ ධම්දෙශනාව කළ සේක.

**හිත්වා මානුසකං යොගං දිබ්බං යොගං උපච්චගා,**
**සබ්බයොගවිසංයුත්තං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණන්ති.**

යමෙක් මිනිසුන් පිළිබඳ ආයුෂය හා පස් කම් ගුණය ද හැර දෙවියන් පිළිබඳ ආයුෂය හා පස් කම් ගුණය ඉක්මවා ගියේ ද සියලු යොගයන්ගෙන් වෙන් වූ ඔහු, මම බමුණු යි කියමි.

**හිත්වා මානුසකං යොගං දිබ්බං යොගං උපච්චගා** = (යමෙක්) මිනිසුන් පිළිබඳ ආයුෂය හා පස්කම් ගුණය හැර දෙවියන් පිළිබඳ ආයුෂය හා පස්කම් ගුණය ඉක්මවා ගියේ ද.

**'මානුසකං'** යන මෙයින් මිනිසුන් පිළිබඳ මිනිසුන් අයත් හැම දැයක් කිය හැකි වුව ද, මෙහි එය **'යොගං'** යන්න හා එක්වනුයේ කාමයොගය කියන්නේ ය. මිනිසුන් පිළිබඳ ආයුෂය ද එහි වැදී සිටුනේ ය. අටුවායෙහි මෙය මෙසේ ආයේ ය:- **"මානුසකං යොගන්ති මානුසකං ආයුඤ්චෙව පඤ්චකාමගුණං ච"**යි. **'දිබ්බං යොගං'** යන දෙ පදයෙහි ද කිය යුතු මෙසේ ය. **"දිබ්බ-යොගෙපි එසෙව නයො"**යි කීයේ එහෙයිනි.[1]

මිනිසුන් පිළිබඳ ආයුකාල ය, දෙව්බඹුන් පිළිබඳ ආයුකාල ය මෙන් මෙතෙකැ යි ප්‍රමාණවත් කොට දක්විය නො හැකි ය. මිනිසුන්ගේ ආයුකාලය පවත්නේ ඔවුන්ගේ කර්මවෙගය පවත්නා

---

1. 1. 13. 'භීරයොා තන්දති' යනු බලනු
,, 2. 4. 'මා කාමරතිසන්ථවං' ,, ,,

තුරු ය. ඔවුහු එතෙක් ම ජීවත් වෙති. මිනිසුන්ගේ ච්‍යුතිය ආයු ගෙවී යෑමෙන් පින් ගෙවී යෑමෙන් කර්මවේගය ගෙවී යෑමෙන් උපච්ඡේදක කර්මයක්හුගේ ලං වීමෙන් සිදු වන්නී ය. ඇතැම් දෙවියන් පිළිබඳ ව ද මෙසේ වන්නේ ය. මිනිසුන් අතර ඇතැම් කෙනෙක් දිගා ඇතියෝ වෙති. විශාඛා මහා උපාසිකා, පොක්කරසාති බ්‍රාහ්මණ, බ්‍රහ්මායු බ්‍රාහ්මණ, සෙලබ්‍රාහ්මණ, පාවාරිය බ්‍රාහ්මණ, ආනන්ද මහාස්ථවිර, මහාකාශ්‍යප මහාස්ථවිර යන මොවුහු එක්සිය විස්සක් අවුරුදු ජීවත් වූහ. අනුරුද්ධ ස්ථවිරයන් වහන්සේගේ ආයුකාලය අවුරුදු එක් සිය පණසෙකි. බක්කුල ස්ථවිරයන් වහන්සේ අවුරුදු එක් සිය සැටක් ජීවත් වූ හ. උන්වහන්සේ ම වැඩි ආයු කාලයක් ගෙවූහ.

මිනිසුන් පිළිබඳ කාමසම්පත්තීහු ද උස්පහත් විසින් විවිධ වෙති. මොහු පිළිබඳ කාමසම්පත්තිය මෙතරම් ය, මොහු පිළිබඳ මෙතරම් ය, යි මිනිය නො හැකි ය. ගිණිය නො හැකි ය. මිනිසුන් විසින් ඒ ඒ ජාතීන්හි කරණ ලද පුණ්‍යකර්මයන්ගේ වශයෙන් කාමසම්පත්තීන්ගේ ප්‍රතිලාභය වන්නේ ය. එහෙයින් බුදුරජාණන් වහන්සේ මෙසේ වදාළ සේක:- **"අප්පායුකසංවත්තනිකා පටිපදා අප්පායුකත්තං උපනෙති. දීඝායුකසංවත්තනිකා පටිපදා දීඝායුකත්තං උපනෙති. බව්හාබාධසංවත්තනිකා පටිපදා බව්හාබාධත්තං උපනෙති. අප්පාබාධසංවත්තනිකා පටිපදා අප්පාබාධත්තං උපනෙති. දුබ්බණ්ණසංවත්තනිකා පටිපදා දුබ්බණ්ණත්තං උපනෙති. පාසාදිකසංවත්තනිකා පටිපදා පාසාදිකත්තං උපනෙති"** යනාදී විසින්

දෙවියන් පිළිබඳ ව ද කාමසම්පත්තිප්‍රතිලාභය වෙනස් ව සිටි යි. මෙයින් එක් දෙවියෙක් අන් දෙවියකු පරදවා සිටි යි.

**සබ්බයොගවිසංයුත්තං තං අහං බ්‍රෑමි බ්‍රාහ්මණං** = සියලු යෝගයන්ගෙන් වෙන් වූ ඔහු, මම බමුණු යි කියමි.

කාම-භව-දිට්ඨි-අවිජ්ජා යන මේ ය **සබ්බයොග.** මෙ කියූ චතුර්විධ යොගයන්ගෙන් වෙන් වූයේ **'සබ්බයොගවිසංයුත්ත'** නම් වේ.[1]

යමෙක් මිනිසුන් පිළිබඳ ආයුෂය හා පස්කම් සැපය හැර දමා දෙවියන් පිළිබඳ ආයුෂය හා පස්කම් සැපය ඉක්ම ගියේ ද මෙසේ සියලු යොගයන්ගෙන් වෙන් ව සිටියේ ද ඔහු බ්‍රාහ්මණ නම් වන්නේය.

ධර්මදෙශනාවගේ අවසානයෙහි බොහෝ දෙන සෝවන් ඵලාදියට පැමිණියාහු ය.

**නටපුත්‍ර වස්තුව නිමි.**

---

1. 1. 1. 'යොගක්ඛෙමං' යනු බලනු.

# නට පුත්‍රයා

## 26 — 35

**"හිත්වා රතිඤ්ච අරතිඤ්ච"** යනාදී වූ මේ ධර්මදේශනාව සමකු ඇරැබැ දෙසූ සේක් ද, ඔහු පිළිබඳ කතා පුවත මෙයට මුලින් කියූ නටපුත්‍රයන්ගේ කතා පුවත වැනි වේ.

මෙහි ලා බුදුරජානන් වහන්සේ "මහණෙනි! මාගේ පුත්‍ර තෙමේ රතියත් අරතියත් දෙක ම පහ කොට සිටියේ ය"යි වදාරා මේ ධර්මදේශනාව කළ සේක.

> **හිත්වා රතිඤ්ච අරතිඤ්ච සීතිභූතං නිරූපධිං,**
> **සබ්බලොකාභිභුං වීරං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං.**

ඇල්ම ද නො ඇල්ම ද දුරු කොට සිහිල් වූ උපධි රහිත වූ මුළු ලොව මැඩ සිටි වීර්‍යයවත් වූ ඔහු, මම බමුණු යි කියමි.

**හිත්වා රතිං ච අරතිං ච සීතිභූතං නිරූපධිං** = ඇල්ම ද නො-ඇල්ම ද දුරු කොට සිහිල් වූ උපධි රහිත වූ.

**'රති'** නම්: මෙහි ඇල්ම ය. **'අරති'** නම්: වන සෙනසුන්හි උකටලී බව ය. **"පන්තෙසු වා සෙනාසනෙසු අඤ්ඤතරඤ්ඤත-රෙසු අධිකුසලධම්මෙසු අරති අරතිතා අනභිරති අනභිරමණා උක්කණ්ඨිතා පරිතස්සිතා අයං වුච්චති අරති"**යි විභඞ්ගයෙහි ආයේ ය. වනයෙහි මිනිසුන්ගේ හැසිරීම් නැති මිනිසුන් නො සාන නො වපුරණ දුර සෙනසුන්හි නො ඇලීම අන්‍යතර අන්‍යතර අධිකුශල ධර්මයන්හි නො ඇලීම **'අරති'**යි කියන ලදී. අතිශයින් සිදී ගියේ, සංස්කාර ක්ලෙශදරථයන් සන්සිඳ වූයේ **'සීතිභූත'** නම් ඛන්ධ-කිලෙස-අභිසඞ්ඛාර-කාමගුණ යන මොවුහු උපධි නම් වෙති. එහි ඛන්ධුපධි නම්, පස්වැදෑරුම් වූ උපාදාන ස්කන්ධයෝ ය. කිලෙ-සූපධි නම්, ලොභ-දෙස-මොහාදී වූ දසවැදෑරුම් වූ ක්ලෙශයෝ ය. අභිසඞ්ඛාරඋපධි නම්, කාම-රූප-අරූප යන තෙවැදෑරුම් වූ භූමීන් පිළිබඳ කුශල චෙතනාවෝ ය. මේ දෙකොටස ම සංස්කාර ස්කන්ධයෙහි ඇතුළත් ය. කාමගුණඋපධි නම්, ඇසින් දතයුතු වූ කණින් ඇසිය යුතු වූ නාසයෙන් ගතයුතු වූ දිවෙන් විඳිය යුතු වූ සිරුරෙන් පැහැසිය යුතු වූ රූප-ශබ්ද-ගන්ධ-රස. ස්ප්‍රෂ්ටව්‍යයෝ ය. ඔවුහු රූපස්කන්ධයෙහි ඇතුළත් වෙති. උපධි යි ගණුලබන්නේ පඤ්චස්කන්ධය යි. එහි වූ රූප කොටස රූපස්කන්ධ නම්. සෙසු කොටස් සතර නාම නම්. මෙසේ බෙදෙන මේ කොටස් පස නාම-රූප විසින් වෙන් කොට ගෙණ ව්‍යවස්ථා කොට, ඉනික්බිති මේ නාම-රූපයන් පිළිබඳ අවිද්‍යාදී වූ හෙතු ප්‍රත්‍යයයන් ද නුවණින්

දුඹිව අල්ලා ගෙණ පරීක්ෂා කොට සියලු උපධීහු අනිත්‍යයහ, දුඃඛයහ, පෙරලෙන සැහැවි ඇතියහ,යි අනිත්‍ය-දුඃඛලක්ෂණයන්ට නගා විදසුන් පිළිවෙළින් ගොස් රහත් මග නුවණින් මුන් නසා සිටියේ 'නිරුපධි' නම් වේ. මෙහි අනිත්‍යදුඃඛලක්ෂණ විසින් වැඩූයේ අනාත්මලක්ෂණ විසින් වැඩූයේ ද වේ. **"යදනිච්චං තං දුක්ඛං, යං දුක්ඛං තදනත්තා"**යි වදාල බැවිනි. මෙහි අනිත්‍යලක්ෂණයෙන් දුඃඛලක්ෂණයත් දුඃඛලක්ෂණයෙන් අනාත්මලක්ෂණයත් දක්වන ලද ය. මේද දත යුතුයः-

"කායං ච භිදුරං ඤත්වා විඤ්ඤාණං ච පභඞ්ගුරං,
උපධිසු භයං දිස්වා ජාතිමරණමච්චගා,
සම්පත්වා පරමං සන්තිං කාලං කඞ්ඛති භාවිතත්තො"

යනු. සිරුර බිඳෙන සුලුය යි ද, සිතත් බිඳෙන සුලුය යි ද දැන උපධීන්හි බිය දැක ඉපදීම හා මරණය ඉක්මියේ ය. උතුම් වූ නිවනට පැමිණ භාවනාවශයෙන් වැඩූ අත්බව් ඇතියේ තමන්ගේ පරිනිර්වාණ කාලය බලාපොරොත්තු වේ යනු අරුත්. ඛන්ධ-ක්ලෙස-අභිසඞ්ඛාර-කාමගුණ යන මොවුන් නසා සිටියේ **'නිරුපධි'** නම්.

**සබ්බලොකාභිභුං වීරං තං අහං බ්‍රෑමි බ්‍රාහ්මණං**=මුළු ලොව මැඩ ගෙණ සිටි වීර්‍ය්‍යවත් ඔහු, මම බමුණු යි කියමි.

සියලු ස්කන්ධයන්ගේ මතු පහළවීම නැසූ ශීල - සමාධි - ප්‍රඥා, විමුක්ති - විමුක්තිඥානදර්ශනාදියෙන් මුළු ලොව මැඩ ලූයේ **'සබ්බාභිභු'** ය. චතුර්විධ සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යයෙන් වීර්‍ය්‍යවත් වූයේ පහකල කෙලෙස් සැලීම් ඇතියේ **'වීර'** නම්.

පස්කම්හි ඇල්මත් වනසෙනසුන්හි නො ඇල්මත් දුරු කොට නිවී ගිය සිත් ඇත්තා වූ උපධි රහිත වූ සියලු ස්කන්ධ ලොකය මැඩ ගෙණ සිටියා වූ වීර්‍ය්‍යවත් පුද්ගල තෙමේ බ්‍රාහ්මණ නම් වන්නේ ය.

ධර්මදෙශනාවගේ අවසානයෙහි බොහෝ දෙන සෝවන්පලාදි-යට පැමිණියාහු ය.

**නටපුත්‍ර වස්තුව නිමි.**

# වඞ්ගීස ස්ථවිරයන් වහන්සේ

## 26 — 36

මළ මිනිසුන්ගේ හිස් කබලට නිය පිටින් ගසා මෙය නිරයයෙහි උපන්නකුගේ හිස, මෙය තිරිසන් යෝනියෙක උපන්නකුගේ හිස, මෙය ප්‍රෙතයෝනියෙහි උපන්නකුගේ හිස, මෙය මනුෂ්‍යලෝකයෙහි උපන්නකුගේ හිස, මෙය දෙව ලෝකයෙහි උපන්නකුගේ හිසැ’ යි කියන්නට දන්නා **වඞ්ගීස** නම් බමුණෙක් රජගහා නුවර විසූයේ ය. සෙසු බමුණෝ “මේ බමුණා නිසා අපට ලොව ගසා කෑ හැකි ය” යි ඔහුට රතුපැහැති රෙදි කඩ දෙකක් අන්දවා “මේ වංගීස බමුණු, මළ මිනිසුන්ගේ හිස් කබලට ගසා ඔවුන් උපන් තැන් කියන්නට දන්නේ ය, යම් කෙනෙක් තම තමන්ගේ මැතියන් උපන් තැන් දැන ගණු කැමැත්තාහු නම් මේ බමුණුගෙන් එය අසවු” යි කියමින් දනවු සැරිසැරූහ. මිනිස්සු, තමාට හැකි පරිදි සමහරු කහවණු දසය බැගින්, සමහරු විස්ස බැගින්, සමහරු සියය දහස බැගීන් දී තම නෑයන් උපන් තැන් විචාරන්නට පටන් ගත්හ. දවසක් බමුණෝ වංගීස බමුණන් ගෙණ සැවැත් නුවරට ගොස් දෙව්රමට නො දුරෙහි නවාතැන් ගත්හ. එක් දවසක් දවල් බත් අනුභව කොට නිමවා සිටි බමුණෝ, පස්වරුයෙහි සුවඳ මල් ගෙණ බණ අසන්නට දෙව්රම් වෙහෙරට යන උවසු උවැසියන් දැක “කො තැන යහු?” යි විචාරා “බණ අසන්නට වෙහෙරට යමූ” යි ඔවුන් කී කල්හි “මෙහි එනවා, එහි යෑමෙන් වැඩෙක් නැත, මේ වංගීසට ලංවිය හැක්කෙක් එහි නැත, වංගීස, මළ මිනිසුන්ගේ හිස් කබලට ගසා ඔවුන් උපන් තැන් කියන්නේ ය, ඒ නිසා මෙහි අවුත් ඔහුට යම්කිසිවක් දී තමූසේලාගේ මවුපියන් ඈ උපන් තැන් අසා දැන ගණිවූ” යි කියත්. ඒ උපාසක උපාසිකාවන් “තොපගේ වංගීස කුමක් දනී ද, මොන අතකිනුත් අපගේ බුදුරජුන්ට ලංවිය හැක්කෙක් නො වේ වංගීස, බුදුරජානන් වහන්සේ ලොකයෙහි එක් ම ආශ්චර්‍ය්‍යමනුෂ්‍ය වෙති, එසේ ම උන්වහන්සේ ලොකයෙහි දෙවන බුදුවරයකුගේ අභාවයෙන් අද්විතීය වෙති, එසේ ම උන්වහන්සේට අත්බවින් හෝ ප්‍රතිවෙධ කළ ධර්‍මයෙන් හෝ සහායයකු නො වන බැවින් අසහාය වෙති, උන්වහන්සේ තමන්ගේ අත්බව වැනි අත්බවෙක් අන්හට නැත්තේ අප්‍රතිම වෙති, තමන්ගේ අත්බව හා ප්‍රතිසම වූ අත් බවක් අන්හට නැති බැවින් අප්‍රතිසම වෙති, උන්වහන්සේ විසින් ‘චත්තාරො මෙ භික්ඛවෙ සතිපට්ඨානා’ යනාදි ක්‍රමයෙන් යම් ධර්‍ම කෙනෙක් දෙසන ලදද එහි ‘සතිපට්ඨාන සතරෙක් නො වේ, තුනක් හෝ පසක් විය යුතු ය’ යි විරුද්ධකථා කරන්නට සමර්‍ථ

වූවකු නො වන බැවින් අප්‍රතිභාග වෙති, 'මම බුදුමි' යි කියන්නට සමර්ථ වූ පුද්ගලයකු නො වන බැවින් උන්වහන්සේ අප්‍රතිපුද්ගල වෙති, අප්‍රතිපුද්ගල බැවින් ම සියලු සත්ත්වයන් හා අසම වෙති, අතීතානාගත සම්‍යක් සම්බුද්ධයන් හා සම බැවින් අසමසම වෙති, අපාද–දිපාද–චතුප්පාද–බහුප්පාද–රූපී–අරූපී – සඤ්ඤී – අසඤ්ඤී – නෙවසඤ්ඤීනාසඤ්ඤී සත්ත්වයන්ට අග්‍ර බැවින් අග්‍ර වෙති, මේ නිසා වංගීස කො තැන? අපගේ බුදුරජාණන් වහන්සේ කො තැනැ යි තෙපි දන්නහු ද? තොපගේ වංගීස අපගේ බුදුරජුන් ඉදිරියෙහි කශ්‍යෝපැණියකු තරම් ද නො වේ''යි කී කල්හි බමුණෝ ''කුමක් කියහු, වංගීස තරම් හපනෙක් නො වේ තමුසේලාගේ ශාස්තෘ''යි කතාව දිග් ගසා ගත්හ. උපාසකවරු ''එවු, දැන් යන්නට, තමුසේලාගේ ඔය කියන වංගීසගේත් අප ශාස්තෘහුගේත් තරම බලන්නටැ'' යි බමුණන් කැටුව වෙහෙරට ගියහ.

බුදුරජාණන් වහන්සේ උන් එන බව දැන නිරයයෙහි, තිරිසන් යොනියෙහි, මනුෂ්‍යලොකයෙහි, දෙවලොකයෙහි ඉපද සිටින සිවු දෙනකුන්ගේ හා රහත් මහණක්හුගේත් හිස්කබල් පසක් ගෙන්වා පිළිවෙළින් තබවා උන් එනු බලා වැඩහුන් සේක. උන් ආ කල්හි ''වංගීස! මළ මිනිසුන්ගේ හිස් කබලට ගසා උන් උපන් තැන් කියන්නට දනිහි සැබෑ ද?''යි අසා වදාළ සේක. ''එසේ ය, දනිමි''යි වංගීස කී ය. ''හා, හොඳ යි, එසේ වේවා, මේ කාගේ හිස්කබල ද?''යි අසා වදාළ කල්හි හිස් කබලට ගසා නිරයෙහි උපන්නහුගේ ය යි කී ය. බුදුරජනන් වහන්සේ ''කීවා සැබෑය''යි ඔහුට සතුති කළහ. තිරිසන් යොනියෙහි මිනිස්ලොව දෙව්ලොව උපන්නවුන්ගේ හිස් කබල්වලට නිය පිටින් ගසා උන් උපන් තැන් ද නො වරදවා කී ය. ඒ හැම වරත් බුදුරජාණන් වහන්සේ ඔහුට වෙන් වෙන් ව සතුති කළහ. පස්වන වර රහත් නමගේ හිස් කබල පෙන්වා ''මේ කො තැන උපන්නහුගේ හිස් කබල ද?'' යි අසා වදාළ සේක. ඒ හිස් කබල නිරයෙහි හෝ එයින් අන් තැනෙක හෝ උපන්න හුගේ ය, යි කියන්නට හේ අසමත් වී ය. එවිට බුදුරජනන් වහන්සේ ''වංගීස! මේ හිස් කබල කො තැන උපන්නහුගේ දැ යි කියන්නට නො දනිහි''යි විචාරා ''නො දනිමි'' යි කී කල්හි ''මම නම් දනිමි''යි වදාළ සේක. එවිට වංගීස ''මට මේ මන්ත්‍රය දෙවු''යි බුදුරජුන්ගෙන් ඉල්ලා සිටියේ ය. ''මේ මන්ත්‍රය නො පැවිදි වූවනට දෙන්නෙක් නො වේ, මෙය දෙන්නෙම් පැවිදි වූවනට ය''යි වදාළ කල්හි ''මේ මන්ත්‍රය උගත හොත් මම මුළු දඹදිව නායක වන්නෙමි''යි බමුණන් අමතා ''තමුන්නාසේලා මා මන්ත්‍රය උගෙණ එනතුරු කිහිප දවසක් මෙහි කො තැනක හෝ රැඳී සිටිනු මැනැව, මම මන්ත්‍රය පිණිස පැවිදි වෙමි''යි කියා බමුණන් යවා හෙ තෙමේ

පැවිදි ව උපසපන් ව වංගීස ස්ථවිර යි ප්‍රසිද්ධ වූයේ ය. නැවත බුදුරජාණන් වහන්සේ "මන්ත්‍රයට පිරියම් පිණිස මෙය වඩව"යි අසුබ කමටහන උගන්වා වදාළ සේක. ඔහු එහි පිරියම් කරණුයේ අතරතුර බමුණන් අවුත් "මන්ත්‍රය උගත්තහු ද?" යි අසත්, "තව ටික දවසක් ඉවසාලවු, මන්ත්‍රය උගන්නෙමි" යි කියා අසුබ කමටහන වඩනුයේ රහත් වූයේ ය. පසු දවසෙක බමුණන් අවුත් "මන්ත්‍රය උගන්නා ලද ද?"යි ඇසූ කල්හි "ඇවැත්නි! දැන් යනු නො හැකි ය, නො යා හැකි තැනට වැටුනෙමි, තොප හා යන්නට මම නො සුදුස්සෙමි"යි වංගීස ස්ථවිරයන් වහන්සේ කීහ. වංගීස තෙරුන්ගේ මේ කතාව අසා භික්ෂූන් වහන්සේලා බුදුරජුන් වෙත ගොස් "ස්වාමීනි! වංගීස බොරු කියා රහත් බව හඟවා"යි දන්වා සිටියහ. බුදුරජාණන් වහන්සේ "මහණෙනි! එසේ නො කියවු, මාගේ පුත් දැන් ච්‍යුති-ප්‍රතිසන්ධි දැක්මෙහි දක්‍ෂයෙකැ"යි වදාරා මේ ධර්මදෙශනාව කළ සේක.

**චුතිං යො වෙදි සත්තානං උපපත්තිඤ්ච සබ්බසො,**
**අසත්තං සුගතං බුද්ධං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං.**

**යස්ස ගතිං න ජානන්ති දෙවා ගන්ධබ්බමානුසා,**
**ඛීණාසවං අරහන්තං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණන්ති.**

යමෙක් සත්‍වයන්ගේ ච්‍යුතියත් උත්පත්තියත් හැම ලෙසින් දනී ද නො ඇලුනා වූ මනාගති ඇති සිවු සස් දහම් අවබොධ කළා වූ ඔහු, මම බමුණු යි කියමි.

යමක්හුගේ ගතිය දෙවියෝත් ගන්ධර්වයන් හා මිනිස්සුත් නො දනිත් ද, ක්‍ෂය කළ ආස්‍රව ඇති කෙලෙසුන් කෙරෙන් දුරු වූ ඔහු, මම බමුණු යි කියමි.

**චුතිං යො වෙදි සත්තානං උපපත්තිං ච සබ්බසො** = යමෙක් සත්‍වයන්ගේ ච්‍යුතියත් උත්පත්තියත් දනී ද.

ප්‍රත්‍යය හෙතුවෙන් උපන් සංස්කෘතයන්ගේ බිඳී යෑම **'චුති'** නම්. **"පච්චයසමුප්පන්නානං සඞ්ඛතධම්මානං භඞ්ගං = චුති"** යනු අටුවා. ඒ ඒ භවයෙන් සකන්ධපරම්පරාවගේ ගිලිහී යෑම ය චුති. මරණ යැ යි කියනුද මෙහි යෙදේ.

**'සත්ත'** යනු, ප්‍රාණීන්ට නාමෙකි. රූප – ශබ්ද – ගන්ධ – රස – ස්ප්‍රෂ්ටව්‍ය යන මෙ තැන්හි ඇලෙන බැවින් සත්‍වැ යි කියනු ලැබේ. අයොනිසොමනසිකාරය බොහෝ බැවින් ඒ ඒ වස්තුන්හි වූ ආදීනවය දොෂය නො බලා නො සිහි කොට ආස්වාදය ම පතා

ඒ ඒ වස්තූන්හි ඇලෙන්නේ සත්ත ය. “**සත්තාති අයොනිසො මනසිකාරබහුලතාය විජ්ජමානම්පි අදීනවං අනොලොකෙත්වා අස්සාදමෙව සරිත්වා සජ්ජනවසෙන ආසත්තා ලග්ගාති**” යනු ආඥා සි.

‘**උපපත්ති**’ නම්: ඒ ඒ භවයොනිස්ථිතිසත්ත්වාවාසයන්හි ඒ ඒ භවයනට නියමිත ස්කන්ධප්‍රතිලාභය සි. හෙවත් පිළිසිඳ ගැණීම සි. **ජාති – සඤ්ජාති – ඔක්කන්ති** යනාදී විසින් කියනලද්දී ද උපපත්තිය සි. ච්‍යුතිචිත්තයත් ප්‍රතිසන්ධිචිත්තයත් දිවැසින් නො දැකිය හැකි බැවින් මෙහිලා ගත යුත්තේ ච්‍යුති-ප්‍රතිසන්ධිචිත්තයන්ගේ ආසන්නය සි.[1]

**අසත්තං සුගතං බුද්ධං තං අහං බ්‍රෑමි බ්‍රාහ්මණං** = නො ලැගුනු මනාගති ඇති සිවු සස්දහම් අවබොධ කළ ඔහු, මම බමුණු සි කියමි.

කිසි භවයෙක, කිසි අරමුණෙක නො ලැගුනේ ‘**අසත්ත**’ නම්. කාමසුඛල්ලිකානුයොග – අත්තකිලමථානුයොග යන අන්ත දෙකට නො බැස මධ්‍යම ප්‍රතිපදායෙන් නිවනට ගියේ ‘**සුගත**’ නම්.[2] සිවු සස්දහම් අවබොධ කළේ ‘**බුද්ධ**’ නම්.[3]

යමෙක් සත්වයන් පිළිබඳ ච්‍යුතිආසන්නයන් මුළුමනින් පැහැදිලි ලෙස දනී ද, කිසි භවයෙක, කිසි අරමුණෙක නො ලැගුනු මධ්‍යම ප්‍රතිපදායෙන් නිවනට ගිය සිවු සස් දහම් අවබොධ කළ ඔහු බ්‍රාහ්මණ නම් වන්නේ ය.

**යස්ස ගතිං න ජානන්ති දෙවා ගන්ධබ්බමානුසා** = යමක්හුගේ ගතිය දෙවියෝත් ගන්ධර්වයෝත් මනුෂ්‍යයෝත් නො දනිත් ද.

‘**ගති**’ නම්: මෙහි උත්පත්තිය සි. නැත, නිෂ්ඨාය. කුශලාකුශල කර්මයන්ගේ වශයෙන් යා යුතු බැවිනි. තව ද **ගතිගති-නිබ්බත්තගති-අජ්ඣාසයගති-විභවගති-නිප්ඵත්තිගති** සි ගති බහුවිධ ය. එය “**යස්සගතිං න ජානන්ති**” යන මෙහි ගතිගතියෙහි ද, “**ඉමෙසං ඛො අහං භික්ඛූනං සීලවන්තානං නෙව ජානාමි ගතිං වා අගතිං වා**” යන මෙහි නිබ්බත්තගතියෙහි ද, “**එවම්පි ඛො තෙ අහං බ්‍රහ්මෙ ගතිඤ්ච පජානාමි චුතිඤ්ච පජානාමි**” යන මෙහි අජ්ඣාසයගතියෙහි ද, “**විභවො ගති ධම්මානං නිබ්බානං අරහතො ගති**” යන මෙහි විභවගතියෙහි ද, “**ද්වෙව ගතියො භවන්ති අනඤ්ඤා**” යන මෙහි නිප්ඵත්තිගතියෙහි ද ආයේ ය.

---

1. 5, 1 ‘සංසාරො’ යනු බලනු
2. 21, 5 ‘බුද්ධගතාසති’ ,, ,,
3 14, 1 ‘තං බුද්ධමනන්ත ගොචරං’ ,, ,,

පංචකාමගුණයන් කරණ කොට ගෙණ ද තම තමන්ගේ ආනු-භාවයෙන් ද ක්‍රීඩා කරණුයේ **'දෙව'** නම්. **"පංචහි කාමගුණෙහි අත්තනො අත්තනො ආනුභාවෙහි ච දිබ්බන්තීති = දෙවා"** යනු ආපත යි. මනසින් උත්සන්න ව ගියේ **'මනුස්ස'** නම්. **"මනසො උස්සන්නත්තා = මනුස්සා"** යනු ආපත යි.[1] සිවු මහ රජයේ ගයනුයේ වයනුයේ නටනුයේ **'ගන්ධබ්බ'** නම්.[2]

**ඛීණාසවං අරහන්තං තං අහං බ්‍රෑමි බ්‍රාහ්මණං** = ක්‍ෂය කළ ආස්‍රව ඇති කෙලෙසුන් කෙරෙන් දුරු වූ ඔහු, මම බමුණු යි කියමි.

කාමාදිආස්‍රවයන් ක්‍ෂය කොට සිටියේ **'ඛීණාසව'** නම්.[3] කෙලෙසුන් කෙරෙන් දුරු වූයේ, කෙලෙස් සතුරන් නැසූයේ, සංසාරචක්‍රයෙහි අර සිඳලූයේ, ප්‍රත්‍යයයනට සුදුසු වූයේ **'අරහන්ත'** නම්.[4]

යමක්හුගේ උත්පත්තිගතිය දෙවියෝත් ගන්ධර්වයෝත් මනුෂ්‍ය-යෝත් නො දනිත් ද, ඔහු ක්‍ෂය කළ කාමාදිආස්‍රව ඇතියේ කෙලෙසුන් කෙරෙන් දුරු වූයේ බ්‍රාහ්මණ නම් වන්නේ ය.

ධර්මදෙශනාවගේ අවසානයෙහි බොහෝ දෙන සෝවන්පලා-දියට පැමිණියාහු ය.

**වඞ්ගීසස්ථවිර වස්තුව නිමි.**

---

1\. 1. 13. 'සීයෙසා තන්දති' යනු බලනු.
2\. 8. 4 'න ගන්ධබ්බා' " "
3\. 7. 4. 'යස්සාසවා පරික්ඛීණා' " "
4 7. 9. 'යථා රහන්තො විහරන්ති' " "

# විශාඛ - ධම්මදින්නා දෙදෙන

## 26 — 37

**ධම්මදින්නාවගේ** ස්වාමිපුත්‍ර වූ **විශාඛ** උපාසක තෙමේ දවසක් විහාරයට ගොස් බුදුරජුන් වෙතින් බණ අසා අනාගාමීඵලයට පැමිණියේ ය. ඉන් පසු ඔහු "දැන් ඉතින් මා අයත් සියලු දේපල ධම්මදින්නාවට පවරා දිය යුතු ය"යි සිතා ගෙට එනුයේ අනාගාමී වන්නට පෙර කො තැනක හෝ ගොස් ගෙට එන විට වා කවුළුයෙන් පිටත බලා ඉන්නා ධම්මදින්නාව දෙස බලා සිනාසෙමින් ගෙට ඇතුල් වන්නේ ය. අනාගාමීඵලයට පැමිණිදා ගෙට එනුයේ වා කවුළුයෙන් බලා හුන් ධම්මදින්නාව දෙස නො බලා ම ගෙට ඇතුල් වී ය. ධම්මදින්නා තොමෝ "අද මාගේ ස්වාමිපුත්‍රයා වෙනදා මෙන් මා දෙස බලා සිනහ නො වී ගෙට ඇතුල් වූයේ කුමක් නිසා දැ යි නො දනිමි, හොඳ යි, වේවා, කෑම ගන්නා වේලෙහි මෙය දැන ගන්නෙමි" යි වහා ම කෑම පිළියෙල කොට කෑම එළවා තැබූ ය. උපාසක, කිසිත් නො බැණ නිහඬව ම කෑම ගත්තේ ය. ඒ වේලෙහි ධම්මදින්නා "මා හිමි කුමකින් නමුත් මට කිපුනේ වනැ"යි සිතූ ය

විශාඛඋපාසක දවසක් නිදහස් සිතින් සුවසේ ඉන්නා වේලාවක ධම්මදින්නාවට ලඟට කතා කොට වැඩි යමක් නො කියා "ධම්මදින්නා! මේ ගෙයි ඇති මා සතු සියලු දේපල බාර ගෙණ යහතින් ජීවත් වන්නැ"යි කීයේ ය. එබසට කිපී ගත් ඕ තොමෝ දේපල නො පිළිගෙණ "මේ වන්නට යන්නේ කිමැ" යි සිතමින් "හිමි! තමුන්නාන්සේ මේ දේපල මට පවරා කො තැනක යන්නහු? කුමක් කරන්නහු?"යි විචාළා ය. මම මෙවක් පටන් මේ දේපල ගැණ නො බලමි, මට මේ දේපලවලින් වැඩෙක් නැත, එහෙයින් මම මේවා ගැණ කිසිත් විචාරීමක් ද නො කරමි" යි විශාඛ කීවිට, ධම්මදින්නා තමුන්නාන්සේ විසින් කටින් දැමූ මේ කෙලගොඩ කවරෙක් පිළිගණී ද, මට මේ කිසිත් දැයෙක් වුවමනා නැත, මට පැවිදි වන්නට අවසර දුන මැනැවැ"යි ඉල්ලා සිටියා ය. "සොඳුර! හරි, ධම්මදින්නාවගේ අදහස හොඳ යි, මාත් එයට එකඟ යි, පැවිදි වන්නැ"යි මහත් සත්කාර පෙරටු කොට ඇය මෙහෙණවරට කැඳවා ගෙණ ගොස් පැවිදි කර වි ය. ඕ ඉන් පසු උපසපන් වූවා **ධම්මදින්නාස්ථවිරා** යි ප්‍රසිද්ධ වූ ය. විවේකය කැමැත්තෙන් මෙහෙණින් හා එක් ව දනවු බලා ගිය ධම්මදින්නා තොමෝ එහි වසන්නී නො බෝ දවසකින් ම පිළිසැඹියාවන් සමග රහත්බව ලැබූ ය. රහත්බව ලැබූ ඕ තොමෝ "මා නිසා මාගේ නෑයෝ පින්කම්හි යෙදී ගත්හ"යි පෙරළා රජගහානුවරට

පැමිණියා ය. විශාඛ, ඇය රජගහානුවරට පැමිණිබව අසා මෙහෙණවරට ගොස් ස්ථවිරාවන් වැඳ එකත් පසෙක හිඳ “ආයසීං! කුමක් නිසා නැවැත මෙහි ආවා ද? සසුන් පිළිවෙතෙහි කලකිරුණි ද? යි ඇසීම නො සුදුසු ය, ප්‍රශ්නයක් පමණක් අසමි” යි සිතා ස්‍රොතාපත්තිමාර්ගයෙහි ප්‍රශ්නයක් විචාළේ ය. ධම්මදින්නා තොමෝ ඇසූ ඇසිල්ලෙහි ම නො පැකිළ එය විසඳූ ය. උපාසක, ඒ ලෙසින් සෙසු මාර්ගයන්හි ද ප්‍රශ්න විචාරා ඒ ඉක්මවා රහත් මගෙහි ද ප්‍රශ්න විචාළේ ය. එවිට ධම්මදින්නා තොමෝ “ඇවැත් විශාඛ! ඔබ මෙතෙක් රහත් නො වූ බැවින් එය ඔබට විෂය වූවෙක් නො වේ, කැමැත්තහු නම් ඕනෑකම තිබේ නම් බුදුරජුන් වෙත එළැඹ මේ ප්‍රශ්නය විචාරවූ” යි කීවා ය. එ කල්හි විශාඛ තෙමේ ස්ථවිරාවන් වැඳ හුන් තැනින් නැගිට බුදුරජුන් වෙත ගොස් ඒ සියලු කතාපුවත බුදුරජුන්ට සැලකෙළේ ය. උන්වහන්සේ “ධම්මදින්නා තොමෝ ධර්මකථික වූ මෙහෙණන් අතර අග්‍රස්ථානයෙහි තබන ලද්දී මා විසිනි, ඕ තොමෝ පියුමතුරා බුදුරජුන් දවස හංසවතී නුවර පරාඅයත් තැනෙක ඉපද සිටියා පියුමතුරා බුදුරජුන්ගේ අගසවු වූ සුජාත තෙරුන්ට අධිකසත්කාර කොට ඒ තනතුර පැතූය, ඕ දිවි පමණින් කුසල් දහම් කොට දෙව්ලොව උපන්නීය, මෝ තොමෝ බුදුරජුන්ගේ කාලයෙහි උන්වහන්සේගේ භින්නමාතෘකවූ තුන් බෑයන්ගේ දානාධිකාරයෙහි කටයුතුවල යෙදී සිටි එහි සංවිධායක වූ කම්කරුගේ ගෙයි වසන්නී ‘එකක් දෙව’ යි කී කල්හි දෙකක් දීමෙන් සියල්ල නො පිරිහෙළා මැනැවින් සිදු කළා ය, එසේ කොට දෙයානූකපක් ඉක්මවා කසුප් බුදුරජුන් ලොව පහළව දම් දෙසමින් දනවූ සැරිසරමින් ලොකාර්ථචර්යායෙහි යෙදී සිටුනා කාලයෙහි කිකීරජුගේ ගෙයි පිළිසඳ ගත්තී ය, සත් බුහුනැනියන්ට ඇතුළත් ව විසි දහසක් අවුරුදු බඹසර හැසිරෙන්නී මහසඟුන් උදෙසා පිරිවෙණක් කරවා පිදූ ය, මෙසේ මෝ තොමෝ එක් බුද්ධාන්තරයක් දෙව්මිනිසුන් අතර ම සැරිසරන්නී මෙ දවස් සියලු කෙලෙස් නසා සිවුපිළිසැඹියාවන් ලබා රහත් වූ ය, මෙසේ මා දුවනිය වූ ධම්මදින්නාව විසින් එය මැනැවින් කියනලද ය, මමත් මේ ප්‍රශ්නය විසඳන්නෙම් එ ලෙසමැ” යි වදාරා මේ ධර්මදෙශනාව කළ සේක.

**යස්ස පුරෙ ච පච්ඡා ච මජ්ඣෙ ච නත්ථි කිඤ්චනං,**
**අකිඤ්චනං අනාදානං තමහං බ්‍රූමි බ්‍රාහ්මණන්ති.**

යමක්හට අතීත ස්කන්ධයන්හි ද අනාගත ස්කන්ධයන්හි ද වර්තමාන ස්කන්ධයන්හි ද පළිබොධයෙක් නැත්තේ ද, පළිබොධ නැති, ගැණීම් නැති ඔහු, මම බමුණු යි කියමි.

**යස්ස පුරෙ ච පච්ඡා ච මජ්ඣෙ ච නත්ථි කිඤ්චනං** = යමක්හට අතීත ස්කන්ධයන්හි ද අනාගත ස්කන්ධයන්හි ද වර්තමාන ස්කන්ධයන්හි ද පලිබෝධයෙක් නැත්තේ ද.

මෙහි **'පුරෙ'** යන්නෙන් අතීත භවයෙහි නිරුද්ධ ව ගිය රූප-වෙදනා - සංඥා - සංස්කාර-විඥාන යන ස්කන්ධ පංචකයත්, **'පච්ඡා'** යන්නෙන් අනාගත භවයෙහි වර්තමාන හෙතූන් නිසා පහළ වන රූප - වෙදනාදිස්කන්ධ පංචකයත්, **'මජ්ඣෙ'** යන්නෙන් අතීත භවයෙහි හෙතූන් නිසා පහල වූ වර්තමාන රූප - වෙදනාදිස්කන්ධ පංචකයත් ගත යුතු ය.

**'කිඤ්චන'** නම් රාගාදිපලිබෝධයෝ ය.[1]

**අකිඤ්චනං අනාදානං තං අහං බ්‍රෑමි බ්‍රාහ්මණං** = පලිබෝධ නැති ගැණීම් නැති ඔහු, මම බමුණු යි කියමි.

රාගාදි පලිබෝධ නැතියේ **'අකිඤ්චන'**ය. චතුරුපාදාන නැතියේ **'අනාදාන'** ය. අතීත - වර්තමාන - අනාගත ස්කන්ධයන්හි රාගාදී වශයෙන් ගැණීම් නැතියේ තෘෂ්ණා - දෘෂ්ටි - මාන වශයෙන් ගැණීම් නැතියේ අකිඤ්චනැ යි ද, අනාදානැ යි ද ගත යුතු ය. ඉක්ම ගිය භවයෙහි ස්කන්ධයන්හි, ඉදිරියෙහි ලබන භවයෙහි ස්කන්ධයන්හි දූත් දරා සිටුනා භවයෙහි ස්කන්ධයන්හි ආත්ම ආත්මීය වශයෙන් ගැණීමෙක් යමක්හට නැත්තේ ද එසේ පලිබෝධ නැති, ගැණීම් නැති ඔහු බ්‍රාහ්මණ නම් වන්නේ ය.

ධර්මදෙශනාවගේ අවසානයෙහි බොහෝ දෙන සෝවාන්පලාදි-යට පැමිණියාහු ය.

**ධම්මදින්නා සංවිරාවස්තුව නිමි.**

---

1 15, 2. 'නත්ථි කිඤ්චනං' යනු බලනු.

# ඇතුනට බිය නො වූ අඞගුලිමාල ස්ථවිරයන් වහන්සේ

## 26 — 38

**අඞ්ගුලිමාල** මහතෙරුන් පිළිබඳ කතා පුවත **"න වෙ කදරියා දෙවලොකං වජනති"** යන ගාථාවර්ණනායෙහිලා කියන ලද්දේ ය. එහි "කිම, ඇවැත්නි! ඔබ වහන්සේගේ හිස මතුයෙහි කුඩය දරා සිටි නපුරු ඇතු දුක ඔබ වහන්සේට බියෙක් නැති ගැණීමෙක් නො වූයේ දැ?" යි භික්ෂූන් නැගූ ප්‍රශනයෙහි දී උන් වහන්සේ "ඇවැත්නි! මම බිය නො වීමි, මට බියෙක් නො උපනැ"යි කීහ. එ කල්හි භික්ෂූන් වහන්සේලා බුදුරජුන් වෙත එළැඹැ "ස්වාමීනි! අඞගුලිමාල ස්ථවිරයන් වහන්සේ තමන් රහත් යි කියා ගත්නාහ" යි දන්වා සිටියහ. එවිට බුදුරජාණන් වහන්සේ "මහණෙනි! මාගේ පුත් අඞගුලිමාල ඈතකුට බිය වන්නෙක් නො වේ, ක්ෂීණාස්‍රව මහාශ්‍රෙෂ්ඨයන් අතුරෙහි ජ්‍යෙෂ්ඨ වෘෂභ වූ මාගේ පුතුන් වැනි භික්ෂුහු බියට පත් නො වෙති" යි වදාරා මේ ධර්මදෙශනාව කළ සේක.

> **උසභං පවරං වීරං මහෙසිං විජිතාවිනං,**
> **අනෙජං නහාතකං බුද්ධං තමහං බ්‍රෑමි බ්‍රාහමණනති.**

වෘෂභාජානෙයයකු බඳු වූ උතුම් වූ වීර්‍ය්‍යවත් වූ මහර්ෂි වූ දිනූ සතුරන් ඇති තෘෂ්ණා රහිත වූ සෝදා හළ කෙලෙස් මල ඇති සිවු සස් දහම් අවබොධ කළ ඔහු, මම බමුණු යි කියමි.

**උසභං පවරං වීරං මහෙසිං විජිතාවිනං** = වෘෂභාජානෙයයකු බඳු වූ උතුම් වූ වීර්‍ය්‍යවත් වූ මහර්ෂි වූ කෙලෙස් සතුරන් දිනූ, දිනූ කෙලෙස් සතුරන් ඇති.

**'උසභ'** නම්, භයසනත්‍රාස නැති බැවින් අභිමඞගල සම්මත වූ ශ්‍රෙෂ්ඨ වෘෂභ තෙමේ ය. **"අචඡම්භිතටඨෙන අභිමඞගලසම්මතෙන උසභ සදිසතාය උසභං"** යනු අටුවා. තිහීය කාරණයෙන් වෘෂභ රාජත් වූයේ **උසභ**. ගොපිතෘ වූ ගොපරිණායක වූ සමූහ නායක වූ වෘෂභ තෙමේ ය. ගෙරින් සියයකට දෙටු වූයේ **උසභ** ය, දහසකට දෙටු වූයේ **වසභ** ය, සියක් දහසකට දෙටු වූයේ **නිසභ** ය, යි ඇතමුන්ගේ පිළිගැණීම ය. තවත් කෙනෙක් එක් ගම් කෙතකට දෙටු වූයේ උසභ ය, ගම් කෙත් දෙකකට දෙටු වූයේ වසභ ය, සියලු තැන නො සැලී සිටියේ නිසභ ය, යි කියත්. එහෙත් උසභ – වසභ – නිසභ යන නම්, සම කළ හැකියකු නැති බැවින් එකකු කෙරෙහි ම යෙදී සිටියේ ය යි ගැණීම වඩා සුදුසු ය.

'පවර' නම්, සියලු ලෝ වැස්සන් විසින් අභිප්‍රාර්ථනීය වූයේ ය. ඒ මෙසේ කීහ:- **"සබ්බලෝකෙන අභිපත්ථනීයත්තා පවරො"** යනු විසින්.

'වීර' නම්, මෙහි සියලු ස්කන්ධලෝකය අභිභවනය කිරීමෙහි සමත් වූ වීර්‍ය්‍යය ඇතියේ ය.

'මහෙසි' නම්, ශීලස්කන්ධාදි වූ ගුණයන් සොයනුයේ ය. **"මහන්තෙ සීලක්ඛන්ධාදිකෙ ගුණෙ ගවෙසතීති = මහෙසී"** යනු නිරුක්ති. කෙලෙස් සතුරන් දිනූ, දිනූ කෙලෙස් සතුරන් ඇතියේ **'විජිතාවී'**ය. පුරුෂාජානෙයයකු විසින් දිනිය යුතු වූ සියලු කෙලෙස් දිනා සිටියේ විජිතාවී නම් වේ ය යි අටුවාව කියයි. **"පුරිසාජානියෙන විජෙතබ්බස්ස සබ්බස්සාපි සඞ්කිලෙසපක්ඛස්ස විජිතත්තා විධමිතත්තා=විජිතාවී"** යනු විසින්. සසුන්හි මනාව පිළිපැදීමෙන් දිනිය යුතු කෙලෙස් ඇති තාක් දිනා සිටියේ විජිතා වී ය. මෙහිලා මෙය දත යුතු ය:- **"සාසනෙ සම්මා පටිපජ්ජන්තෙන විජෙතබ්බං කිලෙසගණං විජිත්වා ඨිතො විජිතාවී නාම"** යනු. මෙතෙමේ උපධිවිවෙකයෙන් යුක්ත වූයේ ය.

**අනෙජං නහාතකං බුද්ධං**=තෘෂ්ණා රහිත වූ සෝදා හළ කෙලෙස් මල ඇති සිවු සස් දහම් අවබෝධ කළ.

**'එජා'** නම්, තෘෂ්ණා ය. අරමුණුවල ලා සත්ත්වයන් කම්පනය කරණ බැවින් එජා නම් වූ තෘෂ්ණාව මුළුමනින් නසා සිටියේ **'අනෙජ'** නම්.[1]

**'නහාතක'** නම්, සෝදා හළ කෙලෙස්මල ඇතියේ ය. **"නහාතකිලෙසත්තා = නහාතකො, ධොතකිලෙසත්තාති අත්ථො"** යනු අටුවා. සිවු සස් දහම් මුළුමනින් සිවුමග නුවණින් දැන සිටියේ **'බුද්ධ'** නම්.

**තං අහං බ්‍රෑමි බ්‍රාහ්මණං** = ඔහු මම බමුණු යි කියමි.

යමෙක් සන්ත්‍රාස නැති බැවින් වෘෂභාජානෙයයකු බඳු වූයේ ද, සියලු ලෝ වැස්සන් විසින් පැතිය යුතු බැවින් උතුම් වූයේ ද, සම්‍යක්ප්‍රධානවීර්‍ය්‍යයෙන් වීර්‍ය්‍යවත් වූයේ ද, ශීලාදිධර්මස්කන්ධ පංචකය සොයා ගත් බැවින් මහර්ෂි වූයේ ද, සියලු කෙලෙස් සතුරන් දිනූයේ ද, තෘෂ්ණා රහිත වූයේ ද කෙලෙස්මල සෝදා හළේ ද සිවු සස් දහම් අවබෝධ කෙළේ ද ඔහු බ්‍රාහ්මණ නම් වන්නේ ය.

ධර්මදෙශනාවගේ අවසානයෙහි බොහෝ දෙන සෝවන්ඵලාදී-යට පැමිණියාහු ය.

**අඞ්ගුලිමාල ස්ථවිරවස්තුව නිමි.**

---

1. 14, 6 'දුක්ඛසමුප්පාදං' යනු බලනු.

# උණුදිය හා උක්පැණි පිදූ බ්‍රාහ්මණයා

## 26 — 39

**භාග්‍යවත්** බුදුරජාණන් වහන්සේ එක් අවස්ථායෙක වාත රොගයකින් පෙළී සිටි සේක්, **උපවාන** තෙරුන් උණුදිය ගෙණ එන්නට **දෙවහිත** බ්‍රාහ්මණයා වෙතට යැවූ සේක. උන්වහන්සේ බමුණා වෙත ගොස් බුදුරජාණන් වහන්සේ රොගාතුර ව වැඩ සිඳිනබව කියා උණුදිය ටිකක් ඉල්ලූහ. එයසා තුටු සිත් ඇති බ්‍රාහ්මණ තෙමේ “බුදුරජාණන් වහන්සේ උණු දිය ඉල්ලා තමන් වහන්සේගේ ශ්‍රාවකයකු මා වෙතට එවූ සේක් ද, එය ඒකාන්තයෙන් මට මහත් ලාභයෙකැ”යි උණුදිය කදක් පුරුෂයකු ලවා ගෙන්වා ගෙණ යන්නට නියම කොට, උපවාන තෙරුන් අතට උක්පැණි මුලකුත් දුන්නේ ය. උන්වහන්සේ එය ගෙන්වා ගෙණ විහාරයට ගොස් බුදුරජුන් උණුදියෙන් නාවා උණුදිය ටිකක් බඳුනකට ගෙණ එහි උක්පැණි වත් කොට කලතා බුදුරජුන්ට පිළිගැන්නූහ. එය වැළඳූ සේක. එ කෙණෙහි ම වාතරොගය සන්සිඳී ගියේ ය. බ්‍රාහ්මණ තෙමේ “දියයුතු දෑය කාහට දුන් කල්හි මහත්ඵල වේ දැ?යි බුදුරජුන් අතින් විචාරමි”යි සිතා බුදුරජුන් වෙත ගොස් එය විචාරණුයේ “දියයුතු දෑය කවරක්හට දෙන්නේ කවරක්හට දෙන ලද්දේ මහත් ඵල ඇත්තේ වේ ද? කොයි ලෙසකින් දෙන්නහුට දක්ෂිණාව කෙසේ සමෘද්ධ වන්නී දැ?”යි විචාළේ ය.

ඉක්බිති එයට පිළිතුරු දී වදාරණ බුදුරජාණන් වහන්සේ “මෙන්න, මෙබඳු බ්‍රාහ්මණයාහට දුන් දෑය මහත් ඵල ඇත්තේ වේ ය”යි වදාරා බමුණාට ඒ දක්වන සේක් මේ ධර්ම දෙශනාව කළ සේක.

**පුබ්බෙනිවාසං යො වෙදී සග්ගාපායඤ්ච පස්සති,**
**අථො ජාතික්ඛයං පත්තො අභිඤ්ඤාවොසිතො මුනි,**
**සබ්බවොසිතවොසානං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණන්ති.**

යම් මහණෙක් පෙර වුසු කඳ පිළිවෙළ දනී ද, ස්වර්ගය හා අපායයත් දකී ද, අර්හත්ඵලයට පැමිණියේ ද, විශිෂ්ටඥානයෙන් දත යුතු නිම කෙළේ ද, මගබඹසර වැස නිම වූ ඔහු, මම බමුණු යි කියමි.

**පුබ්බෙනිවාසං යො වෙදී** = යම් මහණෙක් පෙර වුසු කඳපිළිවෙළ දනී ද.

**‘පුබ්බෙ නිවාසං’** යන මෙයින් දක්වූයේ තමන් පිළිබඳ වූත් පරා පිළිබඳ වූත් පෙර වුසු සකන්ධපරම්පරාව පිළිවෙළින් සිහි

කරණ නුවණ ය. ඒ මේ නුවණ පිළිබඳ ඉතා කෙටි කතාවක් **"සම්පජානවිජ්ජාචරණ"** යන්නට කළ පරිකථායෙහි ලා කියන ලද්දී ය. එහි කියන ලද්ද හැර මෙහි කියනු ලබන්නී ද ඒ පිළිබඳ ඉතා කෙටි කතාවකි. එහෙයින් ඒ හා මේ හා බැලිය යුතු ය.

සන්තානපරම්පරාව හෙවත් චුති-පටිසන්ධීන් සිහි කරණු කැමැති යෝගී මහණහු විසින් පිඩු සිඟා ගොස් අවුත් වළඳා අවසන්හි විවෙක ස්ථානයකට ගොස් එකලා ව හිඳ සිත එක අරමුණෙක තබා පිළිවෙළින් ප්‍රථම - ද්විතීය - තෘතීය - චතුර්ථධ්‍යානයන්ට සමවැද අභිඥාපාදකචතුර්ථධ්‍යානයෙන් නැගී සිටිය යුතු ය. එසේ චතුර්ථ-ධ්‍යානයෙන් නැගී සිට තෙරුවන් වැඳීම් ආදී හැම කටයුතුවලට පසුව කළ හිඳීම ගැණ මෙනෙහි කළ යුතු ය. එයින් පසු ඒ හිඳීමට පෙරටු ව වූ අසුන් පැණවීම සෙනසුනට පිවිසීම පා සිවුරු තැන්පත් කිරීම හා වළඳන කාලය, ගමින් එන කාලය, පිඬු පිණිස හැසිරෙණ කාලය, ඒ පිණිස ගම් වැදුනු කාලය, විහාරයෙන් නික්මෙන කාලය සෑ - බෝ වඳින කාලය, පාත්‍රය දෝනා කාලය, පාත්‍රය ගන්නා කාලය හා එතැන් පටන් මුවසේදීම තෙක් කළ කටයුතු ද එසේ ම අලුයම මැදියම පළමු යාමය යන මේ කාලයන්හි කළ කටයුතු දූ යි ප්‍රතිලෝම වශයෙන් ද සියලු රෑ දැවල කළ කටයුතු ද මෙනෙහි කළ යුතු ය. එවිට මේ කටයුතු ප්‍රකෘතිචිත්තයට හා පරිකර්ම වශයෙන් උපදනා සමාධිචිත්තයටත් ප්‍රකට ව වැටහෙනු ඇත. මෙයින් කිසිවක් නො වැටහේ නම් නැවැත පාදකධ්‍යානයට සමවැද ඉන් නැගිට ආවර්ජනය කළ යුතු ය. එවිට ප්‍රකට ව වැටහෙන්නේ ය.

මෙසේ ප්‍රතිලෝම වශයෙන් දෙවන දවස තෙවන දවස සිවුවන දවස පස්වන දවස දසවන දවස ද අඩමස, මස, අවුරුද්දක් ද යන මෙතෙක් කල් තෙක් කළ දූය ආවර්ජනය කළ යුතු ය. ක්‍රමයෙන් දස අවුරුද්දක් ද විසි අවුරුද්දක් දූ යි මේ අත්බව්හි තමාගේ පිළිසඳ තෙක් මෙනෙහි කළ යුතු ය. නැවැත මෙයට අනතුරු අත්බව්හි ච්‍යුතික්ෂණයෙහි පැවැති නාම - රූප මෙනෙහි කළ යුතු ය. මෙහි පුරුදු කළ නුවණැති මහණ මුල්වාරයෙහි ම ප්‍රතිසන්ධිය උගුළුවා ච්‍යුතික්ෂණයෙහි පැවැති නාම - රූප බැලීමට සමර්ථ වන්නේ ය. මුලින් කියූ සේ පැසුළු හිඳීම පටන් ප්‍රතිසන්ධිය තෙක් පැවැති ඥානය පූර්වේනිවාසානුස්මෘතිඥානය නො වන්නේ ය. ඒ වනාහි ඒ ඥානයට පිරියම් පිණිස පැවැති සමාධිය හා එක් වූ ඥානය යි. මේ යෝගී මහණහුට ප්‍රතිසන්ධිය ඉක්ම ච්‍යුතික්ෂණයෙහි පැවැති නාම - රූප අරමුණු කොට මනොද්වාරාවර්ජනචිත්තය උපදී ද එය නිරුද්ධව ගිය කල්හි එය ම එල්බ ගෙණ ජවන් සිත් සතරක් හෝ පසක් උපදී. එයින් මුලින් සිටි ජවන් සිත් පරිකර්මාදිකාමාවචර නම් ලබන

අතර අවසනැ ම වූ ජවනය රූපාවචර චතුර්ථධ්‍යානය හා සමග යෙදුණේ අප්පණාචිත්ත යි නම් ලබන්නේ ය. ඒ අර්පිණාචිත්තය හා සමග යෙදුනු ඥනය පුබ්බෙ නිවාසානුස්සතිඥණ නම් වේ. ඒ හා යෙදුනු සිහියෙන් මේ යොගී තෙමේ පෙර වුසූ කඳපිළිවෙල සිහි කරන්නේ ය.

මේ, බුදුරජාණන් වහන්සේ එය වදාළ සැටි:-

"සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ පුබ්බෙනිවාසානුස්සති ඤාණාය චිත්තං අභිනින්නාමෙති. සො අනෙක විහිතං පුබ්බෙනිවාසං අනුස්සරති. සෙය්‍යථීදං:- එකම්පි ජාතිං ද්වෙපි ජාතියො තිස්සොපි ජාතියො චතස්සොපි ජාතියො පඤ්චපි ජාතියො දසපි ජාතියො වීසතිම්පි ජාතියො තිංසම්පි ජාතියො චත්තාරීසම්පි ජාතියො පඤ්ඤාසම්පි ජාතියො ජාතිසතම්පි ජාතිසහස්සම්පි ජාතිසතසහස්සම්පි අනෙකෙපි සංවට්ටකප්පෙ අනෙකෙපි විවට්ටකප්පෙ අනෙකෙපි සංවට්ට විවට්ටකප්පෙ 'අමුත්‍රාසිං එවංනාමො එවංගොත්තො එවංවණ්ණො එවමාහාරො එවං සුඛ-දුක්ඛපටිසංවෙදී එවමායුපරියන්තො. සො තතො චුතො ඉධූප පන්නොති ඉතිසාකාරං සඋද්දෙසං අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති. සෙය්‍යථාපි භික්ඛවෙ පුරිසො සකම්හා ගාමා අඤ්ඤං ගාමං ගච්ඡෙය්‍ය, තම්හා ගාමා අඤ්ඤං ගාමං ගච්ඡෙය්‍ය, සො තම්හා ගාමා සකංයෙව ගාමං පච්චාගච්ඡෙය්‍ය, තස්ස එවමස්ස:- අහං ඛො සකම්හා ගාමා අමුං ගාමං අගච්ඡිං, තත්‍ර එවං අට්ඨාසිං, එවං නිසීදිං, එවං අභාසිං, එවං තුණ්හී අහොසිං, තම්හාපි ගාමා අමුං ගාමං අගඤ්ඡිං, තත්‍රාපි එවං අට්ඨාසිං, එවං නිසීදිං, එවං අභාසිං, එවං තුණ්හී අහොසිං, සොම්හි තම්හා ගාමා සකංයෙව ගාමං පච්චාගතොති" යි.

අධිගතචතුර්ථධ්‍යානය ඇති යොගී මහණ තෙමේ මේ අයුරෙන් රූපාවචර සිත චතුර්ථධ්‍යාන සමාධියෙන් එකඟ වූ කල්හි උපෙක්‍ෂා ස්මෘතියෙන් පිරිසිදු වූ කල්හි එබැවින් ම ප්‍රභාස්වර වූ කල්හි පහ වූ රාගාදි අඞ්ගණ ඇති කල්හි පහවූ කෙලෙස් ඇති කල්හි මොනවට වැඩූ බැවින් මොළොක් වූ කල්හි කර්මයට යොග්‍ය වූ කල්හි පිරිසිදු බැව් ආදියෙහි පිහිටි කල්හි ශ්‍රද්ධාදීන් විසින් පරිගෘහිත බැවින් නො සැලී සිටුනා කල්හි පූර්වේනිවාසානුස්මෘතිඥනය පිණිස සිත එලවා තබයි. ඒ මහණ තෙමේ නන්වැදෑරුම් වූ පෙරවුසු කඳ පිළිවෙළ සිහි කරයි. ඒ කිසේද? යත්:- ජාති එකකුදු ජාති දෙක-කුදු ජාති තුනකුදු ජාති සතරකුදු ජාති පසකුදු ජාති දසයකුදු ජාති විස්සකුදු ජාති තිසකුදු ජාති සතළිසකුදු ජාති පණසකුදු

ජාති සියයකුදු ජාති දහසකුදු ජාතිසියක් දහසකුදු නොයෙක් සංවත්‍ කල්පයනුදු නොයෙක් විවත්කල්පයනුදු නොයෙක් සංවත්විවත් කල්පයනුදු අසවල් තැන මෙබඳු නම් ඇතියෙම් වීම්, මෙබඳු ගොත් ඇතියෙම් වීම්, මෙබඳු පැහැ ඇතියෙම් වීම්, මෙබඳු අහර ඇතියෙම් වීම්, මෙසේ සුවදුක් විඳියෙම් වීම්, මෙසේ ආයු කෙළවර කෙළෙම් වීම්, මම මෙයින් ච්‍යුත ව අසවල් තැන උපන්මි, එහිදු මෙබඳු නම් ඇතියෙම් වීම්, මෙබඳු ගොත් ඇතියෙම් වීම්, මෙබඳු පැහැ ඇතියෙම් වීම්, මෙබඳු අහර ඇතියෙම් වීම්, මෙසේ සුවදුක් විඳියෙම් වීම්, මෙසේ ආයු කෙළවර කෙළෙම් වීම්, මම එයින් ච්‍යුත ව මෙහි උපන්මි''යි මෙසේ ආකාරසහිත වූ උද්දෙස සහිත වූ පෙරවුසු කඳ පිළිවෙළ සිහි කරයි. මහණෙනි! යම් පරිදි පුරුෂ තෙමේ සියගමින් අන් ගමකට යන්නේ වේ ද, එ ගමිනුදු අන් ගමකට යන්නේ වේ ද, හෙ තෙමේ එගමින් සියගමට ම පෙරළා එන්නේ වේ ද, එ කල්හි ඔහුට මෙබඳු සිත් වන්නේ යඃ- මම වනාහි සිය ගමින් අසවල් ගමට ගියෙමි, එහිදී මෙසේ සිටියෙමි, මෙසේ හිඳ ගතිමි, මෙසේ බිණිමි, මෙසේ නිහඬ වීමි, මම එගමිනුදු අසවල් ගමට ගියෙමි, එහිදීත් මෙසේ සිටියෙමි, මෙසේ හිඳ ගතිමි, මෙසේ බිණිමි, මෙසේ නිහඬ වීමි, මම එගමින් පෙරළා සිය ගමට ම ආයෙමි'' යනු එහි සිංහලය යි.

මෙහි **''එකම්පි ජාතිං''** යනු ප්‍රතිසන්ධිය මුල් කොට ච්‍යුතිය කෙළවර කොට සිටි එක් ම භවයකට අයත් එක් ම භවයෙක්හි ඇතුළත් ස්කන්ධපරම්පරාව ය. ජාති දෙකක් යනාදී තන්හි ද මෙසේ ය. **''සංවට්ටකප්ප''** නම්, පිරිහෙන නැසෙන කල්පය යි. **''විවට්ටකප්ප''** නම් වැඩෙන හට ගැණෙන කල්පය යි. මෙදෙකින් **''සංවට්ටට්ඨායී – විවට්ටට්ඨායී''** කල්ප ද ගැණේ. විස්තර විශුද්ධි මාර්ගයෙන් දත හැක්කේ ය.

**''අමුත්‍රාසිං''** යනු, අසවල් සංවට්ටකල්පයෙහි මෙ නම් භවයෙක හෝ මෙ නම් යොනියෙක හෝ මෙ නම් ගතියෙක හෝ මෙ නම් විඤ්ඤාණට්ඨිතියෙක හෝ මෙ නම් සත්ත්වාවාසයෙක හෝ මෙ නම් සත්ත්ව නිකායෙක හෝ උපන්මි, **''එවං නාමො''** යනු, තිස්ස–ඵුස්ස ආදී වශයෙන් මෙසේ නම් ඇතියෙම් වීම්, **''එවං ගොත්තො''** යනු, කච්චායන – කස්සප ආදී වශයෙන් මෙසේ ගොත් ඇතියෙම් වීම්, යනු අරුත්. ඒ කාලයෙහි තම සිරුරෙහි පැහැය හෝ රළු පිණි දිවිපෙවෙත හෝ සුවදුක් අඩු වැඩිබව හෝ වයසෙහි අඩු වැඩිබව හෝ සිහි කරණු කැමැති නම් එද සිහි කරන්නේ ය. එහෙයින් **''එවං වණ්ණො එවමාහාරො එවං සුඛදුක්ඛපටිසංවෙදී එවමායු–පරියන්තො''** යනු වදාළෝ ය. ඒ මම ඒ භව – යොනි ආදියෙන්

ච්‍යුත ව අසවල් භවයෙහි ආදියෙහි උපන්මි'යි සිහි කරණ බව **"සො තතො චුතො අමුත්‍ර උපපාදිං"** යන මෙයින් වදාළ සේක. **"තත්‍රාපාසිං"** යන මෙයින් වදාළෝ ඒ යොගිහුගේ මෙහි ඉපැත්මට අනතුරුව හුන් තැන, නම්, ගොත් ආදීන්ගේ සිහි කරණ බව දක්වීමට ය. මේ යොගී තෙමේ 'ඒ මම නැවත උපන් එ තැනින් ච්‍යුත ව මේ අත්බව්හි අසවල් කැත්කුලයෙහි හෝ බමුණු කුලයෙහි හෝ උපන්මි' යි සිහි කරන්නේ ය, යනු දක්වනු සඳහා **"සො තතො චුතො ඉධූපපන්නො"** යනු වදාළාහු ය. මෙසේ නොයෙක් අයුරින් පෙරවිසූ කඳ පිළිවෙළ සිහිකිරීම පුබ්බෙනිවාසානුස්සතිඤාණ ය යි දත යුතු ය.

**සග්ගාපායං ච පස්සති** = සවර්ගය හා අපායයන් දකී ද.

සවිසි වැදෑරුම් දෙව්ලොව **'සග්ග'** නම්.[1] සිවුවැදෑරුම් අපාය ය **'අපාය'** නම්.[2] කාමසවර්ග සය, බ්‍රහ්මලොක නවය, සුද්ධාවාස පස, අරූපලොක සතර, අසඤ්ඤසත්තය, වෙහප්ඵලය යන මේ ය සවිසි වැදෑරුම් සවර්ග. නිරය, තිරිසන්යොනිය, ප්‍රෙතලොකය, අසුරකාය යන මේ ය සිවුවැදෑරුම් අපාය ය. ඒ මේ සවර්ගය හා අපාය ය දිවැසින් දැකීම **'පස්සති'** යන ක්‍රියා පදයෙන් කියන්නේ ය. ච්‍යුති – උත්පත්ති දන්නා නුවණ දිවැසැ යි කියනු ලැබේ.[3]

**අථො ජාතික්ඛයං පත්තො** = තව ද අර්හත්ඵලයට පැමිණියේ(ද)

**'ජාතික්ඛය'** නම්, අර්හත්ඵලය යි. භවයෙහි ඉපැත්ම මුළුමනින් නසාලනුයේ අර්හත්ඵලයෙනි. එහෙයින් අර්හත්ඵලය ජාතික්ඛය යි කියන ලදී.[4]

**අභිඤ්ඤා වොසිතො මුනි** = විශිෂ්ටඥානයෙන් දැන සිවු මගින් කටයුතු නිම කෙළේ ද.

විශිෂ්ටඥානයෙන් දතයුතු මාර්ගඵලධර්ම වෙසෙසා දැන පිරිසිඳ දතයුතු පස්කඳ පිරිසිඳ දැන පැහිය යුතු තෘෂ්ණාව ප්‍රහාණය කොට පිළිවිද දතයුතු නිවන පිළිවිද දැන වැඩිය යුතු අරි අටඟිමග වඩා සිවුමගින් අවසන් කළ කටයුතු ඇතියේ **'අභිඤ්ඤාවොසිත'** නම්.[5]

**'මුනි'** නම්, ආස්‍රවක්ෂයප්‍රඥයෙන් ප්‍රඥවත් වූ රහතුන් වහන්සේ ය.[6]

1. 1. 13. 'සුගතිං' යනු බලනු
2. 1. 12. 'දුග්ගතිං' ,, ,,
3. 10. 10. 'සම්පන්නාවිජ්ජාචරණ' ,, ,,
4. 14. 6. 'දුක්ඛස්ස ච අතික්කමං' ,, ,,
5. 14. 6 'අරියංචට්ඨඞ්ගිකංමග්ගං ,, ,,
6. 17. 5. 'අහිංසකා යෙ මුනයො ,, ,,

**සබ්බවොසිතවොසානං තං අහං බෘමි බ්‍රාහ්මණං** = මගබඹසර වැස නිම වූ ඔහු, මම බමුණු යි කියමි.

සකලක්ලෙශයන්ගේ අවසනැ යි කියූ අර්හත්මාර්ගඥාන නම් වූ බ්‍රහ්මචර්‍ය්‍යාවාසය වැස නිම වූයේ **'සබ්බවොසිතවොසාන'** නම්. **"සබ්බකිලෙසානං වොසානං අරහත්තමග්ගඤාණං බ්‍රහ්මචරියවාසං වුසිතභාවෙන සබ්බවොසිතවොසානං"** යනු දේශනා ය. **'තං'** යනු වෙසෙසන්නේ ය.

යමෙක් අතීතස්කන්ධපරම්පරාව දත ස්වර්ගය හා අපායයත් දිවැසින් දක අර්හත්ඵලයට පැමිණ විශිෂ්ටඥානයෙන් දත සිවුමගින් කළයුතු කටයුතු මුළුමනින් ක්ෂය කෙළේ ද, මෙසේ මගබඹසර වැස නිම වූ ඔහු බ්‍රාහ්මණ නම් වන්නේ ය.

ධර්මදේශනාවගේ අවසානයෙහි බොහෝ දෙන සෝවත්පලාදියට පැමිණියාහු ය. බ්‍රාහ්මණයා ද පහන් සිත් ඇතියේ සරණයෙහි පිහිටා ගෙණ තමන් උපාසකයකු වූ බව දන්වා සිටියේ ය.

**දෙවහිතක බ්‍රාහ්මණ වස්තුව නිමි.**

අම්බලම්ගොඩ ශාස්ත්‍රොදයපරිවෙණාධිශ්වර සකලජනධර්මාර්ථසංග්‍රහාභිලාෂී **පණ්ඩිත අම්බලම්ගොඩ ධම්මකුසල** අධිකරණ නායක ස්ථවිරයන් කළ **සද්ධර්මසාගර** නම් වූ **ධර්මපදවර්ණනායෙහි** බ්‍රාහ්මණවර්ගාත්මක ෂඩ්විංශතිතමතරඞ්ගය නිමියේ ය.

---

ශ්‍රී රාජාධිරාජසිංහනෘපතෙර්මන්ත්‍රිෂු යොධ්‍යාපනෙ,
මාත්‍යොභූත්තත එව සොන්වයවශාජ්ජාතොක්ෂරාර්ජීශාහ:,
ඉත්ථං බණ්ඩිතපට්ටවංශතිලක: ශාස්ත්‍රොදයෙධීශ්වර
ශ්වක්‍රෙ ග්‍රන්ථමිමං **සද්ධර්මකුශලො** ව්‍යක්තො යතීනාම්පති:

රන්ධ්‍රව්‍යොමමහර්ෂිකද්ර්ශනමිතෙ බෞද්ධාබ්දිකෙ ශ්‍රාවණෙ
ශුක්ලෙ පක්ෂගතෙත්‍ර සප්තමතිථෞ හෞමෙ සමාප්තිංගත:
ග්‍රන්ථොයං පරධර්මශාස්ත්‍රවිදුරෛර්මුක්තෞ සමාරොපිතා
සන්තා ද්‍රෂ්ටි විෂමා යථාර්ථවිමුඛා හිත්වා සදා වර්තතෙ

සර්වාණ්‍යත්‍රගතෙ පදාන්‍යනුපදං සුද්ධාත්‍ය සංවර්ණිතෙ
ධීමද්භි: පරිභාවිතො මෘතරසෛර්ව්‍යාප්ත: ප්‍රමාහෙතුක:
සොයං ඥානවතාං යථාර්ථවිදුෂාං මුක්ත්‍යර්ථමුද්භාසයන්
නාකල්පං භුවි වර්තතාමිති හිතාභීෂ්ටා මදීයා භවෙත්.

ශම්

## වර්ග නිර්දේශය

යමක, අප්‍රමාද, චිත්ත, පුෂ්ප, බාල, පණ්ඩිත, අර්හන්ත, සහස්‍ර, පාප, දණ්ඩ, ජරා, ආත්ම, ලෝක, බුද්ධ, සුඛ, ප්‍රිය, ක්‍රෝධ, මල, ධර්මස්ථ, මාර්ග, ප්‍රකීර්ණක, නිරය, නාග, තෘෂ්ණා, භික්ෂු, බ්‍රාහ්මණ යි සව්සි වර්ග කෙනෙක් සුයර්බඥු වූ බුදුරජානන් වහන්සේ විසින් දෙසන ලදහ.

## වර්ගීය ගාථා සඞ්ඛ්‍යානිර්දේශය

යමකවර්ගයෙහි ගාථා විස්සෙක. අප්‍රමාදවර්ගයෙහි දොළොසෙක. චිත්තවර්ගයෙහි එකොළොසෙක. පුෂ්පවර්ගයෙහි සොළොසෙක. බාලවර්ගයෙහි සොළොසෙක. පණ්ඩිතවර්ගයෙහි තුදුසෙක. අර්හන්තවර්ගයෙහි දසයෙක. සහස්‍රවර්ගයෙහි සොළොසෙක. පාපවර්ගයෙහි තෙළෙසෙක. දණ්ඩවර්ගයෙහි සතොළොසෙක. ජරාවර්ගයෙහි එකොළොසෙක. ආත්මවර්ගයෙහි දසයෙක. ලෝකවර්ගයෙහි දොළොසෙක. බුද්ධවර්ගයෙහි අටළොසෙක. සුඛවර්ගයෙහි දොළොසෙක. ප්‍රියවර්ගයෙහි දොළොසෙක. ක්‍රෝධවර්ගයෙහි තුදුසෙක. මලවර්ගයෙහි එක් විස්සෙක. ධර්මස්ථවර්ගයෙහි සතොළොසෙක. මාර්ගවර්ගයෙහි සතොළොසෙක. ප්‍රකීර්ණකවර්ගයෙහි සොළොසෙක. නිරයවර්ගයෙහි තුදුසෙක. නාගවර්ගයෙහි තුදුසෙක. තෘෂ්ණාවර්ගයෙහි සව්ස්සෙක. භික්ෂුවර්ගයෙහි තෙවිස්සෙක. බ්‍රාහ්මණවර්ගයෙහි එක්සාළිසෙකැ යි ගාථා සාරසිය තෙවිස්සෙක් වේ.

# වසතුනිදේශ:—

## යමකවග්ගය 1.

**1 චක්ඛුපාලත්ථෙරවත්ථු** =

1. මනොපුබ්බඞ්ගමා ධම්මා මනොසෙට්ඨා මනොමයා,
මනසා චෙ පදුට්ඨෙන භාසති වා කරොති වා,
තතො නං දුක්ඛමන්වෙති චක්කංව වහතො පදං. 15

**2 මට්ටකුණ්ඩලීවත්ථු** =

2. මනොපුබ්බඞ්ගමා ධම්මා මනොසෙට්ඨා මනොමයා,
මනසා චෙ පසන්නෙන භාසති වා කරොති වා,
තතො නං සුඛමන්වෙති ඡායාව අනපායිනී. 34

**3 චුල්ලතිස්සත්ථෙරවත්ථු** =

3. අක්කොච්ඡි මං අවධි මං අජිනි මං අහාසි මෙ,
යෙ තං උපනය්හන්ති වෙරං තෙසං න සම්මති.

4. අක්කොච්ඡි මං අවධි මං අජිනි මං අහාසි මෙ,
යෙ තං න උපනය්හන්ති වෙරං තෙසූපසම්මති. 44

**4 කාලියක්ඛිනීවත්ථු** =

5. න හි වෙරෙන වෙරානි සම්මන්තීධ කුදාචනං,
අවෙරෙන ච සම්මන්ති එස ධම්මො සනන්තනො. 53

**5 කොසම්බකභික්ඛුවත්ථු** =

6. පරෙ ච න විජානන්ති මයමෙත්ථ යමාමසෙ,
යෙ ච තත්ථ විජානන්ති තතො සම්මන්ති මෙධගා. 67

**6 චූලකාල මහාකාලත්ථෙරවත්ථු** =

7. සුභානුපස්සිං විහරන්තං ඉන්ද්‍රියෙසු අසංවුතං,
භොජනම්හි ච අමත්තඤ්ඤුං කුසීතං හීනවීරියං,
තං වෙ නප්පසහති මාරො වාතො රුක්ඛං ච
දුබ්බලං.

8. අසුභානුපස්සිං විහරන්තං ඉන්ද්‍රියෙසු සුසංවුතං,
භොජනම්හි ච මත්තඤ්ඤුං සද්ධං ආරද්ධවීරියං,
තං වෙ නප්පසහති මාරො වාතො සෙලංව පබ්බතං. 75

**7 දෙවදත්තත්ථෙරවත්ථු =**

9. අනික්කසාවො කාසාවං යො වත්ථං පරිදහෙස්සති,
අපෙතො දමසච්චෙන න සො කාසාවමරහති.

10. යො ච වන්තකසාවස්ස සීලෙසු සුසමාහිතො,
උපෙතො දමසච්චෙන ස වෙ කාසාවමරහති. 100

**8 අග්ගසාවකත්ථෙරවත්ථු =**

11. අසාරෙ සාරමතිනො සාරෙ චාසාරදස්සිනො,
තෙ සාරං නාධිගච්ඡන්ති මිච්ඡාසඞ්කප්පගොචරා.

12. සාරඤ්ච සාරතො ඤත්වා අසාරඤ්ච අසාරතො,
තෙ සාරං අධිගච්ඡන්ති සම්මා සඞ්කප්පගොචරා. 152

**9 නන්දත්ථෙරවත්ථු =**

13. යථාගාරං දුච්ඡන්නං වුට්ඨී සමතිවිජ්ඣති,
එවං අභාවිතං චිත්තං රාගො සමතිවිජ්ඣති.

14. යථාගාරං සුච්ඡන්නං වුට්ඨී න සමතිවිජ්ඣති
එවං සුභාවිතං චිත්තං රාගො න සමතිවිජ්ඣති. 160

**10. චුන්දසූකරිකවත්ථු =**

15. ඉධ සොචති පෙච්ච සොචති
පාපකාරී උභයත්ථ සොචති,
සො සොචති සො විහඤ්ඤති දිස්වා
කම්මකිලිට්ඨමත්තනො. 168

**11 ධම්මිකඋපාසකවත්ථු =**

16. ඉධ මොදති පෙච්ච මොදති කතපුඤ්ඤො
උභයත්ථ මොදති,
සො මොදති සො පමොදති දිස්වා
කම්මවිසුද්ධිමත්තනො. 186

**12 දෙවදත්තත්ථෙරවත්ථු =**

17. ඉධ තප්පති පෙච්ච තප්පති පාපකාරී
උභයත්ථ තප්පති,
පාපං මෙ කතන්ති තප්පති භීය්‍යො තප්පති
දුග්ගතිං ගතො. 201

**13 සුමනාදෙවිවත්ථු =**

18. ඉධ නන්දති පෙච්ච නන්දති කතපුඤ්ඤො
උභයත්ථ නන්දති,
පුඤ්ඤං මෙ කතන්ති නන්දති භීය්‍යො නන්දති
සුග්ගතිං ගතො. 212

14 දෙවසහායකභික්ඛුවත්ථු =

19. බහුම්පි චෙ සහිතං භාසමානො,
න තක්කරො හොති නරො පමත්තො,
ගොපොව ගාවො ගණයං පරෙසං
න භාගවා සාමඤ්ඤස්ස හොති.

20. අප්පම්පි චෙ සහිතං භාසමානො
ධම්මස්ස හොති අනුධම්මචාරී,
රාගඤ්ච දොසඤ්ච පහාය මොහං
සම්මප්පජානො සුවිමුත්තචිත්තො,
අනුපාදියානො ඉධ වා හුරං වා
ස භාගවා සාමඤ්ඤස්ස හොති. 220

## අප්‍රමාදවගීය 2.

1 උදෙනවත්ථු =

21. අප්පමාදො අමතපදං පමාදො මච්චුනො පදං,
අප්පමත්තා න මීයන්ති යෙ පමත්තා යථා මතා.

22. එතං විසෙසතො ඤත්වා අප්පමාදම්හි පණ්ඩිතා,
අප්පමාදෙ පමොදන්ති අරියානං ගොචරෙ රතා.

23. තෙ ඣායිනො සාතතිකා නිච්චං දළ්හපරක්කමා,
ඵුසන්ති ධීරා නිබ්බානං යොගක්ඛෙමං අනුත්තරං. 301

2 කුම්භඝොසකවත්ථු =

24. උට්ඨානවතො සතිමතො සුචිකම්මස්ස
නිසම්මකාරිනො,
සඤ්ඤතස්ස ච ධම්මජීවිනො අප්පමත්තස්ස
යසොභිවඩ්ඪති. 349

3 චූළපන්ථකත්ථෙරවත්ථු =

25. උට්ඨානෙන'ප්පමාදෙන සඤ්ඤමෙන දමෙන ච,
දීපං කයිරාථ මෙධාවී යං ඔඝො නාභිකීරති. 366

4 බාලනක්ඛත්තසුට්ඨවත්ථු =

26. පමාදමනුයුඤ්ජන්ති බාලා දුම්මෙධිනො ජනා,
අප්පමාදඤ්ච මෙධාවී ධනං සෙට්ඨංව රක්ඛති.

27. මා පමාදමනුයුඤ්ජෙථ මා කාමරතිසන්ථවං,
අප්පමත්තො හි ඣායන්තො පප්පොති විපුලං සුඛං. 371

5 මහාකස්සපත්ථෙරවත්ථු =

28. පමාදං අප්පමාදෙන යදා නුදති පණ්ඩිතො,
පඤ්ඤාපාසාදමාරුය්හ අසොකො සොකිනිං පජං,
පබ්බතට්ඨොව භුම්මට්ඨෙ ධීරො බාලෙ අවෙක්ඛති. 378

6 පමත්තාපමත්තදෙවසහායකභික්ඛුවත්ථු =

29. අප්පමත්තො පමත්තෙසු සුත්තෙසු බහුජාගරො,
අබලස්සංව සීඝස්සො හිත්වා යාති සුමෙධසො. 389

7 මහාලිපඤ්හවත්ථු =

30. අප්පමාදෙන මඝවා දෙවානං සෙට්ඨතං ගතො,
අප්පමාදං පසංසන්ති පමාදො ගරහිතො සදා. 403

8 අඤ්ඤතරභික්ඛුවත්ථු =

31. අප්පමාදරතො භික්ඛු පමාදෙ භයදස්සි වා,
සංයොජනං අණුං ථූලං ඩහං අග්ගීව ගච්ඡති. 405

9 නිගමවාසිතිස්සත්ථෙරවත්ථු =

32. අප්පමාදරතො භික්ඛු පමාදෙ භයදස්සි වා,
අභබ්බො පරිහාණාය නිබ්බානස්සෙව සන්තිකෙ. 410

## චිත්තවර්ගය 3.

1 මෙඝියත්ථෙරවත්ථු =

33. ඵන්දනං චපලං චිත්තං දූරක්ඛං දුන්නිවාරයං,
උජුං කරොති මෙධාවී උසුකාරොව තෙජනං.

34. වාරිජොව ථලෙ ඛිත්තො ඔකමොකතඋබ්භතො,
පරිඵන්දතිදං චිත්තං මාරධෙය්‍යං පහාතවෙ. 415

2 අඤ්ඤතරභික්ඛුවත්ථු =

35. දුන්නිග්ගහස්ස ලහුනො යත්ථකාමනිපාතිනො,
චිත්තස්ස දමථො සාධු චිත්තං දන්තං සුඛාවහං. 466

3 උක්කණ්ඨිතඤ්ඤතරභික්ඛුවත්ථු =

36. සුදුද්දසං සුනිපුණං යත්ථකාමනිපාතිනං,
චිත්තං රක්ඛෙථ මෙධාවී චිත්තං ගුත්තං සුඛාවහං. 471

**4 භාගිනෙය්‍ය සඞ්ඝරක්ඛිතත්ථෙරවත්ථු =**

37. දූරඞ්ගමං එකචරං අසරීරං ගුහාසයං,
යෙ චිත්තං සඤ්ඤමෙස්සන්ති මොක්ඛන්ති
මාරබන්ධනා. 475

**5 චිත්තහත්ථත්ථෙරවත්ථු =**

38. අනවට්ඨිතචිත්තස්ස සද්ධම්මං අවිජානතො,
පරිප්ලවපසාදස්ස පඤ්ඤා න පරිපූරති.

39. අනවස්සුතචිත්තස්ස අනන්වාහතචෙතසො,
පුඤ්ඤපාපපහීණස්ස නත්ථි ජාගරතො භයං. 480

**6 පඤ්චසතවිපස්සකභික්ඛුවත්ථු =**

40. කුම්භූපමං කායමිමං විදිත්වා
නගරූපමං චිත්තමිදං ඨපෙත්වා,
යොධෙථ මාරං පඤ්ඤායුධෙන
ජිතඤ්ච රක්ඛෙ අනිවෙසනො සියා. 491

**7 පූතිගත්තතිස්සත්ථෙරවත්ථු =**

41. අචිරං වතයං කායො පඨවිං අධිසෙස්සති,
ඡුද්ධො අපෙතවිඤ්ඤාණො නිරත්ථංව කලිඞ්ගරං. 502

**8 නන්දගොපාලවත්ථු =**

42. දිසො දිසං යන්තං කයිරා වෙරි වා පන වෙරිනං,
මිච්ඡාපණිහිතං චිත්තං පාපියො නං තතො කරෙ. 507

**9 සොරෙය්‍යත්ථෙරවත්ථු =**

43. න තං මාතා පිතා කයිරා අඤ්ඤෙ වා පි ච ඤාතකා,
සම්මාපණිහිතං චිත්තං සෙය්‍යසො නං තතො කරෙ. 516

## පුෂ්පවර්ගීය 4.

**1 පඨවිකථාපසුතපඤ්චසතභික්ඛුවත්ථු =**

44. කො ඉමං පඨවිං විජෙස්සති යමලොකඤ්ච
ඉමං සදෙවකං,
කො ධම්මපදං සුදෙසිතං කුසලො පුප්ඵමිව
පචෙස්සති.

45. සෙඛො පඨවිං විජෙස්සති යමලොකඤ්ච
ඉමං සදෙවකං,
සෙඛො ධම්මපදං සුදෙසිතං කුසලො පුප්ඵමිව
පචෙස්සති. 521

**2 මරීචිකම්මට්ඨානිකථෙරවත්ථු =**

46. ඵෙණූපමං කායමිමං විදිත්වා මරීචිධම්මං
අභිසම්බුධානො,
ඡෙත්වාන මාරස්ස පපුප්ඵකානි අදස්සනං
මච්චුරාජස්ස ගච්ඡෙ. 621

**3 විඩූඩභවත්ථු =**

47. පුප්ඵානි හෙව පචිනන්තං ව්‍යාසත්තමනසං නරං,
සුත්තං ගාමං මහොඝොව මච්චු ආදාය ගච්ඡති. 640

**4 පතිපූජිකාවත්ථු =**

48. පුප්ඵානි හෙව පචිනන්තං ව්‍යාසත්තමනසං නරං,
අතිත්තංයෙව කාමෙසු අන්තකො කුරුතෙ වසං. 646

**5 මච්ඡරියකොසියසෙට්ඨිවත්ථු =**

49. යථාපි භමරො පුප්ඵං වණ්ණගන්ධං අහෙඨයං,
එලෙති රසමාදාය එවං ගාමෙ මුනී චරෙ. 654

**6 පාඨිකාජීවකවත්ථු =**

50. න පරෙසං විලොමානි න පරෙසං කතාකතං,
අත්තනොව අවෙක්ඛෙය්‍ය කතානි අකතානි ච. 661

**7 ඡත්තපාණිඋපාසකවත්ථු =**

51. යථාපි රුචිරං පුප්ඵං වණ්ණවන්තං අගන්ධකං,
එවං සුභාසිතා වාචා අඵලා හොති අකුබ්බතො.

52. යථාපි රුචිරං පුප්ඵං වණ්ණවන්තං සගන්ධකං,
එවං සුභාසිතා වාචා සඵලා හොති පකුබ්බතො. 665

**8 විසාඛාවත්ථු =**

53. යථාපි පුප්ඵරාසිම්හා කයිරා මාලාගුණෙ බහූ,
එවං ජාතෙන මච්චෙන කත්තබ්බං කුසලං බහුං. 694

**9 ආනන්දත්ථෙරපඤ්හවත්ථු =**

54. න පුප්ඵගන්ධො පටිවාතමෙති න චන්දනං
තගරමල්ලිකා වා,
සතඤ්ච ගන්ධො පටිවාතමෙති සබ්බා දිසා
සප්පුරිසො පවාති.

55. චන්දනං තගරං වාපි උප්පලං අථ වස්සිකී,
එතෙසං ගන්ධජාතානං සීලගන්ධො අනුත්තරො. 699

**10 මහාකස්සපත්ථෙරස්ස පිණ්ඩපාතදින්නවත්ථු =**

56. අප්පමත්තො අයං ගන්ධො යායං තගරචන්දනී,
යො ච සීලවතං ගන්ධො වාති දෙවෙසු උත්තමො. 706

**11 ගොධිකත්ථෙරස්ස පරිනිබ්බානවත්ථු =**

57. තෙසං සම්පන්නසීලානං අප්පමාදවිහාරිනං,
සම්මදඤ්ඤා විමුත්තානං මාරො මග්ගං න වින්දති. 721

**12 ගරහදින්නවත්ථු =**

58. යථා සඞ්කාරධානස්මිං උජ්ඣිතස්මිං මහාපථෙ,
පදුමං තත්ථ ජායෙථ සුචිගන්ධං මනොරමං.

59. එවං සඞ්කාරභූතෙසු අන්ධභූතෙ පුථුජ්ජනෙ,
අතිරොචති පඤ්ඤාය සම්මා සම්බුද්ධසාවකො. 730

## බාලවගීය 5.

**1 කුමුදුප්පලානීතදුග්ගතසෙවකවත්ථු =**

60. දීඝා ජාගරතො රත්ති දීඝං සන්තස්ස යොජනං,
දීඝො බාලානං සංසාරො සද්ධම්මං අවිජානතං. 744

**2 මහාකස්සපත්ථෙරසද්ධිවිහාරිකවත්ථු =**

61. චරං චෙ නාධිගච්ඡෙය්‍ය සෙය්‍යං සදිසමත්තනො,
එකචරියං දළ්හං කයිරා නත්ථි බාලෙ සහායතා. 775

**3 ආනන්දසෙට්ඨිවත්ථු =**

62. පුත්තාමත්ථි ධනම්මත්ථි ඉති බාලො විහඤ්ඤති,
අත්තා හි අත්තනො නත්ථි කුතො පුත්තා
කුතො ධනං. 785

**4 ගණ්ඨිභෙදක චොරවත්ථු =**

63. යො බාලො මඤ්ඤති බල්‍යං පණ්ඩිතො
වාපි තෙන සො,
බාලො ච පණ්ඩිතමානී සවෙ බාලොති වුච්චති. 788

**5 උදායිත්ථෙරවත්ථු =**

64. යාවජීවම්පි චෙ බාලො පණ්ඩිතං පයිරුපාසති,
න සො ධම්මං විජානාති දබ්බී සූපරසං යථා. 791

**6 පාඨෙය්‍යක භික්ඛුවත්ථු =**

65. මුහුත්තමපි චෙ විඤ්ඤූ පණ්ඩිතං පයිරුපාසති,
ඛිප්පං ධම්මං විජානාති ජිව්හා සූපරසං යථා. 796

**7 සුසපබුද්ධකුටඨිවත්ථු =**

66. චරන්ති බාලා දුම්මෙධා අමිත්තෙනෙව අත්තනා,
කරොන්තා පාපකං කම්මං යං හොති කටුකප්ඵලං. 799

**8 කසසකවත්ථු =**

67. න තං කම්මං කතං සාධු යං කත්වා අනුතප්පති,
යස්ස අස්සුමුඛො රොදං විපාකං පටිසෙවති. 819

**9 සුමනමාලාකාරවත්ථු =**

68. තං ච කම්මං කතං සාධු යං කත්වා නානුතප්පති,
යස්ස පතීතො සුමනො විපාකං පටිසෙවති. 825

**10 උප්පලවණ්ණත්ථෙරීවත්ථු =**

69. මධුවා මඤ්ඤති බාලො යාව පාපං න පච්චති,
යදා ච පච්චති පාපං අථ බාලො දුක්ඛං නිගච්ඡති. 829

**11 ජම්බුකාජීවකවත්ථු =**

70. මාසෙ මාසෙ කුසග්ගෙන බාලො භුඤ්ජෙථ භොජනං,
න සො සඞ්ඛතධම්මානං කලං අග්ඝති සොළසිං. 837

**12 අහිපෙතවත්ථු =**

71. න හි පාපං කතං කම්මං සජ්ජු ඛීරංව මුච්චති,
ඩහන්තං බාලමන්වෙති භස්මච්ඡන්නොව පාවකො. 843

**13 සට්ඨිකූටපෙතවත්ථු =**

72. යාවදෙව අනත්ථාය ඤත්තං බාලස්ස ජායති,
හන්ති බාලස්ස සුක්කංසං මුද්ධමස්ස විපාතයං. 848

**14 සුධම්මත්ථෙරවත්ථු =**

73. අසතං භාවනමිච්ඡෙය්‍ය පුරෙක්ඛාරං ච භික්ඛුසු,
ආවාසෙසු ච ඉස්සරියං පූජා පරකුලෙසු ච.

74. මමෙව කතමඤ්ඤන්තු ගිහී පබ්බජිතා උභො,
මමෙව අතිවසා අස්සු කිච්චාකිච්චෙසු කිස්මි චි,
ඉති බාලස්ස සඞ්කප්පො ඉච්ඡාමානො ච වඩ්ඪති. 851

**15 වනවාසීතිස්සත්ථෙරවත්ථු =**

75. අඤ්ඤා හි ලාභූපනිසා අඤ්ඤා නිබ්බානගාමිනී,
එවමෙතං අභිඤ්ඤාය භික්ඛු බුද්ධස්ස සාවකො,
සක්කාරං නාභිනන්දෙය්‍ය විවෙකමනුබ්‍රූහයෙ 876

# පණ්ඩිතවග්ගය 6.

1 රාධත්ථෙරවත්ථු =

76. නිධීනංව පවත්තාරං යං පස්සෙ වජ්ජදස්සිනං,
නිග්ගය්හවාදිං මෙධාවිං තාදිසං පණ්ඩිතං භජෙ,
තාදිසං භජමානස්ස සෙය්‍යො හොති න පාපියො. 887

2 අස්සජිපුනබ්බසුකවත්ථු =

77. ඔවදෙය්‍යානුසාසෙය්‍ය අසබ්භා ච නිවාරයෙ,
සතං හි සො පියො හොති අසතං හොති අප්පියො. 893

3 ඡන්නත්ථෙරවත්ථු =

78. න භජෙ පාපකෙ මිත්තෙ න භජෙ පුරිසාධමෙ,
භජෙථ මිත්තෙ කල්‍යාණෙ භජෙථ පුරිසුත්තමෙ. 895

4 මහාකප්පිනත්ථෙරවත්ථු =

79. ධම්මපීති සුඛං සෙති විප්පසන්නෙන චෙතසා,
අරියප්පවෙදිතෙ ධම්මෙ සදා රමති පණ්ඩිතො. 910

5 පණ්ඩිතසාමණෙරවත්ථු =

80. උදකං නයන්ති නෙත්තිකා උසුකාරා
නමයන්ති තෙජනං,
දාරුං නමයන්ති තච්ඡකා අත්තානං දමයන්ති
පණ්ඩිතා. 924

6 ලකුණ්ටකභද්දියත්ථෙරවත්ථු =

81. සෙලො යථා එකඝනො වාතෙන න සමීරති,
එවං නින්දාපසංසාසු න සමිඤ්ජන්ති පණ්ඩිතා. 926

7 කාණමාතුවත්ථු =

82 යථාපි රහදො ගම්භීරො විප්පසන්නො අනාවිලො,
එවං ධම්මානි සුත්වාන විප්පසීදන්ති පණ්ඩිතා. 932

8 විඝාසාදවත්ථු =

83. සබ්බත්ථ වෙ සප්පුරිසා වජන්ති න කාමකාමා
ලපයන්ති සන්තො,
සුඛෙන ඵුට්ඨා අථ වා දුඛෙන නොච්චාවචං
පණ්ඩිතා දස්සයන්ති. 935

9 ධම්මිකත්ථෙරවත්ථු =

84. න අත්තහෙතු න පරස්ස හෙතු න පුත්තමිච්ඡෙ
න ධනං න රට්ඨං,
න ඉච්ඡෙය්‍ය අධම්මෙන සමිද්ධිමත්තනො
සසීලවා පඤ්ඤවා ධම්මිකො සියා. 941

10 ධම්මසවණවත්ථු =

85. අප්පකා තෙ මනුස්සෙසු යෙ ජනා පාරගාමිනො,
අථායං ඉතරා පජා තීරමෙවානුධාවති.
86. යෙ ච ඛො සම්මදක්ඛාතෙ ධම්මෙ
ධම්මානුවත්තිනො,
තෙ ජනා පාරමෙස්සන්ති මච්චුධෙය්‍යං සුදුත්තරං. 943

11 ආගන්තුකපඤ්චසතභික්ඛුවත්ථු =

87. කණ්හං ධම්මං විප්පහාය සුක්කං භාවෙථ
පණ්ඩිතො,
ඔකා අනොකං ආගම්ම විවෙකෙ යත්ථ දූරමං.
88. තත්‍රාභිරතිමිච්ඡෙය්‍ය හිත්වා කාමෙ අකිඤ්චනො,
පරියොදපෙය්‍ය අත්තානං චිත්තකෙලසෙහි
පණ්ඩිතො.

89. යෙසං සම්බොධි අඞ්ගෙසු සම්මා චිත්තං සුභාවිතං,
ආදානපටිනිස්සග්ගෙ අනුපාදාය යෙ රතා,
ඛීණාසවා ජුතීමන්තො තෙ ලොකෙ පරිනිබ්බුතා. 946

## අර්හත්ත වර්ගය 7.

1 ජීවකපඤ්හවත්ථු =

90. ගතද්ධිනො විසොකස්ස විප්පමුත්තස්ස සබ්බධි,
සබ්බගන්ථප්පහීණස්ස පරිළාහො න විජ්ජති. 1002

2 මහාකස්සපත්ථෙරවත්ථු =

91. උය්‍යුඤ්ජන්ති සතීමන්තො න නිකෙතෙ රමන්ති තෙ,
හංසාව පල්ලලං හිත්වා ඔකමොකං ජහන්ති තෙ. 1014

3 බෙලට්ඨසීසත්ථෙරවත්ථු =

92. යෙසං සන්නිචයො නත්ථි යෙ පරිඤ්ඤාතභොජනා,
සුඤ්ඤතො අනිමිත්තො ච විමොක්ඛො
යෙස ගොචරො,
ආකාසෙව සකුන්තානං ගති තෙසං දුරන්නයා. 1016

4 අනුරුද්ධත්ථෙරවත්ථු =

93. යස්සාසවා පරික්ඛීණා ආහාරෙ ච අනිස්සිතො,
සුඤ්ඤතො අනිමිත්තො ච විමොක්ඛො
යස්ස ගොචරො,
ආකාසෙව සකුන්තානං පදං තස්ස දුරන්නයං. 1022

5 මහාකච්චානත්ථෙරවත්ථු =

94. යස්සින්ද්‍රියානි සමථං ගතානි අස්සා යථා
සාරථිනා සුදන්තා,
පහීණමානස්ස අනාසවස්ස දෙවාපි තස්ස
පිහයන්ති තාදිනො. 1029

6 සාරිපුත්තත්ථෙරවත්ථු =

95 පඨවිසමො නො විරුජ්ඣති ඉන්දඛීලූපමො
තාදී සුබ්බතො,
රහදෙව අපෙතකද්දමො සංසාරා න භවන්ති
තාදිනො. 1044

7 තිස්සත්ථෙර සාමණෙරවත්ථු =

96 සන්තං තස්ස මනං හොති සන්තා වාචා ච කම්ම ච,
සම්මදඤ්ඤා විමුත්තස්ස උපසන්තස්ස තාදිනො. 1085

8 සාරිපුත්තත්ථෙරස්ස පඤ්හවිස්සජ්ජනවත්ථු =

97. අස්සද්ධො අකතඤ්ඤූ ච සන්ධිච්ඡෙදො ච
යො නරො,
හතාවකාසො වන්තාසො සවෙ උත්තමපොරිසො. 1088

9 ඛදිරවනියරෙවතත්ථෙරවත්ථු =

98. ගාමෙ වා යදි වාරඤ්ඤෙ නින්නෙ වා යදි වා ථලෙ,
යත්ථාරහන්තො විහරන්ති තං භූමිං රාමණෙය්‍යකං. 1098

10 අඤ්ඤතරඉත්ථිවත්ථු =

99. රමණීයානි අරඤ්ඤානි යත්ථ න රමතී ජනො,
වීතරාගා රමිස්සන්ති න තෙ කාමගවෙසිනො. 1112

## සහස්‍රවර්ගය 8.

1 තම්බදාඨිකචොරඝාතකවත්ථු =

100. සහස්සමපි චෙ වාචා අනත්ථපදසංහිතා,
එකං අත්ථපදං සෙය්‍යො යං සුත්වා උපසම්මති. 1124

**2 දාරුචීරියත්ථෙරවත්ථු =**

101. සහස්සමපි චෙ ගාථා අනත්ථපදසංහිතා,
එකං ගාථාපදං සෙය්‍යො යං සුත්වා උපසම්මති. 1132

**3 කුණ්ඩලකෙසිත්ථෙරිවත්ථු =**

102. යො ච ගාථා සතං භාසෙ අනත්ථපදසංහිතා,
එකං ගාථාපදං සෙය්‍යො යං සුත්වා උපසම්මති.

103. යො සහස්සං සහස්සෙන සඞ්ගාමෙ මානුසෙ ජිනෙ,
එකං ච ජෙය්‍යමත්තානං ස වෙ සඞ්ගාමජුත්තමො. 1140

**4 අනත්ථපුච්ඡකබ්‍රාහ්මණවත්ථු =**

104. අත්තා හවෙ ජිතං සෙය්‍යො යා චායං ඉතරා පජා,
අත්තදන්තස්ස පොසස්ස නිච්චං සඤ්ඤතචාරිනො.

105. නෙව දෙවො න ගන්ධබ්බො න මාරො සහ බ්‍රහ්මුනා,
ජිතං අපජිතං කයිරා තථාරූපස්ස ජන්තුනො. 1144

**5 සාරිපුත්තත්ථෙරස්ස මාතුලබ්‍රාහ්මණවත්ථු =**

106. මාසෙ මාසෙ සහස්සෙන යො යජෙථ සතං සමං,
එකං ච භාවිතත්තානං මුහුත්තමපි පූජයෙ,
සායෙව පූජනා සෙය්‍යො යං චෙ වස්සසතං හුතං. 1151

**6 සාරිපුත්තත්ථෙරස්ස භාගිනෙය්‍යවත්ථු =**

107. යො ච වස්සසතං ජන්තු අග්ගිං පරිචරෙ වනෙ,
එකං ච භාවිතත්තානං මුහුත්තමපි පූජයෙ,
සායෙව පූජනා සෙය්‍යො යං චෙ වස්සසතං හුතං. 1154

**7 සාරිපුත්තත්ථෙරස්ස සහායකබ්‍රාහ්මණවත්ථු =**

108 යං කිඤ්චි යිට්ඨංව හුතං ව ලොකෙ,
සංවච්ඡරං යජෙථ පුඤ්ඤපෙක්ඛො,
සබ්බම්පි තං චතුභාගමෙති
අභිවාදනා උජ්ජුගතෙසු සෙය්‍යො. 1156

**8 දීඝායුකුමාරවත්ථු =**

109. අභිවාදනසීලිස්ස නිච්චං වද්ධාපචායිනො,
චත්තාරො ධම්මා වඩ්ඪන්ති ආයු වණ්ණො සුඛං බලං. 1163

**9 සඞ්කිච්චසාමණෙරවත්ථු =**

110. යො ච වස්සසතං ජීවෙ දුස්සීලො අසමාහිතො,
එකාහං ජීවිතං සෙය්‍යො සීලවන්තස්ස ඣායිනො. 1175

**10 ඛාණුකොණ්ඩඤ්ඤත්ථෙරවත්ථු =**

111. යො ච වස්සසතං ජීවෙ දුප්පඤ්ඤො අසමාහිතො,
එකාහං ජීවිතං සෙය්‍යො පඤ්ඤවන්තස්ස
ඣායිනො. 1183

**11 සප්පදාසත්ථෙරවත්ථු =**

112. යො ච වස්සසතං ජීවෙ කුසීතො හීනවීරියො,
එකාහං ජීවිතං සෙය්‍යො විරියමාරභතො දළ්හං. 1186

**12 පටාචාරත්ථෙරීවත්ථු =**

113. යො ච වස්සසතං ජීවෙ අපස්සං උදයව්‍යයං,
එකාහං ජීවිතං සෙය්‍යො පස්සතො උදයව්‍යයං. 1195

**13 කිසාගොතමීවත්ථු =**

114. යො ච වස්සසතං ජීවෙ අපස්සං අමතං පදං,
එකාහං ජීවිතං සෙය්‍යො පස්සතො අමතං පදං. 1200

**14 බහුපුත්තිකත්ථෙරීවත්ථු =**

115. යො ච වස්සසතං ජීවෙ අපස්සං ධම්මමුත්තමං,
එකාහං ජීවිතං සෙය්‍යො පස්සතො ධම්මමුත්තමං. 1203

## පාපවර්ගය 9.

**1 චූලෙකසාටකබ්‍රාහ්මණවත්ථු =**

116. අභිත්වරෙථ කල්‍යාණෙ පාපා චිත්තං නිවාරයෙ,
දන්ධං හි කරතො පුඤ්ඤං පාපස්මිං රමතී මනො. 1211

**2 සෙය්‍යසකත්ථෙරවත්ථු =**

117. පාපං චෙ පුරිසො කයිරා න තං කයිරා පුනප්පුනං,
න තම්හි ඡන්දං කයිරාථ දුක්ඛො පාපස්ස උච්චයො. 1215

**3 ලාජදෙවධීතුවත්ථු =**

118. පුඤ්ඤං චෙ පුරිසො කයිරා කයිරාථෙතං පුනප්පුනං,
තම්හි ඡන්දං කයිරාථ සුඛො පුඤ්ඤස්ස උච්චයො. 1219

**4 අනාථපිණ්ඩිකවත්ථු =**

119. පාපොපි පස්සති භද්‍රං යාව පාපං න පච්චති,
යදා ච පච්චති පාපං අථ පාපො පාපානි පස්සති.

120. භද්‍රොපි පස්සති පාපං යාව භද්‍රං න පච්චති,
යදා ච පච්චති භද්‍රං අථ භද්‍රො භද්‍රානි පස්සති. 1223

**5 අසඤ්ඤතපරික්ඛාරභික්ඛුවත්ථු =**

121. මාවමඤ්ඤෙථ පාපස්ස න මං තං ආගමිස්සති,
උදබින්දුනිපාතෙන උදකුම්භොපි පූරති,
පූරති බාලො පාපස්ස ථොක ථොකම්පි ආචිනං. 1226

**6 බිළාලපාදකසෙට්ඨිවත්ථු =**

122. මාවමඤ්ඤෙථ පුඤ්ඤස්ස න මං තං ආගමිස්සති,
පූරති ධීරො පුඤ්ඤස්ස ථොක ථොකම්පි ආචිනං. 1230

**7 මහාධනවාණිජවත්ථු =**

123. වාණිජොව භයං මග්ගං අප්පසත්ථො මහද්ධනො,
විසං ජීවිතුකාමොව පාපානි පරිවජ්ජයෙ. 1234

**8 කුක්කුටමිත්තනෙසාදවත්ථු =**

124. පාණිම්හි චෙ වණො නාස්ස හරෙය්‍ය පාණිනා විසං,
නාබ්බණං විසමන්වෙති නත්ථි පාපං අකුබ්බතො. 1246

**9 කොකසුනඛලුද්දකවත්ථු =**

125. යො අප්පදුට්ඨස්ස නරස්ස දුස්සති
සුද්ධස්ස පොසස්ස අනඞ්ගණස්ස,
තමෙව බාලං පච්චෙති පාපං
සුඛුමො රජො පටිවාතංව ඛිත්තො. 1245

**10 මණිකාරකුලූපගතිස්සත්ථෙරවත්ථු =**

126. ගබ්භමෙකෙප්පජ්ජන්ති නිරයං පාපකම්මිනො,
සග්ගං සුගතිනො යන්ති පරිනිබ්බන්ති අනාසවා. 1251

**11 තින්නං භික්ඛූනංවත්ථු =**

127. න අන්තලික්ඛෙ න සමුද්දමජ්ඣෙ
න පබ්බතානං විවරං පවිස්ස,
න විජ්ජති සො ජගතිප්පදෙසො
යත්ථට්ඨිතො මුච්චෙය්‍ය පාපකම්මා. 1257

**12 සුප්පබුද්ධසක්කස්සවත්ථු =**

128. න අන්තලික්ඛෙ න සමුද්දමජ්ඣෙ
න පබ්බතානං විවරං පවිස්ස,
න විජ්ජති සො ජගතිප්පදෙසො
යත්ථට්ඨිතං නප්පසහෙථ මච්චු. 1264

# දණ්ඩවග්ගය 10.

1 ඡබ්බග්ගියභික්ඛුවත්ථු =

129. සබ්බෙ තසන්ති දණ්ඩස්ස සබ්බෙ භායන්ති මච්චුනො,
අත්තානං උපමං කත්වා න හනෙය්‍ය න ඝාතයෙ. 1265

2 ඡබ්බග්ගියභික්ඛුවත්ථු =

130. සබ්බෙ තසන්ති දණ්ඩස්ස සබ්බෙසං ජීවිතං පියං,
අත්තානං උපමං කත්වා න හනෙය්‍ය න ඝාතයෙ. 1269

3 සම්බහුලකුමාරකවත්ථු =

131. සුඛකාමානි භූතානි යො දණ්ඩෙන විහිංසති,
අත්තනො සුඛමෙසානො පෙච්ච සො න
ලභතෙ සුඛං.

132. සුඛකාමානි භූතානි යො දණ්ඩෙන න හිංසති,
අත්තනො සුඛමෙසානො පෙච්ච සො ලභතෙ සුඛං. 1271

4 කුණ්ඩධානත්ථෙරවත්ථු =

133. මා වොච ඵරුසං කඤ්චි වුත්තා පටිවදෙය්‍යු තං,
දුක්ඛා හි සාරම්භකථා පටිදණ්ඩා ඵුසෙය්‍යු තං.

134. ස වෙ නෙරෙසි අත්තානං කංසො උපහතො යථා,
එස පත්තොසි නිබ්බානං සාරම්භො තෙ න විජ්ජති. 1278

5 විසාඛාදීනං උපොසථකම්මවත්ථු =

135. යථා දණ්ඩෙන ගොපාලො ගාවො පාවෙති ගොචරං,
එවං ජරා ච මච්චූ ච ආයුං පාජෙන්ති පාණිනං. 1282

6 අජගරපෙතවත්ථු =

136. අථ පාපානි කම්මානි කරං බාලො න බුජ්ඣති,
සෙහි කම්මෙහි දුම්මෙධො අග්ගිදඩ්ඪොව තප්පති. 1289

7 මහාමොග්ගල්ලානත්ථෙරවත්ථු =

137. යො දණ්ඩෙන අදණ්ඩෙසු අප්පදුට්ඨෙසු දුස්සති,
දසන්නමඤ්ඤතරං ඨානං ඛිප්පමෙව නිගච්ඡති

138. වෙදනං ඵරුසං ජානිං සරීරස්ස ච භෙදනං,
ගරුකං වාපි ආබාධං චිත්තක්ඛෙපං ච පාපුණෙ.

139. රාජතො වා උපස්සග්ගං අබ්භක්ඛානං ච දාරුණං,
පරික්ඛයං ච ඤාතීනං භොගානං ච පභඞ්ගුරං.

140. අථස්ස අගාරානි අග්ගි ඩහති පාවකො,
කායස්ස භෙදා දුප්පඤ්ඤො නිරයං සොපපජ්ජති. 1294

**8 බහුභණ්ඩිකථෙරවත්ථු =**

141. න නග්ගචරියා න ජටා න පඞ්කා
නානාසකා ථණ්ඩිලසායිකා වා,
රජො ච ජල්ලං උක්කුටිකප්පධානං
සොධෙන්ති මච්චං අවිතිණ්ණකඞ්ඛං. 1305

**9 සන්තතිමහාමත්තවත්ථු =**

142. අලඞ්කතො චෙ පි සමං චරෙය්‍ය
සන්තො දන්තො නියතො බ්‍රහ්මචාරී,
සබ්බෙසු භූතෙසු නිධාය දණ්ඩං
සො බ්‍රාහ්මණො සො සමණො ස භික්ඛු. 1316

**10 පිලොතිකථෙරවත්ථු =**

143. හිරීනිසෙධො පුරිසො කොචි ලොකස්මිං විජ්ජති,
යො නිද්දං අපබොධති අස්සො භද්‍රො කසාමිව.

144. අස්සො යථා භද්‍රො කසානිවිට්ඨො
ආතාපිනො සංවෙගිනො භවාථ,
සද්ධාය සීලෙන ච විරියෙන ච සමාධිනා
ධම්මවිනිච්ඡයෙන ච,
සම්පන්නවිජ්ජාචරණා පතිස්සතා පහස්සථ
දුක්ඛමිදං අනප්පකං. 1322

**11 සුඛසාමණෙරවත්ථු =**

145 උදකං හි නයන්ති නෙත්තිකා උසුකාරා
නමයන්ති තෙජනං,
දාරුං නමයන්ති තච්ඡකා අත්තානං
දමයන්ති සුබ්බතා. 1392

## ජරාවග්ගය 11.

**1 විසාඛාසහායිකාවත්ථු =**

146. කොනු හාසො කිමානන්දො නිච්චං පජ්ජලිතෙ සති,
අන්ධකාරෙන ඔනද්ධා පදීපං න ගවෙස්සථ. 1397

**2 සිරිමාවත්ථු =**

147. පස්ස චිත්තකතං බිම්බං අරුකායං සමුස්සිතං,
ආතුරං බහුසඞ්කප්පං යස්ස නත්ථි ධුවං ඨිති. 1403

**3 උත්තරාථෙරීවත්ථු =**

148. පරිජිණ්ණමිදං රූපං රොගනිඩ්ඩං පභඞ්ගුරං,
භිජ්ජති පූතිසන්දෙහො මරණන්තං හි ජීවිතං. 1411

**4 අධිමානිකභික්ඛුවත්ථු =**

149. යානිමානි අපත්ථානි අලාපූනෙව සාරදෙ,
කාපොතකානි අට්ඨීනි තානි දිස්වාන කා රති. 1413

**5 ජනපදකල්‍යාණීරූපනන්දාථෙරීවත්ථු =**

150. අට්ඨීනං නගරං කතං මංසලොහිතලෙපනං,
යත්ථ ජරා ච මච්චු ච මානො මක්ඛො ච ඔහිතො. 1419

**6 මල්ලිකාදෙවීවත්ථු =**

151. ජීරන්ති වෙ රාජරථා සුචිත්තා අථො සරීරම්පි
ජරං උපෙති,
සතං ච ධම්මො න ජරං උපෙති සන්තො
හවෙ සබ්භි පවෙදයන්ති. 1428

**7 ලාළුදායිථෙරවත්ථු =**

152. අප්පස්සුතායං පුරිසො බලිවද්දොව ජීරති,
මංසානි තස්ස වඩ්ඪන්ති පඤ්ඤා තස්ස න වඩ්ඪති. 1434

**8 ආනන්දථෙරඋදානගාථාවත්ථු =**

153. අනෙකජාතිසංසාරං සන්ධාවිස්සං අනිබ්බිසං,
ගහකාරකං ගවෙසන්තො දුක්ඛා ජාති පුනප්පුනං.

154. ගහකාරක! දිට්ඨොසි පුන ගෙහං න කාහසි,
සබ්බා තෙ ඵාසුකා භග්ගා ගහකූටං විසංඛිතං,
විසඞ්ඛාරගතං චිත්තං තණ්හානං ඛයමජ්ඣගා. 1436

**9 මහාධනසෙට්ඨිපුත්තවත්ථු =**

155. අචරිත්වා බ්‍රහ්මචරියං අලද්ධා යොබ්බනෙ ධනං,
ජිණ්ණකොඤ්චාව ඣායන්ති ඛීණමච්ඡෙව
පල්ලලෙ.

156. අචරිත්වා බ්‍රහ්මචරියං අලද්ධා යොබ්බනෙ ධනං,
සෙන්ති චාපාතිඛිත්තාව පුරාණානි අනුත්ථුනං. 1444

# ආත්මවර්ගය 12.

1 බෝධිරාජකුමාරවත්ථු =

157. අත්තානං චෙ පියං ජඤ්ඤා රක්ඛෙය්‍ය නං සුරක්ඛිතං,
තිණ්ණමඤ්ඤතරං යාමං පටිජග්ගෙය්‍ය පණ්ඩිතො. 1453

2 උපනන්දසක්‍යපුත්තවත්ථු =

158. අත්තානමෙව පඨමං පතිරූපෙ නිවෙසයෙ'
අථඤ්ඤමනුසාසෙය්‍ය න කිලිස්සෙය්‍ය පණ්ඩිතො. 1464

3 පධානිකතිස්සථෙරවත්ථු =

159. අත්තානං චෙ තථා කයිරා යථඤ්ඤමනුසාසති,
සුදන්තො වත දමෙථ අත්තා හි කිර දුද්දමො. 1469

4 කුමාරකස්සපථෙරමාතුවත්ථු =

160. අත්තා හි අත්තනො නාථො කො හි නාථො පරො සියා,
අත්තනා හි සුදන්තෙන නාථං ලභති දුල්ලභං. 1474

5 මහාකාලඋපාසකවත්ථු =

161. අත්තනාව කතං පාපං අත්තජං අත්තසම්භවං,
අභිමත්ථති දුම්මෙධං වජිරං වස්මමයං මණිං. 1479

6 දෙවදත්තවත්ථු =

162. යස්ස අච්චන්තදුස්සීල්‍යං මාළුවාසාලමිවොත්ථතං,
කරොති සො තථත්තානං යථා නං ඉච්ඡතී දිසො. 1482

7 සඞ්ඝභෙදපරිසක්කනවත්ථු =

163. සුකරානි අසාධූනි අත්තනො අහිතානි ච,
යං වෙ හිතඤ්ච සාධුං ච තං වෙ පරමදුක්කරං. 1487

8 කාලථෙරවත්ථු =

164. යො සාසනං අරහතං අරියානං ධම්මජීවිනං,
පටික්කොසති දුම්මෙධො දිට්ඨිං නිස්සාය පාපිකං
ඵලානි කට්ඨකස්සෙව අත්තඝඤ්ඤාය ඵල්ලති. 1489

**9 චූලකාලඋපාසකවත්ථු =**

165. අත්තනාව කතං පාපං අත්තනා සඞ්කිලිස්සති,
අත්තනා අකතං පාපං අත්තනාව විසුජ්ඣති,
සුද්ධි අසුද්ධි පච්චත්තං නාඤ්ඤමඤ්ඤො
විසොධයෙ. 1492

**10 අත්තදත්ථත්ථෙරවත්ථු =**

166. අත්තදත්ථං පරත්ථෙන බහුනාපි න හාපයෙ,
අත්තදත්ථමභිඤ්ඤාය සදත්ථපසුතො සියා. 1494

## ලොකවග්ගීය 13.

**1 අඤ්ඤතරදහරභික්ඛුවත්ථු =**

167. හීනං ධම්මං න සෙවෙය්‍ය පමාදෙන න සංවසෙ,
මිච්ඡාදිට්ඨිං න සෙවෙය්‍ය න සියා ලොකවඩ්ඪනො. 1498

**2 සුද්ධොදනවත්ථු =**

168. උත්තිට්ඨෙ නප්පමජ්ජෙය්‍ය ධම්මං සුචරිතං චරෙ,
ධම්මචාරී සුඛං සෙති අස්මිං ලොකෙ පරම්හි ච.

169. ධම්මං චරෙ සුචරිතං න තං දුච්චරිතං චරෙ,
ධම්මචාරී සුඛං සෙති අස්මිං ලොකෙ පරම්හි ච. 1502

**3 පඤ්චසතවිපස්සකභික්ඛුවත්ථු =**

170. යථා බුබ්බුලකං පස්සෙ යථා පස්සෙ මරීචිකං,
එවං ලොකං අවෙක්ඛන්තං මච්චුරාජා න පස්සති. 1505

**4 අභයරාජකුමාරවත්ථු =**

171. එථ පස්සථිමං ලොකං චිත්තං රාජරථූපමං,
යත්ථ බාලා විසීදන්ති නත්ථි සඞ්ගො විජානතං. 1508

**5 සම්මුඤ්ජනිත්ථෙරවත්ථු =**

172. යො ච පුබ්බෙ පමජ්ජිත්වා පච්ඡා සො නප්පමජ්ජති,
සො ඉමං ලොකං පභාසෙති අබ්භා මුත්තොව
චන්දිමා. 1512

**6 අඞ්ගුලිමාලත්ථෙරවත්ථු =**

173. යස්ස පාපං කතං කම්මං කුසලෙන පිථීයති,
සො ඉමං ලොකං පභාසෙති අබ්භා මුත්තොව
චන්දිමා. 1519

7 **පෙසකාරධීතුවත්ථු =**

174. අන්ධභූතො අයං ලොකො තනුකෙත්ථ විපස්සති,
සකුන්තො ජාලමුත්තොව අප්පො සග්ගාය ගච්ඡති. 1524

8 **තිංසභික්ඛුවත්ථු =**

175. හංසාදිච්චපථෙ යන්ති ආකාසෙ යන්ති ඉද්ධියා,
නීයන්ති ධීරා ලොකම්හා ජෙත්වා මාරං සවාහිණිං. 1529

9 **චිඤ්චමාණවිකාවත්ථු =**

176. එකං ධම්මං අතීතස්ස මුසාවාදිස්ස ජන්තුනො,
විතිණ්ණපරලොකස්ස නත්ථි පාපං අකාරියං. 1558

10 **අසදිසදානවත්ථු =**

177 න වෙ කදරියා දෙවලොකං වජන්ති බාලා හවෙ
නප්පසංසන්ති දානං,
ධීරො ච දානං අනුමොදමානො තෙනෙව සො
හොති සුඛී පරත්ථ. 1566

11 **අනාථපිණ්ඩිකපුත්තවත්ථු =**

178. පථව්‍යා එකරජ්ජෙන සග්ගස්ස ගමනෙන වා,
සබ්බලොකාධිපච්චෙන සොතාපත්තිඵලං වරං. 1643

## බුද්ධවගීය 14.

1 **මාරධීතුවත්ථු =**

179. යස්ස ජිතං නාවජීයති ජිතමස්ස නො
යාති කොචි ලොකෙ,
තම්බුද්ධමනන්තගොචරං අපදං කෙන
පදෙන නෙස්සථ.

180. යස්ස ජාලිනී විසත්තිකා තණ්හා නත්ථි
කුහිඤ්චි නෙතවෙ,
තම්බුද්ධමනන්තගොචරං අපදං කෙන
පදෙන නෙස්සථ. 1652

2 **යමකපාටිහාරියවත්ථු =**

181. යෙ ඣානපසුතා ධීරා නෙක්ඛම්මූපසමෙ රතා,
දෙවාපි තෙසං පිහයන්ති සම්බුද්ධානං සතීමතං 1681

3 **එරකපත්තනාගරාජවත්ථු =**

182. කිච්ඡො මනුස්සපටිලාභො කිච්ඡං මච්චාන ජීවිතං,
කිච්ඡං සද්ධම්මසවණං කිච්ඡො බුද්ධානං උප්පාදො. 1688

**4 ආනන්දත්ථෙරස්ස උපොසථපඤ්හවත්ථු =**

183. සබ්බපාපස්ස අකරණං කුසලස්ස උපසම්පදා,
සචිත්තපරියොදපනං එතං බුද්ධානසාසනං.

184. ඛන්ති පරමං තපො තිතික්ඛා,
නිබ්බාණං පරමං වදන්ති බුද්ධා,
න හි පබ්බජිතො පරූපඝාති
සමණො හොති පරං විහෙඨයන්තො.

185. අනූපවාදො අනූපඝාතො පාතිමොක්ඛෙ ච සංවරො,
මත්තඤ්ඤුතා ච භත්තස්මිං පන්තං ච සයනාසනං,
අධිචිත්තෙ ච ආයොගො එතං බුද්ධානසාසනං. 1697

**5 අනභිරතභික්ඛුවත්ථු =**

186. න කහාපණවස්සෙන තිත්ති කාමෙසු විජ්ජති,
අප්පස්සාදා දුඛා කාමා ඉති විඤ්ඤාය පණ්ඩිතො.

187. අපි දිබ්බෙසු කාමෙසු රතිං සො නාධිගච්ඡති,
තණ්හක්ඛයරතො හොති සම්මාසම්බුද්ධසාවකො. 1714

**6 අග්ගිදත්තබ්‍රාහ්මණවත්ථු =**

188. බහුං වෙ සරණං යන්ති පබ්බතානි වනානි ච,
ආරාමරුක්ඛචෙත්‍යානි මනුස්සා භයතජ්ජිතා.

189. නෙතං ඛො සරණං ඛෙමං නෙතං සරණමුත්තමං,
නෙතං සරණමාගම්ම සබ්බදුක්ඛා පමුච්චති.

190. යො ච බුද්ධං ච ධම්මං ච සඞ්ඝං ච සරණං ගතො,
චත්තාරි අරියසච්චානි සම්මප්පඤ්ඤාය පස්සති.

191. දුක්ඛං දුක්ඛසමුප්පාදං දුක්ඛස්ස ච අතික්කමං,
අරියඤ්චට්ඨඞ්ගිකං මග්ගං දුක්ඛූපසමගාමිනං.

192. එතං ඛො සරණං ඛෙමං එතං සරණමුත්තමං,
එතං සරණමාගම්ම සබ්බදුක්ඛා පමුච්චති. 1721

**7 ආනන්දත්ථෙරස්සපුච්ඡිතපඤ්හවත්ථු =**

193. දුල්ලභො පුරිසාජඤ්ඤො න සො සබ්බත්ථ ජායති,
යත්ථ සො ජායති ධීරො තං කුලං සුඛමෙධති. 1869

**8. සම්බහුලභික්ඛුවත්ථු =**

194. සුඛො බුද්ධානං උප්පාදො සුඛා සද්ධම්මදෙසනා,
සුඛා සඞ්ඝස්ස සාමග්ගී සමග්ගානං තපො සුඛො. 1872

9 කස්සපදසබලස්ස සුවණ්ණචෙතියවත්ථු =

195. පූජාරහෙ පූජයතො බුද්ධෙ යදි ච සාවකෙ,
පපඤ්චසමතික්කන්තෙ තිණ්ණසොකපරිද්දවෙ.

196 තෙ තාදිසෙ පූජයතො නිබ්බුතෙ අකුතොභයෙ,
න සක්කා පුඤ්ඤං සඞ්ඛාතුං ඉමෙත්තමිති කෙනචි. 1884

---

පඨමක භාණවාරං

## සුඛවග්ගය 15.

1 ඤාතකානං කලහවූපසමනවත්ථු =

197. සුසුඛං වත ජීවාම වෙරිනෙසු අවෙරිනො,
වෙරිනෙසු මනුස්සෙසු විහරාම අවෙරිනො.

198. සුසුඛං වත ජීවාම ආතුරෙසු අනාතුරා,
ආතුරෙසු මනුස්සෙසු විහරාම අනාතුරා.

199. සුසුඛං වත ජීවාම උස්සුකෙසු අනුස්සුකා,
උස්සුකෙසු මනුස්සෙසු විහරාම අනුස්සුකා. 1895

2 මාරවත්ථු =

200. සුසුඛං වත ජීවාම යෙසං නො නත්ථි කිඤ්චනං,
පීතිභක්ඛා භවිස්සාම දෙවා ආභස්සරා යථා. 1899

3 කොසලරඤ්ඤො පරාජයවත්ථු =

201. ජයං වෙරං පසවති දුක්ඛං සෙති පරාජිතො,
උපසන්තො සුඛං සෙති හිත්වා ජයපරාජයං. 1901

4 අඤ්ඤතරකුලදාරිකාවත්ථු =

202. නත්ථි රාගසමො අග්ගි නත්ථි දොසසමො කලි,
නත්ථි ඛන්ධසමා දුක්ඛා නත්ථි සන්තිපරං සුඛං. 1903

5 අඤ්ඤතරඋපාසකවත්ථු =

203. ජිඝච්ඡාපරමා රොගා සඞ්ඛාරපරමා දුඛා,
එතං ඤත්වා යථාභූතං නිබ්බානං පරමං සුඛං. 1907

6 පසෙනදිකොසලවත්ථු =

204. ආරොග්‍යපරමා ලාභා සන්තුට්ඨිපරමං ධනං,
විස්සාසපරමා ඤාති නිබ්බානපරමං සුඛං. 1912

**7 අඤ්ඤතරභික්ඛුවත්ථු =**

205. පවිවෙකරසං පීත්වා රසං උපසමස්ස ච,
නිද්දරො හොති නිප්පාපො ධම්මපීතිරසං පිබං. 1916

**8 සක්කදෙවරාජවත්ථු =**

206. සාහු දස්සනමරියානං සන්නිවාසො සදා සුඛො,
අදස්සනෙන බාලානං නිච්චමෙව සුඛී සියා.

207. බාලසඞ්ගතචාරීහි දීඝමද්ධාන සොචති,
දුක්ඛො බාලෙහි සංවාසො අමිත්තෙනෙව සබ්බදා,
ධීරො ච සුඛසංවාසො ඤාතීනංව සමාගමො.

208. තස්මා හි ධීරං ච පඤ්ඤං ච බහුස්සුතං ච
ධොරය්හසීලං වතවන්තමාරියං,
තං තාදිසං සප්පුරිසං සුමෙධං භජෙථ
නක්ඛත්තපථංව චන්දිමා. 1920

## ප්‍රියවර්ගය 16

**1 තිණ්ණං භික්ඛූනං වත්ථු =**

209. අයොගෙ යුඤ්ජමත්තානං යොගස්මිඤ්ච අයොජයං,
අත්ථං හිත්වා පියග්ගාහී පිහෙතත්තානුයොගිනං.

210. මා පියෙහි සමාගඤ්ඡි අප්පියෙහි කුදාචනං,
පියානං අදස්සනං දුක්ඛං අප්පියානං ච දස්සනං.

211. තස්මා පියං න කයිරාථ පියාපායො හි පාපකො,
ගන්ථා තෙසං න විජ්ජන්ති යෙසං නත්ථි පියාප්පියං. 1932

**2 අඤ්ඤතරකුටුම්බිකවත්ථු =**

212. පියතො ජායති සොකො පියතො ජායති භයං,
පියතො විප්පමුත්තස්ස නත්ථි සොකො කුතො භයං. 1939

**3 විසාඛාවත්ථු =**

213. පෙමතො ජායති සොකො පෙමතො ජායති භයං,
පෙමතො විප්පමුත්තස්ස නත්ථි සොකො
කුතො භයං. 1942

**4 ලිච්ඡවිවත්ථු =**

214. රතියා ජායති සොකො රතියා ජායති භයං,
රතියා විප්පමුත්තස්ස නත්ථි සොකො කුතො භයං. 1944

5 අනිත්ථිගන්ධකුමාරවත්ථු =

215. කාමතො ජායති සොකො කාමතො ජායති භයං,
කාමතො විපපමුතතසස නත්ථි සොකො
කුතො භයං. 1948

6 අඤ්ඤතරබ්‍රාහ්මණවත්ථු

216. තණ්හාය ජායති සොකො තණ්හාය ජායති භයං,
තණ්හාය විපපමුතතසස නත්ථි සොකො
කුතො භයං. 1950

7 පඤ්චසතදාරකවත්ථු =

217. සීලදසසනසමපනනං ධමමට්ඨං සචචවෙදිනං,
අතතනො කමමකුබබානං තං ජනො
කුරුතෙ පියං. 1953

8 අනාගාමිත්ථෙරවත්ථු =

218. ඡන්දජාතො අනකඛාතෙ මනසා ච ඵුටො සියා,
කාමෙසු ච අපපටිබද්ධචිතෙතා උද්ධංසොතොති
වුචචති. 1955

9 නන්දියවත්ථු =

219. චිරපපවාසිං පුරිසං දූරතො සොත්ථිමාගතං,
ඤාතිමිතතා සුහජජා ච අභිනන්දන්ති ආගතං.

220. තථෙව කතපුඤ්ඤම්පි අසමා ලොකා පරං ගතං,
පුඤ්ඤානි පතිගණ්හන්ති පියං ඤාතීව ආගතං. 1959

## ක්‍රොධවර්ගය 17.

1 රොහිණීවත්ථු =

221. කොධං ජහෙ විපපජහෙයය මානං
සඤ්ඤොජනං සබබමතිකකමෙයය,
තං නාමරූපසමිං අසජජමානං අකිඤ්චනං
නානුපතනති දුකඛා. 1965

2 අඤ්ඤතරභික්ඛුවත්ථු =

222. යො වෙ උපපතිතං කොධං රථං භනතං ව ධාරයෙ,
තමහං සාරථිං බ්‍රෑමි රසමිගගාහො ඉතරො ජනො. 1977

3 උත්තරාඋපාසිකාවත්ථු =

223. අකොධෙන ජිනෙ කොධං අසාධුං සාධුනා ජිනෙ,
ජිනෙ කදරියං දානෙන සචෙචන අලිකවාදිනං. 1988

4 මහාමොග්ගල්ලානත්ථෙරස්ස පඤ්හවත්ථු =

224. සච්චං භණෙ න කුජ්ඣෙය්‍ය දජ්ජාප්පස්මිම්පි
යාචිතො,
එතෙහි තීහි ඨානෙහි ගච්ඡෙ දෙවාන සන්තිකෙ. 1990

5 සාකෙතකබ්‍රාහ්මණවත්ථු =

225. අහිංසකා යෙ මුනයො නිච්චං කායෙන සංවුතා,
තෙ යන්ති අච්චුතං ඨානං යත්ථ ගන්ත්වා
න සොචරෙ. 1994

6 පුණ්ණාවත්ථු =

226. සදා ජාගරමානානං අහොරත්තානුසික්ඛිනං,
නිබ්බානං අධිමුත්තානං අත්ථං ගච්ඡන්ති ආසවා. 1997

7 අතුලඋපාසකවත්ථු =

227. පොරාණමෙතං අතුල! නෙතං අජ්ජතනාමිව
නින්දන්ති තුණ්හිමාසීනං නින්දන්ති බහුභාණිනං,
මිතභාණිම්පි නින්දන්ති නත්ථි ලොකෙ අනින්දිතො.

228 න චාහු න ච භවිස්සති න චෙතරහි විජ්ජති,
එකන්තං නින්දිතො පොසො එකන්තං වා
පසංසිතො.

229. යඤ්චෙ විඤ්ඤූ පසංසන්ති අනුවිච්ච සුවෙ සුවෙ,
අච්ඡිද්දවුත්තිං මෙධාවිං පඤ්ඤාසීලසමාහිතං.

230. නෙක්ඛං ජම්බොනදස්සෙව කො තං නින්දිතුමරහති,
දෙවාපි නං පසංසන්ති බ්‍රහ්මුනාපි පසංසිතො. 2001

8 ඡබ්බග්ගියභික්ඛුවත්ථු =

231. කායප්පකොපං රක්ඛෙය්‍ය කායෙන සංවුතො සියා,
කායදුච්චරිතං හිත්වා කායෙන සුචරිතං චරෙ.

232. වචීපකොපං රක්ඛෙය්‍ය වාචාය සංවුතො සියා,
වචීදුච්චරිතං හිත්වා වාචාය සුචරිතං චරෙ.

233. මනොපකොපං රක්ඛෙය්‍ය මනසා සංවුතො සියා,
මනොදුච්චරිතං හිත්වා මනසා සුචරිතං චරෙ.

234. කායෙන සංවුතා ධීරා අථො වාචාය සංවුතා,
මනසා සංවුතා ධීරා තෙ වෙ සුපරිසංවුතා. 2006

# මලවග්ගය 18.

1 **ගොඝාතකපුත්තවත්ථු =**

235. පණ්ඩුපලාසොව'දානිසි යමපුරිසාපි ච තමුපට්ඨිතා,
උය්‍යොගමුඛෙ ච තිට්ඨසි පාථෙය්‍යම්පි ච තෙ
න විජ්ජති.

236. සො කරොහි දීපමත්තනො ඛිප්පං වායම
පණ්ඩිතො භව,
නිද්ධන්තමලො අනඞ්ගණො දිබ්බං
අරියභූමිමෙහිසි. 2011

2 **අඤ්ඤතරබ්‍රාහ්මණවත්ථු =**

239. අනුපුබ්බෙන මෙධාවී ථොකථොකං ඛණෙ ඛණෙ,
කම්මාරො රජතස්සෙව නිද්ධමෙ මලමත්තනො. 2017

3 **තිස්සත්ථෙරවත්ථු =**

240. අයසාව මලං සමුට්ඨිතං තදුට්ඨාය තමෙව ඛාදති,
එවං අතිධොනචාරිනං සකකම්මානි නයන්ති
දුග්ගතිං. 2020

4 **ලාළුදායිත්ථෙරවත්ථු =**

241. අසජ්ඣායමලා මන්තා අනුට්ඨානමලා ඝරා,
මලං වණ්ණස්ස කොසජ්ජං පමාදො
රක්ඛතො මලං. 2024

5 **අඤ්ඤතරකුලපුත්තවත්ථු =**

242. මලිත්ථියා දුච්චරිතං මච්ඡෙරං දදතො මලං,
මලා වෙ පාපකා ධම්මා අස්මිං ලොකෙ පරම්හි ච

243. තතො මලා මලතරං අවිජ්ජා පරමං මලං,
එතං මලං පහත්වාන නිම්මලා! හොථ භික්ඛවො. 2027

6 **චූලසාරිකවත්ථු =**

244. සුජීවං අහිරිකෙන කාකසූරෙන ධංසිනා,
පක්ඛන්දිනාපගබ්භෙන සඞ්කිලිට්ඨෙන ජීවිතං.

245. හිරීමතා ච දුජ්ජීවං නිච්චං සුචිගවෙසිනා,
අලීනෙනාපගබ්භෙන සුද්ධාජීවෙන පස්සතා. 2031

7 **පඤ්චසතඋපාසකවත්ථු =**

246. යො පාණමතිපාතෙති මුසාවාදඤ්ච භාසති,
ලොකෙ අදින්නං ආදියති පරදාරඤ්ච ගච්ඡති.

247. සුරාමෙරයපානඤ්ච යො නරො අනුයුඤ්ජති,
ඉධෙව පොසො ලොකස්මිං මූලං ඛණති අත්තනො.

248. එවම්භො පුරිස! ජානාහි පාපධම්මා අසඤ්ඤතා,
මා තං ලොභො අධම්මො ච චිරං දුක්ඛාය රන්ධයුං. 2039

**8 තිස්සදහරකවත්ථු =**

249. දදාති වෙ යථාසද්ධං යථා පසාදනං ජනො,
තත්ථ සො මඞ්කුභාවං වා පරෙසං පානභොජනෙ,
න සො දිවා වා රත්තිං වා සමාධිං අධිගච්ඡති.

250. යස්ස චෙතං සමුච්ඡින්නං මූලඝච්චං සමූහතං,
ස වෙ දිවා වා රත්තිං වා සමාධිං අධිගච්ඡති. 2043

**9 පඤ්චඋපාසකවත්ථු =**

251. නත්ථි රාගසමො අග්ගි නත්ථි දොසසමො ගහො,
නත්ථි මොහසමං ජාලං නත්ථි තණ්හාසමා නදී. 2049

**10 මෙණ්ඩකසෙට්ඨිවත්ථු =**

252 සුදස්සං වජ්ජමඤ්ඤෙසං අත්තනො පන දුද්දසං,
පරෙසං හි සො වජ්ජානි ඔපුණාති යථාභුසං,
අත්තනො පන ඡාදෙති කලිං ව කිතවා සඨො. 2060

**11 උජ්ඣානසඤ්ඤිනාමත්ථෙරවත්ථු =**

253. පරවජ්ජානුපස්සිස්ස නිච්චං උජ්ඣානසඤ්ඤිනො,
ආසවා තස්ස වඩ්ඪන්ති ආරා සො ආසවක්ඛයා. 2062

**12 සුභද්දපරිබ්බාජකවත්ථු =**

254. ආකාසෙ පදං නත්ථි සමණො නත්ථි බාහිරෙ,
පපඤ්චාභිරතා පජා නිප්පපඤ්චා තථාගතා.

255. ආකාසෙ පදං නත්ථි සමණො නත්ථි බාහිරෙ,
සඞ්ඛාරා සස්සතා නත්ථි නත්ථි බුද්ධානමිඤ්ජිතං. 2063

## ධර්මස්ථවර්ගය 19.

**1 විනිච්ඡයමහාමච්චවත්ථු =**

256. න තෙන හොති ධම්මට්ඨො යෙනත්ථං සහසා නයෙ,
යො ච අත්ථං අනත්ථං ච උභො නිච්ඡෙය්‍ය
පණ්ඩිතො.

257. අසාහසෙන ධම්මෙන සමෙන නයති පරෙ,
ධම්මස්ස ගුත්තො මෙධාවී ධම්මට්ඨොති පවුච්චති. 2075

2 ඡබ්බග්ගියභික්ඛුවත්ථු =

258. න තෙන පණ්ඩිතො හොති යාවතා බහු භාසති,
ඛෙමී අවෙරී අභයො පණ්ඩිතොති පවුච්චති. 2078

3 එකුදානඛීණාසවත්ථෙරවත්ථු =

259. න තාවතා ධම්මධරො යාවතා බහු භාසති,
යො ච අප්පම්පි සුත්වාන ධම්මං කායෙන පස්සති,
සවෙ ධම්මධරො හොති යො ධම්මං නප්පමජ්ජති. 2081

4 ලකුණ්ටකභද්දියත්ථෙරවත්ථු =

260. න තෙන ථෙරො හොති යෙනස්ස පලිතං සිරො,
පරිපක්කො වයො තස්ස මොඝජිණ්ණොති වුච්චති.

261. යම්හි සච්චං ච ධම්මො ච අහිංසා සඤ්ඤමො දමො,
සවෙ වන්තමලො ධීරො ථෙරො ඉති පවුච්චති. 2083

5 සම්බහුලභික්ඛුවත්ථු =

262. න වාක්කරණමත්තෙන වණ්ණපොක්ඛරතාය වා.
සාධුරූපො නරො හොති ඉස්සුකී මච්ඡරී සඨො.

263. යස්ස චෙතං සමුච්ඡින්නං මූලඝච්චං සමූහතං,
සවන්තදොසො මෙධාවී සාධුරූපොති වුච්චති. 2113

6 හත්ථකවත්ථු =

264. න මුණ්ඩකෙන සමණො අබ්බතො අලිකං භණං,
ඉච්ඡාලොභසමාපන්නො සමණො කිං භවිස්සති.

265. යො ච සමෙති පාපානි අණුං ථූලානි සබ්බසො,
සමිතත්තා හි පාපානං සමණොති පවුච්චති. 2121

7 අඤ්ඤතරබ්‍රාහ්මණවත්ථු =

266. න තෙන භික්ඛු හොති යාවතා භික්ඛතෙ පරෙ,
විස්සං ධම්මං සමාදාය භික්ඛු හොති න තාවතා.

267 යොධ පුඤ්ඤං ච පාපං ච බාහිත්වා බ්‍රහ්මචරියවා,
සඞ්ඛාය ලොකෙ චරති සවෙ භික්ඛූති වුච්චති. 2125

8 තිත්ථියවත්ථු =

268. න මොනෙන මුනී හොති මූළ්හරූපො අවිද්දසු,
යො ච තුලං ව පග්ගය්හ වරමාදාය පණ්ඩිතො.

269. පාපානි පරිවජ්ජෙති ස මුනි තෙන සො මුනි,
යො මුනාති උභො ලොකෙ මුනි තෙන පවුච්චති. 2127

9 **බාලිසිකවත්ථු =**

270. න තෙන අරියො හොති යෙන පාණානි හිංසති,
අහිංසා සබ්බපාණානං අරියොති පවුච්චති. 2129

10 **සම්බහුලභික්ඛුවත්ථු =**

271. න සීලබ්බතමත්තෙන බාහුසච්චෙන වා පන,
අථවා සමාධිලාභෙන විවිත්තසයනෙන වා.

272. ඵුසාමි නෙක්ඛම්මසුඛං අපුථුජ්ජනසෙවිතං,
භික්ඛු විස්සාසමාපාදි අප්පත්තො ආසවක්ඛයං. 2131

## මාර්ගවර්ගය 20.

1 **පඤ්චසතභික්ඛුවත්ථු =**

273. මග්ගානට්ඨඞ්ගිකො සෙට්ඨො සච්චානං චතුරො පදා,
විරාගො සෙට්ඨො ධම්මානං ද්විපදානං ච චක්ඛුමා.

274. එසොව මග්ගො නත්ථඤ්ඤො දස්සනස්ස විසුද්ධියා,
එතං හි තුම්හෙ පටිපජ්ජථ මාරස්සෙතං පමොහනං.

275. එතං හි තුම්හෙ පටිපන්නා දුක්ඛස්සන්තං කරිස්සථ,
අක්ඛාතො වෙ මයා මග්ගො අඤ්ඤාය සල්ලසත්ථනං.

276. තුම්හෙහි කිච්චං ආතප්පං අක්ඛාතාරො තථාගතා,
පටිපන්නා පමොක්ඛන්ති ඣායිනො මාරබන්ධනා 2133

2 **අනිච්චලක්ඛණවත්ථු =**

277. සබ්බෙ සඞ්ඛාරා අනිච්චාති යදා පඤ්ඤාය පස්සති,
අථ නිබ්බින්දති දුක්ඛෙ එසමග්ගො විසුද්ධියා. 2140

3 **දුක්ඛලක්ඛණවත්ථු =**

278. සබ්බෙ සඞ්ඛාරා දුක්ඛාති යදා පඤ්ඤාය පස්සති,
අථ නිබ්බින්දති දුක්ඛෙ එසමග්ගො විසුද්ධියා. 2196

4 **අනත්තලක්ඛණවත්ථු =**

279. සබ්බෙ ධම්මා අනත්තාති යදා පඤ්ඤාය පස්සති,
අථ නිබ්බින්දති දුක්ඛෙ එසමග්ගො විසුද්ධියා. 2197

**5 පධානකම්මිකතිස්සත්ථෙරවත්ථු =**

280. උට්ඨානකාලම්හි අනුට්ඨහානො යුවා බලී
ආලසියං උපෙතො,
සංසන්නසඞ්කප්පමනො කුසීතො පඤ්ඤාය
මග්ගං අලසො න වින්දති. 2200

**6 සූකරපෙතවත්ථු =**

281. වාචානුරක්ඛී මනසා සුසංවුතො කායෙන ච
අකුසලං න කයිරා,
එතෙ තයො කම්මපථෙ විසොධයෙ ආරාධයෙ
මග්ගං ඉසිප්පවෙදිතං. 2207

**7 පොට්ඨිලත්ථෙරවත්ථු =**

282. යොගා වෙ ජායතී භූරි අයොගා භූරිසඞ්ඛයෙ,
එතං ද්වෙධාපථං ඤත්වා භවාය විභවාය ච, 2212
තථත්තානං නිවෙසෙය්‍ය යථා භූරි පවඩ්ඪති.

**8 මහල්ලකත්ථෙරවත්ථු =**

283. වනං ඡින්දථ මා රුක්ඛං වනතො ජායතී භයං,
ඡෙත්වා වනං ච වනථං ච නිබ්බනා හොථ
භික්ඛවො.

284. යාවං හි වනථො න ඡිජ්ජති අණුමත්තොපි
නරස්ස නාරිසු,
පටිබද්ධමනොව තාව සො වච්ඡො ඛීරපකොව
මාතරි. 2215

**9 සුවණ්ණකාරත්ථෙරවත්ථු =**

285. උච්ඡින්ද සිනෙහමත්තනො කුමුදං සාරදිකං ච
පාණිනා,
සන්තිමග්ගමෙව බ්‍රෑහය නිබ්බානං සුගතෙන
දෙසිතං. 2221

**10 මහාධනවාණිජවත්ථු**

286. ඉධ වස්සං වසිස්සාමි ඉධ හෙමන්තගිම්හිසු,
ඉති බාලො විචින්තෙති අන්තරායං න බුජ්ඣති. 2224

**11 කිසාගොතමීවත්ථු =**

287. තං පුත්තපසුසම්මත්තං ව්‍යාසත්තමනසං නරං,
සුත්තං ගාමං මහොඝො ව මච්චු ආදාය ගච්ඡති. 2227

**12 පටාචාරාවත්ථු =**

288. න සන්ති පුත්තා තාණාය න පිතා නපි බන්ධවා,
අන්තකේනාධිපන්නස්ස නත්ථි ඤාතීසු තාණතා.

289. එතමත්ථවසං ඤත්වා පණ්ඩිතො සීලසංවුතො,
නිබ්බානගමනං මග්ගං ඛිප්පමෙව විසොධයෙ. 2229

## ප්‍රකීර්ණකවර්ගය 21.

**1 ගඞ්ගාරොහණවත්ථු =**

290. මත්තාසුඛපරිච්චාගා පස්සෙ චෙ විපුලං සුඛං,
චජෙ මත්තා සුඛං ධීරො සම්පස්සං විපුලං සුඛං. 2239

**2 කුක්කුටණ්ඩඛාදිකාවත්ථු =**

291. පරදුක්ඛූපදානෙන අත්තනො සුඛමිච්ඡති,
වෙරසංසග්ගසංසට්ඨො වෙරා සො න පරිමුච්චති. 2241

**3 භද්දියභික්ඛුවත්ථු =**

292. යං හි කිච්චං තදපවිද්ධං අකිච්චං පන කයිරති,
උන්නළානං පමත්තානං තෙසං වඩ්ඪන්ති ආසවා.

293. යෙසං ච සුසමාරද්ධා නිච්චං කායගතා සති,
අකිච්චං තෙ න සෙවන්ති කිච්චෙ සාතච්චකාරිනො,
සතානං සම්පජානානං අත්ථං ගච්ඡන්ති ආසවා. 2243

**4 ලකුණ්ටකභද්දියත්ථෙරවත්ථු =**

294. මාතරං පිතරං හන්ත්වා රාජානො ද්වෙ ච ඛත්තියෙ,
රට්ඨං සානුචරං හන්ත්වා අනීඝො යාති බ්‍රාහ්මණො.

295. මාතරං පිතරං හන්ත්වා රාජානො ද්වෙ ච සොත්ථියෙ,
වෙය්‍යග්ඝපඤ්චමං හන්ත්වා අනීඝො යාති බ්‍රාහ්මණො. 2254

**5 දාරුසාකටිකපුත්තවත්ථු =**

296. සුප්පබුද්ධං පබුජ්ඣන්ති සදා ගොතමසාවකා,
යෙසං දිවා ච රත්තො ච නිච්චං බුද්ධගතා සති.

297. සුප්පබුද්ධං පබුජ්ඣන්ති සදා ගොතමසාවකා,
යෙසං දිවා ච රත්තො ච නිච්චං ධම්මගතා සති.

298. සුප්පබුද්ධං පබුජ්ඣන්ති සදා ගොතමසාවකා,
යෙසං දිවා ච රත්තො ච නිච්චං සඞ්ඝගතා සති.

299. සුප්පබුද්ධං පබුජ්ඣන්ති සදා ගොතමසාවකා,
යෙසං දිවා ච රත්තො ච නිච්චං කායගතා සති.

300. සුප්පබුද්ධං පබුජ්ඣන්ති සදා ගොතමසාවකා,
යෙසං දිවා ච රත්තො ච අහිංසාය රතො මනො.

301. සුප්පබුද්ධං පබුජ්ඣන්ති සදා ගොතමසාවකා,
යෙසං දිවා ච රත්තො ච භාවනාය රතො මනො. 2259

**6 වජ්ජිපුත්තකභික්ඛුවත්ථු =**

302. දුප්පබ්බජ්ජං දුරභිරමං දුරාවාසා ඝරා දුඛා,
දුක්ඛො සමානසංවාසො දුක්ඛානුපතිතද්ධගූ,
තස්මා න චද්ධගූ සියා දුක්ඛානුපතිතො සියා. 2286

**7 චිත්තගහපතිවත්ථු =**

303. සද්ධො සීලෙන සම්පන්නො යසො භොගසමප්පිතො,
යං යං පදෙසං භජති තත්ථ තත්ථෙව පූජිතො. 2288

**8 චූළසුභද්දාවත්ථු =**

304. දූරෙ සන්තො පකාසෙන්ති හිමවන්තොව පබ්බතො,
අසන්තෙත්ථ න දිස්සන්ති රත්තිඛිත්තා යථා සරා. 2294

**9 එකවිහාරිකත්ථෙරවත්ථු =**

305. එකාසනං එකසෙය්‍යං එකො චර මතන්දිතො,
එකො දමයමත්තානං වනන්තෙ රමිතො සියා. 2297

## නිරයවර්ගය 22.

**1 සුන්දරිපරිබ්බාජිකාවත්ථු =**

306. අභූතවාදී නිරයං උපෙති යො චාපි කත්වා න
කරොමීති චාහ,
උභොපි තෙ පෙච්ච සමා භවන්ති නිහීනකම්මා
මනුජා පරත්ථ. 2304

**2 දුච්චරිතඵලානුභවසත්තවත්ථු =**

307. කාසාවකණ්ඨා බහවො පාපධම්මා අසඤ්ඤතා,
පාපා පාපෙහි කම්මෙහි නිරයං තෙ උපපජ්ජරෙ. 2307

**3 වග්ගුමුදාතීරියභික්ඛුවත්ථු =**

308. සෙය්‍යො අයොගුළො භුත්තො තත්තො
අග්ගිසිඛූපමො,
යං චෙ භුඤ්ජෙය්‍ය දුස්සීලො රට්ඨපිණ්ඩං
අසඤ්ඤතො. 2311

4 ඛෙමවත්ථු =

309. චත්තාරි ඨානානි නරො පමත්තො ආපජ්ජති
පරදාරූපසෙවී,
අපුඤ්ඤලාභං න නිකාමසෙය්‍යං නින්දං තතියං
නිරයං චතුත්ථං.

310. අපුඤ්ඤලාභො ච ගතී ච පාපිකා භීතස්ස
භීතාය රතී ච ථොකිකා,
රාජා ච දණ්ඩං ගරුකං පණෙති තස්මා නරො
පරදාරං න සෙවෙ. 2313

5 දුබ්බචභික්ඛුවත්ථු =

311. කුසො යථා දුග්ගහිතො හත්ථමෙවානුකන්තති,
සාමඤ්ඤං දුප්පරාමට්ඨං නිරයායුපකඩ්ඪති.

312. යං කිඤ්චි සිථිලං කම්මං සංකිලිට්ඨං ච යං වතං,
සඞ්කස්සරං බ්‍රහ්මචරියං න තං හොති මහප්ඵලං.

313. කයිරා චෙ කයිරාථෙනං දළ්හමෙනං පරක්කමෙ,
සිථිලො හි පරිබ්බාජො භිය්‍යො ආකිරතෙ රජං. 2316

6 ඉස්සාපකතිත්ථිවත්ථු =

314. අකතං දුක්කතං සෙය්‍යො පච්ඡා තපති දුක්කතං,
කතඤ්ච සුකතං සෙය්‍යො යං කත්වා නානුතප්පති. 2320

7 ආගන්තුකභික්ඛුවත්ථු =

315. නගරං යථා පච්චන්තං ගුත්තං සන්තරබාහිරං,
එවං ගොපෙථ අත්තානං ඛණො වො මා උපච්චගා,
ඛණාතීතා හි සොචන්ති නිරයම්හි සමප්පිතා. 2322

8 නිගණ්ඨවත්ථු =

316. අලජ්ජිතායෙ ලජ්ජන්ති ලජ්ජිතායෙ න ලජ්ජරෙ,
මිච්ඡාදිට්ඨිසමාදානා සත්තා ගච්ඡන්ති දුග්ගතිං.

317. අභයෙ භයදස්සිනො භයෙ චාභයදස්සිනො,
මිච්ඡාදිට්ඨිසමාදානා සත්තා ගච්ඡන්ති දුග්ගතිං. 2325

9 තිත්ථියසාවකවත්ථු =

318. අවජ්ජෙ වජ්ජමතිනො වජ්ජෙ චාවජ්ජදස්සිනො,
මිච්ඡාදිට්ඨිසමාදානා සත්තා ගච්ඡන්ති දුග්ගතිං.

319. වජ්ජං ච වජ්ජතො ඤත්වා අවජ්ජං ච අවජ්ජතො,
සම්මාදිට්ඨිසමාදානා සත්තා ගච්ඡන්ති සුග්ගතිං. 2328

# නාගවග්ගය 23.

**1 අත්තානං ආරබ්භකථිතවත්ථු =**

320. අහං නාගොව සඞ්ගාමෙ චාපාතො පතිතං සරං,
අතිවාක්‍යං තිතික්ඛිස්සං දුස්සීලො හි බහුජ්ජනො.

321. දන්තං නයන්ති සමිතිං දන්තං රාජාභිරූහති,
දන්තො සෙට්ඨො මනුස්සෙසු යොතිවාක්‍යං
තිතික්ඛති.

322. වරමස්සතරා දන්තා ආජානීයා ච සින්ධවා,
කුඤ්ජරා ච මහානාගා අත්තදන්තො තතො වරං. 2331

**2 හත්ථාචරියපුබ්බකභික්ඛුවත්ථු =**

323. න හි එතෙහි යානෙහි ගච්ඡෙය්‍ය අගතං දිසං,
යථාත්තනා සුදන්තෙන දන්තො දන්තෙන ගච්ඡති. 2335

**3 අඤ්ඤතරබ්‍රාහ්මණපුත්තවත්ථු =**

324. ධනපාලකො නාම කුඤ්ජරො කටුකප්ප
භෙදනො දුන්නිවාරයො,
බද්ධො කබලං න භුඤ්ජති සුමරති නාගවනස්ස
කුඤ්ජරො. 2341

**4 පසෙනදිකොසලවත්ථු =**

325. මිද්ධී යදා හොති මහග්ඝසො ච නිද්දායිතා
සම්පරිවත්තසායී,
මහාවරාහොව නිවාපපුට්ඨො පුනප්පුනං
ගබ්භමුපෙති මන්දො. 2344

**5 සානුසාමණෙරවත්ථු =**

326. ඉදං පුරෙ චිත්තමචාරි චාරිකං යෙනිච්ඡකං
යත්ථකාමං යථාසුඛං,
තදජ්ජහං නිග්ගහෙස්සාමි යොනිසො හත්ථිප්පභින්නං
විය අඞ්කුසග්ගහො. 2349

**6 බද්ධෙරකහත්ථිවත්ථු =**

327. අප්පමාදරතා හොථ සචිත්තමනුරක්ඛථ,
දුග්ගා උද්ධරථත්තානං පඞ්කෙ සන්නොව කුඤ්ජරො 2352

7 දිසංවාසිභික්ඛුවත්ථු =

328. සචෙ ලභෙථ නිපකං සහායං සද්ධිං චරං
සාධු විහාරි ධීරං,
අභිභුය්‍ය සබ්බානි පරිස්සයානි චරෙය්‍ය
තෙනත්තමනො සතීමා.

329. නො චෙ ලභෙථ නිපකං සහායං සද්ධිං චරං
සාධු විහාරි ධීරං,
රාජාව රට්ඨං විජිතං පහාය එකො චරෙ
මාතඞ්ගරඤ්ඤෙව නාගො.

330. එකස්ස චරිතං සෙය්‍යො නත්ථි බාලෙ සහායතා,
එකො චරෙ න ච පාපානි කයිරා අප්පොස්සුක්කො
මාතඞ්ගරඤ්ඤෙව නාගො 2355

8 මාරවත්ථු =

331. අත්ථම්හි ජාතම්හි සුඛා සහායා තුට්ඨී සුඛා යා
ඉතරීතරෙන,
පුඤ්ඤං සුඛං ජීවිතසඞ්ඛයම්හි සබ්බස්ස දුක්ඛස්ස
සුඛං පහාණං.

332. සුඛා මත්තෙය්‍යතා ලොකෙ අථො
පෙත්තෙය්‍යතා සුඛා,
සුඛා සාමඤ්ඤතා ලොකෙ අථො
බ්‍රහ්මඤ්ඤතා සුඛා.

333. සුඛං යාව ජරා සීලං සුඛා සද්ධා පතිට්ඨිතා,
සුඛො පඤ්ඤාය පටිලාභො පාපානං අකරණං සුඛං. 2361

## තෘෂ්ණාවර්ගය 24.

1 කපිලමච්ඡවත්ථු =

334. මනුජස්ස පමත්තචාරිනො තණ්හා වඩ්ඪති
මාලුවා විය,
සො පලවති හුරාහුරං ඵලමිච්ඡං ව වනස්මිං
වානරො.

335. යං එසා සහතෙ ජම්මී තණ්හා ලොකෙ විසත්තිකා,
සොකා තස්ස පවඩ්ඪන්ති අභිවට්ඨංව බීරණං.

336. යො චෙ තං සහතී ජම්මිං තණ්හං ලොකෙ දුරච්චයං,
සොකා තම්හා පපතන්ති උදබින්දුව පොක්ඛරා.

337. තං වො වදාමි භද්දං වො යාවන්තෙත්ථ සමාගතා,
තණ්හාය මූලං ඛණථ උසීරත්ථොව බීරණං,
මා වො නලං ව සොතොව මාරො භඤ්ජි
පුනප්පුනං. 2370

**2 සූකරපොතිකාවත්ථු =**

338. යථාපි මූලෙ අනුපද්දවෙ දළ්හෙ ඡින්නොපි
රුක්ඛො පුනරෙව රූහති,
එවම්පි තණ්හානුසයෙ අනූහතෙ නිබ්බත්තති
දුක්ඛමිදං පුනප්පුනං.

339. යස්ස ඡත්තිංසති සොතා මනාපස්සවණා භුසා,
වාහා වහන්ති දුද්දිට්ඨිං සඞ්කප්පා රාගනිස්සිතා.

340. සවන්ති සබ්බධි සොතා ලතා උබ්භිජ්ජ තිට්ඨති,
තං ච දිස්වා ලතං ජාතං මූලං පඤ්ඤාය ඡින්දථ.

341. සරිතානි සිනෙහිතානි ච සොමනස්සානි
භවන්ති ජන්තුනො,
තෙ සාතසිතා සුඛෙසිනො තෙ වෙ
ජාතිජරූපගා නරා.

342. තසිණාය පුරක්ඛතා පජා පරිසප්පන්ති
සසොව බාධිතො,
සංයොජනසඞ්ගසත්තා දුක්ඛමුපෙන්ති
පුනප්පුනං චිරාය.

343. තසිණාය පුරක්ඛතා පජා පරිසප්පන්ති
සසොව බාධිතො,
තස්මා තසිණං විනොදයෙ භික්ඛු
ආකඞ්ඛී විරාගමත්තනො. 2375

**3 විබ්භන්තකභික්ඛුවත්ථු =**

344 යො නිබ්බනථො වනාධිමුත්තො
වනමුත්තො වනමෙව ධාවති,
තං පුග්ගලමෙථ පස්සථ මුත්තො
බන්ධනමෙව ධාවති. 2383

**4 බන්ධනාගාරවත්ථු =**

345. න තං දළ්හං බන්ධනමාහු ධීරා යදා යසං
දාරුජං බබ්බජං ච,
සාරත්තරත්තා මණිකුණ්ඩලෙසු පුත්තෙසු
දාරෙසු ච යා අපෙක්ඛා.

346. එතං දළ්හං බන්‍ධනමාහු ධීරා ඔහාරිනං
සිථිලං දුප්පමුඤ්චං,
එතම්පි ඡෙත්වාන පරිබ්බජන්ති අනපෙක්ඛිනො
කාමසුඛං පහාය. 2386

**5 ඛෙමාථෙරීවත්ථු =**

347. යෙ රාගරත්තානුපතන්ති සොතං සයං
කතං මක්කටකොව ජාලං,
එතම්පි ඡෙත්වාන වජන්ති ධීරා අනපෙක්ඛිනො
සබ්බදුක්ඛං පහාය. 2389

**6 උග්ගසෙනසෙට්ඨිපුත්තවත්ථු =**

348. මුඤ්ච පුරෙ මුඤ්ච පච්ඡතො මජ්ඣෙ
මුඤ්ච භවස්ස පාරගූ,
සබ්බත්ථ විමුත්තමානසො න පුන
ජාතිජරං උපෙහිසි. 2394

**7 දහරභික්ඛුවත්ථු =**

349. විතක්කපමථිතස්ස ජන්තුනො තිබ්බරාගස්ස
සුභානුපස්සිනො,
භීය්‍යො තණ්හා පවඩ්ඪති එස ඛො දළ්හං
කරොති බන්‍ධනං.

350. විතක්කූපසමෙ ච යො රතො අසුභං
භාවයති සදා සතො,
එස ඛො ව්‍යන්තිකාහිති එස ඡෙච්ඡති මාරබන්‍ධනං. 2399

**8 මාරවත්ථු =**

351. නිට්ඨං ගතො අසන්තාසී වීතතණ්හො අනඞ්ගණො,
අච්ඡින්දි භවසල්ලානි අන්තිමොයං සමුස්සයො.

352. වීතතණ්හො අනාදානො නිරුත්තිපදකොවිදො,
අක්ඛරානං සන්නිපාතං ජඤ්ඤා පුබ්බාපරානි ච,
ස වෙ අන්තිමසාරීරො මහාපඤ්ඤො
මහාපුරිසොති වුච්චති. 2413

**9 උපකාජීවකවත්ථු =**

353. සබ්බාභිභූ සබ්බවිදූහමස්මි සබ්බෙසු
ධම්මෙසු අනූපලිත්තො,
සබ්බඤ්ජහො තණ්හක්ඛයෙ විමුත්තො සයං
අභිඤ්ඤාය කමුද්දිසෙය්‍යං. 2425

**10 සක්කපඤ්හවත්ථු =**

354. සබ්බදානං ධම්මදානං ජිනාති සබ්බං රසං
ධම්මරසො ජිනාති,
සබ්බං රතිං ධම්මරති ජිනාති තණ්හක්ඛයො
සබ්බදුක්ඛං ජිනාති. 2428

**11 අපුත්තකසෙට්ඨිවත්ථු =**

355. හනන්ති භොගා දුම්මෙධං නො ච
පාරගවෙසිනො,
භොගතණ්හාය දුම්මෙධො හන්ති
අඤ්ඤෙව අත්තනං. 2434

**12 අඞ්කුරවත්ථු =**

356. තිණදොසානි ඛෙත්තානි රාගදොසා අයං පජා,
තස්මා හි වීතරාගෙසු දින්නං හොති මහප්ඵලං.

357. තිණදොසානි ඛෙත්තානි දොසදොසා අයං පජා,
තස්මා හි වීතදොසෙසු දින්නං හොති මහප්ඵලං.

358. තිණදොසානි ඛෙත්තානි මොහදොසා අයං පජා,
තස්මා හි වීතමොහෙසු දින්නං හොති මහප්ඵලං.

359. තිණදොසානි ඛෙත්තානි ඉච්ඡාදොසා අයං පජා,
තස්මා හි විගතිච්ඡෙසු දින්නං හොති මහප්ඵලං. 2436

## භික්ඛුවග්ගය 25.

**1 පඤ්චභික්ඛුවත්ථු =**

360. චක්ඛුනා සංවරො සාධු සාධු සොතෙන සංවරො,
ඝානෙන සංවරො සාධු සාධු ජිව්හාය සංවරො.

361. කායෙන සංවරො සාධු සාධු වාචාය සංවරො,
මනසා සංවරො සාධු සාධු සබ්බත්ථ සංවරො,
සබ්බත්ථ සංවුතො භික්ඛු සබ්බදුක්ඛා පමුච්චති. 2442

**2 හංසඝාතකභික්ඛුවත්ථු =**

362. හත්ථසඤ්ඤතො පාදසඤ්ඤතො වාචාය
සඤ්ඤතො සඤ්ඤතුත්තමො,
අජ්ඣත්තරතො සමාහිතො එකො
සන්තුසිතො තමාහු භික්ඛුං. 2450

**3 කොකාලිකවත්ථු =**

363. යො මුඛසඤ්ඤතො භික්ඛු මන්තභාණී අනුද්ධතො,
අත්ථං ධම්මං ච දීපෙති මධුරං තස්ස භාසිතං. 2453

**4 ධම්මාරාමත්ථෙරවත්ථු =**

364. ධම්මාරාමො ධම්මරතො ධම්මං අනුවිචින්තයං,
ධම්මං අනුස්සරං භික්ඛු සද්ධම්මා න පරිහායති. 2456

**5 විපක්ඛසෙවකභික්ඛුවත්ථු =**

365. සලාභං නාතිමඤ්ඤෙය්‍ය නාඤ්ඤෙසං පිහයං චරෙ,
අඤ්ඤෙසං පිහයං භික්ඛු සමාධිං නාධිගච්ඡති.

366. අප්පලාභොපි චෙ භික්ඛු සලාභං නාතිමඤ්ඤති,
තං වෙ දෙවා පසංසන්ති සුද්ධාජීවං අතන්දිතං. 2459

**6 පඤ්චග්ගදායකබ්‍රාහ්මණවත්ථු =**

367. සබ්බසො නාමරූපස්මිං යස්ස නත්ථි මමායිතං,
අසතා ච න සොචති ස වෙ භික්ඛූති වුච්චති. 2462

**7 සම්බහුලභික්ඛුවත්ථු =**

368. මෙත්තාවිහාරී යො භික්ඛු පසන්නො බුද්ධසාසනෙ,
අධිගච්ඡෙ පදං සන්තං සඞ්ඛාරූපසමං සුඛං.

369. සිඤ්ච භික්ඛු! ඉමං නාවං සිත්තා තෙ ලහුමෙස්සති,
ඡෙත්වා රාගං ච දොසං ච තතො නිබ්බානමෙහිසි.

370. පඤ්ච ඡින්දෙ පඤ්ච ජහෙ පඤ්ච චුත්තරි භාවයෙ,
පඤ්චසඞ්ගාතිගො භික්ඛු ඔඝතිණ්ණොති වුච්චති.

371. ඣාය භික්ඛු! මා ච පාමදො මා තෙ කාමගුණෙ
භමස්සු චිත්තං,
මා ලොහගුළං ගිලී පමත්තො මා කන්දි
දුක්ඛමිදන්ති ඩය්හමානො.

372. නත්ථි ඣානං අපඤ්ඤස්ස පඤ්ඤා නත්ථි අඣායතො,
යම්හි ඣානඤ්ච පඤ්ඤා ච ස වෙ නිබ්බානසන්තිකෙ.

373. සුඤ්ඤාගාරං පවිට්ඨස්ස සන්තචිත්තස්ස භික්ඛුනො,
අමානුසී රතී හොති සම්මා ධම්මං විපස්සතො.

374. යතො යතො සම්මසති ඛන්ධානං උදයබ්බයං,
ලභති පීතිපාමොජ්ජං අමතං තං විජානතං.

375 තත්‍රායමාදී භවති ඉධ පඤ්ඤස්ස භික්ඛුනො,
ඉන්ද්‍රියගුත්ති සන්තුට්ඨී පාතිමොක්ඛෙ ච සංවරො.

876. මිත්තෙ භජස්සු කල්‍යාණෙ සුද්ධාජීවෙ අතන්දිතෙ,
පටිසන්ථාරවුත්‍යස්ස ආචාරකුසලො සියා,
තතො පාමොජ්ජබහුලො දුක්ඛස්සන්තං කරිස්සති. 2468

**8 පඤ්චසතභික්ඛුවත්ථු =**

377. වස්සිකා විය පුප්ඵානි මද්දවානි පමුඤ්චති,
එවං රාගඤ්ච දොසඤ්ච විප්පමුඤ්චෙථ භික්ඛවො. 2479

**9 සන්තකායත්ථෙරවත්ථු =**

378. සන්තකායො සන්තවාචො සන්තවා සුසමාහිතො,
වන්තලොකාමිසො භික්ඛු උපසන්තොති වුච්චති. 2480

**10 නඞ්ගලකුලත්ථෙරවත්ථු =**

379. අත්තනා චොදයත්තානං පටිමාසෙත්ථ මත්තනා,
සො අත්තගුත්තො සතිමා සුඛං භික්ඛු! විහාහිසි.

380. අත්තා හි අත්තනො නාථො අත්තා හි
අත්තනො ගති,
තස්මා සඤ්ඤමයත්තානං අස්සං භද්‍රං ව වාණිජො. 2483

**11 වක්කලිත්ථෙරවත්ථු =**

381. පාමොජ්ජබහුලො භික්ඛු පසන්නො බුද්ධසාසනෙ,
අධිගච්ඡෙ පදං සන්තං සඞ්ඛාරූපසමං සුඛං. 2486

**12 සුමනසාමණෙරවත්ථු =**

382. යො හවෙ දහරො භික්ඛු යුඤ්ජති බුද්ධසාසනෙ,
සො ඉමං ලොකං පභාසෙති අබ්භා
මුත්තොව චන්දිමා. 2500

## බ්‍රාහ්මණවර්ගය 26.

**1 පසාදබහුලබ්‍රාහ්මණවත්ථු =**

383. ඡින්ද සොතං පරක්කම්ම කාමෙ පනුද බ්‍රාහ්මණ!,
සඞ්ඛාරානං ඛයං ඤත්වා අකතඤ්ඤූසි බ්‍රාහ්මණ!. 2501

**2 සම්බහුලභික්ඛුවත්ථු =**

384. යදා ද්වයෙසු ධම්මෙසු පාරගූ හොති බ්‍රාහ්මණො,
අථස්ස සබ්බෙ සංයොගා අත්ථං ගච්ඡන්ති ජානතො. 2506

**3 මාරවත්ථු**

385. යස්ස පාරං අපාරං වා පාරාපාරං න විජ්ජති,
වීතද්දරං විසංයුත්තං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං. 2508

**4 අඤ්ඤතරබ්‍රාහ්මණවත්ථු =**

386. ඣායිං විරජමාසීනං කතකිච්චං අනාසවං,
උත්තමත්ථං අනුප්පත්තං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං. 2510

**5 ආනන්දත්ථෙරවත්ථු =**

387. දිවා තපති ආදිච්චො රත්තිං ආභාති චන්දිමා,
සන්නද්ධො ඛත්තියො තපති ඣායී තපති බ්‍රාහ්මණො
අථ සබ්බමහොරත්තිං බුද්ධො තපති තෙජසා. 2512

**6 අඤ්ඤතරබ්‍රාහ්මණපබ්බජිතවත්ථු =**

388. බාහිතපාපොති බ්‍රාහ්මණො සමචරියා
සමණොති වුච්චති,
පබ්බාජයත්තනො මලං තස්මා
පබ්බජිතොති වුච්චති. 2516

**7 සාරිපුත්තත්ථෙරවත්ථු =**

389. න බ්‍රාහ්මණස්ස පහරෙය්‍ය නාස්ස මුඤ්චෙථ බ්‍රාහ්මණො,
ධී බ්‍රාහ්මණස්ස හන්තාරං තතො ධී යස්ස මුඤ්චති

390. න බ්‍රාහ්මණස්සෙතදකිඤ්චි සෙය්‍යො යදා
නිසෙධො මනසො පියෙහි,
යතො යතො හිංසමනො නිවත්තති තතො
තතො සම්මතිමෙව දුක්ඛං. 2519

**8 මහාපජාපතිගොතමිවත්ථු =**

391. යස්ස කායෙන වාචාය මනසා නත්ථි දුක්කතං,
සංවුතං තීහි ඨානෙහි තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං. 2524

**9 සාරිපුත්තත්ථෙරවත්ථු =**

392. යම්හා ධම්මං විජානෙය්‍ය සම්මාසම්බුද්ධදෙසිතං,
සක්කච්චං තං නමස්සෙය්‍ය අග්ගිහුත්තං ව
බ්‍රාහ්මණො. 2525

**10 ජටිලබ්‍රාහ්මණවත්ථු =**

393. න ජටාහි න ගොත්තෙන න ජච්චා හොති
බ්‍රාහ්මණො,
යම්හි සච්චඤ්ච ධම්මො ච සො සුචී සො ච
බ්‍රාහ්මණො. 2526

**11 කුහකබ්‍රාහ්මණවත්ථු =**

394. කිං තෙ ජටාහි දුම්මෙධ! කිං තෙ අජිනසාටියා,
අබ්භන්තරං තෙ ගහනං බාහිරං පරිමජ්ජසි. 2530

**12 කිසාගොතමීවත්ථු =**

395. පංසුකූලධරං ජන්තුං කිසං ධමනිසන්ථතං,
එකං වනස්මිං ඣායන්තං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං 2531

**13 එකබ්‍රාහ්මණවත්ථු =**

396. න චාහං බ්‍රාහ්මණං බ්‍රෑමි යොනිජං මත්තිසම්භවං,
භොවාදී නාම සො හොති සචෙ හොති සකිඤ්චනො,
අකිඤ්චනං අනාදානං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං 2533

**14 උග්ගසෙනවත්ථු =**

397. සබ්බසංයොජනං ඡෙත්වා යො වෙ න පරිතස්සති,
සඞ්ගාතිගං විසංයුත්තං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං. 2535

**15 බ්‍රාහ්මණවත්ථු =**

398. ඡෙත්වා නද්ධිං වරත්තං ච සන්දාමං සහනුක්කමං,
උක්ඛිත්තපලිඝං බුද්ධං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං. 2537

**16 අක්කොසකභාරද්වාජවත්ථු =**

399. අක්කොසං වධබන්ධං ච අදුට්ඨො යො තිතික්ඛති,
ඛන්තීබලං බලානීකං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං. 2540

**17 සාරිපුත්තත්ථෙරවත්ථු =**

400. අක්කොධනං වතවන්තං සීලවන්තං අනුස්සුතං,
දන්තං අන්තිමසාරීරං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං. 2543

**18 උප්පලවණ්ණත්ථෙරීවත්ථු =**

401. වාරි පොක්ඛරපත්තෙව ආරග්ගෙරිව සාසපො,
යො න ලිප්පති කාමෙසු තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං. 2545

**19 අඤ්ඤතරබ්‍රාහ්මණවත්ථු =**

402. යො දුක්ඛස්ස පජානාති ඉධෙව ඛයමත්තනො,
පන්නභාරං විසංයුත්තං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං. 2547

**20 ඛෙමාභික්ඛුනීවත්ථු =**

403. ගම්භීරපඤ්ඤං මෙධාවිං මග්ගාමග්ගස්ස කොවිදං,
උත්තමත්ථං අනුප්පත්තං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං. 2548

**21 පබ්භාරවාසිතිස්සත්ථෙරවත්ථු =**

404. අසංසට්ඨං ගහට්ඨෙහි අනාගාරෙහි චූභයං,
අනොකසාරිං අප්පිච්ඡං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං. 2552

**22 අඤ්ඤතරභික්ඛුවත්ථු =**

405. නිධාය දණ්ඩං භූතෙසු තසෙසු ථාවරෙසු ච,
යො න හන්ති න ඝාතෙති තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං. 2555

**23 සාමණෙරවත්ථු =**

406. අවිරුද්ධං විරුද්ධෙසු අත්තදණ්ඩෙසු නිබ්බුතං,
සාදානෙසු අනාදානං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං. 2559

**24 මහාපන්ථකත්ථෙරවත්ථු =**

407. යස්ස රාගො ච දොසො ච මානො
මක්ඛො ච පාතිතො,
සාසපොරිව ආරග්ගා තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං. 2561

**25 පිලින්දිවච්ඡත්ථෙරවත්ථු =**

408. අකක්කසං විඤ්ඤාපනිං ගිරං සච්චං උදීරයෙ,
යාය නාභිසජෙ කඤ්චි තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං. 2563

**26 අඤ්ඤතරත්ථෙරවත්ථු =**

409. යොධ දීඝං ව රස්සං වා අණුං ථූලං සුභාසුභං,
ලොකෙ අදින්නං නාදියති තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං. 2565

**27 සාරිපුත්තත්ථෙරවත්ථු =**

410. ආසා යස්ස න විජ්ජන්ති අස්මිං ලොකෙ පරම්හි ච,
නිරාසයං විසංයුත්තං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං. 2567

**28 මහාමොග්ගල්ලානත්ථෙරවත්ථු =**

411. යස්සාලයා න විජ්ජන්ති අඤ්ඤාය අකථංකථී,
අමතොගධං අනුප්පත්තං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං. 2569

**29 රෙවතත්ථෙරවත්ථු =**

412. යොධ පුඤ්ඤඤ්ච පාපඤ්ච උභො සඞ්ගං උපච්චගා,
අසොකං විරජං සුද්ධං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං. 2571

**30 චන්දාභත්ථෙරවත්ථු =**

413. චන්දංව විමලං සුද්ධං විප්පසන්නමනාවිලං,
නන්දීභවපරික්ඛීණං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං. 2576

**31 සිවලිථෙරවත්ථු =**

414. යො ඉමං පළිපථං දුග්ගං සංසාරං මොහමච්චගා,
තිණ්ණො පාරගතො ඣායී අනෙජො අකථංකථී,
අනුපාදය නිබ්බුතො තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං. 2578

**32 සුන්දරසමුද්දථෙරවත්ථු =**

415. යොධ කාමෙ පහත්වාන අනාගාරො පරිබ්බජෙ,
කාමභවපරික්ඛීණං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං. 2583

**33 ජොතියථෙරවත්ථු =**

416. යොධ තණ්හං පහත්වාන අනාගාරො පරිබ්බජෙ,
තණ්හාභවපරික්ඛීණං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං. 2604,2606

**34 නටපුත්තකවත්ථු =**

417. හිත්වා මානුසකං යොගං දිබ්බං යොගං උපච්චගා,
සබ්බයොගවිසංයුත්තං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං. 2607

**35 නටපුත්තකවත්ථු =**

418. හිත්වා රතිං ච අරතිං ච සීතිභූතං නිරූපධිං,
සබ්බලොකාභිභුං වීරං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං. 2609

**36 වඞ්ගීසථෙරවත්ථු =**

419. චුතිං යො වෙදී සත්තානං උපපත්තිඤ්ච සබ්බසො,
අසත්තං සුගතං බුද්ධං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං.

420. යස්ස ගතිං න ජානන්ති දෙවා ගන්ධබ්බමානුසා,
ඛීණාසවං අරහන්තං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං. 2613

**37 ධම්මදින්නථෙරවත්ථු =**

421. යස්ස පුරෙ ච පච්ඡා ච මජ්ඣෙ ච නත්ථි කිඤ්චනං.
අකිඤ්චනං අනාදානං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං. 2617

**38 අඞ්ගුලිමාලථෙරවත්ථු =**

422. උසභං පවරං වීරං මහෙසිං විජිතාවිනං,
අනෙජං න්හාතකං බුද්ධං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං. 2619

**39 දෙවඩ්ඪිකබ්‍රාහ්මණවත්ථු =**

423. පුබ්බෙනිවාසං යො වෙදී සග්ගාපායඤ්ච පස්සති,
අථො ජාතික්ඛයං පත්තො අභිඤ්ඤාවොසිතො මුනි,
සබ්බවොසිතවොසානං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං. 2621

**ස්වස්ති.**

# පරිශිෂ්ට:—

අකතඤ්ඤූ 1090, 2505
අකතාති 662
අකථඞ්කථී 2570
අකනිට්ඨයෝ 321
අකරණං 1698
අකාලිකො 2278
අකිච්චං 2244, 2252
අකිඤ්චනො 947, 1974, 2534
අකිරියදිට්ඨි 108
අකුතො භයෙ 1886
අකුශල කර්ම 806
අක්කොච්ඡි 44
අක්කොධ 1988
අක්කොධන 2543
අක්ඛරානං සන්නිපාතං 2421
අග්ගි 408, 1300, 1903, 2050
අගාරං 160, 1300
අගාරියබහුස්සුත 1926
අඞ්ගණ 2013
අච්චගා 2579
අච්චන්තදුස්සීල්‍යං 1482,
අච්ඡිද්දවුත්ති 2004
අජ්ජතනං 2002
අජ්ඣත්තකාම 374
අජ්ඣත්තබහිද්ධාකාම 374
අජ්ඣත්තරත 2451
අජ්ඣත්තසමුට්ඨානාභිරි 2032
අජ්ඣත්තසංයොජන 407
අජ්ඣත්තිකබාහිර 608
අඤ්ජලිකරණීයො 2282
අඤ්ඤාය 2138
අඤ්ඤාරාධනා 1536
අට්ඨගරුධම්මපටිග්ගහණ
උපසම්පදා 1589
අට්ඨඞ්ගිකං 1819
අට්ඨමී 1596
අට්ඨවාචිකඋපසම්පදා 1589
අට්ඨික 89, 2403
අට්ඨිකඅසුභභාවනා 2403
අට්ඨීනි 1414
අට්ඨීනං 1419
අණුං 406, 2565
අණුමත්ත 2217
අණ්ඩජයොනි 754
අතන්දිත 2300, 2460
අතප්පා 321
අත්තකාමපාරිචරියා 1484
අත්තගුත්ත 2483
අත්තසඤ්ඤාය 1491
අත්තදණ්ඩ 2560
අත්තදත්ථං 1495
අත්තනං 2435
අත්තදන්තස්ස 1145
අත්තමන 2557
අත්තවාද 246
අත්තසන්නිය්‍යාතනං 1863
අත්තහෙතු 941
අත්තා 1145, 1458, 1470
අත්තාධිපතෙය්‍යාභිරි 2032
අත්තානං 925, 1454
අත්තානුයොගිනං 19[illegible]5
අතිත්ත 647
අතිධොනචාරිනං 2021
අතිවාක්‍ය 2332
අතීතකාම 374
අතීතස්ස 1558
අතීතානාගත පච්චුප්පන්න 607
අතුල 2002
අත්තුප්පක්කම්මූලකදුක්ඛය 1736
අත්ථ 937
අත්ථා 1934, 1998, 2253
අත්ථපටිසම්භිදා 2416

අත්ථපදං 1126
අත්ථිකම්ම අත්ථිකම්ම විපාකො 811
අත්ථිකම්ම නත්ථිකම්ම විපාකො 811
අත්ථිකම්ම භවිස්සතිකම්ම විපාකො 811
අදස්සනං 623
අදින්න 2566
අදුක්ඛමසුඛ 17
අදොස 19, 572
අධම්මෙන 942
අද්ධගු 2287
අද්ධානපරිච්ඡෙද 603
අධිචිත්ත 1710
අධිට්ඨාන 1014
අධිට්ඨාන ඉද්ධි 1531
අධිපන්න 2230
අධිමුත්තානං 1998
අධිමොක්ඛ 19,577
අධිසෙස්සති 502
අධීත්‍යසමුත්පන්නික 113
අනක්ඛාතෙ 1956
අනඞ්ගණ 1247,2415
අනත්ථං 2076
අනත්ථපදසංහිතා 1125
අනන්තගොචරං 1660
අනන්වාහතචෙතසො 487
අනපායිනී 37
අනලීනෙන 2037
අනවට්ඨිත චිත්තස්ස 480
අනවස්සුත චිත්තස්ස 486
අන්තරා පරිනිබ්බායී 319
අන්තලික්ඛෙ 1257
අන්ධකාරෙන 1398
අන්ධභූතෙ 731
අන්ධභූතො 1524
අනාගත කාම 374
අනාගාමිමග්ගචිත්තං 128,452
අනාගාර 2553,2584
අනාත්ම ලක්ෂණ 2168
අනාදාන 2415,2560
අනාසවා 1252,2511
අනික්කසාවො 100
අනිච්චා 2141
අනිත්‍ය ලක්ෂණ 2168
අනිඤ්ජිතො 2003
අනිබ්බිසං 1436
අනිමිත්ත 236,1814
අනිමිත්තවිමොක්ඛ 1018
අනිවෙසනො 498
අනිස්සිතො 1026
අනීඝො 2256
අනුක්කම 2538
අනුචර 2255
අනුට්ඨහානො 2201
අනුට්ඨානමලා 2025
අනුතපති 2321
අනුත්තර 342,2268
අනුධම්මචාරී 237
අනුපද්දව 2377
අනුපාදාය 998
අනුපාදාය නිබ්බුතා 2580
අනුපාදින්න 550
අනුපාදියානො 246
අනුපාදිසෙසනිබ්බාන 236, 1811
අනුපුබ්බං 2017
අනුපුබ්බසික්ඛා 1636
අනුමොදනා 1639
අනුයුඤ්ජති 371
අනුලොමඤාණ 1381
අනුසාසෙය්‍ය 893
අනුස්සුතා 1897
අනූපඝාතො 1709
අනූපවාදො 1709
අනෙකජාති සංසාරං 1436

අනෙජ 2579
අනොකං 947
අනොකසාරී 2553
අනත්තකො 649
අනන්තානන්තික දිට්ඨි 110
අන්තිමසාරීර 2544
අත්ථං 1569
අධෙති 26
අපගබ්භන 2037
අපචායන 188
අපඤ්ඤස්ස 2474
අපදං 1659
අප්ප – අප්පක 943
අප්පටිවිජ්ඣනාදුක්ඛ 1733
අප්පටිබද්ධචිත්ත 1956
අප්පණාසමාධි 1179, 1360
අප්පණිහිත 236, 1814
අප්පදුට්ඨස්ස 1246
අපබොධති 1324
අප්පමත්තා 311, 355, 706
අප්පමාදෙ 302, 313
අප්පමාදවිහාරිනං 721
අපරචෙතනා 1608
අපරාපරිය වෙදනීයකම්ම 805
අපරිග්ගහිතකාම 375
අපලොකිත 1793
අපවිද්ධ 2244
අප්පලාභ 2460
අප්පසද්ද 1235
අප්පස්සාද 1715
අප්පස්සුතා 1434
අපායපටිසන්ධි 761
අපාර 2508
අපි 233, 654, 1128
අපිච්ඡකථා 777
අප්පියසම්පයොගො 1747
අපෙතවිඤ්ඤාණො 502
අපෙතො 125
අබලා 666
අබ්භක්ඛානං 1298
අබ්භා 1512
අබ්‍යාපජ්ඣං 1793
අභය 2079
අභයදස්සිනො 2327
අභාවිතං 160
අභි 355, 1211
අභිඤ්ඤාවොසිත 2625
අභිඤ්ඤාය 878
අභිජ්ඣාකායගන්ථො 1003
අභිත්ථරෙථ 1211
අභිධම්මපිටකං 225
අභිවස්සති 355
අභිවාදනා 1158
අභිසජෙ 2564
අභිසම්බුධානො 622
අභූතවාදී 2305
අබ්භුතධම්ම 231
අබ්භොකාසිකාඞ්ග 1070
අමත්තඤ්ඤූ 81
අමත්තඤ්ඤුතා 82
අමතවට්ඨ 1814
අමතපදං 309, 1200
අමතොගධං 2569
අමරාවික්ඛෙපිකා දෘෂ්ටි 112
අමානුසී 2475
අමුත්‍රාසිං 2624
අමෘත 2476
අමොහ 19, 572, 1828
අයසා 2021
අයොගෙ 1932
අරඤ්ඤ 1102, 1113
අරති 2298, 2609
අරහං 2262
අරහත්තමග්ගචිත්තං 128, 452
අරහන්තා 1103
අරිය 1729

අරියප්පවෙදිතෙ 911
අරියභූමි 2013
අරියවංසපටිපදා 1465
අරියසච්චානි 1727
අරියසඞ්ඝො 1583
අරියා ඉද්ධි 1546
අරියානං 315, 1920
අරූකායං 1404
අරූපරාග 1115
අරූපාවචර කුශලකර්ම 806
අරූපාවචර පටිසන්ධිය 761
අරූපාවචර සමාධි 1366
අලගද්දූපරියත්ති 227, 793
අලජ්ජිතායෙ 2325
අලජ්ජී 1335
අලසො 2202
අලිකං 2122
අලොභ 19, 571
අලංසාටක 93
අවජ්ජ 2329
අවත්ථුක 36
අවිරුද්ධ 2559
අවිජානතං 745
අවිජ්ජා 2029
අවිජ්ජාසව 1023
අවිජ්ජොස 368
අවිතිණ්ණකඞ්ඛං 1311
අවිද්දසු 2128
අවිහා 321
අවිහිංසාසඞ්කප්ප 1839
අවීතික්කමොසීලං 706
අවෙක්ඛති 386
අවෙක්ඛන්තං 1506
අවෙක්ඛෙය්‍ය 662
අවෙරිනො 1896
අවෙරෙන 54
අව්‍යාපාද සඞ්කප්ප 1838
අසඞ්ඛත 1793
අසඞ්ඛතට්ඨ 1814
අසඞ්ඛාරපරිනිබ්බායී 319
අසඞ්ඛාරිකං 436
අසජ්ඣායමලා 2025
අසඤ්ඤත 2308, 2312
අසඤ්ඤසත්තපටිසන්ධිය 761
අසංඥිදෘෂ්ටිය 115
අසතං 852
අසන්ත 2295
අසන්තාසී 2414
අසබ්භා 894
අසම්ප්‍රජානකර්ම 812
අසප්පුරිසදාන 1615
අසමාන සංවාසො 2287
අසමාහිතො 1179
අසරීරං 475
අස්සතර 2334
අස්සද්ධො 1088, 1090
අස්සාදෙ 1692
අසාධු 1487, 1988
අසාරො 152
අස්සාස 2130
අසාහසෙන 2076
අසුභ 2402
අසුභානුපස්සිං 88
අස්සුමුඛො 820
අසොකො 384
අසම්මයං 1479
අසංසග්ගකථා 780
අසංසට්ඨ 2552
අහිතානි 1487
අහිරික 21, 123, 582
අහිරිකෙන 2031
අහිංසකා 1994
අහිංසා 2086, 2130, 2283
අහෙතුඅප්පච්චයවාදය 119
අහෙතුකදිට්ඨි 107
අහොරත්තං 1998

අහොසිකර්ම 806
අහොසිකම්ම අහොසිකම්ම විපාක 811
අහොසිකම්ම අත්ථිකම්ම විපාක 811
අහොසිකම්ම න භවිස්සති කම්මවිපාක 811
අහොසිකම්ම නාහොසි කම්මවිපාක 811
අහොසිකම්ම භවිස්සති කම්මවිපාක 811
ආකාසෙ 1019
ආකිඤ්චඤ්ඤායතන 449
ආගන්තුක 1611
ආචාර 2478
ආචාරකුසල 2478
ආචාරවිපත්ති 2317
ආචීර්ණකර්ම 803
ආජානීය 2334
ආජීවපාරිසුද්ධිසීල 1341, 1349
ආජීවවිපත්ති 2318
ආඥාදෙසනා 223
ආතප්ප 2138
ආතාපිනො 1325
ආතුර 1405, 1897
ආදානපටිනිස්සග්ගෙ 998
ආදිච්ච 2512
ආදිච්චපථ 1530
ආදීනව 1693
ආදීනවානුපස්සනාඥාණ 1378
ආනන්ද 1397
ආපායිකකාම 375
ආපොධාතු 527
ආබාධ 1296
ආභස්සරා 1900
ආයු 1165, 1284
ආයූහනට්ඨ 1755
ආරග්ග 2546
ආරඤ්ඤකඞ්ගං 1065
ආරද්ධවිරිය 93
ආරබ්ධ විදර්ශක 2186
ආරම්මණං 76
ආරාමරුක්ඛචෙත්‍යානි 1723
ආරුප්‍ය 382
ආරොග්‍ය 1912
ආලම්බනං 76
ආලම්බනොපනිධ්‍යාන 326
ආලය 2569
ආලසිය 2202
ආවසථ 1570
ආවාසෙසු 853
ආසවා 1022, 2062, 2253
ආසවක්ඛයඥාණ 1373
ආසන්නකර්ම 803
ආසා 2567
ආසීන 2510
ආහාරෙ 1026
ආහාරහත්ථක 93
ආහුනෙය්‍යො 2281
ඉච්ඡා 2123, 2439
ඉච්ඡාවිඝාතදුක්ඛ 1750
ඉණපරිභොග 1352
ඉතර 1978
ඉතරවත්ථුදුක්ඛ 26, 36
ඉතිවුත්තක 231
ඉත්ථි 2028
ඉත්ථින්ද්‍රියං 536
ඉදංසච්චාභිනිවෙසකායගන්ථො 1010
ඉධතපති 202
ඉධමොදති 186
ඉධසොචති 168
ඉද්ධි 1530
ඉද්ධිපාද 1550
ඉද්ධිවිධඥාණ 1382
ඉන්ද්‍රඛීලූපමො 1045

ඉන්ද්‍රියානි 1030
ඉන්ද්‍රියගුත්ති 2477
ඉන්ද්‍රියසංවරසීලං 239
ඉන්ද්‍රියසංවරසංවුතං 1341
ඉන්ද්‍රියෙසු අසංවුතං 78
ඉන්ද්‍රියෙසු සුසංවුතං 89
ඉස්සරනිම්මාණහෙතුවාදය 119
ඉස්සරියං 853, 854
ඉස්සා 21, 587
ඉසි 2208
උක්කුටිකප්පධානං 1308
උක්ඛිත්තපළිඝ 2538
උග්ගහකොසල්ල 1407
උග්ගහනිමිත්ත 1408
උග්ඝටිතඤ්ඤූ 1694
උච්චාවචං 939
උච්ඡින්ද 2221
උච්ඡෙදදෘෂ්ටිය 108
උජුකභාවො 576
උජුපටිපන්නො 2280
උජ්ජුගත 1160
උජ්ජුගතෙසු 1158
උජුංකරොති 456
උට්ඨානකාල 2200
උට්ඨානවතො 349
උත්තමං 1867
උත්තමත්ථ 2511
උත්තමපොරිසො 1093
උත්තිට්ඨෙ 1502
උත්ථානගාමිනීවිදර්ශනා 161
උදකං 924
උදකුම්භො 1227
උදබින්දුනිපාතෙන 1227
උදයබ්බයානුපස්සනාඤාණ 1374, 2188
උදයව්‍යයං 1195
උදාන 231
උදීරයෙ 2564
උද්ධච්චං 21, 123, 584
උද්ධච්චකුක්කුච්ච 950
උද්ධම්භාගිය 407
උද්ධංසොතො අකනිට්ඨගාමි 319
උද්ධුමාතක 88
උද්ධුමාතක අසුභභාවනා 2402
උන්නලානං 2244
උප 1127
උපඝාතක 802
උපච්චගා 2571
උපචාරසමාධි 1179, 1359
උත්ථම්භක කර්ම 802
උපධිවිපත්තිපතිබාළ්හ 809
උපධිසම්පත්ති 810
උපධිසම්පත්තිපතිබාළ්හ 808
උපනය්හති 45
උපනිස්සයගොචර 1284
උපපජ්ජවෙදනීයකර්ම 805
උපපත්තිදෙවා 403
උප්පාදෙ 1695, 1696, 1872
උපාදාන 2580
උපාදින්නස්කන්ධ 2072
උපායාස 1746
උපපීළක කර්ම 802
උපස්සග්ග 1298
උපසන්ත 1086, 1901, 2481
උපසම්පදා 1698
උපසම්පන්න 2447
උපසම්මති 1127
උපලක්ඛණ 1828
උපෙක්ඛා 17, 2103
උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො 968
උපෙක්ඛාසහගතසමාධි 1361
උපෙතො 129, 2202
උභ 2077
උභයත්ථසොචති 182
උය්‍යුඤ්ජන්ති 1014
උසභ 2619

උසුකාරා 924
උස්සුකෙසු 1897
එක 1152
එකග්ගතා 19, 445
එකඝනො 926
එකචරං 479
එකත්තකායඑකත්තසඤ්ඤිනො 756
එකත්‍යශාස්වත දෘෂ්ටිය 108
එකම්පි ජාතිං 2624
එකරජ්ජෙන 1643
එකසෙය්‍යා 2297
එකාදසමී 1597
එකාසනං 2297
එකාසනිකඞ්ගං 1060
එකුප්පාදෙකනිරොධ 606
එකුප්පාදනානානිරොධ 604
එකො 2358
එතං 313, 2002
එතෙහි 2335
එවං 163, 656
එවංගොත්තො 2624
එවංනාමො 2624
එසධම්මො 55
එසානො 1272
එහිභික්ඛුඋපසම්පදා 1589
එහිපස්සිකො 2278
ඔකං 947
ඔසතිණ්ණා 2473
ඔඝො 367
ඔත්තප්පං 19, 571, 2033
ඔත්ථතං 1486
ඔපපාතිකා 755
ඔරම්භාගිය 407
ඔළාරික 550
ඔළාරිකසුඛුම 608
ඔවදෙය්‍ය 893
ඔවාදපටිග්ගහණඋපසම්පදා 1589
කඞ්ඛාවිතරණ විසුද්ධි 2159
කටත්තාකම්ම 803
කටුකප්පභෙදන 2342
කටුකප්ඵලං 817
කණ්හං 946
කතකිච්ච 2511
කතපුඤ්ඤො 187
කතාකතං 662
කදරියා 1566, 1567
කප්පති අදසකං 1591
කප්පති අනුමතිකප්පො 1591
කප්පති අමථිතකප්පො 1591
කප්පති ආචිණ්ණකප්පො 1591
කප්පති ආවාසකප්පො 1591
කප්පති ගාමන්තරකප්පො 1590
කප්පති ජලොගිපාතුං 1591
කප්පති ජාතරූපරජතං 1591
කප්පති ද්වඞ්ගුලකප්පො 1591
කප්පති සිඞ්ගිලොණකප්පො 1590
කබල 2342
කම්මං 800, 801, 826, 1085
කම්මස්සකතා 574
කම්මපථ 2208
කම්මවිපාකජා 1547
කම්මස්සකතසම්මාදිට්ඨි 1824
කමටහන් 327
කම්මාරො 2017
කරුණා 20, 578, 2098
කලං 839
කලණමිතුරු 327
කලි 1905, 2061
කලිඞ්ගරං 503
කල්‍යාණං 900, 1211
කහාපණවසෙන 1714, 1715
කාකමාසක 93
කාකසූරෙන 2034
කාපොතක 1414
කාම 647, 1948, 2502, 2584

කාමකාම 936
කාමගවෙසිනො 1116
කාමගුණ 2473
කාමච්ඡන්ද 948
කාමතණ්හා 1757
කාමභවපරික්ඛීණ 2584
කාමරතිසන්ථවං 373
කාමසුගතිපටිසන්ධිය 761
කාමරාග 1113
කාමාවචර කුශලකර්ම 806
කාමාවචර සමාධි 1366
කාමාසව 1022
කාමොඝ 368
කාය 80, 428, 492, 621, 2062
කායකම්මඤ්ඤතා 20
කායකර්ම 169
කායගතාසති 2244
කායදශක 599
කායුජ්ජුකතා 20
කායදුච්චරිතවිරති 580
කායප්පකොප 2006
කායපස්සද්ධි 20
කායපාගබ්භිය 2036
කායපාගුඤ්ඤතා 20
කායප්‍රසාදය 533
කායමුදුතා 20
කායවත්ථුක 36
කායවත්ථුක දුක්ඛ 26
කායවිඤ්ඤාණං 438
කායසුචරිතය 2007
කායසංසග්ග 1483
කායෙනසංවරොසාධු 2443
කාලඤ්ඤාති 1611
කාලවිපත්ති 809
කාලවිපත්තිපතිබාළ්හ 810
කාලසම්පත්ති 810
කාලසම්පත්තිපතිබාළ්හ 808
කාසාවං 124
කාසාවකණ්ඨ 2307
කිච්චං 2243, 2244, 2252
කිච්චාකිච්ච 858
කිච්ඡා 1688
කිඤ්චනං 1899, 1974
කිතවා 2061
කිලෙසකාම 376
කිසං 2532
කිං 1397
කුක්කුච්චං 21, 587
කුඤ්ජර 2341
කුටිකාර 1484
කුඩාපළිබොධ 328
කුමුද 2222
කුම්මො 492
කුලං 1870
කුස 2316
කුසග්ගෙන 837
කුසලා 591
කුසලානි 438, 696, 1519
කුසීත 82, 1187
කෙවලශාශ්වත දෘෂ්ටිය 108
කො 522, 1867
ක්‍රෝධ (කොධ) 1965, 1972
කොලංකොලො 317
කොසජ්ජං 2025
කොසල්ල 1828
කංසො 128
ඛණ 2017
ඛන්තියො 2255
ඛන්ති 92, 1699
ඛන්ධ 598, 1905
ඛයං 1441
ඛලුපච්ඡාභත්තිකඞ්ග 1064
ඛිත්තො 457
ඛෙත්තං 2437
ඛෙම 1793, 1867
ඛෙමී 2079

ගතද්ධිනො 1002
ගති 1019, 2614
ගතිවිපත්ති 809
ගතිවිපත්තිපතිබාළ්හ 809
ගතිසම්පත්ති 810
ගතිසම්පත්තිපතිබාළ්හ 808
ගන්ධො 76, 535, 701, 706, 1570
ගන්ධබ්බො 1147
ගබ්භං 1251
ගබ්භාක්කන්තික මූලකදුක්ඛ 1735
ගබ්භපරිහරණමූලකදුක්ඛය 1735
ගබ්භවිජායනමූලකදුක්ඛය 1735
ගබ්භවිපත්තිමූලකදුක්ඛය 1736
ගමික 1611
ගම්භීර 932
ගම්භීරපඤ්ඤ 2549
ගරහිතො 404
ගරුකකම්ම 803
ගහකාරක 1437
ගහකූට 1441
ගහට්ඨ 2553
ගාථා 231, 1132
ගාම 642, 656, 1098
ගාවො 1283
ගිම්හ 2225
ගිලාන 1611
ගිහි 856
ගුණාතිරෙකසම්පදා 1598
ගුහාසයං 476
ගෙය්‍ය 231
ගොචරො 325, 1019, 1283
ගොතමසාවකා 2260
ගොත්ත 2526
ගොපාලො 1282
ගොපෙථ 2323
ඝරා 2025
ඝාණං 427
ඝාණෙන සංවරො සාධු 2442
ච 372, 1085
චක්ඛුනා සංවරො සාධු 2442
චක්ඛුප්පසාද 531
චක්ඛුමා 2136
චක්ඛුවිඤ්ඤාණං 426, 593
චත්ත 27
චත්තාරි 1727
චතුත්ථජ්ඣානසමාධි 1365
චතුත්ථී 1596
චතුත්ථීසඞ්ඝගතාදක්ඛිණා 1592
චතුප්පද 2136
චතුසච්චබුද්ධ 1655
චන්දනං 700
චන්දිමන්තු 1513
චන්දිමා 1929
චපලං 415
චරණං 1383
චරන්ති 800
චරිත 328
චාගො 1781
චාතුම්මහාරාජිකා 215
චිත්ත 415
චිත්තකෙලසෙහි 948
චිත්තකම්මඤ්ඤතා 20
චිත්තකොප්පං 1297
චිත්තුජ්ජුකතා 20
චිත්තපස්සද්ධි 20
චිත්තපාගුඤ්ඤතා 20
චිත්තමුදුතා 20
චිත්තලහුතා 20
චිත්තවිසුද්ධිය 2142
චිත්තසමාධි 1366
චින්තා 1828
චිරප්පවාසී 1960
චුති 1422, 2613
චුතූපපාතඤාණ 1373

චුද්දසම් 1597
චුල්ලසීල 776
චුල්ලසොතාපන්න 2166
චෙ 25, 1125
චෙතනා 18, 564
චෙතනාසම්පද 1598
චෙතනාසීලං 706
චෙතසිකං 23
චෙතසිකං සීලං 706
චොරකන්තාර 1002
ඡට්ඨී 1596
ඡට්ඨීසඞ්ඝගතාදක්ඛිණා 1592
ඡත්තිංසතිසොතා 2378
ඡන්ද 576, 1216
ඡන්දජාතො 1952
ඡායා 37
ජගතිප්පදෙසො 1262
ජටා 1307, 2526
ජනකකම්ම 101
ජන්තු 1149, 1559
ජම්බොනදස්ස 2005
ජම්මි 2372
ජරා 1420, 1737
ජලාබුජා 755
ජාගරතො 487, 744
ජාතක 231
ජාතෙන 695
ජාතිං 1296
ජාල 2051
ජාලමුත්තො 1527
ජිගච්ඡා 1907
ජිණ්ණකොඤ්චා 1450
ජිව්හා 80
ජිව්හාවිඤ්ඤාණං 427
ජීවිතින්ද්‍රියං 19, 568
ජුතිමන්තො 999
ඣානපසුත 1681
ඣානසම්මාදිට්ඨි 1826
ඣායන්තං 2532
ඣායිනො 325, 1179
ඤාණසංවරය 92
ඤාණදස්සන විසුද්ධි 2195
ඤාණවිප්ඵාරා ඉද්ධි 1543
ඤාතකා 517
ඤාතපරිඤ්ඤා 1017
ඤායපටිපන්නො 2281
ඤත්තිචතුත්ථකම්මඋපසම්පද 1589
ඨිති 1405
තචජකා 924
තෘෂ්ණා 1451, 2604
තණ්හක්ඛය 2604, 2430
තණ්හක්ඛය විමුත්ත 2425
තණ්හානුසය 2377
තණ්හාභව පරික්ඛීණ 2604
තතියා 1596
තතියා සඞ්ඝගතා දක්ඛිණා 1592
තත්‍රමජ්ඣත්තතා 20, 578
තත්‍රතත්‍රාභිනන්දිනී 1754
තත්‍රාපාසිං 2625
තථාගතා 2064
තදඞ්ගවිමුත්ති 245
තනුකො 1526
තන්දි 2298
තප්පරායණතා 1863
තපො 1704
තාදිනා 1031
තසිනා 2380
තසෙසු 2555
තාදිස 1928
තාවතා 2081
තාවතිංසා 215
තිණ 2437
තිණදෙස 2437
තිණ්ණ 2579
තිතික්ඛා 1199
තිත්ති 1715

තිබ්බරාග 2401
තිරච්ඡීන 206
ත්‍රිවිද්‍ය 781
තීරං 944
තීරණපරිඤ්ඤා 1017
තූලං 2128
තුසිතා 216
තෙචීවරිකඞ්ගං 1052
තෙජනං 456
තෙරසමී 1497
තෙරසධුතගුණා 781
තොසං 46
ථණ්ඩිලසායිකා 1308
ථලෙ 457, 1102
ථාවරෙසු 2555
ථීනං 21, 122, 585
ථීනමිද්ධ 950
ථූලං 407, 2565
ථෙර 2080
දක්ෂිණා විචිනන 1610
දක්ෂිණාගී විචිනන 1610
දක්ඛිණෙය්‍යා 2282
දක්ඛිණෙය්‍යසඞ්ඝ 1583
දණ්ඩ 2555
දණ්ඩකම්මනාසනා 1177
දණ්ඩස්ස 1267
දඩ්ඪං 1213
දන්තං 468, 1316, 2333, 2544
දබ්බි 795
දම 2111
දමයන්ති 924
දමසවෙවන 125, 129
දළ්හං 1187
දළ්හපරක්කමා 341
දසපළිබොධ 327
දසමී 1597
දස්සන 1921
දහරා 2500
දානං 187, 1569
දායජ්ජපරිභොගය 1352
දාරුං 924
ද්වාදසමී 1597
දිට්ඨධම්මවෙදනීය කම් 804
දිට්ඨාසව 1023
දිට්ඨි 21. 106
දිට්ඨිවිනිවෙඨන කථා 224
දිට්ඨිවිපත්ති 2317
දිට්ඨිවිසුද්ධි 2142
දිට්ඨුජ්ජුකම්ම 188
දිට්ඨොඝ 368
දිපද 2136
දිබ්බකාම 375
දිබ්බසොතඤාණ 1383
දිවා 2044
දිසො 508
දීඝා 744, 2565
දීපං 366, 2012
දුක්කතං 2320, 2524
දුක්ඛ 17, 428, 1437, 1739, 1745, 2547
දුක්ඛදුක්ඛ 1733
දුක්ඛස්සච අතික්කමං 1779
දුඃඛලක්ෂණ 2168
දුක්ඛසමුප්පාදං 1752
දුක්ඛාපටිපදා ඛිප්පාභිඤ්ඤා 316
දුක්ඛාපටිපදා දන්ධාභිඤ්ඤා 316
දුක්ඛෙඤාණ 1827
දුක්ඛනිරොධ 1781
දුක්ඛනිරොධෙඤාණ 1829
දුක්ඛනිරොධගාමිනී-පටිපදායඤාණ 1830
දුක්ඛසමුදයෙඤාණ 1829
දුබ්බෙන 937
දුග්ග 2353
දුග්ගතිං 202
දුච්චරිතං 1504, 2028

දුච්ඡන්නං 160
දුට්ඨදොස 1484
දුට්ඨුල්ලවාචා 1483
දුතියජ්ඣානසමාධි 1365
දුතියදුට්ඨදොස 1484
දුතියසඞ්ඝභෙද 1485
දුතියා 1596
දුතියාසඞ්ඝගතාදක්ඛිණා 1592
දුද්දිට්ඨි 2379
දුන්නිග්ගහස්ස 466
දුන්නිවාරයං 456, 2342
දුප්පඤ්ඤ 1183
දුප්පබ්බජ්ජං 2286
දුප්පරාමට්ඨ 2317
දුම්මෙධ 800, 2434, 2530
දුම්මෙධිනො 371
දුරභිරමං 2286
දුරාවාසා 2286
දුස්සීල 1175
දූතෙන උපසම්පදා 1589
දූරක්ඛං 455
දූරඞ්ගමං 475
දූරසන්තිකා 609
දෙවානං 403
දෙවො 1146
දෙශක 1866
දෙශනාස්ථාන 1866
දොමනස්ස 1746
දොස 21, 102, 586, 2438
දොසක්ඛය 1787
දෘෂ්ටධර්මනිර්වාණ වාදය 119
ධමනිසන්ථතං 2532
ධම්ම 16, 34, 77, 235, 791, 945
946, 1430, 1498, 1503, 1558
2527
ධම්මගතාසති 2273
ධම්මචාරී 1503
ධම්මජීවිනො 353
ධම්මට්ඨො 2076
ධම්මදානං 2428
ධම්මදෙසනා 188
ධම්මධරො 2081
ධම්මපටිසම්භිදා 2417
ධම්මපදං 616
ධම්මපීති 911
ධම්මරති 2430
ධම්මරසො 2430
ධම්මවිචයසම්බොජ්ඣඞ්ගො 961
ධම්මවිනිච්ඡයෙන 1370
ධම්මානුවත්තිනො 945
ධම්මාරාමො 2456
ධම්මිකො 942
ධීරා 341, 386, 2357
ධුත 1077
ධුතඞ්ග 1077
ධුතධම්ම 1077
ධුතවාද 1077
ධොරය්හසීලං 1927
නඋපලිත්තා 2425
නක්ඛත්තපථං 1929
නගරං 1419
නගරූපමං 497
නග්ගචරියා 1306
නත්ථිකදිට්ඨි 2537
නන්දි 2537
නන්දිභවපරික්ඛීණ 2576
නරක 202
නර 641, 1092
නවමී 1597
නහාතක 2620
නාග 2332
නාථ 1475
නානත්තකාය එකත්ත
සඤ්ඤී 756
නානත්තකාය නානත්ත
සඤ්ඤී 755

නානාසකා 1307
නානුප්පාදඵකනිරොධ 605
නානුප්පාදනානානිරොධ 606
නාමරූපපරිච්ඡෙදකථා 226
නාවා 2471
නිකෙතෙ 1115
නිග්ගය්හවාදී 890
නිත්ථරණපරියත්ති 227, 793
නිද්දරො 1918
නිදාන 1755
නිද්දායිතා 2345
නිධිනං 887
නිද්ධන්තමලො 2013
නින්දා 1324
නින්දන්ති 2003
නින්දාපසංසාසු 927
නිතෙත 1102
නිපක 2355
නිප්පරියායදුක්ඛ 1733
නිප්පීතිකසමාධි 1361
නිබ්බඝථ 2384
නිබ්බානං 342, 411, 1783
නිබ්බානගමනං 2230
නිබ්බානගාමිනී 877
නිබ්බිදානුපස්සනාඤාණ 1378, 2188
නිබ්බුතෙ 1886, 2560
නිබ්බෙධභාගිය 1366
නියතො 1318
නිරත්ථං 503
නිරාසය 2568
නිරුත්තිපටිසම්භිදා 2417
නිරුත්තිපදකොවිද 2415
නිරුදකකන්තාර 1002
නිරුපධි 2610
නිවාපපුට්ඨ 2345
නිවාරයෙ 1212
නිෂ්ඨා 2414
නිසම්මකාරිනො 353
නිස්සරණට්ඨ 1814
නිස්සරණපරියත්ති 227
නිහීනකම්මී 2305
නෙක්ඛං 2005
නෙක්ඛම්ම 1681
නෙය්‍යා 1695
නෙවසඤ්ඤානාසඤ්ඤායතනං 449
නෛෂ්ක්‍රම්‍යසඞ්කල්ප 1837
නො 1045
පක්ඛන්දිනා 2035
පඞ්කා 1307
පච්චත්තං 1493
පච්චන්ත 2323
පච්චයසන්නිස්සිතසීල 350, 713
පච්චයසම්පදා 1598
පච්චවෙක්ඛණාසුද්ධි 1355
පච්ඡින්නන්තං 640
පච්චුපට්ඨිතකාම 375
පච්චුප්පන්නකාම 374
පච්චුපලක්ඛණා 1828
පච්චෙකබුද්ධ 1655
පචෙස්සති 616
පජ්ජා 2618
පජා 2064
පඤ්චමී 1596
පඤ්චමීසඞ්ඝගතාදක්ඛිණා 1592
පඤ්චුපාදානක්ඛන්ධදුක්ඛ 1751
පඤ්ඤා 480, 1434, 1828
පඤ්ඤා ආලොක 1828
පඤ්ඤා ඔභාස 1828
පඤ්ඤා පජ්ජොත 1828
පඤ්ඤාපාසාදං 379, 1828
පඤ්ඤාබල 1828
පඤ්ඤාය 2141
පඤ්ඤායුධෙන 497
පඤ්ඤාරතනං 1829

පඤ්ඤාසම්පදාකථා 781
පඤ්ඤින්ද්‍රිය 1828
පඤ්හාබ්‍යාකරණඋපසම්පදා 1589
පටිච්ඡන්නදුක්ඛ 1733
පටිජග්ගෙය්‍ය 1460
පටිපත්ති 743
පටිප්පස්සද්ධිවිමුත්ති 246
පටිබද්ධමනො 2218
පටිභාගනිමිත්ත 1408
පටිභානපටිසම්භිදා 2419
පටිවෙධ 794
පටිවෙධබහුස්සුත 1926
පටිසඞ්ඛානුපස්සනාඤාණ 1379
පටිසන්ථාරවුත්ති 2478
පටිසන්ධි 758
පටිසම්භිදා 2415
පටිසෙවති 821
පඨමජ්ඣානසමාධි 1364
පඨමාපාටිපුග්ගලිකාදක්ඛිණා 1596
පඨමාසඞ්ඝගතා දක්ඛිණා 1592
පඨවිං 502
පඨවිසමො 1044
පඨවීධාතු 526
පට්ඨානනයො 1692
ප්‍රණිපාත 1864
පණ්ඩිතො 313, 378, 928, 938, 2012
පණ්ඩිතමානී 789
පතිරූපෙ 1464
පතීත 826
පත්තපිණ්ඩිකඞ්ගං 1062
පත්තිදාන 188
පථව්‍යාඑකරජ්ජෙන 1643
පදං 1027, 1200, 2063, 2470
පදීප 1398
පදීපෙය්‍ය 1570
පදුට්ඨෙන 24
පදුමං 730
පනුද 2502
පන්තං 1710
පපඤ්චසමතික්කන්තෙන 1885
පපඤ්චාභිරතා 2064
පපුප්ඵකානි 623
පබ්බජිතා 857
පබ්බතට්ඨො 386
පබ්බතා 1260, 1722
පභඞ්ගුරං 1299, 1412
පමත්තා 233, 2244, 2473
පමාදෙ භයදස්සී 405
පමාදො 310, 404
පයිරුපාසති 791
පයොගවිපත්ති 809
පයොගවිපත්තිපතිබාළ්හ 810
පයොගසම්පත්ති 810
පයොගසම්පත්තිපතිබාළ්හ 809
පයොගාභිසඞ්ඛාර 2073
පරක්කම 2502
පරකුලෙසු 856
පරංගතං 1961
පරචිත්තවිජානනාඤාණ 1383
පරනිම්මිතකාම 375
පරනිම්මිතවසවත්තී 217
පරමත්ථදෙසනා 226, 230, 1457
පරස්සහෙතු 941
පරික්ඛයං 1299
පරිග්ගහිතකාම 375
පරිචරෙ 1154
පරිජිණ්ණ 1411
පරිඤ්ඤතභොජන 1017
පරිත්තඅප්පමාණාරම්මණ 1364
පරිත්තසමාධි 1363
පරිදෙව 1743
පරිනිප්ඵන්න 610
පරිනිබ්බන්ති 1252
පරිනිබ්බුතා 999

පරිප්ලවපසාදස්ස 480
පරිබ්බජේ 2584
පරියත්ති 792
පරියත්තිබහුස්සුත 1924
පරියායදුක්ඛ 1733
පරියෙට්ඨිසුද්ධි 1350
පරියොදපෙය්‍ය 951
පරිස්සය 2357
පරිසූපට්ඨාක 1925
පරූපක්කමමූලකදුක්ඛ 1736
පරූපඝාතී 1707
පරෙ 67, 68
පරෙසං 661
පල්ලල 1015
පළිපථ 2579
පළිබොධ 1755
පලිත 2086
පවරං 2620
පවත්තාරං 888
පවිවෙකකථා 780
පවිවෙකරසං 1916
පස්සද්ධි 573
පස්සද්ධිසම්බොජ්ඣඞ්ග 965
පසන්න 2470
පසන්නෙන 36
පස්ස 1410
පසහති 86
පංසුකූලිකඞ්ග 1048
පංසුකූල 2532
පාගබ්භිය 2036
පාගුඤ්ඤතා 575
පාණ 2129
පාණි 1285
පාණිමන්ති 1240
පාතිමොක්ඛ 92; 237, 1709
පාථෙය්‍යං 2021
පාදකජ්ඣාන 454
පාදසඤ්ඤත 2450
පාපධම්ම 2308
පාන 1570
පානභොජන 2044
පාප 1224
පාපකං 800, 895
පාපිකං 1490
පාපියො 508, 891
පාමොජ්ජ 2476
පාර 2508
පාරගත 2579
පාරගවෙසිනො 2435
පාරගාමිනො 943
පාරගූ 2506
පාරාපාරං 2508
පාවක 843, 1300
පාහුනෙය්‍යො 2282
පිණ්ඩපාතිකඞ්ගං 1054
පිතා 517
පිතරං 2254
පිපීයති 1519
පියගාහී 1935
පියතො 1939
පියවිප්පයොගදුක්ඛ 1749
පියෙහි 1936
පියො 894
පීති 2476
පුග්ගල 2092
පුග්ගලජ්ඣාසයජ්ඣාන 454
පුඤ්ඤ 1213, 2571
පුඤ්ඤක්ඛෙත්ත 2282
පුඤ්ඤපාපපහීණස්ස 487
පුඤ්ඤවතොඉද්ධි 1547
පුත්ත 785, 787, 2229
පුත්තපසුසම්මත්තං 2227
පුථුජ්ජන 731
පුනප්පුනං 1437
පුප්ඵ 655, 665
පුප්ඵගන්ධො 700

පුබ්බාපර 600, 2423
පුබ්බෙකතහෙතුවාදය 119
පුබ්බෙනිවාසානුස්සතිඤාණ 1371, 2621
පුරිස 1323, 1960
පුරිසදම්මසාරථි 2269
පුරිසාජඤ්ඤ 1869
පුරිසාධම 900
පුරිසුත්තම 902
පුරෙක්ඛාරං 852
පුරෙ 2618
පුළුවක 88, 2403
පුළුවකඅසුභභාවනා 2403
පූජා 856, 1152
පූතිසන්දෙහො 1412
පෙච්ච 169, 186, 202, 1272
පෙතා 207
පෙත්තෙය්‍යතා 2362
පෙමතො 1942
පොක්ඛර 2372
පොක්ඛරපත්ත 2545
පොනොභවිකා 1753
පොරාණා 2002
පොස 1145
ඵන්දනං 415
ඵරුසං 1279, 1295
ඵස්ස 18, 563
ඵාසුකා 144
ඵුටො 1956
ඵුසන්ති 341
ඵෙණූපමං 621
ඵොට්ඨබ්බ 77
ඵොට්ඨබ්බායතන 536
බන්ධන 2540
බන්ධවා 2229
බලං 1166
බලානීකං 2540
බලිවද්ද 1434
බලී 2202
බල්‍යං 789
බහිද්ධාකාම 374
බහිද්ධාසංයොජන 407
බහිද්ධාසමුට්ඨානඔත්තප්ප 2033
බහිනික්ඛමණමූලකදුක්ඛ 1736
බහුං 1721
බහුජාගරො 390
බහුප්පද 2136
බහුසඞ්කප්ප 1405
බහුස්සුත 1924
බාල 745, 838, 858
බාලසඞ්ගතචාරිනී 1922
බ්‍යාසත්තමනසං 2227
බිම්බං 1404
බුද්ධ 1653, 2270, 2538
බුද්ධගතාසති 2262
බුද්ධසාසන 1711, 2470
බුබ්බුලක 1505
බොජ්ඣඞ්ග 957
බ්‍රහ්මචරිය 1444, 2319
බ්‍රහ්මචාරී 1319
බ්‍රහ්මඤ්ඤතා 2366
බ්‍රාහ්මණ 2256, 2502
භගවා 2271
භඞ්ගානුපස්සනාඤාණ 1376, 2188
භණ්ඩාගාරිකපරියත්ති 227, 793
භත්තසම්මද 2298
භමර 655
භය 487, 1234, 2216
භයතජ්ජිතා 1724
භයතුපට්ඨානඤාණ 1377, 2188
භයදස්සී 2327
භවතණ්හා 1766
භවසල්ලානි 2415
භවාසව 1023
භවොඝ 368

භවිස්සතිකම්මනභවිස්සති කම්මවිපාක 811
භවිස්සතිකම්මභවිස්සති කම්මවිපාක 811
භස්මච්ඡන්න 843
භායන්ති 1267
භාවනා 188, 852
භාවනාවට නොසුදුසු තැන් 328
භාවිතත්ත 1151
භාසති 36
භික්ඛු 1320, 2444
භික්ඛුනොවාදක 1925
භික්ඛවෙ 2217
භුත්තවමිතක 93
භූත 1271, 2092, 2555
භූමි 1107
භෙදනං 1296
භොග 1299, 2434
භොජන 81, 92, 1018
භොවාදී 2533
මක්කට 2390
මක්ඛ 1424, 2561
මග්ග 1234, 2134, 2202, 2208
මග්ගජින 1707
මග්ගජීවී 1708
මග්ගදෙසී 1708
මග්ගාමග්ගස්ස කොවිද 2549
මඞ්කු 2044
මඤ්චා 403
මච්ච 1311
මච්චාන ජීවිතං 1689
මච්චු 311, 695, 1422
මච්චුධෙය්‍ය 945
මච්චුරාජා 1507
මච්ඡරිය 21, 587
මච්ඡෙර 2028
මජ්ඣත්තතා 578
මජ්ඣිමකාම 374
මජ්ඣිමසමාධි 1361
මජ්ඣිමසීල 777
මණි 1481
මත්තඤ්ඤු 92
මත්තඤ්ඤුතා 1709
මත්තා 2239
මත්තෙය්‍යතා 2362
මධු 829
මනො 15, 24, 34, 35, 81, 1085
මනසිකාර 19, 577
මනසිකාරකොසල්ල 1407
මනසුචරිත 2007
මනාපස්සවණා 2378
මනුජ 2371
මනුස්ස 213, 2333
මනුස්ස පටිලාභො 1688
මනොපකොපං 2007
මනොපාගබ්භිය 2036
මනොපුබ්බඞ්ගමා 22
මනොමය ඉද්ධිඤාණ 1382
මනොමයා 24, 35
මනොමයා ඉද්ධි 1542
මනොසෙට්ඨා 24, 35
මන්තාභාණී 2453
මන්තා 2024
මමායිත 2463
මමායිතකාම 375
මරණ 1739
මරීචි 1506
මල 2025
මංසලොහිතලෙපනං 1419
මහග්ඝස 2344
මහාපඤ්ඤ 2424
මහාපථ 730
මහාපුරිස 2424
මහාවරාහ 2345
මහාසීල 777
මහෙසී 2620

මිහොස 642
මා 373
මාතඞ්ග 2358
මාතා 516, 2254
මාන 21, 103, 585, 1970
මානුසක 2607
මානුසිකකාම 375
මානුසෙ 1142
මාර 86, 497, 623, 1148, 1552
මාරධෙය්‍ය 457
මාරපමොහනං 2137
මාරබන්ධනා 477
මාලා 1570
මාලාගුණෙ 694
මාළුවාසාල 1485
මාස 837
මිච්ඡාජීවවිරති 580
මිච්ඡාදිට්ඨි 584
මිච්ඡාදිට්ඨිසමාදාන 2326, 2327, 2329
මිච්ඡාපණිහිත 508
මිච්ඡාසඞ්කප්පගොචර 153
මිත්ත 895, 900
මිද්ධ 21
මිද්ධී 2344
මුඤ්චනචෙතනා 1608
මුඤ්චිතුකම්‍යතාඤාණ 1379, 2188
මුණ්ඩකෙන 2121
මුත්ති 1781
මුදිතා 20, 579, 2101
මුදුතා 574
මුද්ධ 848
මුනි 656
මුසාවාදිස්ස 1559
මුහුත්තං 797
මූලං 2040, 2376
මූලසච්චං 2045
මූළ්හරූප 2128
මෙත්තා 2086
මෙත්තාවිහාරී 2469
මෙධගා 68
මෙධාවී 367, 2005, 2076
මොහ 21, 102, 583
මොහක්ඛය 1787
ය 367
යො 788, 2124
යථා 160, 1900
යථාකාමනිපාතිනො 467, 471
යථාධම්මසාසන 226
යථානුලොමසාසන 224
යථාපරාධසාසන 223
යථාපසාදනං 2044
යථාසද්ධං 2044
යථාසන්ථතිකඞ්ගං 1074
යමපුරිස 2011
යමලොක 616
යසො 355
යසොභොගසමප්පිත 2289
යාචක 1991
යාචිත 1991
යාන 570, 2336
යාමා 216
යාම 1459
යාවජීවං 791
යාවතා 2081
යාවනෙතා 2373
යුවා 2201
යොගසම්මිං 1933
යොගක්ඛෙමං 342
යොජනං 745
යොනිජං 2533
යොනිසො 2350
යොබ්බනෙ 1449
රක්ඛති 373
රක්ඛෙ 498

රජත 2018
රට්ඨ 2255
රට්ඨපිණ්ඩ 2312
රති 1414, 2609
රත්ති 744, 2295 2514
රස 77, 635, 656
රස්සං 2565
රහදෙ 932
රාග 163, 245, 2437, 2561
රාගක්ඛය 1787
රාගසමො 1903
රාජනො 1297
රාජරථො 1428
රාජරජ්ජුපමං 1509
රාජානො 2254
රාමණෙය්‍යකො 1107
රුක්ඛමූලිකඞ්ගං 1068
රුචිරං 665
රූපං 76, 522, 1411
රූපරාග 1114
රූපාවචර කුසලකම් 806
රූපාවචරචතුර්ථධ්‍යානයට 3 8
රූපාවචරතෘතීයධ්‍යානයට 338
රූපාවචරද්විතීයධ්‍යානයට 3 8
රූපාවචරපංචමධ්‍යානයට 338
රූපාවචරප්‍රථමධ්‍යානයට 338
රූපාවචරපටිසන්ධි 761
රූපාවචරසමාධි 1366
රොගනිඩ්ඩං 1412
රොගා 1907
රොධ 1782
ලක්ඛණොපනිජ්ඣාන 326
ලජ්ජාසභාවසණ්ඨිතාගිරි 2033
ලජ්ජිතායෙ 2326
ලපයන්ති 936
ලහුකා 574
ලහුනො 466
ලාභූපනිසා 816
ලිඞ්ගනාසනා 1177
ලීනත්තං 2298
ලොක 999, 1156, 1505,
1509, 1524
ලොකවද්ධනො 1500
ලොකවිදූ 2266
ලොකාධිපතෙය්‍යඔත්තප්ප 2033
ලොකියසමාධි 1360
ලොකුත්තරසමාධි 1360
ලොකොත්තරශරණගමන 1862
ලොභ 20, 101, 582, 2124
ලොහිතක 88, 2402
ලොහිතක අසුභභාවනා 2403
ලෞකිකශරණගමන 1862
වචීදුච්චරිතවිරති 580
වචීපකොපං 2007
වචීපාගබ්භිය 2036
වජ්ජ 2060, 2329
වජ්ජදස්සිනං 888
වජ්ජභීරුකභයදස්සාවී
ලක්ඛණඔත්තප්ප 2034
වජිර 1497
වණ්ණො 1240
වණ්ණී 1163
වණ්ණගන්ධං 65
වණ්ණපොක්ඛරතාය 2114
වතවත්තං 1927, 2543
වත්ථං 124, 1570
වත්ථුකාමා 374
වත්ථුසම්පද 1598
වධ 3540
වද්ධාපචායිනො 1163
වන 1154, 1722, 2215
වනථ 2216
වනාධිමුත්ත 2384
වනතෙත 2302
වනන්තසංවස්ස 127
වනන්තලොකාමිස 2481

වනන්තාසො 1092
වනමුත්ත 2384
වයො 2086
වරත්ත 2537
වා 25, 938, 1101
වාක්කරණමත්තෙන 2113
වාකසුචරිත 2007
වාචානුරක්ඛී 2207
වාචායසඤ්ඤත 2450
වාචායසංවරො 2443
වාණිජ 1234
වාතො 87
වානර 2371
වාරි 2545
වාරිජ 456
වාළකන්තාර 1002
වාහා 2379
ව්‍යාපාද 949
ව්‍යාපාදකායගන්ථො 1007
ව්‍යාසත්තමනසං 641
විකුබ්බනා ඉද්ධි 1541
වික්ඛම්භණවිමුත්ති 245
වික්ඛායිතක 88
වික්ඛිත්තක 88, 2402
වික්ඛිත්තක අසුභභාවනා 2402
විචාර 19, 444, 566
විචිකිච්ඡා 21, 121, 588
විච්ඡිද්දක 88, 2402
විච්ඡිද්දක අසුභභාවනා 2402
විජම්භිකා 2298
විජානාති 795
විජ්ජාමයා ඉද්ධි 1548
විඤ්ඤාණං 590
විඤ්ඤාණඤ්චා
යතනජ්ඣානයට 339
විඤ්ඤාණඤ්චායතනං 448
විඤ්ඤුපති 2564
විඤ්ඤූ 797, 2004
විතක්ක 19, 444, 565, 2400
විතක්කූපසම 2401
විතිණ්ණපරලොකස්ස 1559
විදර්ශනා 161, 781, 2141, 2456
විදිත්වා 497
විනයපිටක 222
විනීලක 88, 2402
විනීලක අසුභභාවනා 2402
විපචිතඤ්ඤූ 1694
විපරිණාම 1730
විපරිණාමට්ඨ 1730
විපරිණාමදුක්ඛ 1733
විපස්සනාසම්මාදිට්ඨි 1826
විප්පමුත්තස්ස 1003, 1939
විප්පසන්නෙන 911
විපාතයං 848
විපුබ්බක 88, 2402
විපුබ්බක අසුභභාවනා 2402
විභවතණ්හා 1767
විමුත්තානං 722
විමුත්තිඤාණදස්සන
සම්පදාකථා 781
විමුත්තිසම්පදාකථා 781
විමොක්ඛා 1018
විරජ 2510
විරිය 92, 567
විරියසමාධි 1366
විරියසම්බොජ්ඣඞ්ග 963
විරියාරම්භකථා 780
විලෙපනං 1570
විලොමාති 661
විවට්ට 2624
විවර 1262
විවෙක 878, 947
විවෙකට්ඨ 1815
විසං 1235, 1240
විසඞ්ඛාරගතං 1441
විසංයුත්ත 2509, 2536

විසත්තිකා 2372
විස්සාසපරමා 1913
විසීදන්ති 1509
විසුජ්ඣති 1493
විසුද්ධිදෙවා 403
විසෙසභාගීය 1366
විසොකස්ස 1003
විස්සං 2126
විහරාම 1896
වීතතණ්හා 2414
වීතරාගා 1113, 1610
වීතද්දර 2508
වීමංසාසමාධි 1366
වීර 2610
වුට්ඨි 160
වෙ 1393
වෙදනා 17, 558, 1295
වෙදල්ල 231
වෙය්‍යග්ඝපඤ්චමං 2256
වෙය්‍යාකරණ 231
වෙය්‍යාවච්ච 188
වෙරං 45
වෙරසංසග්ගසංසට්ඨ 2242
වෙරී 508, 1896
වො 2373
වොත්ථපනං 434
වොහාරදෙසනා 224
ව්‍යන්තීකාහති 2412
සඋපාදිසෙස නිබ්බාන 1811
සකදාගාමී මග්ගචිත්තං 128, 452
සක්කාරං 878
සඞ්කස්සර 2319
සන්ත 700, 1085
සන්තවාචා 1085
සපදාන චාරිකඞ්ගං 1058
සප්පීතිකසමාධි 1360
සප්පුරිස 702
සප්පුරිසදානානි 1613
සථලා 667
සබ්බගන්ථප්පහීණස්ස 1003
සබ්බඤ්ඤුතා 1438
සබ්බත්ථ 935
සබ්බත්ථකබහුස්සුත 1925
සබ්බත්ථසංවරො 2443
සබ්බදානං 2428
සබ්බනාසනා 1177
සබ්බපාපස්ස 1698
සබ්බයොගවිසංයුත්ත 2608
සබ්බලොකාභිභූ 2618
සබ්බවිදූ 2425
සබ්බවොසිතවොසාන 2626
සබ්බසො 2643
සබ්බාභිභූ 2425
සබ්බෙ 1265
සබ්බෙ ධම්මා 2197
සබ්බංරතිං 2430
සබ්බං රසං 2430
සභාගනිමිත්ත 351
සමණ 1319, 1707, 2064
සමතිවිජ්ඣති 162
සමථ 161
සමථංගතානි 1030
සමථයානික 321
සමසිතජ්ඣාන 454
සමාදානවිරති 1843
සමාධි 568, 1355, 1367 2044
සමාධි ආනිසංසෙ 1367
සමාධි භාවනා 1367
සමාධිවිප්ඵාරා ඉද්ධි 1545
සමාධිවොදානය 1367
සමාධිසංකිලෙසය 1367
සමාධිසම්පදා කථා 781
සමාධිසම්බොජ්ඣඞ්ගො 967
සමාහිත 2451
සමිඤ්ජනති 928
සමිති 2333

සමිද්ධි 942
සමුග්ගම 599
සමුච්ඡින්නං 2045
සමුච්ඡෙද විමුත්ති 246
සමුච්ඡෙද විරති 1843
සමුද්දමජ්ඣෙ 1257
සමුස්සිතං 1404
සමූහතං 2045
සයනාසනං 1710
සංගාම 1142
සංචරිත්ත 1484
සම්පජඤ්ඤ 1828
සම්පජාන 2252
සම්පවිච්ඡනං 428
සම්පත්තවිරති 1843
සම්පන්නවිජ්ජාචරණා 1371
සම්පන්නසීලානං 721
සම්පරිවත්තසායී 2345
සම්ප්‍රජානකාමී 812
සංයොග 1755, 2507
සංයොගට්ඨ 1755
සංයොජනං 406, 2535
සංවච්ඡරං 1158
සංවට්ටකප්ප 2624
සංවර 1330
සංවරාසංවරකථා 223
සංවරො සීලං 706
සංවුතා 1994
සංවෙගිනො 1326
සංසන්නසඞ්කප්පමන 2202
සංසාරා 1081
සංසාරො 745
සංසෙදජ 755
සරණං 1861
සරණගත 1862
සරණගමන 1862
සරණගමන උපසම්පදා 1589
සල්ලසත්ථනං 2131
සවාහිනිං 1552
සස්සත 2074
සහස්සං 1124, 1141
සහසා 2077
සහාය 2356
සහායතා 776
සහිතං 221
සාකසිතා 2380
සාදුක 2560
සාධු 468, 1921
සාධුජීවකායසංවරො 2442
සාධුරූප 2114
සාධුවිහාරී 2357
සාධුසොතෙන සංවරො 2442
සානුචරං 2255
සාමග්ගී 1876
සාමඤ්ඤ 234, 2317
සාමඤ්ඤතා 2365
සාමිපරිභොගය 1352
සාමීචිපටිපන්නො 2281
සාරථිං 1977
සාරදික 2222
සාරදෙ 1413
සාරමතිනො 152
සාරම්භකථා 1279
සාරෙ 152
සාල 1485
සාසනං 1490, 1699
සාසප 2546
සාහු 1920
සිනෙහං 2221
සිනෙහිතාති 2380
සින්ධව 2334
සිරො 2085
සිස්සභාවස්ස උපගමනං 1864
සිස්සෙසා 390
සීතිභූත 2609
සීල 129, 187, 1 26

සීලදස්සනසම්පන්නං 1953
සීලබ්බතපරාමාස කායගන්ථො 1008
සීලවන්තං 706
සීලවිපත්ති 2317
සීලවිසුද්ධි 2142
සීලසම්පදාකථා 781
සුකත 2321
සුකතිනො 1251
සුක්කං 946
සුක්කංසං 848
සුක්කවිසට්ඨි 1483
සුක්ඛවිපස්සක 321
සුඛ 377, 431, 1165, 1272, 1872 2470
සුඛසහගතසමාධි 1361
සුඛසංවාස 1923
සුඛාපටිපදාඛිප්පාභිඤ්ඤ එකබීජී 317
සුඛාපටිපදාදන්ධාභිඤ්ඤ එකබීජී 316
සුඛාවහං 468
සුඛෙසිනො 2380
සුගත 2264
සුගතිං 213
සුවික්කමස්ස 352
සුවිගවෙසිතා 2037
සුවිත්තා 1428
සුවජ්ජන්නං 168
සුඤ්ඤත 236, 1814,
සුඤ්ඤාගාර 2475
සුත්ත 231, 389, 642
සුත්තපිටක 224
සුදන්තා 1030, 1470
සුදස්සදෙව් 321
සුදස්සීනු 321
සුදුත්තරං 945
සුදුද්දසං 471
සුද්ධාජීව 2038, 2460
සුද්ධි 1493
සුපටිපන්නො 2280
සුබ්බත 1048, 1392
සුභානුපස්සී 76, 2401
සුභාවිතං 998
සුභාවිතාවාචා 666
සුභාසුභං 2565
සුමනො 826
සුචිරති 2342, 2343
සුමෙධසො 391
සුවිමුත්තචිත්ත 245
සුවෙසුවෙ 2004
සුසංහිත 129, 2481
සුසුඛං 1895
සුසංවුතං 89
සුභජ්ජා 1960
සූපරසං 795
සෙඛො 617
සෙට්ඨංගතො 404
සෙට්ඨි 373
සෙට්ඨො 2333
සෙය්‍යසො 518
සෙය්‍යා 1570
සෙලො 926
සෙති 1290
සො 789
සොකො 1743
සොතං 426, 2333
සොතවිඤ්ඤාණං 427
සොතාපත්තිමග්ගචිත්තං 127, 451
සොත්ථිය 2256
සොපාදිසෙසනිබ්බාන 236
සොමනස්ස 17, 2380
සොළසිං 839
සොසානිකඞ්ගං 1072
හතවික්ඛිත්තක 88, 2402

හතවික්ඛිත්තක අසුභභාවනා 2403
හතාවකාස 1092
හත්‍ථ 2317
හත්‍ථසඤ්ඤත 2450
හවෙ 1145
හංස 1015, 1529
හසිතුප්පාදං 434
හාස 1397
හි 376, 1213
හිඞ්ඝායාති 391
හිමවන්ත 2294
හිරි 19, 570, 2032
හිරිනිසෙධො 1322
හිංසමනො 2522
හීනං 1498
හීනකාම 374
හීනප්පණීත 608
හීනවීරියං 86
හුත 1152
හුරං 2371
හෘදයවස්තු රූපය 537
හෙමන්තගිම්හිසු 2224

# ප්‍රශස්තිකලිකා:—

ශ්‍රී ශාක්‍යසිංහවදනාද්ගලිතානනල්පාං-
ස්තාංස්තාන් විමුක්තිරසධර්මපදාර්ථජාතාන්,
සංගෘහ්‍ය පූර්විගතාස්‍රවබුද්ධපුත්‍රාඃ
ක්ෂුද්‍රාගමං පරමධර්මමනෙතිප්‍රජ්ජෛවේ.

තස්මින්නතිප්‍රථිතධර්මපදප්‍රශස්තෙ
ග්‍රන්ථෙ'ත්‍ර විස්තෘත අයම්ප්‍රතිවර්ගබද්ධඃ,
අස්‍යාර්ථවර්ණනමුඛාද්විතානුවාද
භාසවන්ති සර්ජනබුද්ධිවිවර්ධමානාඃ.

දුෂ්ප්‍රාඥලක්ෂණපරා මතිකල්පලොකාඃ
කෛවල්‍යවෛකෘතගතා රතිලම්පටාස්තෙ,
යස්‍යාර්ථ බොධනවශාදිහ බුද්ධිමාර්ගී-
මෙධාම්බුභූවුරධුනාපි සරාජතෙ'ලම්.

දුර්භාග්‍යකාදිමතිමග්නජනා ජගත්‍යාං
ප්‍රක්ෂාලනාය විධිවත්ප්‍රතිපත්තිමග්නාඃ,
යස්‍යාර්ථ ශික්ෂණවශාදිහ භාග්‍යමාර්ගී-
මෙධාම්බුභූවුරධුනාපි සරාජතෙ'ලම්.

දුර්දාන්තවහ්නිපතිතාඃ ප්‍රතිපද්විහීනාත්
ප්‍රාගල්භ්‍යශූන්‍යපරමාර්ථසමීක්ෂකාස්තෙ,
යස්‍යාර්ථභූෂණවශාදිහ දෘන්තමාර්ගී-
මෙධාම්බුභූවුරධුනාපි සරාජතෙ'ලම්.

අද්භුතධර්මරසබින්දුපරාර්ථබුද්ධි-
ප්‍රඛ්‍යාතපණ්ඩිතපදශ්‍රිතසංයමීනාම්,
භාස්‍යාවමර්ශීවිෂයොපි සුධාමරන්ද-
කිඤ්ජල්කමූර්තිරිව සො'ත්‍ර විරාජතෙ'ලම්

භාෂාන්තරප්‍රගතධර්මපදං මනොඥං
සංවීක්ෂ්‍ය නෛකජනතා විෂයාන්තරස්ථාඃ,
සාංසාරිකාග්‍රවිෂකෘච්ඡ්‍රමපාස්‍ය භූයඃ
කෛවල්‍යසාතමපි නාත්‍ර විකර්තුමීයුඃ.

ශාස්ත්‍රොදයාඛ්‍යපරිවෙණපතිර්මතිෂ්ඨඃ
ප්‍රායොජ්‍යබුද්ධිපරිපුෂ්ටගතිප්‍රබන්ධඃ,
විඥප්‍රශස්තචරිතශ්චරිතඥදක්ෂඃ
ශාස්ත්‍රඥදීප්තිහතඃ ප්‍රතිහතීද්වෙෂඃ.

විඥාතධර්මවිනයඃ ප්‍රතිපද්‍රසඥ–
ආකල්පගුම්ඵිතයශා ගුණවානකුණ්ඨඃ,
සඞ්ඝානුවිජ්ජකපතිර්නිජභික්ෂුවංශෙ
ධර්මෝත්තරාජිවවිචක්ෂණයුක්තිරූපඃ.

දීප්‍රො ගුණෛ රවිකලෛර්මුනිභාෂිතෛසීඃ
ස්ථාස්නූර්ධීරප්‍රතිපදි ප්‍රගුණප්‍රවීණඃ,
සෙද්ධානුයාතජගතාමනවාප්තලාභඃ
කර්තා විශිෂ්ටවිෂයාශ්‍රිතසත්කෘතීනාම්.

ධර්මාර්ථසාරමඛිලං පපිවානජස්‍රං
ශීලාදිසද්ගුණපථං යයිවානජිහ්මම්,
ආම්නායරක්ෂණවිභූෂණබද්ධකල්පො
විද්‍යෝදයප්‍රචිතශාස්ත්‍රවිනීතධර්මඃ

ශාස්ත්‍රාන්තරප්‍රහිතබුද්ධිවිශුද්ධකීර්ත්තිඃ
පාත්‍රීකෘතාත්මපරතන්ත්‍ර කෘතතන්ත්‍රමන්ත්‍රාත්,
යස්‍යාර්ථවාදපදසර්ම්මුපාත්තවිද්‍යඃ
සර්වාර්ථසූදනපරාදපරාර්ථබුද්ධ්‍යාඃ.

ව්‍යක්තීකෘතාර්ථරසකල්‍යවිකල්පබුද්ධිඃ
පාශ්චාත්‍යමන්දමතිමත්සු දයාර්ද්‍රචෙතාඃ,
ලොකාර්ථපෙශලසුභාවිතධර්මබන්ධුඃ
පූජ්‍යඃ සද්ධර්මකුශලස්ථවිරො වරෙණ්‍යඃ.

වීජාතමවසතුපරි සම්ප්‍රති විශ්‍රුතාර්ථං
සංහෘත්‍ය ධර්මපදජාත මපාරපාරම්,
සද්ධර්මසාගර ඉතීරිතභාෂ්‍යරත්නං
වාචා ස්වයා සරලයා විධිවච්චකාර.

විද්ධවසතගර්පරමො ගුරුභක්තිපූර්ණඃ
සම්භක්තසාධුජනමන්දිරරත්නරූපඃ,
කල්‍යාත්මපූතචරිතොත්තමස්‍ය කර්තා
දෙදීප්‍යතාං සුගතශාසනභූෂණාර්ථම්.

ගුණී ගුණඥඃ පරශංවදෙ'ස්මින්
සමීක්ෂමීක්ෂං ගුණදොෂසර්වම්,
**යදුත්තරානන්ද යතිර්බබන්ධ**
**ප්‍රශස්ති**රෙෂා කලිකාන්තරූපා.

(වැල්ලවත්තේ ශ්‍රී ධර්මෝදය පරිවෙණාධිපති විද්‍යාවිශාරද පණ්ඩිත ඉඳුරුවේ උත්තරානන්ද ශ්‍රී ලංකා රාමඤ්ඤනිකායයේ අධිකරණ නායක මහාස්ථවිරයන් වහන්සේ විසින් සද්ධර්ම සාගරයෙහි ලා කරණ ලද ප්‍රශස්තිය යි.)

# ග්‍රන්ථකරු

හා

# ග්‍රන්ථකරු පැතුම්:—

හෙළදිව දකුණුදිග – ගාලුපුරවරෙනුතුරේ,
පිහිටි සරසවි සිරිකත – උරෙනුර ගැටී වසනා.

බොදුදනට ම නිවෙස් – පින්කිරියවත් පුරණා,
අම්බලම්ගොඩ නමිනී – පළට වත් නුවරෙක් වේ.

සිරි රජදිරජසිහ – රජමැතිමඬුල හෙබ වූ,
රජකුරුගෙසි ඇමතිසඳ – ලැබී පටබඳ එහිලා.

රද පැහැදුම් ලබා – මහදන කිස ද නිසි සේ,
කැරූ සිටි එ මා මැතිසඳ – පරපුරැ දුනු පිවිතුරු.

පෙළපත් නම් විසිනි – අකුරැවිය පටබැඳිගේ
මැතිදෙක් වීය දනදෙටු – පිළිවෙළ නො සිඳ වැඩුනු.

ගුණැති එ මැතිඳුගේ – දරුමුනුබුරුනතුරෙකෙක්,
මෙනුවරැ විසී දනමත් – පොබකළ දහැම් වැටුමෙන්.

මවු පියන් දෙපසින් – පිරිසිදු එ මැති පරපුරැ
උපන ලත් ගත්කරු මේ – සසුනට නතු ව වැටුනේ.

මෙ නුවරැ මහදනා – තෙරුවනැ සැදැලෙන් බැඳී,
ඉදි කළ මහවෙහෙර තුම් – පළ වේ සුනදරම් යි.

හව් වෙහෙරගිනි පිරි – මේ මහවෙහෙර හෙළදිව,
හැමට පින්කෙත් වනුයේ – බුදුදු සිරිත් තෙවුනු.

අමරපුර මහනාකැ – එක් ගෙණෙකැ මුල් බිම් වූ,
මෙහි මුල් හිමි පදවි දැරූ – ලෝ සසුන් කිසැ රැඳුනු.

විලේගොඩ පින්සර – බිදත් මාහිමි පින්සරු,
අමරපුරනකැ මහනා – තනතුරෙනි පුද ලදුවෝ.

ගුණනැණැති තද තෙද – එ මාහිමි සිසුගණැතුරැ,
පැසුළු සිසු වූ දේගොඩ – සිරි අබයතිස් මාහිමි.

සියැදුරු ඇවෑමෙන් – වෙහෙර ගණදෙටුතැන් ලැබ,
ලෝ සසුන් කිස වඩමින් – හුදු මුදු ගුණෙති තෙවුනෝ.

එ මාහිමි සිසුගෙණෙ – ඤුමත් වරදෙහි බිය දුටු,
සිරි ඉඳුදේ යතිඳු සඳ – වෙහෙරැගණදෙටු තැන්පත්.

හැම වැටුමැ හැමදෑ – රහතුන් විලස් නො ලැගු,
ගුණෙනි තද බඳ යතිඳු – සුදන මන ඇද සිටියෝ.

මෙ හිමිසඳු වළඳනු – දුටු දන එදෑ කුහුලින්,
රහතකු මෙනැයි ගැණුමෙන් – පුද පෙරහරින් පිදුවෝ.

සිත කරණියෙහි සික් – සිය දිවි වැටුමැ යෙදුමෙන්,
නුබඳ සිවු පිරිසිදු සිල් – සුරැකියෝ ඒ මාහිමි.

දම්තිය බිඳකුදු – නො ලැග රැකි සිල් සුවඳින්,
දසත හොබවාලූවෝ – ලෝ සසුන් වැඩ වැඩුමෙන්.

මෙ ගත්කරු එහිමි – ඇදුරු කොටැ සසුනට වත්,
හැම පිළිවෙතෙහි නිසිලෙස – පිහිටා උගත් බණ දම්.

මාගාලු පුරවරැ – සුදම්රම් වෙහෙරැදිපති,
අමරපුරමහනකයෙහි – මහනා පදවි දූරු ඒ.

මලලගමු සිරිමත් – සඟනද මහිමි ගත්කරු,
සිවුරු කර ලා සාතොස් – හෙරණ සික් හැම ගැත් වූ.

යලි සානඳුරපුරැ – සුගත් විදුහල් සපැමිණැ,
පදනැදුරු දම්සත්හි – පරතෙරට වත් පඬිගුරු.

සිරි නැණවිමල්තිස් – නාහිමි දමැදුරු කොටැ,
එහි සිසු ගණ ඔබා ගෙණැ – දම් සත් උගත් මැනැවින්.

එහි උපපදනැදුරු – දම්සද සතර වෙසෙරද,
සිරිධෛර්‍යවන් නා හිමි – ඇසුරැ දම්සදසතුගත්.

කරගම්පිටියෙ නා – හිමි මෙගත්කරු වැඩුමෙහි,
නුබඳ සෙනෙහස දක්වා – දම්සදසතර ගැත්තු.

එක්බිති කොළොම්පුරැ – විදූදය මහා විදුහලැ,
පදනැදුරු දම්සතරෙහි – පඬි සක්විති බවට පත්.

වදනිසුරු කහවේ – සිරිරූවන්සර නාහිමි,
ඇසුරු කැරැ මේ ගත්කරු – උගත් දම්සත් ඇතියේ.

එහි අවසන් පෙළෙහි – මුල් තැන් ලැබූ ගත්කරු,
සියම් මහරද තිළිනෙන් – පිදුනේ ලකිසුරු තුමන්.

පඬි බවෙහි සත්නස් – ලකිසුරු අතින් ලත් මෙ,
ගත්කරු ගෙතූ තේ ගත් – රට දැය සමය නැගුමට.

රට දූය හා සමය – නගාලනුවස් ගත්කරු,
ඇරැඹි සතුදස නම් ඒ – විදුහල දෙවුපෙළට පත්.

එහි පදනැදුරු තැනැ – සිට ලෝ සසුන් වැඩුමට,
සිසුගණ ඉබෝ වැඩු යේ – දම්සඳ සතර ගත්වා.

බුරුම දෙසැ සවැනී – සඟායෙහි සඟිකරු කොටැ,
සිරිලක් රදෙනි තෙවරක් – නියොදුයේ මේ ගත්කරු.

තෙවළාදහම් සිය – බසට නැගුමට රජයෙන්,
නියොදුනු පිරිවැඩුම් සෙබෙ – යෙදුනේ සසුන් හිතකිසැ.

සියබසට පෙරළු – එගත් සෝදුමැ නියොදුනු,
තෙවළා සකර සෙබෙහි – වැටුනේ සැබි ව නිසි සේ.

මෙගත්කරු විදුදස – සරසවියැ සකු ඇදුරු ව,
යෙදුනේ ඉගැන්නුම්හි – සරසවි සිසුන් තොස් කැරැ,

සියනකා සඟගණ – ගත්කරු සියනකාහි,
අදිකරණ නා තනතුරු – තැබූ ඇති තතු දූන සොඳ.

ලක්රදෙනි නියොදෙන – සාහිත මඬලැ තුළ වූ,
සකුඅනුමඬලැ සෙබෙපති – තනතුරු තැබූ රදෙනී.

මේ ගත්කරු තෙවළා – දහම් පොත පත විමසා,
යතරුත් උකාගෙණ ඉන් – සදහම් සයුර සැපයී.

බුදුවසිනි දෙදහස් – පන්සිය නවවන වසෙහි,
නිකිණි මසැ පුරපසැ වූ – පළමු කුජ දිනැ ගත්කරු.

තෙරුවන් පිහිට ලැබ – සදහම් සයුරු තෙර දූයා,
දම්රසිනි ඔද වැඩුනේ – බුදුබව පතා සිටුනේ.

පැසසුම් ද ගැරහුම් – ඉසිමත් දනත් කිවිමත්
පමණ නො ම වේ මෙහිලා – දම්සත් දත්හු පමණෝ.

---

ගත්කරුගෙ මවුපිය – දෙදෙන ගත්කරු වැඩුමට,
නො විඳි ගැහටෙක් වෙහෙසෙක් – නැත්තේය ඒ දවසෙහි.

වැඩියක් මවු ම මෙහි – පැවිදි කරවා සසුනෙහි,
ගත්කරු නැගුමැ බැඳි සිත් – වූය ඇතියා දිවිතෙක්.

තමනට ගත් අහර – පිඩ ද සහවා දීමෙන්,
ගත් වෙහෙස නො ද සුලු වේ – එ මවුහට ම ය වැඩි පින්.

ගත්කරු වැඩුමැ බැඳි – අකුරැටිය පටබැඳිගේ,
දෙටු බෑ **ජේ. ද සිල්වා** – මා සැප ලබා මෙ පිණෙන්.

දම්සද සතර ලා – ගත්කරු වඩාලන්නට,
**කරුණි** හැම පිරික්සා – සැපයූ නො කොට උනු බැව්.

සතුදයසත්මැදුර – වැඩුමට ඇරඹුද සිට,
නේ වැඩට සිය දන යෙදූ – ලෝ සසුන් හිතයෙහි රුදී.

**මහඅම්බලම්ගොඩ** – **සිතුලිය** නිවැසැ අදිපති,
**අකුරැටිය පටබැඳිගේ** – **මැන්දිස් සිල්ව** නැමැති.

ගත්කරුගෙ දෙවැනී – සොහොයුරු මහත්මා මෙ ද,
පළට කැරුමට සියදන – යෙදී කම්පල හදහා.

දෙව් සිරි සැප වහා – රිසි ව මනුදිවි හැර ඔහු,
ගිය බැවින මේ ගත්හී – නතර වී පළ කැරුම ද.

**පොල්වතු** ගම්පෙදෙසැ – **මානෙල්**-නිවෙසැ හිමි වූ,
ගත්කරුගෙ සුවදුක්හී – හිතබව නිතර දැක් වූ.

සතුදයෙහි නැගුම ද – තම නැගුමෙකැයි හදහා,
නිසි කල දන වැර යොදා – ලොබැර සිටි සදහම් දූන,

මැතිඳු දෙන් **දම්සෙන්** – **ජේපල් වීරසූරිය,**
සිය දන යෙදී මේ ගත් – පළට කැරුමට එක්බිති.

ගුණ නැණැති එ දෙදෙන – මෙහි යෙදූ ඒ දන රුස,
පල ගැනුනේ ය මෙතෙකින් – ලබත් දෙදෙන ම මොක්සැප.

**බුද්ධින් ඉන්ද්‍රජිත්** – **ගුණතුඟු** සිවිල් නිලදර,
මුනුබුරු ගත්කරුගේ – ගුණ නැණෙනි උස් තැන් ගත්.

හුදු මුදු ගුණගපත් – **සුවන්මාලි ගුණතුඟු,**
මිනිබිරි ගත්කරුගේ – තෙරුවනැ බැඳුනු සිතැති.

මහදනකඳක් මෙහි – යෙදූ බැවිනද මේ ගත්,
පළට කැරුම ද නිම වී – ඔවුන්හට පින් අත් වේ.

මෙ ගත පළ කැරුමට – ගත්කරුට හිත දැක් වූ,
පිරිවෙන් පිරික්සුම්හි – පදත් තනතුරැ සිටුනා.

දම්සතර වෙසෙරද – පඬිබවෙහි මුදුනට වත්,
අමරවංස නායකිසුරු – ලබා පින් අකුරැටියේ.

සදහම් සයුරතෙර – දකිනුරිසියෙන් අත දුන්,
ගත්කරුගෙ හිතමිතුරු – ශෝනාපීනුවලැ දුනු.

වෙසෙරද ව දම්සත් – සතැදුරුපදවි ලත් ඒ,
පින්සර නායකිසුරු – ලබා මේ පින් නිවනට.

යතරුතිනි සදහම් – සයුර සදහම් සයුරයි,
දූත තතු සයුර සදහම් – සකුපැදිමලිනි පුද දුන්.

විදුවෙසෙරදට වන් – පඬිබවෙහි අගැ සිටුනා,
ඉඳුරුවෙ තුරුනඳ නා – යතිසුරු ලබා මේ පින්.

ඤාණසේකර බිදත් – බෙරලපනතොට දුනු මෙහි,
උපපදනැදුරු පඬිතෙර – ඉගැත්තුම්බර උසුලා.

ඒ ද මේ ගත්කම – නො බරවනුයෙහි එක් හේ,
එකතයැ ඒ තැනට පින් – අත්වනු දුකින් මිදුමට.

නිත්දැන අබිනව – රම්හි මුල් තැන සිටුනා,
අම්බලම්ගොඩ දම්වස් – තෙරහු එහි බර දරණු.

ගත්කරුට ගත්කම් – බර නො බරවීමෙහි එක්,
හේ වේ එ තැන මෙ පිණෙන් – ලබනු ඇත නිවනෙහි රස.

පිටපත යමාවග – ලියූ පිණෙනී සත්විඳු,
අම්බලම්ගොඩ සුමඟුල් – තෙරහු ලබනූ ඇත මා.

සත්දත් වියත් දන – ඔබා සිටි සත් නැණෙනී,
අනඳ ගුරුගේ මහැදුරු – තුමා දම්තිය රැදුනූ

සදහම්සයුරැ රැඳි – දම් අමා රස බීමෙන්,
පිණා සිටුනේ එමැතිට – නිවන්සුව අත්පත් වේ.

සතුදය නැගුම්හි – බැඳි සිත් ඇතිවැ වැටෙනා,
ගත්කරුගෙ නැපුත් වූ – තෙරුවන් පිහිට කොටැ ගත්.

ඛානකරුවන බිදත් – ගුණතුඟු මහැදුරුතුමා,
ලේකම් වසම් ලියනා – පරපුරැ දුනූ සත්දත්.

මෙගත පළ කැරුමෙහි – යෙදූ ඒ තැනට හැමවර,
ලැබේ මින් දුනු මහපින් – ඔහුට මොක්සැප ලැබුමට.

සෝදුම්පත් බැලූ – දම්රම් වරදිවෙළැ දුනු,
ගොඩගේනැ දුනු දෑකැමි – කළණ කළුවඩුමුල්ලේ.

පටබැඳිමුල්ලගමැ – කෝවිදද බටපොලගමැ,
දුනු **රක්ඛිත** පැවිදි – සිසුනට ද ගිහිසිසු වූ.

රජපැකිගෙ පරපුරැ – **අමරවස්**, හා පරපුරැ,
ඇත්මුනී ආරච්චී – **විල්සන්** සිල්ව නම් වූ.

මොවුනට හා අතුල – යතුරු අල හිමි ගුණ රැඳි,
**රත්නා ඩබ්ලියූ. ඩී. ජේ** – මහතුනට පින් අත් වේ.

පවත්පත් මගිනී – සදහම් සයුරු ඇති තතු,
නො සිව පළකළ ඒ හැම – ගතුගත් වියත් පඬිහු.

පිහිට කොට මේ පින් – ලෝ සසුන් වැඩ වැඩුමෙන්
දිගාසිරි විඳ රිසි සේ – මිදෙත්වා බව දුකෙනි.

---

සතදරසෙබෙහි පති – **ආර්. එච් ද සිල්වා** නම්,
වෙදදුරුතුමන්හට මේ – ලැබේ පින් මොක් සුවයට.

සතුදය සත්මැදුර – ඇරඹුමෙහි මුල් තැන් ගත්,
සතදරසෙබෙහි පළමු – ලේනා පදවි දරුමෙන්.

ලෝවැඩ ඉතසිතින් – සැලසූ නො බා සිටි ඒ,
**ඩේවිඩ් වාස් ගුණවඩු** – මහතුනට පින් පැමිණේ.

ගේ දොර අඹුදරු – නො තකා ලොවැඩ පතමින්,
දන වැර යොදා සතුදය – නාගාලනුවස් දවරු

ඩේවිඩ් වාස් ගුණ – වඩන මහතුන් ගත් තැන,
පමණ නො කළැකි වේ මය – තිවන් ඕහට අත් වේ.

සතුදය ඇරඹුමෙහි – පෙර ගැමි ව සිටි, **ජේ. පී.**,
තනතුරු ලබා රදෙනී – මහදන හිතෙහි ඇලුනූ.

**ජී. එච්. ඩී.** කුරෙනි – වෙසෙසු **කුමරදස්** නම්,
වෙදදුරුතුමා මෙපිණෙන් – ලබාවා මාරස තුම්.

ඉනෙක්බිති එසෙබෙහි – ලේනා පදවි තැන් පත්,
**තෝමස් සිල්ව කේ. පී.** – මහතුනට පින් පැමිණේ.

සතුදයැ ගුරුන් හා – සිසුන් හිතයෙහි වැටුමෙන්,
දන් පින් බොහෝ සැපයූ – මොහුට මොක් ලැබෙ එකතයැ.

යලි එසෙබෑ ලේනා – පදවි ලත් ශූ. ගිනිගේ,
මහතුනට පින් අත් වේ – මොක් සැප ලබනු සඳහා.

මුදලි ඒ. සී. ඇස් – කනකරුවන බිදත් මැති,
සතදර සෙබෙහි බඩැරි ව – සිටියේ පිණෙන් තුටු වේ.

සතුදය සත් මැදුර – පල්නා සෙබෙහි මෙවකෙහි,
බඩැරිතනතුර සිටුනා – ජී. ඇම්. ඒ. ද සිල්වා.

මහතුනට හා එහි – ලේනා පදවි දරණා,
ජේම්න් වාස් ගුණවඩු – මහතුනට පින් අත් වේ.

බඩැරි – ලේනා මේ – ගුණදත් දෙදෙන ගත්කරු,
සුවදුක් බලා සිටුනෝ – අත් කෙරෙත්වා මාරස.

සතුදයෙහි නැගුමට – අත දී සිටින ගුණ හිමි,
මෙ දෙදෙන අමාරසයෙන් – පිණා යනුවෝ එකතයෑ.

සතදර සෙබෙහි සැබි – සතුදයට හිතවත් වූ,
ඇම්. එම්. සෑඳුසෙන් මැති – අම්බලම්ගොඩ මැතිසුනෑ.

මහදනවැඩුම්හි – තදබදසිතින් නො ලැසි ව,
දවරැ ගෙවාලනුයේ – මෙ මැතිහට පින් පැමිණේ.

සතදර සෙබෙහි අන් – සැබි ව සිටුනා හැම දෙන,
මෙ ගත් සැරුමෙන් ලත් පින් – ලබා සෙත් පත් වෙත්වා.

---

දම්නිය බිදකුදු – නො ලැගි දම්විනෙ කෙලපත්,
ඉගරු බෙරුවල සිරි – සුමඟුල් සිරිනිවෙස් නම්,

අමරපුර මහනකෑ – මහනායතිඳු සඳුහට,
ලැබේ පිණ මා ලැබුමට – ගත්කරුට ඇදුරෙව් වූ.

සියවස් ඉක්මවා – මහනා යතිඳු ගුණ හිමි,
ලෝ සසුන් කිස සඳහා – දිගා වෙත්වා නිදුකින්.

විදුදය විදුහලෙහි – පදන්තනතුර හෙබ වූ,
සුරගුරු සදිසි නැණෙනී – තෙවලාවදතිසුරු ගරු.

සිරි සිසරුවන් නම් – නායතිඳුසඳ ගුණ දෙටු,
ගත්කරුට ඇදුරෙව් සිටි – ලබත් මොක් සැප උස් වූ.

විදුදය සරසවියැ – කුලපතිපදවි දැරූ මෙහි.
එක් ම දම්සතලුටැඹ – තෙවළාවදිනිසුරු වූ.

වැලිවිටියගමැ දුනු – **සෝරත** නායනිඳුසඳ,
ගත්කරු නිතෙනි වැටුනෝ – ලබත්වා ලෝතුරු සැප.

ගත්කරු වැඩුම්හී – රැඳී සිටි කටයුතු කිසැ,
**බී. එච්. ජ්. ද සිල්වා** – නැ සොහොයුරුද එක්වන්.

එහැම කිසැ අත දුන් – **පී. වයි. ජ්. ද සිල්වා,**
නැසොහොයුරු ද මේ පිත් - ලබා මොක් පත්වනු ඇත.

තවද ගත්කරු මේ – මහාපින්කඳ මින් දුනු,
දෙගුරු ඇදුරු සෝයුරු – බූන මිතුරු සතුරු.

වැඩකරු කැපකරු – හිතකරු හැමට මොක්සැප,
ලබනුවස් හිතකුළුණින – පමුණුවාලී සහතොස්.

මෙ පිණෙන් හැම දනෝ – දෙලොවැ යසිසුරු විඳැ තොස්,
අවසනැ උතුම් මොක්සැප – ලැබුමෙන් නිදුක් වෙත්වා.

ලෝ සසුන් රක්නා – මුරුගණ ද මේ පින් කඳ,
පිහිට කොට ගෙණැ බියකරු - සසරින් මිදී යෙත්වා.

වැසි ලැබුමෙන් කලට – කෙත් වත් වගා වේවා,
රෝදුක් බිය නැසීලා – සතට සෙත සැලසේවා.

රට රක්නා දනෝ – දස රජදහම්හි පිහිටා,
හොර බොරු කපට කම් හැර – දහමින් රට රකිත්වා.

නැත මෙලෝ පරලෝ – නැත මවුපියෝ කො තැනත්,
නැත මෙහි පින් පව් කමෙක් – කියනා මිසදිටු දනෝ.

එ මිසදිට් හැරලා – සම්දිට්හි පිහිටා ගෙණැ,
සෙමෙහි තැබුමෙන් රට දැය – රකිත්වා දන තොස්වා.

සම්දිටු සිහල දැ – මෙකප්හිම් කොට මිහිතලැ,
දැහැමි ව නැගී යේවා – බුදුදහමනුව වැටුනී.

සදමින් සත් ලොවට - නොමින් හිතවැඩ දෙලොවින,
වාපත් දහස් කල් – බුදුසසුන පවතීවා.

නියම බෞද්ධ පිළිවෙත – රක්නා ගුණෙනි සිරිමත්,
හෙළ හුරු නො හැර වැටුමෙන් – සිත් ගත් දනන් හැමදා.

බෞද්ධ උවසු අතිගරු – විලියම් ගොපොල්ලව නම්,
අගලකිසුරුතුමා මෙහි – දුකැර සැරදේ සැපතින්.

පරපුරෙනි පරපුර – වැඩුනු හෙළද ගුණෙනී,
තෙරුවන තමන් හදවත – ලෙසින් ගත් රට කරවන.

පිරිසිදු බෞද්ධ සිහල – ලෙසිනි තදබද දනදෙටු,
ඩඩ්ලි සෙල්ටන් සේනා – නායක දනන් රඳවන

ගරු අගමැතිඳු සඳ – තෙරුවන් සරණ ලැබුමෙන්,
කුළුණුගුණ පිඩු සිරිමත් – සැරදෙ රිපුනෙබී බිඳහැර.

හෙළයා මෙසේය සි – හඩ නැගූ ලෝ දනමැද,
නො බිය ව සිටින හැමතැන – හෙළබෞද්ධ සිරිත් කැවුනු.

ගරු රැදී ඇමැතිඳු – ජයවඩු මැතිඳු ජේ. ආර්,
පිළිමලුන් ඔද බිඳ හැර – දෙසැර ලක්දන වැඩුමට.

නිසිමග ගැණීමෙන් – දෑ සමය වැඩ වඩනා,
හෙළබෞද්ධ සිරිත් ඇගමස – කැවී සිටුනා තෙදවත්.

ලක්රදෙනි නියොදෙක – ඉගැන්නුම් කිස මඩලෙහි
ඇමැති තනතුර හොබවන – ජීයගොල්ල මැති ගරු

ඉගැන්නුම් මග දෑ – සමය වැඩුමට නිසි සේ,
සකසා දෙසැර නො කැපි – පිළිමලුන් සැඩබසිනි.

විදුලිබල කිසැ හා – ගම් බිම් ඉඩම් වැඩුමෙහි,
ගරු ඇමැති තැන්පත් ඒ – ලක්දනට සෙත සැලසූ.

සී. පී. ද සිල්වා – මැතිසඳ මෙ පින් ලැබුමෙන්,
බෝකල් දිනේ දනමැද – හැම දුක් දුරැර යහතින්.

හැම මැති ඇමැතිවරු – පක් විපක් බේ නො තකා,
රට දූය නගාලනු වස් – එක්සිත් ව නැග යෙත්වා.

මැති ඇමැති හැම දෙන – තෙරුවන් සරණ ලැබුමෙන්,
රට දූය වඩා මහදන – තොස්වා දිගා වෙත්වා.

---